පපඤ්චසූදනී නම් වූ
මජ්ඣිම නිකායට්ඨකථා
දෙවැනි කොටස
(සිංහල පරිවර්තනය)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට
නමස්කාරය වේවා !

1-2-1

එවමෙම සුතං යනු චූලසීහනාද සූත්‍රයයි. යම් හෙයකින් මෙම සූත්‍ර ධර්මය දේශනා කිරීමට හේතුකාරකයක් වී ද? එම හේතුකාරකය දක්වමින්ම සූත්‍රයාගේ පෙර විස්තර නොකළ අපූර්ව පදයන්ගේ අර්ථ වර්ණනාව කරන්නෙමු. කවර හෙයකින් මෙම සූත්‍රය වදාරන ලද්දේද යත්? ලාභ සත්කාර ප්‍රත්‍යයෙන් තීර්ථකයන්ගේ විලාප කීම හේතුවෙන් වදාරන ලදී. භාග්‍යවතුන් වහන්සේට වනාහී 'ධම්ම දායාද' සූත්‍රයේ කී පරිද්දෙන් මහත් වූ ලාභසත්කාර උපන. මේ ලෝක සත්ත්ව තෙම සතරාකාර (සතර ප්‍රමාණික) වේ. රූප ප්‍රමාණ වූවෝ රූපයෙහි ප්‍රසන්නය හ. ඝෝෂ ප්‍රමාණ වූවෝ ඝෝෂයෙහි (ශබ්දයෙහි) ප්‍රසන්නය හ. ධර්ම ප්‍රමාණ වූවෝ ධර්මයෙහි ප්‍රසන්නයහ. රළු බවෙහි රූක්ෂ ප්‍රමාණ වූවෝ රළු බවෙහි (රූක්ෂ ප්‍රතිපදාවෙහි) ප්‍රසන්නයහ. පුද්ගලයන් වශයෙන් මොවුහු සතර පරිද්දෙකින් සිටීම ඔවුන්ගේ නානත්වයයි. රූපප්‍රමාණ වූ රූපයෙහි පහදින්නෝ නම් කවරහුද? මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ආරෝහ පරිණාහ තත්ත්වය (රූ සපුව) දැක පහදින්නෝය. මේ පුද්ගල තෙම

රූපප්‍රමාණ වූ රූප ප්‍රසන්න පුද්ගලයා යයි කියනු ලැබේ. ඝෝෂ ප්‍රමාණ වූ ඝෝෂ ප්‍රසන්න පුද්ගලතෙම කවරේද? මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් අන් අයගේ වර්ණනාවෙන්, අන් අයගේ ස්තුතියෙන්, අන් අයගේ ප්‍රශංසාවෙන්, අන් අයගේ වර්ණහාරිත්වයෙන්, එහි ප්‍රමාණය ගෙන ප්‍රසාදය උපදවති. මෙතෙම ඝෝෂ ප්‍රමාණ වූ ඝෝෂ ප්‍රසන්න පුද්ගලයා යයි කියනු ලැබේ. රූක්ෂප්‍රමාණ වූ රූක්ෂ ප්‍රසන්න පුද්ගලයා කවරේද? මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් සිවුරෙහි රළු බව දැක හෝ පාත්‍රයෙහි ගොරහැඩි බව දැක හෝ, සෙනසුන්වල කටුක බව දැක හෝ විවිධ වූ දුෂ්කර ක්‍රියාවන් දැක හෝ, ප්‍රසාදය උපදවති. මේතෙමේ රූක්ෂ ප්‍රමාණ වූ රූක්ෂ ප්‍රසන්න පුද්ගලයා යයි කියනු ලැබේ. මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක්, ධර්මප්‍රමාණ වූ ධර්මප්‍රසන්න පුද්ගල තෙම කවරේද? මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් සීලය හෝ දැක, සමාධිය හෝ දැක, ප්‍රඥාව හෝ දැක එහි ප්‍රමාණය ගෙන ප්‍රසාදය උපදවති. මේ තෙමේ ධර්මප්‍රමාණ වූ ධර්මප්‍රසන්න පුද්ගලයා යයි කියනු ලැබේ.

මේ පුද්ගලයන් සතරදෙනා අතුරෙන් රූපප්‍රමාණ පුද්ගලයා වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ආරෝහ පරිණාහ යුක්ත වූ, පරිපූර්ණ වූ වර්ණ සෞන්දර්යය ඇති, අසූ අනූ ව්‍යඤ්ජනයන්ගෙන් පිරිපුන් බැවින්, විවිධ වර්ණයන්ගෙන් විසිතුරු වූ, රන්පටක් වැනි දෙතිස්මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් ගැවසීගත් බැවින්, තාරකා සමූහයෙන් බබළන අහස්තලය වැනි, සියළුතැන්හි හාත්පස හටගත් මල් ඇති, සියක්යොදුන් පරසතු රුක් වැනි වූ, අටළොස් රියන් උස් වූ, ශරීරය වටා වූ ව්‍යාමප්‍රභා මාලාවෙන් අලංකාර වූ අනූපම වූ ශරීරය දැක සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ කෙරෙහිම ප්‍රසන්න වෙයි. පහදියි.

ඝෝෂය පමණ කොටගෙන ප්‍රසන්න වන්නා ද 'භාග්‍යවතුන් වහන්සේ විසින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට අධික කාලයක් දශ පාරමීහූ, දශ උපපාරමීහූ, දශ පරමත්ථ පාරමීහූ පුරන ලද්දාහු ය. අඟ පසඟ පරිත්‍යාගය, අඹුදරු පරිත්‍යාගය, රාජ්‍ය පරිත්‍යාගය, ආත්ම පරිත්‍යාගය, දෑස් පරිත්‍යාගය ද කරන ලද්දේය.' යනාදී වශයෙන් පවත්නා වූ ගුණඝෝෂය (ගුණරාවය) අසා සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ කෙරෙහි ම පහදියි.

රූක්ෂ ප්‍රතිපත්ති පමණ කොටගෙන ප්‍රසන්න වන්නා ද භාග්‍යවතුන් වහන්සේ ගේ චීවරයෙහි රළු බව දැක, ඉදින් භාග්‍යවතුන් වහන්සේ ගිහිගෙයි වාසය කළේ නම් කසීසළු ම දරන්නාහු ය. එතකුදු වුවත් පැවිදි වී සණ පාංශුකූල සිවුරෙන් ම සතුටු වන්නා වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දුෂ්කර වූවක්ම කරන ලදැයි සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ කෙරෙහිම පහදියි. පාත්‍රයෙහි ගොරහැඩි බව දැක මුන්වහන්සේ ගිහිගෙයි වාසය කළේ නම් උතුම් වූ රත්රන් බඳුන්හි සක්විති රජෙකුගේ භෝජනයට සුදුසු වූ සුවඳහැල් සහලේ භෝජනයම වළඳන ලද, එතකුදු වුවත් පැවිදිව සෙල්මුවා පාත්‍රයක් ගෙන උසස් පහත් කුලදොර සපදානයෙන් පිඬු පිණිස හැසිර ලත් පිණ්ඩපාත ආහාරයෙන් ම සතුටුවෙමින් දුෂ්කර වූවක්ම කෙරෙති'යි සම්‍යක් සම්බුද්ධයන් කෙරෙහි ම පහදියි. සෙනස්නෙහි රූක්ෂ බව දැක මෙ තෙමේ ගිහිගෙයි වසත් නම් තුන් ඍතුන්ට සුදුසු වූ තුන් පහයෙක්හි ත්‍රිවිධ නළුනිළියන් පිරිවරකොට ඇතිව දිවසැපක් මෙන් රජසැප විඳියි. දැන් පැවිදි වූවාහු රුක්මුල් සෙනසුන් ආදියෙහි දැවපුවරු, ගල්තල, විදල් මැසි ආදියෙහි සැතපෙමින් දුෂ්කර වූවක්ම කරතියි සම්‍යක් සම්බුද්ධයන් කෙරෙහිම පහදියි. උන්වහන්සේගේ දුෂ්කර ක්‍රියා දැක ද සාවුරුද්දක් මුං යුස, කොල්ලු යුස, කලත් යුස ආදීන්ගේ අඩපතක් අඩපතක් පමණකින් යැපුනේය. අප්‍රාණික ධ්‍යානයෙන් ධ්‍යාන කළේය. පුදුමයෙකි. ආශ්චර්යය. භාග්‍යවතුන් වහන්සේ දුෂ්කර ක්‍රියා ඇතිසේකැයි සම්‍යක් සම්බුද්ධයන් කෙරෙහිම පහදියි. ධර්මය ප්‍රමාණකොට ඇත්තේ ද භාග්‍යවතුන් වහන්සේ ගේ ශීල ගුණය සමාධි ගුණය ද ප්‍රඥා ගුණය ද ධ්‍යාන විමෝක්ෂ සමාපත්ති සම්පත්තිය ද, අභිඥාවන්ගේ පාරිපූරිත්වය ද යමක මහා ප්‍රාතිහාර්යය ද, දේවාවරෝහණය ද, පාටියපුත්‍ර දමනාදිය ද, යන නොයෙක් ආශ්චර්යයන් දැක සම්‍යක් සම්බුද්ධයන් කෙරෙහි ම පහදියි.

ඔව්හු මෙසේ ප්‍රසන්න වූවාහු භාග්‍යවතුන් වහන්සේට මහත් වූ සත්කාර එලවති. තීර්ථකයන්ට වනාහි බාවෙරු ජාතකයෙහි කවුඩාට මෙන් ලාභ සත්කාරයෙහි පිරිහුනේ යි.
වදාළේ මය.

අදස්සනෙන මොරස්ස - සිඛිනො මඤ්ඤු භාණිනො
කාකං තත්ථ අපූජෙසුං - මංසෙන ච ථලෙනව
යදා ච සර සම්පනෙන්නා - මොරො බාවෙරු මාගමා
අථ ලා හො ච සකකාරො - වායසස්ස අභායථ

යාව නූපපජ්ජති බුද්ධා - ධම්මරාජා පභංකරෝ
අථ අඤ්ඤා අපූජේසුං - පුථූ සමණ බ්‍රාහ්මණෙ
යදා ච සර සම්පනෙත්තා - බුද්ධා ධම්මං අදෙසයී
අථ ලාභොච සක්කාරෝ - තිත්ථියානං අභායථා

ශිඛායෙන් යුක්ත වූ මියුරු හඬ ඇති මොනරාගේ නොදැක්මෙන් බාවේරු රට ජනයෝ එහි විසූ කපුටෙකුට මාංසයෙන් ද නන්වැදෑරුම් ඵලයෙන් ද පිදූහ.

නැවත යම් කලෙක මිහිරි හඬින් යුක්ත වූ මොනර තෙමේ බාවේරු රටට ආයේද? එකල්හි කවුඩාගේ ලාභය ද සත්කාරය ද පිරිහුනේය.

ධර්මරාජන් වූ පභංකර වූ බුදුන්වහන්සේ යම්තාක් පහළ නොවන සේක් ද ඒ තාක් අන්‍ය වූ බොහෝ මහණ බමුණන් පිදූහ.

නැවත යම් කලෙක බ්‍රහ්මස්වරයෙන් යුත් බුදුන් වහන්සේ සිව්සස් දහම් වදාළ සේක් ද? එකල්හී තීර්ථකයන්ගේ ලාභය ද සත්කාරය ද පිරිහුණේ ය.

මෙසේ ලාභ සත්කාරයෙන් පිරිහුණු ඔවුහු, රාත්‍රියෙහි අඟලක් දෙකක් පමණ ආලෝක කොට ද හිරු නැගෙනකල්හි කලාමැදිරියන් මෙන් නටුවා වූ ප්‍රභා ඇත්තාහු වූහ.

යථාහි ඛජ්ජූපනකා - කාලපක්ඛම්හි රත්තියා
නිදස්සයන්ති ඕභාසං - එතෙසං විසයෝ භිසෝ
යදා ච රස්මි සම්පනෙනා - අබ්භුදෙති පභංකරෝ
අථ ඛජ්ජූපසංඛානං - පභා අන්තරධායිති
එවං ඛජ්ජූපසදිසා - තිත්ථියාපි පුථූ ඉධ
කාල පක්ඛූපමෙ ලොකෙ - දීපයන්ති සකං ගුණං
යදා ච බුද්ධා ලොකස්මිං - උදෙති අම්තපභෝ
නිප්පභා තිත්ථියා ලොකස්මිං - උදෙති අම්තපභෝ
නිප්පභා තිත්ථියා හොන්ති - සුරියෙ ඛජ්ජපකා යථා හි

යම් සේ කලාමැදිරියෝ කරුවල දවස්හි රාත්‍රියෙහි ආලෝකය දක්වත් ද? ඒ කරුවල කාලය කලාමැදිරියන්ට සුදුසු කාලය වන හෙයිනි.

යළිදු යම් කලෙක දහසක් රැස් ඇති සූර්යයා උදාවේද එකල්හි කදෝපැනියන්ගේ ආලෝකය දිලිසීම අතුරුදහන් වේ.

එපරිද්දෙන් මේ ලෝකයෙහි කදෝපැනියන් සමාන වූ බොහෝ තීර්ථකයෝ ද කරුවල කාලය හා සමාන වූ ලෝකයෙහි ස්වකීය ගුණය ප්‍රකාශ කරත්.

නැවත යම්කලෙක්හි අප්‍රමාණ වූ ප්‍රභා ඇති බුදුන්වහන්සේ ලෝකයෙහි පහළ වේද? තීර්ථකයෝ හිරු උදා වූ කල්හි කදෝපැනියන් මෙන් නිෂ්ප්‍රභා වේ.

ඔවුහු මෙසේ නිෂ්ප්‍රභා වී සිරුරු කැසීම නිසා ඇති වූ බිබිළි ආදියෙන් ගැවසුණු සිරුරු ඇත්තාහූ අතිශයින් පිරිහීමට පැමිණියාහු බුදුහු යම් තැනක ද, ධර්මය යම් තැනක ද, සංඝයා යම් තැනක ද මහජන රැස්වීම් යම් තැනක ද ඒ ඒ තැන්වලට ගොස් අතුරු වීථිවල ද, දෙමංසන්ධිවල ද, සතරමංසන්ධිවල ද, සභායෙහි ද සිට විලාප කියති. කිම පින්වත්නි! ශ්‍රමණ භවත් ගෞතමයෝම ශ්‍රමණ වෙත් ද? අපි ශ්‍රමණයෝ නොවමුද? කිම ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ ම ශ්‍රමණයෝ වෙත් ද? අපගේ ශ්‍රාවකයෝ අශ්‍රමණ වෙත් ද? ශ්‍රමණ භවත් ගෞතමයන්ට සහ ඔහුගේ ශ්‍රාවකයන්ට දෙන ලද්දම මහත්ඵල ද? අපට දෙන ලද්ද මහත්ඵල නොවේ ද? ශ්‍රමණ භවත් ගෞතමයෝ ශ්‍රමණ වූයේ නම් අපිත් ශ්‍රමණයෝ නොවමෝද? ශ්‍රමණභවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ ශ්‍රමණයෝ ය. ශ්‍රමණ භවත් ගෞතමයන්ටත් ඔහුගේ ශ්‍රාවකයන්ටත් දෙන ලද්ද මහත්ඵලය. අපටත් අපගේ ශ්‍රාවකයන්ටත් දෙන ලද්ද ද මහත්ඵලමය. ශ්‍රමණ භවත් ගෞතමයන්ට ද, ඔහුගේ ශ්‍රාවකයන්ට ද (දන්) දෙව්! (පූජා) කරව්. අපට ද අපගේ ශ්‍රාවකයන්ට ද (දන්) දෙව්! (පූජා) කරව්. ශ්‍රමණ ගෞතම තෙමේ පළමු දිනයන්හි උපන්නෝ නොවේ ද? අපි වූ කලී ලොව උපදනා කලම උපන්නමෝ වෙමු'යයි මෙසේ නන් අයුරින් කෑ ගසත්.

එකල්හි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව් පිරිස ඔවුන්ගේ ශබ්දය අසා භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. 'ස්වාමීනි, තීර්ථකයෝ මේ මේවා කියති'. ඒ අසා භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, තෙපි තීර්ථකයන්ගේ වචනයෙන් (ශාසනයෙන්) බැහැර අන්තැනෙක මහණෙක් ඇතැයි නො සිතවු. පිළිගැනීම් ඇත්තෝ නොවව්'යයි වදාරා අන්‍ය තීර්ථකයන් කෙරෙහි ශ්‍රමණ භාවය (මහණකම) ප්‍රතික්ෂේප කරන සේක් යළි මේ සසුන්හිම (මහණකම) අනුදන්නා සේක්, මෙම අදාළ **ඉධෙව භික්ඛවෙ සමණො** යනාදී මෙම සූත්‍රය වදාළ සේක.

එහි **ඉධෙව** යනු මේ ශාසනයෙහි ම (යන අර්ථයි) මෙම නියමය සෙසු පදයන්හි ද දතයුතුය. දෙවැනි ශ්‍රමණාදීහු ද මේ ශාසනයෙහි ම වෙති. අන් තැනෙක නැත. **සමණො** - සෝවාන් පුද්ගලයා. එහෙයින් ම වදාළහ. **කතමොච භික්ඛවෙ! සමණො? ඉධ භික්ඛවෙ භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපනෙනා හොති අවිනිපාත ධම්මො නියතො සම්බොධිපරායණො අයං භික්ඛවෙ සමණෙ** 'මහණෙනි, ශ්‍රමණ තෙම කවරෙක් ද? මහණෙනි! මේ ශාසනයෙහි භික්ෂුව ත්‍රිවිධ සංයෝජනයන් දුරු කිරීමෙන් සෝවාන් බවට පැමිණියේ ද? ධර්ම නියාමයෙන් නියත වූයේ මතු තුන්මග පිහිටකොට ඇත්තේ ද? මහණෙනි, මේ ශ්‍රමණයා වේ. **දුතියො සකෘදාගාමී** පුද්ගලයා යි. එහෙයින් වදාළහ. **කතමොච භික්ඛවෙ දුතියො සමණො ඉධ භික්ඛවෙ භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාග දොස මොහානං තනුතතා සකදාගාමී හොති. සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. අයං භික්ඛවෙ දුතියො සමණො** 'මහණෙනි, දෙවැනි ශ්‍රමණයා කවරෙක් ද? මේ ශාසනයෙහි භික්ෂුව තුන් සංයෝජනයන් දුරු කිරීමෙන් රාග ද්වේෂ මෝහයන් තුනී කිරීමෙන් සකෘදාගාමී බවට පැමිණියේ ද? එක්වරක් පමණක් මෙලොවට අවුත් සසර දුක් කෙළවර කරයි ද? මොහු දෙවැනි ශ්‍රමණයා වේ. **තතියො** අනාගාමී පුද්ගලයා ය. **කතමො ච භික්ඛවෙ තතියො සමණෙ? ඉධ භික්ඛවෙ භික්ඛූ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති. තත්ථ පරිනිබ්බායි අනාවත්ති ධම්මො තස්මා ලොකා, අයං භික්ඛවෙ තතියො සමණො** තුන්වැනි ශ්‍රමණයා කවරෙක් ද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව ඕරම්භාගිය සංයෝජනයන් පස දුරු කිරීමෙන් ඕපපාතික වේද? ඒ භවයෙහිම පිරිනිවෙනසුලු වූයේ ඒ බඹලොවින් නැවත පිළිසිඳ නොගන්නා ස්වභාව ඇත්තේ වේද, මොහු තුන්වැනි ශ්‍රමණයා වේ. **චතුත්ථො** රහතන්

වහන්සේ ය. එහෙයින් වදාළහ. **කතමෝ ච භිකඛවෙ චතුත්ථෝ සමණෝ** - ඉධ භිකඛවෙ භිකඛූ ආසවානං ඛයා අනාසවං චෙතෝ විමුත්තිං පඤ්ඤා විමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං භිකඛවෙ චතුත්ථෝ සමණෝ මහණෙනි, සතරවැනි ශ්‍රමණයා කවරෙක්ද? මේ ශාසනයෙහි මහණතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් රහත්ඵල සිත ද රහත්ඵල ප්‍රඥාව ද මේ ආත්මයෙහිම තෙමේම මනාකොට අවබෝධ කරගෙන ඊට පැමිණ වාසය කරයි ද මේ සතරවැනි ශ්‍රමණයා වේ. මෙතැන්හී සතර ඵලයෙහි පිහිටි ශ්‍රමණයෝ ම අදහස් කර ඇත. **සුඤ්ඤා** යනු හිස් වූවාහුය. **පරප්පවාදා** යනු සතර ශාස්වත වාදයෝය. සතර ඒකත්‍ය ශාස්වතයෝය. සතර අන්තානන්තිකයෝය. සතර අමරා වික්ඛෙපවාදීහුය. අධිත්‍ය සමුත්පන්නයෝ දෙදෙනය. සොළොස් ආකාර සංඥීවාදයෝය. අටවැදෑරුම් අසංඥීවාදයෝය. අටවැදෑරුම් නේවසඤ්ඤී නාසඤ්ඤී වාදයෝය. සත්වැදෑරුම් උච්ඡේදවාදයෝය. පස්වැදෑරුම් දිට්ඨධර්ම නිර්වාණ වාදයෝය. මේ සියළු දේ බ්‍රහ්මජාල සූත්‍රයෙහි ආවා වූ දෙසැට දෘෂ්ටීහු මේ සසුනෙන් බැහැර වූ අනුන්ගේ වාදයෝ 'පරප්පවාදා' නම් වේ. ඒ සියල්ල (කලින් දැක් වූ) සතරවිධ ඵලස්ථයන්ගෙන් ශූන්‍යය. ඒ දෘෂ්ටි මේ ශාසනයෙහි නැත්මය.

හුදෙක් මේ ඵලස්ථයන්ගෙන් (පමණක්) ශූන්‍ය වූයේ නොවේ. සතර මාර්ගස්ථ ශ්‍රමණයන්ගෙන් ද සතර මාර්ග සඳහා ආරම්භ කළ විදර්ශනා ඇත්තවුන්ගෙන් ද දොළොස් ආකාර ශ්‍රමණයන් කෙරෙන් ද ශූන්‍ය වූවෝම වෙති. මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ පරිනිර්වාණ සූත්‍රයේ දී වදාරන ලදී.

එකූනතිංසො වයසා සුභද්‍ර යං පබ්බජිං කිං කුසලානු එසී
වස්සානි පඤ්ඤාස සමාධිකානි යතො අහං පබ්බජිතෝ සුභද්‍ර
ඤායස්ස ධම්මස්ස පදෙසවත්තී ඉතෝ බහිද්ධා සමණොපි නත්ථි

එම්බා සුභද්‍රය, වයසින් එකුන්තිස් අවුරුද්දේ කුසලය කුසලය කවරේදැයි සොයමින් පැවිදි වූයෙමි. යම්තැනක පටන් මා පැවිදි වූයෙම් ද, වසක් අධික කොට පනස් වසක් වේ. මේ ශාසනයෙන් බැහැර ආර්ය ධර්මයාගේ ප්‍රදේශ සංඛ්‍යාත විදර්ශනා මාර්ගයෙහි පිහිටියෙක් ද සෝවාන් මාර්ගයට පැමිණියෙක් ද නැත්තේය.

සෝවාන් මගට පිළිපන් විදර්ශනා ඇත්තාහුය. මාර්ගස්ථයාය. ඵලස්ථයාය. යන තිදෙනම ගෙන 'සමණොපි' 'නත්ථි' යනු වදාළහ. සකදාගාමී මගට පිළිපන් විදර්ශනා ඇත්තහුය. මාර්ගස්ථය ඵලස්ථය යන තිදෙනම ගෙන, 'දුතියොපි සමණෙ නත්ථි' යනු වදාළහ. අනෙක් දෙතැන්හි ද මේ නියම මයි.

කුමක් හෙයින් අන්‍ය තීර්ථකයන් අතර ශ්‍රමණයෙක් නැතැයි කියන ලද ද? සුදුසු බිමක් නො වන හෙයිනි. යම් සේ හිඳිකටු මූණ අග අබඇටයක් නොරැඳේ ද? දිය පිට ගිනි නො දැල්වේද? පිටිගලෙක බීජ නො වැඩේද? එසේම බාහිර තීර්ථායතනයන්හී මේ ශ්‍රමණයෝ නොඋපදිත්. මේ සසුන් බිමේ ම උපදිත්. කවර හෙයින් ද? ක්ෂේත්‍රය වන බැවිනි. මේ ඵල රහිත භූමිය හා ඵල සහිත භූමිය ආර්ය මාර්ග නොහට ගැනීමෙන් හා හටගැනීමෙන් දතයුත්තාහ. භාග්‍යවතුන් වහන්සේ එහෙයින් වදාළ සේක. යම් ශාසනයෙක ආර්ය අෂ්ටාංගික මාර්ගය නො ලැබේ ද සෝවාන් මහණ ද එහි නො ලැබෙයි. දෙවැනි මහණ ද එහි නො ලැබෙයි. තුන්වැනි මහණ ද එහි නො ලැබෙයි. සිව්වෙනි මහණ ද එහි නො ලැබේ. තව ද සුභද්‍රය, යම්කිසි ශාසනයෙක්හි ආර්ය අෂ්ඨාංගික මාර්ගය ලැබේද, සෝවාන් මහණ ද, දෙවෙනි මහණ ද, තුන්වෙනි මහණ ද සිව්වෙනි මහණ ද එහි ලැබේ. සුභද්‍රය, මේ මාගේ ශාසනයෙහි ආර්ය අෂ්ඨාංගික මාර්ගය ලැබෙයි. එහෙයින් පළමුවැනි මහණ ද දෙවෙනි මහණ ද තෙවෙනි මහණ ද සිව්වෙනි මහණ ද මේ ශාසනයෙහිම ය. අනෙක් පරවාදයෝ මේ සතර ශ්‍රමණයන් කෙරෙන් සිස් වූහ.

මෙසේ යම්හෙයකින් තීර්ථායතනය සරුකෙත නොවූයේ ද, ශාසනය සරු කෙත වූයේ ද, එහෙයින් සුරත් අත්පා ඇති බාසුරු කෙසරු සළා ඇති මිගරාජන් වූ සිංහයෙක් සොහොනෙහි කසළ ගොඩෙහි හෝ නොවෙසෙත්ද, තුන්දහසක් යොදුන් විතරැති හිමවතට පිවිස මැණික් ගුහාවක වෙසෙත් ද, යම් සේ සද්දන්ත ඇති රජෙක් ගෝචරිය ඇත්කුලය ආදී නවකුලයන්හි නූපදිත් ද, සද්දන්ත කුලයෙහිම උපදිත්ද, යම්සේ වලාහක අශ්ව රාජයෙක් කොටළු කුලයෙහි හෝ අස්කුඩ කුලයෙහි නූපදිත්ද, සින්ධු නදීතෙර සෛන්ධව කුලයෙහි ම උපදිත්ද, යම් සේ කැමති කැමති සියළු සම්පත් දෙන මනහර මිණිරුවන කසළ ගොඩෙක්හි හෝ පස්කඳුවල හෝ නූපදිත්ද, වෙඵුල්ල කඳුවැටිය තුළ ම උපදිත් ද, යම්සේ තිමිර පිංගල මත්ස්‍ය රාජයෝ කුඩා පොකුණුවල නූපදිත් ද,

අසූහාර දහසක් යොදුන් ගැඹුරු වූ මහ මුහුදෙහිම උපදින්ද, දෙඅඩ සියයක් යොදුන් ගුරුළු රජෙක් ගම්දොර එරඬු වනයක නො වෙසේද, මහ සමුදුරට පිවිස හිඟුල් වනයේ ම වෙසේද, යම් සේ ධ්‍රතරාෂ්ට්‍ර නම් ස්වර්ණ හංසයා ගම්දොර කුඩා වළෙක නො වෙසේද, යම් සේ දිවයින් සතරකට අධිපති වූ සක්විති රජ පහත් කුලයෙක නූපදින්නේ ද, අසම්හින්න වූ ක්‍ෂත්‍රිය කුලයෙහි ම උපදින්නේ ද, එසේම සතර ශ්‍රමණයන් අතුරෙන් එක් ශ්‍රමණයෙකු හෝ අන්‍ය තීර්ථායතනයක නො උපදී. එහෙයින් වදාළහ. **ඉධෙව භික්ඛවෙ සමණෝ -පෙ- සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ ති'**

සම්මා සීහනාදං නදථ යනු මෙහි සම්මා හේතුවෙන්, නයෙන්, කාරණායෙන්, සීහනාදං ශ්‍රේෂ්ඨ නාදය, බිය නැති නාදය, අනිකෙකුට අසමාන වූ නාදය, මේ සතරවැදෑරුම් ශ්‍රමණයන් මේ ශාසනයේ ම ඇති බැවින් මෙම ශ්‍රේෂ්ඨ නාදය, උත්තම නාදය නම් වෙයි. මේ ශ්‍රමණයෝ මෙහිම ඇත්තාහු යයි කියන්නහුට අනුන් කෙරෙන් භයක් හෝ සැකයක් හෝ නැතැයි අභීත නම් වේ. මේ සතර වැදෑරුම් ශ්‍රමණයන් මෙහිම ඇති බැවින් මේ නාදය ශ්‍රේෂ්ඨ නාදය උත්තම නාදය නම් වෙයි. මේ ශ්‍රමණයෝ මෙහි ම ඇත්තේ යයි කියන්නකුට අනිකෙකු කෙරෙන් භයක් හෝ සැකයක් නැතැයි 'අභීතනාද' නම් වේ. අපගේ ශාසනයෙහි මේ ශ්‍රමණයෝ ඇත්තාහුයි පූරණාදීන් අතුරෙහි කෙනෙකුවත් නැගිට කියන්නට අසමත් හෙයින් මේ නාදය 'අප්පටිනාද' නම් වේ. සීහනාද, ශ්‍රේෂ්ඨ නාද, අභීතනාද, අප්පටිනාද යනු එහෙයින් කියන ලදී.

යානං ඛො පනෙතං විජ්ජති යනු මේ කාරණය වනාහි විද්‍යමාන වේ. මෙහිදු තීර්ථය දතයුතුයි. **යං අඤ්ඤතිත්ථියානි.** යම් කරුණකින් අන්‍ය තීර්ථකයෝ මෙහි ද තීර්ථයන් වශයෙන් දතයුතු ය. තීර්ථකයෝ දතයුත්තාහ. තීර්ථ ශ්‍රාවකයෝ දතයුත්තාහ. තීර්ථ නම්. දෙසැට මිසදිටු ය. යම්හෙයකින් මේ දෙසැට දෘෂ්ටියෙහි සත්ත්වයෝ තරණය කෙරෙත්ද, ඉල්පෙත් ද, ගිලීම නැගීම කෙරෙත් ද, එහෙයින් තීර්ථ යයි කියනු ලැබේ. ඒ දෘෂ්ටීන් උපදවන්නෝ 'තීර්ථකර' නම් වේ. ඔවුන්ගේ ලබ්ධිය ගෙන පැවිදි වූවාහූ 'තීර්ථකයෝ' නම් වෙති. ඔවුන්ගේ ප්‍රත්‍යදායකයෝ තීර්ථක ශ්‍රාවකයෝ යයි දතයුතුය. **පබ්බාජක** යනු ගිහි බැඳුම් හැර පැවිදි වූවාහුය. **අසසාසො** අස්වැසීම, පිහිටීම, උපකාර වීම, **මලං** යනු ශක්තියයි. **යෙන තුම්හෙ** යම්කිසි විධියකින් තෙපි අස්වැසීමකින් හෝ බලයකින් මෙසේ කියවුද?

අත්ථි ඛො නො ආවුසො තෙන භගවතා **ජානතා පස්සතා අරහතා සම්මා සම්බුද්ධෙ න** යන මෙහි කෙටි අදහස (කියනු ලැබේ) යම් ඒ භාග්‍යවතුන් වහන්සේ කෙනෙක් සමතිස් පෙරුම් පුරා සියළු කෙළෙසුන් බිඳ අර්හත් වූ සම්මා සම්බෝධිය අවබෝධ කළ සේක් ද, **තෙන භගවතා** ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ ඒ සත්ත්වයන් ගේ සිත්වල පවත්නා තත්ත්වයන් **ජානතා** දන්නහු විසින්, අත්තලෙහි තැබූ නෙල්ලි ගෙඩියක් මෙන් සියළු දතයුතු ධර්මයන් **පස්සතා** දක්නහු විසින් පූර්වේනිවාසාදියෙන් දන්නහු විසින් දිවැසින් දක්නහු විසින්, ත්‍රිවිද්‍යාවන්ගෙන් හා ෂඩ් අභිඥාවන්ගෙන් දන්නහු විසින් **ජානතා** සියළු තැන්හී අප්‍රතිහත වූ සමතැසින්, **පස්සතා** - සියළු ධර්මයන් දැනීමෙහි ප්‍රඥාවෙන්, **ජානතා** සියළු සත්ත්වයන්ගේ ඇස් විෂය ඉක්මවන තිරොකුඩ්ඩාදියට පැමිණියා වූ හෝ රූපයන් පවා ඉතා නිර්මල වූ පියවි මසැසින් දක්නා වූ, අක්වැඩ සිදුකරන සමාධියට පදස්ථාන වූ පටිවේධ ප්‍රඥාවෙන් **ජානතා** දන්නා වූ අනුන්ගේ යහපත සඳහා සිදුකරන සමාධියට පදස්ථාන වූ පටිවේධ ප්‍රඥාවෙන් **ජානතා** දන්නා වූ අනුන්ගේ යහපත සඳහා සිදුකරන (පරවැඩ) කරුණාවට පදට්ඨාන වූ, දේශනා ප්‍රඥාවෙන් **පස්සතා** දක්නා වූ, කෙලෙස් සතුරන් නැසූ හෙයින්, ප්‍රත්‍යාදියට සුදුසු වූ හෙයින් අර්හත් වූ, **අරහතා** - මනාකොට තෙමේම අවබෝධ කළ හෙයින් සම්‍යක් සම්බුද්ධ වූවහු විසිනැයි **සම්මා සම්බුද්ධෙන**,

අන්තරායික ධර්මයන් හෝ, නෛර්යානික ධර්මයන්, **පස්සතා** දක්නා වූ, සියළු කෙලෙස් දුරුකළ බැවින් **අරහතා**, සියළු ධර්මයන් අවබෝධ කරගැනීම නිසා **සම්මා සම්බුද්ධෙන** මෙසේ චතු වෛශාරද්‍ය වශයෙන් සතර ආකාරයෙන් ස්තුති කරන ලද (බුදුන් වහන්සේ විසින්) සතර ධර්ම කෙනෙක් ප්‍රකාශ කරන ලද්දාහුය. **චතතාරො ධම්මා අක්ඛාතා යෙ මයං අතතනි සම්පස්සමානා එවං වදෙම** යම් සතර ධර්ම කෙනෙක් අපි මනාකොට දකින්නමෝ මෙසේ කියමු. රජ රජමහඇමති ආදීන්ගේ මැදිහත්වීම දක්නමෝ නො කියමුද, කාය බලය දක්නමෝ නො කියමුද?

සත්ථරි පසාදො 'ඉතිපි සො භගවා' යනාදී වශයෙන් බුදුගුණ සිහිකරන්නවුන්ට උපන් පැහැදීම වේ. **ධම්මපසාදො** යනු 'සවාක්ඛාතො භගවතා ධම්මො' යනාදී වශයෙන් දහම් ගුණ සිහිකරනවුන්ට උපන් පැහැදීම වේ. **සීලෙසු පරිපූරිකාරිතා** යනු ආර්යකාන්ත සීලයන් සම්පූර්ණ කරන බවය. ආර්යයන්ට රුචි වූ ශීලය නම් පන්සිල්ය. අන්‍ය භවයකට

ගියා වූ ද ආර්ය ශ්‍රාවක තෙම තමන්ගේ ආර්ය ශ්‍රාවක භාවය නො දන්නේ නමුදු ඒ ශීලය නො ඉක්මවයි. යම්කිසිවෙක් මේ සියළු සක්විති රජය පිළිගෙන කුඩා මැස්සකු මරන්නයැයි ඔහුට කියන්නේ නම්, එහෙත් ඔහු එය නො කරන්නේ ය. මෙසේ ආර්යයන්ට ශීලය කාන්තයහ. ප්‍රියයහ. මනාපයහ. සීලෙසු පරිපූරිකාරිතානි යනු ඒ ශීලයන් සඳහා කියන ලදී.

සහ ධම්මිකා ඛොපන යනු භික්ෂු, භික්ෂුණී, ශික්ෂමාන සාමණේර, සාමණේරී, උපාසක, උපාසිකා යන සත්දෙන වේ. මොවුහු සමාන ධර්මයෙහි හැසිරෙන්නාහු වෙති. භික්ෂුව භික්ෂූන් සමග සමාන ධර්මයෙහි හැසිරෙයි. සමාන ශික්ෂා ඇති බැවිනි. භික්ෂුණිය භික්ෂුණීන් සමග -පෙ- උපාසිකාවන් සමග සමාන ධර්මයෙහි හැසිරේ. සෝවාන් පුද්ගලයා සෝවාන් පුද්ගලයන් සමග ද, සකෘදාගාමී පුද්ගලයා සකෘදාගාමී පුද්ගලයන් සමග ද, අනාගාමී පුද්ගලයා අනාගාමීන් සමග ද, සමාන ධර්මයෙහි හැසිරෙති. එහෙයින් මේ සියල්ලෝ ම සහධාර්මිකයෝ නම් වෙති. තව ද මෙහි ආර්ය ශ්‍රාවකයෝ ම අදහස් කරන ලදහ. යම්හෙයකින් භවාන්තරයෙහි පවා ඔවුන්ගේ මාර්ග දර්ශනයෙහි විවාදයෙක් නැත. එහෙයින් ඔව්හු ඒකාන්තයෙන් සමාන ධර්මයෙහි හැසිරෙන බැවිනි. සහධාර්මිකයෝමය. මෙයින් 'සුපරිපනෙනා භගවතො සාවකසංඝො' යනාදී ක්‍රමයෙන් සංඝයා සිහිකරන්නවුනට උපන් පැහැදීම කිවයුතුය. මෙතෙකින් සෝවාන් වූවහුගේ සතර අංගයෝ (කියන ලද්දේ වේ.) පවසන ලද්දාහු වෙති.

ඉමෙ ඛො නො ආවුසො යනු ඇවැත්නි, අපි යම් ධර්ම කෙනෙක් තමන් කෙරෙහි දක්නමෝ මෙසේ කියමු. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සතර ධර්මයෝ අප ගේ අස්වැසීම ද බලය ද වෙතියි වදාරන ලදී. යො අමහාකං සත්ථා යන මෙයින් පූර්ණ කාශ්‍යප ආදී ශාස්තෘවරුන් සදෙන දක්වත්. යම් සේ වනාහි මෙම සසුන්හි ආචාර්ය උපාධ්‍යායයන් කෙරෙහි අපගේ ආචාර්යය අපගේ උපාධ්‍යාය යන ගේහ නිශ්‍රිත ප්‍රේමයක් වේද? මෙබඳු වූ ප්‍රේමය සඳහා 'සත්ථරි පසාදො' යයි කියත්. ස්ථවිරයෝ මෙසේ කීහ. යම්සේ ශාස්තෘවරු වනාහි එකෙකුට හෝ දෙදෙනෙකුට නොවේද, දෙවියන් සහිත වූ ලෝවැස්සන් සඳහා එකම ශාස්තෘහු වේද, එහෙයින් තීර්ථකයෝ 'අමහාකං සත්ථා' යන එකම පදයකින් ශාස්තෘහු වෙන්කොට මේ පදයෙන්ම වදාරන ලද්දාහු, පරදවන ලද්දාහුය.

ධම්මෙ පසාදො යනු මේ වනාහි දැනට අපගේ ශාසනයෙහි අපගේ

දීඝනිකාය ය, අපගේ මජ්ඣිම නිකාය ය, යනුවෙන් මමත්වයක් කෙරේ ද, එපරිද්දෙන් තම තමන්ගේ පර්යාප්ති ධර්මය පිළිබඳව ගෘහාශ්‍රිත ප්‍රේමය සඳහා කියත්. **සීලෙසු අජ සීල, ගෝ සීල, බැටළු සීල, සුනඛ සීල** ආදියෙහි, **ඉධ නො ආවුසො** යන මෙහි 'ඉධ' යනු ප්‍රසාදය සඳහා කියත්. **කො අධිපපායො** අධික ප්‍රයෝගය කවරේද? **යදිදං** තොපගේ හා අපගේ විවිධ කාරණා කියන්නෙහි ද? ඒ කිනම්ද? තොපගේ සතර තැනෙක්හි ප්‍රසාදය වෙයි. අපගේ ද සතර තැනෙක්හි ප්‍රසාදය වෙයි. මේ ප්‍රසාදයෙහි තෙපි ද අපි ද දෙකට බෙදුනු ස්වර්ණයක් සෙයින් එක සමාන වූවාහු නොවමෝද? වචනයෙන් සමධුරව සිටියාහුද, එබැවින් ඒ සමධුර බව (මිහිරි) බිඳින්නා වූ භාග්‍යවතුන් වහන්සේ **එවං වාදිනො** මෙසේ වදාළ සේක.

එහි එකා නිටඨා ඒ ප්‍රසාදයාගේ කෙළවර වූ යම් අවසානයක් වේද කිම ඒ නිෂ්ඨාව එකක්ද? නොහොත් වෙන්වූවක්දැයි මෙසේ විචාරවූ කියයි. යම් හෙයකින් ඒ ඒ ලබ්ධියෙහි නිෂ්ඨාවක් නො පනවන්නෙක් නැත් ද බ්‍රාහ්මණයන්ගේ විශ්වාසයෙහි බඹලොව නිෂ්ඨාවය. තවුසන්ගේ ආහරස්සරය ය. පරිව්‍රාජකයන්ගේ සුභකිණ්හකය ය. ආජීවකයන්ගේ අනන්තමානස යයි. මෙසේ සලකන ලද අසංඥී භවයයි. මේ ශාසනයේ අර්හත්වය නිෂ්ඨාවයි. මොව්හූ සියල්ලෝම රහත්බව නිෂ්ඨාවයයි කියත් ද, දෘෂ්ටි වශයෙන් බඹලොවම පනවත්ද, එහෙයින් තම තමන්ගේ ලබ්ධි වශයෙන් එකම නිෂ්ඨාවක් පනවත්. එය දක්වන්නට බුදුහු **සම්මා** **ව්‍යාකරමානො** යනාදිය වදාළහ.

දැන් භික්ෂූන්ගේ එක නිෂ්ඨාවකි. තීර්ථකයන්ගේ එක නිෂ්ඨාවකි. එක නිෂ්ඨාවයයි යුක්ති ප්‍රකාශ කරන්නවුන් දෙදෙනෙකු සිටි කල්හි භාග්‍යවතුන් වහන්සේ කරුණු දැක්වීම් වත දක්වන සේක් **සා පනාවුසො නිටඨා සරාගසස උදාහු වීතරාගසස** ආදිය වදාළහ. එහි යම්හෙයකින් රාග රක්තාදීන්ට නිෂ්ඨාවක් නම් නැත්ද? එසේ නැත්නම් බලු සිවල් ආදීන්ට ද එසේම වන්නී යයි මේ දෝෂය දක්නා වූ තීර්ථයන්ගේ 'වීතරාගසස ආවුසො නිටඨා' යනාදී නිෂ්ඨාව විසඳීම දක්වන ලදී. එහි **විදසසුනො** පණ්ඩිතයාගේ, **අනුරුද්ධ පටිවිරුද්ධසස** රාගයෙන් අනුරුද්ධ වූවහුගේ ක්‍රෝධයෙන් ප්‍රතිවිරුද්ධ වූවහුගේ, **පපඤ්චරාමසස පපඤ්ච රතිනො** යන මෙහි සිත්අලවා වෙසෙත්නුයි ආරාම නම් වෙයි. ප්‍රපඤ්චය ආරාම වූයේ මොහුට නුයි **පපඤ්චාරාම** නම් වේ. ප්‍රපඤ්චයෙහි රතිය මොහුට නුයි **පපඤ්චරති** නම් වේ. පපඤ්ච යනු ද මත්ත ප්‍රමත්තාකාරයෙන්

පවතින්නා වූ කෘෂ්ණා මාන දෘෂ්ටීන්ට ම නමකි. මෙහි වනාහි තෘෂ්ණා දෘෂ්ටිහුම අදහස් කර ඇත.

සරාගසස යනාදී ස්ථාන පසෙහි දී එකම ක්ලේශයක් ආයේය. ඔහුගේ ආකාර වශයෙන් නානත්වය දතයුතුයි. **සරාගසස** යයි කියන තන්හි පංචකාමගුණික රාග වශයෙන් ගන්නා ලදී. **ස තණහසසා** භවතණ්හා වශයෙන් ද, **සළපාදානසස** යී ග්‍රහණ වශයෙන් ද **අනුරුදධ පටිවිරුදධසස** යී යුගල වශයෙන් ද **පපඤචරාමසස** ප්‍රපඤචයා ගේ උත්පත්තිය දැක්වීම් වශයෙන් ද **සරාගසස** යන මෙහි අකුසල මූල වශයෙන් ද ගන්නා ලදී. **සතණහසස** යන මෙහි තණහා ප්‍රත්‍යයෙන් දැඩිව අල්ලා ගැනීම දැක්වීම් වශයෙන් ද (ගන්නා ලදී) සෙස්ස පෙර කියන ලද පරිදිම ය. ස්ථවිරයන් වහන්සේ කීහු. කුමක් හෙයින් මෙසේ විශේෂයෙන් කීයේද? මේ එකම ලෝභය රැඳීම් වශයෙන් 'රාග' යයි කියන ලදී. ආශා කිරීම් වශයෙන් 'තණහා' යයි ද, ගැණීම් අර්ථයෙන් උපාදාන යයි ද, උභය වශයෙන් 'අනුලෝම පටිවිරෝධ' යයි ද, ප්‍රපඤචයන්ගේ ඉපදීම් අර්ථයෙන් 'පපඤච' යයි ද වදාරන ලදී.

දැන් මෙම ක්ලේශයන්ට මුල් වූ දෘෂ්ටි වාදය දක්වන්නේ, දෙවමා භිකඛවෙ දිටඨියො යනාදිය කීහ. එහි භවදිටඨි යනු ශාස්වත දෘෂ්ටියයි. විභව දිටඨි යනු උච්ඡේද දෘෂ්ටියයි. භවදිටඨි අලලීනා තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ශාස්වත දෘෂ්ටිය වැළඳ ගත්තාහු, උපගතා තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ම පැමිණියාහු, අජෙඣඣාසිනා තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ම ඇතුළත් වූවාහු විභව දිටඨියා තෙ පටිවිශුදධා ඔවුහු සියල්ලෝ ම උච්ඡේද වාදීන් සමග තෙපි අඳ බාලයෝ ය. නො දන්නහුය. මේ ලොව ශාස්වතය. මේ ලොව නො නැසෙන්නේ ය, යයි ප්‍රතිවිරුද්ධ වූවාහු නිතර රණ්ඩු දබර විවාදයෙහි ඇලුනාහුව වසත්. දෙවන වාරයේ ද මේ න්‍යාය මයි.

සමුදයඤව යනාදියෙහි දෘෂ්ටීන්ගේ ඉපදීම් හටගැනීම් දෙකකි. ඛණික සමුදය, පචචය සමුදය ද (කියායි) ඛණික සමුදය නම් දෘෂ්ටීන්ගේ ඉපදීමයි. පචචය සමුදය නම් අටදෙනෙක් වෙති. ඒ කවරහු ද? ස්කන්ධයෝ ද දෘෂ්ටි ස්ථානයකි. අවිද්‍යාව ද, ස්පර්ශය ද, සංඥාව ද, විතර්කය ද අයෝනිසෝ මනසිකාරය ද, පාප මිත්‍රයා ද, පරතෝසෝසය ද දෘෂ්ටි ස්ථානයකි. දෘෂ්ටීන්ගේ ඉපදීමට සමුත්ථානාර්ථයෙන් ස්කන්ධයෝ හේතුවෙයි. ස්කන්ධයෝ ප්‍රත්‍ය වේ. මෙසේ ස්කන්ධයෝ ද දෘෂ්ටි ස්ථානයක්

වේ. අවිද්‍යාව, ස්පර්ශය, සංඥාව, විතර්කය, අයෝනිසෝ මනසිකාරය, පාපමිත්‍රය, පරතොඝෝෂය සමුට්ඨානාර්ථයෙන් දෘෂ්ටීන්ගේ ඉපදීමට හේතු වේ. පරතෝඝෝෂය ප්‍රත්‍යය වේ. දෘෂ්ටීන්ගේ අත්ථංගමය ද දෙපරිදිය. ක්ෂණික අස්තංගමය, ප්‍රත්‍ය අස්තංගමය යනුවෙනි. ක්ෂණික අස්තංගමය නම් (ක්ෂණයෙහි) ක්ෂය වීමය. නැසීමය, බිඳීමය, හාත්පසින් බිඳීමය, අනිත්‍ය බවය, අතුරුදහන් වීමය. ප්‍රත්‍ය අස්තංගමය නම්, සෝවාන් මාර්ගය ය. සෝවාන් මාර්ගය දෘෂ්ටීන්ගේ සහමුලින් නැසීම යයි කියන ලදී. **අසසාදං** - දෘෂ්ටි මූලික ආනිසංසය යමක් සඳහා කියන ලද ද? ශාස්තෘ තෙමේ යම් දෘෂ්ටියක් ඇත්තේ වේද ශ්‍රාවකයෝ ඒ දෘෂ්ටියම ඇත්තාහු වෙති. ශ්‍රාවකයෝ යම් දෘෂ්ටියක් ඇති ශාස්තෘවරයෙක් සත්කාර කෙරෙත් ද, ගරු කෙරෙත් ද, බුහුමන් කෙරෙත් ද, පූජා කෙරෙත් ද, ඒ හේතුවෙන් සිවුරු, පිණ්ඩපාත, සෙනසුන්, ගිලන්පස, බෙහෙත් පිරිකර ලබන්නේ ය. මේ වූ කලී දෘෂ්ටිය පිළිබඳ ආනිසංස යි. **ආදීනවං** - දෘෂ්ටි ග්‍රහණය මුල්කොට ඇති උපද්‍රවය, වග්ගුලි වෘතය, උක්කුටික වීර්යය, කණ්ටකාධාරයෙහි හිඳීම ආදියයි. පංචතාපයෙන් තැවීම ගල්හතට පැමිණීම, කෙස් රවුල් ඉදිරීම, අප්‍රාණක ධ්‍යානය යනාදී වශයෙන් දතයුතුයි. **නිසසරණං** දෘෂ්ටීන්ගේ නිස්සරණය නම් නිවණයි. **යථාභූතං නප්පජානං** යමෙක් මේ සියල්ල යථා ස්වරූපයෙන් නො දනිත්ද? **න පරිමුච්චනති දුක්ඛසමා** සියළු වෘත්ත දුක්ඛයෙන් නො මිදෙත්. මෙයින් මොවුන්ගේ නිෂ්ඨාවක් නම් නැත. **පරිමුච්චනති දුක්ඛසමා** සියළු සසර දුකින් මිදෙත්. මෙයින් ඔවුන්ගේ නිෂ්ඨාව ඇතැයි යුක්ති කියන්නවුන් දෙදෙනාගේ යුක්තිය සිඳිමින් මෙන් ශාසනයෙහිම නිෂ්ඨාව ඇතැයි පිහිටුවයි.

ඉදින් දෘෂ්ටීන්ගේ බැඳීම දක්වන්නේ **චතාරිමානි භික්ඛවෙ උපාදානානි** ආදිය කීහ. ඔවුන්ගේ විස්තර කථාව විශුද්ධි මාර්ගයේ කියන ලදී. **සංඛුපාදාන පරිඤ්ඤාවාදා පටිජානානති**. අපි සියළු උපාදානයන්ගේ ප්‍රහාණය ඉක්මවීම කියමුයි මෙසේ ප්‍රතිඥා කරන්නෝ, **න සම්මා සබ්බුපාදාන පරිඤ්ඤනති** සියළු උපාදානයන්ගේ ඉක්මවීම නො පනවත්. කිසිවෙක් කාම උපාදානයාගේ (ප්‍රහාණය) පනවති. කිසිවෙක් දෘෂ්ටි උපාදානයාගේ ද කිසිවෙක් ශීල ව්‍රත උපාදානයාගේ ද, (ප්‍රහාණය පනවත්) අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය පනවන්නෙක් නැත. එම භේදය දක්වන්නේ **කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙනති** ආදිය කීහ. එහි සියල්ලෝම කාම උපාදානයන්ගේ ප්‍රහාණය පනවති. සයානූවක් පාෂාණ්ඩයෝ ද කාමයෝ වනාහි පැවිද්දන් විසින් සේවනය නොකළ

යුතුයයි පනවති. වස්තු ප්‍රතිසේවන කාමය කැපයයි නො පනවති. අකැප වූවක්ම කොට පනවති. යමෙක් වනාහි සේවනය කෙරෙත් ද ඔවුහු හොර රහසින් ම සේවනය කරති. එහෙයින් කියන ලදී. **කාමූපාදානසස පරිඤ්ඤං පඤ්ඤාපෙනති** යනු දෙන කෙනෙක් නැත යනාදිය ගෙන හැසිරෙත් ද සීලයෙන් පිරිසිදු බව, ව්‍රතයෙන් පිරිසිදු බව, භාවනාවෙන් පිරිසිදු බව වේයයි ගනිත්ද, ආත්මයයි දැඩිකොට ගැනීම නොහරිත්ද? එහෙයින් **න දිට්ඨූපදානසස න සීලබබතූ පාදානසස, න අතතවාදූපාදානසස පරිඤ්ඤං පඤ්ඤාපෙනති** දෘෂ්ටි උපාදානයාගේත්, සීල ව්‍රත උපාදානයාගේත්, ආත්මවාද උපාදානයාගේත් ඉක්මවීම නො පනවත්. **තං කිසස හෙතූ** එයට හේතු කවරේද? එසේ නොපැනවීම කවර හේතුවකින් කවර කාරණයකින් ද? **ඉමානි භි තෙ භොනෙතා** යනු මේ කරුණු තුන පිළිබඳව නිසි පැහැදිලි කිරීමක් ඔවුන් නො දක්නා බැවිනි යන අර්ථයයි. මෙහි යමෙක් වනාහි ප්‍රහාණයන් දෙදෙනා ගේ පැනවීමට කරුණු වූ දෘෂ්ටිය ද සීල ව්‍රතය ද, ප්‍රහාණය කළ යුතු යයි යථා ස්වභාව වශයෙන් දනිත් ද, ඔවුන් සඳහා මත්තෙහි දෙවාරය කියන ලදී. එහි යමෙක් දුන් දෙයෙහි විපාක ඇත ආදිය ගනිත්. **තෙ දිට්ඨූපාදානසස පරිඤ්ඤං පඤ්ඤාපෙනති** දිටඨී උපාදානයාගේ පැනවීම පනවති. යමෙක් සීලයෙන් පිරිසිදු වීමක් නැත. ව්‍රතයෙන් පිරිසිදු වීමක් නැත. භාවනාවෙන් පිරිසිදු වීමක් නැතැයි ගනීද? ඔවුහු සීලව්‍රත උපාදානයාගේ ඉක්මවීම පනවති. එසේ වුවද අත්තවාද උපාදානයාගේ ඉක්මවීම පනවන්නට එක් අයෙකුද නොහැකි වෙයි. (යම් හෙයකින්) අෂ්ට සමාපත්ති ලාභී වූයේ ද සඳ හිරු දෙදෙන අතින් පිරිමැද හැසිරෙන්නාහු වුවද තීර්ථකයෝ ප්‍රහාණයන් තිදෙනෙක් පනවත් ද, අත්තවාද උපාදානය මුදාහරින්නට නොහැකි වෙත් ද, එහෙයින් නැවත නැවත සංසාර වෘත්තයෙහි ම වැටෙත්.

මොව්හූ පොළවට පිළිකුල් කරන සාවෙකු මෙනි. එය වූ කලී අර්ථය ප්‍රකාශ කරන උපමාවෙකි. පෘථුවිය සාවෙකුට මෙසේ කීවේල, එම්බා සාවානෙනි, සාවා කීය. මේ කවරෙක් ද, මගේම මතුපිට සියළු ඉරියව් කරන්නේ මළ මූත්‍ර දමන්නේ කුමක් හෙයින් මා නොහඳුනන්නෙහි ද? තී විසින් මම මනාකොට දක්නා ලදුයෙමි. මා විසින් හැසුරුණු තැන ඇඟිලි අගින් ස්පර්ශ කළ තැනක් මෙන් වෙයි. මුදාහළ මූත්‍ර ප්‍රමාණය අල්මාත්‍රය. මලය ඉඟිනි ඇටයක් පමණ ය. ඇත් අස් ආදීන් විසින් හැසිරුණු තැන අති විශාලය. ඔවුන්ගේ මුත්‍ර ද කළයක් පමණය. වසුරු ද කුඩයක් පමණ වේ. තීගෙන් මට කමක් වැඩක් නැතැයි උඩ පැන වෙනත්

තැනක වැටුණෝය. එවිට පෘථුවිය ඔහුට මෙසේ කීය. අපොයි දුර ගිය තරම. මගේ මතුපිටම වැටුනේ නොවේද? හෙතෙම නැවත එසේ පරිභාස කරන්නේ උඩ පැන වෙනත් තැනක වැටුනේය. මෙසේ අවුරුදු දාහක් උඩපැන යළි බිමටම වැටෙන්නේ පොළවෙන් මිදෙන්නට නො හැකි වන්නේය. මෙසේ ම තීර්ථකයෝ ද සියළු උපාදානයන්ගේ ඉක්මවීම පනවන්නාහුද කාම උපාදාන ආදී වූ උපාදාන තුනම ඉක්මවීම පනවති. එසේ වුවත් අත්තවාද උපාදානය අත්හරින්නට නොහැකිව නැවත නැවත සංසාර වෘත්තයෙහිම වැටෙති. මෙසේ තීර්ථකයෝ යම් ආත්මවාද උපාදානයක් ඉක්මවන්නට නො හැකි වෙත් ද, නැවත නැවත සංසාර වෘත්තයේම වැටෙත්.

මෙසේ තීර්ථකයෝ යම් ආත්මවාද උපාදානයක් ඉක්මවන්නට නො හැකිවේද, ඔවුනගේ වශයෙන් දෘෂ්ටි බිඳීමේ වාරය කියා, දැන් ප්‍රසාදචෙෂ්දවාරය දක්වන්නේ එවරූපෙ ඛො ධම්මවිනයෙ ආදිය කීහ. එහි ධම්ම විනයෙ ධර්මයෙහි හා විනයෙහි ද දෙපදයෙන් ම අනෛර්යාණික ශාසනය දක්වයි. **යො සත්ථරි පසාදො සො න සමගගතො** අනෛර්යාණික ශාසනයෙහි ශාස්තෘවරයා කළුරියකොට සිංහයෙක් හෝ ව්‍යාඝ්‍රයෙක් හෝ දිවියෙක් හෝ වලසෙක් හෝ තිරළුවෙක් හෝ වෙයි. ශ්‍රාවකයෝ වනාහි මෘගයෙක් හෝ උෟරෙක් හෝ වෙත්. හෙතෙම මොවුහූ පෙර මාගේ උපස්ථායකයෝ ය. ප්‍රත්‍ය දායකයෝ යයි ශාන්තියක් හෝ මෛත්‍රියක් හෝ දයාවක් හෝ නොකොට ඔවුන් මතුයෙහි පැන ලේ ද බොති. සන වූ මස් කයි. (නැවත) ශාස්තෘවරයා බළලෙක් වෙයි. ශ්‍රාවකයෝ කුකුළෝ හෝ මීයෝ වෙති. එකල්හි පළමු කී පරිද්දෙන් ම අනුකම්පාවක් නොකොට මස් කයි. ශාස්තෘවරයා නිරය පාලකයෙක් වෙයි. ශ්‍රාවකයෝ නිරිසත්තු වෙති. හෙතෙම මොවුන් පෙර මගේ ප්‍රත්‍යදායකයෝ යයි අනුකම්පාවක් නොකොට විවිධ දුක් හිරිහැර පමුණුවයි. ගිනි ඇවිලගත් රථයේ යොදයි. අඟුරු කන්දටත් නංවයි. ලොහො කුඹුයෙහිත් දමයි. නොයෙක් දුක් කරදරයන්හි යොදවයි. යළි ශ්‍රාවකයෝ කළුරියකොට සිංහාදීහු වෙති. ශාස්තෘවරයා මෘගාදීන් අතුරෙන් එකෙක් වෙයි. ඔව්හූ අපි මොහු පෙර සිව්පසයෙන් උපස්ථාන කළෙමු. මොහු අපගේ ශාස්තෘ යයි ඔහු කෙරෙහි ඉවසීමක්, මෛත්‍රියක්, කරුණාවක් නොකොට පළමු කී ආකාරයෙන්ම විවිධ ව්‍යසනයන්ට පමුණුවත්. මෙසේ අනෛර්යාණික සාසනයෙහි යම් ශාස්තෘවරයෙක් කෙරෙහි පැහැදීමක් වේද, ඒ ප්‍රසාදය

යහපතක් සඳහාම නො වන්නේය. යම්කිසි කාලයක් ඉකුත්වැ හෝ පසුව නැසෙන්නේමය.

යො ධම්මෙ පසාදො අනෙර්යාණික ශාසනයෙහි ධර්මයෙහි ප්‍රසාදය නම්, ඉගෙන ගත්, පුහුණු කළ, කියන ලද, දරණ ලද ද ධර්මයෙහි ප්‍රසාදය වේ. එසේ වුවද මෙහි සසරින් මිදීමක් නැත. එහෙයින් මෙහි යම් පැහැදීමක් ඇද්ද එය නැවත නැවත සසරම ගැඹුරු කෙරේනුයි මනාකොට නො පැමිණියේ අස්වාභාවික බවටම පැමිණියේ යයි කියයි. **යා සීලෙසු පරිපූරිකාරිතා** අනෙර්යාණික ශාසනයෙහි අජ (එළු) සීලාදී වශයෙන් පිළිවෙත් පුරණ බවක් වේද, ඒ පිළිවෙත් සසරින් මිදීමට භවයෙන් නික්ම යාමට පිටිවහලක් උපකාරයක් නොවේද, තිරිසන් යෝනියට පමුණුවාද? නිරයට පමුණුවාද? එහෙයින් **න සමගහා අකඛායති** නිසි ලෙස නොපැමිණියේ යයි කියයි.

යා සහධම්මිකෙසු යම් අනෙර්යාණික ශාසනයෙක්හි සහදැමියෝ වෙත් ද? ඔවුන් අතරින් යම්කිසිවෙක් කළුරියකොට සිංහාදීහූ වූවහු මේ අපගේ සහධර්මිකයෝ වූවාහු යැයි මුව ආදීන් කෙරෙහි අධිවාසනය නොකොට පෙර කී ආකාරයෙන් ම මහත් දුක් උපදවති. එහෙයින් මෙහි සහදැමියන් කෙරෙහි ප්‍රියමනාප බවටද නොපැමිණියාහු යයි කියයි.

යා සහධම්මිකෙසු අනෙර්යාණික ශාසනයෙහි යම් සහදැමියෝ වෙත්ද, ඔවුන් අතරින් යම්කෙනෙක් යම් හෙයකින් කළුරියකොට, සිංහාදීහූ වෙත්ද, ඇතැම් කෙනෙක් මුව ආදීහු වෙත්ද, එයින් සිංහාදි වූවාහු මොව්හු අපේ සහදැමියෝ වූවාහු යයි මුවාදීන් කෙරෙහි අනුකම්පා නොකොට පළමු කී සෙයින්ම ඔවුන්ට මහත් වූ දුක් උපදවද්ද, එහෙයින් මෙහි සහදැමියන් කෙරෙහි ප්‍රියමනාප බවට නොපැමිණියාහු යයි කියයි.

මේ සියළු කාරණාවන්ගේ භේදය (නොගැලපීම) එක්තැන්කොට දක්වන භාග්‍යවතුන් වහන්සේ **තං කිසස හෙතු? එවං හෙතං භිකඛවෙ හොති** ආදිය වදාළහ. 'එවං හෙතං භිකඛවෙ හොති යං මයා වුත්තං යො සත්ථරි පසාදො' මහණෙනි, මා විසින් යමක් කියන ලද ද? මේ කාරණය මෙසේ වෙයි. කවර හෙයින් ද යත්, යම්හෙයකින් ඒ ප්‍රසාදාදීහූ දුරනුබෝධ වූ ධර්ම විනයෙහි වරදවා කියන ලද, සම්බුද්ධ නොවූවකු විසින් අවබෝධ කරන ලද ශාසනයක වීද, එහෙයිනි. මෙහි **යථාතං** යනු හේතුව දැක්වීමේ

නිපාතයි. එහි **දුරකඛාතො** වරදවා කියන ලද, වරදවා කියන ලද හෙයින්ම දුරවබෝධ වූ ඒ ධර්මය යම්හෙයකින් මාර්ගඵල පිණිස නොපමුණුවාද එහෙයිනි. **අනීයාානිකො අනෙර්යාණිකය.** රාගාදීන්ගේ සංසිඳවීම පිණිස නොපවත්නා හෙයින් **අනුපසම සංවතතනිකො සම්මා සම්බුද්ධ** වූ සර්වඥ කෙනෙකුන් විසින් අවබෝධ නොකරන ලදනුයි **අසමමා සමබුදධසස වෙදිතො** එහි **අනියාානිකො, අනුපසම සංවතතනිකෙ, අසමමා සමබුදධපප වෙදිතෙ**

මෙතෙකින් භාග්‍යවතුන් වහන්සේ තීර්ථකයන් කෙරෙහි ප්‍රසාදය මෙන් නිරර්ථකයයි දැක්වූහ. එක්තරා කණ සිවලෙක් රාත්‍රියෙහි නගරයට පිවිසියේ සුරාමණ්ඩ කා තෝර කැලෑවෙක්හි වැතිරී නිදන්නේ හිරු උදාවන කල්හි පිබිද, මෙසේ සිතී ය. මේ වේලාවේ යාමට නොහැක. අපගේ සතුරෝ බොහෝය. එක් කපටිකමක් කිරීම වටනේ යයි (සිතා) යන්නා වූ එක් බ්‍රාහ්මණයෙක් දැක වංචාවක් කරන්නෙමි යයි ආර්ය බමුණානනි'යි කීහ. කවරෙක් මා කැඳවන්නේ ද බමුණා සිතීය. මමයි සාමිනි! පළමුකොට මෙහි එනු මැනව. කිම පින්වත! මා ගමින් පිටතට ඇරලව. මම නුඹට කහවනු දෙසියක් දෙමි. හෙතෙම හා ගෙනයන්නෙමියි කකුල්වලින් (එල්ලා) ගත්තේය. කොල! බාල බමුණ, මගේ කහවණු බැහැර (දමා) විසිකොට නැත. කහවණු ඉතා දුර්ලභය. මනාකොට මා ගනුව පින්වත කෙසේ ගනිම්ද? උතුරු සළුපටෙහි ඔතා උරහිසක එල්ලා ගනු මැනව. බමුණා සිවලා කී පරිදි ගෙන දකුණු දොර සමීපයට ගොස් මෙහි තබන්නදැයි විමසීය. මේ කවර නම් තැනක්ද? මේ ප්‍රධාන දොරටුවයි. කොල බාල බමුණ! කිම තොපගේ නෑදෑයෝ ඇතුළු දොරටුවෙහි කහවණු තබත්ද? තව එහාට මා ගෙන යව. ඔහු ද ටික ටික දුර යමින් නැවත නැවත බස්සවමිද බස්සවමිදැයි විචාරා ඒ හිවලා විසින් තර්ජනය කරන ලද්දේ රවටන ලද්දේ බිය රහිත තැනකට ගොස් මෙහි බස්සවයි .කියා බස්වා ගත්තේ ය. සළුව ද ගත්තේය.

කණ සිවලා මෙසේ කීය. මම තොපට කහවණු දෙසියයක් දෙන බව කීමි. මා ළඟ කහවණු බොහෝ ඇත. කහවණු දෙසියයක් පමණක්ම නොවේ. මම කහවණු රැගෙන එමි. ඒ තාක් ඔබ හිරුඑළිය බලමින් සිටිනු මැනවැ, කියා ටික දුරක් ගොස් නැවතී නැවත බ්‍රාහ්මණයාට මෙසේ කීය. ආර්ය බ්‍රාහ්මණය, වෙනත් දෙසක් නො බලනු. සූර්යයා දෙසම බලමින් සිටුව, මෙසේ ද කියා වැටකේ වනයකට පිවිස කැමති පරිද්දෙන් ගියේය.

බමුණා ද හිරු බලමින් සිටින්නේ ම බමුණාගේ නළලින් ද කිසිලිවලින් ද ඩහදිය වැගුරුණාහ. ඉක්බිති ඔහුට රුක් දෙවියෙක් මෙසේ කීය.

සද්දහාසි සිගාලසස - සුරා පීතසස බ්‍රාහමණ
සිප්පයා න සතං නත්ථි - කුතො කංසසතා දුවෙ

'බමුණ, සුරාපානය කළ සිවලාගේ වචනය ඇදහූයෙහි, සිප්පි බෙල්ලන් සියයකුදු නැති (සිවලාගෙන්) කහවණු දෙසීයක් කොයින් ලැබේද?

මෙසේ කණ සිවලා කෙරෙහි වූ ප්‍රසාදය යම් සේ නිරර්ථක වීද, එපරිද්දෙන් තීර්ථකයන් කෙරෙහි (පැහැදීමද නිරර්ථකය) අනෛර්යාණික ශාසනයෙහි පැහැදීම නිරර්ථකභාවය දක්වා, නෛර්යාණික ශාසනයෙහි පැහැදීමේ සාර්ථක බව දැක්වීමට **තථාගතො ච ඛො භික්ඛවෙ** ආදිය කීහ. එහි **කාමුපාදානසස පරිඤ්ඤං පඤ්ඤාපෙති** රහත් මගින් කාම උපාදානයාගේ ප්‍රහාණ පරිඥාව ඉක්මවීම පනවයි. ඉතිරි තුන් උපාදානයන්ගේ ප්‍රහාණය සෝවාන් මගින් පණවයි. එවමෙව ඛො භික්ඛවෙ ධම්මවිනයෙ මහණෙනි, මෙබඳු වූ ධර්මයෙහි ද විනයෙහි ද දෙපදයෙන්ම නෛර්යාණික ශාසනය දක්වයි. **සත්ථරි පසාදො** මෙබඳු වූ ශාසනයෙහි ශාස්තෘන් කෙරෙහි යම් ප්‍රසාදයක් වේද, **සො සම්මගගතො අකඛායති** ඒ ප්‍රසාදය මනකොට පැමිණියේ යයි කියයි. සසර දුක් නිවාරණය පිණිස පවත්නේයි

මෙහි මේ වස්තු වෙත්

භාග්‍යවතුන් වහන්සේ චේදියක පර්වතයෙහි ඉන්දසාල ගුහාවෙහි වාසය කරන සේක. එකල්හි එක් බකමූණු පක්ෂියෙක් භාග්‍යවතුන් වහන්සේ ගමට පිඬු පිණිස වැඩමවන වේලෙහි අඩ මගක් පසුගමන් යයි. (ගමින්) නික්මෙන කල්හි අඩමගක් පෙරගමන් යයි. හෙතෙම එක් දිනක් පර්වතයෙන් බැස සවස් කාලයෙහි භික්ෂුසංඝයා පිරිවරාගෙන වැඩසිටින සර්වඥයන් වහන්සේ වැඳ පියාපත් නමා ඇඳිලි ගෙන හිස යටකොට දශබලධාරීන් වහන්සේ නමදිමින් සිටියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහු බලා සිනහ පහළ කළේය. ආනන්ද ස්ථවිරයෝ, ස්වාමීනි, සිනහ පහළ කිරීමට හේතුකාරණා කවරේදැයි විචාළහ. ආනන්ද, මේ මහමුහුණු පක්ෂියා බලව. මේ තෙමේ මා කෙරෙහි ද භික්ෂු සංඝයා කෙරෙහි ද, සිත පහදවා සිය දහසක් කල්පයන්හි දෙව්ලොව ද මිනිස් ලොව ද සැරිසරා සෝමනස්ස නමින් පසේබුදු වන්නේ යයි වදාළ සේක.

උලූකක මණ්ඩලකඛික වේදියතෙ චිරදීඝවාසක
සුඛිතොපි තවං අය්‍ය - කොසිය කාලුටඨිතං පසසසි බුදධවරං

මයි චිතතං පසාදෙත්වා - භිකඛු සංසෙ අනුතතරෙ
කපපානි සත සහසසානි - දුගගතිං සො න ගචඡති

දෙවලොකං චවිත්වාන - කුසල මූලෙ න වොදිතෙ
භවිසසති අනනත ඤාණො සොමනසෙසාති විසසුතො

මහ මුහුණු සංඛ්‍යාත වූ කවාකාර වූ ඇස් ඇති, ඉතා දිගු කලක සිට වේදිස පර්වතයෙහි වාසය කරන්නා වූ ආර්ය වූ කෝසිය නම් වූ පක්ෂිය, සවස් කාලයෙහි දිවා විහරයෙන් නැගී සිටියා වූ, උතුම් සර්වඥයන් දක්නෙහි සුඛිත වූයේ වෙහි.

මා කෙරෙහි ද, අනුත්තර වූ භික්ෂු සංඝයා කෙරෙහි ද සිත පැහැදවූ ඔහු කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නො යන්නේ ය.

දෙව්ලොවින් චුතව, මෙම කුසල මූලයෙන් මෙහෙයන ලදුයේ සෝමනස්ස නමින් අපරිමිත ඤාණ ඇති (පසේ බුදු කෙනෙක්) වන්නේය.

තවද මෙහි රජගහ නුවර සුමන මාලාකාර වස්තුව, මහා භෙරිවාදක වස්තුවය, මෝරජික වස්තුවය, වීණාවාදක වස්තුවය, සංඛ ධමන වස්තුවය, (යන කථාවස්තු) විස්තර කටයුතු ය. මෙසේ නෛර්යාණික ශාසනයෙහි ශාස්තෘන් කෙරෙහි ප්‍රසාදය මනාකොට පැමිණියේ වේ.

ධමෙම පසාදො නෛර්යාණික ශාසනයෙහි ධර්මයෙහි ප්‍රසාදය මනාකොට පැමිණියේ වෙයි. ශබ්ද මාත්‍රයෙහි නිමිත්ත ගෙන අසන්නා වූ තිරිසන් සතුන්ට පවා සම්පත් ලබාදෙන්නේ වේ. මණ්ඩුක දිව්‍ය පුත්‍රයාගේ කථාවස්තුව ආදිය දතයුතුය. **සීලෙසු පරිපූරිකාරිතා** නෛර්යාණික ශාසනයෙහි මනාකොට සිල් පුරන්නා වූ අයට ද ස්වර්ග මෝක්ෂ සම්පත් ලබාදෙයි. ඒ පිළිබඳව ඡත්ත මාණවක වස්තුව, සාමණේර වස්තුව ආදිය දැක්විය යුතුය.

සහධම්මිකෙසු නෛර්යාණික ශාසනයෙහි සහදැමියන් කෙරෙහි මනාකොට ප්‍රියමනාප වේද, ඔවුන්ට ද මහත් වූ සම්පත් ලබාදෙයි. මේවායේ විස්තර විමානවත්ථු පේතවත්ථු ආදියෙහි දැක්වේ.

එබැවින් කියන ලදී.

ඛීරොදනං අහමදාසිං භිකඛුනො පිණඩාය චරනතසස -පෙ-
ඵාණිතං - උචඡුඛණඩකං, තිමබරුසකං - කකකාරුකං
ඵලාලුකං - වලලිපකකං - ඵාරුසකං - හත්ථපතාකං
සාකමුට්ඨිං - පුථුකමුටඨිං - මූලකං - නිමබමුටඨිං - අමබිලකඤජිං
දොණි නිමජජනිං - කාය බන්ධනං - අංසවට්ටකං - අයොගපට්ටං
විධූපනං - තාල වණ්ටං - මොරහත්ථං
ඡත්තනං - උපාහනං - පූවං - මොදකං
සංකුලිකං - අහමදාසිං - භිකඛුනො පිණඩාය චරනතසස
තසසා මෙ පසස - විමානං - අවඡරාකාම වණ්ණි නීහමසමි

පිඬු පිණිස හැසිරෙන්නා වූ භික්ෂුවකට මම කිරිබතක් දුනිමි. උක්සකුරු හෝ පැණි, උක්කඩක් (උක්ගස් කැල්ලක්) තිඹිරිපලයක්, කැකිරි ගෙඩියක් ද, එළවලු, වැල් ඵලයක්, උගුරුස්ස, ගිනි කබලක්, පලාමිටක්, ළා කොළ මිටක්, හබල පෙත්තක්, අල මුලක්, කොසඹ මිටක්, ඇඹුල් කැඳක්, තෙල් සහිත තල කැරලි, පටියක් (සිවුරු) අංසකඩයක්, උරහිස් පටියක් (උරහිසේ දමන), සිවුරුස් විජිනිපතක්, තල්පතින් කළ කවාකාර විජිනිපතක්, මොනරපිළින් කළ විජිනිපතක්, කුඩයක්, වහන් සඟලක්, අග්ගලා, රසකැවිලි ආදියක්, මම පිඬු පිණිස හැසිරෙන භික්ෂුවකට දුනිමි. (ඒ පිණින් පහළ වූ) මාගේ විමානය බලව. මම කැමති විධියේ රූප වර්ණ ඇති දිව්‍ය අප්සරාවක් වෙමි.

තං කිසස හෙතු පෙර කී ආකාරයෙන්ම යොදා දතයුතුයි. තීර්ථකයෝ කිසියම් උපාදානයන්ගේ ප්‍රහාණය මනාකොට නො පණවත්ද, තථාගතයෝ පණවත් ද, ඔවුන්ගේ ප්‍රත්‍යය දක්වන්නට භිකඛවෙ ආදිය වදාළහ. එහි කිනනිදානා යනාදී තන්හි නිදානාදි වූ සියල්ලම අදාළ කාරණය සඳහා වචනයෝ ය. යම්හෙයකින් කාරණය එය ගනිවු යයි පාවාදෙන කලක් මෙන් ඵලය ගෙන දේද, එහෙයින් නිදාන යයි කියයි. යම්හෙයකින් මම ඵලය එහි උපදී ද, හටගනී ද, උදාවේද, එහෙයින්

සමුදයෝ ජාති පභවතෝ යයි කියයි. මේ වනාහි පදාර්ථයයි. මේ කරුණුවලට කුමක් නිදානය වීදැයි **කිනනිදානා** නම්. කවරක් හේතුව වූයේනුයි **කිං සමුදයා** යනු වේ. කවරෙක් ජාති වූයේදැයි **කිං ජාති** යනු වේ. කුමක් උදා වූයේ දැයි **කිං පභවා** යනු වේ. යම්හෙයකින් ඔවුන්ට තෘෂ්ණාව ඉහත කියන ලද අර්ථයෙන් නිදානය ද සමුදය ද ජාතිද ප්‍රභව වේද එහෙයින් **තණහා නිදානා** ආදිය කීහ. මෙසේ සියළු පදයන්හි අර්ථය දතයුතුයි. යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ හුදු උපාදානයාගේම ප්‍රත්‍යය දන්නා සේක් නොවෙත්ද, උපාදානයට ප්‍රත්‍ය වූ තෘෂ්ණාවගේ ද, තෘෂ්ණාදීන්ට ප්‍රත්‍ය වූ වේදනාදීන්ගේ ද, ප්‍රත්‍යය දන්නා සේක්මය. එහෙයින් **තණහා චායං භිකඛවෙ** යනාදිය කීහ.

යතෝ ච ඛෝ යම්කලෙක **අවිජජා පහීනා හොතීති** සසරට මුල් වූ අවිද්‍යාව අනුත්පාද නිරෝධයෙන් ප්‍රහීණ වේද, **විජජා උපපනනා** අර්හත් මාර්ගයෙන් විද්‍යාව උපන්නේ ද, **සෝ අවිජජා විරාගා විජජුපාදා** ඒ භික්ෂුව අවිද්‍යාව ප්‍රහීණ කළ බැවින් ද, විද්‍යාව උපන් බැවින් ද, **නෙව කාමූපාදානං උපාදියති** කාම උපාදානය ද සෙසු උපාදානයන් ද හට නොගැනේ. **අනුපාදියං න පරිතසසති** මෙසේ කිසිදු උපාදානයක් නොගන්නේ තණ්හා පරිතස්සනාවෙන් තැති නොගනී. **අපරිතසසං තුස්ත** නොවන්නේ තණ්හාව නූපදවන්නේ **පචචතතං යෙව පරිනිබබායති** තෙමේම ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවෙයි. මෙසේ ඔහුගේ ආශ්‍රවක්ෂය දක්වා ක්ෂීණාශ්‍රව භික්ෂූන්ගේ ප්‍රත්‍යවේක්ෂා දක්වන්නේ **ඛීණා ජාති** යනාදිය වදාළහ. එහි ඉහතින් කියන ලද අර්ථ ඇත්තේම වේ.

චූල සීහනාද සූත්‍ර වර්ණනාව නිමියේය.

1-2-2

එවමෙමසුතං යනු මහා සීහනාද සූත්‍රයයි. එහි **වෙසාලියං** යනු ඒ නම් ඇති නගරයෙහි, ඔබිනොබ විශාල වූ බැවින් වෙසාලී 'විසාලා' යයි ප්‍රසිද්ධියට ගියේය. මේ එහි පිළිවෙළ කථාවයි. බරණැස් රජුගේ අග මෙහෙසියගේ කුසෙහි දරු ගැබක් පිහිටියේය. ඕ තොමෝ එය දැන රජුට දැන්වූ (කල්හි) රජතෙමේ ගැබ් පෙරහර දුන්නේ ය. ඕ තොමෝ මනාකොට ගැබ පරිහරණය කරනු ලබන්නී, ගැබ මේරීමට ගිය කල්හි තිඹිරිගෙට පිවිසියාය. පිනැත්තියන් ගේ ගැබ් බිහිවීම අළුයම් කාලයේම සිදුවේ. ඕතොමෝ පිනැත්තියන් අතුරෙක් එක් තැනැත්තියකි. එහෙයින් අළුයම් කාලයෙහි, ලතුයෙන් ආලේප කළ බඳු වදමලක් මෙන් මස් වැදැල්ලක් වැදුවාය. එය දුටු අගමෙහෙසිය 'අනෙක් දේවීහූ රන් බිඹු වැනි පුතුන් වදති. අග මෙහෙසිය (වැදූයේ) මස්වැදැල්ලකැයි රජු ඉදිරියෙහි මගේ අගුණ පහළ වන්නේ යයි' සිතා ඒ නුගුණ බියෙන් ඒ මස් වැදැල්ල එක් භාජනයෙක බහා වසා රාජ මුද්‍රායෙන් ලස් තබා ගංගා ජලයෙහි දැම්මවීය. මිනිසුන් විසින් අත්හළ මොහොතේ පටන් දෙවියෝ ආරක්ෂාව සැලසූහ. එම බඳුනෙහි 'බරණැස් රජුගේ අගමෙහෙසියගේ දරුවෝ' යයි දෑ හිඟුලෙන් ලියූ රන්පටක් ද බැන්දහ. එතැන් සිට එම බඳුන රළ භයාදියෙන් ආරක්ෂිතව ගංගා ජලයෙහි පාවී ගියේය.

එ සමයෙහි එක්තරා තාපසයෙක් ගොපලු කුලයක් නිසා ගංඉවුරේ වසයි. හෙතෙම උදේම ගඟට බටුයේ එන්නා වූ එම භාජනය දැක පාංශුකූල හැඟීමෙන් ගත්තේ ය. නැවත එහි අකුරුපට ද, රාජ මුද්‍රිකාවද දැක මුදා මස්වැදැල්ල දුටුයේය. එය දුටු තවුසාට මෙසේ සිතිණ. 'දරු ගැබක් විය හැක. එසේ වුවද දුගඳක් කුණු බවක් නැත'යි අසපුවට ගෙන ගොස් පිරිසිදු තැනෙක තැබුයේය. ඉක්බිති අඩ මසකින් මස්වැදලි දෙකක් වූහ. තාපසයා එය දැක ඉතා මැනවින් තැන්පත් කළේය. නැවත අඩමසක් ගිය තැන්හී එකී එකී පේශියෙහි අත් පා හිස් පිණිස පස පස බැගින් පේශීහු නැගියාහුය. ඉක්බිති ඉන් අඩමසක් ඇවෑමෙන් එක් මස් වැදැල්ලක් ස්වර්ණ බිම්බයක් වැනි දරුවෙක් විය. අනික දැරියක් වූවාය. ඔවුන් කෙරෙහි තවුසාට පුත්‍ර සෙනෙහස පහළ විය. යළි ඔහුගේ මාපටඇඟිල්ලෙන් කිරි උපන. එතැන් පටන් කිරි හා බත් ද ලැබිණ. තාපසයා බත් වළඳ, කිරි

දරුවන්ට පොවයි. ඔවුන්ගේ උදරයට යමක් යමක් පිවිසේද ඒ ඒ සියල්ල වීදුරු බඳුන්ගත වූවා සේ පෙනෙයි. මෙසේ නිඡවි වූයේයි. වෙනත් ආචාර්ය කෙනෙක් (මෙසේ) කීහ. වියා තබන ලද්දාක් මෙන් ඔවුන්ගේ එකිනෙක වැළඳගත් සිවිය වූවාය. මෙසේ ඔව්හූ අපගත ඡවි ඇති බැවින් හෝ වැළඳගත් ඡවි ඇති බැවින් 'ලිචඡවී' යයි ප්‍රසිද්ධ වූහ.

තවුස්තෙම දරුවන් පෝෂණය කරන්නේ හිරු නැගි කල්හි ගමෙහි පිඬු පිණිස හැසිරේ. ඉතා දහවල්ව (ගමින්) නික්මෙයි. ඔහුගේ ඒ හැසිරීම් පිළිවෙළ දත් ගෝපාලකයෝ කීහ. ස්වාමීනි! පැවිද්දන්ට දරුවන් පෝෂණය කිරීම පලිබෝධ සහිතය. දරුවන් අපට දෙනු මැනවි. අපි පෝෂණය කරන්නෙමු. නුඹවහන්සේ තපස්කම් කළ මැනව. තවුසා මැනවැයි පිළිගත්තේය. ගොපල්ලෝ දෙවන දවස් මග සමතලා කොට, මල් විසුරුවා, ධජ පතාක ඔසවා තූර්ය වාදනයෙන් යුක්තව ආශ්‍රමයට ආවාහුය. තවුස් තෙම මොව්හූ මහා පින්වත් දරුවෝය. අප්‍රමාදයෙන් වර්ධනය කරවු. හොඳින් වඩා ඔවුනොවුන් ආවාහ කරවු. පස්ගෝරසයෙන් රජු සතුටට පත්කොට සුදුසු බිමක් ගෙන නුවරක් කරවු. එහි කුමාරයා අභිෂේක කරවු යයි (ගොපල්ලන්ට) කියා දරුවන් දුන්නේය. ඔව්හූ මැනවැයි පිළිගෙන දරුවන් ගෙනගොස් පෝෂණය කළහ.

දරුවෝ වැඩීමට පැමිණ ක්‍රීඩා කරන්නාහු, යම් යම් ප්‍රශ්නවල දී අනෙක් ගොපලු දරුවන්ට අතින් ද පයින් ද පහර දෙති. ඔව්හූ හඬති. හඬන්නේ මන්දැයි දෙමාපියන් විචාල කල්හි මේ මව්පියන් නැති තවුසා හැදූ වැඩූ (ළමයින්) අපට පහර දෙතී යි කියත්. ඉක්බිති ඔවුන්ගේ මව්පියෝ 'මේ අනුන්ගේ දරුවෝ ය. අපේ දරුවන් පිටස්තර දරුවන්ගෙන් විනාශයට පත්වෙතියි දුක්වෙති. මොවුන්ට සංග්‍රහ නොකළ යුතුය. මොවුන් වර්ජනය කළ යුතුයයි' කීවාහුය. එතැන් පටන් යොදුන් සියයක් පමණ වූ ඒ පෙදෙස 'වජ්ජී' යයි කියයි.

ඉක්බිති ගොපල්ලෝ ඒ ප්‍රදේශය රජුන් සතුටට පත්කොට ලබාගත්හ. එහි නුවරක් කරවා සොළොස් වයස් වූ කුමරු අභිෂේක කරවා, රජ කළහ. එම වයසේම වූ දැරිය සමග විවාහ කොට, 'බැහැරින් දැරියක් නො කැඳවන ලෙසට ද, මෙයින් දැරියක් කිසිවෙකුට පිටතට නොදෙන ලෙසට ද සම්මත කළහ. ඔවුන්ගේ පළමු සංවාසයෙන් දුවක් ද පුතෙක්දැයි දරුවෝ දෙදෙනෙක් වූහ. මෙසේ සොළොස්වරක් දෙදෙනා බැගින්

උපන්නහ. ඉක්බිති අනුක්‍රමයෙන් වැඩෙන්නා වූ, (දරුවන්ට අවශ්‍ය) පිරිවර සම්පතට අවශ්‍ය ආරාම උයන් ගෙවතු නිවාස ආදිය සැපයීමට තුන්වරක් ගව්වෙන් ගව්ව පුළුල් (විශාල) කළාහ. නැවත නැවතත් විශාල වන බැවින් 'වෙසාලි' යයි නම් විය. එයින් කියන ලදී. වෙසාලියං යනු එනම් නගරයයි.

බහිනගරෙ නගරයෙන් පිටත, අම්බපාලි වනය මෙන් ඇතුළු නගරයෙහි නොවේ. මෙය වූ කලී ජීවක අඹ වනය මෙන් නගරයෙන් පිටත වූ වනලැහැබෙකි. එහෙයින් කීහ. බහිනගරෙකි පිටත නගරය, අවරපුරෙ පුරයේ අවරයෙහි, බටහිර දිසාවෙහි යන අර්ථයි. වනසණ්ඩ ඒ වනලැහැබ නගරයෙන් බටහිර දිසාවේ ගව්වක් පමණ දුරිනි. එහි මිනිස්සු භාග්‍යවතුන් වහන්සේට ගඳකිළියක් කොට එය පිරිවරා භික්ෂූන් සඳහා රාත්‍රිස්ථාන, දිවාස්ථාන, සක්මන්මළු, ලෙන්, කුටි, මණ්ඩප ආදිය ඉදිකළහ. භාග්‍යවතුන් වහන්සේ එහි වාසය කරන සේක. අවරපුරෙ වනසණ්ඩ යන්න එහෙයින් කියන ලදී.

සුනකඛතෙතා යනු ඔහුගේ නමයි. ලිච්ඡවි රජුගේ පුත්‍ර වූ බැවින් ලිචඡවි පුතෙතා යි කියයි. අචිරපකකනෙතා සිවුරු හැර ගිහි බවට පැමිණීමෙන් අලුත නික්ම ගියේ, පරිසති, පිරිස් මැද, උතතරි මනුසස ධමමා මෙහි මනුෂ්‍ය ධර්ම නම් දශකුසල කර්මපථයෝය. එය වැලැක්වීමට ප්‍රතික්ෂේප කිරීමට නො හැක්කේය. කවර හෙයින් ද? දෝෂාරෝපණ බියෙනි. විසාලා නුවර බොහෝ මිනිස්සු රත්නත්‍රයෙහි පැහැදුනේ බුදුන් කෙරෙහි මමත්වය, සඟුන් කෙරෙහි මමත්වය, ඇත්තාහුය. ඔව්හූ දශකුශල මාත්‍රයකුදු ශ්‍රමණ ගෞතමයන්ට නැතැයි කී කල්හි, ඔබ කොතැන්හිදී භාග්‍යවත්හු සතුන්ගේ දිවි තොරකරනු දුටුවෙහිද? නුදුන් දෙය ගන්නා වූ භාග්‍යවතුන් කොතැනදී දුටුවෙහිද? ආදිය කියා, තමාගේ පමණ නො දන්නෙහි? කිම මට දත් ඇත්තේ යයි කියා ගල්බොරළු කන්නෙහිද? සර්පයකුගේ නගුට කසන්නට වෑයම් කරයිද? කියති. දත්වල මල්දමක් යයි සිතා ක්‍රීඩා කරන්නට කැමැත්තෙහිද? ඔබගේ කටින් දත් හෙලන්නෙමු යයි කියන්නාහුය. දෝෂාරෝපණ භීතියෙන් මෙසේ කියන්නට ඔහුට නොහැකි වෙයි. එසේ වුවත් එයින් මත්තෙහි (සමථ විදර්ශනා ආදී) විශේෂ අධිගමය වලකන්නේ, උතතරි මනුසස ධමම අලමරියඤාණ දසසන විසෙසො යි කීය.

එහි ආර්යයෙකු කරන්නට ප්‍රමාණවත් යයි 'අලමරිය' නමි. ආර්ය භාවයට සමර්ථයයි කියන ලද්දේය. ඥාන දර්ශනයම ඥාන දර්ශන වෙයි. අලමරිය වූයේත් ඤාණ දර්ශන වූයේත් එමනුයි **අලමරියඤාණ දසසන විසෙසො** වෙයි. ඤාණදසසනං යනු දිවැස ද විදර්ශනාවද, මාර්ගයද, ඵලයද, ප්‍රත්‍යවේක්ෂා ඥඤාණය ද, සර්වඥතා ඤාණය ද වේ. 'අපපමත්තො සමානො ඤාණ දසසනං ආරාධෙති යන මෙහි දිවැස ම ඤාණදර්ශන නමි. 'ඤාණදසසනාය චිත්තං අභිනීහරති අභිනනාමෙති' යන මෙහි විදර්ශනා ඤාණයයි. 'අභබ්බා තෙ ඤාණ දසසනාය අනුත්තරාය සමෙබාධාය' යන තන්හි මාර්ගයයි. 'අයමඤ්ඤා උත්තරි මනුසස ධම්ම අලමරිය ඤාණ දසසන විසෙසො අධිගතො එාසු විහාරො' යන මෙහි ඵලයයි. 'ඤාණඤ්ච පන මෙ දසසනං උදපාදි, අකුප්පා මෙ චෙතො විමුත්ති අයමන්ති මා ජාති නත්ථිදානි පුනබ්භවො' මෙහි ප්‍රත්‍යවේක්ෂා ඤාණයයි. ඤාණඤ්ච පන මෙ දසසනං උදපාදි, සත්තාහ කාලකතො ආළාරො කාලා මොා' යන මෙහි සර්වඥතා ඥානයයි. මෙහි වූ කලී ලෝකෝත්තර මාර්ගය අදහස් කරන ලදී. හෙතෙම භාග්‍යවතුන් වහන්සේ ඒ මාර්ගය ප්‍රතික්ෂේප කිරීම කරයි.

තක්කපරියාහතන්ති යන මෙයින් ආචාර්යවරයා වළක්වයි. ඔහුට මෙබඳු සිතක් වීල. 'ශ්‍රමණ ගෞතමයන් ගුරුවරුන් වෙත එළඹ මනාකොට උගත් ධර්මාන්තරයක් නැත. තර්කකොට විතර්ක කොට මෙසේ වන්නේය මෙසේ වන්නේ යයි ඒ ඒ තත්ත්වයන් අනුවිතර්කයෙන් ගන්නා ලද්දක් කොට දහම් දෙසයි. **විමංසානුචරිතං** යනු මෙයින් උන්වහන්සේගේ ලෞකික ප්‍රඥාව ප්‍රකට කෙරෙයි. ශ්‍රමණ ගෞතමයෝ ප්‍රඥා ඇත්තෙකි. හෙතෙම ඒ ප්‍රඥා සංඛ්‍යාත වූ ඉන්ද්‍රියාගේ සිළුමිණ බඳු වූ වීමංසාවම මෙසේ වටනේය මෙසේ වටනේය යි, ඔබමොබ හසුරුවා වීමංසාවෙන් හසුරුවන ලද ධර්මය දේශනා කරයි. **සයංපටිභානං** මෙයින් මේ බුද්ධ ධර්මයන්හි ප්‍රත්‍යක්ෂභාවය වළක්වයි. ඔහුට මෙසේ අදහසක් ඇති විය. ශ්‍රමණ ගෞතමයන්ට සියුම් ධර්මාන්තරයක් විදර්ශනා මාර්ගයක් ඵලයක්, ප්‍රත්‍යක්ෂ වූවක් නම් නැත. එතකුදු වුවත් මෙතෙම ලද පිරිස් ඇත්තේය. සක්විති රජෙකු මෙන් සිව්වණක් පිරිස පිරිවරා සිටිත්. ඔහුගේ දෙතොළ මනාකොට පහස් ඇත්තේය. දිව මොළොක්ය. හඬ මිහිරිය. වචනය නිවැරදිය. ඔහුට යමක් යමක් වැටහේද? ඒ ඒ කරුණ ගෙන තමන්ට වැටහුණු කථාව කියමින් හේ මහජනයා සතුටු කරයි.

යසසච ඛවාසස අත්ථාය ධමෙමා දෙසිතො යම් කරුණක් සඳහා ඔහු විසින් ධර්මය දේශනා කරත්ද? රාගය නැසීම පිණිස අශුභ කර්මස්ථානය ය, ද්වේෂය නැසීම සඳහා මෛත්‍රී භාවනාමය. මෝහය නැසීම සඳහා පංච ධර්මයෝ ය. විතර්කය නැසීම සඳහා ආනාපාන සතියය. **සො නීය්‍යාති තක්කරසස සමමා දුකඛකඛයාය** ඒ ධර්මය මනාකොට පිළිපදින්නහු හේතු වශයෙන්, නය වශයෙන් කරුණු වශයෙන් සංසාර දුකින් මිදීමට පැමිණෙයි. ඒ ධර්මය ඒ අර්ථය සිද්ධ කෙරේ යයි දක්වයි.

මෙය වනාහි තමාගේ අදහස් වශයෙන් හෙතෙම නො කියයි. බුදුවරුන්ගේ ධර්මය අනෛර්යාණිකයයි හෙතෙමේ කියන්නේ ද? එසේ වුවත් කියන්ට අසමර්ථ වේද, ඒ කුමක් හෙයින් ද? දෝෂාරෝපණ භීතියෙනි. විසාලා මහනුවර සෝවාන් වූ සකෘදාගාමී වූ අනාගාමී වූ බොහෝ උපාසක උපාසිකාවෝ වෙති. ඔව්හූ මෙසේ කියති. සුනක්ඛත්තය! ඔබ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අනෛර්යානික යයි කීයෙහි. ඉදින් මේ ධර්මය අනෛර්යානික වූයේ නම් මේ නගරයේ මෙතෙක් ජනයෝ කෙසේ සෝවාන් වූවාහුද? මෙතෙක් කෙසේ සකෘදාගාමී වූවහුද? මෙතෙක් කෙසේ අනාගාමී වූවහුද? මේ ආදී ක්‍රමයෙන් දෝෂාරෝපණය කරන්නාහු යයි, දෝෂාරෝපණ භීතියෙන් අනෛර්යාණික යයි කියන්නට නොහැකි වන්නේ අර්ජුන විසින් විදින ලද ඊතලයක් සෙයින් ඔහුගේ ධර්මය නොසිස් වූයේ නිවන් පිණිස ජනයා පැමිණෙති. එසේ වුව ද ඔහුගේ අභ්‍යන්තරයෙහි කිසිවක් නැතැයි කියයි.

අසෙසාසි ඛො විසාලාවෙහි බමුණු කුල සිටු කුල ආදී පිරිස් මැද තැන් තැන්වල මෙසේ කියන්නවුන්ගේ ඒ වචනය ඇසී, එසේ වුවත් නො වැළකීය. කුමක් හෙයින් ද? කරුණාව නිසාය. උන්වහන්සේට මෙසේ සිතිණ. මේ තෙමේ කිපියේ දැවෙන්නා වූ හුණ වනයක් මෙන්, උදුනට ලුණු දැමූ කලක මෙන් ද, ක්‍රෝධයෙන් පිපිරෙයි. මා විසින් වළකන ලද්දේ මා කෙරෙහි ද වෛර බඳින්නේ ය. මෙසේ ඔහුගේ තථාගතයන් කෙරෙහිද, මා කෙරෙහි ද, දෙදෙනා කෙරෙහිම ආඝාතය බඳින අතර එය ඉතා බර වන්නේයයි කරුණාබර බැවින් නො වැළකීය. බුදුවරුන් පිළිබඳව නුගුණ කථා නම් පුන්සඳට බැනීමක් වැනිය. කවරෙක් මොහුගේ කථා අදහයිද? තමාගේ කෙළ සිඳුන කල්හි මුව වියලුනු කල්හි නවත්වනු ඇත. මේ කරුණෙන් ද නොවැළකීය. **පිණඩපාත පටිකකනෙතා** පිණ්ඩපාතය

සෙවීමෙන් වෙන්වූයේ, කොධනෝ සැඩ වූයේ, එරුළ වූයේ, මොඝ පුරිසෝ හිස් පුරුෂයා, ඒ එසේම ය යමෙකුට එම ආත්මභාවයෙහිදී ම මාර්ගඵල ලැබීමට හේතු සම්පත් නැත්ද? ඔහු මෝඝ පුරුෂයෙකියි බුදුවරු පවසත්. හේතු සම්පත් ඇතිකල්හිදු එකෙණෙහි මාර්ගයක් හෝ ඵලයක් හෝ නැත්තේ නම් ඔහුට ද 'හිස් මිනිසා' යයි කියති. මේ පුද්ගලයාට වනාහි මේ ආත්මයේම මගඵල ලබන්නට හේතුසම්පත් තිබියදීම කවර හෙයකින් මෝඝපුරිස යයි කීයේද, **කොධා ච පනසස එසා වාචා නාසිතා** ඔහුගේ සිතේ ඇති ක්‍රෝධය නිසාම මේ වචන කියන ලදී.

කවර හෙයකින් මෙතෙම භාග්‍යවතුන් වහන්සේට කිපියේද? මෙතෙම මෙයට කලින් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ දිවැස් පිළිබඳ පිළියම් විචාළේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට වදාළ සේක. හෙතෙම දිවැස් උපදවා දෙව්ලොව නන්දන උයන, චිත්‍රලතා වනය, ඵාරුසක වන, මිශ්‍රක වන ආදියෙහි දිවසැපත් විඳින දෙව් පුතුන් ද දෙව් දූවරුන් ද, දැක මෙවැනි ආත්මභාවයක සිටින මොවුන්ගේ හඬ කොපමණ මිහිරිදැයි සිතන්නේ, ශබ්දය ඇසීම සඳහා දිවකන් ලබාගැනීම සඳහා අවශ්‍ය පිළියම්, දසබලධාරීන් වහන්සේ වෙත පැමිණ විචාළේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට දිවකන් ලැබීමට හේතුවාසනා නැති බව දැන පිළියම් නො වදාළහ. බුදුවරයෝ යමෙකුට (යමක් සඳහා) හේතුවාසනා නැත්නම් එය නොවදාරති. හෙතෙම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ආඝාත බැඳ සිටීය. මම පළමුව ශ්‍රමණ ගෞතමයන්ගෙන් දිවැස් සඳහා පිළියම් විචාළෙමි. හෙතෙම මට එය සමෘද්ධ වේවා හෝ නොවේවා හෝ කීයේය. මම ආත්ම ශක්තියෙන් එය උපදවා, දෙවනුව දිවකන් ලැබීමට පිළියම් විචාළෙමි. එය මට නොකීයේය. ඒකාන්තයෙන් ඔහුට (මෙසේ) සිතිණ. මෙතෙම රජකුලයෙන් පැවිදි විය. මොහු දිවැස් උපදවා, දිවකන් උපදවා, චේතොපරිය ඤාණය උපදවා, ආශ්‍රවයන් ක්ෂය කිරීමේ නුවණ උපදවා, මා හා සම සමයෙක් වන්නේ යයි ඊර්ෂ්‍යාවෙන් මසුරුබවින් මට නොකීයේය. හෙතෙම බොහෝ සෙයින් ආඝාත බැඳ කසාවත් හැර, ගිහි බවට පැමිණ ද නිශ්ශබ්දව නොසිටියි. දශබලධාරීන් වහන්සේට හිස් වචනයෙන්, අසත්‍යයෙන් බොරු දෝෂාරෝපණ කෙරෙමින් හැසිරෙයි. **කොධාච පනසස එසා වාචා භාසිතාති** ක්‍රෝධය නිසා මේ දෝෂාරෝපණ කරන බව භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

වණ්ණා හෙසෝ සාරිපුත්තෙනා ශාරිපුත්‍රය, කල්ප ලක්ෂයක් අධික

කොට ඇති සිව් අසංඛ්‍යයක් පෙරුම් පුරන්නා වූ තථාගතයන් විසින් 'මාගේ මේ දේශනා ධර්මය නෛර්යාණික වන්නේ' මේ සඳහාම උත්සාහ කරන ලද්දේය. එහෙයින් යමෙක් මෙසේ කියන්නේ ද, ඔහු තථාගත ගුණයම කියන්නේය. ශාරිපුත්‍රය, මේ තථාගතයන්ගේ ගුණයමය. අගුණයක් නම් නොවේ යයි දැක්වීය.

අයමපි හි නාම සාරිපුත්ත යනාදිය කුමක් දක්වත්ද? සුනක්ඛත්ත විසින් ප්‍රතික්ෂේප කරන ලද උතුරු මිනිස්දම් තමන් වහන්සේ කෙරෙහි ඇති බව දක්වයි. බලන්න ශාරිපුත්‍රය, සුනක්ඛත්ත නම් හිස් මිනිසා තථාගතයන්ට මනුෂ්‍යත්වය ඉක්ම වූ ධර්ම නැතැයි කියයි. එහෙත් මට සර්වඥතා ඥානය ඇත. ඍද්ධිවිධ ඤාණය ඇත. දිව්‍යශ්‍රෝත ධාතු ඤාණය ඇත. චේතෝපරිය ඤාණය ඇත. දශබල ඤාණය ඇත. චතුර් වෛශාරද්‍ය ඤාණය ඇත. අට පිරිස්හි කම්පා නොවන ඤාණය ඇත. සතර උත්පත්තීන් පිළිබඳ පිරිසිඳ දැනීමේ ඤාණය ඇත. පංචගති පිළිබඳ පිරිසිඳ දැනීමේ ඤාණය ඇත. උත්තරී මනුස්ස ධර්ම (මනුෂ්‍යත්වය ඉක්මවූ) ධර්ම නම් මේවාමයි. මේ උතුරු මිනිස්දම් අතුරෙන් එකක් පිළිබඳව වත් දැනගැනීමේ සමත්කමක් මේ හිස් පුරුෂයාට නැත්තේමය. මේ කාරණය දැක්වීම සඳහා අයමපි හි නාම සාරිපුත්තනා යනාදී ක්‍රමයෙන් මේ දේශනාව ආරම්භ කළේය.

එහි 'අඤ්ඤෙතීති අඤ්ඤයෝ' දැනගනී. අවබෝධ කෙරේ යන තේරුමයි. 'ධම්මස්ස අඤ්ඤයෝ' ධර්මය දැනගැනීම ධර්මඤ්ඤයයි. ඒ සර්වඥතා ඥානය ආදී ධර්මයන් දත් ප්‍රඥාවට නමකි. ඉතිපිසෝ භගවා යනාදියෙන් මෙබඳු වූ සර්වඥතා ඥාන ආදී වූ මනුෂ්‍යත්වය ඉක්මවූ ධර්මයන් (උතුරු මිනිස්දම්) ඇතැයි දැන ගැනීමට ඒ හිස් පුරුෂයාට ධර්මඤ්ඤයක් ධර්මාවබෝධයක් නැත්තේම යයි දැක්වීය. ඍද්ධිවිධඥාන ආදියෙහි ද මේ ආකාරයෙන් ම දතයුතුයි.

මෙහි කිවයුත්තක් ඇත. චේතෝපරියාය ඤාණයට අනතුරුව ත්‍රිවිද්‍යාවෝ කිවයුතුය. එසේ වුවත් ත්‍රිවිද්‍යාවන් කී කල්හී මත්තෙහි තථාගත බල ඤාණය (දසබල ඤාණය) නො පිරේද, එහෙයින් ඔවුන් නො දක්වා තථාගත බල ඤාණයම උසස්කොට දක්වන සේක්, දස ඛො පනිමානි සාරිපුත්තානි ආදිය කීහ. එහි තථාගත බලානි අන්‍යයන්ට අසාධාරණ වූ

තථාගතයන්ටම සමාන වූ බලයෝ, පෙර බුදුවරුන්ගේ බලයෝ, පින් බලයෙන්ම පැමිණියාහූ වෙති යන අර්ථයි.

එහි තථාගතයන්ගේ බලය දෙපරිදි වේ. කාය බලය හා ඤාණ බලය වශයෙනි. ඒ අතුරෙන් කාය බලය ඇත් කුල අනුසාරයෙන් ම දතයුතුයි. පැරැන්නන් විසින් මෙසේ කියා ඇත.

කාලාවකඤ්ච ගංගෙය්‍යං - පණ්ඩරං තම්බ පිංගලං
ගන්ධ මංගල හෙමඤ්ච - උපොසථ ඡද්දනති මෙ දසා ති

මොවුහූ දස ඇත් කුලයෝ ය. එහි කාලාවක නම් නිතර පෙනෙන (ප්‍රකෘති) ඇත් කුලයයි. පුරුෂයන් දස දෙනකුගේ ශක්තිය එක් කාලාවක ඇතෙකු ඇත. කාලාවක ඇතුන් දස දෙනෙකුගේ ශක්තිය එක් ගංගෙය්‍ය ඇතෙකුට වේ. ගංගෙය්‍ය ඇතුන් දස දෙනකුගේ ශක්තිය එක් පණ්ඩර ඇතෙකුට වේ. පණ්ඩර ඇතුන් දස දෙනකුගේ ශක්තිය තම්බ හස්තියෙකුට වේ. තම්බ හස්තීන් දසදෙනකුගේ බලය එක් පිංගල හස්තියෙකුට ඇත. පිංගල ඇතුන් දස දෙනකුගේ බලය ගන්ධ කුලයේ එක් හස්තියෙකුට ඇත. ගන්ධ කුලයේ ඇතුන් දස දෙනෙකුගේ බලය මංගල කුලයේ එක් හස්තියෙකුට ඇත. මංගල කුලයේ ඇතුන් දසදෙනෙකුගේ ශක්තිය හේම කුලයේ එක් ඇතෙකුට තිබේ. හේම කුලයේ ඇතුන් දස දෙනෙකුගේ ශක්තිය උපෝසථ කුලයේ එක් ඇතෙකුට ඇත. උපෝසථ කුලයේ ඇතුන් දස දෙනෙකුගේ ශක්තිය ඡද්දන්ත කුලයේ එක් ඇතෙකුට ඇත. ඡද්දන්ත කුලයේ ඇතුන් දස දෙනෙකුට යම් බලයක් වේ නම් එය එක් තථාගතවරයකුගේ කාය බලයට සමාන වේ. මෙය නාරායන සංඝාත බලය යයි ද කියනු ලැබේ.

කාලාවක කුලය ද, ගංගෙය්‍ය කුලය ද, පණ්ඩර කුලය ද තම්බ හා පිංගල කුලය ද, ගන්ධ කුලය, මංගල කුලය, හේම කුලය යන මොවුහුද උපෝසථ කුලය හා ඡද්දන්ත කුලය යන මොව්හූ දස ඇත්කුලයෝ වෙති.

ඒ මේ බලය කෙළ දහසක් ප්‍රකෘති ඇතුන්ගේ ද, දස කෙළ දහසක් මිනිසුන්ගේ ද බලයට සමාන බලයක් වේ. ඒ තථාගත කාය බලයයි.

ඥාන බලය වනාහි පෙළෙහි ආ පරිද්දෙනි. සිව් වැදෑරුම් විශාරද

නුවණ, අටපිරිස්හි කම්පා නොවන නුවණ, සිව් යෝනීන් පිළිබඳ පිරිසිඳි නුවණ, පංච ගති පිළිබඳ පිරිසිඳි නුවණ, සංයුත්තයෙහි ආවා වූ තෙ සැත්තෑ නුවණ, සත් සත්තෑ නුවණ සහ අනෙක් දහස් ගණන් ඥානයෝ මේ ඤාණ බලය ම වේ. මෙම ඤාණ අකම්පියාර්ථයෙන් ද, උපස්ථම්භාර්ථයෙන් ද, බලය මැයි කියන ලදී.

යෙහි බලෙහි සමන්නාගතො යම් ඥාන බල දසයකින් යුක්ත වූයේ, මැනවින් යුක්ත වූයේ **අසභංඨානං** ශ්‍රේෂ්ඨ ස්ථානය, උත්තම ස්ථානය නොහොත් ආසභයෝ පූර්ව බුදුවරයෝමය. ඔවුන්ගේ ස්ථානය යන අර්ථයි. තව ද ගවයන් සියයකට ජ්‍යෙෂ්ඨ වූයේ, 'උසභ' නම් ය. ගවයන් දහසකට ජ්‍යෙෂ්ඨ වූයේ 'වසභ' නම් වේ. සියළු ගවයන්ට ශ්‍රේෂ්ඨ වූ, සියළු උවදුරු ඉවසන සුදු වූ ප්‍රසාද උපදවන, සියළු බර උසුලන හෙන හඬකින් වුවද කම්පා නොවන්නේ 'නිසභ' නම් වේ. හෙතෙම (නිසභයා) මෙහි උසභ යන්නෙන් අදහස් කරන ලදී. මෙය වනාහි ඔහුට පරියාය වචනයකි. 'උසභස්ස ඉදං' උසභයාගේ මෙයනුයි ආසභ නම් වේ. ඨානං යනු සතර පයින් පෘථුවිය වෙළා සිටීමය. මේ සිටීම වනාහි ආසභට්ඨානය වැනිනුයි, ආසභ නම් වේ. යම් සේ නිසභ සංඛ්‍යාත උසභ තෙම, වෘෂභ බලයෙන් යුක්ත වූයේ සතර පාදයන්ගෙන් පෘථුවිය පෙළා නිශ්චල භාවයෙන්ම සිටීද, එපරිද්දෙන් තථාගතයන් වහන්සේ ද දශවිධ තථාගත බලයෙන් යුක්ත වූයේ, චතුර් වෛශාරද්‍යය නමැති කකුල් සතරින් අට පිරිස නමැති පෘථුවිය පෙළා දෙවියන් සහිත ලෝකයෙහි, කිසියම් සතුරෙකු විසින් හෝ පසමිතුරෙකු විසින් කම්පා නොවූයේ නොසෙල්වී ස්ථාවරව සිටින සේක. මෙසේ සිටින්නේම ඒ ආසභට්ඨානය ප්‍රතිඥා කෙරෙති. එළඹෙයි. ප්‍රතික්ෂේප නො කරයි. තමන්වහන්සේ කෙරෙහි ආරෝපණය කෙරෙත්. එහෙයින් කියන ලදී. **ආසභං ඨානං පටිජානාති**

පරියාසු අටපිරිස්හී සීහනාදං නදති ශ්‍රේෂ්ඨ නාදය අභීත නාදය නගයි. සිංහනාදය සමාන වූ නාදය නගයි. මේ අර්ථය සීහනාද සූත්‍රයෙන් දැක්විය යුත්තේය. සිංහතෙම (සිවලුන් වැනි ලාමක සතුන්ගේ සහනයෙන් ද (ඇතුන් ආදී සතුන්) විනාශ කිරීමෙන් ද සිංහ වේ. තථාගතයන් වහන්සේ ලෝක ධර්මයන්ගේ ඉවසීමෙන් ද පරප්‍රවාදයන් (විරුද්ධ වාදයන්) නසන හෙයින් ද, 'සිංහ' යයි කියනු ලැබේ. මෙසේ කියන ලද සිංහයාගේ නාදය සිංහනාද නම් වේ. එහි යම් සේ සිංහ තෙමේ සිංහ බලයෙන් යුක්ත වූයේ, සියළු තන්හි විශාරද වූයේ, පහ වූ මයිල් කෙළින් වීම් ඇත්තේ,

'රෝමහර්ෂ' ඇත්තේ සිංහනාදය නගයි. මෙසේ තථාගත සිංහයාද තථාගත බලයෙන් යුක්ත වූයේ, අටපිරිස්හී විශාරද වූයේ, පහ වූ රෝමහර්ෂ ඇත්තේ, 'ඉති රූපං' ආදී ක්‍රමයෙන් නානාවිධ දේශනා විලාස සම්පන්න වූ, සිංහනාදය නගයි. **පරිසාසු සීහනාදං නදති** යනු එහෙයින් කියන ලදී.

බ්‍රහමචක්කං පවත්තෙන තීති, මෙහි බ්‍රහ්මං යනු ශ්‍රේෂ්ඨය. උත්තමය. විශිෂ්ටය යන අර්ථයි. **චක්ක** ශබ්දය වනාහී,

සම්පත්තියං ලක්ඛණෙව රථංගෙ ඉරියාපථෙ
දානෙ රතන ධම්මූර චක්කාදිසු ච දිස්සති
ධම්මචක්කෙ ඉධ මතෝ තඤ්ච දෙවාධා විභාවයෙ

සම්පත්තියෙහි ද, ලක්ෂණියෙහි ද, රථ අවයවයෙහි ද, ඉරියව්වෙහි ද, දානයෙහි ද, රතන චක්‍ර, ධර්ම චක්‍ර, උර චක්‍ර යනාදී තැන්වල ද චක්‍ර ශබ්දය දක්නට ලැබේ. මෙහි ධර්ම චක්‍රයෙහි දන්නා ලදී. එය ද දෙපරිද්දෙකින් දක්වන්නේ ය.

චත්තාරිමානි භික්ඛවෙ චක්කානි යෙහි සමන්නාගතානං දෙවමනුස්සානං ආදියෙහි සම්පත්තියෙහි දක්නා ලැබේ. පාදතලෙසු චක්කානි ජාතානි මෙහි ලක්ෂණයෙහිය. චක්කංව වහතෝ පදං මෙහි රථාංගයෙහිය. චතුචක්කං නවද්වාරං මෙහි ඉරියව්වෙහිය. දද භුඤ්ජ ච මාව පමාදෝ චක්කං වත්තය සබ්බපාණිනං එහි දීමෙහි ය. දිබ්බං චක්කරතනං පාතුරහොසි - එහි රුවන් සක්හි ය. මයා පවත්තිතං චක්කං යන තන්හි දම්සක් හිය. ඉච්ඡා හතස්ස පොසස්ස චක්කං භවති මත්ථකෙ මෙහි උර චක්‍රයෙහිය. බුර පරියනෙත්තන චෙපි චක්කෙකන යන මෙහි ප්‍රහරණ චක්‍රයෙහිය. අසනි විය චකනති මෙහි අසනි (හෙණ) මණ්ඩලයෙහිය. මෙහි වනාහි ධර්ම චක්‍රයෙහිම දන්නා ලදී.

ඒ ධර්ම චක්‍රය දෙපරිදි වෙයි. ප්‍රතිවේධ ඤාණයද, දේශනා ඤාණයද කියායි. එහි තමන්ගේ ආර්යඵලය ප්‍රකට වන්නා වූ ප්‍රඥාවෙන් උපදවන ලද්දේ ප්‍රතිවේධ ඤාණයයි. ශ්‍රාවකයන්ගේ ආර්යඵලය ප්‍රකට කරන්නා වූ කරුණාවෙන් උපදවන ලද්දේ දේශනා ඤාණයයි. එහි ප්‍රතිවේධ ඤාණය උපදිමින් පවත්නේය. උපන්නේ යයි, දෙආකාර වේ. ඒ ප්‍රතිවේධ ඤාණය අභිනිෂ්ක්‍රමණයෙහි පටන් අරහත් මග තෙක් උපදිමින් පවත්නේයි.

ඵලක්ෂණයෙහි උපන්නේ නම් වෙයි. තුසිත භවනයෙහි පටන් මහාබෝධි පර්යංකයෙහි රහත් මග තෙක් උපදිමින් පවත්නේ වෙයි. ඵලක්ෂණයෙහි උපන්නේ නම් වෙයි. දේශනා ඤාණය ද පැවතෙමින් සිටියේය. පැවැත්තේ යයි දෙපරිදි වෙයි. එය (දේශනා ඤාණය) අඤ්ඤා කොණ්ඩඤ්ඤ ස්ථවිරයන්ගේ සෝවාන් මග තෙක් පැවැත්වෙමින් සිටියේ වෙයි. සෝවාන් පෙලෙහි පැවැත්තේ නම් වේ. ඔවුන් අතුරෙන් ප්‍රතිවේධ ඤාණය ලෝකෝත්තරය. දේශනා ඤාණය ලෞකිකය. මේ නුවණ දෙකම අන්‍යයන් හා අසාධාරණ වූ, බුදුවරයන්ගේම ළෙහි උපන්නා වූ ඔෟරස ඤාණයක් වේ.

දැන් යම් දසබලයකින් සමන්විත වූ තථාගතයන් වහන්සේ ආසභ ස්ථානය ශ්‍රේෂ්ඨ ස්ථානය ප්‍රතිඥා කරන සේක්ද, ආදියෙහිම **දසඛො පනිමානි සාරිපුත්ත තථාගතස්ස තථාගත බලානි** යන්න බැහැර කළේද, එහි විස්තර දැක්වීමට කතමානි දස? **ඉධ සාරිපුත්ත තථාගතො ඨානඤ්ච ඨානතො** ආදිය කීහ. එහි **ඨානඤ්ච ඨානතො** කාරණය ද කාරණය වශයෙන්, කාරණය වනාහි යම්හෙයකින් එහි ඵලය සිටීද? එය අයත් පැවතුම් ඇති බැවින් උපදින්නේත් ද පවතින්නේත් වේද, එහෙයින් ඨාන යයි කියනු ලැබේ. එය භාග්‍යවත්හු, යම් යම් ධර්ම කෙනෙක් යම් යම් ධර්ම කෙනෙකුන්ට ඉපදීම පිණිස හේතු ප්‍රත්‍යය වෙත්ද, ඒ ඒ ස්ථානය, යම් යම් ධර්ම කෙනෙක් යම් යම් ධර්ම කෙනෙකුන්ට ඉපදීම පිණිස හේතු ප්‍රත්‍යය නො වෙත් ද, ඒ ඒ ධර්මය අස්ථානයයි දන්නාහු, ස්ථානය ස්ථානයයි ද අස්ථානය අස්ථානයයි ද සුදුසු පරිද්දෙන් දැනගනී. අභිධර්මයෙහි වනාහි 'තත්‍ථ කතමං තථාගතස්ස ඨානඤ්ච ඨානතො, අට්ඨානතො යථා භූතං ඤාණන්ති' ආදී වශයෙන් විස්තර කරන ලද්දේමය. **යමපි** යම් ඤාණයකින්, **ඉදමපි සාරිපුත්ත!** **තථාගතස්ස** යනු මේ ඨානා ඨාන ඤාණය ද තථාගතයන්ගේ තථාගත බලයෙක් නම් වෙයි යන අර්ථයි. මෙසේ සියලු පදයන්හි යෙදීම දතයුතුයි.

කම්ම සමාදානානං සමාදන්ව කරන ලද කුශලාකුශල කර්මයන්ගේ නොහොත් කර්මයම කර්ම සමාදානයයි. **ඨානසො හෙතුසො** ප්‍රත්‍ය වශයෙන් හා හේතු වශයෙන් එහි ගති, උපධි, කාල, ප්‍රයෝග විපාකයට ස්ථානයයි. කර්මය හේතුයි. මේ ඥානයාගේ විස්තර කථා 'අත්ථෙකච්චානි පාපකානි කම්ම සමාදානානි ගති සම්පතති බාළ්හාන න විපච්චනති' ආදී වශයෙන් අභිධර්මයෙහි විස්තර කර ඇත.

සබ්බත්ථගාමිනී සියලු ගතිගාමිනී වූ ද, අගතිගාමිනී වූ ද, **පටිපදං** මාර්ගය, **යථාභූතං පජානාති** බොහෝ මිනිසුන් එකම සතෙකු මරණ කල්හි, මොහුගේ චේතනාව නිරයගාමිනී වන්නේය. මොහුගේ (චේතනාව) තිරිසන් යෝනි ගාමිනී වේ යයි මෙම ක්‍රමයෙන් එක් වස්තුවෙක්හි ද කුශලාකුශල චේතනා සංඛ්‍යාත වූ ප්‍රතිපත්තීන්ගේ ස්වභාවය වෙනස් නොවන සේ දැනගනී. මේ ඤාණයාගේ විස්තර කථාව ද 'තත්‍ථ කතමං තථාගතස්ස සබ්බත්ථ ගාමිණී පටිපදං යථාභූතං ඤාණං ඉධ තථාගතො අයං මග්ගො අයං පටිපදා නිරයගාමිනී ති පජානාති' ආදී වශයෙන් අභිධර්මයෙහි ආයේය.

අනෙකධාතුං චක්ඛු ධාතුව ආදී හෝ කාමධාතු ආදී හෝ ධාතූන්ගෙන් බොහෝ ධාතු ඇති, **නානාධාතු** ඒ ධාතූන්ගේ විවිධ ලක්ෂණවලින් යුත් විවිධ ආකාරයේ ධාතු ඇති **ලොකං** ස්කන්ධායතන ධාතු ලෝකය **යථාභූතං පජානාති** ඒ ඒ ධාතූන්ගේ වෙනස් නොවන ස්වභාවය අවබෝධ කරයි. මේ ඥානයද 'තත්‍ථ කතමං තථාගතස්ස අනෙක ධාතු නානා ධාතු ලොකං යථාභූතං ඤාණං ඉධ තථාගතො බන්ධනා නාතතං පජානාති' ආදී වශයෙන් අභිධර්මයෙහි විස්තර කෙරේ.

නානාධිමුත්තිකතන්ති හීනාධි අධිමුක්තීන් ද, විවිධ ස්වරූප ඇති අධිමුක්තීන් ද (ඉගැන්වීම්) වන ස්වභාව මේ ඤාණයයි. 'තත්‍ථ කතමං තථාගස්ස සත්තානං නානාධිමුත්ති කථං, යථාභූතං ඤාණං, ඉධ තථාගතො පජානාති, සන්ති සත්තා හීනාධිමුත්තිකා' ආදී වශයෙන් මෙම ඤාණයද අභිධර්මයෙහි විස්තර වශයෙන් සඳහන් වේ.

පරසත්තානං ප්‍රධාන සත්ත්වයන්ගේ, **පරපුග්ගලානං** එයින් අන්‍ය වූ හීන සත්ත්වයන්ගේ, (මේ පද දෙකම එකම අර්ථයයි. ශික්ෂණය වූවන්ගේ වශයෙන් දෙපරිදි වේ.) **ඉන්ද්‍රිය පරෝ පරියත්තන්ති** ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ පරභාවය ද අපරභාවය ද වෘද්ධිය ද හානිය ද යන අර්ථයි. මෙම ඤාණයාගේ විස්තර කථාව 'තත්‍ථ කතමං තථාගතස්ස පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රිය පරෝ පරියත්තං යථාභූතං ඤාණං ඉධ තථාගතො සත්තානං ආසයං ජානාති අනුසයං ජානාති' ආදී වශයෙන් අභිධර්මයෙහි එන්නේය.

ඣාන විමොක්ඛ සමාධි සමාපත්තීනං යනු සතර ධ්‍යානයන්ගේ ද, 'රූපී රූපානිපස්සති' යනාදී වූ අෂ්ට විමෝක්ෂයන්ගේ ද, සවිතක්ක සවිචාරාදී වූ තුන් සමාධීන්ගේ ද, ප්‍රථමධ්‍යාන සමාපත්ති ආදී වූ නව අනුපූර්ව සමාපත්තීන්ගේ ද, **සංකිලෙසං** හානභාගිය ධර්මය. **වොදානං** විශේෂභාගිය ධර්ම, **වුටඨානං** වොදානය ද වුට්ඨාන මැයි. ඒ ඒ සමාපත්තීන්ගෙන් නැගී සිටීම ද වුට්ඨානයයි. මෙසේ කියන ලද ප්‍රගුණ ධ්‍යානය ද භවාංගය ද, ඵලසමාපත්තිහු ද, (වුට්ඨාන මැයි) යම් හෙයකින් හෙට්ඨිම හෙට්ඨිම වූ (යට දිසාවට අදින) ප්‍රගුණ ධ්‍යානය මතු මතු ධ්‍යානයන්ට පදස්ථාන වේද, එහෙයින් වොදානය ද වුට්ඨාන යයි කියන ලදී. නැවත සියළු ධ්‍යානයන්ගෙන් නැගී සිටීම භවාංගයෙන් වේද, නිරොධ සමාපත්තියෙන් නැගී සිටීම ඵල සමවතින් වේද, ඒ සඳහා ඒ ඒ සමාධියෙන් නැගී සිටීම ද වුට්ඨාන යයි කියන ලදී. මේ ඤාණය ද, 'තත්‍ථ කතමං තථාගතස්ස ඣාන විමොක්ඛ සමාපත්තීනං සංකිලෙසං වොදානං වුටඨාන යථාභූතං ඤාණං ඣායති චතතාරෝ ඣායී අත්‍ථිකචෙවා ඣායී, සමාපත්තිං යෙව සමානං විපත්තී ති පවෙචති' ආදී ක්‍රමයෙන් අභිධර්මයෙහි විස්තර කරන ලදී.

සියළු ඤාණයන්ගේ විස්තර කථා පිළිබඳ විනිශ්චය සම්මෝහ විනෝදනී විභංගට්ඨ කථාවෙහි කියන ලද්දේය. පූර්වේ නිවාසානුස්සති, දිබ්බචක්ඛු ඤාණයන් පිළිබඳ විශුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලදී. ආශ්‍රව ක්ෂය කථාව භයභෙරව සූත්‍ර අටුවාවේ විස්තර කර ඇත. **ඉමානි ඛො සාරිපුත්ත** යනු යම් පූර්වයෙහි. **දස ඛො පනිමානි සාරිපුත්ත තථාගතස්ස තථාගත බලානි** යි කීයෙම්ද මේ ඒවායැයි තානිති නිගමනය කරන සේක.

එහි අනෙක් මතයක් ද වේ. දසබල ඥානය යනුවෙන් වෙනම නුවණක් නැත සර්වඥතාඥානයේම ප්‍රභේදයකි. එය එසේ නොදත යුතුය. කවර හෙයින්ද යත්, දශබල ඥානය අනිකකි. සර්වඥතා ඥානය අනෙකකි. දශබල ඥානය තම තමන්ගේම කෘත්‍යයන් දැනගනී. සර්වඥතාඥානය නය එයද එයින් අවශේෂ දේද දැනගනී. දශබල ඤාණයන් අතුරෙහි පළමුවැන්න කාරණා කාරණයම දැනගනී. දෙවැන්න කර්මාන්තරය විපාකාන්තරයම දනී තෙවැන්න කර්ම පරිච්ඡේදයම දනී. සිව්වැන්න ධාතූන්ගේ නානත්වකාරණයම දනී. පස්වැන්න සත්ත්වයන්ගේ අධ්‍යාශය අදිමුත්තියම දනී. සයවැන්න ඉන්ද්‍රියයන්ගේ තියුණු බව, මෘදු බව දනී.

සත්වැන්න ධ්‍යානාදීන් සමගම ඔවුන්ගේ කෙලෙසීම දනී. අටවැන්න පෙර විසූ ස්කන්ධ සංයුතියම දනී. නවවැන්න සත්ත්වයන්ගේ චුති ප්‍රතිසන්ධිය දනී. දසවැන්න සත්‍ය පරිච්ඡේදයම දනී.

සර්වඥතාඥානය වනාහි මොවුන් විසින් දතයුත්තද, එයින් මත්තෙහිද දැනගනී. මේ දශබල ඥානයන්ගේ කෘත්‍ය සියල්ල නො කෙරෙයි. එය ධ්‍යානය වී අර්පනය කරන්නට නොහැකි වෙයි. ඍද්ධිය වී විකුර්වනය කරන්නට නොහැකි වෙයි. මාර්ගය වී කෙලෙස් සංසිඳවන්නට නොහැකි වෙයි.

තවද පරවාදී තෙමේ මෙසේ විමසිය යුතුය. දශබල ඤාණය නම් සවිතර්ක සවිචාරද, අවිචාර විචාර මාත්‍ර ද, අවිතර්ක අවිචාරද? කාමාවචරද, රූපාවචරද, අරූපාවචරද, ලෞකිකද, ලෝකෝත්තරද, කියායි. (හෙතෙම) දන්නේ පිළිවෙළින් ඥානයෝ සවිතර්ක සවිචාරයෝ යයි කියන්නේ ය. එයින් මත්තෙහි දෙදෙන අවිතර්ක අවිචාරයෝ යයි කියන්නේ ය. ආශ්‍රවක්ෂය ඥානය සවිතර්ක සවිචාර වන්නේය. අවිතර්ක විචාර මාත්‍ර වන්නේය. අවිතර්ක අවිචාර යයි කියන්නේය. එසේම පිළිවෙළින් සත්දෙනෙක් කාමාවචරයෝය. දෙදෙනෙක් රූපාවචරයෝය. අවසානයෙහි එකෙක් ලෝකෝත්තර යයි කියන්නේය. සර්වඥතාඥානය වනාහී සවිතර්ක සවිචාරමය. ලෞකිකමයයි කියන්නේය.

මෙසේ මෙහි අනුපද වර්ණනාව කොට මෙවිට යම්හෙයකින් තථාගතයන් වහන්සේ පළමුකොට ස්ථානාස්ථාන ඤාණයෙන් ලෞකික සම්‍යග්දෘෂ්ටි ස්ථානය දන්නා හෙයින් ද, නියත මිථ්‍යාදෘෂ්ටියේ අභාවය දක්නා හෙයින් ද, වෙනෙය ජනයාගේ කෙලෙස් දුරු කිරීමේ අධිගමයට හා අනධිගමයට තැන නොතැන වූ ක්ලෙශාවරණයාගේ අභාවය දක්නේද, නැවත කර්ම විපාක ඥානයෙන් ඔවුන්ගේ ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය දක්නා හෙයින්, විපාකාවරණයාගේ අභාවය දක්නා සේක් ද, සරවත්‍රගාමිනී ප්‍රතිපදා ඥානයෙන් ආනන්තරිය කර්මයන්ගේ අභාවය දක්නා හෙයින්ද, කර්මාවරණයන්හි අභාවය දක්නේ ද, මෙසේ හෙළිදරව් වූ සත්ත්වයන්ට සුදුසු ධර්මදේශනය පිණිස අනේකධාතු නානාධාතු ඥානයෙන් ධාතූන්ගේ වෙනස්කම් දැකීම නිසා චරිත විශේෂයන් දකින්නේ, නැවත ප්‍රයෝගය නොගෙනම ඔවුන්ගේ අදහස කැමැත්ත පරිදි ධර්ම දේශනය පිණිස, නානාධිමුත්තික ඥානයෙන් අදහස දකින්නේ, නැවත කෙසේ දක්නා ලද

කැමැත්ත ඇත්තවුන්ගේ ශක්තිය නො ඉක්මවා, බලය නො ඉක්මවා, දහම් දෙසනු පිණිස, ඉන්ද්‍රිය පරාවර්තා ඥානයෙන් ශ්‍රද්ධාදීන්ගේ තියුණු බව හා මෘදු බව දක්නා හෙයින් ඉන්ද්‍රියයන්ගේ වෘද්ධිය හා හානි බව දක්නේද, යළි මෙසේ දැනගන්නා ලද ඉන්ද්‍රිය පරාවරත්වය ඇති හික්මිය යුතු ජනයෝ දුරුවෙත් නම් ප්‍රථමධ්‍යාන ආදියෙහි වැඩි කැමැත්තක් දක්වන බැවින් සෘද්ධි විශේෂයෙන් වහා ඔවුන් වෙත පැමිණෙන සේක. පැමිණද පෙර කඳපිළිවෙල දන්නා නුවණින් ඔවුන්ගේ පෙර ජාති භාවනාවද, දිවැස හේතුකොට ගෙන පැමිණිය යුතු, චේතෝ පරියාය ඥානයෙන් එකෙණෙහි පැමිණිය යුතු චිත්ත විශේෂය ද, දක්නේය. ආශ්‍රවක්ෂය ඥානයෙන් ආශ්‍රවයන් නැති කිරීමේ ප්‍රතිපදාවෙහි පහ වූ, මුලාව ඇති බැවින් ආශ්‍රවයන් දුරුකිරීම සඳහා ධර්මදේශනා කරන සේක් ද, එහෙයින් මේ පිළිවෙළින් මේ දශබලයෝ කියන ලද්දේ යයි දතයුතු.

තං වාචං අපපහාය යනාදී තන්හී නැවත මෙබඳු වචනයක් නො කියමියි කියන්නේ වචනය දුරු කෙරෙයි නම් වේ. නැවත මෙබඳු සිතක් නූපදවමියි සිතන්නේ සිත දුරු කෙරෙයි නම් වේ. නැවත මෙබඳු දෘෂ්ටියක් නොගන්නෙමියි දුරුකරන්නේ දෘෂ්ටිය බැහැර කරයි නම් වේ. එසේ නොකරන්නේ දුරු නොකරයි. බැහැර නොකරයි. යම්සේ නිරය පාලකයන් විසින් ගෙනවුත් නිරයෙහි තබන ලද්දේ, එපරිද්දෙන් නිරයෙහි තබන ලද්දේම වේයයි දතයුතු.

මෙවිට අර්ථසාධක උපමාවක් දක්වන්නේ **සෙය්‍යථාපි** යනාදිය වදාළහ. එහි සීලසම්පන්නෙනා යනාදී තන්හි ලෞකික ලෝකෝත්තර සීල සමාධි ප්‍රඥා දතයුතුය. ලෝකෝත්තර වශයෙන් විනිවර්තනය ද කරන්නට වටී. මෙතෙමේ 'යහපත් වචන, කර්මාන්ත, ආජීවයන්ගෙන් සීල සම්පන්න වෙයි. යහපත් උත්සාහය සිහිය හා සමාධීන්ගෙන් සමාධි සම්පන්න වෙයි. නිවැරදි දෘෂ්ටි හා සංකල්පයන්ගෙන් ප්‍රඥා සම්පන්න වෙයි. මෙසේ සීලාදියෙන් සම්පූර්ණ වූ ඒ මහණ තෙම දිටෙයව ධම්මෙ මෙම ආත්ම භාවයෙහිම **අඤ්ඤං** ආරාමෙති රහත්බවට පැමිණේද, **එවං සම්පදමිදං සාරිපුත්ත** වදාමි මේ කාරණයද මෙබඳුමැයි. මෙසේ මාර්ගයට අනතුරුව නොවරදවාම ඵලය උපදී ද, එපරිද්දෙන් මේ පුද්ගලයාගේ ද චුතියට අනතුරුව නොවරදවාම නිරයහි ප්‍රතිසන්ධිය වේයයි දක්වයි. සියළු බුද්ධ වචනයෙහි මෙම උපමාවට වඩා දැඩිතර කොට දැක්වූ උපමාවක් නම් නැත.

වෙසාරජජානිති මෙහි නොබුහුටි බවට විරුද්ධ වූයේ වෙසාරජ්ජ නම් වෙයි. සතර තැන්හි ශාරද්‍යයාගේ අභාවය ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට උපන් සොම්නස්මය නුවණට නමකි. **සම්මා සම්බුද්ධස්ස තෙ පටිජානතො මම සම්මා සම්බුද්ධයෙමි.** සියළු ධර්මයන් මා විසින් අවබෝධ කරගන්නා ලදී. මෙසේ ප්‍රකාශ කරන්නා වූ, ඔබ විසින් අනභිසම්බුදධා මෙනම් ධර්මයෝ ඔබ විසින් අවබෝධ නොකරන ලද්දේය. **තත්‍ර වත ඒ** අනහි සම්බුද්ධයයි. මෙසේ දක්වන ලද ධර්මයන්හි **සහධම්මෙන** හේතු සහිත වූ කරුණු සහිත වූ වචනයෙන් සුනකඛතතයා මෙන් විප්‍රලාප කියන්නාහු අප්‍රමාණය. **නිමිත්තතා මෙතං** යන මෙහි පුද්ගලයා ද ධර්මය ද 'නිමිත්ත' අදහස් කරන ලදී. යමෙක් මට විරුද්ධව චෝදනා කරන්නේ ද ඒ පුද්ගලයා නොදකිමි. යම් ධර්මයක් දක්වා මේ ධර්මය ඔබ විසින් අවබෝධ කරගෙන නැතැයි මට ප්‍රතිචෝදනා කරන්නේද ඒ ධර්මයද නොදකිමි යනු මෙහි අර්ථයි. **ඛෙමප්පතෙතා** ක්ෂේමයට පැමිණියේ සෙසු පද දෙකම මේ පදයේම පරියාය වචනයි.

මේ සියල්ල වෛසාරද්‍ය ඤාණය සඳහාම වදාරණ ලදී. 'මේ නම් ධර්මය ඔබ විසින් අවබෝධ කරගෙන නැතැයි' චෝදනා කරන පුද්ගලයෙක් හෝ චෝදනා කාරණයක් හෝ අවබෝධ නො කළ ධර්මයක් හෝ නොදක්නා වූ දසබලයන් වහන්සේට ඒකාන්ත ස්වභාවයෙන්ම බුද්ධ වූයේ ම 'මම බුද්ධ වෙමි'යි කියමි යි ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට බලවත් සොම්නසක් උපදී. ඒ සෝමනස්ස හා යෙදුනා වූ ඥානය වෛශාරද්‍ය නම් වෙයි. ඒ සඳහා ඛෙමප්පතෙතා යනාදිය වදාළහ. මෙසේ සියළු තන්හි අර්ථ දතයුතුයි.

අනතරායිකා ධම්මා මෙහි අන්තරාය කෙරෙත්නුයි අන්තරායිකා නම් වේ. ඔවුහූ අර්ථ හෙයින් දැන දැන ඉක්මවන ලද සප්ත ආපත්ති ස්කන්ධයෝයි. දැන දැන ඉක්මවන ලද යටත් පිරිසෙයින් දුකුළා දුර්භාෂිතයක් වුවද මාර්ග ඵලයන්ට අන්තරාය කරයි. මෙහි වනාහි මෛථුන ධර්මය අදහස් කරන ලදී. මෙවුන්දම් සෙවුනා වූ යම් කෙනෙකුට නිසැකයෙන් ම මාර්ග ඵලයන්ට අන්තරාය කර වේ. **යසස ඛො පන තෙ අත්ථාය රාගාදී කෙලෙස් ධර්ම ක්ෂය කිරීම් අතුරෙන් යමක් යමක් පිණිස ධම්මො දෙසිතොති** අශුභ භාවනාදී ධර්මය වදාරන ලද ද **තත්‍ර වතමං** ඒ අනෛර්යානික ධර්මය මට ඉතිරිය කී ආකාරයෙන්ම දතයුතු.

අථ ඛො ඉමෙ සාරිපුතත මෙය කුමක් සඳහා ආරම්භ කළේද? වෛසාරද්‍ය ඥානයාගේ බලය දැක්වීම පිණිසය. යම් සේ වියත් පිරිසක් මැදට පැමිණි උගතුන්ගේ සිත් ගැනීමෙහි සමත් වූ කථාවෙන් ධර්ම කථිකයාගේ දක්ෂතාවය පෙනේද? මෙසේ මෙම අට පිරිස කරා පැමිණ වෛශාරද්‍ය ඥානයාගේ විශාරද බව දැකගන්නට හැකිවේනුයි වෛශාරද්‍ය ඤාණයාගේ බලය දක්වන සේක් අථ ඛො මො සාරිපුතතා යනාදිය වදාළහ.

එහි ඛතතිය පුරිසා ක්ෂත්‍රියයන් රැස්ව හුන් තැන සෑම තන්හිම මෙම ක්‍රමයමැයි. මාරකායික දෙවියන් රැස්ව හුන් තැන, **මාරපරිසා** යයි දතයුතුය. මාරයන් නොවේ. තව ද මේ සියලු පිරිස්ම උග්‍ර වූ ස්ථානයක් දැක්වීම් වශයෙන් ගන්නා ලදී. මිනිස්සු මෙහි රජතුමා හුන්නේයයි ප්‍රකෘති වචනය පවා කියන්නට නොහැකි වෙයි. දෙකිසිල්ලෙන් දහදිය වැගිරෙත්. මෙසේ ක්ෂත්‍රිය පිරිස උග්‍රයි. බමුණෝ ත්‍රිවේදයෙහි දක්ෂයෝ වෙති. ගෘහපතියෝ විවිධ ව්‍යවහාරයන්හි ද, අක්ෂර චින්තාවෙහි ද (දක්ෂ) වෙති. ශ්‍රමණයෝ ස්වවාද හා පරවාදයන්හි දක්ෂ වෙත්. ඔවුන් මැද ධර්මදේශනා කිරීම නම් ඉතා බැරෑරුම්ය. අමනුෂ්‍යයෝ ද බොහෝ වෙති. අමනුෂ්‍යයන් යයි කී ඇසිල්ලෙහිම සියලු සිරුරු කම්පා වෙයි. ඔහුගේ රූපය දැක හෝ ශබ්දය අසා හෝ සත්ත්වයෝ සිහි නැතිවෙත්. මෙසේ අමනුෂ්‍ය පිරිසද බොහෝ විය. ඒ පිරිස මැද ධර්මදේශනය ද ඉතා බැරෑරුම්ය. මෙසේ උග්‍ර වූ ස්ථාන දැක්වීම් වශයෙන් ඒ පිරිස් ගත්තේ යයි දතයුතු.

අඤ්ඤාගාහති ඇතුළත පිවිසෙයි. **අනෙකසතං ඛතතිය පරිසං** බිම්බිසාර සමාගම, ඤාති සමාගම, ලිච්ඡවි සමාගම සමාන වූ (සමාගම්) අන් සක්වළද ලැබේ. කිමෙක්ද භාග්‍යවතුන් වහන්සේ අන් සක්වළ වලටත් යන සේක්ද, එසේය යති. කෙබඳුවද, ඔවුහු යම්බඳු වූයේද එබඳුවම යත්. එහෙයින් වදාළහ. මම යම්කිසි සියගණන් ක්ෂත්‍රිය පිරිස් කරා එළඹුන බව දනිමි. එහි ඔවුන්ගේ යම්බඳු වර්ණයක් වීද මාගේ ද එබඳු වූ වර්ණයම වෙයි. ඔවුන්ගේ යම්කිසි ස්වරයක් වේද මාගේ ද එබඳුම ස්වරය වෙයි. දැහැමි කථාවෙන් දක්වමි. -පෙ- සතුටු කරවමි. කථා කරන්නා වූ මා (හා) කවරෙක් කථා කෙරේද දෙවියෙක් හෝ මිනිසෙක් හෝ දැයි නො දනිති. යළි දැහැමි කථාවෙන් කරුණු දක්වා -පෙ- සතුටු කරවා අතුරුදහන් වෙමි. අතුරුදහන් වූ ද මා මේ කවරෙක් අතුරුදහන් වූයේද දෙවියෙක් හෝ මිනිසෙක්දැයි නොදනිත්.

ක්ෂත්‍රියයෝ වළලු අඟු පළඳනා මල් ගඳ ආදියෙන් සැරසුණාහූ විවිධ වර්ණ වස්ත්‍ර ඇත්තාහු පළන් මිණිකොඩොල් ඇත්තාහූ මුහුළු දරන්නාහු වෙති. කිම භාග්‍යවතුන් වහන්සේ ද එපරිද්දෙන් සැරසෙත්ද? තව ද ඔවුහූ සුදු වූවාහු කළු වූවාහූ වගුරුවන් සිවි ඇත්තාහු වෙති. කිම ශාස්තෘන් වහන්සේත් එබඳු වෙත්ද? ශාස්තෘන් වහන්සේ තමන්ගේ පැවිදි වෙසින්ම වඩියි. එසේ වුවත් ඔවුන්ට එබඳුම වැටහෙත්. ගොස් රාජාසනයෙහි හුන්නාහූ තමන් දක්වති. ඔවුන්ට අපේ රජ්ජුරුවෝ වෙසෙසින් බබළතියි සිත්වෙයි. ඔව්හූ සිඳුණු ස්වර ඇත්තාහු බැඳුණු ස්වර ඇත්තාහූ කාක ස්වර ඇත්තාහු වෙති. තථාගතයෝ බ්‍රහ්ම ස්වරයෙන්ම බණ වදාරති. **තාදිසකො මයහං සරෝ** මෙය වනාහි භාෂාන්තරය සඳහා කියන ලදී. මිනිස්සු ඒ අසා අද රජතුමා මිහිරි හඬින් කථා කරතියි සිතයි. තව ද භාග්‍යවතුන් වහන්සේ බණ වදාරා ආපසු නික්මගිය කල්හි, යළි ආවා වූ රජු දැක මොහු කවරෙක්දැයි විමති උපදියි. මෙය කියන ලදී. මේ ස්ථානයෙහි මෙවිටම මගද බසින් සිංහල බසින් මිහිරි හඬින් කථා කරමින් අතුරුදහන් වූයේ කවරෙක්ද? කිම දෙවියෙක් ද, මිනිසෙක්ද? කුමක් පිණිස මෙසේ නොදත්තවුන්ට දහම් දෙසත්ද? වාසනාව පිණිසය. මෙසේ අසන ලද ධර්මය අනාගතයෙහි ප්‍රත්‍යයම වේ යයි අනාගතය සඳහා දේශනා කරන සේක.

සනනිසිනන පුබබනති එක්ව හුන් පරිදිය. **සල්ලපිත** පුබ්බ ආලාප සල්ලාප කළ පරිදිය. **සාකච්ඡාති** 'ධර්ම සාකච්ඡා පැමිණෙන ලද විරූය. **අනෙකසතං බ්‍රාහමණ පරිසමපි** යනාදීන්ගේ සෝමදණ්ඩ සමාගම ආදී වශයෙන් ද අන්‍ය චක්‍රාවාට වශයෙන් ද ස්වභාවය දතයුතුය.

චතසෙසා ඛො ඉමෙ සාරිපුත්ත යොනියෝ මෙහි යොනි යනු ස්කන්ධ කොට්ඨාශයකට ද, කාරණයට ද, ප්‍රසව මාර්ගයට ද නමකි. චතසෙසා නාගයොනියෝ චතසෙසා සුපණ්ණ යොනියෝ ආදී තැන්වල ස්කන්ධ කොට්ඨාශයෝම යෝනි නම් වේ. යෝනි හෙසා භූමිජ ඵලසස අධිගමාය යන මෙහි කාරණයයි. නවාහං බ්‍රාහමණ බ්‍රූමි යොනිජං මතති සමභවං මෙහි ප්‍රසව මාර්ගය 'යොනි' යයි අදහස් කෙරේ. එහි බිජුවටෙහි උපන්නාහු **අණ්ඩජ** නම් වෙති. දළබුවෙහි උපන්නාහු **ජලාබුජ** නම් වෙති. වැදෑමසෙහි උපන්නාහූ **සංසෙදජ** නම් වෙති. මේ හැර උපදින්නාහු **ඕපපාතික** නම් වෙති. **අභිනබභිජජ ජායනති** බිඳ නික්මීම් වශයෙන් උපදිත්. **පූති කුණාපෙවා** යනාදීහු වනාහි අනිෂ්ට වූවාහුම දක්වන ලදී. එතකුදු

වුවත් ඉෂ්ට වූ ද ගිතෙල් තලතෙල් - මීපැණි ආදීන්හි සත්ත්වයෝ උපදිත්මැයි.

දෙවා යනාදියෙහි චාතුර්මහා රාජිකයෙහි පටන් මත්තෙහි දෙවිවරු ඕපපාතික වෙති. භූමාටු දෙවියෝ වනාහි සිව්යෝනි වෙති. **එකචෙව මනුසසා** මිනිසුන් අතුරෙන් කිසිවෙක්ම ඕපපාතික වෙති. මොව්හු වනාහි බොහෝසෙයින් ජලාබුජයෝමය. කුන්තක පුත්‍ර වූ දෙබෑ තෙරුන් මෙන් අණ්ඩජයෝ ද වෙත්. පියුම්ගැබ උපන් පොක්ඛරසාති බ්‍රාහ්මණ හා පද්මාවතී දේවී ආදීන් මෙන් සංසේදජයෝ ද වෙත්. විනිපාතිකයන් අතුරෙහි නිජඣාම තනහික ප්‍රේතයෝ නිරිසතුන් මෙන් ඕපපාතිකයෝමයි. සෙස්සෝ සිව්යෝනි ඇත්තාහු ද වෙත්. ඔවුන් යම්සේ ද යක්ෂයෝ ද සියලු සිවුපාවුන්, පක්ෂි ජාති - දීර්ඝ ජාති ආදී වූ සියල්ලෝ සතරයෝනි ඇත්තාහුමය.

පංච බො ඉමා සාරිපුත්තගතියො යන මෙහි මනාව කළ කර්ම හා නපුරුකොට කළ කර්ම වශයෙන් යා යුතු වන්නේ යයි ගති නම් වේ. තවද ගති ගති, පවත්නා ගති, අධ්‍යාශය ගති, විභව ගති, නිෂ්පත්ති ගති යයි ගතිය බහුවිධ වන්නීය. එහි කං ගතිං පෙචචගචඡාමියි ද, යසස ගතිං න ජානතති දෙවා ගන්ධබ්බ මනුසසා යි ද, මොව්හූ 'ගති ගති' නම්. ඉමෙසං බො අහං භික්ඛූනං සීලවනත්තානං නෙව ජානාමි ගතිං වා ආගතිං වා යන මොව්හූ 'නිබ්බනති ගති' නම්. එවමපි බො තෙ අහං බ්‍රහම ගතිඤ්ඤව පජානාමි චුතිඤ්ඤව පජානාමි යන මොව්හූ **අජඣාසයගති'** නමු. විභවො ගති ධම්මානං නිබ්බානං අරහතො ගති යන මොව්හු 'විභව ගති' නමු. දෙව එව ගතියො භවනති අනඤ්ඤා යන මොවුහු 'නිපවතතිගති' නමු. ඔවුනතුරෙන් මෙහි 'ගති ගති'ය අදහස් කරන ලදී.

නිරයො යනාදියෙහි ආශ්‍රාවන් නැති අර්ථයෙන් ද, ආශ්වාද රහිත අර්ථයෙන් ද 'නිරය' නම් වේ. සරසට ගියේනුයි 'තිරචඡාන' නම් වේ. ඔවුන්ගේ යෝනිය **තිරචඡාන යෝනි** වේ. ප්‍රේතභාවයට පැමිණියවුන්ගේ විෂයනුයි. **පෙතති විසය** නම් වේ. මනසින් උත්සන්න බැවින් **මනුසසා** නම් වේ. පංචකාමයන් නිසා ද තම තමන්ගේ ආනුභාවයෙන් ද ක්‍රීඩා කෙරෙත්නුයි දෙව නම් වේ. **නිරයඤ්ඤවාහං සාරිපුතත** යනාදියෙහි **නිරයො** යනු අවකාශය සමග ස්කන්ධයෝයි. **තිරචඡාන යොනිඤ්ඤව** ආදියෙහි මෙම න්‍යායමැයි. **මගගං පටිපදං** යන දෙකින් ම ඒ ඒ ගතිය පිණිස

පවත්නා වූ කර්මයම දක්වයි. යථා පටිපනෙනා යම් මාර්ගයකින් යම් ප්‍රතිපදාවකින් පිළිපන්නේ යයි දෙකම එකක් වශයෙන් ගෙන දක්වයි. අපායං යනාදියෙහි වැඩීම් වශඃයන් හෝ සුව විඳීම් වශඃයන් අයයෙන් පහවූ බැවින් අපාය නම් වෙයි. දුකට ගතිය පිළිසරණතුයි දුගගති නම්. දුෂ්කර කාර්යයන් මෙහි විවසව වැටෙත්නුයි විනිපාත නම්. නිබබාණඤචාහං යන මෙහි හුදෙක් ගතියම නොවේ. ගති නිස්සරණය (ගතියෙන් වැළකීම) වූ නිවන ද දනිමියි දක්වනු පිණිස වදාළහ. මෙහි මගෙහා, පටිපදා යන දෙකින්ම ආර්ය මාර්ගයම කියන ලද්දේය.

දැන් කියන ලද ස්ථානයන්හි තමන්ගේ ඤාණය පවත්නා ආකාරය දක්වන්නේ ඉදානි සාරිපුතත ආදිය කීහ. එහි එකනත දුකඛාති නිත්‍යයෙන් දුක් වූ නිරන්තරයෙන් දුක් වූ තිපපා බහුල වූ, කටුකා රළු වූ සෙය්‍යථාපි යනාදිය සමානකම දැක්වීම පිණිස වදාරණ ලදී. එහි කාසූ යන්නෙන් වළඳ රැස ද කියනු ලැබේ.

කිනනු සනතර මානොව - කාසු ඛණසි සාරථී
පුථෙථා මෙ සමම අකඛාහි - කිං කාසුයා කරිසස සි

එම්බා රියැදුර, කුමක් හෙයින් වළ සාරයිද? යහළුව, වළෙන් ඔබට කවර ප්‍රයෝජනයක් දැයි අසන මට පිළිතුරු දෙනු මැනවි.

මෙහි කාසු නම් ආවාටයයි වළයි.

අංගාර කාසුං අපරෙ පුණනති
නරා රුදනතා පරිදඩඪ ගතතා

අනෙක් මිනිස්සු හඬන්නාහු හාත්පසින් දැවුණු සිරුරු ඇත්තාහු අඟුරු රැස විසුරුවත්.

එහි 'කාසු' නම් රාශියයි. මෙහිද ආවාට 'වළ' අදහස් කරනු ලැබේ. එහෙයින් කියන ලදී. සාධික පොරිසං පුරංගාරානං යනු අධිකයක් සහිත වූ පුරුෂ ප්‍රමාණය මොහුට ඇත්තේනුයි සාධික පොරිසං පුරංගාරානං යනු වේ. අතිරේක වූ පස්රියනක් යනු අර්ථයි. විචචිකානං වීතධුමානං යන මෙය පරිදාහයේ බලවත් බව දැක්වීම පිණිස කියන ලදී. ගිනිසිල

හෝ දුම ඇති කල්හි වාතය හටගනී. එහෙයින් පරිදාහය බලවත් නොවේ. **සමම පරතො** ග්‍රීෂ්මය අනුව ගියේ **තසිතො** යනු හටගත් තෘෂ්ණා ඇත්තේ, **පිපාසිතො** දිය බොනු කැමැත්තේ, **එකාසනො මගෙගා නාති** එකම මගකින්ම. **පිළිවෙළින්** යා යුතු වූ දෙපැත්තේම නිරතුරුවම කටු රුක්වලින් ගහණ වූ **පණිධායා** අඟුරුවල ප්‍රාර්ථනාවක් නැත්තේම ය. අඟුරුවළ අරභයා ඉරියව් පිහිටවන ලද බැවින් මෙසේ කියන ලදී.

එවමෙව ඛො යන මෙහි මේ සමානකම සැසඳීමයි. අඟුරුවළ මෙන් නිරය දතයුතු, අඟුරුවළට යන මග මෙන් නිරයට පැමිණෙන කර්මය ද, මගට බැසගත්තහු මෙන් කර්මයෙන් යුක්ත පුද්ගලයා ද, ඇස් ඇති පුද්ගලයා මෙන් දිවැස් ඇති භාග්‍යවතුන් වහන්සේ ද, යම් සේ ඒ පුද්ගලයා ගමන් ගන්නා දැක මේ පුද්ගලයා මේ මගින් ගොස් අඟුරුවළට වැටෙන්නේ යයි දැනගනී ද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ ප්‍රාණඝාතාදීන් අතුරෙන් යම්කිසි කර්මයක් රැස් කරන්නේ මොහු මෙම කර්මය කොට කොහේ උපදින්නේදැයි ආලෝකය විහිදුවා දිවැසින් බලන්නේ නිරයෙහි උපදින බව දකියි. පංචවිධ බන්ධනාදී මහා දුක් විඳින්නාහු දක්නා සේක. තවෙකක් ඇත. ඔහු එහි (මිනිස්ලොව) කර්ම රැස්කරන කාලයෙහි ඔහුගේ වර්ණය අනිකෙක. නිරයෙහි උපන් කාලයෙහි වර්ණය අනිකෙක. එකල්හිත් ඒ සත්ත්ව තෙමේ කර්මයකොට එහි (නිරයෙහි) උපන්නේ යයි බලන්නා වූ භාග්‍යවතුන් වහන්සේට නොයෙක් දහස් ගණන් සත්ත්වයන් මධ්‍යයෙහි සිටියේ නමුත් 'මේ හෙතෙමේ' යයි ඒ සත්ත්වයාවම හඳුනාගැනීමට හැකිවෙයි. දිවැස්හුගේ ඵලය නම් එයයි.

දෙවැනි උපමාවෙහි යම්හෙයකින් අඟුරු වළෙහි මෙන් ගැඹුරු කුපයෙහි දැවිල්ලක් නැත්ද එහෙයින් **එකනත අදුකඛා** යයි නො කියා **දුකඛා** යනාදිය කීහ. මෙහි ද පළමු ක්‍රමය මෙන් ම සමානකම සසඳන බව දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ මේ පුද්ගලයා ද හස්ති යෝනි ආදියෙහි යම්කිසි තැනෙක උපන්නහු වධ බන්ධන, ඇදීම ඉදිරියට ඇදීම පසුපසට ඇදීම ආදී වශයෙන් මහත් වූ දුක්විඳින බව දකින්නේම ය.

තුන්වැනි උපමාවෙහි **තනුපතත පලායො** යනු වලා පටලයක් මෙන් නොව, තුන් පත්‍ර ඇත්තේ, ඒ ගස විරල වූ, කොළ ඇති බව දැක්වීම සඳහා වදාරන ලදී. **කබරවජායො** විරල වූ සෙවන ඇත්තේ **දුකඛ**

බහුලො ප්‍රේත විෂයෙහි දුකම බහුල වේද මද වූ සැපයම චින්ද යුතු වේ. මෙය ද පෙර කී ආකාරයෙන්ම සමානකම් සැසඳිය යුතු වේ.

සතරවැනි උපමාවෙහි බහලපතත පලායො බහුල වූ කොළ ඇත්තේ, කොළවලින් ගැවසීගත්තේ, සඳුචජායො පහණ සතක් මෙන් සණ වූ සෙවන ඇත්තේ සුබබහුලා වෙදනා මිනිස් ලොව ක්ෂත්‍රිය කුල ආදී සැප බහුල වූ වේදනාවේ විඳිය යුත්තාහු වෙති. ඒ සුව වේදනා විඳීමෙන් උන්නා වූ හෝ හොත්තා වූ හෝ (අය) දකින්නෙමියි දක්වයි. මෙහි ද උපමා සංසන්දනය පෙර පරිදිම දතයුතුයි.

පස්වැනි උපමාවෙහි පාසාදො දීර්ඝ ප්‍රාසාදයක්, උල්ලිත්තාවලිත්තං ඇතුළත හා පිටත හුණු ආලේප කළ, එුසසිතගගලං මනාකොට වසන ලද දොර ජනෙල් ඇති, ගොනකත්ථතො අඟල් සතරක් පමණ දික් වූ ලොම් ඇති කොඳු පලසින් අතුරන ලද පටිකත්ථතො එළුලොම් මුවා සුදු ඇතිරියෙන් අතුරන ලද, පඨලි කත්ථතො සන වූ සුප් ඇති එළුලොම් මුවා සුදු ඇතිරියෙන් අතුරන ලද, කදලි මිග පවර පවත්ථරණො කෙසෙල් මුවසම් මුවා උතුම් පසතුරුණෙන් අතුරන ලද, යන අර්ථයි. ඒ පසතුරුණු සුදු වතක් මතුයෙහි කෙසෙල්මුව සම් අතුරා මසා නිම කෙරෙත්ල. ස උභතරවජාදො උඩුවියන් සහිත වූ මතුයෙහි බඳනා ලද රතු වියන සමග යන අදහසයි. උභතො ලොහිතකූපධානො ශීර්ෂෝපධානයද පාදොපධානය ද පර්යංකයෙහි තබන ලද රතු කොට්ට ඇති, මෙහිද උපමා සැසඳීම පළමු පරිද්දෙන් ම බෙදා දතයුතුයි.

දැන් කියනු ලබන්නේ පසුභාගයෙහි අර්ථ යෝජනාවයි. මේ පුරුෂයා ඒ මගින්ම ගොස් ප්‍රාසාදයට නැගී කුළුගෙට පිවිස පර්යංකයෙන් හිඳින්නේ හෝ නිදන්නේ හෝ දැනගනීද, එසේ මේ අයුරින්ම භාග්‍යවතුන් වහන්සේ දානාදී පුණ්‍යක්‍රියා අතුරෙන් යම්කිසි කුසල කර්මයක් රැස්කරන්නා වූ මේ පුද්ගලයා දැක, මේ තෙමේ මේ කර්මය නිසා දෙව්ලොව උපදින්නේ යයි දැනගනී. යම්සේ ඒ පුරිස තෙම මෑත භාගයෙහි ඒ ප්‍රාසාදයට නැග කුළුගෙට පිවිස පර්යංකයෙන් හුන්නේ ඒකාන්තයෙන් සැප වූ නිරන්තරයෙන් සැප වූ වේදනාවන් විඳින්නාහු දකීද? එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ මෑත කාලයෙහි ඒ පුරුෂයා කුශලකර්ම කොට කොහි උපන්නේදැයි ආලෝකය විහිදා දිවැසින් බලන්නේ දෙව්ලොව

ඉපිද නන්දන වන ආදියෙහි දිව්‍ය අප්සරා සමූහයන් පිරිවරා දිව සැපත් විඳින අයුරු දක්නා සේක.

ආශ්‍රවක්ෂයකර වාරයෙහි දිබ්බන චක්ඛුනායි නොකියා තමෙනං පසසාමි කියන ලදී. ඒ කුමක් හෙයින්ද? නියමයක් නැති හෙයිනි. මේ පුද්ගලයා දිවැසින් දකියි. චේතෝපරියාය ඤාණයෙන් ද දැනගනී. සර්වඥතා ඥානයෙන් ද දැනගනිත්. එකනත සුඛා වෙදනා යන මෙය කිසිසේත් දෙව්ලොව සැප සමග ව්‍යඤ්ජන හෙයින් එකය. එසේ වුවද අර්ථ වශයෙන් විවිධ වෙයි. දෙව්ලෝ සුවය රාග පරිදාහ ආදිය ඇති බැවින් අනිවාර්යයෙන් ම ඒකන්ත සුව නොවේ. නිවන්සුවය වනාහි සියළු පරිදාහයන් ව්‍යුපසමනය කරන හෙයින් ඒකාන්ත සුවය වේ. උපමාවෙහි ද ප්‍රාසාදයෙහි ලා 'ඒකත්තසුඛ' යයි යමක් කියන ලද ද, එය මාර්ග පරිදාහය නොසන්සුන් බැවින් ද, බඩසයින් පෙළුන බැවින් ද, පවසින් මඩනා ලද බැවින් ද, ඒකාන්තයෙන් ඒකන්ත සුඛ නොවේ. එසේ වුවත් වනලැහැබෙහි පොකුණට බැස දූවිලි සෝදා හළ බැවින් ද, ගමන් වෙහෙස සන්සිඳුණු බැවින් ද, නෙළුඹුදැලි කෑමෙන් හා මිහිරි දිය බීමෙන් සා පවස සන්සිඳුණු බැවින් ද, දියසළුව පෙරළා දුහුල් පටපිළිය හැඳ, සහල් ථවිකාව හිස්දොර තබා, දියසළුව මිරිකා ලෙහි තබා මද මද සුළඟින් විඩා සන්සිඳුවන බැවින් හැම අතින්ම ඒකාන්ත සුව නම් වේ.

එවමෙව ඛො යන මෙහි උපමා උපමේය සන්සන්දනය මෙසේය. ආර්ය මාර්ගය පොකුණ මෙන් දතයුතුය. පොකුණට යන මග මෙන් පූර්වභාග ප්‍රතිපදාව ද, මග බැසගත්තහු මෙන් ප්‍රතිපදාවෙන් යුත් පුද්ගලයාද, ඇස් ඇති පුරුෂයා මෙන් අනාවරණ වූ පසැස් ඇති භාග්‍යවතුන් වහන්සේද, වනලැහැබ මෙන් නිවනද (දතයුතු) යම්සේ ඒ පුරුෂයා මගට බසිනු දැකම, මෙතෙමේ මේ මගින් ගොස් පොකුණෙහි නා සිත්කළු වූ වනලැහැබෙහි රුක්මුල හිඳින්නේ හෝ නිදන්නේ හෝ යයි දැනගනීද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ, පිළිවෙත් පුරන්නහුම . නාමරූපයන් පිරිසිඳින්නහුම, ප්‍රත්‍යය පරිග්‍රහ කරන්නහුම ලක්ෂණාරම්මනයෙහි විදර්ශනා කර්ම කරන්නෙහි යයි දනියි. මෙතෙමේ මෙම ප්‍රතිපදාව පුරා සියළු ආශ්‍රවයන් ක්ෂය කොට 'අනාසවං චෙතො විමුතතිං පඤ්ඤා විමුතති' යන මෙසේ කියන ලද ඵලසමාපත්තියට පැමිණ වාසය කරන්නේ යයි දැනගන්නේය. යම්සේ ඒ පුරුෂයා සවස් භාගයෙහි ඒ පොකුණෙන් නහා වන ලැහැබට පිවිස හිඳින්නේ හෝ හොවින්නේ ඒකාන්ත වූ සැපවේදනා විඳින්නේ යයි

දකීද? එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ මෑතභාගයෙහි ඒ පුද්ගලයා පිළිවෙත් පුරා මාර්ගය වඩා ඵලය ප්‍රත්‍යක්ෂකොට නිරෝධ නමැති උතුම් වූ යහන්ගත වූවහු නිවන් අරමුණුකොට ඇති ඵලසමාපත්තියට පැමිණ, ඒකාන්ත සැප වූ වේදනාව විඳින්නහු දක්නා සේක.

අභිජානාමි ඛො පනාහං සාරිපුතත - චතුරංග සමන්නාගතං යන මෙය කුමක් අරභයා කියන ලද ද? වෙනම අනුසන්ධි වශයෙන් ආරබ්ධයහ. මේ වනාහි සුනකඛතත දුෂ්කර ක්‍රියාවෙන් ශුද්ධිය වේයයි කියන පිළිගැනීම ඇත්තේල. එහෙයින් ඔහුට භාග්‍යවතුන් වහන්සේ මා විසිනුදු එක් ආත්ම භාවයක සිට චතුරංගයෙන් සමන්විත වූ දුෂ්කරක්‍රියා කරන ලද, දුෂ්කරක්‍රියා කරන්නවුන් අතරින් නම් මා හා සමානයෙක් නැත. දුෂ්කර ක්‍රියාවෙන් ශුද්ධිය ඇතිවන්නේ නම් මම ම ශුද්ධ වූවෙක් වන්නෙමි යි දැක්වීමට මේ දේශනාව ආරම්භ කළේය.

තව ද මේ සුනකඛතත තෙම දුෂ්කර ක්‍රියාවෙහි ප්‍රසන්න වූවෙක. ඔහුගේ ඒ ප්‍රසන්න භාවය අදදසා ඛො භගවව සුනකඛතෙතා ලිචඡවි පුතෙතා අචෙලකං කොරකඛතතිකං චතුකුණ්ඩිකං ඡමානිකිණණං භකඛාසං මුඛෙනෙව ඛාදනතං මුඛෙන භුඤජනතං දිසවානසස එතදහොසි. සාධුරූපො වතහො අරහං සමණෙ චතුකුණ්ඩිකො ඡමානිකිණණං භකඛාසං මුඛෙනෙ ඛාදති මුඛෙන භුඤජති ති මේ ආදී වූ පාටික සූත්‍රයෙහි ආ පිළිවෙළින් දතයුතු. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙතෙමේ ද දුෂ්කර ක්‍රියාවෙහි ප්‍රසන්න වූවෙක. මා විසින් ද එක් ආත්ම භාවයක සිට සිව්රහින් යුත් දුෂ්කර ක්‍රියාව කරන ලද, දුෂ්කර ක්‍රියාවෙහි පහදනා වූ මොහු විසින් මා කෙරෙහි පැහැදිය යුතු වන්නේ ය. ඔහුගේ ඒ ප්‍රසාදය මා කෙරෙහි නැතැයි දක්වන්නාහු ද මේ දේශනාව ආරම්භ කළහ.

එහි බ්‍රහමචරියං යනු දානය ද, වතාවත් ද, ශික්ෂාපද ද, බ්‍රහ්ම විහාරය ද, ධර්ම දේශනාව ද, මෛථුන විරතිය ද, ස්වදාර සන්තෝෂය ද උපෝසථය ද, ආර්ය මාර්ග ද, මුළු සසුන ද, අධ්‍යාශය ද, වීර්යය ද කියනු ලැබේ.

භගවය, සුනකඛතත නම් ලිචඡවී පුත්‍රයා කොරකඛතතිය නම් නග්නයා දෙදන වැලමිට බිම තබා හැසිරෙන්නහු, බිම දමන ලද ආහාරය මුඛයෙන් ම කන්නහු, මුඛයෙන් ම බුදින්නහු දුටුයේය. දැක ඔහුට මෙසේ සිතිණ. ඒකාන්තයෙන් සොඳුරු පියවි ඇති රහත් මහණෙක. දෙදණ වැලමිට බිම තබා බිම දමන ලද ආහාරය මුඛයෙන්ම කයි.

කිං තෙ වතං කිංපන බ්‍රහමචරියං - කිසස සුචිණ්ණසස අයං විපාකො
ඉද්ධී ජුතී බල විරියූපපතති - අකඛාහි මෙ නාග මහා විමානං

අහඤ්ච භරියාව මනුසස ලොකෙ - සද්ධා උභො දානපතී අහුම්හ
ඔපාන භූතං මෙ සරං තදාසී - සනතපපිතා සමණ බ්‍රාහමණාච

තමෙම වතං තං පන බ්‍රහමචරියං - තසස සුචිණ්ණසස අයං විපාකො
ඉද්ධී ජුතී බලවිරියූපපතති - ඉධංච මෙ ධීර මහා විමානං

මේ පුණ්ණක ජාතකයෙහි 'දානය' බ්‍රහ්මචරියයි කියන ලද

නාගරාජය, තොප විසින් සමාදාන වන ලද ව්‍රතය කිම! දාන සංඛ්‍යාත බ්‍රහ්මචරියාව, ශ්‍රේෂ්ට චරියාව කිමෙක්ද? මනාකොට රැස්කරන ලද කවර කර්මයක විපාක වේද? ආනුභාවය ද කාන්තිය ද වෙයි. කාය බලයෙන් හා උත්සාහයෙන් ද සමන්විත වූයේ මහත් වූ විමානයක් ද වේ. මේ මා විසින් විචාරණ ලද්දේ කියව!

2. මම ද භාර්යාව ද අපි දෙදෙන මිනිස් ලොව ශ්‍රද්ධාව ඇත්තේ දානපතියෝ වීමු. එකල්හි මගේ ගෙය සතරමං සන්ධියක කණින ලද පොකුණක් මෙන් විය. මහණ බමුණෝ ආහාර පානාදියෙන් සංග්‍රහ කරන ලදී.

3. වීර්යයන් වහන්ස! මා විසින් සමාදන් වන ලද ඒ ව්‍රතය වෙයි. ඒ දාන සංඛ්‍යාත ශ්‍රේෂ්ඨ චරියාව වෙයි. මනාකොට රැස්කරන ලද ඒ කර්මයාගේ මේ විපාකයයි. ආනුභාවය ද කාන්තිය ද වෙයි. කාය බලයෙන් හා උත්සාහයෙන් යුක්ත වෙමි. මේ මහත් වූ විමානය ද වේ.

කෙන පාණි කාම දදො - කෙන පාණි මධුසස වො
කෙන තෙ බ්‍රහමචරියෙන - පුඤ්ඤං පාණිමහි ඉජඣති
තෙන පාණි කාමදදො - තෙන පාණි මධුසසවො
තෙන මෙ බ්‍රහමචරියෙන පුඤ්ඤං පාණිමහි ඉජඣති

මේ අංකුර ප්‍රේත වත්ථුවෙහි 'වතාවත' බ්‍රහ්මචරියයි කියන ලදී.

'ඉදං වෝ තං' භික්ඛවෙ තිත්තිරියං නාම බ්‍රහමචරියං අහොසි' යයි තිත්තිර ජාතකයෙහි පංච ශික්ෂාපදය 'බ්‍රහ්මචරිය' යයි කියන ලදී. 'තං ඛොපන පඤ්ඤවසිඛ බ්‍රහමචරියං නෙව නිබ්බිදාය න විරාගාය යාවදෙව බ්‍රහමලොකූපපත්තියා' යයි මහා ගෝවින්ද සූත්‍රයෙහි 'බ්‍රහ්ම විහාරයෝ බ්‍රහ්මචරියයි කියන ලදී. එකසමිං බ්‍රහමචරියසමිං සහසසං මචවූ භායිනෝ යන මෙහි ධර්මදේශනාව 'බ්‍රහ්ම චරියයි' කියන ලදී. පරෙ අබ්‍රහමචාරී භවිසසනති මයමෙපථ බ්‍රහමචාරී භවිසසාමී, සලෙලඛ සූත්‍රයෙහි 'මෙථුන විරතිය' බ්‍රහ්මචරිය යයි කියන ලදී.

මයඤ්ඤව භරියා නාතික්කමාය - අමෙහ ච භරියා නාතික්කමනති
අඤ්ඤත්‍ර තහි බ්‍රහමචරියං චරාම - තසමාති අමහං දහරා නමීයරෙ

මහා ධම්මපාල ජාතකයෙහි ස්වදාර සන්තෝෂය බ්‍රහ්මචරිය යයි කියන ලදී.

හීනෙන බ්‍රහමචරියෙන - ඛත්තියෙ උප පජ්ජති
මජ්ඣිමෙනච දෙවදත්තං - උත්තමෙන විසුජ්ඣති

මෙසේ නිමි ජාතකයෙහි ආත්ම දමන වශයෙන් කරන ලද අෂ්ටාංගික උපෝසථය බ්‍රහ්මචරිය යයි කියන ලදී.

ඉදං ඛො පන පඤ්ඤවසිඛ බ්‍රහමචරියං එකන්ත නිබ්බිදාය විරාගාය -පෙ- අයමෙව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ

මහා ගෝවින්ද සූත්‍රයෙහි ම 'ආර්ය මාර්ගය' බ්‍රහ්මචරිය යයි කියන ලදී. තයිදං බ්‍රහ්මචරියං ඉධඤ්ඤෙවව ථීතඤ්ඤව විත්ථාරිතං බාහුජඤ්ඤං පුථුභූතං යාවදෙව මනුසෙසහි සුපපකාසි තනති' පාසාදික සූත්‍රයෙහි ශික්ෂාත්‍රය සංග්‍රහ වූ සියළු ශාසනය 'බ්‍රහ්මචරිය' යයි කියන ලදී.

අපි අතරමානානං ඵලසාව සම්ජඤ්ඣති
විපක්ක බ්‍රහමචරියොසම් - එවං ජානාහි ගාමිණී

මෙහි අධ්‍යාශය බ්‍රහ්මචරිය යයි කියන ලදී.

මෙහි වනාහි වීර්යය බ්‍රහ්මචරිය යයි අදහස් කරන ලදී. වීර්ය බ්‍රහ්ම චරියාවට මෙම සූත්‍රයම නිදසුන් වේ. ඒ මේ වීර්යය එක් අත්බවෙක්හී සිව් වැදෑරුම් දුෂ්කර ක්‍රියාව කළ බැවින්, **චතුරංග සමනනාගත** යයි වදාළහ.

තපසසී සුදං හොමී යන මෙහි සුදං යනු නිපාතයි. තපස් ඇත්තෙක් වීමි යන අර්ථයි. **පරමතපසසී** උතුම් වූ තපස් ඇත්තෙක්, පස් ඇත්තවුන් අතුරෙන් උතුම් වූවෙක් **ලූඛසසුදං හොමි** රූක්ෂ වූයෙමි වෙමි. **ජෙගුචජී** පාපයට ජිගුප්සා කරන්නෙමි. **පවිවිතසසුදං හොමි** මම උතුම් විවේකය ඇතියෙක් වෙමි.

තත්‍රසසු මෙ ඉදං සාරිපුතත ඒ චතුරංග බ්‍රහ්මචරියාවෙහි මේ මාගේ තපස් ඇති බව වෙයි. තපසින් යුක්ත භාවයෙහි මාගේ මේ අචේලකාදී තපසින් යුක්ත බව වේයයි දක්වති. එහි **අචෙලකො** සෙල් රහිත වූයේ, නග්න වූයේ **මුතතාචාරො** හරින ලද ආචාර ඇත්තේ උච්චාර කර්මාදියෙහි ලෞකික කුලපුත්‍රයන්ගේ හැසිරීමෙන් වෙන් වූයේ, මළ මූ කෙරෙහි කම් බුදිමි. **හත්ථාපලෙචනො** අතෙහි බත්පිඩ නිමිකල්හි දිවෙන් අත ලෝනෙමි. මළ හෝ කොට අතෙහිම දඬුකඩෙක යන හැඟීම ඇතිව, අතින්ම පිස දමමි. ඔව්හූ දඬුකඳ සත්ත්වයෙකැයි පනවත්ල. එහෙයින් ඔවුන්ගේ පිළිවෙත පුරමින් මෙසේ කළේය. භික්ෂාව පිළිගැනීම සඳහා එනු මැනැවි වහන්ස'යි කියන ලදුයේත් නොඒනුයි **න එහි භදනතික** නම් වෙයි. එසේ වීනම් සිටිනු මැනවි වහන්ස'යි කියන ලද්දේ නොසිටිනුයි **නතිටඨභදනතික** නම් වෙයි. ඒ දෙකම තීර්ථකයෝ මොහුගේ වචනය කරන ලද්දේ යයි නොකරති. මම ද එසේ කළෙමියි දක්වති. **අභිහට** - පළමුකොට ගෙන එලවන ලද භික්ෂාව, **උද්දිසසකටං** මෙය ඔබ උදෙසා කරන ලදැයි ආරොචනය කළ භික්ෂාව, **න නිමනතනං** අසවල් නම් කුලයට හෝ වීදියට හෝ ගමට හෝ පිවිසෙනු මැනවැයි නිමන්ත්‍රණය කළ භික්ෂාව නො ඉවසමි. නොපිළිගනිමි.

න කුමහීමුඛා කළයෙන් නගා දෙන්නා වූ භික්ෂාව නො ගනිමි. **න කළොපිමුඛා** කළොපි යනු සැළිය හෝ පැසයි. එයින් ද නගා දෙන භික්ෂාව පිළි නොගනිමි. කුමක් හෙයින් ද යත්, මා නිසා කළ සැළි ආදිය හැන්දෙන් පහර ලබතියි කියාය. **න එළකමනතරෙ** එළිපත අතර කොට දෙන භික්ෂාව නොගනිමි. කවර හෙයින්ද? මෙතෙමේ (එළිපස අතුරුකිරීම ලබායයි කියාය. දඬු - මෝල්හි ද මේ පිළිවෙතමැයි. **න දවිනනං** දෙදෙනකු

වළඳන අතර එකකු නැගිට දෙන දේ නොගනිමි. ආලෝපයට අන්තරාය වේය යන අදහසිනි. **න ගබ්භිනියා** යනාදියෙහි ගැබිනියගේ කුසෙහි දරුවා වෙහෙසෙයි. **පායන්තියා** කිරි පොවන තැනැත්තියගේ ළදරුවාට කිරි අනතුරක් වෙයි. **පුරිසන්තරගතා** පුරුෂයකු අතරට ගිය තැනැත්තියගේ රතියට අන්තරාය වෙයි යන අදහසින් පිළි නොගනියි. **න සංකිත්තිසූ** ප්‍රසිද්ධියේ එකතුකර සකස්කළ බත නොපිළිගනී. දුර්භික්ෂ කාලයේ අචේල ශ්‍රාවකයෝ අචේලකයන් පිණිස තැන් තැන්වලින් සහල් ආදිය සම්මාදන් කර බත් පිසයි. උත්කෘෂ්ඨ වූ අචේළකයෝ එය නොපිළි ගනිති.

න යත්ථසා යම්කිසි තැනක සුනඛයකු ආහාරයක් ලබමියි බලාපොරොත්තුව සිටියේද, එවැනි තැනකදී බල්ලාට නොදී (අචේළකයා සඳහා) ගෙන එන ලද්ද නොපිළිගනී. කවර හෙයින්ද අර සුනඛයා ගේ ආහාර වේල නැතිවුනේය යන හැඟීමෙනි. **සණ්ඩ සණ්ඩචාරිනී** සමූහ සමූහව හැසිරෙන්නාහු අචේළකයකු දැක මොහුට භික්ෂාව දෙන්නෙමු යි මනුෂ්‍යයෝ ආහාර ගෙට ගොස්, ඔවුන් ආහාර ගෙන නැවත පිවිසෙද්දී ආහාර සැලිවල වසා සිටි මැස්සෝ සමූහ සමූහව ඉගිලෙත්ද, එසේ ගෙන එන භික්ෂාව නොගනිමි. කවර හෙයින් ද මා නිසි මැස්සන්ගේ ගෝචරය නැති වූයේ ය කියාය. මම ද එසේ කළෙමි. **ථූසොදකං** සියළු සශ්‍ය එකතුවෙන් කරන ලද සෞවීරකය. මෙහි ද සුරාපානය සාවද්‍යය. මෙතෙම වනාහි සියල්ලෙහි සාවද්‍ය සංඥා ඇත්තේය. **එකාගාරිකෝ** යමෙක් එකම ගෙයකින් භික්ෂාව ලැබ නවතීද, හෙතෙමේය. **එකාලොපිකෝ** යමෙක් එකම බත්පිඩකින් යැපේද ඔහුයි. **දවාගාරිකෝ** මෙහිද මෙම ක්‍රමයමැයි. **එකිසසාපිදන්තියා** දනතී නම් යම් බඳුනක අග්‍ර භික්ෂාව බහා තබත්ද, එබඳු වූ කුඩා තැටියක් වේ. එක් බත් තැටියකින්, **අදධමාසිකං** අඩමසක් අතර වූ, **පරියාය භත්තභොජනං** වාර භෝජනයෙහි, එක් දිනකට වරක්, දෙදිනකට වරක්, සත්දිනකට අඩමසකට වරක් යයි මෙසේ දින වාරයෙන් හා භක්ත භෝජනයෙහි, **සාකභක්ඛා** අමුපලා බුදින්නේ, **සාමාක භක්ඛා** බොඩහමු සහල් බුදින්නේ **නීවාරාදීසු** නීවරාදියෙහි, නීවාර නම් වනයෙහි ස්වයංජාතික වී වර්ගයකි. දඳුල සම්මරුන් විසින් සම් ලියා දමන ලද කසටය. **හටං** මැලියම් ද, සෙවෙල්, කිණිහිරි ආදී රුක්ලාටු ද කියයි. **කණ** කුඩුය. ආවාම බත්සැළියෙහි දම්කුඩ, බත්කැඳ යයි ද කියති. **පිඤ්ඤාකාදී** ප්‍රකටමය. **පවත්තඵල** හොජී වැටෙන ගෙඩි බුදිනසුළු

සාණානි, සණවැහැරි, **මසාණානි** මිශ්‍රක වස්තු, **ඡවදුසසානි** මළ සිරුරෙන් හැරදමන ලද වස්ත්‍ර, එරුපත් තණ ආදිය හෝ ගොතා කළ වස්ත්‍ර **පංසකූලානි** පොළවෙහි දමන ලද කඩරෙදි, **තිරීටානි** රුක් සුඹුලුයෙන් කළ වස්තු, **අජිනං** අඳුන් දිවිසම්, **අජිනක්ඛිපං** එයම මැද පලන ලද්දේ, කුර සහිත අඳුන් දිවිසම්, **කුසචීරං** කුසතණ ගොතා කළ වැහැරි, **වාකචීරං** - **ඵලකචීරං** මෙහිදු එම ක්‍රමයමයි. **කෙසකම්බලං** මිනිස් කෙසින් කළ කම්බලය, යමක් සඳහා කියන ලදද, 'යානි කානිච භික්ඛවෙ තනතාවුතානි වත්ථානි, කෙසකම්බලං, තෙසං පතිකිට්ඨා, සීත කාලෙ සීතං, උණ්හකාලෙ උණ්හං, අපපඝෙසාච දුක්ඛ සම්ඵස්සා ච දුග්ගන්ධා වායති' **වාලකම්බලං** අස් වල්ග ආදියෙන් කළ කම්බිලි, **උලූකපක්ඛනති** බකමුහුණු පියාපත් ගොතා කළ වස්ත්‍රය.

උබ්බටයකෝ උඩුකුරුව සිටියේ, **උකකුකප්පධාන මනුයුතෙතා** උක්කුටික වීර්යයෙහි යෙදුනෙ, යන්නේ ද උක්කුටිකවම පැන පැන යති. **කණ්ටකාපසසියිකෝ** ලොහෝ කටු හෝ පියවි කටු පොළවෙහි සිටවා එහි සමක් අතුරා සිටීම, ඇවිදීම, කෙරේ. **සෙය්‍යං** එහිම හෝනේ ද වෙයි. සවස තුන්වැනි වූයේ මොහුටනුයි **සායතතියක** නම් වේ. උදයේ ද මධ්‍යාහ්නයේ ද සවස ද දවසට තුන්වරක් පව් සෝදා හරිමැයි ජලයට බැසීමේ යෝගයෙහි යෙදුනේ, වාසය කෙරෙමියි දක්වයි.

උදකොරොහ නානුයොගං අනුයුතෙත වසමියි දක්වයි.

නෙකවසස ගණිකා නොයෙක් වර්ෂ සමූහයෙන් හටගත්, **රජොජල්ලං** රජස්මල මෙය තමන්ගේ රජො ජල්ලක ව්‍රත සමාදානය ගැන කියයි. **ජෙගුච්ඡරිසම්මං** පාපයට පිළිකුල් කරන බැව්හි. **යාව උදව බින්දුමහි පි** දිය බින්දුවෙහි මගේ කරුණාව එළඹ සිටියේ වෙයි. අන්‍ය වූ ගල්කැට, කැබිලිති, දඬු වැල් ආදියෙහි කියනුම කවරේද? ඔව්හු වනාහි දිය බින්දු මෙන් මේ කැටකැබලිති ආදීහු ක්ෂුද්‍ර ප්‍රාණීහු යයි පනවති. එයින් කීහ දිය බින්දුවෙහි පවා මගේ දයාව පැතිරුනේ වෙයි. දිය බින්දුවකුදු නොනසම්. විනාශ නොකරම්. කුමන කරුණකින් ද යත්, **මාහං චුදකෙ පාණෙ විසමගතෙ සංඝාත මා පාදෙසිං** මළ ගොඩ තණ රුක් අතු ආදී වූ විෂම ස්ථානයන්හි පැමිණි ජල බින්දු සංඛ්‍යාත වූ කුඩා සතුන් නැසීමට වධයට නො පමුණුවයි කියායි. මේ සඳහා සිහි ඇතිවම ඉදිරියට යෙමියි දක්වයි. අචේළකයන් අතුරෙහි බිම ඇක්මුණු තැන් පටන් සිල්වත් වූයෙක් නම් නැත්ල. පිඬු සිඟීමට යන්නා ද දුශ්ශීලයෝවම එත්ල. උපාසකයන්ගේ

ගෙදර වළඳන්නාහු ද දුශ්ශීලයෝ ම වළඳත්ල. එන්නාහු ද දුශ්ශීලයෝවමැ එත්ල. යම්කලෙක වනාහි මොනර පිළින් පෝරුව ඇමද, සිල් ඉටා නිදිත් ද එකල්හි සිල්වත් වූවාහු නම් වෙත්ලු.

වනකම්මිකං අල මුල් ආදිය සඳහා වනයෙහි හැසිරෙන්නෙකු **වනෙනවනං** වනයෙන් වනයට, සියලු තන්හි මෙම ක්‍රමයමැයි. **පපතාමි** යෙමි. **ආරඤ්ඤකෝ** වනයෙහි ඉපිද වැඩුණු, මෙය තමන්ගේ ආජීවක කාලය සඳහා කියයි. බෝසත් තෙම පාසාණ්ඩයන් පරීක්ෂා කිරීම පිණිස ඒ පැවිද්දට පැමිණියේය. ප්‍රතිඵල රහිත බව දැන, යළි ගිහි නොවූයේය. බෝසත්හු යම් යම් තැනකට පැමිණෙත් ද, එයින්, නොනවතින ස්වභාව ඇත්තාහු වෙති. එසේ පැවිදිව 'කිසිවෙක් මා නොදකීවා'යි' එයින්ම වනයට පිවිසියේය. **මා මං තෙ අද්දසංසු අහං ච මා නෙ අද්දසං** යනු එහෙයින් කීහ.

ගොටඨා හරක් ගාල් පටඨිතගාවෝ නික්මුණු ගවයන් ඇත්තාහූ, තත්ථ චතුකුණ්ඩිකෝ මහ කුඩා ගස් ඇති කැලෑවේම සිටියේ, ගොපල්ලන් දෙනුන් සමග ආපසු ගිය බැව් දැක දෙ අත් ද දෙ දණද බිම තබා මෙසේ චතු කුණ්ඩිකව එළඹ සිටියේ යන අර්ථයි. **තානි සුදං ආහාරෙමිති, මහත්** වූ වස්සන්ගේ ගොම කසට වූවාහු ඕජස් රහිත වූවාහූ, වෙත් ද එහෙයින් ඒ ගොම හැර තරුණ වූ කිරි බීමෙන් ම වැඩෙන්නවුන්ගේ ඕජස් සහිත වූ ගොම කුස පුරා කා යළි වන ලැහැබටම පිවිසෙයි. **තානි සුදං ආහාරෙමි** යනු ඒ සඳහා කීහ. **යාවකීවඤ්ච** මෙ යම් කාලයකට මාගේ සිය මළ මූ ක්ෂය නොවූයේ වේද, යම්තාක් මාගේ (නව) දොරවල ප්‍රයෝජන ගැනීම පැවැත්තේ වේද, ඒ තාක් එයම ආහාර කෙරෙමි යන අර්ථයි. අනතුරුව කල් යත් යත් ම ක්ෂය වූ මස් ලේ ඇත්තේ, නව දොරවල ප්‍රයෝජන ගැනීම සිදී ගියේ, වස්සන් පිළිබඳ ගොම ආහාර කළේයි. **මහා විකට භොජනසම්ං** මහත් වූ විකෘති භෝජනයෙහි අස්වාභාවික භෝජනයෙහි යන අර්ථයි.

තත්‍ර සුදං සාරිපුත්ත හිංසනකස්ස වනසණ්ඩස්ස හිංසන කතසම්ං හොති මෙහි තත්‍ර යනු පළමු වචනය අපේක්ෂා කිරීමයි. සුදං යනු පද පූරණ මාත්‍රයෙහි නිපාතය. **සාරිපුත්ත** යනු ඇමතීමයි. මෙහි මතු කියන්නේ අර්ථ යෝජනායි. **තත්‍ර 'අඤ්ඤතරසම්ං හිංසනකෙ වන සණ්ඩ'** යයි යමක් කියන ලද ද, ඒ බිහිසුණු වනලැහැබෙහි හිංසන කතසම්ං හොති

බිහිසුනුකම වෙයි යන අර්ථයි. කුමක් වේද? මෙය වෙයි. යම්කිසි අවීතරාගයක් වේද? ඔහුගේ ලොමු දහගනිත්යයි, නොහොත් තත්‍ර යනු ස්වාමී අර්ථයෙහි ආධාරතයයි. සු යනු නිපාතයි. **කිංසුනාම තෙ හොනෙතා සමණ බ්‍රාහමණ** යනාදියෙහි මෙනි. **ඉදං** අදහස් කළ අර්ථය ප්‍රත්‍යක්ෂ වූවාක් මෙන් කොට, දක්වන වචනයි. **සු+ඉදං සූදං**, සන්ධි වශයෙන් ඉකාර ලෝපයයි දතයුතු චකඛුන්ද්‍රියං, ඉත්ථීන්ද්‍රියං අනඤ්ඤතඤ්ඤස්සාමිතින්ද්‍රියං කිංසූධ චිත්තං යනාදිය මෙනි.

මේ වනාහි අර්ථ යෝජනායි. ශාරිපුත්‍රය, ඒ බිහිසුණු වනලැහැබෙහි බිහිසුණු බැව්හි මේ වෙයි. **හිංසනකතසමිං** බිහිසුණු බැව්හි යන අර්ථයි. එක් නකාරයක්හු ගේ ලෝපය දක්වයි. හිංසනකතසමිං කියා හෝ පාඨයි. හිංසනකතාය කියයුතු තන්හි ලිංග විපර්යාස කරන ලද තව ද මේ නිමිත්තාර්ථයෙහි ආධාර වචනයි. එහෙයින් මෙසේ සම්බන්ධය දතයුතු. බිහිසුනු බැව්හිම වෙයි. බිහිසුනු බව නිමිතිකොට, බිහිසුනු බව හේතුකොට, බිහිසුනු බව ප්‍රත්‍යකොට, මේ වෙයි. **යො කොචි අවීතරාගො තං වනසණ්ඩං සවිසති යෙභුය්‍යෙන ලොමානි භසතනී** බොහෝ ලොමු දහගනිති. උඩුහුරු වූවාහු හිඳි වැනි ද කටු වැනි ද වී සිටිති. ඉතා බොහෝ සත්ත්වයන්ගේ ලොම් උඩට නැගුණු මුව ඇතිව සිටිති. ස්වල්ප වූ ඉතා ශූර පුරුෂයන්ගේ රෝමහර්ෂ නො වෙත්.

අනතරාටඨතා නවමී මස අවසානයෙහි සතරෙක, මැදින් මස ආදියෙහි සතරෙකැයි මෙසේ දෙමස අතර රාත්‍රීහු අටදෙනා, **අබෙභාකාසෙ** මහසත් තෙම හිමවැටෙන කල්හී රාත්‍රියෙහි අභ්‍යවකාශයෙහි වෙසෙයි. එකල්හි ඔහුගේ රෝම කූපයන්හි අවුනන ලද මුතු මෙන් හිම බින්දු සිටිති. ශරීරය සුදු දුහුලකින් පොරවන ලද්දාක් මෙන් පෙනෙයි. **දිවා වනසණ්ඩ** දවල් හිරුරැස් පහසින් හිම බින්දු පහව ගියකල්හී අස්වැසිල්ලක් වන්නේය. එහෙත් මෙතෙමේ හිරු නැගෙන කල්හිම වන ලැහැබට පිවිසෙයි. එහිදු හිරු රසින් වැගිරෙන හිම ඔහුගේ සිරුරෙහි වැටේ. **දිවා අබෙභාකාසෙ විහරාමි රතතිං වණසණ්ඩ** ග්‍රීෂ්ම කාලයෙහි මෙතෙම දවල් අභ්‍යවකාශයෙහි විසීල එබැවින් ඔහුගේ දෙකිසිල්ලෙන් ඩහදිය වැගිරුනාහුය. රාත්‍රියෙහි අස්වැසීමක් වන්නේ ය. එතකුදු වුවත් මෙතෙම හිරු අස්තයට යන කල්හිම වන ලැහැබට පිවිසෙයි. එකල්හි දහවල් ගත් උණුසුම ඇති වන ලැහැබෙහි අඟුරු වලෙක බහාලන ලද්දෙකු මෙන්,

ඔහුගේ ආත්මභාවය හාත්පසින් දැවේ. **අනච්ඡරියා** අනු+අච්ඡරියා - ආශ්චර්ය වූ **පටිභාසි** වැටහිණි.

සොතතෙනා දවල් අව්වෙන්, රෑ වන උණුසුමින් අතිශයින් තැවුනේ, **සොසිනො** රෑ හිමයෙන් දවල් හිම ජලයෙන් අතිශයින් තෙමුනේ, **හිංසනකෙ** භය උපදවන, **නගෙගා** නග්න වූයේ, හඳන පොරෝණ ඇතිකල්හි සිසිල හෝ උණුසුම අතිශයින් නො පෙළෙන්නේ ය. ඒවාද තමන්ට නැති බව දක්වයි. **නවගහිමාසිනො** ගින්න කරා ද නොඑළඹියෙමි. **එසනා පසුතො සංසාර ශුද්ධිය** සෙවීම පිණිස යෙදුනේ, අතිශයින් යෙදුනේ මුනි, එකල්හි තමන්වහන්සේ මුනියයි දක්වන සේක.

ඡවටඨිකානි අඩක් පිළිස්සුණු ඇට, **උපධායාති** යම්සේ හිසට කොට්ටයක් පයට කොට්ටයක් තිබේ ද එසේ අතුරා ශයනය කරමියි දක්වති. **ගොමණඩලා** ගොපලු දරුවෝ බෝසතුන් සමීපයට ගොස් සුමේධය, නුඹ මෙතැන්හි කුමක් හෙයින් ඉන්නෙහිද, කියවයි කියති ලු. බෝසත්තෙම යට බැලූ මුහුණු ඇතිව හිඳියි. කථා නො කෙරෙයි. එකල්හි ඔව්හූ කථා නො කරන්නට නො දෙමුයි බෝසතුන් පිරිවරා කාරා දමති. ශරීරයෙහි කෙළ ගසති. බෝසත් තෙමේ එසේත් කථා නො කරති. එකල්හි ඔහුට නුඹ කථා නො කෙරෙතියි මුත්‍රා කෙරෙති. ඔහු මතුයෙහි මුත්‍රා ජලය විසුරුවති. බෝසත් තෙමේ මෙසේත් කතා නොකෙරෙත්ම ය. නැවත ඔහුට කථා කරව කථා කරවයි පස් විසුරුවති. බෝසත් තෙමේ මෙසේත් කථා නො කෙරේම ය. එවිට ඔහු කථා නොකෙරේ යයි දඬු කැබලි ගෙන කන්සිදුරුවල රුවති බෝසත් තෙම දුක් වූ තියුණු වූ කටුක වූ වේදනාව ඉවසමින් කිසිවකුට කිසිවක් නො කියන්නෙමියි මළ එකෙකු මෙන් හිඳී. **නඛො පනාහං සාරිපුතත අභිජානාමි තෙසු පාපකං චිතතං උපපාදෙතාති** යනාදිය කීහ. මා විසින් ඔවුන් කෙරෙහි පවිටු සිතක් නො උපදවන ලදී යන අර්ථයි.

උපෙකඛා විහාරසමිං හොතීති උපේක්ෂා විහාරය වෙයි. යම් හෙයකින් වාසය කිරීමට විහාර ණයම 'විහාරසමිං'යි කියන ලද ද, එහෙයින් මෙහි, **ඉදංසු** මෙ යන මෙතැන්හී 'අයංසු මෙ' යි මෙසේ අර්ථ දතයුතු. මේ ක්‍රමයෙන් අන්‍ය වූ ද මෙබඳු පදයෝ දතයුත්තාහ. මෙම දේශනාවෙන් මෙයින් (පෙර) එක් අනූවන කල්පයෙහි පිරූ උපේක්ෂා විහාරය (පාරමිතාව) දක්වන ලදහ.

සුඛෙ පතෙන න රජ්ජාමි - දුකෙඛ හොමි න දුම්ම නො
සබ්බත්ථ කුලිතො හොමි එසා මෙ උපෙකඛා පාරමී

සැපයක් පැමිණි කල්හි නො ඇලෙමි. දුකක් පැමිණි කල්හි නො සතුට සිත් ඇත්තේ නො වෙමි. සුව දුක් ආදී සියළු තැන්හි තරාදියක් මෙන් වෙමි. මේ මාගේ උපේක්ෂා පාරමිතාවයි.

ආහාරෙන සුදධි ඩෙබර ආදී එක්තරා ස්වල්ප වූ ආහාරයකින් ශුද්ධිය ලබන්ට හැක්කේ යයි මෙබඳු පිළිගැනීම් ඇත්තාහු වෙති. එවමාහංසු මෙසේ කියත්. කොලෙහි, ඩෙබරවලින් කොළො දකං ඩෙබර මිරිකා කළ පානය. කොල චිකති ඩෙබරවලින් කළ විවිධාකාර ආහාර, එක පරමො මේ ප්‍රමාණය සීමා වූයේ මොහුට යයි ඒත පරම වේ. එදා මෙයට ඒකානූ කපකට පෙර ඩෙබර ගෙඩි බෙලි ගෙඩි තල්ගෙඩි පමණ වූයේ නොවේ. අද ඩෙබර ගෙඩියක් යම් ප්‍රමාණ වේද, එදා ද එම ප්‍රමාණයම වෙයි.

අධිමත්තක සීමානං අතිශය කෙට්ටු බවට, ආසීතික පබ්බානි වා කාළ පබ්බානි වා ආසීතික නම් පැළෑටි වර්ගයේ හෝ කළුවැලේ ගැට තැන්හි මැළවී මැද උස් උස් වූවාහු වෙත් ද, මගේ අඟපසඟ ද ඒ සමාන වූයේය. ඔටඨපදනති ඔටුවාගේ පිය මැද ගැඹුරු වේ ද, එපරිද්දෙන් බෝසතුන්ගේ මස් ලේ මැලවිණ. වස් දොර ඇතුළත පිවිසි බැවින් තට්ටම් මැද ගැඹුරු විය. එකල ඔහු බිම හුන් කල ඊ පගලියකින් ඇක්මුණු කලක් මෙන් මැද උස් වෙයි. වටනාවලී යම්සේ නූලකින් අමුණන ලද නවගුණවැලේ ඇට අතරින් අතර පහත් වේ ද, ඇට පිහිටි තැන් උස් වේද, එපරිද්දෙන් කොඳුඇට පේළිය උස්පහත් වෙයි. ජරසාලාය ගොපානසියො දිරාපත් වූ ගොඩනැගිල්ලක ගොනැස්ස (පරාල යටලී ආදිය) බිත්තිවලින් වැටී බිම සිටියේ ද එකක් යට වී එකක් උඩ සිටී ද, බෝ සතුන්ගේ ඉලඇට එසේ නොවෙති. එහෙත් ලේ සිඳුනු විට මස් මැළවුණු විට, (දිය වූ විට) ඉලඇට අතරින් සම යටට බැස්සහ. ඒ සඳහා මෙය කියන ලදී. ඔකඛායිකා යටට ගියාහූ, ඔහුගේ ලේ සිඳුණු කල, මස් දියවුණු කල ඇස්වටය හිස්මුලට හැපී සිටියේය. ඇස් තාරකා බඳු විය. ආමකවජ්ජනෙතා ඉතා තරුණ කාලයේ සිඳින ලදුයේ, ඔහු අවී සුළඟින් පැලෙන්නේ ද මැලවෙන්නේ ද විය.

යාවසසු මෙ සාරිපුත්තා ශාරිපුත්‍රය, මගේ උදරයේ සිවිය පිටකටුව

දක්වා ඇලුණී වෙයි. නොහොත් මගේ දුෂ්කරක්‍රියාව යම්තරම් බැරෑරුම් වූයේ ද මගේ උදර සිවිය පිටකටුවට ඇලුනේ යයි මෙහි සම්බන්ධය දතයුතු. **පිටඨී කණ්ටකං යෙව පරිගණ්හාමී** පිටකටුව සමග ගනිමි. **උදරචජවිං යෙව පරිගණ්හාමී** උදර සිවිය සමග ගනිමි. **අවකුජෙජා පපතාමී** මළ මූ කිරීම පිණිස උන්නා වූ ඔහුගේ මුත්‍රා නො නික්මේ. මලය වූ කළී ඉඟිනි ඇට එකක් දෙකක් පමණ නික්මේ. බලවත් වූ දුක් උපදවයි. සිරුරින් ඩාදිය වැගිරේ. එහිමැ යටිකුරුව බිම වැටේ. 'අවකුජෙජා පපතාමී' යනු එහෙයින් කීහ. **තමෙමකායං** ඒ එකුන් අනූවන කපට පෙර ශරීරය මහා සච්චක සූත්‍රයෙහි පශ්චිමභවික ශරීරය සඳහා 'ඉමමෙව කායං' යනුවෙන් වදාළහ. **පූතිමූලානි** මස් හෝ ලේ ඇතිකල්හි (ලෝම) පවතී. මස් ලේ නැති කල්හි සම්කඩක ලෝමයන් මෙන් අතෙහිම ඇලෙති. 'පූතිමූලානි කායසමා පතනති' යනු එහෙයින් වදාළහ. **අලමරිය ඤාණ දසසන විසෙසං** ආර්යභාවය,

අලමරියඤාණ දසසන විසෙසං ආර්යභාවය කරන්නට සමත් වූ, ලෝකෝත්තර මාර්ගය. **ඉමිසසා යෙව අරියාය පඤ්ඤායාති** විදර්ශන ප්‍රඥාව නො ලැබීමෙන්, **යායං අරියා** යම් ආර්ය මාර්ග ප්‍රඥාවකට පැමිණෙන ලද්දේ ද මේ කියන ලදී. යම් සේ මෙකල්හි විදර්ශනා ප්‍රඥාව ලැබූ බැවින් මාර්ග ප්‍රඥාව ලබන ලද්දේ ද, එපරිද්දෙන් මෙයින් එක් අනූ කපකට පෙර විදර්ශනා ප්‍රඥාව නො ලැබූ බැවින් ලෝකෝත්තර මාර්ග ප්‍රඥාවට නො පැමිණියෙමි. තෙරුන්වහන්සේ මෙසේ කීහ. 'ඉමිසසායෙව' යනුවෙන් වදාළ ප්‍රඥාවද 'යායං අරියා' යන්නෙන් වදාළ ප්‍රඥාවද මාර්ග ප්‍රඥාව මැයි. එකල්හි ඔහුට භික්ෂූහු මෙසේ කීහ. 'වහන්ස, එසේ ඇතිකල්හි මාර්ගයට නොපැමිණියේ ම මාර්ගයට නො පැමිණියේ යයි කියන ලදී. ඇවැත්නි, යම්කිසිවක් දක්වන්නට නො හැකි වෙමි. එසේ වුවත් දෙකම මාර්ග ප්‍රඥාව මැයි' මෙය ම මෙහි සුදුසුය. වෙනත් අයුරකින් සිදු වූයේ නම් 'යා අයං' යන නිර්දේශය සුදුසු නො වන්නේ ය.

සංසාරෙන සුදධිති බොහෝ කලක් සැරිසරා පිරිසිදු වෙති යි කියත්. **උපපතතියා සුදධි** බොහෝවර ඉපදීමෙන් සුද්ධ වෙතියි කියති. **ආවාසෙන සුදධි** බොහෝ තැන්වල විසීමෙන් සුද්ධ වේයයි කියති. තුන් තන්හි සැරිසැරීම් වශයෙන් 'සංසාරය' ඉපදීම් වශයෙන් 'උත්පත්ති' බොහෝ තැන්වල විසීම් වශයෙන් 'ආවාසෝ' යයි ස්කන්ධ වශයන් ම කියන ලදී. **යඤ්ඤෙන** බොහෝ යාගයන් යැද සුද්ධ වේයයි කියති. **මුදධා වසතෙතන**

සක් තුනකින් ක්ෂත්‍රිය රාජාභිෂේකයෙන් මුදුනෙහි අභිෂේක කරන ලද්දහු විසින් අගගි පරිචරියායා බොහෝ ගිනි පිදීමෙන් සුද්ධ වෙතියි කියති.

දහරො තරුණයා යුවාති යොවුන් බැවින් යුක්ත වූ තැනැත්තා සුසුකාළ කෙසො මනා වූ කළු කෙස් ඇත්තා - සදෙදන යොබ්බනෙන සමන්නාගතො යන මෙයින් යම් යොවුන් බවකින් යුක්ත වූවේ තරුණ වේද? ඔහුගේ ඒ යොවුන් බව සොඳුරු යයි සිත්කළු යයි දක්වයි. පඨමෙන වයසාති පළමුවන වයස නම් තිස්වසරයි. එයින් සමන්විත වූයේ යන අදහසයි. පඤ්ඤා වෙය්‍යත්තියෙන යනු නුවණින් ව්‍යක්ත බවින්, ජිණ්ණා ජරාවෙන් දිරූයෙමි. වුදෙධා වැඩිහිටි බවට පැමිණ අඟපසඟ ඇතියෙමි. මහල්ලකො උපතින් මහළු වූයේ වෙමි. අද්ධගතො බොහෝ කල් ගියේ, දීර්ඝ කාලයක් ඉක්ම ගියේ, වයො අනුසත්තෙනා හොති අවුරුදු සියයේ තුන්වන කොටස වූ අවසාන කොටසට පැමිණියෙමි. අහීතිකො මෙ වයො වත්තතීති මේ සූත්‍රය වනාහි භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණ වර්ෂයෙන් වදාළ සේක. එහෙයින් කියන ලදී. පරමාය උතුම් වූ, සතියා යනාදියෙහි පද සියයක් ද, පද දහසක් ද, කියත් කියත්ම උගෙනීමට සමර්ථ බව සති නම්. එය ම සිත්හි ලා විමසා ගැනීමෙහි සමත් බව ගති නම්. මෙසේ ගන්නා ලද්ද දරණ ලද්ද, හැදෑරීම් කරන්නට සමර්ථ බව, ධිති නම්. ඔහුගේ අර්ථයෙහි ද කරණයෙහි ද, දැකීමෙහි සමත් බව පඤ්ඤාවෙය්‍යත්තති නම් වේ.

දළහධම්මො ධනුග්ගහො දැඩි වූ දුන්නක් ගෙන සිටින දුනුවායෙක් දළ්හධනු නම්. 'දවිසහස්සත්ථාමං' දෙදහසක් පුරුෂයන්ගේ ශක්තිය ඇත්තේ යයි කියනු ලැබේ. දවිහස්සත්ථාම නම්, නගන ලද දුනු දඬුයෙහි (දුනුදිය ඇදීමෙහි) ගෙල පමණට ඔසොවන ලද ද, එම දුනුදියෙහි බඳනා ලද ලෝහ ඊයම් ආදීන්ගේ බර පොළවෙන් උඩට එසවේද, එයයි. සික්ඛිතො දහ දොළොස් වසක් ගුරු ගෙදර උගන්නා ලද ශිල්පය ඇති, කතහත්ථො සමහරු ශිල්පය උගනියි. පළපුරුද්ද (කෘතහස්ත බව) ඇති නොවේ. මේ වනාහි පළපුරුද්ද ඇත්තේ වෙයි. වශීතාව ඇත්තේ වෙයි. කතූපාසනො රාජකුල ආදියෙහි දක්වන ශිල්ප ඇත්තේ ලහුකෙන අසනෙනා ඇතුළත සිදුරුකොට පුලුන් ආදිය පුරවා කරන ලද ලා පිරියම් ඇති සැහැල්ලු ඊයෙන්, මෙසේ කරන ලද්දේ, එක් ඉස්බක් යන ඊට දෙඉස්බක් යාමටද අට ඉස්බක් යන ඊය සොළොස් ඉසබක් යාමටද හැකිවීම සඳහායි. අටඅකසිරෙ නිදුකින්, අතිපාතෙය්‍ය ඉක්මවන්නේය. එවං අධිමනත

සකිමනෙතා යම් සේ ඒ ධනුර්ධර තෙමේ, ඒ වියත් සතරඟුල් සෙවනැල්ල වහාම ඉක්මවාද, එසේ පද සියයක්, පද දහසක්, ඉගෙනගන්ට හදාරන්ට, අර්ථාන්විත කරුණු, විමසන්නට සමත් වේ යන අර්ථයි. **අඤ්ඤතු අසිත පීත ඛායිත සායාතානි** වැළඳීම්, පානය කිරීම් ආදිය භාග්‍යවතුන් වහන්සේ විසින් ද, භික්ෂූන් විසින් ද, කළයුත්තාහු වෙත් ද, එම කාර්යයන් කරන පමණට කල්වේලා තබා යයි දක්වත්.

අපරියාදිනනයෙව ක්ෂය නො වූයේමය. ඉදින් එක භික්ෂුවක් කායානුපස්සනා විචාරයි. තව කෙනෙක් වේදනානුපස්සනාව විචාරයි. තව අයෙක් ධම්මානුපස්සනාව විචාරයි. මොහු විසින් විචාළ කල්හි මම විචාරන්නේ එකෙක් එකකු නොබලා ද, එසේ ඇතිකල්හි ඔවුන්ගේ වාරය පැමිණෙයි. එහෙත් එපරිද්දෙන් සර්වඥවරයන්ගේ වාරය නො පෙනෙයි. එක් වියත් සතරඟුල් ඡායාව පළමුවම භාග්‍යවතුන් වහන්සේ, තුදුස් ආකාරයකින් කායානුපස්සනාව ද, නවවිධ වූ වේදනානුපස්සනාව ද, සොළොස් ආකාර චිත්තානුපස්සනාව ද, පස් අයුරකින් ධම්මානුපස්සනාවද, වදාළහ. පළමුකොට මොව්හූ සතරදෙන සිටිත්වා. අනෙක් අය, සතර සම්‍යක් ප්‍රධන් වීර්යයෙහි ද, අනෙක් අය ඉද්ධිපාදයන් විෂයයෙහි ද, අනෙක් අය පංච ඉන්ද්‍රිය විෂයයෙහි ද, අනෙක් අය පංච බලය විෂයයෙහිද, අනෙක් අය සප්ත බොජ්ඣංග විෂයයෙහි ද අනෙක් අය ආර්ය අෂ්ටාංගික මාර්ග විෂයයෙහි ද, ප්‍රශ්න විචාරන්නාහු නම්, එය ද භාග්‍යවතුන් වහන්සේ විසඳන සේක. ඉදින් මොහු අටදෙන සිටිත්වා. ඉන් අනෙක් තිස්හත් දෙනෙක් බෝධිපාක්ෂික ධර්ම විෂයෙහි ප්‍රශ්න විචාරන්නේ නම් එය භාග්‍යවතුන් වහන්සේ එකෙණෙහිම විසඳන සේක. කවර හෙයින්ද, යම්හෙයකින් ලෞකික මහජනයා එක්පදයක් කියත්ද? එකල්හි ආනන්ද හිමියෝ අටපදයක් කියති. ආනන්ද හිමියන් එක පදයක් කියන කල්හි භාග්‍යවතුන් වහන්සේගේ දිව මොළොක් නිසාය. තොළ සුපර්ශිත නිසාය. වචනය නොගිලින ලද නිසාය. පෙරලීම සැහැල්ලු නිසාය. **අපරියාදිණණා යෙවසස සාරිපුත්ත තථාගතසස ධම්මදෙසනා** යනු එහෙයින් කියන ලදී.

එහි **ධම්මදෙසනා** යනු පෙළතැබීම, **ධම්මපද බ්‍යඤ්ජන** පෙළ සම්බන්ධී වූ පද ව්‍යඤ්ජනය, ඒ ඒ අර්ථයෙහි ව්‍යඤ්ජන සංඛ්‍යාත අක්ෂරය, **පඤ්හ පටිභානං** ප්‍රශ්න විසඳීම, මෙයින් කුමක් දක්වන්නේද, තථාගතයන් වහන්සේට පෙර තරුණ කාලයෙහි අකුරු පිඬුකොට පදයක් කියන්ට හැකිවෙයි. පදයන් පිඬුකොට ගාථාවක් කියන්ට හැකිවේ. අකුරු සතරකින්

හෝ අටකින් හෝ සොළසකින් හෝ පදයන්ගෙන් යුත් ගාථාවක් හෝ එවැනි ගාථාවක අර්ථ කියන්න හැකිවෙයි. තරුණ කාලයේ පැවැති මේ සියල්ල මහළු කාලයේදී ද, වෙනසක් නැතිවම පවතින්නේ යයි මෙයින් දැක්වේ. **මඤ්ඤකෙන චෙපි මං** යන මෙය බුද්ධබලය පැහැදිලි කිරීම සඳහා කල්පනා කොට අදහස් කොට ද වදාළහ. එහෙත් දශබලධාරීන් වහන්සේ ඇඳකට නංවා ගම් නියම්ගම් රාජධානිවලට ඔසවාගෙන යාමක් නම් නැත්තේමය. තථාගතයෝ පස්වන ආයු කොටසෙහි දත් වැටීම් ආදියෙන් නො මඩනා ලද්දාහු, රන්වන් සිරුර විරූප වීමකට පත්නොවීම දෙවි මිනිසුන්ට ප්‍රියමනාප අවදියෙහිම පිරිනිවෙත්.

නාගසමාලො යනු ඒ තෙරුන්ගේ නමයි. ප්‍රථම බෝධියේ විසිවසක් ඇතුළත උපවාණ - නාගිත - මේඝිය යන තෙරවරුන් මෙන් මෙතෙමේ ද බුදුන්වහන්සේගේ උපස්ථායකයෙක් විය. **විජයමානො** මද මද වූ වටාපත් සුළඟින් බුදුනට සුදුසු පරිසරය (ඍතුසුඛය) ඇතිකරමින් එතදවොච සියළු සූත්‍රාන්තයන් අසා භාග්‍යවතුන් වහන්සේගේ පෙර සිරිත වූ දුෂ්කර ක්‍රියාවෙහි පැහැදුනේ **එතං අච්ඡරියං භනෙත** යනාදී වචනය කීය. එහි අසුර ගසන්නාට සුදුසු නුයි අච්ඡරිය නම් වේ. පෙර නොවූ විරූවක් වූයේ නුයි අබ්භූත නම්. දෙකින්ම තමන්ගේ විෂ්මය දක්වයි. **කො නාමො අයං භනෙත** යන මෙය ඒකාන්තයෙන් ධර්ම පර්යායයි. සොඳුරුය. භාග්‍යවතුන් වහන්සේ නැමද අයැද නාමය ගන්වන්නේ නම් මැනව යන අදහසයි. එකල භාග්‍යවතුන් වහන්සේ එයට නාමය ගන්නා සේක් **තසමාතිහ ත්වං** යනාදිය වදාළහ. එහි අර්ථය නම් යම්හෙයකින් මේ සූත්‍ර ධර්මය අසා තොපගේ ලොමුදැහැගත්තාහුද එහෙයින් නාගසමාල! තෙපි මෙහිලා මේ ධර්ම පර්යායය. 'ලොමහංසන පරියාය' නමින් සිත්හි ධාරණය කරගනුව යනුයි.

මහා සීහනාද සූත්‍ර වර්ණනාව නිමියේය.

1-2-3

එවමෙමසුතං යනු මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රයයි. එහි **සම්බහුලා** විනයට අනුකූලව තුන්දෙනෙක් 'සම්බහුලා' යයි කියති. එයින් මත්තෙහි 'සංඝ'ය. සූත්‍රාන්තයන්ට අනුකූලව තුන්දෙන, තුන්දෙනම වේ. ඊට වැඩි වූ පිරිස 'සම්බහුලා'ය නම් වේ. මෙහි සූත්‍රාන්ත ක්‍රමයෙන් සම්බහුල වූයේ යයි දතයුතු. **පිණ්ඩාය පවිසිංසු** පිඬු පිණිස පිවිසියාහුය. එහෙත් ඔව්හු ඒ තාක් නො පිවිසියාහුය. පිවිසෙන්නෙමුයි පිටත් වූ බැවින් 'පවිසිංසූ' යයි කීහ. කුමක් මෙන්ද යත්, ගමට යන්නෙමියි පිටත් වූ පුද්ගලයෙක් ගමට නොගියේ නමුත්, අසවලා කොහිදැයි කී කල්හි ගමට ගියේ යයි කියන්නාක් මෙනි. **පරිබ්බාජකානං ආරාමෝ** ජේතවනාරාමයට නුදුරින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමයක් ඇත. ඒ සඳහා කියන ලදී. **සමණෝ ආවුසෝ** ඇවැත්නි, ඔබලාගේ ශාස්තෘ වූ ශ්‍රමණ ගෞතම තෙම **කාමානං පරිඤ්ඤනති** කාමයන්ගේ ප්‍රහාණය ඉක්මවීම පනවයි. රූප වේදනා ආදිය පිළිබඳව ද මෙම පිළිවෙතමයි.

එහි තීර්ථකයෝ ස්වසමය දන්නාහූ ප්‍රථමධ්‍යානය කියමින් කාමයන්ගේ දුරුකිරීම (විනාශය) පනවන්නාහුය. එතකුදු වුවත් ඔව්හූ මේ ප්‍රථමධ්‍යානය මේ අරූපභවය මේ අසංඥ භවයයි නොදනිති. ඔව්හූ පැනවීමට නොහැකි වන්නාහුම හුදෙක් පනවමු පනවමු'යයි කියති. තථාගතයන් වහන්සේ වනාහි කාමයන් දුරුකිරීම අනාගාමී මාර්ගයෙන් පනවයි. රූප වේදනාවන් දුරුකිරීම රහත් මාර්ගයෙන් පනවයි. ඔව්හූ මේ මහත් වූ වෙනස දැක දැක ද **ඉධ නො ආවුසෝ කො විසෙසෝ** (මෙහි විශේෂයක් කොහින්දැයි) කීහ. එහි **ඉධ** මේ පැනවීමෙහි **ධම්ම දෙසනාය වා ධම්ම දෙසනං** ශ්‍රමණ ගෞතමයන්ගේ ධර්මදේශනාව සමග අපගේ ධර්මදේශනාව හෝ අපගේ ධර්මදේශනාව අනුව ශ්‍රමණ ගෞතමයන්ගේ ධර්ම දෙශනාව හෝ අරභයා යම් මේ වෙනස් කරුණක් කියවිද, ඒ කිනම්දැයි කියති. දෙවෙනි පදයේ ද මෙම ක්‍රමයමයි. මෙසේ ඔව්හූ මැදින් බිඳිගිය රනක් මෙන් වූ තමන්ගේ ලබ්ධිය, ශාසනය සමග සම තත්වයෙන් වචන මාත්‍රයෙන් තැබූහ. **නෙව අභිනන්දිංසු** මෙය එසේ යයි නොපිළිගත්තාහුය. **න පටිකොසිං** මෙය එසේ නොවේ යයි ප්‍රතික්ෂේපද නොකළහුය. කවර හෙයින්ද, ඒ තීර්ථකයෝ වනාහි අන්ධ වූවාහු දැන

හෝ නොදැන හෝ කියන්නහු යයි නොපිළිගත්තාහුය. **පරිභාසං** යන වචනයෙන් මදක් ශාසන ගන්ධය ඇතැයි ප්‍රතික්ෂේප නොකළාහුය. නොහොත් ජනපදවාසී වූ ඒ භික්ෂූහු බුදු සමය හා තීර්ථක සමය පිළිබඳව අතිශයින් සමර්ථ නොවූවාහු නිසා පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ නොකළාහුය.

න චෙප සමපායිසසනති සම්පාදනය කොට කියන්නට නොහැකි වන්නාහුය. **උත්තරිඤ්ච විඝාතං** සකසා නොකියහැකි හෙයින් මත්තෙහිද දුකට පැමිණෙන්නාහ. ඒ සත්‍යය සකස්කොට මනාව කීමට නොහැකි වන්නන්ට දුක් උපදනේමය. **යථා තං භිකඛවෙ අච්සයසම්ං** මෙහි යථා යනු කළයුතු වචනය. **තං** යනු නිපාතයකි. යම්හෙයකින් අවිෂය වූ ප්‍රශ්නයක් විචාරන ලද්දේය යන අර්ථයයි. **සදෙවකෙ** දෙවියන් සහිත වූයේ, **සමාරකෙ** ආදියෙහි ද මේ ක්‍රමයමයි. මෙසේ තුන් තැනක් 'ලොකෙ' යිද, දෙතැනක් 'පජාය'යි ද, තබා පද පසින් ම සත්ත්ව ලෝකය ම ඇතුළත් කොටගෙන මේ සදේවකාදී භේද ඇති ලෝකයෙහි ඒ දෙවියා හෝ මිනිසා නොදක්මියි දක්වයි. **ඉතො වා පන සුත්වා** මේ මාගේ ශාසනයෙන් හෝ අසා, ඒ එසේමයි. මේ ශාසනයෙන් අසා තථාගත නොවූයේ ද, තඝාත ශ්‍රාවක නොවූයේද ආරාධනා කරන්නේය. සතුටු කරන්නේය. අන් පරිද්දෙකින් සතුටු කිරීමක් නම් නැතැයි දක්වයි.

දැන් තමන් විසින් ඒ ප්‍රශ්නයන් විසඳීමෙන් චිත්තාරාධනය දක්වන්නේ **කොච භිකඛවෙ** යනාදිය වදාළහ. **කාමගුණ** කැමති කරවිය යුතුය යන අර්ථයෙන් කාම යෝම, බැඳීම් අර්ථයෙන් 'ගුණ' නම් වෙති. 'අනුජානාමි භිකඛවෙ අහතාන වත්ථානං දිවිගුණං සංඝාටිනති' යන මෙහි ගුණ ශබ්දය පට යන අරුතින් යෙදී ඇත. අවෙචනති කාලා තරයනති රත්තියො වයොගුණා අනුපුබබං ජහනති' යන මෙහි 'රැස' යන අරුත්හි ගුණ ශබ්දය දැක්වේ. 'සතගුණා දකඛිණා පාටිකංඛිතබබා' යන මෙහි 'ආනිසංස' යන අරුත්හි ගුණ ශබ්දය වැටේ. 'අනතං අනතගුණං' - 'කයිරමාලා ගුණෙ බහූ' යන මෙහි බන්ධනාර්ථයෙහි ගුණ ශබ්දය වැටේ. මෙහිද මේ බන්ධනාර්ථයම අදහස් කරන ලදී. එහෙයින් කියන ලදී. 'බන්ධනාර්ථයෙන් ගුණ නම් වෙති' **චකඛු විඤ්ඤෙඤ්ඤයා** චක්ෂුර් විඥානයෙන් දැක්ක යුත්තාහුය. මෙම ක්‍රමයෙන් 'සොත විඤ්ඤෙඤ්ඤයාදිය' පිළිබඳවද අර්ථ දතයුතුය. **ඉටඨා** සොයන ලද්දාහු හෝ නොසොයන ලද්දාහු හෝ වේවා **ඉෂ්ටාරම්මණ** වූවාහූ, අරමුණු ඉටු වූ යන අර්ථයි. **කනතා** කමනීය

වූවාහු, **මනාපා** සිත් අලවන්නාහු **පියරූපා** ප්‍රිය ස්වභාව ඇත්තාහූ, **කාමූපසංහිතා** අරමුණුකොට උපදනා වූ පංච කාමයෙන් යුක්ත වූවාහූ, **රජනීයා** ඇළුම් කටයුතු වූ, රාගෝත්පත්තියට කරුණු වූවාහු යන අර්ථයි.

යදි මුද්දාය යනාදියෙහි මුද්දා යනු ඇඟිලි පුරුක්වල සලකුණු තබා කරන හස්ත්‍ර මුද්‍රාවය. ගණනා නොසිඳුණු ගණන් කිරීමය. (එක දෙක ආදී වශයෙන්) **සංඛානං** යනු පිඬු ගණනය. යම් විද්‍යාවකින් කෙතක් බලා මෙහි මෙපමණ වී තිබෙන්නාහ. ගසක් බලා මෙහි මෙපමණ ගෙඩි තිබෙන්නේය. අහස බලා මෙහි මෙපමණ පක්ෂීහූ වන්නාහ යයි දනිත් ද එයයි. **කසී** යනු කෘෂිකර්මයයි. **වණිජජා** ගොඩ වෙළඳම, දිය වෙළඳම ආදී වෙළඳ ක්‍රමයි. **ගොරකඛනති** තමන්ගේ හෝ අනුන්ගේ ගෙරි සරක් රැකීමෙන්, පස්ගෝරස විකිණීමෙන් ජීවත්වන රැකියාවය. **ඉසසත්ථා** අවි ගෙන උවැටන් කරන කර්මයයි. ආරක්ෂක කාර්යයි. **රාජපොරිසං** අවි ආයුධවලින් තොරව රාජ්‍ය සේවයේ යෙදීමයි. **සිපපඤඤත** ඉතිරි වූ හස්ති ශිල්ප අශ්ව ශිල්ප ආදියයි. **සීතසස පුරකඛතා** ඊතලයට ඉලක්කය මෙන්, සීතලට පෙරටුව සිටියේ, සීතලෙන් පෙළෙනු ලබන්නේ යන අර්ථයි. උෂ්ණයෙහි ද මෙම පිළිවෙතමයි. **ඩංස** ඇට ලේ මැස්සෝ, **මකසා** සියලු මැස්සෝ **සිරිංසප** බිම හැසිරෙන, බඩගා යන සත්ත්වයෝ, දළඹු විශේෂයක්, **රිසසමානා** පෙළෙන්නේ ගැටෙන්නේ, **දවියමානා** මිරිකෙන්නේ, මැරෙන්නේ,

අයං භිකඛවෙ මහණෙනි, හස්ත මුද්‍රාදියෙන් ජීවිකාව කිරීමට පැමිණ, ශීතාදී ප්‍රත්‍යයන්ගෙන් ආබාධිතව පෙළෙන්නේ, **කාමානං** ආදීනවො කාමයන්හී උපද්‍රවය, උවදුරු යන අර්ථයි. **සන්දිට්ඨිකො** ප්‍රත්‍යක්ෂ වූ තමා විසින් දැක්කයුතු වූ, **දුකඛකඛන්ධා** දුක් රැස - **කාමහෙතු** ප්‍රත්‍යයාර්ථයෙන් කාමයෝ මොහුට හේතු වන්නේ යයි 'කාමහෙතු' යනු වේ. මූලාර්ථයෙන් කාමයෝ මොහුට නිදාන වේනුයි **කාම නිදාන** යනු වේ. ලිඟු පෙරලියෙන් කාමනිදානං යි කියන ලදී. කාරණාර්ථයෙන් කාමයෝ මොහුට කාරණානුයි. **කාමාධිකරණො** යනු වේ. එහෙත් ලිංග විපර්යාසයෙන් කාමාධිකරණං වේ. **කාමාන මෙව හෙතු** මේ නියම වචනයි. කාම ප්‍රත්‍යයෙන් උපදීමය යන අර්ථයි.

උටඨහතො ආජීව සමුටඨානක (උටඨාන) වීර්යයෙන් නැඟී සිටින්නහුගේ **ඝටතො** ආරම්භයෙහි පටන් නිරතුරුව ගලපන්නහුගේ,

වායමතො උත්සාහය, පරාක්‍රමය, ප්‍රයෝගය කරන්නහුගේ නාභිනිපඵජජනති නො නිපදිති. අතට පත් නොවෙති. සෝචති සිත උපන් බලවත් ශෝකයෙන් ශෝක කෙරෙයි. කිලමති ශරීරයේ උපන් දුකින් ක්ලාන්ත වෙති. පරිදෙවති වචනයෙන් වැළපෙයි. උරතතාලිං ළය පෙළා - කඳුති හඬයි. සමෙමාහං ආපජජති විසඥ වූවාක් මෙන් (සිහි මුලා වූවාක් මෙන්) අතිශයින් මුළා වූයේ වෙයි. මොඝං හිස්ය. අළුලො ප්‍රතිඵල රහිතය. ආරකඛාධිකරණං ආරක්ෂාව කරණකොට, කිනති කවර උපායකින් යමපිමෙ මා විසින්, ගොවිතැන් ආදිය කොට උපදනා ලද යම් ධනයක් වේ නම් තමපි නො නත්‍ථි ඒ කිසිවක් අද අපට නැත.

පුනචපරං භිකඛවෙ - කාම හෙතු යනාදියෙන් හේතුව දක්වා ම ආදීනව දක්වයි. එහි කාමහෙතු කාම හේතුවෙන් රාජානොපි රජුන් සමගද විවාද කරත්. කාමනිදානං යනු භාව නපුංසකයි. කාමයන් පදනම් කොටගෙන විවාද කරති යනු අර්ථයි. කාමාධිකරණං යනු ද භාව නපුංසකයි. කාමයන් කරණ කොටගෙන විවාද කෙරෙත්. කාමාන මෙව හෙතු ගම් නියම්ගම්, සේනාපති පුරෝහිත ආදීහු කාමයන්ම හේතුකොටගෙන විවාද කරත්. උපකකමනති පහර දෙත්.

අසිචමමනති කඩු හා පලිහ ආදියෙන් - ධනු කලාපං සනනයහිත්වා දුන්න ගෙන හියවුරු බැඳ, උභතො ව්‍යූළහ දෙපසින් රැස් වූ, පකඛන්දනති පිවිසෙති. උසූසූති ඊතලයත්, විජෙජා තලනෙත කරකවන කල්හි. තෙ තත්‍ථා ඔවිහූ ඒ සංග්‍රාමයෙහි, අදදාවලෙපනො උපකාරියො මෙහි මිනිස්සු ප්‍රාකාර පාදය අස්කුර සටහනින් ගඩොල්වලින් බැඳ මතුපිට සුණුවලින් ආලේප කරති. මෙසේ කරන ලද ප්‍රාකාරයෝ උපකාරියො උපකාරීහූ යයි කියනු ලැබේ. ඒවා තෙත් වූ මැටියෙන් ඉසින ලද්දාහු අදදාවලෙපනා නම් වේ. පකඛන්දනති ඒ (උපකාරීන්) යට සාරා සිටුවන ලද යකඩඋල්, ලී උල් ආදියෙන් විඳිනු ලබන්නාහූ බෙලසුල් බැවින් නැගීමට නොහැකි වන්නාහු ද, සමීපයට දුවත්. පකකටඨියා කකාරවන ලද ගොමවලින් අභිවගෙගන සතදන්තයෙන්, එය අටදන්තාර කොට නුවරදොර බිඳ ඇතුළට පිවිසෙන්නෙමැයි ආ කල්හි, ප්‍රාකාර දොරටුව මත්තෙහි සිටියාහූ ඒ සතදන්තයාගේ බැඳුම් යොත් බිඳ සතදන්තයෙන් මර්ධනය කරත්.

සතිමපි ජීහනති ගෘහ සන්ධි සිදිත්. නිලෙලාපනති ගම් පැහැර වහා විනාශයක් කරති. එකාගාරිකනති පනහක් හැටක් පමණ දෙනෙකු

විසින් පිරිවරා පණ පිටින් ගෙන ධනය ගෙන්වා ගනිත්. **පරිපතෙථපි තිටයනති** මංපැහැරීම් ද කරති.

අදධදණඩකෙහි පොලු මුගුරුවලින් පහරදීම සඳහා සතර රියන් පොල්ලක් දෙකට කඩා ගන්නා ලද දඬුවලින්, පොලුවලින්, **මිලංගථාලිකා** කැඳහැලි නම් වධය (දඬුවම) එය කරන්නාහු හිස්කබල ගලවා (ඔළුකටුව) රත් වූ යකඩ ගුලියක් එහි බහාලයි. එයින් හිස් මුල් කකියා ඇටමිදුලු උතුරා යයි. **සංඛමුණඩිකනති** සංඛ මුණ්ඩික නම් වධය දඬුවම දෙයි. එය කරන්නහු.

සම සිඳ සියළු කෙස් එකට ගැටයක් කොට දණ්ඩකින් සොළවා උපුටති. කෙස් සමග සම නැගෙයි. නැවත හිස්කබල බොරළුවලින් ගටා සෝදමින් සක්මන් කෙරෙති.

රාහු මුඛනති රාහු මුඛ නම් දඬුවම - එය කරන්නාහු අඬුවකින් මුඛය විවෘත කොට මුව තුළ පහනක් දල්වති. නොහොත් කන්සිළු පටන් මුඛය යකඩ කටුවකින් සාරයි. ලේ වැගිරී මුඛය පුරවයි. **ජොතිමාලික** සියළු සිරුර තෙල් පොඟවන ලද පාන්කඩවලින් ඔතා ගිනි දල්වති. **හත්ථපජෙජාතිකා** දෙඅත් පොල්තෙල් පාන්කඩවලින් වෙලා පන්දමක් මෙන් දල්වති. **එරක වතතිකං** එරකවත්තික නම් දඬුවම බෙල්ලේ යට පටන් ශරීරයේ සම ගලවා ගොප්ඇටය මත හෙළති. නැවත ඔහු යොත්වලින් බැඳ අදිති. ඔහු තමාගේම සම්වැටියෙහි පැටලි පැටලී වැටේ. **චීරකවාසිකං** චීරකවාසික නම් දඬුවම - අච්චුව පෙර සේම සම ගලවා තුනටියෙහි තබති. තුනටිය පටන් සම ගලවා ගොප්ඇටය මත තබති. උඩ යට සිරුර වැහැරි වතක් හැඳි අයෙකු මෙන් පෙනේ.

එණෙයයකං එණෙය්‍යකනම් අච්චුව-දඬුවම දෙවැලමිටෙහිද, දෙදණෙහි ද යකඩකුරු ගසා එම යකඩකුරු බිම සිටුවති. හෙතෙම යකඩ කුරු සතර උඩ බිම හොවිති. ඉක්බිතිව වටේට ගිනි දල්වයි. 'එණෙය්‍යකො ජොති පරිගගහො යථා' යනුවෙන් කියන තන්හිද මෙසේමැයි. ඔහු සන්ධි සන්ධිවලින් හුල් ඉවත්කොට සතර ඇටකොන්වලින්ම තබති. මෙවැනි වූ කම්කටොල්ලක් නම් නැත. **බළිසමංසිකං** දෙපස මුව ඇති බිළී කොක්කෙන් සම් මස් නහර උගුල්ලති. **කහාපණකං** සියළු සිරුර තියුණු වෑවලින් කෙළවර පටන් කහවණු පමණට පමුණුවමින් කොටති.

ඛාරාපතච්ඡිකං ශරීරය විවිධ ආයුධවලින් කොටා කොසුවලින් කාරම් දමති. සම් මස් නහර වැගිරී ඇටසැකිල්ල පමණක් ඉතිරි වෙයි.

පලිසපරිවතතිකං එක් ඇලයකින් හොවා කන් සිදුරෙහි යහුලක් සිටුවා, පෘථුවියේ සිටුවයි. අනතුරුව දෙකකුල්වලින් අල්ලා කරකවති. පලාලපීඨකං දැඟ වූ වධකයෙක් සිව්ය සම නොසිඳ, ඇඹරුම් ගලකින් ඇට තලා බිඳිති. ඉක්බිති කෙස්වලින් ඔසවයි. මස් රැසක්ම වෙයි. නැවත ඔහු කෙස්වලින්ම වෙළති. පිදුරු මිටියක් මෙන් කොට වෙළත්. සුනඛෙහිපි කීප දිනක් ආහාර නොදී බඩගින්නෙන් පෙළෙන සුනඛයන් ලවා කවති. ඔව්හු මොහොතකින් ඇටසැකිල්ල පමණක් ඉතිරි කරති. සමපරායිකො දෙවන ආත්මභාවයේ දී විපාක දේ යන අර්ථයි.

ඡන්දරාග විනයො - ඡන්දරාගපපහානං යනු නිර්වාණයයි. යම්හෙයකින් නිවණට පැමිණ පස්කම්හි ඡන්දරාගය දුරුවන්නේද, ප්‍රහීණ වන්නේද, එහෙයින් නිවණ ඡන්දරාග විනය, ඡන්දරාගපපහාණ යයි කියන ලදී. සාමං වා කාමෙ පරිජානිසසනති තෙමේ ම හෝ කාමයන් ත්‍රිවිධ පරිඥාවෙන් දැනගනිත්. තථත්තාය එබඳු බව, යථා පටිපනෙනා යම් පිළිවෙතකින් පිළිපන්නේ

ඛතතිය කඤඤාවා යනාදිය නොමද වූ මහත් වූ කුසලයකින් ගත් පිළිසිඳ ගැනීම් ඇත්තේ වස්ත්‍රාභරණාදිය ලබන තැනක උපන්නහු දක්වන්නට වදාරන ලදී. පනනරසවසසුදෙසිකා පසළොස් අවුරුදු වයස් ඇති, දෙවන පදයෙහිද මේ ආකාරමයි. වයස් ප්‍රමාණය කවරහෙයින් ගනීද? වර්ණ සම්පත්තිය දැක්වීම පිණිසයි. දුගී කුලයෙහි උපන්නා වූ මාගමගේ මෙකල පැහැ සටහන ටිකින් ටික පහදී. පුරුෂයන්ගේ වනාහි විසිවැනි වයස විසිපස්වැනි වයස කාලයන් රූප සම්පත්තිය ප්‍රසන්න වේ. නාතිදීඝා යනාදියෙන් සදොසින් තොර වූ වර්ණ සම්පත්තිය දක්වයි. වණණනිභා යනු වර්ණයෝමය.

ජිණණං ජරාවෙන් දිරූ, ගොපානසිවංකං ගොනැස්සක් මෙන් වක් වූ භොගගං මිදුණු, මෙයින් ඔහුගේ කුදු බවම දක්වයි. දණඩපරායනං සැරයටිය පිහිටකොට ඇති, සැරයටිය දෙවැනිකොට ඇති, පවෙධමානං කම්පා වන්නා වූ, ආතුරං ජරාවෙන් ආතුර වූ, ඛණඩදනතං ජරාවට පැමිණීම නිසා වැටුණු දත් ඇති, පලිතකෙසං සුදුපැහැ වූ කෙස් ඇති,

විලූනං තට්ට හිස ඇති, ඛලිතසිරං (පැසුණු) බල්ලාට හිස ඇති මුඩු හිස් ඇති, වලීනං ඇඟ රැළි වැටුණු තිලකාහත ගතතං සුදු ලප කළු ලපවලින් ගැවසුනු සිරුර ඇති, ආබාධිතං වැළඳුනු රෝග ඇති, දුකඛිතං දුකට පත්, බාළහගිලානං අසාධ්‍ය තත්ත්වයෙන් දැඩිව ගිලන් වූ, සීවථිකාය ඡඩ්ඩිතං අමු සොහොනෙහි දමන ලද, මෙහි ඉතිරි විස්තර සතිපට්ඨාන සූත්‍රයේ ආ පරිදිය. මෙහි ද නිර්වාණයම ඡන්ද රාග විනය නම් වේ.

නෙව තසමිං සමයෙ අතතව්‍යාබාධාය එසමයෙහි ද තමන්ට දුක් පිණිස නො සිතයි. අබ්‍යාපජ්ඣංයෙව, නිදුක් වූමය. යං භිකඛවෙ වෙදනා අනිචචා මහණෙනි, යම්හෙයකින් වේදනාව අනිත්‍ය වේද, එහෙයින් මේ අනිත්‍යාදී ආකාරය වේදනාවගේ ආදීනවය යන අර්ථයි. නිසසරණය' ගමන කියන ලද ආකාරයම වේ.

මහා දුකඛක්ඛන්ධ සූත්‍ර වර්ණනාව නිමියේය.

1-2-4

එවමෙමසුතං යනු චූල දුකඛක්ඛන්ධ සූත්‍රයයි. එහි සකෙකසු එනම් ජනපදයෙහි, ඒ ජනපදය ශාක්‍යරාජ කුමාරවරුන්ගේ වාසස්ථාන වූ බැවින් 'සක්ක' යයි ප්‍රසිද්ධියට පත්විය. ශාක්‍යයන්ගේ උත්පත්ති කථාව අම්බට්ඨ සූත්‍රයේ ආයේමැයි. කපිලවත්ථුසමිං එනම් නගරයෙහි එය වනාහි කපිල ඍෂිහුගේ නිවාසස්ථානයේ කළ බැවින් 'කපිලවත්ථු' යයි කියන ලදී. එය ගොදුරු ගම්කොට නිග්‍රොධාරාමෙ නිග්‍රොධ නම් ශාක්‍යයෙකි. හෙතෙම සෑති සමාගම් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වතට වැඩමකළ කල්හි තමන්ගේ නගරයට නුදුරුව රෝපණය කළ උද්‍යානයෙහි විහාරයක් කරවා භාග්‍යවතුන් වහන්සේට පිදීය. එම විහාරයේ වාසය කරන සේක යන අර්ථයි.

මහානාමො අනුරුද්ධ ස්ථවිරයන්ගේ සහෝදරයාය. බුදුන්වහන්සේගේ සුළුපියාගේ පුතාය. සුද්ධෝදන, සුකෙකාදන, සකෙකාදන, ධොතොදන, අමිතොදන යන පස්දෙන සහෝදරයෝයි. අමිතා නම්

දේවිය ඔවුන්ගේ නැගනියයි. තිස්ස තෙර ඇගේ පුත්‍රයාය. තථාගතයන්ද නන්ද ස්ථවිරයන් ද, සුද්ධෝදන රජුගේ පුත්‍රයෝය. මහානාම රජුද අනුරුද්ධ ස්ථවිරයන්ද සුකෙකාදන ගේ පුත්‍රයෝය. ආනන්ද ස්ථවිරයන් අමිතෝදනගේ පුත්‍රයාය. උන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේට බාලය, මහානාමට වැඩිමහල්ය. සකෘදාගාමී ආර්ය ශ්‍රාවකයෙකි.

දීඝරත්තං මාගේ සකෘදාගාමී පැමිණීම පටන් බොහෝකල් දනිමියි දක්වයි. **ලොභධම්මා** ලෝභ සංඛ්‍යාත ධර්මයෝ නානාවිධ ලෝභය සඳහාම කියයි. ඉතිරි දෙතැන්හි ද මෙම ක්‍රමයමැයි. **පරියාදාය තිට්ඨන්ති** ක්ෂය කොට සිටිත්. මේ 'පරියාදානය' නම් 'සබ්බං හත්ථිකායං පරියාදියිත්වා, සබ්බං අස්සකායං, සබ්බං රථකායං, සබ්බං පත්තිකායං පරියාදියිත්වා ජීවන්තං යෙව න අගගහෙසි' යන මෙහි ගැනීමෙහි ආයේය. 'අනිච්ච සඤ්ඤා භික්ඛවෙ! භාවිතා බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියති' යන මෙහි ක්ෂය කිරීමෙහිය. මෙහි ද ක්ෂය කිරීම අදහස් කර ඇත. එයින් කියන ලදී. 'පරියාදියිත්වාති ඛෙපෙත්වා' යනු

යෙන මෙ එකදා ලොභ ධම්මාපි යම් කරුණකින් එක් කලෙක ලෝභ සංඛ්‍යාත ධර්මයෝ ද මාගේ සිත ක්ෂය කොට සිටිත්දැයි විචාරයි. මේ රජතෙම වනාහි සකෘදාගාමී මාර්ගයෙන් ලෝභ, ද්වේෂ, මෝහයෝ නිරවශේෂ වූවාහූ ප්‍රහීණ වූ සංඥා ඇත්තේ විය. හෙතෙම මාගේ කෙලෙස් ප්‍රහීණ වූයේ ඇතැයි ද දනී. අප්‍රහීණ වූ නිසා ප්‍රහීණ වූයේ මුත් පෙරළා එන්නේ යයි හැඟීම් ඇත්තේ වේ. ආර්ය ශ්‍රාවකයන්ට මෙසේ සැකයක් උපදින්නේ ද යත්, එසේය උපදී. කවර හෙයින් ද? ප්‍රඥප්තියෙහි අදක්ෂ හෙයිනි. මේ ක්ලේශයෝ අසවල් මගින් නැසිය යුතු යයි මේ ප්‍රඥප්තියෙහි අදක්ෂ වූ ආර්ය ශ්‍රාවකයාට මෙසේ සැක උපදී. කිම, ඔහුට ප්‍රත්‍යවේක්ෂා නැත්ද? ඇත. එසේ වුවත් සියල්ලන්ටම එය සම්පූර්ණ වූයේ නොවෙයි. සමහරු ප්‍රහීණ වූ ක්ලේශයම ප්‍රත්‍යවේක්ෂා කරයි. එකක් අවශේෂ වූ ක්ලේශයමය. එකක් මාර්ගයම ය. එකක් ඵලයමය. එකක් නිර්වාණයමය. එසේ වුවත් මේ පංච ප්‍රත්‍යවේක්ෂාවන් අතුරෙන් එකක් හෝ දෙකක් නොලබන්නට නොවටී. මෙසේ යම් කෙනෙකුන්ට ප්‍රත්‍යවේක්ෂාව පරිපූර්ණ වූයේ නොවේද, ඔහුගේ මාරවධ්‍ය වූ ක්ලේශ ප්‍රඥප්තියෙහි අදක්ෂ භාවයෙන් මෙසේ වේ.

සො එව ඛො තෙ එම ලෝභයද, ද්වේෂය ද, මෝහය ද තොපගේ

සන්තානයෙහි, අප්‍රහීණය. ඔබ වනාහී ප්‍රහීණය යන හැඟීම් ඇත්තේ යයි දක්වයි. **සොච හි තෙ** ඒ තොපගේ ලෝභ ද්වේෂ මෝහ ධර්මය **කාමෙ** දෙපරිදි වූ කාමයන් පරිභෝග නොකරන්නෙහි නම්, අප මෙන් පැවිදි වන්නෙහි යයි දක්වයි. **අපපසසාදා** මද වූ සුව ඇත්තාහු, **බහුදුකඛා** මෙලොවදී ලබන ඵලය හා පරලොවදී ලබන ඵලය වූ දුක් රැසම මෙහි බොහෝය. **බහුපායාසා** මෙලොව හා පරලොවදී ලබන ඵලයන් වූ උපද්‍රවම මෙහි බොහෝය. **ආදීනවො** මෙලොව හා පරලොව උපද්‍රවයන් **එත්ථ හියේ‍යා** මේ කාමයන්හි ආදීනව මෙහි බොහෝය. ආස්වාදය වූ කලී හිමවත නිසා අබ ඇටයක් මෙන් අල්පය. මද වේ. **ඉති චෙපි මහානාම** මහානාමය, මෙසේත් ආර්ය ශ්‍රාවකයා විසින්, **යථාභූතං**, තත් වූ පරිදි ස්වභාව වූ, **සම්මා** මනාකොට න්‍යායයෙන් කාරණයෙන්, **පඤ්ඤාය** ප්‍රඥාවෙන් මොනවට දක්වන ලද වේයයි දක්වයි. එහි **පඤ්ඤාය** විදර්ශනා ප්‍රඥාවෙන් - අනාගාමී, අරහත් මාර්ග දෙකින් යන අර්ථයි.

සොච ඒ දෙමගින් දුටු කාමාදීනව ඇති ආර්ය ශ්‍රාවක තෙමේ **පීති සුඛනති** මෙයින් සප්පීතික වූ ඣාණයන් දෙක දක්වයි. **අඤ්ඤං වා සතො සතත තරනති** ඒ ධ්‍යාන දෙකට හෝ වඩා අතිශයින් ශාන්ත වූ, අනෙක් මත්තෙහි ධ්‍යාන දෙකද මාර්ග දෙකද, නෙව තාව අනාවටයී කාමෙසු හොති ඒ දෙමග පිළිබඳ සිටියා වූ ද, ආර්ය ශ්‍රාවක තෙම චතු ධ්‍යානයන්ට හෝ මාර්ගයන්ට හෝ නො පැමිණි බැවින් ඒ තාක් කාමයන්හි නොවැටෙනසුලු වූයේ නොම වෙයි. අනාවර්තන වූයේ අනොහෝග වූයේ නොවෙයි. ආවර්තත සහිත වූයේ ආහෝග සහිත වූයේම වෙයි. කවර හෙයින්ද? සතර ධ්‍යානයෙන් විෂ්කම්භන ප්‍රහාණයාගේ ද අභාවය වන හෙයිනි.

මයහමපි ඛො හුදෙක් තොප විසින්ම නොව මා විසින් ද **පුබ්බෙව සමෙබාධා** මාර්ග සම්බෝධියෙන් පළමුකොටම, **පඤ්ඤාය සුදිටඨං අහොසි** ඇතොවුරු නාටකයන් දුරු කිරීමෙහි ප්‍රඥාව අදහස් කරන ලදී. **පීති සුඛං නාජඣගමං සප්‍රීතික** වූ ධ්‍යානයන් දෙක නොලැබීම. **අඤ්ඤංවා සතො සනතතරං** මෙහි මතුයෙහි ධ්‍යානයන් දෙක හා සතර මාර්ග අදහස් කරන ලදී. **පචවඤ්ඤාසිං** ප්‍රතිඥා කළෙමි.

එකමිදාහං මහානාම සමයනති කවර හෙයින් ආරම්භ කළේද, මේ වෙනම අනුසන්ධියෙකි. යට කාමයන්ගේ ආස්වාදය ද, ආදීනවය ද, කියන ලදහ. නිස්සරණය නොකියන ලදී. එය කීම සඳහා මේ සූත්‍රය

ආරම්භ කර ඇත. කාමසුබල්ලිකානු යෝගය එක් අන්තයෙකි. අත්තකිලමථානුයෝගය අනිත් අන්තයයි. මේ අන්ත දෙකින්ම මගේ ශාසනය මිදුනේයයි දැක්වීම සඳහාද, මත්තෙහි ඵල සමාපත්ති ශීර්ෂයෙන් සියලු ශාසනය දැක්වීම සඳහාද මෙම දේශනාව ආරම්භ කර ඇත.

ගිජඣකූටෙ පබ්බතෙ ඒ පර්වතයෙහි ගිජුලිහිණියෙකු වැනි වූ මුදුනක් ඇති එහෙයින් 'ගිජුකුළු' යයි කියනු ලැබේ. නොහොත් ඒ පර්වතය මුදුනේ ගිජුලිහිණියෝ වෙසෙති යන අදහසින් 'ගිජුකුළු' යයි කියයි. **ඉසිගිලි පසෙසති** ඉසිගිලි පර්වතයේ පසෙක, **කාළසිලායං** කළු පැහැති ගල්තලාවෙක **උබභටඨකා හොනති** උඩුබැලි අතට සිටියාහු හෝ නොසිටියා හෝ වෙත්. **ඔපකකමිකා** උඩුකුරුව සිටීම් ආදී වූ තමාගේ උපක්‍රමයෙන් උපදවන ලද, **නිසණ්ණා ආවුසො** අනෙක් කරුණක් කියන්ට නොහැකි වන්නාහු නිසණ්ඨයාගේ මතුයෙහි දැමූ. **සබ්බඤ්ඤූ සබ්බදසසාවී** අපගේ ශාස්තෘ තෙමේ අතීත වර්තමාන අනාගත සියල්ල දනී. දකී යයි දක්වයි. **අපරිසෙසං ඤාණදසසනං පටිජානාති** ඒ අපගේ ශාස්තෘන් වහන්සේ ඉතිරි නැතිවම ධර්මය දන්නේ ඒ සේස රහිත ඤාණ දර්ශනය ප්‍රතිඥා කෙරෙයි. ප්‍රතිඥා කරන්නේ මෙසේම ප්‍රතිඥා කෙරෙයි. **චරතො ච මෙ තිටඨතොච -පෙ- පචචුපටඨිතං එහි සතතං නිතොර සමිතං** ඒ පදයේම සමානාර්ථ ඇති වචනයයි.

කිං පන තුමෙහ ආවුසො නිගණඨා! ජානාථ පතතකං වා දුකඛං නිජජිණණං යන මෙය භාග්‍යවතුන් වහන්සේ, 'පුරුෂයෙක් යමක් කෙරේද එය දැනගනී. කහවණු විස්සක් ණයට ගෙන දහයක් දී මා විසින් දහයක් දෙන ලද්දේය. දහයක් ඉතිරියයි දැනගනී. එයද දී සියල්ල දුන්නේ යයි දැනගනී. කුඹුරෙන් තුනෙන් එකක් කපා, එක කොටසක් කපන ලදහ. දෙකොටසක් ඉතිරියයි දැනගනී. එයද කැපූ කල්හි සියල්ල නිමියේ යයි දැනගනී. මෙසේ සියලු කටයුතුවල කරන ලද්ද හා නොකරන ලද්ද දැනගනී. තොපි විසින් ද එසේ දතයුතුයයි දක්වයි. **අකුසලානං ධම්මානං පහාණං** මෙයින් අකුසල් හැර කුසල් වඩා ශුද්ධත්වයට පැමිණි එක් නිසණ්ටයෙක්වත් තොපගේ ශාසනයේ ඇත්දැයි විචාරයි. **එවං සනෙතති** තොපගේ මෙසේ නොදන්නාකම ඇතිකල්හිම, **ලුද්දා රෞද්‍ර** වූ, හැසිරීම් ඇති, **ලොහිතපාණිනො ති** දිවි ඇත්තන් ජීවිතයෙන් තොර කරන්නහු, ලෙයින් තෙත් වූ අත් ඇත්තා වූ, ප්‍රාණීන්ට හිංසා කරන්නහුගේ ද ලෙයින් අත තවරනු ලැබේ. හෙතෙමේ ද ලෝහිතපාණි යයි කියයි. **කුරූර කමමනතා**

දරුණු ක්‍රියා ඇත්තාහූ, මව කෙරෙහි ද පියා කෙරෙහි ද ධාර්මික මහණ බමුණන් කෙරෙහි ද කළ අපරාධ ඇත්තාහූ මුව වැදි ආදී කෘර ක්‍රියා ඇත්තාහු.

නඛො ආවුසො ගොතම, මේ නිසණ්ඨයෝ 'මෙතෙමේ අපගේ වාදයෙහි දෝස දක්වයි. අප ද මොහුගේ වාදයෙහි දෝෂ දක්වමු යි සිතමින් ආරම්භ කළාහුය. එහි තේරුම නම් ඇවැත්නි, ගෞතමයෙනි, යම් ඒ ඔබ පිණිස සිවුරු දරමින් හැල්, මස්, බත් බුදිමින් දෙව් විමනක් වැනි වූ ගඳකිළියෙහි වෙසෙමින් සැපයෙන් සැපයට පැමිණෙන්නහුද? මෙසේ සැපයෙන් සැපයක් නො ලැබිය හැකියි. යම්සේ අපි උක්කුටිකප්ප ධනාදියෙන් නන්වැදෑරුම් වූ දුක් විඳිමුද? එපරිද්දෙන් දුකින් සැපත ලැබිය යුතුයි. සුඛෙනව භාවුසොති යන මෙය ඉදින් සැපයෙන් සැපයක් ලද හැකි වන්නේ නම් රජ තෙමේත් සැප ලබන්නේ යයි දක්වනු පිණිස කියන ලදී. එහි මාගධො මගධ රට අධිපති වූයේ සෙනියො යනු ඔහුගේ නමයි. බිම්බි යනු ආත්ම භාවයට නමයි. ඔහුගේ එම ආත්මභාවය සාර වූයේය. දර්ශනීයය. ප්‍රසාද ඵලවන්නේයයි ආත්මභාවයාගේ සමෘද්ධිය හේතුකොටගෙන බිම්බිසාර නම් කියනු ලැබේ. සුඛවිහාරීතරො මෙය ඔහු තුන් පහයෙහි තුන් වයස් ඇති නළුවන් සමග රජුගේ සැපත් විඳීම සඳහා කියති.

අදධා ඒකාන්තයෙන් සහසා අපපටිසංඛා සැහැසිකමක් කොට නොවිමසා රාග වශයෙන් රත්වූයේ, ද්වේෂ වශයෙන් දුෂ්ට වූයේ, මෝහ වශයෙන් මුළා වූයේ යම්සේ කියාද, එපරිද්දෙන් වචන කියන ලදැයි දක්වයි. එහි පටිපුචජ්ඡිසසාමි ඒ අර්ථයෙහි විචාරන්නෙමි. යථා වො ඛමෙය්‍ය යම් සේ තොපට රුචි වන්නේද, පහොති හැකිවෙයි. අනිඤ්ඡමානො නොසැලෙනුයේ, එකනත සුඛ පටිසංවෙදී ඒකාන්ත වූ සැපය විඳිනසුලු වූයේ අහං ඛො ආවුසො ! නිගණ්ඨා පහොමි එකනත සුඛ පටිසංවෙදී - මෙය තමන්ගේ ඵල සමවත් සුවය දක්වමින් වදාළහ. මෙහි ද කථාව දක්වනු පිණිස රාජ වාරයෙහි සතත යන්න ප්‍රශ්න කිරීම් දක්වන ලදී. සතත රතතින්දිවානි නපපහොති කී කල්හි සය පස සතර යයි කියනු ලබන්නේ ආශ්චර්ය නොවේද? එහෙයින් එක ආදිකොට දේශනා කරන ලද්දේය. ඉතිරිය සියලු තන්හි නො ගැඹුරු අර්ථ ඇත්තේය.

චුලල දුකඛකඛන්ධ සූත්‍ර වර්ණනාව නිමියේය.

1-2-5

එවමෙමසුතං යි අනුමාණ සූත්‍රයයි. එහි **භගෙගසු** එනම් ජනපදයෙහි, මෙහි වචනාර්ථය කී අනුසාරයෙන්ම දතයුතු. **සුංසුමාරගිරෙ** එනම් නගරයෙහි, ඒ නගර වස්තුව ගන්නා දිනයෙහි, නොදුරු තන්හි දිය විලෙක කිඹුලෙක් ශබ්ද කළේල. වචන කීයේල. එකල නගර නිර්මාණය කරන කල්හි 'සුංසුමාරගිර' යයි එයට නම් කළාහුය. **හෙසකලා වනෙ** හෙසකලා නම් වනයෙහි 'හෙසකලා වනෙ' යනු ද පාඨයි. **මිගදායෙ** ඒ පෙදෙස මුව පක්ෂීන්ට අභය දුන් තැන පිහිටියේය. එහෙයින් මිගදාය යයි කියනු ලැබේ.

පවාරෙති කැමති කරවයි. වදනතු අවවාද අනුශාසනා වශයෙන් කියත්වා! අවවාද කෙරෙත්වා. අනුශාසනා කෙරෙත්වා! යන අර්ථයි. සොව හොති දුබ්බචො හෙතෙමේ ද දුකසේ කියයුතු වූයේ වෙයි. කියන ලද්දේ නොඉවසයි. **දොවචසස කරණෙහි** දුර්වච බව කරන්නා වූ, මත්තෙහි ආ සොළොස් ධර්මයන්ගෙන් අපපදකඛිණගගාහි අනුසාසති යම්හෙයකින් යමක් කියන්නේ තෙපි මට කුමක් හෙයින් කියවුද? මම තමාහට කැප අකැප වරද නිවරද වැඩ අවැඩ දනිමියි කියාද, මෙතෙම අනුශාසනාව දකුණින් නො ගනීද, වමතින්ම ගනීද, එහෙයින් 'අපපදකඛිණගගාහී' යයි කියනු ලැබේ.

පාපිකානං ඉචඡානං ලාමක වූ අසත් සම්භාවන ප්‍රාර්ථනාවන්ගේ **පටිපඵරති** ප්‍රතිවිරුද්ධව සතුරුව සිටී. **අපසාදෙති** බාල වූ, අව්‍යක්ත වූ තොප විසින් කියන ලද්දේ කුමක්ද? තෙපිද කිය යුතුයයි සිතුයෙහි යයි මෙසේ ගැටුම් ඇතිකරයි. **පචචාරොපෙති** ඔබත් මෙනම් ඇවතට පැමිණියේ වෙහි පළමුකොට එයට පිළියම් කරවයි මෙසේ පෙරළා ආරෝපණය කෙරෙයි. **අඤඤෙන අඤඤං පටිචරති** අනිත් කරුණකින් හෝ වචනයකින්, අනෙක් කරුණක් හෝ වචනයක් වසයි. 'ඇවතට පැමිණියෙහි' කී කල්හි කවරෙක් පැමිණියේද? කුමකට පැමිණියේද? කොහි පැමිණියේද? කවරෙකුට කියවුද? කුමක් කියයිදැයි කියයි. මෙබඳු වූ කිසිවක් තා විසින් දක්නා ලදදැයි කී කල්හි නො අසමියි කන හෝ එළවයි. **බහිදධා කථං අපනාමෙති** මෙනම් ඇවතට පැමිණියේ වෙහිද?යි විචාරන ලද්දේ පැළලුප් නුවරට ගියෙමියි කියා, යළිත් තොපගේ පැළලුප් නුවර ගමන නො විචාරමි. ඇවත විචාරමු කියන ලද්දේ එයින් රජගෙදරට ගියෙමියි කියයි. රජ

ගෙදරට හෝ බමුණු ගෙදරට යව, ඇවතට පැමිණියේ වෙහි යි. එහිදී ඌරුමස් ලද්දේය යනාදිය කියමින් කථාව බැහැර විසුරුවයි. අපදානෙ තමාගේ චරිතයෙහි **න සමපායති** ඇවැත්නි, ඔබ කොහි වෙසෙහිද? කවරක් නිසා වෙසෙයිද? හෝ මා විසින් ඇවතට පැමිණෙන්නා වූ මෙතෙම දක්නා ලදැයි' තෙපි යමෙකුට කීයෙහිද? මෙතෙම කුමක් කෙරේද? එකල්හි තෙපි කුමක් කෙරෙහිද? යළි තෙපි කොහි වූයෙහිද? මෙතෙමේ කොහි වූයේද? හෝ මේ ආදී වශයෙන් චරිතය විචාරන ලද්දේය. සකස්කොට කියන්නට නොහැකි වෙයි.

තත්‍රාවුසො ඇවැත්නි, ඒ සොළොස් ධර්මයන්හි අතතනාව අතතානං **එවං අනුමිතිතබ්බං** මෙසේ තමන් විසින්ම තෙමේ ම ප්‍රමාණ කළයුතු, තුලනය කළයුතු, තීරණය කළයුතු **පචවෙක්ඛිතබ්බා** ප්‍රත්‍යවේක්ෂා කළයුතු, **අහො රතනානු සිකඛිනා** දවල්ද, රෑද හික්මෙන්නාහු විසින්, රෑ ද දවල්ද කුසල්දහම්හි හික්මෙන්නාහු විසින් ප්‍රීති ප්‍රමෝදයම ඉපදවිය යුතුය යන අර්ථයි.

අචෙජ වා උදපතෙත ති පැහැදිළි දිය බඳුනෙක හෝ මුඛ නිමිත්තං මුව පිළිබිඹුව, **රජං** ආගන්තුක දූවිලි, **අංගණං** එහි හටගත් තිලකයක් හෝ කැළලක් (ගඩුවක්) හෝ **සඛ්බපි මෙ පාපකෙ අකුසලෙ ධමෙම පහීණෙ** මෙයින් සියළු ප්‍රහාණය වදාළහ. කෙසේද මෙතෙක් අකුසල ධර්මයෝ පැවිද්දා සුදුසු නොවෙති. ප්‍රත්‍යවේක්ෂාව උපදවන්නහුට ප්‍රත්‍යවේක්ෂා ප්‍රහාණය වදාරන ලද්දේය. ශීලය පදස්ථාන කොටගත් කිසුණු පිරියම් ආරම්භ කර ධ්‍යාන සමවත් උපදන්නහුට (විෂ්කම්භන ප්‍රහාණය) ධ්‍යාන ලැබීමෙන් පංච නීවරණ දුරුකිරීම වදාරන ලදහ. සමාපත්තිය මූලාරම්භය කොට විදර්ශනා වඩන්නහුට තදංග ප්‍රහාණය කියන ලදී. ඵලයට පැමිණි පැමිණි කල්හි පටිපපසසදධි ප්‍රහාණය (සතර ශ්‍රාමණ්‍යඵල මාර්ගයෙන් කෙලෙස් ප්‍රහීණ කිරීම) කියන ලදී. නිවනට පැමිණි කල්හි නිස්සරණ ප්‍රහාණය ද මෙසේ මේ සූත්‍රයෙන් සියළු ප්‍රහාණයන් කියන ලද්දේය.

මේ සූත්‍රය භික්ෂු ප්‍රාතිමෝක්ෂය යයි පෞරාණිකයෝ කියති. මෙය දවසට තුන්වරක් ප්‍රත්‍යවේක්ෂා කටයුතුය. උදෑසන වසන තැනට පිවිස හුන්නහු විසින් මේ මෙපමණ කෙලෙස් මට ඇත්ද නැත්දැයි සිහියෙන් කල්පනා කළ යුතුය. ඉදින් ඇතැයි දක්නේ නම්, ඔවුන්ගේ දුරලීම සඳහා වෑයම් කළ යුතුය. ඉදින් නොදකී නම් මනා පැවිද්දෙක්මි යි සතුටුවිය

යුතුය. බත්කිස නිමවා රාත්‍රීස්ථානයෙහි හෝ දිවාස්ථානයේ හිඳ ප්‍රත්‍යවේක්ෂා කටයුතුය. සවස් යාමයේ වසන තැන සිට ප්‍රත්‍යවේක්ෂා කටයුතුය. තෙවරක් නොහැක්කේ නම්, දෙවරක් හෝ දෙවරක් නොහැක්කේ නම් එක්වරක් වත් අවශ්‍යයෙන්ම ප්‍රත්‍යවේක්ෂා කළයුතුය. ප්‍රත්‍යවේක්ෂා නොකරන්ට නොවටීමැයි. සෙස්ස සියලු තන්හි කියන ලද පරිද්දෙන්ම නොගැඹුරු අර්ථ ඇති වේ.

අනුමාණ සූත්‍ර වර්ණනාව නිමියේය.

1-2-6

එවමෙමසුතං යනු චේතෝඛීල සූත්‍රයයි. එහි චෙතොඛිලා යනු සිතෙහි තද බැව්, කසළ බැව්, කණු බැව් යනුයි. චෙතසෝ විනිබඳධා සිත බැඳ එකමිටට ගනිත්නුයි 'චෙතසෝ විනිබඳධ' නම් වේ. චුදධිං යනු සීලයෙන් වැඩීමට, මාර්ගයෙන් නැගීමට, නිර්වාණයෙන් විපුලබවට, නොහොත් සීල සමාධීන්ගෙන් වැඩීමට, විදර්ශනා මාර්ගයෙන් නැගීමට, ඵල නිර්වාණයන්ගෙන් විපුල බවට,

සතථරි කංඛති ශාස්තෘන්ගේ ශරීරය ගැන හෝ ගුණය ගැන සැක කෙරෙයි. ශරීරය පිළිබඳව සැක කරන්නේ උතුම් වූ දෙතිස් ලකුණෙන් පිරි ශරීරයක් ඇත්දැයි නැත්දැයි සැක කෙරෙයි. ගුණය පිළිබඳව සැක කරන්නේ අතීත අනාගත වර්තමාන දැනීමෙහි සමත් වූ සර්වඥතා ඥානය ඇත්දැයි හෝ නැත්දැයි සැක කෙරෙයි. **විචිකිචඡති** විමසමින් වෙහෙසෙයි. දුකට පැමිණෙයි. විනිශ්චය කරන්නට නො හැකි වෙයි. **නාධිමුචඡති** මෙය මෙසේ යයි නිශ්චයට නො පැමිණෙයි. **නසමපසීදති** ගුණයන් නිසා නුවණින් පිවිස නිසැක බවින් පහදින්නට නො කැළඹුනෙක් වන්නට නො හැකි වෙයි. **ආතපපාය** කෙලෙස් තවන වීර්යය කරන්නට, **අනුයොගාය** නැවත නැවත යෙදෙන්නට **සාතචචාය** සත්තක්‍රියා කරන්නට, **පධානාය**, ප්‍රධන් වීර්යය වඩන්නට, **අයං පඨමො චෙතොඛිලො** මේ ශාස්තෘන් කෙරෙහි සැක සහිත වූ පළමුවන සිතෙහි තදබව, මෙසේ මේ භික්ෂුවගේ අප්‍රහීණ වූයේ වේ.

ධමෙම පර්යාප්ති ධර්මයේ ද, ප්‍රතිවේධ ධර්මයේ ද, පර්යාප්ති ධර්මය පිළිබඳව සැක කරන්නේ, ත්‍රිපිටක බුද්ධවචනය, සුවාසුදහසක් ධර්මස්කන්ධය යයි කියති. මෙය ඇද්ද නැද්දැයි සැක කිරීමයි. ප්‍රතිවේධ ධර්මය පිළිබඳව සැක කරන්නේ විදර්ශනානිසංස මාර්ගය නම්. මාර්ගානිසංස ඵලය නම් සියලු සංස්කාරයන්ගේ දුරලීම නිර්වාණය නමැයි කියයි. එය ඇද්ද නැද්දැයි සැක කරයි.

සසංසෙ කංඛති සුපටිපන්න යනාදී පදයන්ගෙන් දැක්වෙන, එබඳු වූ පිළිවෙතට පිළිපන් සතර මාර්ගස්ථයෝය. සතරඵලයට පැමිණි ඇත්තෝය. අෂ්ට ආර්ය පුද්ගලයන්ගේ සමූහය වූ සංඝයා ඇත්තේද නැත්තේදැයි සැක කරයි. ශික්ෂාවෙහි සැක කරන්නේ අධිශීල ශික්ෂා, අධිචිත්ත ශික්ෂා, අධිපඤ්ඤා ශික්ෂා නම් වේ. ඒ ශික්ෂා ඇද්ද නැද්දැයි සැක කරයි. **අයං පඤ්චමෝ** මේ සබ්‍රහ්මචාරීන් කෙරෙහි කෝපසංඛ්‍යාත වූ පස්වැනි සිතේ තදබව, කසළ බව කණුහුල් බව වේ.

විනිබද්ධයන්හි කාමෙ වස්තු කාමයෙහි ද ක්ලේශ කාමයෙහි ද **කායෙ** තමාගේ ශරීරයෙහි, **රූපෙ** බාහිර රූපයෙහි, **යාවදත්ථං** යම්තාක් කැමතිවේද ඒතාක්, **උදරාව දෙහකං** බඩපුරා - එය වනාහි උදරය පිරීම කරන හෙයින් 'උදරාව දෙහකං' යයි කියනු ලැබේ. **සෙය්‍යසුඛං** ඇඳ පුටු සුවය ද **සෘතුසුවය** ද **පසසසුඛං** දකුණු පැත්තට වම් පැත්තට පෙරලෙමිනි. නිදන්නහුට යම් සුවයක් වේද එසේ උපන් සුවය **මිදධසුඛං** නිදි සුවය, **අනුයුතෙතා** විදිමින් මනාව විදිමින් වෙසේද, **පණිධාය** ප්‍රාර්ථනා කොට, **සීලෙන** යනාදියෙහි **සීලං** චතුපාරිශුද්ධි ශීලය, **වතං** සමාදානය, **තපො** තපස් රැකීම, **බ්‍රහමචරියං** මෛථුන විරතිය, **දෙවො වා භවිසසාමි මහේශාක්‍ය** දෙවියෙක් හෝ වන්නෙමි. **දෙවඤ්ඤතරො වා** අල්පේශාක්‍ය දෙවියන් කෙරෙහි හෝ එක්තරා කෙනෙක්,

ඍද්ධිපාදයන්හි ඡන්දය නිසා පැවති සමාධිය **ඡන්ද සමාධි** නම්. ප්‍රධාන වූ සංස්කාරයෝ **පධාන සංඛාර** නම් වෙති. **සමනනාගතං** ඒ ධර්මයන්ගෙන් යුක්ත වූ, ඍද්ධියගේ පාදය නොහොත් ඍද්ධි වූ පාදය **ඉදධිපාද** නම්. ඉතිරි කරුණු සඳහා ද මෙම න්‍යායමැයි. මේ මෙහි සංක්ෂේපයයි. විස්තර වනාහි ඉද්ධිපාද විභංගයෙහි ආයේමය. විශුද්ධි මාර්ගයෙහි මේ පදයන්හි අර්ථ දක්වන ලදී. මෙසේ මෙම සතර ඍද්ධිපාදයන්හි විෂ්කම්භණ ප්‍රහාණය රූපාවචර ධ්‍යාන ලැබීමෙන් පංච

නීවරණ දුරුකිරීම කියන ලද්දේය. **උසෙසාළහියෙව පඤ්ඤමී** එහි උසෙසාළහී යන්නෙන් සියළු තන්හි කටයුතු වීර්යය දක්වයි.

උසෙසාළහි පතතර සංග සමනනාගතො පංච චෙතොඛීල ප්‍රහාණයෝය. පංච විනිබද්ධ ප්‍රහාණයෝය. සතර ඍද්ධිපාදයෝය. වීර්යය යයි මෙසේ වීර්යය සමග පසළොස් අංගයකින් සමන්විත වූයේ, **භබෙබා** අනුරූප වූයේ, සුදුසු වූයේ, **අභිනිබහිදාය** නුවණින් කෙළෙස් බිඳීම පිණිස, **සමෙබාධාය** සතර මාර්ගයන්හි අවබෝධය පිණිස, **අනුතතරසස** ශ්‍රේෂ්ඨ වූ, **යොගකෙඛමසස** සතර යෝගයන්ගෙන් උපද්‍රව රහිත වූ, රහත් බැව්හී **අධිගමාය** ප්‍රතිලාභය පිණිස.

සෙය්‍යථා උපමා අර්ථයෙහි නිපාතයි. **පී** යනු සම්භාවනාර්ථයෙහිය. 'දෙකින්ම මහණෙනි, යම් සේ නම්' යනු දක්වයි. **කුකකුටියා අණ්ඩානි** අටයිවා දසවා දවාදසවා මෙහි කිකිළියගේ කියන ලද ආකාරයෙන් අඩුවැඩි ඌනාධික වූ ද බිජුවට වෙති. වචනයෙහි සිලුටු බව පිණිස මෙය කියන ලදී. මෙසේ ලෝකයෙහි සිලුටු වචන වෙයි. **තානසසු තානි+අසසු** වන්නාහුය යන අර්ථයි. **කුකකුටියා සමමා අධිසයිතානි** ඒ මව වූ කිකිළිය පියාපත් විහිදුවා ඒ බිජුවට මතුයෙහි සයනය කරන්නෙහි, මනාකොට මතුයෙහි හෝනා ලද්දීය. **සමමා පරිසෙදිතානි** කලින් කල ඍතු ගන්වන්නිය විසින් මනාකොට තෙත් කරන්නී, උණුසුම් කරන්නී, **සමමා පරිභාවිතානි** කලින් කල මනාකොට හාත්පස භාවිත කරන්නී කුකුළු ගඳ ගන්වන ලද්දී යන අර්ථයි. **කිඤ්චාපි තසසා කුකකුටියා** එම කිකිළිය විසින් මෙහි තුන් පරිද්දෙකින් ක්‍රියා කිරීමෙන් අප්‍රමාදය කොට (පමා නොවී) ද, ඒ කිකිළියට මෙවැනි කැමැත්තක් නූපදනේය. **අථ ඛො භබබාව තෙ ඉක්බිති** ඒ කුකුළු අටුව කියන ලද ආකාරයෙන් සුවසේ පිටත නික්මෙන්නට සුදුසු වූවාහුමය. යම්හෙයකින් ඔවුන් එම කිකිළිය විසින් මෙසේ තුන් ආකාරයකින් ඒ බිත්තර පරිපාලනය කරන්නේ කුණු නොවෙත්ද? ඔවුන්ගේ යම් තෙත් වූ දිය ගතියක් වේද? එය වියලි බවට යේද? කටුව තුනී වේද? එබැවින් දෙස, නිය, කොණ්ඩය, (කුඩුම්බිය) මුව තුඩ ආදිය රළු වේද? තුමුත් මේරීමට යේද? කටුව තුනී බැවින් පිටත ආලෝකය ඇතුළතට පෙනේද? එහෙයින් ඒකාන්තයෙන් අපි බොහෝ කලක් හකුළන ලද අත් පා ඇත්තමෝ සම්බාධයෙහි ශයනය කළෙමු. දැන් මේ පිටත ආලෝකය පෙනේ. එහි දැන් අපට සැපවිහරණය වන්නේයයි නික්මෙනු කැමතිව කටුව පයින් පහරති. කර දිගු කරති. එවිට ඒ කටුව දෙකක්ම බිඳෙයි. එකල්හි ඔව්හු

පියාපත් සලමින් ඒ මොහොතට ගැලපෙන සේ නාද කරමින් නික්මෙත්මය. නික්මී ගම් කෙත් හොබවමින් හැසිරෙත්.

එවමෙවඛො යන මෙය උපමා ප්‍රතිපාදනයයි. එය මෙසේ අර්ථය හා සසඳ දතයුතුය. ඒ කිකිළියගේ බිත්තර විෂයෙහි ත්‍රිවිධ ක්‍රියා කිරීම මෙන් මේ භික්ෂුවගේ වීර්යය පසළොස් වැනි කොට ඇති අංගයන්ගෙන් සමන්විත වේ. කිකිළියගේ ත්‍රිවිධ ක්‍රියා සම්පාදනයෙන් බිජුවට කුණු නොවන්නාක් මෙන් පසළොස් අංගයන්ගෙන් යුත් මහණහුගේ ත්‍රිවිධ අනුපස්සනා සම්පාදනයෙන්, විදර්ශනා ඥානයාගේ නො පිරිහීම වෙයි. කිකිළියගේ ත්‍රිවිධ ක්‍රියාකරණයෙන් බිජුවටවල තෙත් දිය ක්ෂයවීම මෙන්, මහණහුගේ ත්‍රිවිධ අනුපස්සනා සම්පාදනයෙන් භවත්‍රයානුගත වූ නිකාන්ති ස්නේහයාගේ ක්ෂයවීම වෙයි. බිජුවට පාලනයෙන් බිජුවට කටු තුනී වන්නාක් මෙන් භික්ෂූහුගේ අවිද්‍යා නමැති අණ්ඩකෝෂයාගේ තුනී බව ඇති වෙයි. කුකුළු පැටවුන්ගේ පා, නිය, තුඩුවල තදබව මෙන් ඒ භික්ෂූහුගේ විදර්ශනා ඥානය පිළිබඳ තියුණු රළු පැහැදුනු බව වේ. කුකුළු පැටවුන්ගේ බිහිකිරීම් කාලය මෙන් භික්ෂූහුගේ විදර්ශනා ඤාණය පිළිබඳ පිරිනැමුණු කාලය, වැඩුණු කාලය, ගැබ්ගන්නා කාලය වෙයි. කුකුළු පැටවුන්ගේ පා නියසිළින් හෝ මුවතුඩින් අණ්ඩකෝෂය (බිත්තර කටුව) පලා පියා සුවසේ නික්මෙන කාලය මෙන් ඒ භික්ෂූහුගේ විදර්ශනා ඥානය ගැබ් ගන්වා හැසිරෙන්නාහු තද්ජාතික වූ ඍතු පහසුව හෝ භෝජන පහසුව හෝ පුද්ගල පහසුව හෝ ධර්මශ්‍රවණ පහසුව හෝ ලැබ එක් අසුනක හුන්නාහුම, විදර්ශනා වඩන්නහුගේ පිළිවෙළින් පැමිණෙන ලද රහත් මගින් අවිද්‍යා අණ්ඩකෝෂය පලා අභිඥා නමැති පියා විහිදුවා, සුවසේ රහත් බවට පැමිණි කාලය දතයුතු.

යම් සේ කුකුළු පැටවුන් මුහුකළ බව දැන මවුතොමෝත් අණ්ඩකෝෂය බිඳී ද? එපරිද්දෙන් එබඳු භික්ෂූහුගේ නුවණ බිහිකිරීම දැන ශාස්තෘන් වහන්සේ ද,

උජ්ඣිත සිනෙහ මත්තනෝ - කුමුදං සාරදිකංව පාණිනා
සනති මගමෙව බ්‍රූහය - නිබ්බාණ සුගතෙන දෙසිතං

සරත් කාලයෙහි උපන් කුමුදු මල් අතින් සිඳින්නාක් මෙන්, තමාගේ තෘෂ්ණා සංඛ්‍යාත ස්නේහය සිඳුව. නිර්වාණගාමී වූ අෂ්ඨාංගික මාර්ගයව වඩව, සුගතයන් විසින් නිර්වාණය දේශනා කරන ලද හෙයිනි.

ආදී වශයෙන් ආලෝකය විහිදුවන්නා වූ ගාථාවකින් අවිද්‍යා අණ්ඩකෝෂය පහකරණ සේක. හෙතෙම ගාථාව අවසානයේ අවිද්‍යා අණ්ඩකෝෂය බිඳ අරහත්වයට පැමිණෙයි. එතැන් පටන් යම් සේ කුකුළු පැටව් ගම් කෙත් හොබවමින් ඒ ඒ තැන හැසිරෙත් ද? එ පරිද්දෙන් මේ මහා ක්ෂීණාශ්‍රවයා ද, නිවන් අරමුණු කොට ඇති ඵල සමවතට සමවැද සංසාරාම හොබවමින් හැසිරෙයි.

මෙසේ මේ සූත්‍රයෙහි සතර ප්‍රහාරණයෝ වදාරණ ලදහ. කෙසේද චේතොඛීලයන්ගේ ද, චේතෝ විනිබද්ධයන්ගේ ද, ප්‍රහාණයෙන් පටිසංඛා ප්‍රහාරණය වදාරණ ලදහ. සෘද්ධිපාදයන්ගේ විෂ්කම්භන ප්‍රහාණයද, මාර්ගය පැමිණි කල්හි සමුච්ඡේද ප්‍රහාණය ද, ඵලය පැමිණි කල්හි ප්‍රතිප්‍රශබ්ධි ප්‍රහාණයද, වදාරණ ලදී. අවශේෂ සියලු තන්හි ප්‍රකට වූ අර්ථ ඇත්තේමය.

චේතොඛීල සූත්‍ර වර්ණනාව නිමියේය.

1-2-7

එවමෙමසුතං යනු වනපත්ථ සූත්‍රයයි. එහි **වනපත්ථ පරියායනති** ගමින් නුදුරු සෙනසුනක සිටින කාරණය. ගමින් නුදුරු සෙනසුනක සිට කළ දේශනය වේ. **වනපත්ථ උපනිසසාය විහරති** මිනිසුන්ගේ ඇසුර ඉක්මවන ලද වනලැහැබ් සෙනසුනක් ඇසුරුකොට මහණදම් පුරමින් වාසය කරයි. **අනුපටඨීතා** යනාදියෙහි **පුබෙබ අනුපටඨීතා සති** පෙර නො එළඹ සිටි සිහිය. එය ඇසුරුකොට වසන්නහුට **න උපටඨාති** නො එළඹේද? **පුබෙබ අසමාහිතං චිතතං න සමාධියති** පෙර සමාධියට නො පැමිණි සිත, සමාධියට නො පැමිණේද? **පුබෙබ අපරික්ඛීණා ආසවා න පරික්ඛයං ගචඡනති** පෙර තුනී නො කළ කෙලෙස් ප්‍රහීණයට නොයත්ද? **පුබෙබ අනනුපපතතං අනුතතරං යොගක්ඛෙම සංඛාතං** පෙර නොපැමිණෙන ලද නිරුත්තර වූ යෝගක්ෂේම සංඛ්‍යාත වූ අර්හත්වයට නො පැමිණේ ද යන තේරුමයි.

ජීවිත පරිකඛාරා ජීවිත රැකීම පිණිස වූ උපකරණයෝ සමුදානෙ තබබා රැස්කළ යුත්තාහ. කසිරෙන සමුදා ගවජනති දුකසේ උපදිත්ද, රතතිභාගං වා දිවසාභාගංවා දිවා රැ දෙක්හි, මෙහි රාත්‍රී කාලයේ ප්‍රත්‍යවේක්ෂා කරන්නහු රාත්‍රියෙහිම නික්ම යායුතුය. රාත්‍රියෙහි වග වළසුන් ආදීන්ගේ උවදුරු ඇතිකල්හි හිරු උදාවීම බලාපොරොත්තු විය යුතුයි. දවල් කාලය දැන දවල් නික්ම යා යුතුයි. දවල් උවදුරු ඇතිකල්හි හිරු බැසයාම (අත්ගල් පැමිණීම) බලාපොරොත්තු විය යුතුයි. සංඛාපි මෙසේ මහණදම් නොවැඩෙන බව දැන, වැලි අනතුරු වාරයෙහි සංඛාපි මහණදම් වැඩෙන බව දැන, යාවජීවං දිවි ඇතිතාක් විසිය යුතුයි.

සො පුගගලො යන පදයෙහි නා'නු බන්ධිතබෙබා යන මෙය සමග සම්බන්ධ වේ. අනාපුචඡා මෙහි වනාහි එම පුද්ගලයා නො විචාරා, පකකමි තබබං නික්ම යා යුතුය යන අදහසයි. සංඛාපි මෙසේ මහණදම් නොවැඩෙන බව දැන, සො පුගගලො නානු බන්ධිතබෙබා ඒ පුද්ගලයා අනුව බැඳීම නො කළ යුතුයි. තං අනාපුචඡං පකකමි තබබං ඔහු නො විචාරා නික්ම යා යුතු. අපි පනුජජමානෙන'පි බැහැර කරනු ලබන්නහු විසින්ද එය එසේමයි. මෙබඳු පුද්ගලයා දරමිටි සියයක්, දිය කළ සියයක්, වැළි අමුණු සියයක් හෝ දඩ ගෙවීමක් හෝ කරයි? මෙහි නො වසවයි හෝ බැහැර කරයිද? ඔහු සමා කරවා දිවි ඇති තාක් වාසය කළ යුත්තේමය.

වනපත්ථ සූත්‍ර වර්ණනාව නිමියේය.

1-2-8

එවමෙමසුතං යනු මධුපිණ්ඩික සූත්‍රයයි. එහි මහාවනං හිමවත සමග එකට බැඳුනු, රෝපණය නොකොට තෙමේ ම හටගත් ස්වාභාවික වනය විසාලාවෙහි රෝපණය කොට හැදුණු හා ස්වයංජාතව හැදුණු මිශ්‍ර වනය මෙන් නොවේ. දිවා විහාරායාති දහවල් දවස සමවතින් විසීම පිණිස බෙලුවලටඨිකාය තරුණ බෙලි ගසේ දණ්ඩපාණී, ජරාවෙන්

දුබලවීමෙන් දඬුගත් අත් ඇත්තේ නොවේ. මොහු තරුණ වියේ ප්‍රථම වයසේ සිටියේය. එහෙත් සැරයටියක් ගෙන ඇවිදීමේ කැමැත්ත නිසා රන්වන් වූ සැරයටියක් ගෙන හැසිරෙති. එහෙයින් දණ්ඩපානී යයි කියන ලදී. **ජංඝා විහාරං** කෙණ්ඩ විඩාව දුරලනු පිණිස, ශරීර සුවය සඳහා ඇවිදීමෙන් **අනුචංකමානෝ අනුවිචර මානෝ** ආරාම, වන, පර්වත ආදිය දැකීම සඳහා ඔබමොබ හැසිරෙන මෙතෙම, නිතර නික්මීම් ඇති හෙයින් එක් දිනක මෙසේ නික්ම ගියේල. **දණ්ඩමොලුබභා** කෝටුව (සැරයටිය) ඉදිරියට දිගුකරගෙන යන ගොපලු දරුවකු මෙන්, සැරයටිය ඉදිරියෙහි තබා ඒ මත දෙඅත් පිහිටුවා පිටිඅත්ල හක්කෙන් විකා එකත්පස්ව සිටියේය.

කිං වාදී කවර දෘෂ්ටි ඇත්තේද? **කිමකඛායී** කුමක් කියන්නේද? මේ රජු භාග්‍යවතුන් වහන්සේට නොවැඳ, පිළිසඳර පමණක් මැ කොට ප්‍රශ්න විචාරයි. කුමක් හෙයින්ද? දේවදත්ත පාක්ෂිකයෙක් නිසාය. දෙව්දත්හු තමන් හමුවට පැමිණෙන්නන් තථාගතයන් කෙරෙහි බිඳුවයි. හේ මෙසේ කියත්ල. ශ්‍රමණ ගෞතමයෝ අපගේ කුලය සමගින් වෛරය, අපගේ කුලයේ වැඩීම දියුණුව නො ඉවසයි. සක්විත්තෙකු විසින් පරිභෝග කටයුතු මගේ නැගණියය ද අත්හැර දමා, මෝ නසිවායි නික්ම ගොස් පැවිදි විය. මාගේ බෑනා ද සක්විති බීජයකැයි දැන, අපගේ කුලයාගේ වැඩීම සංවර්ධනය නො රුස්සන්නේ, ඔහු ද විනාශ වේවා යි සිතා ළදරු කාලයේ ම පැවිදි කරවීය. මා වූ කලී ඔවුන්ගෙන් වෙන්ව පවතින්නට නොහැක්කේ පසුව පැවිදිවීමි. එසේ පැවිදි වූ දින පටන් මා පිළිබඳව සෘජු ඇස්වලින් නො බලයි. පිරිස් මැද කථා කරන්නේ ද මහා පොරවකින් පහර දෙන්නාක් මෙන් දෙව්දත් අපායේ උපදින්නෙකි යනාදිය කියමිනි. මේ ආදී වශයෙන් මේ රජු ද දෙව්දතුන් විසින් බිඳවන ලද්දෙකි. එහෙයින් එසේ නොවැඳ සිටියේය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ යම්සේ මේ රජ මගෙන් ප්‍රශ්න විචාරන්නේ පිළිතුරු නොදී සිටියේ යයි කියන්නට ඔහුට නුපුළුවන් වේද? යම්සේක් දෙන ලද පිළිතුරෙහි අර්ථය මොහුට නො වැටහේද? එසේ සුදුසු කොට කිය යුතු යයි සිතා **යථාවාදි ඛෝ** ආදිය වදාළේය. එහි **න කෙනචි ලොකෙ විගගයහ** ලොවෙහි කිසිකෙනෙකු සමග විරුද්ධ ග්‍රහණයෙන් යුත් කථාවක් නො කෙරේද? විවාද නො කෙරේද? තථාගතයෝ ලෝකයා සමග විවාද නො කෙරෙති. එසේම ජනයාද තථාගතයන් අනිත්‍යයයි කී කල, නිත්‍ය යයි කියමින් ද, දුක් ය, අනාත්මය,

අශුභය කී කල, සුවය, ආත්මය, ශුභය යයි කියමින් විවාද කෙරෙති. එහෙයින් වදාළහ. **නාහං භික්ඛවෙ ලොකෙන විවදාමි ලොකො ච ඛො භික්ඛවෙ මයා විවදති** මහණෙනි, මම ලෝකයා සමග විවාද නො කරමි. එහෙත් ලෝකයා මා සමග විවාද කෙරේ. **න භික්ඛවෙ! ධම්මවාදී කෙනචි විවදති - අධම්මවාදී ච ඛො භික්ඛවෙ විවදති** මහණෙනි, ධර්මවාදී තෙම කිසිවකු සමග විවාද නො කෙරෙයි. මහණෙනි, අධර්මවාදීහු විවාද කෙරේ. **යථා යම් කරුණෙකින් කාමෙහි වස්තු කාමයන්ගෙන් ද, ක්ලේශ කාමයන්ගෙන් ද, තං බ්‍රාහමණං ඒ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයා අකථං කථිං** සැක රහිත වූවහු **ඡිනන කුකකුචචං** විපිළිසර කුකුස හා අත් පා කුකුසද, සිඳිනා ලද බැවින් පහ වූ සැක ඇත්තාහු, **භවා භවෙ** නැවත නැවත භවයෙහි, නොහොත් හීන ප්‍රණීත භවයෙහි, ප්‍රණීත වූ භවය වෘද්ධියට පැමිණියේ 'අභව' යයි කියයි. **සඤ්ඤා** ක්ලේස සංඥා, ක්ලේශයෝම මෙහි 'සඤ්ඤා' නාමයෙන් කියන ලද්දේය. එහෙයින් යම් කරුණකින් කාමයන්ගෙන් වෙන් වී වාසය කරන්නා වූ, ලෝකයෙහි විවාද රහිත වූ ඒ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයා කෙරෙහි ක්ලේශ සංඥාවෝ නො නැගෙත් ද නො පිබිදෙත් ද ඒ කාරණය මම දනිමි යනු මෙහි අදහසයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ ක්ෂීණාශ්‍ර භාවය දැක්වූ සේක.

නිලෙලාතෙථො බැහැරකොට, ක්‍රීඩා කරවා, **තිවිසාධං** රේඛා තුනක් ඇති, **නළාටිකං** නළල රැලිගන්වා, නළලෙහි ඉරි තුන දක්වමින් දණ්ඩ මොලබහ සැරයටිය පෙළා, තදින් සැරයටිය පොළවේ ඇන ගියේය යන අදහසයි.

අඤ්ඤතරො නමින් අප්‍රකට වූ එක් මහණෙක්, ඔහු ගැළපීමෙහි දක්ෂයෙකි. භාග්‍යවතුන් වහන්සේ විසින් 'යම් සේ දණ්ඩපානී තෙම නො දනී ද එපරිද්දෙන් මා විසින් කියන ලදැයි' වදාළ කල්හි කවර කරුණකින් භාග්‍යවතුන් වහන්සේ නොදතහැකි පරිද්දෙන් ප්‍රශ්නය වදාරණ ලදැයි මැනවින් ගලපා, භික්ෂු සංඝයා හට මේ ප්‍රශ්නය ප්‍රකට කරන්නෙමියි දසබලයන් අයැද, හුනස්නෙන් නැගිට සිවුර ඒකාංශකොට, ඇඟිලි දසය එක්කොට දොහොත්මුදුන් දී ඇදිලි බැඳ,

කිංවාදි භනෙත භගවා යනාදිය කීහ.

යතො නිදානං මෙය භාව නපුංසකය. යම් කරුණකින්, යම් කරුණක් ඇති කල්හි යන අර්ථයි. **පපඤ්ච සඤ්ඤානි තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්ච** යන

සමග යෙදුනු සංඥාවෝ, සංඥා නාමයෙන් තෘෂ්ණාදී ප්‍රපඤ්චයෝමැ කියන ලදී. එහෙයින් ප්‍රපඤ්ච කොට්ඨාසයෝ යනු මෙහි අර්ථයි. **සමුදාචරනති** පවතිත්. **එත්ත වෙ නත්ථි අභිනන්දි තබ්බං** ද්වාදශායතන සංඛ්‍යාත වූ යම් කරුණක් ඇති කල්හි ප්‍රපඤ්ච සම්ප්‍රයුක්ත වූ සංඥා කොට්ඨාශයෝ පවතිද්ද? මෙහි එක ආයතනයක ද, සතුටුවිය යුත්තක්, කිය යුත්තක්, ඇතුළත් කරගත යුත්තක් නැත යන අර්ථයි. (මම ය මාගේ යයි ගත යුත්තක් නැත යන අර්ථයි) **එත්ථ වෙ නත්ථි අභිනන්දිතබ්බං** මම ය මාගේ යයි සතුටුවිය යුත්තක් **අභිවදි තබ්බං** මම ය මාගේ යයි පැවැතිය යුත්තක්, **අජ්ඣොසෙ තබ්බං** ඇතුළත්ව ගිල අවසන්කොට ගතයුත්තක් (නැත) මෙයින් මෙම ආයතන විෂයයෙහි තෘෂ්ණාදීන්ගේ නො පැවැත්මම කියති.

එසවනෙතා මේ සතුටුවිය යුතු බව, පැවැතිය යුතු බව ආදිය නැති බවම රාගානුසයන්ගේ අන්තය ය. සියලුතැන්හි මෙම ක්‍රමයයි. දණ්ඩදාන යනාදියෙහි යම් චේතනාවකින් දඬු ගනී ද එය 'දණ්ඩ දාන' නම්. යම් චේතනාවකින් ආයුධ ගනී ද පරාමර්ශ කෙරේද ඒ චේතනාව සත්‍ථදාන නම්. මුදුන් පැමිණියේ කලහ නම්. විවිධ එල්බගැනීම්වලට පැමිණියේ විගහ නම් විවිධ වාදයට පැමිණියේ විවාද නම්. 'තෝ තෝ' යයි වචන පැවැත්තේ තුවං තුවං නම්. ප්‍රිය බව ශූන්‍ය කිරීම පෙසුඤ්ඤ නම්. අයථා ස්වභාවය වූ බොරු කියා ද ඕ මුසාවාද නම්.

එතෙ තෙ මේ දොළොස් ආයතනයන්හි, කෙලෙස් උපදනාහු මේ දොළොස් ආයතනයන් ඇසුරුකොට උපදිති. නිරුද්ධ වන්නාහු ද දොළොස් ආයතනයන්හිම නිරුද්ධ වෙති. මෙසේ යම්තැනෙක උපන්නාහුද එහිම නිරුද්ධ වෙති. ඒ මේ කාරණය සමුදය සත්‍ය ප්‍රශ්නයෙන් පැහැදිලි කළ යුතුය. **'සා ඛො පනෙසා තණ්හා කත්ථ උප්පජ්ජ මානා උප්පජ්ජති! කත්ථ නිවිසමානා නිවිසති'** උපදනා වූ මේ ත්‍රිවිධ තෘෂ්ණාවෝ කොතැන්හි උපදීද? නැවත නැවත පැවතීම වශයෙන් පිහිටා සිටින්නී කොතැන පිහිටා සිටී ද? **'යං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති - එත්ථ නිවිසමානා නිවිසති කිඤ්චි ලොකෙ පියරූපං සාතරූපං චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං** ලෝකයෙහි යම්කිසිවක් ප්‍රිය වූ ස්වභාව ඇත්තේ ද? මනාප වූ ස්වභාව ඇත්තේද? උපදනා වූ මේ ත්‍රිවිධ තෘෂ්ණාව මේ ප්‍රිය වූ මනාප වූ ස්වභාවයෙහි උපදී. පැවතීම වශයෙන් පිහිටා සිටින්නේ මෙහි පිහිටා සිටී. ලෝකයේ එබඳු වූ

ප්‍රිය ස්වභාවය මනාප ස්වභාවය කුමක්ද? ඇස ලෝකයේ ප්‍රිය ස්වභාවය මනාප ස්වභාවය මධුර ස්වභාවය ඇත්තේ වේ යනාදී වශයෙන් දොළොස් ආයතනයන්හිම ඒ තෘෂ්ණාවගේ උපත ද විපත ද කියන ලදී. යම් පරිද්දෙකින් තෘෂ්ණාව දොළොස් ආයතනයන්හි ඉපිද, නිර්වාණයට පැමිණ නිරුද්ධ වූවාහු ද, යළි ආයතනයන්හිම නිරුද්ධ වීයයි කියන ලදී. එපරිද්දෙන් මේ ලාමක අකුසල ධර්මයෝ ආයතනයන්හි නිරුද්ධ වේයයි දතයුතුය.

නොහොත් යම් මේ සතුටින් පිළිගන්නා වස්තුවල අභාවයම රාගානුසයාදීන්ගේ කෙළවර යයි ලබන ලද ව්‍යවහාර ඇති, නිර්වාණයෙහි ලාමක අකුශල ධර්මයෝ ඉතිරි නැතිවම නිරුද්ධ වෙත්. යමක් යමක් යම්තැනෙක නැද්ද, එය එතැන්හි නිරුද්ධ වූයේ නම් වේ. ඒ කාරණය නිරෝධ ප්‍රශ්නයෙන් දැක්විය යුතුය. **දුතියජ්ඣාන සමාපත්තස්ස විතක්ක විචාර වචී සංඛාර පටිප්පස්සද්ධි හොනති** දුතියධ්‍යාන සමාපත්තියට පැමිණීමෙන් විතර්ක විචාර, වචී සංඛාර කෙළෙස් බර හැරීම සිදුවේ ආදිය.

සත්ථු චෙව සංවණ්ණිතො ශාස්තෘන් වහන්සේ විසින් ද පසස්නා ලද්දේය. **විඤ්ඤූනං** මෙය කරණාර්ථයෙහි සාමි වචනයි. පණ්ඩිත වූ සබ්‍රහ්මසරුන් විසින් ප්‍රශංසා කරන ලද්දේය යන අදහසයි. **පහොති** හැකිවෙයි. **අතික්කමෙමව මූලං අතික්කමම ඛන්ධං හරය** නම් මුලෙහි හෝ කඳෙහි හෝ වන්නේ ද එය ද ඉක්මවා යන අර්ථයි. **එවං සමපදමිදං** මෙසේ සම්පත් ඇත්තේ, මෙබඳුය යන අර්ථයි. **අතිසිත්වා ඉක්මවා - ජානං ජානාති** දතයුත්තම දනී. **පසසං පසසති** දැක්ක යුත්තම දකී. යම්සේ ඇතැම් කෙනෙක් විපරීත වැ ගන්නේ දන්නේත් නොදනීද? දක්නේත් නො දකීද? භාග්‍යවතුන් වහන්සේ එසේ නො වෙති. භාග්‍යවතුන් වහන්සේ වනාහී දන්නා සේක් දනිති. දක්නා සේක් දකිති. එය මේ කෘත්‍යයෙහි මගපෙන්වන්නා යන අර්ථයෙන් **චක්ඛුභූතය**. විදීත කරණාර්ථයෙන් **ඤාණභූතය**. අවිපරීත ස්වභාව අර්ථයෙන් සද්ධර්මය පවත්වන හෙයින් හෝ සිතින් සිතා වචනයෙන් දේශනා කළ ධර්මයම වන්නේ යයි **ධම්මභූත** නම්ය. ශ්‍රේෂ්ඨ අර්ථයෙන් **බ්‍රහ්මභූත** ය. තව ද ඇසක් මෙන් වූයේ **චක්ඛුභූත** ය. මෙසේ මේ පදයන් ගේ අර්ථ දතයුතු. ඒ මේ (සිව්සස්) දෙසන හෙයින් **වත්තා** ය. පවත්නා හෙයින් **පවත්තා** ය.

අර්ථය වඩ වඩාත් පැහැදිලි කර දැක්වීමෙහි සමත් හෙයින් අත්ථසස නිනෙනතා ය. නිවන් අවබෝධය පිණිස පිළිවෙත දක්වන්නේ නුයි අමතසසදාතා ය.

අගරුකත්ථා නැවත නැවත යාඥා කරන්නේ ම ගරුකරන්නේ නම් වේ. තමන්ගේ ශ්‍රාවක පාරමී ඤාණයේ සිට, මහමෙර පතුලෙන් වැලි නගන්නෙකු මෙන් නො දත හැකි කොට කියන්නේ ද ගරු කරන්නේ නම් වේ. එසේ නො කොට අප විසින් නැවත නැවත යඥා නො කරවා අපට පහසුවෙන් දතහැකි ලෙස වදාළ මැනැවැයි කියන ලද්දේ වේ.

යං ඛො නො ආවුසො මෙහි කිසිවක් ඇත. කියයුතු වන්නේ නමුත්, ඒ භික්ෂූන් ද තමන් සමග ඇසුරු කරන්නෝ 'යං ඛො නො' යි කීහ. යම්හෙයකින් උද්දේශය ද ඔවුනට උදෙසන ලද ද, භාග්‍යවතුන් වහන්සේ නැවත තෙරුන්ට ද ඒ භික්ෂූන්ට ද භාග්‍යවත්හු ම වෙත්ද? එහෙයින් භගවා යන පදය සඳහා මෙසේ කීය. යම්සේ අපගේ භාග්‍යවතුන් වහන්සේ තොපට සැකෙවින් යම් උද්දේසයක් උදෙසා යන අර්ථයි.

චකඛුඤඤවාවුසො ආදියෙහි අර්ථය මෙසේය. ඇවැත්නි, ඇලීමේ හේතුවෙන් චක්ෂු ප්‍රසාදය ද, අරමුණු ස්වභාවයෙන් චතු සමුට්ඨානික රූපයන් ද නිසා චක්ෂුර් විඤඤාණය උපදී. තිණණං සංඝාති එසෙසා ඔවුන් තිදෙනාගේ එක්වීමෙන් ස්පර්ශය උපදී. ඒ ස්පර්ශය නිසා සහජාතාදි වශයෙන් එසස පචචයා වෙදනා ස්පර්ශය ප්‍රත්‍ය කොටගෙන වේදනාව උපදී. ඒ වේදනාව පිළිබඳව යම් අරමුණක් වෙදෙති විඳී ද? තදෙව සඤඤා තොමෝ ඒ අරමුණම හැඳින ගනී. සංඥාව යම් අරමුණක් හැඳින ගනී ද, තදෙව විතර්කය ඒ අරමුණම විතර්ක කෙරේ. විතර්කය යමක් විතර්ක කෙරේද? ප්‍රපඤ්චය ඒ අරමුණම ප්‍රපඤ්ච කෙරේ. තතො නිදානං මේ චක්ඛු රූපාදී කරණයන්ගෙන් පුරිසං පපඤඤව සඤඤා සංඛා සමුදාචරනති ඒ පමණ නොදන්නා ලද කාරණය ඇති පුරුෂයා ප්‍රපඤ්ච කොට්ඨාසයෝ මැඩපවත්වති. ඔහු පිළිබඳව පවතින් යන අදහසයි.

එහි ස්පර්ශ - වේදනා - සංඥාවෝ, චක්ෂු විඥානය සහ සහජාත වූවෝ වෙති. විතර්කය වූ චක්ඛු විඤඤාණන්තරාදී වූ සවිතර්ක චිත්තයන්හි දතයුතු. ප්‍රපඤ්ච කොට්ඨාශයෝ තෘෂ්ණාදී ප්‍රපඤ්ච, ජවනය හා සහජාත වූවාහු වෙති. ඉදින් එසේ නම් කුමක් හෙයින් අතීතානාගත ග්‍රහණය

කරන ලද ද? එසේ උපදින හෙයින්ය. දැන් යම්සේම චක්ඛුර් ද්වාරික වූ ප්‍රපඤ්චය ඇස ද, රූපය ද ස්පර්ශ වේදනා සංඥා විතර්කයන් ද නිසා උපන්නේ ද එපරිද්දෙන් අතීත වූ ද, අනාගත වූ ද, චක්ඛුර් විඤ්ඤෙය වූ රූපයන්හි ඒ ප්‍රපඤ්චයා ගේ උත්පත්තිය දක්වන්නේ මෙසේ කීහ. **සොතඤ්චාවුසො** ශ්‍රොත ආදියෙහි ද මෙම ක්‍රමයමයි.

සවන වාරයෙහි වනාහි **මනං** භවාංග සිත ධම්ම ත්‍රෙභූමක ධම්මාරම්මණය **මනො විඤ්ඤාණං** ආවර්ජනය හෝ ජවනය හෝ මෙනෙහි කොට ගත් කල්හි ස්පර්ශය වේදනාව සංඥාව විතර්කය යන මොව්හු ආවර්ජනය හා සහජාත වූවාහු වෙති. ප්‍රපඤ්චය ජවන සහජාත වෙයි. ජවනය ගත් කල්හි ආවර්ජනය සහිත වූ භවාංගය 'මන' නම් වෙති. නැවත ස්පර්ශාදී සියල්ලෝම සහජාත වූවාහුම වෙති. මනෝද්වාරයෙහි වනාහි යම් හෙයකින් අතීතාදී භේද වූ සියල්ලම අරමුණු වේද? එහෙයින් **අතීතානාගත පච්චුප්පන්නෙනසු** යන මෙය සුදුසුමැයි.

මෙවිට වෘත්තය දක්වන්නාහූ **සොවතාවුසො** යී දේශනාව ආරම්භ කළහ. **එසස පඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සති** ස්පර්ශ නම් එක් ධර්මයක් උපදනේ යැයි මෙසේ ස්පර්ශ ප්‍රඥප්තිය පනවන්නේ ය. දක්වන්නේ ය යන අර්ථයි. සියලු තැන්හි මෙම ක්‍රමයයි.

මෙසේ මෙය ඇතිකල්හි මෙය වේයයි දොළොස් ආයතනයන්ගේ වශයෙන් සියළු වෘත්තය දක්වා, දැන් දොළොස් ආයතනයන්ගේ ප්‍රතික්ෂේප වශයෙන් විවෘත්තය දක්වන්නේ **සො වතාවුසො චකඛුසමිං අසති** යන දේශනාව ආරම්භ කළහ. එහි පෙර කී ආකාරයෙන් ම අර්ථ දතයුතු.

මෙසේ ප්‍රශ්නය විසඳ දැන් ශ්‍රාවකයකු විසින් ප්‍රශ්නය කියන ලදැයි නිසැක වූවාහූ නොවවු. මේ භාග්‍යවතුන් වහන්සේ සර්වඥතාඥාන නමැති තුලාව ගෙන හුන් සේක. සිය කැමැත්තෙන්ම භාග්‍යවතුන් කරා මැ එළඹ නිසැක නැත්තෝ වවු යයි යොදවනු වෝ **ආකංඛමානා ච පන** යනාදිය කීහ.

ඉමෙහි ආකාරෙහි මේ කරුණ දැක්වීමෙන් ප්‍රපඤ්චයන්ගේ ඉපදීමට වෙනම කාරණයන්ගෙන් හා වෘත්ත විවෘත්ත කාරණයන්ගෙන් ද, **ඉමෙහි පදෙහි** මේ අක්ෂර කැටිකිරීම් මගින්, **බ්‍යඤ්ජනෙහි** වෙනම අක්ෂරයන්ගෙන්,

පණ්ඩිතො උගත් බවින් සමන්විත වූයේ නොහොත් ධාතු කුසල, ආයතන කුසල, පච්චයකාර කුසල, කාරණා කාරණ කුසල යන සතර කාරණයන් පිළිබඳ දක්‍ෂයන් වූයේ **මහාපඤ්ඤා** මහත් වූ අර්ථයන්, මහත් වූ ධර්මයන්, මහත් වූ නිරුක්තීන්, මහත් වූ ප්‍රතිභාණයන් අවබෝධ කිරීමෙහි සමර්ථ වූ, මහා ප්‍රඥාවෙන් සමන්විත වූයේ, **යථා තං මහා කච්චානෙන** යම් සේ මහා කච්චායන හිමියන් විසින් කියන ලද ද එසේ ඒ සඳහා 'තං' යැයි කයන ලදී. යම් සේ මහා කාත්‍යායන තෙරුන් විසින් එය ප්‍රකාශ කරන ලද ද, මම ද එය එපරිද්දෙන් ම ප්‍රකාශ කරන්නෙමි යන අර්ථයි.

මධු පිණ්ඩිකං මහත් වූ උක්සකුරු ගුළියක්, බඳනා ලද අග්ගලා ගුලියක් හෝ **ආසෙවනකං** සමව වැගිරිය යුතු රස ඇති ගිතෙල්, පැණි, මී, හකුරු, ආදීන් අතුරෙහි, සමව යෙදූ රස ඇති, **චෙතසෝ** (දහම් සිතිවිල්ලෙන්) සිතනසුලු වූ **දබබජාතිකෝ** පණ්ඩිත ස්වභාව ඇති, **කෝ නාමෝ අයං** මෙය (ආනන්ද) ස්ථවිරයන් වහන්සේ මෙම ධර්ම දේශනාව ඉතා සොඳුරුය, දශබලධාරීන් ගේ සියල්ල දන්නා නුවණින් ම මෙයට නාමය ගන්වන්නෙමි යි සිතා කීයේය. **තසමා** යම්හෙයකින් මීපැණි බිඳුවක් මෙන් මිහිරිද? එහෙයින් මධුපිණ්ඩික පරියා යොතෙවනං ධාරෙහි මධුපිණ්ඩික යන නම මැ ධරවයි වදාරයි. ඉතිරිය සියලු තන්හි ප්‍රකට අර්ථ ඇත්තේ මැයි.

මධුපිණ්ඩික සූත්‍ර වර්ණනාව නිමියේය.

1-2-9

එවමෙම සුතං යනු දෙවධා විතක්ක සූත්‍රයයි. එහි දෙවධා කත්වා, දෙවාධා කත්වා කොටස් දෙකක් දෙකක් කොට, **කාමවිතකෙකා** කාම ප්‍රතිසංයුක්ත වූ විතර්කය, **බ්‍යාපාද විතකෙකා** ව්‍යාපාද ප්‍රතිසංයුත්ත වූ

විතර්කය, **විහිංසා විතකෙකා** විහිංසා ප්‍රතිසංයුක්ත වූ විතර්කය. **එකං භාගං** අධ්‍යාත්ම වූ හෝ බාහිර වූ හෝ මහත් වූ හෝ සියුම් වූ හෝ මේ සියළු විතර්කයෝ ම අකුසල පක්ෂයේ ම වූයේ ම යයි කාම, ව්‍යාපාද, විහිංසා විතර්කයන් තිදෙන එක් කොටසක් කළෙමි. කාමයෙන් වෙන්වුනා වූ නෛෂ්ක්‍රම්‍ය සමග පවතින වූ විතර්කය. **නෙක්ඛම්ම විතකෙකා** නෙක්ඛම්ම විතර්කය නම් වෙයි. ඒ විතර්කය ප්‍රථම ධ්‍යානය තෙක් වටී. අව්‍යාපාදය සමග පවතින විතර්කය **අබ්‍යාපාද විතකෙකා** අවිහිංසා විතර්කය නම් වේ. එය කරුණා පූර්වභාගයේ පටන් ප්‍රථමධ්‍යානය තෙක් පවතී. **දුතියං භාගනති** මේ සියලු විතර්කයන්ම කුසල පක්ෂයෙහි වූයේම බැවින් දෙවෙනි කොටස කළෙමි. මේ මගින් බෝසතුන්ගේ විතර්ක නිග්‍රහය කරන කාලය කියන ලදී.

වසර හයක් ප්‍රධන් වීර්යය කරන්නා වූ බෝසතුන්ට විතර්කාදිය සමූහ සමූහව, මහා ගංගාවක සැඩපහර මෙන් පැවැත්තාහුය. එහෙත් සිහිමුළාවීමකින් වහා කාමවිතර්කාදිය ඉපිද, කුසල වාරය සිඳ, තුමූ අකුසල ජවන වාරයෝ වී සිටිති. එනිසා බෝසත්හු මෙසේ සිතූහ. මාගේ මේ කාම විතර්කාදිය කුසල වාරය වෙනස්කොට (කඩා) සිටිති. මම මේ විතර්කයන් දෙ කොටසක් කොට වාසය කරමි. කාම විතර්කාදීහූ අකුශල පක්ෂයේ වූවාහුයි එක් කොටසක් කරමි. නෛෂ්ක්‍රම්‍ය විතර්කාදිය කුශල පක්ෂයේ වූවහුයි එක් කොටසක් කරමි. ඉක්බිති අකුශල පක්ෂයෙන් ආවා වූ විතර්කය, මන්ත්‍ර බලයකින් කළු සර්පයෙකු දැඩිව පෙළා ගත්තාක් මෙන් ද, සතුරකු බෙල්ලෙන් මැඩ ගත්තකු මෙන් ද දමනය කරන්නෙමි. වැඩෙන්නට ඉඩ නො දෙන්නෙමි. කුශල පක්ෂයෙන් ආ විතර්කය වැසි කලෙක මේඝයක් මෙන් ද, මනා කෙතක හොඳින් වැඩෙන සල් පැළයක් මෙන් ද, වහ වහා වර්ධනය කරන්නෙමි යි (සිතීය.) හේ එසේ කොට අකුසල විතර්කයන් දුරු කළේය. කුසල විතර්කයන් වර්ධනය කළේය. මෙසේ බෝසතුන්ගේ විතර්ක නිග්‍රහ කාලය කියන ලද්දේ යයි දතයුතුය.

දැන් මෙවිට, යම්සේ ඔහුට විතර්කයෝ උපන්නාහු ද යම් සේ ඔවුන් නිග්‍රහ කළේද? එය දැක්වීම සඳහා **තසස මයහං භික්ඛවෙ** යනාදිය කීහ. එහි **අපපමත්තසසා** සිහියෙන් වෙන් නොවී සිටියාහු **ආතාපිනො** කෙලෙස් තවන වීර්යය ඇත්තා වූ **පහිතත්තසස** යවන ලද සිත් ඇත්තාහූ, **උපපජ්ජති කාම විතකෙකා** වසර සයක් ප්‍රධන් වීර්යය වඩන බෝසතුන්ට රජසුව පිළිබඳව හෝ ප්‍රාසාද පිළිබඳව හෝ, නිළියන් පිළිබඳව හෝ,

අන්තඃපුරය පිළිබඳව හෝ කිසියම් සැපතක් පිළිබඳව කාම විතර්කයක් පහළ වූයේ නැත. දුෂ්කර ක්‍රියාවෙහි ආහාර නොගැනීමෙන්, පමණ ඉක්මගිය කෘෂ භාවයට (කෙට්ටු වීමට) පැමිණි ඔහුට මෙසේ සිතිණ. ආහාර ප්‍රතික්ෂේප කිරීමෙන් විශේෂයක් උපදවන්නට නො හැකිය. යම්හෙයකින් ඕළාරික ආහාර ගන්නේ නම් ඉතා යෙහෙක. හෙතෙම පිඬු පිණිස උරුවෙල් දනව්වට පිවිසියේය. මිනිස්සු, පෙර මහා පුරුෂයා සමීපයට ගෙනත් දෙන ලද්ද ද නො පිළිගත්හ. දැන් ඒකාන්තයෙන් ඔහුගේ මනදොළ මුදන් පැමිණියේ වන. එහෙයින් තෙමේ ම ආයේ වනැයි ප්‍රණීත ආහාර පිදූහ. බෝසතුන්ගේ ජීවිත පැවැත්ම වැඩිකල් නොගොස්ම ප්‍රකෘති ස්වභාවයට පත්විය. ජරාවෙන් දිරීම් ස්වභාවයට පැමිණි ආත්ම භාවයක් සැප බොජුන් ලැබීමෙන් ප්‍රකෘති තත්ත්වයට නො පැමිණේ. එහෙත් බෝසත්තුමා වනාහි සැප වූ ආහාර ගැනීමෙන් වැළිත් තරුණ වූයේ නොබෝ කලකින් ම ආත්මභාවය ප්‍රකෘති ස්වභාවයට පැමිණියේය. ඉන්ද්‍රියයෝ වෙසෙසින් පැහැදුනහ. සමේ පැහැය පිරිසිදු විය. තාරකා සමූහයෙන් ශෝභන වූ අහස මෙන් දෙතිස් මහා පුරිස් ලකුණුවලින් සැරසුණු ශරීරය විය. හෙතෙම ඒ සිරුර බලා 'ඒ තාක් ක්ලාන්ත වූ ආත්මභාවය මෙසේ පෙරළා ප්‍රකෘති තත්ත්වයට පත්විනැයි සිතා තමාගේ ප්‍රඥා මහන්තත්වය හේතුකොටගෙන මෙසේ විනැයි මද වූද විතර්කය ගෙන කාම විතර්කය යයි (මෙනෙහි) කළේය.

පන්සල ඉදිරිපිට උන්නා වූ රුරු මෘග, පසඳ මෘග, ගවර, රෝහිත මෘග ආදී මෘග සමූහයන් ද, සිත්කලු වූ පියාපත් හා හඬ ඇති, මොනර වළිකුකුළු ආදී වූ කුරුළු සමූහයා ද, නිලුපුල්, කුමුදු, නෙළුම් ආදියෙන් ගැවසීගත් කුඩා විල් ද, නන්වැදෑරුම් මල්වලින් ගැවසීගත් පඳුරු ඇති වනරොදවල් ද, මැණික් මෙන් පිරිසුදු ජලය ගලා යන නේරංජරා නදියද, දැකීමෙන් ඔහුට මෙසේ සිත්විය. 'මේ මුව සමූහයෝ ද, පක්ෂි සමූහයෝද, කුඩා විල් වන ලැහැබ් නේරංජරා නදිය ඒකාන්තයෙන් දැකුම්කළුය. හොබනේය. හෙතෙම ඉතා සුළු වූ ද ඒ විතර්කය ගෙන කාම විතර්කයක් කළේය. එහෙයින් වදාළහ. **උපපජ්ජති කාම විතකෙකා**

අතතව්‍යා බාධායපි තමහට දුක් පිණිස සියලු තන්හි මෙම ක්‍රමය මැයි. කිම? යළිත් මහා සත්ත්වයන්ට ද්විවිධ දුක් පිණිස පවත්නා වූ විතර්කයෙක් ඇත්ද? නැත. එසේ වුවත් ප්‍රහාණය නොකොට සිටියහුගේ

විතර්කය යම්තාක් උභය දුක් පිණිස පවතීනුයි මේ නම් තුන ලබයි. එහෙයින් මෙසේ වදාළහ. **පඤ්ඤා නිරොධිකො** නූපන් ලෞකික ලෝකෝත්තර ප්‍රඥාවන් උපදින්නට ඉඩ නො දෙයි. ලෞකික ප්‍රඥාව අෂ්ට සමාපත්ති, පංචභිඥා වශයෙන් උපන්නත් සිඳ දමානුයි **පඤ්ඤා නිරෝධික** නම් වේ. **විඝාත පකඛිකො** දුක් කොටසෙහි වූයේ සංස්කරණය නොකළ නිර්වාණාමෘතය ප්‍රත්‍යක්ෂ කරන්නට ඉඩ නො දේනුයි **අනිබ්බාන සංවත්තනික** නම් වේ. **අබ්භත්ථං ගච්ඡති** ක්ෂය වීමට නැති බවට පත්වෙයි. දියබුබුළක් මෙන් නොපෙනී යයි. **පජහාමෙව** දුරු කෙළේම ය. **විනොදමෙව** බැහැර කළෙමිම ය. **ව්‍යනෙතව නං අකාසි** යනු විගතාන්ත වූවක්, ඉතිරි නොවූවක්, හාත්පසින් පරිච්ඡින්න වූවක්ම පිරිසිදින ලද්දක්ම කළෙමි.

බ්‍යාපාද විතකෙකා අනුන් පෙලීම පිළිබඳ විතර්කයක් නම් බෝසතුන් ගේ සිතෙහි නූපදී. එහෙත් අධික වර්ෂාව, අධික උෂ්ණය, අධික ශීතල ආදිය නිසා ඔහුගේ සිතෙහි වෙනස්වීම් ස්වභාවය ඇතිවෙයි. ඒ සඳහා බ්‍යාපාදවිතකෙකා යයි කීහ.

විහිංසා විතකෙකා මෙරමා කෙරෙහි දුක් ඉපිදවීම පිළිබඳ විතර්කයක් බෝසතුන්ට නූපදී. එහෙත් සිත්හී උඩඟු වූ ආකාරය එකඟ නොවූ ආකාරය එයි. එය ගෙන විහිංසා විතර්කය කළේ ය. පන්සල් දොරකඩ හුන්නේ සිංහ ව්‍යාඝ්‍ර ආදී ව්‍යාල මෘගයන්, උගරන් ආදී වූ කුඩා සතුන් නසන්නවුන් දකී. එකල්හි බෝසත්හු බිය රහිත වූ මෙම වනයෙහි ද මේ තිරිසන්ගත සතුන්ට ද සතුරෝ උපදිති. බලවත්හු දුබලයන් ගොදුරු කරගනිති. දුර්වලයන් කන්නේ යයි කරුණාව උපදවයි. අනෙක් බළල් ආදීන් ද, කුකුළු, මී ආදීන් කන්නවුන් දකී. ගමට පිණ්ඩපාතයේ යනවිට රාජ්‍ය නිලධාරීන් විසින් මිනිසුන්ට වධ බන්ධන පමුණුවනු දකී. තමන්ගේ ගොවිතැන් වෙළඳම් කරගෙන ජීවත් වන්නට ඉඩ නොලබයි. මේවා දැක කරුණාව උපදී. ඒ සඳහා **උපපජ්ජති විහිංසා විතකෙකා** යනාදිය වදාළහ. **තථාතථා** ඒ ඒ කියන ලද ආකාරයෙන් මේ කියන ලද වේ. කාම විතර්කාදීන් අතුරෙන් යමක් විතර්ක කෙරේද? යම් යම් විතර්කයන් පවත්වාද? ඒ ආකාර වූම කාම විතර්කාදි භාවයෙන් ඔහුගේ සිතේ නැමීම වෙයි. **පහාසි නෙකඛම්ම විතකකං** නෛෂ්ක්‍රම්‍ය විතර්කය දුරු කෙරෙයි. බහුල **ඔකාසි** බහුල කෙරෙයි. **තසස තං කාම විතකකාය චිතතං** ඔහුගේ ඒ සිත කාම විතර්කය පිණිස, යම්සේ කාම විතර්ක සම්ප්‍රයුක්ත වූයේ ද, එපරිද්දෙන් නැමෙයි යන අර්ථයි. සෙසු පදයන්හි ද මෙම ක්‍රමයමැයි.

දැන් අර්ථය පැහැදිලි කරන උපමාවක් දක්වන්නේ **සෙය්‍යථාපි** යනාදිය වදාළහ. එහි **කිටඨ සම්බාධෙ** වගාවෙන් හිරිහැර ඇතිකල්හි, **ආකොටෙය්‍ය** කෙලින්ම පිටට පහර දෙන්නේය. **පතිකොටෙය්‍ය** පිට හරහා ඉල ඇටවලට පහර දෙන්නේ ය. **සනනිරුන්ධෙය්‍ය** ආවරණය කොට සිටින්නේය, **සනනිවාරෙය්‍ය** ඇවිදීමට නො දෙන්නේය. **තතො නිදානං** ඒ කරුණින්, නොරක්නා වූ ගවයන් විසින් අනුන්ගේ වගාවන් පාළු කරයි යන අර්ථයි. අඥාන වූ ගොපල්ලා ගෙරි හරකුන් නො රක්නේ 'මොහු අපගේ බත් වැටුප් කයි. හරිහැටි හරකුන් රකින්නට ද නො හැකි වේ. අනෙක් කුලයන් සමග ආරාවුල් ඇතිකරන්නේ යයි ගව හිමියන්ගෙන් ද කුඹුරු හිමියන්ගෙන් ද දඬුවම් ලබයි. එහෙත් නුවණැති ගොපල්ලා මේ සතර භය දකිමින් හරකුන් මැනවින් රැකබලා ගනියි. ඒ සඳහා මෙය කියන ලද්දේය. **ආදීනවං** ආදිනව, උපද්‍රව, **ඔකාරං** ලාමක බව නොහොත් ස්කන්ධයන්ගේ පිවිසීම, **සංකිලෙසනං** කිලුටු බව, **නෙකඛම්මෙ** ගිහිගෙයින් වෙන්ව යාමෙහි **ආනිසංස** ඉතා පිරිසිදු බව, **වොදානපක්ඛං** මෙය සමාන අර්ථ ඇත්තේය. (පිරිසිදු බව) කුසල ධර්මයන් සම්බන්ධව නෛෂ්ක්‍රම්‍යයෙහි යහපත් පැත්ත දුටුවෙමි යන අර්ථයි. තව ද නෙකඛම්මං යනු කාමයන්ගෙන් වෙන් වූ සියලු කුශලය යන අදහසයි. එක් ධර්මයක් ගනු ලබන කල්හිම නිර්වාණය ම අදහස් වේ.

එහි උපමා සන්සන්දනය මෙසේ දතයුතු. වගාවට ඇති හිරිහැරය මෙන් රූපාදී අරමුණු ද, නො හික්මුණු ගවයා මෙන් දමනය නො කළ සිත ද, නැණවත් ගොපල්ලා මෙන් බෝසතුන් ද, චතුර්විධ භය මෙන්, උභය දුක්ඛයන් සඳහා වන ස්ව පර විතර්කයෝ ද, නැණවත් ගොපල්ලාගේ චතුර්විධ භය දැක, වගාවන් පාඨ නොකරන අයුරින් ගෙරින් රැකීම මෙන්, සාවුරුද්දක් ප්‍රධන් වීර්යය කරන්නා වූ බෝසතුන්ගේ ආත්ම පීඩාදී භය දැක රූපාදී අරමුණුවල කාම විතර්කාදිය නො ඉපදීම ද, එපරිද්දෙන් සිත රැකීම ද, දතයුතුය.

පඤ්ඤාදධිකො යනාදියෙහි නූපන් ලෞකික ලෝකෝත්තර ප්‍රඥාව ඉපදීම පිණිස ද, උපන් ප්‍රඥාව වැඩීම පිණිස ද, පවතීනුයි පඤ්ඤාවුදධිකො නම් වේ. දුක් කොටියාසයන්හි නො පවත්නීනුයි **අවිසාත පක්ඛිකො** නම් වෙයි. නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතීනුයි **නිබ්බාණ සංවත්තනිකො** නම් වෙයි. **රත්තිඤ්ඤෙවපි නං භික්ඛවෙ අනුවිතක්කෙය්‍යං** සෑම රාත්‍රියකම ඒ විතර්කය පවතින්නේ නම්, **තතො නිදානං** එය නිමිත්තකොට

උභතෝඝුඤ්ඤයඤ්ඤ ගැටෙන්නේය. උඩඟු බව පිණිස පවත්නේය. **ආරා දුරෙහි සමාධිමහා** උපචාර සමාධියෙන් ද අර්පනා සමාධියෙන් ද,

සො ඛො අහං භිකඛවෙ අජ්ඣත්තමෙව විත්තනති මහණෙනි! මට මාගේ සිත සමාධියෙන් දුරු නොවේවා'යි, අධ්‍යාත්මයෙහි ම සිත පිහිටුවමි. ගෝචරාධ්‍යාත්මයෙහි තබමි යන අදහසයි. **සනතිසාදෙමි** එහිම සිත හිඳුවමි. **එකොදිං කරොමි** එකඟ කරමි. **සමාදහාමි** මනාකොට පිහිටුවමි. මනාකොට අරමුනෙහි ආරෝපණය කරමි. **මා මෙ චිත්තං උභතඝුඤ්ඤි** මාගේ සිට නො ගැටේවා. නො සන්සුන්කම පිණිස, උඩඟුකම පිණිස නො පවතීවා.

උපපජ්ජති අබ්‍යාපාද විතකෙකා අවිහිංසා විතකෙකා මෙහි යට කියන ලද තරුණ විදර්ශනාව සමග උපන් යම් ඒ විතර්කයක් කාමයන්ට විරුද්ධ අර්ථයෙන් නෙක්ඛම්ම විතර්කයයි කියන ලද ද, ඒ විතර්කයම, ව්‍යාපාදයට විරුද්ධ අර්ථයෙන් අව්‍යාපාද විතර්කයයි ද, පීඩාවට විරුද්ධ අර්ථයෙන් අවිහිංසා විතක්ක යයි කියන ලදී.

මෙතෙකින් බෝසතුන්ගේ සමාපත්තිය නිසා විදර්ශනා පිහිටුවන කාලය කියන ලදී. බෝසත්හුගේ සමාධිය ද විපස්සනාව ද තරුණය. විදර්ශනා පිහිටුවා ඉතා බොහෝ කලක් හුන්නා වූ බෝසතුන්ගේ ශරීරය ක්ලාන්ත වෙයි. ඇතුළත ගින්නක් මෙන් වැටහෙයි. කිසිළිවලින් දහදිය ගළයි. මුදුනින් ගිනි වැටියක් මෙන් වැටහෙයි. සිත ගැටෙයි. වෙසෙසින් ගැටෙයි. සැලෙයි. ගැහෙයි. උපුටයි. ඔසවයි. යළි හෙතෙම සමවතට සමවැද ඒ සිත දමනයකොට, මෘදු වූවක් කොට, අස්වසා නැවත විදර්ශනාව පිහිටුවයි. නැවත බොහෝ වේලාවක් සිටින්නහුට එසේම වෙයි. හෙතෙම නැවත සමවතට වැද එසේම කරයි.

විදර්ශනාවට සමාපත්තිය බොහෝ උපකාර වෙයි. යම්සේ යෝධයාට කොටු පවුර බොහෝ උපකාර වේද, හෙතෙම එය ඇසුරුකොට යුද්ධයට පිවිසේද? එහි ඇතුන් අසුන් යෝධයන් ද සමග යුදකොට, ආයුධ අවසන් වූ කල්හි හෝ කෑම බීමේ අවශ්‍යතාවයක් ඇතිකල්හි, නැවත කොටුවට පිවිස ආයුධ ගනී ද, විඩාහැර කන්නේ ද බොන්නේ ද සන්නාහයත් නැවත හඳී ද ඒ සියල්ල කොට නැවත යුද්ධයට යේද? එහි යුදකොට යළිත් මළ මුත්‍රාදියෙන් පීඩිත වේද? කිසියම් කටයුත්තක් සඳහා

නැවත කොටුවට පිවිසේද, ඒ අවශ්‍යතා සම්පූර්ණ කොට නැවත යුදබිමට පිවිසේද මෙසේ යෝධයා හට පවුරුකොටුව මෙන් විදර්ශනාවට සමාපත්තිය බොහෝකොට උපකාර වන්නේය. සංග්‍රාමයට බසින්නා වූ යෝධයාට බලකොටුවට වඩා, සමාපත්තියට විදර්ශනාව අතිශයින් උපකාරී වන්නේය. සමාපත්තිය නිසා විදර්ශනාව පවතී. එහෙත් ස්ථිර වූ විදර්ශනාව සමාපත්තිය රකී. ස්ථිර වූවක් කරයි. යම්සේ ගොඩබිමදී, නැව ද නැවෙහි බඩු ද කරත්තය මගින් අදී. දියෙහි දී කරත්තය ද, කරත්තයේ බඩු ද, ගොනුන් ද නැව විසින් අදී. නැව හරස් දිය පහරවල් කපා සුවසේ සුන්දර වූ දිවයිනට යේද, එපරිද්දෙන් සමාපත්තිය නිසා විදර්ශනාව පවතින්නේ නමුත්, ස්ථිර වූ විදර්ශනාව සමාපත්තිය රකී. ස්ථිර වූවක්ම කෙරෙයි. සමාපත්තිය ගොඩබිමට පැමිණි කරත්තය මෙනි. විදර්ශනාව ජලයට පැමිණි නැව මෙනි. මෙසේ බෝසතුන්ගේ සමාපත්තිය නිසා විදර්ශනා පිහිටුවන කාලය වදාරන ලදැයි මෙ නයින් දතයුතු.

යක්‍ඛදෙව යනාදිය කෘෂ්ණ පක්‍ෂයෙහි කී අනුසාරයෙන්ම දතයුතුය. මෙහි දී අර්ථය පැහැදිලි කිරීම සඳහා උපමාවක් දැක්වීමට **සෙය්‍යථාපි** ආදිය කීහ. එහි ගාමනත **සමභතෙසූ** ගමට ගෙන ආ කල්හී **සති කරණීය** මෙව හොතීති එතා ගාවො මොව්හූ ගවයෝ යයි සිහිය ඉපිදවීම පමණක්ම කළයුතුය. ඔබ මොබ ගොස් පහරදීම් වැනි කිසිවක් නැත. එතෙ ධම්මා මොව්හූ සමථ විදර්ශනා ධර්මයෝ යයි සිහි ඉපිදවීම් මාත්‍රයක්ම කළයුතු වේ. මෙයින් බෝසතුන්ගේ සමථ විපස්සනා ස්ථාවර වූ කාලය කියන ලදී. එකල්හි වනාහි සමාපත්තිය පිහිටුවීමට සූදානම් වන්නහුට සමාපත්තීහු එක් ආවර්ජනාවකින් ම බැලීමකින් ම ඉන්ද්‍ර ගෝචරයට පැමිණෙත් ල, විදර්ශනාවට පැමිණ හුන්නේ සප්ත අනුපස්සනාවන්ට එක්වරම පැමිණෙන්නේ ල (ආරූඪ වන්නේල)

සෙය්‍යථාපි මෙහි කුමට දක්වත් ද? මේ වෙනම අනුසන්ධියකි. සත්ත්වයන්ට හිතවත් ව හැසිරීම ද, තමන්ගේ ශාස්තෘභාව සම්පත්තිය ද, දක්වන්නා වූ භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව ආරම්භ කළේය. එහි **අරඤ්ඤ** කැලෑවෙහි. **පවනෙ** වනලැහැබෙහි, අර්ථ වශයෙන් මේ පද දෙකම එකක්ය. පළමුවැන්නට දෙවැන්න සමානාර්ථයි. අයොගකෙඛම කාමො සතර ඕඝයන්ගෙන් ක්ෂේම වූ බිය රහිත ස්ථානය කැමති නොවන්නේ, භයම කැමති වන්නේ **සොවත්ථිකො** සුවපත් බව එළවන්නේ **පීති ගමනීයො** සතුටු සේ යා හැකි වූ, 'පීතගමනියෝ' යනු ද පාඨයි.

පිදහෙය්‍යා අතු ආදියෙන් වසන්නේය. **විවරෙය්‍ය** ප්‍රකට වූ මුඛය ඇතිකොට විවෘත කරන්නේ ය. **කුම්මගගං** ජල-වන-පර්වත ආදියෙන් අවුරන ලද නොමග, **ඔදහෙය්‍ය ඔකචරණං** ඔවුන්ගේ ගෙදොර හැසිරෙන්නෙකු මෙන් එක් දඬුමුවෙක් එක්තැනෙක තබන්නේය. **ඔකචාරිකං** දිග ලණුවකින් බඳින ලද ඔහුගේම මුවදෙන.

වැද්දා වනයෙහි මුවන් හැසිරෙන ප්‍රදේශයට ගොස් එහි වසයි. මේ මගින් නික්මෙති. මේ දිසාවේ හැසිරෙති. මෙහි දිය බොති. මේ මගින් පිවිසෙති ආදී වශයෙන් සලකා නියම මග වසා, නොමග විවෘත කර, කෘතිම මුවා ද කෘතිම මුව දෙන ද තබා තෙමේ ආවරණ සහිත තැනක සැඟවී සිටී. ඉක්බිති සවස් කාලයේ මෘගයෝ හාත්පසින්ම ආරක්ෂිත වූ වනයෙහි හැසිරෙ වතුර බී, මුව පැටවුන් සමග ක්‍රීඩාකොට වාසස්ථානවලට ඇවිත් කෘතිම මුවාද කෘතිම මුවදෙන ද දැක, අපගේ යහළුවන් පැමිණියේ වනැයි සිතා නිසැකව පිවිසෙති. ඔවුහු මගට පැවිසි වසා ඇති මග දැක මේ අපගේ මාවත නොවේයයි නො මගට ඇතුල් වෙති. මුව වැද්දා ඒ තාක් කිසිවක් නො කරයි. පිවිසි කල්හි රැළේ අන්තිමයාට හෙමින් ගසයි. හෙතෙම තැති ගනී. ඉන්පසු සියල්ලෝම තැතිගෙන භයක් උපන්නේයයි දැන ඉදිරිය බලන්නේ ජලයෙන් හෝ වනයෙන් හෝ පර්වතවලින් හෝ අවුරන ලද මග දැක, පිවිසි මගින්ම නික්මීමට ආරම්භ කරත්. මුව වැද්දා ඔවුන් නැවතුණු බව දැන මුල පටන් මුවන් තිහක් හතලිහක් මරාගනී. මේ සඳහා

එවං හි සො භික්ඛවෙ මහා මිගසංඝො

අපරෙන සමයෙන අනයව්‍යසනං තනුත්තං ආපජ්ජෙය්‍යාති යනාදිය වදාළහ.

නන්දිරාගසෙසතං අධිවචනං අවිජ්ජායෙන අධිවචනං යන මෙහි යම්හෙයකින් මේ සත්ත්වයෝ අවිද්‍යාවෙන් නුනුවණයෝ වැ, ඒ ඒ භවයන් පිළිබඳව ආසාවෙන් හාත්පසින් බැඳී රූපාලම්බන ආදියට පමුණුවන ලද්දාහු සසර දුක් නමැති ආයුධ පහර ලබත්ද, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දඩමුවා නන්දිරාග යයි ද දඩමුවදෙන අවිද්‍යාව යයි ද සමකොට දැක්වූහ.

මුව වැද්දා එක් දවසක් ඒ දඩමුවන්ගේ (කෘතිම) සිරුර, මිනිස් ගඳ ඉවත්කිරීම සඳහා අතුකඩකින් පිසදමා එක්තැනෙක තබා, දඩමුවදෙන රැහැනක් සමග හැරදමා, ආයුධයක් ද අතින් ගෙන දඩමුවා සමීපයේ සැඟවී සිටී. දඩමුවදෙන මුව සමූහයා හැසිරෙන තැනට අභිමුඛව යයි. ඈ දැක මුවෝ හිස් ඔසවා බලා සිටිති. ඕ ද හිස ඔසවා සිටී. ඔව්හූ අපගේ සමජාති ඇත්තියකැයි ගොදුරු ගණිති. ඕ ද තණ කන්නියක මෙන් සෙමින් සෙමින් සමීපයට යයි. වනයෙහි වූ මුවගණයාගේ ප්‍රධානියා ඇගේ වාතය ලැබ සිය පිරිස හැර ඈ වෙතට සමීප වෙයි. සත්ත්වයන්ට අලුත් අලුත් වූවහු ම ප්‍රිය මනාප වේ. දඩමුවදෙන වනමුවාට ඉතා ආසන්න වන්නට නොදී, ඔහුට අභිවූවාම පිටිපසින් පෙරළා අවුත් දඩමුවා වෙතට යයි. යම් යම් තැනෙක ඇගේ රැහැන පටලැවේද ඒ ඒ තැන කුරයෙන් ගසා මුදයි. වනමුවා දඩමුවා දැක, දඩමුවදෙන කෙරෙහි අතිශයින් මත්ව දඩමුවා කෙරෙහි ඊර්ෂ්‍යා කොට පිට නමා හිස සලමින් සිටී. ඒ අවස්ථාවේ ආයුධයක් දිවින් ලෙවන්නේ නමුදු ඒ කුමක්දැයි නොදනී. දඩමුව තෙමේ ද ඔහුගේ මතුභාගයෙන් ඒ මුවාට පහර දෙන්ට පහසු වේ නම් පිට නමයි. ඔහුගේ යට භාගයෙන් පහර දෙන්නට පහසු වේ නම් ළය උඩට නමයි. එකල්හි වැද්දා වනමුවාට සැතින් පහර දී එහිම හෙළා මස් ගෙන යයි. එපරිද්දෙන්ම යම්සේ ඒ මුවා දඩමුවදෙන කෙරෙහි අතිශයින් මත්වූසේ දඩමුවා වෙත ඊර්ෂ්‍යාකොට ආයුධයක් දිවින් ලොවින්නේ නමුදු ඒ කිසිවක් නො දනීද, එපරිද්දෙන්ම මේ සත්ත්වයෝ අවිද්‍යාවෙන් අතිශයින් අන්ධ වූවෝ කිසිවක් නො දන්නෝ රූපාදිය කෙරෙහි නන්දිරාගයට පැමිණ සසර දුක් නමැති ආයුධයෙන් පීඩාවට පත් වන්නේ යයි දක්වන භාග්‍යවතුන් වහන්සේ, දඩමුවා භව තණ්හාව වශයෙන් ද, දඩමුවදෙන අවිද්‍යාව වශයෙන් ද දැක්වූ සේක.

ඉති ඛො භිකඛවෙ විවටො මයා ඛෙමො මගෙගා මහණෙනි, මේ සත්ත්වයන්ගේ හිතසුව පිණිස හැසිරෙන මා විසින් සම්‍යක් සම්බෝධියට පැමිණ, 'මම බුදු වූයෙමි'යි නිශ්ශබ්දව නො සිට දම්සක් පැවැත්වීමෙහි පටන් ධර්මය දේශනා කරන්නහු විසින් අඤ්ඤාකොණ්ඩඤ්ඤ ආදී සුදුසු පුද්ගලයන්ට, ආර්ය අෂ්ටාංගික මාර්ගය විවෘත කරන ලද්දේමය. **පිහිතො කුමමගෙගා** අඤ්ඤා කොණ්ඩඤ්ඤ ආදී වූ දහම් අවබෝධ කිරීමට සුදුසු පුද්ගලයෝ, **ඌහතො කචරො** නන්දිරාගය දෙපලුකොට සිඳහෙලන ලද්දේය. **නාසිකා ඔකචාරිකා** අවිද්‍යාව සියල්ලෙන් සියල්ල මුළුමනින්ම

නසන ලද්දේයයි තමන්වහන්සේගේ හිතවත්ව හැසිරීම දැක්වූ සේක. ඉතිරිය සියලු තැන්හි ප්‍රකට අර්ථ ඇත්තේය.

ඛෙධාවිතක්ක සූත්‍ර වර්ණනාව නිමි.

1-2-10

එවමෙම සුතං විතක්ක සණ්ඨාන සූත්‍රයයි. එහි අධිචිත්ත මනුයුත්තෙන්න දස කුසල කර්මපථ වශයෙන් උපන් සිත සිතම මයි. විදර්ශනා පාදක වූ අෂ්ට සමාපත්ති චිත්තය ඒ සිතට වඩා අධික වූ චිත්ත යනුයි අධිචිත්ත නම් වේ. අධිචිත්තං අනුයුත්තෙන්න ඒ අධිචිත්තයෙහි යෙදුනහු විසින් එහි යෙදුණු මනාව යෙදුණු යන අර්ථයි. එහි මේ භික්ෂුව පෙරබත පිණ්ඩපාතයේ හැසිර, බතින් පසුව පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කරන්නේ, නිසීදනය (පත්කඩය) අසවල් රුක්මුල හෝ වනලැහැබෙහි හෝ පර්වත පාදයෙහි හෝ පල්ලමෙහි හෝ මහණකම් කරමියි නික්මෙන්නේ ද, එහි ගොස් අතින් හෝ පයින් හිඳිනා තැන තණ පරණලා ඉවත් කරයිද, ඔහු අධිචිත්තයෙහි යෙදුනාම වේ. හිඳගෙන මුහුණ කට සෝදා (අත් පා) එරමිණිය ගොතා වාඩි වී මූල කර්මස්ථානය ගෙන වාසය කරන්නේ අධිචිත්තයෙහි යෙදුනේම වේ.

නිමිත්තානි කාරණයෝ කාලෙන කාලං කලින් කල, කර්මස්ථානය නම් මොහොතක්වත් නො හැර නිරතුරුව මෙනෙහි කළයුතු නොවේද? භාග්‍යවතුන් වහන්සේ කුමක් හෙයින් 'කලින් කල' යයි වදාළේ ද, පෙලෙහි කර්මස්ථානයෝ තිස්අටක් බෙදන ලදහ. ඔවුන් අතුරෙන් තමන්ගේ සිතට රුචි වූ කර්මස්ථානයක් ගෙන, හුන්නා වූ මහණ විසින් යම්තාක් කිසියම් උපක්ලේශයක් නො උපදී ද, ඒ තාක් මේ නිමිත්තයන්ගේ මනසිකාර කෘත්‍යයක් නැත. යළිත් යම්විටක උපක්ලේශයක් උපදීද, එකල මේ නිමිති

ගෙන සිතෙහි උපන් අර්බුදය බැහැර කටයුතු යයි දැක්වීමට මෙසේ වදාළහ.

ඡන්දූපසංහිතානි ඡන්ද සහගත වූ රාගය හා යෙදුනා වූ මේ තුන් විතර්කයන්ගේ උත්පත්ති ස්ථානය ද, අරමුණ ද දතයුතුයි. එහි ඡන්ද සහගත වූ විතර්කයන්ට ලෝභ සහගත සිත් අටදෙන ක්ෂේත්‍රයයි. උපන් බිමයි. ද්වේෂ සහගත විතර්කයන්ට, දෝස සහගත සිත් දෙදෙන උපන් බිමයි. මෝහ සහගත විතර්කයන්ට අකුසල් සිත් දොළසම උපන් බිම වන්නාහ. විචිකිච්ඡා උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත් දෙදෙන මොවුන්ට තම තමන්ට අයත් ක්ෂේත්‍රයි. සියල්ලන්ට ම සත්ත්වයෝ ද සංස්කාරයෝ ද අරමුණු වේ. ඉෂ්ට අනිෂ්ට වශයෙන් නො සමව බලන ලද සත්ත්වයන් කෙරෙහි ද සංස්කාරයන්හි ද විතර්කයෝ උපදිත්.

අඤ්ඤං නිමිත්තං මනසිකා තබ්බං කුසලූපසංහිතං එහෙයින් ඒ නිමිත්තට අන්‍ය වූ කුසල නිමිත්තක් මෙනෙහි කළ යුතුය. එහි අනෙක් නිමිත්ත නම් ඡන්ද සහගත වූ විතර්කයක් සත්ත්වයන් තුළ උපන් කල්හි අශුභ භාවනාව අන්‍ය නිමිත්ත නම් වේ. සංස්කාරයන් කෙරෙහි උපන් කල්හී අනිත්‍යය මෙනෙහි කිරීම අන්‍ය නිමිත්ත නම් වෙයි. ද්වේෂ සහගත විතර්කයක් සත්ත්වයන් තුළ උපන් කල්හී මෛත්‍රී භාවනාව අනෙක් නිමිත්ත වේ. සංස්කාරයන් කෙරෙහි උපන් කල්හි ධාතු මනසිකාරය අනෙක් නිමිත්ත නම් වේ. මෝහ සහගත විතර්කයක් යම්කිසිතැනෙක උපන් කල්හි පංච ධර්මයන් ඇසුරු කිරීම අනෙක් නිමිත්ත වේ.

මොහුගේ අත් හෝ පා හෝ හොබනාහුය යනාදී ක්‍රමයෙන් සත්ත්වයන් කෙරෙහි ලෝභය (ආශාව) උපන් කල්හි අශුභ වශයෙන් කල්පනා කළ යුතුය. කුමක් කෙරෙහි ඇලුනේද? කේශයන්හි ඇලුනේ වෙයි. ලෝමයන්හි ඇලුනේ වෙයි. මුත්‍රයෙහි ඇලුනේ වෙයි. මේ ආත්මභාවයෙහි නම්, තුන්සියයක් ඇටවලින් ඔසවන ලද්දේය. නවසියයක් නහරවලින් බඳන ලද්දේය. මාංශපේශි නවසියයකින් අනුලිප්තය. තෙත් සමින් හාත්පස වසන ලද්දේය. සිවියෙන් වසන ලද්දේය. නව වණ දොරින් ද නවානූදහසක් රෝම කූපයන්ගෙන් ද, අසූචි වැගිරෙයි. ඇටසැකිලිවලින් පූරිතය. දුගඳය. පිළිකුල්ය. ජුගුප්සිතය. දෙතිස් කුණපයන්ගේ සමූහය ය. මෙහි සාරයක් හෝ උතුම් වූවක් නැතැයි, මෙසේ අසුභ වශයෙන් සිතන්නහුට සත්ත්වයන් කෙරෙහි උපන් ආශාව

ප්‍රහීණ වෙයි. එහෙයින් අශුභ වශයෙන් මෙනෙහි කිරීම ඒ නිමිත්තේ අන්‍ය නිමිත්තයි. පාත්‍රා සිවුරු ආදී සංස්කාරයන් පිළිබඳව ආශාව උපන් කල්හි දෙපරිද්දෙකින් සංස්කාර මධ්‍යස්ථතාව උපදවානුයි, සතිපට්ඨාන වර්ණනාවෙහි කී ආකාරයෙන් අස්වාමික තාවකාලික භාව වශයෙන් මෙනෙහි කරන්නහුට එය ප්‍රහීණ වෙයි. එහෙයින් අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීම ඔහුගේ අනෙක් නිමිත්ත වේ. සත්ත්වයන් කෙරෙහි ආඝාතය උපන් කල්හී ක්‍රෝධය ඉවත්කර ගැනීමට ඝකවූපම උපමා ආදීන්ගේ වශයෙන් මෙත් වැඩිය යුතුය. එය වඩන්නහුගේ ඒ ද්වේෂය ප්‍රහීණ වෙයි. එහෙයින් මෛත්‍රී භාවනාව අනෙක් නිමිත්ත නම් වේ. යළි කණු කටු තණ පරණලා ආදියෙහි ද්වේෂය උපන් කල්හි තෙපි කාට කිපෙහිද? පෘථුවි ධාතුවට ද? ආපෝ ධාතුවට ද? මේ කවරෙක් කිපෙන්නේද? කිම පෘථුවි ධාතුවට ද නැතිනම් ආපෝ ධාතුවටද යනාදී ක්‍රමයෙන් ධාතු මනසිකාරය කරන්නහුට ඒ ද්වේෂය ප්‍රහීණ වෙයි. එහෙයින් ධාතු මනසිකාරය ඔහුගේ අන්‍ය නිමිත්ත වේ. මෝහය වනාහි යම්කිසි තැනක උපන් කල්හි,

ගරූපවාසෝ උදෙදසෝ - උද්ධිටඨ පරි පුච්ඡනං
කාලෙන ධම්ම සවණං - ඨානාඨාන විනිච්ඡයෝ
පඤ්ච ධම්මූපනිසසාය - මොහධාතු පහීයති

ගුරුවරුන් ආශ්‍රය කිරීම, පර්යාප්ති ධර්මයෙහි උද්ග්‍රහණය, උදෙසන ලද ධර්මයෙහි අර්ථ විචාරීම, සුදුසු කල්හි ධර්මශ්‍රවණය, කාරණයෙන් කාරණය විසඳීම යන ධර්මයන් පස්දෙන නිසා මෝහය ප්‍රහීණ වෙයි.

මේ පංච ධර්මයෝ ඇසුරු කළ යුත්තාහ. ගුරුවරයා ඇසුරෙහි වාසය කරන භික්ෂුව නොවිචාරා ඇවිදීමට යන්නහුට, පා දෝනා තැනට නො පැමිණෙන්නහුට, වත් පිරිය යුතු වේලේ වත්පිළිවෙත් නො කරන්නහුට, ආචාර්යවරයා විසින් දිය කළ සියයක් ඇදීම ආදී වූ (වැලිදඬුවම්) දඬුවම් කෙරේයයි උත්සාහවත් වූයේ වේද මෙසේ ඔහුගේ මෝහය ප්‍රහීණ වෙයි. බණ ඉගෙන ගතයුතු කාලයෙහි උගෙන නොගන්නහුට ද, නො මනාකොට හදාරන්නහුට ද, නොහදාරන්නහුට ද ගුරුවරයා දඬුවම් කෙරේනුයි උත්සාහවත් වූයේ ද එයිනුත් මොහුගේ මෝහය ප්‍රහීණ වෙයි. ගරුකටයුතු බුහුමන් කටයුතු භික්ෂූන් කරා එළඹ ස්වාමීනි, මෙය කෙසේ වේද? මෙහි අර්ථය කුමක්ද ආදී වශයෙන් විමසන්නහුගේ ද සැකය දුරුවෙයි. ඒ

මගින්ද මොහුගේ මෝහය ප්‍රහීණ වෙයි. සුදුසු කල්හි ධර්මශ්‍රවණය කරන තැන්වලට ගොස් සකසා මැනවින් ධර්මය ශ්‍රවණය කරන්නේද ඒ ඒ තැන්වල අර්ථය පැහැදිලි කරගන්නේද මෙසේත් මෝහය දුරුවෙයි. මේ මෙයට කාරණයයි. මේ මෙයට ආකාරණයයි ආදී වශයෙන් තැන නොතැන විමසීමෙහි දක්ෂ වේද, මේ මගින්ද මෝහය දුරුවෙයි. එහෙයින් මේ පංච ධර්මයන් ඇසුරු කිරීමම නිමිත්තයාගේ අනෙක් නිමිත්ත වේ.

තව ද අටතිස් අරමුණු අතරින් යම්කිසි අරමුණක් මඩන්නහුට ද මේ විතර්කයෝ ප්‍රහීණ වෙත්. මේ නිමිත්තයෝ වනාහි රාගාදීන්ට සෘජුව විරුද්ධ වූවාහුය. ප්‍රතිපක්ෂ වූවාහුය. මේ නිසා ප්‍රහීණ වූ රාගාදීහූ මනාකොට ප්‍රහීණ වූවාහු වෙත්. යම්සේ ගින්න දරවලින් ද පස්වලින්ද අතුවලින්ද ගසා නිවන්නේද, එහෙත් ජලය ගින්නට සෘජුවම විරුද්ධය. වතුරෙන් නිවන ලද්දේ සහමුලින්ම නිවුනා වෙයි. මෙසේ මේ නිමිත්තයන්ගෙන් ප්‍රහීණ වූ රාගාදීහූ මනාකොට ප්‍රහීණ වූවාහු වෙත්. එහෙයින් මොව්හූ කියන ලද්දාහුමය.

කුසලූපසංහිතං කුසලයට සම්බන්ධ වූ, කුසලයට ප්‍රත්‍යය වූ, **අජඣත්තමෙව** ගෝචර අධ්‍යාත්මයෙහිම, **පලගණ්ඩකො** වඩුතෙම **සුඛුමාය** ආණියා යම් ඇණයක් ඉවත්කරනු කැමති වේද? ඊට වඩා සියුම් වූ ලී ඇණයකින් **ඔළාරිකං** ආණිං සඳුන් ලෑල්ලක හෝ හර ලෑල්ලක හෝ ගසන ලද විෂම ඇණයක් **අභිනීහනෙය්‍ය** මිටියකින් ගසමින් පෙළන්නේද, **අභිනීහරෙය්‍ය** මෙසේ ගසමින් ලෑල්ලෙන් ඉවත් කරන්නේය. **අභිනිවජ්ජය්‍ය** දැන් බොහෝ නික්මුණේ යයි දැන අතින් අල්ලා ඇද දමන්නේය. මේ උපමාවෙහි ලෑල්ල මෙන් සිත දතයුතු ය. අකුශල විතර්කයෝ ලෑල්ලේ ගැසූ විෂම ඇණය මෙන් ය. අනෙක් අශුභ භාවනාදී කුශල නිමිති සියුම් ලී ඇණය මෙනි. ඒ සියුම් ලී ඇණයෙන් මහත් විෂම ඇණය බැහැර කිරීම මෙන් අශුභ භාවනාදී කුශල නිමිතිවලින් ඒ විතර්කයන්ගේ බැහැර කිරීම වේ.

අහිකුණපෙන යනාදිය ඉතා ජුගුප්සාජනක, පිළිකුල් වූ කුණපය දැක්වීම සඳහා වදාළහ. **කණ්ඨෙ** ආසත්තෙන කිසියම් පසමිතුරෙකු විසින් ගෙනැවිත් ගෙලෙහි බඳින ලද, එල්වන ලද අටඨියෙය්‍ය ආර්ත වූයේ දුකට පැමිණියේ **හරායෙය්‍ය** ලජ්ජාවට පත්වූයේ **ජිගුචෙඡය්‍ය** හටගත් ජුගුප්සා ඇත්තේ වන්නේය. **පහීයනති** මෙසේ මේ මේ කාරණයෙන් මේ

අකුසල ධර්මයෝ වරද සහිතය. දුක්විපාක ගෙන දෙන්නේ යයි තමාගේ නුවණ බලයෙන් විමසන්නහුට ගැරඬි කුණක් මෙන් පිළිකුල් කරන්නහුට ප්‍රතීණ වෙති. යමෙකුට තමන්ගේ ප්‍රඥා බලයෙන් විමසන්නට නො හැකිවන්නේ නම්, ඔහු විසින් ගුරුවරුන් හෝ උපාධ්‍යායයන් හෝ අනෙක් ගරු තන්හි සිටින නුවණැති සබ්‍රහ්මචාරීන්ගෙන් හෝ සංඝ ස්ථවිරයන් හෝ වෙත එළඹ ගෙඩිය (සීනුව) ගසා භික්ෂු සංඝයා කැඳවා පැහැදිළි කළ යුතුය. බොහෝදෙනාගේ රැස්වීමකදී යමෙක් මේ විතර්ක විෂයෙහි ආදීනව දතයුතු යයි කියන්නේ ද, කාය ව්‍යවචඡනීය කථාදියෙන් හෝ ඒ විතර්කයන් නිග්‍රහ කරන්නේද, (එබඳු වූ) එක් පණ්ඩිත මනුෂ්‍යයෙක් වන්නේම ය.

අසති අමනසිකාරෝ ආපජ්ජිතබ්බා ඒ විතර්කයෝ සිහි නොකළ යුතුය. මෙනෙහි නොකළ යුතුය. අන් අරමුණු පවත්වන ලද්දකු විය යුතුය. යම්සේ රූපයක් දකිනු අකමැති වූ පුරුෂයෙක් ඇස් පියා ගනීද, එසේම මූල කර්මස්ථානය ගෙන ඉන්නා වූ භික්ෂුව විසින් සිතෙහි විතර්කයක් උපන් කල්හි අන් අරමුණුවල සිත පවත්වන්නකු විය යුතුය. මෙසේ උන්වහන්සේ ඒ විතර්කය ප්‍රහීණ වේ. එය ප්‍රහීණ වූ කල්හි නැවත කර්මස්ථානය ගෙන හිඳගත යුතුය. එසේත් ප්‍රහීණ නොවේ නම්, උගන්නා ලද ධර්මකථා ප්‍රබන්ධයක් ඇත්නම් ඒ ප්‍රබන්ධය මහත් හඬින් ශබ්ද නගා සජ්ඣායනා කළ යුතුය. මෙසේත් අන් අරමුණු ගත්තහුගේ විතර්කය ප්‍රහීණ නොවේ නම්, බුදුගුණ දහම් ගුණ ලියන ලද අත්පොතක් පසුම්බිය ඇතුළේ වේ නම් එය ගෙන කියවමින්, අන් අරමුණක සිත යෙදවීම කළ යුතුය. මෙසේත් විතර්කය ප්‍රහීණ නොවීනම්, පසුම්බියෙන් ගිනිගානා දඬු යුගලය ගෙන, මේ උඩ දණ්ඩය මේ යට දණ්ඩය යයි ආවර්ජනය කරමින් වෙනත් අරමුණක හිත යොදවන්නකු විය යුතුය. මෙසේත් ප්‍රහීණ නොවේ නම්, කොපුව බැහැරකොට, මේ ඉදිකටුවය, මේ මහන නූල්ය, මේ කඩ කතුරය, මේ නියසැතය යනුවෙන් නම් වශයෙන් පිරිකර පිළිබඳව බලමින් සිත වෙනත් අරමුණක පිහිටවිය යුතුය. එසේත් ප්‍රහීණ නොවීනම් හිඳිකටුව ගෙන සිවුරෙහි ඉරුණු තැන් මහමින් එළලමින් සිත වෙනත් අරමුණක පිහිටුවන්නකු විය යුතුයි. මෙසේ යම් තාක් විතර්කය ප්‍රහීණ නො වේද, ඒ තාක් කුශල කර්මයන් මෙනෙහි කරමින් සිත වෙනත් අරමුණක පිහිටුවන්නකු විය යුතුයි. ප්‍රහීණ වූ කල්හි යළි මුල් කර්මස්ථානය ගෙන හිඳගත යුතුයි. අලුත් කර්මාන්ත පටන් නොගත යුතුයි. කවරහෙයින්ද යත්, විතර්කය සංසිඳුණු කල්හි කමටහන් මෙනෙහි

කිරීමට අවස්ථාවක් නො ලැබෙන බැවිනි. එසේ වුවත් පැරණි පණ්ඩිතයෝ නවකම් කොට ද විතර්කය සංසිඳුවූහ.

එහි මේ උදාහරණ වස්තුවෙකි. තිස්ස සාමණේරයන් වහන්සේගේ උපාධ්‍යායයන් වහන්සේ තිස්සමහා විහාරයෙහි වාසය කෙරෙයි. උන්වහන්සේට තිස්ස සාමණේරයෝ 'ස්වාමීනි, උකටලී වූයෙමි'යි කීය. එකල්හි උපාධ්‍යායයන් වහන්සේ ඔහුට 'මේ විහාරයෙහි නහන ජලය දුර්ලභය. මා ගෙන සිතුල්පව්වට යව'යි කීය. හෙතෙම එසේ කළේය. එහිදී ස්ථවිර තෙමේ ඔහුට මෙසේ කීය. 'මේ විහාරය අතිශයින්ම සඟසතුය. එනිසා මෙහි පුද්ගලික ස්ථානයක් කරව' එය ඇසූ හෙතෙම මැනවි ස්වාමීනි'යි මුල පටන් සංයුක්ත නිකාය ද පර්වත ප්‍රපාතය ශුද්ධ කිරීමද, තේජෝ කසිණ පරිකර්මය ද, යන තුනම එකවිට පටන්ගෙන කර්මස්ථානය අර්පණාවට පැමිණවීය. සංයුක්ත නිකාය අවසන් කළේය. ලෙන් කර්මාන්තය නිම වීය. සියල්ල කොට උපාධ්‍යායන්ට දැන්වීය. උපාධ්‍යායයෝ 'සාමණේරය, තොප විසින් දුකසේ කරන ලද ලෙනෙහි අද පළමුකොට තෙපිම වාසය කරව'යි කීය. හේ ඒ රැය ලෙණෙහිම වෙසෙමින් සෘතු පහසුව ලැබ විදසුන් වඩා රහත් බවට පැමිණ එහිම පිරිනිවීය. උන්වහන්සේගේ ධාතූන් ගෙන සෑයක් කළහ. අද ද එය තිස්ස ස්ථවිර චෛත්‍යයයි ප්‍රකට වේ.

මේ පර්වය 'අසති පර්වය' නම් වේ. මෙහි සිට විතර්කයන් නිග්‍රහ කරන්නට නො හැකි වෙත් නම්, මෙහි සිට නිග්‍රහ කළ යුතු යයි 'විතර්ක මූල භෙද පර්වය' දක්වමින් නැවත **තසස චෙ භික්ඛවෙ** යනාදිය වදාළහ. එහි **විතක්ක සංඛාර සත්ථානං මනසිකාතබ්බං** රැස් කෙරේනුයි 'සංඛාර' නම්. ප්‍රත්‍යය, කාරණය, මූලය යන අර්ථයි. මෙහි පිහිටා සිටීනුයි 'සත්ථාන' නම් වේ. විතර්ක සංස්කාරයාගේ පිහිටා සිටීම 'විතක්ක සංඛාර සත්ථාන නම්. එය මෙනෙහි කටයුතු. මෙය කියන ලද්දේ වේ. මේ විතර්කය කුමක් හේතුවෙන්, කුමන ප්‍රත්‍යයකින්, කවර කරුණකින් උපන්නේද? විතර්කයන්ගේ මූලය ද, මූලයෙන් මූලය ද මෙනෙහි කළයුතුයි. **කින්නුඛො අහං සීඝං ගච්ඡාමි** කුමන කරුණකින් මම වහා යම්ද, **යන්නූනාහං සණිකං ගච්ඡෙය්‍යං** ඉක්මන් ගමනින් මට කවර ප්‍රයෝජනයක්ද? සෙමින් යන්නෙම් නම් මැනවැයි සිතයි. **සො සණිකං ගච්ඡෙය්‍ය** හේ මෙසේ සිතා සෙමින් යන්නේ ය. සියලු තන්හි මෙම ක්‍රමයයි. මේ භික්ෂුවගේ විතර්කයට නැඟි කාලය එහි ඒ පුරුෂයා ශීඝ්‍රව ගමන් කරන කාලය මෙනි. මොහුගේ

විතර්කයන්ගේ හැසිරීම් සිදින කාලය ඔහු සෙමින් ගමන් කරන කාලය මෙනි. මොහුගේ විතර්ක වාරය සිඳ මූල කර්මස්ථානය සිතට බසින කාලය ඔහුගේ සිටි කාලය මෙනි. මොහු විදසුන් වඩා රහත් බවට පැමිණි කාලය ඔහු හුන් කාලය මෙනි. මොහු නිවන් අරමුණු කොට ඵල සමවතින් දවස ඉක්මවන කාලය ඔහු වැදහොත් කාලය මෙනි. එහි මේ විතර්කයෝ කුමක් හේතුකොට ඇත්තාහු ද කුමක් ප්‍රත්‍යය කොට ඇත්තාහුදැයි විතර්කයන්ගේ මුලින් මුලට යන්නහුගේ විතර්ක වාරය ලිහිල් වෙයි. එය ලිහිල් වූ කල්හි, මස්තකයට පැමිණෙන කල්හි විතර්කයෝ සියලු පරිද්දෙන් නිරුද්ධ වෙති. මේ අර්ථය 'දද්දහ' ජාතකයෙන් පැහැදිලි කළ යුතුය.

බෙලි රුකක් මුල සාවෙකු නිදා සිටියදී, නටුවෙන් ගිලිහුණු බෙලි ගෙඩියක් සාවාගේ කණ ළඟට වැටුණි. ඔහු ඒ බෙලි ගෙඩියේ ශබ්දයෙන් පොළව බිඳේයයි යන හැඟීමෙන් නැගිට වේගයෙන් පලා ගියේය. මෙය දැක අනෙක් සිවුපාවෝ ද පළා ගියාහුය. එකල බෝධිසත්ත්වයෝ සිංහයකු වී සිටියේය. හෙතෙම මෙසේ සිතීය. මේ මහපොළව නම් කල්ප විනාසයකදීම බිඳෙයි. ඒ අතරතුර පොළව බිඳීමෙක් නැත. මම මුලින් මුලට ගොස් ඇති සැටි දැනගන්නෙම් නම් යහපත්ය. හෙතෙම ඇතාගේ පටන් සාවා තෙක් විචාළේය. දරුව! තා විසින් පොළව බිඳෙනු දුටුවෙහිද? සාවා එසේය දේවයිනි'යි කීය. සිංහයා එව දරුව මට දක්වව. සාවා නො හැක්කෙමි හිමියනි'යි කීය. භය නොවෙව. එව කොල! ආදී තද මොළොක් වචනයෙන් ගෙන ගියේය. සාවා රුක සමීපයේ සිට,

දද්දභායති හද්දං තෙ - යසම්ං දෙසෙ වසාමහං
අහමෙපතං න ජානාමි - කිමෙතං දද්ද භායති

ඔබට යහපතක් වේවා. යම් පෙදෙසක මම විසීම්ද එහි 'දද්දභ' යයි ශබ්ද කෙරේ. මේ කුමක් දද්දභ යයි ශබ්ද කෙරේද? මම මේ කාරණය නො දනිමි.

බෝසත් සිංහයා තෝ මෙහිම සිටුවයි, ගස මුලට ගොස් සාවා නිදා සිටි තැන දුටුවේය. බෙලිගෙඩිය දුටුයේය. උඩ බලා නටුව දුටුයේය. දැක මේ සාවා මෙහි නිදා සිටියදී කන් මුල වැටුණු මේ ගෙඩියේ ශබ්දයෙන් පොළව බිඳේ යයි හැඟීම් ඇතිව පලා ගියේ යයි දැන ඒ

කරුණු සාවාගෙන් විචාළේය. සාවා එසේය දේවයිනි'යි කීහ. බෝධි සත්ත්වයෝ මේ ගාථාව කීහ.

බෙල්ලං නිපතිතං සුත්වා - දහකකනති සසොජව
සසසස වචනං සුත්වා - සනතතතා මිගවාහිනී

'දද්දහ' යයි හඬ නගමින් බෙලිගෙඩිය වැටුණු හඬ අසා සාවා දිවීය. සාවාගේ වචනය අසා මෘග සේනාව තැතිගෙන දිවූහ.

ඉක්බිති බෝධිසත්ත්වයෝ භය නොවවු යයි මෘග සමූහය අස්වසාලූහ. මෙසේ විතර්කයන්ගේ මුලින් මුලට යන්නහුගේ විතර්කයෝ ප්‍රහීණ වෙත්.

මේ විතර්ක භේද මූල පර්වයෙහි සිට, විතර්කයන් කියන්නට නොහැක්කහු විසින්, මෙසේ නිග්‍රහ කටයුතු යයි තවත් කාරණයක් දක්වන්නේ 'පුන තසස මෙ භික්ඛවෙ' යනාදිය වදාළහ. දනෙතහි දනත මාඛාය යටිදත උඩු දතැ තබා චෙතසො චිතතනති කුසල චිත්තයෙන් අකුසල චිත්තය නිග්‍රහ කටයුතුයි. බලවා පුරිසො යම් සේ ශක්ති සම්පන්න වූ මහා බලවත් පුරුෂයෙක් දුර්වල පුරුෂයකුගේ හිස හෝ කඳ හෝ ගෙන දැඩිව නිගන්නේද, දැඩිව පෙළන්නේද, දැඩිව තවන්නේ ද, තැවුණකු ක්ලාන්ත වූවකු, සිහි මූර්ඡා වූවකු කරන්නේ ද එපරිද්දෙන්ම භික්ෂුව විසින් විතර්කයන් සමග ප්‍රතිමල්ලවයකු වී තෙපි කවරහුද මා කවරෙක්දැයි මැඩ පවත්වා 'ඒකාන්තයෙන් සම ද නහර ද ඇට ද ඉතිරි වේවා. ශරීරයෙහි මස් ලේ වියැලේවා'යි මෙසේ මහා වීර්යය දැඩි කොටගෙන විතර්කයෝ නිග්‍රහ කළයුතු යයි දක්වමින් මේ අර්ථ ප්‍රකාශක උපමාව වදාළහ.

යතො ඛො භික්ඛවෙ මෙය සීමා බිඳීම නම් වෙයි. එය ප්‍රකට වූ අර්ථ ඇත්තේය. තව ද යම් සේ, දිසාපාමොක් ආචාර්යවරයා පිටරටින් රජ කුමරෙකුට පංචායුධ ශිල්ප උගන්වා, යන්න තමන් ගේ රටට ගොස් රාජ්‍යය කරව, ඉදින් තා වෙත අතරමග දී සොරුන් එළඹ සිටිත් නම් දුන්නෙන් කටයුතු කර යව, ඉදින් තොපගේ දුන්න නැසේ නම් හෝ බිඳේනම් හෝ කඩුවෙන් ද, සැතින් ද මෙසේ ආයුධ පසින්ම ශිල්ප දක්වා මෙහෙයාද? හෙතෙම එසේ කොට සිය රටට ගොස් රාජ්‍යය ගෙන,

රජසිරි වළඳද? එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ අධි චිත්තයෙහි යෙදුනා වූ භික්ෂුව රහත්බැව් ගැනීම පිණිස මෙහෙයවන්නාහූ, ඔහුට අතරතුර අකුසල විතර්කයෝ උපදිත්ද (එකල) අන්‍ය නිමිත්ත පර්වයෙහි සිට ඒ විතර්කයන් දුරුකොට විදසුන් වඩා රහත්බවට පැමිණෙන්නේ ය. එහි නොහැකි වන්නේ ආදීනව පර්වයෙහි සිට, එහි ද නොහැකි වන්නේ, අසති පර්වයෙහි සිට, එහි ද නො හැකි වන්නේ විතර්ක මූලඡේද පර්වයෙහි සිට, එහිද නොහැකි වන්නේ අභිනිග්‍රහණ පර්වයෙහි සිට විතර්කයන් දුරුකොට විදසුන් වඩා රහත්බවට පැමිණෙන්නේ යයි මේ පංච පර්වයන් දේශනා කළ සේක.

වසී විතකක පරියාය පඨෙසු විතර්ක මාර්ගයන්හි පුරුදු කළ වශී බව ඇතිව, ප්‍රගුණ කළ වසඟ බව ඇතිව, **යං විතකකං ආකංඛිසසති** මෙය ඔහුගේ වසඟ වූ ආකාරය දැක්වීම පිණිස කියන ලදී. මෙතෙම පෙර යම් විතර්කයක් විතර්ක කරනු කැමති වේද, එය විතර්ක නොකෙරේ. යමක් විතර්ක නොකරනු කැමති වේද, එය විතර්ක කෙරේ. යමක් විතර්ක නො කරනු කැමති වේද, එය විතර්ක නො කෙරෙයි. එයින් වදාළහ. යං විතකකං ආකඞ්ඛිසසති තං විතකකං විතකෙකසසති, යං විතකකං නාකඞ්ඛිසසති තං විතකකං විතකෙකසසති. අවෙජ්ජේ තණහං යනාදිය සබබාසව සූත්‍රයෙහි කියන ලද්දේම ය.

විතක්ක සණ්ඨාන සූත්‍ර වර්ණනාව නිමියේය.

දෙවෙනි වූ සිංහනාද වර්ගය සමාප්තයි.

1-3-1

එවමෙමසුතං යනු කකවූපම සූත්‍රයයි. එහි මොළිය එගගුනෙනා මෝළිය නම් (සිළුව) කොණ්ඩය යයි කියනු ලැබේ.

ඡෙත්වාන මොළිං වර ගන්ධ වාසිතං
වෙහාසයං උකඛිපි සක්‍ය පුඞ්ගවෝ
රතනස්ස වඩ්ඪාටවරෙන වාසවෝ
සහස්ස නෙත්තෙනා සිරසා පටිගහි

බෝසත් තෙම උතුම් වූ සුවඳ ගල්වන ලද කොණ්ඩය සිඳ අහසට දැමීය. ශක්‍ර දේවේන්ද්‍රයා උතුම් වූ රන් කරඬුවකින් මුදුනින් පිළිගත්තේ ය.

ඔහුගේ කොණ්ඩය 'මොළිය' ගිහි කල විශාල විය. එහෙයින් ඔහුට මොළිය එග්ගුණ යන නාමය උපන. පැවිදි වුව ද ඔහු ඒ නමින් ම හඳුන්වති.

අතිවෙලං වේලා ඉක්මවා, එහි කාලවේලා, සීමා වේලා - සීල වේලායයි වෙලාව තෙ පරිදි වේ. **තායං වෙලායං ඉමං උදානං උදානෙසි** යන මෙහි කාල වේලාවය. **ඨිත ධමෙමා වෙලං නාති වතතති** යන මෙහි සීමවේලාවය නම්. **වෙලා අනතිකකමෙමා සෙතුඝාතෝ, යිද, වෙලා වෙසා අනතිකකමනටෙඨන** යනු ද සීලවේලා නම්. මේ ත්‍රිවිධ වූ වේලාවන්ම ඔහු ඉක්මවූයේය. භික්ෂුණීන්ට අවවාද කරන්නට කාලයක් නම් ඇත. හෙතෙම හිරු අස්තංගත වූ කල්හිද, අවවාද කරන්නේ ඒ සීම වේලාවද ඉක්මවීය. භික්ෂුණීන්ට අවවාද කිරීමෙහි ප්‍රමාණයෙක් සීමාවක් චාරිත්‍රයක් ඇත. හෙතෙම වචන පහකින් හයකින් මත්තෙහි අවවාද කරන්නේ කාල වේලාවද ඉක්මවීය. යළි කථා කරන්නේ ක්‍රීඩා සහගතකොට දුට්ඨුල්ලාපත්ති ඇවතට පොහොනක් කොට කථා කරති. මෙසේ සීල වේලාව ඉක්මවීය. **සංසටෙඨා** මිශ්‍ර වූයේ සමාන සුවදුක් ඇතියෙක් ව,

සමමුඛා අභිමුඛයෙහි, **අවණණං භාසති** ඔවුන් පිසිමි, කෙටිමි, ආදිය කරන්නවුන් දැක, මොවුන්ට නො ඇවැත් නම් නැත. (ඇවැත් ඇති) මේ භික්ෂුණීහු අනාචාර ඇත්තාහුය. නරක ව්‍රත ඇත්තාහුය. ප්‍රගල්භ

(කාය වාග්) වූවාහු යයි අගුණ කියයි. **අධිකරණමපි කරොති** මේ භික්ෂූහු මේ භික්ෂුණීන් දුටුකල පටන් මේ භික්ෂූන්ගේ ඇස් දැවෙති. මේ විහාරයෙහි මල් පිදීම හෝ ආසන සේදීම් හෝ පිරිබඩ කිරීම් ආදිය හෝ මොවුන්ගෙ වශයෙන් පවතිත්. මෑලා ලජ්ජා ඇති කුල දූවරුන්ය. තෙපි මේ අයට මේ මේ වචන කියහු ද, තොපට මේ නම් ඇවැත් වෙති. විනයධරයන් වෙත පැමිණිවිට විනිශ්චය දුන මැනවැයි අධිකරණය ඉදිරියට අදියි.

මොලිය එගගුනනසස අවණණං භාසති මේ මහණ හට ඇවැත් ඇත. නිරතුරු මොහුගේ පිරිවෙන් දොර භික්ෂුණීන්ගෙන් නොසිස් යයි අගුණ කියයි. **අධිකරණමපි කරොනති** මෝලිය එග්ගුන තෙරුන් දුටු කල පටන් මේ භික්ෂූන්ගේ ඇස් දැවෙති. මේ විහාරයෙහි අන්‍යයන්ගේ වාසස්ථානයක් බලන්නට ද නො හැකිය. විහාරයට පැමිණි භික්ෂුණීහු අවවාද හෝ පිළිසඳර හෝ උද්දේස පද හෝ තෙරුන් නිසාම ලබති. මෙතෙම කුල පුත්‍රයෙක, ලජ්ජා ඇත්තෙක. කුකුස් ඇත්තෙක. මෙබඳු භික්ෂුවකට තෙපි මේ වචන කියහුද? එවූ විනයධරයන් ඉදිරියේ විනිශ්චය දෙවු යයි අධිකරණයට ඉදිරිපත් කරත්.

සො භිකඛූ භගවනතං එතදවොච ප්‍රිය බව කැමැත්තෙන් නොම වෙයි. භේදාධ්‍යාශයෙන් නොවෙයි. වැඩ කැමති බැවින් හිතවත්ව කීය. ඔහුට මෙසෙ සිතීල, මෙසේ සංසර්ගව වාසය කරන්නා වූ මේ භික්ෂුවට අයස උපදින්නේ ය. හෙතෙම ශාසනයාගේ ද අගුණයෙක් විය. එතකුදු වුවත් වෙනත් කෙනෙකු විසින් කීවත් මොහු මෙය නො නවත්නේ ය. භාග්‍යවතුන් වහන්සේම දහම් දෙසා අවවාද දී නැවැත්විය යුතු වන්නේය. ඔහුට වැඩ කැමති බැවින් භාග්‍යවතුන් වහන්සේට **ආයසමා භනෙත** ආදී වචන කීයේය. **ආමනෙතහි** දන්වව, **ආමනෙතහි** කැඳවව.

තසමා යම්හෙයකින් තෙපි **සදධාය**, සැදැහැයෙන් කුලපුත්‍ර වූයේ ද සැදැහැයෙන් පැවිදි වූයේ ද? යම්හෙයකින් හෝ මොවුන් සමාග සංසර්ගව වාසය කරන්නා වූ තොපට යමෙක් තුමූ ඒ භික්ෂුණීන්ට ආක්‍රෝශ කරන්නාහු පහර දෙන්නාහු වෙත් ද ඔවුන් කෙරෙහි දොම්නස උපදින්නේද? සංසර්ග ප්‍රහීණ වූ කල්හි නූපදින්නේ ද එහෙයින් තත්‍ර ඒ නුගුණ කීමෙහි **ගෙහසිතා** පංචකාම ගුණ නිශ්‍රිත වූ, **ඡන්දා තෘෂ්ණා ඡන්දයෝද**, ප්‍රතිඝ ඡන්දයෝ ද, **විපරිණතං** රාගයෙන් රත් වූ සිත ද විපර්යාස වේ. දුෂ්ට වූ සිත ද මුළා වූ සිත ද, විපර්යාස වේ. මෙහි තෘෂ්ණා ඡන්ද වශයෙන් රත් වූ, ප්‍රතිඝ ඡන්ද

වශයෙන් දුෂ්ට වූ සිත වටී. **හිතානුකම්පී** හිතවත්ව අනුකම්පා කරන්නේ හිතයෙන් පතුරුවන්නේ **න දොසනතරෙ** ද්වේෂ සිත් ඇත්තේ නො වන්නෙමි.

අථඛො භගවා කවර හෙයින් ආරම්භ කළේද? එග්ගුන හට මෙතෙක් අවවාද අසා ද, භික්ෂුණී සංසර්ගය නවත්වන්නෙමි. වළක්වන්නෙමි යන අදහසක් නූපදිති. භාග්‍යවතුන් වහන්සේ සමග විලොම්ව සිටි ඇණයක් මෙන් ප්‍රතිවිරුද්ධව සිටියේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ බඩගිනි ඇත්තෙකුට භෝජනය මෙන් ද, පිපාසිත වූවහුට දියපොදක් මෙන් ද, සීතලෙන් වෙවුලන්නෙකුට උණුසුම මෙන් ද දුකින් පීඩිත වූවෙකුට සුව ප්‍රාර්ථනා උපදින්නාක් මෙන් ද මේ දුර්වච වූ භික්ෂුව දැක, ප්‍රථම බෝධියෙහි සුවච වූ භික්ෂූන් ද මිථ්‍යා මාර්ගයට පැමිණියාහු. ඒ භික්ෂූන්ගේ විස්තර කියනු කැමැත්තේ මේ දේශනාව ආරම්භ කළහ. **ආරාධයිංසු** ගත්තාහුය, පිරුවාහුය. **එකං සමයං** එක් කාලයෙක්හි **එකාසන භොජනං** එක් පෙරබත වැළඳීම්. ඒ එසේමැයි. හිරු නැගීමේ පටන් මධ්‍යාහ්නය දක්වා සියක් වර වැළඳූ භෝජනය වුවද මෙහි ඒකාසන භෝජන නමින් ගැනේ. **අපපබාධතං** නිරෝග බව, **අපපාතංක තං** නිදුක් බව **ලහුටඨානං** ශරීරයේ සැහැල්ලු පැවතුම, **බලං** කාය බලය, **ඵාසු විහාරං** ශරීරයේ සැප විහරණය, මෙයින් කුමක් කියන ලදද? දහවල් විකාල භෝජනය දුරු කරවූ කාලය කියන ලද, භද්දාලී සූත්‍රයෙහි දී රාත්‍රි විකාල භෝජනය දුරුකරවූ කාලය කියන ලදී. මේ විකාල භෝජන දෙක භාග්‍යවතුන් වහන්සේ එක්වරම දුරු නොකරවූහ. කුමක් හෙයින්ද? යම්හෙයකින් මේ භෝජන දෙක සසර වසන්නාහු විසින් පුරුදු කරන ලද්දාහුද? සියුමැලි කුලදරුවෝ ඇත්තාහුය. ඔව්හූ එක්වරම භෝජන දෙකම දුරුකරන්නාහූ ක්ලාන්ත වෙත්ද? එහෙයින් එක්විට දුරු නො කරවා, එක් කලෙක දිවා විකාල භෝජනය, එක් කලෙක රාත්‍රි විකාල භෝජනයැයි වෙන වෙනම දුරු කරවූ සේක. ඔවනතුරෙන් මෙහි දිවා විකාල භෝජනය දුරු කරවූ කාලය වදාරන ලදී. එහි යම්හෙයකින් බුදුවරයෝ භය දක්වා තැති ගන්වා දුරු නො කරවත්ද, නැවත අනුසස් දක්වා දුරු කරවත්ද? මෙපරිද්දෙන් සත්ත්වයෝ සුවසේ දුරු කෙරෙත්ද, එහෙයින් අනුසස් දක්වන සේක් මේ පස් ගුණයන් දැක්වූහ.

න අනුසාසනී කරණීයා නැවත නැවත අනුසාසනයෙන් කටයුතු නොවීය. මෙය කරවු මෙය නොකරවු යයි සිහි ඉපදීම පමණක්ම කළයුතු වී. එපමණකින්ම ඔව්හූ කටයුතු කළාහුය. පහ කළයුතු දේ පහ කළාහුය.

මහණෙනි, ප්‍රථම බෝධියෙහි භික්ෂූහු සුවච වූහ. කීකරු වූහ. අවවාදය පිළිගෙන කරන්නෝ වූහ. මෙවිට ඔවුන්ගේ සුවච බව ප්‍රකාශක වූ උපමාවක් ගෙනහැර දක්වන්නේ සෙය්‍යථාපි යනාදිය වදාළහ. සුභූමියං සම බිමෙහි, සුභූමෙ සුඛෙතෙත විහත ඛාණුකෙ බීජානි පතිට්ඨාපෙය්‍ය සකස් කළ භූමිය 'සුභූමි' නම් වේ. චාතුම්මහාපථෙ මහා මාර්ග දෙකක් විනිවිද ගිය තැන්හි ආජඤ්ඤරථෝ හික්මවන ලද අසුන් යෙදූ රථයක් මධ්‍යසතපතොදෝ යම්සේ රථයට නැගී සිටියහු විසින් ගන්නට හැකිවේද එපරිද්දෙන් අරමුණට එළඹීම නිසා සරසට තබන ලද කැවිටි ඇතියේ යොගගාචරියෝ අශ්වයන් පුහුණු කරන්නෙක් තෙමේම හිලෑ කළයුතු අසුන් හිලෑ කෙරේනුයි අසසදම්මසාරථී නම් වෙයි. යෙනිච්ඡකං යම් යම් මගකින් කැමති වේද යදිච්ඡකං යම් යම් ගමනක් කැමති වේද, සාරෙය්‍ය සෘජුව ඉදිරියට යවන්නේ ය. පච්චාසාරෙය්‍ය පෙරලා නවත්වන්නේ ය.

එවමෙව ඛෝ යම්සේ ඒ අස් රියැදුරා යම් යම් මගකින් ගමන යන්න කැමති වේද ඒ ඒ මගට අශ්වයෝ ආරූඪ වූවෝම වෙති. තව ද යම් යම් ස්වභාවයක් කැමති වේද ඒ ඒ ස්වභාවයම ගන්නා ලද්දේම වෙයි. රථය යවා අශ්වයන් නො වැළැක්විය යුතු නොවේ. කෙවිටෙන් පහර නො දිය යුත්තාහු වෙති. හුදෙක් සම වූ භූමි භාගයෙහි ඔවුන්ගේ කුරයන්හි සලකුණු තබා ගමනම බැලිය යුතු වේ. එපරිද්දෙන් මට ද ඒ භික්ෂූන් කෙරෙහි නැවත නැවත කිවයුත්තෙක් නොවී ය. මේ කරවු මෙය නො කරව් යයි සිහි ඉපදවීම් පමණක්ම කළ යුතු විය. ඔවුන් විසින්ද එකෙණෙහිම කටයුතු කරන ලද්දේ විය. නො කළ යුතු දේ අත්හරින ලද්දේම විය. තසමා යම්හෙයකින් සුවච වූ අසුන් යෙදූ යානයක් සමාන වූවෝ ම, සිහි ඉපිදවීම් පමණකින්ම අත්හළෝ ද එසේම තෙපි ද අත්හළ යුතුය යන අර්ථයි.

එලණ්ඩහි පලණ්ඩයෝ වනාහී පිළිල වෙති. එහෙයින් මෙසේ වදාළහ. විසොධෙය්‍ය පිළිල අනෙක් ගස්වැල් ද සිඳ බැහැර දැමීමෙන් ශුද්ධ කරන්නේ ය. සුජාතා මොනවට පිහිටියාහු, සම්මාපරිහරෙය්‍ය සීමාව බැඳ ජලය ඉසීමෙන් ද, කලින් කල මුල අවට කෙටීමෙන් ද, වල් පඳුරු ආදිය සිඳීමෙන් ද, දිම්ගොටු, මකුළුදැල්, වියලිදඬු, හැරීමෙන් ද මනාකොට වඩන්නේ ය. පෝෂණය කරන්නේ ය. චුදඩි ආදියෙහි කියන ලද අර්ථ ඇත්තේමය.

මෙවිට නො ඉවසීමෙහි දොස් දක්වන්නේ **භූතපුබ්බං** ආදිය කීහ. **වෙදෙහිකා** විදේහ රටවැසි කුලයකගේ දියණිය වූ නොහොත් 'වෙද' යී ප්‍රඥාව කියන ලදී. ප්‍රඥාවෙන් උත්සාහ කරයි. ඉරියව් පවත්වානුයි වෙදෙහිකා නම්. නුවණැත්තා යන අර්ථයයි. **ගහපතානී** ගෘහ ස්වාමිනිය, **කිතතිසද්දෝ** යශෝරාවය, **සොරතෝ** සුරත බැවින් යුක්ත වූවා නිවාතා පහත් පැවැතුම් ඇත්තී, **උපසන්තා** නිවුනී, දකඛා බත් පිසීම්, යහන් ඇතිරීම්, පහන් දැල්වීම් ආදියෙහි දක්ෂ වූවා **අනලසා** උට්ඨාන වීර්ය ඇති, **සුසංවිහිතකම්මන්තා** මොනවට පිහිටුවන ලද කර්මාන්ත ඇත්තී, එකක් අනලස වූවා වෙයි. එතකුදු වුවත් යම් යම් බඳුනක් ගනිද, ඒ ඒ බඳුන බිඳී හෝ සිදුරු කරයි. මෝ වනාහි එබඳු නොවූවා යයි දක්වයි.

දිවා උටඨාසී පාන්දර කළ යුතු දෙනුන් දෙවීම ආදී කටයුතු නො කොට හිරු නැඟී සිටි කල්හි (දවල් වී) නැඟිටියි. **සෙ** ජෙ කාලි එම්බා කාලිය, **කිං** ජෙදිවා උටඨාසි දහවල් වී නැඟිටින්නේ කිසියම් අපහසුවක් ඇද්ද, **නො වත රෙ කිඤ්චි** එම්බා කෙල්ල! තොපට අපහසුවක් නැත්නම්, හිසරුදාවක් පිටරුදාවක් ආදී කිසිවක් නැත්නම් දහවල් වී පිබිදෙන්නේ ඇයිදැයි කිපියා නො සතුටු වූවා ඇහිබැම උඩට ගෙන රවා බැළීය. **දිවාතරං උටඨාසි** දෙවන දවසෙහි ඉතා දවල් වී පිබිදුනාහුය. **අනතතමන වාචං** එම්බා පාපී කෙල්ල, තමාගේ පමණ දනුව, ඇයි ගිනි සීතලයි කියා සිතයිද දැන් තී මට්ටු කරන්නෙමැයි ආදී කිපුණු වචන කියමින් හික්මවීය. **පටිවිසසකානං** අසල්වැසි ගෙහිමියන්ට, **උපජඣාපෙසී** අවමන්කොට කීය. **චණ්ඩී** කීකරු නො වූවා, අපරාධ ඇත්තීය. යම් පමණ හොඳ ගතිගුණ තිබිණිද, එමෙන් දෙගුණයක් නරක් වූවාය. යහපත් දේ ටිකින් ටික පැමිණෙති. දෝෂයෝ එක දවසින් ම ඇතිවේ.

සොරත සොරතෝ ඉතාම යහපත් වූයේ (සුරත) සෝවාන් වූවෙක්ද නැතහොත් සකෘදාගාමී, අනාගාමී, අර්හත් වූවෙක්දෝ කිවයුතු බවට පැමිණෙයි. **ඵුසනති** ස්පර්ශ කෙරෙමින්, ගැටෙමින්, හමුවට පැමිණෙති. **අථ භික්ඛු සොරතොති** වෙදිතබ්බා එකල්හි අධිවාසනා ක්ෂාන්තියෙහි සිටියා වූ මහණ සුරත වූයේ යයි දතයුතු. **යො චීවර -පෙ- පරිකඛාරහෙතූනි** යමෙක් සිවුරු ආදිය ඉතා ප්‍රණීත වූවන් ලබන්නේ පාසේදීම් පිට මිරිකීම් ආදී සේවා ආදිය ලබන්නේ එක් වචනයෙන්ම කෙරේද, **අලාභමානො** පෙර යළසේ ලැබීද එසේ නො ලබන්නේ **ධම්මඤ්ඤව සකකරොනෙතා** ධර්මයට ම සත්කාරය මනාසේ **පිළිපැදීම්** කරන්නේ **ගරුකරොනෙතා**

ගරු වූ බර වූ ක්‍රියාවන් කරන්නේ, **අපචායමානෝ** ධර්මයටම යටත් පහත් පැවැත්ම දක්වන්නේ

මෙසේ නො ඉවසීමේ දොස් දක්වා, මෙවිට යමෙක් ඉවසත්ද ඔව්හූ මෙසේ ඉවසතීයි පස්වැදෑරුම් වාචනා මාර්ගය දක්වන්නේ **පඤ්චිමෙ භිකඛවෙ** යනාදිය වදාළහ. එහි **කාලෙන** සුදුසු පැමිණි කාලයෙන්, **භූතෙන** ඇත්තා වූ විද්‍යමාන වූ කරුණකින්, **සණ්හෙන** මට වූ වචනයෙන් **අත්ථසංහිතෙන** අර්ථ නිශ්‍රිත වූ කාරණා නිශ්‍රිත වූ වචනයෙන්, **අකාලෙන** යනාදිය ඔවුන්ගේම විරුද්ධ වශයෙන් දතයුත්තාහ. **මෙත්තචිත්තා** උපන් මෙත් සිත් ඇත්තෝව **දෙසනතරා** දුෂ්ට වූ සිත් ඇත්තාහූ ඇතුළත උපන් ද්වේෂ ඇත්තෝවැ **තත්‍ර** ඒ වචන පථයන්හී **එරිතබා** පැතිර **තදාරමමණඤ්ඤව** සියලු සත්ත්වයන් ඇති ලෝකය කෙසේ තදාරම්මණය කෙරේද යත්, පංච වචන පථයන් ගෙන ආ පුද්ගලයා මෙත් සිතට අරමුණු කොට, යළි ඒ මෙත් සිතටම සෙසු සත්ත්වයන් අරමුණු කරන්නේ, සියලු සත්ත්වයන් ඇති ලෝකය තදාරම්මණය කෙරෙයි.

මේ එහි වචනාර්ථයයි. **තදාරමමණඤ්ඤව** ඒ මෙත් සිතටම අරමුණු කොට **සබබාවනතං** සියළු සත්ත්වයන් ඇති **ලොකං** සත්ත්ව ලෝකය **විපුලෙන** නොයෙක් සත්ත්වයන් අරමුණුකොට ඇති **මහග්ගතෙන** මහද්ගත භූමියෙහි වූ **අප්පමාණෙන** මොනවට වඩන ලද්දා වූ, **අවෙරෙන** නිදොස් වූ **අබ්‍යාපජ්ජෙඛන** නිදුක් වූ **එරිතබා විහරිසසාමි** මෙබඳු වූ මෛත්‍රී සහගත සිතින් ඒ පුද්ගලයා ද, සියලු ලෝකය ද ඒ සිතට අරමුණුකොට පතුරුවා වාසය කරන්නෙමු.

මෙවිට එහි අර්ථය ප්‍රකාශ කරන උපමාවක් දක්වන්නේ, **සෙය්‍යථාපි** යනාදිය කීහ. එහි **අපඨවිං** නො පොළොවක් කරන්නෙමි - අභාවයට පමුණුවන්නෙමි යන අර්ථයි. **තත්‍ර තත්‍රානි** ඒ ඒ තන්හි **විකිරෙය්‍ය** කුඩයකින් පස් ගෙන බිජුවට මෙන් විසුරුවන්නේය. **ඔටඨුහෙය්‍ය** කෙළ ගසන්නේය. **අපඨවිං කරෙය්‍ය** මෙසේ කයින් ද වචනයෙන් ද උත්සාහ කොටත් නො පොළොවක් කරන්නට හැකිවෙත් ද? **ගම්භීරා** යොදුන් දෙසිය දහසක් හා සිව් නහුතයක් ද, (දෙලක්ෂ හතලිස් දහසක්) පානය ගැඹුරුය. **අප්පමෙය්‍යා** හරස් අතට වූ කලි නො පිරිසුන් වූහ. එව මෙව ඛො දැන් මෙහි උපමා සන්සන්දනය මෙසේය. පොළව මෙන් මෙත් සිත දතයුතුය. උදැල්ල හා කුඩය ගෙන ආ මිනිසා මෙන් පංච වචන පථයන් ගෙන ආ

පුද්ගලයා දතයුතුය. යම් සේ හෙතෙම උදැල්ලෙන් හා කූඩයෙන් මහ පොළව නොපොළොවක් කරන්නට ඔහු නො හැකි වේද, එපරිද්දෙන් පංච වචන පථයන් ගෙන ආ පුද්ගල තෙම තොපගේ මෙත් සිත අන් ආකාරයකට වෙනස් කරන්නට නොහැකි වන්නේම ය.

දෙවැනි උපමාවෙහි, **හළිද්දිං** යම්කිසි කහ පැහැයක් **නීලං** නිල හෝ පලාවන් නිල, **අරූපී** රූප රහිත වූයේ, තව ද කාෂ්ඨ දෙකක්හුගේ හෝ රුක් දෙකක්හුගේ හෝ යහන් දෙකක්හුගේ හෝ, ගල් දෙකක්හුගේ අතර පරිච්ඡින්න කාසරූපයයි. ආයේ නොවේද කුමක් හෙයින් මෙහි අරූපී යයි කියන ලදද? නිදර්ශන සහිත බවට ප්‍රතික්ෂේප වශයෙනි. එහෙයින් වදාළහ. **අනිදසසනෝ** යම් හෙයකින් එහි රූපයක් අදින්ට හෝ රූපයේ පහළවීම් දක්වන්නට නොහැකි වේද? එහෙයින් අරූපී යයි වදාරන ලදී. **අනිදසසනෝ** දැකීමට චක්ෂු විඥානයට හමු නොවූයේ, මෙහි උපමා සැසඳීමෙහි වනාහි අහස මෙන් මෙත් සිතය. තෙලිකුර පස්වැනි කොට ඇති සතර සතරවිධ සායම් මෙන්, පස්වැදෑරුම් වචනයෝය. තෙලිකුර පස්වැනිකොට ඇති සායම් ගෙන ආ පුරුෂයා මෙන් පංච වචන පථයන් ගෙන ආ පුද්ගලයාය. යම්සේ හෙතෙම තෙලිකුර පස්වැනිකොට ඇති සායම්වලින් අහසේ රූප අඳින්නට නො හැකි වේද? එපරිද්දෙන් පංච වචන පථයන් ගෙන ආ පුද්ගලයා තොපගේ මෙත්සිත වෙනස්කොට තරහ ඉපදවීම දක්වන්නට නොහැකි වන්නේ ය.

තුන්වැනි උපමාවෙහි **ආදිතතං දිලිසෙන ගම්භීරා අපපමෙය්‍යා** මේ ගංගාවෙහි ගැඹුරු තැන ගවුවක් ද අඩ යොදුනක් ද ඇති ගඟේ පුළුල් බව ද එසේමැයි. දිගින් වනාහී යොදුන් පන්සියයක් වෙති. ගංගාව කෙසේ ගැඹුරු වූයේ ද අප්‍රමෙය්‍ය වූයේ ද යත්, මේ ප්‍රයෝගයෙන් පරිවර්තනය කොට උදුනෙහි දියක් මෙන් තවන්ට නො හැකිවන හෙයිනි. සිටි ජලය යම්කිසි උපායකින් අඟලක් හෝ අඟල් භාගයක් පමණ මෙසේ තවන්නට හැකි වේ. එතකුදු වුවත් මේ නදිය තවන්නට නො හැකි වේ. එහෙයින් මෙසේ වදාරන ලදී. මෙහි උපමා සන්සන්දනයෙහි වනාහී ගඟ මෙන් මෙත් සිතය. තණහුල ගෙන ආ පුරුෂයා මෙන් පංච වචන පථයන් ගෙන ආ පුද්ගලයාය. යම්සේ හෙතෙම තණ හුලින් නදිය තවන්නට නොහැකි වේද? එපරිද්දෙන් පංච වචන පථයන් ගෙන ආ පුද්ගලයා තොපගේ මෙත් සිත අන් පරිද්දෙකින් වෙනස් කරන්නට නොහැකි වන්නේය.

සතරවෙනි උපමාවෙහි **බිළාර** හසතා බළල් සමින් කළ පසුම්බිය **සුමද්දිතා** හොඳින් බඳින ලද්දී, **සුපරිමද්දිතා** ඇතුළත ද පිටතද හාත්පසින් මනාකොට මදින ලද්දී තුලිනී හිඹුල් පුළුන්, ලිය පුළුන් සමාන වූයේ **ජිනන සසසරා** සිඳින ලද සස්සර යන ශබ්ද ඇත්තේ **ජිනනභබභරා** සිඳින ලද බබ්භර යන ශබ්ද ඇත්තේ, මෙහි උපමා සන්සන්දනයෙහි වනාහී බළල් පසුම්බිය මෙන් මෙත් සිතය. දඬුකැබිලිති ගෙන ආ පුරුෂයෙකු මෙන් පංච වචන පථයන් ගෙන ආ පුද්ගලයාය. යම්සේ හෙතෙම දණ්ඩකින් හෝ කැබලිත්තකින් හෝ බළල් අතකින් හෝ සස්සර ශබ්දය භබ්භර ශබ්දය නගන්නට නොහැකි වේද? එපරිද්දෙන් පංච වචන පථයන් ගෙන පුද්ගලයා තොපගේ මෙත්සිත වෙනස්කොට ද්වේෂය ඇතිකරන්නට නොහැකි වන්නේය.

ඔවරකා ලාමක හැසිරීම් ඇත්තාහු පහත් හැසිරීම් ඇත්තාහු නීච ක්‍රියා කරන්නා වූ යන අර්ථයි. **යෝ මනොපදොසෙය්‍ය** යම් මහණක් හෝ මෙහෙණක් හෝ සිත දූෂ්‍ය කරන්නේද? කියතින් පහතට කැපීම නො ඉවසන්නේ ද **නමෝ සෝ තෙන සාසනකරෝ** හෙතෙම ඒ නො ඉවසීමෙන් මගේ අවවාදය කරන්නේ නොවෙයි. එහෙත් මෙහි ඇවතක් නැති. **අණුවෝ ථූලං වා** අල්ප සාවද්‍ය හෝ මහා සාවද්‍ය හෝ **යං තුමෙහ නාධිවාසෙය්‍යාථ** යමෙක් තොප විසින් නො ඉවසිය යුතු නො වන්නේ ය යන අර්ථයි. **නෝ හෙතං භනෙත** වහන්ස, නො ඉවසිය යුතු වචන පථයක් නම් නොදක්නෙමු යන අදහසයි. **දීඝරත්තං හිතාය සුඛාය** මෙසේ භාග්‍යවතුන් වහන්සේ රහත් බවින් කුළුගන්වමින් අනුසන්ධි වශයෙන් දේශනාව නිම වූ සේක.

කකචූපම සූත්‍ර වර්ණනාව නිමියේය.

1-3-2

එවමෙමසුතං මේ අල ගද්දූපම සූත්‍රයයි. එහි ගිජුලිහිණියන් නැසුවේනුයි 'ගද්ධබාධි' නම් වේ. ගිජුලිහිණියන් නැසූ පෙර පුරුෂයෝ මේ අය වෙත්නුයි 'ගදධබාධිපුබබ' නම් වෙයි. **ගදධබාධිපුබබසස** ගිජුලිහිණියන් නසන කුලයෙහි උපන්නහුගේ යන අර්ථයි. සගමොක් සුවයන්ට අන්තරාය කෙරෙත්නුයි **අනතරායික** නම් වෙයි. ඔව්හූ කම්ම-කිලෙස විපාක-උපවාද-ආණාවීතිකකම වශයෙන් පස්වැදෑරුම් වේ. ඔවුන් අතරෙහි පංච ආනන්තරිය කර්මයෝ කර්මාන්තරායික නම් වෙත්. භික්ෂුණී දූෂක කර්මය ද එසේයි. එහෙත් එය මෝක්ෂයටම අනතුරු කරයි. ස්වර්ගයට අනතුරක් නැත. නියත මිථ්‍යාදෘෂ්ටි ධර්මයෝ ක්ලේශ අන්තරායික නම් වේ. පණ්ඩක තිරශ්චීනගතික උභතෝබ්‍යඤ්ජනක යන අයගේ ප්‍රතිසන්ධි ධර්මයෝ විපාක අන්තරායික වෙත්. ආර්යෝපවාද ධර්මයෝ උපවාද අන්තරායික වේ. ඔව්හූ වූ කලී යම්තාක් ආර්යයන් ක්ෂමා නොකරවත්ද ඒ තාක්ම වෙති. එයින් මත්තෙහි නොවෙති. දැන දැන ඉක්මවන සප්ත ආපත්ති ස්කන්ධයෝ ආඥා ව්‍යතික්‍රම අන්තරාය වෙති. (අණ ඉක්මවීමේ අනතුර) ඔව්හුද යම්තාක් භික්ෂුභාවය ප්‍රාර්ථනා කෙරේ ද (ඇවතින්) නො නැගිටි හෝ වේද? නො දෙසා හෝ වේද ඒ තාක්ම වෙති. එයින් මත්තෙහි නො වෙති.

එහි භික්ෂුව ඇසූ පිරූ තැන් ඇතියහ. ධර්ම කථිකයහ. සෙසු අන්තරායකර ධර්මයන් දනී. එහෙත් විනයෙහි අදක්ෂ බැවින් ව්‍යවහාරය පැණවීම ඉක්මවීමේ අන්තරායකර ධර්මයන් නොදනී. එහෙයින් රහසිගතව මෙසේ සිතයි. මේ ගිහියෝ පස්කම් සුව වළඳමින්ම සෝවාන් සකෘදාගාමී අනාගාමී මාර්ග ඵලවල පැමිණෙත්. භික්ෂූහූ මන වඩන්නා වූ රූපයෝ චක්ෂුර් විඥානයෙන් දකිති. කයින් විඳිය යුතු වූ ස්පර්ශයන් ස්පර්ශ කරති. මෘදු වූ සුවදායක වූ ඇතිරිලි ආදිය පරිහරණය කරති. මේ සියල්ල සුදුසුය. කවරහෙයින්ද ස්ත්‍රීන්ගේ රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශයෝ පමණක් නුසුදුසුද නොවටිත්ද, මෙසේ වරද රහිත වූ ප්‍රත්‍ය පරිභෝග රසය ද, වරද සහිත වූ කාම පරිභෝගය ද එකක් කොට, ගොරෝසු රුක් පට්ටා සමග ඉතා සිනිඳු නූලක් සම කරන්නෙකු මෙන්, අබ ඇටයක් සමග මහමෙර සමාන කරන්නාක් මෙන් පාපී දෘෂ්ටියක් උපදවා ඇයි භාග්‍යවතුන්

වහන්සේ මහා සමුද්‍රය බඳින්නෙකු මෙන් මහත් උත්සාහයෙන් ප්‍රථම පාරාජිකා පත්තිය පනවන ලද්දේද? මෙහි වරදක් නැත. සර්වඥතාඥානය සමග ප්‍රතිවිරුද්ධ වෙමින් වෛශාරද්‍ය ඥානය වලක්වමින් ආර්ය මාර්ගයේ කණු කටු ආදිය හෙලමින් මෙවුන්දම් සෙවීමෙහි දොසක් වරදක් නැතැයි ජිනයන් වහන්සේගේ ආඥා චක්‍රයෙහි පහර දුන්නේ ය. එහෙයින් කීහ. **තථාහං භවෙතා ධම්මං දෙසිතං අජානාමීති** යනාදිය.

එවං ව්‍යා ඛො එවං+ව්‍ය ඛො එසේම **සමනුයුඤ්ජනති** ආදියෙහි කවර ලබ්ධියෙක්ද? ඔබ ලබ්ධිය කියනු මැනවැයි විචාරන්නාහු **සමනුයුඤ්ජනති** නම් වේ. ලබ්ධියෙහි පිහිටුවන්නේ, **සමනුගාහනති** යනුවෙන් කවර කාරණයකින් මෙසේ කියන්නේදැයි කරුණු විමසන්නේය. **සමනුභාසනති** නම් වේ. **අටඨීකංඛලූපමා කාමා** මද වූ රසවිඳීම් අර්ථයෙන් ඇටසැකිල්ලකට බඳු උපමා ඇත්තේ, **මංසපෙසූපමා** බොහෝදෙනාට සාධාරන අර්ථයෙන් මස් වැදැල්ලකට බඳු උපමා ඇත්තේ **අංගාරකාසූපමා** මහත් වූ අභිතාප අර්ථයෙන් අඟුරු වලකට බඳු උපමා ඇත්තේ, **සුපිනකූපමා** මද කලක් එළඹ සිටීම අර්ථයෙන් සිහිනයකට බඳු උපමා ඇත්තාහුය. **යාචිතකූපමා** තාවකාලික අර්ථයෙන් පිරුළුවකට බඳු උපමා ඇත්තාහුය. **රුක්ඛඵලූපමා** සියළු අඟපසඟ බිඳීම් අර්ථයෙන් රුක්ඵල හා උපමා ඇත්තාහූ, **අසිසූනූපමා** දංගෙඩිය - මස්ලොඹුව යන අර්ථයෙන් කඩුව හා මස්ලොඹුවකට බඳු උපමා ඇත්තාහුය. **සතතිසුලූපමා** විනිවිද යන අර්ථයෙන් සැත් හුලකට බඳු උපමා ඇතියහ. **සපපසිරූපමා** සැක සහිත බිය යන අර්ථයෙන් සර්ප හිසකට බඳු උපමා ඇතියහ. **ථාමසා** දෘෂ්ටි ශක්තියෙන්, **පරාමාසා** දෘෂ්ටිය ස්පර්ශ කිරීමෙන්, **අභිනිවිසස වොහරති** ඇතුළත්ව ව්‍යවහාර කෙරෙයි. ඇතුළත්ව දක්වයි. **යතො ඛො තෙ භිකඛූ** යම් කලෙක ඒ භික්ෂූහු,

එවං ව්‍යා ඛො අහං භනෙත භගවතා මෙය මොහු තමන්ගේ අදහසක් නැතැයි කියනු කැමැත්තේ වුවද, භාග්‍යවතුන්ගේ ආනුභාවයෙන් පිළිගනී. බුදුන්වහන්සේ හමුයෙහි කථා දෙකක් කීමට සමර්ථ කෙනෙක් නැත. **කසස ඛො නාම ත්වං මොඝ පුරිසා** හිස් පුරුෂය, ඔබ මා විසින්, කවර ක්ෂත්‍රියයකුට - බ්‍රාහ්මණයකුට, වෛශ්‍යයකුට ශූද්‍රයෙකුට, ගිහියෙකුට හෝ පැවිද්දෙකුට මෙවැනි ධර්මයක් දේශනා කරන ලද්දේ යයි දන්නේද?

අථ ඛො භගවා භිකඛූ ආමනෙතසි මෙය වෙනම ගැළපීමෙකි.

අරිට්ඨතෙම මෙසේ සිතුවේල, භාග්‍යවතුන් වහන්සේ මට හිස් පුරුෂයා යයි කියයි. එහෙත් හිස් පුරුෂයා යයි කී පමණින් මාර්ග ඵලයන්ට හේතුසම්පත් නැතිවන්නේ නොවෙයි. වංගන්ත පුත්‍ර වූ උපසේන තෙරුන්ටද, **අතිලහුං ඛො තවං මොඝපුරිස බාහුලලාය ආවත්තෙතා** යනුවෙන් හිස් පුරුෂය යි අමතා අවවාද කළේය. තෙරුන්වහන්සේ ඊට පසු මෑතකදී වෑයම් කරමින් ඡට් අභිඥා අවබෝධ කළේය. මම ද එසේ වීර්යය වඩා මාර්ගඵල උපදවන්නෙමි. එවිට භාග්‍යවතුන් වහන්සේ නටුවෙන් ගිලිහුණු පඬුවන් පැහැ ඇති ඉදුණු කොළයක් මෙන් සසුන්හි නොවැඩෙන බැව් දක්වමින් මෙම දේශනාව ඇරඹීය.

උසමීකතො මහණෙනි, ඔබලා කුමක් සිතන්නහුද? මේ අරිට්ඨ තෙමේ මෙබඳු ලබ්ධි ඇත්තේ සර්වඥතාඥානය හා ප්‍රතිවිරුද්ධව වෛශාරද්‍ය ඥානය වළක්වා තථාගතයන්ගේ ආඥා චක්‍රයෙහි පහර දෙමින් මේ ශාසනයෙහි උණුසුම් කරන ලද්දේ වේද? යම්සේ මහත් වූ ගිනිකඳක් නිවීගිය කල්හිදු, යළි මහා ගිනිකඳක් වන්නේද? කලාමැදිරියෙකු පමණ වූ ගිනි පුපුරක් වේ මැයි, එපරිද්දෙන් මොහුට ඉතාම සුළු වූ යම් නුවණක් නිසා වෑයම් කරන්නේ මගපල උපදවන්නේ ද එබඳු මද පමණ වූත් ඤාණයක් ඇත්ද? **නොහෙත භනෙත ස්වාමීනි**, මෙබඳු ලබ්ධි ඇත්තෙකුට ඤාණෝස්මයක් කොයින්ද? මාර්ග ඵලයන්ට ප්‍රත්‍යවීමට සමර්ථ වූ ඥානෝස්මයෙන් උණුසුම් කළ බැව් ප්‍රතික්ෂේප කරමින් කියත්. **මංකුභූතො** තෙද රහිත වූයේ, **පතතකඛන්ධො** පහතට හෙලූ කඳ ඇති, **අපපටිභානො** කිසිදු වැටහීමක් නොදක්නේ, සුන් වූ වැටහීම් ඇත්තේ, මෙබඳු වූ නෛර්යාණික ශාසනයක් ලැබ නොවැඩෙන ස්වභාව ඇත්තෙමි වූයෙම්ල, නසන ලද ප්‍රත්‍ය ඇත්තෙමි වීම්ල, තමන්ගේ නුසුදුසු බව සිහිකල්පනා කරමින් පයෙහි ඇඟිලිවලින් බිම සාරමින් හුන්නේය.

පඤ්ඤායිස්සසි මෙයද වෙනම ගැළපීමෙකි. අරිට්ඨ තෙම මෙසේ සිතුවේල. භාග්‍යවතුන් වහන්සේ මගේ මාර්ගඵලයන්ට හේතු සම්පත් පසිඳුනා ලදැයි කියති. එහෙත් බුදුවරු දහම් දෙසන්නේ හේතුසම්පත් ඇති අයට පමණක්ම නොවේ. හේතුසම්පත් නැති අයටද දහම් දෙසති. මම ශාස්තෘන් වහන්සේ සමීපයෙන් බුද්ධාවවාද ලැබ තමාගේ සම්පත්තියට පැමිණෙන කුසලයක් කරන්නෙමි. ඉක්බිති, ශාස්තෘන් වහන්සේ ඔහුට අවවාද දීම ප්‍රතික්ෂේප කරන්නේ **පඤ්ඤායිස්සසි** යනාදිය වදාළහ. හිස්පුරුෂය, තෙපිම මේ **පාපකෙන දිට්ඨිගතෙන** පාපී වූ ලාමක

වූ දෘෂ්ටිය නිසා නිරයාදියෙහි (පැනෙන්නෙහි) දුක් විඳින්නෙහි. මා සමීපයේ තොපට බුද්ධාවවාදයක් නම් නැත. මට තොපගෙන් වැඩක් නැත. අර්ථයක් නැත. **ඉධාහං භික්ඛූ පටිපුච්ඡිසසාමි** මම මේ පිළිබඳව භික්ෂූන්ගෙන් නැවත විචාරන්නෙමි.

අථඛෝ භගවා මෙය ද වෙනම ගැලපීමෙකි. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ පිරිස පිරිසිදු කරන සේක. අරිට්ඨ මහණ ගණයෙන් බැහැර කරන සේක. ඉදින් පිරිසෙහි සිටිය අය අතරින් කිසිවකුට මෙවැනි සිතක් උපදින්නේද? මේ අරිට්ඨ භාග්‍යවතුන් විසින් නොකියන ලද්දක් කියන්නට කෙසේ පුළුවන් වන්නේද? පිරිස් මැද භාග්‍යවතුන් වහන්සේ කථාව පටන්ගත් කල්හි වහා කියන ලද්දේ ද කියායි. මෙසේ කියන ලද්ද අරිට්ඨ තෙමේම නො අසයි. අනෙක් අය විසින් ද අසන ලද්දේය. ශාස්තෘන් වහන්සේ අරිට්ඨ මහණ නිග්‍රහ කෙරේද එපරිද්දෙන්ම මට ද නිග්‍රහ කරන සේක. මෙසේ අසාත් නිහඬ බවට පැමිණෙන්නේ ය. ඒ සියල්ල නො කරන්නාහුය. මා විසින් ද නො කියන ලද්දක් අන්‍යයන් විසින්ද අසන ලද්දේ නැතැයි තුමෙහපි මෙ භිකඛවෙ ආදී වශයෙන් පිරිසෙහි ලබ්ධිය නිරවුල් කරන සේක. මෙසේ පිරිසෙහි ලබ්ධිය නිරවුල්, නිවැරදි කිරීමෙන්ම අරිට්ඨ භික්ෂුව සමූහයෙන් බැහැර කරන ලද්දේ වේ.

දැන් අරිට්ඨගේ ලබ්ධිය ප්‍රකාශ කරන සේක් **සො වත භිකඛවෙ** යනාදිය කීහ. එහි **අඤඤත්‍රෙව කාමෙහි** යනාදියෙහි මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක්, 'අනතරාය කරහ'යි කියන ලද ධර්මයන් සේවනය කරන්නාට, එම ධර්මයන් ස්වර්ගමෝක්ෂ සම්පත්තියට අන්තරාය පිණිස හේතු නොවේයයි මතවාදයක් පිලිගැනීමක් ඇත්තේ ද? හෙතෙම ඒකාන්තයෙන් ක්ලේශ කාමයන්ගෙන් ද, ක්ලේශකාම සම්ප්‍රයුක්ත සඤඤා විතර්කයන්ගෙන්ද, වෙන්ව මේ ධර්මයන් හැර මේ ධර්මයන්ගෙන් වෙන්ව වස්තුකාමයන් සේවනය කරන්නේය. මෛථුන සමාචාරයෙහි හැසිරෙන්නේය. **නෙතං ඨානං විජජති** මේ කාරණය නම් නැත. මෙය කරුණු රහිතය. අනවකාශය,

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, යම්සේ රෙදි සෝදන්නෙක් සුවඳ වූද, දුගඳ වූද, පරණ වූද, අලුත් වූද, පිරිසිදු වූද, අපිරිසිදු වූද, රෙදි සියල්ල එක්කොට පොදියක් කෙරේද? එපරිද්දෙන් භික්ෂූන්ගේ අහිතකර ආශාවක් වන ප්‍රණීත චීවරාදීන්ගේ පරිභෝගයද, නිබඳ සිල් නැත්තවුන්ට

අන්තරායකර වූ සච්ඡන්ද රාග පරිභෝගයද නිබඳ සිල් ඇති භික්ෂූන්ට ආවරණය කරවූ සච්ඡන්දරාග පරිභෝගය ද, සියල්ල එක සමාන කෙරේයයි අරිෂ්ඨගේ මතවාදය ප්‍රකාශකොට, අනතුරුව වරදවා ගන්නා ලද පර්යාප්ති දෝෂය දක්වන සේක් **ඉධ භික්ඛවෙ එකවෙව** යනාදිය වදාළහ.

එහි පරියාපුණනත උගනිත්. **සුතතං** යනාදියෙහි උභතෝ විභංග-නිද්දේස - ඛන්ධක - පරිවාරයෝ ද, සුත්ත නිපාතයෙහි මංගල සූත්‍රය, රතන සූත්‍රය, නාලක සූත්‍රය, තුවටක සූත්‍රයෝ ද අන්‍ය වූ සූත්‍ර නාමය ඇති තථාගත වචනය ද, සුත්ත යයි දතයුතු. සියලුම ගාථා සහිත සූත්‍ර **ගෙය්‍ය** යයි දතයුතු. විශේෂයෙන් සංයුක්ත නිකායෙහි සියලුම සගාථක වර්ගයයි. සියළු අභිධර්ම පිටකය ද, ගාථා රහිත සූත්‍රද, අඞ්ගයෙන් සංග්‍රහ නොකරන ලද අන්‍ය වූත් යම් බුද්ධ වචනයක් වේනම් එයද **වෙය්‍යාකරණ** යයි දතයුතු. ධම්මපද, ථෙරගාථා, ථෙරිගාථා ද සූත්‍ර නිපාතයෙහි සූත්‍ර නාමය නොලත්, සුද්ධික ගාථාද ගාථා යයි දත යුත්තීය. සොම්නස් සහගත නුවණින් වදාළ ගාථා ප්‍රතිසංයුක්ත වූ දෙ අසූවක් සූත්‍රාන්තයෝ **උදාන** යයි දතයුතුය. **වුතතමිදං භගවතා** යනාදී නයින් දසාධික සූත්‍රාන්ත සියය **ඉතිවුතතක** යයි දතයුත්තාහ. **අපණණක ජාතකය** ආදිකොට ඇති පන්සියපනසක් අධික කොට ඇති ජාතක **ජාතක** නමැයි දතයුත්තාහ. **චතතාරො මෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භූත ධම්මා ආතංත්‍තෙ** යනාදි නයින් පැවති ආශ්චර්ය අද්භූත ධර්ම ප්‍රතිසංයුත්ත වූ සූත්‍රාන්තයෝ **අබ්භූතධම්ම** යයි දතයුතුය. චුල්ලවේදල්ල මහාවේදල්ල සම්මාදිට්ඨි සක්කපඤ්හ, සංඛාර භාජනීය, මහා පුණණම සූත්‍රාදිය නුවණ ද සතුට ද ලබමින් විමසන ලද සූත්‍රාන්තයෝ **වෙදල්ල** යයි දතයුතු.

අථ නං උප පරිකඛනති ප්‍රයෝජන ලැබෙන අර්ථය කාරණාර්ථය තුලනය නොකරති. නොවිමසති. **අනුපරිකඛතං** නො විමසන්නවුන්ට **නිජඣානං ඛමනති** නොවැටහෙත්, ඇස් හමුවට නො පැමිණෙත්. මෙතැන්හී සීලය, සමාධිය, විදර්ශනාවය, මාර්ගය, ඵලය, වෘත්තය, විවෘත්තය හෝ කියන ලදැයි දැනගන්නට හෝ නොහැකි වේය යන අදහසයි. **තෙ උපාරම්භානිසංසාවෙවා** යනු ඔහුගේ අනුන්ගේ වාදයෙහි දෝෂාරෝපණය අනුසස් කොට ඇත්තාහූ වැ ප්‍රගුණ කෙරෙත් යන අර්ථයි. **ඉති වාදපප මොක්ඛානි සරසාව** මෙසේ තමන්ගේ වාදයෙහි දොෂාරෝපණයෙන් මිදීම අනුසස්කොට ඇත්තාහූවැ අන්‍යයන් විසින් ස්ව වාදයෙහි දොස් නැගූ කල්හී ඒ දෝෂය මෙසේත් මෙසේත් මුදන්නෙමුයි

යන මේ කාරණයෙන් ප්‍රගුණ කෙරෙත් යන අර්ථයි. **තඤ්චසස අත්ථං නානු භොනති** යම් මාර්ගයක් හෝ ඵලයක් සඳහා කුලපුත්‍රයෝ ධර්මය පුහුණු කරත්ද, ඒ ධර්මයේ අර්ථය වරදවා ගන්නාහූ නොවෙති. නැවතද පරවාදයෙහි දොස් නගන්නට, ස්වකීය වාදයෙන් මුදන්නට නොහැකි වන්නාහුද ඒ අර්ථය නො ලබත්. **අලගද්දූපමා** යනු සර්පයෙකු කැමති වූයේ ගදොා යනු විසට නමකි. එය ඔහුට සම්පූර්ණයෙන් ඇත්තේනුයි, විසෙන් යුක්ත වේනුයි යන අරුතින් **අලගද්දෝ** අලගද්ද නම් වේ. **හොගෙ** ශරීරයෙහි.

ඉධපන භික්ඛවෙ එකච්ච කුලපුත්තා ධම්මං පරියාපුණන්ති එතෙරවීම් වශයෙන් පර්යාප්තිය උගනිත්. පර්යාප්ති තුනෙකි. අලගද්ද පරියත්ති නිත්ථරණ පරියත්ති භණ්ඩාගාරික පරියත්ති යනුවෙනි. එහි යම්කිසිවෙක් සිවුරු ආදිය ලබාගැනීමේ අදහසින් ද සිව්පිරිස් මැද කැපී පෙනීමේ අදහසින් ද, ලාභසත්කාර ලැබීමෙන් අදහසින් ද, බුද්ධවචනය උගන්නේ නම් ඒ 'අලගද්ද පරියත්ති' නම්. මෙසේ බුද්ධ වචනය පුහුණු කිරීමට වඩා පුහුණු නොකොට නින්දට යාම ඉතා උතුම් වේ. යම් කෙනෙක් බුද්ධ වචනය උගෙන, සීලය පැමිණි තන්හි සිල් පුරා, සමාධිය පැමිණි තන්හි සමාධියට සමවැදී, විදර්ශනාව පැමිණි තන්හි විදර්ශනා වඩා, මාර්ගඵලයන් පැමිණි තන්හි මාර්ගය වඩන්නෙමි. ඵලය ප්‍රත්‍යක්ෂ කරන්නෙමියි බුද්ධ වචනය උගනී ද, ඔහුගේ එම පර්යාප්තිය නිත්ථරණ පර්යාප්තිය වේ. ක්ෂීණාශ්‍රවයාගේ පරියාප්තිය වනාහි භාණ්ඩාගාරික පර්යාප්ති නම් වේ. ඔහු විසින් පරිඥානය නො කළ, ප්‍රහීණ නොකළ, අභාවිත වූ ප්‍රත්‍යක්ෂ නොකළ ඵලයෙක් නැත. යම්හෙයකින් හෙතෙම පරිඥානය කළ ස්කන්ධ ඇත්තේ ද, ප්‍රහීණ කළ කෙලෙස් ඇත්තේද වැඩූ මාර්ගය ඇත්තේද ප්‍රත්‍යක්ෂ කළ ඵලය ඇත්තේද එහෙයින් බුදු වදන් පුහුණු කරන්නේ පාලිය රකින්නේ ප්‍රවේණිය, පාලනය කරන්නේ වංශය රකින්නෙක්ම වී උගනියි. මෙසේ ඔහුගේ පර්යාප්තිය භාණ්ඩාගාරික පර්යාප්තිය වේ.

යම්කිසි පෘථග්ජනයෙක් සාගින්න හා බිය ඇතිකල්හි ග්‍රහණධාරීව එකතැනක විසීමට අපහසු වන්නේ තෙමේ (භික්ෂාචාරයෙන්) පිණ්ඩපාතයෙන් අතිශයින් ක්ලාන්ත වෙමින් ඉතා මිහිරි වූ බුද්ධවචනය නොනසීවා. පරම්පරාව දරන්නෙමි. වංසය තබන්නෙමි. ප්‍රවේණිය පාලනය කරන්නෙමි. පුහුණු කරන්නේ ද ඔහුගේ පර්යාප්තිය භාණ්ඩාගාරික

පරියාප්තිය වේද නොවේද? නොවෙයි කුමක් හෙයින් ද ස්වකීය ස්ථානයෙහි නොසිට පුහුණු කළ හෙයිනි. පෘථග්ජනයාගේ පර්යාප්තිය නම් 'අලගද්දා' හෝ 'නිත්ථරණ' නම් වෙයි. සප්ත ශෛක්ෂයන්ගේ පර්යාප්තිය 'නිත්ථරණ'මය. ක්ෂීණාශ්‍රවයාගේ භාණ්ඩාගාරික පර්යාප්තියමැයි. මෙතන්හි නිත්ථරණ පරියාප්තිය අදහස් කරයි.

නිජඣාවං ඛමනතීති ශීලාදිය ආ තැන්හි මෙහි ශීලය කියන ලදී. මෙහි සමාධිය මෙහි විදර්ශනාය, මෙහි මාර්ගය - මෙහි ඵලය මෙහි වෘත්තය, මෙහි විවෘත්තය, මිථ්‍යා මාර්ගයට පැමිණෙත්. **තඤ්ඤවසස අත්ථං අනුභොනතී** යම් මාර්ග ඵලයන් සඳහා ප්‍රගුණ කෙරෙත්ද, මනාකොට ගන්නා ලද පර්යාප්තිය නිසා මාර්ගය වඩා ඵලය ප්‍රත්‍යක්ෂ කරන්නාහූ ඒ ධර්මයේ ප්‍රයෝජනය ලබත්ද? අනුන්ගේ දොස් පෙන්වා දෙන්නට හැකිවන්නේද, තමන්ගේ වාදයට ආරෝපණය කළ දෝෂය කැමති කැමති තැනකින්, නිවැරදි කරන්නට මුදවන්නට හැකිවන්නේද ඒ ප්‍රයෝජනය ලබත්මයි. **දීඝරතතං හිතාය සුඛාය සංවතතනති** ශීලාදිය ආ තැන්හි ශීලාදිය පුරන්නවුන්ට ද, අන්‍යයන්ගේ වාදයෙහි කරුණු සහිතව දොස් නගන්නවුන්ට ද ස්වකීය වාදයෙන් දෝෂය බැහැර කරන්නවුන්ට ද, රහත්බවට පැමිණ පිරිස් මැද දහම් දෙසා, ධර්ම ශ්‍රවණයෙන් සතුටු වූවන් විසින් එළවූ සිව්පසය වළඳන්නවුන්ට ද, දිගුකලක් හිතසුව පිණිස පවතිත්.

මෙසේ මනාකොට උගන්නා ලද බුද්ධ වචනයෙහි අනුසස් දක්වා එහිම යොදවන්නේ **තසමාතිහ භිකඛවෙ** යනාදිය වදාළහ. එහි **තසමා** යම්හෙයකින් වරදවා ගත්තා වූ පර්යාප්තිය වරදවා ගත් සර්පයෙකු මෙන් දිගුකලක් අහිත පිණිස දුක් පිණිස පවතී යන අර්ථයි. **තථානං ධාරෙය්‍යථ** එසේම එය දරන්නහුය. ඒ අර්ථයෙන්ම ගන්නාහුය. **යෙ වා පනසස වයතතා භිකඛූ** අන්‍ය වූ සැරියුත්, මුගලන්, මහා කාශ්‍යප, කච්චායන ආදී ව්‍යක්ත වූද ප්‍රඥාවන්ත වූද භික්ෂූන්ගෙන් විමසිය යුතුය. මගේ ශාසනයෙහි අරිට්ඨ භික්ෂුව මෙන් මඩ හෝ කසළ නොදැමිය යුතුය. නොබහාළිය යුතුය.

කුලලූපමං පසුරක් සමානකොට, **නිත්ථරණත්ථාය** චතුරෝඝයෙන් එතෙරවීම පිණිස **උදකණණවං** යම් ජලයක් වනාහි ගැඹුරුද පුළුල් නොවේද නැතිනම් පුළුල් ද ගැඹුරු නොවේ ද එය අර්ණවයයි කියනු නොලැබේ. යම් ජලයක් ගැඹුරුත් වේද, පුළුලුත් වේද, එය අර්ණවයයි කියනු ලැබේ.

මහන්තං උදකණ්ණවං යනු මහත් වූද, පුළුල් වූද, ගැඹුරු වූද, ජලයකැයි මෙසේ අර්ථ වේ. **සාසංකං** යම්කිසි තැනෙක සොරුන් විසූ තැන පෙනේද සිටි තැන පෙනේද හොත් තැන පෙනේද, හුන් තැන පෙනේද එයයි. **සපපටිභයං** යනු යම්කිසි පෙදෙසක සොරුන් විසින් මිනිස්සු නසන ලද්දාහු දක්නට ලැබේද, පැහැර ගන්නාහු දක්නා ලද්දේද, තලන ලද්දාහු දක්නට ලැබේද (එයයි) **උත්තර සෙතුං** ගඟට ඉහලින් තනන ලද පාලම, **කුලලං බන්ධිත්වා** කුල්ල නම් දියෙන් එතෙරවීම සඳහා මිටිකොට බඳනා ලද්ද පහුරු ආදියයි. යමෙක් 'උළුම්ප' පාරුව යයි ද කියනු ලැබේ. **උසසාදෙත්වා ඔසවා තබා, නිච්චකාරී** කරනසුළු වූයේ, යෝග්‍ය සේ කරනසුළු වූයේ, සුදුසු සේ කරන සුළු වූයේ යන අර්ථයි.

ධම්මාපි වො පහාතබ්බා මෙහි ධම්මා යනු සමථ විදර්ශනාය. භාග්‍යවතුන් වහන්සේ සමථයෙහි ද විදර්ශනාවෙහි ද, ඡන්දරාගය දුරුකරවන සේක. සමථයෙහි ඡන්දරාගය කෙසේනම් දුරු කරන්නේද? **'ඉති ඛො උදායි නෙවසඤ්ඤා නාසඤ්ඤායතනස්සපි පහානං වදාමි පස්සසි නො ත්වං උදායි තං සංයෝජනං අණුංවා ථූලංවා යස්සාහං නො පහානං වදාමි'** උදායී මෙසේ වනාහී නේවසඤ්ඤා නාසඤ්ඤායතනයාගේ ද ප්‍රහාණය කියමි. උදායි! මම යම් සංයෝජනයක්හුගේ ප්‍රහාණය නො කියම්ද, සියුම් වූ හෝ මහත් වූ හෝ ඒ සංයෝජනය තෙපි දක්නහුද? යන මෙහි ශමථයෙහි ඡන්දරාගය දුරුකර වූයේය. **ඉමඤ්ච තුමෙහ භිකඛවෙ දිට්ඨිං එවං පරිසුද්ධං පරියොදාතං න අල්ලීයෙථ, න කෙළායෙථ, න ධනායෙථා ති එත්ථ විපස්සනාය ඡන්දරාගං පජ්ජහාපෙසි** මහණෙනි, තෙපි මෙසේ පිරිසිදු වූ හාත්පසින් සුදු වූ මේ දෘෂ්ටිය නොඇලෙන්නාහුය. මමත්වය නොකරන්නාහුය. ධනයක් මෙන් නොගන්නාහුය. මෙසේ විදර්ශනාවෙහි ඡන්දරාගය දුරු කරවූහ. මෙහි දෙතැන්හිම ඡන්දරාගය දුරුකරන අයුරු පෙන්වීය. **ධම්මාපි වො පහාතබ්බා පගෙව අධම්මාති ආහ යී** වදාළහ. එහි අදහස මෙසේය. මහණෙනි, මම මෙබඳු වූ ශාන්ත වූද, ප්‍රණීත වූද ධර්මයෙහි ඡන්දරාග ප්‍රහාණය කියමි. නැවතත් යම්හෙයකින් මේ අරිට්ඨ නම් වූ හිස් පුරුෂයා වරද රහිතය යන හැඟීම ඇතිව පස්කම් ගුණයන්හි ඡන්දරාගය අන්තරායකර නොවේයයි කියාද, ගම්වැසියන්ගේ හීන ධර්මයක් වූ, දූෂිත නො සියුම් වූ, දිය කිස අවසන්කොට ඇති, අසද්ධර්මයෙහි (ඡන්දරාග ප්‍රහාණය නොකියයිද) අරිට්ඨ විසින් මෙන් තොප විසින් මාගේ ශාසනයෙහි මඩ හෝ කසල නොදැමිය යුතුය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ අවවාද මගින් අරිට්ඨ භික්ෂුවම නිග්‍රහයට පත් කෙරේ.

දැන් යමෙක් පංචස්කන්ධයෙහි තෙපරිදි ගැනීම් වශයෙන් මම ය මාගේ ය යයි ගනීද හෙතෙම මාගේ සසුන්හි අරිට්ඨ මෙන්ම මඩ කසල දමන්නේ යයි දක්වමින් **ඡ ඉමානි භික්ඛවෙ** යනාදිය කීහ. එහි **දිට්ඨිට්ඨානානි** යනු ලබ්ධිය ය. ලබ්ධි ස්ථානය, ලබ්ධියේ අරමුණු, ලබ්ධියේ ප්‍රත්‍යයද, දිට්ඨිට්ඨානයයි. **රූපං එතං මම** යනාදියෙහි **එතං මම** යනු තෘෂ්ණා වශයෙන් ගැනීමයි. **එසොහමස්මි** යනු මාන වශයෙන් ගැනීමයි **එසො මෙ අත්තා** අරමුණු වශයෙන් ගැනීමයි. මෙහි රූපය අරමුණුකොට ඇති තෘෂ්ණා, දෘෂ්ටි, මාන කියන ලදී. රූපය වනාහි ආත්මය යයි නොකිය යුතු. වේදනා යනාදියෙහි ද මෙම ක්‍රමයමැයි. **දිට්ඨං** රූපායතනය. **සුතං** ශබ්දායතනය. **මුතං** ගන්ධායතනය - රසායතනය - ස්පර්ශායතනය, එය පැමිණ ගතයුතු බැවින් මුත යයි කියන ලදී. ඉතිරි සප්තායතනයෝ **විඤ්ඤාත** නම් වේ.

පත්තං යනු සොයා හෝ නොසොයා පැමිණෙන ලද්ද, **පරියෙසිතං** පැමිණෙන ලද හෝ නොපැමිණෙන ලද හෝ සොයන ලද්ද, **අනුවිචරිතං මනසං** නම් සිතෙන් හැසිරෙන ලද්ද, ලෝකයෙහි සොයා පැමිණෙන ලද්දේ ද ඇත. සොයා නො පැමිණෙන ලද්දේ ද ඇත. එහි සොයා පැමිණෙන ලද්දේ 'පත්ත' නම් වේ. සොයා නො පැමිණෙන ලද්දේ, 'පරියේසිත' නම් වේ. නො සොයා පැමිණෙන ලද්දේ ද, නො සොයා නො පැමිණෙන ලද්දේ ද 'මනසානු විචරිත' නම් වේ. නොහොත් සොයා පැමිණෙන ලද්දේ ද, නො සොයා නො පැමිණෙන ලද්දේ ද පරියෙසිත අර්ථයෙන් 'පත්ත' නම්. සොයා නොපැණෙන ලද්දේ 'පරියේසිත' නම්. නො සොයා නො පැමිණෙන ලද්දේ 'මනසානු විචරිත' නම්. මේ සියල්ල හෝ සිතින් අනුවිචරිත හෙයින් මනසානු විචරිත නම් වෙයි. මෙයින් විඥානය අරමුණුකොට ඇති තෘෂ්ණා, දෘෂ්ටි, මාන කියන ලදී. මෙහි දේශනා විලාසයෙන්ම දෘෂ්ටාදී අරමුණු වශයෙන් විඥානය දක්වන ලදි.

යමපිදං දිට්ඨිට්ඨානං හේ ලෝකය යනාදී ක්‍රමයෙන් පැවැති යම් මේ දෘෂ්ටි ස්ථානයක් **සො ලොකො සො අත්තා යම් මෝ රූපං අත්තනො සමනුපස්සති** ආදී වශයෙන් පවත්නා දෘෂ්ටියත්, ලෝකයත් ආත්මයත් වේ යයි ගනීද, ඒ දෘෂ්ටිය සඳහා මෙය කියන ලදී. **සො පෙච්ච භවිස්සාමි** මම පරලොව ගොස් නිත්‍ය වූවෙක් වන්නෙමි. නො නස්නා කෙනෙක් වන්නෙමි. ශාස්වතයෙක්, නොවෙනස්වන ස්වභාව ඇත්තෙක් වන්නෙමි.

මහමෙර, මහා පෘථුවිය, මහා සමුද්‍රය ආදිය මෙන් ශාස්වතීන් සමග එසේ සිටින්නෙමි. **තමපි එතං මම** ඒ දර්ශනයද මෙය මාගේ ය, මම ම වෙමි, මේ මාගේ ආත්මයයි දකී. මෙයින් රූපායතනය අරමුණුකොට ඇති, මාන දෘෂ්ටිහු කියන ලද්දාහුමය. විදර්ශනාවෙන් ප්‍රති විදර්ශනා කාලයෙහි මෙන්, පශ්චිම දෘෂ්ටියෙන් පූර්ව දෘෂ්ටිය ගන්නා කාලයෙහි මෙසේ වෙයි. ශුක්ල පක්ෂයෙහි **රූපං නෙතං මම** රූපයෙහි තෘෂ්ණා මාන දිට්ඨි ග්‍රහණයෝ ප්‍රතික්ෂේප කර්න ලදහ. වේදනාදියෙහි ද මෙම ක්‍රමයමැයි.

සමනුපසසති යන මේ පදයෙන් තණහා සමනුපස්සනා, මාන සමනුපස්සනා, දිට්ඨි සමනුපස්සනා, ඤාණ සමනුපස්සනා යන සිව් සමනුපස්සනාවෝ කියති. ඔව්හු අකුසල පක්ෂයෙහි තුන් සමනුපස්සනාවන්ද, කුසල පක්ෂයෙහි ඤාණ සමනුපස්සනාවද කියන ලදී. **අසති න පරිතසසති** නොපෙනෙන කල්හී භය පරිතස්සනාවෙන් හෝ තණ්හා පරිතස්සනාවෙන් තැති නො ගන්නේ ය, මෙයින් භාග්‍යවතුන් වහන්සේ අධ්‍යාත්ම ස්කන්ධයන්ගේ විනාශය ඇති කල්හි, තැති නොගන්නා වූ රහතන් වහන්සේ දක්වමින් දේශනාව මුදුන් පැමිණවූහ.

එවං වුතෙත අඤ්ඤතරෝ භිකඛූ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදාළ කල්හී එක්තරා බුද්ධ වචන ගැළපීමෙහි දක්ෂ වූ භික්ෂුවක්, භාග්‍යවතුන් වහන්සේ විසින් අධ්‍යාත්ම ස්කන්ධයන්ගේ විනාශය ඇතිකල්හී තැති නොගන්නා වූ ක්ෂීණාශ්‍රවයා දක්වා දේශනාව නිමවන ලදී. එසේ වුවත් ස්කන්ධයන්ගේ විනාශයෙහි තැති නොගන්නහු ඇති කල්හි අධ්‍යාත්මයෙහි තැති ගන්නෙක් ද, බාහිර පරිෂ්කාර විනාශයෙහි තැති ගන්නෙක් ද, තැති නො ගන්නෙක් ද විය යුතුයි. මෙසේ මේ සතර කාරණයන්ගෙන් මේ ප්‍රශ්නය විචාළ යුතු යයි සිතා සිවුර ඒකාංස කොට ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. **බහිද්ධා අසති** බාහිර පරිෂ්කාරයන්ගේ විනාශයෙහි **අහු වතමෙ** ඒකාන්තයෙන් මට සොඳුරු වූ යාන වාහන ධනය ස්වර්ණ වූයේය යන අර්ථයි. **තං වත මෙනත්ථි** ඒකාන්තයෙන් දැන් මට මේවා නැත. රජුන් විසින් හෝ සොරුන් විසින් හෝ පැහැර ගන්නා ලදී. ගින්නෙන් හෝ දැවෙන ලදී. ජලයෙන් හෝ පාවෙන ලදී. පරිභෝගයෙන් හෝ දිරන ලදී. **සියාවත මෙ** ඒකාන්තයෙන් මට යානය වාහනය ධනය රන්ය. හාල්ය. වීය. යවය. තිරිඟුය යන මේවා වන්නේ ද **තං වතාහං නලභාමි** මම අලසවීම නිසා, අවශ්‍ය කටයුතු නොකර සිටීම නිසා මම නොලබමියි ශෝක කරයි. මේ ගිහියන්ගේ

ශෝක කිරීමයි. අනගාරිකයාගේ ශ්‍රමණයාගේ ශෝක කිරීම පාසිවුරු ආදීන්ගේ වශයෙන් දතයුතුයි. අපරිතස්සන වාරයෙහි (කෙලෙස් පීඩා රහිත වාරයේ) නං එවං හොති යම් ක්ලේශයක් හේතුකොට ගෙන මෙසේ වන්නේ ද, එම ක්ලේශයන් ප්‍රහීණ කළ බැවින් මෙසේ නොවෙයි.

දිට්ඨිට්ඨයානාධිට්ඨයාන පරියුට්ඨයානා හි නිවෙසානුසයානං විශ්වාසයන්ගේද, විශ්වාස ස්ථානයන්ගේද, විශ්වාස අධිෂ්ඨානයන්ගේ ද විශ්වාසයන් නැගී සිටීමේ ද, ප්‍රවේශයානුසයන්ගේ ද, **සබ්බ සංඛාර සමථාය** නිර්වාණය පිණිස, නිවනට පැමිණ සියළු සංස්කාරයන්ගේ කම්පාවන ලද සියලු සංස්කාර චලනයෝ, සැලුනු සියලු සංස්කාරයෝ සංසිඳෙත් ද, වෙසෙසින් සංසිඳෙත් ද එහෙයින් ඒ නිවන **සබ්බ සංඛාරසමථ** යයි කියනු ලැබේ. තව ද එයටම පැමිණ ස්කන්ධ උපධි, ක්ලේශ උපධි, අභිසංස්කාර උපධි, පංචකාම ගුණ උපධි යන මේ උපධීහූ දුරලනු ලැබෙත්ද, තෘෂ්ණාව ක්ෂය වේද, නො ඇලේ ද නිරුද්ධ වේද එහෙයින් සබ්බූපධිපටිනිසසග්ගය, තණ්හක්ඛය, විරාගය, නිරෝධයයි කියනු ලැබේ. නිබ්බාණාය මේ වනාහි නිර්වාණයාගේ ස්වරූප දැක්වීමය. මෙසේ මේ සියලු පදයන්ගේම නිවන් පසක් කිරීම පිණිස දහම් දෙසන්නහුගේ යයි අර්ථය දක්වන ලදී. **තසෙසවං** හොති ඒ දෘෂ්ටි ගතිකයා හට, **උච්ඡිජ්ජිසාමි නාමසු - විනසසිසසාම නාමසු - නසු නාම භවිසසාමි** උත්පත්ති වශයෙන් සිඳෙන්නෙමි. වැනසෙන්නෙමි. මතු පහළ නොවන්නෙමි. මෙසේ සිතක් වේ. තිලකුණු නගා ශූන්‍යතා ප්‍රතිසංයුත්ත කොට ධර්මය දෙසනු ලබන්නා වූ ධර්මය අසන දෘෂ්ටි ගතිකයා හට තැති ගැනීම් උපදී. **තා සො හෙ සො භිකඛවෙ අසසුතවතො පුථුජ්ජනසස යදිදං නො වසං නො සියා** යයි වදාරන ලදී.

මෙතෙකින් බාහිර පරිෂ්කාරයන්ගේ විනාශයෙහි තැති ගන්නහුගේ තැති නොගන්නහුගේ ද, අධ්‍යාත්ම ස්කන්ධ විනාශයෙහි තැති ගන්නහුගේද, තැති නොගන්නහුගේදැයි වශයෙන් සිව්කොන් ඇති හිස්බව කියන ලදී. දැන් බාහිර පිරිකර අයිතිය (පරිගහ) නම් කොට විසි ආකාර සක්කාය දෘෂ්ටිය මමය මාගේය යන හැඟීම මුල්කොට ඇති දෙසැට දෘෂ්ටීන් 'දිට්ඨි නිසසය' නම් කොට තුන් කොන් හිස් බව දැක්වීමට **තං භිකඛවෙ පරිගහං** යනාදිය වදාළහ. එහි **පරිගහං** බාහිර පරිෂ්කාරය **පරිගණෙහය්‍යාථ** යම්සේ නුවණැති මිනිසෙක් පරිග්‍රහණය කරන්නේ ද (එසේ විමසන්නහුය.) **අහමපි ඛො තං භිකඛවෙ** මහණෙනි, තෙපිද

නොදක්නහු මම ද නොදක්නෙමි. මෙසේ මෙබඳු පිරිකරක් නැතැයි දක්වති. මෙසේ සියලු තැන්හි අර්ථය දතයුතුය.

මෙසේ ත්‍රිකෝණාකාර හිස් බව දක්වා, දැන් අධ්‍යාත්ම ස්කන්ධයන් ආත්ම යයි බාහිර පරිෂ්කාරයන් ආත්මනිය යයි කොට දෙකොන් හිස් බව දක්වන සේක් **අතතනි වා භිකඛවෙ සති** ආදිය කීහ. මේ එහි කෙටි අදහසයි. මහණෙනි, ආත්මය ඇතිකල්හි මේ මාගේ පිරිකර සමූහය, තමා සතු යයි යන අදහස වන්නේ ය. තමන් සතු පරිෂ්කාර ඇති කල්හි මේ මගේ ආත්මය, මේ පිරිකරවල හිමිකරු මම ය යන අදහස ඇතිවන්නේ ය. මෙසේ මම යයි අදහස ඇතිකල්හි, මාගේ යයි අදහස ඇති කල්හි, මම යයි ද සුදුසුය. **සචචතො** සත්‍ය වශයෙන් **ථෙතතො** ස්ථිර වශයෙන්, පිහිටි වශයෙන්.

මෙවිට මේ පංච ස්කන්ධයන් අනිත්‍යය. දුක්ඛය. අනාත්මයයි මෙසේ තිපරිවෘත්ත වශයෙන් නොගන්නේ මේ අරිට්ඨ මෙන් මගේ ශාසනයෙහි කලල කසල දමන්නේ යයි දක්වන්නේ **තං කිං මඤඤථ භිකඛවේරූපං අනිචචංවා** යනාදිය වදාළහ. **අනිචචං භනෙත** ස්වාමීනි, යම්හෙයකින් ඇතිව නැතිවේද එහෙයින් අනිත්‍ය ය. ඉපදීම, විනාශවීම තාවකාලිකය. නිත්‍ය ප්‍රතික්ෂේපය යන සතර කරුණින් අනිත්‍යය. **දුකඛං භනෙත** වහන්ස, නැවත නැවත පෙළෙන ආකාරයෙන් දුක්ය. තැවීමය. ඉවසිය නොහැකි බවය. දුකට වස්තු බවය. සැපයට විරුද්ධය යන සතරාකාරයන්ගෙන් දුක්ය. **විපරිණාම ධමමං** භවය ඉක්මවා ගිය නැවත භවයට නොපැමිණෙන ස්වභාවය පියවි බව හරින ස්වභාවය, **කලලනනු තං සමනුපසසිතං එතං මම එ සො හමසමි එසො මෙ අතතා** එය තෘෂ්ණා, මාන වශයෙන් දෘෂ්ටි ග්‍රහණයෙන් මම ය මාගේ යයි මෙසේ ගැනීමට සුදුසුද? **නොහෙතං භනෙත** යන මෙයින් ඒ භික්ෂූහු වහන්ස වසඟයෙහි නො පවත්නා ආකාරයෙන් රූපය අනාත්මයයි පිළිණ කෙරෙති. ශූන්‍යත, අස්වාමික, අනීශ්වර, ආත්මය පිළිකෙව් කිරීම යන සතර කාරණයෙන් අනාත්මය.

භාග්‍යවතුන් වහන්සේ සමහර තැනක අනිත්‍ය වශයෙන් අනාත්ම බව දක්වති. සමහර තැනෙක දුක් වශයෙන් ද, සමහර තැනෙක දෙදෙනාගේ වශයෙන් ද අනාත්ම බව දක්වති. ඇස ආත්මය යයි යමෙක් කියන්නේද එය නොයෙදේ. ඇසෙහි ඇතිවීම ද නැතිවීම ද පෙනෙයි. යමෙක්හුගේ

ඇතිවීමත් නැතිවීමත් පෙනේද මාගේ ආත්මය උපදින්නේ හෝ වේද නොවේ හෝද මෙසේ ඔහුට මෙපරිද්දෙන් ආයේ වේද, එහෙයින් ඇස ආත්මය යයි යමෙක් කියන්නේද එය නොයෙදේ. මෙසේ ඇස අනාත්මය යයි ඡ ඡක්ක සූත්‍රයේදී අනිත්‍ය වශයෙන් අනාත්ම බව දැක්වූහ. මහණෙනි! යම්හෙයකින් මේ රූපයත් ආත්මය වන්නේ නම් මේ රූපය ආබාධ පිණිස නො පවත්නේය. රූපයෙහි මාගේ රූපය මෙසේ වේවා! මාගේ රූපය මෙසේ නොවේවායි ලැබෙන්නේ ද වෙයි. මහණෙනි! යම්හෙයකින් රූපය අනාත්ම වේද එහෙයින් මේ රූපය ආබාධ පිණිස පවතී. රූපයෙහි මාගේ රූපය මෙසේ වේවා. මාගේ රූපය මෙසේ නොවේවායි (පැතුවද) නො ලැබෙන්නේ ය. යන මේ අනාත්ම ලක්ෂණ සූත්‍රයෙහි දුක් වශයෙන් අනාත්ම බව දැක්වූ සේක. මහණෙනි! රූපය අනිත්‍යය. යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුක නම් එය අනාත්මය ය. යමක් අනාත්ම නම්, එය මේ මාගේ නොවෙයි. මේ මම නොවෙමි. ඒ ආත්මය මාගේ නොවේයයි මෙසේ මේ රූපය තත් වූ පරිද්දෙන් විදර්ශනා ඤාණයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුය. මේ අරහන්ත සූත්‍රයෙහි දෙදෙනාගේ වශයෙන් අනාත්ම බව දැක්වූ අයුරුයි.

කවර හෙයින්ද! අනිත්‍යය ද දුක ද ප්‍රකටයහ. අනාත්ම යනු අප්‍රකටය. පරිහරණය කරන භාජන ආදිය බිඳුණු කල්හි 'අහෝ අනිචචං'යි කියති. අනත්තා යයි කිසිවෙක් නො කියයි. සිරුරෙහි ගඩු පොළ ආදිය නැගුණු කල්හි හෝ කටුවකින් විදිනා කල්හි හෝ 'අහෝ දුක්ඛං' යනුවෙන් කියති. 'අහෝ අනත්තා' යයි කියන කෙනෙක් නැත. කුමක් හෙයින් ද මේ අනාත්ම ලක්ෂණය නම් අප්‍රකට ද දුකසේ දැක්ක යුතුද? දුකසේ හැඟවිය යුතුද? එහෙයින් භාග්‍යවතුන් වහන්සේ එය අනිත්‍ය වශයෙන් හෝ දුක් වශයෙන් හෝ උභය වශයෙන් දක්වති. මේ අනාත්ම ලක්ෂණය ත්‍රිපරිවෘත්තයෙහිද අනිත්‍ය දුක්ඛ වශයෙන් ම දක්වන ලදී. වේදනාදියෙහිද මෙම න්‍යායමයි.

තසමාතිහ භික්ඛවෙ යම් හෙයකින් දැන්ද අන්කල්හි ද රූපය අනිත්‍යය, දුක්ය, අනාත්මය යන අදහසයි. **යං කිඤ්චිරූපං** ආදිය විසුද්ධි මාර්ගයෙහි ස්කන්ධ නිර්දේශයේ විස්තර වශයෙන් එයි. **නිබ්බින්දති** යනු උකටලී වෙයි. මෙහි ද උට්ඨානගාමිනී විදර්ශනාව අදහස් කරයි. උට්ඨානගාමිනී විදර්ශනාවට බොහෝ නම් තිබේ. සමහර තැනක 'සඞ්ඛාරුපගහං' යයි ද සමහර තැනක 'ධර්මස්ථිති ඤාණය' යයි ද, සමහර

තැනක 'පාරිසුදධිපධානියංගං' යනු ද, සමහර තැනෙක 'පටිපදා ඤාණදසසන විසුද්ධි යනු ද, සමහර තැනෙක 'තමමය පරියාදානං' යනුද යොදා ඇත. සමහර තැනෙක නම් තුනකින් ද සමහර තැනක නම් දෙකකින් ද දක්වයි.

එහි පළමුකොට පොට්ඨපාද සූත්‍රයෙහි 'සඤ්ඤා ඛො පොට්ඨපාද පඨමං උපපජ්ජති, පචජා ඤාණං' මෙසේ 'සඤ්ඤුගගං' යන්න දක්වන ලදී. සුසීම සූත්‍රයෙහි, 'පුබ්බෙ ඛො සුසීම ධම්මට්ඨිති ඤාණං, පචජා නිබ්බාණෙ ඤාණං' මෙසේ 'ධම්මට්ඨිති ඤාණ' යන්න දක්වන ලදී. දසුත්තර සූත්‍රහි 'පටිපදා ඤාණ දසසන විසුද්ධි පාරිසුද්ධි පධානියංගං' මෙසේ පාරිසද්ධි පධානියංග' යයි දක්වන ලදී. රථවිනීත සූත්‍රයෙහි 'කිනනුඛො ආවුසො පටිපදා ඤාණ දසසන විසුදධත්ථං භගවති බ්‍රහමචරියං වුසසතී' මෙසේ පටිපදා ඤාණදසසන විසුදධි යයි දක්වන ලදී. සළායතන විභංගයෙහි 'අතමමයතං භිකඛවෙ නිසසාය අතමමයතං ආගමම යායං උපෙකඛා නානත්තා නා නත්තසිතා තං අභිනිවෙජෙජත්වා යායං උපෙකඛා එකත්තා එකත්තසිතා තං නිසසාය තං ආගමම එවමෙතිසසා පහානං හොති, සමතික්කමො හොති' මෙසේ 'තමමය පරියාදාන' කියන ලදී. පටිසම්භිදා මග්ගයෙහි 'යාව මුඤ්චිතු කම්‍යතා - යාච පටිසංඛානුපස්සනා, යාච සංඛාරුපෙකඛා ඉමෙ ධම්මා එකටඨා බ්‍යඤ්ජනමෙව නානං' මෙසේ නම් තුනකින් කියන ලදී. පට්ඨානයෙහි 'අනුලොමං ගොත්‍රභුසස අනනතර පචචයෙන පචචයො, අනුලොමං වොදානසස අනතර පචචයෙන පචචයො' මෙසේ නම් දෙකකින් කියන ලදී. මෙහි අලගද්ද සූත්‍රයෙහි නිබ්බිඳති නිබ්බිදා නාමයෙන් ආයේය.

නිබ්බිඳං විරජජති මෙහි විරාග යනු මාර්ගයයි. **විරාගා විමුචචති** යන මෙහි විරාග නම් වූ මාර්ගයෙන් මිදුනේ යයි ඵලය කියන ලදී. **විමුතතසමිං විමුතතිමිති ඤාණං හොති** මෙහි ප්‍රත්‍යවේක්ෂාව (සිහි නුවණින් මෙනෙහි කිරීම) කියන ලදී.

මෙසේ මිදුන සිත් ඇති මහා රහතුන් දක්වා, අනතුරුව ඔහුට ඇති සැටියෙන් කරුණු පහකින් නාමය ගන්වන්නේ **අයං වුචචති භිකඛවෙ** යනාදිය කීහ. **අවිජජා** සසරට මුල් වූ අවිද්‍යාව, ඔසවා දමන ලද බැවින්, 'පලිඝ' යයි කියයි. එසේ ඔසවා දමන ලද බැවින් (ප්‍රහීණ කරන ලද බැවින්) උකඛිතත පලිඝ යයි කියන ලදී. තාලාවත්ථුකතා මුදන සිඳින ලද

තල් රුකක් මෙන් කරන ලද්දේය. නොහොත් මුල් සහිත වූ තල්ගස උදුරා (භූමියෙහි බීජ විනාශ කරන ලද්දේය) යම් සේ ඒ භූමියෙහි නැවත තල්ගස් නො පැළ වන්නේ ද එසේ කරන ලද්දේය යන අර්ථයි. **පොනොභවිකො** නැවත ඉපදීම ගෙන දෙන්නා වූ, **ජාති සංසාරො** ඉපදීම් වශයෙන් ද හැසිරීම් වශයෙන් ද, මෙසේ ලද නම් ඇති නැවත ඉපදීම් සංඛ්‍යාත ස්කන්ධයන්ට ප්‍රත්‍ය වූ කර්මාභිසංඛාරය, හේ නැවත නැවත උත්පත්තිය කිරීම් වශයෙන් විනාශ කිරීම කරන ලද බැවින් **පරිඛා** කියන ලදී. හෙතෙම ඒ පරිඛාව සංකීර්ණ කළ බැවින් විකීර්ණ කළ බැවින් **සංකිණණ පරිඛ** යයි කියන ලදී.

තණහා සසරට මුල් වූ තෘෂ්ණාව, ගම්භීරානුගතාර්ථයෙන් එසිකා යයි කියනු ලැබේ. මෙතෙම ඒ තෘෂ්ණාව උදුරාහළ බැවින් පහකරන ලද බැවින්, සිඳින ලද බැවින් **අබ්බූළ්හසික** යයි කියන ලදී. **ඔරම්භානි** කාමභවය ඇසුරු කරන්නා වූ, කාම භවයෙහි උත්පත්තියට ප්‍රත්‍ය වූ, මොව්හූ නුවර දොර කවුළුව මෙන් සිත වසා ඇති බැවින් අගල යයි කියනු ලැබේ. එහෙයින් මෙතෙම ඒ සංයෝජනයන් නො තැබූ බැවින් බිඳින ලද බැවින් **නිරගගළ** යයි කියන ලදී. **අරියො** නිකෙළෙස් වූයේ, පිරිසිදු වූයේ, **පනනදධජො** හෙළන ලද මානද්වජ ඇත්තේ, **පනනභාරො** ස්කන්ධ භාර ක්ලේශ භාර අභිසංස්කාර භාර, පංචකාම ගුණභාර, පතිත වූවාහූ බහා තබන ලද්දාහු යි 'පන්නභාර' නම්. තව ද මෙහි මානභාරය දුරුකරන ලද බැවින් 'පනාභාර' යයි අදහස් කරන ලදී. **විසංයුතෙතා** සතර ඕඝයන්ගෙන් ද, සියලු කෙලෙස් වලින් ද වෙන්වූයේ මෙහි වූ කලී මාන යෝගයෙන්ම වෙන් වූ බැවින් විසංයුත්ත යයි අදහස් කරන ලදී. **අසතිමානො** රූපයෙහි මම වෙමි යන මානය, වේදනාවෙහි, සංඥාවෙහි, සංස්කාරයන්හි විඥානයෙහි මම වෙමි යන මානය.

මෙතෙකින් භාග්‍යවතුන් වහන්සේ විසින් මාර්ගයෙන් කෙලෙසුන් ක්ෂයකොට උතුම් වූ නිරෝධයට පැමිණ නිවන් අරමුණුකොට ඇති ඵල සමවතට සමවැද වාසය කරන්නා වූ රහතන් වහන්සේගේ කාලය දක්වන ලදී. උපමාවකින් පැහැදිලි කරයි. චෝර නගරය හා ඛේම නගරය යයි නගර දෙකක් ඇත. එකල මහා යෝධයකුට මෙසේ සිත්වේ. යම්තාක් මේ චෝර නගරය පවතීද? ඒ තාක් මේ ඛේම නගරය භයින් නොමිදෙයි. චෝර නගරය විනාශ කරන්නෙමියි සන්නාහ සන්නද්ධව කඩුව ගෙන චෝර නගරය වෙත පැමිණ නුවරදොර පිහිටුවන ලද එක්ටැම්කුළුණ

කඩුවෙන් සිඳ දොරපළු සමග කැණිමඬල ඔසවා පවුර බිඳ දියඅගල විසුරුවා නගර අලංකාරය පිණිස ඔසවන ලද ධජ පතාක හෙළා නුවර ගින්නෙන් දවා ක්ෂේම නගරයට පැමිණ ප්‍රාසාදයට නැගී ඥාති සමූහයා පිරිවරන ලදුව මනා රජබොජුන් වළඳමින් ජයපැන් බොන්නේ ද? මෙහි සත්කායය චෝර නගරය මෙනි. නිර්වාණය ක්ෂේම නගරය මෙනි. යෝගාවචරයා මහා යෝධයා මෙනි. ඔහුට මෙසේ සිතෙයි. යම්තාක් සත්කාය පවතීද ඒ තාක් දෙතිස් කම්කටොලු, අටඅනූ රෝග, පස්විසි මහා භය, ආදියෙන් මිදීමක් නැත. ඒ මහා යෝධයාගේ සන්නාහය මෙන් සීල නමැති සන්නාහය ගෙන ප්‍රඥා නමැති කඩුව ගෙන, රහත් මගින් තෘෂ්ණාව නමැති එක්ටැම් කුළුණ ගලවා, ඒ යෝධයා දොරපළුව සහ නුවර කවුළුව මෙන් වූ පංච ඕරම්භාගිය සංයෝජන නමැති අගුළු කණුව උගුළුවා අවිද්‍යාව නමැති කැණිමඬල ඔසවා, පවුර බිඳිමින් දියඅගල මෙන් වූ කරමාභිසංස්කාර බිඳ, ජාති සංසාර නමැති දියඅගල විසුරුවා, නගරාලංකාරය සඳහා එසවූ කොඩි මෙන් වූ මාන නමැති ධජ පතාක ගලවා, සක්කාය නමැති නගරය දවා ඒ යෝධතෙම නගරයේ ප්‍රාසාද මතුයෙහි සිට ජයපැන් බොන්නාක් මෙන් කෙලෙස් රහිත වූ නිවන්පුර පිවිස අමා නිවන් අරමුණුකොට ඇති ඵල සමවත් සුව විඳිමින් කල් ගෙවයි.

මෙවිට මෙසේ මිදුණු සිත් ඇති රහතන් වහන්සේ ගේ, අන්‍යයන් විසින් නො ලැබිය හැකි විඥානය දක්වනුයේ **එවං විමුත්තචිත්තං ඛො** යනාදිය දැක්වීය. එහි **අත්ථෙසං** සොයන්නාහූ **ඉදං නිස්සිතං** මේ අරමුණ ඇසුරු කළේ **තථාගතස්ස** මෙහි සත්ත්ව තෙමේ ද තථාගතයෝ ද උතුම් පුද්ගලයන් වූ රහතන් වහන්සේලා ද අදහස් කරන ලදී. **අනනුවෙජ්ජා** අවිද්‍යාමාන වූයේ හෝ නොලැබිය හැකි වූයේ 'තථාගතො' සත්ත්වයා ගත්කල්හි 'අවිද්‍යමාන වූයේ' යන අර්ථය සුදුසුය. ක්ෂීණාශ්‍රවයා ගත්කල්හි නොලැබිය හැක්කේ යන අර්ථය සුදුසුය.

එහි පළමු න්‍යායයෙහි මේ අදහසයි. මහණෙනි! මම මේ ආත්ම භාවයෙහි ජීවමාන වූම ක්ෂීණාශ්‍රවයා තථාගතය, සත්ත්වය පුද්ගල යයි නො පනවමි. යළි පිළිසිඳ නොගත්තා වූ හෝ, පිරිනිවියා වූ හෝ ක්ෂීණාශ්‍රවයා සත්ත්වයා කියා හෝ පුද්ගලයා කියා කෙසේ පනවන්නේද? ක්ෂීණාශ්‍රවයා නොලැබිය හැක්කේය. පරමාර්ථ වශයෙන් කිසි සත්ත්වයෙක් නැත්ද? ඒ නොපෙනී ගියාහුගේ විඥානය මෙය ඇසුරු කළේ යයි

සොයන්නාහුද? නැතිනම් අධිගමය කරන්නාහුද? කෙසේ ලබන්නහුද? යන අර්ථයි. දෙවෙනි න්‍යායයෙහි මෙසේ අදහස් වේ. මහණෙනි, මම මේ අත්බවෙහි ජීවමාන වූම ක්ෂීණාශ්‍රවයා විඥාන වශයෙන් නො ලැබිය හැකියයි කියමි. ශක්‍රයා සහිත වූ, බ්‍රහ්මයා සහිත වූ, මාරයා සහිත වූ දෙවියන් විසින් සොයන්නේ නමුදු, ක්ෂීණාශ්‍රවයාගේ විදර්ශනා සිත හෝ මාර්ග සිත හෝ ඵල සිත හෝ මෙනම් අරමුණු නිසා පවතීයයි දැනගන්නට නොහැකි වේ. එසේ තිබියදී ඔව්හු පිළිසිඳ නොගත් හෝ පිරිනිවි හෝ කෙනෙකුගේ සිත කෙසේ දැනගනිත්ද?

අසතා අවිද්‍යමාන වූයෙන්, **තුච්ඡා** හිස් වචනයෙන්, මුසා බොරුවෙන්, අභූතෙන සිදු නොවූ දෙයින්, **අබභාවිකකනති** අභිබවා කියත්. වෙනයිකො 'විනයති' වනසානුයි 'විනය' නම්. එයම වෙනයික නම්. සත්ත්වයන් වනසන්නෙක යන අදහසයි. **යථාවාහං භිකඛවෙ -න-** මහණෙනි, යම් ආකාරයකින් මම සත්ත්ව විනාශය නොපනවන්නෙමි. යම් පරිද්දෙකින් සතුන් වනසන්නෙක් නොවෙමි. යම්සේත් සත්ත්ව විනාශය නොපනවන්නෙම්ද එපරිද්දෙන් මම ඒ පින්වත් මහණ බමුණෝ වෙනයිකො **සමණෙ** ගොතමො කියමින් මහණ ගොයුම් සතුන් වනසන්නෙකැයි ද, **සතො සත්තසස උවෙඡදං විනාසං විභවං පඤඤාපෙති** කියමින් සත්ත්වයන්ගේ විනාශය පනවා යයි ද අසත්‍ය වූ හිස් වූ බොරු වූ අභූත වචනයෙන් අභිබවා කියත්.

පුබෙබව පෙර ද මහාබෝමැඩදීම, **එතරහිව** දහම් දෙසුමෙහිද, **දුකඛඤෙඤව පඤඤාපෙමි දුකඛසස ච නිරොධං** දම්සක් නො පවත්වා බෝමැඩ වසන්නෙම්ද, දම්සක් පැවැත්වීමෙහි පටන් දහම් දෙසන්නෙම්ද, සිව්සස් ම පනවමි යන අර්ථයි. මෙහි දුක ඉපදීමෙන්, ඒ දුකට මුල් වූ සමුදය ද, නිරෝධය ගැනීමෙන් එයට පමුණුවන මාර්ගය ද, ගන්නා ලද්දේම වේ. **තත්‍රවෙ** ඒ සිව්සස් ප්‍රකාශ කිරීමෙහි **පරෙ** සත්‍යයන් දැනගැනීමට අවබෝධ කරගැනීමට අසමර්ථ පුද්ගලයෝ **අකෙකාසනති** දස ආක්‍රොශ වස්තූන්ගෙන් පරිභව කෙරෙත්. **පරිභාසනති** වචනයෙන් පරිභාස කෙරෙත්. **රොසෙනති-විභසෙනති** කෝප කිරීමේ වෙහෙස කිරීමේ අදහසින් ගැටුම් ඇතිකරත්. දුකට පමුණුවත්. තත්‍ර ඒ පරිභාස කිරීම්, වෙහෙස කිරීම් ආදියෙහි අනෙක් පුද්ගලයන් කෙරෙහි **ආඝාතො** වෛරයක් **අපපචචයො** දොම්නසක්, **අනභිරදධි** නොසතුට නොඇල්මක්,

තත්‍ර වෙ සිව්සස් ප්‍රකාශ කිරීමෙහි ම, **පරෙ** සිව්සස් අවබෝධ කරගැනීමට, ප්‍රතිවේධ කරගැනීමට, සමත් පුද්ගලයෝ **ආනන්දෝ** ප්‍රීතියක්, **උබ්බිලාවිතත්තං** ඉල්පෙන ප්‍රීතියක්, **තත්‍රවෙ** සිව්සස් ප්‍රකාශ කිරීමෙහි ම, **තත්‍ර** සත්කාරාදියෙහි, **යං ඛො ඉදං පුබ්බෙ පරිඤ්ඤාතං** යම් මේ ස්කන්ධ පහක් බෝමැඩදීම තුන් පරිද්දෙකින් අවබෝධ කරගන්නා ලද්දේ ද, **තථා** මෙ ඒ ස්කන්ධ පසෙහි මොව්හූ කුමක් කියන ලද වේද, එහි ද තථාගතයන්ට මේ සත්කාරයෝ මා කෙරෙහි කරනු ලැබෙතියි හෝ මම ඒ සත්කාර අනුභව කෙරෙමියි හෝ නොවෙයි. පෙර අවබෝධ කළ ස්කන්ධ පංචකයම ඒ සත්කාර අනුභව කෙරෙයි. **තස්මා** යම්හෙයකින් සත්‍යයන් අවබෝධ කිරීමට අසමත් වූවෝ තථාගතයන්ට ආක්‍රෝශ කෙරෙත් ද, ඉතිරිය කී නයින්ම දතයුතු.

තස්මාතිහ භික්ඛවෙ යං න තුම්හාකං යම්හෙයකින් තමා කෙරෙහිම ඡන්දරාග ප්‍රහාණය දිගුකලක් හිතසුව පිණිස පවතීද, එහෙයින් යමක් තොපගේ නොවේද? එය දුරුකරවු යන අර්ථයි. **යථාපච්චයං වා කරෙය්‍ය** යම් යම් සේ කැමති වන්නේද ඒ ඒ පරිද්දෙන් කරන්නේය. **න හි නො එතං භනෙත අතත්තා වහන්ස**, මේ තණ දර කොළ අපගේ ආත්මය නො වේමය. අපගේ රූපය නො වේමය. විඥානය නොවේමය. **අතත්තනියංවා** අපගේ සිවුරු ආදී පිරිකර ද නො වේමය යන අර්ථයි. **එවමෙව ඛො භික්ඛවෙ යං න තුම්හාකං තං පජහථ භාග්‍යවතුන් වහන්සේ** ස්කන්ධ පංචකයම තොපගේ නොවේ යයි දක්වා දුරු කරවති. එය වනාහි උපුටා හෝ ගලවා හෝ නොවේ. ඡන්දරාගයෙන්ම එය දුරුකරවයි. **එවං සවකඛා තො** යන මෙහි ත්‍රිපරිවෘත්තය පටන් මෙතැන දක්වා ගැනීම සුදුසුය. ප්‍රතිලෝමයෙන් (මුල සිට ගැනීමෙන්) ප්‍රේම මාත්‍රයකින් ස්වර්ග පරායණයේ පටන් මෙතැන දක්වා ගන්නට නිසිය. **සවාකඛාතො** මැනවින් කියන ලද්දේ ය. ඉතා හොඳින් කියන ලද බැවින් නො ගැඹුරුය. විවෘතව දක්වන ලද්දේය. **පිලොතිකා** යනු සුන්බුන් වූ ඒ ඒ තැන මසන ලද, ගැටගසන ලද වස්ත්‍රයයි. එය යමෙකුට නැත්ද අටරියන් හෝ නවරියන් හෝ අළුත් සළුවක් අඳින ලද්දේ වේද හෙතෙම **ජිනන පිලොතික** නම් වෙයි. මේ ධර්මය ද එසේය. කුහක බව ආදී වශයෙන් සුන්බුන් මසන ලද, ගැටගසන ලද බවක් නැත. තව ද කසළ ද 'පිලොතිකා' යන්නෙන් ගැනේ. මේ ශාසනයෙහි මහණ කසළක් නම් පිහිටා සිටින්නට නො ලැබේ.

කාරණඩවං නිදධමථ - කසම්බුඤ්ඣාව කඩ්ඪථ
තතො පලාපෙ වාහෙථ - අසසමණෙ සමණ මානිනෙ
නිද්ධම්මඨාන පාපිඡෙ - පාප ආචාර ගොචරෙ
සුද්ධා සුද්ධෙහි සංවාසං - කප්පයවෙහා පතිසසතා
තතො සමගගා නිපකා - දුක්ඛසසනතං කරිසසථා

ශ්‍රමණ කසළය, පිඹහරිවු. ශ්‍රමණ කසටය, බැහැර දමවු - නැත අපි ශ්‍රමණයන් යයි මාන්නය ඇති අශ්‍රමණයෝ නිසරු බැවින් (වී අතුරෙහි බොල් වී මෙන් ශ්‍රමණයන් අතුරෙන්) උල්පවා හරිවු.)

ලාමක ආශා ඇති ලාමක හැසිරීම් ඇති ශ්‍රමණයන් බැහැරකොට නිර්මල වූවාහූ සිහි කල්පනාවෙන් යුක්ත වූවාහු පිරිසිදු ඇත්තන් සමග සහවාස කරවු. නැවත සමගි වූවාහු නිපක නම් ප්‍රඥාවෙන් යුක්ත වූවාහු සසර දුක කෙළවර කරවු.

මෙසේ මහණ කසළය සුන් බැවින් ද මේ ධර්මය ජිනනපිලොතික නම් වේ.

වටටං තෙසං නතථි පඤ්ඤාපනාය මොවුන්ගේ වෘත්තය නොපැනවිය හැකි බවට ගියේය. ප්‍රඥප්ති රහිත විය. මෙබඳු වූ මහරහතන් වහන්සේ මේ ස්වාක්ඛාත වූ ශාසනයෙහිම උපදී. තව ද අනාගාමී ආදීහුද එසේයි. එහි **ධම්මානුසාරිනො, සද්ධානුසාරිනො** යන මේ දෙදෙන සෝවාන් මග සිටියෝ වෙති. ධම්මානුසාරී පුද්ගලයා කවරේද? සෝවාන්ඵල පසක් කිරීම සඳහා පිළිපන්නා වූ යම් පුද්ගලයකුගේ පඤ්ඤින්ද්‍රිය අධිමාත්‍ර වේද? ප්‍රඥාව එළවන සුළු වූයේ ප්‍රඥාව පෙරදැරිකොට ඇති ආර්ය මාර්ගය වඩාද ඔහු ධම්මානුසාරී නම් වේ. සෝවාන් ඵල අවබෝධ කිරීම පිණිස සූදානම් පුද්ගලයා ධම්මානුසාරීය. ඵලයෙහි සිටියේ දෘෂ්ටිප්‍රාප්තය. සද්ධානුසාරී පුද්ගලයා කවරේද? සෝවාන්ඵල පසක් කිරීම පිණිස පිළිපන්නා වූ යම් පුද්ගලයෙකුගේ ශ්‍රද්ධා ඉන්ද්‍රිය අධිමාත්‍ර වේද? ශ්‍රද්ධාව එළවනසුළු වූයේ ශ්‍රද්ධාව පෙරදැරිකොට ඇතිව ආර්ය මාර්ගය වඩාද හෙතෙම සද්ධානුසාරී නම් වේ. සෝවාන්ඵල පසක් කිරීම පිළිබඳව පිළිපන් පුද්ගලයා සද්ධානුසාරීය. ඵලයෙහි පිහිටියේ සද්ධා විමුත්ත නම් වේ.

යෙසං මයි සද්ධාමත්තං පෙමමත්තං මෙයින් යම් කෙනෙකුන්ට අන්‍ය ආර්ය ධර්මයෙක් නැත්ද? එතකුදු වුවත් තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධා මාත්‍රයක්, ප්‍රේම මාත්‍රයක් පමණක් වේද ඒ විදර්ශක පුද්ගලයෝ අදහස් කරන ලදී. විදසුන් පිහිටුවා හුන් විදර්ශක භික්ෂූන්ට දසබලයන් කෙරෙහි හුදු ශ්‍රද්ධාව, හුදු ප්‍රේමය උපදී. ඒ ශ්‍රද්ධාවෙන් ඒ ප්‍රේමයෙන් අත්ගෙන ස්වර්ගයෙහි තබන ලද්දවුන් මෙන් වෙති. මොව්හූ නියති ගතිකයෝය. පෞරාණික ස්ථවිරයෝ වනාහි මෙබඳු මහණ චුල්ල සෝතාපන්න යයි කියත්. සෙසු පදයන්හි ප්‍රකට අර්ථ ඇත්තේමැයි.

අලගද්දූපම සූත්‍ර වර්ණනාව නිමියේය.

1-3-3

එවමෙම සුතං වම්මික සූත්‍රයයි. එහි ආයසමා මේ ප්‍රියවචනයයි. **කුමාර කසසපො** ඔහුගේ නමය. කුමාර කාලයෙහි පැවිදි වූ බැවින්, භාග්‍යවතුන් වහන්සේ විසින් කාශ්‍යපයන් කැඳවවූ, මේ එලය හෝ කන දෙය කාශ්‍යපට දෙවු යයි කී කල කවර කාශ්‍යපටදැයි (ඇසූ විට) කුමාර කාශ්‍යපට යයි කී හෙයින්, එතැන් පටන් මහළු වූ කාලයෙහි පවා 'කුමාර කස්සප' යයි ම කියයි. තව ද රජුන් විසින් පෝෂණය කළ කුමාරයා බැවින් ද කුමාර කාශ්‍යප යයි හැඳින්වූහ.

මේ වනාහි ඔහුගේ පෙර ආත්ම චරිතයේ පටන් පවසන කථාවයි. මේ තෙරුන් වනාහි පදුමුත්තර භාග්‍යවතුන්ගේ කාලයෙහි සිටු පුතෙක් වූයේය. එකල එක් දවසක් භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ ශාසනයෙහි එක් ශ්‍රාවකයකු, චිත්‍ර කථිකයන් අතුරෙන් අග්‍රස්ථානයේ පිහිටවනු දැක, භාග්‍යවතුන් වහන්සේට සත්දිනක් මහා දන් දී 'භාග්‍යවතුන් වහන්ස, මම ද අනාගතයේ දී එක් බුදුකෙනෙකුන්ගේ ශාසනයෙක, මේ තෙරුන් වහන්සේ මෙන්, චිත්‍රකථික අග තනතුරු ලබන ශ්‍රාවකයෙක්

වන්නෙමි යි ප්‍රාර්ථනා කොට පින් කරන්නේ කාශ්‍යප බුදුන් වහන්සේගේ ශාසනයෙහි පැවිදි වී විශේෂයක් උපදවන්නට නො හැකි විය. එය මෙසේ අසනු ලැබේ. එකල පිරිනිවියා වූ භාග්‍යවතුන්ගේ ශාසනයෙහි භික්ෂූන් පස්දෙනෙක් හිණිමගක් බැඳ පර්වතයකට නැගී මහණදම් කළාහුය. එහි සංඝ ස්ථවිර තෙමේ තුන්වන දිනයෙහි රහත්බවට පැමිණියේය. දෙවෙනි ස්ථවිර තෙම සතරවැනි දවසේ අනාගාමී ඵලයට පැමිණියේය. ඉතිරි තෙනම විශේෂයක් උපදවන්නට නොහැකිව දෙව්ලොව උපන්නාහුය.

එක් බුද්ධාන්තරයක් දෙව්ලොව ද මිනිස්ලොව ද සම්පත් වළඳන්නා වූ ඔවුන් අතුරෙන් එක් අයෙක් තක්සිලාවේ රජගෙදර ඉපිද පුක්කුසාති නම් රජ වැ භාග්‍යවතුන් වහන්සේ උදෙසා පැවිදි වී රජගහ නුවරට එන්නේ කුම්භකාර ශාලාවෙහි භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා අනාගාමී ඵලයට පැමිණියේය. එක් අයෙක් එක් මුහුදු පටුනෙක කුලගෙයක ඉපදී නැවකට නැගී (යන්නේ) නැව බිඳී ගිය කල්හි දැව වැහැරි කඳ ලාභ සම්පත්තියට පැමිණියේ තමන් රහත් කෙනෙකැයි සිත් උපදවා සිටි කල්හී) එක් වැඩ කැමති දේවතාවෙකු විසින් තොප රහත් කෙනෙක් නොව, යව ශාස්තෘන් වහන්සේ හමුවී ප්‍රශ්න විචාරවයි මෙහෙයවන ලදින් එසේ කොට රහත්ඵලයට පැමිණියේය. තුන්වැන්නා රජගහනුවර එක් කුල දැරියකගේ කුස උපන.

ඕ තොමෝ පළමුකොට මව්පියන් අයැද පැවිදිවීමට අවස්ථාව නො ලද්දී, විවාහ වීමෙන් පසුව පිහිටියා වූ ගැබ නො දන්නී ස්වාමියා සතුටුකොට ඔහුගේ අනුමැතිය ලබා භික්ෂුණීන් කෙරෙහි පැවිදි වූවාය. ඇගේ ගැබ් නිමිති දැක භික්ෂුණීන් දෙව්දත්ගෙන් (කළ යුත්ත) විචාළාහුය. හෙතෙම අශ්‍රමණික යයි කීය. (පසුව) දශබලධාරීන් වහන්සේගෙන් විමසූහ. ශාස්තෘන් වහන්සේ උපාලි ස්ථවිරයන්ට පැවරීය. උන්වහන්සේ සැවැත්නුවරවාසී කුලන් ද, විශාඛා උපාසිකාව ද කැඳවා, ඔවුන් ලවා පරීක්ෂා කරවන්නාහු (පැවිද්දෙන්) පෙර ලත් ගර්භයෙක පැවිද්ද නිදොස් වූයේ යයි (ඔව්හූ) තීරණය කළහ. අධිකරණය මනාකොට කරන ලද්දේ යයි ශාස්තෘන් වහන්සේ උපාලි ස්ථවිරයන්ට සාධුකාර දුන්හ. ඕ මෙහෙණ රන් පිළිමයක් වැනි පුතකු වැදූය. ඔහු ගෙන පසේනදී කොසොල් රජු පෝෂණය කළේය. ඔහුට කස්සප යයි නම්කොට පසුකලෙක ශාස්තෘන් වහන්සේ වෙත ගෙන ගොස් පැවිදි කරවීය. මෙසේ ඔහු රජු විසින් පෝෂණය කළ කුමාරයා බැවින් 'කුමාර කස්සප' යයි හැඳින්වීය.

අන්ධවනෙ එසේනම් ඇති වනයෙහි ඒ වනය බුදුවරුන් දෙදෙනකුගේ කාලයෙහි අන්ධ වනයයි කියාම නො හරනා ලද නාමය පෙනේ. මේ එහි ව්‍යවහාරය පැහැදිලි කිරීමයි. අල්පායුෂ්ක බුදුවරුන්ගේ ශාරීරික ඒකඝන නොවේ. අධිෂ්ඨාන පරිද්දෙන් විසිරී යයි. ඒ අනුව අප බුදුන් වහන්සේ ද මම බොහෝකල් සිටියේ නො වෙමි. ස්වල්ප වූ සත්ත්වයන් විසින් මම දක්නා ලද්දෙමි. නො දක්නා ලද අය බොහෝ වෙති. ඔව්හූ මගේ ධාතූන් ගෙන ඒ ඒ තැන්වල පිදීමෙන් නිවනට මග පාදා ගන්නාහු වෙති යි පරිනිර්වාණය සමීපවන කල්හි තමන්ගේ ශරීරය ධාතු විසිරේවායි අධිෂ්ඨාන කළේය. දීර්ඝායුෂ්ක බුදුන් වහන්සේලාගේ වනාහි රන්කඳක් මෙන් ඒකඝන වූ ධාතු ශරීරය සිටී. කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ ද එසේ සිටියහ.

ඉක්බිතිව මහාජනයා රැස්ව ධාතු ඒකඝන වූයේය. වෙන් කරන්නට නොහැක. කුමක් කරන්නෙමුදැයි කථාකොට එකම සෑයක් කරන්නෙමුයි තීරණය කළහ. එක් අයෙක් සත්යොදුනක් යයි යෝජනා කළේය. මෙය ඉතා විශාලය. අනාගතයේ පිළිදැගුම් කරන්නට නුපුළුවන් වේ. යොදුන් සය, යොදුන් පහ, යොදුන් සතර, යොදුන් තුන, යොදුන් දෙක, එක් යොදුනයයි සම්මතකොට ගඩොල් කෙබඳු වන්නාහුදැයි? පිටිපස ගඩොල් රක්ත ස්වර්ණමය වූ ඒකඝන වූ ලක්ෂයක් අගනාහු විය යුතුය. ඇතුළුපස ගඩොල් පනස්දහසක් අගනාහු විය යුතුය. සිරියල් මනෝසිල මැටි සඳහා ගතයුතුය. තල තෙලින් දිය කිස කළ යුතුය. මේ අයුරින් හතර පැත්ත කොටස් හතරකට බෙදූහ. රජු එක් පැත්තක් භාර ගත්හ. රාජ පුත්‍ර වූ පඨවින්ධර කුමරු එක් පැත්තක් ද, ඇමතියන්ට ප්‍රධාන වූ සෙනෙවි තෙම එක් පැත්තක් ද, ජනපදවාසීන්ට ප්‍රධාන වූ සිටුවරයා එක් පැත්තක් ද භාර ගත්තේය. ඔවුන් අතුරින් රජු ධන සම්පන්න බැවින් රන් බැහැර කරවා තමා විසින් ගන්නා ලද පැත්තෙහි කර්මාන්ත ආරම්භ කළේය. යුවරජු ද, සේනාපති ද බාරගත් පැතිවල කර්මාන්ත ඇරඹිණි. එහෙත් සිටුවරයා ගත් පැත්තේ කර්මාන්ත පමා වෙයි.

මේ අතර ත්‍රිපිටක භාණක වූ, අනාගාමී ආර්ය ශ්‍රාවකයකු වූ සෝරත නම් උපාසකයෙක් විය. හෙතෙම කර්මාන්ත පසුබසී යයි දැන, පන්සියයක් ගැල් යොදවා ජනපදයට ගොස්, කාශ්‍යප බුදුන් වහන්සේ විසිදහසක් අවුරුදු සිට පිරිනිවන්පෑ සේක. උන්වහන්සේ වෙනුවෙන් යොදුනක රුවන්සෑයක් ඉදිකරයි. යම්කිසි කෙනෙක් රන් හෝ අමුරන්

හෝ සප්තවිධ රත්න හෝ, සිරියල් හෝ මනෝසිල හෝ යමක් දීමට කැමැත්තේ නම් එය දෙවයි මහජනයා සම්මාදම් කරවීය. මිනිස්සු තම තමන්ගේ ශක්ති පරිද්දෙන් රන් අමුරන් ආදිය පූජා කළහ. නොහැකි වූ අය තෙල් සහල් ආදිය දුන්හ. උපාසක තෙමේ තෙල් සහල් ආදිය කම්කරුවන්ගේ බත් වැටුප් පිණිස යවයි. තවදුරටත් රන් රැස්කරවා යවයි. මේ අයුරින් මුළු දඹදිව පින්කමට සම්මාදන් වූහ. චෛත්‍ය කර්මාන්තය නිමියේය. චෛත්‍ය ස්ථානයෙන් ලිපියක් යැවීය. චෛත්‍ය කර්මාන්තය නිමියේය. ආචාරීන් වහන්සේ පැමිණ චෛත්‍යය වඳිවා. ඔහු ද ලිපියක් යැවීය. මා විසින් මුළු දඹදිව සමාදන් කරන ලද්දේය. යමක් ඇද්ද එය ගෙන කර්මාන්ත නිමා කෙරෙත්වා. ලියුම් දෙකම අතරමගට පැමිණියහ. ආචාරීන්ගේ ලියමනට පෙර චෛත්‍යස්ථානයෙන් එවූ ලිපිය ආචාරීන් අතට හමුවිය.

හෙතෙම ලිපිය කියවා චෛත්‍යය වඳින්නෙමැයි හුදෙකලාවම ගියේය. අතරමග කැලෑවේ සොරු පන්සියයක් සිටියහ. සොරුන් අතරින් කෙනෙකු ඔහු දැක, 'මොහු විසින් මුළු දඹදිවින් රන් අමුරන් රැස්කරන ලදී. අපට නිධිකුම්භියක් (නිධන් කළ සැලියක්) පෙරලමින් ආවේ යයි සෙස්සන්ට දන්වා එය අරගත්හ. දරුවනි, කවර හෙයින් මා රඳවා ගත්තහුද? තොප විසින් මුළු දඹදිව සියලු රන් රිදී එකතු කරන ලදී. අපටත් ටිකක් දෙව! කිම තෙපි නො දනිවුද? කාශ්‍යප බුදුන් පිරිනිවන්පෑහ. උන්වහන්සේ උදෙසා රුවන් චෛත්‍යයක් ඉදිකරවයි. ඒ සඳහා මා විසින් (ජනයා) සමාදන් කරවන ලදී. මා පිණිස නොවෙයි. එය ලද ලද විගස එහි යවන ලදී. මාගේ ඇඳි වස්ත්‍රය පමණක් මිස වෙනත් කහවණුකුදු ධනයක් නැත. කිසිවෙක් එසේය ආචාරීන් අත්හරිවු කීහ. කිසිවෙක් මෙතෙම රාජ පූජිතයහ. අමාත්‍ය පූජිතයහ. අප අතුරෙන් කිසිවෙක් නගර වීදියේදී දැක රාජ රාජ මහ ඇමතින්ට දන්වා කරදරයකට හිරිහැරයකට පමුණුවනු ඇතැයි කීහ. උපාසක තෙමේ, මම එසේ නො කරන්නෙමියි කීය. ඔහු වනාහි ඔවුන් කෙරෙහි කාරුණික විය. ඒ තමාගේ ජීවිත ආසාවෙන් නොවේ.

එකල්හි 'මොහු ගත යුතු' යයි ද 'හළ යුතු යයි ද විවාද කරන්නා වූ ඔවුන් අතුරෙහි ගත යුතුය යන අදහස ඇත්තෝ බොහෝ වූ හෙයින් ඔහු මරණයට පත් කළේය. බලවත් ගුණ ඇති ආර්ය ශ්‍රාවකයාට කරන ලද අපරාධය නිසා නිවුණු පන්සිළු මෙන් ඔවුන් හැම දෙනාගේ ඇස් අතුරුදහන් වූහ. ඔව්හූ අහෝ ඇස අහෝ ඇස යයි විලාප කියන්නාහූ

කිසිවෙක් නෑයන් විසින් ගෙට ගෙන යන ලදහ. නෑයන් නැත්තවුන් අනාථ වූහ. එහිම වනයෙහි රුක්මුල පන්සලෙහි විසූහ. වනයට ගිය මිනිස්සු ඔවුන්ට සහල් හෝ බත්මුල් හෝ මුදල් දෙති. දර, පළා කොළ ආදිය සඳහා වනයට යන එන මිනිස්සු කොහේ ගියේදැයි විමසූ කල්හි අන්ධ වනයට ගියෙමුයි කියති.

මෙසේ බුදුවරුන් දෙදෙනෙකුගේ ම කාලයෙහි ඒ වනය අන්ධ වනය වශයෙන්ම පැනේ. කාශ්‍යප බුදුන් වහන්සේගේ කාලයෙහි මේ වනය ඇත්හරනා ලද අඩවියක් විය. අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සැවැත්නුවරට සමීපව දෙව්රමට පිටුපස විවේකය කැමැත්තන්ට වාසස්ථාන වූ ප්‍රධාන ඝරයක් ප්‍රධන් වීර්ය වඩන සථානයක් විය. එහි ආයුෂ්මත් කුමාර කාශ්‍යප තෙරුන් ශෛක්ෂ ප්‍රතිපදාව පුරමින් වාසය කරයි. අන්ධවනෙ විහරති යයි එහෙයින් කියන ලදී.

අඤ්ඤතරා දෙවතා නම් හා ගෝත්‍ර වශයෙන් අප්‍රකට වූ දේවතාවෙක්, 'අභිජානාති නො භනෙත භගවා අහූනං යෙව අඤ්ඤතරස්ස මහෙසක්ඛස්ස යක්ඛස්ස සංඛිත්තෙන තණ්හා සංඛය විමුත්තිං අභාසිත්ථා' මේ අනුව ප්‍රසිද්ධ වූ සක්දෙව් ද අන්‍යතර යයි කියන ලදී. දෙවතා මෙය දෙවිවරුන්ට ද දෙව් දූවරුන්ට ද සාධාරණ වචනයකි. මෙහි දෙවියන් අදහස් කරන ලදී.

අභික්කන්තාය රත්තියා යන මෙහි අභික්කන්ත යන පය, ක්ෂය, සුන්දර, අභිරූප, අනුමෝදන්වීම යන අර්ථයන්හි දක්නා ලැබේ. එහි 'අභික්කන්තා භනෙත රත්ති නික්ඛන්තා පඨමොයාමො, චිර නිසින්නො භික්ඛු සංඝො, උද්දිසතු භනෙත භගවා භික්ඛූනං පාතිමොක්ඛං' යනාදී තන්හි ක්ෂය වීමෙහි දක්නා ලදී. 'අයං ඉමෙසං චතුන්නං පුග්ගලානං අභික්කන්ත තරොච පණීතතරොච' යනාදී තන්හි සුන්දර අර්ථයෙහිය.

කො මෙ වන්දති පාදානි - ඉද්ධියා යසසා ජලං
අභික්කන්තෙන න වණ්ණෙන - සබ්බා ඔභාසයං දිසා

මේ ආදී තන්හි අභිරූපයෙහි ය. අභික්කන්තං භො ගොතම යනාදී තන්හි අනුමෝදනාවෙහිය. මෙහි ක්ෂයෙහි වේ. **අභික්කන්තාය රත්තියා**

රාත්‍රිය ක්‍ෂය වූ කල්හි යයි කියන ලදී. එහි මේ දේවපුත්‍රයා මධ්‍යම යාමයට අනතුරුව ආයේ යයි දතයුතුය.

අභිකනත වණ්ණා මෙහි අභිකකනත ශබ්දය අභිරූපයෙහි ය. වණ්ණ ශබ්දය ඡවි, ස්තුති, කුල වර්ග, කාරණා, සංස්ථාන - ප්‍රමාණා රූපායතන ආදියෙහි දැක්වේ. එහි 'සුවණ්ණ වණ්ණති භගවා' ආදී තන්හි ඡවිය, සිවිය (සම) 'කදා සංයූළ්හා පන තෙ ගහපති සමණසස ගොතමසස වණ්ණ මේ ආදී තන්හි ස්තුතියෙහිය, 'චතතාරෝ මෙ භො ගොතමො වණ්ණ' මේ ආදී තන්හි කුල වර්ගයෙහිය. 'අථ කෙ කෙන නු වණ්ණෙන ගන්ධපෙථනොති වුචති' මේ ආදී තන්හි කාරණයෙහිය. 'මහනතං හත්ථිරාජ වණ්ණං අභිනිම්මිනිත්වා' මේ තන්හි සටහනෙහිය. 'තයො පතතසස වණ්ණා' මේ තැන්හි ප්‍රමාණයෙහිය. 'වණ්ණෙණා ගන්ධො රසො ඔජෝ' මේ ආදී තන්හි රූපායතනයෙහිය. එය ඡවියෙහි දැක්ක යුතුය. එහෙයින් අභිකකනත වණ්ණා අභිරූප වූ හම ඇති ඉෂ්ට වූ ඡවි ඇති, මන වඩන්නා වූ සිවිය ඇති, යයි කියන ලද වේ. ඒ එසේමයි. මිනිස්ලොවට එන්නා වූ දිව්‍යපුත්‍රයෝ ස්වාභාවික වර්ණය, ස්වාභාවික සෘද්ධිය හැර, උපාරූ වූ ආත්මභාවයක් මවාගෙන අතිරේක වර්ණ, අතිරේක සෘද්ධි මවා නාට්‍ය උත්සවවලට යන මිනිසුන් මෙන් සකස් කරන ලද ශරීරයෙන පැමිණේ. මේ දේවපුත්‍රයා ද එසේම ආයේය. 'අභිකකනත වණ්ණා' යනුවෙන් එහෙයින් කියන ලදී.

කෙවලකපපං මෙහි 'කෙවල' ශබ්දය ඉතුරු නැති, බොහෝ සෙයින්, බොහෝ දෙය, අව්‍යාමිශ්‍ර, ඉතිරි නැති, දෘඪාර්ථ, වෙන්ව යෙදීම විවේකය ආදී නොයෙක් අර්ථයන්හි යෙදේ. 'කෙවල පරිපුණ්ණං පරිසුදධං බ්‍රහමචරියං' මේ ආදී තන්හි අනවශේෂ බව ද, 'කෙවලකපපා ච අංග මගධා පහූතා ඛාදනීයං භෝජනීයං, ආදාය උපසංකමිසසනති' මේ තන්හි අව්‍යාමිශ්‍රත්වය ද, කෙවලං සදධාමත්තකං නූන අධිමාසමා' මේ ආදියෙහි ඉතිරි නැති බව ද, ආයසමතො අනුරුද්ධසස බාහිකො නාම සද්ධි විහාරිකො කෙවලකපපං සංසහෙදාය ඨිතො' මේ ආදියෙහි දණ්ඩාර්ථය ද, කෙවලී වුසිතවා උත්තම පුරිසොති වුචති' ආදී තන්හි වෙන්ව යෙදීම - විවේකය යන අරුත්හි ද යෙදේ. මෙහි වනාහි මේ ශබ්දයාගේ අනවශේෂ භාවය අර්ථයයි අදහස් කරන ලදී.

මේ 'කපප' ශබ්දය (අභිසද්දහන) ඇදහීම - විශ්වාසය, ශ්‍රද්ධාව, ව්‍යවහාර, කාල, ප්‍රඥප්ති, ඡේදන - විතර්කය, සැකය, අදහස, ස්වල්පය,

ටික, ඡායාව, සමන්තභාව (හාත්පස, වටේට) ආදී නොයෙක් අර්ථයන්හි යෙදේ. 'ඔකප්පනියමෙතං භොතෝ ගොතමසස යථා තං අරහතෝ සම්මා සම්බුදධසස' ආදියෙහි අභිසද්දහන අර්ථයි. 'අනුජානාමි භික්ඛවෙ පඤ්චහි සමණ කප්පෙහි ඵලං පරිභුඤ්ජිතුං' ආදියෙහි ව්‍යවහාරයයි. 'යෙන සූදං නිච්චකප්පං විහරාමි' මේ තැන්හිදී කාලය කියයි. 'ඉච්චායසමා කප්පෙපා' ආදී තන්හි ප්‍රඥප්තියයි. 'අලංකතෝ කප්පිත කෙසමසසු' ආදියෙහි ඡේදන අර්ථයි. (කපයි. දෙපළු කරයි.) 'කප්පති දවංගුල කප්පෙපා' මේ ආදී තන්හි විකල්පයයි. 'අත්ථිකප්පෙපා නිපජ්ජිතුං' මේ ආදියෙහි ලෙස (ස්වල්පය-ටික) අර්ථයි. 'කෙවල කප්පං වෙළුවනං ඔභාසෙත්වා' මේ ආදියෙහි හාත්පස යන අර්ථයි. මෙහි මෙම ශබ්දයෙන් සමන්තභාවය හාත්පස යන අර්ථය අදහස් කරන ලදී. එහෙයින් කෙවලකප්පං අන්ධවනං යන මෙහි නිරවශේෂයෙන් අන්ධවනයේ හාත්පසින් යන තේරුම ගතයුතුයි.

ඔභාසෙත්වා ඇදි වස්ත්‍රවලින් හා පැළඳි අබරණවලින් ද, ශරීරයෙන් ද උපන් ආලෝකය පතුරුවා, සඳ මෙන් ද හිරු මෙන් ද, ආලෝකමත් කොට, බබුළුවා යන අර්ථයි. එකමනතං අට්ඨාසි එක්පසෙක එක් අවකාශයෙක සිටියේය. එතදවොච මේ භික්ඛු භික්ඛු ආදී වචන කීහ. කුමක් හෙයින් නොවැඳ ශ්‍රමණ ව්‍යවහාරයෙන් කථා කළේද? ශ්‍රමණ සංඥාව පවත්නා හෙයිනි. ඔහුට මෙසේ සිතිණ. මෙතෙම අතරතුර කාමාවචරයෙහි විසීය. මම වනාහි ඒ කාලයේ පටන් බඹසර ඇත්තෙම් වෙමි. ඕහට ශ්‍රමණ සංඥාවම පවතී. එහෙයින් නොවැඳම ශ්‍රමණ ව්‍යවහාරයෙන් කථා කරයි.

මේ දේවපුත්‍රයා තෙරුන්ගේ පෙර මිත්‍රයෙක් වීලු. කවර තැනක පටන්ද, කාශ්‍යප බුදුන්ගේ කාලයේ පටන්ය. පූර්වාධිකාර කථාවෙහි ආ මිත්‍රයන් පස්දෙනා අතුරෙන් යම් අනුතෙර කෙනෙක් සතරවැනි දවසේ අනාගාමී වූයේ ද, මේ හෙතෙමේ ය. එකල ඔවුන් අතුරෙහි සංඝස්ථවිරයන්ට රහත් බව සමග අභිඥාවෝ පැමිණියාහුය. හෙතෙම මගේ කෘත්‍යය මුදුන් පැමිණියේ යයි අහසට පැන නැඟී අනෝතත්ත විලෙන් මුව සෝදා, උතුරුකුරු දිවයිනට පිණ්ඩපාතය ගෙන අවුත් ඇවැත්නි, මේ පිණ්ඩපාතය වළඳ නො පමාව මහණදම් පුරව්' යයි (කීය.) අනෙක් අය මෙසේ කීහූ. යමෙක් පළමුව අධිගමය උපදවා පිණ්ඩපාතය ගෙන ඒද? ඔහු විසින් ගෙන එන පිණ්ඩපාතය වළඳ සෙස්සන් මහණදම් කටයුතු යයි අපගේ කතිකාවතක් නැත. නුඹවහන්සේ තමන්ගේ

හේතුසම්පත් හේතුවෙන් පළමුව කාර්යය මුදුන් පමුණුවන ලදී. අපි ද අපේ උපනිශ්‍රයක් වන්නේ නම්, එය හේතුකොටගෙන කටයුතු මුදුන් පමුණුවමු. එය අපට උත්තරයකි. ප්‍රපඤ්චයෙකි. නුඹවහන්සේ යනු මැනවි. උන්වහන්සේ යම් පහසු තැනකට ගොස් ආයු කෙළවර පිරිනිවන්පෑහ.

දෙවන දවස්හි දෙවැනි තෙරුන් වහන්සේ අනාගාමී ඵලය පසක් කළහ. උන්වහන්සේට ද අභිඥා පැමිණියාහු ය. හෙතෙමේ ද එසේම පිණ්ඩපාතය ගෙනවුත් අනෙක් අය විසින් පිළිකෙව් කරන ලදින් පහසු තැනකට ගොස් ආයු කෙළවර ශුද්ධාවාසයෙහි උපන. හෙතෙම ශුද්ධාවාසයේ සිට තමන්ගේ සහායකයන් බලන්නේ, ඒ වනවිට එක් අයෙක් පිරිනිවියේය. එක් අයෙක් දැන් භාග්‍යවතුන් සමීපයෙහි ආර්ය භාවයට පැමිණියේය. එක් අයෙක් ලාභ සත්කාර උදෙසා මම රහත්මියි සිත් උපදවා සුප්පාරක පටුනෙහි වසන බව දැන, එහි එළඹ තොපි රහත් නොවේ. රහත් මගට පිළිපන්නේ නොවේ. යන්න, භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් ධර්මය ශ්‍රවණය කරව'යි උනන්දු කරවීය. හෙතෙමේ ද ඇතුළු ගමේ දී භාග්‍යවතුන් වහන්සේගෙන් අවවාද යාඥා කොට 'තසමාතිහ තෙ බාහිය දිට්ඨේ දිට්ඨමත්තං හොතූ'යි භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් අවවාද දෙන ලද්දේ, ආර්යභූමියට පැමිණියේය.

නැවත, තව එක් අයෙක් ඇත. ඔහු කොහේදැයි බලන්නේ අන්ධ වනයෙහි ශෛක්ෂ ප්‍රතිපදාව පුරමින් වසනු දැක මෙසේ සිතීය. සහායකයා සමීපයට යන්නෙමි. යන්නහු විසින් හිස් අතින් නොගොස් පඬුරක් ගෙන යන්නට වටී. එහෙත් යහළුවා නිරාමිස තැනැත්තෙක. පර්වතය මුදුනෙහි වසන්නා වූ ඔහුට මා විසින් අහසෙහි සිට දෙන ලද පිණ්ඩපාතයවත් පරිභෝග නොකර මහණදම් කළේය. දැන් ආමිස පඬුරු කෙසේ ගන්නෙහිද? දහම් පඬුරක් රැගෙන යන්නෙමි'යි බඹලොව සිටිමින්ම රුවන් වැලක් ගොතන්නකු මෙන්, ප්‍රශ්න පසළොසක් විභාගකොට, ඒ දහම් පඬුර ගෙන පැමිණ සහායකයාට නුදුරෙහි සිට තමන්ගේ ශ්‍රමණ සංඥාව පැවැත්වීම් වශයෙන් ඒ තෙරුන් නොවැඳ ම 'මහණ! මහණ!! යයි අමතා 'අයං වම්මිකෝ' යනාදිය කීහ.

එහි සීඝ්‍රව ඇමතීම් වශයෙන් භිකඛු භිකඛු යයි නැවත නැවත දෙවරක් කීම දතයුතුය. යම්සේ එකම තිලකයකින් නළල නොහොබීද? එය වටකොට අනෙක් තිලකයන් ද දුන් කල්හි, පිපී සැරසුණාක් මෙන්

හොබනේය. මෙසේ හුදෙකලා තනි වචනයම නො හොබී. පිරිවර පද සමග පිපී සැරසුණාක් මෙන් හොබනේ යයි පිරිවර පද වශයෙන් වචනය පිපී සැරසුණාක් මෙන් කරන්නේ මෙසේ කීය.

අයං වම්මිකො පෙරටව සිටි තුඹසක් නම් නැත. දේශනා වශයෙන් පෙරටුව සිටියකු දක්වන්නකු මෙන් අයං යයි කීය. **ලංගිං** ආයුධයක් ගෙන හාරන්නේ කණායමක් දැක්කේය. **උකඛිපපලංඝිං අභිකඛණ සුමෙධ** දරුව! පණ්ඩිතය! කණායමක් නම් රාත්‍රියෙහි දුම් නො දමයි. දහවල් දිලිසෙයි. ඒ කණායම ඔසවා හැර ගනුව. ඔසවන්න. මත්තෙහි (තව තවත්) සාරව. මෙසේ සියලු පදයන්හි අර්ථ දතයුතුයි. **උදධුමායිකං** මැඩියෙකු **චංගවාරං** කර පෙරහනක්, **කුමමං ඉබ්බෙක්**, (කැස්බෙක්) **අසිසූනං** මස් කපන පිහියක් හා මස් ලොඹුවක්, **මංසපෙසිං** අත්ගලක් පමණ වූ අමු මස් ගොඩක්, **නාගං** සමන් මලන් කළඹක් ප්‍රමාණ සෝවැති තුනකින් යුතු මහා පෙනයක් ඇති නාගයකු දුටුවේය. **මා නාගං ඝටෙටසි** දඬු කෙළවරකින් හෝ වැල්පොටකින් හෝ පස් වැලි ආදියකින් හෝ නාගයා නොගටව. **නමෝ කරොති නාගසස** උඩු සුළඟින් ඉවත්ව පිරිසිදු වතක් හැඳ නාගයා වඳිවි. නාගයා විසින් අධිෂ්ඨාන කළ ධනය සත්මුතු පරම්පරාව දක්වා පරිභෝග කළ ද අවසන් නොවේ. නාගයා තමන් සතු ධනය දෙන්නේය. නාගයාට නමස්කාර කරව, **ඉතොවා පන සුත්වා දුක්ඛකඛධ** සූත්‍රයෙහි **ඉතො** යනු ශාසනයෙහි අධිවචන වීද මෙහි එසේ නොවේ. මෙහි වනාහි දෙවපුතෙත යන්න අවධි වචනයි. එහෙයින් **ඉතොවා පන** නැවත මගෙන් විමසා වා යන අර්ථයි.

චාතුමමහා භූතිකසස සතරමහා භූතමය වූ, **කායසස අධිවචනං** ශරීරයට නමකි. යම්සේ බාහිර වම්මිකය තුඹස වමනය කෙරේනුයි වමනය කරන ලදනුයි, වමනය කරන ලද්දෙන් ඔසවන ලදනුයි වමනය කරන ලද ස්නේහය බඳනා ලදනුයි සතර කරුණින් වම්මික යයි කියන ලදී. ඒ තුඹස මත මුගටි, මී, සිකනල් ආදී නන්වැදෑරුම් ප්‍රාණීන් වමනය කරන ලදනුයි වම්මික නම්. වේයන් විසින් වමනය වමනය කොට මුවතුඩින් නගන ලද පස්වලින් උකුළු පමණටද මිනිස් පමණටද, උඩට නංවන ලදනුයි වම්මික නම්. වේයන් විසින් වමනය කළ කෙළ හා බැඳීමෙන් හාත්පසින් බඳනා ලද බැවින් සතියක් වැසි වැස්ස ද, නො විසිරෙන බැවින් වම්මික නම්. නියඟ කාලයෙහි එයින් පස්මිටක් ගෙන එය තමාගේ මිටින් පොඩිකරන කල්හි ස්නේහය නික්මෙයි. මෙසේ වමනය කළ

ස්නේහයෙන් බඳනා ලද්දේනුයි වම්මික නම්. එපරිද්දෙන් මේ කයද, අකබිමහා අකබිගුථකො ආදී වශයෙන් නන්වැදෑරුම් අසූචි කිළුටු මල වමනය කෙරේනුයි වම්මික නම්. බුදු පසේබුදු ක්ෂිණාශ්‍රවයෝ මේ අත්බැව්හිදීම, නිකාන්තිය දැඩිව ගැනීම ක්ෂය කිරීමෙන් ආත්මභාවය හැරගියාහු නිසාද, ආර්යයන් විසින් වමනය කරන ලදනුයි ද වම්මික නම්. මේ ශරීරය ඇට තුන්සීයකින් ඔසවන ලද්දේ, නහරවැලින් බඳනා ලද්දේ මසින් පුරවන ලද්දේ, තෙත් සහිත සමින් ඔතන ලද්දේ සත්ත්වයන් සත්ත්වයන් මුලා කෙරේද ඒ සියල්ල සියළු ආර්යයන් විසින් වමනය කරන ලද්දේනුයි වම්මික නම්. මෙසේ තෘෂ්ණාව විසින් උපදවන ලද බැවින් ආර්යයන් විසින් ඉවත දමන ලද්දා වූ ආශාවෙන් ස්නේහයෙන් මේ කය බඳනා ලදනුයි වම්මික නම් වේ.

යම්සේ තුඹස ඇතුළෙහි නොයෙක් ආකාරයේ ප්‍රාණීන් එහිම උපදිත්ද, එය මළ මුත්‍ර පහකරයිද, ගිලන්ව නිදියත්ද, මැරී වැටෙත්ද, මෙසේ හෙතෙම ඔවුන්ට වැදුන් ගෙයත්, වැසිකිළියත්, රෝහලත්, සොහොන් බිමත්, එයම වේ. මෙසේ ක්ෂත්‍රිය මහාසාර ආදීන්ගේ පවා ශරීරය මුරකරුවන් විසින් ආරක්ෂා කරන ලද මනාකොට විසිතුරු සැරසිලි කරන ලද, මහානුභාව වූ ශරීරයක් යයි නො සිතා, සිවිය ඇසුරු කළ කුඩා ප්‍රාණීහුය. සම ඇසුරු කළා වූ, මස් ඇසුරු කළා වූ, නහර ඇසුරු කළා වූ, ඇට ඇසුරු කළා වූ, ඇටමිදුලු ඇසුරු කළා වූ, පණුවෝ කුල ගණනින් අසූ දහසක් පමණ වූ කෘමි කුලයෝ ඇතුළු කයෙහිම උපදිත්. මළ මුත්‍ර පහ කරත්. රෝගීව හොවිති. මැරී වැටෙත්. මෙසේ මේ සියලු ප්‍රාණීන්ගේ වැදුම් ගෙය, වැසිකිළිය, ගිලන්හල, සොහොන්බිම වේනුයි, මේ ශරීරය වම්මික සංඛ්‍යාවටම ගියේය. එහෙයින් **වම්මිකොති ඛො භික්ඛූ ඉවසෙසතං චාතුමමහා භූතිකසස කායසස අධිවචනං** යනාදිය වදාළහ.

මාතා පෙතතික සමභවසස මව නිසා ද පියා නිසා ද උපන්, මව්පියන්ගේ ශුක්‍ර ශ්‍රෝණිතයෙන් හටගත්තා වූ, **ඔදන කුම්මාසූපචයසසා** ආහාරවලින් ද, කුම්මාසයෙන් ද වඩනා ලද්දා වූ, **අනිචචුච්ඡාදන පරිමද්දන භෙදන විද්ධංසන ධම්මසසාති** මෙම ශරීරය ඇතිව නැතිවන අනිත්‍යය ස්වභාව කොට ඇත්තේය. දුගඳ නැතිකිරීම පිණිස ශරීර විලේපනයන් ආලේප කළයුතු ස්වභාව ඇත්තේය. අඟපසඟ පීඩා මගහැරීම පිණිස සම්පබාහන කටයුතු කළයුතුව ඇත්තේය. ළදරු කාලයෙහි, ගැබ විසීමෙන්

වැරදි අන්දමින් පිහිටි අත් පා ආදිය සකස් කිරීම සඳහා අඳුන්ගෑම් අතින් පිරිමැදීම් ආදිය කළයුතු ස්වභාව ඇත්තේය. මෙසේ පරිහරණය කරන්නහුගේ ද කැඩෙන, බිඳෙන, විසිරෙන ස්වභාව ඇත්තේය. එසේ මාතාපෙත්තික සම්භව ඔදන කුම්මාසූපචය, උච්ඡාදන, පරිකම්මන මද්දන යන පදයන්ගේ හටගැනීම කියන ලනදී. අනිච්ච, භෙදන, විධ්වංසන පදයන්ගෙන් බැසයාම - විනාශය කියන ලදී. මෙසේ පද හතෙන්ම සතරමහා භූතමය වූ සිරුරේ උස් පහත් බව ද වැඩීම ද, පිරිහීමද හටගැනීම හා නැසීමද කියන ලද බව දතයුතුය.

දිවා කම්මනෙන දවල් දවසේ කළයුතු කර්මාන්ත, ධූපායනා මෙහි ධූම ශබ්දය ක්‍රෝධය, තෘෂ්ණාව, විතර්කය, පඤ්චකාම ගුණ, ධර්ම දේශනාව සහ ස්වාභාවික දුම් යන අර්ථයන්හි වැටේ. 'කොධෝ ධූමෝ භසමනි - මොඝවජ්ජං' යන මෙහි ක්‍රෝධය යන අර්ථයෙහි වැටේ. 'ඉච්ඡා ධූමායිතා සදා' යන මෙහි තෘෂ්ණා අර්ථයෙහි වැටේ. 'තෙන ඛෝ පන සමයෙන අඤ්ඤතරෝ භික්ඛු භගවතෝ අවිදූරෙ ධූපායනෙතා නිසිනෙනා හොති' මෙහි විතර්ක අර්ථයෙහි ය.

පංකෝ ච කාමා පලිපාච කාමා - භයඤ්චෙව මෙතං තිමූලං පවුත්තං
රජෝ ච ධූ මොච මයා පකාසිතා - හිත්වා තුවං පබ්බජ බ්‍රහමදත්තතා

යන මෙහි පස්කම් ගුණයෙහිය. ධූමංකත්තා හොති මෙහි ධර්මදේශනා අර්ථයෙහිය. 'ඔජෝ රථසස පඤ්ඤාණං ධූමෝ පඤ්ඤාණ මගගිනෝ' ස්වාභාවික දුමෙහි ය. මෙහි වූ කලී විතර්කයෙහි අදහස් කරන ලදී. අයං රතති ධූපායනා යනු එහෙයින් වදාරණ ලදී.

(ගාථාවේ අදහස පස්කම් ගුණයෝ පංකයක් ද වේ. මඩක් ද වෙයි. මේ කාම සංඛ්‍යාත භය මූලත්‍රයකින් පිහිටියාක් මෙන් නිශ්චල යයි කියන ලදී. මා විසින් මුල් තුනක් ඇත්තේ යයි කියන ලද රජස් දුම් යයි ද ප්‍රකාශ කරන ලද්දේ ද, ඒ කාමයන් හැර බ්‍රහ්මදත්තය පැවිදි වව)

තථාගතසෙසතං අධිවචනං තථාගතයන් වහන්සේ සප්ත ධර්මයන් බැහැර කරන ලද බැවින් බ්‍රාහ්මණ නම් වේ. සප්ත ධර්ම කවරේද? රාගය, ද්වේෂය, මෝහය, මානය, සක්කාය දෘෂ්ටිය, සැකය, සීල-ව්‍රත පරාමාස මේ සප්ත ධර්මයන් බැහර කරන ලද බැවින්, බ්‍රාහ්මණ නම් සුමෙධෝ

යහපත් වූ ප්‍රඥා ඇත්තේ, සෙඛසස මෙහි හික්මේනුයි සෙඛ නම්. භික්ෂුව ශික්ෂාවන්හි හික්මෙනු ලබන බැවින් සෙඛ යයි කියයි. කුමකින් හික්මේද අධි ශීලයෙහි හික්මෙයි. අධි චිත්තයෙහි හික්මෙයි. අධි ප්‍රඥාවෙන් හික්මෙයි. පඤ්ඤායෙතං ලෞකික ලෝකෝත්තර ප්‍රඥාවට මේ නමකි. ආයුධ සංඛ්‍යාත ශාස්ත්‍රයට නොවේ. විරියාරම්භසස කායික චෛතසික වීර්යයට එය ප්‍රඥාගතික වෙයි. ලෞකික ප්‍රඥාව හා ලෞකික වීර්යය ලෝකෝත්තර ප්‍රඥාව හා ලෝකෝත්තර වීර්යය ද වේ.

එහි වනාහි අර්ථ දැක්වීමය. එක් දනව්වැසි බමුණෙක් උදෑසනම මාණවකයන් සමග ගමින් නික්ම දහවල් මන්ත්‍ර කියවා සවස ගමට ආයේය. අතරමග එක් තුඹසක් ඇත්තේය. එය රාත්‍රියෙහි දුම් දමයි. දවල් ඇවිලෙයි. බමුණා අතවැසි වූ සුමන මාණවකයාට කීය. දරුව! මේ තුඹස රෑ දුම් දමයි. දවල් දැල්වෙයි. මොහුගේ විකාරය බලන්නෙමු. එය බිඳ සතර කොටසක් කර විසුරුවව. හෙතෙමේ මැනවැයි උදැල්ලක් ගෙන සම පොළවෙහි පා තබා එසේ කළේය.

එහි ආචාර්ය බ්‍රාහ්මණයා මෙන් භාග්‍යවතුන් වහන්සේ ද සුමේධ මාණවකයා මෙන් ශෛක්ෂ භික්ෂුව ද, තුඹස මෙන් ශරීරය ද දරුව! මේ තුඹස රෑ දුම් දවයි. දවල් ඇවිලෙයි. මොහුගේ විකාරය බලන්නෙමු. එය බිඳ සතර කොටසක් කොට විසුරුවවයි බමුණා විසින් කියන ලද කාලය මෙන්, මහණ සතරමහා භූතමය වූ කය සතර කොටසක් කොට විමසව'යි භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද කාලය ද, ඔහුගේ මැනවැයි උදැල්ලක් ගෙන එසේ කිරීම මෙන්, ශෛක්ෂ භික්ෂූහුගේ විසි කොටසෙහි යම් තද බවක් වේද, මේ පෘථිවි ධාතුවයි. යම් දොළොස් කොට්ඨාශයෙහි යම් හාත්පසින් බඳනා බවක් වේද මේ ආපෝ ධාතුවයි. යම් සතර කොටසෙහි යම් පැසවන බවක් වේද, මේ තේජෝ ධාතුවයි. සය කොටසෙහි යම් පුරවන බවක් වේද, මේ වායෝ ධාතුවයි. මෙසේ මෙසේ චතුධාතු වවත්‍ථාන වශයෙන් ශරීරයට ඇති අයිතිය දතයුතුයි.

ලංගීති ඛෝ භිකඛූ කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ අවිද්‍යාව අගුලු කණුව කොට දැක්වූයේද? යම්සේ නගරයේ දොර වසා අගුල දැමූ කල්හි මහජනයාගේ ගමන නවතීද? යමෙක් නගරය තුළ වෙත්ද ඔහු ඇතුලේම වෙයි. යමෙක් පිටිනුවර වෙයි ද ඔහු පිටිනුවරම වේ. මෙසේ යමෙකුගේ නුවන් දොරටුවෙහි අවිද්‍යා නමැති අගුල වැටේද? ඔහුගේ

නිවනට පමුණුවන ඥානගමනය නවතියි. එහෙයින් අවිද්‍යාව දොරගුලයයි දැක්වූ සේක. පජහ අවිජ්ජනති මෙහි කර්මස්ථානය ඉගෙනීම් පිළිවිසීම් වශයෙන් අවිද්‍යාව නැතිකිරීම කියන ලදී.

උදධුමායිකාති බො භිකඛු මෙහි උදධුමායික නම් මැඩියා මහත් නොවේ. නියපිටක් පමණ වේ. පරණ කොළ (පරණලා) අතර හෝ ගස් අතරෙහි හෝ වැල් අතරේ සිටී. හෙතෙම දඬු කෙළවරකින් හෝ වැල් කෙළවරකින් හෝ පස් සුන්නෙන් ගටන ලද වෑයම්කොට මහත්වැ වටකුරුව බෙලිගෙඩියක් පමණ, වී සතරපාදයන් අහස්ගත කොට නැවතුනු ගමන් ඇතිව සතුරන්ගේ වසඟයට පැමිණෙයි. කවුඩු උකුසු ආදීන්ට ආහාර පිණිස වේ. මෙසේ මේ ක්‍රෝධය ද පළමුව උපදින්නේ සිත කැළඹීම් මාත්‍රයක්ම වෙයි. එකෙණෙහිම නිග්‍රහ නොකරන ලද්දේ වැඩී මුහුණ හැකිලීමට පමුණුවයි. එකල්හි බැහැර නොකරන ලද්දේ හඬ සැලීමට පමුණුවයි. එකල්හි දුරු නො කරන ලද්දේ එරුස වචන කීමට පොළඹවයි. එකල්හි දුරු නො කරන ලද්දේ දිශාවන් බැලීමට පමුණුවයි. එකල්හි දුරු නොකරන ලද්දේ එහෙ මෙහෙ ඇදීමට පමුණුවයි. එකල්හි දුරු නොකරන ලද්දේ අත්, ගල්, දඬු-අවි අතට ගැනීමට පමුණුවයි. එකල්හි දුරු නොකරන ලද්දේ දඬු - අවිවලින් පහර දීමට පමුණුවයි. එකල්හි දුරු නොකරන ලද්දේ අනුන් ඇසීමට හෝ තමන් නැසීමට පමුණුවයි. 'යතො අයං කොධො පරං ඝාතෙත්වා අත්තානං ඝාතෙති. එත්තාවතායං කොධො පරමුස්සද ගතො හොති පරම වෙපුල්ලප්පතෙතා' යනාදිය වදාරණ ලද්දේය.

එහි යම් සේ මැඩියාගේ සතරපාදයන් අහස්ගත කල්හි ගමන නවතීද? මැඩියා සතුරන්ගේ වසඟයට ගොස් කවුඩු ආදීන්ට ආහාර වේද? එසේම ක්‍රෝධයෙන් යුත් තැනැත්තා කමටහන් ගෙන වඩන්නට නොහැකි වෙයි. සතුරන්ගේ වසඟයට යෙයි. සියලු මාරයන් විසින් කැමති සේ කටයුතු කරන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේ, 'උදධමායිකාති බො භිකඛූ කොධූ පායා සසෙසතං අධිවචනං යන්න වදාළහ. එහි බලයට පත් ක්‍රෝධයම කෝධූපායස නම්. පජහ කොධූපායා සනති යන මෙහි ප්‍රත්‍යවේක්ෂා ප්‍රහාණය වදාරණ ලදී.

දෙවාධාපතො යනු මෙහි යම් සේ පුරුෂයෙක් ධනය සහිත වූයේ සම්පත් සහිත වූයේ කාන්තාර මාර්ගයකට අවතීර්ණ වූයේ, දෙමං

සන්ධියකට පැමිණ මේ මගින් යා යුතුද? මේ මගින් යා යුතුදැයි තීරණය කරන්නට නොහැකි වන්නේ එහිම සිටී. ඉක්බිති ඔහු වෙත සොරු පැමිණ හිරිහැර කරදරවලට පමුණුවත්. මෙසේම මූල කර්මස්ථානය ගෙන සිටින්නා වූ භික්ෂුව බුද්ධාදි අට තැන සැකය උපදවා කර්මස්ථාන වඩන්නට නොහැකි වන්නේ ය. අනතුරුව ඔහුට ක්ලේශ මාරාදී සියලු මාරයෝ හිරිහැර පමුණුවති. එය සැකයෙන් දෙමංසන්ධියේ සිටින්නාක් වැනිය. 'ඛෙධා පතොති ඛො භිකඛූ විචිකිචඡා යෙත අධිවචනං' යන්න භාග්‍යවතුන් වහන්සේ එහෙයින් වදාළහ. **පජහ විචිකිචඡං** මෙහි කර්මස්ථානය වැඩීම, පිළිවිසීම වශයෙන් සැකය දුරුකිරීම කියන ලදී. **චංගවාරං** මෙහි රදවුන් විසින් කර පරහනෙහි දිය වත්කරන කල්හි කළ එකක් ද දෙකක් ද දහයක් විස්සක් කළ සියයක් වත්කරත් ද, බිඳුවක් පමණකුදු දිය රඳ නොසිටී. මෙසේම නීවරණ සහිත වූ පුද්ගලයාගේ අභ්‍යන්තරයෙහි කුසල ධර්මයන් නො පිහිටයි. 'චංගවාරනති ඛො භිකඛූ පඤචනෙතතං නීවරණානං අධිවචනං' යන්න එහෙයින් කියන ලදී. **පජහ පඤච නීවරණෙහි** මෙහි විකඛමභණ තදංග වශයෙන් නීවරණ ප්‍රහාණය වදාරණ ලදී.

කුමෙමා මෙහි ඉදිඛුවාගේ සතරපාද, හිස යනුවෙන් අංග පසක් වේද? එසේම සියලු සංඛත ධර්මයෝ සංග්‍රහ කරනු ලබන්නා වූ පංචස්කන්ධයම වෙති. 'කුමෙමාති ඛො භිකඛු පඤචනෙතතං උපාදානකඛනධානං අධිවචනං' යනාදිය වදාළහ. **පජහ පඤච පාදානකඛනධෙහි** මෙහි පඤච උපාදානස්කන්ධයන්හී ඡන්ද රාගය දුරුකිරීම වදාරණ ලදී.

අසිසූනාති මෙහි යම් සේ මස්ලොඹුව මතුයෙහි මස් තබා මන්නයෙන් කපයිද කොටයිද? එපරිද්දෙන් සත්ත්වයෝ වස්තුකාමය පිණිස ක්ලේශ කාමයන් විසින් නසනු ලබන්නේ වේද, වස්තුකාමයන් මත්තෙහි කොට ක්ලේශකාමයන් විසින් කපන ලද්දාහු කොටන ලද්දාහුම වෙත්. 'අසිසුනාති ඛො භිකඛූ පඤචනෙතතං කාම ගුණානං අධිවචනං' යන්න එහෙයින් වදාළහ. **පජහ පඤචකාම ගුණෙති** මෙහි පස්කම් ගුණයන්හි ඡන්දරාගය දුරුකිරීම කියන ලදී.

මංසපෙසීති ඛො භිකඛූ මෙහි (මංසපෙසී) මස්වැදලි නම් බොහෝ දෙනා විසින් පතන ලදී. ක්ෂත්‍රියාදී මිනිස්සු ද එය ප්‍රාර්ථනා කරත්. කවුඩන් ආදී තිරිසන්නු ද ප්‍රාර්ථනා කරති. යම්හෙයකින් මේ සත්ත්වයෝ

අවිද්‍යාවෙන් මුළුමනින්ම මුවා වී, නන්දිරාගයට පැමිණ සංසාරය (වෘත්තය) ප්‍රාර්ථනා කෙරෙද්ද? යම්සේ හෝ මස්වැදැල්ල තැබූ තුබූ තැන ලැගේද එපරිද්දෙන් මේ සත්ත්වයෝ තෘෂ්ණාවෙන් බඳිනා ලද්දාහූ සසර ලැගෙති. දුකට පැමිණේ ද උකටලී නොවෙති. මෙසේ තෘෂ්ණාව මස් වැදැල්ලක් සමාන වූයේ වේ. 'මංසපෙසීති ඛො භික්ඛු නන්දිරාගසෙසතං අධිවචනං' යන්න භාග්‍යවත්හු වදාළහ.

නාගොතිලො භික්ඛූ ඛිණාසවසෙසතං භික්ඛුනො අධිවචනං මෙහි යම් අර්ථයකින් ක්ෂිණාශ්‍රව තෙම නාගයයි කියනු ලැබේද? එය අනඞ්ගණ සූත්‍රයෙහි ප්‍රකාශ කරන ලදී. නමො කරොහි නාගසස ක්ෂීණාශ්‍රව වූ බුද්ධ නාගයා හට 'ඒ භාග්‍යවත්හු සත්‍යාවබෝධය කළාහු සත්‍යාවබෝධය පිණිස දහම් දෙසති. ඒ භාග්‍යවත්හු දැමුණාහු ඉන්ද්‍රිය දමනය පිණිස දහම් දෙසති. ඒ භාග්‍යවත්හු සන්සිඳුනාහූ ශමථය පිණිස දහම් දෙසති. ඒ භාග්‍යවත්හූ තරණය කළාහූ නිත්ථරණය පිණිස දහම් දෙසති. ඒ භාග්‍යවත්හූ පිරිනිවියාහූ පරිනිර්වාණය පිණිස දහම් දෙසති. මෙසේ නමස්කාර කරවයි මෙහි අර්ථයි.

මෙසේ මේ සූත්‍රය තෙරුන් වහන්සේට කර්මස්ථානය විය. තෙරුන් වහන්සේද මේ සූත්‍රයම කර්මස්ථානය කොට විදසුන් වඩා රහත් බවට පැමිණි සේක. අයමෙතසස අත්ථො මේ එම ප්‍රශ්නයාගේ අර්ථයයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ, රුවන් රැසක කුළුගන්වන්නාහු මෙන් අන්සන්ධි වූ පරිද්දෙන් දේශනාව නිමවූ සේක.

වම්මික සූත්‍ර වර්ණනාව නිමියේය.

1-3-4

එවමෙමසුතං යනු රථවිනීත සූත්‍රයයි. එහි **රාජගහෙ** එනම් නගරයෙහි ඒ නගරය වනාහී මහා මන්ධාතු මහා ගෝවින්ද ආදීන් විසින් පරිහරණය කරන ලද බැවින් රාජගහ යයි කියනු ලැබේ. මෙහි අන්‍ය වූ ප්‍රකාරයන් වර්ණනා කරති. ඔවුන්ගෙන් කිම මේ ඒ නගරයේ නාමයයි. මේ නගරය බුද්ධ කාලයෙහි ද, චක්‍රවර්ති කාලයෙහි ද, නගරය වේ. සෙසු කල හිස් වූයේ යක්‍ෂයන් විසින් අරක් ගන්නා ලදී. ඔවුන්ට වසන්ත වනයක්ව සිටී. **වෙළුවනෙ කලන්දක නිවාපෙ වෙළුවනං** ඒ උද්‍යානයේ නාමයයි. එය වනාහි හුණ ගසින්ද අටළොස් රියන් පවුරකින් ද, ගෝ පුර අට්ටාල ආදියෙන් යුක්තය. නීලවරණ වූයේ මනහර වෙයි. එහෙයින් වෙළුවන යයි කියයි. තව ද මෙහි ලෙහෙනුන්ට වැටුප් දුන්නාහු, එහෙයින් කලන්දක නිවාප යයි කියනු ලැබේ.

පෙර එක්තරා රජෙක් එහි උයන්කෙළි කෙළීමට පැමිණියේ සුරා මදයෙන් මත් වී දහවල් නින්දට පැමිණියේ ශයනය කළේය. ඔහුගේ පිරිවර ජනයා ද රජු ශයනය කළේයයි මල්පල ආදියෙන් පොළඹවනු ලබන්නේ ඔබනොබ ඇවිද්දේය. එකල රා ගඳ නිසා එක්තරා ගස් සිදුරකින් කළු නයෙක් නික්ම රජු ඉදිරියට ආයේය. ඒ දැක රුක් දේවතාවා රජුගේ ජීවිතය දෙමියි ලෙහෙන වෙසින් අවුත් කණ ළඟ ශබ්ද කළේය. රජු පිබිදියේය. කළු නයා නැවතුනේය. හෙතෙම එය දැක මේ ලෙහෙනා විසින් මට ජීවිත දානය දුන්නේ යයි එහි ලෙහෙනුන්ට වැටුප් පිහිටුවීය. ජීවිත දානයෙන් ද සෝෂා කළේය. එතැන් පටන් **කලන්දක නිවාප** යයි ප්‍රසිද්ධියට පත්විය. කලන්දක යනු ලෙහෙනුන්ට නමකි.

ජාතිභූමකා ජාති භූමියෙහි වැසි වූ, එහි ජාති භූමි යනු උපන් තැනයි. ඒ මේ උපන් තැන කොසොල් මහරජු ආදීන්ගේ නොවේ. චංකි බ්‍රාහ්මණ ආදීන්ගේ ද නොවේ. ශක්‍ර සුයාම සන්තුසිත ආදීන්ගේ නොවේ. අසූ මහා ශ්‍රාවක ආදී අන්‍ය සත්ත්වයන්ගේ උපන් තැන ජාතභූමි යයි නො කියනු ලැබේ. යමෙකුගේ උපන්දිනයෙහි දස සහශ්‍රී ලෝකධාතුව එකම ධජපෙල ඇතිව විසුරුණු මල් සුවඳ සුණු ගඳින් සුවඳ වූවා පිපුණා වූ සියළු ගස්වැල්වලින් යුත් නදුනුයන මෙන් බබළන්නී නෙළුම් කොළයක වූ දියබිඳක් සේ කම්පා වූද ජාත්‍යන්ධයන්ගේ රූපයන් දැකීම ආදී

නොයෙක් ප්‍රාතිහාර්ය පෑවා වූද, ඒ සර්වඥ බෝධි සත්ත්වයන්ගේ උපන්බිම වූ ශාක්‍ය ජනපදයෙහි, කපිලවස්තු ගෘහය උපන් බිම යයි කියනු ලැබේ. වසසං වුත්ථා තෙමසක් වස් වසන ලද්දාහු, පවාරණය කළ පැවරුම් ඇති.

භගවා එතදවොච මහණෙනි! කිම ඉවසිය හැකිද? ආදී වචනයන්ගෙන් ආගන්තුක පිළිසඳර කොට එතං කොතු ඛො භිකඛවෙ ආදී වචන කීය. ඒ භික්ෂූහු වනාහි මහණෙනි, කිම ඉවසිය හැකිද? කිම යැපිය හැකිද? කිම වෙහෙස නැතිව මග ආවාහුද? පිණ්ඩපාතය නොලැබී ක්ලාන්ත වූයේද යළි මහණෙනි, තෙපි කොහි සිට ආවාහුද? ආදී පිළිසඳර විසින් විචාරන ලද්දාහු භාග්‍යවතුන් වහන්ස! ශාක්‍ය ජනපදයෙහි කපිලවත්ථාගාරයේ සිට ජාත භූමියෙන් ආම්හයි කීහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සුද්ධෝදන මහරජුගේ, සුකෙකාදන රජුගේ, සකෙකාදන රජුගේ, ධොතොදන රජුගේ, අමිතොදන රජුගේ, අමිතා දේවියගේ, පමිතා දේවියගේ, මහා ප්‍රජාපතීගේ ආදී සියළු ශාක්‍ය මණ්ඩලයාගේ සුවදුක් නො විචාළේය. අනතුරුව තමාත් දශ කථා වස්තුලාභී වූ අනුනුත් එහි සමාදන් කරවන්නා වූ ප්‍රතිපත්ති සම්පන්න වූ භික්ෂුවක් විචාරණ සේක්, කොතු ඛො භිකඛවෙ යනාදිය වදාළහ.

කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ සුද්ධෝදන ආදීන්ගේ සුවදුක් නො විචාරා මෙබඳු වූ භික්ෂුවකගේම විචාරන සේක්, ප්‍රිය බැවිනි. බුදුරදුන්ට ප්‍රතිපන්න භික්ෂූහු ද, භික්ෂුණීහු ද, උපාසක උපාසිකාවෝ ද, ප්‍රිය වෙත්. මනාප වෙත්. කුමක් හෙයින්ද? ධර්ම ගරුත්වය හෙයින් තථාගතයෝ ධර්මගරුක වූවාහු වෙති. ඔවුන්ගේ ධර්මගරුක භාවය ද 'දුකඛං ඛො අගාරවො විහරති අපපතිසෙසා' මේ අජපල් නුගරුක උපන් අදහසින් බව දතයුතුය.

භාග්‍යවතුන් වහන්සේ ධර්ම ගරුත්වය නිසාම මහා කාශ්‍යප තෙරුන් වහන්සේගේ අභිනිෂ්ක්‍රමණයේ දී තුන්ගව්වක් පමණ පෙරගමන් වැඩියහ. අතිරේක යොදුන් සියයක් ගොස් ගංගා තීරයේ දී දහම් දෙසා මහාකප්පින ස්ථවිරයන් රහත් බලයෙහි පිහිටවූහ. එක්දිනක් බතින් පසුව පන්සාලිස් යොදුන් මග ගෙවා ගොස් කුඹල් නිවසේ තුන්යම රෑ මුලුල්ලේ දහම් දෙසා පුක්කුසාති කුලපුත්‍රයා අනාගාමී කළ සේක. එක්විසි යොදුන් ගොස් වනවාසී තෙරණුන්දෑට අනුග්‍රහ කළහ. සැටයොදුන් මග ගොස් ඛදිරවනිය රේවත තෙරුන්ට දහම් දෙසූහ. අනුරුද්ධ තෙරුන් පාචීනවංස මිගදායෙහි

හුන්නේ මහා පුරුෂ විතර්කය විතර්ක කෙරේයයි දැන අහසින් එහි ගොස් තෙරුන් හමුවෙහි බැස සාධුකාර දුන්හ. කුටිකණ්ණසොණ තෙරුන්ට එක් ගඳකිළියෙහි සෙනසුන් පනවා අලුයම දම් දෙසුමට ආරාධනා කොට, ස්වර භඤ්ඤය (මිහිරි ගායනය) අවසානයේ සාධුකාර දුන්හ. තුන්ගවු මග ගෙවා ගොස් තුන් කුලපුතුන් වසන තැන, ගොසිංගසාල වනයෙහි සමගි රසයෙහි අනුසස් වදාළහ.

කාශ්‍යප බුදුහාමුදුරුවෝ ද සටීකාර කුඹල්කරුගේ නිවෙසට ගොස් මෙතෙම අනාගාමී ඵලයට පැමිණි ආර්යයෙකැයි විශ්වාස උපදවා සියතින් අහර ගෙන වැළඳූහ. අපගේ භාග්‍යවතුන් වහන්සේ ද වස් එළඹෙන දිනය පැමිණි කල්හි, භික්ෂු සංඝයා විසින් පිරිවරන ලදුව දෙව්රමින් නික්ම චාරිකාවේ යෙදුනහ. කොසොල් මහරජු අනේපිඬු සිටු ආදීන්ට නවත්වනු නොහැකි විය. අනේපිඬු සිටු ගෙට අවුත් දොම්නසට පැමිණ සිටියහ. එකල පුණ්ණ නම් දාසිය පැමිණ ස්වාමීනි දොම්නසට පැමිණියේ ඇයිදැයි ඇසීය. එසේය ශාස්තෘන් වහන්සේ නවතා ගන්නට නො හැකි විය. මම මේ තෙමස තුළ ධර්මය අසන්නට හෝ අදහසේ හැටියට දන් දෙන්නට හෝ නො ලබමි. මම ශාස්තෘන් වහන්සේ නවත්වා ගන්නෙම් ද? ඉදින් හැකිනම් නවත්වා ගනුව, එසේ වුවහොත් තී දාසියක් නො වූවාම වේ. ඕ තොමෝ ගොස් දශබලධාරීන් වහන්සේගේ පාමුල වැටී භාග්‍යවතුන් වහන්ස නවතිනු මැනව කීවාය. පුණ්ණාවෙනි! තී අනුන් නිසා ජීවත් වන්නියකි. තී කුමක් කරන්නද? භාග්‍යවතුන් වහන්සේ මට දීමට සුදුසු වස්තුවක් නම් නැති. ඔබවහන්සේ දනී. එසේ වුවත් භාග්‍යවතුන් වහන්සේ නවතින්නේ නම් මම තිසරණ සරණයෙහි ද පංච ශීලයෙහි ද පිහිටමි. භාග්‍යවතුන් වහන්සේ මැනවි මැනවැ පුණ්ණාවෙනි වදාරා සාධුකාර දී නැවතී ජේතවනාරාමයටම වැඩමවූ සේක. මේ කථාව පතළ විය. සිටුතුමා මේ කථාව අසා පුණ්ණා විසින් භාග්‍යවතුන් වහන්සේ නවත්වා ගත්තේ යයි අසා ඇය දාසි බවින් නිදහස් කොට දූ තනතුරෙහි තැබීය. ඕ තොමෝ ප්‍රවජ්‍යාව යැද පැවිදි වූවාය. පැවිදි වී විදර්ශනාව ආරම්භ කළාය. ඇගේ පටන්ගත් විදර්ශනාව දැනගත් ශාස්තෘන් වහන්සේ මේ ඕභාස ගාථාව වදාළ සේක.

පුණ්ණෙණා පුරෙසි සද්ධම්මං - චන්දෝ පණ්ණරසෝ යථා
පරිපුණ්ණාය පඤ්ඤාය - දුක්ඛසසනතං කරිසසසි

පුණ්ණාවෙනි! පණ්ණරසී චන්ද්‍රයා මෙන් ශාසන ධර්මය පුරව. විදර්ශනා සහිත මාර්ග ප්‍රඥාව සම්පූර්ණ වූ කල්හි සසර කෙළවර කරන්නෙහිය.

මේ ගාථාවගේ කෙළවර ඕ තොමෝ අර්හත් බවට පැමිණ අභිඥා සම්පන්න ශ්‍රාවිකාවක් වූවාය.

තථාගතයෝ මෙසේ ධර්මය ගරුකකොට ඇත්තාහ.

නන්දක ස්ථවිරයෝ උපස්ථාන ශාලාවෙහි ධර්මය දේශනා කරන කල්හී භාග්‍යවතුන් වහන්සේ ස්නානය නොකරම ගොස් තුන්යම රාත්‍රී සිටගෙනම බණ අසා දේශනාවසානයේ සාධුකාර දුන්හ. ස්ථවිරයන් පැමිණ වැඳ ස්වාමීනි, කවර වේලාවක වැඩියාහුදැ'යි විචාළේය. 'ඔබ ධර්මදේශනාව ආරම්භ කළ මොහොතේමය.' 'වහන්ස, දුෂ්කර කාර්යයක් කළාහුය. නුඹවහන්සේ බුදු හෙයින් සියුමැළි වූවාහුය. භාග්‍යවතුන් වහන්සේ නන්දකය, ඉදින් ඔබ කල්පයක් බණ කියන්නේද? කල්පයක් පමණම මම සිටියේම අසන්නෙමි යි වදාළහ. මෙසේ තථාගතයෝ ධර්මගරුක වෙත්. ධර්මගරුක බවින් ඔවුන්ට පිළිවෙතට පැමිණියාහු ප්‍රිය වෙති. එහෙයින් ප්‍රතිපන්නකයෝ විචාරත්.

ප්‍රතිපන්නකයෝ නම්,

1.තමන්ට හිත පිළිපන්නේ අනුන්ට හිත බවට නො පිළිපන්නේය.

2.අනුන්ගේ හිත බවට පිළිපන්නේ තමන්ට හිත පිණිස නො පිළිපන්නේය.

3.තමන්ට ද අනුන්ට ද හිත බවට පිළිපන්නේය.

4.තමන්ට ද අනුන්ට ද හිත පිණිස නො පිළිපන්නේය යනුවෙන් හතරවැදෑරුම් වේ.

එහි යමෙක් තමන් දශකථා වස්තුලාභී වේද, එහි අනුන් අවවාද නො කෙරේද, අනුශාසනා නො කෙරේ ද? ආයුෂ්මත් බක්කුල තෙරුන් මෙනි. මේ තෙමේ තම හිතබවට පිළිපන්නේ පරහිත බවට පිළිපන්නේ නොවේ. මෙබඳු වූ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේ නො විචාරණ සේක. කවර හෙයින්ද මාගේ ශාසනයෙහි වාද්ධි පක්ෂයෙහි නො සිටියේ යයි කියා යමෙක් වනාහී දශකථා වස්තූන් නො ලබන සුළු වූයේ ඒ දශකථා

වස්තූන්ගෙන් අනුන් අවවාද කෙරේද? ඒ කරන ලද වත් ඉවසනු පිණිසය. උපනන්ද ශාක්‍යපුත්‍රයන් මෙනි. මේ අය පරහිත පිණිස පිළිපන්නේ ස්වහිත පිණිස නො පිළිපන්නේය. මෙබඳු අයගෙන් ද නො විචාරති. කුමක් හෙයින්ද ඔහුගේ තෘෂ්ණාව ප්‍රහීණ නොවූ බැවිනි. යමෙක් තමාත් දශකථාවස්තු නො ලබනසුළු වූයේ මෙරමාත් එයින් අවවාද නො කෙරේද? ලාළුදායී තෙරුන් මෙනි. මේ තෙමේ තමහට වැඩ පිණිස පිළිපන්නේත් නැත. අනුන්ට වැඩ පිණිස පිළිපන්නේ තී නොවේ. මෙබඳු වූවහුද නො විචාරති. කුමක් හෙයින්ද ඔහුගේ ඇතුළත ක්ලේශයන් පොරවකින් කැපිය යුතු තරම් මහත් වූ නිසයි. යමෙක් වනාහි තෙමේ දශකථා වස්තුලාභී වූයේ අනුනුත් එයින් අවවාද කෙරේද? මෙතෙමේ තම හිත බවටද අනුන්ගේ හිත බවට ද පැමිණියේ වෙයි. සැරියුත් මුගලන් කසුප් ආදී අසූමහා සව්වන් මෙනි. මෙබඳු වූ භික්ෂුව විචාරණ සේක. කවර හෙයින්ද, මාගේ ශාසනයේ වෘද්ධි පක්ෂයේ සිටිය බැවිනි. මෙහිද මෙබඳු වූ මහණක් විචාරණ සේක් කොනු ඛො භිකඛවෙ යනාදිය වදාළහ.

මෙසේ භාග්‍යවතුන් විසින් විචාරණ ලද්දා වූ ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ ස්වකීය ජාති භූමියෙහි දෙපිරිසිටම හිත පිණිස පිළිපන් දශකථා වස්තුලාභී වූ භික්ෂුවක් විචාරයි. එහි කවරෙක් මෙබඳු වූයේ ද? ඔවුනොවුන් සිතීමක් හෝ සාකච්ඡාවක් හෝ නො වීය. කුමක් හෙයින්ද යම්හෙයකින් මන්තානිපුත්ත තෙරුන් මෙ ජනපදයෙහි අහස් මැද සිටි චන්ද්‍රයා මෙන්ද හිරු මෙන්ද, ප්‍රකට වූයේ ප්‍රසිද්ධ වූයේ වේද, එහෙයින් ඒ භික්ෂූහු මේස නාදය අසා එකවිට රැස්වූ මොනර සමූහයා මෙන් ද, ගණ සජ්ඣායනා කරන්නට ආරම්භ කළ භික්ෂූන් මෙන් ද, තමන්ගේ ගුරුවරයා වූ පුණ්ණ තෙරුන් භාග්‍යවතුන් වහන්සේට දන්වන්නාහු තෙරුන්ගේ ගුණ කියන්නට නො පොහෝනා මුවින් එක් පැහැරම **පුණ්ණෙණ නාම භනෙත** ආයසමා ආදිය කීහ.

එහි **පුණ්ණෙණ** යනු ඒ තෙරුන්ගේ නමයි. හෙතෙම මන්තානියගේ පුත්‍රයාය. එහෙයින් මන්තාණිපුත්ත යයි කියයි. **සමභාවිතො** ගුණ සම්භාවනාවෙන් සම්භාවිතය. **අපපිච්ඡා** දැඩි කැමැත්තෙන් වෙන්විය. තණ්හාව නැත්තේය. මෙහි වනාහි ව්‍යඤ්ජන සාවසේස මෙන් වේ. එහෙත් අර්ථය නිරවශේෂය. යම්හෙයකින් ඔහුගේ සිත තුළ ක්ලේශ මාත්‍ර වූද කැමැත්තක් නම් නැත්තේද එහෙයිනි. මොහු සියලු ආකාරයෙන් ප්‍රහීණ වූ තෘෂ්ණා ඇති රහතන් වහන්සේ කෙනෙක්මය. තව ද මෙහි

අත්‍රිච්ඡතා, පාපිච්ඡතා, මහිච්ඡතා, අපපිච්ඡතා යන මේවායේ භේදය දතයුතුය. එහි ස්වකීය ලාභයෙහි සතුටු නැති වූවහුගේ පරලාභයෙහි ප්‍රාර්ථනාව **අත්‍රිච්ඡතා** නම් වේ. එයින් යුක්ත වූවහට එකම බඳුනෙහි පිසින ලද ආප්පයක්, කැවුමක්, තමන්ගේ පාත්‍රයට වැටුණු කළ එය නො පිළිස්සුණු, මනාව නො ඉදුණු කුඩා කැවුමක් ආප්පයක් ලෙස හැඟේ. එයම වෙනත් කෙනෙකුගේ පාත්‍රයක වැටුණු කල එය හොඳින් පිළිස්සුණු ලොකු ආප්පයක් කැවුමක් සේ හැඟෙයි.

අවිද්‍යමාන ගුණ පහළ කරන බව ද, පිළිගැනීමෙහි පමණ නො දන්නා බව ද **පාපිච්ඡතා** නම්. 'ඉධෙකච්චෝ අසඃසද්ධෝ සමානෝ සද්ධෝති මං ජනෝ ජනාතු' ආදී ක්‍රමයෙන් අභිධර්මයේ පෙන්වයි. එයින් සමන්විත වූ පුද්ගලයා කොහොත් බැව්හි පිහිටයි.

විද්‍යමාන ගුණ පහළ කරන බව ද, පිළිගැනීමෙහි පමණ නො දන්නා බව ද **මහිච්ඡතා** නම් වේ. 'ඉධෙකච්චෝ සද්ධෝ සමානෝ සද්ධෝති මං ජනෝ ජානාතුති ඉච්ඡති - සීලවා සමානෝ සීලවාති මං ජනෝ ජානාතුති' ආදී වශයෙන් අභිධර්මයෙහි ආයේය. එයින් සමන්විත වූ පුද්ගලයා සතුටු කිරීමට දුෂ්කර වූයේ වෙයි. වැදූ මවුද ඔහුගේ සිත් ගන්නට නොහැකි වෙයි.

අගඟිකඛත්තෝ සමුද්දොව - මහිච්ඡා වාපි පුගඟලෝ
සකටෙන පච්චයං දෙනතු - තයෝ පෙතෙ අතපපියා

ගිනි කඳ ද, සමුද්‍රය ද, මහේච්ඡ පුද්ගලයා ද යන මොහු තිදෙනම ගැලින් ප්‍රත්‍යය දුන්නත් සතුටු කළ නො හැකිමය.

විද්‍යමාන ගුණ සඟවන බව ද, පිළිගැනීමෙහි පමණ දන්නා බවද **අපපිච්ඡතා** නම් වේ. එයින් සමන්විත වූ පුද්ගලයා තමන් කෙරෙහි විද්‍යමාන වූ ගුණය සඟවනු කැමති බැවින් සැදැහැ ඇතියේ සැදැහැ ඇතියයි ජනයා දැනගනීවායි නො කැමති වෙයි. සිල් ඇත්තේ, විවේක ඇත්තේ, බහුශ්‍රැත වූයේ, ප්‍රඥාවන්ත වූයේ පටන්ගන්නා ලද වීර්යය ඇත්තේ, සමාධි සම්පන්න වූයේ, ප්‍රඥාවත් වූයේ, ක්ෂීණාශ්‍ර වූයේ, මා ක්ෂීණාශ්‍රවයෙකැයි ජනයා දැනගනීවායි නො කැමති වේ. මජ්ඣන්තික ස්ථවිරයන් වහන්සේ මෙනි.

මජ්ඣන්තික තෙරුන් වහන්සේ මහා රහතන් වහන්සේ නමකි. එහෙත් උන්වහන්සේගේ පා සිවුරු පාදයක් (කහවනුවෙන් හතරෙන් එකක්) පමණ අගී. උන්වහන්සේ අශෝක රජුගේ විහාර පූජා දිනයෙහි සංඝ ස්ථවිර වූහ. උන්වහන්සේගේ රූක්ෂභාවය දැක මිනිස්සු ස්වාමීනි, මදක් බැහැර වුව මැනවැයි කීහු. රහතන් වහන්සේ මා වැනි රහත් කෙනෙකු රජුට සංග්‍රහ නො කරන කල්හි අන් කවරෙක් පිහිට වන්නේදැයි, පොළවෙහි කිමිද සංඝස්ථවිරයන්ට පුදන ලද පිණ්ඩය ගනිමින්ම නැගුනු සේක. මෙසේ මහ රහතන් වහන්සේ නමක් වූයේ ම 'මේ රහත් කෙනෙකැ'යි මිනිසුන් දැනගන්නවාට නො කැමති විය. මෙසේ අල්පේච්ඡ භික්ෂුව නූපන් ලාභය උපදවයි. උපන් ලාභය තහවුරු කරයි. දායකයන්ගේ සිත ආරාධනය කරයි. හෙතෙම යම් විධියකින් තමාගේ අල්පේච්ඡ භාවයෙන් මදක් ගනී ද ඒ ඒ පරිද්දෙන් ඔහුගේ වතෙහි පැහැදුණු මිනිස්සු බොහෝකොට දෙන්නාහුය.

මීට වෙනස් වූ ද සතරවැදෑරුම් අල්පේච්ඡයක් වෙයි. ප්‍රත්‍ය අල්පේච්ඡය, ධුතංග අල්පේච්ඡය, පරියත්ති අල්පේච්ඡය, අධිගම අල්පේච්ඡය යනුවෙනි. ඔවුන් අතරෙන් සිවුපසයෙහි අල්පේච්ඡ වූයේ ප්‍රත්‍ය අල්පේච්ඡයයි. ඔහු දායකයාගේ කැමැත්ත, ශක්තිය දනී. දාන වස්තුවේ ප්‍රමාණය දනී. තමාගේ තරාතිරම ශක්තිය දනී. ඉදින් දාන වස්තුව බොහෝ වේද? දායකයා මදක් දෙනු කැමති වේද, දායකයාගේ වශයෙන් ස්වල්පයක් ගනී. දාන වස්තුව ස්වල්ප වූයේ දායකයා බොහෝ දෙනු කැමති වේද, තමාගේ ශක්තිය දැන ප්‍රමාණයෙන් ගනී. දාන වස්තුවත් බොහෝ වේද, දායකයා බොහෝ දෙනු කැමතිත් වේද, එකල තමාගේ ශක්තිය දැන ප්‍රමාණයෙන් ගන්නේ ය. ද්‍රවඟ පිළිවෙත් තමා සන්තකව ඇති බැව් නො දන්වනු කැමැත්තේ, ප්‍රචාරය නො කරනු කැමැත්තේ ධුතංග අල්පේච්ඡයයි.

එය ප්‍රකෘති කිරීම පිණිස මේ වස්තුහු වෙති. සෝසානික මහා කුමාර ස්ථවිරයෝ අවුරුදු හැටක් සුසාන භූමියෙහි විසීය. වෙනත් එකම භික්ෂුවක් වත් එය නො දත්තේය.

සුසානෙ සට්ඨී වසසානි - අබ්බොකිණ්ණං වසාමහං
දූතියෝ මං නජානෙය - අහෝ සොසානිකුත්තමෝ

මම හැටවසක් සොහොනෙහි විසුවෙමි. වෙනත් කෙනෙකු හා සම්බන්ධ නොවී විසූවෙමි. දෙවැන්නෙක් මා පිළිබඳව නො දන්නේය. සෝසානික ධුතංගයාගේ උතුම් බව පුදුම සහගතය.

සෑගිරි පර්වතයෙහි සහෝදරවරු දෙනමක් විසූහ. බාල තැනැත්තා උපස්ථායකයා විසින් එවන ලද උක්දඬු කීපයක් ගෙන වැඩිමහල්ලා වෙත ගියේය. ස්වාමීනි, පරිභෝග කළ මැනවැයි ඉල්ලීය. තෙරුන්ගේද දන් වළඳ අවසන මුව සෝදන වෙලාව විය. හෙතෙම කම් නැතැයි කීය. ඇයිද ස්වාමීනි, ඒකසනිකංග වූයේදැයි විමසීය. ඇවැත්නි, උක්දඬු ගෙනෙව කීය. පනස්වසක් ආරක්ෂා කළ ඒකාසනිකංගය සඟවා උක්දඬු පරිභෝග කොට මුව සෝදා දමා නැවත ඒකාසනිකංග ධුතංගය අධිෂ්ඨාන කළේය.

යමෙක් වනාහි සාකෙතකතිස්ස තෙරුන් මෙන් බහුශ්‍රැත භාවය දන්වන්නට නො කැමැති වීම මේ පර්යාප්ති අල්පේච්ඡතාවයයි. ස්ථවිරයන් වහන්සේ වනාහි, උදෙසීම් පිළිවිසීම් ආදිය නො කරන්නේ මොහොතක් (වෙලාවක්) නැතැයි කියයි. එහිදී මරණ ඇසිල්ල ලබන්නෙහිදැයි සමහරු චෝදනා කළහ. එසේ චෝදනා කරන ලද සඟ පිරිස අත්හැර කිහිරිවැල මුහුදු විහාරයට වැඩියහ. එහිදී වස් කාලය තුළ ස්ථවිර නවක මජ්ඣිම භික්ෂූන්ට උපකාරව සිට මහා පවාරණ පොහෝ දිනයෙහි ධර්ම කථාවෙන් මුළු ජනපදය (තම බහුශ්‍රැත) බවින් එකලු කොට ගියේය.

යමෙක් වනාහී සෝවාන් ආදි මාර්ගඵල ලබාත්, නය දන්වන්නට අකැමැති වේද, එය අධිගම අල්පේච්ඡභාවය වේ. කුලපුත්‍රයන් තුන්දෙනා මෙන් ද, සටීකාර කුඹල්කරු මෙන් ද වේ.

ආයුෂ්මත් පුණණ තෙරුන් වහන්සේ වනාහි අත්‍රිච්ඡතාව (අධික ආශා ඇති බව) පාපිච්ඡතාව (පව් කිරීමට ආශාව) මහිච්ඡතාව (බොහෝ දේ අවශ්‍ය බව) යන සියල්ල හැර හැම අයුරකින්ම ඉච්ඡාවන් දුරුකොට තෘෂ්ණාරහිත වූ පිරිසිදු වූ අපිස් බවින් සමන්විත වූයේ අල්පේච්ඡ නම් වේ. භික්ෂූන්ට ද ඇවැත්නි, අත්‍රිච්ඡතා (ආශාධික වූයේ) පාපිච්ඡතා (පාපී බවට යොමුවූයේ) මහිච්ඡතා (බොහෝ දේ අවශ්‍ය වූයේ) යන මේ සියලු ධර්මයන් පහකළ යුතුයයි ඒ ධර්මයන්හි ආදීනව දක්වා මෙබඳු වූ අපිස්

බවම සමාදන්ව පැවැතිය යුතුයයි අල්පේච්ඡ කථාව වදාළේය. "අත්තනාව අපපිවෙජා අපපිඤ්ඤව කථංච භික්ඛූනං කත්ථා" යනු එහෙයින් කියන ලදී.

දැන් අත්තනාව සනතුටෙඨා ආදියෙහි විශේෂාර්ථයම දක්වන්නෙමු. අර්ථ යෙදීම කී ආකාරයෙන්ම දතයුතුයි. සනතුටෙඨා යනු ඉතරෙතර ප්‍රත්‍ය සන්තෝෂයෙන් සමන්විත වූයේ, ඒ සන්තෝෂය වනාහි දොළොස් ආකාර වෙයි. කෙසේද යත්, යථාලාභ සන්තෝෂ යථා බල සන්තෝෂ, යථා සාරුප්ප සන්තෝෂ යනුවෙන් තෙපරිදිය. පිණ්ඩපාතාදියෙහි ද මෙසේය.

මේ එහි ප්‍රභේද විස්තරයයි. මෙහි භික්ෂුවක් සිනිඳු හෝ රළු හෝ සිවුරක් ලබයි. හෙතෙම එයින් ම යැපෙයි. වෙන එකක් ප්‍රාර්ථනා නො කරයි. ලැබුනත් නො ගනියි. මෙය ඔහුගේ සිවුරු පිළිබඳ යථාලාභ සන්තෝෂයයි. ඉක්බිති යම් භික්ෂුවක් ස්වාභාවයෙන් ම දුර්වල වේද, රෝගයකින් හෝ ජරාවෙන් පීඩා විඳින්නේ ද, බර සිවුරක් පොරවන්නේ ක්ලාන්ත වේද, හෙතෙම සහාග භික්ෂුවක් සමග එය මාරුකොට සැහැල්ලු සිවුරක් ලබාගෙන සතුටු වන්නේද මේ ඔහුගේ චීවරයෙහි යථාබල සන්තෝෂයයි. වෙනත් කෙනෙක් ප්‍රණීත වූ ප්‍රත්‍යය ලබනසුළු වේද, හෙතෙම පට සිවුරක් හෝ වෙනත් වටිනා සිවුරක් හෝ බොහෝ සිවුරු හෝ ලැබ, මෙය පැවිදිව බොහෝකල් වූ ස්ථවිර නමකට නැතිනම් බහුශ්‍රැතයන්ට සුදුසුය. නැතිනම් මෙය ගිලනුන්ට හෝ අල්පලාභියෙකුට සුදුසුයයි එවැන්නෙකුට දී ඔවුන්ගේ පැරණි සිවුරක් හෝ, කසල ගොඩ ආදියෙන් අවුලා සකස් කරන ලද සඟල සිවුරක් දරන්නේ ද එයින් සතුටු වන්නේ ද චීවරය පිළිබඳ යථා සාරුප්‍ය සන්තෝෂයයි.

නැවත භික්ෂුවක් වනාහි නීරස හෝ මිහිරි හෝ පිණ්ඩපාතයක් ලබයි ද හෙතෙම එයින් යැපෙයි ද, වෙනත් දෙයක් නො පතයිද, ලැබුනත් නො ගන්නේ ද මෙය ඔහුගේ පිණ්ඩපාතය පිළිබඳ යථාලාභ සන්තෝෂයයි. යම්කිසි භික්ෂුවක් තමාගේ ස්වභාවයට (කැමැත්තට) විරුද්ධ හෝ රෝගයට අපථ්‍ය හෝ පිණ්ඩපාතයක් ලබයි. යම්කිසි විධියකින් පරිභෝග කරන ලද පිණ්ඩපාතයකින් අපහසු තත්ත්වයකට පත්වීද, හෙතෙම එය සහාග මහණක් හට දී ඔහු අතින් වෙනත් යහපත් බොජුන් වළඳ මහණදම් කරන්නේ ද සතුටුවූයේම වේ ද මේ ඔහුගේ පිණ්ඩපාතයෙහි යථාබල සන්තෝෂයයි. වෙනත් භික්ෂුවක් බොහෝ ප්‍රණීත පිණ්ඩපාතය ලබයිද,

හෙතෙම එය ප්‍රව්‍රජිත ස්ථවිරවරුන්ට, බහුශ්‍රැතයන්ට අල්පලාභීන්ට දී ඔවුන්ගෙන් ඉතිරිය හෝ පිණ්ඩපාතයේ හැසිර මිශ්‍රක ආහාරයක් ලැබ එය වළඳමින් සතුටු වන්නේද මේ පිණ්ඩපාතයෙහි යථා සාරුප්‍ය සන්තෝෂයයි.

මෙහි භික්ෂුවක් වනාහි කැමති හෝ අකමැති සෙනසුනක් ලබාද, හෙතෙම එයින් සොම්නසක් හෝ ක්‍රෝධයක් උපදවයි ද, යටත්පිරිසෙයින් තණ ඇතිරියක් ලද පරිද්දෙන් ම සතුටු වේද, මේ ඔහුගේ සෙනසුන් පිළිබඳව 'යථාලාභ' සන්තෝෂයයි. යම් භික්ෂුවක් වනාහි තමන්ගේ ස්වභාවයට විරුද්ධ හෝ අසනීපයට විරුද්ධ හෝ සෙනසුනක් ලබයි. එහි වැසීම අපහසු වෙයි ද, හෙතෙම එය සහාග භික්ෂුවකට දී ඔහු සමීපයෙන් සත්ප්‍රාය වූ ගැලපෙන්නා වූ සෙනසුනක් ලැබ සන්තෝෂ වන්නේ ද, මේ ඔහුගේ සෙනසුන් පිළිබඳව 'යථාබල සන්තෝෂයයි. වෙනත් භික්ෂුවක් ලෙන්, මඩුලු, කුළුගෙවල් ආදියෙන් සමන්විත බොහෝ සැප පහසු ඇති සෙනසුනක් ලබා ද, එය චීවරාදියෙහි මෙන් වැඩි වස් සහිත ස්ථවිර භික්ෂුවකට හෝ බහුශ්‍රැත භික්ෂුවකට හෝ අල්පලාභි භික්ෂුවකට හෝ ගිලන් භික්ෂුවකට හෝ දී, යම්කිසි තැනක වෙසෙමින් සතුටු වන්නේ ද මේ සෙනසුන් පිළිබඳව යථා සාරුප්‍ය සන්තෝෂය වන්නේ ය. උතුම් සේනාසන නම් ප්‍රමාදයට කරුණුය. එහි ඉන්නා අයට ථීනමිද්ධය, නිදිමත බව ඇති වේ. නින්දෙන් මඩනා ලදුව නැවත පුබුදින්නන්ට පාප සිතිවිලි පහළ වෙති. ප්‍රත්‍යවේක්ෂා කොට එවැනි සෙනසුනකට පැමිණිය ද නො පිළිගනී. හෙතෙම එය ප්‍රතික්ෂේප කොට පාළු හිස් තැනක, ගසක් මුලක වෙසෙමින් ම සතුටු වන්නේ ද එය සේනාසන පිළිබඳව යථා සාරුප්‍ය සන්තෝෂය වේ.

මෙහි යම්කිසි භික්ෂුවක් වනාහි බෙහෙත් ගිලන්පස ලබයි. එය ප්‍රණීත වූයේ හෝ තිත්ත වූයේ හෝ තමන් එයින් සතුටු වන්නේ ද වෙන යමක් නො පතන්නේ ද, ලැබුනත් නො ගන්නේ ද එය ගිලන්පස පිළිබඳව යථාලාභ සන්තෝෂය වේ. යම්කිසි භික්ෂුවකට තෙලින් ප්‍රයෝජන ඇති කල්හි (උක්) පැණි ලබයි ද, හෙතෙම එය සහාග භික්ෂුවකට දී ඔහු අතින් තෙල් ගෙන වෙනත් තෙලක්ම සොයා වෙදකම් කරන්නේ ම සතුටට පත් වේද, මේ වූ කලී බෙහෙත් ගිලන්පස පිළිබඳ යථාබල සන්තෝෂය වේ. අනෙක් මහ පිනැති භික්ෂුවක් බොහෝ තෙල්, මී, සකුරු, ආදී ප්‍රණීත වූ බෙහෙත් ලබයිද? හෙතෙම එය මහා ස්ථවිර, බහුශ්‍රැත, අල්පලාභී, ගිලන්,

භික්ෂුවකට දී ඔවුන්ගෙන් ලබන්නා වූ කිසිවකින් යැපෙමින් සතුටු වේද, නැතහොත් එක් භාජනයක මුත්‍ර හරීතකය ද, එකක චතුමධුර ද තබා ස්වාමීනි, කැමති දෙයක් ගන්නැයි කී කල්හී, ඉදින් ඔහුගේ රෝගය ඒ දෙක අතුරෙන් එකකින් වුවත් සන්සිඳෙන්නේ ද, එකල්හි මුත්‍ර හරීටකය බුද්ධාදීන් විසින් වර්ණිත බැවින් චතුමධුර පිළිකෙව් කොට මුදු හරීටකය ගෙන බෙහෙත් කරමින් පරම සතුටට පත් වන්නේද? මේ වූ කලී ගිලන්පස පිළිබඳව යථා සාරුප්‍ය සන්තෝෂය වේ.

මොවුන් අතුරෙන් වනාහි වෙන වෙනම ප්‍රත්‍යයන්හි මේ සන්තෝෂ තුන අතුරෙන් යථා සාරුප්‍ය සන්තෝෂයම අග්‍ර වේ. ආයුෂ්මත් පුණ්ණ තෙරුන් වහන්සේ එකි එකී ප්‍රත්‍යයෙහි මේ තුන් සන්තෝෂයන්ගෙන් සන්තෝෂ වූයේය. **සනතුටඨී කථඤ්ච** යනු භික්ෂූන්ට මේ සන්තුට්ඨි කථාව කරන්නේම වේ.

පවිවිතෙතා යනු කාය පවිවේකය, චිත්ත පවිවේකය, උපධි පවිවේකය යන මේ තුන් පවිවේකයන්ගෙන් සමන්විත වූයේ යනුයි. එක්වන්ව යයි, හුදෙකලාවම සිටියි. හුදෙකලාවම නිදයි. හුදෙකලාවම පිඬු පිණිස හැසිරෙයි. හුදෙකලාවම පෙරළා එයි. හුදෙකලාවම සක්මන් කරයි. හුදෙකලාවම හැසිරෙයි. හුදෙකලාවම වාසය කරයි. මේ වූ කලී කාය පවිවේකය නම් වෙයි. අෂ්ට සසමාපත්තිය චිත්ත පවිවේකය නම් වේ. නිර්වාණය උපධි පවිවේක නම් වේ. 'කාය පවිවේකොච වචකථ කායානං, නෙකඛමමාහිරකානං, චිතත පවිවෙකො ච පරිසුද්ධ චිතතානං, පරම වොදානපපතතානං, උපරි පවිවෙකොච නිරූපධීනං පුගගලානං විසංඛාර ගතානං' යනු එහෙයින් කියන ලදී. **පවිවෙක කථනති** යනු භික්ෂූන්ට ද යළි මේ පවිවේක කථාව කරන්නේ,

අසංසටෙඨා යනු පස් වැදෑරුම් සංසර්ගයන්ගෙන් වෙන් වූයේ, සංසර්ගය පස්වැදෑරුම්ය. ශ්‍රවණ සංසර්ගය (ශබ්දයෙහි ඇලීම), දර්ශන සංසර්ගය (දැකීමෙන් ඇලීම), සමුල්ලාප සංසර්ගය, (මිථ්‍යා විතර්කයන්හි ඇලීම) සම්භෝග සංසර්ගය (සම්භෝගයෙහි ඇලීම), කාය සංසර්ගය (ස්පර්ශයෙහි ඇලීම) යනු පස්වැදෑරුම් සංසර්ගයෝය. ඔවුන් අතුරෙහි මෙහි යම් භික්ෂුවක් අසවල් ගමේ හෝ නියම්ගමේ හෝ රූපශ්‍රීයෙන් යුත්, දැකුම්කළු, ප්‍රසාදය එළවන, ලස්සන පාටින් යුත් ස්ත්‍රියක් හෝ තරුණියක් ඉන්නේ යයි අසයි. අසා ඒ පිළිබඳ ඇල්මෙහි ගැලෙයි. විශේෂයෙන්

ඇලෙයි. බ්‍රහ්මචරියාව ආරක්ෂා කරන්නට නො හැකි වෙයි. ශික්ෂාවන් දුර්වල වී එය ප්‍රකාශ නො කොට ගිහි බවට පත්වෙයි. මෙසේ අනුන් විසින් කියන ලද රූප සම්පත්තිය අසා හෝ තමන් විසින් සිනහසෙන, කථාකරන, ගී කියන හඬ අසන්නහුගේ ශ්‍රෝත විඤ්ඤාණයෙහි උපන්නා වූ රාග සිතිවිල්ල සවන සංසඟ නම් වෙයි. මෙය අනිත්‍යගන්ධ පසේ බෝධි සත්ත්වයන්ගේ ද පංචග්ගල නම් ලෙන්වැසි තිස්ස සාමණේරයන්ගේ වශයෙන් ද දතයුතුයි. සාමණේර තෙම අහසින් යන්නේ, ගිරිගම් වැසි කම්කරු දියණියන් වූ කුමරියන් පස්දෙනා පියුම් විලට ගොස් නා මල් පැළඳ මිහිරි හඬින් ගැයූ ගී හඬ අසා කාම රාගයෙන් විඳින ලද්දේ විශේෂයෙන් පිරිහී අනතුරට පත් වූයේය.

මේ ශාසනයෙහි කිසියම් භික්ෂුවක් තමන්ම නො අසයි. (එහෙත්) ලස්සන රූපයක් ඇති ප්‍රසාදය එළවන, උතුම් වූ ඡවි වර්ණයෙන් පැහැපත් වූ හොඳට වැඩුණු අඟපසඟ ඇති ස්ත්‍රියක් හෝ තරුණියක් තමන්ම දකී. හෙතෙම ඈ දැක ඒ රූපයෙහි ඇලෙයි. වශී වෙයි. බඹසර රකින්නට නො හැකි වෙයි. ශික්ෂාවන් දුබල බවට පැමිණෙයි. ශික්ෂාවන් දුබල නොකොට ගිහි බවට පැමිණෙයි. මෙසේ විසභාග රූපය බලන්නාට චක්ෂුර් විඥාන වීථි වශයෙන් උපන් රාගය දර්ශන සංසර්ගය නම් වෙයි. එය මෙසේ දතයුතුයි. එක් තරුණ භික්ෂුවක් කාල දීඝවාපී විහාරයට පාමොක් උදෙසීම පිණිස ගියේ ගුරුවරයා ඔහුට වන අන්තරාය දැක අවසර නුදුන්නේ. හෙතෙම නැවත නැවත ඇවිටිලි කරන්නේ, ඉදින් ඔබ ඇතුලුගම නො හැසිරෙන්නෙහි නම් තොපට අවසර දෙන්නෙමි'යි කීය. භික්ෂුව එය පිළිගෙන අවසර ලබා, උද්දේසය නිමි කල්හි ආචාර්යයන් වැඳ යන්නේ, ගුරු හාමුදුරුවෝ මේ ගමෙහි හැසිරෙන්නට ඉඩ නො දෙයි. කවර කරුණක් නිසාදැයි සිවුරු පොරවා ගමට පිවිසියේය. එක් කුල දියණියක් කහ වස්ත්‍රයක් පොරවා ගෙදර සිටියේ, තරුණ භික්ෂුව දැක හටගත් රාග ඇත්තේ කෙණෙස්සෙන් කැඳ ගෙනැවිත් භික්ෂුවගේ පාත්‍රයෙහි බහා නැවතී ඇඳෙහි හොත්තීය. එකල්හි මව්පිය දෙදෙන මේ ඇයිද දරුවයි විචාළහ. (දැන) මෙතනින් ගියා වූ භික්ෂුව ලබන්නේ නම් ජීවත් වන්නෙමි. නැතිනම් මිය යන්නෙමියි ඇය කීවාය. මව්පිය දෙදෙන ඉක්මනින් ගොස් ගම්දොරදී තරුණ භික්ෂුව නවත්වා වැඳ ස්වාමීනි නවතිනු මැනැවි. දහවල් දානය ගතමැනැවැයි කීහ. භික්ෂුව කම් නැත යන්නෙමියි කීය. ඔව්හූ වහන්ස, කීමට කාරණයක් ඇතැයි ඉල්ලා සිටින්නේ, අපේ ගෙදර බොහෝ ධනය ඇත. එකම දියණියක් ද සිටී. ඔබ අපගේ එකම

පුතා වතු මැනැවි. සුවසේ ජීවත් වන්නට හැකියයි කීහු. තරුණ භික්ෂුව මට මේ පළිබෝධයෙන් ප්‍රයෝජන නැතැයි නික්ම ගියේය. දෙමාපියෝ ආපසු ගොස් දරුව, භික්ෂුව නවත්වා ගැනීමට නො හැකි විය. අපි වෙනත් කැමැති කෙනෙකු බලමුයි කීහ. නැගිට කන්න බොන්නැයි කීහ. ඕ නො කැමති වන්නී සතියක් නිරාහාරව සිට කලුරිය කළාය. දෙමාපියේ, ඇගේ සිරුර පිළිබඳව අවසන් කටයුතු කර ඒ කහ වස්ත්‍රය ළඟ පන්සලේ භික්ෂු සංඝයාට පූජා කළහ. භික්ෂූහු වස්ත්‍රය කෑලි කෑලි කපා බෙදූහ. එක් මහළු භික්ෂුවක් තමන් ලත් කොටස ගෙන, කැළණි විහාරයට පැමිණියේය. (යට කී) තරුණ භික්ෂුව ද කැළණි සෑය වැඳීම සඳහා දවල් කාලයෙහි ම එහි ගොස් සිටියේය. මහළු භික්ෂුව ඒ රෙදිකඩ ගෙන, මේ රෙද්දෙන් මට පෙරහනක් මසා දෙන්නැයි තරුණ භික්ෂුවට කීය. තරුණ භික්ෂුව මේ රෙදිකඩ කොහෙන් ලැබුනේදැයි මහළු භික්ෂුවගෙන් ඇසීය. මහළු භික්ෂුව සියළු ප්‍රවෘත්ති කථාව කීය. හෙතෙමේ එය අසාම මෙබඳු තැනැත්තිය සමග සංවාසය නො ලදිමියි රාග ගින්නෙන් දැවුනේ එහිම කළුරිය කළේය.

ඔවුනොවුන් අල්ලාප සල්ලාප වශයෙන් උපන් රාගය වනාහි 'සමුල්ලාප සංසර්ග' නම්. භික්ෂුවක් භික්ෂුණියක සතු හෝ භික්ෂුණියක් භික්ෂුවක සතු හෝ යම් භාණ්ඩයක් ගෙන පරිභෝග කිරීම, වශයෙන් උපන් රාගය 'සම්භෝග සංසර්ග' නම් වෙයි.

එය මෙසේ දතයුතුය. මිරිසවැටි විහාර පූජාවෙහි භික්ෂූන් ලක්ෂයක්ද භික්ෂුණීන් අනූදහසක් ද සහභාගි වූහ. එක් සාමණේර නමක් උණුකැඳ බඳුනක් ගෙන ය න්නේ වරක් සිවුරු කොණෙහි ද වරක් බිම ද තැබීය. එක් සාමණේරියක් එය දැක පාත්‍රය මෙහි තබාගෙන යවයි තැටියක් දුන්නීය. ඉන් මෑත කාලයෙහි කිසියම් බියක් උපන් නිසා විදේශගත වූහ. ඔවුන් අතුරෙන් සාමණේරිය පළමුව ගියා ය. පසුව ඕ තොමෝ සිංහල භික්ෂුවක් ආයේ යයි අසා තෙරුන් සමීපයට ගොස් පිළිසඳර කතා කරන්නී වහන්ස, මිරිසවැටි විහාර පූජා අවධියේ නුඹවහන්සේ කෙතෙක් වස් ඇත්තේදැයි ඇය විචාළාය. එකල මම අවුරුදු සතක් වයසැති හෙරණක් වීමි. ඔබ වනාහි කෙතෙක් වස් ඇත්තීදැයි හෙරණ විචාළේය. එකල මම ද සත් වයස් ඇති හෙරණියක් වීමි. එහිදී උණුකැඳ ගෙන යන්නා වූ එක් හෙරණකට මම තැටියක් දුනිමි'යි ඇය කීවාය. ස්ථවිර තෙමේ ද ඒ මම යැයි තැටිය ගෙනහැර දැක්වීය. ඔව්හූ මෙපමණ වූ මැ සංසර්ගයෙන්

බඹසර රක්නට නො හැකි වූවෝ දෙදෙනම හැටවැනි විසේ දී උපැවිදි වූහ.

අත් ගැනීම් ආදිය නිසා උපන් රාගය 'කාය සංසර්ග' නම් මේ කතාව මෙසේ දැක්වේ. මහසෑ මළුවෙහි තරුණ භික්ෂූහු පාඩම් කරති. ඔවුන් පිටුපස තරුණ භික්ෂුණීහු බණ අසති. එහි එක් තරුණ භික්ෂුවක් අත් දික්කරන විට එක් තරුණ භික්ෂුණියකගේ ඇඟෙහි ගැටිණ. ඕ ඒ අත ගෙන තම පපුවෙහි තබා ගත්තාය. මෙම සංසර්ගයෙන් දෙදෙනම ගිහි බවට පැමිණියාහුය. මේ පස්වැදෑරුම් සංසර්ගයන් අතුරෙන් භික්ෂූන් සමග භික්ෂුවගේ ශ්‍රවණ, දර්ශන, සමුල්ලාප සම්භෝග, කාය සංසර්ග නිරතුරුව සිදුවන්නේය. භික්ෂුණීන් සමග කාය සංසර්ගය තබා සෙසු සංසර්ගයෝ කලින් කල වෙති. උපාසිකාවන් සමග ද එසේයි. උපාසකයන් සමග සියල්ලෝම කලින් කල වෙති. ඔවුන් ක්ලේශ වසඟ නොවී සිත රැකිය යුතුය.

එක් භික්ෂුවක් ග්‍රාහ ග්‍රාහක වෙයි. එක් භික්ෂුවක් ග්‍රාහ වුත්තක වෙයි. එක් භික්ෂුවක් මුක්ත මුක්තක වෙයි. ඔවුන් අතරෙහි යම් භික්ෂුවක් කරා මිනිස්සු ආමිසයෙන් සංග්‍රහ කිරීම් වශයෙන් පැමිණෙත් ද, භික්ෂුවද මල් ගෙඩි ආදියෙන් සංග්‍රහ කෙරේ ද, මේ තෙමේ ගාහ ගාහක නම් වේ. යම්කිසි මිනිසුන් පිරිසක් යම්කිසි භික්ෂුවක් කරා කී පරිද්දෙන් පැමිණේද, භික්ෂුව ද දක්ෂිණෙය්‍ය (දීමට සුදුස්සා වශයෙන්) පැමිණේද, මේ තැනැත්තේ ග්‍රාහ මුත්තක නම් වේ. යම් භික්ෂුවකට මිනිස්සු සිව්පසය දෙත්. භික්ෂූහු මල් ගෙඩි ආදිය දී සංග්‍රහ කෙරේද, මෙ තෙමේ මුත්තගාහක නම් වේ. යම් භික්ෂුවකට මිනිස්සු දීමට සුදුස්සන් වශයෙන් සළකා සිව්පසය දෙත් ද, භික්ෂුව ද චුල්ලපිණ්ඩපාතික තිස්ස තෙරුන් මෙන් දක්ඛිණෙය්‍ය වශයෙන් වළඳීද? මේ තෙමේ මුත්ත මුත්තක නම් වේ.

එක් උපාසිකාවක් චුල්ල පිණ්ඩපාතිකතිස්ස තෙරුන්ට දොළොස් වසරක් පිණ්ඩපාතයෙන් උපස්ථාන කළේය. එක් දවසක් ගමේ ගින්නක් ඇති වී උපාසිකාවගේ ගෙය දැවිණ. අනෙක් කුලුපග භික්ෂූන් පැමිණ කිමෙක්ද, උපාසිකාවෙනි, යම්කිසි දෙයක් රැක ගන්නට පුළුවන් වීද යනුවෙන් පිළිසඳර කථා කළහ. මිනිස්සු අපගේ මවගේ කුලුපග තෙරුන් වහන්සේ වළඳන වේලාවටම එන්නේ යයි කීහු. තෙරුන් වහන්සේ ද පිඬු පිණිස හැසිරෙන වේලාවටම වැඩියහ. උපාසිකාවද බිත්ති සෙවනෙහි

හිඳුවා භික්ෂාව සකස්කොට දුන්නීය. තෙරුන්වහන්සේ බත්කිස නිමවා නික්ම ගියකල්හි මිනිස්සු අපේ මවගේ කුලුපග භික්ෂුව වළඳන වේලෙහිම පැමිණියාහු යයි කීහ. උපාසිකා තොමෝ ඔබලාගේ කුලුපග භික්ෂූහු ඔබලාටම සුදුසුය. මගේ කුලුපග භික්ෂුව මටම සුදුසුයයි කීවාය.

ආයුෂ්මත් මන්තාණිපුත්‍ර තෙරුන් වනාහි මේ පස්වැදෑරුම් සංසර්ගයන්ගෙන් අසංසර්ග වූයේම ග්‍රාහ මුත්තක ද මුත්තමුත්තක ද වූයේය. උන්වහන්සේ අසංසට්ඨ වූයේ ද, එපරිද්දෙන් අනෙක් භික්ෂූන්ට ද අසංසට්ඨ කථාවම කරන්නේ විය.

ආරද්ධවිරියො දැඩිව ගන්නා ලද වීර්යය ඇත්තේ සම්පූර්ණ වූ කායික චෛතසික වීර්යය යන අර්ථයි. යම්කිසි භික්ෂුවක් ගමනෙහි දී උපන් ක්ලේශයෝ පැමිණෙන්නට නො දේද? සිටීමෙහි උපන් ක්ලේශය හිඳීමට හෝ හිඳීමෙහි උපන් ක්ලේශ නිදීමට හෝ පැමිණෙන්නට නොදේද, මන්ත්‍රයකින් කළු නයෙකු පෙළාගන්නෙකු මෙන් ද, සතුරෙකු බෙල්ලෙන් අල්ලා ගන්නාක් මෙන් ද හැසිරේද මෙතෙම ආරද්ධවිරිය නම් වේ. මේ ස්ථවිරයෝ ද එබඳු වූහ. භික්ෂූන්ට ද එසේම වීර්යාරම්භ කිරීමට අවවාද කරන්නෙක් වූයේය.

හීල සමපනෙනා යනාදියෙහි **සීලං** යනු සිව්පිරිසිදු ශීලයයි. **සමාධි** විදර්ශනාව පාදක කොටගත් අෂ්ට සමාපත්තියයි. **පඤ්ඤා** යනු ලොවී ලොව්තුරා නුවණයි. **විමුතති** යනු ආර්ය ඵලයයි. **විමුතති ඤාණදසසනං** යනු එකුන්විසි වැදෑරුම් ප්‍රත්‍යවේක්ෂා ඤාණයයි. ස්ථවිර තෙමේ තමනුත් ශීලාදියෙන් සම්පූර්ණව, සෙසු භික්ෂූන්ට ද ශීල සම්පන්න වන ලෙස සීලාදී කථා වදාරයි.

ඒ මේ ස්ථවිර තෙම දසකථා වස්තූන්ගෙන් අවවාද දෙයි. ඔවාදකො යමෙක් අවවාද කරන්නේම වේද, සියුම්ව අර්ථය පරිවර්තනය කර දක්වන්නට නොහැකි වේද? මේ ස්ථවිරයෝ එසේ නොවේ. මේ ස්ථවිරයන් වනාහි ඒ දසකථා වස්තූන් විස්තර කරන්නට හැකිවන බැවින් විඤ්ඤාපක නම් වේ. තවත් කෙනෙකුට දක්වන්නට හැකිවෙයි. කරුණු දක්වන්නට නො හැකි වෙයි. මේ ස්ථවිරයෝ කරුණු ද දක්වති. ඒ නිසා **සඤ්ඤසක** නම් වේ. තවත් කෙනෙක් විද්‍යමාන කරුණ දක්වයි. එහෙත් තේරුම් ගන්වන්නට නො හැකි වෙයි. මේ ස්ථවිරයෝ තේරුම් ගන්වන්නට ද

සමත් වේ. ඒ අනුව **සමාදපක** නම් වේ. නැවත එසේ සමාදන් කරවා ඒ කථා වස්තූන්හි උත්සාහය ඉපදවීම් වශයෙන් භික්ෂූන් තෙදගන්වන නිසා **සමුතෙතජක** නම් වෙයි. උත්සාහය උපන් කල්හි ගුණ කියා සතුටු කරවත්නුයි **සමපහංසක** නම් වෙයි.

සුලද්ධ ලාභා අනුන්ගේ මිනිසත් බව, පැවිද්ද, ආදි ගුණයෝ ලාභයෝ නම් වෙති. ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරයන්ට මේ ගුණ මැනැවින් පිහිටා තිබීම මේ ලාභයෝ වෙති. ශාස්තෘන් වහන්සේ සමීපයෙහි මෙසේ යම් කෙනෙකුගේ ගුණය ප්‍රකාශ වූයේ ද, එහෙයින් යන අර්ථයි. තව ද මෝඩයන් විසින් එසේ ගුණ කීම නම් ලාභයක් නොවේ. නුවණැත්තන් විසින් කරන ගුණකථනයම ලාභයක් වේ. ගිහියන් විසින් ගුණ කීම ද එවැනි ලාභයක් නොවේ. ගිහියන් විසින් වනාහි ගුණ කියන්නෙමැයි අපගේ ස්ථවිරයන් වහන්සේ මෘදුමොලොක්, මිත්‍රබව දක්වන, ප්‍රියමනාප කථා ඇත්තහ. විහාරයට එන අයට කැඳබත් ආදී ප්‍රණීත දේ දෙන්නාහ. සංග්‍රහ කරන්නාහ ආදිය කියමින් අගුණම කියයි. මේ ස්ථවිරයෝ අතිශයින් මෝඩයකු මෙන්, දුර්වලයකු මෙන්, ඇහිබැම නගන්නෙකු මෙන් වේ. මොහු සමග විශ්වාසයක් නැතැයි කියන්නේම වර්ණනා කරයි. භික්ෂූන් විසින්ද බුදුන්වහන්සේ නැති තැන දී ඒ ගුණ වර්ණනා කරත්. එය ලාභයක් නොවේ. ශාස්තෘන් වහන්සේ සමීපයෙහි ගුණ කීමම ඉතා ලාභයෙකි. මේ කාරණය සඳහා **සුලද්ධ ලාභා** යන්න කීහ. **අනුමාසස අනුමාසසා** යනු දසකථා වස්තූන්ට පිවිස පිවිස, **තඤ්ච සත්ථා අබභනුමොදති** ශාස්තෘන් වහන්සේ ද ඒ ගුණය දැන, මෙය එසේමය. ඒ භික්ෂුව අල්පේච්ඡමය. ඒ භික්ෂුව ලද දෙයින් තුටුවේම යැයි අනුමෝදන් වෙති. මෙසේ නුවණැත්තන් විසින් ගුණ කීම එක් ලාභයෙක. මේ භික්ෂූන් විසින් ගුණ කීම, ශාස්තෘන් හමුවෙහි ගුණ කීම, දශකථා වස්තූන්ට පිවිසෙමින් ගුණ කීම, ශාස්තෘන් විසින් අනුමෝදන් වීම, මේ ලාභ පස සඳහා **සුලද්ධ ලාභො** යයි කීහ.

කදාචි කිසියම් කලෙක, කරහචි යනු ඊටම සමාන අර්ථවත් වදනකි. **අපෙපවනාම සියා කොචි දෙව කථා සල්ලාපෝ** යනු කිසියම් කථා පැවැත්මෙක් වන්නේ නම් ඉතා යෙහෙක. තෙරුන් විසින් ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරයන් නො දක්නා ලද්දේල, ඔහුගේ ධර්ම කථාවක් නො ඇසූ විරූල, මේ නිසා හෙතෙම ඔහුගේ හමුවීම ද බණ ඇසීම ද ප්‍රාර්ථනා කරමින් මෙසේ කීහ.

යථාභිරන්තං යනු කැමති පරිද්දෙන් වැස, එක් තැනක වසන්නා වූ බුදුවරුන්ට සෙවන, දිය ආදී විපතකින් හෝ, අපහසු සෙනසුනකට හෝ මිනිසුන්ගේ සැදැහැ නැතිවීමකට හෝ පැමිණියේ නම් එහි වැඩසිටීමක් නැත. සම්පත්තියෙන් මෙහි සුවසේ වෙසෙමුයි සිත් අලවා කලක් විසීමක්ද නැත. එහෙත් යම්තැනක තථාගතයන් වැඩසිටින කල්හි සත්ත්වයෝ සරණයෙහි හෝ පිහිටත්ද සිල් සමාදන් වෙත්ද, පැවිදි වෙත්ද සෝවාන් මාර්ගාදී ඵලයන්ට උපනිශ්‍රය වෙත් ද, එහි බුදුවරයෝ සත්ත්වයන් ඒ ඒ සම්පත්තීන්හි පිහිටුවන අදහසින් එහි වෙසෙති. ඔවුන් නැතිකල්හි නික්ම යති. 'අදහස් වූ පරිදි වැස' යන්න එහෙයින් කියන ලදී.

චාරිකං චරමානො භාග්‍යවතුන් වහන්සේගේ චාරිකා වූ කලී දෙයාකාර වේ. තුරිත චාරිකා අතුරිත චාරිකා යනුවෙනි. (සිව්සස්) අවබෝධ කළ හැකි පුද්ගලයන් දුරක හෝ සිටින්නේ නම් ඔවුන් සොයා වහා යාම තුරිත චාරිකා නම් වේ. මහාකාශ්‍යප තෙරුන් නිසා පෙරගමන් යාම දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ මහකසුප් මහතෙරුන් වහන්සේ සඳහා පෙරගමන් යන්නේ ක්ෂණිකව තුන්ගවුවක් වැඩියේය. ආලවකයන් නිසා තිස්යොදුනක් ද එසේම අංගුලිමාල සඳහා ද එසේය. පුක්කුසාති රජු වෙනුවෙන් යොදුන් පන්සාලිසක් වැඩියහ. මහාකප්පින රජු සඳහා එක්සිය විසි යොදුනකි. ඛදිරිවනිය රේවත තෙරුන් සඳහා සත්සිය යොදුනක් ගියහ. ධම්ම සේනාපතීන්ගේ සද්ධි විහාරිකයකු සඳහා වනවාසී තිස්ස තෙරුන් සඳහා එක්විසි යොදුනක් හා තුන්ගව්වක් වැඩියහ.

එක් දවසක් සැරියුත් තෙරුන් වහන්ස ස්වාමීනි, තිස්ස සාමණේරයන් සමීපයට යන්නෙමැයි කීහ. භාග්‍යවතුන් වහන්සේ ද මම ද යන්නෙමියි කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් ඇමතීය. ආනන්ද වනවාසී තිස්ස සාමණේරයන් සමීපයට යාම සඳහා විසිදහසක් ෂඩභිඥාධාරීන්ට දන්වව යි කීය. ඉක්බිති දෙවන දිනයේ විසිදහසක් ක්ෂීණාශ්‍රවයන් පිරිවරාගෙන අහසට පැන නැඟී එක්සිය විසියොදුනක් පමණ ගොස් ඔහුගේ ගොදුරුගමෙහි බැස සිවුරු පෙරවූහ. රැකීරක්ෂා සඳහා යන මිනිස්සු බුදුහාමුදුරුවන් දැක, පින්වතුනි! භාග්‍යවතුන් වහන්සේ වැඩියහ. ගමන් නවතවු යයි කියා, අසුන් පනවා, කැඳ පිළිගන්වා පා මෙහෙවර කරන්නාහු, භාග්‍යවතුන් වහන්සේ කොහේ වඩින්නේදැයි තරුණ භික්ෂූන් විචාළාහුය. උපාසකයිනි, භාග්‍යවතුන් වහන්සේ අන්තැනක නො වඩිති. මෙහිම මේ තිස්ස සාමණේරයන් දැකීම පිණිස වැඩියේමය. ඔව්හු අපගේ කුලුපග

තෙරුන් දැකීම පිණිස ශාස්තෘන් වහන්සේ වැඩමවීලු. අපගේ තෙරුන් වහන්සේ කුඩා කෙනෙක්ම නොවූයේ යයි සතුටට පැමිණියාහු වෙති.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේගේ බත්කිස අවසානයේ සාමණේර හිමියෝ ගමෙහි පිඬු පිණිස හැසිර උපාසකවරුනි, මහා භික්ෂු සංඝයාදැයි විචාළේය. ඔව්හූ එසේය භාග්‍යවතුන් වහන්සේ වැඩමවූහයි කීවාහුය. හෙතෙම භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ පිණ්ඩපාතයෙන් විචාළේය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ පාත්‍රය අතින් ගෙන තිස්සය, කම් නැත. බත්කිස අවසන්යයි කීය. ඉන්පසුව උපාධ්‍යායන් විචාරා තමන්ට නිසි වූ ආසනයෙහි හිඳ බත්කිස කළේය. ඉක්බිති බත්කිස අවසානයේ ශාස්තෘන් වහන්සේ බණ වදාරා නික්මී, ගම්දොර සිට තිස්සය, තොප වසන තැනට ගමන්මග කෙසේදැයි පිළිවිසීය. භාග්‍යවතුන් වහන්ස මේය, තිස්සය මග දක්වමින් පෙරටුව යව.

භාග්‍යවතුන් වහන්සේ වනාහි දෙවියන් සහිත ලෝකයාට මාර්ගෝපදේශකයා වුවත්, සියලු තුන්ගවු මග සාමණේරයන් දක්නට ලැබීම සඳහා මාර්ග දේශකයා කළේය. හෙතෙම තමන් වසන තැනට ගොස් භාග්‍යවතුන්ට වත්පිළිවෙත් කළේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තිස්සය, තොපගේ සක්මන කොහේදැයි විචාරා, එහි ගොස් සාමණේරයන්ගේ හිඳින ගල්පොත්ත උඩ වාඩි වී තිස්සය, මෙතැන ඔබ සුවසේ වසන්නේදැයි විචාළේය. එසේය ස්වාමීනි, මෙතැන වසන්නහුට සිංහ, ව්‍යාඝ්‍ර, ඇත්, මුව, මයුර ආදීන්ගේ ශබ්ද අසන්නා වූ මට අරණ සංඥාව උපදී. ඒ නිසා සුවසේ වසමි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට භික්ෂු සංඝයා රැස්කරව! තොපට බුද්ධ දායාදය දෙන්නෙමි කියා භික්ෂු සංඝයා රැස් වූ කල උපසම්පදාවෙහි පිහිටුවා තමන් වසන තැනට ගියේය. මේ තුරිත චාරිකා නම් වේ.

නැවත ගම් නියම්ගම් පිළිවෙළින් දිනපතා යොදුන අඩයොදුන වශයෙන් පිඬුසිඟා වැඩීම ආදී චර්යාවන්හි ලෝක සත්ත්වයාට අනුග්‍රහ පිණිස වඩින්නා වූ ගමන අතුරිත චාරිකා නම් වේ. මේ චාරිකාවෙහි හැසිරෙන භාග්‍යවතුන් වහන්සේ මහා මණ්ඩලය, මධ්‍ය මණ්ඩලය, අන්තර් මණ්ඩලය යන මේ තුන් මණ්ඩලයන් අතුරෙන් එක් මණ්ඩලයකදී හැසිරෙන සේක. එහි මහා මණ්ඩලය යොදුන් නවසීයකි. මධ්‍යම මණ්ඩලය යොදුන් හයසියයකි. අන්තර් මණ්ඩලය යොදුන් තුන්සීයකි. යම් දවසක මහා

මණ්ඩලයේ චාරිකාවේ හැසිරීමට කැමති වේද, මහා පවාරණයෙන් පවරා පැළඳිය දිනයෙහි මහ බික්සඟන පිරිවරා නික්මෙයි. හාත්පස යොදුන් සියයක් එකම උත්සවයක් වෙයි. පළමු පළමු පැමිනි අය නිමන්ත්‍රණයට අවස්ථාව ලබයි. අනෙක් මණ්ඩල දෙක්හි සත්කාරය මහා මණ්ඩලයේ බැසගනී. එහි භාග්‍යවතුන් වහන්සේ ගම් නියම්ගම්හි එක් දිනක් දෙදිනක් වසන්නේ දාන මානාදිය පිළිගැනීමෙන් මහා ජනයාට අනුග්‍රහ දක්වමින් ධර්ම දානයෙන් සසරින් එතෙර වීමට කුසල වර්ධනය කරවමින් නව මසක් සැරිසැරීම කරන සේක.

ඉදින් ඇතුළු වස භික්ෂූන්ගේ සමථ විදර්ශනා තරුණ වේද, මහා පවාරණයෙන් පවාරණය නොකොට පවාරණ සංග්‍රහය දී, ඉල්මස පුණු පොහෝදා පවරා, උඳුවප් මස පළමු දිනයෙහි මහා බික්සඟන පිරිවරා නික්මී මධ්‍ය මණ්ඩලයේ සැරිසරයි. අනෙක් කාරණයකින් මධ්‍යම මණ්ඩලයෙහි චාරිකාවේ සැරිසරනු කැමැත්තේ සතරමාසයක් වැස නික්මෙයි. පෙර කී ආකාරයෙන්ම ඉතිරි මණ්ඩල දෙක්හි ද සත්කාරය මධ්‍යම මණ්ඩලයේ දී බැස ගනී. භාග්‍යවතුන් වහන්සේ පළමු ආකාරයෙන්ම ලෝකයාට අනුග්‍රහ කරන්නේ මාස අටක් චාරිකාව සම්පූර්ණ කරන සේක.

යළි ඉදින් සිව්මසක් වසන්නා වූ භාග්‍යවතුන් වහන්සේ වෙනෙය ජනයෝ මුහුකුරා නොගිය ඉඳුරන් ඇත්තෝ වේද, ඔවුන්ගේ ඉන්ද්‍රියයන්ගේ මේරීම් බව බලාපොරොත්තුවෙන් තවත් මාසයක් දෙකක් සිව්මසක් එහිම වැස මහබික් සඟන පිරිවරා නික්මෙති. පෙර කී පරිද්දෙන්ම ඉතිරි මණ්ඩල දෙක්හි සත්කාරය අන්තර් මණ්ඩලයේ දී බැසගනී. භාග්‍යවතුන් වහන්සේ පෙර කී පරිද්දෙන්ම ලෝ වැස්සන්ට අනුග්‍රහ දක්වමින් පස් මසක් හෝ සාර මසක් චාරිකාව සම්පූර්ණ කරන්නේය.

මෙසේ මේ මණ්ඩල තුනෙහි යම්කිසි තැනෙක චාරිකාවෙහි හැසිරෙන සේක් චීවරාදී සිව්පස හේතුවෙන් නො හැසිරෙති. වැළිත් යම් කෙනෙක් දුබල වූයේ ද, බාල වූවෝ ද ජරාවට පත් වූවෝ ද, රෝගී වූවෝද ඔව්හු කවර කලක අවුත් තථාගතයන් දකින්නෝ ද, එහෙත් මා චාරිකාවෙහි හැසිරෙන කල්හි මහා ජනයා තථාගතයන්ගේ දැක්ම ලබන්නේය. එහිදී ඔව්හු සිත් පහදවා ගන්නෝය. සමහරු මාලාදියෙන් පූජා කරන්නෝය. සමහරු බත් හැන්දක් පූජා කරන්නෝය. සමහරු

මිථ්‍යාදෘෂ්ටිය අත්හැර සම්‍යක් දෘෂ්ටිකයෝ වන්නාහ. මෙසේ ලෝවැස්සන් කෙරෙහි අනුකම්පාවෙන් දීර්ඝ කාලයක් හිතසුව පිණිස චාරිකාවෙහි සැරිසරන්නේය.

තව ද භාග්‍යවතුන් වහන්සේ කරුණු හතරක් මුල්කරගෙන චාරිකාවේ හැසිරෙත්. ජංඝා විහාර වශයෙන් ශරීරයේ පහසුව සඳහා අර්ථෝත්පත්ති කාලය කැමති වනු පිණිස, භික්ෂූන්ට ශික්ෂාපද පැණවීම පිණිස, ඒ ඒ තැන්හි සිව්සස් අවබෝධ කිරීමට මුහුකුරා ගිය ඉඳුරන් ඇති අය අවබෝධ කරවනු පිණිස ද, වශයෙනි. මත්තෙහි ද අන්‍ය වූ සතරකාරණයකින් භාග්‍යවතුන් වහන්සේ චාරිකාවෙහි සැරිසරන සේක. බුදුන් සරණ යන්නාහු යයි කියා හෝ දහම් සරණ යන්නාහු යයි කියා හෝ සංඝයා සරණ යන්නාහු යයි කියා හෝ මහත් වූ ධර්ම වර්ෂාවෙන් සිව්වණක් පිරිස සතප්වන්නෙමියි කියා චාරිකාවේ සැරි සරති. අන්‍ය වූ කරුණු පහක් උපයෝගී කරගෙන භාග්‍යවතුන් වහන්සේ චාරිකාවේ සැරි සරති. සතුන් මැරීමෙන්, සොරකම් කිරීමෙන්, පර ස්ත්‍රීන් හා පරපුරුෂ සේවනයෙන් බොරු කීමෙන්, මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීමෙන් වෙන් වන්නාහු යයි කියා හෝ තවත් අන්‍ය වූ කරුණු අටක් නිසාද භාග්‍යවතුන් වහන්සේ චාරිකාවෙහි හැසිරෙන්නෝ වෙති. ප්‍රථමධ්‍යාන, ද්විතීය ධ්‍යාන තෘතීය ධ්‍යාන චතුර්ථ ධ්‍යාන ලබන්නාහු යයි කියා හෝ, ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤානාසඤ්ඤායතන, ලබන්නාහු යයි කියා හෝ, අනික් වූ තවත් අට කරුණක් නිසා භාග්‍යවතුන් වහන්සේ චාරිකාවෙහි හැසිරෙන්නෝ වෙති. සෝවාන්, සකෘදාගාමී, අනාගාමි, අර්හත් මාර්ගවලට හා ඵලයන්ට පැමිණෙන්නාහු යයි යම්කිසි පිරිස් ඇත්නම් ඔවුන් සඳහාය. මේ අතුරිත චාරිකායයි අදහස් කෙරේ. මේ අතුරිත චාරිකාව නිබද්ධ චාරිකා අනිබද්ධ චාරිකා වශයෙන් දෙපරිදි වේ. සිව්සස් අවබෝධයට උපනිශ්‍ර සසම්පත් ඇති එකම පුද්ගලයකු සඳහා යෙත් ද ඒ නිබද්ධ චාරිකාවයි. යම් විධියකින් ගම් නියම්ගම් නුවර පිළිවෙළින් වැඩමවන්නේ අනිබද්ධ චාරිකායි. මේ අනිබද්ධ චාරිකාව මෙහි අදහස් කරන ලද්දේය.

සෙනාසන පටිසාමෙත්වා සෙනස්න සකස්කොට එය වනාහි සකස් කරන්නා වූ තෙරුන් කුඩා පාත්‍ර, විශාල පාත්‍ර, කුඩා තැටි, මහා තැටි, පටසිවුරු, දුහුල් සිවුරු ආදිය පොදියක් කොට ගිතෙල්, තෙල් ආදිය හෝ කළයක පුරවා ගබඩාවක තබා දොර වසා අගුල් යතුරු ආදිය යෙදවීය.

ඉදින් භික්ෂුවක් හෝ සාමණේරයෙක් හෝ ආරාමිකයෙක් හෝ විහාරාධිපතිවරයෙක් හෝ නොවේ ද? ගල් සතරක් උඩ ඇඳක් පිට ඇඳක් නංවා පුටුවක් උඩ පුටුවක් නංවා චීවර වංශයෙහි,

සිවුරු වනන වැළෙහි හෝ මතුයෙහි ගුලිකොට දොර කවුළු වසා නික්ම යා යුතුයයි කී හෙයින් නේවාසික භික්ෂුවගෙන් ඇසීමෙන් පමණක් සකස් කළහ.

යෙන සාවත්ථී තෙන චාරිකං පක්කාමි යනු ශාස්තෘන් වහන්සේ දකිනු කැමැත්තේ වී, සැවැත්නුවර යම් දිසාවකද, එහි ගියේය. එහි යන්නේද සුද්ධෝදන රජුට කියා ගිතෙල්, තල තෙල්, මීපැණි ආදිය ගෙන්වාගෙන නො ගියේය. සමූහය අත්හැර ගියා වූ මතැතෙකු මෙන් ආ විවිධ වැඩකටයුතු ඇති සිංහයෙකු මෙන්, පාසිවුරු ගෙන හුදෙකලාවම ගියේය.

කුමක් හෙයින් මෙතෙම පන්සියයක් අතවැස්සන් සමග රජගහ නුවරට පැමිණ දැන් නික්මුනේද? රජගහනුවර කිඹුල්වත්පුරයෙන් දුර සැට යොදුනකි. සැවැත්නුවර වනාහී පසළොස් යොදුනකි. ශාස්තෘන් වහන්සේ සතලිස්පස් යොදුනක් අවුත් සැවැත්නුවර වාසය කරයි. දැන් ඉතා සමීපයයි අසා නික්මුනේය. මෙය කරුණු රහිතය. බුදුන් හමුවට යන්නා වූ මෙතෙම යොදුන් දහසක් වුවද යන්නේමය. එකල්හි වනාහි කාය විවේකය ලබන්ට නො හැකි වේද? බොහෝ දෙනා සමග යන කල්හි කෙනෙක් 'යමු' යයි කියත්. කෙනෙක් මෙහි ටිකක් සිටිමු'යි කියති. කෙනෙක් සිටිමු'යි කියනවිට කෙනෙක් යමු'යි කියයි. එහෙයින් කැමති කැමති වෙලාවක, සමවත් සම වදින්නට හෝ පහසු සෙනසුනක කාය විවේකය ලබන්නට හෝ නො හැකි වන්නේ ය. තනිවම යනවිට මේ සියල්ල සුලභ වන නිසා එකල්හි තනිවම නික්ම ගියේ ය.

චාරිකං චරමානො යනු මේ සෑම චාරිකාවක්ම මහජනයාට සංග්‍රහ පිණිස බුදුවරුන්ගෙන්ම ලැබේද? එහෙත් බුදුන් ගෙන රෑසී ශබ්දයෙන් ශ්‍රාවකයන් ද කියනු ලැබේ. පැදුරු ආදියෙන් කරන ලද විජිනිපත තල්වැට වන්නාක් මෙනි.

යෙන භගවා යනු සැවැත්නුවර සමීපයෙහි එක් ගමක පිඬු පිණිස

හැසිර, බත්කිස නිමවා, සැරියුත් ස්ථවිරයන් හෝ මුගලන් ස්ථවිරයන් වයන තැනට ගොස් පා දොවා තෙල් ගල්වා යම්කිසි පානයක් බී මදක් ගිමන් හැර ශාස්තෘන් වහන්සේ දකින්නෙමි'යි සිතක් නූපදවා කෙලින්ම ගඳකිළිය වෙතම ගියේය. යම්හෙයකින් ශාස්තෘන් වහන්සේ දකිනු කැමති වූ තෙරුන්ට අන් කිසිවෙකු විසින් කළයුත්තක් නැත. එහෙයින් රහල් තෙරුන් හෝ ආනන්ද තෙරුන් සමග ගොස් ශාස්තෘන් වහන්සේ දකින්නට අවසර ලබාගත යුතු යයි යන සිතක් නො ඉපදවීය. ස්ථවිර තෙමේම බුද්ධශාසනය කෙරෙහි වල්ලභ වූයේ, රජුගේ යුද්ධය දිනූ මහා යෝධයකු මෙන් විය. යම්සේ (රජුගේ යුද්ධය දිනූ) එවැනි සෙන්පතියකුට රජුන් දැකීමට අනුන්ගේ සරණ සෙවීමට අවශ්‍ය නැත. වල්ලභ ස්වභාවය නිසා හුදෙකලාවම රජු දකී. මෙසේ තෙරුන් වහන්සේ ද බුදු සසුනෙහි වල්ලභ වූ බැවින්, එවැන්නකුට ශාස්තෘන් වහන්සේ දකින්නට අනෙක් කෙනෙකු සෙවීමේ කෘත්‍යයක් නැතැයි පා සෝදා පාපිස්නෙහි පා පිස,

යෙන භගවා තෙනුපසංකමි යනු භාග්‍යවතුන් වහන්සේ ද මන්ත්‍රානිපුත්‍ර නිසස ස්ථවිරයන් වඩින්නේ යැයි අලුයම් කාලයේ ම දුටු සේක. එහෙයින් ගඳකිළියට පිවිස දොරඅගුලු නොදීම වෙහෙස සන්සිඳුවා ගෙන නැගිට සිටියේය. තෙරුන් වහන්සේ දොර හැර කිළියට පිවිස භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව සිටියේය.

ධම්මියා කථායා යනු භාග්‍යවතුන් වහන්සේ ධාර්මික කථා කථා කරන්නේ චුල්ල ගොසිංග සූත්‍රයෙහි එන කුලපුත්‍රයන් තිදෙනාට සමගිය පිළිබඳ ආනිසංස වදාළහ. සේඛ සූත්‍රයෙහි ආවාස ආනිසංශය ද, සටීකාර සූත්‍රයෙහි සිහිය පිහිටුවා ගැනීම පිළිබඳව වූ පූර්වේනිවාසය පිළිබඳ කථාවද, රට්ඨපාල සූත්‍රයෙහි සතරවිධ ධර්මෝපදේසද, සේල සූත්‍රයෙහි පැන් දීමේ අනුසස් ද, කිලේසීය සූත්‍රයෙහි භගු ස්ථවිරයන් දහම්කථා පවත්වන්නේ එකඟ බැව්හී අනුසස් ද කීයේ ය. මේ රථවිනීත සූත්‍රයෙහි වනාහි ආයුෂ්මත් පුණ්ණ තෙරුන්ට වදාරන්නේ දසකථා වස්තු ආශ්‍රයකොට ඇති අනන්ත නය දැක්වීය. පුණ්ණ, මේ ද අල්පේච්ඡ කථාමය. සන්තෝෂ කථාමය. පටිසම්භිදාවන්ට පත් වූ ශ්‍රාවකයා හට වෙරළෙහි සිට මහා සමුද්‍රය අත දිගුකර පෙන්වන්නාක් මෙන් වූයේය.

යෙනඤ්ඤවනං යනු එකල්හි වනාහි බතින් පසුව ජේතවනය ආකීර්ණ වෙයි. බොහෝ ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීහූ ජේතවනයට රැස් වෙති. සක්විති

රජකුගේ කඳවුර පිහිටි තැන මෙන් වෙයි. උතුම් වූ විවේකය ලබන්නට නොහැකි වෙයි. අන්ධවනය වනාහි ප්‍රධන් ඝරයක් මෙන් විවේක ඇත්තේය. එහෙයින් අන්ධවනය වෙත එළඹියේය. කවර හෙයකින් මහතෙරවරුන් නො පෙනේද? ඔහුට මෙසේ සිතුණේල. සවස් යාමයෙහි අවුත් මහතෙරුන් දැක නැවත බුදුන් දකින්නෙමි. මෙසේ මහතෙරවරුන්ට එක උපස්ථානයක් වන්නේය. ශාස්තෘන් වහන්සේට උපස්ථාන දෙකක් වන්නේය. ශාස්තෘන් වහන්සේ වැඳ එයින් පසු මගේ වසන තැනට යන්නෙමි.

අභිණ්හං කිතතයමා නො අහොසි යනු නැවත නැවත ගුණ සිහි කරමින් වර්ණනා කරමින් වාසය කළේය. ස්ථවිරයන් වහන්සේ වනාහි එතැන් පටන් දිනපතා සංඝයා මැද මනතානිපුතත නම් වූ පුණණ ස්ථවිරයන් වහන්සේ සිව් පිරිස සමග එකතුවීමක් පයිරුපාසනයක් නැත්තේය. හෙතෙම දශබලධාරීන් වහන්සේ දැකීමට එන්නේය. කෙසේ නමුත් මා නො දැකම යන්නේ යයි, ස්ථවිර, නවක මධ්‍යම භික්ෂූන්ට සිහිකිරීම පිණිස ආයුෂ්මත් පුණ්ණ තෙරුන්ගේ ගුණ වර්ණනා කරයි. මෙසේ සිතුණේල. මහළු භික්ෂූන් නම් හැමකල්හිම ඇතුළු විහාරයේ නො සිටිති. (එහෙත්) ගුණකථාව කරන කල්හී, යම්කිසි කෙනෙක් ඔහු දකීද? හෙතෙම අවුත් මට කියාවා, ඉක්බිති තෙරුන්ගේම සද්ධිවිහාරික තෙම ඒ ආයුෂ්මතුන් පාසිවුරු ගෙන ගඳකිළියට ඇතුල්වෙනු දුටුවේය. කෙසේනම් ඔහු එය දැනගත්තේද? පුණ්ණ පුණ්ණ යයි කියන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම කථාවෙන් දැනගත්තේ ය. මාගේ උපාධ්‍යායන් වහන්සේ යම් කෙනෙකුගේ ගුණ නිතර නිතර කියන්නේ ද මේ ඒ ස්ථවිරයෝය. මෙසේ ඔහු පැමිණ තෙරුන්ට දැන්වීය.

නිසීදනං ආදායා යනු නිසීදනය නම් දාවලු සහිත චීවරයයි. ස්ථවිරයන් වහන්සේ වනාහී සම්කඩ ගෙන ගියේය. **පිටඨිතො පිටඨිතො පිටිපසින් පිටිපසින් සීසානු ලොකිති** යමෙක් උස්තැනෙක්හි දී පිට දකින්නේ ද, මිටි තැනකදී හිස දකින්නේ ද එසේ යන්නේ ද එය සීසානුලෝකයයි කියනු ලැබේ. ඒ අනුව ලුහුබැන්දේය. තෙරුන් වහන්සේද සංවර වූ පා ශබ්දය ඇති බැවින් ඉතා ආසන්නවට ගියේ නමුත් පා ශබ්දයෙන් බාධාවක් නො වීය. එහෙත් මේ කථා කිරීමට සුදුසු කාලය නොවේයයි දැන ඉතා සමීප නො වූයේය. අන්ධවනය ඉතා විශාලය. එක් තැනක රුක්ගොමු ආදියට වැසී සැඟවී යාමෙන් නො දක්නේ

'ඇවැත්නි, පුණ්ණ'යයි අපහසු ශබ්දයක් කළයුතු වේයැ'යි හුන් තැන දැනගැනීම සඳහා ඉතා නුදුරු තැනක සිසානුලෝකීව ගියේය.

දිවා විහාරං නිසීදති යනු දිවා විහරණය සඳහා හුන්නේය.. එහි දී ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරයෝ ද සැරියුත් තෙරණුවෝ ද, උසස් වූ බ්‍රාහ්මණ වංශිකයෝ වූහ. පුණ්ණ තෙරුන් ද සැරියුත් තෙරුන් ද, රන්වන් වූහ. පුණ්ණ තෙරුන් ද සැරියුත් තෙරුන් ද අර්හත්ඵල සමාපත්තියට සමවැදුණෝ වූහ. පුණ්ණ තෙරුන් කල්ප ලක්ෂයක් සම්පූර්ණ කරන ලද (අභිනීහාර) පාරමී දහම් ඇත්තේය. සැරියුත් තෙරුන් කල්ප ලක්ෂයක් අධික කොට ඇති ඒකාසංඛ්‍යයක් පිරූ පාරමීදම් ඇත්තේය. එක රන් ගුහාවකට පැමිණි සිංහයන් දෙදෙනෙකු සේ ද, එක් ඇඟ කිළිපොළන භූමියකට බැසගත් ව්‍යාඝ්‍රයන් දෙදෙනෙකු සේ ද, මල් පිපුණු එක සල් වනයකට පිවිසි ඡද්දන්ත කුලයේ ඇත් රජුන් දෙදෙනෙකු මෙන් ද, එක් සිම්බලී හිඹුල් වනයකට පිවිසි ගුරුළු රජුන් දෙදෙනෙකු මෙන් ද, එකම මිනිස් යානයකට පැමිණි වෛශ්‍රවණයන් දෙදෙනෙකු මෙන් ද, එකම විමානයකට ඇතුල් වූ භාරිත මහා බ්‍රහ්මයන් දෙදෙනෙකු මෙන් ද, දෙදෙනම බ්‍රාහ්මණ ජාති ඇති, දෙදෙනම රන්වන් වූ දෙදෙනම සමාපත්තිලාභී වූ, දෙදෙන පාරමී පිරුවා වූ දෙදෙනම පටිසම්භිදා පත් වූ, මහා ක්ෂීණාශ්‍රවයෝ එක වනලැහැබකට පැමිණ ඒ වනලැහැබ ශෝභා සම්පන්න කළාහු වෙති.

භගවති නො ආවුසො බ්‍රහමචරියං වුසසති යනු ඇවැත්නි, අපගේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි ආයුෂ්මතුන් වහන්සේ බඹසර විසූයේද? මෙය ආයුෂ්මත් සැරියුත් තෙරුන්වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි ඔහුගේ බඹසර විසීම දන්නා නමුත් කථාවක් ආරම්භ කිරීම සඳහා විචාළේය. පළමුව කථා නොකොට පසුව කථාවක් නූපදීද, එහෙයින් මෙසේ විචාළේය. තෙරුන්වහන්සේ පිළිතුරු දෙන්නේ ආයුෂ්මතුනි, එසේයයි කීය. ඉක්බිතිව ප්‍රශ්න විසඳීම් අසනු කැමතිව, ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේ **කිනනු ඛො ආවුසො සීල විසුදතථං භගවති බ්‍රහමචරියං වුසසති** පිළිවෙළින් සප්ත විසුද්ධීන් විචාළේය. ඒ පිළිබඳ විසිතුරු කථාව විශුද්ධි මාර්ගයේ කියන ලදී. ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරයෝ, යම්හෙයකින් සිව් පිරිසිදු සිල්හි පිහිටියේ වුවත්, බ්‍රහ්මචරිය වාසය සම්පූර්ණත්වයට නො පැමිණියේය. එහෙයින් **නො හිදං ආවුසො** යනුවෙන් සියල්ල ප්‍රතික්ෂේප කළේය.

කිමත්ථං වර ආවුසො යනු ඉදින් ශීල විශුද්ධි ආදීන් සඳහා බ්‍රහ්ම චරියාවෙහි නො වෙසේද? එසේ නම් කුමක් සඳහා වෙසේදැයි විචාළේය. **අනුපාදා පරිනිබ්බාණත්ථං ඛො ආවුසො** යනු මෙහි අනුපාදා පරිනිබ්බාණය නම් අප්‍රත්‍ය පරිනිබ්බාණයයි. උපාදානයෝ දෙදෙනෙක්ම වෙති. ග්‍රහණොපාදානය, (දැඩි සේ ගැනීම) හා ප්‍රත්‍යයොපාදානය (ප්‍රත්‍ය දැඩිව ගැනීම) යනු එම දෙකයි. ග්‍රහණොපාදානය - කාම උපාදාන ආදී වශයෙන් සතරවැදෑරුම් වේ. (කාම-දිට්ඨි-සීලබ්බත-අත්තවාද) ප්‍රත්‍යයොපාදානය නම් අවිජ්ජා පච්චයා සංඛ්‍යාත (අවිද්‍යාව හේතුවෙන් සංස්කාරයෝ හටගනී) ආදී වශයෙන් දැක්වූ ප්‍රත්‍යයෝයි. එහි ග්‍රහණොපාදානය කියන ආචාර්යවරයෝ **අනුපාදාන පරිනිබ්බානනති** සතර උපාදානයන්ගෙන් එක්තරා එකකිනුදු කිසි ධර්මයක් නොගෙන පවත්නා වූ අර්හත් ඵලය අනුපාද පරිනිර්වාණයයි කියත්. එය වනාහි උපාදානයන් හා සම්ප්‍රයුක්තවද කිසි ධර්මයක් දැඩිකොට නො ගනී. ක්ලේශයන්ගේ පිරිනිවීම අවසානයේ උපන් බැවින් පරිනිබ්බාණ යනු වේ. ප්‍රත්‍යයොපදානය ප්‍රකාශ කරන් ඇදුරො අනුපාදා පරිනිබ්බාණය යනු ප්‍රත්‍ය රහිත පරිනිර්වාණය වූ ප්‍රත්‍ය වශයෙන් නූපන් අසංඛත වූ අමෘත ධාතුවම 'අනුපාදා පරිනිබ්බානය' යයි කියත්. මෙය අන්තයයි. මෙය කෙළවරයි. යම්හෙයකින් අප්‍රත්‍ය පරිනිර්වාණයට පැමිණියහුගේ බඹසර විසීම මුදුන් පැමිණියා නම් වේ. එහෙයින් ස්ථවිරයෝ **අනුපාදා පරිනිබ්බානත්ථං** ආදිය කීයේය.

ඉක්බිති ඔහු වෙනත් පැනයකට යොමු කරන්නා වූ ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේ **කිනනු ඛො ආවුසො සීල විසුදධි අනුපුබ්බානනති** ආදී වශයෙන් නැවත සාකච්ඡාව ආරම්භ කළහ. ස්ථවිර තෙමේ ද සියලු පරිවර්තනයන්හි එසේම ප්‍රතික්ෂේප කොට අවසානයෙහි දොස් දක්වන්නාහු, **සීල විසුදධිඤ්ඤෙව ආවුසො** යනාදිය කීහ. එහි **පඤ්ඤා පෙසස** ඉදින් පනවන්නේ නම්, **ස උපාදානං යෙව සමානං අනුපාදා පරිනිබ්බානං, පඤ්ඤාපෙසස** ග්‍රහණ සහිත වූ ධර්මයෙක් ද, ග්‍රහණ රහිත වූ ධර්මයෙක ද ප්‍රත්‍ය සහිත වූ ධර්මයක් ද අප්‍රත්‍ය වූ ධර්මයක් ද, සංඛත ධර්මයක් ද අසංඛත ධර්මයක් ද පනවන්නේ ය යන අර්ථය ගතයුතුයි. **පුථුජජනො භාවුසො** යනු මෙහි සංසාරගත වූ බාල ලෞකික පෘතග්ජනයෝම දතයුතුයි. හෙතෙමේ සිව්පිරිසිදු සිල් පමණකුදු නැති හෙයින් සියලු අන්දමින්ම මේ ධර්මයන්ගෙන් වෙන්වූයේ වෙයි.

තෙන හි යම් කාරණයකින් ඇතැම් පණ්ඩිතයෝ උපමාවෙන්

අර්ථය දැන ගනිත් ද, ඒ කාරණයෙන් උපමා තෙ කරිසසාමි උපමාවක් කියන්නෙම් යන අර්ථයි. සත්ත රථ විනීතානි යනු හික්මුණු අසුන් යෙදූ රථ සතකි. යාවදෙව චිත්ත විසුද්ධත්තා යනු ඇවැත්නි, මේ සීල විශුද්ධිය නම් යම්තාක් චිත්ත විශුද්ධි සංඛ්‍යාත වේ යනු අර්ථයි. චිත්ත විසුද්ධත්ථා යනු අවධි වචනයි. මෙය වනාහි මෙහි අර්ථයයි. යම්තාක් චිත්ත විසුද්ධි සංඛ්‍යාත අර්ථය වේද, ඒ තාක් සීල විශුද්ධිය කැමති විය යුත්තේය. මේ යමක් චිත්ත විශුද්ධිය වේද, එයම සීල විශුද්ධිය වේ යන අර්ථයි. මේ කෙළවරය. මේ අවසානයය. චිත්ත විශුද්ධියෙහි සිටියහුම සීල විසුද්ධි කෘත්‍යය කරන ලද්දේ ද එහෙයිනි. මෙසේ අනෙක් සියළු පදයන්හි ද අර්ථ ගතයුතුයි.

මේ දක්වනු ලබන්නේ එහි උපමා සන්සන්දනයයි. පසේනදී කෝසල රජු මෙන් ජරා-මරණ දෙකින් බියපත් වූ, යෝගාවචර තෙමේ දතයුතුයි. සැවැත්නුවර මෙන් සත්කාය නමැති නගරය ය. සාකේත නුවර මෙන් නිර්වාණ නගරයය. රජුගේ සාකේත නගරයෙහි වෘද්ධි එළවන්නා වූ, වහා ගොස් පැමිණිය යුතු වූ අත්‍යවශ්‍ය කාර්යයක් උපන් කාලය මෙන්, යෝගියාගේ අභිසමය නො කළා වූ චතුරාර්ය සත්‍යයන්ගේ අභිසමය කිස උපන් කාලයයි. අසුන් යෙදූ රිය සත මෙන් සප්ත විසුද්ධීහුය. පළමුවන රථයට නැගි කල්හි මෙන් සීල විසුද්ධියේ සිටි කාලයයි. පළමුවන රථ විනීතාදියෙන් දෙවෙනි රථවලට නැගි කාලය මෙන් සීල විසුද්ධි චිත්ත විසුද්ධීන්හි සිටි කාලයයි. සත්වැනි රථ විනීතයෙන් සාකේතයේ අන්තඃපුර දොරටුවෙහි බැස ප්‍රාසාද තලයෙහි (මතු මහලෙහි) නෑ මිතුරු සමූහයා පිරිවරාගෙන, මිහිර රස බොජුන් වළඳන කල මෙන්, යෝගීන්ගේ ඤාණ දර්ශන විසුද්ධියෙන් සියලු කෙලෙසුන් නසා, උතුම් ධර්මය නමැති ප්‍රාසාදයට නැගී පණහක් කුසල් දහම් පිරිවරාකොට ඇතිව, නිවන අරමුණු කොට ඵල සමාපත්තියට පැමිණ, නිරෝධ නමැති ශයනයෙහි හුන්නහුගේ ලොව්තුරු සුවය විඳින කාලය දතයුතු.

මෙසේ ධර්ම සේනාධිපති වූ සැරියුත් මහ ස්ථවිරයන් වහන්සේ දස කථාවස්තුලාභී වූ පුණ්ණ තෙරුන් ගෙන් සප්ත විසුද්ධීන් විචාළාහ. ආයුෂ්මත් පුණ්ණ තෙරුන් වහන්සේ දසකථා වස්තූන් විසඳූහ. මෙසේ විචාරන්නා වූ ධර්ම සේනාපතීන් වහන්සේ දැනගෙන විමසුවේද? නැතිනම් නොදැන විමසුවේද? නැවත තීර්ථ කුසලවැ හෝ විෂයෙහි විමසුවෝද, නැතිනම් තීර්ථ කුසල නොවී අවිෂයයෙහි විසඳුවෝද, යම්හෙයකින් දැන

තීර්ථ කුශලව විෂයෙහි විසඳුවෝද, නැතිනම් තීර්ථ කුශල නොව අවිශයෙහි විසඳුවෝද, යම්හෙයකින් දැන තීර්ථ කුශලව විෂයෙහි විචාරති. දම් සෙනෙවියන්ට කියන්නේද, දැන තීර්ථ කුශලව විෂයෙහි විසඳතියි පුණ්ණ තෙරුන්ට කියන්නේද, යමක් කථා වස්තූන්හි කෙටියෙන් කියා විශුද්ධීන්හි විස්තර දක්වන්නේ ද, යමක් විශුද්ධීන්හී දි කෙටියෙන් කියා කථා වස්තූන්හි විස්තර දක්වන්නේ ද, මේ ක්‍රමයෙන් දත යුතුය.

විශුද්ධීන් අතරෙහි, එක් ශීල විශුද්ධිය කථා වස්තූන්හි සතරක්ව ආයේ ය. අල්පේච්ඡ කථාය, සන්තුට්ඨි කථාය, අසංසගග කථාය, සීල කථාය යනුවෙනි. එක් චිත්ත විශුද්ධිය තුන් වස්තුවක්ව ආයේය. පවිවේක කථා, විරියාරම්භ කථා, සමාධි කථා. මෙසේ යමක විශුද්ධීන්හි කෙටියෙන්ද කථා වස්තූන්හි විස්තර වශයෙන් ද දක්වා ඇත්තේ ය. කථා වස්තුවෙහි එක් ප්‍රඥා කථාව විශුද්ධි පහක් වශයෙන් සවිස්තරව ආයේය. දිට්ඨි විශුද්ධි, කංඛාවිතරණ විසුද්ධි, මගගාමගග ඤාණදසසන විසුද්ධි, පටිපදාඤාණ දස්සන විසුද්ධි, ඤාණදස්සන විසුද්ධි වශයෙනි. මෙසේ යමක් කථාවස්තුවෙහි සංක්ෂිප්තද, එය විසුද්ධියේ දී සවිස්තරව දැක්වෙයි. එහෙයින් සැරියුත් තෙරණුවෝ සප්ත විසුද්ධි විචාරන්නේඅනෙකක් නො විචාළාහුය. දශකථා වස්තූන්ම විචාළහ. පුණ්ණ ස්ථවිරයෝ ද සප්ත විසුද්ධීන් විසඳන්නේ අනෙකක් නො විසඳූහ. දශකථා වස්තූන්ම විසඳූහ. මෙසේ උන්වහන්සේලා දෙදෙනම දැන එතෙරවීමෙහි සමත් වූවෝම අදාළ කාරණයම විසඳූහ. විසඳුවාහ'යි දතයුතු.

කො නාමා ආයසමා යනු තෙරුන් වහන්සේ ඔහුගේ නම නො දන්නේම නොවේ. නැවත දැනගැනීමෙන් සතුටක් විඳින්නෙමි'යි යන අදහසින් විචාළහ. **කථඤ්චවපන ආයසමනතං** යනු මෙය ස්ථවිරයන් වහන්සේ සතුටුවෙමින් කීහ. **මනතානි පුතෙතා** යනු මන්තාණි නම් බැමිණියගේ පුතාය. **යථා තං** යන මෙහි තං යනු නිපාතයක් පමණි. ඇසූ පිරූ තැන් ඇති ශ්‍රාවකයෙකු විසින් යම්සේ ප්‍රකාශ කළයුතු ද එපරිද්දෙන් ප්‍රකාශ කරන ලදී යනු මෙහි කෙටි අර්ථයයි. **අනුමාසස අනුමාසසා** යනු දසකථා වස්තූන්ට බැස ඊට පිවිස, **වෙලණඩුකෙන** යනු මෙහි වෙලං යනු වස්ත්‍රයයි. අණඩුක නම් සුඹුලය. වත්සුඹුලක් හිසෙහි රඳවා ආයුෂ්මතුන් එහි හිඳුවා පරිහරණය කරන්නා වූ ද, ඉදින් සබ්‍රහ්මචාරීහූ මෙය දකින්නට ලබන්නාහු නම්, ඒ දැකීම ඔවුන්ට යහපත පිණිසම වේ යයි අස්ථාන පරිකල්පනයෙන් නිරතුරුවම දැකීමට උපාය යෙදූහ. යම්හෙයකින් මෙසේ

පරිහරණය නො කරන්නා වූ, ප්‍රශ්න විචාරනු කැමැත්තහු විසින් හෝ බණ අසනු කැමැත්තහු විසින් හෝ තෙරුන්වහන්සේ කොහේ සිටියේද, කොහේ හෝන්ද, විමසමින් හැසිරිය යුතු වේද, ඉක්බිති මෙසේ පරිහරණය කරන්නහු විසින් කැමති කැමති වේලාවක හිසෙන් බස්වා, උතුම් ආසනයක වඩා හිඳුවා, ප්‍රශ්න විමසන්නට හෝ බණ අසන්නට හැකිවේද, එහෙයින් අස්ථාන පරිකල්පනයෙන් නිරතුරු දැකීමට උපාය යෙදූහ.

සාරිපුත්තෙනා ච පන මනති යනු සාරීනම් බැමිණියගේ පුත්‍ර තෙමේද මෙසේ ම සබ්‍රහ්මචාරීහූ දනිති. **සත්ථුකප්පෙන** යනු ශාස්තෘන් සමානවම මෙසේ තනි පදයකින්ම ආයුෂ්මත් පුණ්ණ තෙර සැරියුත් තෙරුන් සඳමඬලෙහි නගා තබන්නෙකු මෙන් එසවීය. යම්හෙයකින් මෙතැන්හී තෙරුන්ගේ (ඒකාන්ත) අසමසම ධර්මකථික භාවය ප්‍රකට වූයේ ද එහෙයිනි. ඇමතියෙකු ශ්‍රේෂ්ඨයයි කියන්නේ රජු හා සමානයයි කියන්නේ ද? ගොනෙකු ඇතෙකු හා සමාන යයි කියන්නේ ද, වැවක් සමුද්‍රය තරම් යයි කියන්නේ ද, ආලෝකය සඳ හිරු පෑයුවා හා සමානයයි කියන්නේද? මෙයින් මත්තෙහි මුන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ කථාවක් නැත්තේ ම ය. ශ්‍රාවකයකුගේ ශ්‍රේෂ්ඨ බව කියන්නේ ශාස්තෘන් සමානයයි කියන්නේ ය.

එතනකමපි නො නප්පටිභාසෙය්‍ය යනු පටිසම්භිදාලාභියෙකුට නො වැටහීමක් නම් නැත. යම් උපමාවක් ඉදිරිපත් කළේද? එය ගෙනහැර නො දක්වන්නෙමු. අර්ථයම කියන්නෙමු. උපමාව නො දන්නන්ට නො වැටහේද, එහෙයිනි. අටුවාව මෙය ප්‍රතික්ෂේප කොට උපමා නම් බුදුන් සමීපයේදීම ගෙන දැක්විය යුතුයයි, තෙරුන්ට ගරු බුහුමන්, පිදීම් කරන්නේම මෙසේ කීය.

අනුමාසස අනුමාසස පුච්ඡිතානි යනු දස කථාවස්තූන්ට බැස විචාරණ ලද්දාහු, කිමෙක්ද ප්‍රශ්න විචාරීම බරෙක්ද? නැතිනම් විසඳීම අපහසුතාවයක්ද? උගෙන විචාරීම්. නො පුළුවන. එහෙත් විසඳීම් බරක් වේ. හේතු සහිතව කරුණු සහිතව විචාරීම බැරෑරුම් ම ය. **සමනුමොදිංසු** යනු සමාන සිත් ඇත්තේම අනුමෝදන් වූහ. මෙසේ අනුසන්ධි වූ පරිද්දෙන් දේශනාව නිමවීය.

රථවිනීත සූත්‍ර වර්ණනාව නිමියේය.

1-3-5

එවමෙමසුතං යනු නිවාප සූත්‍රයයි. එහි **නෙවාපිකො** යනු යමෙක් මුවන් ඇල්ලීම පිණිස, මේ තණ කන්නට එන මුවන් පහසුවෙන් අල්ලා ගන්නෙමි යයි කැලෑවෙහි තණ බිජුවට වපුරාද? **නිවාපං** යනු තණකොලය **නිවුතතං** යනු වපුරන ලද, **මිගජාතා** යනු මුව සමූහයා, **අනුපඛජ්ජා** යනු ඇතුළතට පිවිස, **මුචඡිතා** යනු තෘෂ්ණාවෙන් මුසපත් වූවාහු, **මුචඡිතා** තෘෂ්ණාව හදවතට· ඇතුල් වී (මූර්ඡා) මුසපත් වූ ආකාරයට පමුණුවන ලද්දාහු, **මදං ආපජ්ජිසසනති** යනු මාන මදයට පැමිණෙන්නාහුය. **පමාදනති** යනු විසුරුණා වූ සිත් ඇති බවට, **යථා කාම කරණීයා භවිසසනති** යනු යමක් කැමති වන්නෙම්ද එය එසේ කටයුතු වන්නේ ය. **ඉමසමිං නිවාපෙ** යනු මේ තෘණ වැපිරූ තන්හි.

එක් නිවාප තණ වර්ගයක් නම් ඇත. එය යම් යම් සේ නියඟය ඒද ඒ ඒ පරිද්දෙන් හූරුහැල් වනයක් මෙන් ද, මේඝමාලාවක් මෙන් ද, එකට ගුටි වෙයි. වැද්දෝ එය එක් දිය පහසුකම් ඇති තැනක කැස (හා) වපුරා වැටක් බැඳ දොරක් දමා ආරක්ෂා කරත්. අනතුරුව යම් මහා නියඟයක් පැමිණි කල්හි සියලු තණකොළ වියලී ගියේද, දිව තෙමන පමණකුත් ජලය නැති වූයේ ද, එකල්හි මුව සමූහයෝ වියලි තණ ද, පරඬැල් ද කමින් වෙවුලමින් මෙන් හැසිරෙන කල්හි, නිවාප තෘණයාගේ සුවඳ ආඝ්‍රාණය කොට වධ බන්ධනාදිය නො සලකා වැට කඩමින් ඇතුල් වෙති. ඔවුන්ට නිවාප තණ අතිශයින් ප්‍රියමනාප වන බැවිනි. නෙවාපික තෙපීමේ (අයිතිකරුවන්) එය දැක දෙතුන් දිනක් ප්‍රමාද ද ඇත. මුවේ විවරකළ දොරෙන් ඇතුල් වී හැකිතරම් කා දිය බී පැනයති. දෙවන දවසෙහි කිසිවක් සිදු නොවේ. කන් සලමින් කා දිය බී නො වෙවුලන ගතියෙන් යෙති. ඊළඟ දවසේ කිසිවක් කිරීමට කිසිවෙක් නැතැයි යැපෙන තාක් කා වතුර බී සෙවන තැනකට වී නිදති. ඔවුන්ගේ ප්‍රමාද බව දුටු වැද්දෝ දොර වසා පිරිවර සමගින් වටකොට, කෙළවරක සිට කොට කොට යති. මෙසේ ඔවුන් ඒ නිවාපස්ථානයේ නේවාසිකයා විසින් කැමති පරිද්දෙන් තමන්ගේ කටයුතු කරත්.

තත්‍ර භික්ඛවෙ මහණෙනි! ඒ මෘග සමූහයන් කෙරෙහි **පඨමා මිගජාතා** මෘග සමූහයෝ පළමුවෙනි දෙවෙනි කියා නැත. එහෙත්

භාග්‍යවතුන් වහන්සේ පැමිණ පිළිවෙළින් පළමුවෙනි දෙවෙනි තෙවැනි සිව්වෙනි වශයෙන් නම් කොට දැක්වීය. **ඉද්ධානු භාවා** යනු කැමති පරිද්දෙන් කළයුතු බැවින්, මෙහි වසඟ බවම ඉද්ධි යයි ද ආනුභාවයයිද අදහස් කළහ. **භයභොගා** බියෙන් කළයුතු පරිභෝගයෙන්, **බලවිරියං** යනු ඔබිනොබ හැසිරෙන වායෝ ධාතුව **පරිහායි** පිරිහුනේය යන අර්ථයි. **උපනිසසාය ආසයං කපෙපයාාම** යනු ඇතුළතට වැදී කන්නවුනට බයම වෙයි. පිටතින් අවුත් කන්නවුන්ටද භයම වෙයි. අපි වනාහි මේ නිවාපන ස්ථානය ඇසුරු කොට එක පැත්තක (පිටත) වාසය කරන්නේ නම් ඉතා හොඳයයි සිතුවෙමු. **උපනිසසාය ආසයං කපපයිංසු** වැද්දෝ වූ කලී හැමදාම ප්‍රමාද වන්නේ නොවෙති. අපි තැන් තැන්වල සෙවණ ඇති තැන්වල ලැහැබ්වල, වැට අයිනේ එක්පසෙක සිටින්නෙමු. වැද්දන් කෑමට හෝ මුව දෙවීමට හෝ පිටත ගියකල්හි නිවාප වත්තට පැන කෑ පමණක් බිව් පමණක් කොට අප වසන තැන්වලටම පිවිසෙන්නෙමු යයි නිවාප වත්ත ඇසුරුකොට වනයෙහි ගස් මුල් සෙවණ තැන්, පඳුරු තුළ ආදියෙහි විසූහ. **භුඤජිංසු** යට කී ආකාරයෙන් වැද්දන්ගේ ප්‍රමාද කාලය දැක වහ වහා පිවිස තණ කෑවාහු වෙති.

කෙටුහීනො යනු හික්මුණු කෙරාටිකයෝ **ඉද්ධිමනතා** යන ඍද්ධි ඇත්තවුන් මෙන්, **පරජනා** යක්ෂයෝ, මොවුන් මෘග සමූහයෝ නො වෙති. **ආගතිංවා ගතිංවා** යනු මෙතැනින් එති. අසවල් තැනින් යති. මේ කිසිවක් නො දන්නමෝ වෙමු. **දණඩවාකරාහි** යනු දඬුවර දැල්වලින් **සමනතා සපපදෙසං අනුපරිවාරෙසු** යනු මොව්හූ මායා ඇත්තෝය. ඉතා දුර නොයත්. කිට්ටුව ම සිටින්නාහු වෙති. නිවාප ක්ෂේත්‍රය හාත්පස මහත් වූ අවසරය පිරිවැරුවාහු වෙති. **අඳසාසුං** මෙසේ වටකොට හාත්පස දැල් එලා වටකොට බලන්නාහු දුටුවාහුය යන අර්ථයි. යම් තැනකට ඔවුහු ගියාහුද, එතැන දුටුවාහුය.

යනනූන මයං තතථ අගතීති ඔව්හූ වනාහි මෙසේ සිතූහ. ඇතුළත හෙව ඇතුළත කන්නවුන්ට ද බිය වේ. පිටතින් ඇවිත් කන්නවුන්ට ද, සමීපයේ ජීවත්ව කන්නවුන්ට ද බියම උපදී. යම්හෙයකින් ඔවුන්ද වරදැලින් වටකොට ගනිත්ද ඒ නිසාම ඔවුන්ට මෙසේ සිතිණ. අපි යම්හෙයකින් නේවාපිකයාට ද, නේවාපික පිරිසට ද සුදුසු නො වේද, විෂය නො වේද, අරමුණු නොවේද, එබඳු තැනෙක්හි වාසය කරන්නෙමු නම් එය ඉතා මැනවි. **අඤඤෙ සංටෙසසනති** එහෙයින් එයින් ඉතා දුර වසන්නා වූ

අන්‍යයෝ ද පැමිණ ගැටෙන්නාහ. **තෙ සටිතා අඤ්ඤෙ** ඔවුහු ද ගැටෙන්නාහු එයින් ඉතා දුර වසන්නා වූ අන්‍යයන් සමග ගැටෙන්නාහ. **එවං ඉමං නිවාපං නිවුත්තං සබ්බසො මිගජාතා රිඤ්චිසසන්ති** යනු මෙසේ අප විසින් වපුරන ලද නිවාපය සියලු මුවන් විසින්, මුව සමූහයා විසින් අත්හරින්නාහ. දුරු කරන්නාහ. **අජ්ඣුපෙක්ඛයාමා** ඔවුන් ගැනීමට අපි අපොහොසත් වෙමු. දුරු කරන්නෙමු. යම් සේ එසේ එන්නා වූ තරුණ මුවකු හෝ පැටියෙකු හෝ මහල්ලෙක් හෝ දුබලයෙක් හෝ රැලින් වෙන් වූ කෙනෙක් හෝ ලබන්නට හැකි වන්නේය. නො එන කල්හි මේ කිසිත් නැත්තේය. **අජ්ඣුපෙක්ඛිංසු ඛො භික්ඛවෙ** යනු මෙසේ සිතා උත්සාහ නො කරන්නෝ වූහ.

අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනිව ලොකොමිසාති මෙහි සංසාරයේ ආමිෂ වූ පස්කම් ගුණයන්ට මේ නමකි. මාර තෙමේ බීජයන් මෙන් පස්කම් ගුණ වපුරමින් නො ඇවිදියි. එහෙත් කාමගුණයන් පිළිබඳව ගිජු වූවන්ගේ මත්තෙහි ආධිපත්‍යය පවත්වයි. එහෙයින් කාම ගුණය මාරයාගේ නිවාපයයි. එහෙයින් කියන ලදී. **අමුං නිවාපං නිවුත්තං මාරස්සාති න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවාති** යනු මාරයාගේ වසඟයට ගියාහු වූවෝය. ඔවුහූ යම්සේ කැමැත්තේ ද එසේ කටයුතු කළහ. මේ දූපුත් අඹුදරුවන් සහිත ප්‍රව්‍රජ්‍යාවට දක්වන ලද උපමාවයි.

වෙතො විමුත්ති පරිහායි මෙහි **වෙතො විමුත්ති** නම් ආරණ්‍යගතව වසන්නෙමි යයි උපන් අදහසයි. එය පිරිහී ගියේය යන අර්ථයි. **තථූපමෙ අයං භික්ඛවෙ ඉමෙ දුත්තියොති** යනු මේ බ්‍රාහ්මණ ධර්ම ප්‍රව්‍රජ්‍යාවට උපමාවයි. බ්‍රාහ්මණයෝ වනාහි අටසාළිස් වසක් කුමර බඹසරෙහි හැසිර, පරම්පරාව සිඳීමේ බියෙන් පරපුර ගළපන්නෙමැයි ධනය සොයා, බිරිඳක් ගෙන ගෘහවාසයෙහි වැස එක් පුතෙකු වැදූ කල්හි, අපගේ සමීපයට පැමිණ, සසර බිය නොසිඳිනා ලදය. ප්‍රවේණිය ගලපන ලදයැයි නැවත නික්ම පැවිදි වෙයි. එහිම සකලත්‍රවාසයෙහි හෝ යෙදෙත්. **එවංහි තෙ භික්ඛවෙ තතියා සමණ බ්‍රාහමණ න පරිමුච්චිංසු** යනු පෙර අය මෙන් ඔව්හු ද මාරයාගේ අධිපතිභාවයෙන් නො මිදුණහ. කැමති සේ කටයුතු කරන්නෝ ම වූහ. නැවත ඔව්හූ කුමක් කළෝ ද, ගම් නියම්ගම් රාජධානිවල හැසිරෙමින්, ඒ ඒ ඔවුන්ගේ ආරාම උයන් පිහිටි තන්හි ආශ්‍රමයන් තනා පදිංචි වී තම දරුවන්ට ඇත්, අස් රිය ශිල්ප ආදියෙහි හික්මවා, ශිල්ප උගන්වති. මෙසේ ඔවුන්, වරදැලින් තෙවැනි මෘගජාතීන් මෙන් පාපීමත්

වූ මාරයාගේ දිමුදැලින් වටකරන ලද්දාහු කැමති සේ කටයුතු කරන්නෝ වූහ.

තථූපමං අහං භිකඛවෙ - ඉමෙ චතූතෙථති යන මෙය ශාසනය පිළිබඳව දැක්වූ උපමාවයි. **අන්ධමකාසිමාරං** යනු මාරයාගේ ඇස් නොබිඳි බවයි. එහෙත් විදර්ශනාපාදක ධ්‍යානයට සමවැදුනු භික්ෂූන්ගේ සිත මෙනම් අරමුණු නිසා පවතීයයි මාරයාට දකින්නට නො හැක්කේය. එහෙයින් කියන ලදී. **අන්ධමකාසි මාරං** යනු **අපදං වධිත්වා මාර චකඛුං** එම පර්යායෙන්ම යම්සේ මාරයාගේ ඇස අස්ථාන වේද, ස්ථාන රහිත වේද, නො පිහිටියේ වේද අරමුණු ගැනීමට නො හැකි වූයේ ද, එපරිද්දෙන් නසා යන අර්ථයි. **අදසසනං ගතො පාපිමතො** යනු ඒ අන්දමින්ම ඒ ප්‍රකාරයෙන්ම පාපිමත් වූ මාරයාගේ ඇස් නො පෙනී ගියේ ද, නො දක්නා බවට ගියේද, හෙතෙම තමන්ගේ මසැසින් විදර්ශනා පාදකධ්‍යානයට සමවැදුනු භික්ෂුවගේ ඤාණ ශරීරය දක්නට නො හැකි වන්නේමය.

පඤඤාය චසස දිසවා මාර්ග ප්‍රඥාවෙන් චතුරාර්ය සත්‍යය දැක සතර ආශ්‍රවයෝක්ෂය කරන ලද්දාහු වෙති. **තිණණ ලොකෙ විසතතිකං** ලෝකයෙහි ඇළුණු විශේෂයෙන් ඇළුණු බැවින් විසත්තිකා නම් වූ සංඛ්‍යාවට ගිය නොහොත්, **විසතතිකාති කෙනටඨෙන විසතතිකා** පතළ වූයේ යයි විසත්තිකා නම්. තුන්බිම පතුරුවන බැවින් විසත්තිකා රූපාදියෙහි විශාල වූ අරුතින් විසත්තිකා, ඉවසන සුළු බැවින් විසත්තිකා සිත හකුළුවානුයි විසත්තිකා, දුක් ගෙන එන්නේයයි විසත්තිකා - විසංවාදය කරන බැවින් විසත්තිකා - විෂය මූල වන හෙයින් විසත්තිකා විෂ ඵල ඇති බැවින් විසත්තිකා, දුක් පරිභෝජනය කරන්නේනුයි විසත්තිකා, රූපයෙහි ශබ්දයෙහි ගන්ධයෙහි රසයෙහි ස්පර්ශයෙහි තෘෂ්ණා ඇත්තේනුයි විසත්තිකා නම් වේ. තෘෂ්ණාව තරණය කළේනුයි විසත්තිකා.

එහෙයින් කියන ලදී. **තිණණ ලොකෙ විසතතිකා**

නිවාප සූත්‍ර වර්ණනාව නිමියේය.

1-3-6
අරියපරියෙසනා සුත්‍රය

එවමෙමසුතං මේ පාසරාසි සූත්‍රයයි. එහි **සාධු මයං ආවුසෝ** යනු ආයාචනා කරමින් කියත්. මේ දනව්වැසි පන්සියයක් භික්ෂූහු දශබලධාරීන් වහන්සේ දකින්නෙමුයි සැවැත්නුවරට පැමිණියාහුය. මේ පිරිස ශාස්තෘන් වහන්සේ දුටහ. එහෙත් ධර්මකථාවක් නො ඇසූහ. ඔවුන් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ඇති ගෞරවය නිසා අපට ධර්මකථාවක් වදාරන්නැයි කියන්නට අපොහොසත් වූහ. බුදුවරු නම් ගෞරව කළයුත්තේමය. තනිව හැසිරෙන මෘගරාජන් වූ සිංහයෙකු බඳුය. මදය ඇති ඇතෙකු මෙනි. පෙණය කළ සර්පයකු මෙනි. ගිනිකඳක් මෙනි. එබැවින් ළංවිය නොහැක. මෙසේ කියන ලද්දේය.

අසිවිසෝ යථා සොරෝ - මිගරාජාව කෙසරී
නාගෝ ච කුඤ්ජරෝ දනතී - එවං බුද්ධා දුරාසදා

දරුණු ආශීර්විෂයක්හු වෙත, කේශර සිංහයකු වෙත, දන්තී නම් වූ ඇතකු වෙත ළංවිය නොහැක්කේ ද, එසේ සර්වඥ බුදුවරයන් වෙත ද ළංවිය නො හැක්කේය.

මෙසේ ළංවිය නො හැක්කා වූ බුදුරජුන් වෙත යාඥා කරන්නට නො හැකි වූ ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද හිමියන් වෙත යාඥා කරන්නාහු **සාධු මයං ආවුසෝ** යයි කීහූ.

අපෙපවනාම ලබන්නෙමු නම් ඉතා යහපත්ය. කුමක් හෙයින් ඒ තෙරවරුන්ට රම්මක බමුණාගේ ආශ්‍රමයට පැමිණෙන්න යයි ආනන්ද තෙරුන් කීයේ ද, බුදුන් වහන්සේගේ ක්‍රියා තමන්ට පළපුරුදු බැවිනි. අද ශාස්තෘන් වහන්සේ දෙව්රම වැස පූර්වාරාමයේ දී දිවා විහාර කරන්නේය. අද පූර්වාරාමයෙහි වැස දෙව්රමැ දිවා විහාර කරන්නේය. අද හුදෙකලාවම පිඬු පිණිස පිවිසෙන්නේය. අද භික්ෂු සංඝයා පිරිවරා මෙකල ජනපද චාරිකාවේ සැරිසරන්නේය. මෙසේ දකින්නට ඔහුට චෙතොපරියාය ඤාණය තිබේද? නැත. අනුමාන බුද්ධියෙන් මෙතෙක් කරන ලද ක්‍රියාවන් පිළිබඳ දැනීමෙන් මේ පිළිවෙළ දනියි. යම් දවසක භාග්‍යවතුන් වහන්සේ ජේතවනයෙහි වැස පූර්වාරාමයෙහි දිවා විහාරය කරනු කැමති වේද,

එකල්හි සේනාසන පරිෂ්කාර භාණ්ඩයන්ගේ සකස්කරන අයුරු දැක්වෙයි. තෙරුන්වහන්සේ මුසුන් කසල දමන කුඩ ආදිය සකස් කෙරේ. පූර්වාරාමයේ වැස දෙව්රම් වෙහෙර දිවා විහාරය කරනු කැමති වේද, එකල්හි ද මේ ක්‍රමයමැයි. යම් දවසක හුදෙකලාව පිඬු පිණිස හැසිරීම කැමති වේද, එදා උදෙන්ම සිරුර පිළිදැගුම් කොට, ගඳකිළියට වැඩමවා දොර වසා ඵල සමාපත්තියට වඩා හිඳියි. අද භාග්‍යවතුන් වහන්සේ හික්මවිය යුත්තෙකු දැක හුන්නේ ය යන සංඥාව දැන, අද භාග්‍යවතුන් වහන්සේ තනිවම පිඬුසිඟා වඩින්නේ ය. තෙපි පිඬුසිඟා යාමට, භික්ෂාචාරයට සැරසෙවු යයි භික්ෂූන්ට දැනුම් දෙයි. යම්කිසි දවස භික්ෂූන් පිරිවරා වැඩමවනු කැමැත්තේ වේද, එදින ගඳකිළියේ දොර අඩක් පමණක් වසා ඵලසමවත් සුවය විඳිමින් සිටියි. ආනන්ද තෙරුන් එයින් දැන පා සිවුරු ගෙන පිඬු පිණිස හැසිරීමට සූදානම් වන්නැයි භික්ෂූන්ට දන්වයි. යම්කිසි දවසක ජනපදචාරිකාවේ පිවිසෙනු කැමති වන්නේ ද එදිනට පිඬු දෙක තුනක් වැඩිපුර වළඳා සක්මනට නැගී ඔබිනොබ සක්මන් කරති. ඒ සලකුණෙන් ආනන්ද තෙරුන්, භාග්‍යවතුන් වහන්සේ ජනපද චාරිකාවේ හැසිරෙන්නේ ය. ඔබලාද කළයුතු දේ දනිවු යයි භික්ෂූන්ට දන්වයි.

භාග්‍යවතුන් වහන්සේ ප්‍රථම බෝධියෙහි විසිවසක් අනිබද්ධවාසික වූයේය. පසුව විසිපස් වසක් සැවැත්නුවරම ඇසුරුකොට වාසය කරන්නේ එක් දවස දෙතැනක් පරිභෝග කරති. දෙව්රම් වෙහෙර රාත්‍රියෙහි වැඩසිට දෙවන දවසේ භික්ෂු සංඝයා පිරිවරා දකුණු දොරින් පිණ්ඩපාතය සඳහා පිවිස, පෙරදිග දොරින් නික්ම පූර්වාරාමයෙහි දිවා විහරණය කරයි. පූර්වාරාමයේ රාත්‍රියේ වැඩසිට දෙවන දවසේ නැගෙනහිර දොරටුවෙන් සැවැත්නුවර පිඬු පිණිස හැසිර, දකුණු දොරින් නික්ම දෙව්රම දිවා විහාරය කරති. කවර හෙයින් ද, දෙපසම මහජනයාට අනුකම්පාව පිණිසය. පුරුෂයෙකු වශයෙන් ජීවත්ව අනේපිඬු සිටාණන් මෙන් ද, ස්ත්‍රියක වශයෙන් ජීවත්ව විශාඛාව මෙන් ද තථාගතයන් උදෙසා ධන පරිත්‍යාග කළ වෙනත් පුරුෂයකු හෝ ස්ත්‍රියක නැත. එබැවින් භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට අනුකම්පා කිරීම පිණිස මේ දෙතැනම පරිභෝග කළ සේක. මේ කියන දවසේ ජේතවනයේ විසූහ. එහෙයින් ආනන්ද ස්ථවිර තෙමේ අද භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර පිඬු පිණිස හැසිර, සවස් කාලයෙහි සිරුර සේදීම සඳහා පැදුන් කොටුවට යන සේක. එහිදී මම ඇඟ සෝදා සිටියා වූ භාග්‍යවතුන් යැද, රම්මක බමුණාගේ අසපුවට ගෙන යන්නෙමි. එහිදී මේ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ සමීපයෙන් දැහැමි කථා

අසන්නට හැකි වන්නේ යයි සිතා එම භික්ෂූන්ට (එහි යන ලෙස) මෙසේ කීහ.

මිගාරමාතු පාසාදෝ විශාඛාව විසින් ඉදිකළ ප්‍රාසාදය. ඕ තොමෝ මිගාර සිටුවරයා විසින්, මව් තන්හි තැබූ බැවින් මිගාර මාතා යයි කියයි. **පටිසල්ලාණා වුටඨිතෝ** ඒ ප්‍රාසාදයෙහි දෑගසව්වන් ගේ සැතපෙන කාමර දෙක මැද, භාග්‍යවතුන් වහන්සේගේ ගඳකිළිය වූයේ ය. තෙරුන්වහන්සේ දොර විවරකොට ඇතුළු කාමරය හැමද පරවුණු මල් කසළ බැහැරකොට ඇඳ පුටු ආදිය සකසා පණවා ශාස්තෘන් වහන්සේට දැන් වූ කල්හි, ශාස්තෘන් වහන්සේ ඇතුළු ගැබට පිවිස සතිසම්පජඤ්ඤයෙන් යුතුව, දකුණු පසට හැරී සිංහ සෙය්‍යාවට පැමිණ වෙහෙස නිමවා නැගිට එල සමවතට සමවැද හිඳ, සවස් භාගයෙහි එයින් නැගී සිටියේය. **පටිසල්ලාණ වුටඨිතෝ** යනු ඒ සඳහා කියන ලදී. **පරිසිඤ්චිතුං** යමෙක් වනාහි හුණු මැටි ආදියෙන් අත් පා අවයව උලමින්, මූලාදියෙන් ගටමින් නාන්නේද, හෙතෙම ජලස්නානය කරන්නේ යයි කියනු ලැබේ. යමෙක් එසේ නොකොට ප්‍රකෘතියෙන්ම නහා ද හෙතෙම පරිෂේක කෙරේයයි කියනු ලැබේ. බුදු සිරුරෙහි එසේ හළයුතු රජස් දැලි ආදිය නො තැවරෙයි. එහෙත් සෘතු ගැනීම සඳහා තථාගතයෝ හුදෙක් ජලයට බසිති. **ගතත්තානි පරිසිඤ්චිතුං** යන්න එබැවින් කීහ.

පුබ්බ කොටඨකෝ පැදුන් කොටුව, සැවැත්නුවර විහාරය සමහර කලෙක විශාල වෙයි. සමහර කලෙක කුඩා වෙයි. විපස්සී භගවතුන්ගේ කාලයෙහි එය යොදුනක් පමණ විය. සිඛී බුද්ධ කාලයෙහි තුන්ගව්වක්ද, වෙස්සභූ බුදුන් දවස අඩ යොදුනක් ද, කකුසඳ බුද්ධ කාලයේ ගව්වක් පමණද, කෝනාගමන බුදුන් දවස අඩගව්වක් පමණද, කාශ්‍යප බුද්ධ කාලයේ විසි ඉස්බක් පමණ ද, අප බුදුන් දවස අටකිරියක් පමණ ද වූයේය. ඒ නගරය ඒ විහාරයට සමහර කාලවල පෙරදිගින් පිහිටියේය. සමහර කාලවල දකුණුපසින් පිහිටියේය. සමහර කාලවල පැලදිගින් ද සමහර කාලවල උතුරුදිගින් ද පිහිටියේය. එසේ වුවත් දෙව්රම් වෙහෙර ගඳකිළිය පිහිටි තැන හා බුදුන් සැතපෙන ඇඳේ සතර පා පිහිටි තැන් වෙනස් නො වන්නේම ය. අචලය. එසේ වෙනස් නො වන්නා වූ ස්ථාන සතරක් වෙති. මහබෝමැඩ, පිහිටි තැන, දම්සක් පැවතුම් සූත්‍රය දෙසූ තැන, සංකස්සපුර දොරටුව, දේවාවරෝහණ කාලයේ හිණිපෙළ පිහිටි තැන සහ ඇඳේ පා සතර පිහිටි තැන යන හතරයි.

මේ පූර්වකොටුව වනාහි කසුප් දශබලධාරීන් දවස විසි ඉස්බක් පමණ විහාරය පිහිටි කල්හි, පෙරදිග දොරටුවෙහි විය. එය දැනුදු පැදුන් කොටුව නම් වන්නේ ම ය. කාශ්‍යප දශබලධාරීන්ගේ කාලයේ අචිරවතී නගරය වටකොට ගලා බසින්නී පැදුන්කොටුවට පැමිණ ජලයෙන් බිඳී ගැඹුරු වූ සමකොට ඇති, මහත් වූ දිය වළක් මැවිණ. එහි එකක් රජු නාන තොටය. එකක් පුරවැසියන් නාන තොටය. එකක් භික්ෂු සංඝයා නාන තොටය. එකක් සර්වඥයන් නහන තොටයයි සිත්කලු වූ රිදීපට වැනි සුදුවැළි විසිරුණු නහන තොටවල් විය.

භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් සමග මෙවැනි වූ පැදුන්කොටුව වෙත එළඹ සිරුර සෝදන්නට විය. ඉක්බිති ආනන්ද තෙරුණුවෝ දියසළුව එලවූහ. භාග්‍යවතුන් වහන්සේ රත් දෙපට අඳනය ඉවත්කොට දියසළුව හැන්දේය. අනඳ හිමි අඳනය සමග සිවුරු තම අතට ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ දියට බැස්සේය. උන්වහන්සේ දියට බැසීමත් සමග දියේ සිටි මසුන් සියල්ලෝ රන්වන් වූහ. යතුරු නළවලින් රන්රස දහර විසුරුවන කලක මෙන් ද, රන්පට අතුරන කලක මෙන් ද විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නහා අවසන් වූ පසු අනඳ තෙරහු අඳනය හා සිවුරු ලබාදුන්හ. භාග්‍යවතුන් වහන්සේ අඳනය හැඳ විදුලියක් වැනි වූ කාය බන්ධනය (පටිය) බැඳ මහා චීවරය දෙකොන්හි ගෙන සිටියහ. **පුබ්බකොට්ඨකෙ ගනතානි පරිසිඤ්චිත්වා පච්චුතතරිත්වා එකචීවරො අට්ඨාසි** යන්න එහෙයින් කියන ලදී.

මෙසේ සිටියා වූ භාග්‍යවතුන් වහන්සේගේ සිරුර, විකසිත කමල උපුල ආදියෙන් ශෝභාමත් වූ විලක් මෙන් ද, මුල සිට අග දක්වා මල් පිපුණු පරසතු රුක මෙන් ද, තරු කිරණින් විසිතුරු වූ අහස්තලය මෙන්ද බැබළුණේය. බඹයක් විහිදෙන්නා වූ ෂඩ්වර්ණ රශ්මියෙන් ඔප්නැංවුණු දෙතිස්මහා පුරිස් ලකුණු දෙතිස් සඳමාලාවක් මෙන්, දෙතිස් හිරු මාලාවක් මෙන් ද, බැබළුනේය. තව ද පිළිවෙළට සිටින ලද දෙතිස් සක්විත්තන් මෙන් ද, දෙතිස් දිව්‍යරාජයන් මෙන් ද, දෙතිස් මහා බ්‍රහ්මරාජයන් මෙන් ද අතිශයින් බැබලූහ. මෙබඳු තන්හි බුදුවරුන්ගේ ශරීර වර්ණය හෝ ගුණය හෝ වර්ණනා කිරීමට ගාථා හෝ උපමා හෝ නැත්තේමය. විචිත්‍ර භාණක ප්‍රතිභා පූර්ණ ධර්ම කථිකයෙකු විසින්ම ඔහුගේ ශක්තියෙන්ම කළ යුත්තේය.

ගතතානි පුබබායමානො ශරීරය ප්‍රකෘති භාවයට පමුණුවමින්, නිරුදක කෙරෙමින්, වියලවමින් යන අර්ථයි. දිය සහිත සිරුරෙහි සිවුරු පොරවන්නහුගේ සිවුර තැනින් තැන පැල්ලම් ඇති වේ. එසේ සිවුරේ තෙත් පැල්ලම් නිසා පුස් නැගීමෙන් පරිෂ්කාර කෙළෙසෙයි. එහෙත් බුදු සිරුරෙහි රජස් දැලි නො තැවරෙයි. නෙළුම් කොළයක වැටුණු දියබිඳු මෙන් ජලය පෙරලී යයි. මෙසේ ඇති කල්හි ද භාග්‍යවතුන් වහන්සේ ශික්ෂාවන්ට ගරුකිරීම සඳහා මේ පැවිදි වතෙකැයි මහ සිවුර දෙකොනින් අල්ලා කයෙහි ඉදිරිපස වසා සිටියේය.

එකෙණෙහි ආනන්ද තෙරහු මෙසේ සිතූහ. භාග්‍යවතුන් වහන්සේ මහා සිවුර පොරවා මිගාරමාතු ප්‍රාසාදය වෙත ගමන් ඇරඹූ කල්හි නො නැවැත්විය හැක්කේය. බුදුවරයන්ගේ අභිප්‍රායයෙහි ස්වභාවය නම් තනිව හැසිරෙන්නා වූ සිංහයකු ගැනීම පිණිස අත දිගු කරන්නාක් මෙන් ද, මද ඇතෙකුගේ සොඬ පිරිමදින්නාක් මෙන් ද උග්‍ර තේජස් ඇති සර්පයකු බෙල්ලෙන් අල්ලා ගැනීමක් මෙන් ද, බරපතළ කාර්යයක් වෙයි. දැන් මෙහිදීම රම්මක බ්‍රාහ්මණයාගේ අසපුව පිළිබඳව වර්ණනා කොට එහි වැඩමවීම පිණිස භාග්‍යවතුන් වහන්සේ යාඥා කරමි. හෙතෙම එසේ කළේය. **අථඛො ආයසමා ආනන්දො** -පෙ- අනුකම්පංදාය භාග්‍යවතුන් වහන්සේ සමීපයෙන් දැහැමි කථාවක් අසන්නෙමු යයි ධම්මික අසපුවට ගිය පන්සියයක් භික්ෂූන්ට අනුකම්පා පිණිස ඔවුන් කෙරෙහි කරුණාවෙන් මේ යාඥාව කළේය යන අර්ථයි.

ධම්මියාකථායා දස පාරමිතාවන් අතුරෙන් එක්තරා පාරමිතාවක් පිළිබඳ වූද, මහාභිනිෂ්ක්‍රමණය පිළිබඳව ද ගුණ කථා කරමින් ඒ භික්ෂූහු සිටියාහුය. **ආගමයමානො** යනු බලමින්, මම බුද්ධයෙමි. වහාම නො පිවිස භික්ෂූන්ගේ කථා අවසන් වන තෙක් සිටියේය යන අදහසයි. **අගගලං ආකොටෙසි** යනු නියපිටින් දොරටු තට්ටු කළේය. **විවරිංසු** ඒ හඬ ඇසූ කෙණෙහිම හුන් තැනින් නැගිට අවුත් දොර විවර කළහ. **පඤ්ඤත්තෙන ආසනෙ** බුද්ධ කාලයෙහි ඒ ඒ තැන භික්ෂුවක් හෝ වාසය කළේය. ඒ සියළු තන්හිම බුද්ධාසන පනවන ලද්දේම වේ.

තසමා කවර හෙයින්ද යත්, තමන් සමීපයෙන් කමටහන් ගෙන පහසු තැන්වලට ගිය භික්ෂූන් වහන්සේලා පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ (වරින්වර) සිහිකරන සේක. අසවල් භික්ෂුව මා සමීපයෙන් කමටහන්

ගෙන ගියේය. ඔහුට මාර්ගාධිගමක් උපදවන්නට හැකිවීද නැද්දැයි උන්වහන්සේ ඔවුන් පිළිබඳව බලති. එකල්හි ඔව්හු කමටහන් හැර දමා අකුසල විතර්කයක් උපදවාගෙන සිටිනම්, උන්වහන්සේ දකිති. නැවත, මා සමාන වූ ශාස්තෘවරයෙකු සමීපයෙන් කර්මස්ථාන ගෙන වසන්නා වූ මේ කුලපුත්‍රයා අකුශල විතර්කයන් මැඩපවත්වා අනවරාග්‍ර වූ මේ සංසාර දුකෙහි ගිල්වන්නේ කෙසේදැයි ඔහුට අනුග්‍රහ පිණිස ඒ කුලපුත්‍රයාට එහිදීම තමන් දක්වා ඒ කුලපුත්‍රයාට අවවාද කොට අහසින් තමන් වසන තැනටම වැඩමවන්නේ ය. එකල්හි ඔවදන් ලබන්නා වූ භික්ෂුව මෙසේ සිතයි. ශාස්තෘන් වහන්සේ අපගේ සිත් දැන වැඩමවා අපගේ සමීපයේ සිටම අපට දක්වන්නේ ය. ඒ අවස්ථාවේ මෙහි වැඩ සිටින්න, මෙහි වැඩ සිටින්න යැයි අසුන් සෙවීම කළ නො හැක්කේය. ඒ නිසා බුදුන් සඳහා ආසන පනවාම ඔව්හු වාසය කරති. යමෙකුට පුටුවක් ඇත්ද ඔහු එය පනවයි. යමෙකුට නැත්තේද, හෙතෙම ඇඳක් හෝ පුවරුවක් හෝ, ලී කොටයක් හෝ ගලක් හෝ වැලි ගොඩක් හෝ ඒ සඳහා පනවයි. එයත් නො ලබන්නාහු පැරණි පරණලා රැස්කොට ඒ මත පාංශුකූල රෙද්දක් අතුරා තබති. මේ වනාහි ස්වාභාවිකවම පනවන ලද්දා වූ අසුනක් වන්නේ ය. **පඤ්ඤත්තෙත ආසනෙ නිසීදි** යන්න ඒ සඳහා කියන ලදී.

කායනුත්ථා කවර කථාවකින් යුක්තව රැස්ව හුන්නේද යන අර්ථයි. 'කාය වෙත්‍ථාති' යනුවෙන් ද පෙළේ සඳහන්ය. ඇගේ මෙහි කවර කථාවක නියැළී සිටියාහුද යන අදහසයි. කාය නොත්‍ථාති යනුවෙන්ද එයි. පළමු අදහසමැයි. **අනතරා කථා** යනු කර්මස්ථාන, මනසිකාර, උදෙදස, කමටහන්, මෙනෙහි කිරීම්, උදෙසීම්, පිළිවිසීම් ආදීන් අතුරෙන් එක් කථාවක, **විපපකා** මගේ පැමිණීමෙන් අවසන් නොවූ, මුදුන්පත් නොවූ, **අථ භගවා අනුපපත්තෙනා** මේ කාලයෙහිම භාග්‍යවතුන් වහන්සේ වැඩමවූහ. **ධම්මීවා කථා** දශකථා වස්තුවලින් වෙන් වූ දැහැමි කථා, **අරියොවා තුණ්හීභාවෝ** මෙහි වනාහි උතුම් වූ ද්විතීය කර්මස්ථානය ද ආර්ය වූ නිශ්ශබ්දතාවය වේ. එහෙයින් ඒ ධ්‍යානය වඩා උන්නා වූ ද, මූල කර්මස්ථානය ගෙන උන්නා වූද භික්ෂූන් ආර්ය වූ නිශ්ශබ්දතාවයෙන් යුක්ත වූයේ යයි දතයුතු.

දෙව මා භික්ඛවෙ පරියෙසනා යනු අනුසන්ධි කවරේද? ඒ භික්ෂූහු තථාගතයන්ගේ ධර්ම කථාවක් අසන්නෙමු'යි ආනන්ද තෙරුන්ට භාර කළහ. ඔව්හු එහි හිඳ තිරශ්චීන කථා නොකොට ධාර්මික කථාවකින්ම හුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ තොපගේ පර්යේෂණය ආර්ය

පර්යේෂණයයි දැක්වීමට මේ දේශනාව ආරම්භ කළ සේක. එහි කතමාච භික්ඛවෙ අනරියා පරියෙසණා මෙහි යම්සේ මාර්ගයෙහි දක්ෂ වූවෙක් පළමුකොට දුරුකළයුතු අපාය මාර්ගය දක්වන්නේ වම හැර දකුණු ගනුවයි කියාද, මෙසේ භාග්‍යවතුන් වහන්සේ දේශනාවෙහි දක්ෂ බැවින්, පළමුව දුරුකළයුතු අනාර්ය පර්යේෂණය වදාරා පසුව අරිය පරියේසනය කියන්නෙමැයි උදෙසීමේ අනුක්‍රමය බිඳ මෙසේ වදාළහ.

ජාතිධම්මො උපදින ස්වභාව ඇති, ජරා ධම්මො දිරණ ස්වභාව ඇති, ව්‍යාධී ධම්මො රෝගී ස්වභාව ඇති, මරණ ධම්මො මියෙන ස්වභාව ඇති, සොක ධම්මො ශෝක කරන ස්වභාව ඇති, සංකිලෙස ධම්මො කෙළෙසන ස්වභාව ඇති, පුත්ත භරියා පුත්‍රයෝ ද භාර්යාවෝ ද, සියලු තන්හි මේ ක්‍රමයයි. ජාතරූප රජතං මෙහි වනාහි ජාතරූපං යනු රත්රන්ය. රජතං රිදීය. යම්කිසි එදිනෙදා ව්‍යවහාරයට පැමිණි ලෝහ මසු මුදල් ආදියයි. ජාතිධම්මා හෙතෙ භික්ඛවෙ උපදයො මේ පස්කම් ගුණයෝ උපධීහු නම් වෙති. ඒ සියල්ල ජාතිධම්ම යන්නෙන් දක්වන්නේය. උපදින ස්වභාව ඇත්තේය යන තේරුමයි. ව්‍යාධිධම්ම ආදියෙහි ජාතරූප නොගනී. ශීර්ෂ රෝගාදිය ව්‍යාධි නම් වෙති. ජාතරූප ආදියෙන් සත්ත්වයන්ගේ උපත් මරණ සිදු නොවේ. ශෝකය නූපදී. එහෙත් අයස් ආදී කෙලෙසිලිවලින් කෙලෙස් වේයයි සංකිලෙස ධර්මාචාරයෙහි ගන්නා ලදී. එසේ සෘතු විපර්යාසයෙන් ජාති ධර්ම චාරයෙහි ද, මල හටගෙන දිරන හෙයින් ජරා ධම්මචාරයි ද ගන්නා ලදී. අයං භික්ඛවෙ අරියා පරියෙසනා මහණෙනි, මේ නිදොස් බැවින් ද, ආර්යයන් විසින් සේවිය යුතු බැවින් ද, අරිය පරියේසනා යයි දතයුතුයි.

අහමපි සුදං භික්ඛවෙ යනු කුමක් හෙයින් ඇරඹියේද, මුලපටන් මහාභිනිෂ්ක්‍රමණය දැක්වීමටය. ආදියේ මෙසේ සිදුවිල. මහණෙනි, මම පෙර අනාර්ය වූ පරියේසනය සේවනය කෙළෙමි. ඒ මම එය අත්හැර අරිය පරියේසනය පරිශීලනය කොට සර්වඥ භාවයට පැමිණියෙමි. පස්වග මහණෝ ද අනාර්ය පරියේසනය පරිශීලනය කළාහු වෙති. ඔව්හූ එය අත්හැර ආර්ය පරියේසනය පරිශීලනය කොට රහත්බවට පැමිණියාහුය. ඔබලාද මගේ හා පස්වග මහණුන්ගේ ගමන්මගට පිළිපන්හ. ආර්ය පරියේෂණය මුලපටන් ඔබලාගේ පරියේෂණයයි. මුලපටන් මහාභිනිෂ්ක්‍රමණය දැක්වීමට මේ දේශනාව ආරම්භ කළහ.

එහි දහරොව සමානොති තරුණ වූයේම, **සුසුකාළකෙහොති** මනාව කළු වූ හිසකෙස් ඇති, අඳුන්වන් හිසකෙසින් යුක්ත වූයේ යන අර්ථයි. **භද්‍රෙන සිත්කළු** වූ භද්‍ර යෞවනයේ, **පඨමෙන වසසා** තුන් වයස් අතුරෙන් පළමුවන වයසේ, **අකාමකානං** නොකැමැති වන්නවුන්ට, අනාදරාර්ථයෙහි සාමි වචනයි. මොවුන්ගේ මුහුණුවල කඳුළු ඇත්තේනුයි අසසුමුඛ නම් වේ. ඔවුන්ගේ **අසසුමුඛානං** කඳුළුවලින් තෙත් වූ මුහුණු ඇතිකල්හිම **රදනතානං** හඬා කඳුළු වගුරුවන්නවුන්ට, **කිං කුසලගවෙසී**

කිං කුසල ගවෙසී කුසලය කුමක්දැයි සොයන්නෙමි. **අනුතතරං සනතිවරං පදං** උතුම් වූ ශාන්ති සංඛ්‍යාත වූ, උතුම් ධර්මය, නිර්වාණය සොයන්නේ යන අර්ථයි. **යෙන ආළාරො** මෙහි ආළාර යනු ඔහුගේ නමයි. දීර්ඝ පිංගලයෙක් නිසා ඔහුට ඒ නම වීය. **කාලාමො** යනු ගෝත්‍රයයි. **විහාරතායසමා** ආයුෂ්මත්හු වාසය කෙරේවා. **යතථ විඤඤූ පුරිසො** යම් ධර්මයෙක්හි පණ්ඩිත පුරුෂයෙක් තෙම **සකං ආචරියකං** තමන්ගේ ආචාර්ය කාලය, **උපසමපජජ විහරෙය්‍ය** අවසර ලැබ වාසය කරන්නේය. මෙයින් ඔහු විසින් අවසර දෙන ලද බව කියයි.

තං ධමමං ඒ ඔහුගේ සමය පෙළ **පරියුපණිනති** අසා උගත්තේය. **ඔටඨ පහත මතෙතන** ඔහු විසින් කියන ලද්ද පිළිගත්තේ යයි තොල් හැසිරවීම් පමණකින් පමණකින් අනුමත කළේ යන අර්ථයි. **ලපිතලාපන මතෙත** ඔහු විසින් කියන ලද්දට පෙරලා කියන පමණින් **ඤාණවාදං** වාදය දනිමි. **ථෙරවාදං** ස්ථිරභාව වාදය, මේ වචනයෙහි මම ස්ථිර වෙමි. පිළිගනිමි. **අහඤෙඤව අඤෙඤඤචාති** තනිව මම පමණක් නොවේ. අනිත් අය ද මෙසේ කියති. **කෙවලං සදධා මත්ථකෙන** නුවණින් ප්‍රත්‍යක්ෂ නො කොට පිරිසිදු වූ ශ්‍රද්ධාව පමණකින් බෝසත් තෙමේ වචනයෙන් පමණක් ධර්මය උගත්තේ, කාලාම විසින් වචනයෙන් පමණක් නොව, මේ ධර්මයෙහි මෙතෙම ඒකාන්තයෙන් සමාපත්තිලාභී වීයයි දැනගත්තේය. එහෙයින් ඔහු මෙසේ කීවේය. **ආකිඤඤඤඤායතනං පවෙදෙසි** ආකිඤඤඤඤායතනය අවසන්කොට ඇති සත් (සමාපත්ති) සමවත් ලාභීයයි මා දැනගත්තේය. **සදධා** මේ සත් සමවත් ඉපදවීම පිණිස ශ්‍රද්ධාවද වීර්යය ද (උපයෝගී) විය යන කාරණයයි න්‍යායයි. **පද භෙය්‍යං** උත්සාහ කරන්නෙමි.

න චිරසෙසව තං ධමමං සයං අභිඤඤා සචඡිකත්වා උපසමපජජ

විහාසිං බෝසත් තෙමේ වීර්යය දැඩිකොට වැඩිකල් නො යවාම සත්රුවන් හිණිමගක් ගලපන්නෙකු මෙන් සත් සමවත් ඉපිදවීය. එහෙයින් මෙසේ කීය. **ලාභානො ආවුසො** මේ කාලාම තෙමේ ඊර්ෂ්‍යා නොකරන්නෙක්ල. එහෙයින් මේ ආධුනිකයා කුමක්කොට මේ සත් සමවත් ඉපිදවූයේදැයි ඊර්ෂ්‍යා නොකොට තමන්ගේ ප්‍රසාදය පළකරන්නේ මෙසේ කීය. **උභො සනතා ඉමංගණං පරිහරාම** මගේ මේ පිරිස ඉතා විශාලය. දෙදෙනාම පරිහරණය කරමුයි කියා සමූහයාට අදහසක් දුන්නේය. මම ද සත් සමවත්ලාභී වෙමි. මේ මහා පුරුෂයා ද සත් සමවත්ලාභී වේ. මෙතෙක් දෙනා (කොටසක් මේ මහා පුරුෂයා සමීපයෙන් පරිකර්ම උගනිව්. මෙපමණක් මා සමීපයෙන් උගනිව් යයි භාගයක් බෙදා දුන්නේය. උළාරාය උතුම් වූ, පූජාය කාලාමගේ උපස්ථායක ස්ත්‍රී පුරුෂයෝ සුවඳ ද්‍රව්‍ය හා මල් රැගෙන එති. කාලාම තෙමේ යව්, මහා පුරුෂයා පුදන්නැයි කියයි. ඔව්හූ මහා පුරුෂයා පුදා ඉතිරි වූ දෙයින් කාලාම පුදත්. මහාර්ඝ වූ ඇඳ පුටු ආදිය ගෙන එති. ඒවාද මහා පුරුෂයාට දී යමක් ඉතිරි වූයේ නම් තමන් ගනියි. ගිය ගිය තැන උතුම් වූ සෙනසුන් බෝසතුන්ට පමුණුවා සෙස්ස තමන් ගනියි. මෙසේ ශ්‍රේෂ්ඨ වූ පූජාවෙන් පිදීය.

නායං ධම්මො නිබ්බිදාය ආදිය මේ සත් සමවත් ධර්ම සසරින් එතරවීමට, සසර කලකිරීමට, රාගාදිය ප්‍රහීණ කිරීම පිණිස, කෙලෙස් සංසිඳීම පිණිස දතයුතුව සර්ව ධර්මයන් දැනගැනීමට, සිව්මග අවබෝධය පිණිස, නිවන සාක්ෂාත් කිරීම පිණිස නො පවත්නේය යන අර්ථයි. **යාවදෙව ආකිඤ්චඤ්ඤා යතනූපපතතියා** කල්ප සැටදහසක් ආකිඤ්චඤ්ඤායතන භවයෙහි ඉපදීමට පමණක් ප්‍රමාණවත් වේ. එයින් මත්තෙහි නො පවතී. මෙය නැවත ආපසු එන ස්වභාවයක්ම ඇත්තේය. යම් තැනකට පමුණුවාද එතැනද ජාති ජරා මරණවලින් පිරිපුන් තැනක්මය. මාර පාසයෙන් වටකරන ලද්දේමය.

එතැන් පටන් මහසත් තෙමේ, යම් සේ සාදුකින් පෙළෙන පුද්ගලයෙක් මිහිරි ආහාරයක් ලැබ අතිශයින් ප්‍රියකරනු ලබන්නේ, මදක් වළඳ පිත් වශයෙන් හෝ සෙම් වශයෙන් හෝ මැස්සෙකු සිටීමෙන් හෝ ඉවත දමයිද එක පිඩක්වත් බුදින්නට අකමැති වේද, සිත් නූපදවාද, එසේම මහත් උත්සාහයකින් මේ සප්ත සමාපත්තීන් ලැබී ද, එයද නැවත ඉපදීම ආදී ආදීනව භේදයන් දැක, නැවත මේ ධර්මය ආවර්ජනා කරන්නෙමි. සමාදන් වන්නෙමි. සමවදින්නෙමි. අධිෂ්ඨාන කරන්නෙමි.

නැගී සිටින්නෙමි. ප්‍රත්‍යවේක්ෂා කරන්නෙමි යන සිතක් පමණවත් නො ඉපදවීය. අනලං කරිත්වා මෙයින් කම් නැත. මෙයින් කම් නැත. නැවත නැවත ප්‍රතික්ෂේප කොට නිබ්බිජ්ජා කළකිරී. අපක්කමිං ගියේය.

නඛොරාමෝ ඉමං ධම්මං මෙහි ද බෝසත් තෙම ඒ ධර්මය ඉගෙන ගත්තා පමණක් නොව, මේ අෂ්ට සමාපත්ති ධර්මය ද, උද්දකරාම තවුසාගේ වචනයෙන් උගත්තා පමණක් නොව, ඒකාන්තයෙන් මොහු අෂ්ට සමාපත්තිලාභීයයි දැනගත්තේය. එබැවින් ඔහුට ද මේ සිත විය. **න ඛො රාමෝ -පෙ- ජානං පසසං විහාසි** පෙර කියන ලද පරිදිම මෙහි අර්ථය දතයුතුයි.

යෙන උරුවෙලා සෙනානිගමෝ යන මෙහි උරුවෙලා මහත් වූ වැලි රැස (ගොඩ) යන අර්ථයි. නොහොත් **උරු** යන්නෙන් වැලි කියයි. **වෙලා** යන්නෙන් සීමාව කියයි. සීමාව ඉක්මවීමෙන් ගෙන එන ලද වැලි උරුවෙලා යි මෙහි අරුත් දතයුතු. බුදුන් උපදින්නටත් පෙර ඇත අතීතයේ දස දහසක් කුල පුත්‍රයෝ තවුස් පැවිද්දෙන් පැවිදිව එම ප්‍රදේශයෙහි වාසය කරන්නේ, එක් දවස් සියලු දෙන රැස් වී කතිකාවක් ඇතිකර ගත්හ. කයින් කරන ක්‍රියා සහ වචනයෙන් කරන ක්‍රියා (කිම්) අන්‍යයන්ට ප්‍රකට වෙති. සිතින් කරන ක්‍රියා ප්‍රකට නොවේ. එහෙයින් යමෙකුට කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක පහළ වුවහොත් ඔහුට අනික් චෝදකයෙක් නැත. හෙතෙම තම තමන්ම චෝදනා කර ගනිමින්, පාත්‍රය පුරවා වැලි ගෙනවුත්[1] (කොළ ගොටුවකින් වැලි ගෙනවිත්) මෙතැන්හි විසුරුවා හළයුතුය. මෙය ඔහුම ඔහුටම කරගන්නා දඬුවමයි. එතැන් පටන් යමෙකුට එබඳු විතර්කයක් පහළ වූයේද, හෙතෙම එහි වැලි විසුරුවයි. මෙසේ එහි ක්‍රමයෙන් වැලි රැසක් විය. ඊට පසුව පශ්චිම ජනයා පරිකම්පෙත්වා - චටකොට (චෛත්‍ය ස්ථානයක්) පූජනීය ස්ථානයක් කළේය. ඒ සඳහා **උරුවෙලා** යයි කියන ලදී. මහත් වූ සමූහය, මහා වැලි රැස යන අර්ථයි. ඒ සඳහාම කියන ලදී. තව ද, උරු යනු වැලි වලට නමකි. වෙලා යනු සීමාවයි. සීමාව ඉක්මවා වැලි ගෙන එන ලද හෙයින් උරුවෙලා යන අර්ථය වීයයි මෙසේත් අර්ථ දතයුතු.

---

1. ඈත අතීතයේ සාමණේරවරුන් වැරදි කළවිට ඔවුන්ට ද වැලි දඬුවම් දුන් බව සාමණේර බණ දහම් පොත අනුව පෙනේ. එසේ වැලි ගෙනාවේ පාත්‍රයෙනි. තෙල් ගෙනාවේ පාත්‍රයෙනි.

සෙනානිගමෝ සේනාවගේ නියම්ගම, ප්‍රථම කල්පයෙහි දී එතැන සේනාවගේ නිවෙසය කඳවුර පිහිටියේල. ඒ පෙදෙස සේනානි ගමයයි කියයි. සෙනානිගාමෝ යනු ද පාඨයි. සේනානි යනු සුජාතාවගේ පියාය. ඔහුගේ නියම්ගමය යන අර්ථයි. **තදවසරි** එහි ගියෙමි. **රමණීයං භූමිභාගං** සිත්කළු වූ බිම් පෙදෙස, මනාව පිපුණු නොයෙක් වර්ණ වූ ගොඩ හටගන්නා මලින් විසිතුරු වූ මනරම් බිම් පෙදෙස, **පාසාදිකංච වනසණ්ඩං** මොනරපිල් කලප් හා සමාන වූ ප්‍රසාදය උපදවන්නා වූ නිල්වන් වන පෙදෙස දුටුවේය. **නදිඤ්ච සන්‍දනති** ගලා බසින්නා වූ නිල් මැණිකක් සමාන වූ පිරිසිදු වූ සීතල වූ නිල් දියදහර ඇති නේරංජරා නදිය ද දුටුවේය. **සෙතකං** පිරිසිදු වූ මඩ රහිත වූ, **සුපතිත්ථං** පිළිවෙළින් ගැඹුරු වූ සුන්දරව පිහිටියා වූ තොටුපල ඇති, **රමණීයං** රිදීපටක් හා සමානව විසිරුණු වැලි ඇති බොහෝ මස් කැසුබුවන් ඇති, මන වඩන දැකුම් ඇති, **සමනන්තාච ගොචර ගාමං** හාත්පස නො දුරෙහි ගමන් පහසුකම් ඇති, පැමිණි පැවිද්දන්ට සුලභ ආහාරපාන ඇති ගොදුරුගම දුටුවේය. **අලං වත** ඒකාන්තයෙන්ම සුදුසුය. **තත්‍රේව නිසීදිං** බෝ පලඟ හිඳීම සඳහා කීය. උපරි සූත්‍රයෙහි තත්‍රේව යන්නෙන් දුෂ්කර ක්‍රියා ස්ථානය අදහස් කර ඇත. මෙහි වනාහි බෝ පලඟ ස්ථානය අභිප්‍රේතයි. මේ වනාහි බෝ පලඟයි. **තත්‍රේව නිසීදි** යන්න එහෙයින් කිහ. **අලමිදං පධානාය** මෙතැන පධන් වීර්යය වැඩීම සඳහා සුදුසුයයි සිතා හුන්නෙමි යන අර්ථයි.

අජඣගමං ලැබීම්, **ඤාණඤ්ච පන මෙ දස්සනං** සියළු ධර්මයන් දැකීමෙහි සමර්ථ වූ සර්වඥතාඥානය පහළවිය. **අකුප්පා මෙ චෙතො විමුත්ති** මාගේ අර්හත්ඵල විමුක්තිය, අකෝප්‍ය බැවින් ද, අකෝප්‍ය වූ අරමුණු ඇති බැවින් ද අකෝප්‍යය, ඕ විමුක්ති රාගාදියෙන් නො කිපේනුයි අකෝප්‍ය වේ. අකෝප්‍ය වූ නිවන අරමුණු වී ඇති බැවින් ද අකොප්‍යාලම්බණ බැවින් ද අකුප්පා නම් වේ. **අයමන්තිමා ජාති** මේ සියල්ලට පසුව එන අන්තිම ජාතියයි. **නත්ථිදානි පුනබ්භවො** දැන් නැවත මට අලුත් ප්‍රතිසන්ධියක් නම් නැත්තේමය. මෙසේ ප්‍රත්‍යවේක්ෂා ඤාණය මට උපන්නේයයි දක්වයි.

අධිගතො ප්‍රතිවේධ කරන ලද, අවබෝධ කරන ලද, **ධම්මො** චතුරාර්ය සත්‍ය ධර්මයි. **ගම්භීරො** ගැඹුරුය. දුරවබෝධය. මේ ප්‍රකට බවට විරුද්ධ වචනයි. දුදකෙ ගැඹුරු බැවින්ම දුකසේ දැකිය යුතුය.

පහසුවෙන් දක්නට නො හැකිය. **දුරනුබොධො** දුකසේ අවබෝධ කළයුතුය. **සනෙතා නිවුණොය.** **පණීතො** අතෘප්තිකරය. මේ වචන දෙක ලෝකෝත්තර තත්ත්වය සඳහාම කියන ලදී. අතකකාවචරො තර්කයෙන් බැසගත යුත්තේ, පැමිණිය යුත්තේ අවබෝධ කරගත යුත්තේ නොවෙයි. නුවණින්ම අවබෝධ කළයුතුය. **නිපුණො** සිලුටුය. **පණඩිත වෙදනීයො** සම්‍යක් ප්‍රතිපත්තියට පිළිපන් නුවණැත්තන් විසින්ම දත යුත්තේය.

ආලයරාමා සත්ත්වයෝ පස්කම් ගුණයන්හි ඇලී පවතිත්. එහෙයින් ඒ පස්කම් ගුණයෝ ආලය නමැයි කියනු ලැබේ. එකසිය අටක් වූ තෘෂ්ණා විචරිතයෝ අලවති. එහෙයින් ආලය යයි කියනු ලැබෙති. ඒ තෘෂ්ණා සංඛ්‍යාත ආලයෙහි හැසිරී ක්‍රීඩාකරන තේරුමින් ආලයරාමා නම් වේ. ආලයෙහි ඇලෙනේනුයි **ආලයරතා** නම් වේ. ආලයන්හි මනාකොට මුදිත (සතුටු) වූයේ නුයි ආලය **සමුදිතා** නම් වේ. එසේම යි. යම්සේ මනාව මල් පිපුණු පලබරින් යුතු වූ රුක්පෙළකින් සමන්විත උයනකට පිවිසි රජ කෙනෙක් ඒ උයනේ සම්පත් දැක එහි ඇලේද, අතිශයින් සතුටු වී ප්‍රමෝදිතව, ප්‍රීතිමත්ව, උකටලී නොවී සවස ආපසු නික්ම යන්නට ද අකැමති වේද, එපරිද්දෙන් කාමයෙහි ද තෘෂ්ණාවෙහි ද සත්ත්වයෝ ඇලෙති. සංසාර වෘතයෙහි අතිශයින් සතුටු වී උකටලී නොවී වසත්. එහෙයින් ඔවුන්ට භාග්‍යවතුන් වහන්සේ දෙවදෑරුම් වූ ආලය උද්‍යාන භූමියක් මෙන් දක්වමින් ආලයරාමා යනාදිය කීහ.

යදිදං යනු නිපාතයෙකි. ඔහුගේ ස්ථානය සඳහා **යං ඉදං** යන්නද, පටිච්ච සමුප්පාදය සඳහා **යො ඉදං** යන්න ද යොදන ලදැයි අර්ථ දතයුතුයි. **ඉදප්පචචයතා පටිචච සමුපපාදො** මොවුන්ගේ ප්‍රත්‍යය ඉදප්පචචයා, **ඉදප්පචචයා** එව **ඉදප්පචචයතා** මොවුන්ගේ ප්‍රත්‍යයෝම ඉදප්පචචය නම් වෙයි. ඉදප්පචචයතා වූයේ ද පටිච්ච සමුප්පාද වූයේ ද හේ නුයි **ඉදප්පචචයතා පටිචච සමුපපාද** නම් වේ. සංස්කාරාදීන්ට ප්‍රත්‍ය වූ අවිද්‍යා ආදීන්ට මේ නමයි. **සබබසංඛාර සමථො** යනාදී සියල්ල නිර්වාණයම වේ. යම්හෙයකින් ඒ නිවනට පැමිණ සියලු සංස්කාර විප්ඵන්දිතයෝ සන්සිඳෙත් ද වෙසෙසින් සන්සිඳෙත්ද ව්‍යපසමනය වේද එහෙයින් **සබබසංඛාර සමථො** යයි කියන ලදී. යම්හෙයකින් නිවනට පැමිණ සියලු උපධීහු දුරලනු ලද්දාහු වෙත්ද, සියළු තෘෂ්ණාවෝ ක්ෂය වෙත්ද, සියලු ක්ලේශ රාගයෝ නොඇලෙත් ද, සියළු දුක්වලින් මිදෙන්නේද එහෙයින් **සබබූපධි පටිනිසසගෙගා තණහකඛයො විරාගො නිරොධො**

යයි කියයි. ඒ තෘෂ්ණාව වනාහි භවයෙන් භවය ඵලය සමග හෝ කර්මය සමග හෝ ගළපයි. විශේෂයෙන් ගළපන්නේ වාන යයි කියයි. ඒ වාන යෙන් නික්මෙන්නේය යන අරුතින් **නිබ්බාන** යයි කියති.

සො මමස්ස කිලමථො නො දන්නවුන්ට යම් දේශනාවක් නම් එය මට විඩාවක් ක්ලාන්ත බවක් වෙහෙසක් ගෙන දෙන්නේය යන අර්ථයි. කාය කිලමථයක් කයට වෙහෙසක් වන්නේයයි කියන ලදී. එහෙත් බුදුවරයන්ගේ සිතෙහි මේ දෙකම නැත. **අපිසද්‍ද** අනුබ්‍රූහනාර්ථයේ නිපාතයි. හුදෙක් ඒ සිතම වූයේ නොවේ. මේ ගාථා වැටහුනේ යයි අවබෝධ වූයේ යයි දක්වයි. **මං** යනු මට, **අනචජරියා** - අනු + අච්ඡරියා අතිශයින් පුදුම සහගත වූ. **පටිභංසු** ප්‍රතිභාන සංඛ්‍යාත නුවණට ගොදුරු වූහ. විමසිය යුතු බවට පැමිණියාහුය.

කිලෙජන දුකසේ, දුක් සහිත වූ ප්‍රතිපදාව. බුදුවරුන්ට දුක් ප්‍රතිපදාවක් නැත. සතර මාර්ගයෝම සුඛ ප්‍රතිපදාම වෙති. පෙරුම් පුරන කාලයෙහි රාග දෝස මෝහ සහිතවම ආ ආ යදියන්ට ලස්සනට සරසන ලද හිස ගලවා ගල ලෝහිතය බැහැරකොට (දුන්හ) මනාව අඳුන් ගල්වන ලද ඇස් උගුලුවා (දුන්හ) කුලවංශය බබළවන්නට සිටි දූ දරුවන්, මන වඩන්නා වූ භාර්යාවරුන්, (දුන්හ) මෙසේ දෙන්නහුගේ අනෙක් ක්ෂාන්තිවාදී ආත්ම භාවයන්හි සිඳුම් බිඳුම් ආදියට පැමිණෙන්නහුගේ පැමිණ පිළිවෙළ සඳහා මෙය කියන ලදී. **හලං** මෙහි හකාරය නිපාතයක් පමණි. අලං - කම් නැත යන අර්ථයි. **පකාසිතුං** දේශනා කරන්නට මෙසේ අධිගමනය කරන ලද ධර්මය දේශනා කම් නැත. දේශනා කිරීමෙන් කවර ප්‍රයෝජනද, **රාග දොස පරෙතෙහි** රාග ද්වේෂයන් ස්පර්ශ කරන ලද්දවුන් විසින් නැතහොත් රාග ද්වේෂ අනුව ගියවුන් විසිනි.

පටිසොතගාමිං අනිත්‍ය, දුක්ඛ-අනාත්මය, නිත්‍යයයි ගත් නිත්‍යාදීන්ගේ ප්‍රතිශෝතයට ගිය චතුරාර්ය සත්‍ය ධර්මය **රාගරත්තානි** කාමරාග, භවරාග දෘෂ්ටි රාගයන්හි ඇලුණාහූ **නදක්ඛිනති** අනිත්‍ය දුක්ඛ අනාත්ම අශුභයයි ස්වභාවයයෙන් නො දකිත්. එසේ නො දක්නා ඔවුන්ට මෙය පිළිගන්වන්නට කවුරුනම් සමත් වේද? **තමොකඛන්ධෙන** ආවටා අවිද්‍යා රාශියකින් වෙළුනාහූ අවිද්‍යා රාශියකින් පැතිරෙන ලද්දාහූ,

අපෙපාසුක්කතාය උත්සාහ රහිත බැවින්, නො දෙසනු කැමති

බැවින් යන අර්ථයි. කුමක් හෙයින් මෙසේ උන්වහන්සේගේ සිත නැමුනේද? (ශාස්තෘන් වහන්සේ) මිදුනේ මුදවන්නෙමි එතෙර වූයේ එතෙර කරවන්නෙමි.

කිමෙම අඤ්ඤාත වෙසෙන - ධම්මං සච්ඡිකතෙ නිධ
සබ්බඤ්ඤුතං පාපුණිත්වා - තාරයිසසං සදෙවකෙ

මේ ශාසනයෙහි භික්ෂුවක් අප්‍රකට වේශයෙන් සිව්සස් දහම් ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ ද, මා විසින් කවර ප්‍රයෝජන ද, සර්වඥ බවට පැමිණ දෙවියන් සහිත වූ සත්ත්වයන් එතෙර කරවන්නෙමි යි පෙරුම් පුරා සර්වඥ බවට පැමිණියේ නොවේද, ඇත්ත එයයි. එහෙත් ප්‍රත්‍යවේක්ෂානුභාවයෙන් මෙසේ සිත නැමුනේය. සර්වඥ බවට පැමිණ, ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ උන්වහන්සේට සත්ත්වයන් කෙලෙස් බර ද, ධර්මයේ ගැඹුරු බව ද සර්වප්‍රකාරයෙන් ප්‍රකට වූයේය. එකල්හි උන්වහන්සේට මේ සත්ත්වයෝ කැඳ පිරුණු ලබුකබල් මෙන් ද, මෝරු පිරුණු හැළි මෙන් ද, වුරුණුතෙල් උරාගත් රෙදි කැබලි මෙන් ද, අඳුන් වැකුණු අතක් මෙන් ද, ක්ලේශ භරිතයහ. ඉතාම සංකීර්ණයහ. රාගයෙන් රත් වූවෝය. ද්වේෂයෙන් දූෂිත වූවෝය. මෝහයෙන් මුලා වූවෝය. ඔවිහූ කුමක්නම් අවබෝධ කරන්නහුද යනුවෙන් සිතන්නහුට, සත්ත්වයෝ කෙළෙස් ගහණ බව නැවත නැවත සිහිපත් වන්නේ මෙසේ සිත නැමුණේය.

මේ ධර්මය තෙමේ පෘථුවි සන්ධාරක පෘථුවිය දරා සිටින ජලස්කන්ධය මෙන් ගැඹුරුය. පර්වතයකින් ඇති අබ ඇටයක් මෙන් දැකීම අපහසුය. සියවරක් පලන ලද අස්ලොමක කෙළවරයන් කොනින් කොන ගැලපීම මෙන්, අවබෝධ කිරීම අපහසුය. මේ ධර්මය අවබෝධ කරගනු සඳහා උත්සාහ ගන්නා වූ මා විසින් නො දුන් දනක් නම් නැත. නොරැකි සීලයක් නැත. නො පිරූ කිසියම් පාරමිතාවක් නැත. ඒ (පාරමීදම් බලයෙන්) නිරුත්සාහයෙන් මාරබලය පරාජය කරන කල්හි කම්පා නොවූ පොළව, ප්‍රථම යාමයෙහි පෙර විසූ කඳපිළිවෙල දන්නා නුවණ අවබෝධ කරත්. කම්පා නොවූ පොළව, මැදුම්යම දිවැස් නුවණ අවබෝධ කරගනිත්ම කම්පා නොවූ පොළව පැසුළුයම හේතුඵල ධර්මය (පටිච්ච සමුප්පාදය) අවබෝධ කරත්ම දස සහශ්‍රී ලෝකධාතුව කම්පා විය. මෙසේ මා වැනි තියුණු නුවණැත්තෙකු විසින් ද දුකසේ ම මේ ධර්මය අවබෝධ කරගත්තේය. එසේ වූ කල ලෞකික (පෘථග්ජන) මහජනයා කෙසේ

අවබෝධ කරගනිත්ද, ධර්මයේ ගැඹුරු බවම නුවණින් සිතා බැලීමේ ආනුභාවයෙන්ම මෙසේ සිත නැමුණේයයි දතයුතුය. මගේ සිත අල්පෝත්සුක භාවයට (ධර්මචක්‍රය පැවැත්වීමට පසුබැසීමට) සිත නැමෙන කල්හි මහා බ්‍රහ්ම තෙමේ ධර්ම දේශනාවට යාඥා කළේය. මේ සත්ත්වයෝ මහා බ්‍රහ්මයාට ගරු කරන්නෝ ය. මහා බ්‍රහ්මයා අදහන්නෝ ය. දහම් නො දෙසීමට භාග්‍යවතුන් වහන්සේ පසුබැස සිටිනවිට, මහා බ්‍රහ්මයා උන්වහන්සේට ආරාධනා කොට දහම් දෙසීමට උත්සාහවත් විල. (මේ සිතිවිල්ල ජනයා අතර පැතිර ගියේය) ඒකාන්තයෙන් මේ ධර්මය ශාන්තය. ප්‍රණීතයයි සිතමින් ජනයා අසනු කැමති වන්නේ යයි දන්නා සේක. මේ කාරණය නිසා ද ධර්මය දේශනා කිරීමට අල්ප උත්සාහ ඇත්තේ වීයයි දතයුතුය.

සහම්පතිසස හෙතෙම වනාහි කාශ්‍යප බුද්ධ ශාසනයෙහි සහක නම් ස්ථවිර විය. ප්‍රථමධ්‍යානය උපදවා ප්‍රථම ධ්‍යානයෙහි කල්පායුෂ්ක මහා බ්‍රහ්මව උපනි. ඔහු සහම්පති මහා බ්‍රහ්මයයි හඳුන්වති. බ්‍රහ්මුනො **සහම්පතිසස** යනු ඒ සඳහා කීයේය. **නසසති** වත ඔහුගේ මේ ශබ්දය දස සහශ්‍රී ලෝකධාතුවෙහි බ්‍රහ්මයෝ අසා සියලු දෙනම රැස්වූවාහ. **යත්‍රහිනාම** යම් ලෝකයෙක්හි නම්, **පුරතො පාතුරහොසි** ඒ දස දහසක් බ්‍රහ්මයන් සමග (තථාගතයන් සිටි තැනට) පහළ විය. **අපපරජකඛ ජාතිකා ප්‍රඥාමය** ඇසෙහි, අල්ප වූ ස්වල්ප වූ, රාග ද්වේෂ මෝහ රජස් මොවුන්ට ඇත්තේනුයි **අපපරජකඛජාතික** නම් වේ. **අසසවනතා** නො අසන බැවින්. **භවිසසනති** පෙර බුදුවරුන් කෙරෙහි දශ පුණ්‍යක්‍රියා වශයෙන් කරන ලද පළපුරුද්ද මුහුකුරා ගිය, මොවුන්, පියුම් හිරුරැස් කැමති වන්නාක් මෙන් දහම් දෙසුම්ම කැමති වෙමින් සතරපද ගාථාවසානයේ ආර්ය භූමියට බැස ගැනීමට සුදුසු වූවාහු කෙනෙකු දෙන්නකු නොව, නොයෙක් සියදහස් ගණනක් දහම් අවබෝධ කරන්නාහු වන්නෝය යයි දක්වයි.

පාතුරහොසි පහළ විය. **සමලෙහි චිනතිතො** කෙළෙස් සහිත ෂට් ශාස්තෘන් විසින් සිතන ලද, ඔවුන් වනාහි පළමුව ඉපිද මුළු දඹදිව කටු පතුරවන්නාහු මෙන් ද, විෂ ඉසින්නවුන් මෙන් ද, කෙළෙස්මල සහිත මිසදිටු දහම් පැතිරවූහ. **අවාපුරෙතං** මෙය විවෘත කරනු මැන. **අමතසස දවාරං** නිර්වාණයට දොර වන්නා වූ ආර්ය මාර්ගය, **සුණනතු ධමමං විමලෙනානු බුදධං** මේ සත්ත්වයෝ රාගාදී ක්ලේෂයන්ගේ අභාවය පිණිස සම්මා සම්බුද්ධයන් වහන්සේ විසින් දේසිත නිර්මල වූ චතුරාර්ය සත්‍ය

ධර්මය අසත්වායි ඉල්ලීමක් කරයි. සෙලො යථා පබ්බත මුද්ධ නිට්ඨිතො ඒකඝන වූ ශෛලමය වූ, පර්වතයක් මුදුනෙහි සිටිය එකකු මෙන්, එහි සිටිය කෙනෙකු දැකීම පිණිස ගෙළ දිගුකිරීම ආදී කටයුත්තක් නො කළ යුතු වේද තථූපමං ඒ ශෛල පර්වතයට බඳු උපමා ඇති, මේ වනාහි මෙහි කෙටි අදහසයි. යම්සේ ගල් පර්වතය මුදුනෙහි සිටියා වූම ඇස් ඇති පුද්ගලයෙක් භාත්පස පහළ ඉන්නා වූ ජන සමූහයා දකින්නේද, එපරිද්දෙන් ඔබ ද, සුන්දර වූ ප්‍රඥා ඇති, සර්වඥතා ඥානයෙන් හෙබි සමන්ත චක්ඛු වූ භාග්‍යවතුන් වහන්සේ ධම්මමයං - පඤ්ඤාමයං ධර්මමය වූ ප්‍රඥාමය වූ, ප්‍රාසාදයට නැගී තෙමේ පහ වූ ශෝක ඇති ශෝකයට බැස ගත්තා වූ ජාති ජරාවෙන් මඩනා ලද, ජන සමූහය අවෙක්ඛස්සූ බලනු මැනවි. පිරික්සනු මැනවි.

මේ වනාහි මෙහි අදහසයි. යම්සේ පර්වත පාදයේ භාත්පස මහත් වූ කුඹුරක් වපුරා, එහි ලියදි, පැල්පත් නිමවා රාත්‍රියෙහි ගිනි දල්වන්නාහුද, චතුරංග සමන්නාගත අඳුරක් එහි වන්නේද ඉක්බිති එම පර්වතය මත සිට බිම බලන්නා වූ ඇස් ඇති පුරුෂයකුට කුඹුර නො පෙනේ ද, එහි නිදිගත් මිනිසුන් නො පෙනේද, පැල් වළ ගිනිදැල් පමණක්ම පෙනේ ද, එපරිද්දෙන් දහම් නමැති පහයට නැගී සත්ත්ව සමූහයා බලන්නා වූ භාග්‍යවතුන් වහන්සේට, නොකළ කුසල් ඇති සත්ත්වයෝ එක වෙහෙර දකුණ දණමඬුලු පස උන්නේ නමුත් බුදු ඇසට හමු නොවෙති. රාත්‍රියෙහි විදින ලද ඊතල මෙන් වෙති. එහෙත් යම් කුසල් කළ වෙනේය පුද්ගලයෝ වෙත් ද ඔවුන් දුර සිටියේ නමුත් උන්වහන්සේගේ ඇස් හමුවට යොමු වෙති. ඔව්හූ ගින්න මෙන් ද හිමවත් පර්වතය මෙන් ද වෙති.

දූරෙ සන්තෙතා පකාසෙනති - හිමවන්තෙතාව පබ්බතො
අසන්තෙත්ථ න දිස්සනති - රත්ති ඛිත්තා සරා යථා

සත්පුරුෂයෝ දුර සිටියාහුද හිමාලය පර්වතය මෙන් ප්‍රකට වේ. මේ ලෝකයේ බාල පුද්ගලයෝ රාත්‍රියෙහි විදින ඊතල මෙන් නො පෙනෙති.

උටෙයහි දහම් දෙසීම සඳහා චාරිකාවෙහි සැරිසරන මෙන් භාග්‍යවතුන් වහන්සේට යාඥා කරයි. වීරා උත්සාහවන්ත බැවින් වීරනම් වෙති. දේවපුත්‍ර මාර, මෘත්‍යුමාර, ක්ලේශ මාරයන් දිනූ බැවින් විජිත

සංගාම වෙති. සසර තරණය කොට එතරවීම පිණිස වෙනෙය ජනයන් ගමන් කරවන බැවින්, මෙහෙයවන බැවින් සත්‍ථවාහ නම් වෙති. කාමච්ඡන්‍ද නමැති ණය නැති බැවින් අනණෙ යි දතයුතුයි.

අජෙඣඣසනං යාඥාව, බුදධචකඛුනා ඉන්‍ද්‍රිය පරො පරියත්ති ඤාණය ආසයානුසය ඤාණය, මේ ඤාණ දෙක බුද්ධ චක්ඛු නම්. සර්වඥතාඥානය සමන්තචක්ඛු නම්. තුන්වැදෑරුම් මාර්ගඥාන, ධම්මචක්ඛු නම් වේ. අපපරජකෙඛ ආදී වශයෙන් කියන ලද පරිදි යම්කෙනෙකුගේ නුවණැසෙහි රාගාදී රජස් මද වේද ඔව්හූ අපපරජකඛ නම් වේ. යම් කෙනෙකුන්ගේ එය බොහෝ වේද ඔව්හූ මහා රජකඛ නම් වේ. යම් කෙනෙකුන් ගේ ශ්‍රද්ධාදී ඉන්‍ද්‍රියයන් තියුණු වේද ඔව්හූ තිකඛින්‍ද්‍රිය නම් වේ. යම්කිසි කෙනෙකුන්ගේ එය මෘදු වේද ඔව්හු මුදුන්‍ද්‍රිය නම් වේ. යම්කිසි කෙනෙකුන්ගේ ඒ ශ්‍රද්ධාදී ආකාර යහපත් වේද ඔව්හූ සවාකාර නම් වේ. යමෙක් තමන් කී කරුණු සලකත්ද, සුව සේ දක්වන්නට හැකිවේද, ඔව්හූ සුවිඤඤාපය නම් වේ. පරලොව පිළිබඳ භය දකින්නේද ඔව්හූ පරලොක වජ්ජ භය දසසාවී නම් වේ. මේ වනාහි මෙහි පෙළය.

උප්පලිනීයං උපුල් වනයෙක්හි, අනෙක් තන්හිද, මෙම ක්‍රමයම යි. අතෙතා නිමුගග පොසිනී යමෙක් ඇතුළත ගිලුනාහුට පෝෂණය වෙත් ද, උදකං අචචුගගම්ම තිට්ඨනති ජලය ඉක්මවා සිටිති. ඔවුන් අතුරෙන් යමෙක් ජලයෙන් මතු වී සිටියාහු ද, ඔව්හූ හිරු රැස් පහස කැමති වෙමින් සිටිති. අද පිපෙන්නාහුය. යමෙක් ජලය හා සම සමව සිටියාහුද ඔව්හූ හෙට පිපෙන්නාහුය. යමෙක් ජලයෙන් උඩට නො ආවාහුද, ඔව්හූ තෙවෙනි දවසේ පිපෙන්නාහුය. ජලයෙන් උඩට මතු නොවුනු තවත් සරෝග නෙළුම් ආදීහූ ඇත්තේය. ඒවා විකසිත නොවන සේ කුසුම් වූවාහුම වෙති. ඔව්හූ පෙළට නො ආවෝමය. එහෙත් මතුපිටට ගෙන ප්‍රකට කළ යුත්තාහුම යයි දක්වන ලදී.

ඒ සිව්වැදෑරුම් පුෂ්පයෝ යම්සේද එපරිද්දෙන්ම උගඝටිතඤ්ඤ, විපචිතඤ්ඤ, නෙය්‍ය, පද පරම යන සතර පුද්ගලයෝ වෙති. ඔවුන් අතරෙහි යම් කෙනෙකුට කියන ලද කල්හිම වහා අවබෝධ වේද, හේ උග්ඝටිතඤ්ඤ නම් වන්නේය. යම් පුද්ගලයකුට කෙටියෙන් කියන ලද්ද විස්තර කිරීමෙන් පසුව අවබෝධ වේද හේ විපටිතඤ්ඤ නම් වේ. දෙසීම් වශයෙන් ප්‍රශ්න උත්තර විචාරීම් වශයෙන් කලණ මිතුරන්ගේ සේවනයෙන් වඩාත් පැහැදිලි

කිරීමෙන් පසුව අවබෝධ වේද, මේ තැනැත්තා ඤෙය්‍ය නම් වේ. යම් පුද්ගලයෙකුට කොතෙක් කීවත්, කොතෙක් ඇසුවත, කොතෙක් පරිශීලනය කරත්, කොතෙක් දැරුවත් අවබෝධ නො වන්නේ නම් හේ පදපරම නම් වන්නේය.

එහි භාග්‍යවතුන් වහන්සේ උපුල් වනය සමානකොට දස දහසක් ලෝකධාතුව බලනසේක් අද පිපෙන මල් මෙන් උද්ඝටිතඥයන් ද, හෙට පිපෙන මල් මෙන් විපචිතඥයන් ද, තෙවෙනි දවසේ පිපෙන මල් මෙන් ඤෙය්‍ය පුද්ගලයන් ද, මස් කැසුබුවන් විසින් කන ලද මල් මෙන් පදපරමයන්ද දකින්නේ ය. එසේ දැකීමෙන් ම මෙතෙක් අල්ප රජස්කයෝය. මෙතෙක් මහා රජස්කයෝය. ඔවුන් අතරින් මෙතෙක් උද්ඝටිතඥයෝ යයි සියලු ආකාරයෙන් දුටු සේක. ඒ තුන් පුද්ගලයන්ට මෙම අත්බැව්හිදීම භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාවෙන් වැඩක්ම සිදුවන්නේය. පදපරමයන් අනාගතය සඳහා මගහෙළිවන්නේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ සතර පුද්ගලයන්ට සුව එළවන්නා වූ ධර්මදේශනාව දැන දෙසීමට කැමැත්ත උපදවා, නැවත තුන් භවයෙහි සියලු සත්ත්වයින් සුදුසු නුසුදුසු පරිද්දෙන් කොටස් දෙකක් කළේය. ඒ සඳහා කියන ලදී. යම්කිසි සත්ත්ව කෙනෙක් කර්මාවරණයෙන් යුක්ත වූවාහු ද යම්කිසි සත්ත්ව කෙනෙක් විපාකාවරණයෙන් යුක්ත වූවාහුද, යම්කිසි සත්ත්ව කෙනෙක් ක්ලේශාවරණයෙන් යුක්ත වූවාහු ද, සැදැහැ නැත්තෝ වන්නාහු ද, කුසලච්ඡන්ද රහිත වූවාහු ද, නුවණින් පිරිහුණාහුද, ආර්ය මාර්ගයට පිවිසීමට නුසුදුස්සන් වූවාහුද ඒ සියල්ලෝ නුසුදුස්සෝමය. එසේනම් සුදුස්සෝ කවරහුද? යම්කිසි සත්ත්ව කෙනෙක් කර්මාවරණයෙන් යුක්ත නොවූවාහු ආදීන් වෙත්ද ඒ සත්ත්වයෝ සුදුස්සෝ වෙති. ඒ සියලු පුද්ගලයන් අතුරෙන් නුසුදුසු පුද්ගලයන් හැර සුදුසු පුද්ගලයන් නුවණින් සලකා බලා, මෙපමණ දෙනෙක් රාග චරිතයෝය. මෙපමණ දෙනෙක් මෝහ චරිතයෝය. විතර්ක, ශ්‍රද්ධා බුද්ධි චරිතයෝ යයි කොටස් සයකට බෙදා, දහම් දෙසන්නෙමි යයි සිතූ සේක.

පවවභාසිං පෙරලා කීමි. අපාරුතා විවෘත වූවාහු, අමතසසදවාරා ආර්ය මාර්ගයෙහි දොරටුව අමෘත සංඛ්‍යාත වූ නිර්වාණ මාර්ගයේ දොර, මා විසින් විවෘත කර තබන ලද්දේ යයි දැක්වෙයි. **පමුඤ්චනතු** සඳධං සියල්ලෝ තමන්ගේ ශ්‍රද්ධාව පමුණුවත්වා. විහිදුවත්වා. පසු පාඨ

දෙක්හිද අර්ථය මෙසේමයි. මම වනාහි පුහුණු කළා වූ යහපත්ව පැවැත්තා වූ මේ ප්‍රණීත වූ උතුම් ධර්මය කයට හා වචනයට වෙහෙසය යන හැඟීමක් ඇතිව නොදෙසීමි. දැන් වනාහි සියලු ජනයා සැදැහැ නමැති බඳුන පමුණුවාවා, එළවාවා. ඔවුන්ගේ සංකල්පය අදහස පුරවන්නෙමි.

තසස මයහං භික්ඛවෙ එතදහොසි මහණෙනි එවේලේ මට මේ සිත විය. **කසසනුඛො අහං පඨමං ධම්ම දෙසෙය්‍යනති** මේ ධර්මය දෙසීම පිළිබඳව විතර්කයක් (අපැහැදිලි අවිනිශ්චිත තත්වයක්) පහළවිය යන අදහසයි. කවර කලෙක මෙය උපන්නේද, බුදු වී අටවෙනි සතියේය. මේ එහි පිළිවෙළ කථාවයි. බෝසතුන් වනාහි ගිහිගෙයින් වෙන්වීමේ දිනයෙහි විවෘත කරන ලද අන්තඃපුරය දැක සංවේගයට පත් හදින් යුතුව, කන්ථක රැගෙන එන්නැයි ඡන්නට නියමකොට, ඡන්නයන් සහාය කොටගෙන නගරයෙන් නික්මී, කන්ථක නැවතුනු තැන් දක්වා තුන් රාජ්‍යයක් ඉක්මවා අනෝමා ගංතෙර දී පැවිදි වී පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙන්නේ රජගහනුවර පිඬු පිණිස හැසිර පාණ්ඩව පර්වතයෙහි වැඩ හුන්නේ මගධ රාජේශ්වරයා විසින් නම් ගොත් විචාරා, මේ රාජ්‍යය විචාරවයි, මහරජ කම් නැත. මට රජයෙන් වැඩක් නැත. මම රජකම හැරදා ලොවට හිතවැඩ පිණිස ප්‍රධන් වීර්යයෙහි යෙදී, ලෝකයේ හරන ලද රාගාදී කෙලෙස් ඇති බුදු කෙනෙක් වන්නෙමියි නික්ම ආවෙමි. එසේ වීනම් බුදු වැ පළමුව මගේ රාජ්‍යයට වැඩමවනු යන ආරාධනය පිළිගන්නා ලද්දේ, කාලාම හා උද්දක තවුසන් වෙත එළඹ ඔවුන්ගේ ධර්මදේශනාවන්හි සාරයක් නොවිඳින්නේ එයින් නික්ම උරුවෙලාවෙහි සය වසරක් දුෂ්කරක්‍රියා කළත්, නිවන අවබෝධ කරන්නට නොහැකි වූයෙන් සාමාන්‍ය පොදු ආහාර ගැනීමෙන් ශරීරය සන්තර්පනය කළෙමි.

එකල උරුවෙල් ගම සුජාතා නම් සිටු දියණිය එක් නුගරුකක් මුලදී ප්‍රාර්ථනාවක් කළාය. ඒ මම සමජාති ගැලපෙන කුලයක කුල ගෙයකට ගොස් පළමු ගැබ පුතකු ලබම්ද, බලිකර්මයක් කරන්නෙමි. ඇගේ ඒ ප්‍රාර්ථනාව ඉටුවිය. වෙසක් පුණු පොහෝ දින උදෑසනම ඒ බලිකර්මය (භාරය ඔප්පු) කරන්නෙමැයි රැ අළුයම් කල කිරිබත් පිළියෙල කළාය. එම කිරිබත පැසෙන කල්හි මහත් මහත් බුබුළු නැඟී දකුණට කරකැවෙමින් පවතී. එක් බිඳකුදු උතුරා නොයයි. මහබඹු (කිරිබතට) කුඩය ඉසිලීය. ලෝකපාලක සිව් දෙවියෝ කඩු ගෙන රැකවරණ සැලසූහ. ශක්‍රයා දර දමමින් ගිනි ඇවිලවීය. දෙවිවරු සිව් දිවයින්හි ඕජා රැස්කොට

කිරිබතෙහි බහාලූහ. බෝසත් තෙමේ පිඬුසිඟා යන වේලාව බලමින්, හිමිදිරියේම රුක්මුල වාඩිවිය. රුක්මුල පිරිසිදු කිරීම පිණිස ගිය කිරිමව ආපසු පැමිණ සුජාතාවට මෙසේ දැන්වූවාය. ඔබේ දේවතාවා රුක්මුල සිටී. සුජාතා සියලු අබරණ පැළඳ ලක්ෂයක් අගනා රන්තලියක කිරිබත් වඩා තවත් රන් පියනකින් වසා, ඔසවාගෙන ගොස් බෝසත් තවුසා දැක තැටිය සමගම අතැ තබා වැඳ යම්සේ මාගේ මනදොළ සපුරා ගියේද එසේම ඔබගේ මනදොළ ද සපිරේවායි පතා නික්ම ගියාය.

බෝසත් තෙමේ නේරංජරා ගංඉවුරට ගොස් රන්තලිය ඉවුරෙහි තබා දිය නා ගොඩට විත් පිඬු හතලිස් නවයක් කොට කිරිබත් වළඳ, අද මා ඒකාන්තයෙන් බුදුවන්නේ නම් මේ තලිය ගඟේ උඩුඅතට යේවායි 'ගඟ දියට දැමීය. තලිය ටිකදුරක් උඩුගං බලාගොස් නැවතී කාලනාග රාජයාගේ භවනට ගොස් තුන් බුදුවරුන්ගේ තලිවලට උඩින් පිහිටියේය.

මහසත් තෙමේ වනලැහැබෙහි දී දවල් දවස ගෙවා සවස් වරුවෙහි සොත්ථික බමුණා විසින් දුන් තණමිටි අට රැගෙන බෝමැඩට නැඟී දකුණු පැත්තේ සිටියේය. ඒ පෙදෙස නෙළුම් කොළයකට වැටුණු දියබිඳක් මෙන් කම්පා විය. මහසත් තෙමේ මේ ප්‍රදේශය මගේ ගුණ දරන්නට අපොහොසත් යයි බටහිර .පැත්තට ගියේය. ඒ පැත්ත ද එසේම කම්පා විය. ඉක්බිතිව උතුරු පැත්තට පිවිසියේය. ඒ පැත්තද ඒසේමය. අනතුරුව නැගෙනහිර පැත්තට ගියේය. එහි පර්යංකය පිහිටන කොටස මනාව පිහිටුවන ලද ඉන්ද්‍රඛීලයක් මෙන් ස්ථාවර විය. මහා සත්ත්වයෝ මේ තැන සියලු බුදුවරුන් කෙළෙස් පඳුරු උදුරා හළ ප්‍රදේශය යයි, සියලු තණමිටි අගින් ගෙන සැළීය. ඒවා සිත්තරෙකු විසින් තෙලිතුඩින් රූපවත් කලක් මෙන් පිහිටියේය. බෝසත් තෙමේ, බුදුබවට නො පැමිණ මේ අසුනින් නො නැගිටින්නෙමියි, සිව්රඟ වීර්යය අධිෂ්ඨාන කොට පර්යංකයට නැඟී උන්නේ ය.

එකෙණෙහිම මාර තෙමේ අත් දහසක් මවා, යෙළ සියයක් යොදුන් ප්‍රමාණ ගිරිමෙවුල් නම් ඇතුපිට නැඟී, නව යොදුනක් වූ මාර බලයක් ගෙන, අඩඇසින් බලමින් පර්වතයක් මෙන් යටපත් කරමින් එළඹියේය. මහසත් තෙමේ දස පාරමිතාවන් පුරන්නා වූ මට කිසිදු ශ්‍රමණයෙක්, බ්‍රාහ්මණයෙක්, දෙවියෙක්, මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් අහලකවත් සාක්ෂියට නො සිටියේය. වෙස්සන්තර ආත්ම භාවයෙහි පමණක් මා විසින් සත්

තැනෙකදී සත් වරක් මහාපොළව සාක්ෂි විය. දැනුදු මේ සිත් පිත් නැති, වියලි දඬු කඳක් වැනි මහපොළවම සාක්ෂි යයි අත දිගු කළේය. එකල්හි මහපොළව යකඩ පොල්ලකින් පහර දුන් කස්තළියක් (ලෝහ තලියක්) මෙන් සිය දහස් ගණනින් රාව ප්‍රතිරාව නංවමින් හඬා පෙරලෙමින් මාරසේනාව සක්වළ මුවවිට දක්වා පළවා හැරියේය.

මහසත් තෙමේ සූර්යයා අහසෙහි පෙනෙද්දීම මාර බලය පළවා හැර ප්‍රථම යාමයෙහි පෙර විසූ කඳපිළිවෙළ දන්නා නුවණ ලැබ, මැදුම් යට දිවැස පිරිසිදු කොට, පැසුළු යාමයෙහි හේතුඵල ඤාණයෙහි නුවණ බස්වා, වෘත්තය හා විවෘත්තය නැවත නැවත සිහි කරමින් හිරු නැගෙන අරුණෝදයේ දී ම බුදුවී මා විසින් නොයෙක් කප් කෝටි සිය දහස් කලක් මේ පලඟ සඳහා වෑයම් කරන ලද්දේය යයි සත් දිනක් එම පර්යංකයෙහිම වැඩ හුන්නේය.

එකල්හී ඇතැම් දේවතාවන් තුල කිමෙක්ද බුදුබැව් සිදුකරන තවත් ධර්මයෝ ඇත්දැයි සැක උපන. ඉක්බිතිවැ භාග්‍යවතුන් වහන්සේ දින අටක් ඉකුත්වීමෙන් සමාපත්තියෙන් නැගී සිට, දෙවියන්ගේ සැකය දැන, ඒ සැක දුරුකිරීම සඳහා අහසැ පැනනැගී යමක ප්‍රාතිහාර්යය දක්වා, ඒ සැකය දුරුකොට පර්යංකයෙන් මදක් පෙරදිග ඇසුරු කොට උතුරුදෙස සිට, සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරන ලද පාරමිතාවන්ගේ අවසාන ඵලයට පැමිණි තැන වූ පළඟ ද බෝ රුක ද ඇස්පිල්ලන් ගැසීමෙන් තොර වූ ඇසින් බලමින් සත්දිනක් කල් ගෙවීය. ඒ ස්ථානය අනිමිස චේතිය ස්ථානය නම් විය.

ඉක්බිති පලඟට ද සිටි තැනට ද අතර පෙරදිග ඇසුරුකොට පෑල දිගින් දික් වූ රුවන් සක්මනෙහි සක්මන් කරමින් සත්දිනක් කාලය යැවීය. එතැන රුවන් සක්මන් සෑය නම් විය. එයින් බටහිර පෙදෙසෙහි දෙවියන් විසින් රුවන් ගෙයක් මවන ලදී. එහි පලඟින් හිඳ අභිධර්ම පිටකය ද, විශේෂයෙන් එහි අනන්ත නය සමන්ත පට්ඨානය ද විමසමින් සත්දිනක් කල් ගෙවීය. එතැන රුවන්ගෙය සෑය යයි නම් විය.

මෙසේ බෝමැඩ අසලම සති හතරක් කල්ගෙවා, පස්වෙනි සතියෙහි බෝමැඩ සිට අජපාල නුගරුක වෙත වැඩම කළේය. එහිදී දහම් විමසම්න්ම, විමුක්ති සුවය විඳිමින් වැඩහුන්හ. මෙහි දහම් විමසන්නේ

අභිධර්මයෙහි න්‍යාය මාර්ගය සිහි කළේය. පළමුවැන්න ධම්මසංගණිපපකරණ නම්. නැවත විභංගපපකරණය, ධාතුකථා ප්‍රකරණය, පුග්ගල පඤ්ඤත්ති ප්‍රකරණය, කථා වත්ථුපපකරණය නම්. යමකය නම් නැවත මහා ප්‍රකරණය වූ පට්ඨානය මැයි.

එහි සිලුටු සිනිඳු වූ පට්ඨානයෙහි උන්වහන්සේගේ සිතෙහි බැසගත් කල්හි ප්‍රීතිය උපන්හ. ප්‍රීතිය උපන්කල්හි ලේ පැහැපත් විය. ලේ පැහැපත් වූ කල්හි සිවිය පැහැපත් විය. සිවිය පැහැපත් වූ කල්හි පෙර කයින් කුළුගෙවල් පමණ වූ, බුදුරැස් පැන නැගී අහසෙහි පැන නැගුණි. එය සද්දන්ත ඇත්කුලයක් සෙයින් පෙරදිග අප්‍රමාණ සක්වළ පැන නැංගාහ. පැසුළුකයින් නැගී පැසුළු (බටහිර) දෙස ද, දකුණු දසරුවෙන් නැගී දකුණු දිසාවෙහි ද, වම් දසරුවෙන් නැගී උතුරු දිසාවෙහි ද, කෙළවරක් නැති චක්‍රවාටයන්හී පැන ගියාහුය. පා පියුමෙන් පබළුකුරු පැහැති රැස් නැගී මහපොළව විනිවිද, ජලකඳ දෙබෑකොට, වා කඳ පලාගෙන අජටාකාශය දක්වා නික්මුණේය. හිසින් මනාකොට පරිවර්තනය වෙමින් මැණික්දමක් මෙන් නීලවර්ණ රශ්මිය පැන නැගී සදෙව් ලෝ විනිවිද නවවිධ බඹතලයන් ඉක්මවා අජටාකාශයේ විහිදුනි. එම දවසෙහි අප්‍රමාණ වූ සක්වළයන්හී, අප්‍රමාණ වූ සත්ත්වයෝ සියළු දෙන රන්වන් වූහ. ඒ දවසෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙන් නික්මුණු ඒ රශ්මීහු අද දවසේ ද අනන්ත ලෝකධාතූන් කරා යන්නේ ම ය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ අජපල් නුගරුක මුල සත්දිනක් ගෙවා එයින් නික්මී සත්දිනක් මිදෙල් රුක මුල වැඩ උන්හ. උන්වහන්සේ වැඩහුන් ඇසිල්ලෙහිම මුළු සක්වළ ගැබ පුරවන්නාක් මෙන් අකාල මහා මේඝයක් ආරම්භ විය. එබඳු මහා වැස්සක් වූ කලී අවස්ථා දෙකක දී වසින්නේල. සක්විති රජෙක් රජ වූ කල්හි හා බුදුවරයෙක් බුදු වූ කල්හිද වේ. මේ බුද්ධ කාලයෙහි හටගත්තේය.

තව ද ඒ වැස්ස උපන් කල්හී මුචලින්ද නම් නා රජු මෙසේ සිතීය. මේ මේඝය භාග්‍යවතුන් වහන්සේ මාගේ භවනට, විමානයට පිවිසි කල්හිම උපන්නේ ය. උන්වහන්සේට ඉඳීමට ගෙයක් ලබන්නට වටින්නේය. හෙතෙමේ සත්රුවන්මය වූ පාසාදයක් නිමවීමට පුළුවන්කම තමන්ට ඇතත්, එසේ කළ කල්හී මට මහත්ඵල නොවන්නේ ය. දශබලධාරී වහන්සේට කයින් වතාවතක් කරන්නෙමියි මහා ආත්මභාවයක් මවා,

ශාස්තෘන් වහන්සේ දරණවැල් සතකින් වටකොට හිස මත්තෙහි පෙනය දැරීය. දරණවැල ඇතුළත ඉඩකඩ ලොහෝ පහය පමණ විය. කැමති කැමති ඉරියව්වකින් ශාස්තෘන් වහන්සේ ඉරියව් පවත්වනු මැනැවැයි නාරජුගේ බලාපොරොත්තුව විය. එහෙයින් මෙවැනි මහත් ඉඩකඩක් සැකසීය. මධ්‍යයෙහි රුවන් පළඟක් පනවන ලද්දේ වේ. මත්තෙහි රන්තරුයෙන් විසිතුරු කළ රැස් කළ මල් හා සුවඳ මල්දම් වියනක් විය. සතරකොන්හී සුවඳින් යුතු තෙලින් පහන් දල්වන ලදී. සිව්දෙස විවරකොට සඳුන් කරඬු සතරක් තැබ්බවීය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ එහි සත්දිනක් කල් ගෙවීය. එයින් මත්තෙහි සත්දිනක් රාජායතනයෙහි වැඩ හුන්නේය. රාජායතනයෙන් නික්ම අටවන සතියෙහි සක්දෙව්දුන් විසින් පිළිගන්වන ලද දැහැටි දඬුද, ඖෂධ වූ අරළු ද, වළඳ මුව සෝදා සතරවරම් දෙවිවරුන් විසින් පමුණුවන ලද, ගල්මුවා පාත්‍රයෙන් තපස්සුභල්ලිකයන් විසින් පිරිනමන ලද පිණ්ඩපාතය වළඳ ආපසු නැවත අවුත් අජපල් නුගරුකමුල වැඩහුන් බුදුනට, සියලු බුදුවරයන්ට පොදු වූ මේ විතර්කය පහළ විය.

එහි **පණ්ඩිතො** නුවණැති බවින් සමන්විත වූ, **බ්‍යත්තො** ව්‍යක්ත බවින් පරිපූර්ණ වූ, **මෙධාවී** තැනට උවමනා නුවණින් යුතු වූ, **අපපරජක්ඛ ජාතිකො** සමවතින් යටපත් කළ බැවින් කෙළෙස් දුරුකළ ස්වභාව ඇති අති පරිශුද්ධ සත්ත්වයෙකි. **අජානිසසති** සළකන්නේ ය. අවබෝධ කරන්නේය. **ඤාණඤ්ච පන මෙ මට** ද සර්වඥතාඥානය උපන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ වනාහි දේවතාවා කී පමණින් ම නිගමනයට නො පැමිණ තමන් ද සර්වඥතා ඥානයෙන් බලන්නේ මෙයින් සත්දිනක් මත්තෙහි කළුරියකොට ආකිඤ්චඤ්ඤායතනයේ උපදින බව දුටුයේය. ඒ නිසා **ඤාණඤ්ච පන දසසනං උදපාදි** යන්න කීහ. **මහාජානියො** සත් දිනක් ඇතුළත පත් වූ මාර්ගඵලයෙන් පිරිහෙන බැවින් මහත් වූ හානියක් මොහුට අත්වේනුයි මහාජානිය නම් වේ. අක්ෂණයෙහි (අයෝග්‍ය අවස්ථාවේ) උපන. එහි ගොස් දේශනා කරන ධර්මය අසන්නට ඔහුට ශෝත ප්‍රසාදය නැත. මෙහි දහම් දෙසන තැනට පැමිණීමට පාදය ද නැත. මෙසේ මහත් හානියක් වූ බව දක්වයි. **අභිදොස කාලකතොති** අර්ධ රාත්‍රියේ කළුරිය කළේ. **ඤාණඤ්ච පන මෙ මට** ද සර්වඥතා ඥානය උපන. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ දේවතාවාගේ වචනයෙහිම නො පිහිටා තමන් ද සර්වඥතා ඥානයෙන් බලන්නේ, උද්දකරාමපුත්‍ර

තෙමේ නේවසඤ්ඤා නාසඤ්ඤායතනයේ උපන් බව දුටුයේය. එහෙයින් මෙසේ කීහ. ඉතිරිය පෙර කී පරිදිමය.

බහුකාර බොහෝ උපකාර ඇති, පධානපහිතත්තං උපට්ඨහිංසු ප්‍රධන් වීර්යය සඳහා මෙහෙයවන ලද පුද්ගලයා වසන තැන මිදුල් ඇමදීමෙන් ද, පා සිවුරු ගැනීමෙන් ද, මුව සෝදන දිය දැහැටි දඬු ගෙන දීමෙන් ද, උපස්ථාන කරන ලද පංචවර්ගියෝ නම් කවරහුද?

රාමය, ධජය, ලක්ඛණය, මන්ත්‍රිය, යඤ්ඤය, භෝජය, සුයාමය, සුදත්තය යන මේ බමුණෝ අටදෙන, එකල්හි ෂඩ්වේදාංග ඇත්තාහූ වූහ. ඔව්හූ අංග ලක්ෂණ විද්‍යාව ප්‍රකාශ කළාහු වෙති.

බෝසතුන් උපන් දවස, සිහින පිළිගත්තා වූ, මහා පුරිස් ලකුණු පිළිගත්තා වූ ද, බමුණෝ අටදෙනෙක් වූවාහු ද ඔවුන් අතුරින් තිදෙනෙක් දෙවිධියක් ම ප්‍රකාශ කළහ. මේ ලකුණුවලින් යුත් තැනැත්තා ගිහිගෙයි විසුවොත් චක්‍රවර්ති රජ වේ. පැවිදි වුවහොත් බුදු වේ යනුවෙනි. ඔවුන් අතුරින් තිදෙනෙක් මන්ත්‍ර පදය ඉක්මවමින් ඔව්හූ තමන් ලත් පූර්ණ පාත්‍රය නැයින්ට විහිදා මේ මහා පුරුෂයා ගිහිගෙයි නො වසන්නේ ය. ඒකාන්තයෙන් ම බුදුවන්නේ යයි විතර්ක රහිතව බෝසතුන් උදෙසා ශ්‍රමණ ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූහ. ඔවුන්ගේ පුත්‍රයෝ යයි ද කියති. එය අර්ථකථාව ප්‍රතික්ෂේප කරයි. මොව්හූ තරුණ කාලයෙහිම බොහෝ මන්ත්‍ර දැන ගත්තාහුය. එහෙයින් ඒ බ්‍රාහ්මණයෝ ඇදුරුතන්හි තැබූහ. ඔව්හූ පසුව, අප විසින් අඹුදරුවන් පිළිබඳව අවුල, ආශාව බිඳ පැවිදි වන්නට නොහැකි වන්නේ යයි තරුණ කාලයේදී ම පැවිදි වී සිත්කළු වූ සෙනසුන් ඇසුරු කරමින් හැසිරුනාහ. එහෙත් කලින් කල පින්වත් මහා පුරුෂයාණන් මහාභිනිෂ්ක්‍රමණයෙන් නික්මුනේදැයි විමසා බලත්. මිනිස්සු තොපගේ මහා පුරුෂයා කොතැන්හි දක්නහුද? ඔහු මාලිගා තුනෙක තුන්වැදෑරුම් නළුනිළියන් මැද දෙවියකු මෙන් සම්පත් අනුභව කරතියි කියත්. එය අසා මෙතෙක් මහා පුරුෂයාගේ නුවණ බිහිකිරීම් බවට නොපැමිණියේ යයි අල්පෝත්සුකව කල්ගත කළහ.

කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ බහුකාරා ඛො මෙ පඤ්චවග්ගියා යයි කීවහුද? ඇයි? උපකාර ඇත්තවුන්ට ම ශාස්තෘහූ බණ කියත්ද? උපකාර නැත්තවුන්ට බණ නොකියද්ද? උන්වහන්සේ පුරුද්ද

වශයෙන්ම ආළාර කාලාම, උද්දකරාම තවුසන් ද බැලූහ. තව ද මේ බුද්ධ භූමියේ දී අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන් හැර පළමුකොට දහම් පසක් කරන්නට ප්‍රාර්ථනා කළ සමර්ථයෙක් නම් නැත. කුමක් හෙයින්ද? ඒ සඳහා උපනිශ්‍රය ඇති බැවිනි.

ඈත අතීතයේ පින් කරන කාලයේ සහෝදරවරු දෙදෙනෙක් වූහ. ඔව්හු එක්ව ගොවිතැන්බත් කළාහුය. එහි වැඩිමලාට එක් ශස්‍ය වාරයකදී නව වරක් අගසස් දන් දිය යුතුයයි කල්පනා විය. හෙතෙම වපුරන කල 'බීජගඟ' නම් අගසස් දන් දී, ගැබ් කල සහෝදරයා සමග සාකච්ඡා කළේය. බාලයා ගැබ්කල ගැබ් පලා දී තරුණ ගොයම් නසන්නට කැමැත්තේ දැයි කීහ. වැඩිමලා බාල සොහොයුරා තමන් අනුව නො පවත්නා බව දැන කෙත දෙකට බෙදා තමාගේ කොටසින් ගැබ් පලා කිරි බැහැරකොට ගිතෙල් සකුරු සමග යොදා දන් දුන්නේ ය. පැසෙන කාලයෙහි හබලපෙති කරවා දුන්නේ ය. කපන කාලයෙහි 'දායනගඟ' හා වේණි කිරීමෙහි දී 'වෙණගඟ' වශයෙන් ද, මිටි බැඳීම් කාලයෙහි දී 'කලාපගඟ' වශයෙන් ද, බලගඟ, බළ භණ්ඩගඟ, කොටයගඟ ආදී වශයෙන් එක් ශස්‍ය වාරයක දී නව වරක් අගසස් (අග්‍රශස්‍ය) දන් දුන්හ. බාලයා වනාහි නගා (උදධරිත්වා) වී රැගෙන ම දුන්නේ ය. ඔවුන් අතුරෙන් වැඩිමලා අඤ්ඤා කොණ්ඩඤ්ඤ ස්ථවිරයෝ වූහ. බාලයා සුභද්‍ර පරිබ්‍රාජකයා විය. මෙසේ එක් ශස්‍ය වාරයක දී නව වරක් අගසස් දන් දී ප්‍රාර්ථනා කර තිබූ බැවින් තෙරුන් හැර අන් කිසිවෙක් පළමුකොට ධර්මය අවබෝධ කරන්නට සමත් වෙනත් කෙනෙක් නම් නැත.

බහුකාරා ඛො මෙ පඤ්ච වග්ගියා මේ වනාහි උපකාර සිහිකිරීම් පමණකින් ම වදාරණ ලදී. **ඉසිපතනෙ මිගදායෙ** යනු මේ පෙදෙසෙහි බුදුවරුන් නූපන් වකවානුවල පසේ බුදුවරුන් ගන්ධමාදන පර්වතයෙහි සත්දිනක් නිරෝධ සමාපත්තියට සමවැදී කල්යවා සමාපත්තියෙන් නැගිට නාලිය දැහැටිවලින් දත්මැද, අනවතප්ත විලෙන් මුව සෝදා පා සිවුරු ගෙන අහසින් වැඩමවා මේ ස්ථානයේ බසින බැවින් ද, එහි දී සිවුරු පොරවා පිඬු පිණිස හැසිර කරන ලද බත්කිසෙන් පසුව මෙතැනින් ම ආපසු පිටත්වන බැවින් ද, ඍෂීහූ මෙහි බසින නිසා ද මෙතැනින් නගින නිසා ද 'ඉසිපතන' නම් විය. තව ද මුවන්ට අභය පිණිස දුන් හෙයින් 'මිගදාය' නමින් ද හඳුන්වයි. **ඉසිපතනෙ මිගදායෙ** යන්න එහෙයින් කියන ලදී. **අනතරාව ගයං අනතරාව බොධිං** ගයාවට ද බෝධියට ද

විවර වූ, පොදු වූ තුන්ගවු පමණ ප්‍රදේශය. බෝමැඩ සිට ගයාවට ගවු තුනෙකි. බරණැසට අටළොස් යොදුනෙකි. උපක තෙමේ බෝමැඩට ද ගයාවට ද අතරමග දී භාග්‍යවතුන් මුණගැසිණ. එහෙත් අන්තරාපදය යෙදුන බැවින් කර්ම වචන කරන ලදී. මෙබඳු තන්හී අක්ෂර චින්තකයෝ **අනන්තරා ගාමංච නදිංච යාති** මෙසේ එකම අන්තරා ශබ්දය යොදත්. එය දෙවෙනි පදය හා සම්බන්ධ කළයුතු වේ. නො යොදන කල්හි කර්ම වචන නො යෙදේ. මෙහි යෙදුම කියන ලදී. **අද්ධාන මග්ග පටිපන්නං** දීර්ඝ මාර්ගයට පිළිපන්නහු විභංග ප්‍රකරණයෙහි **අද්ධයොජනං ගච්ඡිසසාමීති භුඤ්ජිතබ්බං** යනුවෙන් වදාළ හෙයින් අඩ යොදුන ද අද්ධාන මාර්ගය වෙයි. ගයාවට බෝමැඩ සිට තුන් ගවුවෙකි.

සබ්බාභිභූ සියළු ත්‍රෛභූමික ධර්මය මැඩපවත්වා සිටියෙමි. **සබ්බවිදූ** සියලු චාතුර්භූමික ධර්මය අවබෝධ කළෙමි. **සබ්බසු ධම්මෙසු අනුපලිත්තෝ** සියලු ත්‍රෛභූමික ධර්මයන්හි ක්ලේශයන්හි නො ඇලීමෙන් යුක්ත වූයේ, **සබ්බං ජහෝ** සියලු ත්‍රෛභූමික ධර්මය හැර සිටියෙමි. **තණ්හක්ඛයෙ විමුත්තෝ** තණ්හාව දුරුකළ නිර්වාණයෙහි අරමුණ වශයෙන් නිදහස් වූයෙමි. **සයං අභිඤ්ඤායාති** සියලු චාතුර්භූමක ධර්මය තමන් විසින්ම දැන, **කමුද්දිසෙය්‍යං** අන් කවරෙක් මගේ ගුරුවරයා යයි කියම්ද? **නමෙ ආචරියෝ අත්ථි** ලෝකෝත්තර ධර්මයෙහි මට ආචාර්යවරයෙක් නැත. **නත්ථි මෙ පටිපුග්ගලෝ** මට වඩා උසස් පුද්ගලයෙක් නම් නැත. **සම්මා සම්බුද්ධෝ** යහපත් හේතු යුක්තීන් අනුව, චතුරාර්ය සත්‍යයන් තමන් විසින් ම අවබෝධ කරන ලද්දේ, **සීතිභූතෝ** සියලු කෙලෙස් ගිනි නිවීමෙන් සිහිල් වූයේ සියලු කෙලෙස්වලින් නිවුනු බැවින්, **කාසීන පුරං** යනු කසීපුරට, කාසි දේශයට **ආමඤ්ඡං අමත දුන්දුභිං** දම්සක් ලැබීම පිණිස අමාබෙරය ගසන්නෙමයි යම්.

අරහසි අනන්ත ජිනෝ යනු අනන්ත ජින යයි වන්ට සුදුසුය. **භූවෙය්‍ය පාවුසෝ** ඇවැත්නි මෙසේත් නම් වන්නේ ය. **පකක්කාමි වංගහාර** ජනපදයට ගියේය.

එහි එක මුවවැදි ගමකට ගොස් එහි වාසය කළේය. ජ්‍යෙෂ්ඨ මුව වැද්දා ඔහුට උපස්ථාන කළේය. ඒ ජනපදයෙහි බොහෝ සැඩ වූ මැස්සෝ සිටියහ. එකල්හි ඔහු එක් සැළියකින් වැසූහ. මුව වැද්දා මුවන් මැරීම සඳහා දුර පළාතකට යන්නේ, 'අපගේ රහතන් වහන්සේට නොපමාව

උවැටන් කරවයි' 'ජවා' නම් දුවණියට පවරා පුතුන් හා සහෝදරයන් සමග ගියහ. ඕ ඔහුගේ දියණිය දැකුම්කළු රුව ඇත්තී පිරුණු දසරුව ඇත්තේ වෙයි. දෙවන දවසෙහි උපක වැදි ගෙදරට ආවේ ඒ දැරිය සියළු ඇප උපකාර කොට වළඳන්නට එළඹියා දැක, රාගයෙන් මැඩුණු පැවතුම් ඇත්තේ අහර බුදින්නට නො හැකි වූයේ බඳුන පිටින්ම බත් රැගෙන තමන් වසන තැනට ගියේ ය. ආහාර බඳුන පසෙකින් තබා 'ජවා' ලදොත් ජීවත් වෙමි. නැතිනම් දිවි හරිමි යි නිරාහාරවම නිදා ගත්තේය. සත්වෙනි දවස මුව වැද්දා පැමිණ දුවගෙන් උපක පිළිබඳ තොරතුරු විමසීය. ඔහු එක් දිනක් ආ බවත්, ඉන්පසුව නො ආ බවත් ඕ කීවාය.

මුවවැදි තෙමේ ආ පයින්ම ඔහු වෙත ගොස් විමසන්නෙමි යි ඒ මොහොතේ ම ගොස්, කිම ස්වාමීනි! අපහසුව කුමක්දැයි දෙපා අතගාමින් ඇසීය. උපක තෙමේ තතනමින් එහා මෙහා පෙරළේ. ස්වාමීනි කියනු මැනවි. යමක් මා විසින් කළ හැකිනම් ඒ සියල්ල කරමි යි කීය. උපක තෙමේ ඉදින් 'ජවා ලැබේ නම් ජීවත් වෙමි. ඉදින් නො ලැබේ නම් මෙහිදීම මරණය උතුමැ'යි කීය. ස්වාමීනි, කිසියම් ශිල්පයක් දනී ද? නොදනිමියි කීය. ස්වාමීනි කිසිම ශිල්පයක් නො දැන ගිහිගෙයි වසන්නට නුපුළුවනැයි වැද්දා කීය. මම කිසි ශිල්පයක් නො දනිමි. එහෙත් ඔබගේ මස් කද ගෙන එන්නට හැකිය. මස් විකුණන්නට පුළුවන. මුව වැසි තෙම මෙය අපට ද ආධාරයක් වේයයි උතුරුසළුව දී ගෙට කැඳවාගෙන ගොස් දියණිය දුන්නේ ය. ඔවුන්ගේ සංවාසයෙන් ඈ පුතකු වැදුවාය. පුතාට සුභද්ද යයි නම් තැබීය. ජාවා තොමෝ පුතු හඬන කල්හි මස් අදින්නාගේ පුත නාඩං, මුව වැද්දාගේ පුත නාඩං යනාදිය කියමින් පුතු නළවයි. මෙයින් උපකට නිග්‍රහ කළාය. (උපක තෙමේ) සොඳුර, මා අනාථයෙකැයි නො සිතව. මට 'අනන්තජින' නම් යහළුවෙක් ඇත. මම ඔහු සමීපයට යන්නෙමි යි කීය. ජාවා මෙසේ මෙතෙම ලජ්ජා වේයයි නැවත නැවත කියයි. හෙතෙම එක් දිනක් නො දන්වාම මැදුම් දෙසට මුහුණ ලා ගමනට පිටත්විය.

ඒ වනවිට භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන මහා විහාරයේ වැඩවසයි. එකල්හි උන්වහන්සේ පළමුව භික්ෂූන් ඇමතූ සේක. 'යමෙක් අනන්තජින යයි විචාරමින් පැමිණියහොත් ඔහුට මා මුණගස්වනු'යි වදාළහ. උපක තෙමේ ද අනන්තජින කොහි වෙසේදැයි විචාරමින් පිළිවෙළින් සැවැතට පැමිණ, වෙහෙර මැද සිට 'අනන්තජින'

යන් කොහිදැයි විවාළේය. ඒ භික්ෂූහු ඔහු භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණවූහ. හෙතෙමේ ද භාග්‍යවතුන් වහන්සේ දැක මා හඳුනන්නහු දැයි ඇසීය. එසේය උපක, හඳුනමි. තෙපි (මෙතෙක් කල්) කොහි විසුවෙහිද? වහන්ස, වංගහාර ජනපදයෙහි ය. උපක මහලු වූයෙහිය. පැවිදි වන්නට හැකිවන්නෙහි ද? වහන්ස, පැවිදි වන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ ඔහු පැවිදි කරවා ඔහුට කමටහන් දුන්නේ ය. හෙතෙම කමටහන් වඩා අනාගාමී ඵලයෙහි පිහිටා කළුරිය කොට අවියෙහි උපන. උපන් කෙනෙහිම රහත්බවට පැමිණියේය.

අවියෙහි උපන් ඇසිල්ලේම සත්දෙනෙක් රහත්බවට පැමිණියාහුය. ඔවුන් අතුරෙන් මොහු එක් අයෙකි.

අවිහ බඹලොවට උත්පත්ති වශයෙන් පැමිණි භික්ෂූහු සත්දෙනෙක් අර්හත්ඵල විමුක්තියෙන් මිදුනාහු, රාග ද්වේෂයන් ක්‍ෂය කළාහු, සත්ත්ව ලෝකයේ තෘෂ්ණාව තරණය කළාහුය.

උපකය, ඵලගණ්ඩය, පුක්කුසාතිය, භද්දිය, ඛණ්ඩදේවය, බාහුදත්තිය, පිංගිය යන සත්දෙන ඕරම්භාගිය සංයෝජන පස දුරුකොට, උද්ධංභාගිය සංයෝජන ඉක්ම ගියාහුය.

සණඨපෙසු කතිකා කළාහුය. **බාහුලිකො** බොහෝ සිවුරු පිරිකර එකතු කිරීමට පිළිපන්නේ, **පධාන විබහනෙතා** ප්‍රධන් වීර්යයෙන් පිරිහුනේ, **ආවතෙතා බාහුල්ලාය** සිව්පසයෙහි බහුල බවට පෙරළුනේ, **අපිච ඛො ආසනං ඨපෙතබබං** එතකුදු වුවත් උසස් කුලයෙහි උපන්නහුට ආසනයක් තැබීම පමණක් කළයුතු යයි කීහු. **නාසකඛිංසු** යනු බුද්ධානුභාවයෙන් බුද්ධ තේජසින් මඩනා ලද්දවුන්ට තමන්ගේ කතිකාවතෙහි පිහිටන්නට නුපුළුවන් වූහ. **නාමෙනව ආවුසො වාදෙනව සමුදාචරන්ති** යනු ගෝතම යයි කියති. ආවුසො යයි කියති. ඇවැත්නි, අපි ඔබ උරුවේලාවෙහි ප්‍රධන් වීර්ය වඩන කාලයේ ඔබේ පාසිවුරු ගෙන හැසුරුනෙමු. මුව දෝවනයට වතුර හා දැහැටි දුන්නෙමු. වාසය කළ තැන හැමදීමු. (අපෙන්) පසුව ඔබට කවරෙක් වත්පිළිවෙත් කළෝද? කිම අප ඉවත්ව ගිය කල්හි ඒ පිළිබඳ නො සිතුවේද? මෙවැනි කථා කියති යන අර්ථයි.

ඉරියායා යනු දුෂ්කර වූ ඉරියව්වෙන්, **පටිපදායා** යනු දුෂ්කර ප්‍රතිපත්තියෙන්, **දුකකරකාරිකායා** යනු පතක් පතක් පමණ වූ මුංයුෂ ආදිය ආහාරකොට ගැනීම ආදී දුෂ්කරක්‍රියා කිරීමෙන්, **අභිඥානාථ මෙ නො දන්නහුද මාගේ එවරූපං විඛභාවිතං මෙතං** යනු මෙබඳු වූ වාක්‍ය භේද යන අර්ථයි. කිමෙක්ද මම උරුවෙලාවෙහි ප්‍රධන් වීර්යය වඩන සමයෙහි තොපගේ සිත් ගැනීම පිණිස, උකටලී නොවනු පිණිස රෑ හෝ දවල් හෝ පැමිණ ඇවැත්නි, විතර්ක නො කරවු. මට ආලෝකයක් හෝ නිමිත්තක් පැනේ යයි මෙබඳු කිසි දෙයක් තොපට කීවෙම් ද? ඔව්හූ එක් පදයෙන්ම සිහි ලැබ උපන් ගෞරව ඇත්තේ මෙතෙමේ ඒකාන්තයෙන් බුදු වූයේ වනැයි අදහා **නො හෙතං භනෙත නැත ස්වාමීනි** යි කීවාහුය.

අසකඛිං ඛො අහං භිකඛවෙ පඤ්චවගගියෙ භිකඛූ සඤ්ඤාපෙතුං යනු මහණෙනි, මම පස්වග මහණුන්ට 'මම බුදුමි'යි හඟවන්නට හැකි වීමි. තව ද එකල භාග්‍යවතුන් වහන්සේ පොහෝ දවස්හිම පැමිණියහ. නැවත තමන්ගේ බුද්ධභාවය දන්වා කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් කාය සාක්ෂි කොට දම්සක් පැවතුම් සූත්‍රය දෙසීය. සූත්‍රාවසානයේ තෙරුන් වහන්සේ අටළොස් කෙළක් බ්‍රහ්මයන් සමග සෝවාන් පෙලෙහි පිහිටියේය. හිරු ධරමාන කල්හිම සූත්‍රය නිමියේය. භාග්‍යවතුන් වහන්සේ එහිම වස් එළඹියහ. **දෙවපි සුදං භිකඛවෙ භිකඛු ඔවදාමි** පෑළවිය දින පටන් පිඬු පිණිස ද ගමට නොයාම කියන ලදී. ඒ භික්ෂූන්ගේ කමටහන්හි උපන් සැක මුසු තැන් විමර්ශනය කරනු පිණිස බුදුන්වහන්සේ ඇතුළු වෙහෙරම විසූහ. කර්මස්ථානයන් පිළිබඳ උපන් උපන් කුකුස් මල භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් විචාරති. භාග්‍යවතුන් වහන්සේ ද ඔවුන් හුන් හුන් තැන්වලට කුකුස් දුරුකරති. ඉවත් කෙරෙති.

මෙසේ බැහැර කළ බත් ඇති භාග්‍යවතුන් විසින් අවවාද කරනු ලබන්නා වූ වප්ප තෙර පෑලවිය දවස් සෝවාන් විය. 'භද්දිය' තෙර දියවක ද, මහානාම තෙර තියවක ද අස්සජී තෙර ජලවක ද සෝවාන් වූහ. යළි පොහොය පසු වී පස්වෙනි දවසේ, 'විසේනිය දා' ඔවුන් සියල්ලන් රැස්කරවා 'අනාත්ම ලක්ෂණ සූත්‍රය' වදාළහ. සූත්‍ර දේශනාවගේ කෙළවර සියලු දෙන අර්හත් ඵලයෙහි පිහිටියාහුය. එහෙයින් කියන ලදී. **අථ ඛො භිකඛවෙ පඤ්චවගගියා භිකඛූ මයා එවං ඔවදියමානා -පෙ- අනුත්තරං යොගක්ඛෙමං නිබ්බාන අජඣගමංසු -පෙ- නත්ථිදානි පුනබ්භවො** මෙතෙක්

කථා මාර්ගය වදාළ බුදුහු, 'තෙපි ද මාගේ හා පස්වග භික්ෂූන්ගේ මගට පිළිපන්හ. තොපගේ සෙවීම ආර්යයන්ගේ සෙවීමයි. පළමු වදාළ දේ සමග අනුසන්ධි ගලපා දක්වන්නේ මෙසේ එලවූ සේක.

මෙවිට යම්හෙයකින් ගිහි ගේ වැසියන්ගේ පස්කම් ගුණ සෙවීම නොවේද? සිව්පසය පස් විකීමෙන් තොරව වළඳන්නා වූ පැවිද්දන්ගේ ද, පස්කම් ගුණ වශයෙන් අනාර්ය පරියේසන වේ. එහෙයින් එය දැක්වීමට **පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා** ආදිය කීහ. එහි අළුත පඬු පෙවූ පටසිවුරු ආදිය **චක්ඛු විඤ්ඤෙය්‍යා රූපා** යනාදී වූ සතර කාම ගුණයෝ ලැබෙති. රසය වනාහි මෙහි නැවත පරිභෝග රසය වේ. මිහිරි වූ පිණ්ඩපාතයෙහි ද බෙහෙත් ගිලන්පසවල ද පසම ලැබෙති. සෙනස්නෙහි සිවුරෙහි මෙන් හතරකි. රසය වනාහි මෙහි පරිභෝග රසයයි. **යෙහි කෙචි භික්ඛවෙ** යනු කුමක් හෙයින් ආරම්භ කළේ ද, මෙසේ පස්විධ කාමගුණයන් දක්වා දැන් යමෙක් තුමූ 'පැවිදි වූ කල පටන් පැවිද්දන්ට අනාපරියේසන නම් කොයින්ද?' ආර්ය පර්යේෂණ ම වේ යයි මෙසේ කියන්නාහු ද ඔවුන් බාධාකරනු පිණිස වළක්වනු පිණිස පැවිද්දන්ගේ ද සිව්පසයෙහි පස් විකීමෙන් තොරව කරන පරිභෝගය අනාර්ය පර්යේෂණ නම් වේයයි දක්වන්නට මේ දේශනාව ආරම්භ කළේය. එහි **ගථිතා** යනු තෘෂ්ණාවෙන් ගැටගැසුණු **මුච්ඡිතා** යනු තෘෂ්ණා ක්ලාන්තයෙන් මුසපත් වූ, **අජ්ඣාපන්නා** තෘෂ්ණාවෙන් ඇතුළත ගැලුනාහු. **අනාදීනව දසසාවිනො** ආදීනව නොදක්නාහු **අනිස්සරණ පඤ්ඤා නිස්සරණ** යනු ප්‍රත්‍යවේක්ෂා ඤාණයයි. එයින් තොර වූ.

මේ අර්ථය පැහැදිලි කරන්නට උපමාවක් දක්වමින් **සෙය්‍යථාපි භික්ඛවෙ** ආදිය කීහ. එහි උපමා උපමේය සන්සන්දනය මෙසේ දතයුතු. වන මෘගයෝ මෙන් මහණ බමුණෝ ද, වැද්දා විසින් වනයෙහි තැබූ උගුල මෙන් සිව්පසය ද, ඒ වැද්දාගේ උගුල් රැස මැඩගෙන නිදන කාලය මෙන් පස් විකීමෙන් තොරව පරිභෝග කරන කාලය ද, වැද්දා එන කල්හි මුවා කැමති තැනකට යා නොහැකිව වැද්දාට රිසි සේ හැසිරෙන කාලය මෙන් මහණ බමුණන් ගේ මාරයා විසින් කැමති පරිද්දෙන් හසුරුවන කාලය ද දතයුතුයි. මාර වසඟයට පැමිණියේ යන අර්ථයි. යළි උගුලේ නොබඳිනා ලද මුවාගේ පාශරාශිය මත්තෙහි සිහියෙන් නිදන කාලය මෙන් මහණ බමුණන් සිව්පසය පස්විකා පරිභෝග කරන කාලය ද

වැද්දා එන කල්හි මුවා කැමති තැනකට යන කාලය මෙන් මහණ බමුණන් මාර වසඟයට නො පැමිණීමද, දතයුතු.

එසසත්‍ථා නිර්භය වූයේ, නිසැක වූයේ අනෙක් සියල්ල පළමු කී පරිදිමය.

පාසරාසි සූත්‍රය හෙවත් අරිය පරියේසන සූත්‍ර වර්ණනාව නිමියේය.

1-3-7

එවමෙමසුතං යනු චූලහත්ථිපදොපම සූත්‍රයයි. එහි සබ්බසෙතෙන වළහිරථෙන යනු සර්වාංයම සුදු වූ වෙළඹුන් සතරදෙනෙක් යෙදූ රථයෙන්, සුදු රථය, සුදෙන් සැරසුනු පිරිවර, සුදු රැස්වලින් යුත්, සුදු සැරයටියෙන් (චේවැලින්), සුදුකුඩ, සුදු ශීර්ෂය, මුදුන, සුදු වස්ත්‍ර, සුදු පාවහන්, සුදු වල් විදුනාවන්, මෙසේ සුදු වූ රථයට මුළු සිරුරම සුදු වූ වෙළඹුන් සතර දෙනෙකු යොදා.

රථය වූ කලී දෙපරිදිය. යෝධ රථ හා අලංකාර රථ වශයෙන්, එහි යෝධ රථය නම් සිව්රැස් සටහන් ඇත්තේ වෙයි. ඉතා මහත් නො වෙයි. දෙදෙනෙකුට හෝ තිදෙනෙකුට හා හැකි වෙයි. අලංකාර රථය නම් මහත් විශාල වෙයි. දිගින් හා පුළුලින් සමන්විතය. එහි (ඡත්තගගාහක) සේසත් දරන්නා, සෙමෙර වල්ග දරන්නා, තල්වැට දරන්නා, ආදී වූ අට දෙනෙකුට හෝ දස දෙනෙකුට සතර ඉරියව්වලින් ම සිටීමට හැකිවෙයි. මෙය අලංකාර රථයයි. එහි සියල්ල රෝද, කුඩුව, ඒරියා කඳ ආදී සියල්ල රිදීයෙන්ම කරන ලද්දේ වෙයි. වෙළඹහු ස්වභාවයෙන්ම සුදු වූවෝ වෙති. ඔවුන්ගේ ආභරණ ද රිදීයෙන් නිමවා ඇත. රැහැන් ද, කෙවිටද රිදීමය වෙති. බ්‍රාහ්මණයා ද සුදු වස්ත්‍ර හැඳ සුදු වස්ත්‍රයක් පොරවා, සුදු විළවුන් තවරා, සුදු මල් පැළඳ සිටී. ඇඟිලිවල මුදු ද, කන්වල

කුණ්ඩලාභරණ ද, ආදී වූ සියලු දෙයම සුදු පැහැ රිදීයෙන්ම බබළති. බමුණාගේ පිරිවර ජනයා ද මෙසේම තනි සුදෙන් හැඳ පෙරව, සුදු පැහැ විලවුන්, මල්දම්, ආදියෙන් අලංකාරව සැරසුනෝ වෙති. සබ්බ සෙතෙන වළහිරතෙන යන්න එහෙයින් කියන ලදී.

සාවත්ථියා නීය්‍යාති යනු ඔහු සෑම සයමසකටම එක් වරක් මේ අන්දමින් නුවර පැදකුණු කෙරේ. මෙයින් මෙතෙක් දිනකින් අසවල් දින නුවර පැදකුණු කරන්නේ යයි නගරය පුරා ප්‍රචාරය කරති. එය අසා නගරවැසියෝ යමෙක් නගරයෙන් පිටත නො ගියාහු ද ඔව්හූ නොයති. නගරයෙන් පිටත ගියාහු නැවත නගරයට පිවිසෙති. යම්කිසි දවසක බමුණා නගර ප්‍රදක්ෂිණා කෙරේද එදින උදයේ නගරයේ පාරතොට හැමද සුදුවැලි ඉස, ලදපස්මල් හාත්පස විසුරුවා පුන්කලස් තබා, කැන් සහිත කෙසෙල්ගස් සිටුවා, කොඩිසේසත් නංවා, මුළු නගරය පුරා සුවඳදුම් අල්ලා සුගන්ධවත් කෙරෙති. බ්‍රාහ්මණයා උදේම හිස නා පෙරබත් අනුභවකොට පළමු කී ක්‍රමයෙන් සුදෙන්ම සැරසී ප්‍රාසාදයට පිවිස රථයට නගී. සුදෙන්ම සැරසුණු පිරිවර ජනයා සේසත් ගෙන ඔහු පිරිවරා ගනී. ඉක්බිති මහා ජනයා රැස්කිරීම සඳහා පළමුව තරුණ දරුවන්ට එලාපල විසුරුවති. ඊට අනතුරු ද මසුරන් ද කහවණු ද විසුරුවති. මහාජනයා රැස්වෙති. ඔල්වර හඬ ද, ප්‍රීතිඝෝෂා ද හිසවටා රෙදි කරකැවීම්. පිළි සිසෑරුම් පවත්වති. ඉක්බිතිව බමුණා ද ආශිර්වාද ගී ජයමඟුල් ගී ගයද්දී මහත් වූ සම්පත්තියෙන් යුතුවැ නගරයේ සැරිසරයි. ධනවත් මිනිස්සු උඩුමහල් තලවලට නැගී දොරජනෙල් විවෘතකොට බලති. බමුණා ද තමන්ගේ යසඉසුරු ශ්‍රී සම්පත්තීන්ගෙන් නගරය උතුරවමින් දකුණු දොරටුවට මුහුණ ලා පැමිණේ. සාවත්ථියා නීය්‍යාති යන්න එහෙයින් කියන ලදී.

දිවාදිවසස දෙවෙන් දවාලේ, මධ්‍යාහ්න කාලයේ **පිලොතිකං පරිබ්බාජකං** ස්ත්‍රීලිංග නාමයෙන් නම් ලද පිරිවැජියා ඒ පිරිවැජි තෙමේ තරුණ වූයේ පළමු වයසේ සිටියේ, රන්වන් වූයේ බුදුනට උවැටන් කරන්නෙක්ල, උදෑසනම බුදුනට ද, මහතෙරවරුනට ද උපස්ථාන කොට, වක් තුනක් වූ දණ්ඩ හා පැන්කෙණ්ඩිය ආදී සිය උපකරණ, පිරිකර රැගෙන දෙව්රමින් නික්ම නගරයට මුහුණ ලා නික්මුණෝය. මෙතෙම සමීපයේ එන බමුණා දුටුවේය.

එතදවොච යනු පිළිවෙළින් සමීපයට පැමිණියාහු හැඳින, **හඤ්ඤතු නු භවං වච්ඡායනො** ගෝත්‍ර නාමයෙන් අමතා මේ වචන කිය. **පණ්ඩිතො මඤ්ඤෙ** යනු පින්වත් වාත්සය්‍යායනය, ඔබ ශ්‍රමණ භවත් ගෞතමයන් නුවණැත්තෙක් යයි සිතන්නේ ද? නැතහොත් එසේ නො සිතන්නේද, මෙසේ ඇසීය යන අර්ථයි.

කොචාහමෙභා යනු පින්වත, ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ප්‍රඥාවෙහි ව්‍යක්ත භාවය දැනගන්නට මා කවරෙක්ද? **කොච සමණසස ගොතමසස පඤ්ඤා වෙය්‍යතතියං ජානිසසාමි** යනු වැලිදු කෙසේ නම් මම ශ්‍රමණ භවත් ගෞතමයන් ප්‍රඥාව දැනගන්නෙම්ද, කවර කරුණකින් කවර හේතුවකින් දැනගන්නෙම්ද, මෙසේ සර්වප්‍රකාරයෙන් තමන්ගේ නොදන්නා බව කීය. **සොපි නූනසස තාදිසො** යනු යමෙක් ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ප්‍රඥා ව්‍යක්ත භාවය දැනගන්නේ ද ඔහු දස පෙරුමන් පුරා සර්වඥතා ඥානයට පැමිණි එබඳු බුදු කෙනෙක්ම විය යුතුය. මහමෙර හෝ හිමවත හෝ පෘථුවිය හෝ අහස මනිනු කැමැත්තෙක් වේ නම් ඔහු ඒ සඳහා දිග සුදුසු රැහැනක්, දන්ඩක් හෝ මිම්මක් ලැබිය යුත්තේමය. ශ්‍රමණ භවත් ගෞතමයන් ගේ ප්‍රඥාව දැනගැනීමට නම් ඒ නුවණ සමාන වූ, සර්වඥතාඥානය ලැබීමට අවශ්‍ය වන්නේය යි දැක්විය. මෙහි ආදර ගෞරව වශයෙන් නැවත නැවත පුන පුනා කියන ලදී.

උළාරාය යනු උතුම් වූ, ශ්‍රේෂ්ඨ වූ, **කොවා හං භො** යනු පින්වත ශ්‍රමණ ගෞතමයන්ට පැසසීමෙහි මා කවරෙක්ද, **කො ච සමණං ගොතමං පසංසිසසාමි** යනු කවර කරුණකින් පසසන්නෙම්ද, **පසත්ථ පසත්ථො** යනු සියලු ගුණයන් මතුයෙහි හැසිරෙන්නා වූ, සියලු ලෝකයා විසින් පසස්නා ලද තමන්ගේ ගුණයන් විසින්ම ප්‍රශස්ත වූ, උන්වහන්සේට අන්‍යයන් විසින් පැසසීමක් කළයුතු නැත්තේය. එය එසේමයි. යම්සේ සපුමලක් හෝ නිලුපුලක් හෝ පියුමක් හෝ රත්සඳුන් හෝ තමාගේ වර්ණයෙන්ම සුවඳින්ම සුවඳ වූයෙන් ප්‍රසාද එළවන්නේත් වූයේද, ඔහුට ආගන්තුක වශයෙන් එන්නා වූ වර්ණ ගන්ධයන්ගෙන් ස්තුති කටයුත්තක් නැත්තේද තව ද, යම් සේ මාණික්‍ය රත්නයක් හෝ සඳමඬල හෝ තමන්ගේ ආලෝකයෙන් ම බබළයි. වෙනත් අනුන්ගේ බැබළවීමක් අනවශ්‍යය. මෙසේ ශ්‍රමණ ගෞතම තෙමේ තමන්ගේ ගුණයෙන්ම සියලු ලෝකයාගේ පැසසීමට හිමිකම් කියන්නේ ය. ප්‍රශස්තයන් විසින්ම පසස්නා ලද නිසා 'පසත්ථ පසත්ථ' නම් වේ.

ප්‍රශස්තයෝ නම් කවරහුද? පසේනදි කොසොල් රජතෙම කාසි කෝසල වාසීන් විසින් ප්‍රශස්තය. බිම්බිසාර රජු අංග මගධ වාසීන් විසින් ප්‍රශස්තය. විශාලා නුවර ලිච්ඡවීහු වජ්ජි රටවැසියන් විසින් ප්‍රශස්තයෝය. පාවෙය්‍ය නුවර මල්ල රජදරුවෝ කුසිනාරාවාසි මල්ල රජදරුවෝ ද ඒ ඒ ක්ෂත්‍රියයන් විසින් ද, රටවැසියන් විසින් ද ප්‍රශස්තය. වංකි ආදී බ්‍රාහ්මණයෝ බමුණු සමූහයා විසින් ප්‍රශස්තයහ. අනාථපිණ්ඩික ආදී උපාසකයෝ උපාසකවරුන් විසින් ප්‍රශස්තය. විශාකාව වැනි උපාසිකාවෝ නොයෙක් සියදහස් ගණන් උපාසිකාවන් විසින් ප්‍රශස්තයහ. සකුලුදායි ආදී පරිබ්‍රාජකයෝ පරිබ්‍රාජකයන් විසින් ප්‍රශස්තය. උත්පලවණ්ණා ස්ථවිරීන් ආදී මහා ශ්‍රාවිකාවෝ නොයෙක් සියගණන් භික්ෂුණීන් විසින් ද, සැරියුත් ස්ථවිර ආදී මහා ස්ථවිරයෝ නොයෙක් සිය ගණන් භික්ෂූන් විසින් ද ශක්‍රාදීහූ නොයෙක් දහස් ගණන් දෙවියන් විසින් ද, මහා බ්‍රහ්මාදී බ්‍රහ්මයෝ නොයෙක් දහස් ගණන් බ්‍රහ්මයන් විසින්ද, ප්‍රශස්තයෝයි. ඔව්හූ සියල්ලෝම දසබලයන් වහන්සේ ස්තුති කරති. වර්ණනා කෙරෙති. ප්‍රශංසා කෙරෙති. මේ නිසා භාග්‍යවත්හූ ප්‍රශස්ත ප්‍රශස්තයෝමය.

අත්ථවසං යනු අර්ථානිශංසයයි. ඉක්බිති පිරිවැජී තෙමේ තමන්ගේ පැහැදීමට කරුණු පැහැදිලි කරන්නේ. **සෙය්‍යථාපි හො කුසලෝ නාගවනිකො** ආදිය කීහ. එහි **නාගවනිකො** යනු ඇතුන් වසන වනයෙහි ජීවත්වන නූගත් අයෙක්, මත්තෙහි වනාහි උගත් ශිල්ප ඇති පුරුෂයෙක් 'නාගවනිකො' යනුවෙන් ආයේය. **චතසාරි පදානි** යනු සතර ඥාන පදයන්ය. නැණ වැළඳුම්, නුවණින් මැඩගෙන සිටි තැන් යන අර්ථයි.

ඛතතිය පණ්ඩිතෙ යනාදියෙහි **පණ්ඩිතෙ** යනු නුවණැති බැවින් යුක්ත වූ, නිපුණො සිලුටු, සියුම් වූ බුද්ධිමතුන්, සියුම් වූ අර්ථාන්තර අවබෝධ කරගැනීමෙහි සමත් වූවන් **කතපරපපවාදෙ** දැනගත් පරවාදයන් ඇති හා අන්‍යයන් හා කළ වාද පිළිබඳ පුරුද්ද ඇතියන්, **වාළවෙධිරූපෙ** වාළවේධී (අස්ලොමට විදීමේ සමත්) දුනු විදින්නන් හා සමාන වූවන්, වාළවේධි විය වාළං - වාලවේධි දුනුවායන් මෙන් **වොභින්දනතා මඤ්ඤෙ චරනති** අස්ලොම් මෙන් සියුම් වූ ද, අනුන්ගේ දෘෂ්ටිගතයන් තමන්ගේ නුවණින් මථනය කරන්නවුන් බිඳින්නවුන් මෙන් හැසිරෙත් යන අර්ථයි. **පඤ්හං අභිසංකරොනති** තනිපද, දෙපද, තුන්පද, සිව්පද, ප්‍රශ්නයන් කෙරෙති. **වාදං ආරොපෙසසාම** යනු දොස් නගන්නෙමු.

නමෙව සමණං ගොතමං පඤ්හං පුච්ඡනති යනු කුමක් මෙයින් නොවිචාරත්ද, භාග්‍යවතුන් වහන්සේ වනාහි පිරිස් මැද දහම් දෙසන්නේ පිරිසෙහි හදගැස්ම බලති. මේ ක්ෂත්‍රිය පණ්ඩිතවරු අදහස් සැඟවුණු රහස් වූ ප්‍රශ්නයක් ඔඩොක්කුවේ තබාගෙන මෙන් ආවාහුයයි දන්නා සේක. හේ ඔවුන් විසින් නො විචාරණ ලද්දේම, මෙබඳු වූ ප්‍රශ්න විචාරීමෙහිලා මෙපමණ දොස් ඇත්තේය. විසඳීමෙහි මෙතෙක් අර්ථය. පද අකුර මෙපමණ වෙති. මේ ප්‍රශ්න විචාරීමෙන්, මෙසේ විමසන්නේ යයි මේ ආකාරයෙන් ඔඩොක්කුවේ වූවක් කොටගෙන ආ ප්‍රශ්න ධර්මකථා අතරෙහි යොදා විශේෂයෙන් දක්වන්නේය. ක්ෂත්‍රිය පණ්ඩිතවරු අපි මේ ප්‍රශ්නය නොවිචාළෙමුද, එය අපට ඒකාන්තයෙන් යහපතකි. ඉදින් අප විමසූයේ නම් අප ප්‍රතිඥා විරහිත වූවන් කොට දමන්නේ යයි සතුටු වෙති.

තව ද බුදුවරයෝ නම් ධර්මය දේශනා කරන්නාහු, පිරිස වෙත මෙත් සිත පතුරුවන්නාහ. මෙත් සිත පැතිරවීම නිසා දශබලයන් කෙරෙහි මහජනයාගේ සිත පහදී. බුදුවරයෝ රුවින් අගතැන්පත් වූවාහු වෙති. දැකුම්කළු ස්වභාවය ද, මිහිරි හඬ ද, මොළොක් දිව ඇත්තාහු (එහෙයින්ම සුදු මුදු වචන ඇත්තාහු) මනාව පිහිටි දන්තාවරණ ඇත්තාහු අමා ජලයෙන් ළය තෙමන්නාක් මෙන් දහම් දෙසති. එහි ඔවුන් වෙත මෙත්සිත පැතිරවීමෙන් පහන් වූ සිත් ඇත්තන්ට මෙසේ සිතේ මෙබඳු වූ දෙපරිද්දෙකින් නො පවත්නා කථාව, නො හිස් කථාව, නෛර්යාණික කථාව කියන්නා වූ භාග්‍යවතුන් සමග විරුද්ධ කථා කියන්නට නොහැකි වන්නෙමු. තමන් තුළ පැහැදීම ඇති නිසාම ප්‍රශ්න නො විචාරති. **අඤ්ඤදත්ථු** ඒකාන්තයෙන් **සාවකා සම්පජ්ජනති** ශරණාගමන යාමෙන් ශ්‍රාවකයෝ වෙති.

තදනුත්තරං යනු ඒ අනුත්තර වූ **බ්‍රහ්මචරිය පරියොසානං** මාර්ග බ්‍රහ්මචරියාවගේ අවසානය වූ අර්හත්ඵලය තම අවසාන අරමුණු කොටගෙන ඔව්හූ පැවිදි වෙති. **මනං වත හො අනස්සාම** යනු පින්වත! අපි (බුදුන් වෙත) නො එළඹෙන්නෙමු නම්, එපමණකින් ඇසුරු කිරීම නො කිරීම පමණකින් නටුවෝ වූවමු. වැලි එළඹීම් පමණකින් විනාශ නොවූවෝ වෙමු යන අර්ථයි. දෙවෙනි පදය පළමු පදයාගේම සමාන තේරුමයි. **අස්සමණාව සමානා** පාපයන් නො සන්සිඳුවන ලද, නොමහණුන් වූවාම, යළි බහා නොතැබූ බැවින් අබ්‍රාහ්මණොව

නො බමුණෝ වූවාහු, කෙලෙස් සතුරන් නො නසන ලද බැවින් **අනරහනෙතා යෙව සමානා** නො රහත් වූවාහුම යන අදහසයි.

උදානං උදානෙසි ප්‍රීතිමය වචනයක් උදානයක් පහළ කළේය. යම්කිසි තෙලක් මැනීම් කරන්නට නොහැකිව වැගිරී යේද, එය 'අවසෙක' යයි කියයි. යම්කිසි ජලයක් විලෙහි රඳන්නට නො හැකි වේද, උතුරා යයි ද එය 'ඕඝ' යයි කියයි. මෙසේ හදවත තුළ ප්‍රීති වචන උපන් කල්හි හෘදයෙහි පවතින්නට නො හැකි වේද, අධිකව ඇතුළත නො පිහිටා (වචන මගින්) පිටත නික්මේද එය 'උදාන' යයි කියයි. මෙබඳු වූ ප්‍රීති වචනයක් පහළ කළේය යන අර්ථයි.

හත්ථීපදොපමො යනු ඇත් පියවර උපමාකොට ඇති ධර්මය 'හත්ථී පදොපම' නම් වේ. ඒ ධර්මය මෙපමණකින් පරිපූර්ණ විස්තරයක් නොවූයේ යයි දක්වයි. **නාගවනිකො** ඇතුන් සිටින වනයක හැසිරෙන හස්ති ශිල්පය උගත් තැනැත්තෙක්, කවර හෙයකින් මෙහි 'කුසලො' යන්න නො කීවේද? මත්තෙහි **යො හොති කුසලො** යන්නෙහි විභාගය දැක්වීම සඳහාය. යමෙක් යම්හෙයකින් පිවිසේද, නැතහොත් යමෙක් දක්ෂ වේද, හෙතෙම ඒ තාක් කෙළවරට නිෂ්ඨාවට නො ගියේද, එහෙයින් මෙහි 'කුසලො' යන්න නොකියා, ඉදිරියට තැබූයේය. **වාමනිකා** කෙටි වූ, දිගින් වඩා දික් නොවූ මහ බඩක් ඇති ඇතිනියෝ, **උච්චාව නිසෙවිතං** හත් අට රියනක් උස ඇති, නුග ආදී ගස්වල කඳ පෙදෙසෙහි (ගැටෙන) ගෑවෙන, **උච්චා කාළාරිකා** උසින් යෂ්ටි සමාන පා ඇතිව උස් වූ දත් නොසම බැවින් 'කාළාරිකා' නම් වූද, ඔවුන්ගේ වනාහි එක් දතක් දළයක් උල්ව උඩින් පිහිටියේය. එක් දතක් (දළයක්) පහලින් පිහිටියේය. දළ දෙක සමීපව සමානව නො පිහිටියේ.

උච්චාව දනෙතහි ආරඤ්ඤිතානි උස නුගරුක්වල හත් අටරියනක් උසින් කඳ පෙදෙස පොරවකින් කෙටූ තැන් මෙන් දළවලින් සිඳින ලද තැන. **උච්චා කණෙරුකා නාමා** සැරයටියක් වැනි උස්වූ පා ඇතිව කණේරුවක් වැනි දළවලින් යුත් 'කණෙරුකා' නම් වූ ද ඔවුන්ට මොට්ටුවක් වැනි දළ ඇත්තාහු වෙත් ල. එහෙයින් කණෙරුකා යයි කියනු ලැබේ.

සො තිට්ඨංගච්ඡති යනු ඒ හස්ති ශිල්පය දන්නා තැනැත්තා. මම යම් ඇතෙකුගේ පියසටහන් අනුව ආයෙම්ද, හේ මොහුම වේ. අනිකෙක්

නොවේ. මම පළමුව යම්කිසි පා සටහනක් දැක වාමාතිකාවන්ගේ පා සටහනක් වන්නේ යයි නිගමනයට නො ගියෙම්ද, ඉන් මෑත දී යම් (පියවරක්) දැක කාළාරිකාවන්ගේ වන්නේ යයි හෝ කණෙරුකාවන්ගේ වන්නේ යයි නිගමනයට නො පැමිණෙත්ද, ඒ සියල්ල මේ මහ ඇත් රජුගේම පියවර යයි මහ ඇතා දැකම නිගමනයට බසී.

එවමෙව ඛො යන මෙහි උපමා උපමේය සන්සන්දනය වේ. ඇත් වනය මෙන්, මුල පටන් නීවරණයන්ගේ ප්‍රහාණය දක්වා ධර්මදේශනාව දතයුතුය. දක්ෂ වූ හස්ති ශිල්පියා මෙන් යෝගාවචර තෙමේ ද, මහ ඇත්හු මෙන් බුදුන් වහන්සේ ද, මහත් වූ ඇත් පිය මෙන් ධ්‍යාන අභිඥාද, නාගවනිකයාගේ ඒ ඒ තැන ඇත් පා සටහන් දැක ද, වාමනිකයන්ගේ පා සටහන් වන්නේ ය. කාළාරිකාවන්ගේ කණේරුකාවන්ගේ පා සටහනක් වන්නේ යයි නිගමනයට නො ගිය බව මෙන් යෝගීහුගේ මේ ධ්‍යාන අභිඥා නම් බාහිර පිරිවැජියන්ට ද ඇත්තාහු යයි නිගමනය නො ගිය බවද, නාගවනිකයාගේ ඒ ඒ තැන මා විසින් දක්නා ලද පියසටහන් මේ මහ ඇතාගේම ය. අනිකකු ගේ නොවේයයි මහ ඇතු දැකම නිගමනයට යාම මෙන්, ආර්ය ශ්‍රාවකයාගේ රහත් බවට පැමිණීම නිගමනයට යාම යයි දතයුතුය. තව ද මේ උපමා සන්සන්දනය මස්තකයේ (ඉහළ) සිටද කිරීම සුදුසුය. මෙතැන්හි දී ද සුදුසුය. පිළිවෙළින් පැමිණියා වූ ඒ පාලි පදය ගෙන මෙතැන්හිම කරන ලදී.

එහි **ඉධ** යනු දේශය දැක්වීමෙහි නිපාතයි. ඉධ ශබ්දය සමහර තැනක ලෝකය දක්වයි. **ඉධ තථාගතො ලොකෝ උපපජ්ජති** යනුය. සමහර තැනක ශාසනය කියනු ලැබේ. **ඉධෙව භික්ඛවෙ සමණෝ ඉධ දුතියෝ සමණෝ** යනු සමහර තැනක 'අවකාශය' කියයි.

ඉධෙව තිට්ඨමානසස - දෙව භූතසස මෙ සතෝ
පුනරායුච මෙ ලදෙධා - එවං ජානාහි මාරිසා

මේ අවකාශයෙහි ම සිටින්නා වූ දිව්‍ය වූ මාගේ නැවත ජීවිතය ද මා විසින් ලද්දේ ය. නිදුකාණන් වහන්ස, එපරිද්දෙන් දැන ගනු මැනව. සමහර තැනක පද පූරණයේ පමණි. වදාළේමැයි. **ඉධාහං භික්ඛවෙ භූතනාවී අසසං පවාරිතෝ** මෙහි ලෝකය සඳහා කියන ලදී. බමුණ, මේ ලෝකයේ අර්හත් වූ සිව්සස් අවබෝධ කළා වූ භාග්‍යවතුන් වහන්සේ

උපදින්නේය. එහි 'තථාගත' ශබ්දය මූල පරියායේ ද 'අරහං' යන්න විසුද්ධි මාර්ගයේ ද විස්තර කර ඇත.

ලොකෙ උපපජ්ජති යන මෙහි ලෝකය වනාහි අවකාශ ලෝකය, සත්ත්ව ලෝකය, සංස්කාර ලෝකයයි තෙපරිදිය. මෙහි සත්ත්වලෝකය අදහස් කරන ලදී. තව ද සත්ත්ව ලෝකයෙහි උපදනා වූ තථාගතයන් වහන්සේ දෙව්ලොව නූපදිති. බඹලොව නූපදිති. මිනිස්ලොවෙහිම උපදිති. මිනිස් ලොව ද අන් සක්වල නූපදිති. මේ සක්වළ ම උපදිත්. එහි ද සෑම තැනෙකම නූපදිත්. පෙරදිග කජංගල නම් නියම්ගමක් වේ. එයට පසුභාගයේ මහාසාලයෝ ද එයින් මත්තෙහි ප්‍රත්‍යන්ත ජනපදයෝ වෙති. මෙයින් මධ්‍යයේ ගිනිකොණ දිසාවෙහි සල්ලවතී නම් නදිය වෙයි. එයින් මත්තෙහි ප්‍රත්‍යන්ත ජනපදයෝ වෙති. මොබින් මධ්‍යයෙහි දකුණු දෙස සේත කර්ණිකා නම් නියම්ගම වෙයි. එයින් මත්තෙහි ප්‍රත්‍යන්ත ජනපදයෝ වෙති. මෙයින් මත්තෙහි පැසුළු දෙසෙහි (බටහිර) ථූන නම් බ්‍රාහ්මණ ගම පිහිටියේ ය. ඔබින් මත්තෙහි ප්‍රත්‍යන්ත ජනපදයෝ වෙති. මොබින් මධ්‍යයෙහි උත්තර දිසාවේ උසිරද්වාජ පර්වතය පිහිටියේය. එයින් මත්තෙහි ප්‍රත්‍යන්ත ජනපදයෝ වෙති. මොබින් මධ්‍යයෙහි, යොදුන් තුන්සියයක් දිගින් වූ, පළලින් දෙසිය පනස් යොදුන් වූ, හාත්පස නවසියයක් යොදුන් වූ, මැදුම් පියසෙහි උපදියි. හුදෙක් තථාගතයන්ම පමණක් නොවෙති. පසේබුදුවරු, අග්‍රශ්‍රාවකවරු, අසූමහා ශ්‍රාවකවරු, බුදු පියා, බුදුමව, සක්විති රජු, අනෙක් මහා භෝග සම්පත් ඇති බ්‍රාහ්මණ ගෘහපතියෝ ද එහිම උපදිති.

එහි තථාගත තෙමේ සුජාතාව විසින් දුන් මිහිරි කිරි ආහාරයේ පටන්, යම්කිසි දිනක රහත් මගට පත්වේද, ඒ තාක් උපදීනම් රහත්ඵලය පැමිණි කල්හි උපන්නේ නම්, මහාභිනිෂ්ක්‍රමණයේ පටන් රහත්මග තෙක් හෝ තුසිත භවනයේ පටන් රහත්මග තෙක් හෝ දීපංකර පාදමූලයේ පටන් රහත්මග තෙක් හෝ යම්තාක් වේ ද, ඒ තාක් උපදී නම් රහත්ඵලය උපන්නේ නම් මෙහි සියල්ලට පළමු උපන් බව සඳහාම **උපපජ්ජති** යන්න කියයි. තථාගතයෝ ලොව උපන්නේ ය යන අර්ථයි.

සො ඉමං ලොකං යනු ඒ භාග්‍යවත්හු මේ ලෝකය මෙවිට කිවයුත්ත නිදර්ශනය කෙරෙයි. **සදෙවකං** දෙවියන් සහිත වූයේ සදේවක නම් වේ. එසේම මාරයා සහිත වූයේ **සමාරකං** වේ. බ්‍රහ්මයන් සහිත වූයේ **සබ්‍රහ්මකං**

වේ. ශ්‍රමණ බමුණන් සහිත වූයේ **සසසමණිං බ්‍රාහමණිං** වේ. උත්කෘෂ්ට අන්දමින් උපන් බැවින් **පජං** නම් වේ. දෙව් මිනිසුන් සමග යන අරුතින් **සදෙව මනුසසං** වේ. එහි සදේවක යන වචනයෙන් කාමාවචර පහේ දෙවිවරුන් ගැනේ. 'සමාරකෙ' යන වචනයෙන් සදෙව්ලොව කාමාවචර දෙවිවරුන් ගැනේ. 'සබ්‍රහමක' යන වචනයෙන් බ්‍රහ්මකායිකාදී බ්‍රහ්ම සමූහයා ද, 'සසසමණ බ්‍රහමණී' යන වචනයෙන් ශාසනයට විරුද්ධ පසමිතුරු මහණ බමුණන්ගේ ගැනීම හා සමිතපාපී බාහිතපාපී මහන බමුණන්ගේ ගැනීමද වෙයි. 'පජා' යන වචනයෙන් සත්ත්ව ලෝකය ගැනීමද 'සදෙව මනුසස' වචනයෙන් සම්මුති දෙවියන් හා අවසේස මිනිසුන් ගැනීමද වේ. මෙසේ මෙහි පද තුනෙන් අවකාශ ලෝකය සමග සත්ත්ව ලෝකය, දෙපදයකින් ප්‍රජා වශයෙන් සත්ත්ව ලෝකයම ගන්නා ලදී. වෙනත් ක්‍රමයකින් ද විස්තර කර ඇත.

'සදෙව ගහණෙන' යන්නෙන් අරූපාවචර ලෝකය ගත්තේය. 'සමාරක ගහණෙන' යන වචනයෙන් කාමාවචර දිව්‍ය ලෝක සයද, 'සබ්‍රහමක ගහණො' යන වචනයෙන් රූපී බ්‍රහ්ම ලෝකය ද 'සසසමණ බ්‍රහමණාදී' යන වචනයෙන් සිව් පිරිස වශයෙන් සම්මුති දෙවිවරුන් හෝ සමග මිනිස්ලොව ද, 'අවසෙස සියලු සත්ත්වලෝක හෝ ගන්නා ලදී. මෙහි **සදෙවක** වචනයෙන් උඩත් පිරිසෙයින් සියලු ලොව පසක් කළ බව කියයි. නැවත යම් කෙනෙකුන්ට මාරතෙම මහානුභාව ඇත්තෙක. කාමාවචර ලෝක සයට අධිපතිය. 'වසවර්තීය' යන සිතක් වීද හෙතෙමේත් මොහු විසින් පසක් කරන ලදැයි විමතිය දුරුකරමින්, **සමාරකං** යනු වදාළහ. නැවත යම් අයකුට 'බ්‍රහ්මතෙම මහානුභාව ඇත්තෙක. එක් ඇඟිල්ලකින් දස දහසක් සක්වළ ආලෝකය පතුරුවයි. නිරුත්තර වූ දැහැන් සමවත් සුවය ද විඳියි. කිම හෙතෙමේත් පසක් කරන ලදැයි සිතක් වීද? ඔවුන්ගේ විමතිය දුරුකරනු සඳහා **සබ්‍රහමකං** යන්න වදාළහ. නැවත යමෙක් තුමූ මෙසේ සිතහුද? බොහෝ මහණ බමුණෝ ශාසනයට විරුද්ධ වූවාහු වෙති. කිම ඔවුහුත් පසක් කරන ලදද? ඔවුන්ගේ විමතිය දුරු කරමින් **සසසමණ බ්‍රාහමණිං පජං** යන්න වදාළහ. මෙසේ විශිෂ්ට වූවන්ගේ පසක් කළ බැව් ප්‍රකාශ කොට නැවත සම්මුති දෙවියන් ද සෙසු මිනිසුන් ද ගෙන විශිෂ්ට බෙදීම් වශයෙන් සෙසු සත්ත්ව ලෝකයා ගේ සාක්ෂාත් කළ බැව් ප්‍රකාශ කරමින් **සදෙව මනුසසං** යනු වදාළහ. මේ මෙහි භවයන්ගේ අනුපිළිවෙළයි.

පුරාණාචාර්යයෝ වනාහි මෙසේ කීහු. **සදෙවකං** යනු දෙවියන් සහිත අවසේස ලෝකය, **සමාරකං** යනු මාරයා සහිත ඉතිරි ලෝකයයි. **සබ්‍රහමකං** යනු බ්‍රහ්මයන් සමග ඉතිරි ලෝකයයි. මෙසේ සියලු තුන් භවයට පැමිණි සත්ත්වයන් තුන් ආකාරයෙක්හිලා තුන්පදයෙක්හි ඇතුළත් කොට නැවත දෙපදයකින් ඇතුළත් කොට ගන්නාහු, **සසසමණං බ්‍රාහමණිං පජං සදෙවමනුසසං** යනු කීහ. මෙසේ පස් පදයකින් හා ඒ ඒ ආකාරයෙන් තුන් ලෝකයම ඇතුළත් කළෝය.

සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති යනු සයං තෙමේ අනිකෙකු විසින් නො දත යුතු **අභිඤ්ඤාය** අධික වූ නුවණින් දැන යන අර්ථයි. **සච්ඡිකත්වා** ප්‍රත්‍යක්ෂකොට, මෙයින් සැකයෙන් බලන්නන්ගේ ඉවතලෑම කරයි. **පවෙදෙති** අවබෝධ කරවයි, දන්වයි, ප්‍රකාශ කෙරෙයි.

සො ධම්මං දෙසෙති ආදි -පෙ- පරියොසන කල්‍යාණන්ති ඒ භාග්‍යවතුන් වහන්සේ සත්ත්වයන් කෙරෙහි කරුණාව පෙරදැරිකොට නිරුත්තර වූ විවේක සුවය හැර දමා දහම් දෙසති. එය මදක් හෝ බොහෝ සෙයින් හෝ දේශනා කරන්නෝ ආදි කල්‍යාණාදී ප්‍රකාර වූවක්ම දේශනා කරති. මුලින්ද කල්‍යාණ වූවක් ම සුදුසු වූවක් ම නිවැරදි වූවක්ම දේශනා කරති. මධ්‍යයෙහි ද එසේමය. අවසානයේ දී ද කල්‍යාණ වූවක්ම යහපත් වූවක්ම නිවැරදි වූවක්ම දේශනා කරති.

එහි එම දේශනාවෙහි ආදි මධ්‍ය අවසාන ඇති ශාසනයාගේ ඇති පළමුකොට දේශනාවෙහි සිව්පදැති ගාථාවෙක ප්‍රථම පාදය ආදි නම්. දෙවැනි දෙපාදය මධ්‍ය නම්. අන්තයෙහි එක් පදය පරියෝසාන නම්. එක් අනුසන්ධියක් ඇති සූත්‍රයෙක නිදානය ආදිය වේ. ඉදමවොව යනු පරියෝසානය, දෙදෙනොගේ අතර මධ්‍යය, නොයෙක් අනුසන්ධි ඇති සූත්‍රයක ප්‍රථමානු සන්ධිය ආදියයි. අන්තයෙහි සන්ධිය අවසානයයි. මධ්‍යයේ එකක් හෝ දෙකක් හෝ බොහෝවක් මධ්‍යයයි. නැවත ශාසනයාගේ ශීල සමාධි විපස්සනා ආදි නම්. මෙසේ කියන ලදී. **කොවාදි කුසලානං ධම්මානං සීලඤ්ච විසුද්ධං දිට්ඨිච උජුකා අත්ථි භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා** මෙසේ වදාරන ලද ආර්ය මාර්ගය මධ්‍ය නම්. **ඵලඤ්චව නිබ්බාණඤ්ච** ඵලය ද නිර්වාණය පරියොසාන නම්. **තසමා තිහ ත්වං බ්‍රාහමණා එතං සාරං එතං පරියොසනං** යන මෙහි ඵලය නිවන පරියෝසානයයි කියන ලදී. **නිබ්බානොගධං ආවුසො විසාඛ**

බ්‍රහ්මචරියං වුසසති නිබ්බාන පරායනං නිබ්බාන පරියොසානං' යන මෙහි නිර්වාණය පරියෝසනයයි කියන ලදී.

මෙම දේශනාවෙහි ආදිය, මධ්‍යය, පරියොසානය, අදහස් කරයි. භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කරන්නේ ආදියෙහි ම සීලය දක්වා, මධ්‍යයෙහි මාර්ගය දක්වා කෙළවර නිවන දක්වති. එහෙයින් **සො ධම්මං දෙසෙති ආදි කල්‍යාණං, මජ්ඣෙ කල්‍යාණං, පරියොසාන කල්‍යාණං** යනු කියන ලද, එහෙයින් අන්‍ය ධර්ම කථිකයෙක් දහම් දෙසන්නේ නම්,

ආදියෙහි සීලය දැක්විය යුතුය. මධ්‍යයෙහි මාර්ගය ප්‍රකාශ කළ යුතුය, කෙළවර නිර්වාණය ප්‍රකාශ කළ යුතුය.[1]

සාත්‍ථං සබ්‍යඤ්ජනං යම් හෙයකින් යමෙකුගේ දේශනාව කැඳ බත්, ස්ත්‍රී පුරුෂ ආදීන්ගේ වර්ණනාවලින් තොරව අර්ථ සහිතව නො දෙසාද, භාග්‍යවතුන් වහන්සේ වනාහි ඒ බඳු වූ දේශනාවන් හැර සතර සතිපට්ඨානාදිය ඇසුරු කළ දේශනාව දෙසන සේක් ද එහෙයින් එය අර්ථ සහිතව දේශනා කරති. නැවත යමෙකුගේ දේශනාව සමාන ව්‍යඤ්ජනයන්ගෙන්ම යුක්ත වූයේ ද සියලු අතින්ම ඔට්ඨජාක්ෂර රහිත බ්‍යඤ්ජනවලින් යුක්ත වූයේ ද, සියලු තැන්හි විසිරුණු සියලු නිග්ගහීතයන්ගෙන්ම යුක්ත වූයේ වේද, ම්ලේච්ඡ භාෂාවන්හි මෙන් ව්‍යඤ්ජන පරිපූර්ණත්වය නැති හෙයින් ඔහුගේ දේශනාව අබ්‍යඤ්ජන දේශනා නම් වේ. භාග්‍යවතුන් වහන්සේ වනාහි

සිථිල ධනිතඤ්ච දීඝරසසං - ගරුක ලහුකඤ්ච නිගහිතං
සම්බන්ධනං වවත්ථිතං විමුත්තනං - දසධා බ්‍යඤ්ජන බුද්ධියා පභෙදො

ශිථිලය හා ධනිතය ය ද දීර්ඝ හා හ්‍රස්ව ද, ගරුකය හා ලහුකයද සානුනාසිකව ද (දේශනා කරයි.) මෙසේ කියන ලද දශවිධ ව්‍යඤ්ජනය හා අහෝසි නො කොට පරිපූර්ණ ව්‍යඤ්ජනයන්ගෙන්ම යුක්ත කොට දේශනා කරන සේකැයි කියයි.

---

1. **ආදිමහි සීලං දසෙසය්‍ය - මජ්ඣෙ මගගං විභාවයෙ**
පරියොසානමහි නිබ්බාණං - එසා කථික සණ්ඨිති

කෙවල පරිපුණ්ණං මෙහි කෙවල යනු පරිපුණ්ණං අනුනාසික වචනයි. සියල්ල නො අඩු නො වැඩි කොට යන අර්ථයි. එකම දේශනාවක් වත් අපරිපරිපූර්ණ නොවේ. සියල්ල පරිපූර්ණය. **පරිසුද්ධං** යනු උපක්ලේශ රහිතය. යමෙක් මේ ධර්මදේශනාව නිසා ලාභය හෝ සත්කාරය ලබන්නෙමියි සිතා ද, එසේ දෙසාද ඔහුගේ ඒ ධර්ම දේශනාව අපරිසුද්ධ වේ. භාග්‍යවතුන් වහන්සේ නිරාමිස වූ සේක් මෙත්සිත පැතිරවීමෙන්, මෛත්‍රියෙන් මොලොක් වූ සිතින්ම, නගා සිටුවන ස්වභාවයෙහි පිහිටි සිතින්ම දේශනා කරන සේක. එහෙයින් පිරිසිදුකොට ම දේශනා කරති. **බ්‍රහ්මචරියංපකාසෙති** යන මෙහි බ්‍රහ්මචරිය නම් ත්‍රි ශික්ෂාවන්ගෙන් යුත් ශාසනයයි. එහෙයින් බ්‍රහ්මචරියං පකාසෙති යනු ඒ තථාගතයෝ ආදි කල්‍යාණ වූ -පෙ- පරිශුද්ධ වූ ධර්මයම දේශනා කරති. මෙසේ දේශනා කරන්නේ ත්‍රි ශික්ෂාවෙන් යුක්ත වූ ශාසන බ්‍රහ්මචරියාවම දේශනා කරන්නේ යයි මෙහි අරුත් දතයුතුය. බ්‍රහ්මචරියං යනු ශ්‍රේෂ්ඨ අර්ථයෙන් බ්‍රහ්ම වූ හැසිරීම හෙවත් බ්‍රහ්ම වූ බුද්ධාදීන්ගේ හැසිරීම යයි දතයුතුය.

තං ධම්මං ඒ කියන ලද අයුරු සම්පත් සහිත ධර්මය **සුණාති** **ගහපති වා** කුමක් හෙයින් පළමුකොට ගෘහපතියකු දක්වන්නේ ද, නිහතමානී බැවින් ද උත්සන්න බැවින් ද වේ. බොහෝසෙයින් කැත් කුලයෙන් පැවිදි වූවාහු කුලය නිසා මානය උපදවයි. බමුණු කුලයෙන් පැවිදි වූවාහු අධ්‍යාපනය (මන්ත්‍ර) නිසා මානය උපදවයි. පහත් කුලවලින් පැවිදි වූවාහු තමා ගේ පහත් ගති පැවතුම්වලින් සෘජුව සිටින්නට නොහැකි වෙයි. ගෘහපති දරුවෝ දහදිය ගලන කිහිලිවලින් යුක්තව, ලුණු පිපෙන පිටෙන් යුතුවැ බිම හාරමින් මාන දර්ප ඇත්තෝ වෙති. ඔව්හූ පැවිදි මානයක් හෝ දර්පයක් නො කොට ශක්ති පමණින් බුදු වදන් උගෙන විදර්ශනාව පිණිස කමටහන් වඩන්නාහූ රහත් බැව්හි පිහිටන්ට හැකිවෙත්. තව ද ඉතිරි කුලයන්ගෙන් නික්ම පැවිදි වූවාහු නම් බොහෝ නොවෙති. ගෘහපතියෝම බොහෝ වෙත්. මෙසේ නිහතමානී බැවින් ද, උත්සන්න බැවින් ද පළමුකොට ගෘහපතියා දක්වයි. **අඤ්ඤතරස්මිං වා** ඉතිරි කුලයන් අතරෙහි හෝ එක්තරා කුලයෙක්හි **පච්ජාජාතො** උපන්නේ.

තථාගතෙ සද්ධං පටිලභති පිරිසිදු දහම් අසා ධර්මස්වාමී වූ තථාගතයන් කෙරෙහි 'ඒකාන්තයෙන් බුදුහු සම්මා සම්බුද්ධහයි' ශ්‍රද්ධාව ලබයි. පැහැදීම වැඩෙයි. **ඉතිපටිසඤ්චික්ඛති** මෙසේ නුවණින් සලකා බලයි. **සම්බාධො සරාවාසො** යනු යම් විධියකින් සැටරියන් ගෙයක

යොදුන් සියයක් අතරම අඹුසැමි දෙදෙනෙක් වෙසෙත් ද, එතකුදු වුවත් ඔවුන්ට සැක සහ වෙනත් පළිබෝධයන් නිසා ගෘහවාසය සම්බාධ සහිත ම ය. **රාජාපථෝ** යනු රාග රජස් ආදීන්ගේ උත්පත්ති ස්ථානයයි. මහා අට්ඨකථාවේ කියන ලදී. පැමිණෙන මග යයි ද, කියනු වටී. නො ලැගෙන හේතුවෙන් අභ්‍යවකාශයක් මෙනියි **අබ්භොකාස** නම් වේ. පැවිදි තෙම වනාහි කුළු ගේ, රුවන් පහය, දෙව් විමන ආදී වූ වසන ලද දොර ජනෙල් ඇති වැසුණු තැනක වසන්නේ නමුත් එහි නො ලැගේ ද, නො ඇලේ ද, නො බැඳේ ද, එහෙයින් කියන ලදී. **අබ්භොකාසෙ පබ්බජ්ජා තව ද සම්බාධෝ ඝරාවාසෝ** කුසල ක්‍රියාවන්ට අවකාශ නැති බැවිනි. රාගාදී රජස් උපදින මගකි. රජස්වලට නො වැසූ කසළ ගොඩක් මෙන් කෙළෙස් රජස් රැස්වන බැවිනි. පැවිද්ද අභ්‍යවකාශයකි. කුශල ක්‍රියාවන්ට කැමති සේ අවකාශ ඇති බැවිනි.

නයිදං සුකරං -පෙ- **පබ්බජෙය්‍යං** යනු මෙහි සංක්ෂේප කථාය. යම් මේ ත්‍රිශික්ෂාවන් බ්‍රහ්මචරියාවක් එක් දවසකුදු නොකඩකොට අවසාන සිතට පැමිණිය යුතු බැවින් **එකනත පරිපුණ්ණා** නම් එක දවසකුදු සංක්ලේශ මලයෙන් මල රහිත කොට අවසාන සිතට පැමිණිය යුතු බැවින්, **එකනත පරිසුද්ධ** නම්. **සංඛලිඛිතං** ලියවන ලද සක්ගෙඩියක් වැනිකොට සේදූ හක්ගෙඩියක් සමානකොට, හැසිරිය යුතු (බඹසර) **අගාරං අජ්ඣාවසනා** ගෘහ ජීවිතයෙහි වසන්නහු විසින් ඒකාන්ත පරිපූර්ණ කොට, හැසිරෙන්ට පහසු නොවේ. මම කෙස් රවුල් බහා කසට රස පෙවූ බැවින් කසාවන් වූ, බඹසර වසන්නවුන්ට සුදුසු වූ වස්ත්‍ර හැඳ පෙරවා ගිහිගෙන් නික්ම පැවිද්දට පිළිවදනේ නම් ඉතා යෙහෙක. මෙහි ගිහිගෙට හිත වූ අවශ්‍ය වූ කෘෂි වණික් කර්මාන්තාදිය 'අගාරිය' යයි කියනු ලැබේ. ඒවා පැවිද්දෙහි නැති බැවින් 'අනගාරිය' යයි දතයුතුය. ඒ පැවිද්දට **පබ්බජෙය්‍ය** පිළිපදනෙම් නම් **අපපං වා දහසින්** බැඳි පියලි භෝගස්කන්ධ අල්ප වේ. දහස පටන් මහත් නම් වේ. පසුපස්සෙන් අනුව එන යන අර්ථයෙන් ඤාතිවරයා **ඤාති පරිවට්ට** නම් වේ. හේ විස්සකින් යට අල්ප වේ. විස්ස පටන් මහත් වේ. **භික්ඛූනං සික්ඛාසා ජීව සමාපන්නෙනා** භික්ෂූන්ගේ යම් අධිශීල සංඛ්‍යාත ශික්ෂාවක් වේද, එය ද යම් ශික්ෂාවෙක්හි භික්ෂූන් සමග ජීවත් වේද, සමාන දිවි පැවතුම් ඇත්තාහු, සභාග පැවතුම් ඇත්තාහු, වෙත් ද, ඒ භාග්‍යවතුන් විසින් පනවන ලද ශික්ෂාපද සංඛ්‍යාත සාජීවය ද එහි හික්මෙන බැවින් පිළිපන්නේ **භික්ඛූනං සික්ඛාසාජීව සමාපන්නෙනා** නම් වේ. ශික්ෂාව පරිපූර්ණ

කරන්නෙක් සාජීවය ද නො ඉක්මවන්නෙක් ව, ඒ දෙකට පැමිණියේ යන අර්ථයි.

පාණාතිපාතං පහාය යනාදියෙහි පරපණ නැසීම පිළිබඳ විස්තරය ඉහත විස්තර කරන ලදී. **පහාය** මේ සතුන් මැරීමේ සිතිවිල්ල නම් වූ දුශ්ශීල බව දුරුකොට, **පටිවරතො හොති** ප්‍රහීණ වූ කාලයේ පටන් ඒ දුසිල්බවෙන් වෙන් වූයේ, මෑත් වූයේම වෙයි. **නිහිතදණ්ඩා නිහිත සත්ථා** අනුන් නැසීම පිණිස ලීයක්-මුගුරක් හෝ ආයුධයක් ගෙන නො පවත්නා හෙයින් බහා තැබූ දඬු ඇත්තෙක් ද වේ යන්නයි. තව ද මෙහි දඬු තබා සියලුම සෙසු උපකරණ සත්ත්වයින් වෙහෙසෙන බැවින් ආයුධ නමැයි දතයුතු. යම්කිසි භික්ෂුවක් සැරයටියක් හෝ දැහැටිදඬු කැපීම සඳහා පිහියක් හෝ කතුරක් හෝ එවැනි යමක් ගෙන හැසිරේද ඒ සතුන් මරණු සඳහා නොවේ. එහෙයින් ඒවා නිහිත දණ්ඩ නිහිතසත්ථ යන ගණයටම වැටේ. **ලජ්ජී** පාපය පිළිකුල් කරන ස්වභාවය වූ ලජ්ජා ස්වභාවයෙන් යුක්ත වූ, **දයාපන්නො** දයාවට මෙත්සිත් ඇති බවට පැමිණියේ, **සබ්බපාණභූත හිතානුකම්පී** සියළු සතුන් වෙතම දක්වන හිතවත් බව, අනුකම්පාව, කරුණාව ඒ මෙත් සිත් ඇති බවට පැමිණි බැවින් සියළු සත්ත්වයන් කෙරෙහිම මෙත්සිත් ඇත්තේ යන අර්ථයි. **විහරති** වාසය කරයි. ඉරියව් පවත්වයි. පාලනය කරයි.

දෙන ලද්දක්ම ගනීනුයි දිනනාදායී නම් වේ. සිතින් ද දෙන ලද්දක් ම කැමති වේනුයි දිනන **පාටිකංඛී** නම්. සොරකම් කෙරේනුයි එන නම් වේ. සොරෙක් නොවූයෙන් අථෙනෙන යනු වේ. නොසොර වූ බැවින්ම, **සුචිභූතෙන** යනු වේ.

අත්තනා අත්බැවින්, සොර නොවූ පවිත්‍ර වූ ජීවිතයක් ඇතිවම වාසය කෙරේ යන අදහසයි.

අබ්‍රහ්මචරියං උසස් නොවූ හැසිරීම, උසස් වූ, ශ්‍රේෂ්ඨ වූ, බ්‍රහ්ම වූ ආචාරයෙහි හැසිරේනුයි **බ්‍රහ්මචාරී** යනු වේ. **ආරාචාරී** අබ්‍රහ්මචරියාවෙන් දුරුව හැසිරෙනසුළු, **මෙථුනා** රාගය ඉපදවීම් සමාන බැවින් 'මෙථුනක' යන ව්‍යවහාර ඇත්තවුන් විසින් සේවනය කරන බැවින් 'මෙථුන' යයි කියන අසද්ධර්මයෙන්, **ගාමධම්මා** ග්‍රාම්‍ය වූ, ගම්වැසියන් ගේ ධර්මයෙන්,

ඇත්ත කියන්නේ නුයි **සචචවාදී** නම් ඇත්තෙන්ම ඇත්තම ඇත්තටම පිහිටුවයි යන අදහසින් **සචචසන්ධ** නම්. අතරින් අතර බොරු නො කියයි යන අර්ථයි. යම්හෙයකින් යම් පුරුෂයෙක් කිසිවිටෙක බොරු කියා ද, කිසිවිටක ඇත්ත කියා ද, ඔහුගේ බොරුවෙන් අනර්ථ කළ බැවින් සැබෑව සැබෑ ලෙසින් නො ගැලපේද, එහෙයින් හේ 'සච්චසන්ධ' නොවෙයි. කෙනෙකු එබඳු නොවූයේ ජීවිතය හේතුකොට ගෙන ද බොරු නොකියා ඇත්තෙන් ඇත්තම පාවිච්චි කෙරේ ද ඔහු 'සච්ච සන්ධ' නම් වෙයි. **ථෙතො** ස්ථිර වූයේ, තිරකථා ඇත්තේ යනුයි. යමෙක් කහ අලවල වර්ණය මෙන් ද, දහයියා ගොඩක සිට වූ කණුවක් මෙන් ද, අසුපිට තබන ලද කොමඩු ගෙඩියක් මෙන් ද, ස්ථිර නොවූ කථා ඇත්තේ වෙයි. එකෙක් ගලෙක ඇඳි ඉරක් මෙන් ද, ඉන්ද්‍රඛීලයක් මෙන් ද යුක්ත වූ කථා ඇත්තේ වෙයි. කඩුවෙන් හිස සිඳින කල්හි ද කථා දෙකක් නො කියයි. මෙවැනි අය 'ථෙත' නම් වේ. **පචචයිකො** විශ්වාස කටයුතු වූයේ ඇදහිය යුත්තේ, යන අර්ථයි. ඇතැම් පුද්ගලයෙක් විශ්වාස නොකටයුත්තේ වෙයි. මෙය කවුරුන් විසින් කියන ලදැයි විමසූ විට අසවලා විසිනැයි කී කල්හි ඉදින් ඔහු විසින් කියන ලද නම් එයම ප්‍රමාණය. නැවත විමසිය යුත්තක් නැත. එය එසේම යයි කිවයුතු බවට පත්වේ. මෙතෙම 'පචචයික' යයි කියනු ලැබේ. **අවිසංවාදකො ලොකසස** ඒ සත්‍යවාදී බැවින් ලෝකයා රැවටීම නො කරයි යන අර්ථයි.

ඉමෙසං භෙදාය යන මෙහි 'ඉතො' යයි කියන ලද යම් කෙනෙකුගේ සමීපයෙහි අසන ලද්ද ඔවුන්ගේ බිඳීම පිණිස **භිනනානං වා සන්ධානා** කිසියම් හේතුවකින් විරසක වූ මිතුරන් දෙදෙනෙකු අතුරෙන් හෝ සමාන උපාධ්‍යායයන් අතුරෙන් හෝ මේ එකිනෙකා වෙත එළඹ, මෙබඳු කුලයෙක පවුලක උපන් දැනඋගත්කම් ඇති, ඔබට මෙය සුදුසු නො වන්නේ ය කියා ඇති, ඔබට මෙය සුදුසු නො වන්නේ ය කියා සමගි කරන්නේ **අනුපපදානා** සමගිය සමාදානය දැඩි කරන්නේ, සමගි වූ දෙදෙනෙකු දැක, මෙබඳු පවුලක උපන් මෙබඳු ගතිගුණවලින් යුත් වූ තොපට මෙය සුදුසුමය කියා දැඩි, තහවුරු කරන්නේ මොහුට නුයි **සමගහාරාමො** යයි කීයේය. යම්කිසි තැනක සමගියක් නැත් ද, එහි වසන්නට කැමති නොවේ යන අර්ථයි. 'සමගහාරාමො' යනු පෙළයි. **සමගහරතො** සමගි වූවන් කෙරෙහි ඇලුනේ, ඔවුන් හැර වෙන තැනකට යාමට අකමැති වේ යන අර්ථයි. සමගි වූවන් දැක විමසා සතුටු වන්නේ **සමගහ නන්දි** යනුයි. **සමගහ කරණිං වාචං භාසිතා** සමගි වූවන් කෙරේ

යම් වචනයක් කියයි ද, සමගි වූවන් ම කෙරෙයි ද, වෙනත් (අහිතකර දේ නො කියයි යන අර්ථයි.)

නෙලා දෝෂය ඵලය යයි කියයි. මේ වචනය පිළිබඳ දොසක් නැත්තේනුයි 'නෙලා' නම් වේ. නිදොස් යන අර්ථයි. **නෙලංගො සෙත පවඡාදො** යන මෙහි කියන ලද සීලය මෙනි. **කණණසුඛා** අකුරුවල යෙදීම හා ශබ්දය නිසා කණට මිහිරි වූ, ඉඳිකටුවකින් විදින්නාක් මෙන් කණට නොරිදවයි. අරුත්බර නිසා මිහිරි බවින් සියලු සිරුරෙහි කෝපය නූපදවා ප්‍රේමය උපදවයි. ඒ නිසා **පෙමනීයා** නම්. හදවතට නොගැටී දුක් නොදී සුවසේ සිතට පිවිසේ යන අරුතින් **හදයංගමා** වේ. ගුණයෙන් පරිපූර්ණව පුරයෙහි වූවෝ **පොරි** නමු. පුරයෙහි වැඩුණු අඟනක් ලෙසින් සියුමැලි වූවා යන අරුතින් ද **පොරි** නම් වේ. 'පුරසස එසා' යිද **පොරී** නමි. පුරසස එසා යනු නගරවාසීන්ගේ කථාවයි. නගරවාසීහු සුදුසු වූ කථා ඇත්තෝ වෙති. පියා පමණ වූවහුට 'පිතා' යයි ද, සොහොයුරු පමණ වූවහුට 'භාතා' යයි ද කියයි. මෙබඳු කථා බොහෝවිට සිත්කළු වේය යන අරුතින් **බහුජන කනතා** නම්. බොහෝදෙනාට මනාප බැවින්, සිතේ සතුට ඇති කරත්නුයි **බහුජන මනාපා** නම් වෙයි.

කාලය කියන්නේනුයි **කාලවාදී** නම්. කියයුතු කාලය සලකා කියන්නේය යන තේරුමයි. විද්‍යමාන වූ ම සත්‍ය වූම ඇත්තක්ම කියතියි **භූතවාදී** නම් වේ. මෙලෝ පරලෝ යහපත සලසා දෙන අර්ථවත් වූවක්ම කියන්නේ යයි **අත්ථවාදී** නම්. නවලොව්තුරු දහම් ඇසුරු කියන්නේ යයි **ධම්මවාදී** නම් වේ. සංවර විනය ප්‍රහාණ විනය ඇසුරුකොට කියන්නේනුයි. **විනයවාදී** නම්. තැන්පත් කරන ඉඩ ප්‍රමාණය නිධානයයි කියයි. නිධානයක් ඇත්තේය යන අරුතින් **නිධානවතී** නම්. හදවතෙහි තැන්පත් කරන ලද්ද තෙපුල කියන්නේ ය යන අර්ථයි. **කාලෙන** මෙසේ කියන්නේ නමුදු මම නිධන්ගත වචනයක් කියන්නෙමි'යි නො කල්හි නො කියයි. සුදුසු කල්ම බලා කියයි යන අර්ථයි. **සාපදෙසං** උපමා සහිතව, කරුණු සහිතව, **පරියත්තවතිං** පරිච්ඡේදය දක්වා යම්සේ මේ පිළිබඳව පරිච්ඡේදය පෙනේ ද මෙසේ කියන්නේය යන අර්ථයි. **අත්ථසංහිතං** විවිධ ක්‍රමවලින් බෙදා වෙන්කොට විභාග කරන්නෙකු විසින් ගන්නට නො හැකි බැවින් අර්ථ සම්පන්න කොට නැතහොත් ඒ අර්ථවාදී තෙමේ යම් අර්ථයක් කියා ද එය අර්ථයෙන් යුක්ත බැවින් අර්ථ යුක්ත වූ වචනයක්ම කියයි. අනෙකක් ඉවත දමා අනිකක් නො කියයි.

බීජගාම භූතගාම සමාරම්භා මූල බීජ, බීජ, ඵල බීජ, අග්ග බීජ, බීජ බීජ යන පස්වැදෑරුම් බීජ සමූහයාගේ ද කිසියම් නිල් තණ, ගස් ආදී වූ භූත සමූහයාගේ ද කැපීම් සිඳීම්, ආදී වෙන් කිරීමෙන් වෙන්වූයේ බැහැර වූයේ යන අර්ථයි.

එකභත්තිකො පාතරාස භත්ත - සායමාස භත්ත යනුවෙන් දෙපරිදි වේ. ඔවුන් අතුරෙන් උදෑසන කෑයුතු බත ඇතුළු මධ්‍යාහ්නයේ පිරිසිඳින ලද දේය. ඉතිරි සායමාස බත මධ්‍යාහ්නයෙන් උඩ ඇතුළු අරුණෙන් සීමිතය. එහෙයින් ඇළු මධ්‍යාහ්නයේ දස වරක් වැළඳුවත් ඒක භත්තික වේ. ඒ සඳහා **එකභත්තිකො** යන්න කියන ලදී. රාත්‍රී භෝජනය රත්ති නම්. එයින් වැළකුනේ **රත්තූපරතො** නම්. මධ්‍යාහ්නය ඉක්ම ගියකල්හි හිරු අස්තයට යෑම තෙක් පවතින භෝජනය 'විකාල භෝජන' නම් වේ. එයින් වෙන් වූ බැවින්, **විරතො විකාල භෝජනා** නම් වේ.

ශාසනයට සුදුසු නොවන බැවින්, ශාසනයට විරුද්ධ වූ පටහැනි වූ දර්ශනය **විසූක දසසන** නම් වේ. තමන් නැටීම නැටවීම ආදී වශයෙන් කරන ක්‍රියා නෘත්‍යයෝය. ගීතයෝ ද වාදිතයෝ ද, යටත් පිරිසෙයින් මොනර නැටුම් ආදී නාට්‍යාදීන්ගෙන් යුක්ත දර්ශනයෝ **නච්ච ගීත වාදිත විසූක දසසන** යන්නෙන් ගැනේ. තමන් නටන්නට හෝ අනුන් නටවන්නට හෝ කටයුතු කිරීම, බැලීම භික්ෂූන්ට නො වටී. භික්ෂුණීන්ට නො වටී.

මල්දම් ආදිය **මාලා** යනුයි. යම්කිසි පුෂ්පයක්, යම්කිසි සුවඳ වහනය වන යමක් **ගන්ධං** යන්නෙන් ගැනෙයි. **විලෙපනං** සිවිය වර්ණවත් කිරීම, ආලේප කිරීම, එය පළඳින්නේ **ධාරණ** නම් වේ. උනු තැන් පිරවීම, කැළැල් වැසීම ආදිය **මණ්ඩන** නම් වේ. සුවඳ වශයෙන් ද ඇඟ ගැල්වීම් වශයෙන් ආලේපන වශයෙන් ද ඉවසීම **විභූසන** නම් වේ. **ඨාන** නම් කාරණයයි. යමෙක් දුසිල් සිතිවිලිවලින් ඒ මල් දැරීම ආදිය මහාජනයා කරයි ද එයින් වෙන්වූයෙන් යන අරුතින් **පටිවිරතො** නම් වේ යන අර්ථයි.

උච්චාසයනං යනු ප්‍රමාණය ඉක්මවූ ආසනයයි. **මහාසයනං** යනු අකැප වූ ඇතිරිලි අතුරන ලද ආසනයයි. එම ආසන පරිහරණයෙන් වෙන්වූයේ යන අර්ථයි. **ජාතරූපං** යනු රත්රන්ය. **රජතං** යනු කහවණුය. කහවණු, ලෝහ මාසක, ජතුමාසක, දාරුමාසක ආදී වශයෙන් ව්‍යවහාර

වන මුදල් වර්ගයි. ඒවා පිළිගැනීමෙන් වෙන්වූයේ යන අර්ථයි. තමා වෙත තබන ලද්ද නො ඉවසයි යන අර්ථයි.

ආමක ධඤ්ඤ පටිගහණ යනු හාල්, වී, යව, තිරිඟු, තණහාල්, හමු, කුරහන් යන හත්වැදෑරුම් ධාන්‍ය වර්ග අමුවෙන් පිළිගැනීමෙන් වෙන්වීම, හුදෙක් මේවා පිළිගැනීම පමණක් නොව, ස්පර්ශය ද භික්ෂූන්ට නුසුදුසුය. **ආමක මංස පටිගහණා** මෙහි වෙනත් තැනක අනුදන්නා ලද අමු මස් මාළු පිළිගැනීම ද ස්පර්ශ කිරීම ද භික්ෂූන්ට නො වටී.

ඉත්ථී කුමාරිකා පටිගහණං මෙහි ස්ත්‍රී නම් විවාහක කාන්තාවන්ය. අනෙක් අය කුමාරිකා යන්නෙන් ගැනේ. ඔවුන්ගේ පිළිගැනීම ද ස්පර්ශය ද නො වටී. අකැපය. **දාසි දාස පටිගහණ** දැසි දසුන් වශයෙන් දරුවන් පිළිගැන්නීම නො වටී. අකැපය. එහෙත් කැපකරුවෙකු, ආරාමිකයකු දෙමියි කී කල පිළිගැනුම වටී. එළු බැටළු ආදීන් පිළිගැනීම ද කෙත්වත්, අවසන්කොට ඇත්තවුන් කෙරෙහි කැප අකැප විස්තරය න්‍යාය විනය වශයෙන් විමසිය යුතු වෙයි. එහි ඛෙත්ත නම් වී ආදිය පුබ්බණ්ණය වැඩෙද එයයි. **වත්ථු** නම් යම් තැනක අපරන්තය වැඩෙද යම්තැනක ධාන්‍ය වර්ග වැඩෙද එයයි. ඛෙත්ත නම් ඒ සඳහා සූදානම් නොකළ බිම් පෙදෙසයි. **වත්ථු** නම් ඉඩම් වැව් පොකුණු ආදිය ඇතුළත් වේ.

දූතෙය්‍යං ගිහියන්ගේ පණිවුඩ, ලියුම්, සන්දේශ ආදිය රැගෙන ඔබ මොබ යාමයි. **පහිණගමනං** ගෙයින් ගෙට යන කුඩා ගමන කියයි. **අනුයෝග** යනු ඒ දෙක කිරීමයි. **කය විකකයා** මිලදී ගැනීමෙන් හා විකිණීමෙන්.

තුලා කූට ආදියෙහි කූටං යනු වංචා කිරීමයි. එහි **තුලා කූටං** යනු රූප කූට, අංගකූට, ගහණකූට, පටිච්ඡන්න කූට යයි සිව්වැදෑරුම් වේ. එහි රූපකූට නම් එක වගේ තරාදි දෙකක් ගෙන ලොකු තරාදියෙන් ගැනීමත් පොඩි තරාදියෙන් දීමත් වේ. අංගකූට නම් ගන්නාවිට පසුපසින් තරාදිය ඔසවයි. දෙනවිට ඉස්සරහින් තරාදිය ඔසවයි. ගහනකූට නම් ගන්නාවිට මුල රැහැන ගනී. දෙනවිට අග රැහැන ගනී. පටිච්ඡන්න කූට නම් තරාදිය සිදුරුකොට ඇතුළත යකඩ කුඩු බහා ගන්නේ එය පසුපස කෙරෙයි. දෙනවිට පෙරපස කෙරෙයි.

කංස නම් රන්තැටියයි. එය වංචා කිරීම කංසකූට නම් වේ. එක් රන්තැටියක් නිමවා එවැනිම රන්වන් වූ ලෝහ තැටි කිපයක් නිමකරයි. ඊට පසු ජනපදවලට ගොස් ධනවත් කුලවලට ගොස් රන්තැටි ගන්දැයි විමසයි. මිලගණන් විමසූවිට අවම අඩුම මිළට දෙනු කැමති වෙති. ඉදින් මේවායේ රන්මය බව විමසුවහොත් පරීක්ෂාකර බලා ගනිවු යයි කියමින් නියම රන්තැටිය උරගා පෙන්වයි. මෙසේ සියලු තැටි දී යෙත්.

මානකූටං මානකූට යන්න හදය භේද, සිඛාභේද, රජ්ජුභේද වශයන් තුන්ආකාර වේ. ඔවුන් අතුරෙන් හදයභේද නම් ගිතෙල් තලතෙල් ආදිය මනින කල ලැබේ. එවැනි දේ මනිනවිට යට සිදුරක් ඇති මිනුමකින් හෙමින් හෙමින් වත්කරයි කියා ඇතුළු බඳුනට බොහෝ වත්කර ගනී. සිඛාභේද - තල සහල් ආදිය මනිනවිට සිදුකරයි. තල සහල් ආදිය ගන්නා විට කුරුණිය සෙමින් පුරවා සෙමින් ගනියි. දෙනවිට ඉක්මණින් කුරුණිය පුරවා ඉක්මණින් දෙයි. (එවිට නියම ලෙස නොපිරේ) රජ්ජුභේදය කුඹුරු-ඉඩම් මනින කල ලැබේ. අත්ලස් නො ලබන(මිනින්දෝරුවෝ) කුඩා ඉඩම හෝ කුඹුර මහත් කොට මනිති.

උක්කෝටනාදියෙහි උකෙකාටනං යනු හිමියා අහිමියා කිරීම සඳහා අත්ලස් ගැනීමයි. වඤ්චනං විවිධ උපායයන්ගෙන් අනුන් රැවටීමයි. මේ එක උදාහරණයකි. එක් වැද්දෙක් මුවෙක් ද මුව පැටියෙක් ද ගෙන ඒ. එක් ධූර්තයෙක් ඔහුගෙන් මුවා කීයද? මුවපැටියා කීයදැයි මිලගණන් විමසයි. මුවා කහවණු දෙකකි. මුවපැටවා කහවණු එකකැයි වැද්දා කියයි. කහවණුවක් දී මුවපැටවා ගෙන ටිකදුරක් ගොස් නැවත මට මුවපැටවාගෙන් වැඩක් නැත. මට මුවා දෙවයි කියයි. එසේනම් කහවණු දෙකක් දෙන්නැයි වැද්දා කියයි. මා එක කහවණුවක් දුන්නා නොවේදැයි ධූර්තයා කියයි. ඔව්. මේ මුවපැටවාද ගනුව, එසේ ඒ කහවණුව ද මේ කහවණු ද මේ කහවණුවක් අගනා මුව පැටවාදැයි කහවණු දෙකක් වන්නේයයි ඔහු කියයි. හෙතෙම යුක්තියක් කියාලයි සිතා සලකා මුවා දෙයි. (එහෙත් මුවා විකිණී ඇත්තේ එක කහවණුවකටය)

නිකති යෝග වශයෙන් හෝ මායා වශයෙන් හෝ පාමංග නොවූයේ (හවඩියක් නොවූ දෙය) පාමංග (හවඩියක්) යැයි ද මැණික් නොවූයේ මැණිකයි. රත්රන් නො වූයේ රන්මයි ආදී වශයෙන් සමාන දෙයකින් රැවටීමයි.

සාවියොගෝ කුටිල (වංක සිතින් කරන) ප්‍රයෝගය මෙය අල්ලස් ගැනීමාදියටම තවත් නමකි. උක්කොටන සාවියෝගය, වංචන සාවියෝගය, නිකති සාවියෝගය වශයෙන් දතයුතු. එහෙත් එය වංචාකාරී වීමමයි.

ඡෙදන නම් අත් පා සිඳීම් ආදියයි. **වධෝ** වධ නම් මරණය, ලණු ආදියෙන් බැඳීම (මාංචු දැමීම) ආදියයි. **විපරාමාසෝ** විපරාමසය ද ගුම්බ විපරාමොසය, හිම විපරාමොසය යයි දෙපරිදිය. යමෙක් හිමවැටෙන කල හිමයෙහි සැඟවී පාරේ යන එන්නන්ගේ කොල්ල කතිද, පැහැරගනිත්ද, එය හිම විපරාමෝසයයි. යමෙක් පඳුරු ආදිය අස්සේ සැඟවී සිට පැහැරගනිත් ද මංකොල්ලකයි ද එය ගුම්බවිපරාමොසයයි. **ආලොපෝ** ආලොපය නම් නියම්ගම් ආදිය කොල්ලකෑමයි. **සහසාකාරෝ** යනු සැහැසිකම් කිරීමයි. ගෙට පිවිසි මිනිසුන්ගේ පපුවෙහි ආයුධ තබා කැමති බඩු උදුරාගැනීමයි. මේ ආදි වශයෙන් අත් පා සිඳීම් - බඩු උදුරාගැනීම් ආදී සියලු සාහසික ක්‍රියාවලින් වැළකීමයි.

සෝ සනතුටෙඨා හොති ඒ මේ භික්ෂුව ඉහත සඳහන් සිව්පසයෙහි දොළොස් අයුරකින් පෙන්නා ඇති, ඉතරෙතර ප්‍රත්‍ය සන්තෝෂයෙන් සමන්විත වූ භික්ෂුවට තුන්සිවුරු, පාත්‍රය, දැහැටිදඬු කැපීමාදිය සඳහා පිහිය, හිඳිකටුව, කාබහන, පෙරහන යන අටපිරිකර වටින්නේ යයි කියන ලදී.

තුන්සිවුර, පාත්‍රය, දැහැටිදඬු කපන පිහිය, ඉඳිකටුව, පටිය, පෙරහන යන පිරිකර අට භික්ෂුව හට වටින්නේ ය. සුදුසු වන්නේ ය.

තිචීවරං ච පතෙතා ච - වාසි සූචීච බන්ධනං
පරිසසාවනෙන අටෙඨ තෙ - යුත්ත යොගසස භිකඛුනෝ

මේ සියල්ල කය පරිහරණයට ද කුස පරිහරණයට ද, ප්‍රමාණ වෙති. කෙසේද? පළමුකොට තුන් සිවුර හැඳ පෙරවා, හැසිරෙන කල කය පරිහරණය කෙරෙයි. පෝෂණය කෙරෙයි යන අදහසින් 'කාය පරිහාරිය' වෙයි. සිවුරු කොණින් දිය පෙරා බොන කල ද, කෑ යුතු පලවැල ගන්නා කලද කුස පරිහරණය කෙරෙයි. පෝෂණය කෙරෙයි යන අදහසින් 'කුච්ඡි පරිහාරිය වෙයි. පාත්‍රය ද එයින් දිය ගෙන නාන කල ද, කුටිය පිරිබඩන

කල ද, 'කාය පරිහාරිය' වෙයි. ආහාර ගෙන වළඳන කල 'කුචඡි පරිහාරිය' වෙයි. පිහිය එයින් දැහැටි දඬු කපන කල ද, ඇඳපුටුවලට වියල්, පා සිවුරු දඬු, කිළිදඬු සකස් කරන කල 'කාය පරිහාරිය' වෙයි. උක්දඬු කපන, පොල් ආදිය සසින කල 'කාය පරිහාරිය' වෙයි. ඉදිකටුව සිවුර ආදිය මහන කල 'කාය පරිහාර' වෙයි. කැවුම් හෝ ගෙඩි හෝ සිඳ විඳ අනුභව කරනවිට 'කුචඡිපරිහාර' වෙයි. කාබහන (පටිය) බැඳ හැසිරෙන කල 'කාය පරිහාරිය' වෙයි. උක් ආදිය බැඳගන්නා කල 'කුචඡි පරිහාරිය' වෙයි. පෙරහන් මගින් දිය පෙරා නාන කල සෙනසුන් පිරිබඩන කල 'කාය පරිහාර' වෙයි. බීම සඳහා පැන් පෙරන කල ද, එයින් තල සහල් හබලපෙති ආදිය පොඟවා ආහාර වශයෙන් ගන්නා විට 'කුචඡි පරිහාරිය' වෙයි. මේ වූ කලී අටපිරිකර හිමි භික්ෂුවගේ පරිෂ්කාර මාත්‍රයෝය.

නැවත ශයනයට පිවිසෙන නව පරිෂ්කාරකයා හට එහි පිහිටි පසතුරණ හෝ පැන් කෙණ්ඩිය සුදුසුය. වටනේය. දස පිරිකරට හිඳිනා සම්කඩ පත්කඩය ද ඇතුළත් වේ. එකොළොස් පිරිකරවලට සැරයටිය හෝ තෙල් නැළිය ඇතුළත් වෙයි. දොළොස් පිරිකරවලට කුඩය හෝ වහන්සඟල ඇතුළත් වේ. තව ද මොවුන් අතුරෙහි අෂ්ටපරිෂ්කාර තෙමේ එයින්මැ සතුටු වෙයි. අන්‍යයෝ අසතුටු වෙති. වැඩිපුර ආශා ඇත්තවුන් මහා තණ්හාධිකයෝ යැයි නො කිවයුතුය. මොවුහු ද අපිස් බවින් සතුටු වූවාහු මැ සුහර වූවාහු මැ සැහැල්ලු පැවැතුම් ඇත්තාහු මැ වෙති. භාග්‍යවතුන් වහන්සේ වනාහි මේ සූත්‍රය ඔවුන් සඳහා නො වදාළහ. එය එසේමය. හෙතෙම කුඩා පිහිය ද, ඉදිකටුව ද, පෙරහන ද, පාත්‍රය ඇතුළත තබා, පාත්‍රය උරහිස එල්වා, තුන්සිවුර ශරීරයෙහි පොරවා තමන් කැමති වූ යම්තැනකට සුවසේ නික්ම යයි. පෙරළා අවුත් ගතයුත්තක් ඔහුට නොවේ.

මෙසේ මේ භික්ෂූන්ගේ සැහැල්ලු පැවැතුම් දක්වමින් භාග්‍යවතුන් වහන්සේ **සනතුටෙඨා හොති කාය පරිහාරිකෙන චීවරෙන** ආදිය වදාළහ. එහි **කාය පරිහාරිකෙන** කය පරිහරණයට, පමණ වූ, **කුචඡි පරිහාරිකෙන** කුස පරිහරණයට ප්‍රමාණ වූ, **සමාදායමෙව පකකමති** ඒ අටපිරිකර වූ සියල්ල ගෙන කය පමණක් රැගෙන යයි. මගේ විහාරය, මගේ පිරිවෙන - මගේ දායකයෝ, යයි ඔහුගේ ඇලීමක් බැඳීමක් නැත. හෙතෙම දුනුදියෙන් මිදුණු ඊතලයක් මෙන් රැළින් වෙන් වූ මහ ඇතෙකු මෙන්, කැමති කැමති සෙනසුන්, වනලැහැබ්, රුක්මුල්, අළුත් අළුත් පර්වත ප්‍රාන්ත,

පරිභෝග කරමින් හුදෙකලාව සිටී. හුදෙකලාව හිඳී. සියළු ඉරියව්වල දෙවැන්නෙක් රහිත වූයේ හුදෙකලා වූයේ (සැරිසරයි).

සිව්දිග කැමති පරිද්දෙන් හැසිරෙන්නේ නොහොත් සිව්දිග බ්‍රහ්මවිහාර පතුරවමින්, සංස්කාරයන් කෙරෙහි නොගැටෙන්නේ වේ. කුදු මහත් ප්‍රත්‍යයෙන්, සතුටුවන්නේ, උපද්‍රවයන් (බාහිර සතුන්ගෙන් සිදුවන උපද්‍රවයන් ද අභ්‍යන්තරිකව කාමච්ඡන්දාදී උපද්‍රවයන් ද) වීර්යයෙන් ඉවසමින්, තැති ගැනීම් රහිතවැ, කඟවේණෙකු මෙන්, හුදෙකලා වූයේ හැසිරෙන්නේ ය.

මෙසේ වර්ණනා කරන ලද කඟවේණෙකු හා සමාන බවට පැමිණේ. දැන් ඒ සඳහා උපමාවක් දක්වන්නේ **සෙය්‍යථාපි** ආදිය කීහ. එහි **පකබ්** සකුණෝ පියාපත් ඇති ලිහිණියෝ, ඩෙති පියාසර කරයි. මෙය වූ කලී කෙටි අරුතයි. ලිහිණියෝ නම් අසවල් ප්‍රදේශයේ ගසක පැසුණු ඉදුණු ගෙඩි ඇතැයි දැන නන් දෙසින් එහි අවුත්, නිය, හොට ආදියෙන් ඒ ගසේ ගෙඩි කති. විසුරුවා දමති. මේවා අදටය. මේවා හෙටට යයි ඔවුන් තුළ අදහසක් නැත. ගසේ ගෙඩි ඉවර වූ කල ගසෙහි පදිංචි නොවෙති. එහි පියාපත් හෝ නිය හෝ තුඩා නො තබති. ඒ ගස පිළිබඳව ආශා රහිතව, යමෙක් යම් දිසාවක් කැමති වේද, සිය පියාපත් බර පමණක් ඇතිවම එහි පියාඹා යෙති. එපරිද්දෙන් භික්ෂුව ද ඇලුම්රහිත වූයේ ආශා රහිත වූයේ අටපිරිකර පමණක්ම ගෙන නික්ම යන්නේ ය.

අරියෙන නිදොස් වූ, **අජ්ඣත්තං** සිය ආත්ම භාවයෙහි **අනවජ්ජසුඛං** නිදොස් සුවය, **සො චක්ඛුනා රූපං දිසවා** මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් යුක්ත වූ භික්ෂුව චක්ඛු විඤ්ඤාණයෙන් රූපයක් දැක යන අර්ථයි. අනෙක් පදවලින් කිවයුතු සියල්ල විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. **අබ්‍යාසෙකසුඛං** කෙලෙසුන් විසින් නො විසුරුණු නො ඉසින ලද සුවය, ඉන්ද්‍රිය සංවරයෙන් උපන් සුවය රූපාදී අරමුණු පිළිබඳව දැකීම් පමණකින් උපන් බැවින්, සිත අවිකීර්ණ (නොවිසිරීම) වේ. **සො අභිකකනෙත පටිකකනෙත** යනු සිත හයවෙනි කොට ඇති ඉන්ද්‍රියයන් ගේ සංවරයෙන් සංවර වූ භික්ෂුව ඉදිරියට යාම, පසුපසට ඒම ආදී ඉරියවු (ස්ථාන) හතේදීම මනා සිහියෙන් යුක්තව, යෝනිසෝ මනසිකාරයෙන් යුතුව නුවණින් දැන ඉටු කරන්නේ වේ. එහි යමක් කිවයුතු වන්නේ නම් ඒ සියල්ල සතිපට්ඨාන සූත්‍රයේ කියන ලදී.

චාතුද්දිසෝ අප්පටිසෝ ච හොති, සන්තසසමානෝ ඉතරීතරෙන
පරිසසයානං සහිතා අජ්ඣගි, එකෝ චරෙ ඛග්ග විසාණ කප්පෝ

සෝ ඉමිනා ච යනාදියෙන් කුමක් දක්වන්නේ ද, යමෙකුට මේ සතර ප්‍රත්‍යයෝ නැත්තාහුද ඔහුගේ අරණ්‍යවාසය සමෘද්ධ නොවේ. තිරිසනුන් හා වැද්දන් සමාන බවට පැමිණෙයි. වනයෙහි අධිගෘහිත දේවතාවෝ, මෙබඳු පව්කාර භික්ෂුවක් අරණ්‍යයෙහි විසීමෙන් කවර ප්‍රයෝජනදැයි භයානක ශබ්ද පතුරුවති. අත්වලින් හිස පැහැර පලායන අයුරු දක්වති. අසවල් භික්ෂුව වනයට පිවිස මේ මේ පව්කම් කළේ යයි අපහාසය අපකීර්තිය පතුරුවති. යමෙකුට මේ සතර ප්‍රත්‍යයෝ ඇත්ද ඔහුගේ වනවාසය සමෘද්ධ වෙයි. හෙතෙම තමන්ගේ ශීලය ප්‍රත්‍යවේක්ෂා කරමින් කිසි කැළලක් හෝ පැල්ලමක් නො දක්වමින් ප්‍රීතිය උපදවා එය ක්ෂය වශයෙන් ව්‍යය වශයෙන් සිහි කරමින් ආර්ය භූමියට බැසගනී. වනයට අධිපති දේවතාවෝ සතුටු වී ගුණ කියති. ඔහුගේ කීර්තිය දියෙහි බහාලූ තෙල් බිඳක් මෙන් පැතිරයන්නේ වේ.

එහි විවිත්ත හිස් වූ, අල්ප ශබ්ද, නිශ්ශබ්ද යන අර්ථයි. මේ සඳහා විභංගයෙහි 'විවිත්තමපි සනතිකෙ වෙපි සෙනාසනං හොති, තඤ්ච අනාකිණ්ණං ගහටෙඨහි පබ්බජිතෙහි තෙන තං විවිත්තං යයි වදාරන ලදී. මෙහි නිදාගන්නේ ද ඉඳගන්නේ ද නුයි සේනාසන නම්. ඇඳ පුටු ආදියට නමකි. ඒ සඳහා සෙනාසනනති මඤ්චොඋ'පි සෙනාසනං පීඨමපි හිසි'පි බිමෙබාහනමපි විහාරොපි අඩ්ඪයොගොපි, පාසාදොපි හම්මියමපි ගුහාපි අටෙටාපි මාලෝ'පි ලෙණමපි වෙළු ගුමෙබාපි රුක්ඛමූලමපි මණ්ඩපොපි සෙනාසනං යත්ථ වා පන භික්ඛූ පටික්කමනති සබ්බමෙතං සෙනාසනං' යනුවෙන් වදාළහ. තව ද විහාරය, අඩ්ඪයොග, (ගුරුළු පියාපත් වැනි සෙවෙනි ඇති ගේ) ප්‍රාසාදය, සඳළු සහිත ගේ, ගුහා ය, යන මේවා විහාර සේනාසන, ඇඳ, පුටු, බිසි, බිම්බෝහන යන මේවා මංච පීඨ සේනාසන නම්. පටරෙදි, සම්කඩ, තණ ඇතිරි, පත් ඇතිරි යන මේවා සත්ථත සේනාසන නම්. යම්තැනෙක්හි භික්ෂුව ආපසු පැමිණෙත් ද මෙය ඕකාසන සේනාසන වේ. මෙසේ සතරාකාර සෙනසුනක් දැක්වෙයි. ඒ සියල්ල සේනාසන නමින්ම ගැනේ. නැවත ලිහිණියක මෙන් සතරදිසාවේ කැමති සේ හැසිරෙන භික්ෂුවට සුදුසු සෙනසුන දැක්වීම සඳහා අරඤ්ඤං රුක්ඛමූලං යනාදිය වදාළහ.

එහි අරඤ්ඤං - නිකඛමිත්වා බහි ඉන්‍දඛීලා සබ්බමෙතං අරඤ්ඤං මේ භික්ෂුණීන්ගේ වශයෙන් ආරණ්‍ය යයි. **ආරඤ්ඤකං නාම සෙනාසනං පඤ්චධනු සතිකං පච්ඡිමං** මේ මහණහට සුදුසු වේ. ඒ සේනාසනවල ලක්ෂණ විශුද්ධි මාර්ගයේ ධුතංග නිර්දේශයේ දක්වයි. **රුක්ඛමූලං** ගන සෙවණලු ඇති හිස් වූ ගස්මුල, **පබ්බතං** කඳු පාමුල්, කුඩා දිය විල්වලින් ජලස්නානය කොට, සිහිල් රුක් සෙවණ යට හිඳ නන් දිගුන් වැටහෙන කල්හි සිහිල් පවනින් සැනසෙන්නහුගේ සිත එකඟ වේ. **කන්දරං** 'කං' යන්නෙන් ජලය කියවේ. එයින් දාරිත වූ දියෙන් බිඳුණු පර්වත ප්‍රදේශය යමක් 'නිතබ්බ' යයි ද 'නදී කුඤ්ජ' යයි ද කියති. එහි රිඳීපට වැනි වැලිතලාව වේ. ඉහල මුදුනේ මැණික් වියනක් මෙන් වන ගහණය. මැණික කඳවැනිව (නිල්වන්ව) ජලය ගලා බසී. මෙවැනි කඳුරට බැස දිය බී ඇඟපත සිහිල්කොට වැලි ගොඩගසා ඊ මත පාංශුකූල සිවුර අතුරා, මහණදම් පුරන්නකුගේ සිත එකඟ වේ. ගිරිගුහා පර්වත දෙකක් අතර හෝ තනි පර්වතයක උමගක් සමාන වූ මහා ඉඩකඩක් වේ. සොහොන්බිමක හැඩරුව විශුද්ධි මාර්ගයේ දක්වයි. **වනපත්ථං** යනු මහජනයාගේ උපචාර සීමාව ඉක්මවා, යම්තැනක ගොවිතැන් නො කෙරේද, නො වපුරන්නේ ද එතැනයි. **දූරානමෙතං සෙනාසනං අධිවචනං** යනාදිය එහෙයින් කීහ. **අබ්භොකාසං** නො වැසුණු තැන, සමහරවිට කැමති වන්නෝ සිවුරු කුටියක් කර වෙසෙති. **පලාල පුඤ්ජං** පිදුරු රැස, මහත් පිදුරු ගොඩකින් පිදුරු ඇද ලෙන් වැනි වාසස්ථානයක් කරති. ගස් පඳුරු ආදිය මත පිදුරු යොදා ඒ යට හිඳ මහණදම් පුරති.

පච්ඡා භත්තං බතට පසුව, **පිණ්ඩපාත පටික්කන්තා පිඬුසිඟා** යාමෙන් වෙන්වූයේ, වැළකුනේ, **පල්ලංකං ආභුජිත්වා** ඌරු බද්ධාසනය බැඳ **උජුං කායං පණිධාය** ශරීරය කෙලින් තබා, දහඅටක් වූ කොඳුඇට කොනින් කොන පිහිටුවා, මෙසේ සිටින්නහුගේ සම්-මස්-නහර නො නැමී කෙළින් සිටී. එකල්හි ඔහුට වරින් වර වේදනා නූපදියි. වේදනා නූපදනා කල්හි සිත එකඟ වෙයි. කමටහන නො පෙරළෙයි. කමටහන් වැඩීමට තරවීමට පැමිණෙයි.

පරිමුඛං සතිං උපට්ඨපෙත්වා කර්මස්ථානයට අභිමුඛව සිහිය පිහිටුවා, මුඛ සමීපයෙහි හෝ කොට යන අර්ථයි. විභංගයෙහි **අයං සති උපට්ඨිතා හොති සුපට්ඨිතා, නාසිකග්ගෙවා මුඛ නිමිත්තෙ වා තෙන වුච්චති පරිමුකං සතිං උපට්ඨපෙත්වා'** යනුවෙන් කීහ. නොහොත් **පරීති**

පරිගගහටෙථා මුඛනති නීය්‍යානටෙථා - සතීති උපටථානටෙථා තෙන වුච්චති පරිමුඛං සතිං' මෙසේ පටිසම්භිදා මාර්ගයෙහි කී නයින් ද මෙහි අර්ථ දතයුතු. ගන්නා ලද හා නික්මයාම ඇති සිහිය ඇතිව, යනු කෙටි අදහසයි.

අභිජඣං ලොකෙ යනු බිඳීම් අර්ථයෙන් පංච උපාදානස්කන්ධ ලෝකයයි කියයි. එහෙයින් පංච උපාදානස්කන්ධයන් කෙරෙහි රාගය දුරුකොට, කාමච්ඡන්දය සිඳ දමා යනු මෙහි අර්ථයයි. **විගතාභිජෙඣනාති** සිඳ දැමීම් වශයෙන් ප්‍රහීණ බැවින් පහවූ අභිධ්‍යාව ඇතිව චක්ඛුර් විඥානය සමාන වූයේ නොවේ යන අර්ථයි. **අභිජඣාය චිතතං පරිසොධෙති** යනු අභිධ්‍යාවෙන් සිත සම්පූර්ණයෙන් මුදයි. යම්සේ අභිධ්‍යාව මුදන්නේත් නැවත නොගන්නේත් යන අර්ථයි. මෙසේ කරන්නේය යන අදහසයි. **බ්‍යාපාද පදොසං පහායාති** ආදියෙහි ද මේ ක්‍රමයමැයි.

මෙයින් සිත විකෘතියට පැමිණෙයි. කුණු කසළ ආදිය මෙන් පළමු ස්වභාවය හරී. **බ්‍යාපාදො** විකාරයට පැමිණීමෙන් දූෂ්‍ය වෙයි. අනුන් හෝ දූෂ්‍ය කෙරෙයි. විනාශ කෙරෙයි. **පදොසො** මේ දෙකින්ම ක්‍රෝධය හඳුන්වයි. **ථීනං** සිතේ ගිලන් බවයි. **මිද්ධං** සිතිවිලිවල ගිලන් බවයි. ථීනයද මිද්ධයද ථීනමිද්ධං නම්. **ආලොක සඤ්ඤී** යනු දහවල් දුටු එළිය රාත්‍රියෙහි ද හැඳිනීමෙහි සමත් වූ, පහ වූ නීවරණ ඇති, පිරිසිදු වූ සංඥාවෙන් යුක්ත වූයේ **සතො සමපජානො** සිහියෙන් ද නුවණින් ද සමන්විත වූ, මේ දෙකම ආලෝක සංඥාවට උපකාර වේ. සිත විසිරී යන උද්ධච්චයද සැක සංකා ඇති කුකුස් බවද උද්ධච්ච කුකකුච්ච වේ. **තිණ්ණවිචිකිච්ඡො** සැකය දුරුකොට, සැකය ඉක්මවා සිටියේ, මේ කෙසේද? මෙය පවතින්නේ ද? නො පවතින්නේද යන්න අකථංකථී නම් වේ. **කුසලෙසු ධමෙමසු** නිවැරදි ධර්මයන්හි, මොව්හු කුසලයෝද? කුසල් වන්නේ කෙසේද? ආදී වශයෙන් සැක නො කරයි යන අර්ථයි. මේ මෙහි කෙටි සටහනයි. නැවත මේ නීවරණයන්හි වචනාර්ථ ලක්ෂණාර්ථ භේදයෙන් යමක් කිවයුතු වේද ඒ සියල්ල විශුද්ධි මාර්ගයෙහි දැක්වේ.

පඤ්ඤාය දුබ්බලී කරණෙ මෙම පංච නීවරණ ඉපදීමෙන් නූපන් ලෞකික ලෝකෝත්තර ප්‍රඥාවට උපදින්ට ඉඩ නොදේ. උපන්නා වූ අෂ්ට සමාපත්ති හෝ පංච අභිඥාවන් මුලින් උපුටා හෙලති. එහෙයින් ප්‍රඥාව දුර්වල කෙරේ යයි කියනු ලැබේ. **තථාගතපදං ඉතිපි** යනු මෙය

තථාගතයන්ගේ ඤාණපදය ඤාණ වලඤ්ජනය නුවණින් ඇක්මුණු තැනයයි කියනු ලැබේ. **තථාගත නිසෙවිතං** තථාගතයන් වහන්සේගේ නුවණ නමැති ඉළයෙන් ගටනා ලද තැනෙකි. **තථාගත රඤ්ජිතං** යනු තථාගතයන්ගේ නුවණ නමැති දළයෙන් ඉරි ඇඳි තැනෙක.

යථාභූතං පජානාති ස්වභාව වූ පරිද්දෙන් දැනගනී. **නත්ථෙවතාව අරියසාවකො නිට්ඨං ගතො හොති** මේ ධ්‍යානාභිඥා බාහිරකයන් හා සාධාරණයෝය. ඒ තාක් නිමාවට නො ගියේ වෙයි. මාර්ග ක්ෂණයෙහිද අවසන් නො කළ කටයුතු ඇති බැවින් ඒ තාක් නිමාවට නොගියේ වේ. **අපි ච ඛො නිට්ඨං ගච්ඡති** නැවත ද වනාහි මාර්ග ක්ෂණයෙහි මහා ඇතු දක්නා වූ නාග වනිකයා මෙන් භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයහයි මේ ආකාරයෙන් තුන් රුවන්හි නිමාවට යෙයි. **නිට්ඨංගතො හොති** මෙසේ මාර්ග ක්ෂණයෙහි නිෂ්ඨාවට යන්නේ අර්හත් ඵල ලක්ෂණයෙහි අවසන් කළ සියලු කිස ඇති බැවින් හැම අයුරකින්ම තුන්රුවන්හි නිමාවට ගියේ වේ. ඉතිරිය සියලු තන්හි ප්‍රකට අර්ථ ඇත්තේය.

චූලහත්ථිපදොපම සූත්‍ර වර්ණනාව නිමියේය.

1-3-8

එවමෙම සුතං යනු මහා හත්ථිපදොපම සූත්‍රයයි. එහි **ජංගලානං** යනු මහාපොළොවෙහි හැසිරෙන්නා වූ, **පාණිනං පා** සහිත ප්‍රාණීන්ගේ, **පද ජාතානි** පදයෝ, **සමොධානං ගච්ඡනති** රැස්වීමට සහභාගිවීමට යති. **අගග මක්ඛායති** යනු ශ්‍රේෂ්ඨ යයි කියනු ලැබේ. **යදිදං මහන්තනෙන** යනු මහත් බැවින් අග්‍රයයි කියනු ලැබේ. ගුණ වශයෙන් නොවේ යන අර්ථයි. **යෙ කෙචි කුසලා ධම්මා** කිසියම් ලෞකික ලෝකෝත්තර කුශල ධර්මයෝ,

සංගහං ගච්ඡනති මෙහි සතරාකාරයකින් සංග්‍රහ කෙරේ. සජාති සංග්‍රහ, සඤ්ඤජාති සංග්‍රහ, කිරිය සංග්‍රහ, ගහණ සංග්‍රහ යන වශයෙනි. 'සියළු ක්ෂත්‍රියෝ එත්වා, සියළු බ්‍රාහ්මණයෝ එත්වා යනුවෙන් යොදන්නේ සජාති සංග්‍රහ නම් වේ. 'සියලු කොසොල්රට වාසීහු සියලු මගධරට වාසීහූ' මෙසේ යොදන්නේ උපන් ප්‍රදේශ, සඤ්ඤජාති වශයෙනි. සියලු රියැදුරෝ සියලු ධනුර්ධරයෝ මෙසේ ක්‍රියා වශයෙන් යොදන්නේ කිරිය සංගහ නම් වේ. චක්ඛායතනය කවරේද? ස්කන්ධ ග්‍රහණයට යන්නේද, චක්ඛායතනය රූපස්කන්ධ ග්‍රහණයට යන්නේද? මේ ආදී වශයෙන් පවතින්නා වූ, පැවතිය යුතු වූ චක්ඛායතන, රූපස්කන්ධ, ආදී වශයෙන් සංග්‍රහ කරන මෙය ගහණ සංග්‍රහ නම් වේ. මෙතැන්හි දී මෙයම අදහස් කරන ලදී.

තව ද චතුනනං අරිය සචචානං කති කුසලා කති අකුසලා, කති අබ්‍යාකතා යන ප්‍රශ්නය විසඳීමෙහි, **සමුදය සචචං අකුසලං, මගග සචචං කුසලං, නිරොධ සචචං අබ්‍යාකතං** යනුවෙන් ආ හෙයින් චාතුර්භූමික කුසලයම සත්‍යයන් දෙකක් භජනය කරන්නේ නොවේද? ඉක්බිති කුමක් හෙයින් මහා තෙරුන්වහන්සේ චතුරාර්ය සත්‍යයන්ගේ ග්‍රහණයට යන්නේ යයි වදාළ සේක් ද සත්‍යයන්ම ඇතුළත් බැවිනි.

යම්සේ සාධිකමිදං භික්ඛවෙ දියඩ්ඪං සික්ඛාපදසතං අඩ්ඪමාසං උදෙදසං ආගච්ඡති යත්ථ අත්ථකාමා කුලපුත්තා සික්ඛන්ති තිස්සො ඉමා භික්ඛවෙ සික්ඛා අධිසීල සික්ඛා, අධි චිත්ත සික්ඛා, අධි පඤ්ඤා සික්ඛා' යන මෙහි සාධක දෙඅඩ ශික්ෂා පද සියය එක් අධිශීල ශික්ෂාවම වෙයි. ඒ මගින් හික්මෙන්නේ ද, ත්‍රිවිධ ශික්ෂාවම හික්මෙන්නේ යයි දක්වයි. ශික්ෂාවන්ට ඇතුළත් බැවිනි. තව ද එක් ඇත් පියවරක සතර කොටසින් එක් කොටසක බැසගත්තා වූ ද, දෙවැනි තුන්වැනි සිව්වැනි කොටස්වල බැසගත්තා වූ ද, හිවල් - සා - මුව ආදීන්ගේ සෑම පා සටහනක්ම ඇත් පා සටහනෙහි ඇතුළත් කළ හැකිවාක් මෙන්, ඇත් පා සටහනින් නො මිදී එය ඇතුළටම ඇතුළත් වූ හෙයිනි. එපරිද්දෙන් ම, එකක් වූ ද, දෙකක් වූද තුනක් වූද සතරක් වූ සත්‍යයන්හි නැතිනම් චතුරාර්ය සත්‍යයන්හි සියලු කුසල ධර්මයන් චතුරාර්ය සත්‍යයෙහි ඇතුළත් කළ හැකි වන්නේ ය. ඒ සඳහා **සබෙබ තෙ චතූසු අරිය සචෙචසු සංගහං ගච්ඡනති** යන්න වදාළහ.

දුකෙඛ අරිය සචෙච ආදී උද්දේස පදයන්හි ද, **ජාති පි දුකඛා** ආදී

වූ නිර්දේශ පදයන්හි ද යමක් කිවයුතු ද ඒ සියල්ල විශුද්ධි මාර්ගයෙහි කියන ලද්දේමය. එසේ වුවද මෙහි දේශනානුක්‍රමය දතයුත්තේය.

යම්සේ දක්ෂ වූ කුලුපොත්තෙක් හොඳින් වැඩුණු උණගසක් දැක සතරට කපා, එයින් තුන්කොටසක් තබා එක් කොටසක් ගෙන, කොටස් පහකට සිඳින්නේද, එයින් සතරක් තබා එකක් ගෙන පලමින් පතුරු පහක් කරන්නේද, එයින් සතරක් තබා එකක් ගෙන එයද බඩ පැත්ත හා පිටපොත්ත පැත්ත වෙන්වන සේ දෙකට පලයිද, එසේ පිටභාගය තබා බඩපැත්ත ගෙන එයින් සුමුඟු (කුඩා පෙට්ටි) විජිනිපත්, තල්වට, තල්අතු (වටාපත්) ආදී නන් වැදෑරුම් භාණ්ඩ කරන්නේ ද, වෙනස් කරන්නේ ද, හෙතෙම ඉතිරි පිට කොටස ද, ඉතිරි කෑලි සතර ද, ඉතිරි උණ කොට කෑලි හතර ද අනෙක් පතුරු කොටස් තුන ද, කර්මාන්ත සඳහා ප්‍රයෝජනයට නොගන්නේ යයි නො කිව යුතුය. එක්වරම ප්‍රයෝජනයට නොගත හැකිය. ක්‍රමයෙන් ඒවා ද ප්‍රයෝජනයට ගනී.

මෙසේම මේ මහතෙරුන් වහන්සේ ද, කුලුපොත්තෙක් මහත උණ ගහක් ලැබී සතරකට කොටස් කළාක් මෙන්, මේ මහත් වූ සූත්‍රය (මාතෘකා වශයෙන්) ගෙන චතුරාර්ය සත්‍ය වශයෙන් මාතෘකා වශයෙන් තැබීය. කුලුපොත්තා තුන් කොටසක් තබා එකක් ගෙන, කොටස් පහකට වෙන්කලාක් මෙන් තෙරුන්වහන්සේ ආර්ය සත්‍ය තුනක් තබා එක් දුක්ඛ සත්‍යය පමණක් ගෙන ස්කන්ධ වශයෙන් පස් අයුරෙකින් කොටස් කළේය. නැවත ඒ කුලුපොත්තා කොටස් සතරක් තබා එක් කොටසක් ගෙන පහකට පැලුවේද, එපරිද්දෙන් තෙරුන්වහන්සේ සතර අරූප ස්කන්ධයන් තබා රූපස්කන්ධය පමණක් ගෙන විභාග කරන්නේ, සතරමහා භූතයෝ ද, සතරමහා භූතයන්ගේ උපාදාය රූපය යයි ආකාර පසෙකින් විස්තර කළහ. නැවත ඒ කුලුපොතු තෙමේ පතුරු සතර තබා එකක් ගෙන බඩ පැත්ත හා පිට පැත්ත යයි දෙකට පැලීද එපරිද්දෙන් තෙරුන්වහන්සේ උපාදාය රූපයද ධාතු තුන ද තබා එක් පඨවී ධාතුවම විභාග කරන්නාහු, අධ්‍යාත්මික බාහිර වශයෙන් දෙපරිද්දෙකින් දැක්වූහ.

යම්සේ කුලුපොත්තා පිට භාගය තබා ඇතුළු භාගය ගෙන නන් වැදෑරුම් භාණ්ඩ තැනී ද එපරිද්දෙන් තෙරුන්වහන්සේ බාහිර පඨවි ධාතුව තබා, අධ්‍යාත්මික පෘථිවි ධාතුව (පඨවි) විභාගකොට දැක්වීම සඳහා, **කතමාචාවුසෝ, අජ්ඣත්තිකා පඨවි ධාතු** ආදිය වදාළහ.

ඉක්බිති යම්සේ කුලුපොතු තෙමේ පිට කොටසද, ඉතිරි සතර කොටසද, ඉතිරි තුන් කොටසද අනුපිළිවෙළින් කර්මාන්ත සඳහා යොදන්නේ ද, එය එකවරටම නො හැකි වන්නේද, එපරිද්දෙන් ස්ථවිරයෝ බාහිර පඨවි ධාතුව ද ඉතිරි ධාතු තුන ද උපාදාය රූපය ද ඉතිරි අරූපස්කන්ධ සතර ද, ඉතිරි ආර්ය සත්‍ය තුන ද, පිළිවෙළින් විස්තරකොට එක්වරම දක්වන්නට නොහැක්කෝ වෙති.

තවදුරටත් රාජපුත්‍ර උපමාවෙන් ද මෙය විස්තර කරන්නට කැමතියහ. එක් මහරජ කෙනෙකුට අතිරේක පුත්‍රයෝ දහසක් සිටියාහුය. රජු ඔවුන් පළඳින රාජාභරණ ආදිය පෙට්ටි සතරක බහා වැඩිමල් පුතාට භාර දුනි. දරුව, මේ ඔබේ සහෝදරවරුන්ගේ පළඳනා බඩුය. කිසියම් උත්සවවලදී අවශ්‍ය වී ඉල්ලුවහොත් ඔවුන්ට දුන මැනවි.

ඔහු ද යහපති පියාණනි යි එසේ කරන්නෙමි යි කියා ගබඩාව විවෘතකොට එහි තැන්පත් කළේය.

ඉන්පසුව එළැඹි එක් සැණකෙළි දිනක රජදරුවෝ පියා වෙත ගොස්, නැකැත් ක්‍රීඩාවලට සහභාගි වීම සඳහා අපට ආභරණ දෙන්නැයි ඉල්ලූහ. 'දරුවනි, තොපගේ සියලු ආභරණ වැඩිමහල් සහෝදරයා භාරයේ තබා ඇත. ඒවා ඔහුගෙන් ඉල්ලා පළඳිව්' යයි කීය. ඔව්හූ මැනවැයි පිළිවදන් දී ඔහු වෙත ගොස් 'අපගේ පළඳිනා බඩු ඔබ අතෙහිල. එය දුන මැනව'යි කීවාහුය. ඔහු ද ආභරණ දෙනු සඳහා ගබඩාව විවෘතකොට පෙට්ටි පෙට්ටි සතරින් තුනක් තබා, එකක් විවෘතකොට, එයින් මලු පහක් බැහැරකොට සතරක් තබා, එකක් විවෘතකොට, එයින් කරඬු පහක් බැහැරකොට සතරක් තබා, එකක් විවෘතකොට, පියන පසෙක තබා එයින් නන්වැදෑරුම් ආභරණ ඉවතට ගෙන දුන්නේය. හෙතෙම ඉතිරි කරඬු සතරින් ද, සුමුගු සතරින් ද ඉතිරි පෙට්ටි තුනෙන් ද එකවර බෙදා නොදෙයි. එහෙත් පිළිවෙළින් දේ. එක්වරම දෙන්නට නොහැකි වේ. ඒ උපමාවෙහි මහරජු මෙන් භාග්‍යවතුන් වහන්සේ දතයුතුය. රජා හමසම් සෙලාති භගවා ධම්මරාජා අනුත්තරෝ ජ්‍යෙෂ්ඨ පුත්‍රයා මෙන් සැරියුත් තෙරණුවන් ද දතයුතුයි. යං ඛෝ තං භික්ඛවෙ, සම්මා වදමානෝ වදෙය්‍ය භගවතෝ පුත්තෙනා ඔරසෝ මුඛතෝ ජාතෝ ධම්මජෝ, ධම්ම නිම්මිතෙනා, ධම්ම දායාදෝ, නෝ ආමිසදායාදෝ සාරිපුත්ත මෙව තං සම්මා වදමානෝ වදෙය්‍ය, භගවතෝ පුත්තෙනා නෝ ආමිස දායාදෝ යන්න වදාරන ලදී.

මෙහි දහසක් රජ පුතුන් මෙන් භික්ෂු සංඝයා ද, වැඩිමල් පුතු මෙන් සැරියුත් තෙරුන් ද දතයුතුය.

'භික්ෂූන් සම්බන්ධ වූ අතිරේක දහසක්, කෙසේවත් බිය නොවූ, නිර්වාණගාමී වූ ධර්මය දේශනා කරන්නා වූ පහ වූ කෙලෙස් ඇති සුගතයන් වහන්සේ ඇසුරු කරති.'

පරෝ සහසසං භිකඛූනං - සුගතං පයිරුපාසති
දෙසෙනතං විරජං ධමමං - නිබබාණං අකුතෝ භයං

රජු විසින් ඒ රජදරුවන්ගේ පළඳනා පෙට්ටි හතරක බහා වැඩිමල් පුතු අත තැබුවාක් මෙන්, භාග්‍යවතුන් විසින් සිව්සස් පවසනු පිණිස සැරියුත් තෙරුන් වෙත පැවරූ කාලය දතයුතුය. **සාරිපුතෙතා භිකඛවෙ පහොති චත්තාරි අරියසචචානි විත්ථාරෙන ආචිකඛිතුං දෙසෙතුං පඤඤාපෙතුං පටඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානි කාතුං** යන්න එහෙයින් වදාළහ.

එබඳු වූ සැණකෙළියෙහි රාජපුත්‍රයන් රජු කරා පැමිණ පළඳනා ආභරණ ඉල්වන කලක් මෙන්, භික්ෂු සංඝයාගේ වස් එළඹෙන සමයෙහි පැමිණ දහම් දෙසනු සඳහා අයැදි කාලය ගතයුතුය. වස් එළඹෙන දවස ළං වූ කල්හි මේ සූත්‍රය දේශනා කරන ලද්දේල. රජු විසින් දරුවනි, ඔබේ වැඩිමහල් සොහොයුරා ළඟ ම විසින් පළඳනා තබන ලදය. එහි ගොස් ඒ පළඳනා ඉල්ලා පැළඳ ගනුවයි. කල මෙන්, සම්මා සම්බුදුන් විසින්, 'මහණෙනි, සැරියුත්-මුගලන් දෙනම සේවනය කරවු, මහණෙනි, සැරියුත් මුගලන් දෙනම භජනය කරවු. ඔව්හු පණ්ඩිත වූ භික්ෂූහුය. සබ්‍රහ්මචාරීන්ට සේවය කරන්නාහුය' මෙසේ දම්සෙනෙවි වෙත භික්ෂූන් පිටත්කර යැවීම ගතයුතුය. රජදරුවන් රජුගේ කීම අසා වැඩිමලා වෙත ගොස් ආභරණ අයැදි සිද්ධිය මෙන්, භික්ෂූන් බුදු වදන අසා දම්සෙනෙවියන් වෙතැ ගොස් දම් දෙසුම අයැදීම ගතයුතුය. වැඩිමල් සොහොයුරා ගබඩාව ඇර පෙට්ටි සතරින් තුනක් බැහැර කිරීම මෙන් දම්සෙනෙවි මේ සූත්‍රය අරඹා චතුරාර්ය සත්‍යය වශයෙන් මාතෘකා තැබීම ගතයුතුය. පෙට්ටි තුනක් තබා එකක් විවරකොට එයින් සුමුගු පසක් බැහැර කිරීම මෙන්, ආර්ය සත්‍ය තුනක් තබා දුක්ඛ ආර්ය සත්‍යය ගෙන විභාග කරමින් පංචස්කන්ධය දැක්වීම ගතයුතුය. සුමුගු සතරක් තබා එකක් විවරකොට එයින් කරඬු පහක් ගැනීම මෙන්, ස්කන්ධ හතරක් තබා රූපස්කන්ධයම විභාග කරමින්

සතරමහාභූත, උපාදා රූප වශයෙන් පස්කොටස දැක්වීම ගතයුතුය. කරඬු සතරක් පසෙක තබා එකක් විවරකොට පියන පසෙක තබා, අත්පළඳනා, පා පළඳනා ආභරණ දීම මෙන්, මහා භූතයන් ද එක් උපාදා රූප ද තබා, එක් පෘථිවි ධාතුව විභාග කරමින් පළමුව බාහිර පියන මෙන් තබා අධ්‍යාත්මික පඨවි ධාතුව ගෙන එහි නානා ස්වභාව විසි ආකාරයකින් දැක්වීම පිණිස, **කතමාචාවුසො අජ්ඣත්තිකා පඨවි ධාතු** යනාදිය ඉදිරිපත් කිරීම සැළකිය යුතුය. නැවත ඒ රජපුතුගේ ඒ කරඬු සතරින් ද සුමුගු සතරින්ද පෙට්ටි තුනකින් ද පසුව පිළිවෙළින් ආභරණ දීම මෙන් ඉතිරි මහාභූත තුන, උපාදාන රූපය, සතර අරූපස්කන්ධ, තුන් ආර්ය සත්‍ය පිළිවෙළින් විස්තර විභාග කිරීම දතයුතුය. **'කතමා චාවුසො අජ්ඣත්තිකා පඨවි ධාතු'**

නැවත **කතමා චාවුසො අජ්ඣත්තිකා පඨවිධාතු**. එහි **අජ්ඣත්තං පච්චත්තං** යන දෙක ස්ව සන්තානයට නමකි. **කක්ඛළං** තද වූ, **ඛරිගතං** පරුෂ වූ, **උපාදිනනං** කර්ම සමුට්ඨාන රූපයම නොවේ. අවිශේෂයෙන් වනාහී ශරීරට්ඨිකයාගේ ගැනීමයි. ශරීරට්ඨිකයාගෙ වනාහි උපාදින්න හෝ අනුපාදින්න හෝ වේවා, ආදින්න, ගහිත, පරාමට්ඨ වශයෙන්, සියල්ල උපාදින්න නම් වේ. **සෙය්‍යථීදං කෙසා ලොමා - උදරියං කරීසං** යන මෙය ධාතු කර්මස්ථානික කුලපුත්‍රයාගේ අධ්‍යාත්මික පෘථුවි ධාතුව වශයෙන් පළමුකොට කර්මස්ථානය විභාග කරන ලදී. මෙහි වනාහි (මනසිකාරය මෙනෙහි කිරීම පටන්ගෙන, විදර්ශනාව වඩා රහත්බව ලැබගනු කැමැත්තකු විසින්, යමක් කළයුතු ද, ඒ සියල්ල විශුද්ධිමාර්ගයෙහි විස්තර කරන ලද්දේම ය. 'මත්ථලුංගය' වනාහි මෙහි පෙළ නො ආයේය. එය ද ගෙන විශුද්ධිමාර්ගයෙහි කී ආකාරයෙන්ම පැහැසටහන් ආදී වශයෙන් විභාගකොට මෙය ද අචේතන වූ අව්‍යාකෘත වූ ශූන්‍ය වූ පෘථුවි ධාතුවම යැයි මෙපරිද්දෙන් සිහිකටයුත්තේ ය. **යං වා පනඤ්ඤම්පි** මෙය ඉතිරි තුන් කොටසෙහි යෙදුනා වූ පෘථුවි ධාතුව ගැනීම සඳහාම කියන ලදී.

යා චෙව ඛො පන අජ්ඣත්තිකා පඨවි ධාතු යනු කියන ලද පරිද්දෙන් අධ්‍යාත්මික පඨවි ධාතුව හා යාව බාහිරා විහංගයෙහි **අයො ලොහං තිපුසීසං** යකඩ (ලෝහ) ගුලි, ඊයම්, ඇලුමිනියම් යනාදී වශයෙන් හා බාහිර වූ යම් පෘථුවි ධාතුවකුත් මෙතෙකින් තෙරුන් විසින් අධ්‍යාත්මික පෘථුවි ධාතුව නොයෙක් ස්වභාවයෙන් විසි ආකාරයකින් විස්තර වශයෙන් දක්වා ඇත.

බාහිර පෘථුවි ධාතුව කෙටියෙන් දක්වන ලද්දේ ඇයි?

යම් හෙයකින් යම් තැනෙක්හි සත්ත්වයන්ගේ ආලය නිකාන්තිය ප්‍රාර්ථනාව, බැසගැනීම, ග්‍රහණය, පරාමර්ශය, බලවත් වේද, එහි ඒ ආලය ආදීන්ගේ දුරුකිරීම, උදුරා දැමීම පිණිස බුදුවරයෝ හෝ බුද්ධශ්‍රාවකයෝ විස්තර කථාව කියති. සමහරවිටක බලවත් නො වේද එහි කළයුතු දෙයක් නැති හෙයින් කෙටියෙන් කියති. යම්සේ ගොවියෙක් කුඹුරක් සාන්නේ යම් තැනකද එහි මුල්බිස්ස බලවත් වී නගුල නවතීද එහිදී ගොනුන් තබා පස් ඉවත්කොට මුල්බිස්ස සිඳිමින් බොහෝ වෑයම් කෙරේද, යම්තැනෙක එවැනි මුල් නැත්ද, එහි බලවත් උත්සාහ නොකරමින් ගොනුන් පිට පහර දෙමින්, සාන්නේද මේ කරුණුද එපරිද්දෙන් දතයුතුයි.

පඨවිධාතුරෙවෙසා ඇවැත්නි, මෝ විවිධ වූවාම තද අරුතින් (කර්කෂ) රළු අර්ථයෙන්, පරුෂාර්ථයෙන් සමාන ලක්ෂණ ඇති පෘථුවි ධාතුවම යයි අධ්‍යාත්මික බාහිර වශයෙන් යොදා දක්වති. කවර හෙයින්ද? යම්හෙයකින් බාහිර වූ පෘථුවි ධාතූහුගේ සිත් නැති බව ප්‍රකට ද අධ්‍යාත්මික පෘථුවි ධාතූහුගේ එසේ නොවේද එහෙයින් බටහිර පෘථුවි ධාතුව සමග එක්වැනි වූවා, අචේතන වූවාම යයි ගන්නහු සුවසේ පරිග්‍රහය වේ. කුමක් මෙන්ද, යම්සේ දැමුණු ගොනෙකු සමග යෙදූ නො දැමුණ ගවයා කීප දවසකින් විරුද්ධ වේද, කම්පා වේද, අනතුරුව කීප දිනකින් දමනයට පැමිණේද, එපරිද්දෙන් අධ්‍යාත්මික පෘථුවි ධාතුව බාහිර පෘථුවි ධාතුව සමග එක්වැනියයි ගන්නහුට කීප දිනකින්ම අචේතනා බැවින් නොවැටහෙයි. අනතුරුව නොබෝ දිනකින් අධ්‍යාත්මික පෘථුවි ධාතූහුගේ අචේතන භාවය ප්‍රකට වෙයි. **තං නෙතං මම** ඒ මේ පෘථුවි ධාතු දෙකම මගේ නොවේ. මෙතෙම මම නො වෙමි. මෙතෙම මගේ ආත්මය නොවේ යයි මෙසේ තතු පිදි විදසුන් නුවණින් දතයුතුයි. **යථාභූතං** යථා ස්වරූපයෙන් එය අනිත්‍යාදී ස්වභාවය වේද, එහෙයින් අනිත්‍යය. දුකය. අනාත්මයයි දතයුතු.

හොති ඛො සො ආවුසො කුමක් හෙයින් ආරම්භ කළ සේක් ද,, බාහිර ආපෝ ධාතු වශයෙන්, බාහිර පඨවි ධාතුවගේ විනාශය දක්වා එයට වඩා ඉතා විශේෂයෙන් උපාදින්න වූ ශරීරස්ථ පෘථුවි ධාතුවගේ විනාශය දැක්වීම පිණිසය. **පකුපපති** යනු ආපෝධාතුව සංවට්ට කාලයේ වැඩෙනුයේ කිපෙයි. **අනතරහිත තසමිං සමයෙ** බාහිරා පඨවි ධාතු හොති

යනු එකල්හි කෝටි සියදහසක් සක්වළ කරදියෙන් යටවන්නේ ජලය හා අනුගතව පර්වතාදී වශයෙන් පිහිටි සියලු පෘථුවි ධාතුව අතුරුදහන් වෙයි. දියව ජලය ම වේ. තාවමහලලිකාය එපමණ මහත් වූ,

දුවෙ සත සහසසානි - චතතාරි නහුතානිච
එතතකං බහලතෙතන - සංඛාතායං වසුන්ධරා

දුවෙ සතසහසසානි යොදුන් දෙසිය දහසක් ද, **චතතාරි නහුතානි** නහුත සතරක් ද, **බහුලතෙතන** බොල් බැවින්, **එතතකං** මෙපමණ **අයං වසුන්ධරා** පෘථුවී තොමෝ, **සංඛාතා** ගණන් තබන ලද්දීය.

මෙසේ බොල් බැවින් මහත් වූ, පුළුලින් කෙළසිය දහසක් සක්වළ පමණ වූ අනිචචතා ඇතිව නැතිවන බව ඛය ධම්මතා ක්ෂයට යන ස්වභාව ඇති බව, විපරිනාම ධම්මතා ප්‍රකෘතිය අත්හරින ස්වභාව ඇති බව, මේ සියලු පදයන්ගෙන් ම අනිත්‍යතා ලක්ෂණයම කියන ලදී. යමක් අනිත්‍යද එය දුකයි. යමක් දුකද එය අනාත්මයි යන ත්‍රිලක්ෂණයම ආවාහු වෙති.

මතතඨකසස මද කලක් සිටිනා වූ එහි දෙ ආකාරයකින් මේ ශරීරයේ මද කලක් සිටින බව දතයුතුයි. 'ඨිති පරිතතතා වශයෙන් ද සරස පරිතතතා වශයෙන් ද වෙති. මෙහි වනාහි, මේ කය අතීත චිත්ත ක්ෂණයෙහි ජීවත්විය. දැන් ජීවත් නොවෙයි. මතු ජීවත් නො වන්නේ ය. අනාගත චිත්ත ක්ෂණයෙහි ජීවත් වන්නේ ය. දැන් ජීවත් වෙයි. පෙර ජීවත් නොවී, වර්තමාන චිත්ත ක්ෂණයෙහි ජීවත් වේ. පෙර ජීවත් නොවීය. අනාගතයේ ජීවත් නො වන්නේ ය.

ජීවිතේන්ද්‍රිය ද, ආත්ම භාවය ද, සුඛ දුඃඛ වේදනා යන මොව්හු අසම්මිශ්‍ර වූවාහු හුදෙකලා වූවාහු එක් එක් චිත්තය හා යෙදුනාහුය. ක්ෂණය ඉතා කෙටිකලක් පවත්නේය.

ජීවිතං අතතභාවොච - සුඛ දුකඛා ච කෙවලා
එකචිතත සමායුතතා - ලහුසො වතතතෙ ඛණො

මොහුගේ මදකල් පැවැත්ම දක්වනු වස් මේ ගාථාව කීහ. මෙසේ ඨිති පරිත්තතා වශයෙන් මදකල් සිටින බැව් දතයුතු. නැවත ආශ්වාස ප්‍රශ්වාස ප්‍රතිබද්ධ භාවයෙන් ඔහුගේ සරස පරිත්තතා දතයුතු. සත්ත්වයන්ගේ ජීවිතය ආශ්වාස සමග බැඳී ඇත. ජීවිතය ප්‍රශ්වාස සමග බැඳී ඇත. ජීවිතය ආශ්වාස ප්‍රශ්වාස සමග බැඳී ඇත. ජීවිතය මහාභූත සමග බැඳී ඇත. ජීවිතය කබලිංකාරාහාර සමග බැඳී ඇත. ජීවිතය විඥානය සමග බැඳී ඇත. මෙය විශුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලදී.

තණ්හූපාදිණ්ණසස තෘෂ්ණාවෙන් ආදින්න - ගහිත - පරාමර්ශ කරන ලද **අහනති වා මමනති වා අසමීති වා** අථ ඛවසස **නො තෙවෙත්ථා හොති** යනු එකල්හි මෙසේ ත්‍රිලක්ෂණයට නගා බලන්නා වූ ඒ මහණ හට මේ අධ්‍යාත්මික පඨවි ධාතුවෙහි 'මේ මම වෙමි' යි හෝ යනාදී ත්‍රිවිධ වූ තෘෂ්ණා මාන දෘෂ්ටි ග්‍රහණය නොවේමැයි යන අර්ථයි. තව ද ආපෝ ධාතු වශයෙන් යම්සේ ද එපරිද්දෙන් තේජෝ ධාතු වායෝ ධාතු වශයෙන් ද බාහිර පඨවි ධාතුහුගේ අතුරුදන් වීම වෙයි. එහෙත් මෙහි ඉතිරි වූවාහු ද අර්ථ වශයෙන් දතයුත්තාහ.

තං වෙ ආවුසො මෙහි ඒ ධාතු කර්මස්ථානික භික්ෂූහුගේ සෝත ද්වාරයෙහි පරිග්‍රහය පිහිටුවමින්, බලය දක්වන්නේ ය. **අකෙකාසනති** දශ ආක්‍රොශ වස්තුවෙන් ආක්‍රොශ කරති. **පරිභාසනති** ඔබ විසින් මේ මේ දෙය කරන ලදී. තට ද මෙසේ කරන්නෙමු යයි වචනයෙන් පරිභව කෙරෙති. **රොසෙනති** හප්පයි - ගටයි. **විහෙසෙනති** දුක් උපදවති. සියලු ගැටීම් වචනයෙන් ම ඇති කරති. **සො එවනති** හෙතෙම ඒ ධාතු කර්මස්ථානික තෙමේ මෙසේ දැනගනී. **උපපනනා ඛො මෙ අයං** දැන් වර්තමානයෙහි උපන් බැවින් ද, සමුදාචාර වශයෙන් උපන් බැවින් ද, උපන්නීය. **සොත සමපසසජා** උපනිශ්‍රය විසින් ශ්‍රෝතස්පර්ශයෙන් උපන් ශ්‍රෝත ද්වාරයෙහි ජවන වේදනා, **එසෙසා අනිචෙවා** ශ්‍රෝත ස්පර්ශය තෙමේම ඇතිවැ නැතිවන අනිත්‍යය දකී. වේදනාදීහූ ශ්‍රෝත ස්පර්ශය හා එක්වම යෙදුන බව දතයුතුය.

ධාතාරමමණමෙව, ධාතු සංඛ්‍යාත වූ අරමුණුම **පකඛන්දති** බසී. **පසීදති** ඒ අරමුණෙහි පහදී. මෙය ව්‍යඤ්ජන සන්ධි වශයෙන් භූම්ම වචනයි. 'ධාතාරමමණ මෙව' යයි කියන ලදී. ධාතු සංඛ්‍යාත අරමුණෙහිම යන අර්ථයයි. **විමුචචති** යනු ධාතු වශයෙන් මෙසේ අධිමෝක්ෂය ලබයි.

නො ඇලෙයි. දූෂ්‍ය නොවෙයි. මෙය චූ කලී සෝතද්වාර අරමුණ අපාථයට පැමිණි කල්හි මූලපරිදෝ ආගන්තුක, තාවකාලික වශයෙන් පරිග්‍රහ (අල්ලා ගැනීම) කරයි. එහි විස්තර කථාව සතිපට්ඨාන සූත්‍රයේ චතු සම්පජඤ්ඤ කාණ්ඩයෙහි එයි. එහි වනාහි චක්ෂු ද්වාර වශයෙන් කියන ලදැයි දතයුතු.

මෙසේ කරන ලද පරිග්‍රහය (අල්ලා ගැනීම) ඇති ධාතු කර්මස්ථානික ඇති බලවත් විදර්ශකය හට වනාහී ඉදින් චක්ෂුද්වාරයෙහි අරමුණ අපාථයට (ගැටීමට) පැමිණි කල්හි නුනුවණින් ආවර්ජනය උපදී ද, ව්‍යවස්ථාපනයට (වොත්ථපනයට) පැමිණේ ද, එසේ ව්‍යවස්ථාපනයට (වොත්ථපනයට) පැමිණ එක්වරක් දෙවරක් ආසේවනය ලැබ සිත භවාංගයට බසීද, රාගාදී වශයෙන් නො උපදීද, මෙතෙම කෙළවරට පැමිණි ශුෂ්ක විදර්ශකය. අනිකකුට රාගාදී වශයෙන් එක්වරක් ජවන් දිවෙයි. යළි ජවන් කෙළවර රාගාදී වශයෙන් මාගේ ජවන් දුවන ලදැයි මෙනෙහි කරන්නහු විසින් අරමුණ නුවණින් වෙන්කොට ගන්නා ලද්දේම වෙයි. නැවත වරක් එසේ නො දිවෙයි. අනිකකුට එක්වරක් මෙනෙහි කරන්නහුට යළි දෙවෙනිවර රාගාදී වශයෙන් දිවේමැයි. එහෙත් දෙවෙනිවර අවසන මෙසේ මාගේ ජවනය මුදන ලදැයි මෙනෙහි කරන්නෙකු විසින් අරමුණ වෙන්කොට ගන්නා ලද්දේම වේ. තුන්වෙනි වර එසේ නූපදී. මෙහි පළමුවැන්නා ඉතා තියුණු වූයේ වෙයි. තුන්වැන්නා ඉතා මදවූයේ වෙයි. දෙවැන්නාගේ වශයෙන් මේ සූත්‍රයේ ද ලටුකිකොපමානයෙහි ද, ඉන්ද්‍රිය භාවනායෙහි ද අර්ථය දතයුතුය.

මෙසේ සෝතද්වාරයෙහි පරිග්‍රහ (අල්ලා ගැනීම්) වශයෙන් ධාතු කර්මස්ථානිකයාගේ බලය පවසන්නාහු **තං වෙ ආවුසො** යනාදිය කීහ. යම් හෙයකින් අනිටු අරමුණට පැමිණ, සෝත ද්වාරයෙහි ද කාය ද්වාරයෙහිද යන දෙ දොරෙහිම වෙහෙසේ ද, එහෙයින් යම්සේ කුඹුරු හිමියෙක් උදැල්ලක් ගෙන කුඹුරෙහි හැසිරෙන්නේ යම් යම් තැන්වල මැටිපිඩක් නොදී දුබල තැනම උදැල්ලෙන් බිම කොටා තණ සහිත මැටිපිඩක් දෙන්නේ ද? එපරිද්දෙන් මහතෙරුන් වහන්සේ අනාගතයෙහි ශික්ෂාකාමී වූ ප්‍රධන්වීර්යය කරන්නා වූ කුලපුත්‍රයෝ මේ දෙදොර සංසිඳුවා සංවරයෙහි පිහිටුවා වහාම ජාති ජරා මරණ කෙළවර කරන්නෝ ය. මේ දේශනාව මේ දෙදොරම දැඩිකොට සංවරය සඳහා දෙසූ සේක. එහි **සමුදාචරනති** උපක්‍රම කෙරෙති. **පාණි සම්ඵසෙසන** අතුල් පහරින්, සෙස්සෙහි ද මේ ක්‍රමයමැයි. **තථාභූතො** එබඳු ස්වභාව ඇති, **යථාභූතසමිං**

යම් ස්වභාවයක් ඇති, කමනති පවතිත්. එවං බුද්ධං අනුසසරතො යනාදියෙහි 'ඉතිපිසො භගවා' යනාදී ක්‍රමයෙන් සිහි කරන්නේ බුදුන් ම සිහිකරති. 'මුත්තං ඛො පනෙතං භගවතා' යනුවෙන් සිහි කරන්නේ ද බුදුන් සිහි කෙරේමැයි. 'සවාකඛාතා භගවතා ධමෙමා' ආදී වශයෙන් සිහි කරන්නේ ධර්මය සිහිකරයි. කකචූපමොවාදය සිහි කරන්නේ ධර්මය ම සිහිකෙරෙයි. 'සුපටිපනෙනා' යනාදී වශයෙන් සිහිකරන්නේ සංඝයා සිහි කරයි. කියතින් කැපීම් ඉවසන භික්ෂුව සිහිකරන්නේ සංඝයාගේ ගුණයම සිහිකරයි.

උපෙකඛා කුසල නිසසිතා න සණඨා යනු මෙහි විදර්ශනා අපේක්ෂාව අදහස් කර ඇත. **උපෙකඛා කුසල නිසසිතා සණඨා** යන මෙහි ෂඩංග උපේක්ෂාව අදහස් කරයි. ඒ මේ ඡළංගුපේක්ෂාව ක්ෂීණාශ්‍රවයන්ට ඉටු අනිටු අරමුණුවල නො ඇලීම් සඳහා පවතී. එහෙත් මේ භික්ෂුව වීර්ය බලයෙන් භාවනා සිද්ධිය පිණිස තමාගේ විදර්ශනාව ක්ෂිණාශ්‍රවයාගේ ෂඩංග උපේක්ෂා ස්ථානයෙහි තබන්නේනුයි 'ඡළංගුපෙකඛා' නම් වේ.

ආපෝ ධාතු නිදර්ශනයෙහි **ආපොගතං** යන සියලු ආපයෙහි ඇතුළත් තෙත් ගතිය ඇති ස්වභාව ලක්ෂණයයි. **පිතතංසෙමහං** යනු යමක් කිය යුතුද ඒ සියල්ල විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. **පකුබබති** ඕස වශයෙන් වැඩෙයි. සමුද්‍රයෙන් හෝ ජලය උතුරයි. මේ ආපෝ ධාතුවගේ ප්‍රකෘති කිපීමයි. ආපය වැඩෙන කාලයෙහි කෙළ සියදහසක් සක්වළ ජලයෙන් පිරුණේ වේ. **මගවඡනති** යටට බසී. උදුනෙහි නැගූ ජලය මෙන් විනාශයට පැමිණේ. මෙහි ඉතිරිය පළමු කී නයින්ම අවබෝධ කළ යුතුය.

තේජෝ ධාතුව දැක්වීමෙහි **තෙජොගතං** යනු සියලු තේජසයන්හි ඇති උණුසුම් ලක්ෂණයයි. 'තේජස්ම' තේජස් බවට ගියේනුයි 'තෙජොගත' නම් වේ. පළමු ආපොගතයෙහි ද (දෙවැනි) පසු වායොගතයෙහි ද මෙම ක්‍රමයමැයි. **යෙනච** කිපියා වූ යම් උෂ්ණ ගතියකින් මේ ශරීරය අතිශයින් තැවේ ද ඒකාන්තික 'උන' ආදී වශයෙන් උණුසුම් වූයේ වේද, **යෙන ච ජීරියති** යමකින් මේ කය දිරා ද, ඉඳුරන්ගේ විකල බවට පිරිහීමට, බලය පිරිහීමට, සෙලවෙන සැලෙන බවට පැමිණේ ද, **යෙනච පරිඩයහති** කිපුණු උෂ්ණයකින් මේ සිරුර දැවේ ද, පුද්ගලයා ද දැවෙමැයි හඬමින් ගිතෙල් රත්සඳුන් ආදිය ගල්වන්නේ ද, තල්වැට පවනින් පවන් සැලුම කැමති වේද, **යෙනච අසිත පීත ඛායිත සායිතං සමමා පරිණාමං ගචඡති**

යමකින් ගන්නා ලද ආහාර, බොන ලද පැන්, පිටිකැවුම් ආදිය කන ලද දේද, නො පෑහූ මීපැණි ආදී රස විඳින ලද දේද, මනාකොට මේරීම් බවට ගියේද, රසාදී භාවයෙන් විභාගයට යන්නේ ය යන අර්ථයි. මේ මෙහි කෙටි අදහසයි. විචිතර වශයෙන් යමක් කිවයුතුද ඒ සියල්ල විශුද්ධි මාර්ගයේ භාවනානය කොටසේ කියන ලදී.

හරිතං යනු නිල් තණ ය. තෙත් වූ තණ වෙත පැමිණ නිවෙයි යන අර්ථයි. **පත්‍ථතනං** මහා මාර්ගය. **සෙලනතං** පර්වතය. **උදකනතං** ජලය. **රමණීයංවා භූමිභාගං** තණලැහැබ් ආදිය නැති, විවෘත වූ ජනශූන්‍ය වූ බිම් පෙදෙස. **අනාහාරා ප්‍රත්‍ය** රහිත වූ, දර රහිත වූ, ස්වභාවයෙන් ම තේජස්විකාරය කියන ලදී. තේජස් සංවෘත කාලයෙහි වනාහි කෝටි සියදහස් සක්වළ දවා අළු පමණද නො සිටි, නහාරු දඳුලෙන සම් වැරලියෙන් අගහි ගවෙසනනි මෙබඳු සුවපහසු සියුම් දැඩිව අල්වාගැනීමෙන් ගෙන යම් මද පමණ වූ උණුසුමක් ලැබ දැල්වේද මෙහි සෙස්ස පෙර කී නයින්ම දතයුතුයි.

වායොධාතු නිදෙසෙ වායො ධාතු නිර්දේශයෙහි **උද්ධංගමා වාතා** යනු ඔක්කාර ඉක්කා ගැසීම වැනි උඩට අදින වාතය, **අධොගමා වාතා** මල මූත්‍ර බැහැර කරන යටට අදින වාතය, **කුච්ඡිසයා වාතා** අතුනු පිටත වාතය, **කොට්ඨසයා වාතා** අතුනු ඇතුළත වාතයෝ **අංගමංගානු සාරිනො** නහරදැල් අනුසාරයෙන් සියළු සිරුර අවයවයක් පාසා පතළා වූ හැකිලීම් දිගු කිරීම් ආදිය උපයන වාත, **අසසාසො** ඇතුළතට පිව්සෙන වාතය, **පසසාසො** පිටතට නික්මෙන වාතය. මේ ඉතා කෙටියෙනි. වැඩි විස්තර විශුද්ධි මාර්ගයේ භාවනා නය කොටසේ කියන ලදී. ගාම වහති සියලු ගමම සුණු විසුණු කරමින් ගෙන යයි. මෙහි වායු සංවර්ත කාලයෙහි කෙළ සිය දහසක් සක්වල වැනසීමෙන් වායෝ ධාතුව විනාශය දක්වයි. **විධූපනෙන** අග්නි විජයෙන්, **ඔසසාවනෙ** ඡදනාග්‍රයෙහි වතුර වැක්කෙරේද, එහෙයින් කියන ලදී. මෙහිද ශේෂය පළමු සේමැයි.

සෙය්‍යථාපි ආවුසො යන මෙහි කුමක් දක්වත්ද, යට කියන ලද මහා භූතයන්ගේ නිස්සත්ව භාවයයි. **කට්ඨං** ද්‍රව්‍ය සම්භාරය, **වල්ලිං** හාත්පසින් බඳින වැල්, **තිණං** සෙවෙණි තණ, **මත්තිකං** මතුයෙහි ආලේප කරන මැටි, **ආකාසො පරිවාරිතො** මේ ද්‍රව්‍ය ඇතුළත ද පිටත ද පිරිවරා අහස සිටියේය යන අර්ථයි. **අගාරන්ත්‍වෙව සංඛං ගච්ඡති** ගේ යයි පැනවීම්

මතු වේ. යළි ද්‍රව්‍යාදිය වෙන වෙනම රැස්කළ කල්හී දැව රැස, වැල් රැස ම යයි කියයි. එවමෙව ඛො එපරිද්දෙන් ඇට ආදිය ඇතුළත ද පිටත ද වටකොට සිටි අහස ඒ ඇට ආදියම නිසා 'රූප' ගණයට වැටේ. ශරීරය යයි ව්‍යවහාරයට ඒ. යම් සේ දැවදඬු ආදිය නිසා 'ගෙය' යයි හඳුන්වන ලද ගෙය රජුගේ ගෙය බමුණු ගේ ගෙය යයි කියනු ලැබේ. එසේම රජ සිරුර බමුණු සිරුර යයි කියනු ලැබේ. මෙහි කිසි සත්ත්වයෙක් හෝ ජීවියෙක් නැත.

අජඣත්තිකඤ්චව ආවුසො චක්ඛුං මේ කුමක් සඳහා කියන ලදද යට උපාදාය රූපය ද, සතර අරූපස්කන්ධයෝ ද, ආර්ය සත්‍ය තුන ද නොකියන ලදී. දැන් ඒවා කියනු සඳහා මේ දේශනාව ආරබ්ධයහ. එහි **චක්ඛුං අපරිහීනනං** යනු චක්ෂු ප්‍රසාදය නිරුද්ධ කල්හිද නට කල්හිද සෙම් පිත් ලෙයින් පිරුණු කල්හි ද, ඇස චක්ෂුර් විඥානයට ප්‍රත්‍යය වන්නට සමත් වූයේ අපරිහින්න නම් වේ. **බාහිරව රූපා** බාහිර වූ චතු සමුට්ඨානික රූපයෝ **තජ්ජා සමඤ්ඤා හාරෝ** ඇස ද රූපයන් ද නිසා භවාංගය පෙරළා උපන් මෙනෙහි කිරීම, භවංගාවර්තනයට සමර්ථ වූ චක්ෂුද්වාරයෙහි ක්‍රියා මනෝධාතු චිත්තය යන අර්ථයි. එය රූපයන් ආපාථයට (ගැටීමට) නො පැමිණි හෙයින් ද, අන්‍යවිහිත නොවූවහුට නොවේ. **තජ්ජසස** එයට සුදුසු වූ **විඤ්ඤාණ භාගසස** විඤ්ඤාණ කොටසට

තථාභූතසස යනාදියෙහි වාර විසින් සිව්සස් දක්වයි. එහි **තථා භූතසස** යනු චක්ෂු විඤ්ඤාණය සමග වූවහුගේ, චක්ෂුර් විඥානයෙන් යුක්ත වූවහුගේ **රූපං** චක්ඛු විඥානය රූපජනක නොවන බැවින් චක්ෂුර් විඥාන ක්ෂණයෙහි තිසමුට්ඨාන රූපය ද, ලැබේ. **සංගහං ගචඡති** ගණනට යයි. වේදනාදීහුද චක්ෂුර් විඥානය හාම යෙදුනේමය. විඤ්ඤාණය චක්ඛු විඤ්ඤාණයමය. **සංඛාරා** චේතනාවම කියයි.

සංගහො එක්තැන සංග්‍රහය, **සන්නිපාතො** සමාගම **සමවායො** රාසිය **යො පටිච්ච සමුප්පාදං පසසති** යමෙක් ප්‍රත්‍යයන් දකීද, **සො ධම්මං පසසති** හෙතෙම ප්‍රතීත්‍ය සමුත්පාදයන් දකී. **ඡන්දො** යනාදී සියල්ල තෘෂ්ණාවට පර්යාය වචනයි. තෘෂ්ණා තොමෝ ඡන්දය කිරීම් වශයෙන්, **ඡන්ද** යනු ඇලීමයි. ඇලීම් වශයෙන් ආලය කිරීමයි. **ආලය** නම් ස්නේහ කිරීම් වශයෙන් අනුනය නම්. බැසගෙන ගිලගැනීම් වශයෙන් **අජ්ඣොසාන**

නමැයි කියනු ලැබේ. **ඡන්දරාග විනයො ඡන්දරාගපපහානං** යනු නිවනට නමකි. මෙසේ තුන් සත්‍යයන් පෙළෙහි ආවේමය. මාර්ග සත්‍යය එළවාගත යුතුයි. මේ තුන් තැන්හී යම් දෘෂ්ටියක්, සංකල්පයක්, වචනයක්, කර්මාන්තයක්, ආජීවයක්, වෑයමක්, සිහියක්, සමාධියක්, භාවනාවක්, ප්‍රතිවේධයක් වේද වේ ම මාර්ගයයි. **බහුකතං හොති** යනු මෙතෙකිනිදු භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය බොහෝකොට කරන ලද වෙයි. **අජඣත්තිකඤ්චේව ආවුසො සොතං** යනු අනෙක් වාරයන්හිද මෙම න්‍යායමැයි.

යළි මනෝද්වාරයෙහි **අජඣත්තිකො මනො** අධ්‍යාත්මික මනස නම් භවංග සිතයි. එය නිරුද්ධ වූයේ ද ආවර්ජන චිත්තයට ප්‍රත්‍යය වන්නට අසමර්ථව මන්දව තංගතවද පවත්නේ ද, පරිහින්න නම් වෙයි. ආවර්ජනයට ප්‍රත්‍ය වන්නට සමර්ථ වූයේ අපරිහින්න නම් වේ. **බාහිරාව ධම්මා** ධර්මාරම්මණය, **නෙව තාව තජ්ජසසා** මෙය භවාංග කාලයෙන් ම කියන ලද ද්විතීය වාරය ප්‍රගුණ වූ ධ්‍යානය ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් හෝ, ප්‍රගුණ කර්මස්ථාන සිහිකිරීමෙන් හෝ ප්‍රගුණ වූ බුදුවදන් හැදෑරීම් ආදියෙන් හෝ, අන්‍යවිහිත වූවන් සඳහා කියන ලදී. මේ වාරයෙහි. **රූපං චතුසමුට්ඨාන** රූපය ලැබේ. මනෝවිඤ්ඤාණ රූපය උපදවයි. වේදනාදිය මනෝ විඤ්ඤාණයෙහිම ඇතුළත් වූවාහුය. 'විඤ්ඤාණය' මනෝ විඤ්ඤාණය මැයි. සංස්කාරයෝ වනාහි ඵස්ස චේතනා වශයෙන් ගතයුතුය. ඉතිරියක් වේ නම් එය කී ආකාරයෙන්ම දතයුතුය.

මෙසේ මහතෙරුන් වහන්සේ යට එක භේදයක්ම සම්මර්ශනය කරමින් අවුත් මෙතැන සිට පිරිහුණු දේශන සියල්ල ඒ ඒ ද්වාර වශයෙන් බෙදා දක්වන සේක් එකටෙක ගැළපෙන අයුරින්ම සූත්‍රාන්තය අවසන් වූයේය.

මහා හත්ථිපදොපම සූත්‍ර වර්ණනාව නිමියේය.

1-3-9

එවමෙම සුතං යනු මහා සාරෝපම සූත්‍රයයි. එහි අචිරපක්කනෙත සංඝ භේදය කොට, ලේ සෙලවීමේ කර්මය කොට නික්ම ගිය කෙටි කලකින් ස්ව ලිංගයෙන්ම වෙන් වූ කල්හි ඉධ භික්ඛවෙ එකච්චො කුලපුත්තෙනා අසවල් කුලපුත්‍රයා යයි නියම නො කරන ලද, එහෙත් දේවදත්ත සඳහාම කියන ලද බව දතයුතුයි. හෙතෙමේ අසම්භින්න වූ මහා සම්මත පරපුරේ ඔක්කාක වංසයේ උපන් ජාතිකයෙකි. ඔකිණ්ණ යමෙකුගේ ජාතිය ඇතුළත පිවිසියේද, සේ ජාතියෙන් අවතීර්ණ නම්. ජරාදියෙහි ද මේ ක්‍රමයමැයි.

ලාභ සත්කාර ආදියෙහි ලාභො සිව්පසය සකකාරො ඔවුන්ගේම මනාකොට ඇලීම, සිංලොකො ගුණ කීම අභිනිබ්බත්තෙතති උපදවයි. අපපඤ්ඤාතානි දෙදෙනෙකු සිටින තැන නො පැනේ. බත් ආහාර පමණකුදු නො ලබති. අපෙප සකඛා මද පිරිවර ඇත්තාහු, ඉදිරියෙන් පසුපසින් යන්නකු නො ලැබ, සාරෙන කර කරණීයං ගස් අරටුවෙන් කළයුතු බොස්ගෙඩි, රෝද, නගුල් ආදී යම්කිසිවක් සාඛා පලාසං අගගහෙසි බ්‍රහ්මචරියස්ස මාර්ගඵල අරටුව කොට ඇති ශාසන බ්‍රහ්ම චරියාවගේ සිව්පසය අතු කොළ, නම් එය ගත්තේ ය. තෙනච වොසානං ආපාදී එයින් මෙතෙක්ම ප්‍රමාණවත්ය. මා විසින් සාරය ලබන ලදැයි කෙළවරට පැමිණියේ වෙයි.

ඤාණදස්සනං ආරාධෙති දෙව්දත් පංච අභිඥා ලද්දේය. දිවැසද පංචාභිඥාවන්ගේ මතුයෙහි සිටියේය. එය මේ සූත්‍රයේ ඤාණදස්සන යයි කියන ලදී. අජානං අපස්සං විහරන්ති කිසි සියුම් රූපයක් නොදන්නාහු යටත් පිරිසෙයින් පාංශු පිසාචාදියෙකු ද නො දකිමින්ම වෙසෙති.

අසමය විමොක්ඛං ආරාධෙති මේ 'සමය විමොක්ඛය කවරේද, සිව් අරී මගයි. සතරවිධ ශ්‍රමණ ඵලයයි. නිවනයි. මේ අසමය විමොක්ඛ නම් වේ' මෙසේ කී කල්හි නව ලොව්තුරු දහම ආරාධනය කෙරෙයි. සම්පාදනය කෙරෙයි. ලබයි. ලෞකික සමාපත්තීන්හි සමවන් සමවන් අවස්ථාවන්හි දී ම, විරුද්ධ ධර්මයන්ගෙන් මිදෙත් ද, එහෙයින් 'සමය

විමොක්ඛය' නම් කවරේ ද, සතර ධ්‍යාන, අරූප සමාපත්ති සතර, මේ සමය විමොක්ඛ' නම් වේ. මෙසේ සමය විමොක්ඛය කියන ලදී. ලෝකෝත්තර ධර්ම වනාහි කලින් කල නො මිදෙති. වරක් විමුක්ත වූ මාර්ග ඵලයෝ විමුක්ත වූවාහුම වෙති. නිර්වාණය අත්‍යන්තයෙන් සියලු කෙලෙසුන්ගෙන් මිදුනේ වෙයි. මේ නව ධර්මයෝ අසමය විමොක්ඛ යයි කියන ලදී.

අකුපපා චෙතො විමුතති අර්හත්ඵල විමුක්තියයි. මේ සඳහා රහත්ඵලය සඳහා මේ බඹසර වෙයි. එතදත්ථං මෙය වනාහි බ්‍රහ්මචරියාවගේ ප්‍රයෝජනයයි කියන ලදී. එතං සාරං මේ අර්හත්ඵලය බ්‍රහ්මචරියාවගේ සාරයයි. එතං පරියොසානං මේ අර්හත්ඵලය බ්‍රහ්ම චරියාවගේ අවසානයයි. මේ කෙළවරයි. මෙයින් මත්තෙහි පැමිණිය යුත්තක් නැත. යථානුසන්ධි වශයෙන් දේශනාව නිමවිය.

මහා සාරෝපම සූත්‍ර වර්ණනාව නිමියේය.

1-3-10

එවමෙමසුතං චූළ සාරොපම සූත්‍රයයි. එහි පිංගලකොචෙඡා ඒ බ්‍රාහ්මණ තෙමේ පිඟුවන් ශරීර වර්ණ ඇත්තේය. කොචෙඡා කොච්ඡ යනු ඔහුගේ නමයි. ඒ නිසා පිංගල කොච්ඡ නම් වූයේය. සංඝිනො ප්‍රව්‍රජිත සංඝ සමූහයක් මොහුට ඇත්තේනුයි සංඝිනො නම් වේ. ස්වකීයමය වූ එම ගණය මොහුට ඇති නිසා ගණිනො නම් වේ. ආචාර - ශික්ෂා ආදී වශයෙන් ඒ සමූහයාගේ ආචාර්යවරයා වශයෙන් ගණාචරිය නම් වේ. ඤාතා යනු ප්‍රසිද්ධ වූවාහු ප්‍රකට වූවාහු යන අර්ථයි. අල්පේච්ඡ බව, සතුටෙන් සිටීම, අපිස් වූ බැවින් වස්ත්‍රයකුදු නොහඳියි. ආදී වශයෙන් උස්ව නැගෙන කීර්තිය මොහුට ඇතිනුයි යසසසිනො නම් වේ. තිත්ථකරා ලබ්ධි ඇතිකරන්නාහු සාධු සම්මතා මේ අය සාධුවරුය, සුන්දරය, සත්පුරුෂයෝය. මෙසේ සම්මත බැවින් බහුජනසස ඇසූ පිරූ තැන් නැති. අන්ධබාල පෘථග්ජනයා විසින්,

දැන් ඔවුන් දක්වමින් **සෙය්‍යථීදං, පූරණෝ** ආදිය කීහ. එහි **පූරණෝ** ශාස්තෘඍයයි හඳුන්වන ඔහුගේ නමයි. **කසසපෝ** යනු ගෝතයයි. හේ එක්තරා කුලයක දාසයන් එකුන්සියය පුරවමින් උපන්නේල. එයින් ඔහුට පූරණ යන නම ලැබිණ. තව ද මංගලදාස වූ බැවින් ඔහු විසින් කරන ලද නොකටයුතු දේ හෝ නොකරන ලද්ද නොකරන ලදැයි කියන්නේ හෝ නැත. හේ කුමට මම මෙහි වෙසෙන්නෙම්දැයි පලා ගියේය. ඉක්බිති එකල්හි සොරු ඔහුගේ වස්ත්‍රය පැහැර ගත්තාහුය. හේ පාත්‍රයෙන් හෝ තෘණවලින් විලි වසන්ටද නො දන්නේ උපන් අයුරින්ම එක් ගමකට පිවිසියේය. මිනිස්සු ඔහු දැක 'මේ මහණ රහත්ය, අල්පේච්ඡය. මොහු හා සමානයෙක් නැතැයි' ආහාර කැවුම් බත් ආදිය රැගෙන ඔහු වෙත එළඹියාහුය. ඔහු ද මා විසින් සළුවක් නොහැඳි බැවින් මේ සත්කාර උපනැයි, එයින් පසු සළුපිළි ලැබුනද නොහඳියි. එයම පැවිද්ද කොට ගත්තේය. ඔහු සමීපයේ වෙනත් පන්සියයක් මිනිස්සු පැවිදි වූහ. පූරණ කසසපෝ යන්න ඔහු සඳහා කීහ.

මක්ඛලී යනු ඔහුගේ නමයි. ගවහලක උපන් බැවින් **ගොසාලක** යනු ඔහුගේ දෙවෙනි නමයි. මඩ සහිත බිම තෙල් කළයක් ගෙන යන ඔහුට ස්වාමියා 'දරුව, නො පැකිල' කීයේල. හේ පැකිල වැටී ස්වාමියාට බියෙන් පලාගියහ. ස්වාමියා එළවාගෙන ගොස් රෙදි කොනින් ඇල්ලුවේය. හේ සළුව දමා 'හෙළුවෙන්ම' පලා ගියේය. ඉතිරිය පූරණ හා සමානය.

අජිත යනු ඔහුගේ නමයි. කෙස්වලින් තැනූ කම්බිලියක් දරානුයි **අජිත කෙසකම්බලී** යන නම ආයේය. එහි කෙසම්බල නම් මිනිස් කෙස්වලින් තැනූ කම්බිලියයි. එයට වඩා අතිශයින් ලාමක වූ වෙනත් වස්ත්‍රයක් නැත. **සෙය්‍යථාපි භික්ඛවෙ යානි කානිච තනතා වුතානං වත්ථානං කෙසකම්බලෝ භික්ඛවෙ සීතෙ සීතෝ, උණ්හෙ උණ්හෝ, දුබ්බණ්ණෝ දුග්ගන්ධෝ දුක්ඛසම්ඵස්සෝ'** යනු එහෙයින් වදාළහ.

පකුධෝ යනු ඔහුගේ නමය. **කච්චායනෝ** යනු ගෝත්‍රයයි. මෙසේ නම් ගොත් සසඳ **පකුධ කච්චායන** යයි කියයි. සිහිල් දිය ප්‍රතික්ෂේප කළ කෙනෙකි. වසරකට ද දියකිස නොකරයි. උණුදිය හෝ කැඳ හෝ ලැබ දිය කිස කරයි. නදියෙහි හෝ මාර්ගයෙහි ජලය ඉක්මවා මගේ සිල් බිඳිනේ යයි වැලි සෑයක් කොට සිල් අදිටන් කොට යයි. මෙසේ වැඩකට නැති ලබ්ධි ඇත්තෙකි.

සඤ්ඤයෝ සඤ්ඤය යනු ඔහුගේ නමයි. බෙල්ලට්ඨගේ පුතා නිසා බෙල්ලට්ඨී පුත්ත නම් වේ. ඒ නිසා සඤ්ඤය බෙල්ලට්ඨී පුත්ත නම් වෙයි.

අප තුළ ගැටගසන කෙලෙස්, වෙහෙසන කෙලෙස් නැත. අප කෙලෙස් ගැට රහිතයම්හයි ප්‍රකාශ කරන නිසා නිසණ්ඨ නම් වෙයි. නාථයාගේ පුතා වූ නිසා නාථ පුත්ත නම් වේ. අබභඤ්ඤංසු ඔවුන්ගේ ප්‍රතිඥාව යම්සේද, එසේම දැනගත්තහු ද, නො දැනගත්තහු ද, මේ කියන ලද වෙයි. 'ඉදින් ඔවුන්ගේ ඒ ප්‍රතිඥාව නෛර්යාණික වූවානම් සියල්ලෝ දැනගත්තාහු ද, ඉදින් නෛර්යාණික නොවූවා නම් නොදැන ගත්තාහු ද, එහෙයින් ඔවුන්ගේ ප්‍රඥාව කිම, නෛර්යාණික වූවා ද නෛර්යාණික නොවූවාද, මේ එම ප්‍රශ්නයේ අර්ථයයි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ අනෛර්යාණික බව කීමෙන් අර්ථයක් නැති හෙයින් අලං යි ප්‍රතික්ෙෂප කොට උපමාවෙන් අර්ථය පිරිවරමින් ධර්මයම දෙසනු පිණිස ධම්මං තෙ බ්‍රාහ්මණ දෙසෙසාමි යනාදිය වදාළහ.

එහි **සචේ කිරියාය** ප්‍රත්‍යක්ෂ කරනු පිණිස, **න ඡන්දං ජනෙති** කතුකම්‍යතා ඡන්දය නො උපදවයි. **න වායමති** වෑයම පරාක්‍රමය නො කරයි. **බලීන වුත්තිකෝ ච හොති** හීන වූ අදහස් ඇත්තේ වෙයි. සාථලිකෝ ශිථීල කොට ගත්තේ, ලිහිල් කොට ගනී. **ඉධ බ්‍රාහ්මණ භික්ඛු විවිච්චෙව කාමෙහි** කෙසේ මේ ප්‍රථමධ්‍යානාදී ධර්මයෝ ඥාන දර්ශනයෙන් උත්තරීතර වූවාහුද නිරෝධපාදක බැවිනි. යම් හෙයකින් ඉහත කී ප්‍රථමධ්‍යානාදී ධර්ම විදර්ශනාපාදක වූවාහුද, මොව්හු නිරෝධපාදක වූවාහුද, එහෙයින් උත්තරීතර වූවාහයයි දතයුතු.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය ද අනුසන්ධි වූ පරිද්දෙන් නිම වූ සේක. දේශනා කෙළවර බමුණා සරණ ශීලයෙහි පිහිටියේ ය.

චූල සාරෝපම සූත්‍ර වර්ණනාව නිමියේය.

තුන්වැනි ඔපම්ම වර්ග වර්ණනාව සමාප්තයි.

1-4-1

එවමෙමසුතං චූළ ගෝසිංග සූත්‍රයයි. එහි නාදිකෙ විහරතී නාදිකං නම් එක් විළක් ඇසුරු කරගෙන සුළු පිය, මහ පිය පුතුන් දෙදෙනකුගේ ගම් දෙකක් වූහ. එයින් එක් ගමක ගිඡඣකා වසථෙ උළු සෙවිලි කරන ලද ගෙයි, මේ අසනු ලැබේ. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ මහජනයාට සංග්‍රහ කරමින් වැඩැරට චාරිකාවේ හැසිරෙමින්, 'නාදික' නම් ගමට පැමිණි සේක. නාදික ගමේ වැසි මිනිසුන් භාග්‍යවතුන් වහන්සේට මහ දන් දෙමින් දහම් අසා පහන් සිත් ඇත්තාහූ, ශාස්තෘන් වහන්සේට ලැගුම්ගෙයක් කරමුයි සාකච්ඡා කර ගඩොල්වලින් ම බිත්ති, කණු, හිණි, වළ රෑ ආදිය දක්වමින් ප්‍රාසාදයක් කරවා සුණු පිරියම්කොට මල්කම් ලියකම් ආදිය නිමවා, බුමුතුරුණු, ඇඳ, පුටු ආදිය පනවා ශාස්තෘන් වහන්සේට පූජා කළේය. යළි පසු පසුව එහි මිනිස්සු භික්ෂු සංඝයාට රාත්‍රී ස්ථාන, දිවාස්ථාන, මණ්ඩප, සක්මන්මළු කරවූහ. මෙසේ මහත් විහාරයක් කරවීය. ඒ සඳහා ගිඡඣකාවසථෙ යන්න කියන ලදී. ගොසිංගසාල වනදායෙ එහි එක් මහරුකක කඳින් හරක් ඇඟක් සමාන වූ විටපයක් නැංගේය. ඒ රුක නිසා මුළු වනයම 'ගො සිංගාල වන' නමින් ප්‍රසිද්ධ විය. දාය යනු අවිශේෂයෙන් ම මේ වනයට නමකි. එහෙයින් ගොසිංගාල වනදායෙ යනු ගෝ සිංග ශාල වනයට නම් වීය. විහරනති යනු සමගි රසද විඳිමින් එහි වෙසෙති. උපරිපණ්ණාසකයෙහි මේ කුලපුත්‍රයන්ගේ පෘථග්ජන කාලය කියන ලදී. මෙහි ක්ෂීණාශ්‍රව කාලය කියන ලදී. එකල ඔව්හූ ලබන ලද ආශ්වාද ඇති ලද ප්‍රතිඡ්ඨා ඇති, අධිගමය කළ පිළිසිඹියා ඇති රහතන් වහන්සේලාම සමගි රස විඳිමින් පාසය කළහ. ඒ සඳහා කියන ලදී.

යෙන ගො සිඬගසාල වනදායො තෙනුපසංකමි දම්සෙනෙවි මහමුගලන් තෙරුන් අතුරෙන් හෝ අසූමහ සව්වන් අතුරෙන් හෝ යටත් පිරිසෙයින් ධර්ම භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයන් ද පවා කිසිවකු නො අමතා තමන් වහන්සේ ම පාසිවුරු ගෙන බල සෙනඟින් වෙන්වුණු හුදෙකලා ඇතෙකු මෙන් ද, වාතයෙන් සිඳුණු වළාකුළක් මෙන් ද හුදෙකලාවම එළඹියේය.

කවර කරුණක් නිසා භාග්‍යවතුන් වහන්සේ එසේ තනිව ගිය සේක්ද, කුලපුත්‍රයෝ තිදෙන ඉතා සමගියෙන් වාසය කරති. ඔවුන්ගේ

උත්සාහය වඩන පිණිසත් පශ්චිම ජනතාවට අනුකම්පා කිරීම පිණිසත්, ධර්මය ගරුකොට ඇති බැවින්ද වේ. උන්වහන්සේට මේ සීත වීල 'මම මේ කුලපුත්‍රයන් උත්සාහවත් කොට උසස් කොට පිළිසඳර කොට දහම් දෙසන්නෙමි' මෙසේ උත්සාහය වඩන හෙයින් වැඩි සේක. උන්වහන්සේට මෙසේ ද සිතෙන්නට විය. 'අනාගතයෙහි කුලපුත්‍රයෝ සම්මා සම්බුද්ධයන් වහන්සේ සමග වාසයෙන් වසන්නවුන් සමීපයට තුමූ ගොස් පිළිසඳර කොට දහම් දෙසා තුන් කුලපුතුන්ගේ උත්සාහය දැනවූහ. කවරෙක් නම් සමඟ වාසයෙන් නො වසන්නෝද, සමග වාසයෙන් විසිය යුතුයයි සිතමින් වහාම දුක් කෙළවර කරන්නාහුය.' මෙසේ පශ්චිම ජනතාවට අනුකම්පා කරන හෙයින් ද වැඩි සේක. තව ද බුදුවරයෝ නම් ධර්මගරුක වූවාහුම වෙති. ඔවුන්ගේ ඒ ධර්මගරුකභාවය රථවිනීත සූත්‍රයේ කියන ලද්දේමය. මෙසේ මේ ධර්මගරුක භාවය නිසා ධර්මය නගන්නෙමි'යි වැඩි සේක.

දායාපාලෝ වනය පාලනය කරන්නා, වනයට කැමති පරිද්දෙන් විවිධ මනුෂ්‍යයන් පැමිණ වනයේ මල්, ගෙඩි, ලාටු, අතු ආදිය මේසේ ගෙන නො යන්නේ ද, එපරිද්දෙන් වැටකොටු බැඳ, අවුරා වනයට ඇතුල්වීම සඳහා යෙදූ දොරටුවේ හිඳ ඒ වනය රකින්නේ ද හෙතෙම 'දාය පාල' නම් වේ.

අත්තකාම රූපා තමන්ට හිත කැමතිවන ස්වභාව ඇතිවැ වාසය කෙරෙති. යමෙක් මේ ශාසනයෙහි පැවිදිව වෙදකම් දූතකම් ගෙන් ගෙට යාම් ආදීන්ගේ වශයෙන් එක්විසි අනේසයන්ඟෙන් ජීවත් වේද, මෙතෙම 'ආත්ම කාමරූප' නො වේ. යළි යමෙක් මේ ශාසනයෙහි පැවිදිව එක්විසි අනේසනයන්ගෙන් තොරව සිව් පිරිසිදු සිල්හි පිහිටා බුදුවදන් ඉගෙන සුදුසු වූ ධුතාංගයක් සමාදන්ව සිතට රුචිකර වූ කමටහනක් ගෙන, ග්‍රාමාන්තරය අත්හැර වනයට පිවිස සමාපත්ති නිපදවා, විදර්ශනා භාවනා වඩමින් සිටී ද, මෙතෙම 'ආත්ම කාමරූපා' නම් වේ. ඒ තුන් කුලපුත්‍රයෝ මෙබඳු වූවාහුය. එහෙයින් අත්ත කාමරූපා විහරනති යන්න කියන ලදී.

මා තෙසං අප්පාසුමකාසී යනු ඔවුන්ට අපහසුතා ඇති නො කරන්නැයි භාග්‍යවතුන් වැළකීය. මෙසේ සිතෙන්නට ඇත. මේ කුලපුත්‍රයෝ සමග වූවාහු වෙසෙති. යළි ඇතැම් කෙනෙක් ගිය තැන භණ්ඩන - කලහ විවාදයෝ පවතිත්. තියුණු අං ඇති සැඩපරුෂ ගොනෙකු

මෙන් ඒ ඒ තැන පහරමින් හැසිරේ. එකල එක් මගින් දෙදෙනෙකුගේ ගමනක් නොවෙයි. කිසිවිටෙක මේ තෙමේත් එසේ කරමින් මේ කුලපුත්‍රයන් සමග වාසය බිඳින්නේ ය. තවෙකක් ද ඇත. මෙතෙම ප්‍රසාද උපදවන්නෙක. රන්වන් වෙයි. රසයෙහි ගිජුකමක් ඇත්තේ වේ. ගිය කල පටන් දායකයින්ගේ ද තම උපස්ථායකයන්ගේ ද ගුණ කීම් ආදියෙන් මේ කුලපුත්‍රයන්ගේ අප්‍රමාද විහරණය බිඳින්නේ ය. නැවත මේ කුලපුත්‍රයන් වසන තැන් ද නිබඳ වූවාහු පිරිසිඳින ලද්දාහුය. පන්සල් තුනක් ද සක්මන්මළු තුනක් ද දිවා ස්ථාන තුනක් ද ඇඳ පුටු ආදිය තුන බැගින් ද වෙති. මේ මහණ මහත් ශරීරයක් ඇත්තෙක. ඉතා වෘද්ධයෙක් වන්නේ යයි හඟිමි. හෙතෙම නො කල්හි මේ කුලපුත්‍රයන් සෙනස්නෙන් නැගිටුවන්නේ ය. මෙසේ හැම අයුරකින්ම මොවුන්ට නො සුව වන්නේය. අපහසුවක්ම වන්නේ ය' යි නො කැමති වන්නේ ය. ඒ නිසා භාග්‍යවතුන් වැළකීය.

යළි කිමෙක් ද, මෙතෙම දැන ඇඳුනුම්කමින් වැළකියේද, නොහඳුනමින් වැළකීද, නො දන්නේ ය. තව ද තථාගතයන්ගේ පිළිසිඳ ගැනීමේ පටන් දස දහසක් සක්වළ කම්පාවීම් වශයෙන් පෙළහර පැවැත්තුවාහුය. එහෙත් වනවාසී දුර්වල මිනිස්සු කර්මයන්හි යෙදුනාහු ඒ පෙළහර සලකන්නට නො හැකි වෙති. තව ද සම්මා සම්බුදුන් නම් යම්කලෙක නොයෙක් දහස් ගණන් භික්ෂු පිරිස් ඇත්තාහු, ව්‍යාම ප්‍රභාවයෙන්ද අසීති අනුව්‍යඤ්ජනයන් ගෙන් ද, දෙතිස්මහ පුරිස් ලකුණුවලින්ද, බුද්ධානුභාවය දක්වමින් හැසිරෙත් ද, එකල්හි මේ කවරෙක්දැයි නො පිළිවිසම දතයුත්තාහු වෙති. එකල භාග්‍යවතුන් වහන්සේ ඒ බුද්ධානුභාවය සිවුරුගබින් වසා මහා වළාවකින් වැසුණු සඳ සේ තුමූ මැ පාසිවුරු ගෙන අප්‍රසිද්ධ වේශයෙන් වැඩිය සේක. එහෙයින් උන්වහන්සේ නොහඳුනා ගනිමින්ම දායපාල, වනාරක්ෂකයා උන්වහන්සේ වැළකීය.

එතදවොච තෙරුන්වහන්සේ වනාහි 'මා සමණා'යි වනය පාලකයාගේ කථාව අසාම සිතූහ. 'අපි තිදෙනෙක් මෙහි වසමු. අන් පැවිද්දෙක් නැත. මෙම වන පාලකයා පැවිද්දකු සමග මෙන් කථා කරයි. කවරෙක් වන්නේදැයි, දිවාස්ථානයෙන් නැගිට දොරටුව දෙස බලද්දී භාග්‍යවතුන් දුටහ. භාග්‍යවතුන් වහන්සේ ද තෙරුන් දුටු විගස ශරීරාලෝකය විහිදවූහ. අසීති අනු ව්‍යඤ්ජනයන්ගෙන් විභූෂිත ව්‍යාමප්‍රභාව විදහළ බුදුහු රන්පටක් මෙන් බැබළුණහ. තෙරුන්වහන්සේ මේ වනපාලකයා

විෂසෝර සර්පයෙකු අතින් ගන්නට අත දික්කරන්නෙකු මෙන් ලෝකයෙහි අග්‍ර පුද්ගලයන් සමග කථා කළත් නො හඳුනන්නේ ය. අප්‍රසිද්ධ මහණක්හු මෙන් කථා කරයි. එය වළකමින් **මා ආවුසො දායපාලා** යන වචන කීය.

තෙනු පසඬකම් කුමක් හෙයින් භාග්‍යවතුන්ට පෙරගමන් නොකොට එළඹියේ ද, හේ මෙසේ සිතීය. අපි තුන් දෙනෙකු මෙහි එකට සමගිව වාසය කරමු. මම තනිවම පෙරගමන් කරන්නේ නම් එය සමගි වාසයට බාධාවකි. ප්‍රිය මිත්‍රයන් ගෙනම පෙරගමන් කරන්නෙමි. තව ද යම්සේ 'භාග්‍යවත්හු මට ප්‍රියසේක් ද, එසේම මගේ ප්‍රිය සහායකයන්ට ද ප්‍රිය සේක' යයි ඔවුන් සමග පෙරගමන් කරනු කැමැතිව තෙමේ තනිව පෙරගමන් නොකොට එළඹියේය. යලි කිසිවෙක් 'ඒ තෙරුන්ගේ පන්සල් දොර සක්මන් කෙළවර භාග්‍යවතුන් වහන්සේ පැමිණෙන මග වෙයි. එහෙයින් තෙරුන් වහන්සේ ඔවුන්ට සවන් දෙමින් ම ගියහ.

අභික්කමථ මෙහි එවු. **පාදෙ පක්ඛාලෙසි** සුපිපි පියුම් වැනි ජාල හස්තයන්ගෙන් මැණික් මෙන් වූ දිය ගෙන රන්වන් වූ පිටිපතුල්හි දිය වත්කොට පාදයෙන් පාදය අතුල්ලමින් සේදුවේය. බුදුවරුන්ගේ ශරීරයේ රජස් දැලි (දූවිලි) නො තැවරෙයි. කුමක් හෙයින් සේදුවේද, ශරීරයට සිසිල දැනවීමට හා භික්ෂූන්ගේ සිත් පිනවනු පිණිස ද වේ. යම්හෙයකින් අප විසින් එළවූ ජලයෙන් බුදුරජාණන් වහන්සේ පා සේදූහ. පරිභෝග කළහයි ඒ භික්ෂූන් තුළ බලවත් සොම්නසින් සිත ප්‍රීතිවේද, එහෙයින් සේදූහ.

ආයසමනතං අනුරුද්ධං භගවා එතදවොච හෙතෙම වනාහි ඔවුන් අතුරෙන් වැඩිමහල්ය. ඔහුට සංග්‍රහ කරනකල්හි සෙස්සන්ට ද කරන ලද්දේ වේනුයි තෙරුන්ටම **කච්චි වො අනුරුද්ධා** යන වචන වදාළහ. එහි **කච්චි** යනු ප්‍රශ්නාර්ථයෙහි නිපාතය. **වො** යනු සාමි වචනය. අනුරුද්ධයෙනි, කිමද තොපට **ඛමනීයං** ඉවසිය හැකිද, තොපගේ ඉරියව් ඉවසාද, **කච්චියාපනීයං** කිම තොපගේ ජීවිතය යැපේද, ගැළපේද, **කච්චි පිණ්ඩකෙන න කිලමථ** ඔබට පිණ්ඩපාතය සුලභද, පිඬුසිඟා වැඩි තොප දැක හුළුකැන් හා කටවඤ්ඤ, භික්ෂාව දීමට ජනයා සිතත්ද පෙළඹේද, යයි පිඬු සිඟීම් පිළිබඳ විස්තර විමසීය. කුමක් හෙයින්ද, යම්හෙයකින් ප්‍රත්‍යයෙන් වෙහෙසෙන්නෙකු විසින් මහණදම් කරන්නට හැකිවේද, මේ පැවිදි වත වේද, එහෙයින්.

ඉක්බිති ඔහු විසින් පිළිවදන් දුන් කල්හි අනුරුද්ධයෙනි, තෙපි රජ පැවිද්දෝය. මහා පිනැතියෝය. මිනිස්සු වනවාසී තොපට නොදී අන් කවරෙකුට දිය යුතුයයි සිතන්නහුද, යළි තෙපි එම පිණ්ඩපාතය වළඳ මුව පැටවුන් මෙන් ඔවුනොවුන් ගැටෙමින් වසවුද, නැතිනම් තොපගේ සමගිය ඇත්ද, සමගි රසය විචාරමින් කච්චි වො පන අනුරුද්ධා සමගගා යනාදිය වදාළහ. එහි ඛීරොදකී භූතා යම්සේ කිරිත් දියත් එකිනෙකට සැසඳේද, වෙන් නොවේද, ඒකත්වයට පැමිණේද, කිම එපරිද්දෙන් ඒකත්වයට පැමිණ එකම සිත් ඇත්තන් මෙන් වසන්නෝ ද යනුවෙන් විචාරමි. පිය චකඛූහි. මෙත් සිත් පිහිටුවා බලන ඇස් 'පියචකඛු' නම් වේ. කිම එවැනි ඇස්වලින් ඔවුනොවුන් බලමින් වසවුද, යනුවෙන් විචාරති. තගඝාති තගඝ යනු ඒකාන්ත අර්ථයෙහි නිපාතය වහන්ස, අපි ඒකාන්තයෙන් කියන ලද්දේ වෙමු.

යථා කථං පනාති මෙහි යථා යන්න නිපාත මාත්‍රයෙකි. කථං යනු කරුණු විමසීමයි. කෙසේ තෙපි මෙපරිද්දෙන් වසවුද? කවර කරුණකින් වසවුද, ඒ කාරණය මට කියන්න. මෙතතං කායකම්මං මෛත්‍රී වශයෙන් පැවැති ක්‍රියාවන්, ආවිචෙවරහො ඇති තැන ද නැති තැන ද සෙස්සෙහිද මේ ක්‍රමයමැයි.

එහි සම්මුඛයෙහි කාය වාක් කර්ම එක්ව විසීමෙහි ලබති. අන්‍යයෝ වෙන්ව විසීමෙහිය. මනඃ කර්මය සියලු තන්හි ලැබේ. සමගිව වසන්නවුන් අතුරෙන් එක් අයෙකු විසින් ඇඳ පුටු හෝ දැව භාණ්ඩ හෝ මැටි භාණ්ඩ හෝ පිටත නො මනාකොට තබන ලද්දේ වේද, එය දැක කවරෙකු විසින් මෙය පරිභෝග කරන ලදදැයි අවඥා නොකොට, තමන් විසින් මනාව තබන ලද්දක් මෙන් සිතා එය නිසිතැන තබන්නහුගේ යළි පිළිදැගිය යුතු තැන හෝ, පිළිදගින්නහුගේ හෝ සම්මුඛයෙහි මෙත් සිතම පහකළ යුතු වෙයි. එය මෛත්‍රී කාය කර්මයයි. එකකු නික්ම ගිය කල්හී ඔහු විසින් නොමනාකොට තබන ලද්ද, සෙනසුන් පිරිකර ආදිය එසේම අරන් තබන්නහුගේ පිළි පිළිදැගිය යුතු හෝ පිළි දගින්නකු හෝ, නැති තැන කරන මෛත්‍රී කාය කර්මය වෙයි.

සමග වසන්නහුගේ තෙරුන් සමග මිහිරි වූ සතුටු විය යුතු කථාව පිළිසඳර කථාව සිහි කළ යුතු කථාව දැහැමි කථාව සරභඤ්ඤං, මිහිරි ගායන (ස්වර බිඳුම්), පැන විමසීම, පැන විසඳීම යන මේ ආදිය කිරීමෙහි

(සම්මුඛයෙහි) ඇති තැන මෛත්‍රී වාක් කර්මය නම් වේ. යළි තෙරවරුන් නික්ම ගිය කල්හි මාගේ ප්‍රිය සහාය වූ නන්දිය ස්ථවිර කිම්බිල ස්ථවිර මෙසේ සීල සම්පන්න ය. ආචාර සම්පන්නය යන ගුණකථනය කිරීම නැති තැන කරන මෛත්‍රී වාක් කර්මය වේ. මාගේ මිත්‍ර වූ නන්දිය ස්ථවිර කිම්බිල ස්ථවිර වෛර නැත්තෙක් වේවා. නිදුක් වේවා. නිරෝගි වේවායි සිතීම නැති තැන මෛත්‍රී මනඃකර්මය වේ. මෙසේ සිතීම ප්‍රාර්ථනය සම්මුඛ පරාම්මුඛ මෛත්‍රී මනඃකර්මය වේ.

නානාහි බො භනෙත කායා කය වනාහි පිටි මෙන් ද මැටි මෙන් ද එකට ගුලි කළ නො හැක්කේය. **එකංව පන මඤ්ඤ චිතතං** එහෙත් අපගේ සිත සහිතාර්ථයෙන් නිරන්තරාර්ථයෙන් විග්‍රහ රහිතාර්ථයෙන් සමග්‍රාර්ථයෙන් එකක්මයයි දක්වයි. නැවත ස්වකීය සිත බහා තබා අන්‍යයන්ගේ සිත් වශයෙන් පැවැත්තාහුද, එක් අයකුගේ පාත්‍රයෙහි මල නැගේ. තව අයකුගේ සිවුර කිලිටි වෙයි. තව අයකුගේ පිරිබඩකම් වෙයි. මේ අය අතුරෙන් යමකුගේ පාත්‍රයෙහි මල නැගුනේද, ඔහු විසින් ඇවැත්නි, මගේ පාත්‍රයෙහි මල නැගුනි. එය පිරිසිදු කිරීම වටී යයි කී කල්හි, අනික් කෙනා මගේ සිවුර කිලිටි විය. එය සේදිය යුතු කී කල්හි, අනෙක් තැනැත්තා මගේ ආරාම පිරිබඩ කළයුතු යයි නො කියා වනයට පිවිස දර ගෙනවුත් කපා පාත්‍ර කටාහය පිරිබඩකොට, පාත්‍රය පිස, එයින් පසුව සිවුර සෝදති. පිරිබඩ හෝ කෙරෙත්. ඇවැත්නි, මගේ සිවුර කිළිටිය. එය සේදිය යුතුය. මගේ පන්සල කසල සහිතය. එය පිරිසිදු කළ යුතුය. පළමුව දැක්වූ තන්හි ද මෙම ක්‍රමයමැයි. **සාධු සාධු අනුරුද්ධා භාග්‍යවතුන් වහන්සේ පළමුව 'නව මයං භනෙත පිණ්ඩකෙන කිලමීමහ' යයි කී කල්හි** සාධුකාර නොදුන්හ. ඒ මන්ද මේ කබලිංකාරාහාරය මේ සත්ත්වයන්ට අපායෙහි ද, දෙව් මිනිස් ලෝකවලද පළපුරුද්දෙන් ස්වාභාවිකම වූයේය. මේ ලෝක සන්නිවාසීහු වනාහි බොහෝසෙයින් විවාදයට පාත්‍ර වූහ. අපායෙහි ද දේව මනුස්ස ලෝකවල ද මේ සත්ත්වයෝ ප්‍රතිවිරුද්ධයහ. මොවුන්ගේ සමගි කාලය සමගි වාසය දුර්ලභය. එබැවින් භාග්‍යවතුන් වහන්සේ සාධුකාර දුන් සේක.

දැන් ඔවුන්ගේ අප්‍රමාදී ලක්ෂණ විචාරන්නේ **කච්චිපන** වෝ **අනුරුද්ධා** ආදිය කීහ. එහි වෝ යනු නිපාතයෙකි. ප්‍රථමා විභක්ති හෝ වෙයි. කිම තෙපි යන අර්ථයි. **අමහාකං** යනු අප තුන්දෙන අතුරෙන් **පිණ්ඩාය පවිසකමති** ගමේ පිඬු පිණිස හැසිර ආපසු පැමිණේ ද අවකකාර

පාතිං අතිරේක පිණ්ඩපාතය බැහැරකොට තැබීම පිණිස එක් භාජනයක් සෝදා තබයි.

යො පචජා ඒ භික්ෂූන් වහන්සේලා එක්වරම පිඬු පිණිස නො පිවිසෙත්. මොව්හූ ඵල සමවත්හි ඇලුනාහු වෙති. උදෑසනම සිරුර පිළිදැගුම් කොට වත්පිළිවෙත් පුරා සෙනසුනට පිවිස කාලය බෙදා ඵල සමාපත්තියට සමවැද සිටිති. ඔවුන් අතුරෙන් යම් කෙනෙක් පළමුව හිඳ ගත්තේ ද තමන්ගේ කාලය අවසන් වූ විට නැගිට සිටියි. හෙතෙම පිඬු සිඟා ගොස් පෙරළා පැමිණියේ බත්කිස කරන තැනට අවුත්, 'භික්ෂූහු දෙදෙනෙක් පසු වූහ. මම ඉතා පළමුව ආමියි දැන ගනී. ඉක්බිතිවැ පාත්‍රය වසා අසුන් පැනවීම ආදිය කොට පාත්‍රයෙහි බත් කොටසක් පමණක් ගෙන වළඳයි. වැඩි ආහාර දමන භාජනයෙහි ආහාර තබා පාත්‍රය වසා කළ බත්කිස ඇතිව පාත්‍රය සෝදා ජලය රහිත කොට පිසදමා, පාත්‍රාථවිකයෙහි දමා අසුන් ඔසවා පා සිවුරු ගෙන තමන් වසන තැනට පිවිසෙයි. දෙවැනි තැනැත්තා අවුත් එක් අයෙක් පළමු ආ බවත් එක් අයෙක් පසුවන බවත් දැන, පාත්‍රයෙහි ඇති ආහාර ආදිය ගෙන වළඳයි. එය මදි වූයේ නම් අතිරේක ආහාර තබන භාජනයෙන් ගෙන වළඳයි. වළඳ පළමු තෙරුන් මෙන් තමන් වසන තැනට පිවිසෙයි. තෙවැන්නා අවුත් දෙදෙනෙක් පළමු ආවාහුය. මා පමා වූයේ යයි දැනගනියි. හෙතෙමේ ද දෙවෙනි තෙරුන් මෙන් වළඳ කළ බත්කිස ඇත්තේ පාත්‍රය සෝදා ජලය රහිත කොට ථවිකාවෙහි තබා, අසුන් ඔසවා තැන්පත් කොට තමා, පැන් කළයෙහි හෝ පරිභෝග කරන දිය කළයෙහි ඉතිරි ජලය ඉවත්කර, කළ යටිකුරු කොට, ඉතිරි බත් දමන භාජනයෙහි බත් තිබේ නම් ඒවා බැහැරකොට එම භාජනය සෝදා පිරිසිදු කොට, බත් ගේ අමදියි. කසළ ඉවත දමා, මුස්න වේයන් නොකන තැනකින් තබා, පාසිවුරු ගෙන වසන තැනට පිවිසෙයි. මේ තෙරවරුන්ගේ වෙහෙරෙහි ද වනයෙහි ද, බත්කිස කරන තැන ද බොජුන්හල ද යන මේ තන්හි වත් පිළිවෙත් සඳහා **යො පචජා** යනාදිය කියන ලදී.

යො පසසති යනු ඔවුන්ගේ ඇතුළු වෙහෙර වත යයි දතයුතු. එහි **වචසටං** වැසිකිළියෙහි පරිභෝගය සඳහා දිය තබන භාජනය **රිතතං** හිස් වූයේ **තුචඡං** එම අරුත්මැයි. **අවිසයහං** ඔසවන්නට නොහැකි වන්නේ ඉතා බරය. **හසථ විකාරෙන** හස්ත සංඥාවෙන් පැන් කළ ආදී යමක් හිස් වූයේ නම් එය ගෙන පොකුණට ගොස් ඇතුළත හා පිටත සෝදා දිය

පෙරා ඉවුරෙහි තබා අන් භික්ෂුවක් අතින් සංඥාකොට කැඳවති. එක් අයකු නියමකොට හෝ නියම නොකොට ශබ්ද නොකරති. කුමක් හෙයින්, නියම නොකරත්ද ඒ භික්ෂුවගේ ශබ්දය බාධාවක් වන බැවිනි. කවර හෙයින්ද නියම නො කෙරෙත්ද, අනියමින් ශබ්ද කළ කල්හි මම පෙරටු වෙමි. මම පෙරටු වෙමි යි දෙතුන් දෙනෙක් එන්නේය. දෙදෙනකු විසින් කළයුතු කාර්යය තුන්වැන්නෙක් පැමිණීම නිසා ඉතිරි අයගේ කර්මච්ඡේදය වන්නේ ය. වැඩ පාළු වන්නේ ය. යළි සංවර වූ පිය හඬ ඇතිව අන්‍ය භික්ෂූහුගේ දිවාස්ථාන කරා ගොස් ඔහු විසින් දුටු බැව් අත්සන් කරයි. ඒ ලකුණින් අනෙක් මහණ පැමිණේ. ඉක්බිති දෙදෙන අතින් අත බඳිමින් දෙ අත්හි තබා එලවා තබත්. ඒ සඳහා හත්ථවිකාරෙන දුතියං ආමනෙත්වා හත්ථවිලංගෙන උපට්ඨපෙම යන්න කියන ලදී.

පඤ්චාහිකං ඛො පනාති තුදුස්වක් පොහොය, පසළොස්වක පොහොය, අටවක යන මේ වූ කලී ප්‍රකෘති ධර්ම ශ්‍රවණයම වේ. එය නොකඩකොට පස්වන පස්වන දිනයෙහි තෙරවරු දෙදෙන ඉතා උදෙන් නා අනුරුද්ධ තෙරුන් වසන තැනට යෙති. එහි තිදෙනම හිඳ තුන් පිටකයෙන් එක්තරා පිටකයෙක්හි ඔවුනොවුන් ප්‍රශ්න විචාරති. විසඳති. ඔවුන් මෙසේ කරද්දීම අරුණ නගී. ඒ සඳහා කියන ලදී.

මෙතෙකින් භාග්‍යවතුන් වහන්සේ විසින් අප්‍රමාද ලක්ෂණ විචාළාහු තෙරුන් විසින් ප්‍රමාදස්ථානයන්හිම අප්‍රමාද ලක්ෂණ විසඳන ලදී. යම්හෙයකින් අනෙක් භික්ෂූන්ට පිඬු පිණිස නික්මෙන කාලය, අඳන හැඳ සිවුර පොරවන කාලය; ඇතුලුගම පිඬු පිණිස හැසිරීමය. දහම් දෙසීමය. අනුමෝදනය, ඇතුලු ගමින් නික්මී වැළඳීමය. මුහුණ කට සේදීමය. පාත්‍රය වියළීමය. පා සිවුරු තැන්පත් කිරීමය යන මේවා මොව්හූ ප්‍රමාදකර ස්ථානයෝ වේද, එහෙයින් තෙරුන් වහන්සේ අපට මෙතෙක් තැන් හැර වෙනත් ප්‍රමාද කාලයක් නැතැයි දක්වමින් ප්‍රමාදස්ථානයන්හිම අප්‍රමාද ලක්ෂණය විසඳූහ. ඉක්බිති ඔහුට භාග්‍යවතුන් වහන්සේ සාධුකාර දී, ප්‍රථම ධ්‍යානය විමසන්නාහු යළි,

අත්ථීපන වො ආදිය වදාළහ. එහි උත්තරි මනුස්ස ධම්මාති මිනිස් දහමින් උපරිමයෙහි අලමරිය විසෙසො ආර්ය භාවය කිරීමෙහි සමත් වූ, විශේෂයෙක් කිං හි නො සියා භනෙත ස්වාමීනි, කුමක් හෙයින් නො ලද්දේ වන්නේ ද,

යාවදෙව යම්තාක් මා මෙසේ ප්‍රථමධ්‍යාන ලාභය ප්‍රකාශ කළ කල්හි ද්විතීයධ්‍යානය විමසන්නාහු එතසස පන වො යනාදිය වදාළහ. එහි **සමතිකකමාය ඉක්මවීම පිණිස, පටිපපසසදධියා මැඩලීම පිණිස,** ඉතිරි විස්තර පෙර කී ආකාරයෙන් දතයුතු. නැවත පශ්චිම ප්‍රශ්නයෙහි ලෝකෝත්තර ඥාන දර්ශනයාගේ වශයෙන් ලබන්නා වූ නිරෝධ සමාපත්තිය විමසන්නාහු, **අලමරිය ඤාණ දසසන විසෙසො** ආදිය වදාළහ. තෙරුන් වහන්සේ විමසන ලද ආකාරයෙන්ම ප්‍රකාශ කළහ. එහි යම්හෙයකින් විඳින්නා වූ සුවයට වඩා නො විඳින්නා වූ සුවය ශාන්ත වේද සුවපත් වේද, එහෙයින් **අඤඤං එාසු විහාරං උතතරිතරංවා පණිතතං වා, න සමනුපසසාමි** ආදිය කීහ.

ධම්මික කථා සමගි රසයෙහි අනුසස් ප්‍රතිසංයුක්ත වූ දැහැමි කථාවෙන්, ඔව්හූ සියල්ලෝම සිව්සස්හි නිම වූ කිස ඇත්තාහු ය. එහෙයින් ඔවුන්ගේ ප්‍රතිවේධය පිණිස වෙනත් කිය යුත්තක් නැත. සමගිව විසීමෙන් මේ මේ අනුසස් යයි සමගියෙහි ආනිශංසම භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට වදාළහ.

භගවනතං අනුසංසාවෙතවා ඔව්හූ භාග්‍යවතුන් වහන්සේගේ පා සිවුරු ගෙන මදක් දුර පසුගමන් ගියාහුය. භාග්‍යවතුන් වහන්සේ විහාරෝපනයේ කෙළවරට ගිය කල්හි, මගේ පාසිවුරු මට දෙව්, තෙපි මෙහිම නවතිවු යයි කියා උන්වහන්සේ වැඩියේය. **තතො පටිනිවතතිතවා** ඒ සිටි තැනින් නැවතී, **කිනනුමයං ආයසමතො** භාග්‍යවතුන් නිසා පැවිදි ආදියට පැමිණ ද, තමන්ගේ ගුණ කථාවෙන් ලජ්ජා වන්නාහු අධිගමය නිසා උපන් අපිස් බවින් කීවාහුය. **ඉමාසංඛ ඉමාසංඛ** ප්‍රථමධ්‍යානාදී ලෞකික ලෝකෝත්තර වූ,

චෙතසා චෙතො පරිචච විදිතො අද මේ ආයුෂ්මත්හු ලෞකික සමාපත්තියෙන් යුක්තව කල් ගෙවූහ. අද ලෝකෝත්තර සමාපත්තියෙකැයි මෙසේ සිතින් සිත පිරිසිඳ ගන්නා ලද, **දෙවතාපි** මෙ ස්වාමීනි අනුරුද්ධයන් වහන්ස, අද ආර්ය වූ නන්දිය ස්ථවිර ආර්ය වූ කිම්බිල ස්ථවිර මේ මේ සමාපත්තීන් ඉක්මවූහයි මෙසේ දැන්වූවාහුය යන අර්ථයි. **පඤඤාභිපුටෙයන** එය ද මා විසින් තමන් දන්නා ලදැයි හෝ දෙවියන් විසින් දන්වන ලද්දේ යයි හෝ මෙතෙකින්ම මගේ මුඛය සැරසිනැයි

කථාව උපදවා මගෙන් නො අසනු ලද්දහු විසින්ම නො කියන ලද, යළි භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්න කොට විචාරණ ලද්දාහු විසින් ප්‍රශ්න අසන ලදුවම ප්‍රකාශ කරන ලදී. එහි මාගේ වචනය නො රැස්නහුදැයි කීය.

දීඝො 'මණිමාණී චරො දීඝො - අථො සෙරිසසකො සහා' යනුවෙන් ආ හෙයින් අට විසි යක් සෙනවියන් ඇතුළත වූ එක් දිව්‍ය රාජයෙක. **පරජනො** ඒ යක්‍ෂයාගේ නමයි. **යෙන භගවා තෙනුපසංකමි** හේ වනාහි වෛශ්‍රවණ විසින් මෙහෙයවන ලදුව එක් තැනකට යන්නේ භාග්‍යවතුන් වහන්සේ තම පා සිවුරු ගෙන ගිජ්ඣකාවසථයෙන් නික්ම ගෝසිංගසාල වනයට යන අතරමගදී දැක භාග්‍යවතුන් වහන්සේ තම පාසිවුරු ගෙන ගෝසිංගාල වනයේ තුන් කුලපුතුන් වෙත යති. අද මහත් දම් දෙසුම වන්නේය. මා ද ඒ දේශනාවට කොටස්කාරයකු විය යුතුයයි පෙනෙන ශරීරයෙන් යුතුව, ශාස්තෘන් වහන්සේ ගේ පියවර අනුව පසුපසින් ගොස් නො දුර සිට දහම් අසා ශාස්තෘන් වඩින කල්හිදු නො ගියේය. යළි මේ තෙරහු කුමක් කරන්නේදැයි දක්නා පිණිස එහිම නැවතිණ. එකල්හි ඒ දෙතෙරුන් අනුරුද්ධ ස්ථවිරයන් වෙහෙසන්නවුන් දැක, මේ ස්ථවිරවරු දෙදෙන භාග්‍යවතුන් නිසා ප්‍රව්‍රජ්‍යා ආදී සියල්ල ලැබ ද, භාග්‍යවතුන් වහන්සේටම මසුරු කෙරෙති. නො ඉවසති. සඟවති. වසති. මෙවිට මොවුන්ට වසන්ට නො දෙමි. පොළව පටන් බඹලොව තෙක් මොවුන්ගේ ගුණ ප්‍රකාශ කරන්නෙමි යි සිතා, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි එළඹියේ ය.

ලාභා භනෙත වහන්ස, යම් වැදෑරට වාසීහූ භාග්‍යවතුන් ද මේ තුන් කුලපුත්‍රයන් ද, දක්නට ලබත් ද, වඳින්නට ලබත් ද, දන් දෙන්නට ලබත් ද, බණ අසන්නට ලබත් ද, ස්වාමීනි, ඒ වජ්ජීන්ට ලාභයකි. **සද්දං සුත්වා** හේ වනාහි තමා ගේ යක්‍ෂානුභාවයෙන් මහත් ශබ්දකොට මුළු වජ්ජි රට වතුරුවමින් ඒ වචන කීය. එහෙයින් ඒ ඒ වෘක්‍ෂ පර්වත ආදීන්හි වෙසෙන බූමාටු දෙවියෝ ඔහුගේ ශබ්දය ඇසූහ. ඒ සඳහා **සද්දං සුත්වා** යන්න කියන ලදී. **අනුසසාවෙති** මහත් වූ ශබ්ද නගා කියන ලදී. සියලු තන්හි මේ ක්‍රමයයි. **යාව බ්‍රහමලොක** බඹලොව දක්වා.

තක්කෙඵපි කුලං අපගේ කුලයෙන් නික්ම මේ කුලවක්හූ පැවිදි වූහ. මෙසේ සීලවන්තයහ. ගුණවන්තයහ. ආචාර සම්පන්නයහ. මනාසේ

කල්‍යාණ ධර්ම ඇත්තාහුය. මෙසේ ඒ තුන් කුල පුත්‍රයන් පහන් සිත් ඇතිව සිහි කරන්නේයැ. මෙසේ සියලු තැන්හි අර්ථ දතයුතු. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අනුසන්ධි වූ පරිද්දෙන් දේශනාව නිමවා වදාළ සේක.

පළමුවන චූළ ගෝසිංග සූත්‍ර වර්ණනාව නිමියේය.

1-4-2

එවමෙමසුතං යනු මහා ගෝසිංග සූත්‍රයයි. එහි **ගොසිංග සාලවනදායෙ** මෙය වසන තැන දැක්වීම පිණිස කියන ලදී. යම්හෙයකින් වෙනත් සූත්‍රයන්හි **සාවත්ථිය විහරති ජෙතවනෙ - අනාථ පිණ්ඩිකසස ආරාමෙ** ආදී වශයෙන් පළමුව ගොදුරුගම දක්වා පසුව වසන තැන දැක්වීද, මෙම සූත්‍රයෙහි භාග්‍යවතුන් වහන්සේගේ ගොදුරුගම අනිබද්ධ වේද, කිසිවක්ම ගොදුරුගම වන්නේද එහෙයින් වසන තැනම දක්වන ලදී. මේ සූත්‍රය ආරණ්‍ය නිදාන නම් ඇත්තේ වෙයි.

සම්බහුලෙහි බොහෝ වූ, **අභිඤ්ඤා තෙහි අභිඤ්ඤාතෙසී** සියලු තැන්හි ප්‍රසිද්ධ වූ ප්‍රකට වූ, **ථෙරෙහි සාවකෙහි සද්ධිං** ප්‍රාතිමෝක්ෂ සංවරාදී සථිරකාරක ධර්මයන්ගෙන් සමන්විත බැවින් ස්ථවිර වූ, ශ්‍රවණානීතයෙන් ජාත වූ බැවින් ශ්‍රාවක වූ භික්ෂූන් හා එක්වැ

මෙවිට ඒ ස්ථවිරයන් ස්වරූපයෙන් දක්වමින් **ආයසමතාච සාරිපුත්තෙන** ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේ තමන්ගේ ශීලාදී ගුණයන්ගෙන් බුදුසසුන්හි ප්‍රසිද්ධය. ඇස් ඇතියනට අහස් මැද සිටි හිරු මෙන් ද, සඳු මෙන් ද, මුහුදු තෙර සිටියවුන්ට සයුර මෙන් ද, ප්‍රකට වූහ.

ප්‍රසිද්ධ වූහ. තව ද මේ සූත්‍රයෙහි ආ ගුණයන්ගේ වශයෙන්ම මහත් බැව් නො දත යුතුය. මෙයින් වෙනස් වූ අනංගණ, ධම්මදායාද, සම්මාදිට්ඨි, සීහනාද, රථ විනීත, මහා හත්ථිපදොපමය, මහා වෙදල්ල, චාතුම දීඝනඛ, අනුපද, සෙචිතබ්බා සෙචිතබ්බ, සච්ච විභංග, සම්පසාදනීය, සංගීති, දසුත්තර, පවාරණ, සුසීම, ථෙරපඤ්හ, මහා නිදෙස, පටිසම්භිදා මග්ගය, ථෙර සීහනාද, අභිනිෂ්ක්‍රමණ, එතදග්ග ආදී මේ සූත්‍රයන්ගේ වශයෙන් ද, තෙරුන්ගේ මහත් බැව් දතයුතුය. ඒතදග්ග පාලියෙහි **එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං මහා පඤ්ඤානං යදිදං සාරිපුත්තෙනා** යනුවෙන් වදාරන ලදහ.

මහ මුගලන් තෙරුන් ද සීලාදී ගුණයන්ගෙන් ද, මේ සූත්‍රයෙහි ආ ගුණයන්ගෙන් ද, සැරියුත් තෙරුන් මෙන්ම ප්‍රසිද්ධ වූහ. ප්‍රකට වූහ. මහත් වූහ. වැලිදූ අනුමාණ සූත්‍රය, චුල්ලතණ්හා සංඛය සූත්‍රය, මාර තජ්ජනීය, පාසාදකම්පන, ඉද්ධිපාද සූත්‍රාන්තය, නන්දොපනන්ද දමනය, යමාමහ පෙළහරින් පසු දෙව්ලෝයාම, විමාන වත්ථු, පේතවත්ථු, තෙරුන්ගේ අභිනිෂ්ක්‍රමණය, ඒතදග්‍රය යන මොවුන්ගේ වශයෙන් ද, උන්වහන්සේගේ මහත් බැව් දතයුතු. ඒ එසේමැයි. ඒතදග්‍රයෙහි, **එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ඉද්ධිමන්තානං යදිදං මහා මොග්ගල්ලානෙ** යයි වදාරණ ලදී.

මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ද ශීලා දී ගුණයන්ගෙන් ද, මේ සූත්‍රයෙහි ගුණයන්ගෙන් ද, (සැරියුත් තෙරුන් මෙන්) ප්‍රසිද්ධ වූහ. ප්‍රකට වූහ. මහත් වූහ. තව ද චීවර පරිවත්තන සූත්‍රය ජිණ්ණචීවර සූත්‍රය, චන්දොපමය, සමස්ත කසස සංයුත්තය, මහා අරියවංස සූත්‍රය තෙරුන්ගේ අභිනිෂ්ක්‍රමණය, ඒතදග්‍රය යන මොවුන්ගේ වශයෙන් ද, උන්වහන්සේගේ මහත් බව දතයුතු. ඒතදග්‍ර පාළියේ 'එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ධුතවාදානං යදිදං මහාකසසපො' යි වදාරණ ලදී.

අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ද ශීලාදී ගුණයන්ගෙන් හා මේ සූත්‍රයෙහි ආ ගුණයන්ගෙන් ද (සැරියුත් තෙරුන් මෙන්) ප්‍රසිද්ධයහ. ප්‍රකටයහ. මහත්ය. තව ද චූළ ගෝසිංග සූත්‍රය, නළකපාන සූත්‍රය, අනුත්තරිය සූත්‍රය, උපක්කිලෙස සූත්‍රය, අනුරුද්ධ සංයුත්තය, මහා පුරිස විතක්ක සූත්‍රය, තෙරුන් ගේ අභිනිෂ්ක්‍රමණය ඒතදග්‍රය යන මොවුන්ගේ වශයෙන්ද, උන්වහන්සේ මහත් බව දතයුතුය. ඒ එසේමයි. ඒතදග්‍රයෙහි 'එතදග්ගං

භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං දිබ්බ චක්ඛුකානං යදිදං අනුරුද්ධා'යි වදාරණ ලදී.

ආයසමතා රෙවතෙන යන මෙහි ඛදිරවනිය රේවතද කංඛා රේවතද යයි රේවත තෙරහු දෙනමක් වූහ. ඔවුනතුරෙහි 'ඛදිරවනිය රේවත' තෙරුන් වහන්සේ ද දම්සෙනෙවි තෙරුන්ගේ කණිටු බෑයා විය. එය මෙහි අදහස් නො කරන ලදී. යළි ගුළ අකැපය. මුං අකැපය යයි සැක පහළ කළ තෙරුන් වහන්සේ මෙහි 'රේවත' යන්නෙන් අදහස් කළේය. උන්වහන්සේ ද ශීලාදී ගුණයන්ගෙන් හා මේ සූත්‍රයෙහි ආ ගුණයන්ගෙන් ද, සැරියුත් තෙරුන් මෙන් ප්‍රසිද්ධයහ. ප්‍රකටය. මහත් වූහ. තව ද උන්වහන්සේගේ අභිනිෂ්ක්‍රමණයෙන් ද, ඒතදග්‍රයෙන් ද, මහත් බැව් දතයුතු. ඒතදග්‍ර පාලියෙහි 'එතදගගං භික්ඛවෙ මෙ සාවකානං භික්ඛූනං ඣායිනං යදිදං කඬ්ඛාරෙවතො' යි වදාරන ලදී.

ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද ශීලාදී ගුණයන්ගෙන් හා මෙම සූත්‍රයෙහි ආ ගුණයන්ගෙන් ද, සැරියුත් තෙරුන් මෙන් ප්‍රසිද්ධයහ. ප්‍රකටයහ. මහත්වූහ. තව ද සේඛ සූත්‍රය, බාහිතිය සූත්‍රය, ආනඤ්ජ සප්පාය ය, ගෝපක මොග්ගල්ලානය, බහුධාතුකය, චූල සුඤ්ඤතය, මහා සුඤ්ඤතය, අචෙඡර අබභූත සූත්‍රය, භද්දෙක රත්තය, මහා නිදානය, මහා පරිනිබ්බානය, සුභ සූත්‍රය, චූළනීය ලෝකධාතු සූත්‍රය, අභිනිෂ්ක්‍රමණය, ඒතදග්‍රය යන මොවුන්ගේ වශයෙන් උන්වහන්සේගේ මහත්බැව් දතයුතු. ඒකදග්‍ර පාලියෙහි එතදගගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං බහුසසුනානං යදිදං ආනන්දො' යනුවෙන් වදාරන ලදී.

අඤ්ඤෙහි ච අභිඤ්ඤාතෙහි අභිඤ්ඤාතෙහි, හුදෙක් මේ තෙරවරුන් සමග පමණක් නොව, අන්‍ය වූ ද මහා ප්‍රකට වූ ද මහත් ගුණවත් බැවින් ප්‍රසිද්ධ වූ ද, බොහෝ ස්ථවිර වූ ශ්‍රාවක භික්ෂූන් සමග භාග්‍යවතුන් වහන්සේ ගෝසිංග සාල වනයෙහි වාසය කරති යන අර්ථයි. මහා ප්‍රඥාවන්ත සැරියුත් හාමුදුරුවෝ එවැනිම තවත් ප්‍රඥාවන්ත හාමුදුරුවරුන් සමග දශබලධාරීන් වහන්සේ සමග පිරිවරා වාසය කළහ. මහා ඍද්ධිමත් වූ මහ මුගලන් ස්ථවිරයන් මහා ධුතංගධාරී කාශ්‍යප ස්ථවිරයන්, දිවැස් ඇත්තා වූ අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ, ධ්‍යානයේ ඇලුම් ඇති කංඛාරේවත ස්ථවිරයන් මනා සේ බහුශ්‍රැත වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ, තවත් නොඑක් බහුශ්‍රැත භික්ෂූන් වහන්සේලා පිරිවරා

දශබලයන් වහන්සේ සමග වාසය කරන්නාහුය. මෙසේ දක්වන ලද්දා වූත්, නො දක්වන ලද්දා වූත් ප්‍රසිද්ධ වූ මහා ස්ථවිරවරුන් තිස්දහසක් පමණ භික්ෂූහු දශබලධාරීන් පිරිවරා වැඩහුන්හයි දතයුතු.

පටිසල්ලාණා වුටඨිතො එල සමාපත්ති විවේකයෙන් නැඟී සිටියේ **යෙනායසමා මහා කසසපො තෙනුපසඞකමි** තෙරුන් වහන්සේ පල සමාපත්ති සුවයෙන් නැඟී සිටියේ, පසු ලෝකධාතුව බලන්නේ, උද්‍යාන ක්‍රීඩා කරන මත් වූ ක්ෂත්‍රියයක්හු ගේ කණින් ගිලිහෙන මිණි කොඩලක් සෙයින් ද, හකුලා කවරයක දැමූ රත්පැහැ කම්බිලියක් සෙයින් ද, මිණිමුවා නාග දන්තයකින් වැටෙන දහස් ගණන් අගනා රත්තැටියක් සෙයින්ද, බැසගෙන යන පූරණ රිවිමඬල දුටහ. එයට අනතුරුව, නැගෙනහිර දෙස අහස බලන්නේ නිම්වළල්ල ගෙන පරිවර්තනය කරන රිදී රෝදයක් මෙන් ද, රිදී පව්වකින් නික්මෙන කිරිදහර මඬලක් සෙයින් ද, පියාපත් සළා ගුවන්තලෙහි පැනනගින සුදු හංසයකු සේ ද, කළු මුහුදු අහස් කුසින් උඩට නැඟි නැගෙනහිර දිග සක්වළගල මතුයෙහි සාවාගේ ලකුණ සහිතව පායන පනස් යොදුන් සඳමඬල දුටහ. ඉක්බිතිව සල්වනය බැලූහ. එකල්හි සල්ගස් මුලපටන් අග තෙක් මුළුමනින් ම පිපී පැවතුණු සල්මල් සිනිඳු දුහුල්සළු පොරෝනා ලද්දවුන් මෙන් ද, මුතු කලප්වලින් අමුණන ලද්දවුන් සෙයින් ද, බැබළුණහ. පොළොතලය මල් ඇතිරි ඇතුරුවාක් මෙන් ඒ ඒ තැන වැටෙන මල් රොනින්, ලාක්ෂා රසයෙන් තෙමන ලද්දක් මෙන් විය. මීමැසි බඹර සමූහයා මල් රොන් මදයෙන් මත්ව ගීතිකා ගයන්නවුන් මෙන් වනාන්තරයේ හැසිරෙති. තව ද එදින පෙහෙවස් දවසක් විය. ඉක්බිති තෙරුන් වහන්සේ අද මේ ලස්සන රාත්‍රිය කෙසේ ගෙවන්නේ දැයි සිතූහ. ආර්ය ශ්‍රාවකයෝ නම් ධර්මශ්‍රවණයටම ඇළුම් ඇත්තෝ වෙති. මගේ දෙටු සොයුරු දම්සෙනෙවි තෙරුන් වෙත ගොස් ධර්මරතියෙන් කල් ගෙවන්නෙමි. නැවත යන්නේ තනිව නොගොස් මහා කාශ්‍යප තෙරුන් සමග යන්නෙමි යයි හුන් තැනින් නැඟිට පත්කඩය ගසා හකුළා ආයුෂ්මත් මහා කාශ්‍යප තෙරුන් වෙත එළඹියේය.

එවමාවුසොති ඛො ආයසමා මහා කසසපො තෙරුන් වහන්සේ ද ධර්මශ්‍රවණය ප්‍රිය කරන්නා වූ ආර්ය ශ්‍රාවකයෙක් වුව ද, උන්වහන්සේගේ වචනය අසා 'ඇවැත්නි, තෙපි යවු, අද මගේ හිස හෝ පිට රිදේ' යයි තුටු සිත් ඇත්තාහුම **එවමාවුසො** යනාදිය කීහ. එසේ පිළිතුරු දී ද හුන් තැනින් නැඟිට පත්කඩය ගසා, මහමුගලන් තෙරුන් අනුව ගියහ.

මහතෙරුන් දෙදෙන පිළිවෙළින් සිටි කල්හි සඳමඬල දෙකක් මෙන්, රිවිමඬල දෙකක් මෙන්, සද්දන්ත ඇත් රජුන් දෙදෙනෙකු මෙන්, සිංහයන් දෙදෙනෙකු මෙන්, ව්‍යාඝ්‍රයන් දෙදෙනෙකු මෙන් බැබළුණහ.

අනුරුද්ධ ස්ථවිරයන් ද එසමයෙහි මේ මහතෙරුන් දෙදෙන සැරියුත් තෙරුන් වෙත යනු දැක, බටහිර ලෝකය බලනුයේ හිරු වනයෙන් බැස යන්නාක් මෙන් ද, සඳු වනයෙන් උඩ නගින්නාක් ද, සල් වනය දෙස බලමින් සුපිපි සල් වනය දැක, 'අද පෙහෙවස් දිනය වේ. මාගේ දෙටු සොහොයුරෝ ද දම්සෙනෙවි වෙත යති. මහත් ධර්ම ශ්‍රවණයක් විය යුතුය. 'මම ද එයට කොටස්කරුවකු වෙමි'යි හුන් තැනින් නැගිට පත්කඩය ගසා මහතෙරවරුන්ගේ පදානුපදිකව නික්මුණහ. එහෙයින් **අථචෝ ආයසමාච මහා මොග්ගල්ලානෝ, ආයසමා ච මහා කස්සපෝ, ආයසමාච අනුරුද්ධෝ** යන්න කියන ලදී.

යෙනායසමා සාරිපුත්තෝ තෙනුපසංකම්ංසු පිළිවෙළින් සිටි තුන් සඳක් මෙන් තුන් හිරක් මෙන්, සිංහයන් මෙන්, බබළමින් එළඹියාහුය. මෙසේ එළඹෙන්නා වූ මහතෙරවරුන්, ආයුෂ්මත් ආනන්ද තෙරුන් විසින් දක්නා ලදී. 'අද මහත් ධර්මශ්‍රවණයක් වන්නේ ය. මා ද එයට කොටස්කරුවකු විය යුතුය. එහෙත් තනිව නොයමි. මා ප්‍රිය සහාය වූ රේවත තෙරුන් ද කැටුව යන්නෙමි' සියල්ල මහ මුගලන් තෙරුන් මහ කසුප් තෙරුන් වෙත එළඹි නියායෙන් ම දතයුතු. මෙසේ ඒ දෙදෙනා වහන්සේ ද සඳ දෙකක් මෙන්, හිරු දෙකක් මෙන්, සිංහයන් මෙන් බබළමින් සැරියුත් තෙරුන් වෙත එළඹියාහුය. ඒ සඳහා **අද්දසා ඛෝ ආයසමා ආනන්දෝ** යන්න කියන ලදී.

දිසවාන ආයසමන්තං ආනන්දං වොච දුරදීම දැක කථාව ඇසෙන දුරට පැමිණියහුට **එතු ඛෝ ආයසමා** යනාදි වචන කීහ. **රමණීයං ආවුසෝ** ඇවැත්නි සිත්කළුය යන මෙහි රමණීය බව දෙපරිදිය. වනයෙහි ඇති සිත් ඇදගන්නා සුළු බව, පුද්ගලයන් සතු සිත් ඇදගන්නාසුළු බව, එහි වනය නම් කිම? නා, හොර, සල්, සපු ආදියෙන් ගැවසී ගත් වනයයි. ගණ සෙවණලු ඇති මල්පල හටගන්නා විවිධ වර්ගයේ ගස් ඇති, ජලාශ්‍රිත වූ ගමින් බැහැර වූ පෙදෙස මේ 'වන රාමණෙය්‍යක' නම්. රමණීයානි යනාදිය ඒ සඳහා කියන ලදී.

'ආරණ්‍යයෝ සිත් අලවති. යම් ආරණ්‍යයක කාම ගවේසක ජනයා නො ඇලේද වීතරාගී වූ ක්ෂීණාශ්‍රවයෝම සිත් අලවා වෙසෙති. ඒ ක්ෂීණාශ්‍රවයෝ වස්තුකාම ක්ලේශකාම නො සොයන බැවිනි.

විෂම වූ, දිය රහිත වූ තුනී සෙවණලු ඇති කටුවලින් ගැවසී ගත් ප්‍රදේශයක් වේද, එහි බුද්ධාදී ආර්යයෝත් වාසය කරත්ද, මෙය 'පුග්ගල රාමණෙය්‍යක' නම් වේ.

ඒ සඳහා කියන ලදී.

රමණීයානි අරඤ්ඤානි - යත්ථ න රමති ජනෝ
වීතරාගා රමිසසනති - න තෙ කාම ගවෙසිනෝ

ගමක හෝ වනයක හෝ වළ තැනෙක හෝ ගොඩ තැනෙක හෝ ආදී යම් තැනෙක රහතන් වහන්සේලා වාසය කරත් ද, ඒ ප්‍රදේශය සිත් අලවන්නේ ය.

මෙහි දෙ ආකාර වූ සිත්කළු බව ලැබෙයි. එකල ගෝසිංග සාල වනය සියලු තැන මනාව සුපිපි මල් සුවඳින් සුවඳවත්ව පවතියි. තව ද මෙහි දෙවියන් සහිත ලෝකයෙහි අග්‍ර පුද්ගල වූ සම්මා සම්බුදුන් වහන්සේ තිස් දහසක් පමණ වූ සුප්‍රසිද්ධ භික්ෂූන් සමග වාසය කරති. ඒ නිසාය. **රමණීයං** ආවුසො ආනන්ද ගොසිංගාල වනං යන්න එය අරමුණුකොට කියා ඇත.

දොසිනා දොසින් පහ වූ, (අභ්‍රය), වළාකුලය, (මහිකා)ය, මීදුමය (ධූමය) දුමය, (රජස්ය) දූවිලි (රාහු) රාහු අසුරේන්ද්‍රයාය යන මේ සියලු උපක්ලේශයන්ගෙන් විරහිත වූයේ වෙයි. **සබ්බපාලි** ඵුල්ලා සියලු තන්හි පාලි ඵුල්ලයෝ (මලින් ගැවසුණු) මුල පටන් අග තෙක් නොපිපි තැනක් නැත. **දිබ්බා මඤ්ඤා සමපවනති** දිව මදාරා මල් කොබෝලීල, පරසතු, සඳුන් සුවඳ, හාත්පස හමයි. ශක්‍ර සුයාම, සන්තුසිත, සුනිම්මිත, පරනිම්මිත, සමහා බ්‍රහ්මයන් බැසගත්, තැනක් මෙන් සුවඳ හමයි.

කථං රූපෙන ආවුසො ආනන්දා ආනන්ද තෙරණුවෝ ඒ තෙරුන් පස්දෙනා අතුරෙන් නවකයෝය. කුමක් හෙයින් සැරියුත් තෙරණුවෝ

පළමුව ඔහුගෙන් විචාරත් ද, මමත්වය කළ හෙයිනි. ඒ ඒ ස්ථවිරවරු දෙදෙනා ඔවුනොවුන් අතිශය මිත්‍රයෝ වූහ. අනඳ තෙරුන්, කුල දරුවන් පැවිදි කරවා සැරියුත් තෙරුන් වෙත උපාධ්‍යාය කොට යැවූහ. සැරියුත් තෙරනුත් එසේම කළහ. මෙසේ ඔවුනොවුන් තමන්ගේ පාසිවුරු දී පැවිදි කරවා උපධ්‍යාය කොට ගන්වන ලද භික්ෂූහු පන්සියයක් වූහ. ආයුෂ්මත් ආනන්ද තෙරුන් යහපත් වූ සිවුරු ආදිය සැරියුත් හිමියන්ට දුන්හ. සැරියුත් තෙරුන් වහන්සේ මා විසින් කළයුතු වූ බුද්ධ උපස්ථානය ආනන්ද තෙරුන් විසින් කරන්නේ යයි අනඳ තෙරුන් වෙත ප්‍රසාදය ගෞරවය කළහ. ආනන්ද තෙරුන් ද බුද්ධශ්‍රාවකයන් අතුරෙන් අග්‍රයයි, ජ්‍යෙෂ්ඨතමයා යයි සැරියුත් තෙරුන් වෙත ප්‍රසාදය ඉපිදවූහ.

එක්තරා බමුණෙක් මෙසේ සිතීය. බුද්ධ රත්නයට ද සංඝ රත්නයට ද පූජා පවත්වති. ධර්මරත්නයට පූජා කරන්නේ නම්,

ගාමෙ වා යදිවා'රඤ්ඤ - නිනෙන වා යදිවා ථලෙ
තත්ථ අරහනෙනා විහරනති - තං භූමිං රාමෙණෙය්‍යකං

කෙපරිද්දෙකින් කෙසේ පූජා කළ යුතු වන්නේද, ඔහු භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මේ කරුණු විමසීය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. ඉදින් බමුණ, ඔබ ධර්මරත්නයට පුදනු කැමැත්තේ නම් එක බහුශ්‍රැතයකු පුදව, වහන්ස, බහුශ්‍රැතයකු වදාළ මැනව. භික්ෂු සංඝයාගෙන් එය විමසව. බමුණ භික්ෂූන් වෙත එළම බහුශ්‍රැතයකු කිව මැනවැයි යළි ඉල්ලීය. බමුණ, ආනන්ද සථවිරයෝය. ඔහු ආනන්ද ස්ථවිරයන්ට දහසක් අගනා සිවුරක් පූජා කළේය. ආනන්ද තෙරුන් එය භාග්‍යවතුන් වෙත ගියහ. භාග්‍යවතුන් වහන්සේ මේ සිවුර කොහෙන් ලැබුනේදැයි විමසීය. ස්වාමීනි! එක්තරා බමුණෙක් මට පැවරූ පූජා කළ මේ සිවුර සැරියුත් තෙරුන්ට පිරිනැමීමට මම අදහස් කරමි. භාග්‍යවතුන් වහන්සේ එය සුදුසු යයි යහපත් යයි වදාළහ. උන්වහන්සේ චාරිකාවේ නික්මුණාහ. ආපසු ආ දවසක දෙන්න. වහන්ස පැමිණීමට දහ දවසක් ඉක්මෙයි. ආනන්ද 'දස දිනක් පරමකොට අතිරේක චීවරයක් තබා ගැනීමට අනුදනිමි'යි ශික්ෂාපද පැනවීය. සැරියුත් තෙරුන් ද එවැනි මනවඩන දෙයක් ලබන්නේ ද එය ආනන්ද හිමියන්ට දෙයි. මේ ප්‍රියශීලී බව නිසා අනෙක් අයගෙන් අසන්නට පළමුවම ආනන්ද තෙරුන්ගෙන් විචාළේය.

තව ද මෙය අනුමති පුච්ඡාව නම්. කුඩාම කෙනාගෙන් පටන්ගෙන ඉහලට යමින් විචාරීම වේ. එහෙයින් තෙරුන්වහන්සේ මෙසේ සිතා පළමුව ආනන්දගෙන් අසන්නෙමි'යි ඇසීය. ආනන්දයෝ තමන්ගේ අදහස පැවසීමෙන් පසුව රේවත, අනුරුද්ධ, මහාකාශ්‍යප, මහා මුගලන් යන ශ්‍රාවකයන්ගෙන් අසන්නෙමි. මහා මුගලන් තෙරහු අවසනට තමන්ගේ මතය ප්‍රකාශ කරන්නාහුය. මෙසේ පස් තෙරවරුන්ගෙන්ම මම විචාරමි. මම ද මගේ වැටහීම ප්‍රකාශ කරමි. මෙතෙකින් මේ ධර්මදේශනාව මුදුන් පැමිණියා මහත් බවට පැමිණියා නො වන්නේ ය. ඉක්බිතිව අපි සියල්ලෝම දශබලයන් කරා එළඹ උන්වහන්සේ විචාරමි. මෙතෙකින් මේ ධර්මදේශනාව මුදුන් පැමිණියා වන්නේය.

යම්සේ ජනපදයෙක උපන් ආරාවුල ගම්ලද්දා (ග්‍රාමසේවක) කෙරේ පැමිණේද, ඔහුට නිශ්චය කරන්නට බැරිකල්හි ජනපද භෝජකයා (ප්‍රාදේශීය ලේකම්) වෙත පැමිණේ ද, ඔහුට නො හැකි කල්හි මහා විනිශ්චයාමාත්‍යයා (දිසාපති) කර පැමිණේද, ඔහුට නො හැකි වූ කල්හි සේනාපතියා (ඇමතියා) කරා පැමිණේද, ඔහුට නො හැකි වූ විට සේනාපති (ජනපති) කරා පැමිණේ ද, ඔහුට නො හැකි වූ කල්හි යුවරජු කරා (ශ්‍රේෂ්ඨාධිකරණය) ඔහුට නොහැකි කල්හි රජු කරා (අභියාචනාධිකරණය) කරා පැමිණේද, ඔහු විසින් විනිශ්චය කළ තැන් පටන් යුක්තිය ඔබ මොබ නො හැසිරේද, රජුගේ වචනයෙන් ම සන්සිඳේ ද, එපරිද්දෙන් මම පළමුව ආනන්දයන්ගෙන් විචාරමි. -පෙ- ඉක්බිති අපි සියල්ලෝ ම දශබලධාරීන් වෙත ගොස් විමසන්නෙමු. සර්වඥයන් වහන්සේ සර්වඥතාඥානයෙන් විමසන්නේ ය. මෙතෙකින් ධර්මදේශනාව මහත් බවට විපුල බවට සාර්ථක බවට පැමිණෙන්නේ ය. මෙසේ අනුමති පෘච්ඡාවෙන් විමසන්නේ පළමුව ආනන්ද තෙරුන්ගෙන් විමසූහ.

බහුසුතො - **හොති** මොහු විසින් බොහෝ අසන ලද්දේ වේ. නවංග ශාස්තෘශාසන, පාලි අනුසන්ධි, පූර්වාපර ගැළපීම්, වශයෙන් උගන්නා ලද්දේය යන අර්ථයි. **සුතධරො** ඇසීමට ආධාර වූයේ. යමෙකුගේ, එක් කණකින් ගෙන අනික් කනින් පළා යන්නේ ද, සිදුරු කළයක දිය මෙන් නො රඳන්නේ ද, පිරිස් මැද එක සූත්‍රයක් හෝ ජාතකයක් කියන්නට නුපුළුවන් වේද, මේ තෙමේ සුතධර නො වන්නේ ය. යළි යමකු විසින් උගන්නා ලද බුද්ධ වචනය උගත් කාලය හා සමාන වේද, දස වසක් හෝ විසිවසක් හැදෑරීම නො කරන්නහුගේ මතකය නො නැසේද මෙතෙම

සුතධර නම් වේ. සුත සනනිවයො ඇසීම මතකය සිතෙහි රැස්වූයේ යමෙකුගේ ඇසීම පෙට්ටියක තැන්පත් කළාක් වැනි වේද? කලෙක ගලක් කෙටූ රේඛාවක් මෙන් වූයේ ද, රන්බඳුනක වත්කළ සිංහ තෙල් මෙන් වූයේ ද, මේ සුත සනනිවය නම් වේ.

ධනා යනු දෙරණ ලද, ප්‍රගුණ කරන ලද, යමකු විසින් උගත් බුදු වදන් ධරණ ලද්දේ, ප්‍රගුණ කරන ලද්දේ, නිශ්චල වූයේ නො වේ. අසවල් සූත්‍රය හෝ ජාතකය කියවයි කී කල හදාරා සසඳ කරුණු ඉදිරිපත් කර, දැනගන්නෙමියි කියයි. යමෙකු විසින් දරණ ලද්ද ප්‍රගුණ කරන ලද්ද, භවාංග ශ්‍රෝතයක් මෙන් වෙයි. අසවල් සූත්‍රය හෝ ජාතකය කියවයි කී කල නගා එයම කියයි. ධනා යනු ඒ සඳහා කියන ලදී. වචසා පරිචිතා සූත්‍ර දසක, වර්ග දසක, පණ්ණාස දසක යනාදී වශයෙන් වචනයෙන් හදාරණ ලද්දේ ද, මනසානු පෙකඛිතා සිතින් විමසන ලද්දාහු යමකුගේ වචනයෙන් හදාළ බුද්ධ වචනය සිතින් සිතන්නහුට ඒ ඒ තන්හි ප්‍රකට වේද, මහත් පහනක් දල්වා සිටිය අයෙකුට රූපයක් මෙන් පෙනේද, ඒ සඳහා මෙය කීය. දිටඨියා සුපපටි විදධා අර්ථ වශයෙන් ද කරුණු වශයෙන් ද, මැනැවින් අවබෝධ කරන ලද,

පරිමණඩලෙහි පදබ්‍යඤ්ජනෙහි මෙහි පදයම අර්ථය ප්‍රකාශ කරන හෙයින් පද බ්‍යඤ්ජන නම්. එය අකුරු සම්පූර්ණ කර දශවිධ ව්‍යඤ්ජන බුද්ධීන් නො පිරිහෙළා කියන ලද්දේ පරිමණඩල නම් වේ. මෙබඳු වූ පද ව්‍යඤ්ජනයන්ගෙන් යන අර්ථයි. තව ද යම් මහණෙක් පිරිස්හි දහම් දෙසන්නේ සූත්‍රයක් හෝ ජාතකයක් හෝ බහා අනෙක් නිග්‍රහ ආරෝහනය කරන සූත්‍රයක් එළවාද, එයට උපමා කියාද, වස්තුවක් හෙළාද, මෙසේ මේ සූත්‍රය ගෙන වෙනත් සූත්‍රයක බහාලමින් එක් පසකින්ම පරිහරණය කරන්නේ, සුදුසු කාලය දැක නැගී සිටින්නේ ද, එහෙත් ගෙනහැර දැක්වූ සූත්‍රය නික්ඛිප්ත මාත්‍රයක්ම වේද, ඔහුගේ කථාව සම්පූර්ණයෙන් සාර්ථක වූයේ නොවේ. යම් භික්ෂුවක් සූත්‍රයක් හෝ ජාතකයක් හෝ බහා එක් පදයකුත් පිටත නො ගොස් පෙළ සමග, පෙළ පිළිබඳව ද අනුසන්ධිය පූර්වාපර ගැළපීම ද, නො ඉක්මවා ආචාර්යවරුන් දුන් මතවාදයෙහිම සිට, තෙලිතුඩකින් සිතුවම් අඳින්නකු මෙන් ගැඹුරු ඇලකින් ජලය හරින්නකු මෙන්, පිය නොවරද්දන, සෛන්ධව අජානෙය්‍යකු මෙන් යේද, ඔහුගේ දේශනය හාත්පසින් පරිපූර්ණ වූයේ වේ. මෙබඳු කථා සඳහා පරිමණඩලෙහි පදබ්‍යඤ්ජනොහි යනාදිය කියන ලදී.

අපප බදෙධහි මෙහි යම් භික්ෂුවක් දහම් දෙසන්නේ සූත්‍රයක් හෝ ජාතකයක් හෝ මාතෘකා කොට, ආරම්භ කළ තැන් පටන් ඉතා තුරිතවැ, ගිනිගානා දණ්ඩ ඇළලීම කරන්නෙකු සේ ද, උණු උණුවේ කෑමක් කන්නෙකු මෙන් ද, පෙළ හා අනුසන්ධි පූර්වාපර ගැළපීම් පිළිබඳව ගන්නා ලද්ද ගත්වනම ද, නො ගන්නා ලද්ද නොගත්වනම කොට, පරණලා අතර හැසිරෙන ගොයෙකු නැගිටුවන්නෙකු මෙන් ඒ ඒ තැන ගැටුමින් අවසන්කොට නැගිට යේද, නැවත යමෙක් දහම් දෙසන්නේ වරෙක බොහෝ හඬින් ද, වරෙක වේගයෙන් ද, වරෙක මන්දවද, වරෙක මහා හයියෙන් ද, වරෙක ඉතා හෙමින්ද දහම් දෙසන්නේද, යම්සේ ප්‍රේත ගින්න කලෙක දැල්වේද, කලෙක නිවේද, එසේ 'ප්‍රේතධර්ම කථික' නම් වේ. පිරිස නැගී සිටිනු කැමති කල්හි නැවත නැවත ආරම්භ කෙරේද, යමක් කියමින් ඒ ඒ තැන තද බවට යේද, තතනන්නෙකු මෙන්, හඬන්නෙකු මෙන්, දෙසයි ද, මේ සියල්ලන්ගේ කථා 'ප්‍රබන්ධ' වූයේ නම් වේ. නැවත යමෙක් සූත්‍රයක් මාතෘකා කොට ආචාර්යවරුන් දුන් (නීතියෙහි) සම්ප්‍රදායෙහිම සිට නො කැඩී ගලාබස්නා දිය දහරාවක් සේද, අහස්ගඟින් ගලා බස්නා ජලධාරාව මෙන් ද, නිරන්තරයෙන් නැවතීමක් නැතිව දේශනා කරයිද ඔහුගේ දේශනය 'අප්‍රබුද්ධා' වූවා නම් වේ. ඒ සඳහා අපපබදෙධහි යන්න කියන ලදී.

අනුසය සමුග්ඝාතායා යනු සප්ත අනුසයන් නැසීම පිණිස එවරූපෙන මෙබඳු වූ බහුශ්‍රැත වූ භික්ෂූන් නිසාම, සිවුරෙන් සිවුර හෝ පළඟින් පළඟ හෝ ගැටී හුන් භික්ෂූන් සියයකින්, දහසකින්, ගෝසිංග සාලවනය හොබනේය. මේ ක්‍රමය සියලු වාරයන්හි අනුගමනය කළයුතු.

පල සමවත ඔහුට ඇලුම් ඇත්තේනුයි **පටිසල්ලාණරාම** නම් වේ. පල සමවතෙහි රති ඇත්තේනුයි **පටිසල්ලාණ රත** නම් වේ. **සහසසං** **ලොකානං** දහසක් ලෝකධාතූන් ඒ එසේමැයි. මෙපමණක් තෙරුන්ගේ නිත්‍ය ආසේවනය (ස්ථිර පදිංචිය) වෙයි. ආවර්ජන ප්‍රතිබද්ධ වෙයි. එහෙත් තෙරුන්වහන්සේ කැමැත්තෙන්ම නොයෙක් සියදහසක් සක්වළ බලත්මැයි, **උපරිමපාසාද වරගතො** සත්මහල් හෝ නවමහල් පහයක් මත්තට ගියේ **සහසසං නෙමි මණඩලානං ඔලොකෙය්‍ය** සහපිරිවෙන්හි නැබින් පිහිටියා වූ නිම් වළල්ලෙන් නිම් වළල්ල හැපී සිටියා වූ, නෙමි මණ්ඩල දහසක් වාකවුළුව විවරකොට බලන්නේ ද, ඔහට සක් නැබ ද, ගරාදි ද අතර නිම්වළලු ද ප්‍රකට වූවාහු වෙත්. **එවමෙව ඛො ආවුසො** එපරිද්දෙන් ම

මේ දිවැස් ඇති තෙරුන් ද මිනිස් ඇසින් ඉක්ම සිටි දිවැසින් දහසක් ලෝක ධාතු බලයි. ප්‍රාසාදයේ සිටි පුරුෂයාට සක්නැබ මෙන් ඒ තෙරුන්ට සක්වළ දහසෙහි මහමෙර දහසක් ප්‍රකට වෙයි. අරයන් මෙන් දීපයෝ ප්‍රකට වෙත්. අර අතර මෙන් දිවයින්වල සිටි මිනිස්සු ප්‍රකට වෙති. අර අතර මෙන් දිවයින්වල සිටි මිනිස්සු ප්‍රකට වෙති. නිම්වළලු මෙන් සක්වළගල් ප්‍රකට වෙති.

ආරඤ්ඤකෝ සමාදන් වූ ධුතාංග ඇත්තේද, අනෙක් පදයන්හිද මෙම ක්‍රමයමයි. **නොච සංසාදෙනති** නො ගිල්වති. ඒ එසේමැයි. හේතු සහිත කොට කරුණු සහිත කොට පැන විචාරීමට ද විසඳීමට ද නො හැකි වන්නේ යටපත් කෙරෙයි නම්, එසේ නො කරති යන අර්ථයි. **පවතතනී** හොති ගලන ගංගාවක් මෙන් පවතී. **යාය විහාර සමපතතියා** යම් ලෞකික වූ හෝ ලෝකෝත්තර වූ හෝ විහාර සම්පත්තියකින්.

සාධු සාධු සාරිපුතතා මේ සාධුකාරය ආනන්ද හිමියන්ට දෙන ලදී. එහෙත් භාග්‍යවතුන් වහන්සේ සැරියුත් තෙරුන් සමග කථාබහ කරති. සියලු තන්හි මේ ක්‍රමයමයි. **යථා තං ආනඤ්ඤා චාති** යළි මනාකොට පවසන්නෙක් යම් සේ පවසන්නේ ද, ආනන්දයන් විසින් එසේ ප්‍රකාශ කරන ලදී. තමන්ට තරම් වූවක් ම අදහසට ගැලපෙන්නක්ම පැවසීය යන අර්ථයි. තෙරුන් වහන්සේ ද තමාත් බහුශ්‍රැතයහ. අදහස ද එසේම විය. ශාසනයෙහි සබ්‍රහ්මචාරීහු බහුශ්‍රැතයෝ වන්නාහු නම් ඉතා යෙහෙකැයි කීය.

කුමක් හෙයින්ද, යම් හෙයකින් බහුශ්‍රැතයන්ට කැප අකැප, සාවද්‍ය නිරවද්‍ය, ගරුක ලහුක, සතෙකිච්ඡ අතෙකිච්ඡ ආදිය ප්‍රකට වේද, තව ද බහුශ්‍රැත තෙමේ උගත් බුදුදහම මෙනෙහි කොට මෙතැන ශීලය, මෙතැන සමාධිය, මෙහි විදර්ශනාව, මෙහි මාර්ගඵල නිර්වාණය යයි මෙනෙහිකොට ශීලය ආ තැන්හී සිල් පුරා සමාධිය වැඩිය යුතු තැන සමවත් පුරා, විදර්ශනා වැඩිය යුතු විට විදසුන් වඩා, මාර්ගය වඩා ඵලය ප්‍රත්‍යක්ෂ කෙරේද, එහෙයින් තෙරුන්ට මෙසේ අදහස් විය. සබ්‍රහ්මචාරීහු එක් නිකායක් හෝ දෙකක් හෝ තුනක් හෝ සතරක් හෝ නිකාය පහම හෝ උගෙන ආවර්ජනය කරමින් සීලාදිය පිරිය යුතු තන්හි සිල් ආදිය පුරමින් අනුපිළිවෙළින් මාර්ගඵල නිර්වාණය සාක්ෂාත් කළ යුත්තේය. අනෙක් තැන්හිද මෙම ක්‍රමයමැයි.

ආයුෂ්මත් රේවතයන් වහන්සේ ධ්‍යානයෙහි අදහස් ඇත්තේ, ධ්‍යානය පිළිබඳව බලවත් කැමැත්ත ඇත්තේ, උන්වහන්සේ මෙසේ සිත් වෙයි. සබ්‍රහ්මචාරීහූ එකලාව හිඳ කිසිණු පිරියම්කොට අටසමවත් නිපදවා ධ්‍යානයන්ට පාදක වූ විදසුන් වඩා ලොව්තුරු දහම් පසක් කරන්නාහු නම් ඉතා යහපත්ය කියායි. එහෙයින් මෙසේ පැවසීය.

ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේ දිවැස් ඇති සේක. උන්වහන්සේ මෙසේ සිත්විය. 'සබ්‍රහ්මචාරීහූ ආලෝකය වඩා දිවැසින් නොයෙක් සක්වල මිය යන්නා වූද, උපදින්නා වූද සත්ත්වයන් දැක සසර බියෙන් සිත සංවේග උපදවා, විදසුන් වඩා ලොව්තුරු දහම් පසක් කරන්නාහු නම් ඉතා යහපත්ය. එහෙයින් මෙසේ පැවසීය.

ආයුෂ්මත් මහා කාශ්‍යපයන් වහන්සේ ධුතවාදීයහ. උන්වහන්සේ මෙසේ සිතීය. 'සබ්‍රහ්මචාරීහූ ධුතවාදීන් වී ධුතංගානුභාවයෙන් ප්‍රත්‍යය තෘෂ්ණාව හකුළුවා අනන්‍ය වූත් නන්වැදෑරුම් වූත් කෙලෙස් ප්‍රහීණ කොට විදසුන්.වඩා ලොව්තුරු දහම් පසක් කරන්නාහු නම් එය යහපත් වේ.

ආයුෂ්මත් මුගලන් මහතෙරුන් වහන්සේ සමාධි පාරමිතාවගේ මුදුනටම පැමිණියහ. සියුම් වූ චිත්තාන්තරය, ස්කන්ධාන්තරය, ධාත්වන්තරය, ආයතනාන්තරය, ධ්‍යාන වක්‍රාන්තිය, ආරම්මණ වක්‍රාන්තිය, අංගසකන්තය, ආරම්මණ සංකන්තය, එකතෝ වඩිඨනය, උභතෝ වඩිඨනය, මේ කරුණු අභිධර්මය හදාළ ධර්මකථිකයාටම අවබෝධ වෙයි. යම්හෙයකින් අභිධර්මය නො හදාළ තැනැත්තේ දහම් දෙසන්නේ මේ ස්වවාදය, මේ පරවාදයයි නො දනී ද, ස්ව වාදය දක්වන්නෙමියි පරවාදය දක්වන්නේ ද පරවාදය දක්වන්නේ යයි ස්වවාදය දක්වන්නේ ද, ධර්මාන්තරය විසංවාදනය කෙරේද, ආභිධම්මික තෙම සකවාදය සකවාද නියමයෙන්ම, පරවාදය පරවාද නියමයෙන්ම, ධර්මාන්තරය විසංවාදය නො කෙරේද, එහෙයින්ම තෙරුන්ට මේ සිත විය. සබ්‍රහ්මචාරීහූ ආභිධර්මිකයෝ ව සියුම් තැන්හි නුවණ විහිදා විදසුන් වඩා ලොව්තුරු දහම් පසක් කරන්නේ නම් ඉතා යහපත් යයි ප්‍රකාශ කළහ.

ආයුෂ්මත් සැරියුත් මහතෙරුන් වහන්සේ ප්‍රඥා පාරමිතාවෙහි මුදුනටම පැමිණියහ. තව ද නුවණැත්තේම සිත තමන් වශයෙහි පවත්වන්නට හැකිවෙයි. දුෂ්ප්‍රාඥයාට අපහසු වෙයි. යම්හෙයකින් දුශ්ප්‍රාඥ

තෙමේ උපනුපන් සිත් අනුවම කටයුතු කරමින්, යළි ඔබනොබ ඇලී කිප දිනකින්ම ගිහිබවට පැමිණු වැරදි ආකල්පයන්ට පැමිණේද, එහෙයින් තෙරුන් මෙසේ අදහස් කළේය. 'සබ්‍රහ්මචාරීහු සිත්වලටම වසඟ නොවී, සිත දමනය කර තමාගේ වශයෙහි පවත්වා ඔහුගේ සියලු විරුද්ධ සේවන, ප්‍රතිපක්ෂග්‍රාහ, විෂ්ඵන්දනයන් බිඳ මදකුත් පිටත නික්මෙන්නට නොදෙමින්, විදසුන් වඩා ලොව්තුරු දහම් පසක් කරන්නේ නම් ඉතා යහපත් යයි යන අදහස ප්‍රකාශ කළේය.

සබ්බසං වො සාරිපුත්ත - **සුභාසිතං පරියායෙන** ශාරිපුත්‍රයෙනි, යම්හෙයකින් සඟමොක් පිළිබඳව නම් බහුශ්‍රැත භික්ෂූන් විසින් ද සිදුකළ යුතු කරුණු ඇත්ද, ධ්‍යානයෙහි ඇලුණාහු විසිනුදු, දිවැස් ඇතියන් විසිනුදු, ධුතවාදීන් විසිනුදු, ආභිධම්මිකයන් විසිනුදු, අචිත්තවසිකයන් විසිනුදු, හොබනට කරුණු ඇත්ද, එහෙයින් ඔබලා සියල්ලන්ගේම අදහස් වචන සුභාෂිතයහ. දුර්භාසිත නොවන්නේමය. පරියායෙන් ද ඒ කරුණු සුභාෂිතමැයි. මාගේ වචනය ද අසවු. **න තාවාහං ඉමං පල්ලංකං භින්දිසසාමි** ඒ තාක් මම මේ සිව්රඟ වීරිය අධිෂ්ඨානයෙන් බැඳි පල්ලංකය නො බිඳින්නෙමි. නො මුදන්නෙමි යන අර්ථයි.

මේ වනාහි භාග්‍යවත්හු නුවණ මෝරාගිය කල රජසිරි සැප හැර කරන ලද මහාභිනිෂ්ක්‍රමණයෙන් පසුව පිළිවෙළින් බෝමැඩට නැඟී චතුරංග සමන්නාගත වීර්යය ඉටා යම් අපරාජිත බද්ධ පරියංකයක් බැඳ අධිෂ්ඨාන ඇතිව වැඩහුන්නාහු තුන්මරුන්ගේ බල පරාක්‍රමයන් බිඳ අලුයම් කල දසදහසක් ලෝකධාතුව කම්පා කරවමින් සර්වඥතා ඥානය ප්‍රතිවේධ කළ සේක් ද, ඒ තමන් වහන්සේගේ මහ බෝ පලඟ සඳහා මෙසේ වදාළහ.

තව ද පශ්චිම ජනතාවට අනුකම්පා කරමින් ප්‍රතිපත්තිගරුක වූ පෘථග්ජන කල්‍යාණයා දක්වමින් මෙසේ වදාළහ. භාග්‍යවතුන් වහන්සේ අනාගතයෙහි මෙවැනි අදහස් ඇති කුලපුත්‍රයෝ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරන්නේ යයි දක්නා සේක. භාග්‍යවතුන් වහන්සේ මහා ගෝසිංග සූත්‍රය වදාරණ සේක්, **ඉධ සාරිපුත්ත භික්ඛු පචඡා භත්තං -පෙ- එවරූපෙන ඛො සාරිපුත්ත භික්ඛුනා ගොසිංගසාල වනං සොභෙය්‍යාති** යි වදාළහ. අපි භාග්‍යවතුන් වහන්සේගේ අදහස දැනගන්නෙමුයි, පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණාහු සිව්රඟ වීර්යය ඉටා දෘඪ සමාන ඇතිව රහත් බවට

නො පැමිණ මේ පළඟ නො බිඳින්නෙමැයි මහණදම් කළ යුතු යයි සිතන්නාහුය. ඔව්හූ මෙසේ පිළිපන්නාහූ කීප දිනකින්ම ජාති ජරා මරණ කෙළවර කරන්නාහු යයි මේ පශ්චිම ජනතාවට අනුකම්පා කරමින් ප්‍රතිපත්ති ගරුක පෘථග්ජනයා සඳහා මෙසේ වදාළහ.

එවරූපෙන ඛො සාරිපුතත, භිකඛුනා ගොසිංගා සාලවනං සොභෙය්‍යාති ශාරිපුත්‍රය, මෙබඳු වූ භික්ෂූන් නිසා වචනයේ මුළුමහත් අරුතින්ම ගෝසිංග සාලවනය හොබනේයයි අනුසන්ධි ලෙසින් දේශනාව නිමවා වදාළ සේක.

ගෝසිංග සාලවන සූත්‍ර වර්ණනාව නිමියේය.

1-4-3

එවමෙමසුතං යනු මහා ගෝපාලක සූත්‍රයයි. එහි කථා තුනක් වෙයි. ඒකනාළිකාය, චතුරසස්‍රය, නිසිනනවත්තිකා යනුවෙනි. එහි පෙළ කියා එකකි. පදවල අරුත් කීම ඒකනාළිකා නම්. අපණ්ඩිත ගොපල්ලා දක්වා අපණ්ඩිත මහණ දක්වා, පණ්ඩිත ගොපල්ලා දක්වා, පණ්ඩිත මහණ දක්වා යන සතර ගැන කීම චතුරස්සා නම්. අපණ්ඩිත ගොපල්ලා දක්වා කෙළවරට යාමය. අපණ්ඩිත මහණ දක්වා කෙළවරට යාම, පණ්ඩිත ගොපල්ලා දක්වා කෙළවරට යාම, පණ්ඩිත මහණ දක්වා කෙළවරට යාම නිසින්න වත්තිකා නම් වේ. මෙය සියළු ආචර්යවරයන් විසින් පවත්වාගෙන එන ලද්දේය.

එකාදසහි භිකඛවෙ අංගෙහි එකොළොස් අගුණ කොටසින් ගොගණං ගව පට්ටිය **පරිහරිතුං** පරිහරණය කරන්නට, පවත්වාගෙන එන්නට, **ඵාති කාතුං** වැඩීමට පමුණුවන්නට

ඉධ මේ ලෝකයෙහි, **න රූපඤ්ඤූ** හොති සංඛ්‍යා වශයෙන් හෝ වර්ණ වශයෙන් හෝ ස්වරූපය නො දනී නම්, තම ගවයන්ගේ සියයෙක හෝ දහසෙක වශයෙන් ගණන නො දනී. හෙතෙම දෙනුන් පැහැරගත් කල්හි හෝ පලාගිය කල්හි හෝ ගවපට්ටිය ගැන අද මෙතෙක් ගවයන් දක්නට නැතැයි ගම් දෙක අතර හෝ කැලයෙහි හෝ නො සොයයි. අනුන්ගේ දෙනුන් තමන්ගේ ගව සමූහයට පිවිසි කල ද, ගව පට්ටිය ගැන මෙතෙක් දෙනුන් අපගේ නොවෙතෙයි කෝටුවෙන් තලා බැහැර නො කරයි. ඔහුගේ නැති වූ ගොනුන් නැති වූවාමය. අනුන්ගේ දෙනුන් ගෙන හැසිරෙයි. ගව හිමියන් මෙය දැක මෙතෙක් කල් අපේ දෙනුන්ගෙන් කිරි ගත්තේ යයි තර්ජනය කොට තම දෙනුන් ගෙන යති. ඔහුගේ ගව පට්ටිය පිරිහෙයි. පස්ගෝරස පරිභෝගය නවතියි. වර්ණ හෙයින් නොදනී නම්, මෙතෙක් දෙන්නු සුදුය. මෙතෙක් දෙන්නු රතුය. මෙතෙක් දෙන්නු කළුය. මෙතෙක් දෙන්නු පළොල් පාටය. නොදනී. හෙතෙම දෙනුන් පැහැර ගත් කල හෝ පැන ගිය කල හෝ නොදනී. -පෙ- පස්ගෝරස පරිභෝගයෙන් ද ඉවත් වෙයි.

න ලකඛණ කුසලෝ ගවයන්ගේ ශරීරයෙහි දුනු - අඩයටි ත්‍රිශූලාදී හංවඩු ගැසූ ලක්ෂණ නො දනී. හෙතෙම දෙනුන් පැහැර ගත් කල්හි හෝ පලාගිය කල්හි අසවල් අසවල් ලකුණු ඇති දෙනුන් නො දක්නා ලැබෙතියි -පෙ- පස්ගෝරස පරිභෝගයෙන් ද වළකියි.

න ආසාටිකං සාටෙතාති ගවයන්ගේ කුර දණිස් ආදිය වණ වෙයි. එහි නිලමැස්සෝ ඉහඳ තබති. ඔවුන්ට 'ආසාටිකා' නම්ය. ඒවා දණ්ඩකින් ඉවත්කොට බෙහෙත් දැමිය යුතු වෙයි. බාල ගොපල්ලෝ එසේ නොකරති. 'ආසාටිකං සාටෙතා' යන්න එහෙයින් කියන ලදී. ඔහුගේ ගවයන්ගේ වණ දියුණුවෙත්. ගැඹුරු වෙත්. පණුවෝ කුසට පිවිසෙති. දෙන්නු ගිලන් බවින් මඩනා ලද්දාහු යැපෙන පමණ තණ කන්නට හෝ, දිය බොන්නට හෝ නොහැකි වෙති. එවිට දෙනුන්ගේ කිරි සිඳෙයි. ගොනුන්ගේ ශක්තිය පිරිහෙයි. දෙනුන් හා ගොනුන් මරණයට පත්වෙති. මේ ආකාරයෙන් ගවපට්ටිය පිරිහේ. පස්ගෝරස ද නැති වේ.

න වණං පටිච්ඡාදෙතා හොති යටකී පරිදි ගවයන්ගේ හටගත් වණය බෙහෙත් යොදා රෙදිපටිවලින් හෝ ගස් පට්ටාවලින් හෝ බැඳිය යුතුය. බාල ගොපල්ලෝ එසේ නො කරති. ගවයන්ගේ වණවලින් ඕජාව

වැගිරෙති. ගවයෝ ඔවුනොවුන් ගැටෙති. එයින් අනෙක් ගවයන්ගේ ද වණ හටගනිත්. මෙසේ ගවයෝ ගිලන් බවින් මඩනා ලද්දාහු අවශ්‍ය තරම් තණ නො කති. දිය නො බොති. -පෙ- පස්ගෝරසද නැති වේ.

න ධූමං කතතා හොති ගවගාලෙහි මැසි මදුරු කෘමි ආදීන් උපන් කල ගව සමූහයා ගොවුද පිවිසි කල්හි ඒ ඒ තැන දුම් ඇල්ලිය යුතු වෙයි. අපණ්ඩිත ගොපල්ලෝ එසේ නො කරති. ගව සමූහයා මුළු රෑ මැසි මදුරුවන් විසින් විඳිනා ලදුව නිදි නො ලැබ දෙවන දවස්හී රුක් මුල් ආදී තැන් තැන්වල නිදයි. යැපෙන තරම් තණ කන්නට හෝ -පෙ- පස්ගෝරසද නො ලබයි.

න තිත්‍ථං ජානාති තොටුපල සමයයි හෝ විෂම යයි හෝ ගැඹුරුද නොගැඹුරුදැයි නො දන්නේ නොතොටින් ගවයන් දියට බස්වයි. නො තොටෙහි ගල් ආදියේ හැපීමෙන් ගවයන්ගේ කකුල් තුවාල වෙති. ගැඹුරු තොටින් බැස්සවූ විට කිඹුලන් ආදීන්ගේ ග්‍රහණයට යටත් වේ. අද මෙතෙක් දෙනුන් නටුවාහ. අද මෙතෙක් යයි කියයුතු බවට පැමිණේ. මෙසේ ඔහුගේ ගව සම්පත පිරිහෙයි. පස්ගෝරස නොලැබී යයි.

න පීතං ජානාති යම්සේ ගොපල්ලා විසින් මේ දෙන දිය බොන ලදී. මේ දෙන නො බොන ලදී. මේ දෙන පැන් තොටේ ඉඩ පහසුකම් ලද්දීය. මේ දෙන නො ලද්දීය, ආදී වශයෙන් පානය කළ බැව් දතයුතු වේද, එහෙත් මෙතෙම දවල් කාලයේ වනයෙහි ගව සමූහයා රැක දිය පොවන්නට ගඟකට හෝ විලකට ගෙන යයි. එහි දී ශක්ති සම්පන්න ගොන්නු, බලවත් දෙන්නු, දුර්වල වූ ද, මහළු වූ ද ගොනුන්ට අංවලින් හෝ ඉලවලින් හෝ පැහැර, තමන්ට ඉඩකඩ සලසාගෙන දියේ ගැඹුරට පිවිස දිය බොති. අනෙක් දුබලයෝ අවකාශ නොලැබ ඉවුරෙහිම සිට මඩ සහිත දිය බොති. සමහරු නොබීවාහුම වෙති. එකල ඒ අපණ්ඩිත ගොපල්ලා පහර දෙමින් නැවත වනලැහැබට දක්කාගෙන යයි. ඔවුන් අතරෙහි දිය නොබී සිටින්නෝ පිපාසයෙන් වියලෙන නිසා ඇති පමණ තණ නො කති. මේ නිසා දෙනුන්ගේ කිරි සිඳෙයි. ගොනුන්ගේ ශක්තිය පිරිහෙයි.

නවීථිං ජානාති මේ මග සමය මේ මග විෂමය. සැක සහිතය. බිය සහිතය යයි නො දනී. හේ සම වූ බිය රහිත වූ මග අත්හැර විෂම මගට

පිවිසෙයි. එහිදී ගවයෝ සිංහ ව්‍යාඝ්‍රාදීන්ගේ ගඳින් හෝ සොර උවදුරුවලින් හෝ මඩනා ලද්දාහු තැති ගත් මුවන් සේ ගෙල ඔසවා නගා සිටිති. යැපෙන පමණ තණ නො කති. දිය නො බොති. දෙනුන්ගේ කිරි සිඳෙති. පස්ගෝරස නොලැබී යයි.

න ගොචර කුසලෝ හොති ගොපල්ලා ගෝචරයෙහි දක්ෂයකු විය යුතුය. පස්දිනක් අතර වූ වාරය හෝ හය දිනක් අතර වූ වාරය හෝ දතයුතුය. එක් ප්‍රදේශයක ගව සමූහයා හසුරුවා දෙවන දවස්හි එහි හැසිරවිය යුතු නොවේ. මහත් ගව සමූහයක් දිනක් හැසිරුණු ප්‍රදේශයේ තණ ඉතිරි නොවේ. බෙර ඇසක් මෙන් ශුද්ධ වේ. ජලය කැළඹේ. එහෙයින් පස්වෙනි දින හෝ සත්වෙනි දින නැවත එහි හසුරුවන්නට සුදුසුය. මෙතෙක් දින තණ නැවත වැඩෙයි. ජලය පෑදෙයි. එහෙත් ගොපල්ලා මේ පස්දින-සත්දින වාර නො දන්නේ නම් දිනපතා එහිම රැඳේ. එහිදී ඔහුගේ ගව සමූහයට නිල් තණ නො ලැබේ. පිරිසිදු දිය බොන්නට නො ලැබේ. තනවල කිරි සිඳෙයි. ගව සමූහය පිරිහෙයි. පස්ගෝරස නො ලැබෙයි.

අනවසෙසදොහි ච හොති නුවණැති ගොපල්ලා විසින් යම් පමණකින් වසුපැටියාගේ ලේ මස් පිහිටාද, ඒ සඳහා තන එකක් දෙකක් තබා ඉතිරි ඒවායින් දොවන්නෙක් විය යුතුය. අනුවණ ගොපල්ලා වසුපැටියාට කිරි ඉතිරි නො කොටම දොවයි. කිරි බොන වස්සා කිරි පිපාසෙන් පෙළෙයි. සිටින්නට නො හැකි වූයේ කම්පා වෙමින් මවු හමුවෙහි වැටී කළුරිය කරයි. මව්තොමෝ පැටවා දැක මගේ පුතා තම මවගේ පවා කිරි බොන්නට නො ලැබ ගියා යයි පුත්‍ර ශෝකයෙන් යැපෙන පමණ තණ කන්නට නො ලබයි. දිය නො බොයි. තණවල කිරි සිඳෙයි. මෙසේ ගව සමූහයා පිරිහෙයි. පස්ගෝරස ලැබීමෙන් වැළකෙයි.

ගවයන්ගේ පිතෘස්ථානය කෙරෙත්නුයි **ගො පිතරො** නම් වේ. (ගව පියා) ගවයන් පමුණුවති. කැමති සේ ගෙනයත්නුයි **ගොපරිණායකා** ගව පරිණායක වෙයි. **න අතිරෙක පූජාය** ඒ එසේමැයි. නුවණැති ගොපල්ලා මෙබඳු ගවයන් අතිරේක පූජාවෙන් පුදයි. ප්‍රණීත වූ ආහාර දෙයි. ගඳ පසඟුලින් සරසයි. මාලා පළඳවයි. අංවල රන් රිදී කොපු දමයි. රෑ පහන් දල්වා සෙල් වියන් යට හොවයි. එහෙත් අපණ්ඩිත ගොපල්ලා මේ එක සත්කාරයකුත් නො කරයි. වෘෂභයෝ (නායක ගොන්නු) අතිරේක සත්කාර

නො ලබන්නාහු ගව සමූහය නො රකියි. උවදුරු නො වලකත්. මෙසේ ඔහුගේ ගව සමූහය පිරිහෙයි. පස්ගෝරස ලැබීමෙන් වළකියි.

ඉධ යනු මේ ශාසනයෙහි **න රූපඤ්ඤූ හොති** යනු **චතුන්නං මහාභූතානි චතුන්නංච මහා භූතානං උපාදාය රූපං** යනුවෙන් වදාළ රූපය ගණන වශයෙන් හෝ සමුත්ථාන වශයෙන් හෝ දෙ ආකාරයෙන්ම නො දනී. ගණන වශයෙන් නො දනී නම්, **'චකඛායතනං, සොත-ඝාන-ජිවහා-කාය-රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බායතනං, ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං, ජීවිතින්ද්‍රියං, කාය විඤ්ඤත්ති, වචී විඤ්ඤත්ති, ආකාසධාතු ආපෝ ධාතු රූපසස ලහුතා මුදිතා කම්මඤ්ඤතා, උපචයෝ සන්තති, ජරතා රූපසස අනිච්චතා කබලිංකාරෝ ආහාරෝ'** මෙසේ පෙළෙහි ආවේ වී නමුත් පස්විසි රූප කොට්ඨාශයෝ යයි නො දනිති. යම්සේ අපණ්ඩිත ගොපල්ලා ගණන් වශයෙන් ගවයන්ගේ ස්වරූපය නො දනීද, එසේම මේ භික්ෂුව ගණන් වශයෙන් රූපය නො දන්නේ, රූපය පරිග්‍රහණය (දැඩිව ගෙන) කොට අරූපය වවත්ථාපනය (ව්‍යවස්ථාපනය) කොට, රූපාරූප පරිග්‍රහණය කොට, ප්‍රත්‍යය සලකා ලක්ෂණයට නගා කම්ටහන් මුදුන් පමුණුවන්ට නොහැකි වෙයි. හෙතෙම යම් පරිද්දෙකින් ඒ ගොපල්ලාගේ ගව සමූහය නො වැඩේද, එපරිද්දෙන් මේ ශාසනයෙහි සීල, සමාධි, විපස්සනා, මාර්ගඵල, නිර්වාණයයන් නො වැඩේ. යළි යම් සේ ඒ ගොපල්ලා පස්ගෝරසයට අහිමි වේද, එපරිද්දෙන් අශෛක්ෂ වූ සීලස්කන්ධයෙන් අශෛක්ෂ වූ සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුත්ති ඤාණ දර්ශන ස්කන්ධ යන පංච ධර්මස්කන්ධයන්ගෙන් අහිමි වේ. සමුත්ථාන වශයෙන් නො දනී නම් මෙතෙක් රූපය ඒකසමුට්ඨානය, මෙතෙක් ද්විසමුට්ඨානය මෙතෙක් තිසමුට්ඨානය, මෙතෙක් චතුසමුට්ඨානය මෙතෙක් කොයිනුත් නූපදී යයි නොදනී. යම්සේ ඒ අපණ්ඩිත ගොපල්ලා වර්ණ වශයෙන් ගවයින්ගේ ස්වරූපය නො දනී ද, එබඳු උපමා ඇති මේ ශ්‍රමණයා සමුත්ථාන හෙයින් රූපය නො දන්නේ රූපය පරිග්‍රහණය කොට අරූපය වවස්ථාන කොට -පෙ- කම්ටහන් මුදුන් පැමිණීමට නො හැකි වෙයි.

න ලකඛණ කුසලෝ හොති යනු **කම්ම ලකඛණෝ බාලෝ කම්ම ලකඛණෝ පණ්ඩිතෝ** මෙසේ වදාළ හෙයින් කුසලා කුසල කර්මය පණ්ඩිත බාල ලක්ෂණයයි නො දනී. හේ එසේ නො දන්නේ බාලයන් හැර පණ්ඩිතයන් සේවනය නො කරයි. එසේම කැප නො කැප කුශලා කුශලය වැරදි සහිතද, නිවැරදි ද, ගරුක ලහුකය. සතේකිච්ඡ, අතේකිච්ඡ

භාවය යන කාරණා කාරණ නො දනී. එය නොදන්නා නිසා කමටහන් ගෙන වඩන්නට නොහැකි වෙයි. ඔහු යම් සේ ගොපල්ලාගේ ගව සමූහය නො වැඩේ ද, එපරිද්දෙන් මේ සසුන්හි ඉහත සඳහන් ශීලාදීන්ගෙන් නො වැඩේ. පස්ගෝරසයෙන් ගොපල්ලා පිරිහෙන්නාක් මෙන්, ශ්‍රමණයා පංච ධර්මස්න්ධයන්ගෙන් පිරිහෙයි.

න ආසාටිකං සාටෙකා හොති යනු උපපනනං කාම විතකකං යනුවෙන් වදාළ කාම විතර්කයෝ දුරු නො කෙරෙයි. හේ මේ අකුශල විතර්ක සංඛ්‍යාත ඉහඳය බැහැර නොකොට විතර්කයන්ට වසඟව හැසිරෙන්නේ කමටහන් ගෙන වඩන්න නොහැකි වෙයි. හේ යම්සේ ගොපල්ලාගේ -පෙ- පරිබාහිර වූයේ වෙයි.

නවණං පටිච්ඡාදෙතා හොති යනු චකඛුනා රූපං දිසවා නිමිත්තගගාහී හොති ආදී වශයෙන් සියලු අරමුණුවල නිමිත්ත ගන්නේ, යම්සේ ගොපල්ලා වණය නො වසාද, එලෙසින්ම සංවරය සම්පාදනය නො කරයි. හෙතෙම අසංවර වූ විවෘත වූ චක්ෂුරාදී දොරටු ඇතිව හැසිරෙන්නේ කමටහන් ගෙන වඩන්නට නොහැකි වෙයි. -පෙ- පරිබාහිර වූයේ වේ.

න ධූමං කතතා හොති ඒ ගොපලු දුම මෙන් ධර්මදේශනා නමැති දුම නො කෙරෙයි. ධර්මකථාව හෝ (ස්වර බිඳීම) සරභණ්‍යය හෝ සමීපයේ සිට කරන (උපනිසිනතක) කථාව හෝ අනුමෝදනාව හෝ නො කරයි. එහෙයින් මිනිස්සු ඔහු බහුශ්‍රැතයෙක් යයි නො දනී. ඔව්හූ ගුණා ගුණ නො දන්නේ සිව්පසයෙන් උපස්ථාන නො කරයි. හෙතෙම ප්‍රත්‍යයෙන් ක්ලාන්ත වන්නේ බුද්ධ වචනය සඞ්ඝායනා කරන්නට, වත් පිළිවෙත් පුරන්නට, කමටහන් ගෙන වඩන්නට අපොහොසත් වෙයි. -පෙ- ශ්‍රමණ ධර්මයෙන් පිරිහෙයි.

න තිත්ථං ජානාති තීර්ථ වූ බහුශ්‍රැත භික්ෂූන් කරා නො එළඹෙයි. එසේ නො එළඹෙන්නේ ස්වාමීනි, මේ ව්‍යඤ්ජනය කෙසේ නැගිය යුතුද, මේ භාෂිතයේ අර්ථ කවරේද? මෙතැන පෙළෙහි කුමක් කියන්නේද, මෙතැන්හි අර්ථයෙන් කුමක් පැහැදිලි කරයිද, මේ අන්දමින් නො විමසන්නේ ය. ප්‍රශ්න නො කෙරෙයි. නො දන්වයි යන අර්ථයි. මෙසේ නො විචාරන්නා වූ ඔහුට සැඟවුණා වූ අර්ථ කියා නො දෙයි.

බෙදා නො දක්වති. ගැඹුරු අර්ථ ලිහිල් පහසු නො කරති. අප්‍රකට වූ අර්ථය ප්‍රකට නො කරති. **අනෙක විහිතෙසුව කංඛායානියෙසු ධම්මෙසු** යනු නන් වැදෑරුම් සැක තැන් අතුරෙන් එක සැකයක්වත් දුරු නො කරයි. සැක සහිත කරුණුම 'කංඛායානීය ධර්ම' නම් වේ. ඒවා අතුරෙන් එක සැකයකුත් බැහැර නො කරති. හෙතෙම එසේ බහුශ්‍රැත සංඛ්‍යාත තොටුපල කරා නො එළඹ සැක සහිත වූයේ කටමහන් වඩන්නට නො හැකි වෙයි. තව ද යම් සේ ඒ ගොපල්ලා සුදුසු කොට නො දන්නේද එපරිද්දෙන් ම මේ ශ්‍රමණයා ද දහම් කොට නො දනී. නො දන්නා හෙයින් අකාරණයෙහි ප්‍රශ්න විචාරයි. ආභිධර්මිකයකු කරා එළඹ කැප අකැප දේ විමසයි. විනයධරයකු කරා පැමිණ රූපාරූප පරිච්ඡේද විස්තර විමසයි. අකාරණයෙහි විමසන නිසා පිළිතුරු කියන්නට නොහැකි වෙයි. හේ තමන් සැක සහිත වූයේ කමටහන් වඩන්නට නො හැකි වෙයි.

න පීතං ජානාති ඒ අනුවණ ගොපල්ලා දිය බිව් නොබිව් ගවයන් නො දක්නාක් මෙන්, ශ්‍රමණයා දහම් නිසා උපන් සතුට නො ලබයි. ඇසීමේ පුණ්‍යක්‍රියා වස්තුව නිසා ආනිශංස නො ලබයි. බණ අසන තැනට ගොස් මනාකොට සකස්ව නො අසයි. බණ අසද්දීම නිදයි. කථා කරයි. අන්‍ය විහිතක වෙයි. වෙනත් කල්පනාවකින් යුතු වෙයි. ඔහු සකස්කොට මනාවැ දහම් නො අසන නිසා කමටහන් වඩන්නට නො හැකි වෙයි. භික්ෂු ධර්මයෙන් පිරිහෙයි.

න වීථිං ජානාති ඒ අනුවණ ගොපල්ලා මග නොමග නොදන්නාක් මෙන් මේ ශ්‍රමණ ද මේ ලෞකික ලෝකෝත්තර, ආර්ය අෂ්ඨාංගික මාර්ගය නියම ලෙස නො දනී. නො දන්නා නිසාම ලෞකික මාර්ගයෙන් පිටිස ලෝකෝත්තර මාර්ගය උපදවන්නට නො හැකි වෙයි. ලෞකික මාර්ගඵල හෝ ලෝකෝත්තර මාර්ගඵල නො ලබයි.

න ගොචර කුසලෝ ඒ අනුවණ ගොපල්ලා පඤ්චවාහ වාර සත්තාහ වාර, නො දන්නාක් මෙන්, ශ්‍රමණයා ද, සතර සතිපට්ඨානයන් ලෞකිකද, ලෝකෝත්තරදැයි තතු සේ නොදනී. නොදන්නා බැවින් සියුම් තන්හි තමන්ගේ නුවණ හසුරුවා ලෞකික සතිපට්ඨානයට පිටිස ලෝකෝත්තර සතිපට්ඨානය උපදවන්නට නොහැකි වේ. (ශ්‍රමණ ධර්මය පිරිහේ.)

අනවසෙස දොහීච හොති යනු පිළිගැනීමෙහි පමණ නො දන්නේ,

අනවශේෂ කොට නිර්දේශ වාරයෙහි අභිහටයුං පවාරෙනති සමීපයට එළවා පවරත්. මෙහි පැවරීම් දෙදෙනෙක් වෙති. වාචාභිහාරය පච්චාභිහාරය යනුවෙනි. 'වාචාභිහාර' නම් මිනිස්සු භික්ෂුව හමුවට ගොස් වහන්ස, යමකින් ප්‍රයෝජනයක් වේද, එය කියනු මැනවි, කියති. 'පච්චයාභිහාර' නම් පිරිකර ආදිය හෝ ගිතෙල් පැනි ආදිය හෝ ගෙන භික්ෂුව වෙත පැමිණ, ස්වාමීනි, යම් පමණකින් ප්‍රයෝජන ඇත්ද, ඒ ප්‍රමාණය ගත මැනවැයි කියත්. **තත්‍ර භික්ඛු මතතං නජානාති** ඒ භික්ෂුව ප්‍රමාණය නො දනී. **දායකසස ච වසො වෙදිතබ්බා දෙය්‍ය ධම්මසස වසො වෙදිතබ්බා අත්තනොථාමො වෙදිතබ්බා** රථවිනීත සූත්‍රයෙහි කියන ලද පරිද්දෙන් ප්‍රමාණයෙන් යුක්තව නොගෙන යමක් ගෙන එත්ද, ඒ සියල්ල ගනී යන අර්ථයි. මිනිස්සු විපිළිසර වූවෝ නැවත ගෙනැවිත් නො පවරත්. හේ ප්‍රත්‍යයෙන් ක්ලාන්ත වන්නේ කමටහන් ගෙන වඩන්නට නොහැකි වෙත්. (ශ්‍රමණ ධර්මයෙන් පිරිහේ)

තෙන අතිරෙක පූජාය පූජෙතා හොති ඒ ගොපල්ලා මහා වෘෂභයන් (හඳුනා නොගන්නාක් මෙන්) (ශ්‍රමණයා) ස්ථවිර භික්ෂූන් හමුවෙහි හා නො හමුවෙහි මෛත්‍රී කාය කර්මාදිය ආදී වූ අතිරේක පූජාවෙන් පූජා නො කරත්. එහෙයින් ස්ථවිර භික්ෂූහු මොව්හු අප කෙරෙහි ගෞරව කිරීමක් සැළකීමක් නො කරති යි නවක භික්ෂූන්ට විවිධ අන්දමින් උපකාර නො කරති. බණ දහම් කියාදීමෙන් සංග්‍රහ නො කරති. සිවුරු පාත්‍රා ආදියෙන් හෝ, පාත්‍රයට ලද දෙයකින් හෝ, පන්සල් ආරාම ආදියෙන් හෝ ආමිෂ සංග්‍රහ ආදියෙන් ද සංග්‍රහ නො කරති. විඩා වෙන කල්හි ද මැලවෙන කල්හි ද. (ලෙඩ දුක් ඇති වූ කල්හි ද) ඇප උපකාර පිළිදැගුම් නො කරති. පෙළ හෝ අටුවාවන් හෝ ධර්මකථා හෝ බණදහම් හෝ වෙනත් ගැඹ ශාස්ත්‍රයන්හි හෝ නො පිහිටුවති කියා නො දෙති. නො හික්මවති. නවකයෝ තෙරවරුන් සමීපයෙන් මුළුමනින්ම මේ සංග්‍රහ දෙකම නො ලබන්නාහු මේ ශාසනයේ පිහිටා සිටින්නට නො හැකි වෙති. යම්සේ අනුවණ ගොපල්ලාගේ ගව සම්පත නො වැඩේද, පිරිහේද එපරිද්දෙන් ශීලාදියෙන් නො වැඩෙති. ගොපල්ලා පස්ගෝරසයට හිමිකාරයෙක් නො වන්නේද, එපරිද්දෙන් නවක භික්ෂුව පංච ධර්මස්කන්ධයන්ගෙන් පරිබාහිර වූවාහු වෙති. ශුක්ල පක්ෂය, අකුසල පක්ෂයෙහි කියන ලද්දට විපර්යාස වශයෙන් යොදා ගත යුතුය.

මහා ගෝපාලක සූත්‍ර වර්ණනාව නිමියේය.

1-4-4

එවමෙමසුතං යනු චූළ ගෝපාලක සූත්‍රයයි. එහි **උකකවෙළාය** උක්කවේළා නම් නම ඇති නගරයේ දී, අසන ලදී. ඒ නුවර ඉදිකරන කල්හී ගඟ දියෙන් මත්ස්‍යයෙක් ගොඩට පැමිණියේය. මිනිස්සු රෙදි තෙල් භාජනවල දමා ගිනිහුල් කොට මත්ස්‍යයා ගත්හ. නුවර ඉදිකර නිමාකොට නම් තබන්නාහු 'අප විසින් නුවරට මුල්ගල් තබන දවසේ රෙදි ගිනි හුල්වලින් මත්ස්‍යයෙකු ගන්නා ලද නිසා' උක්කවෙලා යයි නගරය නම් කළාහුය.

භිකඛු ආමනෙතසි යම්කිසි තැනක සිටියහුට සම්පූර්ණ ගංගාව පැහැදිලිව පෙනේද, එබඳු වූ වැළි ගොඩගැසුණු ගංඉවුරෙහි සවස් කාලයෙහි මහා භික්ෂු සංඝයා විසින් පිරිවරන ලදුව, වැඩහිඳ හාත්පසින් පිරී ගලා බසින ගංගාව බලමින්, මේ ගංගාව නිසා පෙර දියුණුව (වෘද්ධිය) පිළිබඳව පරතෙරට පැමිණි කිසිවෙක් ඇත්දැයි ආවර්ජනාකොට, පෙර එක් ගොපල්ලෙක් නිසා දහස් ගණනක ගව සමූහයක් මේ ගඟ ගංදියට වැටී මුහුදට ගසාගෙන ගියේය. එහෙත් වෙනත් නුවණැති ගොපල්ලෙක් නිසා නොයෙක් දහස් ගණන් ගව සමූහයකට යහපත සැලසුනි. සුව විය. අභිවෘද්ධිය ඇතිවිය. නිරෝග බව ඇති වීයයි දුටුවේය. මේ කරුණ දැක, මේ කරුණ මුල්කරගෙන භික්ෂූන්ට දහම් දෙසන්නේ යයි සිතා භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක.

මාගධකො මගධරට වැසි, **දුපපඤඤ ජාතිකො** නුවණ නැති, දන්ධ වූ, මහද් ජඩ වූ ස්වභාව ඇති, **අසමපෙකඛිත්වා** නොසලකා නොවිමසා, **පතාරෙසි** එතෙර කරවන්ට පටන් ගත්තේය. **උතතර තීරං සුචිදෙහානං** ගංගාවෙන් මෙතෙර මගධ රටය. එතෙර විදේහ රටය. ගවයන් මගධ රටින් විදේහ රටට පමුණුවා රක්නෙමියි උතුරු තෙරට (තරණය) එගොඩ කරන්නට පටන් ගත්තේය. ඒ සඳහා **උතතරං තීරං සුචි දෙහානං** යන්න වදාරන ලදී. **ආමණඩලියංකරිත්වා** රවුම්කොට, **අනයබ්‍යසනං ආපජජිංසු** නොවැඩුණු වනයට පැමිණියාහුය. මහා සමුද්‍රයටම පිවිසියාහුය. ගවයන් බස්වන්නා වූ ඒ ගොපල්ලා විසින් ගංගාවෙහි මෙතෙර සම තොටද, විෂමතොට දැයි විමසා බැලිය යුතුය. ගඟ මැද ගවයන්ගේ විඩා හරින

තැන් සඳහා වැලිතලාවන් ඇත්දැයි සැලකිය යුතු විය. එසේම මේ තොටින් බහින ගවයන් එතෙර අසවල් තොටින් එතෙර වන්නාහු යයි තොටුපල කීපයක් පිළිබඳව දැනුම් තිබිය යුතුය. එහෙත් මේ අනුවණ ගොපල්ලා මෙතෙර ගවයන් බසින තොට සම හෝ විෂම දැයි නොබලයි. ගඟ මැද ගවයන්ට විඩා හැරීම සඳහා වැලි තලා දෙක තුනක් ඇත්දැයි නො සලකාම, පරතෙරදී ගොඩබසින තොටුපලවල් පිළිබඳ කිසිවක් නොවිමසාම, නො තොටින්ම ගවයන් බැස්වීය. එකල ඔහුගේ ප්‍රධාන වෘෂභයා මහා ජවසම්පන්න බැවින් ද, මහා වේගයෙන් යුත් බැවින් ද, ශක්තිමත් බැවින් ද ගඟෙහි හරහට සැඩපහර සිඳ පරතෙරට පැමිණ කැඩුණු ඉවුරද, කටුලැහැබද දැක මෙය ගොඩවීමට නුපුළුවන් තැනකැයි දැන කුරය තැබීමට ද ඉඩක් නොලැබ නැවතුනේය. ගවයෝ ද 'නායක වෘෂභයා නැවතුනි. අපිදු නවතින්නමෝ යයි නැවතුනාහුය. මහා ගව සමූහය නැවතුන තන්හී ගංගා ජලය බිඳී ගඟ මැද දියසුළි නැංවීය. ගව සමූහයා දිය සුලියට හසුවී මුහුදටම ගියහ. එකම ගව ලෝමයක්වත් නිරුපද්‍රිත නොවීය. **තත්‍රෙව අනයබ්‍යසනං ආපජ්ජිංසු** යනු එහෙයින් කියන ලදී.

අකුසලා ඉමසස ලොකසස මේ ලෝකයේ ස්කන්ධ ධාතු ආයතන විෂයෙහි නුනුවණ වූවාහු අදක්ෂ වූවාහු පරලොවදී ද ඒ ක්‍රමයමැයි. **මාරධෙය්‍යං** ත්‍රෛභූමක ධර්මයෝ කියන ලදී. **අමාරධෙය්‍යං** නවලොව්තුරා දහම් **මච්චුධෙය්‍ය** ත්‍රෛභූමයෝමැයි. **අමච්චුධෙය්‍ය** නව ලොව්තුරු දහම් එහි අනුවණ වූවාහු අදක්ෂ වූවාහු වචනයාගේ අර්ථයෙන් මාරයාගේ ගොදුරය. **මාරධෙය්‍ය** නම්. **ධෙය්‍ය** යනු ස්ථානයයි. වස්තුවයි. නිවාසය ගෝචරය. **මච්චුධෙය්‍ය** යන්නෙහි ද මේ ක්‍රමයමැයි. **තෙසං** ඒ මෙබඳු මහණ බමුණන්ගේ මෙයින් ෂට් ශාස්තෘවරු දක්වන ලද්දේමය.

මෙසේ අසුභ පක්ෂය දක්වා සුභ පක්ෂය දක්වන්නේ, **භික්ඛවෙ** යනාදිය වදාළහ. එහි **බලවගාවො** දැමුණු ගොනුන් හා දෙනුන් ද **දමමගාවො** දැමිය යුතු ගොනුන් හා නො වැදූ දෙනුන් ද, **වචඡතරෙ** වසු බැව් ඉක්මවා සිටි බලවත් වස්සන් (නාම්බන්) **වචඡකෙ** දෙනුන් කරා පැමිණෙන තරුණ වස්සන් **කිසබලෙක** මද මස් ලේ ඇති, මද ශක්ති ඇත්තවුන්, **තාව දෙව ජාතකො** එදිනම උපන්, මාතු ගොරවකෙන වුයහමානො මවු දෙන පෙරටුකොට හුං හුං යන ගවහඬ කරමින් සලකුණු දෙමින් ළයෙන් ජලය සිඳිමින් යයි. වසුතෙම එම ගොරව හඬින් සංඥාවෙන්

එම දෙනගේ ළෙන් සිඳී දියෙන් යන්නේ මාතෘ ගොරවකෙන වුයහ මානෝ යයි කියනු ලැබේ.

මාරසස සොතං ඡෙත්වා රහත් මගින් මාරයාගේ තෘෂ්ණා දිය පහර බිඳ **පාරං ගතා** මහා වෘෂභයන් දියපාරට ගියා මෙන් සසර පරතෙර නිවනට ගියාහුය. **පාරං අගමංසු** මහා වෘෂභයන් පරතෙරට ගිය කෙණෙහි ගංගා ජලය තුන් කොටසක් ඉක්මවා සිටියාහු, මහා වෘෂභයන් පරතෙර පැමිණියවුන් දැක ඔවුන් ගිය මාර්ගයෙන් ම පරතෙරට ගියාහුය. **පාරං ගමිසසනති** සිව්මගින් නැගිය යුතු කෙළෙසුන් අතුරෙන් තුන් කොටසක් ගෙවා සිටියාහු මෙවිට ඉතිරි තෘෂ්ණා සොතස සිඳ දැමුණු ගවයන් ජලපහරට මෙන් සංසාරයෙන් එතර වූ නිවනට යන්නාහුය. මෙලෙස සියලු වාරයන්හි අරුත් දතයුතුය.

ධම්මානුසාරිනෝ සද්ධානුසාරිනෝ මොහු දෙදෙන ප්‍රථම මාර්ගයෙන් යුක්ත වූවාහුය. **ඤාතනා** සියලු ධර්මයන් දන්නා වූ බුදුහු විසින් **සුපපකාසිතෝ** මොනවට වදාරන ලද, **විවටං** විවෘත කරන ලද, අමත දවාරං ආර්ය මාර්ගය. නිබ්බාන පතතියා නිවණට පැමිණීම පිණිස විනලීකත පහ වූ මාන නල ඇතිකරන ලද, **ඛෙමං පත්තෙත්ථ** කත්තුකම්‍යතා ඡන්දයෙන්, අර්හත්වය ප්‍රාර්ථනා කරවු, කරන කැමැත්තේ නිපදවනු කැමැත්තේ වවු, **පත්තත්ථ** යනු ද පාඨයකි. මෙබඳු ශාස්තෘවරයකු ලැබ තෙපි පැමිණියාහු නම් වෙති යන අර්ථයි. ඉතිරිය හැම තැන ප්‍රකටය. භාග්‍යවතුන් වහන්සේ සුදුසු සේ අනුසන්ධියෙන් යුක්තව දේශනාව නිමවූ සේක.

චූළ ගෝපාලක සූත්‍ර වර්ණනාව නිමියේය.

1-4-5

එවමෙමසුතං චූළ සච්චක සූත්‍රයයි. එහි මහාවනෙ කූටාගාර සාලායං මහා වනය නම් ස්වයංජාත රෝපණය නො කරන ලද, කොටස් සහිත වූ මහා වනයෙකි. තව ද කිඹුල්වතින් ආරම්භ වන මහා වනය හිමවත හා එකට බැඳුනේ පරිච්ඡේද රහිතව මහා සමුද්‍රය දක්වා පැතිර සිටියේය. මෙය එබඳු නොවේ. පරිච්ඡේද සහිත වූ මහා වනයකි. ඒ නිසාම 'මහා වනය' නම් විය. කූටාගාර ශාලාව වූ කළී මහ වනය ඇසුරුකොට කළ අරමෙහි කුළුගෙයක් ඇතුලුකොට හංස මණ්ඩලාකාර මහලකින් යුතුව, සර්වප්‍රකාරයෙන් සමෘද්ධ වූ භාග්‍යවත් බුදුන්ගේ 'ගඳකිළිය' යයි දතයුතුය.

සච්චකො නිසණ්ඨ පුතෙතා පෙර එක් නිගණ්ඨයෙක් හා නිගණ්ඨීයක් ද පන්සිය පන්සියය වාද උගෙන, වාදය සඳහා අභියෝග කරන්නෙමුයි (වාදාරෝපණය) දඹදිව සැරිසරන්නාහු විසාලා මහනුවර පැමිණියාහුය. ලිච්ඡවී රජවරු ඔවුන් දැක තෝ කවරෙක්ද, තී කවරියක්දැයි විචාළහ. නිගණ්ඨයා 'මම වාදාරෝපණය කරන්නෙමි'යි දඹදිව හැසිරෙමි'යි කීය. නිගණ්ඨීය ද එසේම කීවාය. මෙහි දී ලිච්ඡවීහූ ඔවුනොවුන් අතර වාදාරෝපණය කරවු යයි කීහ. මේ දෙදෙන තම තමන් උගත් වාද පන්සියය විචාළහ. නිගණ්ඨයා විසින් පිළිවුත් කල්හි නිගණ්ඨීය විසින් පිළිතුරු කියයි. නිගණ්ඨීය විසින් පිළිවුත් කල්හි නිගණ්ඨයා විසින් පිළිතුරු කියයි. එක් අයකුටවත් ජය පරාජයක් නැත. දෙදෙනා සම සමයෝ වූහ. ලිච්ඡවීහූ තොපි දෙදෙනම සම සමයෝය. ඇවිද කුමක් කරන්නෝද, මෙහිම වසවු යයි කියා ගෙයක් දී වැටුප් තලයක පිහිටවූහ.

ඔවුන්ගේ සංවාසයෙන් දූවරුන් සතර දෙනෙක් ද, උපන්හ. ඔවුහු සච්චා, ලෝලා, පටාචාරා, සිවාවතිකා නම් වූහ. මව්පියන් උගන්නා ලද වාද පන්සියය ද ඔව්හූ උගත්හ. ඔව්හුද පණ්ඩිත වූවාහුය. වියපත් වූ ඔවුන්ට මව්පිය දෙදෙන මෙසේ කීහ. දියණිවරුනි, අපේ කුලයේ දැරියෝ රන් රිදී වස්තුව ආදී දායාද දී දීග දෙන සිරිතෙක් නැත. ගිහිගෙයි වසන යමෙක් ඔවුන්ගේ වාද මඨනයට සමත් වේනම් ඔහුට පාද පරිචාරිකා වෙති. පැවිදි වූ යමෙක් වාද මඨනය කළහොත් ඔහු යටතේ පැවිදි වෙති. තෙපි කුමක් කරන්නාහුද, අපි ද එසේම කරන්නෙමු යයි පිරිවැජි වෙස්

ගෙන මේ දඹදිව නම් දඹයෙන් පෙනේ යයි දඹ අත්තක් ගෙන චාරිකාවෙහි නික්මුණහ. යම්කිසි ගමකට ඔවුන් පැමිණියේ නම් ඒ ගමේ පස් ගොඩක හෝ වැලි ගොඩක, පස් ගොඩක දඹ අත්ත සිටුවා, 'යමෙක් වාදාරෝපණය කරන්නට හැකි වේනම්, ඔහු මේ දඹ අත්ත මඩිවා කියා අනික් ගමට යති. මෙසේ ගමන් යන්නාහූ සැවැත්නුවරට පිවිස එහි ගම්දොර ජම්බු අත්ත තබා පැමිණි මිනිසුන්ට දන්වා ඇතුළු නුවරට පිවිසියාහුය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ඇසුරුකොට දෙව්රම වැඩ වසයි. ඉක්බිති සැරියුත් තෙරණුවෝ ගිලනුන් විචාරමින්, අතු නොගෑ තැන් අතුගාමින්, තමන්ට වැඩ කටයුතු බහුල බැවින් අනෙක් භික්ෂූන්ට පසුව දහවල්ව පිඬු පිණිස වැඩියහ. එසේ යද්දී ගම්දොර තිබූ දඹ අත්ත දැක මේ කුමක්දැයි ළමයින් අතින් විචාළහ. ඔව්හූ ඒ අර්ථය කීහු. එසේනම් දඹ අත්ත ගලවා කඩන්නැයි කීහ. ස්වාමීනි, නො හැකිය අපි බිය වෙමු. දරුවනි බිය නො වව්. යම්කිසි කෙනෙක් පැමිණ අපගේ දඹ අත්ත කැඩුවේ කවුදැයි ඇසුවහොත්, බුද්ධශ්‍රාවක වූ සැරියුත් තෙරුන් විසින් කැඩුවේ යයි කියන්නැයි වාදාරෝපණය කළේය. වාදාරෝපණය කරනු කැමැත්තේ නම්, දෙව්රම් වෙහෙර සැරියුත් තෙරුන් වෙත යන්නැයි කියවු. ඔව්හූ තෙරුන්ගේ වචනය අසා දඹ අත්ත කඩා ඉවත දැමූහ. සැරියුත් හිමියෝ පිණ්ඩපාතයේ හැසිර විහාරයට වැඩියහ.

පරිබ්‍රාජිකාවෝ ද ගමෙන් නික්ම අපගේ දඹ අත්ත කවුරුන් විසින් ඉවත දැමීදැයි විචාළාහ. දරුවෝ සියලු ප්‍රවෘත්තිය දැන්වූහ. පරිබ්‍රාජිකාවෝ නැවත ගමට පිවිස එක් එක් වීදියක් ගානේ ගොස් බුද්ධශ්‍රාවක සැරියුත් තෙරුන් අප සමග වාද කරන්නේ ය. අසනු කැමැත්තෝ එත්වායි දැන්වූහ. මහජනයාද ගියහ. ඔවුන් සමග පරිබ්‍රාජිකාවෝ දෙව්රමට ගියාහුය. ස්ථවිරයන් වහන්සේ තමන් වසන තැනට ස්ත්‍රීන්ගේ පැමිණීම නුසුදුසුය. අවහිරයයි සිතා වෙහෙර මැද හුන්නේය.

පරිබ්‍රාජිකාවෝ ගොස් තෙරුන් විචාළහ. ඔබ විසින් අපගේ ධජය දඹඅත්ත මඩින ලද්දේද? එසේය. මා විසින් එසේ කරන ලදී. අපි ඔබ සමග වාද කරන්නෙමු. මැනව්, යහපති වාද කරව, කවුරු ප්‍රශ්න අසත්ද? කවුරු විසඳත්ද? ප්‍රශ්න විචාරීම අපි කරමු යි (පරිබ්‍රාජිකාවෝ කීහ.) තෙපි වූ කල්හි ස්ත්‍රීහුය. පළමුව විචාරවු. ඔව්හූ සතර දෙනම සතර පැත්තේ

සිට, මවුපියන් වෙතින් උගත් ප්‍රශ්න දහසම විචාළහ. තෙරුන්වහන්සේ කඩුවකින්, ඕලු දඬු සිඳින්නාක් මෙන් විචාළ විචාළ ප්‍රශ්න දහසම විසඳූහ. අවුල් නැතිකොට ගැට නැති කොට වදාළහ. යළි විචාරව යි කීහ. වහන්ස, අප දන්නේ මෙපමණ යයි පරිබ්‍රාජිකාවෝ කීහ.

තෙරහු මෙසේ කීහ. තොප විසින් වාද දහසක් විචාළහ. මා විසින් සියල්ල විසඳන ලදී. මා දැන් තොපගෙන් එක ප්‍රශ්නයක් විචාරමි. එය තෙපි කියවු. ඔව්හූ තෙරුන්ගේ විෂය දැක 'විචාළ මැනව විසඳන්නෙමු'යි නො කියා, වහන්ස, දන්නමෝ නම් කියන්නෙමු යි කීහ. ස්ථවිරයන් වහන්සේ 'මේ කුලපුත්‍රයන් පැවිදි කරවා පළමුවෙන්ම හික්මවිය යුතු ප්‍රශ්නය' වන 'එකනාම කිං' එක යනු කුමක්දැයි විචාළහ. පරිබ්‍රාජිකාවෝ එහි අගක් මුලක් නො දත්හ. තෙරුන් වහන්සේ කියවු යයි කීහ. වහන්ස, නො දන්නෙමු යි ඔව්හූ කීහ. තොප විසින් වාද දහසක් විචාරන ලදුව මම විසඳීමි. මා විසින් අසන ලද එකම ප්‍රශ්නය විසඳීමට ඔබලාට නොහැක්ක. දැන් ඉතින් ජය කාට ද පරාජය කාට ද? ස්වාමීනි, ඔබවහන්සේට ජය හිමිය. අපි පරාජය භාරගනිමු. දැන් කුමක් කරන්නහු ද? ඔව්හූ මැනවැයි පිළිගෙන තෙරුන්ගේ හසුන් ගෙන භික්ෂුණී සංඝයා වෙත ගොස් පැවිදි වූහ. එසේ පැවිදි වී පමා නොවී කෙළෙසුන් තවන වීර්යය ඇතිව කෙටි කලකින්ම රහත්බවට පැමිණියාහුය. මේ (සූත්‍රයේ එන) සච්චක නම් ඔවුන් සතර දෙනාගේ බාල සහෝදරයාය. ඔවුන් සතර දෙනාටම වඩා නුවණැතියහ. මවුපියන්ගෙන් වාද දහසක් ද, එයින් වෙනත් වූ බාහිර සමය ද, උගෙන කිසිතැනක නො ගොස් රජදරුවන්ට ශිල්ප උගන්වමින් විශාලා මහනුවරම වෙසේ. ප්‍රඥාවෙන් ඉතා පිරුණු බවින් තමන් ගේ කුස බිඳේ යයි බියෙන් බඩ වටකොට යකඩ පටියක් දමාගෙන වාසය කරයි. **සචෙච කො නිගණ්ඨ පුතෙතා** යන්න මොහු සඳහා කියන ලදී.

හසසපඤඤවාදිකො හස්ස යන්නෙන් කථා මාර්ගය කීයේය. එය ප්‍රකාශ කෙරේනුයි හසසපඤඤවාදික වේ. **පණ්ඩිත වාදො මම පණ්ඩිත වෙමියි** වාද ඇත්තේ ය. **සාධු සම්මතො බහු ජනසසා** යනු නැකැත් තරු උපයෝගී කරගෙන (නක්ෂත්‍රයෙන්) යම් යම් දේ කියයි ද, එය බොහෝසෙයින් එසේම වෙයි. එහෙයින් මෙතෙම හොඳ නම ලද්දේය. භද්‍ර යයි විශ්වාසයයි. මහජනයා විසින් සම්මත කරන ලදී. **වාදෙන වාදං සමාරදෙධා** කථා මාර්ගයෙන් දෝෂාරෝපණය කරන ලද්දේ,

ආයසමා අසසජී සැරියුත් මහතෙරුන්ගේ ගුරුවරයා වූ අසසජී තෙරුන් වහන්සේ **ජංඝා විහාරං අනුචංකමානෝ** (දහවල් විහරණයෙන් පසු) ලිච්ඡවී රජගෙයින් රජගෙට යාම සඳහා ගමන් කරද්දී, සච්චක නිගණ්ඨ පුත්‍රයාට මෙසේ සිතිණ. මම ශ්‍රමණ භවත් ගෞතමයන්ට වාදාරෝපණය කරමියි ඇවිදිමි. එහෙත් ඔහුගේ සමය නො දනිමියි වාදාරෝපණය නො කරමි. ඔහුගේ සමය දැනගෙන කරන වාදාරෝපණයම මනාව වාදාරෝපණය කළේ නම් වෙයි. මේ වූ කලී මහණ ගොයුම්ගේ ශ්‍රාවක අස්සජී තෙරණුවෝය. තමන්ගේ ශාස්තෘන්ගේ සමයෙහි දක්ෂය. නිපුනය. මම මොහු පිළිවිස කථාකොට (ඒ සමය දැන) මහණ ගොයුම් හට වාදාරෝපණය කරමි. ඒ සඳහා **යෙනායසමා අසසජී තෙනුපසංකමි** ආයුෂ්මත් අසසජී තෙරණුවෝ කොතැන්හි ඒ වෙත එළඹියේය.

විනෙති යනු හික්මවයි කී සෙයින් හික්මවයිද? කෙසේ උගන්වයිද යනුවෙන් විචාරයි. ස්ථවිරයෝ යම්හෙයකින් 'දුක' යයි කී කල දොස් දැක්වීමට ඉඩ ඇතිවේද, මාර්ගඵලයෝ ද පරියායෙන් දුකැයි ආවාහුය. මේ තෙමේත් 'දුක'යි කී කල තෙරුන් විමසීය. භවත් අස්සජි, ඔබ කුමක් සඳහා පැවිදි වූයේ ද, අනතුරුව මගපල සඳහා යයි කී කල, මේ ඔබගේ ශාසනයෙක් නොවෙයි. මේ මහා ආඝාතයක් මරණයක් නම් වෙයි. මේ ඔසුපත් නිරයක් නම් වෙයි. ඔබ සැපයෙහි ආශා නැත්ද, දුක්ම වඩමින් වීර්යයෙන් ඇවිදින්නේ ය යයි දෝෂාරෝපණය කරන්නේද, එහෙයින් පරවාදියා හට පර්යාය කථා කියන්නට නො වටී. යම් සේ මෙතෙම පිහිටක් නො ලබාද, ඒ සඳහා නිෂ්පරියාය කොට කියන්නෙමි යි සිතා, **රූපං භික්ඛවෙ අනිච්චං** අනිත්‍යාත්ම වශයෙන් ම මේ කථාව කීහ. **දුසසුතං** අසන්නට අයුතු වූවක්.

සන්ථාගාරෙ රජ කුලයන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන ශාලාවෙහි, **යෙන තෙ ලිච්ඡවී තෙනුපසංකමි** (ඔහුට මෙසේ සිතින) මම පෙර ලබ්ධිය නො දන්නා බැවින් ශ්‍රමණ ගෞතමයන්ට වාදාරෝපණය නො කෙළෙමි. එහෙත් දැන් ඔහුගේ මහා ශ්‍රාවකයා විසින් කියන ලද ලබ්ධිය දනිමි. දැන් මා අතවැසි ලිච්ඡවීහු පන්සියයක් රැස් වී සිටිති. මොවුන් සමග ගොස් ශ්‍රමණ භවත් ගෞතමයන්ට වාදාරෝපණය කරමි යනුවෙන් සිතා සන්ථාගාරය වෙත ගියේ ය.

ඤාතඤ්ඤතරෙන දන්නා වූ වෙසෙසින් කවුරුත් දන්නා වූ ප්‍රසිද්ධ වූ පස්වග මහණුන් අතුරෙන් එක් අයෙකු වූ, **පතිටඨිතං** යම් සේ මොහු විසින් කියන ලද පරිදි පිහිටන්නේ නම්, මා විසින් කුමක් කළහැකි වන්නේ දැයි පිට පෙරලමින් කීය. **ආකඩෙඪය්‍ය පරිකඩෙඪය්‍ය** තමා හමුවට අදින්නේ ද, නැතිනම් පිටිපසට තල්ලු කරන්නේද, **සමපරිකඩෙඪය්‍ය** ආකර්ශන කරන්නේ ද පරිකර්ෂණ කරන්නේ ද, **සොණ්ඩිකා කිලඤ්ජං** රා පොළෙහි රා පෙරන මටුල්ල **සොණ්ඩිකාධුත්තෙනා** රා බොන්නෙක්, **වාලං කණ්ණෙණ ගහෙත්වා** රා පෙරන පෙරහන සෝදනු කැමතිව, රොඩු පිඹ හරිනු පිණිස දෙ කෙළවර ගෙන, **ඔධුනෙය්‍ය** යටිකුරු කොට පිඹින්නේද, **නිද්ධුනෙය්‍ය** උඩුකුරුකොට පිඹින්නේ ද, **නිවෙඡාදෙය්‍ය** නැවත නැවත ගසන්නේ ද, පොළන්නේ ද.

සණ්ඨොවිකං නාම යනු මෙහි මිනිස්සු හණ සළු කරනු පිණිස හණ වැහැරි ගෙන මිටි බැඳ දියෙහි බහාලති. ඒ හණමිටි තුන්වැනි දවස වනවිට කුණු වෙති. ඉන්පසු මිනිස්සු ඇඹුල් කැඳ රා ආදිය ගෙන එහි ගොස් හණමිටි ගෙන දකුණු පස, වම්පස ඉදිරිය යන තුන් පුවරුවල ගසමින් කමින් බොමින් ක්‍රීඩා කරති. රජුගේ ඇත්තු ඒ ක්‍රීඩාව දැක ගැඹුරු දියට බැස වරක් ඔළුවේද වරක් පිට ද වරක් දෙපස ද වරක් කලවා අතරේ ද ඕමින් ක්‍රීඩා කරති. ඒ ක්‍රීඩා විශේෂය 'සණ ඩෝවික' නම් වේ. **සණ්ඨොවිකං නාම කිළිතජාතං කීළතීති** යන්න එහෙයින් කියන ලදී.

කිං සො භවමානො සච්චකො නිසණ්ඨපුත්තෙනා භගවතො වාදං ආරොපෙස්සති හෙතෙම කවරෙක් වශයෙන් වාද කරන්නේ ද, යක්ෂයෙක් වශයෙන් ද, නැතිනම් ශක්‍රයා වශයෙන් ද, නැතිනම් බ්‍රහ්මයා වශයෙන් ද භාග්‍යවතුන්ට වාදාරෝපණය කරන්නේ ද, ප්‍රකෘති මිනිසකු වශයෙන් නම් භාග්‍යවතුන්ට වාදාරෝපණය කිරීමට සමර්ථයෙක් නැත යන්න මෙහි අදහසයි.

තෙන ඛො පන සමයෙන යම් කලෙක සච්චක ආරාමයට පිවිසියේ ද, එකල්හි කවර වේලාවක එළඹියේ ද, හිරු මුදුන් වේලෙහි, මධ්‍යාහනයෙහි පැමිණියේ ය. මේ වේලෙහි සක්මන් කරන්නේ ඇයිද ආහාර වළඳ අවසානයේ ඇතිවන බත් මත නිදිමත ගතිය වළක්වනු සඳහාය. නැතිනම් දහවල් ද කරන වීර්යය ඇත්තේ ය. එබඳු පසුබත සක්මන්කොට දිය නා ශරීරය සෘතු ගන්වා හිඳ මහණදම් පුරන්නවුන්ගේ

සිත එකඟ වේ. **යෙන තෙ භිකඛූ** හේ වනාහි 'මහණ ගොයුම් හු කොයිදැයි ආවාස ගෙයින් ගෙට, කුටියෙන් කුටියට ගොස් පිළිවිස විමසන්නෙමියි බලන්නේ වනයෙහි ඇතුන් මෙන් මහ සක්මනැ සක්මන් කරන පාංශුකූලික භික්ෂූන් දැක ඔවුන් වෙත ගියේය. ඒ සඳහා 'යෙන තෙ භිකඛූ' යන්න කීහ.

කහං නුඛො හොති කවර ආවාසයක, හෝ ලෙණක හෝ කුටියක හෝ යන අර්ථයි. **එසගහිවෙසසන භගවා** එදින උදේ අලුයම් වේලේ මහා කරුණා සමාපත්තියට සමවැදී දස දහසක් සක්වල සර්වඥතාඥාන නමැති දැල එලා බෝධිනෙය්‍ය සත්ත්වයකු බලන්නේ, 'සච්චක නිගණ්ඨ පුත්‍රයා ලිච්ඡවීන් පිරිසක් ද රැගෙන තමන්ට වාදාරෝපණය සඳහා එන්නේ'යයි දුටහ. එහෙයින් උදෑසනම ශරීර පිළිදැගුම් කොට, මහණගණ පිරිවර ඇතිවැ විශාලා මහනුවර පිණ්ඩපාතයේ හැසිර, පිණ්ඩපාතයෙන් වැළකුනේ, එන්නා වූ මහ පිරිසට සුවසේ හිඳගැනීමට පහසුකම් ඇති තැනෙක හිඳගන්නෙමි'යි, ගඳකිළියට නො පිවිසම මහ වනයෙහි එක්තරා රුකක් මුල දිවා විහාරණය සඳහා වැඩහුන්හ. භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට වත් දක්වා පැමිණියාහු, සච්චක විසින් විමසන ලදුව, දුර වැඩහුන්නා වූ භාග්‍යවතුන් වහන්සේ දක්වමින් 'එසගහි වෙසසන භගවාති ආහංසු'

මහතියා ලිච්ඡවී පරිසාය සඬ්ඨං පන්සියයක් පමණ ලිච්ඡවීන් විසින් පිරිවරන ලදැයි කියතුදු, ඒ සියල්ල මොහුගේ අතවැසියෝම ය. තව ද විශාලා නුවර ඇතුළත 'සච්චක තෙමේ පන්සියයක් පමණ ලිච්ඡවී රජුන් ගෙන භාග්‍යවතුන් හා සමග වාද කරන්නට ගියේ ය' අසා 'පණ්ඩිතයන් දෙදෙනාගේ වාද කථා අසන්නෙමු' යයි බොහෝ මිනිස්සු එහි රැස්වූහ. එසේ රැස් වූ පිරිස මෙතෙකැයි ගණන් නැත. 'මහතියා ලිච්ඡවී පරිසා' යන්න ඒ සඳහා කියන ලදී.

අඤ්ජලිං පණාමෙත්වා දෙපඤ්ඤයක් වූ ඔව්හූ මෙසේ සිතූහ. 'ඉදින් මිථ්‍යා දෘෂ්ටිකයෝ කුමක් හෙයින් තෙපි මහණ ගොයුම් වැදියහුදැ'යි චෝදනා කරනු ලබන්නහු නම්, ඔවුනට කිම ඇඳිලි බැඳීම් පමණකින් වැන්දේ ද යයි අසන්නෙමු. කියන්නෙමු. සම්‍යක් දෘෂ්ටිකයෝ කුමක් හෙයින් භාග්‍යවතුන් නො වැන්දේ දැයි අපට චෝදනා කරන්නහු නම් හිස බිම තබා වඳින්නම ඕනෑද, ඇඳිලි බැඳීම් පමණින් වැඳීම ප්‍රමාණවත් නො වන්නේදැයි විමසන්නෙමු. කියන්නෙමු.

නාම ගොතතං භවත් ගෞතමයනි, මම අසවලාගේ පුත් දත්ත නම් වෙමි. මිත්ත නම් වෙමි. මෙහි ආවෙමියි කියමින් නමින් හඳුන්වති. භවත් ගෞතමයිනි, මම වාසෙට්ඨ නමි. කච්චාන නම් මම මෙහි ආමි යි කියමින් ගෝත්‍ර වශයෙන් හඳුන්වති. මොව්හූ දිළිඳු වූ ජීර්ණ කුලපුත්‍රයෝ පිරිස මැද නම්ගොත් වශයෙන් ප්‍රසිද්ධ වීම සඳහා මෙසේ කළාහුය. යමෙක් කථා නො කර උන්නාහු ද, ඔව්හූ කෙරාටිකයෝ ය. මෝඩයෝ ය. ඔවුන් අතුරෙන් කෙරාටිකයෝ වචනය දෙකක් කථාකොට විශ්වාස වෙති. එසේ විශ්වාසය ඇති කල්හි වේලක් දෙකක් ආහාර නොදී නො වටනේය. එයින් තමන් මිදීම සඳහා නිහඬව සිටිති. මෝඩයෝ මෝඩ නිසාම බහා තැබූ මැටිපිඬු සේ නිහඬව සිටිති.

කඤ්චිදෙව දෙසං කිසි අවකාශයක්, කිසි කරුණක් ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, ප්‍රශ්න විචාරීම සඳහා අගහිවෙසසන ව උනන්දු කරන්නේ, පොළඹවන්නේ, **පුච්ඡගහි වෙසසන යදාකංඛසි** යි වදාළහ. මේ එහි අර්ථයි. අග්ගි වෙස්සනය ඔබ කැමැත්තෙහි නම් ප්‍රශ්න විචාරව. මට ප්‍රශ්න විසඳීමේ බරක් නැත. තමන් යමක් කැමැත්තේ නම් විචාරව. ඔබ යමක් විචාරන්නේ නම් මම එය විසඳමි යනුවෙන් පසේබුදු - අගසව්, මහසව් හා අසාධාරණ වූ සර්වඥ ප්‍රවාරණයෙන් පැවරූහ. පසේ බුදු ආදීහූ යදා කංඛසී නො කියත්. අසා දැනගත්තෙමුයි කියත්. **පුචඡාවුසො යදා කංඛසී, පුචඡ මහාරාජ යදා කංඛසි** යන්න බුදුවරයෝම කියත්.

පුචඡ වාසව මං පඤ්හං - යං කිඤ්චි මනසිචඡසී
තසස තසෙසව පඤ්හසස - අහං අනතං කරොමි තෙ

ශක්‍රය, යම්කිසි ප්‍රශ්නයක් සිතින් කැමති වේ නම් මාගෙන් විමසන්න. ඔබගේ ඒ ප්‍රශ්නය සැකය කෙළවර කරමි.

මහණ එසේ වී නම් තෙපි ආසනයෙහි හිඳම කැමැත්තේ නම් විචාරව. යමක් කැමැත්තේ නම් පුළුවුස - සියල්ල විසඳන්නෙමි.

බාවාරිසස ච තුමහං වා සබ්බසං සබ්බ සංසයං
කතාවකාසා පුචඡවෙහා - යං කිඤ්චි මනසිචඡථ

ඔබ මා විසින් කළ අවකාශ ඇත්තෝ ය. බාවාරි තවුසාගේ හෝ තොපගේ හෝ සිතින් යම් කිසිවක් කැමති වන්නහු ද තොප සියල්ලන්ගේ ඒ සියලු සැක විචාරවු - දුරුකරන්නෙමි.

පුචඡ මං සභිය පඤ්හං - යං කිඤ්චි මන සිච්ඡසි
තස්ස තස්සෙසව පඤ්හස්ස - අහං අනතං කරොමි තෙ

තුන්වන ගාථාවේ අදහස ද පෙරු සේමැයි.

මෙසේ ඒ යක්ෂ - නරේන්ද්‍ර, දේව - ශ්‍රමණ, පරිබ්‍රාජකයන්ට සර්වඥ ප්‍රවාරණයෙන් පවරණ සේක. යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ බුද්ධ භූමියට පැමිණ මේ සර්වඥ ප්‍රවාරණයෙන් පවරන්නහු නම් මෙය පුදුම විය යුත්තක් නො වේ. බෝධිසත්ත්ව භූමියෙහි ප්‍රදේශ ඥාණයෙහි ද මෙසේම පැවැත්තාහු ය.

4. කොණ්ඩඤ්ඤ ගෝත්‍ර ඇති (සරභංග) ඍෂීන් වහන්ස, සුන්දර රූප ඇති ඍෂීහු ඔබගෙන් ඉල්ලා සිටිති. ඒ ප්‍රශ්නයන් විසඳලනු මැනැව. කොණ්ඩඤ්ඤ ගෝත්‍ර ඇත්ත, යම්කිසි ඥානයෙන් මුහුකුරා ගිය පුද්ගලයෙක් වේද, මේ පැන විසඳීම සඳහා ඔහු කරා සත්ත්වයෝ පැමිණෙති. ඒ පැන විසඳීමේ කාර්යය වගකීම ඔබට භාරය වේ. මේ ධර්මයෙහි ස්වභාව යයි.

මෙසේ ශක්‍රාදීන් සඳහා ඍෂීන් විසින් යදින ලදී.

5. පින්වත්නි, කළ නිම වූ කාර්යයන් ඇතියහු සිතින් ඇතිවන යම්කිසි පැනයක් පිළි විසිත්වා. මම තොපගේ ඒ සියලු ප්‍රශ්න මෙලොවද පරලොව ද නුවණින් දැන විසඳන්නෙමි.

මෙසේ සරභංග කාලයේ ද, සම්භව කාලයේ ද, සමස්ත දඹදිවම තෙවරක් ඇවිද, පැන විසඳන්නෙකු නො දැක, සුචීරත බමුණා විසින් ප්‍රශ්න විචාරීම සඳහා අවසර ලැබූ කල උපතින් සත්හැවිරිදි වූයේ වැලි සෙල්ලම් කරමින් සිටියදීම ඇතුළු වීදියේ ඉඳගෙනම.

6. ඒකාන්තයෙන් මම යමකට සමර්ථ වූයේද, එපරිද්දෙන් මම ඔබට කියන්නෙමි. ඉදින් කරන්නේ හෝ නො කරන්නේ හෝ වේද එය රජතුමාගේ අභිමතය වේ.

සර්වඥ පවාරණයෙන් පැවරීය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් සර්වඥ ප්‍රවාරණයෙන් පැවරූ කල්හි, සතුටු සිත් ඇතිවැ ප්‍රශ්න විචාරන්නේ **කථං පන භො ගොතම** යනාදිය කීහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, 'බලව් පින්වත්නි, ශ්‍රාවකයා විසින් කියන ලද්දේ එකකි. ශාස්තෘන් විසින් වෙන කරුණක් කියයි. මා විසින් පළමුවෙන් කියන ලද්දේ නො වේද, යම් සේ ඔහුගේ ශ්‍රාවකයා විසින් පිහිටා සිටින ලද කාරණයේ ම එපරිද්දෙන් ම පිහිටා සිටින්නේ නම්, එසේ කල්හි මම වාදාරෝපණය කරමි. එහෙත් මෙතෙම අනිකක්ම කියයි. එහිලා මා විසින් කුමක් කළ හැක්කේ ද, මෙසේ නිගණ්ඨයාගේ වචනයට ඉඩක් අවස්ථාවක් නොවේ යයි අස්සජී තෙරුන් කී ආකාරයෙන්ම කියන්නේ **එවං ඛො අහං අගහි වෙසසන** යනාදිය කීහ.

උපමා මං භො ගොතම පටිභාතීති භවත් ගෞතමයිනි, මට එක උපමාවක් සිතට එයි. ඒ උපමාව මම ඉදිරිපත් කරමි. **පටිභාතු තං අගහි වෙසසන** ගිනි වෙස්සන, ඔබට වැටහේවා. නිසැකවම ඒ උපමාව ඉදිරිපත් කරන්න භාග්‍යවතුන් වහන්සේ වදාළහ. **බලකරණීයා** දෑත්වල ශක්තියෙන් කළයුතු ගොවිතැන් වෙළඳම් ආදිය කර්මාන්ත, **රූපතතායං පුරිස පුගගලො** රූපය ආත්මය වූයේ මොහුට නුයි **රූපතතා** රූපය ආත්මය යයි ගෙන සිටි පුද්ගලයා දක්වයි. **රූපෙ පතිටඨාය** ඒ ආත්මය යයි ගත් රූපයෙහි පිහිටා, **පුඤඤං වා අපුඤඤං වා පසවති** කුසල් හෝ අකුසල් උපදවයි. වෙදනතතා වේදනා ආදියෙහි ද මෙම ක්‍රමයමැයි.

මෙයින් කුමක් දක්වයි ද, මේ පංචස්කන්ධයෝ මේ සත්ත්වයන්ට පොළව සේ පිහිටයි. ඔව්හු මේ පංචස්කන්ධයේ පිහිටා සිට කුසල් හා අකුසල් රැස් කරති. ඔබවහන්සේ මෙසේ පෙනෙන්නා වූ ම ආත්මය ප්‍රතිශේධ කරන්නේ ය. නැතැයි කියන්නේ ය. පංචස්කන්ධය අනාත්මයයි දක්වන්නේ යයි අතිශයින් කරුණු සහිතව උපමාව ඉදිරිපත් කළේය.

තව ද මේ නිගණ්ඨයා විසින් ඉදිරිපත් කරන ලද උපමා උපමේය න්‍යායයන්, සිඳ ඔහුගේ කථායෙහි වාද දක්වන්නට, සර්වඥයන් හැර අනෙකක් යමක් නොවේ ම ය. පුද්ගලයෝ දෙපරිදිය. බුදුන් විසින් හික්මවිය යුත්තෝ ද, ශ්‍රාවකයන් විසින් හික්මවිය යුත්තෝ ද යනුවෙනි. ශ්‍රාවකයන් විසින් හික්මවිය යුත්තෝ, ශ්‍රාවකයන් විසින් ද බුදුන් විසින් ද හික්මවනු ලබති. එහෙත් බුදුන් විසින් හික්මවිය යුතු අයෙක් සව්වෝ නො හික්මවති. මේ නිගණ්ඨයා බුදුන් විසින්ම හික්මවිය යුත්තෙකි. එහෙයින් මොහුගේ වාද බිඳ දොස් දක්වන්නට අනෙක් කෙනෙක් සමත් වූයේ නැත. එහෙයින් භාග්‍යවතුන් වහන්සේම ඔහුගේ වාදයේ දොස් දක්වති. ඒ සඳහා නනු තවං අගගිවෙසසන ආදිය වදාළහ.

ඉක්බිති නිගණ්ඨ තෙම මෙසේ සිතීය. 'ශ්‍රමණ ගෞතමයෝ ම මා සමග වාද කරයි. මගේ වාදය පිහිටුවයි. ඉදින් මතුයෙහි කිසි දොසක් පරස්පරයක් වන්නේ නම් අනිවාර්යයෙන් නිග්‍රහ කරන්නෙමි. ඒ නිසා මම මේ වාදය මහජනයා සාක්ෂි කොට තබන්නේ නම් මැනව. එහෙයින්, අහංහි භො ගොතම එවං වදාමි, රූපං මෙ අත්තා -පෙ- විඤ්ඤාණං මෙ අත්තා, අයං ච මහති ජනතා යනුවෙන් කීය.

භාග්‍යවතුන් වහන්සේ නිගණ්ඨයාට වඩා සිය ගුණයෙන් දහස් ගුණයෙන්, සිය දහස් ගුණයෙන්, වාදීන් අතුරෙන් උතුම් වන්නේ ද, අතිශයින් උතුම් වන්නේ ද, ඒ නිසා මෙසේ සිතූ සේක. 'මේ නිගණ්ඨයා තමන් මිදී මහජනයා මත්තෙහි වාදය බහාලයි. ඔහුට මෙයින් මිදෙන්නට ගැලවෙන්නට නො දෙමි. හුදෙක් මහාජනයාගෙන් වෙන්කොට, මොහුවම හුදෙකලාවම වාදයෙහි නිගන්නෙමි' ඉක්බිති ඔහුට, කිංහි තෙ අගගි වෙසසන යනාදිය වදාළහ. එහි අර්ථය 'මේ ජනතාව මට වාදාරෝපණය කිරීමට මා හා වාද කිරීමට නො පැමිණියාහු වෙති. ඔබම මුළු මහත් විශාලා මහනුවරටම දන්වා මට වාදාරෝපණය කිරීමට ආවේමය. එබැවින් තෙපිම තමන්ගේ වාදය ඉදිරිපත් කරව. කුමක් හෙයින් මහජනයා මත්තේ පවරයිද, හෙතෙමේ ම පොරොන්දු වන්නේ, සහතික වන්නේ අහං හි භො ගොතම යනාදිය කීහ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ නිගණ්ඨයාවම වාදයෙහි පිහිටුවා තෙනහි අගගිවෙසසන යී පිළිවිසීමට වාදයට පටන්ගත්හ. එහි තෙනහි යනු කරණාර්ථයෙහි නිපාතය. යම්හෙයකින් තෙපි පංචස්කන්ධය ආත්ම

වශයෙන් ප්‍රතිඥා කෙරෙහි ද, එහෙයින් යන අර්ථයි. **සකසමිං විජිතෙ** තමාගේ රටෙහි **සාතතෙය්‍යංවා සාතෙතුං** නැසීමට සුදුසු වූවෙකු, නැසීමට සුදුසු කෙනෙකු නසන්නට, **ජාපතො යං වා ජාපෙතුං** ධන හානියට සුදුසු වූවකු, ධන හානි කළ යුත්තෙකු ධන හානි කරන්නට, දිළිඳු කරන්නට, **පබ්බාජෙතතයං වා පබ්බාජෙතුං** සියරටින් නෙරපා හරින්නට සුදුස්සෙකු නෙරපා හරින්ට බැහැර කරන්ට, **වතතිතුඤ්ච මරහති** පවත්වන්නේ ද වෙයි. පවත්නට සුදුසුය. පවත්නට යුතුයයි දක්වයි.

මෙසේ නිගණ්ඨ තෙමේ තමන්ගේ වාද බිඳිනු සඳහා අවශ්‍ය අදාළ කාරණයම, තමාගේ මරණය සඳහා, ආයුධයක් මුවහත් තියන්නෙකු මෙන් විශේෂකොට දක්වයි. නුවණ මද වූයෙක් මෙනි. **එවං මෙ රූපං හොතු** මගේ රූපය මෙබඳු වූ ප්‍රසාදය උපදවන, මනා රූ ඇති, අලංකාර කොට සැරසූ රන් තොරණක් මෙන් ද, මනාව සැරසූ සිතුවම් පටක් සේ ද, ප්‍රිය උපදවන පෙනුම ඇති වේමැයි, **එවං මෙ රූපං මා අහොසි** මගේ රූපය මෙබඳු වූ දුර්වර්ණ වූ, අවලස්සන වූ, රැළි වැටුණු, කැලැල් වලින් ගැවසී ගත්තා වූ, සිරුරක් නො වේවායි,

තුණහී අහොසි නිගණ්ඨයා මෙතැනදී වැරදුණු බව දැන, ශ්‍රමණ ගෞතමයෝ මාගේ බිඳීමට කරුණක් ඉදිරිපත් කළේය. මම අනුවණ බැවින් බාල බැවින්, එයම විශේෂ කොට දැක්වීමි. දැන් මම නටුයේ වෙමි. ඉදින් 'පවතී' යයි කියන්නෙම් නම්, මේ රජදරුවෝ නැගී සිට අග්ගිවෙස්සන, තෙපි මගේ රූපයේ වශය පවතීයයි කියයි. ඉදින් තාගේ රූපයේ ඉසුරු පවතී නම්, කවර හෙයින් තෙපි 'යම් සේ මේ ලිච්ඡවී රජදරුවෝ තව්තිසා වැසි දෙවියන් වැනි ආත්මභාවයෙන් බබලත් ද, ප්‍රියමනාප වූවාහු දැකුම්කළු වූවාහු, ප්‍රසාද එළවන්නාහු වෙත් ද, එපරිද්දෙන් බබළන්නේ නැතැයි, ඉදින් නො පවතී යයි කියන්නේ නම්, එවිට ශ්‍රමණ ගෞතමයෝ, අග්ගිවෙස්සන, තෝ පළමුව මාගේ රූපයේ වශය පවතීයයි කියා දැන් ප්‍රතික්ෂේප කෙරෙයි කියා වාදාරෝපය කරන්නේ ය. මෙසේ පවතී යයි කී කල එක් දොසෙක. නො පවතීයයි කිවහොත් තවත් දොසෙකයි පිළිතුරු නොදී නිශ්ශබ්ද විය. දෙවනුව ද, බුදුහු විචාළහ. දෙවනුවද පිළිතුරු රහිතව නිශ්ශබ්ද විය.

යළි යම් හෙයකින් තුන්වරටත් භාග්‍යවතුන් වහන්සේ විචාළ කල්හී පිළිතුරු නොදී සිටියහොත්, පිළිතුරු නො දෙන්නාගේ හිස සත්කඩකට

පැළේ. බුදුවරයෝ නම් සත්ත්වයන්ට වැඩ පිණිසම කල්ප ලක්ෂ ගණනක් පෙරුම් පුරති. සත්ත්වයන් කෙරෙහි බලවත් කරුණාවෙන්ම වසති. ඒ නිසා තුන්වන වරට නො විමසා, සච්චක නිගණ්ඨයාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. **එතං බ්‍යාකරොහි දානි** යනාදී වචන වදාළහ. එහි **සහධම්මිකං** කරුණු සහිතව හේතු සහිතව,

විදුරුවිය මොහුගේ අතේ ඇත්තේනුයි **වජිරපාණි** නම් වේ. **යකෙඛා** ඒ ලාමක යක්ෂයෙක් නොවේ. සක්දෙවිඳු යයි දතයුතුය. **ආදිත්තං** ගිනිවන් වූ, **සම්පජ්ජලිතං** මොනවට ඇවිල ගත්, **සජොති භූතං** එකම ගිනිගුලියක් වූ හාත්පස ගිනිදැල් ඇති. **ඨිතො හොති විශාල** වූ හිස කෙසෙල් ඇවරි මෙන් දළය. බිහිසුනු ඇස්, නහය ආදියෙන් විරූප වූ මුහුණක් මවා සිටියේය. කුමක් නිසා මොහු ආයේ ද, දෘෂ්ටිය හරවනු පිණිසය. තව ද **අහඤ්ඤෙව ඛො පන ධම්මං දෙසෙය්‍යං පරෙව න මෙ අජානෙය්‍යුං** මෙසේ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසීම උත්සාහ රහිත වූ විට සක්දෙව් රජු සමග මහබඹු පැමිණ, භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසනු මැනව, ඔබගේ අණ නො පිළිපදින්නවුන් ලවා අපි පිළිසිඳවමු. ඔබගේ දහම් සක වේවා අපගේ අණසක වේවා. අද සම්මතයා බියගන්වා පැන විසඳවන්නෙමු යි ආහ.

භගවා චෙව පසසති, සච්චකෙ නිගණ්ඨපුතෙතා ඉදින් ඔහු අන්‍යයෝත් දකින්නාහු නම්, එය අගරු වන්නේ ය. ශ්‍රමණ ගෞතමයෝ සච්චකයා තමාට පිළිතුරු නොදෙන නිසා යකෙකු කැඳවා පිළිතුරු ගත්තේ යයි, සච්චකයා භයින් කීයේය යයි සමහරු කියනු ඇත. එහෙයින් භාග්‍යවතුන් හා සච්චක ද දනී. දකී. ඔහු දැකීමෙන් සච්චක ගේ සියල් සිරුරින් දහඩිය ගැලීය. ඇතුළු කුස පෙරළමින් මහ හඬින් හැඬී හේ අනික් අය ද දකින්නේ දැයි වටපිට බලන්නේ අන් කිසිවෙක්හුගේ ලොම් දැහැගැනීමක් වත් නැති බව දිටීය. මේ භයම මට ම උපන. ඉදින් මම යක්ෂයෙකැයි කියමි නම්, කිමද ඇස් ඇත්තේ තොපට පමණ ද, ඔබ පමණක් යක්ෂයකු දකී ද, පළමුව යක්ෂයකු නොදැක දැන් ශ්‍රමණ ගෞතමයන් විසින් වාදාරෝපණය කළ කල්හිම යකකු පෙනේදැයි කියන්නාහු වෙති. දැන් මට ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ සරණ හැර වෙනත් පිළිසරණක් නැතැයි සිතන්නේ, ඉක්බිති සච්චක නිගණ්ඨ පුත්‍රයා මෙසේ කීය. **තාණං** ගවෙසී ආරක්ෂාව සොයන්නේ, **ලෙණං** ගවෙසී සැඟවිය යුතු ස්ථාන සොයන්නේ, **සරණං** ගවෙසි පිහිටාධාර සරණ සොයන්නේ මෙහි පාලනය කෙරෙයි. රක්ෂණය කෙරේනුයි **තාණ** නම්. සැඟවීමට ආධාර වේනුයි

ලෙණ නම්. හැසිරේනුයි **සරණ** නම්. භය නසයි. රැකවරණ දෙයි යන අදහසයි. **මනසිකරිත්වා** මෙනෙහි කොට, ප්‍රත්‍යවේක්ෂා කොට, විමසා,

මනසිකරිත්වා මෙනෙහි කොට, ප්‍රත්‍යවේක්ෂා කොට, විමසා **එවං** මෙ වෙදනා හොතීති කුශල වේදනාවම, සැප වේදනාවම වේවා, **එවං** මෙ සඤ්ඤාහොතු කුසල සංඥාවම වේවා, සොම්නස් හැඟීමම වේවා, සංස්කාර විඤ්ඤාණයන්හි ද මෙම න්‍යායමැයි. **මා අහොසි** මෙහි කියන ලද්දට වෙනස්ව අරුත් දතයුතුයි. **කලලංසු** යුතු ද **සුදුසු** ද **සමනුපසසිතුං** මෙය මාගේ ය. මෙතෙම මම වෙමි. මේ මගේ ආත්මයය, මෙසේ තෘෂ්ණා මාන විසින් දකින්නට, **නො හිදං හො ගොතම** භවත් ගෞතමයිනි, මෙය යුතු නො වෙයි. සර්පයෙකු විසින් දෂ්ට කිරීමෙන් ඇතිවන සර්ප විෂය. ඒ සර්පයා ලවාම විස උරවන්නෙකු නසවන්නෙකු මෙන්, භාග්‍යවතුන් වහන්සේ සච්චක නිගණ්ඨයා ලවා ම, ඒ පිරිස් මැදදීම, ඔහුගේ කටින් පංචස්කන්ධය අනිත්‍ය ය, දුකය, අනාත්මයයි කියවීය.

දුකඛං අලලීනො මේ පංචස්කන්ධ දුක්ඛය තෘෂ්ණා දිට්ඨි ආදියෙහි ඇලුනේ, **උපගතො අජඣාසිතො** යනු තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ම දතයුතු. **දුකඛං එතං මමා** යනාදියෙහි පංචස්කන්ධ දුඃඛය තෘෂ්ණා දෘෂ්ටි මාන වශයන් සිහිකළ යුතුය යන අර්ථයි. **පරිජානෙය්‍ය** අනිත්‍ය දුක්ඛ අනාත්ම බව තීරණ පරිඤ්ඤාවෙන් දැන ගත්තේ ය. **පරිකෙඛපෙක්ඛා** යනු විනාශයට, අවසානයට නිමාවට අනුත්පාදයට පමුණුවා,

නවං යනු තරුණ **අකුකකජාතං** යනු මල් හටගන්නා වකවානුවේ ඇතුළත අඟල් අටක් පමණ වූ එක් සන වූ දණ්ඩක් හටගනී. එයින් විරහිත යන අර්ථයි. **රිතෙතා** ශූන්‍ය වූ, හර රහිත වූ, හිස් වූ බැවින් **තුවෙඡා, අපරදෙධා** පරදන ලදුයේ **භාසිතා ඛො පන තෙති** මෙය භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ මුඛරි බව පවසා නිග්‍රහ කරමින් වදාළහ. ඔහු වනාහි පෙර පූරණාදී ෂට් ශාස්තෘන් වෙත එළඹ ප්‍රශ්න විචාරයි. ඔවුනට ඒවා විසඳිය නො හැකි වෙති. එකල්හි ඔවුන්ට පිරිස් මැද මහත් සිනහ නගා ජය ප්‍රකාශ කර යයි. හේ සම්‍යක් සම්බුද්ධයන් ද එසේම වෙහෙස කරන්නේ ය යන සිතින් පැමිණ,

එම්බා නිසරු රැක! යම් රුකෙක්හි එකම පහරින් මුදුනම (උතුමග) සිඳින ලද්දේ ද, සියුම් කොළ ඇති කටු සහිත වූ මේ රුක කිනම්ද?

අමෙහා කො නාමයං රුකෙඛා සීන පතෙතා සකණ්ටකො
යත්ථ එකප්පහාරෙන - උත්තමංගං විසාරිතං

මේ නිසරු රුක පුරුදු වූ මෙලෙක් තුඩැති ලිහිණියා කිහිරි රුකට කෙටුවද, සර්වඥතාඥාන නමැති අරටුව සහිත වූ නුවණැති රුකට කෙටීමට පැමිණියද, සර්වඥතාඥානයේ හරවත් බව තද බව දැනගත්තේය. ඔහුගේ මුඛරි බව ඒ පිරිස මැද ප්‍රකාශ කරන භාග්‍යවතුන් වහන්සේ **භාසිතා ඛො පන තො** යනාදිය වදාළේය.

එහි **එතරහී** උපාදින්නක ශරීරයේ, තෘෂ්ණාදීන් විසින් ගන්නා ලද ස්කන්ධ පරම්පරාවේ දහදිය නම් නැතැයි නො කිව යුතුය. එහෙත් නැතැයි කියති. **සුවණ්ණ වණ්ණං කායං විවරි** යනු සියලු කය විවෘත නො කළහ. බුදුවරයෝ නම් ගැටවටු ගන්වා (දෙවුරට වසා සිවුර පොරවා) පිළිසන් සිරුරින්ම පිරිසට දහම් දෙසති. එකල භාග්‍යවතුන් වහන්සේ ගලවළුව හමු වූ තැන (බෙල්ලේ වල ඇති තැනින්) සිවුර ගෙන සතරඟුල් පමණ බහාලූහ. එය බහාලූ කෙණෙහි රන්වන් රැස් ගුලි ගුලි වැ, රන් කළයකින් රත්රන් දියර සෙයින් ද, රන්වලා ගැබකින් විදුලිය මෙන් ද නික්මී රන් මිහිඟුවක් බඳු මහකඳ ඇති උතුම් හිස පැදකුණු කරමින් අහසෙහි වැඩ හුන්හ.

භාග්‍යවතුන් වහන්සේ කවර හෙයකින් මෙසේ කළේ ද, මහජනයාගේ සැකය දුරලනු පිණිසය. මහජනයා 'ශ්‍රමණ ගෞතමයෝ මාගේ දහදිය නැතැයි කියති. සච්චක නිගණ්ඨ පුත්‍රයාගේ ඉහින් කනින් යන්ත්‍රයකින් මෙන් දහදිය වැගිරෙති. ශ්‍රමණ ගෞතමයෝ ගත දෙපටසිවුර පොරවා සිටියහ. ඇතුළත දහදිය ඇති නැති බව කෙසේ දැනගන්නදැයි සැක කරන්නේය. ඒ මහජනයාගේ සැක දුරු කරනු පිණිස මෙසේ කළ සේක.

මංකුභූතො තෙද රහිත වූයේ, **පතතකඛන්ධො** හෙලූ කඳ ඇතියේ, **අපපටිභානො** පිළිතුරක් නොදන්නේ, **නිසීදි** පා ඇඟිලිවලින් බිම සාරමින් ඉරි අඳිමින් සිටියහ.

දුම්මුඛො යනු විරූප වූ මුහුණ ඇත්තේ නොවේ. හේ අභිරූප වූයේ ප්‍රසාදය ඇතිවන්නේ ම ය. ඔහුගේ ක්‍රමය එයයි. **අභබ්බා තං**

පොකඛරණිං පුන ඔතුරිතුං සියලු සම්පත් සියලු කරුණු නැති වූ හෙයින්, පසුගමන් ඇත්තේ, බැසගැනීමට නුසුදුසු වූයේ එහිම කවුඩු ගිජුලිහිණි ආදීන්ට ආහාර වේයයි දක්වයි. විසූකායිතානි යනු සම්‍යක් දෘෂ්ටියට වෙනස් වූ දෘෂ්ටීහු, විසේවිතානා දෘෂ්ටි සංචරිතයෝ, විපඵන්දිතානි යනු විරුද්ධ වූ දෘෂ්ටි කම්පනයෝ, යදිදං වාදිසසායො යනු මෙහි යදිදං යනු නිපාතයකි. වාද කිරීමෙහි අදහස් ඇතිව, වාදාරෝපණය කරන්නෙමියි යන අදහසින් තවදුරටත් සිටින්නට නුසුදුසු වෙයි. එහෙත් බණ අසන්නේ යයි කැමති වෙයි. දුම්මුඛං ලිච්ඡවි පුතතං එතදවොච දුර්මුඛ වූ ලිච්ඡවී රජදරුවෝ මෙසේ කීහ. කුමක් හෙයින් කීයේද? දුර්මුඛ වූ තැනැත්තා උපහාසයට ලක් කරනවිට ලිච්ඡවී කුමාරවරුන්ට මෙසේ සිතිණ. 'මේ නිගණ්ඨයා විසින් අපට ශිල්ප උගන්වන විට බොහෝ අවමන් කළේය. දැන් මේ පසමිතුරා පිටුදකින්නට සුදුසු කාලයයි. අපි ද එක එක උපමාව ගෙන දක්වමින්, අතුල් පහරකින් වැටුණු අයකුට මුගුරකින් තලන්නාක් මෙන් නැවත ඔහුට මෙවැනි පිරිස් මැද හිස ඔසවන්නට නො හැකි වන පරිද්දෙන් කටයුතු කළ යුතුයි.' ඔව්හූ දුර්මුඛයාගේ කථාවසානය බලමින් හුන්නාහුය. සච්චක ද ඔවුන්ගේ අදහස් දැන මොවුහූ සියල්ලෝම බෙලි දික්කොට සැලෙන තොල්වලින් සිටිති. නැවත වෙනම මා වෙත උපහාස එල්ල කරන්නේ නම් යළි මට පිරිස් මැද හිස ඔසවන්නට බැරි වේ. මම නිශ්ශබ්ද නො වී, වෙනත් අයකුට ඉඩක් නොලැබෙන පරිද්දෙන්, ශ්‍රමණ ගෞතමයන් සමගම කථා සල්ලාපය ආරම්භ කරමි. ප්‍රශ්න විචාරන්නෙමි. එහෙයින් මෙය කීය.

එහි ආගමෙහි යනු සිටුව, යළි කථා නො කරව. තිටඨතෙක භො ගොතම භවත් ගෞතමයෙනි, අපගේ හා අන්‍ය වූ බොහෝ මහණ බමුණන්ගේ වචන කිම තිබියේවා. එලාපං විලපිතං මඤ්ඤෙ මේ වචනය විලාප මාත්‍රයක් වෙයි යන අර්ථයි. තිටඨ තෙසා යන මෙහි 'කථා' යන්න හැර කිවයුතුයි. වාචා විලාපං විනපිතං මඤ්ඤෙ යන මෙහි වනාහි කථා කිරීම විප්‍රලාප කීමක් මෙන් වන්නේ ය. මෙවිට ප්‍රශ්න විමසන්නේ කිතනාවතා යනාදිය කීය. එහි වෙසාරජ්ජපපතෙතා විශාරද ඤාණයට පැමිණියේ, අපරපපචචයො පර ප්‍රත්‍ය රහිත වූයේ, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ පැන විසඳන සේක් ඉධ අගගිවෙසසන යනාදිය වදාළහ. යම්හෙයකින් මෙහි 'පසසති' යි කී බැවින් ශෛක්ෂ භූමිය දක්වන ලදී. එහෙයින් දෙවැනිව අශෛක්ෂ ප්‍රශ්නය විමසන්නේ දෙවෙනි ප්‍රශ්නය විචාළේය. එයද භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළහ.

එහි දසසනානුත්තරියෙන යනාදියෙහි දසසනානුත්තරිය යනු ලෞකික ලෝකෝත්තර ප්‍රඥාවයි. පටිපදානුත්තරියං යනු ලෞකික ලෝකෝත්තර ප්‍රතිපදාවයි. විමුත්තානුත්තරියං යනු ලෞකික ලෝකෝත්තර විමුක්තියයි. නොහොත් ශුද්ධ ලෝකෝත්තමයි. දසසනානුත්තරියං අර්හත් මාර්ග සම්‍යක් දෘෂ්ටියයි. පටිසදානුත්තරිය යනු සෙසු මාර්ගයෝය. විමුත්තානුත්තරිය යනු මාර්ගඵල විමුක්තිය නොහොත් ක්ෂීණාශ්‍රවයාගේ නිර්වාණ දර්ශනයයි. දසසනානුත්තරිය නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයෝය. පටිපදානුත්තරිය නම් අග්‍රඵලය විමුත්තානුත්තරිය නමැයි දතයුතු.

බුදෙධා සො භගවා ඒ භාග්‍යවතුන් වහන්සේ තමන්ම සිව්සස් අවබෝධ කළහ. බොධයා අනුන්ට චතුරාර්ය සත්‍යය අවබෝධ කරවීමට දහම් දෙසති. දනෙතා ඉන්ද්‍රිය දමනයෙන් යුක්ත වූයේ දමථාය නිර්වාණය පිණිස. සමථාය කෙලෙස් සන්සිඳීම පිණිස, තිණෙණා සතර ඕඝයන් තරණය කළේ, තරණය සතර ඕඝ තරණය පිණිස, පරිනිබ්බුතො ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවියේ, පරිනිබ්බාණය කෙලෙස් නැතිකිරීම නිවාරණය සඳහා දහම් දෙසයි.

ධංසී ගුණ නසන්නාහූ, පගබභා, වාක් - බුහුටිකමින් යුක්තවූවාහූ, ආසාදෙතබ්බං ගැටිය යුතුය, ආසජජා නතථෙව භවනතං ගොතමං භවත් ගෞතමයන් ගටා කිසිවකුට තමාගේ නොනට සියලු වාද ගෙන යන්නට ශක්තිය නැතැයි කියයි. භාග්‍යවතුන් වහන්සේ තිරිසනුන් මෙන් කිසිවකුට ජීවිත අන්තරායක් නො කරති.

මේ නිගණ්ඨයා වූ කලී මේ උපමා තුන භාග්‍යවතුන් වහන්සේට උත්කර්ෂය ශ්‍රේෂ්ඨත්වය පිණිස ඉදිරිපත් නො කළේය. තමන්ට උත්කර්ෂය, ශ්‍රේෂ්ඨත්වය පිණිසම ඉදිරිපත් කළේය. යම්සේ රජු කිසියම් පසමිතුරෙකු නසා මෙසේත් සූර වූ, මෙසේ බලසම්පන්න වූ, පුද්ගලයෙක් වන්නේ යයි පසමිතුරා වර්ණනා කරන්නේ නමුත් තමන්ටම ප්‍රශංසා කරයිද, එපරිද්දෙන් මෙතෙමේත්, සියාහි හො ගොතම සත්ථීපපහිනනං යනාදීන් භාග්‍යවතුන් වහන්සේම උසස් කරන්නේ අපිම ශූරයෝ වම්හ. අපිම පණ්ඩිතයෝ වම්හ. අපිම බහුශ්‍රැතයෝ වම්හ. යම් අපි මෙසේ මත් ඇතෙකු කරා මෙන්ම දිලිසෙන ගිනිකඳක් කරා මෙන් ද, පෙනේ කළ සර්පයකු කරා මෙන් ද, වාද කිරීම සඳහාම එළඹියේ දැයි තමන්ම උසස් කෙරේ. මෙසේ තමා උසස්කොට භාග්‍යවතුන් පවරන්නේ අධිවාසෙතු මෙ යනාදිය කීහ.

එහි අධිවාසෙතු යනු පිළිගනීවා, **සවාතනාය** යනු ඔබ කෙරෙහි සත්කාර කරන්නා වූ මට යම් පිනකුත් ප්‍රීතියකුත් ශ්‍රේෂ්ඨ වන්නේ ද, ඒ සඳහා අධිවාසෙතු භගවා තුණ්හීභාවෙන භාග්‍යවතුන් වහන්සේ **කායංග** වාචං මෙහෙයවීමක් නො කොට, ඇතුළතින්ම ක්ෂාන්තිය දරන්නේ නිශ්ශබ්ද තාවයෙන් ඉවසා වදාළේය. සච්චකයාට අනුග්‍රහ කරනු පිණිස සිතින්ම පිළිගත් සේක.

යමසස පතිරූපං මඤ්ඤය්‍යථ, යනු ඒ ලිච්ඡවීහු ඔහුට පන්සියයක් බත්සැළි නිති බත් දෙති. ඒ සඳහාම මොහු 'හෙට තෙපි යමක් සුදුසු යයි කැප යයි සිතන්නහු නම් එය ගෙන එන්න. යම්හෙයකින් තෙපි ශ්‍රමණ ගෞතමයන්ගේ පිරිවර නිසා කැප අකැප යුතු අයුතු දේ දන්නහුය. එහෙයින් **'භත්තානි භාරං අභිහරිංසු'** එසවිය යුතු බත් එළවූහු.

පණීතෙන යනු උතුම් වූ සහත්ථා සියතින් සන්තපෙපත්වා මනාව භෝජනයෙන් සම්පූර්ණ කරවා, පිංගියකු යැපුනෙකු කොට, **සමපවාරෙත්වා** මනාව පවරා ඇතැයි අතින් ප්‍රතික්ෂේප කරද්දී භුත්තාවී වැළඳුවහු **ඔණීතපත්තපාණිං** පාත්‍රයෙන් ඉවතට ගත් අත් ඇත්තාහු, **ඔහිත පත්තපාණි** යනු ද පාඨයකි. අතින් බැහැර වූ වෙන් වූ පාත්‍ර මොහුටනුයි **ඔහිතපත්තපාණි** නම්. අත් ද පාත්‍රය ද සෝදා එක් පසෙක තබා යන අර්ථයි. **එකමනතං නිසීදි.** භාග්‍යවතුන් වහන්සේ එක් අවකාශයක හුන්නේය යන තේරුමයි.

පුඤ්ඤංච පුඤ්ඤමහ මේ දානයෙහි පින ඉදිරියේ මහත් විපාක දේ යන අර්ථයි. **පුඤ්ඤමහි** විපාක ස්කන්ධයාගේ ම පිරිවර වේ. **තං දායකානං සුඛාය හොතු** යනු මේ ලිච්ඡවී සුවය පිණිසම වේවා, මෙහි වනාහි 'මා පැවිද්දෙකු නම් පැවිද්දෙකු විසින් තමාගේ දන පාවාදෙන්ට අයුතුය' යි ඔවුනට පාවා දෙමින් මෙසේ කීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ යම්හෙයකින් ලිච්ඡවීන් විසින් සච්චකට දෙන ලද ද, එහෙයින් එකරුණ දක්වන සේක් **සංඛෙ අගගිවෙසසන** යනාදිය වදාළහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ සිතක් නැතිවම නිගණ්ඨයා විසින් තමන්ට දුන් දක්ෂිණාව නිගණ්ඨයාටම පාවා දුන්හ. ඒ දක්ෂිණාව අනාගතයේ ඔහුට වාසනාව ගෙන එන්නේය කියායි.

චූළ සච්චක සූත්‍ර වර්ණනාව නිමියේය.

1-4-6

එවමෙමසුතං මහා සච්චක සූත්‍රයයි. එහි **එකං සමයං** යන්න ද **තෙනඛොපන සමයෙන** යන්න ද **පුබ්බණ්හසමයං** යන්න ද මේ පද තුනම එකම වකවානුව කාලය කියන ලදී. භික්ෂූන් වහන්සේලා වත්පිළිවෙත් කොට මුව සෝදා පා සිවුරු ගෙන සෑය වැඳ කවර ගමකට යන්නමෝදැයි විතර්ක කරමින් සිටි කාලය වේ. එබඳු කල භාග්‍යවතුන් වහන්සේ රක්ත වර්ණ දෙපට අඳනය ඇඳ, කාය බන්ධනය (පටිය) බැඳ පාංශුකූල චීවරය ඒකාංශ කොට

පවිසිතු කාමො පිඬු පිණිස වැඩිය යුතු යයි සනිටුහන් ඇතිව (සච්චක තෙමේ භාග්‍යවතුන් වෙත එළඹියේය) කවර හෙයකින් පැමිණියේද, වාදාරෝපණය කරන අදහසිනි. ඔහුට මෙසේ සිතුණේල. පළමුව මම නොවියත් බැවින් විශාලා මහනුවරින් මහ සෙනග පිරිවර ගෙන ශ්‍රමණ ගෞතමයන් වෙත ගොස් මතු වූයෙමි. ලජ්ජාවට පත් වූයෙමි. දැන් එසේ නොකොට හුදෙකලාවම ගොස් වාදාරෝපණය කරන්නෙමි. ඉදින් ශ්‍රමණ ගෞතමයන් පරදවන්නට හැකි වන්නෙම් ද, එකල මාගේ ලබ්ධිය ප්‍රකාශ කොට ජය ලබන්නෙමි. ඉදින් ශ්‍රමණ ගෞතමයන් ජය ගත්තේ නම් එකල අඳුරේ රඟපෑ නාඩගමක් මෙන් කිසිවෙක් නො දන්නේ යයි සිතා නිද්‍රා ප්‍රශ්නය නම් ප්‍රශ්නයක් ගෙන වාද කිරීමේ අදහසින් වෙත එළඹියේය.

අනුකම්පං උපාදාය සච්චක නිගණ්ඨ පුත්‍රයාට අනුකම්පා පිණිස ආනන්ද තෙරුන්ට මෙසේ සිතීල. 'භාග්‍යවතුන් වහන්සේ මොහොතක් හෝ වැඩහුන් කල බුද්ධ දර්ශනය ද ධර්මශ්‍රවණය ද ලැබෙන්නේ එය ඔහුට දිගු කලක් හිතසුව සඳහා පවතින්නේය' එහෙයින් භාග්‍යවතුන් වහන්සේ අයැද පාංශුකූල චීවරය සතරට නවා අසුන් පනවා වැඩහුන මැනවැයි ඇරයුම් කළේය. භාග්‍යවතුන් වහන්සේ ද ආනන්ද තෙරුන් වැදගත් දෙයක් ඉදිරිපත් කරන්නේ යයි පැනවූ අසුනෙහි වැඩහුන් සේක්'

භගවන්තං එදතවොච යම්කිසි ප්‍රශ්නයක් කලින් සිතාගෙන සාරය කොටගෙන ආයේ ද, එය තබා පසෙකින් ගෙන හැසිරෙමින් මේ **සන්තිගොතම** ආදී වචන කීහ. **ඵුසන්ති හි** හො ගොතම යනු ඒ මහණ

බමුණෝ සිරුරෙහි උපන් ශාරීරික දුක් වේදනාව ස්පර්ශ කරති. ලබති. විඳිති යන අර්ථයි. **ඌරුකඛමෙහා** කකුල් තද වී සෙලවිය නො හැකි බව, ඌරුස්තද්ධ බව යන අර්ථයි. මෙහි විෂ්මයාර්ථ වශයෙන් **භවිසසති** අනාගත තාල වචනයෙන් දක්වන ලදී. **කායඛයං** හොති යනු කය අනුව ගියේ, ශරීරය වශයෙන් පවතිනුයේ,

කායභාවනා යනු විදර්ශනාව කියනු ලැබේ. එයින් චිත්ත වික්ෂේපයට පැමිණෙන්නෙක් නම් නැද්ද, එහෙයින් නිගණ්ඨ තෙමේ යමක් අවිද්‍යමාන ද අභූත ද, නැත්තේ ද එයම කීය. **චිතතභාවනා** යනු සමථය කියයි. සමාධියෙන් යුත් පුද්ගලයාට කකුල් පණ නැතිවීමක් නැත. මෙසේ නිගණ්ඨයා අභූතයක්ම කීහ. යම්සේ 'භූතපුබබං' කියා, '**ඌරුකඛමෙහා නාම භවිසසති**' ආදිය කියන්නහුට අනාගත රූපය නො සම වේ. සුදුසු නොවේ. එසේ අර්ථය ද සම නො වෙයි. සිදුනොවන දෙයක් නො ඇසූ දෙයක් නැති දෙයක් කීය.

නො කාය භාවනං - පඤ්චතාප තැවීම් ආදී වූ අත්තකිලමථානු යෝගය සඳහා කීය. මේ ඔවුන්ගේ කාය භාවනා නම් වේ. කුමක් හෙයින් ඔහු මෙසේ කියත් ද, හේ වනාහි දිවා කාලයේ විහාරයට එයි. එ සමයෙහි භික්ෂූන් පාසිවුරු සකස්කොට තබා, තමන්ගේ රාත්‍රීස්ථාන දිවාස්ථානයන්හි සමාධියට පැමිණෙති. හෙතෙම ඒ සමාධියට පැමිණෙන්නවුන් දැක, මොව්හූ චිත්තභාවනා මාත්‍රයක යෙදෙති. එහෙත් මොවුන්ට කාය භාවනාවක් නැතැයි සිතා මෙසේ කීය.

එකල භාග්‍යවතුන් වහන්සේ ඔහු මෙහෙයවමින් **කිතතිපන** තෙ අගගි වෙසසන **කාය භාවනා සුතා** යි වදාළහ. හේ එය විස්තර කරමින් **සෙය්‍යථීදං නන්දෝ වච්ඡෝ** ආදිය කීහ. එහි **නන්දෝ** යනු ඔහුගේ නමයි. **වච්ඡෝ** යනු ගෝත්‍රයයි. **කිසෝ** යනු නමයි, **සංකිච්චෝ** යනු ගෝත්‍රයයි. **මකඛලි ගොසාලෝ** පළමු ආයේමය. එතෙ මේ තුන් දෙන, කිලිටි තපස් පිළිබඳව මුදුන්පැමිණි අය වූහ. **උළාරානි උළාරානි** ප්‍රණීත ප්‍රණීත වූ ගාහෙනති නාම බලය ගන්වති නම්. **බෘහෙනති** වඩති. **මෙදෙනති** හටගත් මේදස් ඇති කෙරෙති. **පුරිමං පහායති** පළමු දුෂ්කර ක්‍රියාව හැර, **පච්ඡා උපචිනනති** පසුව ප්‍රණීත කෑම් බීම්වලින් සන්තර්පණය වෙති. **ආචයා පචයෝ හොති** වැඩීම ද නො වැඩීම ද වෙයි.

මෙසේ මේ කායයාගේ වැඩීම් පිරිහීම් පමණක්ම පෙනේ. කාය භාවනාව වූ කලී නො පෙනේයයි දක්වා චිත්ත භාවනාව විචාරන්නේ කිතනි පන තෙ අගගි වෙසසන චිත්ත භාවනා සුතා යයි වදාළහ. සකස්කොට කියන්නට නො හැකි විය. බාල පෘථග්ජනයෝ එසේය.

කුතෙ පන තඞං යම්බඳු තෙපි මෙසේ ඕළාරික වූ දුර්වල භාවනාව නො දනීද, ඒ තෙපි කෙළෙසක නම් සිලිටු වූ චිත්ත භාවනාව දැන ගන්නෙහි ද, මෙතැන්හි වනාහි ශොණරවිය තෙරුන් වහන්සේ 'මේ පදය බුද්ධ වචනය නොවේ යයි' විජිනිපත තබා නික්ම ගියහ. ඉක්බිති ඔහුට 'මහාසිව' තෙරුන් වහන්සේ මෙසේ කීහ. **'දිසසති භිකඛවෙ ඉමසස චාතුමමහා භූතිකසස කායසස ආචයොපි අපචයොපි ආදානමපි නිකඛමනමපි'** මහණෙනි සතරමහා භූතමය වූ මේ කායයාගේ වැඩීම ද නැසීම ද ඉපදීම ද චුතවීම ද දක්නා ලැබේ. ඒ අසා ඕළාරික ශරීරය පරිග්‍රහ කරන්නවුන්ට උපන් විදර්ශනාව ඕදාරික කියන්ට වටීයයි සැළකීය.

සුඛ සාරාගී සැපයෙන් බහුළ රාගයෙන් සමන්විත වූයේ, සුඛාය වෙදනාය නිරොධා උපපජ්ජති, දුකඛා වෙදනා අනතුරුව නො උපදී. සැපදුක් දෙදෙනාගේ අනන්තර ප්‍රත්‍යභාවය පට්ඨානයෙහි දක්වා ඇත. යම්හෙයකින් සැපය නිරුද්ධ නොවූ කල්හි දුක නූපදී. එහෙයින් මෙහි මෙසේ කියන ලදී. **පරියාදාය තිටඨතීති**, ගෙවා ග්‍රහණය කොටගෙන සිටී. **උභතො පකඛං** සැපය එක් (පසෙකය) එක් පැත්තකය. දුක එක් පැත්තකය. මෙසේ දෙපැත්තක් ව,

උපපනනාපි සුඛා වෙදනා චිතතං න පරියාදාය තිටඨති භාවිතතතා කායසස උපපනනාපි දුකඛා වෙදනා චිතතං නපරිදාය තිටඨති භාවිතතත චිතතසස මෙහි කාය භාවනා නම් විපස්සනාවයි. චිත්ත භාවනා නම් සමාධියි. විදර්ශනාව සුවයට විරුද්ධ වූයේ දුකට ආසන්න වූයේ වෙයි. සමාධිය දුකට විරුද්ධ වූයේ සැපයට සමීප වෙයි. කෙසේද?

විදසුන් පිහිටුවා උන්නහුට කල් යාමෙන් ඒ ඒ තැන ගිනි නැගීමක් මෙන් වෙයි. කිහිලිවලින් දහඩිය ගලයි. මුදුනෙන් ගිනි වැටි වැටීමක් මෙන් වෙයි. සිත පෙළෙයි. වෙසෙසින් පෙළෙයි. සැලෙයි. මෙසේ විදර්ශනා සැපයට විරුද්ධව දුකට ආසන්න වේ. කායික හෝ චෛතසික වූ දුක උපන්කල, ඒ දුක යටපත්කොට සමවතට සමවදින්නහුට සමාපත්තියට

සමවැදුණු කෙණෙහි දුක දුරට පහව යන්නේ වේ. අනල්ප වූ සැපය පැමිණෙයි. මෙසේ සමාධිය දුකට විරුද්ධ වූයේ, සැපයට ආසන්න වේ. මෙසේ විදර්ශනාව සුවයට විරුද්ධ වී දුකට ආසන්න වේද, සමාධිය එසේ නොවේ. දුකට විරුද්ධ වී දුකට ආසන්න වේද, සමාධිය එසේ නොවේ. දුකට විරුද්ධ වී සැපයට ආසන්න වේ. විදර්ශනාව එසේ නොවේ. **උපපනනා සුඛා වෙදනා චිතතං න පරියාදාය තිට්ඨති භාවිතතතා කායසස උපපනනාපි දුකඛා වෙදනා චිතතං න පරියාදාය තිට්ඨති භාවිතතතා චිතතසසා** යනු එහෙයින් කියන ලදී.

ආසජජ උපනාය යනු ගුණයෙහි ගටාත් එළවති. **තං වත මෙ** ඒකාන්තයෙන් මගේ මේ සිත **කිරහි නොසියා අගගිවෙසසන, අග්නි** වෙස්සන, කිම නොවන්නේ ද, වන්නේම ය. මෙවැනි අදහස් හැඟීම් ඇතිකර නොගන්න. මට සැප වූද දුක් වූද වේදනා උපන්නේ ම ය. එසේ වුවත් ඒ උපන් වේදනාවට මගේ සිත මැඩලන්නට නො දෙමි.

දැන් ඔහුට ඒ කරුණු ප්‍රකාශ කරනු පිණිස මත්තෙහි සතුට ගෙනෙන ධර්ම දේශනාව දෙසනු කැමැත්තේ, මුල පටන් මහාභිනිෂ්ක්‍රමණයේ පටන් ආරම්භ කළේය. එහි **ඉධ මෙ අගගිවෙසසන පුබෙබව සමෙබාධා -පෙ- තත්‍රෙව නිසීදිං අලමිදං පධානාය** මේ සියල්ල කලින් පාසරාසි සූත්‍රයේ කී පරිද්දෙන් දතයුතුයි. මේ විශේෂයයි. එහි බෝපලඟ සිටය, මෙහි දුෂ්කර ක්‍රියාවේ සිටය.

අලලංකටඨං අමු දිඹුල් අත්තක්, **සසෙනහං** කිරි වැහෙන කාමෙහි. වස්තුකාමයන් විසින්, **අවුපකටෙඨා** පහ නො වූයේ, **කාමචඡනෙදා** යනාදියෙහි ක්ලේශ කාමය කැමතිවීම් වශයෙන් **ඡනෙදා ඡඳ** නම්. ආදරය කිරීම් වශයෙන් **සෙනහ** නම්.

වශයෙන් **මුචඡා** නම්. **තිබභවීම්** වශයෙන් **පිපාසා** නම්. දැවීම් වශයෙන් **පරිළාහො** යනුයි දතයුතු. **ඔපකකමිකා** උපක්‍රමයෙන් උපදවන ලද **සඳාණුදසසනාය අනුතතරාය සමෙබාධාය** මේ සියල්ල නිර්වාණයට සමාන වචනයි.

දැන් වනාහි උපමා උපමේය සැසඳීම දක්වයි.

කිරි සහිත අමු දිඹුල් අතු කැබැල්ලක් මෙන් ක්ලේශ කාමය හේතු කොටගෙන, වස්තු කාමයෙන් නො නික්මුණු පුද්ගලයා වේ. දියෙහි එබූ බව මෙන් ක්ලේශ කාමයෙන් තෙත් බව වෙයි. ඇතිල්ලීමෙන් ද ගිනි නො ඉපදීම මෙන් ක්ලේශ කාමය හේතුකොටගෙන වස්තු කාමයෙන් බැහැර නොවූවන්ගේ උපක්‍රමයෙන් උපදවන ලද, වේදනාවලින් නිවන්මග නො ලැබීම වෙයි. ඇතිල්ලීමක් නැතිවද ගිනි නො ඉපදීම මෙන් ඒ පුද්ගලයන්ගේ උපක්‍රමයෙන් උපදනා ලද වේදනාවලින් වෙන්ව ද නිවන්මග නො ලැබීම වෙයි. දෙවෙනි උපමාව ද මේ ක්‍රමයෙන් ම දතයුතුය. මෙය වූ කලී විශේෂයයි. පළමු කියන ලද්ද වූ දරු අඹුවන් සහිත ප්‍රව්‍රජ්‍යාව පිළිබඳ උපමායි. පසුව කියන ලද්ද බ්‍රාහ්මණ ධාර්මික ප්‍රව්‍රජ්‍යාව පිළිබඳවයි.

තුන්වෙනි උපමාවෙහි **කොලාපං** සිඳුණු තෙත ඇති, දිය රහිත වූ, **ථලෙ නිකඛිතතං** යනු ගල් තලාවෙහි හෝ පොළොව තලයෙහි බහාලන ලද, එහි ද මේ උපමා සන්සන්දනයයි. වියලුණු කොලපුවක් මෙන් ක්ලේශකාමය හේතුකොටගෙන වස්තුකාමයෙන් නික්මුණු පුද්ගලයා වෙයි. ජලයෙන් වෙන්කොට ගොඩබහාලූ බව මෙන් ක්ලේශකාමයන් නො තෙත් බව වෙයි. ඇතිල්ලීමෙන් ගිනි ඉපදීම මෙන් ක්ලේශකාමය හේතුකොට ගෙන වස්තු කාමයෙන් බැහැර වූවන්ගේ අම්හොකාසික නේසජ්ජිකාදී වශයෙන් උපක්‍රමයෙන් උපදවන ලද්දා වූද, වේදනාවලින් ලොව්තුරා මග ලැබීම වෙයි. නො ඇතිල්ලීමෙන් අනෙක් ගසක වියලි අත්තක් සමග ගැටීම් පමණකින්ම ගිනි ඉපදීම මෙන් උපක්‍රමයෙන් උපදවන ලද වේදනාවලින් වෙන්ව සුව වූ පිළිවෙතින් ම ලොව්තුරා මග ලැබීම වේ යයි මේ උපමාව භාග්‍යවතුන් වහන්සේ විසින් තමන් උදෙසා කියන ලදී.

දැන් තමන්ගේ දුෂ්කරක්‍රියාව දක්වන්නේ **තසසමයහං** ආදිය වදාළහ. කිමෙක්ද භාග්‍යවතුන් වහන්සේට දුෂ්කර ක්‍රියා නො කොට බුදුවන්නට නො හැක්කේ ද, සමත් නොවන්නේ ද, දුෂ්කර ක්‍රියා කොට ද නොකොට ද සමර්ථයහ. එසේ නම් කුමක් නිසා දුෂ්කර ක්‍රියා කළේ ද, 'දෙවියන් සහිත ලෝකයාට තමන් දක්වන්නෙම්, තව ද ඒ වීර්යයෙන් කෙලෙස් ඇලලීම් ගුණය මා සතුටු කරවන්නේ ය' යුද හමුදාව ගෙන සංග්‍රාමයේ යෙදී දෙතුන් වරක් යුද්ධ කොට සතුරන් නසා පැමිණි යම් රජෙක් වේද, ඔහු රජ මැදුරේ සිට පරපුරෙන් උරුමයෙන් ආ රජය ලැබ සතුටු වූයෙක් නොවේමය. සටන්කොට රජය ගෙන රජසිරි වළඳන රජු තමන්ගේ

බලපරාක්‍රමය සිහිකොට, 'අසවල් අසවල් තැන්හි යුදකොට අසවල් අසවල් සතුරන් නසා අසවල් අසවල් රජුන් පරාජය කොට රජසිරි පැමිණියෙමි යි සිතන්නහුට බලවත් සොම්නසක් උපදී. එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ ද දෙවියන් සහිත ලෝකයාට පරාක්‍රමය දැක්වීමෙන් ඒ පරාක්‍රමය මා අතිශයින් සතුටු කරවන්නේ ය. සොම්නස් උපදවන්නේ යයි දුෂ්කරක්‍රියා කළහ. තව ද පශ්චිම ජනතාවට අනුකම්පාවෙන් කළ සේක. භාග්‍යවතුන් වහන්සේ චතුරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පෙරම් පුරා ද ප්‍රධන් වීර්යය කොටම බුද්ධත්වයට පැමිණියේය. අප ද ප්‍රධන් වීර්යය කටයුතුම යයි පශ්චිම ජනතාව සිතන්නේ ය. එසේ ප්‍රධන් වීර්යය කිරීමෙන් ම ජාති ජරා මරණ කෙළවර කළ යුතුයයි පශ්චිම ජනතාවට අවබෝධ කිරීමට අනුකම්පාවෙන්ම දුෂ්කර ක්‍රියා කළහ.

දනෙතහි දනත මාධාය යට දත උඩ උඩු දත තබා **චෙතසා චිතතං** කුසල් සිතින් අකුසල් සිත, **අහි නිගගණ්හය්‍යං** නිග්‍රහ කෙරෙම් නම්, **අභිනිපපීලෙය්‍ය** වෙලම් නම් **අභිසනතාපෙය්‍ය** තවා වීර්යයෙන් අලලන ලද්දක් කෙරෙම් නම් **සාරදෙධා** වෙහෙස සහිත වූයේ **පමානාහි භූතනසස** වීර්යයෙන් මඩන ලද්දහුගේ, **අපපාණකං** ආශ්වාස රහිත වූ, **කමමාර** ගඟඟරියා කම්මල්කරුගේ මයිනහම, **භීස** වෙදනා හොනති කිසි තැනෙකින් නික්මෙන්නට නො හැකි වාතය, නිසා උපදවන ලද හිසේ කැක්කුම වෙති. **සීස** වෙඨං දදෙය්‍ය හිස් වෙළුමක් දෙන්නේ ය.

දේවතා බෝසතුන්ගේ සක්මන් කෙළවර හාත්පස අධිගෘහිත දේවතාවෝ, එදවස බෝසතුන්ට අධිමාත්‍ර වූ ශාරීරික දාහය උපන් වේලේ මූර්ඡාව උපන්නේ ය. බෝසත්හු සක්මනෙහිම සිටියදී වැටුණාහු ල, ඒ දුටු දේවතාවෝ මෙසේ කීහ. **විහාරොතෙවෙසො අරහතො** රහත්හු නම් මෙබඳුම වෙති. මළවුන් සමාන වෙති. පිළිගැනීමෙන් කීහ. එහි සමහර දේවතා කෙනෙක් **කාලක නොති ආහංසු** කළුරිය කළේ යයි කීහු. ඔව්හූ ගොස් ඔබගේ පුතා කළුරිය කළේ යයි සුද්ධෝදන රජට කීහ. මාගේ පුත්‍රයා බුදු වී කළුරිය කළේ ද? එසේ නොවේදැයි ඇසීය. බුදුවන්නට නො හැකි විය. ප්‍රධන් වීර්යය වඩද්දී කලුරිය කළේය. එය මම නො අදහමි. මගේ පුතා බෝධියට නො පැමිණ කළුරිය කරන්නේ නැත.

පසුකාලයෙහි දම්සක් පවත්වා පිළිවෙළින් රජගහ නුවරට ගොස් කපිලවත්තු පුරයට පැමිණ බුදුන් වහන්සේට සුදොවුන් රජු ප්‍රාසාදයට

නංවා කැඳ පිළිගන්වා බතට පෙර, මේ පුවත (සුදොවුන් රජු තථාගතයන්ට) දැන්වීය. භාග්‍යවතුන් වහන්ස, නුඹවහන්සේ ප්‍රධන් වීර්යය කරන දවස්වල දේවතාවෝ ඇවිත් මහරජ, නුඹේ පුතා කළුරිය කළේ යයි මට කීහ. මහරජ, එය ඇදහීද? භාග්‍යවතුන් වහන්ස, මම නො ඇදහීමි. මහරජ, දැන් සිහින පිළිගැනීමේ පටන් ආශ්චර්ය දේ දකිමින් ම මේ කීම කෙසේ අදහයිද? මම බුදු වූයෙමි. ඔබද බුදුන්ට පිය වූයෙහිය. අතීතයේ මා මෝරා ගිය නුවණක් නැතිව සිටියදීම, බෝධිචර්යාවෙහි හැසිරෙන කාලයේ ධර්මපාල කුමාර කාලයේ ශිල්ප උගන්නට ගිය කල්හි 'තොපගේ පුත් ධර්මපාල කුමරු මළේය. මෙන්න ඇට' යයි එළු ඇට ගෙනැවිත් දැක් වූ දවසේ දී, 'මපුතුන්ගේ අඩු වයස් මරණයක් නම් නැත. මම නො අදහමි'යි කියා නො ඇදවූහ'යි ධර්මපාල ජාතකය දක්වා අතීත අර්ථෝත්පත්තිය විස්තර කළහ.

මා ඛො තවං මාරිස යනු අතිශය කැමැත්තෙන් කීහ. යම් මේ 'මාරිස' යන වචනය දෙවිවරුන්ගේ ප්‍රියමනාප වචනයක් ල. **අජඳුකං** නො වැළඳීම **හලනති** වදාමි 'අලං' යයි කියමි. මෙයින් කම් නැත. එසේ නො කරව. මම යැපෙන්නෙමි. ආහාර නො ගැනීමෙන් වළකිමි යන අර්ථයි. **මංගුරවඡවි** මගුරු මසෙකුගේ සිවිය, **තාව පරමං** ඒ වේදනාවන්ට මෙයම පරම වූ ප්‍රමාණයයි.

පිතුසකකසස කමමනෙත -පෙ- පඨමජඣානං උපසමපජජ විහරිතා යනු පියරජුගේ වප්මගුල් දවසක් විය. එදවස විවිධ වූ කෑම් බීම් ද්‍රව්‍ය පිළියෙළ කරති. නගරයේ වීදි පිරිසිදු කරවා පුන්කලස් තබා, ධජ පතාක ඔසවා මුළු මහත් නගරයම දෙව් විමනක් මෙන් අලංකාර කරති. සරසති. සියලු දැසි දස් කම්කරුවෝ, අලුත් රෙදි පිළි හැඳ සුවඳ මලින් සැරසී රජගෙදරට එක්රැස් වෙති. මේ රාජකීය කෘෂි කර්මාන්තය සඳහා නගුල් දහසක් යොදයි. එදවස්හි එකක් අඩු අටසියයක් නගුල් යොදවති. සියලු නගුල් සමග ගවයන් ද ජානුස්සොණි බමුණාගේ රථය මෙන් රිදී පැහැයෙන් අලංකාර කරති. රජුගේ නගුල රත්රනින් සරසන ලදී. ගවයන්ගේ අං ද, රැහැන් හා කෙවිටි ද රන්වන්ව සරසති. රජු මහ පිරිවරින් පිටත්වන්නේ පුතාවද ගෙන පිටත්විය.

සී සාන කුඹුර අසල, මනාව වැඩුණු කොල ඇති සිසිල් සෙවණ ඇති දඹගසක් යට යහනක් පනවා රන්වන් තරුවලින් විසිතුරු කළ

වියනක් බඳවා සතර වටේට තිර ඇද වටකොට, රැකවරණ යොදා රජු සියලු ආභරණයෙන් සැරසී දැකුම්කළුව, ඇමති සමූහයා පිරිවරා සී සානා තැනට ගියහ. එහිදී රජු රන් නගුල ගත්තේය. ඇමතිවරු හත්සිය අනූනවය රිදී නගුල් ගත්හ. ගොවියෝ සෙසු නගුල් ගත්හ. ඔව්හු ඒ නගුල් එහා මෙහා සාති. රජතුමා මේ කෙළවරේ සිට එහාට යති. එහා කෙළවරේ සිට මෙහාට එති. මෙතැන මහා උත්සව සිරියත් ගත්තේය. බෝසතුන් පිරිවරා සිටි කිරි මව්වරු 'රජුගේ උත්සවශ්‍රීය බලන්නෙමු'යි ඇතුළු තිරවලින් පිටතට නික්මුණහ.

බෝසත්හු වටපිටාව බලන්නේ කිසිවෙකු නො දැක, සයනයෙන් නැගිට පලක් බැඳ හුස්ම ඉහළ පහළ ගැනීමේ (ආනාපාන සතිය) පළමුවන දැහැන වැඩූහ. කිරිමව්වරු කමින් බොමින් ප්‍රීතිවෙමින් මදක් කල් යැවූහ. අනෙක් ගස්වල ඡායාව සෙවණැලි නැවතී දඹරුකේ සෙවණට පරිමණ්ඩලව කවාකාරව පිහිටියහ. කිරිමව්වරු ආර්යපුත්‍රයා කුමාරයා තනිවම නොවේදැයි, වහා තිරය ඔසවා බැලූහ. ඔව්හු ඇතුළ පිවිසෙන්නාහූ බෝසතුන් යහන මත ඌරුබද්ධාසනව සිටිනු දැක වහාම ගොස් රජුට දැන්වීය. මහරජතුමනි, කුමාරයා මෙසේ හුන්නේ ය. ගස්වල සෙවණ දඹරුක හාත්පස වැටී තිබේ. රජු වහ වහා ගොස් මේ පෙළහර දැක 'පුත නුඹට මේ දෙවන වැඳුම'යයි පුතුට වැන්දහ. **'පිතු සකකස්ස කම්මනෙත -පෙ- පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරිතා'** යනු එහෙයි කියන ලදී.

සියානුඛො එසො මගෙගා බෝධාය මේ ආනාපාන සති පළමුවන ධ්‍යානය සිව්සස් අවබෝධය පිණිස මාර්ගය වන්නේදැයි **සතානුසාරී විඤ්ඤාණං** මේ දුෂ්කර ක්‍රියාව (අත්තකිලමත්ථානු යෝගය) සත්‍යාවබෝධයට මාර්ගය නො වන්නේය. ආනාපානසති ප්‍රථමධ්‍යානය එයට මාර්ගය වන්නේ යයි.

පචුපටඨිතා හොනති පන්සල්මළුව හැමදීම් ආදී වත් කිරීමෙන් එළඹ සිටියාහූ, **බාහුලිකතො** ප්‍රත්‍ය බහුලකොට ඇත්තේ, **ආවතෙතාබාහුලලය** රජයෙහි ගිජු වී ප්‍රණීත පිණ්ඩපාතය සඳහා පෙළඹුණෝ, **නිබ්බිජ්ජ පකකමිංසු** උකටලීව ධර්ම නියමයෙන් පළා ගියාහුය. බෝසතුන් සම්බෝධියට පත් වූ පසුව කාය විවේකයට අවස්ථාව ඉඩකඩ ලබාදීම් වශයෙන් ස්වභාව ධර්මතාව අනුව පළා ගියාහුය. වෙන තැනක නොගොස් බරණැසටම ගියාහුය. බෝසත්හු ඔවුන් ගිය කල්හි අඩ මසක්

කාය විවේකය ලබා බෝමැඩ පරාජිත නොවන්නා වූ පලඟෙහි වැඩහිඳ සර්වඥතාඥානය අවබෝධ කරගත්හ. විවිචෙව්ව කාමෙහි ආදී වශයෙන් භයභේරව සූත්‍රයෙහි විස්තර කරන ලද ක්‍රමයෙන් දතයුතුයි.

අභිජානාමි ඛො පනාහං යන්න වෙනම අනුසන්ධියෙකි. නිගණ්ඨයා මෙසේ සිතයි. මේ ශ්‍රමණ භවත් ගෞතමයන්ගෙන් මම එක පැනයක් විමසුවෙමි. ශ්‍රමණ ගෞතමයෝ 'අපරාපි මං අගහි වෙසසන අපරාපි මං අගහිවෙසසන', කෙළවරක් නො දක්වමින් වදාරමින් සිටී. ඔහු කිපියාහුද, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අග්ගිවෙස්සන! සිය දහස් ගණන් දෙනාට බණ කියන කල්හි තථාගතයන් කිපියේ යයි කියූ කිසි කෙනෙක් නැත. අන්‍යයන්ගේ අවබෝධය පිණිස ප්‍රතිවේධය පිණිස තථාගතයෝ ධර්ම දේශනා කරති'යි දක්වමින් මෙම දේශනාව ආරම්භ කළේය.

එහි ආරබභා සඳහා **යාවදෙවා** ප්‍රයෝජනවත් වන අයුරින් බෙදා දැක්වීමයි. නියම කිරීම දක්වන ලදී. අනුන්ට ධර්මාවබෝධය ලබාදීමට තථාගතයන්ගේ ධර්මදේශනා කිරීමෙහි ප්‍රයෝජනයයි. එහෙයින් එක් අයෙකු සඳහාම නො දෙසයි. අවබෝධ කිරීමට යම්තාක් දෙනා ඇත්නම් ඒ සියල්ලන් සඳහා දේශනා කරයි.

තසමිං යෙව පුරිමසමිං යනු මෙහි කුමක් දක්වත්ද, සච්චක තෙමේ සිතයි. ශ්‍රමණ ගෞතමයෝ සිත්ගන්නා සුළුය. දුටුවන් පහදින්නේ ය. දෙතොල මනා සේ පිහිටා ඇත්තේ ය. දිව මොළොක්ය. මිහිරි ශබ්ද කිරීම් ඇත්තේය. හඬ ඇත්තේය. බස මිහිරිය. පිරිස තමන් වෙත රඳවා ගැනීමෙහි සමත්ය. මගේ වනාහි සිතේ එකඟ බව නැති. ඉක්බිති ඔහුට භාග්‍යවතුන් වහන්සේ ගිනි වෙස්න, තථාගතයන් පිරිස රඳමින් නො හැසිරෙති. සක්වල කෙළවර කොට ඇති සියලු පිරිසට තථාගතයෝ දහම් දෙසති. (ඒ පිරිස් කෙරෙහි) වෙසෙසින් නො ඇලුනාහු, පැමිණද නොඇලුනාහු ඒකාන්තයෙන්, අසහාය විහරණ ඇතිව, ශූන්‍යතා ඵල සමාපත්තියෙහි යෙදුනාහු දහම් දෙසති.

අජඣත්තමෙව ගෝචරාධ්‍යාත්මයෙහි ද, **සන්නිසාදෙමි** හිඳුවමි. තථාගතයෝ ධර්මය දෙසද්දී, මිනිසුන් යම් ඇසිල්ලක සාධුකාර දෙයිද, ඒ ඇසිල්ලෙහි පූර්වභෝගයෙන් පිරිසිඳ ඵලසමාපත්තියට සමවදිති. සාධුකාර ශබ්දයාගේ නාදය නො සුන් කල්හිම සමවතින් නැගිට, නැවැත්වූ තැන

සිට නැවත ධර්ම දේශනා කරති. බුදුවරුන්ගේ භවාංගයෙහි විසීම ඉතා සුළු වේලාවක් වේ. ආශ්වාස වාරයක් පාසා ඵල සමාපත්තිහි යෙදෙයි. **යෙන සුදං නිච්ච කපපනති** යම් ශූන්‍යතා ඵල සමාපත්තියෙහි යෙදී නිරතුරුව වෙසේද, ඒ සමාධි නිමිත්තෙහි සිත මනාකොට පිහිටුවමියි දක්වයි.

ඔකපප නියමෙතං මෙය ඇදහිය යුතුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ එකඟ සිත් ඇති බව පිළිගෙන, දැන් තමන් විසින් පිළියෙළ කොට සඟවා ගත් ප්‍රශ්නයේ සාරය පුළුවුස්නේ (විමසන්නේ) **අභිජානාති පන භවං ගොතමො දිවා සුපිතා** යනු කීය. යම්සේ සුනඛයෙක් නොමුසු කිරෙන් පිසූ කිරිබත් ගිතෙලින් අනා බඩ පුරා කවන ලද්දේ නමුත්, අසූචි දැක නොකා යන්නට නොහැකි වේද, කන්නේ නැතිනම් ඉව අල්ලා බලාවත් යන්නේද, තව ද ඉවවත් අල්ලා නො ගියහොත් ඔහුගේ හිස රුදා කෙරේල. එපරිද්දෙන් මේ සච්චක හට ද ශාස්තෘන් වහන්සේ නොමුසු කිරිබතක් වැනි අභිනිෂ්ක්‍රමණයේ පටන් ආශ්‍රවක්ෂය කිරීම දක්වා වූ පැහැදිය යුතු ධර්මය දෙසූ සේක. එතකුදු වුවත් ඒ දහම් දෙසීම අසාත් තථාගතයන් කෙරෙහි පැහැදීමක් නුවූයේ ය. එහෙයින් තමන් සිතේ සඟවාගෙන ආ ප්‍රශ්නය නො විචාරා යන්නට නො හැකි වන්නේ මෙසේ කීය.

ඉක්බිති යම්හෙයකින් ථීනමිද්ධය සියලු ක්ෂීණාශ්‍රවයන් ගේ රහත් මගින්ම ප්‍රහීණ වේද, කාය දරථය උපාදින්නක කායයෙහිත් අනුපාදින්නක කායයෙහිත් ඇතිවේද, පියුම්, උපුල් ආදිය එක් කලෙක පිපෙති. එක් කලෙක පරවෙති. සමහර ගස්වල කොල සවසට මැලවෙති. උදයට පිබිදෙති. එපරිද්දෙන් උපාදින්න කායයාගේ දරථය ද විඩා වශයෙන් භවාංග ස්‍රොතය ද මෙහි නිද්දා යන්නෙන් අදහස් කරන ලදී. එය ක්ෂීණාශ්‍රවයන්ට ද එසේම වේ. ඒ සඳහා **අභිජානාමතං** යනාදිය කීහ. **සමෙමාහ විහාරසමිං වදනති** මුළා විහරණයකැයි කියති.

ආසජ්ජ ආසජ්ජ ගට ගටා **උපනීතෙහි උපනීතෙහි** එළව එළවා කියන ලද වචනපථෙහි වචනයන් විසින් **අභිනන්දිත්වා, අනුමොදිත්වා** සිතින් පිළිගනිමින් සතුටුව, වචනයෙන් ප්‍රශංසා කරන්නේ **අනුමෝදන්ව,**

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ නිගණ්ඨයාට සූත්‍ර දෙකක් වදාරණ

ලදී. පළමු සූත්‍රය එක් බණවරෙක. මෙය දෙ අඩ බණවරකි. මෙසේ අඩු තුන් බණවරක් අසාත් මේ නුවටුවා අධිගමයට නො පැමිණියේය. සරණයෙහි නො පිහිටියේය. මොහුට භාග්‍යවතුන් වහන්සේ කුමක් හෙයින් දහම් දෙසූ සේක්ද, අනාගතයෙහි යහපත සඳහාය. භාග්‍යවතුන් වහන්සේ එය දුටු සේක. මොහුට දැන් වැඩක් නැත. එහෙත් පිරිනිවනින් පසු අවුරුදු දෙසීයක් ඇවෑමෙන් තම්බපණ්ණි දීපයේ බුදු සසුන පිහිටන්නේ ය. එහි මොහු එක් කුලගෙයක ඉපිද, පැවිදිව ත්‍රිපිටකය උගෙන විදසුන් වඩා සිව්පිළිසිඹියා පත් රහත්බවට පැමිණ කාලබුද්ධ රක්ඛිත නම් ක්ෂීණාශ්‍රවයන් වන්නේ ය. මේ අනාගත වාසනාව සම්පත බලා දහම් දෙසූ සේක්.

හෙතෙමේ ද තම්බපණ්ණි දිවයිනේ සසුන් පිහිටි කල දෙව්ලොවින් චුතව දකුණුගිරි වෙහෙර ගොදුරු ගමෙහි එක් ඇමති කුලයක උපන්නේ, පැවිදි වී වීමට සුදුසු සමයේ පැවිදිව, ත්‍රිපිටක බුද්ධවචනය අසා උගෙන, සංඝ සමූහයා පිරිවර කොට ඇතිව උපාධ්‍යායන් වහන්සේ දක්නට ගියේය. ඉක්බිති උපාධ්‍යායයන් වහන්සේ අතවැසියාට චෝදනා කරමින්, ත්‍රිපිටක ධර්මධරව පැමිණි ඔහු සමග කථා නො කළේය.

හෙතෙම සවස්භාගයේ තෙරුන් සමීපයට ගොස් ස්වාමීනි, මා ත්‍රිපිටක ග්‍රන්ථධරව ඔබවහන්සේ සමීපයට ආ වේලේ සිනා සී කථාවක්වත් නො කරයි. මගේ කවර දෝෂයක්දැයි විචාළේය. උපාධ්‍යායයන් වහන්සේ මෙසේ වදාළහ. ඇවැත් බුද්ධරක්ඛිතයෙනි, ඔබ ත්‍රිපිටකධාරී වූ පමණින් ප්‍රව්‍රජ්‍යා කෘත්‍යය සම්පූර්ණ කළේයයි සිතන්නේද, ස්වාමීනි කුමක් කරන්නේද, 'සමූහවාසය අත්හැර, ප්‍රපඤ්චයන් සිඳ වාකිරිගල විහාරයට (වාත=වා, කසිතපබ්බතවිහාරං - කිරිගල්පව් වෙහෙර) ගොස් මහණදම් පුරව. හෙතෙම උපාධ්‍යායයන් වහන්සේ ගේ අවවාදය පිළිගනෙ එසේ විදසුන් වඩා සිව්පිළිසිඹියාපත් මහරහත් බවට පැමිණ රාජපූජිතව මහා සඟ ගණ පිරිවරා සෑගිරි) පව්වෙහි විසීය.

එකල තිස්ස මහාරජු උපසම්පදා කර්මය කරවන්නේ චේතිය පර්වතයේ රාජලෙණෙහි වසයි. සද්ධාතිස්ස රජු තෙරුන්ගේ උපස්ථායක භික්ෂුවක් මගින් මෙසේ දැන්වීය. 'යම් කලෙක බුද්ධරක්ඛිත හිමියන් දහම් පැන විසඳන්නේ ද, එ දවස මට ද දැනුම් දෙන්නැයි කීය. අද මගේ පැණ විසඳන දවසයි. බණ ද කියන දවසයි. මේ පණිවුඩය රජුට දෙන්නැයි කීහ. තෙරුන් වහන්සේ ද එදින ධර්මශ්‍රවණය සඳහා භික්ෂූන් රැස්වූ කල්හි,

භික්ෂු සංඝයා පිරිවරා කණ්ටක චෛත්‍ය මළුවට පැමිණ සෑය වැඳ කලුතිඹිරි රුක්මුල සිටියේය. ඉක්බිති එක් පිණ්ඩපාතික තෙර නමක් කාලකාරාම සූත්‍රයෙන් ප්‍රශ්නයක් විචාළේය. ස්ථවිරයෝ ඇවැත්නි, අද බණ කියන දවස නොවේද, එසේය ස්වාමීනි. අද බණ කියන දවසයි. එසේනම් ආසනයක් ගෙන එන්නැයි කියා, මෙහිම ඉඳගෙන ධර්ම ශ්‍රවණය කරන්නෙමියි, ඒ ගසමුලම අසුන් පණවා දුන්හ. ස්ථවිරයන් වහන්සේ පූර්වගාථා වදාරා කාලකාරාම සූත්‍රයෙන් ධර්ම දේශනාව ඇරඹීය.

උන්වහන්සේ උපස්ථායක තෙරණ ඒ බව රජුට දැන්වීය. රජු පූර්ව ගාථාව අවසන් වන්නට කලින්ම එහි පැමිණියේය. පැමිණ අප්‍රසිද්ධ වේශයෙන් පිරිස් කෙළවර සිට තුන්යම පුරා ධර්මය අසා, තෙරුන් වහන්සේ 'ඉදමවොච භගවා'යි කී කල්හි රජු සාධුකාර දුන්නේ ය. තෙරුන් වහන්සේ ඒ රජු බව දැන මහරජ, කොයි වේලේ ආවේද ඇසීය. ස්වාමීනි, පූර්වගාථා අවසන් වන්නට පෙර පැමිණියෙමි යි කීය. මහරජ, ඔබ විසින් මහා අමාරු දුෂ්කර කාරියක් කළේය. නැත ස්වාමීනි, එවැනි දුෂ්කර කාර්යයක් නොවේ. යම්කිසි අයුරකින් ආර්යයන් වහන්සේ බණ දේශනාව ඇරඹූ තැන් සිට එක පදයක්වත්, මට අමතක වී ගියේ නම් මේ තම්බපණ්ණි දීපයේ එක් කෙවිටක් ගහන ප්‍රමාණයකද මගේ රජ බවක් නොවේවයි දිවුළේය.

ඒ සූත්‍රයෙහි බුදුගුණම විස්තර කර දක්වන ලදී. එහෙයින් රජතුමා විචාළහ. ස්වාමීනි, බුදුගුණ මෙතෙක්මද, නොහොත් තවත ඇත්ද, මහරජ, මා විසින් කියන ලද්ද ටිකය. නොකියූ බුදුගුණ බොහෝය. උපමාවක් කිව මැනවි. අමුණු දහසක් පමණ වූ හැල්කෙතක එක හැල් කරලකට වඩා ඉතිරි හැල් බොහෝ වෙත්ද, එපරිද්දෙන් මා කී ගුණ ටිකය. ඉතිරි ගුණ බොහෝය. ස්වාමීනි, තවත් උපමාවක් කිව මැනවි. මහරජ, යම්සේ සැඩ පහරින් පිරුණු මහා ගංගාවෙහි, ඉදිකටු සිදුරක් තරම් කාණුවක් ගිය දිය ටිකක් වේද ඉතිරි දිය බොහෝ වේ ද එපරිද්දෙන් මා විසින් කී ගුණයෝ ටිකය. මා විසින් නොකී ගුණයෝ බොහෝ වෙති. ස්වාමීනි, තවත් උපමාවක් කියනු මැනවි. මහරජ, වැහිලිහිණි අහසේ පියාසර කරන තැන් බොහෝ වේද, අහස බොහෝ වේද, ස්වාමීනි, කුමක් වදාරයි ද, වැහිළිහිණියා පියාපත් සරණ තැන් ඉතා ටිකය. අහස බොහෝය. එපරිද්දෙන් මහරජ, මා කී බුදුගුණ ඉතා මදය. සෙසු ගුණයෝම බොහෝය.

ස්වාමීනි මනාකොට පැහැදිලිව කියන ලද්ද අනන්ත වූ බුදුගුණ අනන්ත වූ අහස සමගම සසඳන ලදහ. අපි ඔබවහන්සේට පැහැදුනෙමු. එසේ වුවත් සුදුසු පූජාවක් කරන්නට නො හැක්කෙමි. මගේ මේ දුගී පූජාවෙක. මේ සියක් යොදුන් තම්බපණ්ණි දිවයිනේ රාජ්‍යය ඔබවහන්සේට පුදමි. මහරජ, ඔබ විසින් පැහැදුනු ආකාරය කරන ලද, අපට තොප දුන් රජය තොපටම දෙමි. මහරජ, දැහැමෙන් සෙමෙන් රජය කරනු මැනවි.

සයවැනි වූ මහා සච්චක සූත්‍ර වර්ණනාව නිමියේය.

1-4-7

එවමෙමසුතං චූළ තණ්හාසංඛය සූත්‍රයයි. එහි පුබ්බාරාමේ මිගාරමාතු පාසාදෙ පූර්වාරාම නම් විහාරයේ මිගාර මව විසින් කරවන ලද ප්‍රාසාදයෙහි, මේ එහි අනුපිළිවෙළ කථාවයි. යටගිය දවස කල්ප ලක්ෂයකින් මත්තෙහි එක් උපාසිකාවක් පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කොට, බුදුන් ප්‍රමුඛ මහා සංඝයාට දන් දී භාග්‍යවතුන් වහන්සේගේ පාමුල වැඳ වැටී මතු දවසක ඔබවහන්සේ වැනි බුදුවරයකුගේ අග්‍ර උපස්ථායිකා වෙමියි ප්‍රාර්ථනා කළාය.

ඕ තොමෝ කල්ප ලක්ෂයක් දිව්‍ය මනුෂ්‍ය ලෝකයන්හි සැරිසරා අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි භද්දිය නුවර මෙණ්ඩක සිටු ගේ පුත් වූ ධනංජය සිටුගේ ගෙයි සුමනා දේවියගේ කුසෙහි පිළිසිඳ ගත්තීය. උපන් දවස්වලම ඇයට විසාඛා යයි නම් තැබීය. ඕ තොමෝ, භාග්‍යවතුන් වහන්සේ භද්දිය නුවරට වැඩම වූ දිනයේ, පන්සියයක් දැරියන් සමග පෙරගමන් ගියහ. බුදුන්ගේ පළමු සමුවීමේදීම සෝවාන් ඵලයට පැමිණියාය. වියපත් වූ කල්හි සැවැත්නුවර මිගාර සිටුවරයාගේ පුත් වූ පුණ්‍යවර්ධන කුමාරයාගේ ගෙට ගියාය. (විවාහ වූවාය) එහිදී ඇයව මිගාර සිටුවරයා විසින් මව් තනතුරෙන් පුදන ලදී. එහෙයින් 'මිගාර මාතා' නම් විය.

පතිකුලයට යන්නා වූ ඇයට, ඇගේ පියා විසින් 'මහලිය' පළඳනා නම් වූ පළඳනාවක් දුන්නේ ය. එම පළඳනාවෙහි විසිතුරු කිරීමට වජිර (මුතු) නැළි සතරක් යෙදීය. මුතු නැළි එකොළසකි. පබළු නැලි විසි දෙකකි. මැණික් නැළි තිස්තුනකි. මෙයට අමතරව සප්තවර්ණ උතුම් රත්නයෝ ද යොදා විසිතුරු නිමාවට පත්කළහ. එය ඇගේ හිසැ පැළඳූ විට පාපිට දක්වා වැටේ. මේ පළඳනාව දරන්නට ඇතුන් පස් දෙනෙකුගේ ශක්තිය ජවය ඇති කාන්තාවක්ම විය යුතුය.

ඕ තොමෝ පසුකලෙක දශබලධාරීන්ගේ අග්‍ර උපස්ථායිකාව වී, ඒ මහාළිය පළඳනාව විකුණා නවකෝටියක් වැයකොට භාග්‍යවතුන් වහන්සේට විහාරයක් කරවන්නී කිරියක් පමණ බිම් කොටසක විහාරය කරවූවාය. ඒ වෙහෙර උඩුමහලේ කාමර පන්සියයකි. යටිමහලේ කාමර පන්සීයකි. ඕ මේ තනි ප්‍රාසාදය පමණක් ප්‍රමාණවත් නො වන්නේ යයි, කුළුගෙවල් පන්සියයක් ද, කුඩාම කාමර පන්සියයක් ද, දික්සාලා පන්සියයක් ද කරවූවාය. විහාර කර්මාන්තයට මාස හතරක් ගතවිය.

වනිතාවක් වශයෙන් විශාඛාවගේ මේ ධන පරිත්‍යාගය හැරුණුකොට මේ බුදුසසුනේ වෙනත් වනිතාවක් මෙවැන්නක් සිදු නොකළේමැයි. පිරිමියෙකු වශයෙන් අනේපිඬු සිටාණන් හැර, වෙනත් පිරිමියෙකුගේ පරිත්‍යාගයක් නැත්තේම ය. හේ වනාහි සූපනස් කෙළක් වියදම්කොට සැවැත්නුවරින් දකුණු පැත්තේ අනුරාධපුරයේ මහා විහාරයට සමාන ලෙස ජේතවන විහාරය කරවීය. විශාඛාවෝ සැවැත්නුවරින් නැගෙන හිර දෙස උත්තමදේවී විහාරයට සමානව පූර්වාරාම විහාරය කරවූවාය. භාග්‍යවතුන් වහන්සේ මේ දෙකුලයන්ට අනුග්‍රහ පිණිස සැවැත්නුවර ඇසිරිකොට වාසය කරන සේක්, මේ විහාර දෙක්හි නිරතුරුව වැඩිකලක් වාසය කළහ. එක් ඇතුලුවසක් ජේතවනයේද එක් ඇතුලු වසක් පූර්වාරාමයේ ද වාසය කළහ. **පුබ්බාරාමෙ මිගාරමාතු පාසාදෙ** යන්න එහෙයින් කියන ලදී.

කිත්තාවතානු බො භන්තෙ ස්වාමීනි, කොපමණකින්, සංඛිත්තෙන තණ්හාසංඛය විමුත්තෙතා හොති තණ්හාව නැතිකිරීම නම් වූ නිවනෙහි එය අරමුණු කොට මිදුණු සිත් ඇති බැවින්, තණ්හාවෙන් විමුක්ත වූවෙක් නම් සැකෙවින් කොපමණකින් වේද, නිවන් අරමුණු කොට කෙලෙසුන්

කෙරෙන් මිදුනේ වේද, ක්ෂීණාශ්‍රව ඒ භික්ෂූහුගේ ඒ පූර්වභාග ප්‍රතිපදාව මට කෙටියෙන් දේශනා කළ මැනවි. විචාරයි.

අචවනත නිටෙඨා ඇතිවීම නැතිවීම නම් වූ ක්ෂය ව්‍යය අනන්තය කෙළවර ඉක්මවන ලදනුයි 'අචවනතා' නම් වේ. අත්‍යන්ත වූ නිෂ්ඨාව මොහුටනුයි 'අචවනත නිටඨ' නම් වේ. නිරතුරු නිෂ්ඨා ඇත්තේ යන අදහසයි. අන්තය ඉක්මවන ලද යෝගක්ෂේම ඇත්තේනුයි **අචවනත යොගකෙඛම** නම්. නිරතුරු සතර ඕඝයෙන් වෙන් වූයේ යන අර්ථයි. නිත්‍ය බ්‍රහ්මචරියාව ඇත්තේ යන අර්ථයි. අත්‍යන්ත වූ පර්යාවසානය - මොහුටනුයි **අචවනත පරියොසාන** නම් වේ. **සෙටෙඨා දෙව මනුසසානං** දෙවියන්ට ද මිනිසුන්ට ද ශ්‍රේෂ්ඨ වූයේ උතුම් වූයේ මෙබඳු මහණ කොපමණකින් වේද, වහාම සැකෙවින් මොහුගේ පිළිවෙත වදාළ මැනැවි'යි භාග්‍යවතුන් වහන්සේ වෙත යාඥා කෙරේ.

කුමක් හෙයින් මෙතෙම මෙසේ යුහුසුළු වේද, ක්‍රීඩා සුඛය විඳිනු සඳහාය. මෙතෙම වනාහි උද්‍යාන ක්‍රීඩාවන් අණකොට විධානකොට, සතරවරම් දෙවිමහරජවරුන් ලවා සතර දිසාවන් ආරක්ෂා කරවා දෙදෙව්ලොව දේව සමූහයා විසින් පිරිවරන ලදුව, අඩු තුන් කෙළක් නළුවන් සමග ඓරාවණ ඇතුපිට නැඟී උයන්දොර සිටියේ මේ ප්‍රශ්නය සැලකීය. 'කොපමණකින් නිවන් අරමුණුකොට කෙලෙසුන් කෙරෙන් මිදුනු රහත්හුගේ සැකෙවින් පැමිණිය යුතු පූර්වභාග ප්‍රතිපදාව වේද,' අනතුරුව ඔහු මෙසේ සිතීය. මේ ප්‍රශ්නය ඉතාම වැදගත්ය. බැරෑරුම්ය. මම මේ ප්‍රශ්නය නො ඉගෙන උයනට පිවිසියෙම් නම් සදොර අරමුණුවලින් අලලන ලද්දෙමි. යළි මේ ප්‍රශ්නය නො සළකන්නෙමි. උද්‍යාන ක්‍රීඩාව පසෙක තිබියේවා. ශාස්තෘන් සමීපයට ගොස් මේ ප්‍රශ්නය විමසා පිළිතුරු උගෙනම උයනෙහි ක්‍රීඩා කරන්නෙමි. ඇතුපිට සිටිද්දීම අතුරුදන් වූයේ භාග්‍යවතුන් වහන්සේ සමීපයේ පහළ විය. සතරවරම් රජවරු අරක්ගත් ස්ථානවලම සිටියාහුය. පිරිවර දිව්‍ය සමූහයා ද නළුනිළියෝ ද ඓරාවණ ඇතු ද උයන්දොරම සිටියෝය. මෙසේ මෙතෙම ක්‍රීඩාලෝලී වූ බැවින් ඉවසුම් නැතිවම මෙසේ කීය.

සබෙබ ධම්මා නාලං අභිනිවෙසාය යන මෙහි සියලු ධර්මයෝ නම් පංචස්කන්ධය, දොළොස් ආයතන, අටළොස් ධාතු, ඒ සියල්ල තෘෂ්ණා දිට්ඨි වශයෙන් ඇතුළත්ව ගැනීමට නුසුදුසුය. නො පිරියත්හුය.

නො සමත්ය. අයුතු වූයේය. කවර හෙයින්ද, ගත් ආකාරයෙන් ම නොසිටින හෙයින්ය. යම්හෙයකින් එය නිත්‍යයයි ගන්නා ලද නමුත් අනිත්‍යයෝ ම වෙත්. සැප වූයේ යයි ගතහොත් දුක් වූවාහු නම් වෙත්, ආත්මයයි ගතහොත් අනාත්මය ම වේ. එහෙයින් තෘෂ්ණා දෘෂ්ටි ඇතුළත්ව ගැනීමට නො සුදුසුයි.

අභිජානාති යනු අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යයි ඥාත පරිඥාවෙන් මැනවින් දැනගනී. **පරිජානාති** එසේම තීරණ පරිඥාවෙන් සම්පූර්ණයෙන් දැනගනී. **යං කිඤ්චි වෙදනං** යටත් පිරිසෙයින් පංච විඤ්ඤාණය සමග යෙදුනා වූද, ටිකක් ස්වල්පයක් වූද, වේදනාවක් විඳිද මෙයින් භාග්‍යවතුන් වහන්සේ සක්දෙවිඳුට වේදනා වශයෙන් විභාගකොට, විවේචනය කොට අරූප පරිග්‍රහය දැක්වූ සේක. ඉදින් වේදනා කර්මස්ථානය මුලින් නොකීවේ නම් මෙතැන්හි කිවයුතු වන්නේය. යම් විධියකින් මුලින් (යට) කියන ලද එය සතිපට්ඨානයෙහි කී අයුරින්ම දතයුතුය.

අනිච්චානුපසසී මෙහි අනිත්‍යය දතයුතුයි. අනිත්‍යානු දර්ශනා දතයුතුය. එහි **අනිච්ච** යනු මෙහි අනිච්ච නම් පංචස්කන්ධයෝය. **අනිච්චානුපසසනා** නම් පංචස්කන්ධය ක්ෂය වශයෙන් ද්වය වශයෙන් ද දතයුතුය. ඒ නුවණය. **අනිච්චානුපසසී** යනු ඒ නුවණින් යුතු පුද්ගලයාය. එහෙයින් **අනිච්චානුපසසී විහරති** අනිත්‍ය වශයෙන් නැවත නැවත නුවණින් බලමින් වෙසෙයි යන මේ අර්ථයි.

විරාගානුපසසී මෙහි විරාග දෙකක් දක්වයි. ඛය විරාගය හා අත්‍යන්ත විරාගයයි. එහි සංස්කාරයන්ගේ ක්ෂයවීම ක්ෂය වශයෙන් දක්නා විදර්ශනාවද අත්‍යන්ත විරාග වූ නිවන විරාග හෙයින් දක්නා මාර්ගඥානය ද 'විරාගානු පසසනා' නම් වේ. මේ දෙකින්ම යුක්ත වූ පුද්ගලයා විරාගානුපස්සී නම් වේ. ඔහු සඳහා කියන ලදී. විරාගානුපස්සී යනු විරාග වශයෙන් නැවත නැවත නුවණින් බලන්නේය යන අර්ථයි. **නිරොධානු පසසමහි** මෙම ක්‍රමයමැයි. නිරෝධය ද ඛය නිරෝධ අච්චන්ත නිරෝධයයි දෙපරිදිය.

පටිනිසසාගගානු පසසී යන මෙහි දුරලීම පටිනිසසගග යයි කියනු ලැබේ. එය පරිච්චාග වොසසගග, පකඛන්දන වොසසගග යයි දෙපරිදිය. එහි පරිච්චාග වොසසගගය නම් විපස්සනාවයි. එහි තදංග වශයෙන් කෙලෙසුන් ද, ස්කන්ධයන් ද දුරලයි. පක්ඛන්දන වොස්සග්ගය නම්

මාර්ගයයි. හේ නිවනට අරමුණු වශයෙන් පැනසිටීම කරයි. දෙකරුණෙන්ම ඒ මාර්ගය වොස්සග්ගයමැයි. සමුච්ඡේද වශයෙන් ස්කන්ධයන්ගේ ද, ක්ලේශයන්ගේ ද දුරලීම කරන හෙයින් ද නිර්වාණයෙන් පැනසිටින හෙයින්ද වේ. එහෙයින් කෙලෙසුන් ද ස්කන්ධයන් ද, පරිත්‍යාග කෙරේනුයි පරිචචාග වොස්සග්ග නම් වේ. නිරෝධ නම් වන නිර්වාණ ධාතුවෙහි සිත ඉදිරිපත් කෙරේනුයි පක්ඛන්දන වොස්සග්ගය. මේ දෙකම මාර්ගයෙහි සම වෙයි. ඒ දෙකින්ම යුක්ත වූ පුද්ගලයා මේ පටිනිස්සග්ගානු පස්සනාවෙන් යුක්ත වන හෙයින් පටිනිස්සාගානු පස්සී නම් වෙයි. පටිනිස්සාගානු පස්සති යන්න එහෙයින් කියන ලදී.

නව කිඤ්චිලොකෙ උපාදියති යනු කිසියම් එකද සංස්කාරයක්වත් තෘෂ්ණා වශයෙන් උපාදානය නො කෙරෙයි. නො ගනී. පරාමර්ශනය නො කරයි. **අනුපාදියං න පරිතසසති** නොගන්නේ තණ්හා පරිතස්සනාවෙන් ත්‍රස්ත නො වෙයි. **පචචතතං යෙව පරිනිබබායති** තමාම ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවෙයි. **ඛීණා ජාතීහි** ආදියෙන් ඔහුගේ ප්‍රත්‍යවේක්ෂාව දක්වන ලදී. මෙසේ භාග්‍යවතුන් වහන්සේ සක්දෙවි රජුට කෙටියෙන් ක්ෂීණාශ්‍රවයන් ගේ පූර්වභාග ප්‍රතිපදාව විචාරන ලදුව සැහැල්ලුකොට කෙටියෙන් වහා වදාළ සේක.

අවිදූරෙ නිසිනෙනා හොති යනු කුළුගෙයි හුන්නේ වේ. **අභිසමෙචවාති** නුවණින් අභිසමය කොට දැන යන අර්ථයි. මෙය කියන ලද්දේ වේ. කිමෙක්ද ඔහු එය දැනගෙනම අනුමෝදන් වීද, නැතිනම් නො දැනම හිස සැලීද, කුමක් නිසා මෙසේ සිතින්ද ස්ථවිරයෝ වනාහී භාග්‍යවතුන් වහන්සේගේ පැන විසඳුමෙහි ශබ්දය නො ඇසූහ. එහෙත් සක්දෙවියන්ගේ **එවමෙතං භගවා, එව මෙතං සුගතා** යන අනුමෝදනා ශබ්දය ඇසීය. සක්දෙව් රජ මහ හඬින් අනුමෝදන් වීය.

ඉක්බිති කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේගේ ශබ්ද නො ඇසීද, පිරිසේ ප්‍රමාණයට ශබ්දය පවතින බැවිනි. බුදුවරුන්ගේ ධර්මය එකට බැඳුනු සක්වළ කෙළවර ඉන්නා අයට ද ඇසේ. එහෙත් කෙළවර ඉක්මවා අඟලකුත් නො ඇසේ. කවර හෙයින්ද, මෙබඳු වූ මිහිරි කථා නිරර්ථක නොවනු සඳහාය. එදිනද භාග්‍යවතුන් වහන්සේ මිගාරමාතු ප්‍රාසාදයේ සත්රුවන්මය වූ කූටාගාරයේ සිරියහන් ගැබ වැඩසිටි සේක. එහි දකුණුපස සැරියුත් මහතෙරුන් වසන කූටාගාරය ද විය. ඇතුළතින් සිදුරකින් විවර

වූ අවකාශයක් ඉඩක්වත් නැත. එහෙයින් තෙරුන්ට භාග්‍යවතුන්ගේ හඬ නො ඇසින. ශක්‍රයාගේ ශබ්දයම ඇසූහ.

පඤ්චහි තූරිය සතෙහි පඤ්චාංගික තූර්ය පන්සියයක, පංචාගික තූර්ය නම්. ආතතය, විතතය, ආතතවිතතය, සුසිරය, ඝණය යන මේ පසෙන් යුක්තය. එහි **ආතතය** නම් සමින් වෙළන ලද බෙර ආදීන් අතුරෙන් එක් මුහුණක් ඇති තූර්ය භාණ්ඩයයි. **විතත** නම් දෙපැත්තේම මුහුණු ඇති තූර්ය භාණ්ඩයයි. **ආතතවිතත** නම් තතින් බඳනා ලද ගැටබෙර ආදියයි. **සුසිර** නම් වස්කුලල් ආදියයි. (බටනලා ආදිය) **ඝණං** කුළු තාලම් - තාලම්පට ආදියයි. **සමපපිතො** යුක්ත වූයේ, **සමංගීභූතො** යනු එයටම සමාන අදහසයි. **පරිවාරෙති** සැපත් අනුභව කරමින් ඒ ඒ තැන ඉඳුරන් හසුරුවයි. පන්සියයක් පංච තූර්යනාදයන්ගෙන් යුක්තව දිවසැප වළඳන බව කියූ අයුරුයි.

පටිපජ්ජාමෙත්වා ඉවත්කරවා නිහඬ කරවා යන අදහසයි. ගෞරවණීය වූ භික්ෂූන් වහන්සේ නමක් පැමිණෙනවිට ශ්‍රද්ධාවන්ත රජෙක් අසවල් ස්වාමීන් වැඩම කරයි. ඒ නිසා ගායනය නො කරව්. වාදනය නො කරව්, නො නටව් ආදී වශයෙන් නළුවන් ගායක ගායිකාවන් නවත්වන්නේ ද, එසේම ශක්‍රයා ද මුගලන් තෙරුන් වහන්සේ දැක එසේ කළේය.

චිරසසං ඛො මාරිස මොගගල්ලාන ඉමං පරියාය මකාසි යනු ලෝකයෙහි මෙබඳු වූ ප්‍රිය උපදවන වචන වෙයි. ලෝවැස්සෝ කලකින් ආවා වූ ද, නො ආ විරූද, මන වඩන ප්‍රියමනාප කෙනෙකු බොහෝ කලකින් ආවිට එසේ ආවාහු දැක (පින්වත, හිතවත මිත්‍රය) කොහි සිට ආයේද, කාලෙකින් ආවේ වේද, කෙසේනම් මගතොට හඳුනා ගත්තේද, පාර නිවැරදිව දැනගත්තේද, මංමුළා වූයේද යනාදිය අසයි. කියයි. මේ වූ කළී පෙර ද පැමිණි බැවින් මෙසේ කීය. තෙරුන් වහන්සේ කලින් කල දේවලෝක චාරිකාවේ යන සේක්මය. එහි **පරියාමකාසි** වාරය කළේය. **යදිදං ඉධාගමනාය** යම් මේ මෙහි පැමිණීමට වාරයක් වේද, එය කලෙකින් කළේ යයි කියන ලද වේ. **ඉදමාසනං පඤ්ඤත්තං** යනු යොදුන් උස ඇති මිණිපළඟක් පණවා මෙසේ කීය.

බහුකිච්චා බහු කරණීයා යන මෙහි යම්කිසිවෙකුට බොහෝ කටයුතු වෙත්ද, ඔව්හූ බහුකිච්ච නම් වෙති. **බහුකරණීයා** යනු එයටම සමාන වචනයි. **අපෙපව සකෙන කරණීයෙන** යනු තමන්ගේ කටයුතු මොහුට අල්පය. බොහෝ නොවේ. එහෙත් දෙවියන්ගේ කටයුතු බොහෝයි. මහපොළවේ පටන් කප්රුක්, ස්ත්‍රීන් සඳහා යුක්ති විසඳීම් ආදී කළයුතු දේ ශක්‍රයා සමීපයේම සිදෙයි. එහෙයින් නියම කරමින් කීය. **අපිච දෙවානංයෙව තාවතිංසානං කරණීයෙන**

දෙවිවරුන්ගේ දූවරුන් ද, පුතුන් ද ඇකයෙහි උපදිත්, පාද පරිචාරිකා ස්ත්‍රීහූ යහනෙහි උපදිති. ඔවුන්ගේ සැරසීම්, පැළඳීම් ආදිය කරන දේවතාවෝ යහන පිරිවරා උපදිත්. වතාවත්කරුවෝ විමන ඇතුළේ උපදිත්. මොවුන් සඳහා නැත. එහෙත් යම්කෙනෙක් සීමා අතර ඉපදුනහොත් ඔවුන් මා සතුද වෙන අයෙක් සතුද යන්න නිශ්චය කරන්නට නො හැකි වූ විට සක්දෙව් රජුගෙන් විමසති. උපන් තැනැත්තා යමෙකුගේ විමානය සමීපයේ උපන්නේ ද ඔහු සතු වේ. ඉදින් විමන් දෙකක් සමීපව උපන්නේ ද, එකල යමෙකුගේ විමන බලමින් සිටියේ නම් ඔහු සතු යයි කියයි. ඉදින් එකකුදු නො බලා නම් ඔවුන්ගේ කලහ සන්සිඳුවීම සඳහා තමන් සතු කරයි. මේ සඳහා **දෙවානං යෙව තාවතිංසානං කරණීයෙනා** යන්න කියන ලදී. තව ද ඔහුට ක්‍රීඩා ද කරන්නට සිදු වේ.

යං නො ඛිපපමෙව අනතරධායති යනු යම්හෙයකින් අඳුරෙහි රූපයක් මෙන් ඉතා ඉක්මණින් අපගේ රූප නො පෙනී යයි. ස්වාමීනි, ඒ කරුණෙන් මම ඒ පැනවිසඳුම් නො සලකම්. දක්වයි. ස්ථවිර තෙමේ, කුමක් හෙයින් මේ දේවිය, නොසලකන බව දක්වයිද, පසෙකින් ගෙන හැසිරේද යන්න ආවර්ජනය කරන්නේ, දෙවිවරු නම් මහා මෝඩයෝ වෙති. සදොරෙහි අරමුණුවලින් කැළඹෙනු ලබන්නේ තමන් කෑ නොකෑ බව ද, බිව් නොබිව් බව ද නො දනිති. මෙහි කරන ලද්ද එතැන්හිම මුලාවී ඇතැයි දැනගත්හ.

සමහරු මෙසේ කීහ. තෙරුන් වහන්සේ මොහු විසින් ගරුබුහුමන් කළයුතුය. එහෙයින් දැන්ම ලෝකයේ අග්‍ර පුද්ගලයන් සමීපයේ ප්‍රශ්න උගෙන ආයේ දැන්ම නළුවන් අතරට පිවිසියේ යයි, මට තෙරුන් වහන්සේ තර්ජනය කරති යි බියෙන් මෙසේ කීය. එය වූ කලී කොහොන් බව, කුහක බව නම් වේ. ආර්ය ශ්‍රාවකයන් තුළ කුහක බවක් නැත. එහෙයින්

මුළා වූ බැවින් නො සැළකීයයි දතයුතු. කුමක් හෙයින් මත්තෙහි සැලකීද ස්ථවිරයෝ ඔහුට සතුට - සංවේගය උපදවා මෝහය බැහැර කළහ. ඒ නිසා එසේ සැලකීය.

දැන් ශක්‍රයා තමන් පිළිබඳව කළ එක් කරුණක් තෙරුන්වහන්සේට කීමට භූත පුබබං යනාදිය කීහ. එහි සමූපබබූළෙහා රැස්වූයේ අසුරා පරාජිනිංසු අසුරයෝ පරාජයට පත්වූහ. නැවත කවරදා ඔවුන් පරාජය කරන ලද්දේද, ශක්‍රයා උපන් කල්හිය.

ශක්‍රයා වනාහි එක්තරා ආත්මභාවයක මගධරට මචල නම් ගමැ මස නමින් මාණවකයෙක් විය. බෝසතුන්ගේ ක්‍රියාපිළිවෙළ මෙන් ක්‍රියා පිළිවෙළක් ඔහුට ද විය. හේ පණ්ඩිතය. ව්‍යක්තය. ඔහු තෙතිසක් පමණ මිනිසුන් සමග යහපත් කටයුතු (කුසල්) කළේය. එක් දවසක් තමාගේම නුවණින් විමසා ගමමැද මහජනයා රැස්වූ තැන කැළි කසල බැහැරකොට රමණීය පෙදෙසක් කළේය. නැවත එහි මණ්ඩපයක් කළේය. පසුව කල් ගතවෙත්ම ශාලාවක් කරවීය. තව ද ගව්වක් අඩ යොදුනක් තුන් ගව්වක් ද යොදුනක් ද හැසිර ඒ යහලුවන් සමග උස් මිටි තැන් සමතලා කළේය. ඔවුන් සියල්ලෝ ඒ ඒ තැන ඒදණ්ඩක් පාලමක් කරන්ට සුදුසු තැන ඒදඬු පාලම් ද, ප්‍රජාශාලා, පොකුණු, මල්වතු, උයන්වතු කරවිය යුතු තැන්වල ඒවා ද කළහ. මෙසේ බොහෝ කුසල් රැස්කළහ. මස මාණවකයෝ සත් වත පද පුරා, මරණයෙන් පසු තව්තිසා දෙව්ලොව උපන්හ. ඔහුගේ යහළුවෝ ද ඔහු සමගම එහි උපන්නාහ. ඒ කාලයේ අසුර සමූහයා තව්තිසා භවනයේ පදිංචිකරුවෝ වූහ. ඔව්හූ ද දෙවියන් හා සමාන සමාන වයස් ඇත්තෝ ද සමාන වර්ණ ඇත්තෝ ද වූහ. ඔව්හූ (ශක්‍රයා) අලුත උපන් දෙවියා හා ඔහුගේ පිරිස දැක අළුත් දිව්‍ය පුත්‍රයෝ පහළ වූහයි මහා පානයක් (උපන්දින සාදයක්) පිළියෙළ කළහ. ශක්‍රයා (නව නායක දෙවියා) තමන්ගේ පිරිසට සංඥාවක් දී, අපි කුසල් කරන්නමෝ අනුන් සමග සාධාරණ නො වමු. එහෙයින් ඔබලා මේ මහා පානය - ගණ්ඩපානය නො නොබොවු. බොන පමණක්ම දක්වවු. ඔව්හු ද එසේ කළහ. මෝඩ අසුරයෝ ගණ්ඩපානය මහත් සේ බීමෙන් මත් වී නින්දට වන්නාහ. ශක්‍රයා නව දෙවිවරුන්ගේ නායකයා අනෙක් නව දෙව්වරුන්ට සංඥා දී, අසුරයන් කකුල්වලින් ඔසවා සිනේරු පර්වත පාදයට වීසි කළහ.

සිනේරු පර්වතය යට පැත්තේ අසුර භවනය පිහිටා තිබේ. එය තව්තිසා දෙව්ලොව තරම්ම වේ. එහි අසුරයෝ වෙසෙති. ඔවුන්ට සිත්පළොල් නම් රුකක් ඇත. ඒ ගසෙහි මල් පිපෙන කල මේ තව්තිසා දෙව්ලොව නොවේයයි දැන ගනිති. මේ තව්තිසාව නොවේ. ශක්‍රයා විසින් අපි වංචා කරන ලද්දෝ වෙමු. ඔහු ගනිව් යයි කියා, වැසි කලට තුඹසකින් මෙරු නගින්නාක් මෙන් අසුරයෝ සිනේරු පව්ව උඩට නගිති. එහි එක් කලෙක අසුරයෝ දිනත්. තවත් කලෙක සුරයෝ දිනති. මෙකල සූරයන්ට දෙවියන්ට ජය නියත කාලයයි. අසුරයන් මුහුදු වෙරළ තෙක් ලුහුබඳිති. අසුරයන්ට ජය අත්වන කල දෙවිවරුන් වේදිකා තලය තෙක් ලුහුබඳිති. මෙකල්හි දෙවියන්ට ජය අත් වේ. දෙවිවරු අසුරයන් මුහුදු වෙරළ දක්වා ලුහුබැන්දාහ. ශක්‍රයා අසුරයන් පළවාහැර, පස් තැනෙක ආරක්ෂාව පිහිටුවීය. එසේ ආරක්ෂාව පිහිටුවා වේදිකා තලයෙහි වජ්‍රායුධය අතින් ගත් ඉන්ද්‍රයාගේ පිළිමයක් තැබීය. අසුරයෝ වරින්වර නැඟී ඒ ප්‍රතිමාව දැක, ශක්‍රයා අප්‍රමාදීව සිටියයි එහිම නවතිත්.

තතො පටිනිවත්තිත්වා දිනූ තැනින් නැවතී **පරිවාරිකායො** මල් ගෙතීම් ආදී කාර්යයන් කරන්නා වූ, **වෙසසවණෝ** මහාරාජා ඔහු වනාහි ශක්‍රයාට පක්ෂපාතීයහ. ඉතා විශ්වාසවන්තය. එහෙයින් ශක්‍රයා සමග ගියේය. **පුරකඛත්වා** පෙරටු කරගෙන, **පවිසිංසූ** පිවිස දොරවල් අඩවල්කොට බලා සිටියාහ.

ඉදමපි මාරිස මොග්ගල්ලාන වෙජයන්තසස පාසාදසස රාමණෙය්‍යකං මුගලන් තෙරුන් වහන්ස, විජයොත්පහයේ මේ රමණීය විසිතුරු බව බලනු මැනවි. රන් කුළුණු, මැණික් කුළුණු, මුතු කුළුණු, පියුම්රාමිණි කුළුණු, මැසිරිගල් කුළුණු, මුතු කුළුණු, සත්රුවන් කුළුණු, ස්වර්ණමයාදී වූ පේකඩවල ව්‍යාළ රූප බලනු මැනවි. මෙසේ ටැම්පෙළ ආදිය දක්වමින් මෙසේ කීහ. **යථා තං පුබ්බෙ කත පුඤ්ඤසස** පෙර පින් ඇත්තෙකුගේ පරිභෝගස්ථානයක් හෙබිය යුතු යම්සේද, එසේ මේ හැම දෙයකින්ම ශෝභමාන වී සුන්දර වී යන අර්ථයි.

අති බාළ්හං ඛො අයං යකෙඛා පමතෙතා විහරති ති තමන්ගේ ප්‍රාසාදයෙහි සම්පත්ති වශයෙන් නළු නිළියන් පිරිවරාගෙන සම්පත්තියෙන් මත් වූයේ, **ඉද්ධාභිසංඛාරං අභිසංඛාසි** සෘද්ධියක් කළේය. ආපෝ කසිණයට සමවැද ප්‍රාසාදය පිහිටි ඉඩකඩ ජලය වේවයි ඉටා ප්‍රාසාදයේ කැණිමඬල

පය මහපට ඇඟිල්ලෙන් හෙල්ලුවේය. ජලයෙහි තැබූ පාත්‍රයක් ඇඟිල්ලෙන් තල්ලු කළ කල්හි යම්සේ කම්පාවේද සැලේද, නො පිහිටාද එපරිද්දෙන් ඒ ප්‍රාසාදය සෙළවිණි. අතිශයින් සෙලවිණි. කළුණු, දොර ජනෙල්, කැණිමඬල ආදිය කර කර යන ශබ්ද නගමින් වැටෙන්නට මෙන් පටන් ගත්හ. **සංකමෙපසි - සමපකමෙපණි, සමපවෙධෙසි** යනු එහෙයින් කියන ලදී.

අවජරියබහූත චිතත ජාතා අහෝ පුදුමයි. මෙසේ හටගත් ආශ්චර්යය අද්භූත ය. මෙසේ හටගත් පුදුම උපදවන සිදුවීම් දැක බලවත් සතුටට පත්වූවාහු වෙති. **සංවිගගං** උද්වේග වූවහු, සැලුණාහු, **ලොමහටඨ ජාතං** ලොම් කෙලින් සිටියාහු, රත්තරන් බිත්තියක තැබූ ඇත්දත් මෙන් උඩු අතට පිහිටි ලොම් දැහැ ගැනීමෙන් සතුටට පත්, සොම්නසින් ද, දොම්නසින් ද වේ. තෙරුන්වහන්සේ ශක්‍රයා සොම්නසින් සංවේගයෙන් යුක්ත කරන්නට ප්‍රාතිහාර්යය කළේය. එහෙයින් සොම්නස් සංවේගයෙන් සංවේගයට පත්ව ලොම් කෙලින් සිටීම වින්දේය යන අර්ථයි. **ඉදහං මාරිසා** මෙවිට යම්හෙයකින් තෙරුන්වහන්සේ විසින් සොම්නස් සංවේග උපදවා මොහඳුරු දුරු කරන ලදද ඒ බව සලකා මෙසේ කීහ.

එසො තෙ මාරිස සො භගවා සත්ථා නිදුකාණනි, තෙපි කොහි ගියහුදැයි කී කල 'මාගේ ශාස්තෘන් වෙතට' යයි කියවු. මේ දෙව්ලොව එක් පියකින් මෙන් සිටිවු. යමෙක් මෙසේ කියයි නම් නිදුකාණනි, මේ තොපගේ භගවත් ශාස්තෘදැයි විචාළාහුය. **සබ්‍රහමචාරී සො එසො** යන මෙහි එකක් ඇත. තෙරුන් වහන්සේ අනගාරියහ. අභිනීහාර සම්පන්න වූ අග්‍රශ්‍රාවක වූහ. ශක්‍රයා අගාරිකය. එහෙත් මාර්ග බ්‍රහ්මචරියා වශයෙන් සබ්‍රහ්මචාරීහූ වෙති. එහෙයින් මෙසේ කීහ. **අහො නූන තෙ භගවා සත්ථා** තොපගේ සබ්‍රහ්මචාරී තෙමේත් මෙසේ මහත් ඍද්ධි ඇත්තේ ය. තොපගේ භගවත් ශාස්තෘන් වහන්සේ ආශ්චර්යය. ඒකාන්තයෙන් මහත් ඍද්ධි ඇත්තාහුය. ශාස්තෘන් වහන්සේ ගේ ඍද්ධි ප්‍රාතිහාර්ය දැකීමෙහි උපන් කැමැත්ත ඇතිව මෙසේ කීහ. **අභිඤ්ඤාතඤ්ඤාතරසස** ප්‍රසිද්ධ වූවන් අතුරෙන් එක්තරා කෙනෙකුගේ, ශක්‍රයා ප්‍රසිද්ධ වූවන් අතුරෙන් අන්‍යතරයෙකි. සෙස්ස සියලු තැන්හි ප්‍රකටය. භාග්‍යවතුන් වහන්සේ දේශනාව අනුසන්ධි වූ ලෙසින් ම නිම වූ සේක.

චූළ තණ්හාසංඛය සූත්‍ර වර්ණනාව නිමියේය.

1-4-8

එවමෙමසුතං මහා තණ්හාකඛය සූත්‍රයයි. එහි දිටඨිගතං අලගද්ද සූත්‍රයෙහි ලඛ්ධිමාත්‍රය දිටඨිගත යයි කියන ලදී. මෙහි ශාස්වත දෘෂ්ටියයි. ඒ මහණ තෙමේ ද බහුශ්‍රැතය. මේ තැනැත්තා අල්පශ්‍රැතය. ජාතක භාණකයෙකි. භාග්‍යවතුන් වහන්සේ ජාතකයක් දේශනා කොට, මහණෙනි, මම ඒ සමයෙහි වෙසතුරු වීමි. මහෞෂධ වීමි. විධුර වීමි. සේනක වීමි. මහාජනක රජු වීමි. පූර්වාපර සන්ධි ගැළපීම අසයි. එකල ඔහුට මේ සිත විය. මේ රූප වේදනා සඤ්ඤා සංඛාරයෝ ඒ ඒ තන්හිම නිරුද්ධ වෙති. විඤ්ඤාණය වනාහි මෙලොවින් පරලොවට, පරලොවින් මේ ලෝකයට මාරුවෙයි. දිවෙයි. හැසිරෙයි. ශාස්වත දෘෂ්ටිය උපදියි. **තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති, සංසරති, අනඤ්ඤන්ති** යන්න එහෙයින් කියන ලදී.

සම්මා සම්බුදුන් විසින්, විඤ්ඤාණය ප්‍රත්‍යය ඇතිකල්හි උපදී. විඤ්ඤාණය ප්‍රත්‍යයෙන් උපදී. ප්‍රත්‍යයෙන් වෙන්ව විඥානයාගේ උත්පත්තියක් නැතැයි කියන ලදී. එහෙයින් මේ භික්ෂුව බුදුන් විසින් නො වදාරණ ලද්දක් කියයි. ජින චක්‍රයෙහි පහර දෙයි. වෛසාරද්‍ය ඤාණය පිටුදකියි. ශ්‍රාවක ජනයා වංචා කෙරේ. (ආර්ය පථයෙහි) ආර්ය මාර්ගයෙහි හරහට වැටී මහජනයාට අහිත පිණිස දුක පිණිස පිළිපන්නේ වෙයි. යම්සේ රජුගේ රාජ්‍යයෙහි මහ සොරෙක් වේද, හේ මහජනයාට අහිත, බිය, දුක උපදවයි. එසේම ජින ශාසනයෙහි සොරෙක් වී මහජනයාට අහිත බව, දුක උපදවන්නේ යයි දතයුතු.

සමබහුලා භික්ඛූ ජනපදවාසී පිණ්ඩපාතික භික්ඛූහූ තෙනුපසංකමිංසු මේසා පිරිසක් ලැබ ශාසනය ද අතුරුදන් කරවන්නේ ය. යම්තාක් පක්ෂය, නොලබයිද ඒ තාක් ඔහු දෘෂ්ටියෙන් වෙන් කරමුයි ඇසූ ඇසූ තැන්වලම නොසිට නොහිඳ එළඹියාහුය.

තතමං සාති විඤ්ඤාණං යනු සාතිය ඔබ යම්කිසි විඤ්ඤාණයක් ගැන කීවේද, ඒ විඤ්ඤාණය කුමක්ද? **යවායං භනෙත වදෙ වෙදෙය්‍යො තත්‍ර තත්‍ර කල්‍යාණ පාපකානං කම්මානං විපාකං පටිසංවෙදෙති ස්වාමීනි,** මේ යමෙක් කියයිද, කථා කරයිද, විඳියිද, මේ යමෙකුත් ඒ ඒ තැන්වල

කුශලාකුශල කර්මයන්ගේ විපාකය විඳී ද, ස්වාමීනි, යමක් සඳහා මම කියම්ද, ඒ විඤ්ඤාණ යයි. **කසසනුඛො නාමා** කවර ක්ෂත්‍රියකුට හෝ බ්‍රාහ්මණයකුට, වෛශ්‍රවණයකුට, ශූද්‍රයකුට, ගෘහස්ථයකුට, පැවිද්දෙකුට, දෙවියකුට හෝ මිනිසකුට මේ අය අතරින් එකකුට.

අථඛො සො භගවා භිකඛූ ආමෙනතසි කුමක් සඳහා ආමන්ත්‍රණය කරයිද, සාති භික්ෂුවට යම්හෙයකින් මෙබඳු සිතක් වීද, ශාස්තෘන් වහන්සේ මට මෝඝ පුරුෂයා යයි කී පමණින් මාර්ගඵලයන්ට උපනිශ්‍රය නොවන්නේ ය. 'අතිලහුං ඛො මොඝපුරිස බාහුල්ලාය ආවත්තෙතා' වදාරන ලද උපසේන තෙර ද, මෑත කාලයෙහි ගැටෙමින් වෑයම් කරමින් අභිඥාවන් ප්‍රත්‍යක්ෂ කළේද, මමත් වීර්යය දැඩිව ගෙන මගපලයන් පසක් කරන්නෙමි' එකල ඔහුට භාග්‍යවතුන් වහන්සේ සිඳුණු ප්‍රත්‍ය ඇති මේ තෙම ශාසනයෙහි නො වැඩෙන ස්වභාව ඇත්තෙකැයි දක්වන්නේ භික්ෂූන් ඇමතූ සේක. **උසමීකතො** යට කියන ලද අදහස් ඇත්තේම වේ.

අථ ඛො භගවා යන මෙය ද වෙනම අනුසන්ධියකි. සාති භික්ෂුවට මෙසේ සිතිණ. 'භාග්‍යවතුන් වහන්සේ මාගේ මාර්ගඵලයන්ට උපනිශ්‍රය නැතැයි වදාරති. උපනිශ්‍රය නැත්තේ නම් කුමක් කරන්නේද, තථාගතයෝ උපනිශ්‍රය සහිත වූවන්ට පමණක් දහම් නො දෙසයි. අනෙක් අයටද දේශනා කරන්නේ ය. මම බුදුන්ගෙන් සුගතෝවාදය ලැබ සැපතට පැමිණිය හැකි කුශලයක් කරන්නෙමි. ඉක්බිති ඔහුට භාග්‍යවතුන් වහන්සේ හිස් පුරුෂය, මම තට අවවාදයක් හෝ අනුශාසනයක් නො කරන්නෙමි. සුගතෝවාදය සේක් මේ දේශනාව ආරම්භ කළහ. එහි අර්ථය යට කී ආකාරයෙන්ම දතයුතුය. දැන් පිරිසේ ලබ්ධිය දුරුකරන සේක් පිරිසිදු කරන සේක්, **ඉධාහං භිකඛු පටිපුච්ඡිසසාමි** යනාදිය වදාළහ. ඒ සියල්ල පළමු කී පරිද්දෙන් ම දතයුතුය.

සාති ඤාණය නිමියේය.

දැන් විඤ්ඤාණයේ ප්‍රත්‍ය සහිත බව දක්වන සේක් **යඤ්ඤදෙව භිකඛවෙ** යනාදිය වදාළහ. එහි **මනඤ්ඤ පටිච්ච ධම්මෙච්ඡාති** ආවර්ජනය සහිත භවාංග සිතද, ත්‍රෙහුමක ධර්මයන්ද නිසා **කථඤ්ඤ පටිච්ච** ආදී

උපමාව දක්වන සේක. එයින් කුමක් කියන්නේද, දක්වන්නේ ද, දොරකින් දොරකට මාරුවීම පැමිණීම නැති බවය. ඒ එසේමය. යම්සේ දර ලීයක් නිසා ඇතිවන ගින්න දර නමැති ප්‍රත්‍යය නිසාම දැල්වේද, එය නැතිකල්හි ප්‍රත්‍යයාගේ වෙන්වීම නිසා එහිම නිවී යන්නේද, රුක් පොතු ආදියට මාරු වී සියල්ල ගිනි ගන්නා තත්ත්වයට නො ඒද, එපරිද්දෙන්ම ඇස නිසාත් රූපය නිසාත් උපන් විඥානය ඒ ද්වාරයෙහි චක්ඛු, රූප ආලෝක මනසිකාර සංඛ්‍යාත ප්‍රත්‍යය ඇතිකල්හිම උපදී. එය නැතිකල්හි ප්‍රත්‍යය වෙනස්වීමෙන් එහිම නිරුද්ධ වෙයි. ශ්‍රොතාදියට මාරු නොවී ශ්‍රෝත විඥාන යනාදී සංඛ්‍යා නොඒ. සියලු ද්වාරයන්හි මේ ක්‍රමයමැයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ 'මම විඥානයාගේ ප්‍රවෘත්තියෙහි ද්වාර සංක්‍රාන්තිය පමණකුදු නො කියමි. එහෙත් මේ සාති මෝඝ පුරුෂයා භව සංක්‍රාන්තිය කියා යයි සාති මහණ හට නිග්‍රහ කළේය.

මෙසේ විඤ්ඤාණයේ ප්‍රත්‍ය සහිත බව දක්වා, දැන් යළි ස්කන්ධයන්ගේ සප්‍රත්‍ය බව දක්වමින් **භූතමිදං** ආදිය කීහ. එහි **භූතමිදං** යනු මේ පංචස්කන්ධය. ජාත ය භූත ය. නිවංතිය මහණෙනි, ඔබ ද මේ පංචස්කන්ධය ප්‍රත්‍යයෙන් උපනැයි පිළිගනිත්ද, **තදාහාර සමභවං** ඒ මේ පංචස්කන්ධය වනාහි ආහාරයෙන් උපන්නේ ය. ප්‍රත්‍යයෙන් උපන්නේ ය. එය ප්‍රත්‍යය ඇතිකල්හිම උපදින්නේ යයි දකින්නේද, යයි විචාරණ සේක් **තදාහාර නිරොධා** ඒ ප්‍රත්‍යයාගේ නිරෝධයෙන්

භූතමිදං නො'සඤ් මෙය උපන්නේ ද නූපන්නේ ද, **තදාහාර සමභවං නො'සඤ්** යළි ඒ උපන් පංචස්කන්ධය ප්‍රත්‍යයෙන් උපන්නේ ද නො උපන්නේ ද, **තදාහාර නිරොධා** ඒ ප්‍රත්‍යයාගේ නිරෝධයෙන්, **නිරොධ ධමමං නු'සඤ්** නිරුද්ධ වන ස්වභාවය ඇත්තේ ද නැත්තේ ද,

සමපඤ්ඤාය පසසතො මේ පංචස්කන්ධ ජාතය, භූතය නිපන්යැයි තතු සේ කෘත්‍ය වශයෙන් ලක්ෂණ වශයෙන් විදසුන් නැණින් දක්නහුට **පඤ්ඤාය සුදිටඨ** යනු විදසුන් නුවණින් මනාකොට දක්නා ලද, මෙසේ යම්කිසි කෙනෙක් ඒ ප්‍රශනය සැලකුහුද, ඔවුනොවුන්ගේ ප්‍රතිඥාව ගනිමින් පංචස්කන්ධයෝ ප්‍රත්‍ය සහිත බව දැක්වූ සේක.

මෙවිට යම් නුවණකින් ඔවුන් විසින් ඒ ප්‍රත්‍ය සහිත වූ, නිරෝධ සහිත වූ පංචස්කන්ධය මනාකොට දක්නා ලද ද, එහි තෘෂ්ණා රහිත බව

විචාරමින් ඉමඤ්ඤව තුමෙහ යනාදිය වදාළහ. එහි දිට්ඨි විදර්ශනා සම්‍යක් දෘෂ්ටිය ස්වභාව දර්ශනයෙන් **පරිසුද්ධං පිරිසිදුය.** ප්‍රත්‍ය දර්ශනයෙන් පරියොදාතා අලලීයෙථ තෘෂ්ණා දෘෂ්ටියෙහි ඇලීගෙන වාසය කරන්නේද, කෙලායෙථ තෘෂ්ණා දෘෂ්ටියෙන් ක්‍රීඩා කරමින් වාසය කරන්නේ ද, ධනායෙථ ධනයක් මෙන් කැමති වෙමින් තෘෂ්ණාවට පැමිණෙන්නහුද, මමායෙථ තෘෂ්ණා දෘෂ්ටි මමත්වය උපදවන්නාහුද **නිත්‍ථරණත්‍ථාය** නො ගහණත්‍ථාය මා විසින් සතර ඕඝයන් නිස්තරණය පිණිස යම් ධර්මයක් පහුරකට උපමා කර දෙසන ලද්දේ ද, බදාගැනීම කරගසා ගැනීම පිණිස නො දෙසන ලද්දේ ද, තෙපි එය දන්නහුද, විපර්යාසයෙන් යහපත් පැත්ත ගතයුතුය.

දැන් ඒ ස්කන්ධයාගේ ප්‍රත්‍ය දක්වන සේක් **චතනාරෝ භිකඛවෙ** ආහාරා යනාදිය වදාළහ. එහි අදහස කියන ලද්දේමය. යම්සේ වනාහි 'මොහු දනීදැ'යි කියන ලද්දේ, 'හුදෙක් මොහු නොව මොහුගේ මව ද දනිමි. මවගේ මව ද දනිමි' මෙසේ ප්‍රවේණි වශයෙන් දන්නේ මනාකොට දනී නම්, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ හුදෙක් ස්කන්ධ මාත්‍රයක්ම නො දනිති. ස්කන්ධයන්ගේ ප්‍රත්‍යය ද, ඒ ප්‍රත්‍යයන් ප්‍රත්‍යය දැයි මෙසේ සියලු ප්‍රත්‍ය පරම්පරාව දකී. මේ බව දක්වන්නට **ඉමමෙව භිකඛවෙ චතනාරෝ ආහාරා** යන්න කියන ලදී. එය කියන ලද අර්ථමයි.

ඉති ඛො භිකඛවෙ අවිජජා පචචයා සංඛාරා -පෙ- දුකඛකඛන්ධසස සමුදයො හොති යන මෙහි ප්‍රතීත්‍ය සමුප්පාද කථාව විස්තර කළයුතු වන්නේ ය. ඕ විසුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලදී. **ඉමසමිං සති ඉදං හොති** මේ අවිද්‍යා ආදී ප්‍රත්‍යය ඇතිකල්හි මේ සංස්කාර ආදී ඵලය වේ. **ඉමසසු පාදා ඉදං උපපජජති** අවිද්‍යාදී ප්‍රත්‍යයාගේ ඉපදීමෙන් මේ සංස්කාරාදී ඵලය උපදී. **යදිදං අවිජජාපචචයා සංඛාරා -පෙ- සමදයො හොති** යනු එහෙයින් වදාළහ.

මෙසේ වෘත්තය දැන් විවෘත්තය දක්වන්නේ **අවිජජායත්‍ථෙව අසෙස නිරොධා** යනාදිය කීහ. එහි **අවිජජා** යත්‍ථෙව නැවත අවිද්‍යාවගේම **අසෙස විරාග නිරොධා** විරාග සංඛ්‍යාත මාර්ගයෙන්.....නිරුද්ධ කිරීමෙන්, **සංඛාර නිරොධො** සංස්කාරයන්ගේ අනුත්පාද නිරෝධය වෙයි. යළි මෙසේ නිරුද්ධ වූ සංස්කාරයන්ගේ නිරෝධයෙන් විඥානය නිරුද්ධ වෙයි. විඥානාදීන්ගේ නිරෝධයෙන් නව රූපාදීහූ නිරුද්ධ වූවාහුම වෙති.

එය දක්වන්නට, **සංඛර නිරොධා විඤ්ඤාණ නිරොධො** යනාදිය වදාරා **එවමෙතස්ස කෙවලස්ස දුකඛකඛන්ධස්ස නිරොධො හොති** යන්න වදාරණ ලදී. එහි **කෙවලස්ස** සියලු නොහොත් සුද්ධ වූ, සත්ත්ව විරහිත වූ යන අර්ථයි. **දුකඛකඛන්ධස්ස** යනු දුක් රාශීහුගේ, **නිරොධො හොතීති** අනුත්පාද වෙයි. **ඉමසමිං අසති** යනාදිය කියන ලද්දට විරුද්ධ ලෙස දතයුතුයි.

මෙසේ වෘත්තය ද විවෘත්තය ද දක්වා දැන් මේ දොළොස් ආකාර ප්‍රත්‍යය වෘත්තය විදර්ශනා ඤාණ සහිත මාර්ගයෙන් දන්නහුගේ යම් පසු දීමක් ප්‍රහීණ වේද, ඒ ධාවනයාගේ අභාවය විචාරන්නේ **අපි නු තුමෙහ භිකඛවෙ** ආදිය කීහ. එහි **එවං ජානනත** යනු මෙසේ විදර්ශනා සහිත මාර්ගයෙන් දන්නාහු. **එවං පසසනතා** යනු ඊටම සමාන වචනයි. **පුබබතතං** පළමු කොටස අතීත ස්කන්ධ ධාතු ආයතනයන් යන අර්ථයි. **පටිධාවෙය්‍යතා** තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ප්‍රතිධාවනය කරවුද, සබබාසව සූත්‍රයේ විස්තර කර ඇත.

දැන් මොවුන්ගේ එහි නිශ්චල බව විමසන්නේ **අපිනු තුමෙහ භිකඛවෙ එවං ජානනතා එවං පසසනතා එවං වදෙය්‍යාථ, සත්ථානො ගරු** යනාදිය වදාළහ. එහි ගරු බරක් වූයේ, නො කැමැත්තෙන් අනුව පැවතිය යුත්තේ, **සමණො බුද්ධශ්‍රමණ අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍යාථ** මේ ශාස්තෘ තෙම අපගේ කාර්යය ඉටුකරන්නට අසමත් වෙයි. නොහැකි වෙයි. කිම මෙසේ අදහස් කොට අනෙක් බාහිර ශාස්තෘ කෙනෙක් උදෙසා වසවුද? **පුථු සමණ බ්‍රාහමණානං** බොහෝ වූ තීර්ථක ශ්‍රමණයන්ගේ ද බ්‍රාහ්මණයන්ගේ ද, **වත කුතූහල මංගලානි**, ව්‍රත සමාදානයේ ද, දෘෂ්ටි කුතූහලයෝ ද, දුටු, ඇසූ, කෑ මංගලයෝ ද, **තානි සාරතො පචචා ගචෙඡය්‍යාථ** ඔවුන් සාර යයි හැඟීම් ඇතුව නැවත ගනියි ද, මෙසේ හරනා ලද්දාවූත් නැවත ගනියිද, යන අර්ථයි. **සාමං ඤාතං** තමන් විසින් නුවණින් දන්නා ලද, **සාමං දිටඨං** තමන් විසින් නුවණින් දක්නා ලද, **සමං විදිතං** තමන් විසින් ප්‍රකට කරන ලද,

උපනීතා ඛො මෙ තුමෙහ මහණෙනි, මා විසින් තෙපි මේ සන්දිට්ඨිකාදී ස්වභාව ඇති ධර්මයන් පමුණුවන ලද්දාහු යන අර්ථයි. **සඬිටඨිකො** යනාදියෙහි අරුත් විශුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලදී. **ඉදමෙතං පටිචච වුතතං** මේ වචනය තොප විසින් ස්වයං ඥාතාදී භාවය සඳහා වදාරණ ලදී.

තිණ්ණං ඛො පන මෙ තුමෙහ යනු කුමක් හෙයින් ආරම්භ කළ සේක්ද, යට වට්ට විවට්ට වශයෙන් දේශනා මුදුන් පමුණුවද්දී, එසේ පමුණුවන ලදී. මේ වූ කලී වෙනම අනුසන්ධියකි. මෙහි ලෝවැසි සත්ත්ව සමූහයා ප්‍රතිසන්ධියෙන් විශේෂයෙන් මෝඩය. එබැවින් ඔවුන්ගේ මුලාවන තැන නසා ප්‍රකට කරන්නෙමි යි මේ දේශනාව ආරම්භ කළහ.

එහි **සනනිපාතා** සමවධානයෙන් පිඬු බැවින් **ගබභ** ගැබ උපදනා සත්ත්වයාගේ අවකකනති හොති ඉපදීම වේ. තව ද සමහර තැනක 'ගබභ' මව්කුස කියන ලදී.

සත්ත්ව තෙමේ රැයක් මුළුල්ලෙහි පළමුකොට පිළිසිඳි කෙණෙහි මව්කුස වෙසේද, මරණයට අභිමුඛව නැගී සිටියේම ඒ මානවයා යයි මය. හෙතෙම යන්නේ ඇසිල්ලකුදු නො නවතී.

කිසිතැනක ගර්භයෙහි උපදනා සත්ත්වයා වදාළේය. 'ආනන්ද, යම් සේ අන්‍ය ස්ත්‍රීහු නව මසක් හෝ දස මසක් දරුගැබ කුසින් දරා වදත්, 'මෙහි සත්ත්වයාවම අදහස් කරන ලදී. ගබභසස අවකකනති හොති යනු ඒ සඳහා කියන ලදී.

ඉධ මේ සත්ත්ව ලෝකයෙහි **මාතා ච උතුනී** හොති මෙය ඍතු කාලය සඳහා කියන ලදී. ස්ත්‍රීන්ගේ යම් අවකාශයක දරුවා උපදීද, එහි මහත් වූ ලේ පිළාවක් පිහිටා බිඳී වැගිරෙයි. වස්තුව පිරිසිදු වෙයි. වස්තුව පිරිසිදු වූ කල්හි සත් දවස තෙක් එයට සුදුසු කාලය වෙයි. කෙත වෙයි. ඒ කාලය තුළ අත් ගැනීම් හිසකේ ගැනීම් ආදී ශරීර පරාමර්ශයෙන් ද දරුවන් හටගනී. **ගන්ධබ්බා** එහි එළඹෙන සත්ත්වයා **පචචුපට්ඨිතො** හොති ළඟ සිටියේ ම නො වේ. කර්මය නමැති යන්ත්‍රයෙන් ක්‍රියාත්මක වූ එක් සත්ත්වයෙක් ඒ අවකාශයෙහි උපදනේ වෙයි යන්න මෙහි අදහසයි.

සංසයෙන මා නිරෝගී වන්නෙම් ද, නැතිනම් මගේ දරුවා නිරෝගී වන්නේද, මහත් වූ ජීවිත සැකයෙන්, **ලොහිතං හෙතං භිකඛවෙ** එකල එතැනට පැමිණි මවගේ ලේ දරු සෙනෙහසින් පඬෙර වේද එහෙයින් මෙසේ වදාළහ. **වංකකං** දරුවන්ගේ කෙළිබඩු, කුඩා නඟුල සටිකා දිග දණ්ඩකින් කෙටි දණ්ඩකට ගැසීමේ ක්‍රීඩාව, (කල්ලි ගැසීම) **මොකඛචිකං** හාත්පස පෙරළෙන ක්‍රීඩාව, දණ්ඩක් ගෙන අහසෙහි තබා හෝ හිසපිට

තබා යට උඩ වශයෙන් පෙරළෙන ක්‍රීඩාව, **චිංගුලකං** තල් කොළ ආදියෙන් කළ සුළං වැදීමෙන් කරකැවෙන චක්‍රය (හුළං පෙත්ත) **පතතාළහ තං** කොළ නැළිය කියයි. එයින් වැලි ආදිය මනිමින් සෙල්ලම් කරති. **රථකං** කුඩා රථය **ධනුකං** කුඩා දුන්න,

සාරජජති රාගය උපදවයි. **බ්‍යාපජජතීති** ව්‍යාපාදය උපදවයි. **අනුපටඨිතකාය සතී** කයෙහි සිහිය කාය සති නම්. එහි නො එළවා යන අර්ථයි. **අනුරාධ විරොධං** රාගය හා ද්වේෂය ද **අභිනන්දති** තෘෂ්ණා වශයෙහි සතුටු වෙයි. තෘෂ්ණා වශයෙන් අහෝ සැපයි යනාදිය කියයි. **අභිවදති** සතුටු වචන කියයි. **අජෙඣාසාය තිටඨති** තෘෂ්ණාවෙන් ගිලී සැපය හෝ උපේක්ෂාව හෝ සතුටු වේවා. සැපය හෝ උපේක්ෂාව හෝ කැමති වේවා. දුක කෙසේ සතුටු වේද, මම දුප්පත්ය. මගේ දුකයයි ගන්නේ සතුටු වේ. **උපපජජති නන්දි** තණ්හාව උපදී. **තදුපාදානං** ඕ තෘෂ්ණාව ගැනීම් අර්ථයෙන් උපාදාන නම්. **තසසුපාදාන පචචයා භවො -පෙ- සමුදයො හොති** භාග්‍යවතුන් වහන්සේ විසින් නැවත එක්වරක් ද්විසන්ධි, ත්‍රිසන්ධි වශයෙන් මේ පටිච්ච සමුත්පාද වෘත්තය දක්වන ලදී.

දැන් විවෘත්තය දක්වන්නට **ඉධ ලොකෙ තථාගතො ලොකෙ උපපජජති** ආදිය වදාළහ. **එහි අපපමාණ චෙතසො** යනු මාර්ග චිත්තය හා යුක්ත වූ යන අර්ථයි. **ඉමං ඛො තුමෙහ භිකඛවෙ සංඛිතෙන තණහා සංඛය විමුතතිං ධාරෙථ** මහණෙනි, මෙසේ සැකෙවින් දේශනා කරන ලද මාගේ තෘෂ්ණා සංඛය දේශනාව තෙපි නිරතුරුව දැරිය යුතුය. නොනැසිය යුතුය. මෙහි දේශනාවම නිවන් ලැබීමට හේතු හෙයින් විමුත්ති යයි කියන ලදී.

මහා තණහා ජාල තණහා සංසාට පටිමුකකනති තෘෂ්ණාව මැසිම කළ අර්ථයෙන් මහා තණ්හා ජාලාය, ගැළපීම කළ අර්ථයෙන් සංසාටය, මෙසේ මේ මහා තෘෂ්ණාජාල සංඛ්‍යාත තෘෂ්ණා සංසාටයෙහි ද, බැඳුණෙකු කොට මේ කෙවුල් පුත් සාති මහණ සලකවු. ඇතුළත පිවිසියෙක. ඇතුළත් වූයෙක. ඔහු ධරන්නහුය යන අර්ථයි. සෙස්ස සියලු තන්හි ප්‍රකට අර්ථ ඇත්තේ ය.

මහා තණ්හාසංඛය සූත්‍ර වර්ණනාව නිමියේය.

1-4-9

එවමෙමසුතං යනු මහා අස්සපුර සූත්‍රයයි. එහි අංගෙසු අංග ජනපදයේ රාජ කුමාරයෝ, ඔවුන් පදිංචිව සිටි එක් ජනපදයක්.

'අංග' යයි ව්‍යවහාර කරයි. ඒ අංග ජනපදයෙහි **අසසපුර** නාම අංගානං නිගමෝ අස්සපුර යන නමින් හඳුන්වන එක් නියම්ගමකි. එය ගොදුරුගම් කොට වාසය කරයි යන අදහසයි. භගවා එතදවොච මේ අය **සමණා සමණාති භිකඛවෙ ජනෝ සඤ්ජානාති මහණෙනි**, ඔබලා ශ්‍රමණයෝ ශ්‍රමණයෝ යයි ජනයා විසින් හඳුන්වනු ලැබේ යයි වදාළ සේක. මෙසේ මේ අය ලජ්ජීහුය. සුපේශල ශික්ෂාකාමීහුය. උදාර ගුණ ඇත්තාහු වෙති. භික්ෂු සංඝයාගේ ගුණම කියති. කුඹුරෙන් හේනෙන් අවුත් රාත්‍රී කෑම ගත් පසුවද, ගෙදර ඉන්දදී ද නින්දට යනතෙක්ම භික්ෂු සංඝයාගේම ගුණ කියත්. භාග්‍යවතුන් වහන්සේ ඒ මිනිසුන්ගේ යටහත් පහත් ගති පැවතුම් දැන භික්ෂු සංඝයා පිඬුසිඟා යාමෙහි යොදවා මෙසේ වදාළ සේක.

යෙ ධම්මා සමණ කරණාව බ්‍රාහමණ කරණාව යම් ධර්ම කෙනෙක් සමාදන්ව පුරන ලද්දාහු සමිතපාප ශ්‍රමණයකුත් බාහිතපාප බ්‍රාහ්මණයකුත් කෙරෙත් ද යන අර්ථයි. 'ශ්‍රමණයා විසින් කළයුතු ධර්මයෝ මෙහි කියන ලදී. මහණෙනි, ශ්‍රමණයා විසින් කටයුතු තුනෙකි. කවර තුනක්ද යත්, අධිශීල ශික්ෂා සමාදානය, අධිචිත්ත ශික්ෂා සමාදානය, අධිප්‍රඥා ශික්ෂා සමාදානය යන තුනයි. ඔව්හු ශ්‍රමණ කරණයෝ වෙත්මැයි. මෙහි වනාහි හිරි ඔතප් ආදී වශයෙන් දේශනාව විස්තර කරන ලදී.

එවං නො අයං අමහාකං යන මෙහි නො යනු නිපාත මාත්‍රයකි. අපගේ යන අර්ථයි. **මහපඵලා මහානිසංසා** යන දෙකම අර්ථ වශයෙන් එක සමානය. අවඤ්ඣා නොසිස් වූවාහූ **සඵලා** ඒ පදයේම අර්ථයි. යමකගේ ඵලයක් නැද්ද, ඕ වඳ වූවා නම් වේ. **සඋද්‍රයා** වැඩීම් සහිත වූවා ඒ සඵලයන්නේම සමාන වචනයි. **එවංහි ඛො භිකඛවෙ සිකඛිතබබං මහණෙනි**, මෙසේ තොප විසින් හික්මිය යුතුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ මෙතෙක් කරුණුවලින් ලජ්ජා භය ආදී ධර්මයන්ගේ ගුණ වදාළ සේක.

කුමක් හෙයින් ද වචන මාර්ගය පසිඳිනා පිණිසය. ඉදින් පැවිදි වූ නොබෝ කල් ඇති කිසි බාල භික්ෂුවක් මෙසේ කියන්නේ නම් 'භාග්‍යවතුන් වහන්සේ හිරි ඔතප් ආදී ධර්මයන් සමාදන්ව පවතීවයි වදාරති. ඒ ධර්මයන් සමාදන් වී පැවැත්මේ අනුසස් කවරේදැයි (අසති) ඔහුගේ වචන මග පසිඳිනා පිණිස මේ මේ ආනිසංස වේයයි (කීය) මේ ධර්මයෝ සමාදන්ව පුරන ලද්දාහූ සමිතපාප ශ්‍රමණයකු බාහිතපාප බ්‍රාහ්මණයකු යයි නම් කරති. සිව්පස ලාභය උපදවති. ප්‍රත්‍ය දායකයන්ට මහත්ඵල ආනිශංස ලබා දෙති. පැවිද්ද නො වඳ වූ සඵල වූ වැඩීම් සහිත වූවක් කෙරෙතියි ගුණ වදාළහ. මෙහි මෙය කෙටියෙන් කියන ලදී. විස්තර වශයෙන් කථාව සතිපට්ඨාන සූත්‍රයේ ආ පරිදිම දතයුත්තේය.

හිරොත්තපෙපන යනු 'යමකින් ලජ්ජාව උපදීද ඒ ලජ්ජාවමයි. යමකින් බිය උපදීද ඒ බියමයි. මෙසේ විස්තර කරන ලද ලජ්ජාවෙන් හා බියෙන් ද, තව ද මෙහි අධ්‍යාත්මයෙහි උපදින්නේ ලජ්ජාවයි. බාහිරව උපදින්නේ ඔත්තප්පයයි. 'බය'යි. ලජ්ජාව තමන් අධිපතිකොට ඇත්තේය. බිය ලෝකය අධිපතිකොට ඇත්තේය. හිරි ලජ්ජා ස්වභාවයෙන් සිටී. ඔත්තප්පය භය ස්වභාවයෙන් සිටී. මේ ධර්ම දෙදෙන ලෝකය පාලනය කරන හෙයින් ලෝක පාලක ධර්මයෝ යයි කියන ලදී. මෙහි විස්තරාර්ථ කථා විශුද්ධි මාර්ගයෙහි කියන ලදී.

මහණෙනි, මේ ශුක්ල ධර්මයෝ දෙදෙනෙක් ලොව පාලනය කරති. කවර දෙදෙනෙක්ද යත්, හිරි ද ඔතප් ද යන දෙදෙනා විසිනි. මහණෙනි, මේ ශුක්ල ධර්මයෝ දෙදෙන ලොව රකිති. තව ද මහණෙනි, මේ ශුක්ල ධර්මයෝ දෙදෙන ලොව නො රක්නාහු නම් මේ ලෝකයේ මව්ය, කුඩා මව්ය, නැන්දාය, ඇදුරු බිරිය, ගුරුන්ගේ බිරිඳය යනාදී වශයෙන් වෙනසක් නො පෙනෙන්නේ ය. එළු බැටළුවන් මෙන් ද, ඌරු කුකුළු, ආදීන් මෙන් ද බලු සිවල්ලු යම්සේද එමෙන් ලෝවැසි මිනිස්සු ද යන්නෝ ය. මොව්හූ ජාතක යේ දේව ධර්මයයි කියන ලදී.

හිරි ඔතප් දෙකින් යුක්ත වූ, කුශල ධර්මයන්ගෙන් යුක්ත වූ, ශාන්ත වූ සත්පුරුෂයෝ ලෝකයේ දේව ධර්මයයි කියනු ලැබේ.

මහා චුන්ද ස්ථවිරයන්ට කෙලෙස් ලිහා දමන පිළිවෙත දක්වන ලදී වදාළේමය. 'අන්‍යයෝ ලජ්ජා රහිතයෝ වන්නාහ. අපි මෙහි ලජ්ජා

සිත් ඇත්තෝ වන්නෙමු'යි සැලකිය යුතුය. අන්‍යයෝ ඔතප් රහිතයෝ වන්නාහුය. අපි ඔතප් ඇතියෝ වන්නෙමු යයි සැලකිය යුතුය.

යළිත් මොව්හූ මහා කාශ්‍යප ස්ථවිරයන්ට අවවාදොප සම්පදාව කොට යයි දක්වන ලද්දාහුය. මෙසේ වදාරණ ලදී. 'කාශ්‍යප එහෙයින් මෙහිලා තොප විසින් මෙසේ හික්මිය යුතුය. ස්ථවිර නවක මධ්‍යමයන් කෙරෙහි මාගේ දැඩි වූ හිරි ඔතප් එළඹ සිටියේ වන, කාශ්‍යප තොප විසින් මෙසේ හික්මිය යුතු'

මොව්හූ 'ශ්‍රමණ ධර්මයෝ' නමැයි දක්වන ලද්දාහුය. යම්හෙයකින් මෙතෙකින් පැවිද්දෙහි ඵලය මුදුන්පැමිණියේ නම් නොවේද, එහෙයින් අනෙක් ශ්‍රමණ කරණ ධර්මයන් දැක්වීමට **සසියා ඛො පන භිකඛවෙ තුමහාකං** යනාදිය වදාළහ. එහි **සාමඤඤඵලෙ** යනු සංයුක්තකයේ මහණෙනි, ශ්‍රමණ බව කවරේද, මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයමැයි. සම්‍යක් දෘෂ්ටිය -පෙ- සම්‍යක් සමාධිය යන මොහුය. මහණෙනි, මේ ශ්‍රාමාණ්‍ය යයි කියනු ලැබේ. මහණෙනි, ශ්‍රාමාණ්‍යර්ථය කවරේද, මහණෙනි, යම් රාගය ක්ෂය කිරීමක්, ද්වේෂය ක්ෂය කිරීමක්, මෝහය ක්ෂය කිරීමක් වේද මහණෙනි, මේ ශ්‍රාමාණ්‍යර්ථයයි පැවිද්දේ ඵලය යයි කියනු ලැබේ. මාර්ගය ශ්‍රමණ බව යයිද, ඵල නිර්වාණ ශ්‍රමණ භාවයේ අර්ථයයිද වදාරන ලදී. එහෙත් මෙහිදී මාර්ගයත් ඵලයත් එක්කොට ශ්‍රාමාණ්‍යර්ථය වදාරන ලදැයි දතයුතු.

ආරොචයාමි කියමි. පටිවෙදයාමි දන්වමි. පරිසුද්ධා නො කාය සමාචාරො මෙහි කාය සමාචාරය පිරිසුදුය. අපිරිසිදු යයි දෙපරිදි වේ. යම් ශ්‍රමණයෙක් පරපණ නසා ද, සොරකම් වංචා කෙරේද, මිය හසරෙහි හැසිරේද ඔහුගේ කාය සමාචාරය අපිරිසිදු වූයේ වෙයි. මෙය කර්ම පථ වශයෙන් ම වළකන ලදී. යම්කිසි ශ්‍රමණයෙක් අතින් හෝ ගලකින් හෝ දණ්ඩකින් හෝ අනුන් පෙළයි ද, විශේෂයෙන් පීඩාවට පත් කරයිද, ඔහුගේ කාය සමාචාරය අපිරිසිදු වූයේ වේ. මෙය ශික්ෂාපද මගින්ම පණවන ලදී. මේ සූත්‍රයෙහි මේ දෙකම නො වදාරා පරම ස්ලේඛ නමැයි වදාරන ලදී. ඒ එසේමයි. යම් ශ්‍රමණයෙක් පැන් කළයෙහි පැන් බොන්නා වූ හෝ පාත්‍රයෙහි ආහාර ගන්නා වූ, කවුඩන් එළවීම් වශයෙන් අතක් හෝ ගලක් හෝ දණ්ඩක් හෝ නගාද, ඔහුගේ කාය සමාචාරය අපිරිසිදුය. ඒවායින් වෙන්වූයේ පිරිසිදු වේ. **උතතානො** උද්ගත වූයේ ප්‍රකට වූයේ

විවටෝ අනාවරණය වූයේ නොවැසුනේ දෙකින්ම පිරිසිදු බව දක්වයි. නව ඡිද්දවා සියලු කල එක සමාන වූයේ අතරින් සිදුරු රහිත වූයේ සංවුතෝ කෙලෙසුන්ට දොර වැසීමෙන් වූයේ වරද වැසීම සඳහා නොවූයේ,

වචී සමාචාරෙපි වාක් සමාචාරයෙහි, යම්කිසි භික්ෂුවක් බොරු කියයි ද, හිස් අර්ථ රහිත වචන කථා කරයි ද, එරුස වචන කියයි ද, සම්පප්‍රලාප කියයි ද, ඔහුගේ වාක් සමාචාරය අපිරිසිදු වූයේ නම් වේ. මේ අධර්ම කර්මපථ වශයෙන්ම වළකන ලදී. තව ද ගෘහපතියෝ යයි හෝ දාසයෝ යයි හෝ මෙහෙකරුවෝ යයි හෝ මේ ආදීන් ආක්‍රෝශ කරමින් කියාද ඔහුගේ වාක් සමාචාරය අපිරිසිදු වූයේ වෙයි. මෙයද ශික්ෂාපද මගින්ම ප්‍රතික්ෂිප්තය. මේ සූත්‍රයෙහි මේ දෙක නො වදාරා පරම සලෙලඛ නමින් වදාරා ඇත. යම් භික්ෂුවක් හෝ තරුණ මහණෙකු විසින් හෝ ළදරු සාමණේරයකු විසින් හෝ, වහන්ස කිමෙක්ද, අපගේ උපාධ්‍යායයන් වහන්සේ දැක්කේද, ඇසුවිට ඇවැත්නි, බොහෝ භික්ෂුණීහූ එක් පෙදෙසක හැසිරුණහ. ඔබගේ උපාධ්‍යායන් ද විකිණිය හැකි පලා පොදියක් ඔසවාගෙන යන්නට ඇතැයි මේ ආදී නයින් සිනාසෙන සුළු කථා විහිළුවටවත් කියයිද, ඔහුගේ වාක් සමාචාරය අපිරිසිදුය. විපරීත පරිශුද්ධ නම්.

මනඃ සමාචාරයෙහි යම් මහණෙක් අභිධ්‍යා බහුල වීද, ව්‍යාපාදයට පැමිණි සිත් ඇත්තේ, මිථ්‍යාදෘෂ්ටි ගත්තේද, ඔහුගේ චිත්ත සමාචාරය අපිරිසිදු වූයේය. මේ වනාහි කර්මපථ විසින්ම වළකන ලදී. යමෙක් වනාහි එළවා තබන ලද රන් රිදී ඉවසාද, ඔහුගේ චිත්ත සමාචාරය අපිරිසිදු වූයේ වෙයි. මෙයද ශික්ෂාපද විසින්ම වළක්වන ලදී. මේ සූත්‍රයෙහි මේ දෙක නො වදාරා පරම සල්ලේඛ වශයෙන් වදාරණ ලදහ. ඒ එසේමැයි. යම් මහණෙක්, තරුණ මහණෙකු විසින් හෝ සාමණේර නමක විසින් හෝ කාම විතර්කයක්, ව්‍යාපාද විතර්කයක්, විහිංසා විතර්කයක් උපදවන ලද්දේ ද, ඔහුගේ චිත්ත සමාචාරය අපිරිසිදුය. විපරීත වූ පිරිසිදු නම්.

ආජීවයෙහි 'යම් මහණෙක් ආජීවය හේතුකොට වෙදකම් ගිහියන්ගේ ලියුම් ගෙන යාම්, භාණ්ඩයන් රැකීම කෙරේද, වණවලට ආලේප දේද, තෙල් සිඳීද' එක්විසි අනේසනාවෙන් ජීවිකාව කෙරේද, යමෙක් සතුටුකොට වළඳද, ඔහුගේ ආජීවය අපිරිසිදු වේ. මෙය වනාහි ශික්ෂාපද පැනවීමෙන් පිහිටුවා ස්ථාවර කොට ඇත. මේ සූත්‍රයෙහි මෙය

නොවදාරා පරම සල්ලේඛ නමැයි වදාරණ ලදී. යම් මහණෙක් ගිතෙල්-වෙඬරු, තෙල්, මී, සකුරු ආදිය ලැබ 'හෙට හෝ අනිද්දා ප්‍රයෝජනයට ගන්නේ යයි රැස්කොට වළඳාද, යමෙක් වනාහි නිම්බංකුරාදිය (කොසඹ) දැක සාමණේරයන්ට 'ඇවැත්නි, අංකුර කවයි' කියාද, සාමණේරයෝ 'තෙරුන් වහන්සේ කනු කැමැත්තේ' යයි සූදානම්කොට දෙද්ද, යළි තරුණ භික්ෂූන්ට හෝ සාමණේරයන්ට හෝ ඇවැත්නි, පැන් බොවයි කියාද, තෙරුන් වහන්සේ පැන් බොනු කැමැත්තාහයි පැන් සක සෝදා පැන් දෙත්ද, එය වළඳන්නහුගේ ආජීවය අපිරිසිදු වේ. පිරිසිදු බව විපරීත වේ.

මත්තඤ්ඤූ යනු සෙවීම, පිළිගැනීම, පරිභෝගය යන තන්හිදී පමණ දන්නා වූ, යුක්ත වූවාහූ, **ජාගරිය මනුයුත්තා** රෑ දාවල් සය කොටසක් කොට, එක් කොටසක සැතපී, නිදා නිදිවැරීමෙහි යෙදුනාහූ, **සීහ සෙය්‍යං** යන මෙහි කාමභෝගී සෙය්‍යාව, ප්‍රේත සෙය්‍යාව, සිංහ සෙය්‍යාව, තථාගත සෙය්‍යාව යයි නිදීමේ ක්‍රම හතරකි. 'මහණෙනි, බොහෝසෙයින් කම්සුව වළඳන සත්ත්වයෝ වම් ඇලයෙන් නිදත්. මෙය කාමභෝගී සෙය්‍යාව නම්, ඔවුනතුරෙන් බොහෝසෙයින් දකුණු ඇලයෙන් නිදන්නෝ නම් නැත. බොහෝසෙයින් මහණෙනි, ප්‍රේතයෝ උඩුකුරුව නිදත්. එය ප්‍රේත සෙය්‍යා නම්. මද වූ මස් ලේ ඇති බැවින් ඇටසැකිලි වලින් යුක්ත වූවන්ට එක් ඇලයකින් නිදන්ට නොහැකි නිසා උඩුකුරුව නිදති. බොහෝසෙයින් මහණෙනි, සිංහ මිගරාජයෝ වලිගය කලවා අතර රුවා දකුණු ඇලයෙන් නිදති. මේ සිංහ සෙය්‍යාව යයි කියති. තේජසින් උණුසුම් බැවින් සිංහයෝ පෙර දෙපය එක තැනක තබා, වලිගය කලවා අතර තබා, පෙර පා පසු පා නගුට යන අංග සිටි සේ සලකා පෙර දෙපය මත්තෙහි හිස තබා නිදති. දවසක් නිදාගෙන වුව ද පුබුදින විට බිය රහිතව පුබුදියි. හිස නගා පෙර පා සිටි ආකාරය සලකයි. ඉදින් මද තැනක් හැර සිටියේ නම් මෙය තොපගේ ජාතියට, ශූරභාවයට නො සුදුසු යයි නො සතුටුව එහිම නිදත්. ගොදුරු පිණිස නොයයි. මද තැනක් හෝ නො හැර සිටියේ නම්, තාගේ ජාතියට ද, ශූර භාවයට ද සුදුසු යයි තුටු පහටුව නැඟිට.....කෙසරු සලා සිංහනාද කොටගොදුරු සඳහා නික්මෙයි. චතුර්ථධ්‍යාන සෙය්‍යාව (නිදන පිළිවෙළ) තථාගත සෙය්‍යාව නම් වේ. ඔවනතුරෙන් සිංහ සෙය්‍යාව ආයේය. මේ තේජසින් ද උණුසුම් බවින් ද යුතු නිසා උත්තම සෙය්‍යා නම් වේ.

පාදෙ පාදං දකුණු පාදය හා වම් පාදය, අචචාධායා මඳක් ඉක්ම තබා, ගොප් ඇටයෙන් ගොප් ඇටය, දණහිසෙන් දණහිස ගැටෙනවිට වේදනාව උපදී. සිත එකඟ නොවේ. නිදීම අපහසු වේ. යම් සේ ඒ ස්ථාන නො ගැටේද, එසේ නොගැටෙන ලෙසින් තබාගැනීමෙන් වේදනාව නූපදී. සිත එකඟ වේ. නිදීම පහසු වේ. එහෙයින් මෙසේ කීහ.

අභිඤ්ඤං ලොකෙ යනාදිය චුල්ල හත්ථි පදෝපම සූත්‍රයෙහි විස්තර කරන ලදී. නැවත මෙය **සෙය්‍යථාපි භික්ඛවෙ** උපමාවක් වදාරණ ලද්දී ද, එහි **ඉණ ආධාය** පොලියට මුදල් ගෙන **ව්‍යතති කරෙය්‍ය** කෙළවර කරන්නේ යම්සේ ඔවුනතුරෙන් කහවණුවක් පමණකුදු අන්තයක් ඉතිරි නො වන්නේ ද, එපරිද්දෙන්ම කරන්නේ ය. මුළුමනින් ම පෙරළා දමන්නේ ය යන අර්ථයි. **තතො නිදානං ණය** නැති බව නිසා, හෙතෙම ණය නැත්තෙමියි සිහි කරන්නේ බලවත් සතුටට පත් වේ. එහෙයින් වදාරණ ලදී. **ලභෙත පාමොජ්ජං අධිගචෙඡය්‍ය සොමනස්සං** යනු එහෙයින් කියන ලදී.

විසභාග අසමාන වූ වේදනාවන්ගේ ඉපදීමෙන් කියතකින් මෙන් සිව් ඉරියව් සිඳිමින් පෙළේ යන අදහසින් 'ආබාධ' නම් වේ. එයින් උපදනා දුකින් දුකට පත්වූයේ **දුකඛිත** නම්. දැඩි සේ ගිලන් වූයේ **බාළහගිලාන** නම්. නවඡා දෙය්‍යා දැඩි වූ ලෙඩ රෝගවලින් පීඩිත බැවින් රුචි නො වන්නේ ය. **බලමතතා** බලයමැයි. ඔහුගේ කයෙහි බලය නො වන්නේ ය යන අර්ථයි. **තතො නිදානං** යනු නිරෝගි බව කරුණුකොට. යම්හෙයකින් අරෝග වෙමි. මෙනෙහි කරන ඔහුට ඒ දෙකම වේ. එහෙයින් වදාරන ලදී. **ලභෙථ පාමොජ්ජං, අධිගචෙඡය්‍ය සොමනස්සං**

න චස්ස කිඤ්චි භොගානං වයො කහවණුවක් පමණකුදු භෝගයන්ගේ විනාශයක් නො වන්නේ ය. **තතො නිදානං** බන්ධනයෙන් මිදීම කරණ කොට, ඉතිරි සියල්ල පෙර කී අයුරින් සියලු පදයන්හි යෙදිය යුතුය.

අනතතාධිනො තමන් කෙරෙහි ප්‍රධාන නො වූයේ, තමා ගේ කැමැත්තෙන් කිසිවක් කරන්නට නො ලබයි. **පරාධීනො** අනුන් කෙරෙහි ප්‍රධාන වූයේ, අනුන්ගේම කැමැත්තෙන් පවතී. **න යෙන කාමංගමො** යම් දිසාවකට යාමට ඔහු කැමති වේද, රුචිය උපදීද එහි යන්නට නො ලබයි.

දාසව්‍යා දාස භාවයෙන්, භුජිසෙසා තමන් සතු වූයේ, තතො නිදානං ක්ෙම භූමිය නිදානය කොට කරුණු කොට,

ඉමෙ පඤ්චනීවරණෙ අප්පහීනෙ යන මෙහි භාග්‍යවතුන් වහන්සේ ප්‍රහීණ නොවූ කාමච්ඡන්ද නීවරණය ණය සමානකොට අනෙක් අය රෝගාදීන් සමාන වූවන් කොට දක්වයි. එහි මොවුන් සමාන බවය. යමෙක් වනාහි අන්‍යයන්ගේ ණය ගෙන විනාශ කෙරේද ඔවුන් විසින් 'ණය දෙවයි' ඉල්ලා සිටිනු ලබන්නේද, එරුෂ වචන කියනු ලබන්නේ ද, බඳිනු ලබන්නේ ද විරුද්ධව කිසිවක් කියන්ට නොහැකි වෙයි. සියල්ල ඉවසයි. යම්හෙයකින් ඒ ණය ඔහුගේ ඉවසීමට කරුණු වේද එහෙයිනි. එපරිද්දෙන්ම යමෙක් යමෙකු කෙරෙහි කාමච්ඡන්දයෙන් ඇලේද, තෘෂ්ණාවෙන් යුතුව ඒ වස්තුව ගනීද, හෙතෙම ඔහු විසින් බැණවදිනු ලබන්නේද, බඳිනු ලබන්නේද, පහර දෙනු ලබන්නේද, සියල්ල ඉවසයි. යම්හෙයකින් ඒ කාමච්ඡන්දය ඔහුගේ ඉවසීමට කරුණු වේද, එහෙයිනි. ගෙහිමියන් විසින් වධ කරනු ලබන්නා වූ දාසියන් මෙනැයි, මෙසේ ණයක් මෙන් කාමච්ඡන්දය ගතයුතුය.

යම්සේ පිත්ත රෝගයෙන් ආතුර වූවෙකුට මීසකුරු ආදිය දුන්නේ වී නමුත් පිත්ත රෝගයෙන් ආතුර නිසා මී සකුරු ආදීන්ගේ පැණිරස නො විඳීද, තිත්ත යයි කියා වමාරන්නේද එපරිද්දෙන් ව්‍යාපාදයට පැමිණි සිත් ඇත්තා වැඩ කැමති ආචාර්ය උපාධ්‍යාය ආදීන් අවවාද දුන්නත් ඒ අවවාද පිළි නො ගනී ද, 'තෙපි මට ඉතා උපද්‍රවකාරී කියා සිවුරු හරීද, පිත්තයෙන් ආතුර වූ තැනැත්තා මී-උක් රස හරනාක් මෙන් ක්‍රෝධයෙන් ආතුර වූ තැනැත්තා එසේ ආතුර බැවින්ම ධ්‍යාන සුව ඇති ශාසන රසය නො විඳී. මෙසේ රෝගයක් මෙන් ව්‍යාපාදය පිළිගත යුතුය.

යම් නැකැත් දිනයෙක සිපිරිගෙයි සිටි කෙනෙක් නැකැත් කෙළි නො දකීද, හෙතෙම දෙවන දවසේ නිදහස් වූයේ, අහෝ ඊයේ නැකැත් කෙළි, නැටුම් ගැයුම් වැයුම් ඉතා මනස්කාන්තයයි අසාත් පිළිතුරු නො දේද, එයට හේතුව නැකැත් කෙළි නො දැකීමයි. නො විඳීමයි. එපරිද්දෙන් ථීනමිද්ධයෙන් මඩනා ලද ශ්‍රමණයා විසිතුර න්‍යාය ඇති ක්‍රම ඇති ධර්මශ්‍රවණය පවත්නා කල්හි එහි මුල මැද අග අවබෝධ කර නොගනී. හෙතෙම ධර්මශ්‍රවණය අවසන් වූ කල අහෝ ධර්මශ්‍රවණය, කාරණය උපමාව, අර්ථවත් බව යයි ධර්ම දේශනාවගේ ගුණ

කියන්නවුන් ගේ වචන අසා නිහඬව සිටී. පිළිතුරු නොදේ. ඇයිද යත් ථීනමිද්ධය නිසා ධර්මය ශ්‍රවණය නො කළ බැවිනි. මෙසේ ථීනමිද්ධය සිරගෙයක් මෙන් දතයුතුය.

නැකැත් කෙළි කෙළින්නා වූ දාසයෙක් 'තොපට ඉක්මන් කටයුත්තක් ඇත වහා යව, 'නොගියේ නම් අත් පා හෝ කන් නාසා සිඳිණු ඇත'යි කියන ලද්දේ නම් වහා දුවයයි. නැකැත්කෙළියේ මුල මැද අග විඳින්නට ඔහුට නො හැකි වේ. කුමක් හෙයින්ද, පරාධීන බැවිනි. එ පරිද්දෙන් විනයෙහි ප්‍රගුණ නොවූ අය, ආරණ්‍යගත වුවද කැප මසෙහි අකැපය යන හැඟීම උපන් කල්හි විවේකය හැර සිල් පිරිසිදු කරනු පිණිස විනයධරයකු වෙත යා යුතු වෙයි. විවේක සුව විඳින්නට නො ලැබේ. කවර හෙයින්ද, උද්ධච්ච කුක්කුච්චයෙන් යුක්ත, මඩනා ලද බැවිනි. මෙසේ උද්ධච්ච කුක්කුච්චය දාස බව මෙන් දතයුතුය.

යම්සේ කාන්තාර මගකට පිළිපන් පුරුෂයා, සොරුන් විසින් මිනිසුන්ගේ ධනය පැහැරගත් තැන්, ආගිය තැන්, දඬු ශබ්දයෙන් ද පක්ෂීන්ගේ හඬින් ද, සොරු ආවාහු යයි (හැඟී) (ඔවුන්) සිටියේ නමුත් ගියේ නමුත් හටගත් සැක ඇතිව, හාත්පස සැක ඇතිව සිටින්නේ ද, ගිය තැනට වඩා ආ තැනම බොහෝ වේද, හෙතෙම දුකින් මහන්සියෙන් ක්ෂේම භූමියට පැමිණෙන්නේ හෝ නො පැමිණෙන්නේ හෝ වෙයි. එපරිද්දෙන් යමෙකුට බුද්ධාදී අටතැන්හි සැකය උපන්නේද, 'හෙතෙම බුදු වූයේ ද, බුදු නොවූයේ ද ආදී වශයෙන් සැක කරන්නේ ද, ගුණ සලකා ශ්‍රද්ධාවෙන් ගන්නට නො හැකි වේ. නො හැකි වන නිසා මාර්ගයට හෝ ඵලයට නො පැමිණේ නුයි, මෙපරිද්දෙන් කාන්තාර මාර්ගයේ සොරු ඇත්දැයි නැද්දැයි නිතර නිතර නැවත සිතන්නේ ද, එසේ සිතමින් ඉදිරියට යාම ආපසු යාම, හාත්පස යාම බැසගැනීම, තැති ගැනීම, උපදවමින් අභය භූමියට පැමිණීමට අනතුරක් කෙරේද, එපරිද්දෙන් සැකයද, 'බුදුහු වීද බුදු නොවීද' ආදී වශයෙන් සැකය ඇති කොට නැවත නැවත හිතේ ඉදිරියට, පසුපසට-හාත්පසට, බැසගැනීම තැති ගැනීම උපදවන්නා වූ අයට ආර්ය භූමියට පැමිණීමට අන්තරා කිරීම කාන්තාර මාර්ගය වශයෙන් දතයුතුය.

දැන් **සෙය්‍යථාපි භික්ඛවෙ ආනණ්‍යං** යන මෙහි භාග්‍යවතුන් වහන්සේ ප්‍රහීණ වූ කාමච්ඡන්ද නීවරණය ණය නැති බවට සමානකොට

අනෙක් නීවරණයන් නිරෝගි බවට සමකොට දක්වයි. මේ එහි සමාන බවයි. යම්සේ පුරුෂයෙක් ණය ගෙන, කර්මාන්තයන්හි යොදවා කර්මාන්තය දියුණුකොට 'ණය නම් පළිබෝධයට මුල' යයි සිතා පොළිය සහිත ණය ගෙවා, ගිවිසුම ඉරා දමන්නේ ද, එතැන් පටන් ඔහු නැවත දූතයන් හෝ පණිවුඩකරුවන් හෝ හසුන් නො එවන්නේද, ඒ ණය හිමියන් හමුවීත් ඉදින් කැමති නම් තම ආසනයෙන් නැගිටින්නේ ද, කැමති නම් නො නැගිටින්නේ ද වේ. කවර හෙයින්ද, ඔහු සමග බැඳීම් නැති හෙයිනි. ඇලීමක් නැති හෙයිනි. එපරිද්දෙන්ම මහණතෙම කාමච්ඡන්ද නම් වූ පලිබෝධ මූලය, සතිපට්ඨානයෙහි කී අයුරින් අශුභ නිමිත්ත ආදී සය ධර්මයන් වඩා කාමච්ඡන්ද නීවරණය ප්‍රහීණ කරයි. මෙසේ දුරුකළ කාමච්ඡන්දය ඇති ඔහුට, යම්සේ ණයෙන් මිදුණු පුද්ගලයාට ණය හිමියන් දැක බියක් ඇති නොවේ ද, තැති ගැනීමක් ඇති නොවේ ද, එපරිද්දෙන් අනුන් සතු වස්තුව කෙරෙහි ඇලීමක් බැඳීමක් නැති වේ. දෙවඟනන්ගේ රූ දිටුවත් කෙලෙස් නූපදී. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ණය නැති බව මෙන් කාමච්ඡන්ද නීවරණය උපමාකොට දක්වා වදාළ සේක.

නැවත යම්සේ පිත් රෝගයෙන් පෙළෙන්නා වූ පුද්ගලයාට බෙහෙත් කිරීමෙන් ඒ රෝගය සුවකොට එතැන් පටන් මී-සකුරු ආදීන්ගේ රස විඳීද, එපරිද්දෙන් ශ්‍රමණ තෙමේ, මේ 'ව්‍යාපාදය අනර්ථකාරී'යයි (මෛත්‍රී ආදී) ධර්ම සය වඩා ව්‍යාපාද නීවරණය දුරු කෙරේ. හෙතෙම ප්‍රහීණ වූ ව්‍යාපාද ඇත්තෙ, යම්සේ පිත් රෝගයෙන් සුව වූ පුද්ගලයා, මී උක්සකුරු ආදී මිහිරි රසයන් ප්‍රිය කෙරෙමින් පරිභෝග කෙරේද, එපරිද්දෙන් ආචාර ප්‍රඥප්තීන්ගෙන් හික්මවනු ලබන්නේ හිසින් පිළිගෙන ප්‍රිය කෙරෙමින් හික්මෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ නිරෝගි බව මෙන් ව්‍යාපාද ප්‍රහීණය දක්වා වදාළහ.

යම්සේ උත්සව දවසෙහි සිරගෙට ඇතුල් කළ පුරුෂයා අනෙනක් උත්සව දිනයෙහි 'පෙරත් මම ප්‍රමාදදෝෂයෙන් බඳනා ලද්දේ ඒ උත්සව දින ප්‍රීතිය නො වින්දෙමි. මෙවිට ප්‍රමාද නො වන්නෙමි.' යම්සේ ඔහුගේ පසමිතුරෝ අවකාශ නො ලබත්ද, එපරිද්දෙන් අප්‍රමාදීව උත්සව ප්‍රීතිය විඳ අහෝ, උත්සවය ප්‍රීතියයි උදන් අනන්නේ ද, එපරිද්දෙන් ශ්‍රමණ තෙමේ 'මේ ථීනමිද්ධය නම් මහා අනර්ථකාරීයයි භෝජනයේ පමණ දැනීම ආදී ධර්ම සය වඩා ථීනමිද්ධය දුරු කරයි. හෙතෙම මෙසේ ප්‍රහීණ කළ ථීනමිද්ධය ඇත්තේ, සිරගෙයින් මිදුණු පුද්ගලයා සතියක්

පුරා උත්සවයේ මුල මැද අග යන තැන් තැන්හි සතුට විඳිමින් සිටීද, එපරිද්දෙන් දහම් නමැති උත්සවයේ මුල මැද අග විඳිමින් සිව්පිළිසිඹියා සමග රහත් බවට පැමිණෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ සිරගෙයින් නිදහස්වීම මෙන් ථීනමිද්ධයාගේ ප්‍රහාණය වදාළහ.

යම්සේ වනාහි දාසයෙක් කිසියම් මිත්‍රයෙකු ඇසුරුකොට වහල්හිමියාට මුදල් දී, තමන් දාසබවින් මුදා එවක් පටන් තමන් කැමති යමක් කරන්නේ ද එපරිද්දෙන් ශ්‍රමණයා මේ 'උද්ධච්ච කුක්කුච්චය' නම් මහා අනර්ථකාරීය. ධර්මසය වඩා (බහුශ්‍රැත භාවය ආදී) උද්ධච්ච කුක්කුච්චය දුරු කෙරේද, හෙතෙම මෙසේ පහ වූ උද්ධච්ච කුක්කුච්චය ඇත්තේ, යම්සේ දාස භාවයෙන් මිදුණු පුද්ගලයා යම්දෙයක් කැමතිනම් එය කෙරේද, කිසිවෙක් බලහත්කාරයෙන් ඔහු නො වළකාද, එපරිද්දෙන් භික්ෂුව කැමති සේ නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදාවට පැමිණේ. ඔහු උද්ධච්ච කුක්කුච්චය බලාත්කාරයෙන් එයින් නො නවත්වයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දාස භාවයෙන් මිදීම මෙන් උද්ධච්ච කුක්කුච්චයාගේ ප්‍රහාණය වදාළහ.

යම්සේ බලවත් පුරුෂයෙක් මිලමුදල් ආදී ධනය ගෙන, ආයුධ සහිත මිනිසුන් පිරිවරා කාන්තාරයට පිවිසෙන්නේ ද, සොරු ඔහු දුරදීම දැක පළා යන්නේද, හෙතෙම සුවසේ කාන්තාරයෙන් එතෙර වී ක්ෂේම භූමියට පැමිණ සතුටු වන්නේද, එපරිද්දෙන් ශ්‍රමණයා 'මේ විචිකිච්ඡාව මහත් අනර්ථකාරීය'යි බහුශ්‍රැතභාවය ආදී සය ධර්මයන් වඩා විචිකිච්ඡාව දුරු කරන්නේද, හෙතෙම එසේ දුරු කළා වූ විචිකිච්ඡාව ඇත්තේ යම්සේ බලවත්ව සැදුණ අවිආයුධ ඇති සපරිවාර පුරුෂයෙක් සොරුන් දැක නිර්භය වූයේ, සොරුන් තණකොළ ගහක් කොටද, නො සිතා සුවසේ පැමිණ ක්ෂේමභූමියට පැමිණේද එපරිද්දෙන් දුෂ්කර වූ දුශ්චරිත නමැති කාන්තාරය තරණයකොට පරම ක්ෂේම භූමිය වූ නිවනට පැමිණේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විචිකිච්ඡා ප්‍රහාණය ක්ෂේමභූමියක් මෙන් වදාළහ.

ඉමමෙව කායං මේ කරජකාය **අභිසන්දෙති** තෙමයි. ස්නේහ කරයි. සියලු තැන්හි ප්‍රීතිසුවය පතුරුවයි. **පරිසන්දෙති** හාත්පසින් තෙමයි. **පරිපූරෙති** වාතයෙන් පසුම්බියක් මෙන් පුරයි. **පරිඵරති** හාත්පසින් ස්පර්ශ කෙරෙයි. **සබ්බාවතො කායසමා** ඒ භික්ෂුවගේ සියලු කොටස් ඇති ශරීරය

පිළිබඳ උපාදින්නක සන්තතිය පවත්නා තැන්හි සිවි මස් ලේ අනුව ගිය කිසි මද පමණකුදු තැනකි. පළමුවන දැහැන් සුවයෙන් ස්පර්ශ කරන ලද්දේ නොවේ.

දකෙඛා නානසුණු චූර්ණ කරන්නට ද, යොදන්නට ද, පිඬු කරන්නටද දක්ෂ වූ, **කංසථාලෙ** ලෝහ වර්ගයකින් කරන ලද භාජනයක, මැටිබඳුන ස්ථිර නොවේද පිඬු කරනවිට බිඳේ ද, එනිසා එය නො දක්වයි. **පරිපෙථාසකං පරිපෙථාසකං** ඉසිමින් **සනෙතය්‍ය** වමතින් යකඩ භාජනය ගෙන, දකුණතින් ප්‍රමාණයට දිය ඉසිමින් පිරිමදිමින් පිඬු කරන්නේය. **සෙනහානුගතා** උදක ස්නේහයෙන් යුක්ත වූයේ **සෙනහ පරෙතා** උදක ස්නේහයෙන් හාත්පසින් යුක්ත වූයේ, **සනතර බාහිර** ඇතුළු පෙදෙසද පිට පෙදෙස ද යන සියලු තැනම දිය තෙතින් ස්පර්ශ කරන ලද්දේ යන අර්ථයි. **නව පගඝරණි** බිඳ බිඳ දිය නො වැගිරේ. අතින් ද දෑඟිලිවලින් ද ගන්නටත් වැටි කරන්නටත් හැකිවේ යන අර්ථයි.

ද්විතීයධ්‍යාන පිළිබඳ උපමාවෙහි උබ්භිතොදකො පොළව බිඳී උඩට නගින දිය ඇත්තේ, යට බිඳී උඩට නගින දිය නොවේ. වැලි ඇතුළතම උපදින දිය ඇති යන අර්ථයි. **ආය මුඛං** එන මග, දෙවොවැස්ස, **කාලෙන කාලං** අඩමසක් පාසා හෝ දසදිනක් පාසා හෝ යන අර්ථයි. **ධාරං** වැහිපොද, **නානුපපවෙච්ඡය්‍යා** නො පිවිසෙන්නේ ය. නො වස්නේ ය යන අර්ථයි. **සිතා වාරිධාරා උබ්භිජ්ජිත්වා** සිහිල් දිය ඒ විල පුරමින් ඉපිද, යටින් උඩට නගින දිය, උඩට නැගී බිඳෙන්නේ දිය අලලයි. සිව්දෙසින් ගලා එන දිය පරඬැල්, තණ, දර, ලීදඬු ආදියෙන් දිය කළඹයි. ධාරානිපාත වැස්සෙන් ඇතිවූ දිය බුබුළු ජලය කළඹයි. වැඩහිටිමින්ම සෘද්ධියෙන් නිර්මාණය කරන ලද වැහිදිය මේ පෙදෙස පැතිරෙයි. නො පැතිරෙන ප්‍රදේශයක් නැත. එහෙයින් ස්පර්ශ නො කළ ප්‍රදේශයක් නැත. එහි ජලය මෙන් කරජකායයි. ජලය මෙන් දුතියධ්‍යානයයි, සෙස්ස කලින් කියන ලද ක්‍රමයෙන්ම දතයුතු.

තතියධ්‍යානය පිළිබඳ උපමාවෙහි, උපුල් මෙහි ඇත්තේනුයි **උපපලිනි** නම් වේ. සෙසු දෙපදයෙහි ද මෙම ක්‍රමයමැයි. මෙහි සුදු, රතු, නිල් යම්කිසි උපුලක්ව, උපුල්මැයි, උනු සියපත් ඇතියේ **පුණ්ඩරීක** නම්. **පුණ්ඩරීක** සියපත් ඇත්තේ **පදුම** නම්. නැතිනම් පත්‍ර නියමයක් නැතිවම සුදු වූයේ **පදුම** නම්. රත් වූයේ **පුණ්ඩරීක** යයි මෙහි විනිශ්චය මැයි.

උදකානුගතානි ජලයෙන් නො නැංගාහූ. අනෙතා නිමුගඟ පොසිනි ජලයෙහි ඇතුලෙම වැඩී පෝෂණය වේ. වැඩේ යන අර්ථයි. සෙස්ස පෙර කී නයින්ම දතයුතු.

චතුර්ථධ්‍යාන සුවය පිළිබඳ උපමාවෙහි **පරිසුදෙධන චෙතසා පරියොදාතෙන** මෙහි උපක්ලේශ නැත්තේය යන අර්ථයෙන් **පරිසුදධ** ප්‍රභාස්වර විහිදෙන්නේය යන අර්ථයෙන් **පරියොදාතය** දතයුතු. **ඔදාතවත්ථෙන** යන මෙය සෘතු පැතිරීම සඳහා කියන ලදී. කිලිටි වතින් සෘතු පැතිරීමක් නොවේ. එකෙණෙහිදු සේදූ පිරිසිදු වතින් ගුණ පැතිරීම බලවත් වේ.

යම්හෙයකින් මෙම උපමාවෙහි වස්ත්‍රය මෙන් කරජකාය වේද, සෘතු පැතිරීම මෙන් සතරවන දැහැන්සුවය වේද, එහෙයින් යම්සේ මනාකොට ස්නානය කොට පිරිසිදු වතක් හිස සහිත පොරවා, හුන් පුරුෂයාගේ ශරීරයෙන් සෘතුගුණය සම්පූර්ණ වස්ත්‍රය පුරා පැතිරේද, වස්ත්‍රයේ කිසි ස්පර්ශයක් නො කළ, ඉඩකඩක් නොවේද, එපරිද්දෙන් සතරවන දැහැන් සුවයෙන් භික්ෂූහුගේ කරජකාය පිළිබඳ කිසි අවකාශයෙක් ස්පර්ශ නො කරන ලද්දේ නොවේයයි අරුත් දතයුතුයි. චතුර්ථධ්‍යාන චිත්තයම පොරවන ලද වස්ත්‍රය මෙන් වෙයි. එයින් උපදනා රූපය සෘතු විපර්යාසය මෙනි. යම්සේ සුදු වස්ත්‍රය ශරීරය ස්පර්ශ නොකරන කල්හි එයින් උපදනා සෘතුවෙන් සියලු තන්හි වූම කය ස්පර්ශ කරන ලදී. එපරිද්දෙන් චතුර්ථධ්‍යානයෙන් උපන් සියුම් රූපයෙන් භික්ෂූහුගේ සම්පූර්ණ කය ස්පර්ශ කරන ලද්දේ වේ යයි ද අර්ථ කිවහැකිය.

පූර්වේනිවාසානුස්මෘති උපමාවෙහි එදවස කළ ක්‍රියාව ප්‍රකට වේ. එදවස ගිය ගම් තුනක්ම ගන්නා ලදී. එහි ගම් තුනට ගිය පුරුෂයා මෙන්, පූර්වේනිවාසානුස්මෘති ඤාණලාභියා දතයුතුය. ගම් තුන මෙන් තුන් භවය ගතයුතුය. ඒ පුරුෂයාට ගම් තුනෙහි එදවස කළ ක්‍රියාව ප්‍රකට වීම මෙන් පූර්වේනිවාසානුස්මෘතිය පිණිස සිත එළවා හුන් මහණහට තුන්භවයෙහි කළ ක්‍රියාවන් පහළවීම දතයුතු.

දිවැස් උපමාවෙහි **දෙව අගාරා** ගෙවල් දෙකක් **සදවාරා** මුඛද්වාර සහිත වූ, **අනුචංකමනෙන ඔබිනොබ සක්මන් කරන්නේ, අනුවිචරෙනති** එහා මෙහා හැසිරෙන්නේ මේ ගෙයින් නික්ම අනෙක් ගෙට ද, ඒ ගෙයින්

නික්මීම හෝ මේ ගෙට පැමිණීම ද, ඒ ගෙයින් ද නික්ම ඒ ගෙයින් මෙම ගෙට ද පැමිණීම දතයුතුය. ඒ උපමාවෙහි ගෘහද්වාර සහිත ගෙවල් දෙක මෙන් චුතිප්‍රතිසන්ධි දෙක දතයුතුයි. ඇස් ඇති පුරුෂයා මෙන් දිව්‍යචක්ෂුලාභියා දතයුතුයි. ගෙවල් දෙක අතර සිට බලන්නා වූ ඇස් ඇති පුරුෂයාට ගෙවල් දෙක අතර අතර පිවිසෙන නික්මෙන පුරුෂයන් දුටු කාලය මෙන් ආලෝකය වඩා බලන්නා වූ දිවැස්ලාභී හට චුතවන උපදින සත්ත්වයන් දුටු කාලය වේ. කිමෙක්ද, ඔහු ඤාණය ප්‍රකට වූ පුද්ගලයාද නුවණට ප්‍රකට වූවාහුද, යත් නුවණටය. යළිත් ඒ නුවණට ප්‍රකට බැවින් පුද්ගලයා හට ප්‍රකට වූවාහුම වෙති.

ආසවක්ඛය ඤාණ උපමාවෙහි **පබ්බසංකපෙති** පර්වතය මුදුනේ, **අනාවිලො** මඩ රහිත වූ බැවින් සිප්පි බෙල්ලෝ ද රන්වන් බෙල්ලෝ ද, **සිපපිසම්බුකං** නම් කැට කැබලිති ද, **සකඛරකඨල** නම් මසුන්ගේ සමූහ යනුයි. **මච්ඡගුම්බ** නම්. **තිට්ඨන්තම්පි චිරත්තම්පි** මෙහි කැටකැබලිති ඇත්තේමය. සෙස්සෝ හැසිරෙන්නාහු සිටින්නාහු යම්සේ අතරින් පතර සිටියා වූ ද, ඉන්නා වූ ද හෝනා වූ ද දෙනුන් ඇතිකල්හි 'මේ දෙන්නු හැසිරෙති' ඇවිදින දෙනුන් සඳහා අන්‍යයෝත් ඇවිදිති' කියනු ලැබෙත්ද, එපරිද්දෙන් සිටිනා වූ කැට කැබලිති ගෙන ඉතිරි දෙක ද, 'තිට්ඨන්තං'යි කියන ලද නැවත නැවත හැසිරෙන්නා වූ ඉතිරි දෙක ගෙන කැට කැබලිතිද, 'චරන්තං' යයි කියන ලදී.

එහි ඉවුරෙහි සිට බලන්නා වූ ඇස් ඇති පුරුෂයාට සිප්පි සම්බුකාදීන් ප්‍රකට කාලය මෙන් ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස සිත එළවාගත් මහණ හට සිව්සස් ප්‍රකට වූ කාලය සේ දතයුතු.

දැන් සත් ආකාරයකින් සමාන ලිංග වශයෙන් සමාන ගුණ වශයෙන් ක්ෂීණාශ්‍රවයාගේ නම ගන්නා වූ '**අයං වුච්චති භික්ඛවෙ භික්ඛු සමණෝ ඉතිපි**' යනාදිය වදාළහ. එහි **එවං ඛෝ භික්ඛවෙ භික්ඛු සමණෝ හොති** ආදියෙහි මහණෙනි, භික්ෂුව සන්සිඳුවන ලද පව් ඇති බැවින් **ශ්‍රමණ** වේ. බැහැරකළ පව් ඇති බැවින් **බ්‍රාහමණ** නම් වේ. කෙලෙස් ඇති බැවින් **නහාතක** නම් වේ. සෝදන ලද කෙලෙස් ඇත්තේ යන අර්ථයි. සිවුමග නුවණ නම් වූ වේදයන් විසින් අකුසල ධර්ම නසන ලද බැවින් **වෙදගූ** වේ. විඳිනු ලබයි යන අර්ථයි. එම නිසා **විදිතාසස හොනති** ආදිය කීහ. කෙළෙස් නසන ලද බැවින් **සොතතිය** නම් වේ. නිශ්‍රෝත බැවින් පහවූ යන

අර්ථයි. කෙලෙසුන් දුරුකළ බැවින් අරිය නම් වේ. දුරු වූ බැවින් යන අර්ථයි. ඉතිරි වූ සියල්ල ප්‍රකට වූයේම වේ.

මහා අස්සපුර සූත්‍ර වර්ණනාව නිමියේය.

1-4-10

එවමෙමසුතං චූළ අස්සපුර සූත්‍රයයි. දේශනාකරණය පළමු සූත්‍රය හා සමාන වේ. **සමණසාමීචි පටිපදා** භික්ෂූන්ට සුදුසු වූ, භික්ෂූන්ගේ අනුලෝම පිළිවෙත. **සමණමලානං** යනාදියෙහි මේ ධර්මයෝ උපදනාහූ භික්ෂූන් මලිනයන් මල ගත්තවුන් කෙරෙති. එහෙයින් **සමණමල** යයි කියනු ලැබෙත්. මොවුන් විසින් භික්ෂූහූ දූෂ්‍ය කරනු ලැබෙත්. ප්‍රදූෂ්‍ය කරනු ලැබෙති. එහෙයින් **සමණෙදාස** යයි කියනු ලැබේ. මොව්හූ ඉපිද භික්ෂූන් කසටයන්, ඕජස් නැත්තවුන් කරත්. මලානික කෙරෙත්. එහෙයින් **සමණ කසට** යයි කියනු ලැබේ. **අපායිකානං ඨානානං** අපායෙහි උපදවන කාරණයන්ට, දුගග නිවෙද නීයානං දුගතියෙහි විපාක විඳින්නට නියම වූවන්ට,

මතජං නාමාති මිනිස්සු තියුණු මුවහත් යකඩ පීරෙන් පහර දී ඒ යහුණු මස් සමග කළවම්කොට කොස්වාලිහිණියන්ට කවති. උන්ට මළපහ කිරීමට නො හැක්කාහු මැරෙති. ඉදින් නො මැරෙන්නේ නම් පහර දී මරති. ඉක්බිති ඔවුන්ගේ බඩ පලා අතුණු ජලයෙන් සෝදා සුණු ගෙන මස් සමග කළවම්කොට නැවත කවත්, මෙසේ සත්වරක් කවාගත යකඩ කුඩුවලින් ආයුධ තනති. එය මැනැවින් පුහුණු වූ ලොහොකරුවෝ බොහෝ කම්මල්වල වැඩ කරත්. ඒ මළ ළිහිණියාගෙන් උපන් හෙයින් මතජ යයි කියති. ඉතා තියුණු වේ. **පීත නිසිතං** දිය බොන ලද්දා වූද, ගලෙහි මැනවින් ගටන ලද්දා වූ ද, **සංඝාටියා** කොපුවෙන් **සමපාරුතං** හාත්පසින් වසන ලද්දේ, වෙලන ලද්දේ,

රඤ්ඤො ජලලිකස්ස රජස් දැළි දරන්නහුගේ **උදකො රොහකස්ස** දවසට තුන්වරක් දියට බස්නහගේ, **රුක්ඛමූලිකස්සා** රුක්මුල්හි වසන්නහුගේ **අබ්භොකාසිකස්ස** අභ්‍යවකාශයෙහි වසන්නහුගේ **උබ්භට්ඨකස්ස** උඩුබැලිව සිටින්නහුගේ, **පරියාභතන්තිකස්ස** මසකට වරක් හෝ අඩමසකට වරක් වළඳන්නහුගේ මේ සියල්ල බාහිර සමයෙන්ම කියන ලදී. මේ සසුනෙහි සිවුරු දරන භික්ෂූහු, සංඝාටික යයි නො කියනු ලැබේ. රජස් දැලි දැරීම් ආදී, ව්‍රතයෝ ද මේ ශාසනයෙහි නැත්තේම ය. බුද්ධ වචනයට 'බුද්ධ වචනයම' යයි නාමයයි. 'මන්ත' යයි නාමයක් නැත. 'රුක්ඛමූලිකය. අබ්භොකාසිකය' යන මෙතෙක් ම ලැබෙයි. එය ද මෙහි බාහිර සමයෙන්ම කියන ලදී.

ජාතමෙවනං උපන්දිනයෙහි උපන් මොහොතක් ඇත්තා වූම ඔහු **සංඝාටිකං කරෙය්‍යුං** සඟලවතක් හඳවා පෙරවා, සංඝාටිකයකු කරන්නාහුය. සියලු තන්හි මේ ක්‍රමයයි.

විසුද්ධ මතතානං සමනුපස්සති තමන් විසුද්ධියෙකැයි දනී. එහෙත් ඒ තාක් විසුද්ධ යයි නොකිව යුතු. **පාමුජ්ජං ජායති** සතුටු ආකාරය උපදී. **පමුදිතස්ස පීති** සතුටු වූවහුගේ සියලු ශරීරය අලලමින් ප්‍රීතිය උපදී. **පීතිමනස්සකායො** ප්‍රීතියෙන් යුක්ත වූ පුද්ගලයාගේ නාම කාය, **පස්සම්භති** පහ වූ විඩා ඇත්තේ වෙයි. **සුඛං වෙදෙති** කායික වූ ද, මානසික වූ ද සුවය විඳී. **චිත්තං සමාධියති** මේ නෛෂ්ක්‍රම්‍ය සුවයෙන් සුවපත් වූවහුගේ සිත එකඟ වේ. අර්පණාවට පැමිණියාක් මෙන් වෙයි.

සො මෙත්තා සහගතෙන චෙතසා යට කෙලෙස් වශයෙන් පටන් ගත් දේශනාව පර්වතයෙහි වට වැස්ස ගඟට යන්නාක් මෙන් අනුසන්ධි නො ඉක්මවා බ්‍රහ්මවිහාර භාවනාවට බැස ගන්නා ලද්දීය. එහි යමක් කියනු කැමැත්තේ නම් ඒ සියල්ල විශුද්ධි මාර්ගයෙහි කියන ලද්දේය. **සෙය්‍යථාපි භික්ඛවෙ පොක්ඛරණී** මහා සීහනාද සූත්‍රයෙහි පොකුණට මාර්ගය උපමා කරන ලදී. මෙහි ශාසනය උපමා කරන ලද්දේයයි දතයුතු. **ආසවානං ඛයා සමණොහොති** සියලු කෙළෙසුන් සන්සිඳුවන ලද බැවින් පරමාර්ථ ශ්‍රමණ වූයේ වේ. සෙස්ස සියලු තන්හි ප්‍රකට වූයේමය.

චූළ අස්සපුර සූත්‍රය නිමියේ ය.

සිව්වැනි වූ මහා යමක වර්ගය සමාප්තයි.

1-5-1

එවමෙමසුතං සාලෙය්‍යක සූත්‍රයයි. එහි **කොසලෙසු** කෝසල නම් ජනපදයේ රාජ කුමාරයා ඔවුන්ගේ පදිංචිය වූ එක් ජනපදයෙක, සමානාර්ථයෙන් කෝසල යයි කියයි. ඒ කෝසල ජනපදයෙහි පැරණි ආචාර්යවරු මෙසේ කීහ. යම්හෙයකින් පෙර මහාපනාද නම් රාජකුමාරයා නොයෙක් විධියේ නළුනිළියන් දැකත්, මදකුත් සිනහ නො වන්නේ යයි අසා රජු මෙසේ කීහ. 'යම්කිසි කෙනෙකු මගේ පුතා සිනහ ගැන්වීමට සමත් වෙතොත් ඔහු සර්වාලංකාරයෙන් සරසවමි. අලංකාර කරමි.' ඉක්බිති මහජනයා සිය වගා කිරීම්, කුඹුරු කෙටීම් කර්මාන්ත ආදිය ඇත්හැර රැස්ව නොයෙක් විධියේ නැටුම් ආදී විවිධ උපා යෙදුවත් හත් අවුරුද්දක් මුළුල්ලේත් ඒ කුමරු සිනා ගන්වන්නට නො හැකි විය. ඉක්බිති සක්දෙවි දිව්‍ය නළුවන් එවීය. ඒ දිව්‍ය නළුවා නාට්‍ය දක්වා සිනහ ගැන්වීය. එකල්හි මිනිස්සු තම තමන්ගේ නිවාසස්ථානවලට ගියාහුය. ඔව්හු සමුවන සමුවන මිතුරන් දැක 'කිම සුවදැයි' ඇසූහ. එහෙයින් ඒ කුසලය කුසලය යන වචනය ගෙන ඒ ප්‍රදේශය කෝසල නම් වීය.

චාරිකං චරමානො අතුරිත චාරිකාවෙහි හැසිරෙන සේක්, **මහතා භික්ඛු සංඝෙන සද්ධිං** සියයක් හෝ දහසක් හෝ ලක්ෂයක් දැයි මෙසේ පිරිසිඳීම් රහිත භික්ෂු සංඝයා සමග, බ්‍රාහ්මණගාමො බමුණන් සමූහ වශයෙන් හැසිරෙන පෙදෙස බමුණුගම නමින් හැඳින්වේ. ඒ බමුණන්ගේ ගොදුරුගම, **තදවසරි** ඒ ගමට ඇතුල්විය. පැමිණියහ යන අර්ථයි. මෙහි විභාරයක් නියම කර නැත. එහෙයින් එයට නුදුරු බුදුනට ගැලපෙන සුදුසු වූ එක් වනලැහැබක් යයි ගතයුතුය. ශාස්තෘන් වහන්සේ ඒ වනලැහැබට වැඩි සේකැයි දතයුතුය.

අසෙසාසුං ඇසූහ. ලැබූහ. ශ්‍රෝතද්වාරයට පැමිණි වචනයේ ශබ්දානුසාරයෙන් දැනගත්හ. **ඛො** යනු අවධාරණාර්ථයෙහි, පද පූරණයෙහි නිපාතය එහි අවධාරණාර්ථයෙන් 'ඇසුවාහුමය' ඔවුන්ට කිසි ශ්‍රවණාන්තරායෙක් නො වීය. මේ අර්ථය දතයුතුය. පද පූරණයේ ව්‍යඤ්ජනයාගේ සිලුටු බව පමණක්මැයි.

මෙවිට යම් කරුණක් ඇසුවාහුද, එය ප්‍රකාශ කරන්ට **සමණෙ ඛලු හො ගොතමො** ආදිය කියන ලදී. එහි සන්සිඳුවන ලද පව් ඇත්තේනුයි

සමණ නමී. බලූ අනුශ්‍රවණ අර්ථයෙහි නිපාතයි. හො යනු ඔවුනොවුන් ඇමතීම් මාත්‍රයෙකි. ගොතමො යනු භාග්‍යවතුන් වහන්සේ ගෝත්‍ර වශයෙන් ඇමතීමයි. එහෙයින් සමණෙ බලූ හො ගොතමො යන මෙහි පින්වත ශ්‍රමණයෝ ගෞතම ගෝත්‍ර ඇත්තාහු. මෙසේ අර්ථ දතයුතුයි. **සක්‍යකුලෝ පබ්බජිතෝ** යනු සැදැහැයෙන් පැවිදි වූයේ යන අර්ථයි. කිසිදු පිරිහීමකින් නො මඩනා ලද, ක්‍ෂය නොවූ ඒ කුලය හැර, ශ්‍රද්ධාවෙන් පැවිදි වූයේ ය යන අර්ථයි. එයින් මත්තෙහි කියන ලද අරුත් ඇත්තේම ය.

තං ඛොපනා යනු මෙය මෙසේ වූයේය යන අර්ථයේ කර්මවචනයි. ඒ භවත් ගෞතමයන්ගේ යන අර්ථයි. **කල්‍යාණෝ** යහපත් ගුණයෙන් සමන්විත වූ, ශ්‍රේෂ්ඨ යයි කියන ලදී. **කිත්තිසද්දෝ** කීර්තියමයි, ස්තුති ඝෝෂාවයි. **අබ්භුග්ගතෝ** දෙවියන් සහිත ලොව යටකරගෙන උඩට නැංගේ. කුමක්ද, **ඉතිපි සෝ භගවා** -පෙ- **බුද්ධෝ භගවා** මේ එහි පද සම්බන්ධයයි. 'සෝ භගවා ඉතිපි' 'අරහං' ඉතිපි සම්මා සම්බුද්ධෝ -පෙ- ඉතිරි, භගවා' මේ මේ කරුණු සඳහා කියන ලදී.

එහි පළමුකොට කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින්, සතුරන් ද දැව් ද නැසූ හෙයින් ය. ප්‍රත්‍යයාදීන්ට සුදුසු වූ හෙයින් ය. පව් කිරීමෙහි රහස් නැති හෙයින්ය. මේ කාරණයන්ගෙන් ඒ භගවත්හු අරහ නම් වන්නේ ය. යනාදී ක්‍රමයෙන් මාතෘකාවට අනුව මේ සියලු පද විශුද්ධි මාර්ගයෙහි බුද්ධානුස්සති නිර්දේශයේ විස්තර කරන ලදී. එහෙයින් ඒ පදයන්ගේ විස්තර දතයුතු.

සාධු ඛෝ පන සුන්දරය. අර්ථ එළවන්නේ ය. සුව එළවන්නේ ය. කිය යුතුය. **තථාරූපානං අරහතං** ඒ ගෞතම බුදුරදු යම්බඳු ද, එබඳු වූ නොයෙක් කප් කෙළ දහසකිනුදු දුර්ලභ වූ දර්ශන ඇති, ව්‍යාම ප්‍රභාවෙන්, බඹයක් හරහා විහිදෙන රැස් වළල්ලෙන් යුක්ත වූ, අසූ අනූ ව්‍යඤ්ජන නමැති රත්නයෙන් සැදුම් ලත් උතුම් වූ දෙතිස්මහා පුරුෂ ලක්ෂණයෙන් හෙබි මනහර ශරීර ඇති, දැක, බලා, ඇතිවීමක් නැති දර්ශන ඇති, ඉතා මිහිරි වූ ධර්ම ඝෝෂා ඇති, විද්‍යමාන වූ ගුණයන්ට පැමිණීමෙන් ලෝකයේ 'අරහනතා' නමින් හඳුන්වන රහතුන් ගේ **දස්සනං හොති** ප්‍රසාදයෙන් සෞම්‍ය වූ, දෙනෙත් උන්මීලනය කොට දැකීම් මාත්‍රයකු යහපත්ම වේ. ඉදින් අෂ්ටංග සමන්නාගත බ්‍රහ්ම ස්වරයෙන් ධර්මය දේශනා කරන්නේ

එක පදයක් හෝ අසන්නට, ලැබෙත් නම් එය යහපත් වන්නේ යයි මෙසේ අදහසක් ප්‍රාර්ථනයක් කොට,

යෙන භගවා තෙනුපසංකමිංසු සියලු කටයුතු හැරදමා ප්‍රසාදයට පත් වූ සිතින් පැමිණියාහුය. **එතදවොචුං** ප්‍රශ්නය දෙවදෑරුම්ය. අගාරිය ප්‍රශ්නය ද අනගාරිය ප්‍රශ්නය ද වේ. 'කිං භනෙත කුසලං, කිං අකුසලං' යනු විසින් අගාරිය ප්‍රශ්නය ආයේය. 'ඉමෙ නු ඛො භනෙත පඤ්චුපාදා නකඛන්ධා' මේ නයින් අනගාරිය ප්‍රශ්නය ආයේය. මොව්හූ වූ කලී තමහට අනුරූප වූ අගාරිය පෘච්ඡාව විචාරන්නාහූ **එතං කොනු ඛො භො ගොතම හෙතු, කො පචචයො** ආදි වචන කීහු.

භාග්‍යවතුන් වහන්සේ ඔවුනට යම් සේ සලකන්නට නො හැකි වෙත්ද, මෙසේ සැකෙවින් පළමුකොට ප්‍රශ්නය විසඳන සේක්, **අධම්මචරියා විසමචරියා හෙතු ඛො ගහපතයො** ආදිය වදාළහ. කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ යම්සේ නො සැලකිය හැකි වෙත්නම් එය විසඳූ සේක් ද, ඔව්හූ යම්හෙයකින් අප පණ්ඩිතයම්හයි මාන ඇත්තාහු වෙත්ද, පළමුව මාතෘකාව තබා යම්සේ සැලකිය හැකි වෙත් ද, එසේ අර්ථය විස්තර කරද්දී දේශනාව නො ගැඹුරු යයි සිතමින් අවමන් කෙරේද, අපිත් කියන්නෙමු නම් මෙසේම කියන්නෝ වෙමු කියන්නාහු වෙත්ද එහෙයිනි. එහෙයින් ඔවුන්ට පළමුව සලකන්නට නො හැකි වේද, ඒ සඳහා මෙසේ සංක්ෂේපයෙන් ප්‍රශ්නය විසඳූහ.

ඉක්බිති සලකන්නට තේරුම් ගන්නට, නො හැකි වන්නේ ම විස්තර වශයෙන් දේශනා කරන ලෙස ඉල්ලා සිටින්නේ අයැද සිටින්නේ, සවිස්තරව දේශනා කිරීම පිණිස, **තෙනහි ගහපතයො** ආදිය කීහ. එහි **තෙනහි** යනු කරණාර්ථයෙහි නිපාතයි. යම්හෙයකින් තෙපි මා යාඥා කරවුද, එහෙයින් යන අර්ථයි. **තිවිධං** යනු කොටස් තුනකින්, **කායෙන** කායද්වාරයෙන්, **අධම්ම චරියා විසම චරියා** අධර්ම චරියා සංඛ්‍යාත විෂම චරියාව, මේ වනාහි පදාර්ථයි. දහමින් තොර හැසිරීම, වැරදි ලෙස හැසිරීම අධම්මචරියා නම් වේ. දහමින් තොර ක්‍රියාව යන අර්ථයි. විෂම හැසිරීම, අසමාන ක්‍රියාවන් කිරීම අසමාන කර්මයන්හි හැසිරීම, විසමචරියා නම්. ධර්මානුකූල නොවන හැසිරීම ද, අසමාන වූ හැසිරීම ද වේනුයි අධම්මචරියා - විසමචරියා නම් වේ. මේ උපායෙන් ක්‍රමයෙන් ම සියලු කලු සුදු පදයන්හි අරුත් දතයුතුය.

ලුද්දෝ කර්කශ වූ දරුණු වූ, සාහසික වූ, **ලොහිතපාණී** අනුන් ජීවිතයෙන් තොර කරන්නන්ගේ දෙඅත් ලේවලින් කිලිටි වේ. ඉදින් නො තැවරෙන්නේ නමුත්, එසේ ලේ තැවරුණු අත් යයි කියනු ලැබේ. හත පහතෙ නිවිටෙයා නැසීමෙහි, අනුන්ට පහර දීමෙහි අනුන් මැරීමෙහි තත්පර වූයේ, යා පනෙනා කරුණ රහිත බවට පැමිණියේ,

යං තං පරසසා යනු යම් ඒ අනුන් සතු වූවක් **පරචිතතූපකරණං** යනු ඒ අනුන් සතු වූ සතුට උපදවන උපකරණ සතුට ඇතිකරන පිරිකර භාණ්ඩ, **ගාමගතංවො** ඇතුලුගම තබන ලද **අරඤඤගතංවා** ගස් අග, අතු අග, පර්වත මුදුන් ආදියෙහි තබන ලද **අදිනනං** අනුන් විසින් කයින් හෝ වචනයෙන් නො දෙන ලද, **ථෙය්‍ය සංඛාතං** යනු එහි ථෙන නම් සොරායි. සොරකම් කරන බව සොරකම් සිත, පැහැර ගැනීමේ සිතට මේ නමකි. **සංඛාතං** 'සංඛාතං' යනු අර්ථ හෙයින් එක් කොටසකට මේ නමකි. **සඤඤා නිදානා හි පපඤචසංඛ** යනාදී තන්හි මෙනි. ථෙය්‍ය (සොරසිත) වූයේත් සංඛ්‍යාත වූයේත් එකම යයි ථෙය්‍ය සංඛ්‍යාත නම්. ථෙය්‍ය චිත්ත සංඛ්‍යාත වූ එක් චිත්ත කොට්ඨාශයක යන අර්ථයි. තව ද මේ කරණාර්ථයෙහි කර්ම වචනයි. එහෙයින් ථෙය්‍ය සංඛ්‍යාත වූ සිතින් යයි අර්ථ දතයුතුය.

මාතුරකඛිතා පියා මියගිය කල්හි වස්ත්‍ර ආහාර ආදියෙන් පිළිදැගුම් කරමින්, වියපත් යමෙක් කුලගෙය පාවාදෙන්නෙමියි මව් රකී ද මෝ මාතුරක්ඛිතා නම්. මේ ක්‍රමයෙන් ම පිතුරක්ඛිතා යන්න ද දතයුතුය. සමාන කුලයෙන් දරුගැබක් කුස පිහිටි කල්හි කතිකා කරති. ඉදින් මට පුතෙකුත් නුඹට දුවෙකුත් වී නම් වෙනත් තැනක යන්නට නො ලැබෙන්නේ ය. මගේ පුතාටම වේවයි මෙසේ ගැබෙහිදීම අයත් කරන ලද්දී **සසසාමිකා** නම්. යමෙක් මේ නම් ස්ත්‍රිය කරා යේනම් ඔහුට මෙතෙක් දඩ යයි මෙසේ ගමක හෝ වීදියක හෝ නගරයක හෝ තැබූ දඬුවම් ඇත්තී **සපරිදණඩා** නමු. **අනතමසො මාලාගුණ පරිකඛිතතාපි** යම් ස්ත්‍රියක් හැමට යටත්පිරිසෙයින් මෝ මට භාර්යා වන්නේ යයි ඇගේ ඇඟෙහි මල්දම් දමන්නා වූ කිසිවකු විසින් මල්දම් පමණකින්ම පරික්ෂිප්ත වූවා වේද, **තථාරූපාසු චාරිතතං** ආපජජිතා හොති මෙබඳු ස්ත්‍රීන් කෙරෙහි සම්මාදිට්ඨි සූත්‍රයෙහි කී මිථ්‍යාචාරයේ ලක්ෂණ වශයෙන් කරන්නේ වේ.

සභගගතො සභාවෙහි සිටියේ, **පරිසගගතො** ගම පිරිස් මැද සිටියේ, **ඤාති මජ්ඣගතො** දායාදයන් මැද සිටියේ, **පූගමජ්ඣගතො** ශ්‍රේණිය (සමූහයා) මැද සිටියේ, **රාජකුලමජ්ඣගතො** රජකුලයන් මැද මහා විනිශ්චයෙහි සිටියේ, **අභිනීතො** ප්‍රශ්න කරනු සඳහා කැඳවන ලද්දේ, **සක්ඛිපුටෙඨා සාක්ෂිකොට** විචාරන ලද්දේ, **එතමෙහා පුරිසා** ඇමතීමයි. **අතතහෙතුවා පරහෙතුවා** තමාගේ හෝ අනුන්ගේ හෝ අත් පා නිසා හෝ ධනය නිසා හෝ, **ආමිසකිඤ්චික්ඛහෙතු වා** මෙහි 'ආමිස' යන්නෙන් 'අත්ලස්' අදහස් කරන ලදී. 'කිඤ්චික්ඛං' යන්නෙන් ඉතා සුළු දෙයක් හෝ අවම වශයෙන් තිත්වටුවෙක්, ගිතෙල් පිඬක්, වෙඬරු පිඩක් ආදී වූ සුළු අත්ලසක්, හේතුකොටගෙන යන අර්ථයි. **සමපජාන මුසා භාවිතො හොති** දැනුවත්වම මුසාවාද කියන්නේ වේ.

ඉමෙසං භෙදායා යමෙකුන්ට, **ඉතො** මෙයින් යම් කෙනෙකුන් ඉදිරිපිටදී අසන ලද්දේ වේද, ඔවුන්ගේ භේදය පිණිස **අමුසං භෙදාය** ඔවුන්ගේ අමුත්තා අසවල් තැනයයි කියන ලද ද ඔවුන්ගේ භේදය පිණිස, **ඉති සමගගානංවා හෙනතා** මෙසේ සමගි වූ යහළුවන් දෙදෙනෙකු භේද කරන්නේ, **භිනනානංවා අනුපපදාතා** ඔහු හරණ වූ තොප විසින් කරන ලද්ද මැනව, කීප දිනකින්ම තිට අවැඩක් කරන්නේ යයි, මෙසේ වෙනස් වූවන්ගේ නැවත සමගි නො වීමට, උදව් දෙන්නේ කරුණු දක්වන්නේ යන අර්ථයි. වෙන්වීම සිත් ඇලවූයේ යහපත් වූයේ මොහුටනුයි **වගගාරාම** නම්. වෙන්වීමේ ඇලුනේ යන අර්ථයේ **වගගරත** නම් වේ. අසමගි වූවන් අසා සතුටු වන්නේ යන අර්ථයෙන් **වගගනන්දි** නම් වේ. **වගගකරණී වාචං** යම් වචනයක් සමග වූ සත්ත්වයන් වර්ග කෙරේද, බිඳුවාද, ඒ කලහකාරී වචන කියන්නේ වෙයි.

අණ්ඩකා යම්සේ උවදුරු සහිත ගසෙක බිත්තර දමන්නේ ද, එසේ වැරදි සදොස් බවින් ආක්‍රොශය පහත් කිරීමය ආදී වචනයන්ගෙන් හටගත් බිජුවට ඇති, **කක්කසා** කුණු වූ ඕ යම් සේ නම් කුණු වූ වෘක්ෂය කලක වූයේ, වැගිරෙන සුණු ඇත්තේ වේද, එසේ කුණු වූවා වෙයි. කණට ගසමින් මෙන් පිවිසෙයි. එයින් කියන ලදී. **කක්කසා** යනු. **පරකුටකා** අන්‍යයන්ට කටුක වූ, සිතට අප්‍රිය උපදවන, **පරාභිසජ්ජනී** වක් වූ කටු අත්තක් මෙන්.....අනුන් අලවන්නී යනු කැමැත්ත ඇති අයට යන්ට නොදී, ඇලීම් කරන්නා වූ **කොධසාමන්තා** ක්‍රෝධයට ආසන්න වූ, **අසමාධි සංවත්තනිකා** අර්පණා සමාධියට හෝ උපචාර සමාධියට නො පවත්නී

වූ, මේ සියල්ල 'සදොස' වචනයට නිර්වචනයි. සමාන අදහස් ඇති වචනයි.

අකාලවාදී නොා කල්හි කියන, අභූතවාදිනී නැති දෙයක් කියන, අනත්ථවාදී නිකරුණේ අර්ථයක් නැති වචන කියන, අවිනයවාදී සංවර විනයට පටහැනි දේ කියන, අධම්මවාදී අස්වාභාවය කියන, **අනිධානවතිං වාචං** හදවතෙහි තබාගැනීමට නුසුදුසු වචන කියන, **අකාලෙන** කීමට සුදුසු කාලයට පෙර හෝ පසුව නොා කිවයුතු කල කියන, **අනපදෙසං** සූත්‍ර ධර්මයන්ට නොා ගැළපෙන සේ කියන, **අපරියනතිවතිං** කොටස් කිරීම් රහිත, සූත්‍රයක් හෝ ජාතකයක් හෝ අත්හැර ඒ සූත්‍රයට හෝ ජාතකයට හේ යෙදිය යුතු උපමාවක් හෝ වස්තුවක් හෝ නොා එළවා, බාහිර කථාවක්ම කියයි. පළමු කියන ලදීද කී පමණකින්ම වේ. සූත්‍රයක් කියන්නේ ද ජාතකයක් කියන්නේ ද යනුවෙන් නිශ්චිතයක් අරමුණක් කෙළවරක් නොා දක්නෙමුයි කිවයුතු බවට පැමිණෙයි. යම්සේ නුගරුක අතු ගිය ගිය තැන අරලු (අතුවලින් ඇතිවන මුල්) බසිත්ද, වැටුණු වැටුණ තන්හි පොළව පිහිටාගෙන නැවත වැඩෙත්ද, මෙසේ අඩ යොදුනක්, යොදුනක් පමණ යමින් යමින් මුල් රුක විනාශ වේද, ප්‍රවේණියෙන් හටගත්තාහුම සිටිති. එපරිද්දෙන් මේ අයත් 'නිග්‍රොධ ධර්ම කථික' නම් වෙත්. කියන ලද්දම කියන ලද කොටස් පහකින් ගනිමින් සිටියි. යමෙක් බොහෝ දේ කියන්නේ ද, ඒ සඳහා මෙය කියන ලදී. එළව එළවා දක්වන්නට හැක්කේ ද, ඔහුගේ කීම වටී. **අනත්ථ සංහිතො** අනර්ථය පිණිස හේතු වූ.

අභිජඣාතා හොති යනු අභිධ්‍යාවෙන් බලන්නේ වෙයි. **අහොවත** යනු ප්‍රාර්ථනාර්ථයෙහි නිපාතයි. තව ද, දැඩි ලෝභයෙන් බැලූ පමණකින් කර්මපථ භේදය නොවේ. යම්කලෙක මෙය මා සතු වන්නේ ද, මම මෙහි අධිපති වන්නේ ද, එය ඉතා යෙහෙකැයි තමන්ට පිරිනමයිද, එකල්හි කර්මපථ භේදය වෙයි. මේ මෙහි අදහසයි.

බ්‍යාපනනචිතතෙතා විරුද්ධ බවට පැමිණි සිත් ඇත්තේ, කුණු වූ සිත් ඇත්තේ, **පදුටඨමනසංකපෙපා** ද්වේෂයෙන් දූෂිත වූ සිත් ඇත්තේ, **හඤඤනතු** නසනු ලැබෙත්වා. **වජඣනතු** වධයට පැමිණෙත්වා. **මාවා අහෙසුං** කිසිවකුදු නොවේවා. මෙහිද කෝප මාත්‍රයකින් කර්මපථ භේදය

නොවෙයි. නසනු ලැබෙත්වා යනු සිතීමෙන්ම වේ. එහෙයින් මෙසේ කියන ලදී.

මිච්ඡාදිට්ඨිකො යනු අකුශල දර්ශන ඇත්තේ, **විපරීත දසසනො** විපර්යාස වූ දර්ශන ඇත්තේ, **නත්ති දිනනං** දුන් දෙයෙහි විපාකය සඳහා කියන ලදී. **යිටඨං** මහා යාගය කියනු ලැබේ. **හුතං** පඬුරුකොට යවන සත්කාරය කියන ලදී. එහි ද ඒ දෙකම ඵලාභාවය සඳහා ප්‍රතික්ෙෂප කරති. **සුතං දුකකටානං** යහපත් අයහපත්, කුසල් අකුසල් යන අර්ථයි. **ඵලං විපාකො** යම්කිසි ඵලයක් හෝ විපාකයක් හෝ කියයි. එය නැතැයි කියයි. **නත්ථි අයං ලොකො** පරලොව සිටියවුනට මෙලොවක් නැතැයි කියයි. **නත්ථි පරො ලොකො** මෙලොව සිටින්නවුන්ට පරලොවක් නැතැයි කියයි. සියල්ලෝ ඒ ඒ තන්හි අවසානයට පැමිණේයයි කියයි. **නත්ථි මාතා නත්ථි පිතා** දෙමාපියන් කෙරෙහි සම්‍යක් ප්‍රතිපත්ති, මිථ්‍යා ප්‍රතිපත්ති (හොඳ නරක කිරීමෙන්) ප්‍රතිඵල නැති බව කියයි. **නත්ථි සතතා ඔපපාතිකා** චුත වැ උපදනා සත්ත්වයෝ නැතැයි කියයි. **සයං අභිඤඤා සචඡිකත්වා පවෙදෙනති** යමෙක් මෙලොවද පරලොව ද අති විශිෂ්ට ඤාණයෙන් තෙමේම අවබෝධ කරගෙන, ප්‍රකාශ එවැනි කෙනෙක් නැතැයි කියයි. සර්වඥ බුදුවරුන් නැති බව දක්වයි. මෙසේ දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය කියන ලද දේ වේ.

පාණාතිපාතං පහාය යනාදී සත්වැදෑරුම් කර්මපථ චූළ හත්ථිපදෝපම සූත්‍රයෙහි විස්තර කරන ලදී. අනභිධ්‍යාදියෙහි කරුණු ප්‍රකටය.

සහව්‍යතං උපපජෙජය්‍යං සහභාවයට පැමිණෙන්නෙමි. **බ්‍රහමකායිකානං දෙවානං** ප්‍රථමධ්‍යාන භූමි දෙවිවරුන්ගේ **ආභානං දෙවානං** ආභා යයි වෙනම නැත. පරිත්තාභ, අප්පමාණාභ, ආභස්සර දෙවියන්ට මේ නමයි. **පරිතතාභානං** යනාදිය එක්කොට නොගෙන ඔවුන්ගේම භේද වශයෙන් ගැනීමය. **සුභානං පරිතතසුභානං** යනාදියෙහි ද මේ ක්‍රමයමැයි. මෙපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ ආශ්‍රවයන් නැතිකිරීම දක්වා අර්හත්වයට කුළුගන්වා දේශනාව අවසන් කළ සේක.

නැවත මෙහි සිට දිව්‍යලෝක දැක්විය යුතුය. පළමුව ත්‍රිවිධ ධ්‍යානභූමි වශයෙන් නව බ්‍රහ්මලෝක වෙති. පංච ශුද්ධාවාස, සතර අරූපී බඹලෝ

සමග නවයක්ම යයි දහඅටෙකි. වෘහත්ඵලයන් සමග දහනවයෙකි. ඔව්හූ අසංඥතලය මහා බ්‍රහ්මලෝක විස්ස වෙති. මෙසේ කාමාවචර සය සමග සවිසි දිව්‍යලෝක වෙති. භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ලන්ගේම දශකුශල කර්මපථයන්ගේ ඉපදීම දක්වති. එහි කාමාවචර සයෙහි තුන් කුසලයන්ගේ විපාකයන්ගෙන් ම උපැදීම ලබයි. එහෙත් මතු දිව්‍ය ලෝකයන්ට මේ කර්මපථයෝ උපනිශ්‍රය වශයෙන් කියන ලද්දාහුය. ඒ එසේමැයි. දශකුශල කර්මපථයෝ ශීලය ය. සිල්වතුන්ගේම කසිණ පරිකර්ම සමෘද්ධ වන බැවින් සීලයෙහි පිහිටා කසිණ වඩා පළමුවන ධ්‍යානය උපදවා දෙවෙනි දහම් ආදිය වඩා ද්විතීය ධ්‍යාන භූමියෙහි උපදී. රූපාවචර ධ්‍යානය පාදක කොට විදසුන් වඩා අනාගාමී ඵලයෙහි පිහිටියේ පංචශුද්ධාවාසයන්හි උපදී. රූපාවචර ධ්‍යානය පාදක කොට අරූපාවචර සමාපත්තිය උපදවා, සතර ආරුප්පයන්හි උපදී. රූපාවචර ධ්‍යානය පාදකකොට විදසුන් වඩා රහත්ඵලයට පැමිණෙයි. අසංඥසත්ත්වයා වූ කලී බාහිර වූ පිරිවැජියන් විසින් පුරුදු කරන ලද්දක් වන නිසා මෙහි නො දැක්වේ. ඉතිරිය සියලු තැන පැහැදිලි අර්ථ ඇත්තේය.

සාලෙය්‍යක සූත්‍ර වර්ණනාව නිමියේය.

1-5-2

එවමෙමසුතං මේ වේරඤ්ජක සූත්‍රයයි. එහි **වෙරඤ්ජකා** වේරඤ්ජවාසීහූ, **කෙනචි දෙව කරණීයෙන කිසියම් නියම නොකළ** කටයුත්තකින්, සෙසු සියල්ල පළමු සූත්‍රයෙහි කී ආකාරයෙන්ම දතයුතුය. එකෙක් ඇත. හුදෙක් මෙහි අධම්මචාරී, විසමචාරී මෙසේ පුද්ගලාධිෂ්ඨාන දේශනාව කරන ලද්දීය. පෙර සූත්‍රයෙහි ධර්මාධිෂ්ඨාන දේශනාවයි. මෙහි විශේෂය මෙපමණය.

වේරඤ්ජක සූත්‍ර වර්ණනාව නිමියේය.

1-5-3

එවමෙමසුතං මේ මහා වේදල්ල සූත්‍රයයි. එහි **ආයසමා** යනු ගරුත්ව සහිත වචනයකි. **මහා කොටඨිතො** ඒ තෙරුන් වහන්සේ ගේ නමයි. **පටිසලලාණා වුටඨිතො** පල සමවතින් නැගී සිටියේ, **දුප්පඤ්ඤා දුප්පඤ්ඤා** මෙහි ප්‍රඥාවගේ දුෂ්ටත්වයක් නැත. නුවණ නැති යන අර්ථයි. **කිතතානුවතානු ඛො** කරුණු, කොටස්, වෙන්කිරීම් විමසීමයි. කොපමණකින් මෙසේ වේද යන අර්ථයි. තව ද මේ විචාරීම නම්, අදිට්ඨ ජොතනා පුච්ඡා (නො දන්නා ධර්මයන්ගේ ලක්ෂණ විචාරීම) දිටඨ සංසන්දනා පුචඡා (දන්නා ලද ධර්මයන් ගැන විමසීම) විමතිචඡදනා පුචඡා (සැක දුරුකිරීම පිණිස විමසීම) අනුමති පුචඡා, (අනුමතිය ලැබීම සඳහා විමසීම) කථෙතු කම්‍යතා පුචඡා (භික්ෂු සංඝයා විසින් ම විචාරා පිළිතුරු සැපයීම) යනුවෙන් පස්වැදෑරුම් වෙයි.

ඔවුන්ගේ මේ විවිධත්වය, විවිධ ස්වරූප ය, එහි අදිටඨජොතිකා පුචඡා නම් කවරේද, ධර්මයන්ගේ ස්වභාව ලක්ෂණ නො දන්නේ නො දක්නේ, ප්‍රමාණ නො කරන ලද්දේ, තීරණය නො කරන ලද්දේ, පැහැදිලි නොවූයේ, නුවණින් නො වඩනා ලද්දේ, ඒ ධර්මයේ ලක්ෂණ දැනගැනීම පිණිස, තුලනය පිණිස, පැහැදිලි කරගැනීම පිණිස, විභාග කිරීම පිණිස ප්‍රශ්න විචාරීම 'අදිටඨ ජොතනා පුචඡා' නම් වේ. දිටඨ සංසන්දනා පුචඡා නම් කවරේද, ස්වභාවයෙන් ධර්ම ලක්ෂණ දන්නා ලද්දේ, දක්නා ලද්දේ, තුලනය කරන ලද්දේ, තීරණය කරන ලද්දේ, පැහැදිලි වූයේ, නුවණින් වඩනා ලදුව, අනෙක් උගතුන් සමග සැසඳීම පිණිස ප්‍රශ්න විචාරීම දිටඨ සංසන්දනා පුචඡා නම් වේ. විමතිවෙඡදනා පුචඡා නම්. ස්වභාවයෙන්ම සැකයට පැමිණියේ, විමතියට පැමිණියේ, මෙසේ වේද නොවේද, කිමෙක් ද, කෙසේ ද, වශයෙන් දෙපැත්තකින් හටගත් සැක ඇත්තේ, හෙතෙම ඒ ඒ විමතිය විසඳීම පිණිස ප්‍රශ්න විචාරීම විමතිවෙඡදනා පුචඡා නම් වේ.

මහණෙනි, ඒ කුමක්දැයි සිතවුද, රූපය නිත්‍ය වේද, අනිත්‍ය වේද, වහන්ස අනිත්‍යයයි. මේ අන්දමින් දහම් දෙසන කල අනුමතිය ගෙන විචාරීම අනුමති පුචඡා නම්. මහණෙනි, මෙසේ සීවටන් සතරකි. කවර සතරක් ද, භික්ෂු සංඝයා තුමූ ම විචාරා තුමූම විසඳනු කැමති සර්වඥයන්

වහන්සේගේ මෙබඳු ප්‍රශ්න කථෙතු කම්‍යතා පුච්ඡා නම්. ඔවුන් අතුරෙන් මෙහි දිට්ඨ සන්සන්දනා පඤ්ඤාව අදහස් කරන ලදී.

තෙරුන් වහන්සේ තමන්ගේ දිවාස්ථානයෙහිම සිට තුමූ ම ප්‍රශ්නය උපදවා, තුමූ ම විසඳමින් මේ සූත්‍රය මුල පටන් මුදුන් පැමිණවූහ. එක් අයෙක් ප්‍රශ්නය උපදවන්නට හැකිවෙයි. විසඳන්නට නො හැකිවෙයි. එක් අයෙක් විසඳන්නට හැකිවෙයි. ප්‍රශ්න උපදවන්නට නො හැකි වෙයි. තව අයෙක් මේ දෙකම නො හැකි වෙයි. තව කෙනෙක් දෙකම හැකි වෙයි. ඔවුන් අතුරෙන් මහාකොට්ඨිත තෙරුන් වහන්සේට දෙකම හැකිවෙයි. කවර හෙයින්ද මහාප්‍රාඥ වන හෙයිනි. මහා ප්‍රඥාව නිසා මේ ශාසනයෙහි සැරියුත් තෙරුන්, මහා කච්චායන තෙරුන්, පුණ්ණ තෙරුන්, කුමාරකාශ්‍යප තෙරුන්, ආනන්ද තෙරුන්, මේ ස්ථවිරයන් වහන්සේලා විශේෂස්ථානයට පැමිණියාහුය.

මද පමණ වූ නුවණින් යුත් මහණකු විසින් ශ්‍රාවක පාරමී ඥානයාගේ උපරිම තලයට පැමිණීමට නො හැක්කේ ය. මහා ප්‍රාඥයකු විසින් ම හැකියේය. මහාප්‍රාඥ බැවින් සැරියුත් ස්ථවිරයන් වහන්සේ ඒ තනතුරට පැමිණියහ. ප්‍රඥාවෙන් ඒ තෙරුන් හා සමානයෙක් නැත. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඒ ස්ථවිරයන් ඒ තදග්‍රයෙහි තැබූ සේක. **එතදගගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං මහා පඤ්ඤානං යදිදං සාරිපුත්තෙතා**

එපරිද්දෙන් මද පමණ වූ නුවණින් යුත්, භික්ෂුව විසින් භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් වදාළ ධර්මය, සර්වඥතාඥානය සමග සන්සන්දනය කොට සමානකොට විස්තර වශයෙන් අර්ථය විසඳන්නට නො හැක්ක. මහා ප්‍රාඥයකුටම හැකිවන නිසා මහා ප්‍රාඥ වූ කච්චායන ස්ථවිරයන් වහන්සේ එයට ඉදිරිපත් වූහ. එහෙයින්ම භාග්‍යවතුන් වහන්සේ කාත්‍යායන හිමියන්, **එතදගගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං සංඛිත්තෙන භාසිතසස විත්ථාරෙන අත්ථං විභජනතා යදිදං මහා කච්චානො'** යි ඒතදග්‍රයෙහි තැබූ සේක.

මද පමණ ප්‍රඥාවෙන් යුක්ත වූ භික්ෂුව ධර්මකථාව කියන්නාහූ දශකථා වස්තූන් ඉදිරිපත් කර, සප්ත විශුද්ධි විභාග කරන්නහු විසින් ධර්මකථාව කියන්නට නො හැක්ක. යළි මහා ප්‍රාඥයෙකුට හැකි නිසා මහා ප්‍රාඥ බැවින් පුණ්ණ තෙරුන් වහන්සේ සිව්පිරිස් මැද අලංකාර

ධර්මාසනයෙහි විජිනිපත ද ගෙන උන්නේ පුන්සඳ මෙන් බැබලෙමින් ධර්මකථාව වදාරති. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ පුණ්ණ ස්ථවිරයන් **එතදගගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ධම්මකථිකානං යදිදං පුණ්ණ මනතානි පුතෙතා** යනුවෙන් ඒ තෙරුන් ඒතදග්‍රස්ථානයේ තැබූ සේක.

නැවත යම් ඒ අල්පමාත්‍ර වූ ප්‍රඥාවෙන් සමන්විත භික්ෂුව ධර්මකථාව කියන්නේ මෙතැනින් හෝ එතැනින් සැරයටියක් ගෙන මගට බට අන්ධයකු මෙන් ද, එක් කොටයක් පමණක් ඇති ඒදණ්ඩක යන්නෙකු මෙන් ද යෙයි. එසේ වුවත් මහා ප්‍රාඥ තෙම සතරපද ගාථාවක් මාතෘකා තබා විස්තර වර්ණනා උපමා මගින් බුදුවදන් උඩු යටිකුරු කරමින් කියයි. එසේ මහ නුවණැති බැවින් කුමාර කාශ්‍යප තෙරණුවෝ සිව්පද ගාථාවක් කියා උපමා ද කරුණු ද දක්වා ඒ උපමා ප්‍රස්තුතයන් සමග යොදමින්, විලක පස්වනක් මල් පුබුදුවන්නාක් මෙන් තෙවලා බුදුවදන් සවිස්තරව දෙසති. එහෙයින්ම භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරුන් **'එතදගගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං චිත්තකථිකානං යදිදං කුමාරකුසසපො'** යනුවෙන් එතදග්‍ර ස්ථානයෙහි තැබූ සේක:

මද පමණ නුවණින් යුත් භික්ෂුව සිව්මසකින් සතරපද ගාථාවක් ඉගෙන ගන්නට නො හැක්කේ ය. එහෙත් මහ නුවණැත්තෙක් එක පියවරේම සිට පද සියයක්, පද දහසක්, උගෙන ගනියි. ආනන්ද ස්ථවිරයෝ මහා ප්‍රාඥ බැවින් එක් පියවරක්ම සිට එක්වරක්ම අසා නැවත නො විචාරා පද සැටදහසක් හෝ ගාථා පසළොස් දහසක්, වැලකින් මල් නෙලා ගන්නාක් මෙන් එක් වරකින් ධාරණය කරති. ධාරණය කරන කරන ලද පද ගලෙහි කෙටූ අකුරු මෙන්, රන්බඳුනෙහි දැමූ සිංහතෙල් මෙන්, ගත් පමණින්ම මතකයේ රැඳෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ **'එතදගගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ගතිමනතානං යදිදං ආනන්දො සතිමනතානං, ධිතිමිනතානං, බහුසසුතානං, උපටඨකානං යදිදං ආනන්දො'** ආදී වශයෙන් ඒතදග්‍ර ස්ථානයෙහි තැබූ සේක.

අල්පමාත්‍ර ප්‍රඥාවෙන් යුත් මහණකුහට සිව්පිළිසිඹියා ප්‍රභේදයාගේ මුදුනට පැමිණෙන්නට නො පුළුවන. මහා ප්‍රාඥයකුටම පුළුවන් වන්නේය. මහා ප්‍රඥා ඇති මහා කොට්ඨිත ස්ථවිරයෝ අධිගම පරිපෘච්ඡා, ශ්‍රවණ, පූර්ව යෝගයන්ගේ වශයෙන් විවිධ ආකාරයෙන් ප්‍රශස්ත වූ, උත්සන්න වූ, ප්‍රතිසම්භිදා ප්‍රභේදයට පැමිණියහ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ

එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං පටිසම්භිදාපපත්තං යදිදං මහා කොට්ඨිතො යනුවෙන් ඒතදග්‍රස්ථානයේ තැබූහ.

මෙසේ තෙරුන් වහන්සේ මහා ප්‍රාඥ බැවින් ප්‍රශ්න උපදවන්නටද විචාරන්නට ද සමර්ථයහ. හෙතෙම දිවාකාලය ගෙවා තෙමේ ම සියලු ප්‍රශ්න උපදවා, තෙමේම විසඳන්නේ මේ සූත්‍රයේ මුල පටන්ම මුදුන් පමුණුවා 'මේ ධර්මදේශනාව ඉතා මනහරය. දෙවු සොයුරු ධර්මසේනාධිපතීන් හා සන්සන්දනය කරමි. නැවත මේ ධර්ම කරුණු අප දෙදෙනාගේම ඒකමතික බවින් එකම අදහසින් තබන ලද්දී නම් ඉතා ගරුකටයුතු වන්නේ ය. පහණ සතක් සමාන වන්නීය. චතුරෝඝතරණය කරනු කැමැත්තන්ට නැව්තොට තැබූ නැවක් වැන්න. දෙව්ලෝ යනු කැමැත්තන්ට දහසක් ආජානීය අසුන් යෙදූ රථයක් වැන්න. බොහෝ උපකාර වන්නීය යයි සන්සන්දනය සඳහා ප්‍රශ්න විමසීම කැමැත්ත දැක්වීය.

නප්පජානාති නප්පජානාති යන මෙහි යම්හෙයකින් නො දන්නේද, එහෙයින් දුප්පඤ්ඤ යයි කියයි. සියලු තන්හි මේ ක්‍රමයයි. **ඉදං දුක්ඛන්ති නප්පජානා** මේ උපාදානස්කන්ධ පහ දුකය. මෙතෙක් දුකය. මෙයින් පිට දුකක් නැත්තේය. දුක්ඛ සත්‍යය තතුසේ සිරස් ලක්ෂණ වශයෙන් නො දනීද. **අයං දුක්ඛ සමුදයො** මේ දුක උපදවයි. පවත්වාගෙන යයි. දුක උපදවන්නා වූ තෘෂ්ණාව සමුදය සත්‍යයයි. **අයං දුක්ඛං නිරොධං** මේ දුක ද, දුක ඉපදීමේ හේතුව ද මෙතැනට පැමිණ අභාවයට යේ නිරුද්ධ වේ. දෙදෙනාගේම නො පැවැත්ම වේ යන අරුතින් නිරෝධ සත්‍යයේ පරිපූර්ණ ලක්ෂණ හෙයින් නොදනී. **අයං දුක්ඛ නිරොධ ගාමිනී පටිපදා** මේ ප්‍රතිපදාව දුක් නිවාරණයට පැමිණේ යයි මාර්ග සත්‍යයේ පරිපූර්ණ ලක්ෂණ වශයෙන් නො දනීද,

මෙයට අමතරව මෙසේ අර්ථ දතයුතුයි. මෙයින් ඉතා කෙටියෙන් චතුස්සත්‍ය කර්මස්ථානික චතුරාර්ය සත්‍යය ඇසීමෙන් උගනී. තෘෂ්ණාව තබා, ත්‍රෛභූමික ධර්මයෝ දුක්ඛ සත්‍යයයි. තෘෂ්ණාව සමුදය සත්‍යයයි. ඒ දෙදෙනා නො පවතින්නා වූ නිවන නිරෝධ සත්‍යයයි. නිරෝධය දැනගන්නා වූ මාර්ගය මාර්ග සත්‍යයයි. මෙසේ ඉගෙන ගනියි. ඒ සත්‍යයන් අතුරෙන් පූර්ව සත්‍ය දෙක වෘත්තය - සසරය. අවසාන සත්‍ය දෙක විවෘත්තය. සසරින් එතරවීමය. සංසාරයේ අභිනිවේසය වේ.

විවෘතයෙහි නොවේ. මෙතෙම අභිනිවේසය කරන්නේ දුක්ඛ සත්‍යයේ මොහු අභිනිවේසය කරයි.

දුක්ඛ සත්‍යය නම් නාමරූපාදී පංචස්කන්ධයයි. ඒ පංචස්කන්ධය නිශ්චය කරන්නට චතුධාතු කර්මස්ථාන වශයෙන් බැස සතරමහා භූතයන්ගේ උපාදාය රූප රූපයයි නිශ්චය කරයි. ඒ රූපයට අරමුණු වූ වේදනාය, සංඥාය, සංස්කාරයා විඥානය, 'නාම' යයි තරුණ තල්කඳක් බිඳින්නකු මෙන් මේ ධර්ම දෙදෙන නාමරූප යයි නිශ්චය කරයි.

ඒ නාමරූප දෙක අහේතුක නොවේ. සහේතුකය. ප්‍රත්‍ය සහිතය. ඔහුගේ ප්‍රත්‍ය කවරේද, අවිද්‍යාදී ධර්මයෝ යයි මෙසේ ප්‍රත්‍ය ද ප්‍රත්‍යයෙන් උපන් ධර්ම ද නිශ්චය කොට මේ සියලු ධර්මයෝ ඇතිව නැසෙන අර්ථයෙන් අනිත්‍ය වන්නේ යයි අනිත්‍ය ලක්ෂණයට ආරෝපණය කරයි. නැවත ඇතිවීම හා නැතිවීම (උදයව්‍යය) දෙකින් පෙලෙන අයුරින් දුක්ඛය තමාගේ වශයෙන් නො පවත්නා අයුරින් අනාත්මයෝ යයි ත්‍රිලක්ෂණයට නගා විදර්ශනා ප්‍රතිපදාවෙන් නැවත නැවත මෙනෙහි කරන්නේ ලොව්තුරා මගට පැමිණේ. මාර්ගක්ෂණයෙහි චතුරාර්ය සත්‍යයන් එකප්‍රතිවේධයෙන්ම අවබෝධ කරයි. ඒකාවබෝධයෙන්ම අවබෝධ කරයි. දුක්ඛ සත්‍යය නුවණින් දැන ගනියි. සමුදය ප්‍රහාණාභිසමයෙන්, නිරෝධය මාර්ග භාවනාභිසමයෙන් අභිසමය කෙරෙයි. නුවණින් දැනගනියි.

ඒ දුක්ඛ සමුදය මාර්ග යන තුන් සත්‍යය කෘත්‍ය හෙයින් නිරෝධන අරමුණ හෙයින් ප්‍රතිවේධ කෙරෙයි. තව ද ඕ හට එකෙණෙහි 'මම දුක හාත්පසින් දැනගනිමි. සමුදය හේතුව දුරු කෙරෙමි. නිරෝධය පසක් කෙරෙමි. මාර්ගය වඩමි' ආභෝගයක් සිත් එළවීමක්, මෙනෙහි කිරීමක් ප්‍රත්‍යවේක්ෂාවක් නැත. යම්හෙයකින් චතුස්සත්‍ය කර්මස්ථාන වඩන මහණ පරිග්‍රහණය කරත් කරත්ම. මාර්ගය තෙම තුන් සත්‍යයන්ම පරිඥාදී කෘත්‍ය සිදුකරමින්ම නිරෝධය අරමුණු හෙයින් ප්‍රතිවේධ කෙරේ.

තසමා පඤ්ඤවා වුච්චති ති මෙහි යටත් පිරිසෙයින් සෝවාන් ද, උඩත් පිරිසෙයින් රහතන් වහන්සේගේ ද ප්‍රඥාව දක්වයි. යම්කිසිවෙක් ත්‍රිපිටක බුද්ධවචනය පාලි වශයෙන් ද, අටුවා වශයෙන් ද, අනුසන්ධි වශයෙන් ද පූර්වාපර වශයෙන් ද, උගෙන උඩුයටි කෙරෙමින් හැසිරෙයි.

අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් පරිග්ගහ මාත්‍රයකුත් නැත්ද, මෙතෙමේ ප්‍රාඥයෙකැයි කියයි. මෝඩයෙක් දුෂ්ප්‍රාඥයෙක් නොවේ යයි සේවනය කරන්නවුන් ප්‍රාඥ පක්ෂයම ඇසුරු කරයි. සූත්‍රයෙහි වූ කලී ප්‍රතිවේධයම කියන ලදී.

විඤ්ඤාණං විඤ්ඤාණනති මෙහි කුමක් විචාරයි ද, යම් විඥානයකින් සංස්කාරයන් පිරිසිඳ බලා මෙතෙර ප්‍රඥාවත් නම් වූයේ ද, ඔහුගේ ආගමනීය විදර්හනා විඥාන කර්මය කළ සිත විචාරමි. විචාරයි. **සුඛනති විජානාති** සැපවේදනාව දැනගනී. මතු පද දෙකෙහිද මෙම ක්‍රමයමැයි. මෙයින් තෙරුන් වහන්සේ '**සුඛ වෙදනං වෙදියමානො සුඛං වෙදනං වෙදියාමීති පජානාති**' යනාදී ක්‍රමයෙන් ආ වේදනාව වශයෙන් අරූප කර්මස්ථානය වදාළේය. එහි අර්ථය සතිපට්ඨානයෙහි කී අයුරින්ම දතයුතුය.

සංසට්ඨා ඒකෝත්පාදාදී ලක්ෂණ වූ සංසර්ගයෙන් මිශ්‍ර වූවාහු ද, නොහොත් අමිශ්‍ර වූවාහු ද විචාරති. තව ද මෙහි තෙරුන් වහන්සේ, මාර්ග ප්‍රඥාව ද විදර්ශනා ඤාණයද යන මේ ලෞකික ලෝකෝත්තර ධර්මයන් දෙදෙන මිශ්‍රකොට භූම්‍යන්තරය බිඳ සමය නොදන්නකු වීමෙන් විචාරති යි නො දතයුතු. මාර්ග ප්‍රඥාවගේ මාර්ග විඤ්ඤාණය සමග ද, විදර්ශනා ප්‍රඥාවගේ විදර්ශනා විඥානය සමග ද මිශ්‍ර බව විචාරතියි දතයුතු. තෙරන් වහන්සේ ද (සැරියුත්) ඒ තෙරුන්ගේ (කොටඨිත) අර්ථයම විසඳන සේක්.

ඉමෙ ධම්මා සංසට්ඨා යනාදිය කීහ. එහි **නව ලබ්භා ඉමෙසං ධම්මානං** යනු ලෞකික මාර්ගක්ෂණයෙහි ද, ලෝකෝත්තර මාර්ග ක්ෂණයෙහි ද, එක්විට උපන් ධර්මයන් දෙදෙනාගේ **විනිබ්භුජිතුං** - **විනිබ්භුජිතුං** විනිරිභෝග කරමින්, විනිවර්තනය කරමින් ආරම්මණ වශයෙන් හෝ වස්තු වශයෙන් හෝ, උත්පාද වශයෙන් හෝ නිරෝධ හෙයින් හෝ වෙනත් කරුණක් දක්වන්නට නො හැක්කේය යන අර්ථයි. ඒ ඒ ධර්මයන්ගේ විෂය නම් ඇත. ලෞකික ධර්මයට පැමිණ සිත දෙවු වෙයි. පෙරදැරි වෙයි. ලෝකෝත්තර ධර්මයට පැමිණ ප්‍රඥාව පෙරදැරි වෙයි.

සම්මා සම්බුදුන් වහන්සේ ලෞකික ධර්ම විචාරන්නේ මහණ, තෙපි කවර ප්‍රඥාවට පැමිණියේ ද, ප්‍රථම මාර්ග ප්‍රඥාවට ද, නොහොත් ද්විතීය, තෘතීය, චතුර්ථ මාර්ග ප්‍රඥාවට ද, මෙසේ නො විචාරති. තෙපි කවර ස්පර්ශ ඇත්තේ ද, කවර සංඥා ඇත්තේ ද, කවර චේතනා ඇත්තේද, කියාත් නො විචාරති. එහෙත් සිත් වශයෙන් මහණ තෙපි කවර සිත් ඇත්තේ වේදැයි විචාරති. කුසලා කුසල පනවන්නාහූ 'මනො පුබ්බංගමා ධම්මා, මනො සෙට්ඨා මනොමයා, යිද, කතමෙ ධම්මා කුසලා යසම් සමයෙ කාමාවචර කුසල චිත්තං උපපන්නං හොති, මෙසේ චිත්තයාගේ වශයෙන් පනවන සේක. නැවත ලොව්තුරු දහම් විමසන්නේ, මහණ තෙපි කවර ස්පර්ශ ඇත්තේ කවර වේදනා ඇත්තේ, කවර සංඥා ඇත්තේ, කවර චේතනා ඇත්තේ වෙහිදැයි නො විචාරති. මහණ තොප විසින් කවර ප්‍රඥාවක් ලබන ලදද. කිම ප්‍රථම මාර්ග ප්‍රඥාවද, නොහොත් ද්විතීය, තෘතීය, චතුර්, මාර්ග ප්‍රඥාවදැයි ප්‍රඥා වශයෙන්ම විචාරති.

ඉන්ද්‍රිය සංයුත්තයෙහි ද, මහණෙනි, ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති. කවර පස්දෙනෙක්ද යත්, ශ්‍රද්ධා ඉන්ද්‍රිය, විරිය ඉන්ද්‍රිය, ස්මෘති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, ප්‍රඥා ඉන්ද්‍රිය යන මොහුයි. මහණෙනි, කොතැන්හි ශ්‍රද්ධා ඉන්ද්‍රිය දැක්ක යුතුද, සිව් සෝතාපත්ති අංගවලය. මෙහි සද්ධා ඉන්ද්‍රිය දැකිය යුතුය. කොතැන්හි විරිය ඉන්ද්‍රිය දැක්ක යුතුද, චතුසම්පදාන වීර්යයෙහිය. මෙහි විරියින්ද්‍රිය දැක්ක යුතුය. කොතැන්හී ස්මෘති ඉන්ද්‍රිය දැක්ක යුතුද, සතර සීවටන්වලදීය. මෙසේ ස්මෘති ඉන්ද්‍රිය දැකිය යුතුය. කොතැන්හි සමාධි ඉන්ද්‍රිය දැකිය යුතුද, සිව්දැහැන් (ධ්‍යාන) වලය. මෙහි සමාධි ඉන්ද්‍රිය දැකිය යුතුය. කොතැන්හි ප්‍රඥා ඉන්ද්‍රිය දැකිය යුතුයි. චතුරාර්ය සත්‍යයේය. මෙහි ප්‍රඥා ඉන්ද්‍රිය දැක්ක යුතුය. මෙසේ තමන්ගේ විෂයයෙහිම ලෞකික ලෝකෝත්තර ධර්මයෝ වදාළහ.

යම් සේ වනාහි රජු පස්වෙනි කොට ඇති සිටුපුත්‍රයෝ පස්දෙනෙක් නැකැත් කෙළි කෙළින්නෙමු යයි වීදියට බැස එක් සිටු පුත්‍රයකුගේ ගෙට ගිය කල ඉතිරි සතරදෙනා කථා නො කර සිටිති. ගෙහිමියාම මේ අයට කෑම් බීම් සුවඳ මල් ආභරණ ආදිය දිය යුතුයයි විධාන කෙරේ. දෙවෙනි තුන්වෙනි සතරවැනි සිටු පුතුන්ගේ ගෙවලට ගියකල්හි ඉතිරි සතරදෙන නිහඬව සිටිති. ගෙහිමියාම මොවුනට කැඳ බත් ආහාරපාන සුවඳමල් දිය යුතුයයි විධාන කෙරෙයි. නැවත සියල්ලට පසුව රජුගේ මාලිගාවට ගිය කල්හි රජු සියලු තන්හි අධිපති වූයේ නමුත්, මෙවේලේ තමාගේ

මාලිගයේදීම, මොවුන්ට කෑම් බීම්, සුවඳ විලවුන් අලංකාර ආභරණ දිය යුතුයයි විධාන කෙරේ. නියම කෙරේ. එපරිද්දෙන් ශ්‍රද්ධාව පස්වෙනි කොට ඇති ඉන්ද්‍රියයන්, ඒ යහළුවන් පස්දෙන එකතුව වීදියට සේන්දු වූවාක් මෙන්, එක අරමුණෙහි උපදිනා විටත්, යම්සේ පළමුවැන්නාගේ ගෙයි ඉතිරි සතරදෙනා නිහඬව සිටිත්ද, ගෙහිමියාම විධාන කෙරේද, එපරිද්දෙන් සෝවාන් ආදී අංගයන්ට පැමිණ, අධිමෝක්ෂ ලක්ෂණය වූ ශ්‍රද්ධාවම ප්‍රධාන වෙයි. පෙරදැරි වෙයි. අනෙක් අය ඒ අනුව ගියාහු වෙති. යම්සේ දෙවැන්නාගේ ගෙහි ඉතිරි සතරදෙන නිහඬව සිටිත්ද, ගෙහිමියාම විධාන කෙරෙත්ද, එපරිද්දෙන් සම්‍යක් ප්‍රධානයන්ට පැමිණ ප්‍රගහ ලක්ෂණය වූ වීර්ය ඉන්ද්‍රියම ප්‍රධාන වෙයි. පෙරදැරි වෙයි. සෙස්සෝ ඒ අනුව ගියාහු වෙති. යම්සේ තෙවැන්නාගේ ගෙහි ඉතිරි සතරදෙන නිහඬව සිටිත්ද, ගෙහිමියාම විධාන කෙරෙත්ද, එපරිද්දෙන් සතිපට්ඨානයන්ට පැමිණ උපස්ථාන ලක්ෂණ වූ ස්මෘති ඉන්ද්‍රියම දෙටු වෙයි. පෙරදැරි වෙයි. සෙස්සෝ ඒ අනුව ගියහ. යම්සේ සතරවැන්නාගේ ගෙහි ඉතිරි සතරදෙන නිහඬව සිටීද, ගෙහිමියාම විධාන කෙරේද, එසේ ධ්‍යාන විමෝක්ෂයන්ට පැමිණ අවික්ෂේප ලක්ෂණ වූ සමාධි ඉන්ද්‍රියම පෙරදැරි වෙයි. ප්‍රධාන වෙයි. සෙස්සෝ ඒ අනුව ගියාහු වෙති. රජ මාලිගාවට ගිය කල්හි ඉතිරි සතරදෙන නිහඬව සිටීද, රජ තෙමේ සියලු සංග්‍රහ කෙරේද, එපරිද්දෙන් ආර්ය සත්‍යයන්ට පැමිණ පජානන ලක්ෂණ වූ ප්‍රඥා ඉන්ද්‍රියම ප්‍රධාන වෙයි. පෙරදැරි වෙයි. සෙස්සෝ ඒ අනුව ගියාහු වෙති.

මෙසේ පිළිසිඹියාවූවන් අතුරෙන් අගතැන්හි තැබූ මහාකොට්ඨිත තෙරුන් වහන්සේ ලෞකික ධර්මය විචාරන්නාහූ සිත ප්‍රධානකොට සිත පෙරදැරිකෙටා විචාළහ. ලෝකෝත්තර ධර්ම විමසන්නාහූ ප්‍රඥාව දෙටු කොට ප්‍රඥාව පෙරදැරි කොට විචාළහ. දම්සෙනෙවි සැරියුත් තෙරුන් වහන්සේ ද එසේම විසඳූ සේක.

යං භාවුසො පජානාති යම් චතුරාර්ය සත්‍ය ධර්මයක් මේ දුකය යනාදී වශයෙන් මාර්ග ප්‍රඥාව දැනගනීද, **තං විජානාති** මාර්ග චිත්තය ද එසේම දැනගනී. **යං විජානාති** යම් සංස්කාරයක් අනිත්‍යය ආදී නයායයෙන් විදර්ශනා චිත්තය දැනගනීද, **තං පජානාති** විදර්ශනා ප්‍රඥාවද එසේම දැනගනී. **තසමා ඉමෙ ධම්මා** ඒ කාරණයෙන් මේ ධර්මයෝ **සංසට්ඨා** ඒකුප්පාද, ඒකනිරෝධ - ඒකවත්ථුක, ඒකාරම්මණ බැවින් සංයුක්ත වූවාහුය.

පඤ්ඤා භාවෙ තබ්බා මෙය මාර්ග ප්‍රඥාව සඳහා කියන ලදී. ඒ මාර්ග ප්‍රඥාව හා සම්ප්‍රයුක්ත එකට යෙදුනු ප්‍රඥාව ඒ ප්‍රඥාව සමගම වැඩිය යුතු වෙයි. **විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං** මෙය විදර්ශනා සිත ගැන කියන ලදී. ඒ විඤ්ඤාණය හා එකට යෙදුනු ප්‍රඥාව ඒ විඤ්ඤාණය සමගම හාත්පසින්ම දැනගත යුත්තේ වේ.

වෙදනා වෙදනා යන මෙය කුමක් හෙයින් විචාරත්ද, වේදනා ලක්ෂණය දැනගැනීම සඳහා විචාරයි. මෙසේ ඇතිකල්හිද තේ‍රභූමක සම්මර්ශන වාරයෙහි, වේදනාවම අදහස් කරන ලද්දේයයි සැලකිය යුතුය. **සුඛම්පි වෙදෙති** සුව අරමුණ විඳියි. අනුභව කරයි. මතු දෙපදයෙහි ද මේ ක්‍රමයමැයි. මහාලී! යම්හෙයකින් මේ රූපය ද, ඒකාන්තයෙන් අනිෂ්ට වූයේ, එනිසාම දුක් වූයේ දුක් වේදනාවෙන් බැසගන්නා ලද්දේ, දුකින් අවක්‍රාන්ත වූයේ, එසේ වන්නේ නම් සත්ත්වයෝ රූපයෙහි නො ඇලෙන්නේය. තව ද මහාලී යම්හෙයකින් රූපය සැප වූයේ ද, සැපයෙන් බැසගන්නා ලද ද, සැපයෙන් අවක්‍රාන්ත ද දුකින් අනවක්‍රාන්ත ද, එහෙයින් රූපයෙහි ඇලෙති. ඇලීම හේතුකොටගෙන සංයෝග වෙති. සංයෝගය හේතුකොටගෙන කෙලෙසෙත්. 'මේ මහා සූත්‍ර පරියායෙන් ද මෙහි ආලම්බනය සැපය, දුක්ය, උපේක්ෂාය යි කියන ලදී. තව ද පූර්ව වූ සුඛවේදනාව අරමුණු කොටගෙන අනෙක් (අපර) සුඛ වේදනාවන් විඳී. පෙර වූ දුක් වේදනාව අරමුණු කොට මතු දුක් වේදනා විඳී. යටගිය උපේක්ෂා වේදනාව අරමුණු කොට මතු දුක් වේදනා විඳී. මෙසේ මෙහි අර්ථ දතයුතු. වේදනාව තමන්ම විඳිය යුතුය. එය විඳින්නා වූ වෙන කිසිවෙක් නම් නැතැයි කියන ලදී.

සඤ්ඤා සඤ්ඤාය මේ කුමක්දැයි විචාරයි. සංඥාවගේ ලක්ෂණ විචාරති. කිම සියල්ලෙන් යුක්ත වූ (සර්වත්‍ර) සංඥාවගේ ද, සංඥාවගේ ලක්ෂණ යයි ද, සර්වත්‍ර සංඥාවගේ ලක්ෂණ යයි ද මේ එකකි. මෙසේ ඇතිකල්හි තේ‍රභූමක සම්මර්ශනවාර සංඥාවම අදහස් කරන ලදැයි සැළකිය යුතුය. **නීලම්පි සඤ්ජානාති** නිල් මලක් හෝ නිල් වස්ත්‍රයක් පරිකර්මකොට උපචාරයට හෝ අර්පණාවට පමුණුවමින් හැඳින ගනී. මේ අර්ථයෙහි පරිකර්ම සංඥාවද, උපචාර සංඥාවද, අර්පණා සංඥාවද වටී. නිල්පාටෙහි නීල යයි උපදනා සංඥාව ද, සුදුසුමය. වටින්නේමය. පීතාදියෙහි ද මෙම ක්‍රමයමැයි.

යං චාවුසො වෙදනා යන මෙහි වේදනාය, සංඥාය, විඤ්ඤාණය යන මේ තුන ගෙන ප්‍රඥාව කුමක් හෙයින් නො ගත්තේද, සියල්ලෙහි ඇතුළත් නොවන හෙයිනි. ප්‍රඥාව ගත් කල්හි ප්‍රඥාවෙහි යෙදුනා වූ වේදනාදියද ලැබෙති. වෙන් වූවාහු නො ලැබෙති. නැවත ඒ ප්‍රඥාව නොගෙන මොවුන් ගත්කල්හි ප්‍රඥා සම්ප්‍රයුක්ත වූද, විප්‍රයුක්ත වූද, දෙපස් විඤ්ඤාණ ධර්මයෝ ලැබෙති. යම්සේ පුරුෂයෝ තිදෙනෙක් නූල් නූල් යයි කියති. සතරවැන්න රතු ඇමුණූ නූලක් යයි කියන්නාහුද, ඒ පළමු පුරුෂයෝ තිදෙන නූල් කටින 'තක්ක' යෙහි වූ නූල්, වෙළන ලද 'පරිවට්ටාදියෙහි' වූ බොහෝ වෙනත් නූල් ලබත් ද, යටත්පිරිසෙයින් මකුළු හුයකුදු ලබත්ද, රුවන් ඇමුණූ නූල සොයන තැනැත්තේ ටිකක් ලබයිද, මේ කරුණ එපරිද්දෙන් දතයුතු. නොහොත් යටින් ප්‍රඥාව විඤ්ඤාණය සමග සම්ප්‍රයෝග ලබා හරන ලද්දේ යයි කියනුයේ හළ බැවින්ද, මෙහි නො ගන්නා ලද්දේ යයි කියත්. **යංහාවුසො වෙදෙති** යම් අරමුණක් වේදනාව විඳීද, සංඥාව එය හැඳිනගනී. **යංසඤ්ජානනති** යම් අරමුණක් සංඥාව විසින් හඳුනාගනු ලබන්නේද, විඥානයත් එම ම දැනගනු ලබන්නේ ය යන අර්ථයි.

මෙවිට **සඤ්ජානාති විජානාති** යන මෙහි විශේෂය ද, අවිශේෂය ද දතයුතු. එහි උපසර්ගය යෙදීමම විශේෂයි. 'ජානාති' යන පදය අවිශේෂයි. ඒ පදයේ ජානනාර්ථය විශේෂයෙන් දතයුතුය. සංඥාව වනාහී නීලා දී වශයෙන් අරමුණු හැඳිනීම පමණක් කරයි. අනිත්‍යය, දුකය, අනාත්මයය යන ලක්ෂණ අවබෝධයට හරවන්නට නොහැකි වෙයි. විඥානය නීලාදී අරමුණු දැනගැනීම කරයි. අනිත්‍යාදී ලක්ෂණ අවබෝධයටත් පමුණුවයි. එහෙත් උත්සාහකොට මාර්ගයට පමුණුවන්නට නොහැකි වෙයි. ප්‍රඥාව වූ කලී නීලාදී වශයෙන් අරමුණුක් හැඳිනගනී. අනිත්‍යාදී වශයෙන් ලක්ෂණද අවබෝධ කරගනියි. උත්සාහකොට මාර්ගයටත් පමුණුවයි.

උපමාව මෙසේය. රන්කරුවාගේ මේසය උඩ කහවණු රැසක් දැමූ කල්හී නුවණ නොමේරූ දරුවෙක් ද, ගැමියෙක් ද, මහාරන්කරුය යන තිදෙනෙක් බලාසිටිති. මේ තිදෙනා අතුරෙන් නුවණ නොමේරූ දරුවා කහවණු පිළිබඳව දිලිසෙන ස්වභාවය, රන්වන් පැහැය, හැඩය, පමණක් දැනගනී. මේ මිනිසුන්ගේ පරිහරණයට සුදුසු රත්තරන් යයි නො හැඳින ගනී. ගැමියා රන්වන්ව දිලිසෙන බවත්, මිනිසුන්ගේ උපභෝග පරිභෝග රත්තරන් බවත්, දැනගනී. එහෙත් ඒවායේ බාල බව හෝ වටිනාකම්

පිළිබඳව යමක් නො දනී. රන්කරු දිලිසෙනසුළු බව ද, බබළන බව ද, නියම රත්තරන් ද බාල රත්තරන් ද, කළවම් රත්තරන් ද ආදී සියලු විස්තර දැනගනී. එසේ දැනගන්නා අතර එහි හැඩ රුව අනුව ද, ශබ්දය බලාද, අතින් බර සැහැල්ලු බව අනුවද, අසවල් රටේ කරන ලද ය, අසවල් ගල සෙවණේ, අසවල් ගං ඉවුරේ, අසවල් කම්හලේ, අසවල් කර්මාන්තකරු විසින් කරන ලද්දේය යනුවෙනුත් දැනගනී. එපරිද්දෙන් සංඥා තොමෝ නොමේරූ නුවණැති ළදරුවා ගේ කහවණු දැකීම මෙන් නීලාදි වශයෙන් අරමුණු පමණක් දැනගනී. විඥානය ගැමියාගේ කහවණු දැනීම මෙන්, නීලාදී වශයෙන් අරමුණත් දැනගනී. අනිත්‍යාදී වශයෙන් ලක්ෂණත් අවබෝධ කරගනී. ප්‍රඥාව මහා රන්කරුවාගේ දැකීම මෙන්, නීලාදී වශයෙන් අරමුණ දැනගනී. අනිත්‍යාදී වශයන් ලක්ෂණ ද අවබෝධ කරගනී. උත්සාහවත්ව මාර්ගයාගේ පහළවීමටත් පමුණුවයි.

ඔවුන්ගේ ඒ දැනීම් විශේෂය දුකසේ අවබෝධ කටයුත්තේය. එහෙයින් නාගසේන ස්ථවිරයෝ 'මහරජ, භාග්‍යවතුන් වහන්සේ දුෂ්කර දෙයක්ම කරන ලදැයි කීහ. භවත් නාගසේනයන් වහන්ස, කවර දුෂ්කර දෙයක් කරන ලදද. මහරජ, භාග්‍යවතුන් වහන්සේ දුෂ්කර දෙයක්ම කළහ. එක් අරමුණෙහි පවත්නා වූ, අරූපී චෛතසික ධර්මයන්ගේ මේ ස්පර්ශය, මෝ වේදනාවය, මෝ සංඥාය. මේ චේතනාය. මේ චිත්ත යයි යම් විභාගයක් වදාරණ ලද ද,

යම් සේ තලතෙල්, අබ තෙල්, මීතෙල්, එරඬු තෙල්, චුරුණු තෙල් යන මේ පස්තෙල් එක් සැළියෙක බහා දවසක් පැත්තකින් අළලා (කළවරම්කර) ඉක්බිති නැවත මේ තලතෙල්ය, මේ අබතෙල්ය, වශයෙන් එකක් එකක් වෙන් වෙන්ව වෙන්කිරීම, දුෂ්කර වේද, මෙය ඊට වඩා අතිශයින් දුෂ්කර වෙයි. භාග්‍යවතුන් වහන්සේ සර්වඥතාඥානය මැනවින් අවබෝධ කළ බැවින් ධර්මස්වාමී, ධර්මරාජන් වූ බැවින්ම එක් අරමුණෙහි පවත්නා වූ මේ අරූපී ධර්මයන්ගේ විභාගය බෙදීම කළ සේක. පංචමහා ගංගා මුහුදට වැටෙන තැන දී, මේ යමුනා නදියේ ජලය ය, මේ ගංගා නම් ජලය ය, මෙසේ ජලය වෙන්කර දැක්වීමේ උපමාව ද මේ හා සම වේ.

නිසසතෙඛන යනු නික්මුනා වූ නොහොත් හරන ලද්දා වූ, එහි නික්මුණු යන අර්ථය ඇතිකල්හි පසිඳුරන් කෙරෙහි අවධි අර්ථයයි.

හරණ ලද යන අර්ථය ඇතිකල්හි කරණ වචනය දතයුතු. පසිඳුරන් කෙරෙන් නික්ම මනෝද්වාරයෙහි පැවැතියා වූ, නොහොත් පසිඳුරන් කරණකොට ගෙන ඔහුගේ වස්තු බවට නො පැමිණෙන බැවින්, පරිත්‍යාග කරන ලද **පරිසුද්ධෙන** උපක්ලේශ රහිත වූ **මනොවිඤ්ඤාණෙන** යනු රූපාවචර චතුර්ථධ්‍යාන සිතෙන්, **කීංනෙය්‍ය** කුමක් දතයුතුද, 'යංකිඤ්චි නෙය්‍යං නාම අත්ථි ධම්මං' යනාදිය මෙන් දතයුත්ත නෙය්‍ය යයි කියන ලදී. **ආකාසානඤ්චායතනං - නෙය්‍යං** යනු රූපාවචර චතුර්ථධ්‍යාන චිත්තයෙන් අරූපාවචර සමාපත්ති කෙසේ දතයුතුද, රූපාවචර චතුර්ථ ධ්‍යානයෙහි සිටියවුන් විසින් අරූපාවචර සමාපත්තිය පිහිටුවන්නට හැකි වෙයි. යම්හෙයකින් මෙහි සිටියහුට, ඒ සමාපත්ති සමෘද්ධ වේද, එහෙයින් 'ආකාසානඤ්චායතනං නෙය්‍යං' යනාදිය කීහ.

නැවත නේවසඤ්ඤා නාසඤ්ඤායතනය කුමක් හෙයින් නො කියන ලදද, වෙන වෙනම අභිනිවේශයක් නැති හෙයිනි. යම්හෙයකින් එහි කලාප හෙයින් නය හෙයින් සම්මර්ශනය ලැබේද දම්සෙනෙවි වැනි මහා තෙරුන්ට ද වෙන වෙනම අභිනිවේශයක් නොවේද, එහෙයින් තෙරුන් වහන්සේත් මෙසේ වනාහි මේ ධර්මයෝ අභිනිවේශ නොවී, පහළ වෙති. පහළවී නැසෙති. කලාප හෙයින් නය හෙයින් සම්මර්ශනය කරමින් විසඳූහ. භාග්‍යවතුන් වහන්සේ වූ කලී සර්වඥතාඥානය අත්පත් කරගත් බැවින් නේවසඤ්ඤා නාසඤ්ඤා සමාපත්තියෙහි ද පරෝ පණස් ධර්මයන් වෙන වෙනම අංගෝද්ධාරයෙන්ම, නගා, 'යාවතා සඤ්ඤා සමාපත්ති, තාවතා අඤ්ඤා පටිවෙධෝ' යනාදිය කීහ.

පඤ්ඤා චකඛුනා පජානාති යනු දැකීමේ පරිණායක අර්ථයෙන් ඇසක් වැනි වූ ප්‍රඥාවෙන් දැනගනී. එහි ප්‍රඥාවෝ දෙදෙනෙක් දක්වති. සමාධි ප්‍රඥා, විදර්ශනා ප්‍රඥා වශයෙන් සමාධි ප්‍රඥාවෙන් කෘත්‍ය හෙයින්ද, අසම්මූළ්හ වශයෙන් දැනගනී. විදර්ශනා ප්‍රඥාවෙන් ලක්ෂණ අවබෝධයෙන් අරමුණු හෙයින් දැනීම කියන ලදී.

කිමත්ථියා යනු ඒ ප්‍රඥාවගේ අර්ථය කවරේද, **අභිඤ්ඤත්ථා** යනාදියෙහි දතයුතු ධර්මයන් විශේෂයෙන් දැනගනී යන අර්ථයෙන් අභිඤ්ඤත්ථා වේ. අවබෝධ කරගත යුතු පිරිසිඳ දැනගතයුතු ධර්මයන් දැනගත්තේය යන අර්ථයෙන් **පරිඤ්ඤත්ථා** නම් වේ. පහ කළයුතු ධර්මයන් පහකළේය යන අර්ථයෙන් **පහානත්ථා** නම් වේ. ඒ මේ ප්‍රඥාව ලෞකික

වූයේ ද, අභිඥාව ප්‍රයෝජනකොට ඇත්තේත්, පරිඤ්ඤාව ප්‍රයෝජනකොට ඇත්තේත්, විෂ්කම්භන වශයෙන් ප්‍රහාණය ප්‍රයෝජනකොට ඇත්තේත් වේ. ලෝකෝත්තර වූයේ ද අභිඥාව ප්‍රයෝජනකොට ඇත්තේත්, පරිඤ්ඤාව ප්‍රයෝජනකොට ඇත්තේත්, සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය ප්‍රයෝජනකොට ඇත්තේත්, සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය ප්‍රයෝජනකොට ඇත්තේත් වේ. එහි ලෞකික ප්‍රඥාව කෘත්‍ය වශයෙන් ද නො මුළා වශයෙන් ද, දැනගනී. ලෝකෝත්තර ප්‍රඥාව නො මුළා වශයෙන් දැනගනී.

සම්මා දිට්ඨියා උපාදාය විදර්ශනා සම්‍යග් දෘෂ්ටියේද, මාර්ග සම්‍යග් දෘෂ්ටියේ ද, පරතො ඝොසො සත්ප්‍රාය වූ සැප වූ, ධර්මශ්‍රවණය. යොනිසොච මනසිකාරො තමන්ගේ උපාය මනසිකාරය එහි ශ්‍රාවකයන් අතුරෙහි දම්සෙනෙවියන්ට ද ප්‍රත්‍ය දෙක ලබන්ට සුදුසුමැයි. තෙරුන්වහන්සේ කල්ප ලක්ෂයක් අධිකකොට ඇති එක් අසංඛ්‍යයක් පෙරුම් පුරාම තමන්ගේ ධර්මතාවය අනුමාත්‍ර වූ ක්ලේශයන් දුරුකිරීමට නොහැකි විය. 'යෙ ධම්මා හෙතුප්පභවා' යනාදී වශයෙන් අස්සජි තෙරුන් විසින් දේශිත ගාථාව අසාම ඒ තෙරුන්ගේ ප්‍රතිවේධය විය. පසේබුදුවරුන් වනාහි සර්වඥ බුදුවරුන්ටද අනුන්ගේ ඝෝෂාවෙන් අර්ථයක් නැත. මැනවින් සිහිය පිහිටුවීමේ සිට ප්‍රත්‍යෙක බෝධිය ද, සර්වඥතාඥාන ගුණයම පිහිටුවත්.

අනුගගහිතාය ලබන ලද උපකාර ඇත්තේ, **සම්මා දිට්ඨි** අර්හත් මාර්ග සම්‍යක් දෘෂ්ටිය, ඵලක්ෂණයෙහි උපන් චේතෝ විමුක්තිය මේ අයට ඇතැයි **චෙතො විමුතති ඵලා නම්** එම චෙතො විමුත්ති ඵලයම මේ අයගේ ප්‍රතිඵලය නම් වේනුයි. **චෙතො විමුතති ඵලානිසංසො** යයි කියන ලදී. දෙවන පදයේද මේ ක්‍රමයමැයි. මෙහි ද සතරවන ඵල ප්‍රඥාව **පඤ්ඤා විමුතති** නම් වේ. අවශේෂ ධර්මයෝ **චෙතො විමුතති** යයි දතයුතු.

සීලානුගගහිතා යනාදියෙහි **සීලං** යනු සිව් පිරිසිදු සිල්ය. **සුතං** යනු සත්ප්‍රාය වූ ධර්මශ්‍රවණයයි. **සාකච්ඡා** නම් කර්මස්ථානයන්හි සැලීම් පැකිලීම් සිඳීම් කථාවයි. **සමථො** යනු විදර්ශනාපාදක වූ අෂ්ට සමාපත්තීහුය. **විපසසනා** යනු සත්වැදෑරුම් අනුපස්සනාවෝය. සිව් පිරිසිදු සිල් පුරන්නා හට සත්ප්‍රාය වූ ගැලපෙන්නා වූ ධර්මකථා අසන්නාට, කර්මස්ථානයෙහි සැලීම් පැකිලීම් සිඳින්නහුට විදර්ශනාවට පාදක වූ අෂ්ට සමාපත්තීන්

කෙරෙහි කර්ම කරන්නහුට සත්වැදෑරුම් අනුපස්සනාවේ වසන්නහුට රහත්මග ඉපිද ඵලය ගෙන දෙයි.

යම්සේ මිහිරි වූ අඹ ගෙඩියක් වළඳනු කැමැත්තේ අඹපැලය වටා දිය කොටුවක් ස්ථිරකොට බඳී. කළයක් ගෙන කලින් කල දිය වත්කරයි. දිය බැහැර නො යාම පිණිස ඉවුර උස්සා තර කරයි. සමීපයේ වැලක් හෝ දණ්ඩක් හෝ දිම්ගොටු ආදියක් හෝ මකුළුදැලක් හෝ තිබේනම් ඒවා ඉවත් කරයි. සාරන ආයුධයක් ගෙන වරින්වර මුල් අවට පස් බුරුල් කරයි. මෙසේ මේ පස් ආකාර සත්කාර කරන්නා වූ ඔහුට අඹ ගස වැඩී ඵල ලබාදෙයි. මෙසේ ඒ කරුණ දතයුතුයි.

අඹ පැලය වටා කොටුව බැඳීම මෙන් සිවු පිරිසිදු ශීලය දතයුතුය. කලින් කල ජලය ඉසීම මෙන් ධර්ම ශ්‍රවණය ද, ඉවුර තර කිරීම මෙන් ශමථය ද, සමපයේ වැල් ආදිය බැහැර කිරීම මෙන් කමටහන්හි සැලීම් බිඳීම් සිඳීම ද, කලින් කල පස් බුරුල් කිරීම මෙන් සත්වැදෑරුම් අනුපස්සනාවන්ගේ භාවනාව ද, ඒ කරුණු පසින් සාරවත්ව අඹරුක මිහිරි ඵල දෙන කලක් මෙන් මේ මහණ හට පංච ධර්මයන්ගෙන් අනුව යන ලද සම්‍යක් දෘෂ්ටියේ රහත් ඵලය ලැබීම ද දතයුතුයි.

කති පනාවුසො භවා මෙහි කුමක් විචාරත්ද, මුලටම ගියා වූ අනුසන්ධියයි. අනුවණ තැනැත්තේ යම් භවයන්ගෙන් නො නැගී සිටීද, එය විචාරන්නෙමියි විචාරයි. එහි **කාමභවො** කාම භවයට යන කර්මයද, කර්මයෙන් උපදනා ලද උපාදින්න ස්කන්ධයෝ ද, මේ දෙක එක්තැන් කොට 'කාම භවො' යයි කීහ. රූපා රූප භවයන් හි ද මේ ක්‍රමයමැයි.

ආයතිං අනාගතයෙහි නැවත භවයේ ඉපදීම **පුනබ්භවා නිබ්බනති** නම් වේ. මෙහි වර්තය (පැවැත්ම) විචාරමියි විචාරයි. **තත්‍ර තත්‍රාභි නන්දනා** රූපයෙහි සතුටු වීමය. ශබ්දයෙහි සතුටු වීමය. මෙසේ ඒ ඒ තැන සතුටු වීම තව ද මේ කාරණයෙහි ප්‍රථමා ය, ඒ ඒ තන්හි අභිනන්දනය නිසා නැවත ඉපදීම සිදුවේය යන අර්ථයි. මෙතෙකින් ගමන වෙයි. ආපසු ඒම වෙයි. ගමනාගමනය වෙයි. වර්තය පවතී යයි වර්තය මුදුන් පමුණුවා දැක්වූ සේක.

දැන් විවර්තය විමසන්නාහූ **කථං පනාවුසො** යනාදිය කීහ. එය විසඳීමෙහි **අවිජ්ජාරාගා** අවිද්‍යාවේ ක්‍ෂය විරාගයෙන් **විජ්ජුප්පාදා** අර්හත් මාර්ග විද්‍යාවගේ ඉපදීමෙන් කිම අවිද්‍යාව පළමුව නිරුද්ධ වූයේ ද, විද්‍යාව උපන්නීද? මේ දෙකම නො කිය යුතුමය. පහන දැල්වීමෙන් අඳුර නැති වූවා සේම, විද්‍යාව ඉපදීමෙන් අවිද්‍යාව දුරු වූයේම වේ. **තණ්හා නිරොධා** යනු තෘෂ්ණාවේ විනාශය යයි කියන නිරෝධයෙන්, **පුනබ්භවො නිබ්බනති නහොති** මෙසේ මතුයෙහි පුනර්භවයාගේ පහළවීම නොවෙයි. ගමනය ආගමනය සිඳෙයි. සසර පැවැත්ම (වර්තය) නො පවතී යයි විවර්තය (නිවන) මුදුන්පමුණුවා දැක්වූහ.

කතමං පනාවුසො මෙහි කුමක් විචාරත්ද, උභතො භාග විමුත්ත වූ භික්ෂුව කලින් කල නිරෝධයට සමවදියි. ඔහුගේ නිරෝධපාදක වූ ප්‍රථමධ්‍යානය ප්‍රශ්න කරමියි විචාරයි. **පඨමං පනාවුසොඡඞ්ගං** මෙහි කුමක් විචාරයිද, නිරෝධයට සමවදනා මහණ විසින් අංග ව්‍යවස්ථාවය. කොට්ඨාශ පරිච්ඡේදය දතයුත්තේය. මේ ධ්‍යානය පස් ආකාරය. මේ ධ්‍යානය සතරාකාරය. මෙය තෙයාකාරය. මෙය දෙයාකාරය. ඒ අංග ව්‍යවස්ථාව හා කොට්ඨාස පරිච්ඡේදය විචාරති. **විතක්කො** යනාදියෙහි නැගීම ලක්‍ෂණ වූයේ **විතක්ක** නම්. පිරිමැදීම් ලක්‍ෂණ වූයේ **විචාර** නම්. පැතිරීම් ලක්‍ෂණ වූයේ **පීති** නම්. සැපය ලක්‍ෂණ වූයේ **සුඛ** නම්. අවික්ෂේපය ලක්‍ෂණ වූයේ **චිත්තෙකග්ගතා** නම්. මේ ධර්ම පස පවතින්.

කතංග විපපහීණං මෙහි කුමක් විචාරත්ද, නිරෝධ සමාපත්තියට සමවදින්නා වූ මහණ විසින් උපකාර වූද අනුපකාර වූ ද, අංගයෝ දතයුත්තාහ. ඒ විචාරන්නෙමියි විචාරත්. විසඳුම වනාහි පතළමය. මෙසේ යට නිරෝධය පාදක වූ ප්‍රථමධ්‍යානය ගන්නා ලදී. මත්තෙහි ඒ නිරෝධයට අනන්තර ප්‍රත්‍ය වූ නේවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය විචාරන්නේ ය. යළි අතරත ෂට් සමාපත්තීහූ කෙටි කරන ලද්දාහු න්‍යාය දක්වා විසඳන ලද්දේ යයි දතයුතු.

දැන් විඥානයට උපකාරී වූ පංච ප්‍රසාදයන් විමසන්නාහූ **පඤ්චිමානි ආවුසො** ආදිය කීයේය. එහි **ගොචර විසයං** යනු ගෝචර විෂයයි. **අඤ්ඤඤ්ඤසස** යනු චක්‍ෂුන්ද්‍රිය ශ්‍රෝත ඉන්ද්‍රියයාගේ ද, ශ්‍රෝතෙන්ද්‍රිය හෝ චක්‍ෂුන්ද්‍රියාගේ ද මෙසේ එකක් එකක්හුගේ ගෝචර විෂය නො විඳී. ඉදින් නීලාදී භේද වූ රූපාරම්මණය රැස්කොට ශ්‍රෝතෙන්ද්‍රියට 'මේ කිනම්

අරමුණක්දැයි විනිශ්චය කරව, සලකවයි කියන්නේ නම්, චක්ඛු විඤ්ඤාණය මුඛයක් නැති නමුදු තමාගේ ප්‍රකෘතියෙන් මෙසේ කියන්නේ ය. බොල මෝඩය, අවුරුදු සියයක් හෝ දහසක් හෝ හාත්පස දුවන්නේ මා හැර මොහුගේ දැනීමක් කොහි ලබන්නෙහි ද, ගෙනෙව. එය චක්ඛු ප්‍රසාදයෙහි එළවව. නිල් වූයේ හෝ කසාවත් වූයේ හෝ මම මේ අරමුණ දැනගන්නෙමි. මෙතෙම අනෙකෙකුට විෂය වූයේ නොවේමැයි. මෙතෙම මට ම විෂය වෙයි. සෙසු තන්හි ද මෙම න්‍යායමැයි. මෙසේ මොව්හු එකිනෙකාගේ ගෝචර විෂය නො විඳිත්. **කිං පටිසරණං** මොවුන්ගේ පිළිසරණ කුමක්ද? මොව්හු කුමක් පිළිසරණ කෙරෙත්ද යනුවෙන් විමසයි. **මනො පටිසරණං** යනු ජවන් සිත පිළිසරණය. **මනොව නෙසං** මනෝද්වාරික ජවන් සිත හෝ පංචද්වාරික ජවන් සිත හෝ මොවුන්ගේ ගෝචර විෂය ඇලීම් ආදියෙන් විඳී. චක්ඛුර් විඤ්ඤාණය රූප දැකීමේ මාත්‍රයක් ම වෙයි. මෙහි ඇලීමක් හෝ නො සතුටක් හෝ මුළාවක් හෝ නැත. මේ චක්ඛුර් ද්වාරයෙහි ජවනය ඇලෙන්නේ හෝ කිපෙන්නේ හෝ මුළාවන්නේ හෝ වෙයි. ශ්‍රෝත විඤ්ඤාණාදියෙහි ද මෙම ක්‍රමයමැයි.

මේ ඒ පිළිබඳ උපමාවයි. දුර්වල වූ භෝජකයෝ මුලාදෑනිවරු පස්දෙනෙක් රජු ඇසුරුකොට දුකසේ ඉතා දුකසේ වෙසෙන්නා වූ කුල පසක් ඇති එක්තරා ගමක ස්වල්ප වූ ආදායම ලැබූහ. ඔවුන්ට එහි මත්ස්‍ය භාගය හෝ මාංශ භාගය යුක්ත එක කහවණුවක් හෝ අනු කහවණුවක් හෝ මාස කහවණුවක් හෝ අට කහවණුවක් හෝ සොළොස් කහවණුවක් හෝ දෙතිස් කහවණුවක් හෝ සුසැට කහවණුවක් හෝ දඩ මුදල් පමණක්ම ලැබේ. සියගණන් හෝ දහස් ගණන් වන අයබදු මහරජුම ගනී. ඒ උපමාවෙහි කුල පහකින් යුත් ගම මෙන් ප්‍රසාද පහ දතයුතුය. දුර්වල මුලාදෑනිවරු පස්දෙන මෙන් පංච විඤ්ඤාණයෝ ද, රජු මෙන් ජවන ද, මුලාදෑනීන්ට ලැබෙන සුළු ආදායම මෙන් චක්ඛුර් විඤ්ඤාණාදීන්ගේ රූප දර්ශන ආදියද දතයුතුය. ඇලීම් ආදිය වනාහි මේ චක්ඛුර් විඤ්ඤාණාදියෙහි නැත. රජුගේ මහා ආදායම් ගැනීම මෙන් ඒ ද්වාරයන් ජවනයාගේ ඇලීම දතයුතු.

පඤ්චිමා නි ආවුසො මෙහි කුමක් විචාරත් ද ඇතුලු නිරෝධයෙහි පංච ප්‍රසාදයන් ක්‍රියාමය ප්‍රවෘත්තියෙහි පවත්නා කල්හි අරූප ධර්මයෝ ප්‍රසාදයන්ගේ බලවත් ප්‍රත්‍යයෙන් වෙති. යමෙක් ඒ පැවැත්ම නිරෝධ කොට නිරෝධ සමාපත්තිය සමවදින්නේ ද, ඔහුගේ ඇතුළු නිරෝධයෙහි

පංච ප්‍රසාදයෝ කුමක් ඇසුරුකොට සිටිත්ද, මෙය විචාරති. ආයුං පටිච්ච ජීවිතේන්ද්‍රිය නිසා සිටී. උසමං පටිච්ච ජීවිතේන්ද්‍රිය කර්මජ තේජස නිසා සිටී. යම්හෙයකින් වනාහි කර්මජ තේජස් ද ජීවිතේන්ද්‍රියෙන් බාහිරව නො සිටී. එහෙයින් කර්මජ තේජස ආයුෂය නිසා සිටියයි කීහ.

කඨායතො දැල්වෙන්නා වූ, අච්චිං පටිච්ච ගිනිසිළුව නිසා **ආභාපඤ්ඤායති** ආලෝකය නම් පෙනෙයි. **ආභං පටිච්ච අච්චි** ඒ ආලෝකය නිසා ගිනිදැල් පෙනෙයි. **එවමෙව ඛො ආවුසො ආයු උසමං පටිච්ච තිට්ඨති** යන මේ ගිනිසිළුව මෙන් කර්මජ තේජෝ ධාතුවය. ආලෝකය මෙන් ජීවිතේන්ද්‍රිය ය, ගිනිසිළුව උපදින්නේ ආලෝකය රැගෙනම උපදී. ඒ ගිනිසිළුව තමන් ඉපිද වූ ආලෝකයෙන් ම තොමෝත් සියුම්ය. මහත්ය. කෙටිය. දිගය යි පතළ වෙයි. එහි ගිනිසිළුව පැවැත්මෙන් ඉපිදවූ ආලෝකයෙන් ඒ ගිනිසිලුවේ පැවැත්මම ප්‍රකට වන්නා සේම, කර්මජ තේජස නිසා කර්මජ මහා භූතයන්ගෙන් හටගත් ජීවිතේන්ද්‍රිය විසින් කර්මජ තේජස්හුගේ පාලනය වෙයි. ජීවිතේන්ද්‍රිය ය දසවසකුදු විසිවසකුදු සියක් වසකුදු කර්මජ තේජස්හුගේ පැවැත්ම පාලනය කෙරෙයි. මෙසේ මහාභූතයෝ උපාදාය රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍ය ආදීන්ගේ වශයෙන් ප්‍රත්‍ය වෙත්නුයි ජීවිතේන්ද්‍රිය කර්මජ තේජස නිසා සිටී. ජීවිතේන්ද්‍රිය මහාභූතයන් පාලනය කරන්නේ ය යන්න නිසා කර්මජ තේජස ජීවිතේන්ද්‍රිය නිසා සිටී යයි දතයුතුය.

ආයුසංඛාරා ආයුෂය ජීවිතේන්ද්‍රියමයි. **වෙදනීයා ධම්මා** යනු වේදනා ධර්මයෝය. **වුටඨානං පඤ්ඤායති** යනු සමවතින් නැගී සිටීමයි. යම් භික්ෂුවක් අරූප ධර්මයන්ගේ පැවතීමෙහි උකටලීව සංඥාවද වේදනාවද නිරුද්ධකොට නිරෝධයට සමවදින්නේ ද, ඔහුට සීමිත කරන ලද කාලයාගේ වශයෙන්, රූප ජීවිතේන්ද්‍රියයාගේ ප්‍රත්‍යයෙන් අරූප ධර්මයෝ උපදින්. යළි මෙපරිද්දෙන් රූපාරූප ප්‍රවෘත්ති පවතී. කුමක් මෙන් ද යම්සේ එක් පුරුෂයෙක් ගිනිදැල් පැවැත්මෙහි උකටලී වූයේ වතුර ගසා ගිනිදැල් නිවා අලුවලින් අඟුරු වසා නිහඬව සිටී ද, නැවත යම්විටක ගිනිවලින් ප්‍රයෝජනයක් වේ නම් අළු ඉවත්කොට අඟුරු උඩට ගෙන දර දමා කටින් පිඹ හෝ, යමකින් (තල්වැටකින්) පවන්සැලීම හෝ කරයි ද, එවිට යළි ගිනි ඇවිළේ ද, එපරිද්දෙන් ගිනිදැල් නැගීම මෙන් අරූප ධර්මයෝය, ගිනිදැල් අනවශ්‍ය වූ විට වතුර ගසා ගිනි නිවා අළුවලින් අඟුරු වසා නිශ්ශබ්දව සිටි පුරුෂයා මෙන් අරූප ධර්මයන්ගේ පැවැත්මෙහි

උකටලීව සංඥාවත්, වේදනාවත් නිරුද්ධකොට, භික්ෂුවගේ නිරෝධයට සමවැදීමය. අළුවලින් වැසූ අඟුරු මෙන් රූප ජීවිතේන්ද්‍රිය ය. යළි ගිනිදැල්වලින් ප්‍රයෝජන ඇතිකල්හි පුරුෂයාගේ අළු ඉවත් කිරීම මෙන් භික්ෂුවගේ සීමිත කාලය ඉක්මීමය. ගිනිදැල් පැවැත්ම මෙන් යළි අරූප ධර්මයන් උපන් කල්හි රූපාරූපයන්ගේ පැවැත්ම දතයුතුය.

ආයු උසමා ච විඤ්ඤාණං යනු රූප ජීවිතේන්ද්‍රිය, කර්ම තේජෝ ධාතුව ය, සිත ය, යන මේ ධර්ම තුන යම් කලෙක රූප කාය අතහරිත්ද, එකල්හි මේ කය සිත් නැති දඬු කඩක් මෙන් පොළවෙහි හැර දමන ලද්දේ වේ.

යම්කලෙක ජීවිතේන්ද්‍රිය ද, කර්මජ තේජස ද සිත ද, යන මොහු මේ කය හරිත්ද, එකල්හි බලාපොරොත්තු රහිතව හැරදමන ලද්දේ, බලු කැනහිල් ආදීන් විසින් කෑ යුතුව සිතිවිලි රහිතව හෝනේ ය.

කාය සංඛාරා යනු ආශ්වාස ප්‍රශ්වාසයෝ, **වචී සංඛාරා** විතක්ක විචාර, **චිත්ත සංඛාරා** සංඥා වේදනා, **ආයු රූප ජීවිතින්ද්‍රිය, විපරිභිනනානි** විනාශ වූවාහූ විශේෂයෙන් විනාශ වූවාහූ, එහි කිසිවෙක් 'නිරොධං සමාපනනසස චිත්ත සංඛාරාව නිරුදධා' යයි කී හෙයින් සිත අනිරුද්ධ වෙයි. එහෙයින් මේ සමාපත්තිය සවිතර්ක වූවායයි කියත්ද, ඔව්හූ එසේ කිවයුත්තාහ. **වචී සංඛාරා පිසස නිරුදධා** යි කී හෙයින් වචනය අනිරුද්ධ වෙයි.

එහෙයින් නිරෝධ සමාපත්තියට සමවදින්නවුන් විසින්, බණ කියමින් ද සජ්ඣායනා කරමින් ද හිඳිය යුත්තාහ. 'යොචායං මතෝ කාලකතෝ තසසාපි චිත්ත සංඛාරා නිරුදධා' යයි කී හෙයින් සිත අනිරුද්ධ වන්නේ ය. එහෙයින් කළුරිය කරන ලද මව්පියන් හෝ රහතුන් හෝ දවන්නහු විසින් ආනන්තරිය කර්මය කරන ලද්දේ වන්නේ ය. මෙසේ හෙයින් ව්‍යඤ්ජනයෙහි අභිනිවේශය නොකොට, ආචාර්යවරුන්ගේ න්‍යායයෙහි පිහිටා අර්ථය පරීක්ෂා කළ යුතුය. අර්ථයම පිහිටයි. ව්‍යඤ්ජනය පිහිට නොවේ. **ඉන්ද්‍රියානි විපපසනනානි** යනු ක්‍රියාමය ප්‍රවෘත්ති පවත්නා

ආයු උසමා ච විඤ්ඤාණං - යදා කායං ජහනති මං
අප විඳෙධා තදා සෙති - පරහතතං අචෙතනං

කල්හි, බාහිර අරමුණු ප්‍රසාදයෙහි ගැටෙන කල්හි ඉන්ද්‍රියයෝ ක්ලාන්ත වෙත්ද, සුළඟින් නැගුණු දුහුවිලි ඇති සතරමං සන්ධියක තබන ලද කැඩපතක් මෙන් අරමුණුවලින් මැඩුනාහු වෙත් ද, තැවරුනාහු වෙත් ද, තව ද යම්සේ පසුම්බියක බහා පෙට්ටිවල තැබූ කැඩපත ඇතුළතම බබළයිද එපරිද්දෙන් නිරෝධයට සමවන් භික්ෂුවගේ ඇතුළු නිරෝධයෙහි පංච ප්‍රසාදයෝම ඉතාම බබළත්. **ඉන්ද්‍රියානි විපපසනනා** යන්න එහෙයින් කියන ලදී.

කතී පනාවුසෝ පචචයා මෙහි කුමක් විචාරත්ද, නිරෝධයාගේ අන්තප්‍රත්‍යය වූ නේවසඤ්ඤා නාසඤ්ඤායතනය ප්‍රශ්න කරමියි විචාරයි. ඒ ප්‍රශ්නයේ විසඳීම වනාහි **සුඛසසව පහානා** පහව යන සතර ප්‍රත්‍යයෝ කියන ලද්දේය.

අනිමිතතායා යනුවෙන් කුමක් විචාරයි ද, නිරෝධයෙන් නැගී සිටිනා ඵල සමාපත්තිය විචාරයි. අවශේෂ සමාපත්තීන්හි නැගී සිටීම භවාංගයෙන් වෙයි. එහෙත් නිරෝධ සමාපත්තියෙන් නැගී සිටීම විදර්ශනානිසංස වූ ඵලසමාපත්තියෙන් වෙයි. මේ තෙරණුවෝ ඒ ඵලසමවත විචාරති. **සබබනිමිතතානං** රූපාදී වූ සියළු අරමුණුවල **අනිමිතතාය ච ධාතුයා මනසිකරොති** සියළු නිමිත්තයන්ගෙන් පහ වූ, නිර්වාණ ධාතුහුගේ මෙනෙහි කිරීම ඵල සමාපත්තිය හා සහජාත වූ මෙනෙහි කිරීම සඳහා කීහ. මෙසේ යට නිරෝධපාදක වූ ප්‍රථමධ්‍යානය ගන්නා ලදී. නිරෝධයාගේ අනන්තර ප්‍රත්‍යය වූ නේවසඤ්ඤා නාසඤ්ඤායතනය ගන්නා ලදී. මෙහි නිරෝධයෙන් නැගී සිටින ඵලසමාපත්තිය ගන්නා ලදී. මෙතැන්හිදී නිරෝධ කථාව කිවයුතුය. ඕ තොමෝ විවිධ බලයන්ගෙන් යුක්ත බැවින් (සමථ-විදර්ශනා) ත්‍රිවිධ සංස්කාරයන්ගේ දුරලීමෙන් සොළොස් ඤාණ චරියාවන්ගෙන් ද නව සමාධි චරියාවන්ගෙන් ද වශීභාවය ඇති ප්‍රඥාව නිරෝධ සමාපත්තිය පිළිබඳ ඥානය යයි ප්‍රතිසම්භිදා මාර්ගයෙහි සඳහන් වේ. විශුද්ධි මාර්ගයෙහි ඒ නිරෝධ කථාවන්ගේ විනිශ්චය කථාව සම්පූර්ණයෙන් කියන ලද්දේය.

මෙවිට වළඳනා සමාපත්තිය විචාරන්නේ **කතිපනාවුසෝ පචචයා** යනාදිය කීහ. නිරෝධයෙන් නැගී සිටිනා ඵල සමවත්හුගේ සිටීමක් නො වේද, චිත්තවාර එකක් දෙකක් පැවති භවාංගයට බසීද, මේ භික්ෂුව සත්දිනක් අරූප ධර්මයන් ගේ පැවැත්ම නිරෝධ කොට උන්නේ

නිරෝධයෙන් නැඟී සිටිනා ඵල සමාපත්තියෙහි කලක් නො සිටී. නැවත වළඤ්ජන සමාපත්තියෙහි කාල පරිච්ඡේදයම ප්‍රමාණ වෙයි. එහෙයින් ඒ වළඤ්ජන සමාපත්තියම ඨිති නම් වේ. එහෙයින් කියන ලදී. **අනිමිත්තාය චෙතො විමුත්තියා ඨිතියා** යනු ඒ සමාපත්තියගේ චිරස්ථිතිය පිණිස කෙතෙක් ප්‍රත්‍යයයෝ වෙත්ද, යන අර්ථයි. ඒ ප්‍රශ්නය විසඳීමෙහි පුබ්බව **අභිසංඛාරෝ** කාල පරිච්ඡේදය, **වුට්ඨානාය** මෙහි භවාංගයේ උට්ඨානය පිණිස විචාරති. ඒ ප්‍රශ්නය විසඳීමෙහි ද **සබ්බ නිමිත්තානඤ්ච මනසිකරොති** රූපාදී නිමිති වශයෙන් භවාංගය හා සහජාත වූ මනසිකාරය කියන ලදී.

යාචායං ආවුසො යනු මෙහි කුමක් විචාරත්ද, මෙහි වෙනත් අලුත් නමක් නැත. යට කියන ලද ධර්මයන්ම එකක් වශයෙන් එක්තැන්කොට විචාරමියි විචාරයි. මේ ධර්මයෝ කවර තැනෙක්හි කියන ලදද, 'නීලම්පි සඤ්ජානාති පීතකම්පි ලොහිතකම්පි ඔදාතම්පි සඤ්ජානාති මෙතැන්හි අප්පමාණ චේතො විමුක්තිය කියන ලදී. 'නත්ථ කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං නෙය්‍යං' යනු මෙහි ආකිඤ්චඤ්ඤායතනය කියන ලදී. 'පඤ්ඤා චකබු නා පජානාති' මෙහි ශූන්‍යතා චේතො විමුත්තිය කියන ලදී. 'කතිපනාවුසො පචචයා අනිමිත්තාය චෙතො විමුතතියා වුටඨානාය' යන මෙහි අනිමිත්ත චෙතො විමුත්තිය කියන ලදී. මෙසේ ඉහත කියන ලද්දාහුම මෙතැන්හිදී එකක් වශයෙන් එක්රැස්කොට විචාරයි. එය ප්‍රතික්ෂේප කොට මේවා ඒ ඒ තැන්වල දක්වන ලද්දේ යයි කියා අනෙක් සතර ධර්මයක් එක් නම් ඇත්තාහු ඇති, එක් ධර්මයක් නම් සතරක් ඇත්තේය. මෙය පැහැදිලිකොට කියවන්නට මෙහි විචාරති යි අටුවාවෙහි සනිටුහන් කරන ලදී.

එය විසඳීම් වශයෙන්, **අයං වුචචතාවුසො අපපමාණා චෙතො විමුතත** යනු මෙය පැතිරීම අප්‍රමාණ බැවින් අප්‍රමාණ නම් අප්‍රමාණ වූ සත්ත්වයන් කෙරෙහි පතුරුවයි. එක් සත්ත්වයකු කෙරෙහි හෝ ඉතිරි නොකොට පතුරුවයි. **අයං වුචචතාවුසො ආකිඤ්චඤ්ඤා ආරම්මණ** පළිබෝධයාගේ අභාවයෙන් ආකිඤ්චඤ්ඤා වේ. **අතෙතනවා** ආත්මභාව - පුරිස, පුද්ගල, සංඛ්‍යාත ආත්මයෙන් ශූන්‍යය. **අතතනියෙන වා** යනු සිවුරු පිරිකර සංඛ්‍යාත තමා අයත් දෙයින් ශූන්‍යය. **අනිමිතතානි** රාගාදී නිමිති නැති හෙයින් අභාවයෙන් 'අනිමිත්තා' නම්. අර්හත් ඵල සමාපත්තිය සඳහා කියන ලදී. **නානාටඨා චෙව නානාබ්‍යඤ්ජනානි** ඔවුන්ගේ ව්‍යඤ්ජනද අර්ථය ද විවිධය. එහි ව්‍යඤ්ජනයාගේ නානත්වය පැහැදිලිය. (ප්‍රකටය.)

අර්ථය වනාහි අප්‍රමාණ චේතෝ විමුත්තිය භූම්‍යන්තර හෙයින් මහග්ගත වේ. රූපාවචරය අරමුණු හෙයින් සත්ත්ව ප්‍රඥප්තිය අරමුණුකොට ඇත. ආකිඤ්චඤ්ඤායතන චේතෝ විමුත්තිය භූම්‍යන්තර හෙයින් මහද්ගතය. අරූපාවචරය. අරමුණු හෙයින් නවක්තව්‍යාරම්මණය, ශූන්‍යතා චේතෝ විමුත්තිය භූම්‍යන්තරය කාමාවචරය. අරමුණු වශයෙන් සංස්කාරාරම්මණය මෙහි විදර්ශනාව 'සුඤ්ඤතා' යයි අදහස් කරයි. අනිමිත්ත චේතෝ විමුත්තිය භූම්‍යන්තර වන අතර ලෝකෝත්තර වේ. අරමුණු වශයෙන් නිර්වාණාරම්මණය.

රාගෝ චෝ ආවුසෝ පමාණ කරණෙන ආදියෙහි යම්සේ පර්වත පාදයෙක්හි කුණු වූ කොලවලින් යුත් ජලය කළුපැහැ වන්නේ ද, බලන්නවුන්ට බඹ සියයක් පමණ ගැඹුර ඇති සේ පෙනේද, වැටහේද, රිටක් හෝ රැහැනක් හෝ ගෙන මනින්නහුට පිටිපතුල වැසෙන පමණකුත් නොවේද, එපරිද්දෙන් රාගාදීහූ නූපදිත් ද, ඒතාක් පුද්ගලයා හැඳින ගන්නට නොහැකි වෙයි. සෝවාන් වූ අයෙකු මෙන් ද, සකෘදාගාමී වූ අයෙකු මෙන් ද, අනාගාමී වූ අයෙකු මෙන් ද, වැටහෙයි. එහෙත් යම්කලෙක රාගාදීහූ උපදිත් ද, එකල්හි (රත්තයෙක) ඇලුණෙකි. දුෂ්ටයෙකි. මෝඩයෙකි යනුවෙන් පෙනේ. මෙසේ ඒ රාගාදීහූ මෙපමණකැයි පුද්ගලයාගේ ප්‍රමාණය දක්වන්නවුන් මෙන් උපදින්නේය යන අර්ථයෙන් 'පමාණකරණ' නමැයි කියන ලද්දාහුය.

යාවතා ඛෝ ආවුසෝ අපපමාණ චෙතෝ විමුතතියා යනු අප්පමාණ චේතෝ විමුත්තිහු යම්තාක් වෙත්ද, නැවත ඔව්හූ කෙතෙක් වෙත්ද, සතර බ්‍රහ්ම විහාරයෝය. සතර මාර්ගයෝය. සතර ඵලයෝය යි දොළොසකි. එම බ්‍රහ්මවිහාරයෝ එරණයාගේ අප්‍රමාණ්‍යයෙන් අප්‍රමාණයහ. සෙස්සෝ ප්‍රමාණයහ. ප්‍රමාණය කරන්නා වූ කෙලෙසුන්ගේ අභාවයෙන් නිර්වාණයත් අප්‍රමාණ ම වේ. එහෙත් චේතෝ විමුත්තිය නොවේ. එහෙයින් නො ගන්නා ලදී. අකුප්පා අර්හත්ඵල චේතෝ විමුත්තිය ඔවුන් අතුරෙන් සියල්ලන්ටම ජ්‍යෙෂ්ඨ වේද, එහෙයින් අගගමක්ඛා යයි කියන ලදී.

රාගෝ ඛෝ ආවුසෝ කිඤ්චිනෝ රාගය පුද්ගලයා පෙළයි. මඩියි. පළිබෝධ කෙරෙයි. එහෙයින් කිඤ්චන යයි කියන ලදී. මිනිස්සු ගොනුන් ලවා කමත මඩවනවිට කපිලය මඩව, කළුව මඩවයි කියත්ලු. මෙසේ

මැඩීමේ අර්ථය කිඤ්චනාර්ථයයි දතයුතුය. ද්වේෂ මෝහයන්හිද එසේමැයි. **ආකිඤ්චඤ්ඤායතන චෙතො විමුත්තියො** ආකිඤ්චඤ්ඤායතන චේතො විමුත්තිය නම් ධර්ම නවයකි. ආකිඤ්චඤ්ඤායතනය හා මාර්ග ඵලයද යනුවෙනි. එහි ආකිඤ්චඤ්ඤායතනය, කිසි අරමුණක් එයට නැති නිසා ආකිඤ්චඤ්ඤායතන නම්. මාර්ගඵලයෝ මඩින පලිබෝධ කරන කෙලෙසුන් නැති බැවින් 'ආකිඤ්චඤ්ඤා' නම්. නිර්වාණය ද ආකිඤ්චඤ්ඤය. එහෙත් චේතෝ විමුත්තිය නොවේ. එනිසා එය නො ගනී.

රාගො චො ආවුසො නිමිත්ත කරණො ආදියෙහි කුල දෙකක සමාන වූ වස්සෝ දෙදෙනෙක් වෙත්ද, යම්තාක් ඔවුන්ගේ ලකුණු කිරීමක් (හංවඩු ගැසීමක්) නොකරන ලද්දේ ද, ඒ තාක් මේ අසවල් කුලයේ වස්සාය. මේ අසවල් කුලයේ වස්සා යයි හැඳින ගැනීමට නො හැකි වේද, යලි යම් දවසක ඔවුන්ගේ ලකුණු කිරීමක් කරන්නේ වේද, එකල්හි දැනගන්නට හැකිවෙත්ද, එපරිද්දෙන් යමෙකුට යම්තාක් රාගය නූපදීද, ඒ තාක් ආර්යයෙක් ද, පෘථග්ජනයෙක් දැයි දැනගැනීමට නොහැකි වෙති. යම් විධියකින් ඔහුට රාගය උපන්නේ ද, මේ පුද්ගලයා සරාගියෙක් යයි හැඳින ගන්නා නිමිත්ත උපදී ද, එහෙයින් නිමිත්තකරණයයි කියන ලදී. ද්වේෂ මෝහ දෙක පිළිබඳව ද මෙම ක්‍රමයමැයි.

අනිමිත්තා චෙතො විමුත්තියො අනිමිත්ත චේතෝ විමුත්තිය නම් විදර්ශනාවය. සතර ආරුප්‍යය, සතර ඵලයෝය යනුවෙන් ධර්ම තෙළෙසකි. එහි විදර්ශනා නිත්‍ය නිමිත්තය, සුඛ නිමිත්තය, ආත්ම නිමිත්තය යන මොවුන් ඉස්මතු කරන්නේනුයි 'අනිමිත්ත' නම් මාර්ගඵලයෝ කෙලෙස් නැති හෙයින් අනිමිත්ත නම් වෙති. නිර්වාණය ද අනිමිත්තය. එහෙත් එය චේතෝ විමුත්ති නොවේ. එහෙයින් නො ගන්නා ලදී. කුමක්හෙයින් ශූන්‍යතා චේතෝ විමුත්තිය නො ගන්නේ ද, චේතෝ විමුත්තිය **සුඤ්ඤාරාගෙන** යනු කී හෙයින් හැමතැන්හිම නො පිවිසියේය. එහෙයින් වෙනම නොගන්නා ලදී. **එකට්ඨා** යනු අරමුණු වශයෙන් ඒකාර්ථයෝය. අප්පමාණය. ආකිඤ්චඤ්ඤය. සුඤ්ඤතය. අනිමිත්තය යන මේ සියල්ල නිවනට නම් වේ. මෙසේ මේ ක්‍රමයෙන් ඒකාර්ථයෝය. යළි අන් තැනක අප්‍රමාණ්‍යයෝ වෙති. අන් තැනක ආකිඤ්චඤ්ඤා වෙති. සමහර තැනක ශූන්‍යතා වෙති. තවත් තැනක අනිමිත්තා වෙති. මේ ක්‍රමයෙන් නා නා

ව්‍යඤ්ජන ඇත්තාහු වෙත්.

මෙසේ තෙරුන් වහන්සේ අනුසන්ධි වූ පරිද්දෙන් දේශනාව නිමවූ සේක.

මහා වේදල්ල සූත්‍ර වර්ණනාව නිමියේය.

1-5-4

එවමෙමසුතං චූළ වේදල්ල සූත්‍රයයි. එහි විසාඛෝ උපාසකෝ විසාඛ නම් වූ උපාසක තෙමේ. යෙන ධම්මදිනනා ධම්මදින්නා මෙහෙණ යම්තැනෙක සිටීද, එහි එළඹියේය.

මේ විසාඛ කවරෙක්ද, ධම්මදින්නා කවරෙක්ද, කුමක් හෙයින් පැමිණියේද, විසාඛ නම් ධම්මදින්නාගේ ගිහිකල ස්වාමිපුරුෂයා වේ. හෙතෙම, යම් දවසක භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය අවබෝධ කොට පවත්වන ලද උතුම් වූ දම්සක් ඇත්තේ, යස කුලපුත්‍ර ආදීන් හික්මවා උරුවෙල් දනව්වට වැඩ, දහසක් ජටිලයන් හික්මවා පැරණි ජටිල හා භික්ෂු සංඝයා සමග රජගහ නුවරට වැඩ, බුදුන් දැකීම සඳහා දොළොස් නහුතයක් සමග ආවා වූ බිම්බිසාර මහරජුට දහම් දෙසුයේද, එදා රජු සමග පැමිණි දොළොස් නහුතයක් වූ පිරිස් අතුරෙන් එක් නහුතයක් උපසාක බවට පැමිණියේය. එකොළොස් නහුතයක් බිම්බිසාර රජු සමග සෝවාන් පෙලෙහි පිහිටියාහුය. මේ උපාසකවරුන් අතුරෙන් එක් අයෙක් විසාඛය. ඔවුන් සමග පළමු හමුවීමේදීම සෝවාන් පෙලෙහි පිහිටා, නැවත එක්දිනක් බණ අසා සකෘදාගාමී ඵලයට පැමිණ, එයින් පසුදිනක බණ අසා අනාගාමී ඵලයෙහි පිහිටියේ ය.

(හේ අනාගාමී වී ගෙට එනවිට) පෙර දී ඔහු ගෙට එනවිට ඔබ්මොබ බලමින්, සතුටුවෙමින්, සිනහවෙමින් එන්නේ ද, හේ අනාගාමී වී එනවිට සන්සුන් ඉඳුරන් ඇතිව ඔබිනොබ නොබලා, සන්සිඳුනු සිතින් යුතුව ආයේය. ධම්මදින්නා ඔහු එන සන්හුන් විලාසය සිමැදුරු කවුළුව හැර බලා මේ කිමෙක්දෝ හෝ යි සිතා පෙර ගමන් යන්නී තරප්පු පේලියේ සිට අල්ලා ගන්නා අත දිගු කළාය. උපාසක තෙමේ තම අත හැකිළීය. ඕ තොමෝ උදේ ආහාර ගන්නා විට දැනගනිමියි සිතුවාය. පෙරදී විසාඛ ආහාර ගන්නා විට ධම්මදින්නා සමග එකතුව ආහාර ගනියි. අද ඈ දෙස නො බලාම තනිවම යෝගාවචරයකු සේ ආහාර වළඳයි. ඕ නිදන කල දැනගන්නෙමියි සිතුවාය. උපාසකයා එදින සිරියහන්ගැබට නොපැමිණියේය. අනික් කාමරයක් පිරිසිදු කරවා සැප ඇඳක් පනවා එහි සැතපුණේය. ධම්මදින්නා මෙසේ සිතීය. කිමෙක්ද, මොහු තුළ වෙනත් බලාපොරොත්තුවක් ඇත්ද, නැතිනම් කේලාම් කියන්නකු විසින් කේලාම් කියා මා බිඳුවා පීද, එසේත් නැතිනම් මා අතින් වරදක් සිදුවීද, මෙසේ දොම්නස් දවසක් ගතවූවිට දැනගත හැකිවේයයි සිතා ඔහුට උපස්ථානය පිණිස ගොස් වැඳ සිටියාය. උපාසක තෙමේ ඇයි ධම්මදින්නාවෙනි, අවේලාවේ පැමිණියේද, එසේය ස්වාමීනි, ආවෙමි. නුඹ පෙර ඔන් නොවේ. වෙනත් බලාපොරොත්තුවක් ඇත්ද, නැත ධම්මදින්නාවෙනි. අන්කිසිවකු කේලමක් කීයේද, එසේද නැත. මා අතින් කිසියම් වරදක් වූයේද, තොපගේ කිසිම දොසක් නැත. එසේනම් මා සමග වෙනදා මෙන් කථාබහ කිරීමක්වත් නැත්තේ ඇයිද,

හෙතෙම මෙසේ සිතීය. ලොව්තුරු දහම් නම් ගරුය. බැරෑරුම්ය. නො පැවසිය යුතුය. එහෙත් ඉදින් මම නො කියන්නේ නම් මෝ මෙහි ම ළය පැලී මිය යනු ඇත. ඇයට අනුග්‍රහ පිණිස කිවයුතුය. ධම්මදින්නාවෙනි, මම ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා ලොව්තුරා දහමට (තත්ත්වයට) පැමිණියේ වෙමි. එසේ පැමිණියහුට මෙබඳු ලෞකික ක්‍රියා නො වටී. ඉදින් ඔබ කැමැත්තෙහි නම්, මගේ සතලිස් කෝටියක ධනයත්, තිගේ සතලිස් කෝටියක ධනයත් යන අසූකෝටියක් ධනයටම අධිපතිව, ඉසුරුව, මගේ මව් තනතුරේ හෝ මගේ නැගනි තනතුරේ හෝ සිටුව. තී දෙන ආහාරවලින් පමණක් මම යැපෙන්නෙමි. නැවත ඔබ එසේ නො කැමති නම් මේ වස්තුව ගෙන ඔබේ දෙමාපියන් වෙත යන්න. එසේත් නැතිව වෙනත් බලාපොරොත්තුවක්

ඇත්නම් මම තී නැගනි තනතුරේ හෝ දුවනි තනතුරේ තබා පෝෂණය කරන්නෙමි.

ඕ තොමෝ මෙසේ සිතුවාය. ස්වාභාවික පිරිමියෙක් නම් මෙසේ නො කියයි. ඒකාන්තයෙන්ම මොහු ලොව්තුරු දහම් ලබා ඇත. එහෙත් ඒ දහම පුරුෂයන් විසින් පමණක් අවබෝධ කළයුතුද, ස්ත්‍රීන්ට එය නුසුදුසු වන්නේද, ස්ත්‍රීන්ට අවබෝධ කළ නො හැකි වන්නේද, මෙසේ විසාඛට කීවාය. ධම්මදින්නාවෙනි, කුමක් කියන්නේද? යම්කෙනෙක් පිළිපදින්නේද ඔහුට මේ දායාදයයි. යම් යම් කෙනෙකුට උපනිශ්‍රය ඇත්ද ඒ ඒ අයට මෙය ලබාගත හැකිය. (විසාඛ කීයේය.) එසේනම් මට පැවිදි වන්නට අවසර දෙව, මැනවි සොඳුර, මම ද මේ මග යොදන්නට කැමැත්තෙන් සිටියෙමි. එහෙත් ඔබගේ අදහස් නොදන්නා බැවින් එය නො කීමි. එකෙණෙහිම විසාඛ බිම්බිසාර රජු සමීපයට ගොස් අභිවාදනය කොට සිටියේය.

රජ තෙමේ, ඇයිද ගෘහපතිය, මේ අවේලාවේ පැමිණියේ ද විචාළේය. මහරජ, ධම්මදින්නා පැවිදිවන්නෙමියි කියයි. ඈට කුමක් අවශ්‍ය වේද, දේවයිනි, ස්වර්ණ සිවිකාවක් ලබන්නට වටී. නගරය පිළිදැගුම් කරන්නට (පෙරහැරක් කරන්නට) වටී. රජු ස්වර්ණ සිවිකාවක් දී නුවර (පෙරහැර කරන්නට ද කටයුතු කළේය.) පිළිදැගුම් කරවීය.

විසාඛ තෙමේ ධම්මදින්නා සුවඳ පැනින් නාවා සියලු අලංකාරයෙන් සරසවා ස්වර්ණ සිවිකාවෙහි හිඳුවා, ඥාතීන් පිරිවරා සුවඳ මලින් සුවඳ දුමින් පුදමින් නුවර බැබළීම කරන්නෙකු මෙන් මෙහෙණ අසපුවට ගොස් ආර්යාවෙනි, ධම්මදින්නා පැවිදි කළ මැනවැයි කීය. භික්ෂුණීහූ ගෘහපතිය, එකක් හෝ දෙකක් දොස් ඉවසන්නට වටී යයි කීහ. ආර්යාවනි, නැත. කිසිම දොසක් නැත. ඕ ශ්‍රද්ධාවෙන්ම පැවිදි වන්නීය. ඉක්බිති ව්‍යක්ත වූ තෙරණියක් තව පංචක කර්මස්ථානය කියවා හිසකෙස් බහා පැවිදි කරවූය. විසාඛ තෙමේ, සිත් අලවා වාසය කරන්න, ධර්මය ස්වාක්ඛාත වේ කියා වැඳ නික්ම ගියේය.

ඇය පැවිදි වූ දින පටන් ලාභසත්කාර උපන. ඒ පලිබෝධයෙන් මහණදම් පුරන්නට ඉඩක් නො ලැබිණ. එකල ආචාර්ය උපාධ්‍යාය තෙරණිවරුන් ද කැටුව අටතිස් අරමුණු අතුරෙන් සිතට රුචි වූ කමටහනක්

කියවාගෙන මහණදම් පුරන්නට පටන් ගත්හ. අභිනීහාර සම්පන්න බැවින් බොහෝකලක් ක්ලාන්ත නොවීය.

මෙහි පටන් කල්ප ලක්ෂයකින් පෙර පදුමුත්තර සර්වඥයන් වහන්සේ ලොව උපන්හ. එකල්හී එකී කුලයක දාසියක වශයෙන් සිටියදී තමන්ගේ කෙස් විකුණා අග්‍රශ්‍රාවක වූ සුජාත තෙරුන්ට දන් දී ප්‍රාර්ථනයක් කළාය. එම ප්‍රාර්ථනාව මුදුන්පත් වීමෙන් බොහෝ කලක් ක්ලාන්ත නොවීය. කීප දිනකින්ම රහත්ඵලයට පැමිණියාය. ඉක්බිතිව ඕ මෙසේ සිතීය. 'මා යම් ප්‍රයෝජනයක් සඳහා මේ බුදු සසුනේ පැවිදි වූයෙම් ද, ඒ අර්ථය මුදුන් පැමිණියේය. තවදුරටත් ජනපද වාසයෙන් කවර අර්ථද, මගේ නෑදෑයෝ පින් කරන්නාහුය. භික්ෂුණී සංඝයාත් ප්‍රත්‍යයෙන් නො වෙහෙසෙන්නෝය. රජගහ නුවරට යම්'යි භික්ෂුණී සංඝයා ද ගෙන රජගහ නුවරටම ගියාය. විසාඛ තෙමේ ධම්මදින්නා ආපසු ආවායයි අසා, පැවිදි වී කෙටි කලකින්ම ජනපදයට ගියාය. ගොස් කෙටි කලකින්ම ආපසු ආවාය. කුමක් සිදුවන්නේ ද, එහි ගොස් දැනගත යුතුයයි. දෙවෙනි ගමනින් උපාසිකාරාමයට ගියේය. අථඛො විසාඛො උපාසකො යෙන ධම්මදිනනා භිකඛුනී තෙනුපසංකමි යන්න එහෙයින් කියන ලදී.

එතදවොච මේ සක්කායො යන වචනය කීයේය. කුමක් හෙයින් කීවේද, ඔහුට මෙසේ සිතිණ, ආර්යාවෙනි, සිත් අලවා වෙසෙයිද, නො වෙසෙයි ද, මෙසේ විචාරීම නුවණැත්තන්ගේ විචාරීමක් නොවේ. පංච උපාදානස්කන්ධය පිළිබඳ ප්‍රශ්න විචාරමි. පැන විසඳීමෙන් ඇගේ අභිරතිය (ඇල්ම) අනභිරතිය ද (නො ඇල්ම) දැනගනිමි. එහෙයින් කීහ.

ඒ අසා ඇවැත් විසාඛ, මා පැවිදි වී ටික කලක් ඉක්ම ගියේය. ස්වකාය හෝ පරකාය කොහෙන් දැනගන්නෙම්ද, අන්‍ය ස්ථවිරීන් කරා එළඹ විචාරවයි නො කියා, ප්‍රවේසම්කර තබන ලද්දක් ආපසු දෙන්නාක් මෙන්, එක් පාශයක් ඇති ගැටයක් ලිහන්නාක් මෙන්, කැලයෙන් වැසුනු තැනක ඇත්මග විවර කරන්නාක් මෙන්, කඩු තුඩකින් පෙට්ටියක් විවෘත කරන්නාක් මෙන්, විශ්ලේෂණාත්මක ඤාණයෙහි සිට ප්‍රශ්නය විසඳමිනි. පඤ්ච ඛො ඉමෙ ආවුසො විසාඛ උපාදානක්ඛන්ධා ආදිය කීහ. එහි පඤ්ච යනු ගණන දැක්වීමයි. උපාදානක්ඛන්ධ යනු උපාදානයන්ට ප්‍රත්‍ය වූ ස්කන්ධයෝ යනාදී වශයෙන් උපාදානස්කන්ධ කථාව විස්තරකොට කිවයුතු වේ. මේ ස්කන්ධ කථා විස්තරය විශුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලද්දේද,

එසේ විස්තර කළ අනුසාරයෙන් දතයුතුය. සත්කාය සමුදය ආදිය පිළිබඳව යමක් කිවයුතු නම්, එය ඒ ඒ තැන කියන ලදී.

මේ (ධම්මදිනනාගේ) චතුරාර්ය සත්‍ය විස්තරය අසා විසාඛ තෙරණින් වහන්සේ බුදුසසුනේ ඇළුම් ඇති බව අවබෝධ කළේය. යමෙක් බුදුසසුනෙහි උකටලී වූයේ නම්, නො ඇලුනා වූ හෙතෙම මෙසේ ඇසූ ඇසූ ප්‍රශ්නය අඬුවකින් එක් නරකෙසක් ගන්නකු මෙන්, මහාමේරු පත්ලෙන් වැල් ගන්නකු සේ විසඳන්නට නො හැකි වෙයි.

යම් හෙයකින් වනාහි මේ සිවුසස් ලෝකයෙහි සඳ හිරු මෙන් බුදු සසුන්හි ප්‍රකට වෙත්ද, සිව්පිරිස් මැදට වන් භාග්‍යවතුන් වහන්සේත්, මහා තෙරවරුත් සිව්සස්ම දේශනා කරත් ද, (සත්‍යයම ප්‍රකාශ කරත්ද) භික්ෂු සංඝයා ද පැවිදි වූ දවසේ පටන් කුලපුතුන්ට සතර නම් කුමක්ද, සතරනම් ආර්ය සත්‍ය සතරය ප්‍රශ්නය උගන්වාද, මේ ධම්මදින්නා තොමෝත් උපාසක කුලයාගේ දියණිය වී පණ්ඩිත වූවාය. ව්‍යක්ත වූවාය. නීතිය ක්‍රමය ගෙන ඇසීමෙන් ද, කියන්ට සමර්ථ වූවාය. එහෙයින් මෙතෙකින් මැය සත්‍යයන් ප්‍රතිවේධ කළ බව දැනගන්නට නොහැක්ක. නැවත සත්‍ය විභාග ප්‍රශ්නය විසඳීමෙන් දැනගන්නට හැකියයි සිතා, යට කී සත්‍ය දෙක නවතා ගැට සහිත ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නෙමියි විමසන්නේ, තං යෙව නුඩො අය්‍යෙ ආදිය කීහ.

එය විසඳීමෙහි නඛො ආවුසො විසාඛ තං යෙව උපාදානං උපාදානය නම් සංස්කාර ස්කන්ධයාගේ එක දේශයක් බැවින් ඒ උපාදානයම පංචස්කන්ධයෝ නොවෙති. පංච උපාදානස්කන්ධයන් විනා උපදානයක් නැත. ඉදින් එයම වන්නේ නම් රූපාදි ස්වභාවයක් උපාදාන වන්නේද, උපාදාන ස්කන්ධයන් විනා උපාදානය වන්නේ නම් එකල්හි පරසමයෙහි සිතින් වෙන්වූ අනුසය මෙන් ද, ප්‍රඥප්තිය මෙන් ද, නිවන මෙන් ද, ස්කන්ධයෙන් තොර වූයේ වන්නේද හයවෙනි ස්කන්ධයක් හෝ පැනවිය හැකි වන්නේ ද, එහෙයින් මෙසේ පිළිතුරු දුන්නීය.

ඇගේ විසඳීම අසා මෝ තොමෝ පැමිණි ප්‍රතිවේධ ඇත්තී යයි විසාඛ තෙමේ නිගමනයට පැමිණියේය. ක්ෂීණාශ්‍රව නොවූවෙකුට නො ගැටෙමින් ව්‍යාකුල නොවෙමින්, පහන් දහසක් දල්වන්නකු මෙන්, මෙබඳු වූ සැඟවුණු තිලකුණෙන් මඩනා ලද ගැඹුරු වූ මෙබඳු ප්‍රශ්නයක්

විසඳීමට නො හැක්කේමය යි නිගමනයට පැමිණ, නැවත මෝ ධම්මදින්නා ශාසනයෙහි ලද ප්‍රතිඡ්ඨා ඇත්තීය. අවබෝධ කළ පිළිසිඹියා ඇත්තීය. විශාරද බවට පැමිණියාය. භවය නසන ලද්දීය. මහා ක්ෂීණාශ්‍රව වූවාය. මා විමසන විමසන ප්‍රශ්න විසඳීමට සමර්ථ වන්නී යයි සිතීය. මෙවිට නැවත ඕවට්ටික සාරය කොට ප්‍රශ්නයක් සිතා එය විචාරන්නේ කථං පනෙය්‍ය ආදිය කීහ.

එය විසඳීමෙහි **අසඝුතවා** යනාදිය මූලපරියාය සූත්‍රයේ විස්තර කරන ලදී. **රූපං අත්තනෝ සමනුපසඝති** යනු මෙලොව කිසිවෙක් රූපය ආත්මය වශයෙන් දකී. යමෙක් රූපය ද හේ මමය, යමෙක් මම වෙමිද එය රූපයයි. රූපයත් ආත්මයත් දෙකක් නොවන සේ එකක්ම සේ දකී. දැල්වෙන තෙල් පහනෙක යම් ගිනිසිළුවක් වේද, එය වර්ණය - යම් වර්ණයක් වේද ඒ ගිනිසිලමය. මෙසේ අද්වය කොට දකී ද, එපරිද්දෙන් මෙලොව කිසිවෙක් රූපය ආත්ම වශයෙන් -පෙ- අද්වය කොට දකී. මෙසේ රූපය ආත්මයයි දෘෂ්ටි දර්ශනයෙන් දකී. ආත්මය රූපවත් යයි හෝ අරූපය ආත්මයයි ගෙන සෙවණැල්ලත් ගස මෙන් රූපවත් ආත්මය දකී. **අත්තනිවා රූපං** අරූපයම ආත්මයයි ගෙන, මලෙහි සුවඳ මෙන් ආත්මයෙහි රූපය දකී. **රූපසමිං වා අත්තානං** අරූපයම ආත්මයයි ගෙන, කරඬුවෙහි මැණික් මෙන්, ආත්මය රූප විෂයෙහි ඇතැයි දකී. **වෙදනං අත්තනෝ** යනාදියෙහි ද මේ ක්‍රමයමයි.

එහි ශුද්ධ රූපයම ආත්මයයි කියන ලදී. 'රූපවන්තං වා අත්තානං, අත්තනිවා රූපං, රූපසමිං වා අත්තානං, වෙදනං, අත්තනෝ සඤ්ඤං සංඛාරෙ, විඤ්ඤාණං අත්තනෝ සමනුපසඝති' යන මේ සත් තැනෙහි ම අරූපය ආත්මයයි කියන ලදී. 'වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වේදනාය වා අත්තානං' යන මේ සතර ස්කන්ධයන්හි තුනක් තුනක්හුගේ වශයෙන්, දොළොස් තැනෙක්හි රූපාරූප මිශ්‍ර වූ ආත්මය කියන ලදී.

එහි 'රූපං අත්තනෝ සමනුපසඝති, වෙදනං, සඤ්ඤං, සංඛාරෙ විඤ්ඤාණං, අත්තනෝ සමනුපසඝති යන මේ පස් තැනෙහි උච්ඡේද දෘෂ්ටිය කියන ලදී. අනෙක් තැන්හි ශාස්වත දෘෂ්ටිය කියයි. මෙසේ මෙහි භව දෘෂ්ටි පසළොසක් ද, විභව දෘෂ්ටි පසක් ද දැක්වේ.

න රූපං අත්තනෝ මෙහි රූපය ආත්මයයි නො දකී. අනිත්‍ය දුක්ඛ අනාත්ම යයි දකී. **න රූපවන්තං අත්තානං -පෙ- න විඤ්ඤාණසමිං අත්තානං** මේ පඤ්චස්කන්ධයන් කිසිම අයුරකින් ආත්ම වශයෙන් නො දකී. එසේම සියලු ආකාරයෙන් අනිත්‍යයෝය. දුක්ඛයෝය. අනාත්මයෝ යයි දකී.

මෙතෙකින් ස්ථවිරීන් විසින් ඇවැත් විසාඛය, මෙසේ සක්කාය දිට්ඨිය වන්නේය. මෙසේ පළමු ප්‍රශ්නය විසඳන්නීය. මෙතෙකින් ගමනය වෙයි. ආගමනය වෙයි. ගමනාගමනය වේ. සංසාර වර්තය පවතී යයි වර්තය මුදුන් පමුණුවා දක්වයි. **එවං ඛෝ විසාඛ සක්කාය දිට්ඨි න හොති** යයි පශ්චිම ප්‍රශ්නය විසඳන්නීය. මෙතෙකින් ගමනය නොවෙයි. ආගමන නොවෙයි. ගමනාගමනය නොවෙයි. වර්තය නො පවතී. විවර්තය මුදුන් පමුණුවා දක්වන ලදී.

කතයෝ පනෙය්‍ය අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ මේ ප්‍රශ්නය තෙරණින් විමසා විසඳිය යුතු වන්නේය. 'උපාසකය, ඔබ විසින් මේ මාර්ගය විමසන ලදී' මෙහි කවර නම් මගක් විචාරයිද, කුමක් හෙයින් විචාරයිද, එහෙත් ඕ තොමෝ තමන් ව්‍යක්ත බැවින් පණ්ඩිත බැවින්, ඔහුගේ බලාපොරොත්තුව සැලකීය. මේ උපාසකයා විසින් ප්‍රතිපත්ති වශයෙන් මාර්ගය විචාරන ලද්දේ වන්නේය. මෙහි වනාහි එය සංඛත අසංඛත වශයෙන්, ලෞකික, ලෝකෝත්තර වශයෙන් සකස් කරන ලද හා සකස් නොකරන ලද වශයෙන්, විචාරන කැමැත්තේ වන්නේ ය. එහෙයින් නො පිළිවිසම යමක් යමක් විචාළේ නම් ඒ ඒ ප්‍රශ්නය විසඳීය. **එහි සංඛතෝ** යනු සිතන ලද, සලකන ලද, හාත්පසින් සලකන ලද, රැස්කරන ලද, උපදවන ලද, පැමිණෙන්නහු විසින් පැමිණිය යුතුයි.

තීහිව ඛෝ ආවුසෝ විසාඛ - ඛන්ධෙහි අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ සංගහීතෝ මෙහි යම්හෙයකින් මාර්ගය ප්‍රදේශ සහිතද, ස්කන්ධත්‍රය ප්‍රදේශ රහිත ද, එහෙයින් මේ මාර්ගය සප්‍රදේශ බැවින්, නගරය නිෂ්ප්‍රදේශ රාජ්‍යය මෙන් නිෂ්ප්‍රදේශ වූ තුන් ස්කන්ධයන්හි සංග්‍රහ කරන ලද්දේය. එහි සම්මා වාචාදී තිදෙන සීලය මැයි. එහෙයින් සමාන ජාති වශයෙන් සීලස්කන්ධ වශයෙන් දක්වන ලදී. යම්කිසි විදියකින් පාලියෙහි **සීලඛන්ධෙ** ආධාරයෙන් මෙන් නිර්දේශ කර ඇත. එහෙත් අර්ථය කරුණු වශයෙන් දතයුතුය.

සම්මා වාචා ආදී තිදෙනාගේ සමාධිය තමාගේ ප්‍රකෘතියෙන් අරමුණෙහි එකඟ බැවින් පිහිටා සිටින්නට නො හැකි වෙයි. නැවත වීර්යය ප්‍රග්‍රහ කෘත්‍යය සිදුකරන කල්හි සිහියද අපිලාපන කෘත්‍යය සිදුකරන කල්හි ලද උපකාර ඇතිව නැතිවේ.

එහි උපමාව මෙසේය. යම්සේ නැකැත් ක්‍රීඩා කරන්නට උයනට පිවිසි යහළුවන් තිදෙනෙකු අතුරෙන් එකෙක් සපු ගසක් දැක අත ඔසවාද ගන්නට නො හැකි වෙයි. ඉක්බිති දෙවැන්නා පහතට නැවී පිට පාන්නේය. හෙතෙම ඔහුගේ පිට උඩ සිට ද වෙවුලමින් ගන්නට නොහැකි වන්නේ ය. එවිට තුන්වැන්නා උරහිස පාන්නේ ය. හෙතෙම එකකුගේ පිටෙහි සිට, අනෙකාගේ උරේ එල්ලී, කැමති පරිදි මල් කඩාගෙන නැකැත් ක්‍රීඩාවෙහි යෙදෙන්නේ ය. මේ කරුණ එපරිද්දෙන් දතයුතුයි.

එක්ව උයනට පිවිසි තුන් යහළුවන් මෙන් එක්ව උපන් සම්‍යක් ව්‍යායාමාදී ධර්ම තුනය. සුපිපි සපුගස මෙන් අරමුණුය. අත ඔසවාත් ගන්නට නොහැකි වූවාක් මෙන් තමන්ගේ ස්වාභාවික අරමුණෙහි එකඟ සිතින් පිහිටන්නට නො හැකි වූ සමාධිය ය. පිට පා ආධාර කළ යහළුවා මෙන් ව්‍යායාම යැ. උරහිස පෑ යහළුවා මෙන් සිහියය, ඔවුන් අතුරෙන් එකකුගේ පිට නැගී, එකකුගේ උරහිසේ එල්ලී මල් නෙලා ගත්තාක් මෙන් වීර්ය ප්‍රග්‍රහ කෘත්‍යය ද, සිහිය අපිලාපන කෘත්‍යය ද සිදුකරන කල්හි ලද උපකාර ඇති සමාධිය අරමුණෙහි එකඟ බැවින් පිහිටා සිටින්නට හැකි වේ. එහෙයින් මෙහි සමාධියම සමාන ජාති වශයෙන් සමාධි ස්කන්ධයෙන් සංග්‍රහ කරන ලදී. ව්‍යායාම - සති වනාහි ක්‍රියා වශයෙන් සංග්‍රහ කර ඇත්තේය.

සම්මා දිට්ඨි සංකල්පයන් අතුරෙන් ප්‍රඥාව වූ කලී තමන්ගේ ධර්මභාවයෙන් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය එනිසා අරමුණු නිශ්චය කළ නො හැක්කේය. විතර්කය වනාහි එළව එළවා දෙන කල්හි හැකිවෙයි. කෙසේද, යම්සේ රන්කරුවා කහවණුව අතෙහි තබා සම්පූර්ණ කොටස් බලනු කැමති වන්නේ නමුත්, ඇසේ බලයෙන්ම පෙරලන්නට නො හැකි වෙයි. ඇඟිලි තුඩුවලින් පෙරලමින් එහා මෙහා (ඒ පැත්ත මේ පැත්ත) බලන්නට හැකිවෙයි. මෙසේම ප්‍රඥාව තමාගේ ධර්මතාවයෙන් අනිත්‍යාදී වශයෙන් අරමුණු නිශ්චය කරන්නට නො හැකිවෙයි. යම්හෙයකින් අරමුණට අභිමුඛ කොට නැංවීම ලක්ෂණකොට ඇති විතර්කය විසින්

එළවන්නකු මෙන් ද පෙරළන්නෙකු මෙන් ද, ගෙන දෙන ලද්දම නිශ්චය කරන්නට හැකිවේද, එහෙයින් මෙහි ද සම්‍යක් දෘෂ්ටියම සමාන ජාති වශයෙන් ප්‍රඥා ස්කන්ධයෙන් සංග්‍රහ කරන ලද්දේ ය. සම්මා සංකල්පය වනාහි ක්‍රියා හෙයින් සංග්‍රහ කරන ලද්දේ ය.

මෙසේ මේ තුන් ස්කන්ධයන් නිසා මාර්ගය සංග්‍රහයට පැමිණේ. තීහිච ඛෝ ආවුසෝ විසාඛ ඛන්ධෙ හි අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ සංගහීතෝ යන්න එහෙයින් කියන ලදී.

දැන් ඒක චිත්තක්ෂණික වූ නිමිති සහිත වූ පිරිවර සහිත වූ මාර්ග සමාධිය විචරන්නේ කතමෝ පනෙය්‍ය ආදිය කීහ. එය විසඳීමේදී චතාරෝ සතිපට්ඨානා සතර සතිපට්ඨානයෝ මාර්ග ක්ෂණයෙහි සතර කෘත්‍යයන් සිදුකිරීම් වශයෙන් උපන් සිහිය සමාධියට ප්‍රත්‍යාර්ථයෙන් නිමිතතා නිමිති වෙත්, චතාරෝ සම්මප්පධානා සතර සම්‍යක් ප්‍රධන් වීර්යය සතර කෘත්‍යයන් සිදුකිරීම් වශයෙන් උපන් වීර්යයයි. එය පරිවාරාර්ථයෙන් පරිකඛාරෝ පිරිකර වේ. තෙසං යෙව ධම්මානං ඒ මාර්ග සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ආසෙවනා ඒක චිත්තක්ෂණික ආසෙවනාදිය කියන ලදී.

(විතණ්ඩවාදීහු) විරුද්ධවාදීහූ ඒක චිත්තක්ෂණික වූ මාර්ගයක් නැතැයි කියති. 'එවං භාවෙය්‍ය සත්තවසසානි' යනු වචන හෙයින් සත් වසක් මාර්ග භාවනාව වෙයි. ක්ලේශයෝ වනාහි වහා සිඳෙන්නාහූ සප්ත අනුපස්සනා ඤාණයෙන් බිඳෙති'යි කියයි. හෙතෙම සූත්‍රයක් ඉදිරිපත්කොට කියවයි. කිවයුත්තේය. ඒකාන්තයෙන් අනෙක් සූත්‍රයක් නො දක්නේ යා තෙසං යෙව ධම්මානං ආසෙවනා භාවනා බහුලී කම්මං යන මෙය ගෙන දක්වා අන් සිතකින් ආසේවනය කරයි. අන් සිතකින් වඩයි. අන් සිතකින් බහුල කෙරේයයි කියයි. එහෙයින් මෙසේ කිවයුතුය. කිම මේ සූත්‍රය නෙය්‍යාර්ථද, නීතාර්ථද එහෙයින් කියයි. 'නීතාර්ථය' සූත්‍රය යම්සේද අර්ථයත් එසේමය.

මේ ඔහුගේ උත්තරයයි. මෙසේ ඇතිකල්හි සේවනය කරමින් උපන් එක් සිතකි. සේවනය කරමින් තවත් සිතකි. සේවනය කරමින් අනිකුදු සිතකි. මෙසේ දවසක්ම ආසේවනය වන්නේ ය. වැඩීමක් කොයින්ද, බහුලීකරණයක් කොයින්ද, වඩමින් උපන් එක් සිතෙක, වඩමින් තවත් සිතෙක, වඩමින් අනෙකුදු සිතෙක, මෙසේ දවසම භාවනා වැඩීම

වන්නේ ය. ආසේවනයක් කොයින්ද, බහුලීකරණයක් කොයින්ද, බහුල කරමින් උපන් එක් සිතෙක, බහුලීකරණයෙන් උපන් තවත් සිතකි. බහුලීකරණයෙන් උපන් අනිකුදු සිතකි. මෙසේ දවසක්ම බහුලීකරණය වන්නේ ය. ආසේවනයක් කොයින්ද? බහුලීකරණයක් කොයින්ද? භාවනාවක් කොයින්ද?

දැන් නැවත මෙසේ කියයි.

එක් සිතකින් සේවනය කරයි. සිත් දෙකකින් වඩයි. තුන් සිතකින් බහුල කෙරෙයි. දෙසිතකින් හෝ සේවනය කෙරෙයි. තුන් සිතකින් වඩයි. එක් සිතකින් බහුල කෙරෙයි. තුන් සිතකින් හෝ ආසේවනය කරයි. එකකින් වඩයි. දෙසිතකින් බහුල කෙරෙයි. හෙතෙම මෙසේ කිවයුතුය. මා විසින් සූත්‍රයක් ලබන ලද්දේය. යම් ඒ කටට ආවක් ම නොකියව, ප්‍රශ්න විසඳන්නහු විසින් ගුරුවරුන් සමීපයේ වැඩි බුදුවදන් ඉගෙන, අරුත් රස විඳ කිවයුතු වෙයි. මේ ආසේවනා ඒක චිත්තක්ෂණික මැයි. භාවනා ඒක චිත්තක්ෂණිකය. බහුලීකරණය ඒක චිත්තක්ෂණිකය. ක්ෂයගාමී වූ ලෝකෝත්තර මාර්ගය බහුචිත්ත ක්ෂණික වූයේ නම් නැත. ඒකචිත්ත ක්ෂණික වූයේමය යයි දැක්විය යුතුය. ඉදින් එසේ හැඳින නො ගන්නේ නම් යව විභාරයට ගොස් කැඳ බොන්නැයි යැවිය යුත්තේය.

කති පනෙය්‍ය සංඛාරා මෙහි කුමක් විචාරයිද, යම් සංස්කාර කෙනෙක් නිරුද්ධකොට නිරෝධයට සමවදිත්ද, ඒ සංස්කාරයන් විචාරන්නෙමි යි විචාරයි. එයින්ම ඔහුගේ අදහස දැන ස්ථවිරීන් වහන්සේ පුණ්‍යාභිසංස්කාරාදී නොයෙක් සංස්කාරයන් ඇති කල්හිදු කාය සංස්කාරාදියම ප්‍රකාශ කරමින් **තයෝ මෙ ආවුසො** යනාදිය කීහ. එය කය පිළිබඳව නිසාත්, කයින් රැස්කරනු ලබන නිසාත්, කයින් උපදවනු ලැබෙන නිසාත් **කාය සංඛාර** නම් වේ. වචන පිළිබඳ බැවිනුත් වචනයෙන් රැස්කරනු ලබන නිසාත්, වචනයෙන් උපදවනු ලබන නිසාත්, **වචී සංඛාර** නම්. සිත පිළිබඳ බැවිනුත්, සිතින් රැස්කරනු ලබන නිසාත් සිතෙන් උපදවනු ලබන නිසාත් **චිත්ත සංඛාර** නම් වේ.

කතමො පනෙය්‍ය යනු මෙහි කුමක් විචාරයිද, යම්කිසි සංස්කාරයක් නිරුද්ධ කොට නිරෝධයට සමවදිත්ද, ඒ සංස්කාරයන් විචාරයි. ඔහුගේ අදහස එයින්ම දත් ස්ථවිරීන් වහන්සේ මේ සංස්කාරයෝ ඔවුනොවුන්

මිශ්‍ර වූවාහු කැළඹුනාහූ අප්‍රකට වූවාහූ දැක්වීමට දුෂ්කර වේ. කායද්වාරයෙහි අල්ලාගැනීම් සංඛ්‍යාත ගැනීමය. හැරීමය. සැලීමය යන මොවුන්ට පමුණුවා උපන් කාමාවචර කුසල චේතනා අටද, අකුසල චේතනා දොළහද, මෙසේ කුසල් අකුසල් චේතනා විස්ස ආශ්වාස ප්‍රශ්වාසයෝ ද කාය සංස්කාර යයි කියති. වාග් ද්වාරයෙහි හනු සැලීමට, වාග් භේදයට උපන් යට කියන ලද චේතනා විස්ස විතර්ක විචාරයෝ ද වාක් සංස්කාර නම් වෙයි. මෙසේ මේ සංස්කාරයෝ ඔවුනොවුන් කාය වාග් ද්වාරයන්හි චලනයට නො පැමිණ, රහසිගතව සිතන්නහුට උපන් කුසලා කුසල චේතනා විසි නවය ද සංඥාව හා වේදනාව ද, චිත්ත සංස්කාර නම් වේ. මෙසේ මේ සංස්කාරයෝ ඔවුනොවුන් මිශ්‍රයෝය. ඇලලුනාහුය. අප්‍රකටයහ. නොදැක්විය හැක්කාහු වෙති. ඔවුන් ප්‍රකට වූවක් විභූත වූවක් කොට කියවන්නෙමියි විචාරයි.

කසමාපනෙය්‍ය මෙහි 'කාය සංඛාර' ආදී නාමයන්ගේ පදාර්ථ විචාරයි. එය විසඳීමෙහි **කාය පටිබද්ධා** කය ඇසුරු කළාහූ කය ඇතිකල්හි සිටිති. නැතිකල්හි නො සිටිති. **චිතත පටිබද්ධා** සිත ඇතිකල්හි සිටිති. සිත නැතිකල්හි නො සිටිති.

දැන් මේ සඤ්ඤායිත නිරෝධය වළඳ ද, නො වළඳ ද, එහි වණණවසී වෙයි ද වණණවසී නො වෙයි ද, දැනගැනීම පිණිස විචාරන්නේ

කථං පනෙය්‍ය සඤ්ඤා වෙදයිත නිරොධ සමාපතති හොති යයි කීහ. එය විසඳීමෙහි **සමාපජ්ජිසසනති වා සමා පජජාමීති වා** යන දෙපදයෙන් නේවසඤ්ඤා නාසඤ්ඤා සමාපත්ති කාලය කියන ලදී. **සමාපනෙනා** යන පදයෙන් ඇතුළු නිරෝධය කියන ලදී. එසේම පළමු දෙපදයෙන් සචිත්ත කාලයද, පසුපදයෙන් අචිත්ත කාලයද කියන ලදී. **පුබෙබව තථා චිතතං භාවිතං හොති** නිරෝධ සමාපත්තියෙන් පෙර කාලය පිරික්සන කල්හි මෙතෙක් කල් අචිත්තක වන්නෙමි කාල පරිච්ඡේද සිත මඩනා ලද වෙයි. **යං තං තථතතාය උපනෙති** මෙසේ වඩන ලද යම් සිතක් ඒ පුද්ගලයා අචිත්තක භාවයට පමුණුවයිද,

පඨමං නිරුජඣති වචී සංඛාරො සෙසු සංස්කාරයන්ගේ පළමුවෙනි දෙවෙනි දැහැන්හිම නිරුද්ධ වෙයි. **තතොකාය සංඛාරෙ** ඉන්පසු කාය සංස්කාරය සතරවන දැහැන්හිම නිරුද්ධ වෙයි. **තතො චිතත සංඛාරො**

ඉන්පසු චිත්ත සංස්කාරය ඇතුළු නිරෝධයෙහි නිරුද්ධ වේ. වුට්ඨහිසඝං වා වුට්ඨහාමී යන පද ද්වයෙන් ඇතුළු නිරෝධ කාලය කියන ලදී. වුට්ඨිතො යන පදයෙන් ඵලසමාපත්ති කාලය කියන ලදී. එසේම මේ පළමු දෙපදයෙන් අචිත්තක කාලය කියන ලදී. පසුපදයෙන් චිත්ත කාලය කියන ලදී. පුබෙබව කථං චිතතං භාවිතං හොති නිරෝධ සමාපත්තියෙන් පෙර කල් බලනකල්හි මෙතෙක් කල් අචිත්තකව සිට ඉන්පසු සචිත්තක වන්නෙමියි කාලය බෙදාගැනීමේ සිත වඩන ලද වෙයි. යං තං තථතතාය උපනෙති මෙසේ වඩන ලද යම් සිතක් ඒ පුද්ගලයා පූර්ණ බවට සචිත්තක බවට පමුණුවාද, මෙසේ නිරෝධයට සමවදින කාලය ගන්නා ලදී. මෙහි නිරෝධයෙන් නැඟී සිටින කාලය ගන්නා ලදී. දැන් නිරෝධ කථාව කියන්නට සුදුසු කාලය යයි නිරෝධ කථාව කියන්නේ ය.

දැන් නිරෝධ කථාව කියන්නට සුදුසු කාලය යයි නිරෝධ කථාව කිවයුතුයි. ඒ නිරෝධ කථාව වූ කලී, 'දවීහි බලෙහි සමනනාගතතතා - තයො වා සංඛාරානං පටිපපසසදධියා සොළසෙහි ඤාණ චරියාහි නවහි සමාධි චරියාහි වසීභාවතා පඤඤා නිරොධ සමාපතතියා ඤාණං' යනුවෙන් මාතෘකා තබා සියලු ආකාරයෙන් විසුද්ධි මාර්ගයෙහි කියන ලදී. එහෙයින් එහි කියන ලද අයුරින් ගතයුතුය. (බල දෙකකින් සමන්විත හෙයින් ත්‍රිවිධ සංස්කාරයන් සංසිඳුවීමෙන්, සොළොස් ආකාර ඤාණයන්ගේ පැවැත්මෙන් ද, නව සමාධීන් ගේ පැවැත්මෙන් ද, වශීභාවයට පැමිණි ප්‍රඥාව නිරෝධ සමාපත්ති ඤාණයයි.)

මේ නිරෝධය නම් කවරේද, වේදනාදී සතර ස්කන්ධයන්ගේ ප්‍රත්‍යවේක්ෂාවෙන් නො පැවැත්මය. එකල්හි කුමක් හෙයින් මෙසේ සම වදිත්ද, සංස්කාරයන්ගේ පැවැත්මෙහි උකටලී වූවාහූ සතියක් සිතින් තොරව සුවසේ වසන්නෙමු. ඒ නිරෝධය වූ කලී 'දිටඨ ධමම නිබබාන' (මෙලොවදීම ලබන නිවන්සුවය) මේ සඳහා සමවදිත්.

පඨමං උපපජජති චිතත සංඛාරො යනු නිරෝධයෙන් නැඟී සිටින්නහුගේ ඵල සමාපත්ති සිත පළමුව උපදීද, එය හා එකට යෙදුනා වූ සංඥාවත් වේදනාවත් සඳහා 'පඨමං උපපජජති චිතත සංඛාරො' යන්න කීය. තතො කාය සංඛාරො ඉන්පසු භවාංග සමයෙහි කාය සංස්කාරය උපදී. ඵල සමාපත්තිය ආශ්වාස ප්‍රශ්වාසයෙන් නූපදවයිද, යම් හෙයකින් චතුර්ථධ්‍යාන ඵල සමාපත්තිය වේද, එහෙයින් කාය

සංස්කාරය නූපදවයි. එල සමාපත්තිය ප්‍රථම ද්විතීය, තෘතීය, චතුර්ථ ධ්‍යානික වේද, ශාන්ත වූ සමාධියෙන් නැගී සිටි භික්ෂූහුගේ ආශ්වාස ප්‍රශ්වාසයෙන් ව්‍යහාරයෙහි නො පවතී. මේ බව මේ තත්ත්වය සංජීව තෙරුන්ගේ වස්තුවෙන් දතයුතුය.

සංජීව තෙරුන් සමාපත්තියෙන් නැගිට කෑලමල් වැනි වූ ගිනිදැල් රහිත දිලියෙන අඟුරු පාගමින් ගිය මුත් සිවුරෙහි නූල්පටක්වත් උණුසුම් වීම පමණකුදු නො වීය. මේ සමාපත්ති බලය නමැයි කියති. එපරිද්දෙන් ශාන්ත වූ සමාපත්තියෙන් නැගී සිටි භික්ෂූහුගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ අව්‍යවහාරික වෙති. මෙය භවාංග කාලයේම සිදුවේයයි දතයුතු.

තතො වචීසංඛාරො ඉන්පසු කාර්යයන්හි යෙදෙන කල්හි වචී සංඛාරය උපදී. භවාංගය විතර්ක විචාරය නූපදවයිද, උපදවයි. එහෙත් එයින් උපන් විතර්ක විචාරයෝ වචනය උපදවන්නට නො හැකි වෙත්. මෙය කාර්යයෙහි යෙදෙන කල්හිම කියන ලදී.

සුඤ්ඤතො එසෙසා ආදිය සමාන ගුණයෙන් ද, ආරම්මණයෙන් ද, කිය යුතුය. පළමුව සමාන ගුණයෙන් කියනු ලැබේ. 'සුඤ්ඤතා' නම් එල සමාපත්තියයි. ඒ එල සමවත සමග උපන් ස්පර්ශය සඳහා 'සුඤ්ඤතො එසෙසා' යන්න කියන ලදී. අනිමිත්ත - අප්පණිහිත යන තන්හිද මෙම ක්‍රමය මැයි. ආරම්මණයෙන් වනාහි නිර්වාණය රාගාදියෙන් හිස් බැවින් 'සුඤ්ඤත' නම් වේ. රාග නිමිති නැති බැවින් 'අනිමිත්ත' වේ. රාග ද්වේෂ මෝහයන්ගේ අභාවය නිසා අපපණිහි නම් වේ. මෙසේ ශූන්‍ය වූ නිර්වාණය අරමුණු කොට උපන් එලසමවතෙහි ස්පර්ශය සුඤ්ඤත නමින්ද, අනිමිත්ත අප්පණිහිත වශයෙන් ද දතයුතුයි.

අනෙක් වූ ආගමනීය කථා නම්, සුඤ්ඤතා, අනිමිත්තතා - අපපණිහිතා යනු විසින් විදර්ශනාව කියනු ලැබේ. එහි යම් භික්ෂුවක් සංස්කාරයන් අනිත්‍ය වශයන් පරිග්‍රහණය කොට අනිත්‍ය වශයෙන් දැක, අනිත්‍යභාවයෙන් නැගී සිටීද, ඔහුගේ විදර්ශනාව උත්තානගාමිනී විදර්ශනාව 'අනිමිත්තා' නම් වෙයි. යම් භික්ෂුවක් දුක් වශයෙන් සලකා, දුක්ඛයෙන් නැගී සිටී ද, ඔහුගේ විදර්ශනාව 'අපපණිහිතා' නම්. යම්කිසි භික්ෂුවක් අනාත්ම වශයෙන් සලකා අනාත්ම වශයන් දැක සංස්කාරයන්ගේ අනාත්ම වශයෙන් නැගී සිටීද, ඔහුගේ විදර්ශනාව 'සුඤ්ඤතා' නම්. එහි

අනිමිත්ත විදර්ශනාවගේ මාර්ගය අනිමිත්ත නම්. අනිමිත්ත මාර්ගයාගේ ඵලය අනිමිත්ත ඵල නම්. අනිමිත්ත ඵල සමාපත්තිය හා එකට උපන් ස්පර්ශය ස්පර්ශ කරන කල්හි අනිමිත්ත ස්පර්ශය ස්පර්ශ කරන්නේ යයි කියනු ලැබේ. අප්‍රණිහිත සුඤ්ඤ, තැන්වලද මෙම ක්‍රමයමැයි.

ආගමනීය කථාව කී කල්හි ශූන්‍යතා ස්පර්ශය හෝ අනිමිත්ත ස්පර්ශය අප්‍රණිහිත ස්පර්ශය හෝ විකල්පය පැමිණෙන්නේ ද එහෙයින් සමාන ගුණයෙන් හා ආරම්මණයෙන් ද කිවයුතුයි. එපරිද්දෙන් තයෝ එසසා ඵුසනති යනු සම වේ.

විවෙකනිනනං යනු 'නිවන' විවේක නම්, ඒ නිවන නමැති විවෙකයෙහි නැමුණේ අවනත වූයේ යන අර්ථයෙන් **'විවෙක නින්න'** නම්. විවේකයෙහි ප්‍රමාණය වූයේ අන් තැනක නොගොස් විවේකය යම් තැනකද එතැන්හි වැටෙන්නෙකු මෙන් සිටියේය යන අර්ථයෙන් **විවෙක පබභාර** නම් වේ.

දැන් යම් වේදනාවක් නිරුද්ධකොට නිරෝධ සමාපත්තියට සම වදීද, ඒ වේදනාවන් විචාරමි. **කති පෙහය්‍ය වේදනා** යනු කීය. **කායිකං වා** යනාදියෙහි පස්දොර උපන් සැපය **කායික** නම් වේ. මනෝද්වාරයෙහි උපන්නේ **චෙතසික** නම් වේ. එහි **සුඛං** යනු ස්වභාව නිර්දේශය. **සාතං** යනු ඔහුගේම මිහිරි බව දක්වන තවත් වචනයකි. **වෙදයිතං** යනු වේදනාභාවය දක්වන සියළු වේදනාවන්ට සාධාරණ වචනයි. අනෙක් පදයන්හිද මෙම ක්‍රමයමැයි.

සුඛා වෙදනා ඨිති සුඛා විපරිණාම දුක්ඛා යනාදියෙහි සැප වේදනාව ඇති බව සුවය, නැති බව දුකය. දුක් වේදනාව ඇති බව දුකය, නැති බව සුවය. උපේක්ෂා වේදනාව දන්නා බව සුවය නො දන්නා බව දුකය යන අදහසයි.

කිං අනුසයෝ අනුසෙති කවර අනුසයයෙක් අනුව සයනය කෙරේද, අප්‍රහීනාර්ථයෙන් සයනය කළ කෙනෙක් මෙන් වේද, අනුසය ප්‍රශ්නය විචාරයි. **න ඛෝ ආවුසෝ විසාඛ සබ්බාය සුඛාය වෙදනාය රාගානුසයෝ අනුසෙති** සියලු සැප වේදනාවෙහි රාගානුසය අනුසයනය නො කෙරෙයි.

සියලු සැප වේදනාවෙහි හෝ අප්‍රහීන වූයේ නොවේ. සියලු සැප වේදනා අරහයා නූපදී යන අර්ථයි. සියලු තන්හි මෙම ක්‍රමයමැයි.

කිං පහාතබ්බං මේ ප්‍රහාණ ප්‍රශ්නයයි. **රාගං තෙන පජහති** මෙහි එක විසඳීමෙන් ප්‍රශ්න දෙකක් විසඳයි. මේ ශාසනයෙහි භික්ෂුව රාගානුසය යටපත්කොට ප්‍රථම ධ්‍යානයට සමවදියි. ධ්‍යානයෙන් යටපත් කළ රාගානුශය එසේ යටපත් කරන ලද්දක්ම කොට විදසුන් වඩා අනාගාමී මාර්ගය මගින් සමූලඝාතනය කෙරෙයි. හෙතෙම අනාගාමී මාර්ගයෙන් ප්‍රහීණ වූයේ නමුත් එසේ යටපත් කළ බැවින්ම ප්‍රථමධ්‍යානයේ අනුසයනය නො කෙරේ. **න තත්ථ රාගානුසයො අනුසෙති** යන්න එහෙයින් කියන ලදී.

තදායතනං තං + ආයතනං - පරමාස්වාස භාවයෙන් පිහිටුවන ලද අර්හත්වය යන අර්ථයි. **ඉති අනුත්තරෙසු** මෙසේ අනුත්තරය විමොක්ඛය, යන නම් ලද රහත්බැව්හී ප්‍රාර්ථනා තබන්නන්ට **උපපජ්ජති පිහපපචචයා දොමනසසං** ප්‍රාර්ථනාව තැබීම මුල්කොට ඇති දොම්නස උපදී. ඒ ප්‍රාර්ථනාව කොට නො ලබන්නහුට නො ලැබීම මුල්ව උපදනේ **උපපජ්ජති පිහපපචචයා** යනු කියන ලදී.

එහි දොම්නස නම් ඒකාන්ත අකුසල්ය. එහෙත් මේ සේවනය කළයුතු දොම්නස වටීයයි කියති. යෝගීහූ තෙමසකින් හෝ සයමසකින් හෝ නව මසකින් ප්‍රතිපදාව ගනිත්. ඔවුන් අතරෙන් යමෙක් ඒ ප්‍රතිපදාව ගෙන අතරතුර කාල පරිච්ඡේදයක දී අර්හත්වයට පැමිණෙන්නෙමියි වෑයම් කරමින්, ගැටෙමින්, සීමිත කාලයකදී පැමිණෙන්නට නො හැකි වේද, ඔහුට බලවත් දොම්නස උපදී. ආලින්දක වැසි මහාඵුස්ස තෙරුන්ට මෙන් කඳුළු ධාරා වැටෙත්. තෙරුන්වහන්සේ දහනව අවුරුද්දක් ගතපච්චාගත වත පිරූහ. මෙවර රහත්බව ලබන්නෙම්, විශුද්ධි පවාරණයෙන් පවරන්නෙමි යි මනසින් බැඳී ශ්‍රමණ ධර්මය කරන්නේ නමුත් දහනව වසක් ඉක්මවා පවාරණ දිනයෙහි පැමිණියා වූ ඒ තෙරුන් ගේ කඳුළු නො වැගුණු දවසක් නම් නැත. අනතුරුව විසිවෙනි වස රහත්බවට පැමිණුනේය.

පටිඝං තෙන පජහති යනු දොම්නසින්ම ප්‍රතිඝය දුරුකෙරෙයි. ප්‍රතිඝයෙන් ප්‍රතිඝය දුරලීමක් හෝ දොම්නසින් දොම්නස දුරලීමක් නැත.

මේ භික්ෂුව ත්‍රෛමාසික ආදී පිළිවෙත් අතුරෙන් එක් පිළිවෙතක් ගෙන මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි. බලව මහණ, කිම තොපගේ සීලයේ පිරිහිණු තැනක් ඇද්ද, නැතහොත් වීර්යයෙන්, නැතිනම් ප්‍රඥාවෙන් පිරිහුණු තැනක් ඇත්ද, ඒකාන්තයෙන් තොපගේ සීලය පිරිසිදු නොවේද, වීර්යය දැඩිකොට ගත්තේ නොවේද, ප්‍රඥාව ශූරව පැමිණියේ නොවේද, හෙතෙම මෙසේ නිතර නිතර නුවණින් සලකා නැවත දොම්නසට උපදින්නට ඉඩ නො දෙමියි වීර්යය දැඩිකොට ඉදිරි තුන්මසින් හෝ හයමසින් හෝ නවමසින් අනාගාමී මාර්ගයෙන් ඒ දොම්නස අවසන් කරයි. මේ ක්‍රමයෙන් ප්‍රතිඝයෙන් ප්‍රතිඝය දොම්නසින් දොම්නස දුරු කෙරෙයි. **න තත්ථ පටිඝානුසයෝ අනුසෙති** යන මෙහි මෙබඳු දොම්නසෙහි ප්‍රතිඝානුසය අනුසය නො කෙරෙයි. එය අරහයා නූපදී. එහි ප්‍රතිඝානුසය ප්‍රහීණය යන අර්ථයි.

අවිජජං තෙන පජහති මේ සසුනෙහි භික්ෂුව අවිද්‍යානුසය යටපත්කොට සතරවන ධ්‍යානයට සමවදී. ධ්‍යානයෙන් යටපත් කළ අවිද්‍යානුසය එසේ යටපත් කරන ලද්දක්ම කොට විදසුන් වඩා රහත් මගින් සහමුලින්ම නසයි. හේ රහත් මගින් ප්‍රහීණ වූයේ නමුත් එසේ යටපත් කරන ලද බැවින්ම චතුර්ථධ්‍යානයෙහි අනුසය නො කෙරෙයි නම් **න තත්ථ අවිජජානුසයෝ අනුසෙති** යන්න එහෙයින් කියන ලදී.

මෙවිට ප්‍රතිභාග ප්‍රශ්නය විමසමින්, **සුඛාය පනෙය්‍ය** ආදිය කීහ. එය විසඳීමෙහි යම්හෙයකින් සැපයට දුකත්, දුකට සැපයත් විරුද්ධ ද, එබැවින් වේදනා දෙකෙහි නොගැළපෙන හා ගැළපෙන තත්ත්වයන් කියන ලදී. උපේක්ෂාව වනාහි අන්ධකාරය අප්‍රකටය. දැක්වීමට දුෂ්කරය. අවිද්‍යාව හා සමානය. අවිද්‍යාවත් එබඳුමය. එබැවින් මෙහි සභාග - ප්‍රතිභාගය කියන ලදී. 'යත්තකෙසු පන ඨානෙසු අවිජජා තමං කරොති, තත්තකෙසු විජජා තමං විනොදෙති' යන මෙහි විසභාග ප්‍රතිභාගය කියන ලදී. **විජජාය ඛො ආවුසො** මෙහි මේ ධර්ම දෙදෙනම අනාශ්‍රවයෝය. ලෝකෝත්තර යයි සභාග ප්‍රතිභාගයම කියන ලදී. **විමුතතියා ඛො ආවුසො** මෙහි අනාශ්‍රව අර්ථයෙන් ද ලෝකෝත්තර අර්ථයෙන් ද, අව්‍යාකත අර්ථයෙන් ද, සභාග ප්‍රතිභාගය කියන ලදී.

අවවසරා යනු ප්‍රශ්නය ඉක්මවා ගියේ යන අර්ථයි. **නාසකඛි පඤ්හානං පරියනතං ග හෙතුං** ප්‍රශ්නයන්ගේ පරිච්ඡේදයක් ප්‍රමාණයක්

ගන්නට නො හැකි වෙයි. අප්‍රතිභාග ධර්මයාගේ ප්‍රතිභාගය විචාළේය. නිර්වාණය නම් අප්‍රතිභාගය, නිල් පාටය කහ පාටය යනුවෙන් කිසි ධර්මයක් සමග සමානකොට දක්වන්නට නො හැක. එය තෙපි මේ අදහසින් විචාරයි යන අර්ථයි.

මෙතෙකින් මේ උපාසක තෙම යම්සේ හත්වැනි ගෙහි සලාක පිණ්ඩපාතය සඳහා ගිය භික්ෂුව ගෙවල් හතක් ඉක්මවා අටවෙනි ගෙදර සිටියේ ගෙවල් හතම වැරදුනු බව දැන නොගත්තේ ද, එපරිද්දෙන් අප්‍රතිභාග ධර්මයාගේ ප්‍රතිභාගය විචාරන්නේ සියලුම ප්‍රතිභාග ප්‍රශ්න සතෙහි වැරදුනේ යයි දතයුතු. නිබ්බාණොගධ නිවනට ඇතුළත් වූයේ නිවනට පිවිසියේ නිබ්බාන පරායණ නිර්වාණය උතුම්ගතිය වූයේ එයින් මත්තෙහි නො යයි යන අර්ථයි. නිර්වාණය අවසාන වූයේ මොහුටය යන තේරුමින් නිබ්බාන පරියොසාන නම්.

පණ්ඩිතා නුවණින් යුක්ත වූ, අටළොස් ධාතුවෙහි දක්ෂ වූ, දොළොස් ආයතනයෙහි දක්ෂ වූ පටිච්ච සමුත්පාදයෙහි දක්ෂ වූ, ස්ථානා ස්ථානයෙහි දක්ෂ වූ, මහා පඤ්ඤා මහත් අර්ථයන් මහත් ධර්මයන් මහත් නිරුක්තීන්, මහත් වූ ප්‍රතිභානයන් පරිග්‍රහණයෙන් සමර්ථ වූ ප්‍රඥාවෙන් යුක්ත වූ යථා තං ධම්ම දිනනාය ධම්මදිනනා භික්ෂුණිය විසින් යමක් පවසන ලද්දේ ද, මමත් එසේම ප්‍රකාශ කරන්නෙමි. තව ද මෙතෙකින් මේ සූත්‍රාන්තය ශ්‍රාවක භාෂිතයක් නොව, ජින භාෂිතයක්ම විය. යම්සේ රාජකාරියෙහි නියුක්ත වූවන් විසින් ලියන ලද සන්නස රාජ මුද්‍රාවෙන් ලස් නොකරන ලද්දේ ද, ඒ තාක් එය රාජකීය සන්නසක් නොවේ. එහෙත් රාජ මුද්‍රාව තැබූ කල්හි රාජකීය සන්නසක් වේද, එපරිද්දෙන්ම අහමපි තං එවමෙව ව්‍යාකරෙය්‍යං යන මේ ජින වචන මුද්‍රාවෙන් ලස් කළ බැවින් මේ සූත්‍රාන්තය එළවා කියන ලද වචනයෙන් ජින භාෂිතයෙක්ම වන්නේ ය. සෙස්ස සියලු තන්හි ප්‍රකට අර්ථ ඇත්තේ ය.

චුල්ල වේදල්ල සූත්‍ර වර්ණනාව නිමියේය.

1-5-5

එවමෙමසුතං යනු චුල්ල ධම්ම සමාදාන සූත්‍රයයි. එහි **ධම්මසමාදානා** යනු ධර්මයයි ගන්නා ලද ග්‍රහණයෝ ලබ්ධි **පච්චුප්පන්නාසුඛං** වර්තමානයෙහි සුව වූ, රැස්කරන අවධියේ සුව වූ, සුවසේ පුරන්නට හැකි, **ආයතිං දුක්ඛ විපාකං** විපාක දෙන කාලයෙහි දුක් වූ දුක් විපාක වූ, මේ ක්‍රමයෙන් සියලු පදයන්හි අර්ථ දතයුතු.

නත්ථි කාමෙසු දොසො වස්තු කාමයන්හි ද ක්ලේශ කාමයන්හි ද දොසක් නැති. **පාතව්‍යතං ආපජ්ජතති** ඔව්හු වස්තුකාම ක්ලේශ කාමයෙන් පියයුතු බවට කැමති සේ වැළඳිය යුතු බවට පැමිණෙත් යන අර්ථයි. මොලි බඳාහි ඔටුන්න මෙන් උඩට බඳින ලද කේශ කලාප ඇති තාපස පරිබ්‍රාජිකාවන් සමග **එවමාහංසු** මෙසේ කියත්. **පරිඤ්ඤං පඤ්ඤාපෙනති** ප්‍රහාණය ඉක්මවීම පනවති.

මාලුවා - සිපාටිකා දික් සටහන් ඇති මාලුවා කරලක් එලෙය්‍ය අව්වෙන් වියලී පැලෙන්නේ ය. **සාලමූලෙ** සල්රුක සමීපයෙහි, **සනතාසං ආපජ්ජෙය්‍ය** යනු කුමක් හෙයින් පැමිණේ ද යත්, විමානය නැසෙන බියෙනි. රුක්මුල වැටුණු මාලුවා ඇටයෙන් වැලක් පැළ වී රුකට නගී. මහත් වූ ද බොහෝ වූ ද කොල ඇත්තේ කොබෝලීල කොල වැනි කොලවලින් යුක්ත වූයේ වෙයි. අනතුරුව ඒ ගස මුල පටන් බඳිමින් සියලු වෙළෙප් වසා මහත් වූ බරක් උපදවයි. සුළං හමන විට හෝ වැසි වසිනවිට යටට බර උපදවා ඒ ගසේ අතු බිඳී බිමට වැටේ. ඉක්බිතිව ඒ ගසෙහි පිහිටි විමන බිඳෙයි. වැනසෙයි. මෙසේ දේවතා විමානය වැනසේය යන බියෙන් තැති ගැනීමට පත්වෙයි.

ආරාම දෙවතා ඒ ඒ තැන පුෂ්පාරාම, ඵලාරාමයන්ට අධිපති දේවතාවෝ **වන දෙවතා** අන්ධවන සුභග වනයන්ට අධිගෘහිත දේවතාවෝ **රුක්ඛ දෙවතා** පූජ්‍යත්වයෙන් සළකනු ලබන නළෙරු පුච්මන්ද ආදී වූ වෘක්ෂයන්හි අධිපතිව වසන දේවතාවෝ **ඔසධී තිණ වනසපතීසූ** අරළු නෙල්ලි ආදී බෙහෙත් වර්ගයන්හි ද, තල් පොල් ආදී ගස්වල ද වනදෙටුව වනස්පතී වෘක්ෂයන්හි වසන දේවතාවෝ ද, **වන කම්මිකා** වනයෙහි

සී සෑම, ගොයම් කිරීම, දර ගෙන ඒම, ගෙරින් රැකීම ආදී කටයුතු කරමින් හැසිරෙන මිනිස්සු උදුභෙයුං කන්නාහුය. **විලම්බිනී** යනු සුළඟින් පහල තැන්හි ක්‍රීඩා කරන්නහුගේ මෙන් එල්බෙන්නී,

සුඛෝ ඉමිසසා යනු මෙබඳු වූ මාලුවා වැලේ ස්පර්ශය ද, සුවඳ ද මාගේ දරුවන්ට අවන් මඩලක් වන්නේ ය. ක්‍රීඩා භූමියක් වන්නේ ය. මා විසින් දෙවෙනි විමනක් ලදැයි හටගත් සතුටින් යුතුව මෙසේ කීය.

විටපිං කරෙය්‍ය අතු උඩට වටේට කුඩයක් මෙන් සිටින්නේ ය. **ඔසනං ජනෙය්‍ය** යටට යන බව උපදවන්නේ ය. උඩට නැඟී මුළඟස හාත්පසින් වෙලා යළි යටට බස්නේ පොළව ගන්නේ ය. **පදා ලෙය්‍ය** මෙසේ යටට යන බව උපදවා, එතැන් පටන් මුල දක්වා බැසගත් අතුවලින් උඩට නගිමින් සියලු අතු වෙළමින් මුදුනට පැමිණ, නැවත ඒ ක්‍රමයෙන් ම බසී ද නගී ද, සියලු රුක වසා සියලු අතු යට කොට තමන් මතුයෙහි සිට සුළං හමන කල්හි වැසි වසින කල්හි පලන්නේ ය. බිඳින්නේ ය. කණු පමණක්ම සිටින්නේ ය.

එහි යම් ශාඛාවක විමානයක් වේද, ඒ අතු බිඳෙන කල්හි ඒ ඒ තැනම බිඳී. සියලු අතු බිඳුණු කල්හි මුළු ගසම බිඳෙයි. රුකෙහි තිබූ විමානය වනාහි යම්තාක් ගසේ මුල පමණක් ඉතිරි වේද, ඒ තාක් විමානය පවතී. යම්හෙයකින් මේ විමන අත්තක පැවතියේ ද, සියලු අතු බිඳෙන කල්හි විමානය ද බිඳුනේ ය. දෙවියා දරුවන් ද ගෙන කණුවෙහි සිට හඬන්ට පටන් ගත්තේ ය.

තිබබරාග ජාතිකෝ බහුල වූ රාග ස්වභාව ඇති **රාගජං දුකඛං දොමනසසං පටිසංවෙදෙති** තියුණු රාග ස්වභාව ඇති බැවින් දුටු දුටු අරමුණුවල නිමිති ගනී. ආචාර්ය උපාධ්‍යායයෝ ඔහුට දඬුවම් නියම කරති. හෙතෙම නිරතුරු දඬුවම් කරන්නේ දුක් දොම්නස් විඳී. ව්‍යතික්‍රමණය නො කෙරෙයි. තියුණු ද්වේෂ ස්වභාව ඇති බැවින් මද පමණකින් කිපෙයි. තරුණ සාමණේරයන් සමග අත පය දිගහරිමින් කථා කරයි. හෙතෙමේ ද දඬුවම් හේතුවෙන් දුක් දොම්නස් විඳී. **න තිබබරාග ජාතිකෝ** යනාදී කියන ලද්දට විරුද්ධ වශයෙන් දතයුතුය.

කුමක් හෙයින් මෙහි කිසිවෙක් තියුණු රාග ස්වභාව ඇත්තේ

වේද, කිසිවෙක් තියුණු රාග ස්වභාව නැත්තේ වේද, කර්ම නියමයෙහි, යමෙකුට කර්මය රැස්කරන වේලේ ලෝභය බලවත් වේද, අලෝභය මද වේද අද්වේෂ, අමෝහයෝ බලවත් වේ ද, ද්වේෂ මෝහයෝ මද වේද, ඔහුගේ මද වූ අලෝභය ලෝභය යටපත් කරන්නට නුපුළුවන් වෙයි. යම් හෙයකින් අද්වේෂ අමෝහ බලවත් වූ විට ද්වේෂ මෝහයන් යටපත් කරන්නට හැකි වෙත්ද, එහෙයින් හෙතෙම ඒ කර්මයෙන් දුන් ප්‍රතිසන්ධි වශයෙන් උපන්නේ ලෝභී වූයේ සැප විඳිනසුලු වූයේ ක්‍රෝධ නොකරන්නේ ප්‍රඥා ඇත්තේ වජ්‍රොපම ඤාණය ඇත්තේ වෙයි.

යමෙකුට කර්මය රැස්කරන වේලේ ලෝභ ද්වේෂ බලවත් වේද, අලෝභ අදෝස මද වේද, හෙතෙම පෙර කීවා සේම, ලෝභී වූයේත් දුෂ්ට වූයේත් වෙයි. යළි ප්‍රඥාවත් වූයේ විදුරුනැණ ඇත්තේ වෙයි. දන්තාභය තෙරුන් මෙනි. යමෙකුට කර්මය රැස්කරන අවදියේ ලෝභ ද්වේෂ මෝහ බලවත් වේද, අනෙක්වා මඳ වෙත් ද, හෙතෙම පෙර කී අයුරින් ම ලෝභී වූයේත්, මද නුවණැත්තේත් වෙයි. සැප විඳිනසුලු වූයේ ක්‍රෝධ නො කරන්නේ වෙයි. එසේම යමෙක් කර්ම රැස් කරන වේලේ ලෝභ, දෝස, මෝහ බලවත් වේ ද, අලෝභාදිය මද වේද, හෙතෙම පෙර කී අයුරින්ම ලෝභ ද වේ. දුෂ්ට ද මෝඩ ද වේ.

යමෙක් වනාහි කර්ම රැස්කරන විට අලෝභ, දෝස, මෝහ බලවත් වේද, ලෝභාදිය මද වේද, හෙතෙම අල්ප වූ ක්ලේශ ඇත්තේ වේ. දිව්‍යාරම්මණයකුදු දැක නිශ්චල වූයේ වෙයි. කිපෙනසුළු වූයේත් මද නුවණ ඇත්තේත් වෙයි. යමෙක් කුසල් රැස්කරන අවදියේ අලෝභ අදෝස අමෝහයෝ බලවත් වේද, සෙස්සෝ මද වෙත් ද ඔහු අලෝභ වූයේත් සැප විඳිනසුළු වූයෙත් වේ. යළි මද නුවණැත්තේය. යමෙකුට කර්ම රැස්කරන වේලේ අලෝභ දෝස අමෝහ බලවත් වේද, සෙස්සෝ මද වේද හෙතෙම අලෝභ වූයේත් නුවණැත්තේත් වෙයි. දුෂ්ට වූයේ කිපෙනසුලු වූයේ වෙයි. යමෙකුට කර්ම රැස්කරන වේලේ අලෝභ අදෝස අමෝහ බලවත් වේද ලෝභාදිය මද වේද හෙතෙම මහා සංඝරක්ඛිත තෙරුන් මෙන් ලෝභ නැති වූයේ, අදුෂ්ට වූයේ නුවණැති වූයේත් වෙයි. සෙස්ස ප්‍රකට අරුත් ඇත්තේය.

චූළ ධම්ම සමාදාන සූත්‍ර වර්ණනාව නිමියේය.

1-5-6

එවමෙමසුතං මහා ධම්ම සමාදාන සූත්‍රයයි. **එවං කාමා** මෙසේ ආශා ඇති **එවං ඡන්දා** මෙසේ අදහස් ඇති. **එවං අධිපපායා** මෙබඳු ලබ්ධි ඇති. **තත්‍ර** ඒ අනිෂ්ටයන් මැඩීමෙහි ද, ඉෂ්ටයන් පිරිහීමෙහි ද,

භගවංමූලකා භාග්‍යවතුන් මුල්වූයේ මොවුන්ටය යන තේරුමෙන් 'භගවං මූලකා' යනු කියන ලදී. ස්වාමීනි, මේ ධර්මයෝ අපට කස්සප සම්මා සම්බුදුන් විසින් උපදවන ලදී. ඒ සම්බුදුන් පිරිනිවි කල්හි එක් බුද්ධාන්තරයක් වෙනත් මහණෙක් හෝ බමුණෙක් මේ ධර්ම උපදවන්නට සමත් වූයේ නැත. යළි භාග්‍යවතුන් වහන්සේ විසින් අපට මේ ධර්ම උපදවන ලදී. භාග්‍යවතුන් නිසාම අපි මේ ධර්මයන් දැන ගන්නෙමු. පිළිපදින්නෙමු. මෙසේ අපේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. **භගවං නෙතතිකා** භාග්‍යවතුන් වහන්සේම ධර්මයන්ට විනේතෘය. නායකය. අනුනෙතං අනුනායකයහ. යථා ස්වභාවයෙන් මේ ධර්ම වෙන වෙනම නම් ගෙන දක්වන නිසාම ධර්මය භවතුන් නේතෘ කොට ඇත්තාහු වෙති. **භගවං පටිසරණං** චාතුර්භූමක ධර්මයෝ සර්වඥතා ඥානයෙන් මිහි කිරීම් බවට පැමිණෙන්නාහු භාග්‍යවතුන් කෙරෙහිම රැස්වෙත්. එහෙයින්ම භාග්‍යවතුන් පිළිසරණ කොට ඇත්තාහු වෙති. **පටිසරනති** බැසගනිත්. රැස්වෙත්. තව ද මහ බෝමැඩ වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ වෙත ප්‍රතිවේධ වශයෙන් ස්පර්ශය පැමිණෙයි. භාග්‍යවතුන් වහන්ස, 'මම කිනම්ද,' ඔබ 'ස්පර්ශ' කිරීම් අර්ථයෙන් 'ඵස්ස' නම්. වෙදනා-සඤ්ඤා-සංඛාර-විඤ්ඤාණ යන මොහු පැමිණෙති. භාග්‍යවතුන් වහන්ස මම කිනම්ද, ඔබ විජානන අර්ථයේ 'විඤ්ඤාණ' නම් වෙයි. මෙසේ චාතුර්භූමක ධර්මයන්ට යථා පරිද්දෙන්, වෙන වෙනම නම් ගන්නා වූ, භග්‍යවතුන් වහන්සේ ධර්මයන් රැස්කෙරෙන අර්ථයෙන් ද, භාග්‍යවතුන් පිළිසරණ කොට ඇත්තාහ. **භගවනතං යෙව අධිභාතූ** භාග්‍යවතුන් වහන්සේටම මේ වචනයන්හි අරුත් වැටහේවා. භාග්‍යවතුන් වහන්සේ අපට කියා දේවා.

සෙවිතබෙබ ඇසුරු කටයුතු ධර්මයන්, **භජිතබෙබ** එළඹිය යුතු ධර්මයන්, **යථා තං අවිද්දසුනෝ** අපණ්ඩිත වූ බාල වූ අන්ධ පෘථග්ජනයකුට

යම් සේ, යථා තං විඳසසුනෝ නුවණැති ප්‍රඥාව ඇති පණ්ඩිතයකුට යම් සේද එසේ, අත්ථි භිකඛවෙ ධම්ම සමාදානං පළමු සූත්‍රයෙහි දක්වන ලද පරිද්දෙන් මාතෘකාව තබන ලදී. මෙහි වනාහි ශාස්තෘන් වහන්සේ ගේ ධර්ම රසය වූ පරිද්දෙන් ම මාතෘකාව තබන ලදී. එහි ධම්ම සමාදානං යනු පාණාතිපාද ආදී ධර්මයන්ගේ ගැනීමයි. අවිජජාගතෝ අවිද්‍යාවෙන් සමන්විත වූයේ විජජාගතෝ විද්‍යාවෙන් සමන්විත වූයේ ප්‍රඥාවත් වූයේ.

සභාපි දුකෙඛන යන මෙහි මිථ්‍යාචාරය, අභිධ්‍යාව, මිථ්‍යා දෘෂ්ටිය යන මේ තිදෙන වනාහී පූර්ව සිතිවිල්ලේ ද, අපර සිතිවිල්ලේ ද යන චේතනාවන් දෙක්හිම, දුක්වේදනා ඇත්තාහු වෙති. නැවත සන්නිට්ඨාපන චේතනාව සුව සහගත වූයේ, උපේක්ෂා සහගත වූයේ හෝ වෙයි. සෙසු ප්‍රාණඝාත ආදී සත් දෙන වූ චේතනාවන්ම දුක් වේදනා වේ. **සභාපි දුකෙඛා - සභාපි දොමනසෙසන** යන්න මේ සඳහා කියන ලදී. මෙහි දෝමනස්සයම දුක යයි දතයුතු. සෙවීමට හෝ පැමිණෙන්නහුට පූර්වභාග අපරභාග, කායික දුක් ලැබීමයි.

සභාපි සුඛෙන යනු මෙහි ප්‍රාණඝාත, ඵරුෂ වචන, ව්‍යාපාදය යන මේ තිදෙන පූර්වචේතනා අපර චේතනා යන චේතනා දෙකේදීම සැප වේදනා ඇත්තාහු වෙති. සන්නිට්ඨාපක චේතනාව වනාහි දුක් සහගත වූයේය. සෙසු සත්දෙන තුන් චේතනාවන්ගේම වශයෙන් සැප වේදනා ඇත්තාහු වෙති. **සභාපි සොමනසෙසන** මෙහි සොම්නසම සැප යයි දතයුතුය. බ්‍රහ්ම ස්පර්ශයෙන් යුක්ත වූවහුගේ පූර්වභාග අපරභාගයන්හි කායික සුවය වටී.

තුන්වන ධර්ම සමාදානයෙහි මෙලොව කිසිවෙක් ධීවරයෙක් හෝ මුව වැද්දෙක් හෝ වෙයි. ප්‍රාණඝාතය නිසාම ජීවිකාව කරයි. ගරුතැනෙහි සිටි ශ්‍රමණයෙක් අකමැති වූම ඔහුට ප්‍රාණඝාතයේ ආදීනව ද ප්‍රාණඝාතයෙන් වෙන්වීමේ ආනිසංස ද කියා සිල් සමාදන් කරවයි. හෙතෙම සිල් ගන්නේම දුකින් දොම්නසින් සිල් ගනියි. පසුව කීපදිනක් ඉක්මවීමෙන් රකින්නට නො හැකි වෙයි. ඔහුගේ පූර්වාපර චේතනා දුක් සහිතම වේ. සන්නිට්ඨාපක චේතනාව සුව සහගත වේ. නැතිනම් උපේක්ෂා සහගත වේ. මෙසේ සියලු තන්හි අරුත් දතයුතුයි. පූර්වභාග - අපරභාග චේතනාවන් සඳහා මෙය කියන ලදී. **සභාපි දුකෙඛන සභාපි දොමනසෙසන** යනු දොම්නසම දුකයයි දතයුතු.

සතරවෙනි ධර්ම සමාදානයෙහි දශ පදයන්හිම පූර්වභාග අපරභාග සන්නිට්ඨාපක චේතනා තිදෙනම සුව සහගත වූවෝ වෙති. **සභාපි සුඛෙන සභාපි සොමනසෙසන** යනු එහෙයින් කියන ලදී. මෙහි සොම්නසම සැප යයි කියන ලදැයි දතයුතු. **තිත්ත කාලාපූ තිත්ත රස ඇති ලබු විසෙන සංසටෙථා** හලාහල විෂ සමග කලවම් වූයේ **නවජා දෙසසති** කැමති නො වන්නේ ය. **සතුටු** නො කරන්නේ ය. **නිගචජසි** පැමිණෙන්නෙහි. **අපපටිසංකා පිවෙය්‍යා** යනු ප්‍රත්‍යවේක්ෂා නො කොට බොන්නේ නම්,

ආපානීයකංසො පානය කළයුතු මිහිරි පානය පුරවන ලද බඳුන. **වණණ සමපනෙනා** පානක වර්ණාදියෙන් යුක්ත වූ ලෝහ බඳුන - නැවත පුරවන ලද ද්‍රව්‍යයන්ගෙන් ලෝ තලිය මෙසේ කියයි. **ජාදෙසසති** යම් හෙයකින් ඒ හලාහල විෂ බඳුන, පුරවන ලද්දහුගේම රසය දෙන්නේ ද, එහෙයින් කියන ලදී. **ජාදෙසසති** යන්න.

පූති මුතතං යනු මුත්‍රමයි. යම්සේ මිනිසත් බව රන්වන් වූයේ නමුත්, පූතිකාය මැයි කියයි. එදවසම හටගත්තා වූ කීඳි වැලක් පූතිලතාවමයි කියයි. එපරිද්දෙන් එකෙණෙහිම ගත්තා වූ තරුණ වූ මුත්‍රා ද 'පූතිමුත්ත' මැයි. **නානා හෙසජෙජහි** යනු අරළු නෙල්ලි ආදී ඖෂධයන්ගෙන් සූචි අසසා සුව ඇත්තේ වේ. නිරෝගි වූයේ රන්වන් වූයේ, සුවපත් වූයේ වන්නේ ය.

දධි ච මධු පිරිසිදු වූ දී ද, මිහිරි වූ මීපැණි ද **එකජඣං සංසටයිං** එකට අනන ලද්දේ කලවම් කරන ලද්දේ අලලන ලද්දේ, **තසස තං** ඒ මිහිරි වූ බෙහෙත බොන්නා වූ අයට එය රුචි වන්නේ ය. මෙය භගන්දර නම් රෝගයෙන් යම් ලේ ගැලීමක් වේද එයට බෙහෙත් නොවේ. ආහාරය දැඩිකොට මාර්ගය නො වළඳනා කෙරෙයි. නැවත පිත කිපීමෙන් ඇති වූ යම් ලේ යාමක් වේද, ඊට මේ බෙහෙත ශීතල වීම අවසන් කොට ඇත්තේම වේ.

විදෙධ යනු වළාකුළු පහවීමෙන් දුරු වූ යන අර්ථයි. විගතවළාහකෙ පහ වූ වැස්ස ඇති. දෙවෙ අහසෙහි **ආකාසගතං තමගතං** අහසෙහි වූ අඳුරු ගතිය. **පුථු සමණ බ්‍රාහමණ පරපපවාදෙ** බොහෝ වූ මහණ බමුණු සංඛ්‍යාත අනුන්ගේ වාදයෙහි, **අභිවිභවව** වෙසෙසින් නසා **භාස තෙ ච**

තපතෙ ච, විරොචති සරත් කාලයේ මධ්‍යාහ්නයේ හිරු මෙන් ආලෝකය පතුරුවයි. දිලිසෙයි. බබළයි.

මේ සූත්‍රය වනාහි දෙවියන්ට ඉතාම ප්‍රිය ය. මනාප ය. එහි මෙය පුවතකි. මෙසේ අසනු ලැබේ. දකුණු දෙස හස්ති හෝග ජනපදයේ පංගුර නම් විහාරයක් ඇත. ඒ වෙහෙර දාන ශාලාව ඉදිරිපිට පංගුර (පඟුරු) ගසෙහි අධිගෘහිත දේවතාවා රාත්‍රි කාලයෙහි එක් තරුණ භික්ෂුවක් පද ප්‍රශ්න වශයෙන් මේ සූත්‍රය පිරිවහත්‍ර අසා (කියවනු අසා) සාධුකාර දුනි. තරුණ භික්ෂුව මේ කවුද කියා ඇසීය. වහන්ස, මම මේ රුකට අධිපති දේවතාවා වෙමි. දේවතාවෙනි, කුමක් නිසා පැහැදුනේ ද, ශබ්දයෙහි ද, සූත්‍රයෙහි ද ස්වාමීනි ශබ්දය නම් යම්කිසිවකුට හිමි දෙයකි. සූත්‍රයෙහි පැහැදුනෙමි. ශාස්තෘන් වහන්සේ දෙව්රමඳී වදාළ දිනයෙහි ද, අද ද, එක අකුරකුදු වෙනසක් නැත. දේවතාවෙනි, තෙපි ශාස්තෘන් වදාළ දිනයෙහි ඇසුවෙහිද, එසේය ස්වාමීනි. කොහි සිටද, ස්වාමීනි දෙව්රමට ගියමේ. එහෙත් මහේශාක්‍ය දේවතාවන් පැමිණෙන කල්හි මට ඉඩ නැතිව අවකාශ නො ලබා මෙහි සිට ඇසීමි. මෙහි සිටියවුන්ට ශාස්තෘන්ගේ ශබ්දය අසන්නට හැකි ද, වහන්ස, ඔබ නැවත මගේ හඬ අසවුද, එසේය දේවතාවෙනි, ස්වාමීනි, දකුණු කන ළඟ ඉඳගෙන කියන කලක් මෙන් ඇසීමි. කෙසේද දේවතාවෙනි, ශාස්තෘන් වහන්සේගේ රූපය දැක්කෙහිද, ශාස්තෘන් වහන්සේ මාව ම බලන සේකැයි සිතමින් සිටින්නට නො හැකි වීමි. දේවතාවෙනි, අධිගමයක් උපදවන්නට හැකි වූවෙහි ද, දේවතා තෙමේ අතුරුදන් වූහ. එදින මේ දේවතාවා සෝවාන් පෙලෙහි පිහිටියේල. මෙසේ මේ සූත්‍රය දෙවියන්ට ප්‍රියය. මනාපය.

මහා ධම්ම සමාදාන සූත්‍ර වර්ණනාව
නිමියේය.

1-5-7

එවමෙමසුතං වීමංසක සූත්‍රයයි. එහි වීමංසකෙන යනු වීමංසකයෝ තිදෙනෙක් වෙති. අර්ථ වීමංසක, සංස්කාර වීමංසක, ශාස්තෘ වීමංසක යනුවෙනි. ඔවුනතුරෙන් පණ්ඩිතා භාවුසෝ මනුසසා වීමංසකා යන මෙහි අර්ථ වීමංසක දැක්වෙයි. යතෝ ඛෝ ආනන්ද භිකඛු ධාතු කුසලෝ ච හොති ආයතන කුසලෝ ච හොති, එතතාවතා ඛෝ ආනන්ද පණ්ඩිතෝ භිකඛු වීමංසකෝ ති අලං වචනාය යන මෙහි සංස්කාර වීමංසක ආයේය. මේ සූත්‍රයෙහි ශාස්තෘ වීමංසක අදහස් කර ඇත්තේ ය. චෙතෝ පරියාය චිත්ත පරිච්ඡේදය. සමනෙනසනා සෙවීම හාත්පසින් සෙවීම, පරීක්ෂා කිරීම, ඉති විඤඤාණය මෙසේ දැන ගැනීම පිණිස, දවීසු ධමෙමසු තථාගතෝ සමනෙනසිතඛෙබා මෙහි කල්‍යාණ මිත්‍රයාගේ උපනිශ්‍රය දක්වන සේක. මේ කල්‍යාණ මිත්‍ර සේවනය ආශ්‍රය නම් මහත්ය. ඔහුගේ මහත් බව මෙසේ දතයුතු. එක් අවස්ථාවෙක ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ බ්‍රහ්ම චරියාවෙන් භාගයක් තමන්ගේ ආනුභාවයෙන් වෙයි. භාගයක් කල්‍යාණ මිත්‍ර ආනුභාවයෙන් වෙත්යයි සිතා තමන්ගේ නුවණින් නිශ්චය කරන්නට නො හැකිව භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ විචාළේය.

ස්වාමීනි, යම් මේ කල්‍යාණ මිත්‍රයන් ඇති බවක් වේද කල්‍යාණ සහායයන් ඇති බවක් වේද, කල්‍යාණ මිත්‍රයන් කෙරෙහි නැමුණු බවක් වේද, මෙය මාර්ග බ්‍රහ්මචරියාවේ අර්ධයකැයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

ආනන්ද එසේ නො කියව, ආනන්ද එසේ නොකියව, ආනන්ද යම් මේ කල්‍යාණ මිත්‍රයන් ඇති බවක්, කල්‍යාණ සහායයන් ඇති බවක්, කල්‍යාණ මිත්‍රයන් කෙරෙහි නැමුණු බවක් වේද මෙය සියලුම මාර්ග බ්‍රහ්මචරියාව වෙයි. ආනන්ද කල්‍යාණ මිත්‍රයන් ඇති කල්‍යාණ සහායයන් ඇති, කල්‍යාණ මිත්‍රයන් කෙරෙහි නැමුණු මහණ හට ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන්නේ ය. ආර්ය අෂ්ටාංගික මාර්ගය බහුල කරන්නේ ය යන යමක් ඇද්ද, මෙය කැමති විය යුතුයි. ආනන්ද, මහණතෙම කල්‍යාණ මිත්‍රයන් ඇත්තේ ආර්ය අෂ්ටාංගික මාර්ගය කෙසේ වඩන්නේ ද, ආර්ය අෂ්ටාංගික මාර්ගය කෙසේ බහුල කරන්නේද, ආනන්ද මේ ශාසනයේ

භික්ෂුව සම්‍යක් දෘෂ්ටිය වඩයි. -පෙ- විවේකය ඇසුරු කළ සම්‍යක් සමාධිය වඩයි. -පෙ- ආනන්ද මෙසේ භික්ෂුව කලණ මිතුරන් ඇත්තේ -පෙ- ආනන්ද යම් කලණ මිතුරන් ඇති බවත්, කලණ යහළුවන් ඇති බවත්, කැ ඹ මිතුරන් කෙරෙහි නැමුණු බවත්, වේද යමසේ සියලු බඹසර වේද, මේ කරුණ මතු දක්වන ක්‍රමයෙන් දතයුතු. ආනන්ද කලණ මිතුරා මා කරා පැමිණ ඉපදීම ස්වභාවකොට ඇති සත්ත්වයෝ ජාතියෙන් මිදෙති. ජරාව ස්වභාවකොට ඇති සත්ත්වයෝ -පෙ- ශෝක පරිදේව දුක් දොම්නස් උපායාස, ස්වභාව කොට ඇති සත්ත්වයෝ ශෝක පරිදේව දුක් දෝමනස්සයන්ගෙන් මිදේ.

භික්ෂූන්ට බාහිරංග සමාපත්තිය වදාරමින් මෙසේ වදාළහ. 'මහණෙනි, යම් කරුණක් මෙසේ මහත් වූ අර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ කල්‍යාණ මිත්‍රයන් ඇති බව යම්සේද, එබඳු වූ බාහිර අංගය කොට අන් එක ද කරුණක් එම නො දක්මි. මහණෙනි, කල්‍යාණ මිත්‍රයන් ඇති බව මහත් අර්ථය පිණිස පවත්නේම ය. මහා චුන්ද තෙරුන්ට කෙලෙස් ලිහා දමන පිළිවෙත වදාරන්නාහූ අන්‍යයෝ පාපමිත්‍රයන් ඇත්තෝ වෙති. අපි මෙහි දී කල්‍යාණ මිත්‍රයන් ඇත්තෝ වෙමු යි සැලකිය යුතුය.

මේඝිය තෙරුන්ට විමුක්තිය මුහුකුරුවන ධර්මයන් වදාරන්නාහූ මේඝිය, මුහුකුරා නොගිය චිත්ත විමුත්තිහුගේ මේරීම පිණිස ධර්මයෝ පස්දෙනෙක් හේතු වේ. කවර පස් දෙනෙක් ද මේ ශාසනයෙහි භික්ෂුව කල්‍යාණ මිත්‍රයන් ඇත්තේ වෙයි. කල්‍යාණමිත්‍ර ආශ්‍රයම විශේෂයි.

පිය පුත් රාහුල තෙරුන්ට නිතර අවවාද දෙන සේක්,

කල්‍යාණ මිත්‍රයන් සේවනය කරව, ජනාකීර්ණ නොවූ ජනයාගේ සෝෂා රහිත වූ, වනයෙහි ඉතා දුර වූ, සෙනසුන සේවනය කරව, භෝජනයෙහි පමණ දැනගනුව.

මිත්තෙ භජසසු කල්‍යාණෙ, පන්තඤ්ඤව සයනාසනං
විවිත්තං අප්ප නිගෙඝාසං - මත්තඤ්ඤූ හොහි භොජනෙ

චීවරයෙහි ද පිණ්ඩපාතයෙහි ද ගිලාන ප්‍රත්‍යයෙහි ද සේනාසනයෙහිද යන සිවුපසයෙහි තණ්හාව නො කරව. මේ ලෝකයට ප්‍රතිසන්ධි වශයෙන් නැවත නො පැමිණෙව.

කල්‍යාණ මිත්‍රයන්ගේ උපනිශ්‍රයම සියල්ලට පෙර වදාළහ.

මෙසේ කල්‍යාණ මිත්‍රයන්ගේ ආශ්‍රය නම් මහත් වේ. මෙහිද එය දක්වන භාග්‍යවතුන් වහන්සේ **දවීසු ධමෙමසු තථාගතො සමනෙතසි** තබෙබා ආදී වශයෙන් දේශනාව ආරම්භ කළ සේක. නුවණැති භික්ෂුව ධර්ම දෙකක් සඳහා තථාගතයන් සොයාවා පරීක්ෂා කෙරේවා.

භාග්‍යවතුන් වහන්සේ මේ මගින්, මෙතෙම මහා ජාති ඇත්තෙකැයි හෝ මනා රූප ඇති දැකීමට සුදුස්සෙකැයි හෝ ප්‍රසිද්ධ වූවෙක අභිලක්ෂිතයෙකැයි හෝ මොහු නිසා මම චීවරාදී සිව්පසය ලබන්නෙමැයි හෝ මෙසේ සිතා ඇසුරු කිරීමෙන් වැඩක් නැත. මෙතෙම මට ශාස්තෘවැ ශාස්තෘ කෘත්‍යය සිදු කරන්නට පොහොසත්දැයි හෙතෙම මා සේවනය කෙරේවයි සිංහනාද කළ සේක. මේ සූත්‍රය බුද්ධ සිංහනාද වීල.

දැන් ඒ ධර්මයන් දෙදෙනා දක්වන්නේ **චකඛු සොත විඤ්ඤෙය්‍යුං** යන්න වදාළහ. එහි ශාස්තෘන්ගේ කායික සමාචාර්ය විමසන්නහුගේ චක්ෂුර් විඥානයෙන් දතයුතු ධර්මය නම් වාචසික සමාචාරය. ශ්‍රොත විඤ්ඤාණයන්ගෙන් දතයුතු ධර්මය නම්. දැන් ඒ ධර්මය විමසිය යුතු ආකාරය දක්වන සේක්, **යෙ සංකිලිටඨා** යනාදිය වදාළහ. එහි සංකිලිටඨා කෙලෙසුන්ගෙන් යුක්ත වූවාහු ඔව්හූ චක්ඛු සෝත විඤ්ඤාණයන්ගෙන් දතයුතු නොවේ. යම්සේ දිය සැලෙන කල්හි හෝ බුබුළු නැගෙන කල්හි ඇතුළත මත්ස්‍යයෝ ඇතැයි හැඟේ ද, එපරිද්දෙන් ප්‍රාණඝාතාදිය කරන්නහුගේ, බොරු කියන්නහුගේ, කාය වාග් සමාචාරයක් ඇත්තේද, දැක්කේද ඇසුයේද, එය උපදවන සිත කිලිටු වේ යයි දනී. කිලුටු සිත් ඇත්තහුගේ කාය වාක් සමාචාරයෝ ද කිලුටු වූවාහුමය. **නතෙ තථාගතසස සංවිජජනති** ඒ සමාචාරයෝ තථාගතයන්ගේ නැත. නො ලබති. මෙසේ දැනගනී යන අර්ථයි. නැතිහෙයින් එය නොලබති. මෙසේ දැනගනී යන අර්ථයි.

චීවරෙ පිණඩපාතෙච - පචචයෙ සයනාසනෙ
එතෙසු තණහා මාකාසි - මා ලොකං පුනරාගමා

නැති හෙයින් ම නො ලබති. ප්‍රතිච්ඡන්න වූ නිසා නොවේ.

භාග්‍යවතුන් වහන්සේ එක් දවසක් මේ ධර්මයන් කෙරෙහි භික්ෂු සංඝයා පවරමින් මෙසේ වදාළහ. **හන්දදානි භිකඛවෙ ආමන්තයාමි. වො නව මෙ කිඤ්චි ගරහථ කායිකං වා වාචසිකං වා,** මෙසේ කී කල්හි ආයුෂ්මත් සැරියුත් තෙරුන් හුන් අසුනෙන් නැගී සිට සඟල සිවුර ඒකාංශ කොට භාග්‍යවතුන් වහන්සේ යම් දිසාවක වැඩසිටීද, ඒ දිසාවට ඇඳිලි බැඳ වැඳගෙන භාග්‍යවතුන්ට මෙසේ කීහ. ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේගේ කායික හෝ වාචසික හෝ කිසිදු සමාචාරයක් නො ගරහමු. ස්වාමීනි, යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ නූපන් මාර්ගය උපදවන්නේ ය. ජනිත නොකළ මාර්ගය ජනනය කරවන්නේ ය. ප්‍රකාශ නොකළ මාර්ගය ප්‍රකාශ කරන්නේ ය. මාර්ගය විශේෂයෙන් දන්නෝ ය. මාර්ගයෙහි දක්ෂයහ. තව ද ස්වාමීනි, මෙකල මාර්ගය අනුව යන්නා වූද, පසුව යෙදුනා වූද ශ්‍රාවකයෝ වාසය කරති. මෙසේ තථාගතයන්ගේ කාය වාග් සමාචාර පිරිසිදු වූවාහුමය.

උත්තර මානවක තෙමේත් තථාගතයන්ගේ කාය වාග් සමාචාරයේ සිත් නොගන්නා කිසිවක් දක්නෙමි, සත්මසක් මුළුල්ලෙහි ලුහුබැඳ අල්ප මාත්‍රයකුත් නො දැක්කහ. මනුෂ්‍ය වූ හෝ මෙ තෙමේ බුදුබවට පැමිණියහුගේ කාය වාග් ද්වාරයන්හි සිත් නොගන්නා කුමක් දකින්නේද, මාරදෙව් පුත් ද බෝසතුන්ගේ මහාභිනිෂ්ක්‍රමණයේ සිට සයවසක් විමසමින් සිත් නොගන්නා කිසිවක්, යටත්පිරිසෙයින් හිතේ විතර්ක මාත්‍රයකුදු නොදැක්කහ. මාරයා මෙසේ සිතීල. ඉදින් මොහු විතර්ක කළ පමණකුදු, අකුශලයක් දක්නෙමි නම්, ඒ විගසම එහිදීම ඔහුගේ මුදුනට පහර දී යන්නෙමි. හෙතෙම අවුරුදු හයක්ම නො දැක බුදුවීමෙන් පසුව එක් අවුරුද්දක් ලුහුබැඳ කිසි වරදක් විතර්කයක් නො දක්නේ, ආපසු යනවිට වැඳ,

මහාවීර වූ, මහාප්‍රාඥ වූ, ඍද්ධියෙන් ද, යසසින් ද, දිලිසෙන්නා වූ සියලු අකුශල වෛරයන්, පුද්ගල වෛරයන්, දුගති භය ආදිය ඉක්මවා සිටි ඔබවහන්සේ ගේ පා වඳිමි.

මහාවීර මහාපඤ්ඤ - ඉද්ධියා යසසා ජලං
සබ්බ වෙර භයානීත - පාදෙ වන්දා ගොතම

ගාථාව කියා ගියේය.

වීතිමිසසා එක්කලෙක කළු වූයේ, එක් කලෙක සුදු වූයේ යයි ව්‍යතිමිත්‍ර වූ, **වොදානා** පිරිසිදු වූ නිකෙලෙස් වූ, **සංවිජජනනී** පිරිසිදු වූ ධර්මයෝ ඇත. ලැබෙත්. තථාගතයන්ගේ කාය සමාචාරාදිය පිරිසිදු වූහ. එහෙයින් කීහ.

'මහණෙනි, තථාගතයන්ගේ නො රැක්ක යුතු ධර්ම සතරක් වෙති. කවර සතරක්ද, මාගේ මේ කර්මය අනිකකු නො දැකීමයි. තථාගතයෝ කිසියම් දුශ්චරිතයක් නො කරන්නෝ ය. වචී සමාර, මනෝ සමාචාර, මහණෙනි තථාගතයෝ පරිසුද්ධ ආජීව ඇත්තාහ. මාගේ මේ කර්මය කිසිවකු නො දක්වායි තථාගත තෙමේ යම් මිථ්‍යා ජීවයක් දරන්නේ ද රක්නේ ද එබඳු මිථ්‍යාජීවයක් තථාගතයන්ට නැත.'

ඉමං කුසලං මේ ආජීව අෂ්ඨමක සීලයට ශාස්තෘ තෙම පැමිණ බොහෝ කලක් වන්නේ ද, බොහෝ කලක පටන් මෙයින් යුක්ත වූයේ ද, එසේ නැතිනම් පැමිණ මද කලක් ඇත්තේ ද, ඊයේ පෙරේදා හෝ ඊට පළමුදා පැමිණියේ වේද, විමසන අර්ථයි.

එකකු විසින් එකම තැනක බොහෝකල් වසන්නාහු නම් මිථ්‍යාජීව කර්ම කරන ලද්දේ වෙයි. කල් ඉක්මයාමේ දී එය පෙනෙයි. ප්‍රකට වෙයි. හෙතෙම එක්තරා පසල් ගමක හෝ, මුහුදු තීරයට හෝ ගොස් පන්සලක් කරවා ආරණ්‍යයක මෙන් වසයි. මිනිස්සු බුහුමන් උපදවා ඔහුට ප්‍රණීත වූ ප්‍රත්‍යයන් දෙති. ජනපදවාසී භික්ෂූහු ඔහුගේ පිරිවර, පෙරහැර දැක 'ඒකාන්තයෙන් මේ භික්ෂුව ඉතා දැපුනෙකු විය යුතුය. මේ කවරෙක්දැයි විමසන්නාහු අසවල් තැන අසවල් මිථ්‍යාජීවය කොට (වැරදි විදියට ජීවත් වී) පැනගිය පුද්ගලයා යයි දැන, 'මොහු සමග පොහොය කිරීම් ආදී විනය කර්ම කරන්නට නො පුළුවනැයි, භික්ෂූන් රැස්ව දැහැමෙන් සෙමෙන් උක්ඛේපනීය ආදී විනය කර්මයක් කරත්. මෙබඳු වූ පිළිකෙව් කරන්නා වූ ප්‍රතිපත්ති ඇති බව හෝ නැති බව විමසන්නට මෙසේ වදාළහ. **එවං ජානාති** බොහෝ කලක පටන් පැමිණියේ ය. පැමිණීම ද කල් ඇතිව නොවේ යයි දැනගනී. තව ද මෙකල්හි සර්වඥ බවට පැමිණි තථාගතයන් ගේ ආජීව අට්ඨමක සීලය බොහෝකල් සිට පිරිසිදු වන්නේ ද,

බෝසත්ව හැසිරෙන කාලයේ ද, යමෙකුගේ සීලය මෙසේ පිරිසිදු වී ද එනිසා මෙහි පුදුමවිය යුත්තක් නැත්තේ ය.

අතීතයේ ගන්ධාර රට ගන්ධාර රජු ද, විදේහ රජු ද යහළුවෝ වැ කාමයන්හි ආදීනව දැන, රාජ්‍යයන්ට පුතුන්ට භාර දී, ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව, එක්තරා කැලෑබද ගමක පිඬු පිණිස හැසිරෙත්. පිටිසර ප්‍රදේශයේ ලුණු ලැබීම දුෂ්කරය. ඔව්හු ලුණු නැති කැඳ ලැබී එක් ශාලාවෙක හිඳ කැඳ බොති. අතරින් අතර (ඉඳහිට) මිනිස්සු ලුණු කුඩු ගෙනැවිත් දෙති. එක් දවසක් වේදේහ ඍෂි හට කොළයක ඔතා ලුණු කුඩු දුන්නේ ය. වේදේහ ඍෂි එය ගෙන අඩක් ගන්ධාර ඍෂීන් සමීපයේ තබා, අඩක් තමන් සමීපයෙහි තබා ගත්තේය. එයින් මදක් වළඳ ඉතිරි වූ ලුණු සුණු ටික කොළයෙන් ඔතා මෙය නැති නොවේවයි සිතා තණ පඳුරක තැබීය. නැවත එක් දිනක් කැඳ බොන විටකදී සිහිපත් කර බලා ඒ ලුණු ගෙන ගන්ධාර ඍෂීන් වෙත පැමිණ ආචාරීනි මෙයින් මදක් ගත මැනවැයි කීය. වේදේහ ඍෂිය තොප විසින් කොයින් ලදද, එදා වළඳ ඉතිරි ලුණු ටික නො නසීවයි තබන ලදැයි වේදේහ ඍෂි කීය. ගන්ධාර ඍෂි එය ගන්නට අකමැතිව, ලුණු නැති කැඳ බී වේදේහ ඍෂිට මෙසේ කීහ.

හිත්වා ගාම සහස්සානි - පරිපුණ්ණානි සොළස
කොට්ඨාගාරානි ඵීතානි - සන්නිධිං දානි කුබ්බසී

සම්පූර්ණ වූ සොළොස් දහසක් ගම් ද, රන්රුවන් පිරි කොටු ගුල්ද හැරදමා දැන් ලුණු සුණු ටිකක් රැස් කරන්නෙහි.

වේදේහ ඍෂි මෙසේ කීය. නුඹවහන්සේ රාජ්‍යය හැරදමා පැවිදි වී දැන් ලුණු කුඩු ටිකක් රැස්කිරීමෙන් පැවිද්දට නුසුදුසු වූවක් නො කරන්නාහුද, වේදේහ ඍෂිය මා විසින් කුමක් කරන ලදද, එකල්හි ගන්ධාර ඍෂීන්ට මෙසේ කීහ.

හිත්වා ගන්ධාර විසයං - පභූත ධන ධාන්‍යං
පසාසනාතෝ නික්ඛන්තෝ - ඉධදානි පසාසසී

පිරුණා වූ ධනධාන්‍ය ඇති ගන්ධාර දේශය හැරදමා අවවාද අනුශාසනා දානයෙන් නික්මුනේ දැන් මේ වනයෙහි මට කුමක් හෙයින් අවවාද කරන්නේ ද,

ගන්ධාර ඍෂි මෙසේ කීය.

ධම්මං භණාමි භද්දනෙත - අධම්මෝ මෙ න රුචතී
ධම්මං මෙ භණ මානසස - න පාප මුපලිප්පති

නුඹට යහපතක්ම වේවා. බුද්ධාදීන් වර්ණනා කළ ස්වභාවය වූ ප්‍රශස්ත කාරණය මට කියමි. මට අධර්ම නම් වූ ස්වභාව රුචි නො වේ. ධර්මයම කියන්නා වූ මගේ සිතේ පාපයෙක් නො ඇලෙයි. වේදේහ ඍෂි කීය.

යෙන කෙනචි වණ්ණෙන - පරෝ ලබහති රූපපනං
මහත්තීයම්පි වෙ වාචං - න තං භාසෙය්‍ය පණ්ඩිතෝ

දැහැමි වූ ද යම්කිසි කාරණයකින් අනුන් කිපෙනු ඇත. ඉදින් අනුන් කිපෙන්නා වූ අර්ථ රහිත ඒ වචනය පණ්ඩිතයෝ නොකියන්නාහ. ගන්ධාර ඍෂි කීය.

කාමං රූපපතු වා මාවා - භුසංච විකිරිය්‍යතු
ධම්මං මෙ භණමානසස - න පාප මුපලිප්පති

ඒකාන්තයෙන් අයුක්තියක් කරනු ලබන්නෙකුට අවවාද කරනු ලබන්නේ කිපේවා හෝ නො කිපේවා හෝ, බොල් මිටක් මෙන් විසිරේවා හෝ ධර්මය කියන්නා වූ මගේ සිතේ පාපය නො ඇලේ.

මෙසේ ද කියා නැවත යමෙකුට ස්වකීය බුද්ධියක් නැද්ද, ආචාර්යවරුන් ඉදිරියේ නො හික්මේ ද, හෙතෙම වනයෙහි අඳ මීමකු මෙන් හැසිරේ.

නො වෙ අසස සකා බුද්ධි - විනයෝ වා සුසික්ඛිතෝ
වනෙ අන්ධ මහිසොව - චරෙය්‍ය බහුකෝ ජනෝ

ඉදින් ස්වකීය බුද්ධිය හෝ මනාව හික්මුණු ආචාරය විනය නැත්තේ ද එකල්හි හේ වනයෙහි අඳ මීමෙකු මෙන් හැසිරේ.

යසමා ච පනිධෙ කවෙව - ආචාරමහි සුසික්ඛිතා
තසමා විනීත විනයා - චරනති සුසමාහිතා

නැවත යම් හෙයකින් මේ ලෝකයේ ඇතැම් කෙනෙක් මැනවින් හික්මුණාහු වෙති ද, හික්මවන ලද විනය ඇති ඒ නුවණැත්තෝ එකඟ වූ සිත් ඇතිව හැසිරෙත්.

ඉක්බිති වේදේහ තවුස් තෙමේ නොදැන තමා විසින් කරන ලද වරදට ගන්ධාර ඍෂීන් ක්ෂමා කරවාගෙන දෙදෙනම තපස් රැක බඹලොව ගියහ.

මෙසේ තථාගතයන් වහන්සේ බෝධිසත්ත්ව කාලයේ ද බොහෝ ආජීව අට්ඨමක සීලයෙන් පිරිසිදු වීය.

ඤත්තඡඩ්ඩා පනෙතා අයමායසමා භිකඛු යසංපතෙතා මේ ආයුෂ්මත් වූ අපගේ ශාස්තෘ වූ භික්ෂු තෙම දන්නා බවට ප්‍රකට බවට ප්‍රසිද්ධ බවට පැමිණි බැවින් ද, යසසින් යුක්ත බැවින් ද, ඇතැම් ආදීනවයෝ දක්නා ලැබේද, නැතහොත් එසේ නොවන්නේදැයි, විමසනු මැනවයි දක්වන සේක. **න තාව භිකඛවෙ** යම්තාක් භික්ෂුව රාජරාජ මහාමාත්‍යාදීන් කෙරෙහි ප්‍රසිද්ධ බවට හෝ පිරිවර බවට නො පැමිණියෝ ද, ඒ තාක් මාන අතිමාන ආදී ආදීනවයෝ නො දක්නා ලැබෙත්. අතිශයින් උපශාන්ත වූයේ සෝවාන් කෙනෙකු මෙන් ද, සකෘදාගාමී කෙනෙකු මෙන් ද, වාසය කෙරෙයි. ආර්යයෙක් ද, පෘථග්ජනයෙක් ද කියා දැනගැනීමට ද නොහැකි වෙයි.

යතො ච ඛො භිකඛවෙ නැවත යම් සේ මෙම ශාසනයෙහි ඇතැම් මහණෙක් ප්‍රසිද්ධ වූයේ පිරිවර සම්පන්න වූයේ වේද එකල්හි, තියුණු අගකින් යුක්තව ගව සමූහයාට අනින්නා වූ දුෂ්ට ගොනෙකු මෙන් ද, මෘග සමූහයා විනාශකරන දිවියකු මෙන් ද, අනෙක් භික්ෂූන් ඒ ඒ තැන්වල ගෞරව රහිත වූයේ අසමාන පැවතුම් ඇත්තේ, අග පයින් බිම ස්පර්ශ කරමින් ඇවිදින්නේ ය. ඇතැම් කුල පුත්‍රයෙක් යම් යම් පරිද්දෙන් ප්‍රසිද්ධ වූයේ කීර්තිය ඇත්තේ වේද, ඒ ඒ පරිද්දෙන්, පල බරින් බර වූ වී කරල් මෙන් ඉතා මැනවින් පහතට නැමේ. රාජරාජ මහ ඇමතින් වෙත එළඹෙන කල්හි නිදොස් බව සිහි නුවණින් සලකා ශ්‍රමණ සංඥාව එළවා, සිඳුණු අං

ඇති වෘෂභයකු මෙන් ද, සැඩොල් දරුවකු මෙන් ද, නිහතමානී යහපත් පැවතුම් ඇත්තේ, පහන් සිත් ඇතිව භික්ෂු සංඝයාගේ ද දෙවියන් සහිත ලෝකයාගේ ද හිත සුව පිණිස පිළි පදී. මෙබඳු වූ පිළිවෙත සඳහා **නාසස ඉධෙකච්ච ආදීනවා** යනුවෙන් වදාළහ. තථාගතයන් වහන්සේ අටලෝ දහම්හී තාදී සේක. ලාභයෙහි ද අලාභයෙහි ද තාදී සේක. කීර්තියේ දී ද අවමන් කිරීමේදී ද තාදී සේක. සුව දුක් දෙකේ දී තාදී සේක. එහෙයින් සියලු ආකාරයෙන්ම තථාගතයන්ගේ ඇතැම් ආදීනවයෝ විද්‍යමාන නොවෙත්.

අභයූ පරතො නොබියව අතිශයින් ඇලුනේ නිරතුරුව ඇලුනේ වේද යන අර්ථයි. නොහොත් භයෙන් නො ඇලුනේ යන අර්ථයෙන් **අභයූපරතො** නම් වේ. භය සතරෙකි. ක්ලේශ භය, සංසාර භය, දුග්ගති භය, උපවාද භය යනුවෙනි. පෘථග්ජනයා මේ බිය සතරෙන්ම බිය වෙයි. ශෛක්ෂයෝ බිය තුනකින් බිය වෙති. ඔවුනට දුර්ගති භය නොමැත. ඉදින් සප්ත ශෛක්ෂයෝ බියෙන් ඇලුනාහු වෙති. ක්ෂීණාශ්‍රවයෝ බිය රහිත වූවෝය. ඔවුන්ට එක් බියක්වත් නැත. පරවාද බිය නැත් ද ඒ පරානුකම්පාව නිසාය. මා වැනි ක්ෂීණාශ්‍රවයකු නිසා සත්ත්වයෝ නොනැසෙත්වා යි උපවාදය රකී.

මුලුප්පලවාපී විහාරවාසී තෙරුන් මෙනි. මුලුප්පලවාපී තෙරුන් වහන්සේ 'මුලු පුලෑගම' පිඬු පිණිස පිවිසියහ. උපස්ථායක කුලගෙදර දොරකඩට පැමිණි උන්වහන්සේගේ පාත්‍රය ගෙන පිලෙහි (ඉස්තෝප්පුවේ) අසුනක් පැනවීය. ඇමති දුව ද ඒ පිලේම අනෙක් පැත්තේ ඉතා මිටි අසුනක හිඳගත්තීය. එක් නේවාසික භික්ෂුවක් පසුව පිඬු පිණිස පැමිණ දොර සිටම බලන්නේ, තෙරුන් වහන්සේ ඇමති දූ හා එක ඇඳෙහි උන්නේ යයි සලකා, මේ භික්ෂුව පාංශුකූලික විහාරයේ ඉතා සන්සුන් උපශාන්ත කෙනෙකු මෙන් වෙසේ. එහෙත් ඇතුළුගම උපස්ථායිකාවන් සමග එක ඇඳෙහි සිටී යයි සිතා, කෙසේ ද මා විසින් වැරදි ලෙස දක්නා ලද්දේ දැයි නැවත නැවත හැරි හැරී බලා ඒ හැඟීමෙන්ම නික්ම ගියේය. තෙරුන්වහන්සේ බත්කිස නිමවා විහාරයට පැමිණ වසන කුටියට පිවිස දොර වසා වැඩ උන්හ. නේවාසික භික්ෂුව ද බත්කිස අවසන් කොට විහාරයට අවුත් ඒ පාංශුකූලික භික්ෂුවට අවමන්කොට විහාරයෙන් නෙරපන්නෙමියි තෙරුන් වසන තෙනට ගොස් අසංවර ලෙසින් පරිභෝග දියකළයෙන්, දිය කෙනෙස්සෙන් වතුර ගෙන මහත් ශබ්ද කෙරෙමින් පා

සේදීය. තෙරණුවෝ මේ අසංවර ලෙස හැසිරෙන්නේ කවරෙක්දැයි විමසන්නාහූ සියල්ල දැන මේ තෙමේ මා පිළිබඳව සිත දූෂ්‍යකොට අපාගත නොවේවායි අහසට පැන නැඟී කැණිමඬල සමීපයේ පලඟින් වැඩ හුන්නේ ය. නේවාසික භික්ෂුව දුෂ්ට අදහසින් යතුර ඔසවා දොර හැර ඇතුළත ද නො සිටියෙන් ආපසු නික්ම යන්නට සැරසුණි. තෙරණුවෝ කෑරීමෙන් ශබ්ද කළහ. නේවාසික භික්ෂුව උඩ බලා දැක ඉවසාගත නොහැකිව ඇවැත්නි, පාංශුකූලිකය, මෙසේ මහත් ආනුභාවයෙන් යුක්ත වූ තොපට උපස්ථායිකාව සමග එකම ඇඳේ ඉඳින්නට සුදුසුදැයි විචාළේය. ඔබ විසින් වැරදි ලෙස දක්නා ලද්දේ යයි (කී තෙරණුවෝ) මෙසේ ක්ෂීණාශ්‍රවයෝ පරානුකම්පාවෙන් උපවාද රකිත්.

ඛයා රාගස්ස යනු රාගය ක්ෂය වීමෙන් ම වීතරාගී හෙයින් කාමයන් සේවනය නො කෙරෙයි. ප්‍රත්‍යවේක්ෂා කොට වළකා නොවේ. **තඤ්ඤෙව** මෙසේ තථාගතයන්ගේ ක්ලේශ ප්‍රහාණය දැන ඒ ඒ තන්හි සිටි කාලයන්හිදී ද සිව් පිරිස් මැද අලංකෘත ධර්මාසනයන්හි හිඳ ද, මෙසේත් තථාගතයන් වහන්සේ පහ වූ රාග ඇතියහ. පහ වූ ද්වේෂ ඇතියහ. පහ වූ මෝහ ඇත්තේය. වමනය කළ කෙලෙස් හා ප්‍රහීණ වූ මල ඇත්තේය. කළු වළාකුළින් මිදුණු පුන්සඳ සේ අති පිරිසිදුයහ. මෙසේ තථාගතයන්ගේ ක්ලේශ ප්‍රහාණයෙහි ගුණ කියන්නා වූ වීමංසක භික්ෂුව, අන්‍යයෝ මෙසේ විචාරන්නාහු වෙති යන අර්ථයි. **ආකාරා කාරණයෝ අත්ථයාති අනුබද්ධීහූ.**

සංසෙවා විහරනෙතා එක් කලෙක අපරිච්ඡින්න වූ (පරපුර නොකැඩුනා වූ) භික්ෂු සංඝයා මැද වාසය කරන්නේ **එකොවා විහරනෙතා = ඉච්ඡාමහං භික්ඛවෙ අඤ්ඤදඨමාසං පතිසල්ලියිතුං 'තෙමාසං පතිසල්ලියිතුං** මෙසේ විවේකව වාසය කරන්නේ හා පාරිලෙය්‍යක වනලැහැබ මැද එකලාව වාසය කරන්නේ, **සුගතා** යහපත් සේ ගියා වූ සුපිළිපන් වූවාහූ, කාරක වූවාහූ යුතුකම්හි නියැලෙන්නා වූ, ඇතැම් භික්ෂූහූ ඇත. **දුගගතානි** වැරදි සේ ගියා වූ, දුෂ්ප්‍රතිපන්න වූ, ශරීරයේ දැඩි බව ඇත්තාහූ මෙබඳු භික්ෂූන් ද සමහරවිට ඇත. **ගණමනුසාසනත** සමූහය බන්ධනයෙන් බැඳුනාහූ, සමූහයා කෙරෙහි බහුල පැවතුම් ඇත්තාහූ ගණයා පරිහරණය කෙරෙති. මෙබඳු වූ භික්ෂූහූ ද වෙති. ඔවුන්ට විරුද්ධ වූ ගණයා කෙරෙන් නික්මුණා වූ, පහ වූ සංසර්ග ඇති, වෙන් ව වාසය කරන්නාහු ද වෙති. **ආමිසෙසු සන්දිසසනති** ආමිෂයෙහි ගිජු වූවාහු ලොල් වූවාහූ, සිවුපසය සඳහාම ඇවිදින්නා වූ ආමිෂයෙන්ම පෙළෙන්නා වූ භික්ෂූන් ද ඇත. ආමිෂයෙහි

නො ඇලුණා වූ සිව්පසය පිළිබඳ නැවතුණු සිත් ඇති, වැහි වළාකුලින් වෙන් වූ සඳ මෙන් වාසය කරන්නා වූ භික්ෂූන් ද ඇත.

නාසමා යසමා - තං තෙන අවජානාති මේ ආයුෂ්මත් ශාස්තෘ තෙමේ ඒ ඒ පිළිවෙතින් ඒ ඒ පුද්ගලයා අවමන් කෙරෙයි. මේ තෙමේ සුපිළිපන්ය. ක්‍රියාකාරීය. මෙතෙම ගණයා කෙරෙන් වෙන් වූයේය. පහ වූ සංසර්ග ඇත්තේය. මෙතෙම ආමිෂයෙන් නො ඇලුනේය. ප්‍රත්‍යයන්ගෙන් නැවතුණු සිත් ඇත්තේය. වළාකුලින් මිදුණු සඳ මෙන් යයි, මෙසේ ඔහුගේ ගෘහාශ්‍රිත වශයෙන් උසස් කිරීමකුදු නැත. මෙතෙමේ දුෂ්ප්‍රතිපන්නය. ශරීරයේ දැඩි බව බහුලකොට ඇත්තේය. අත්හළ කමටහන් ඇත්තේය. මෙතෙම සමූහ බන්ධනයෙන් බැඳුනේය. මෙතෙම ආමිෂයෙහි ගිජුය. ලොල්ය. ආමිස පිළිබඳවම ඇස් ඇත්තේය. මෙසේ ඔහු තෘෂ්ණා වශයෙන් බැහැර කිරීමකුදු නැත. මෙයින් කුමක් කියයි ද, සත්ත්වයන් කෙරෙහි තථාගතයන් තුළ පවත්නා තාදී බවම කියයි.

වධකස්ස දෙවදත්තස්ස චොරස්සංගුලි මාලිනෝ
ධනපාල කෙ රාහුලෙච - සබ්බසං සමනෝ මුනි

තත්‍ර භික්ඛවෙ ඒ වීමාංසකයන් දෙදෙනා අතරෙහි 'කෙපනායසමතෝ ආකාරා යන ප්‍රශ්නයෙන් ගැටළු විසඳන්නෙකුත් වීද 'අභයුපරතෝ ආයමායස්මා' යන ප්‍රශ්නයෙන් ආ මූල වීමංසිකයකුත් වේද, ඔවුන් අතුරෙහි මූල වීමංසකයා විසින් තථාගත තෙමේ මත්තෙහි නො විචාළ යුත්තේය. යම්හෙයකින් හෙතෙම පළමු අනුන්ගේම කථාවෙන් අවසානයට නොගොස් එයින් මතු ද තථාගතයන්ගෙන්ම විචාල යුත්තේය යන අර්ථයි.

ඛ්‍යාකරමානෝ මෙහි තථාගතයන්ගේ මිථ්‍යා ප්‍රකාශයක් නම් නැත්තේ ම ය. එහෙයින් 'සම්මා මිච්ඡා' යයි නො කියා ඛ්‍යාකරමානෝ යයි කීහ. **එථපතොහමස්මි** එත ගොචරෝ මගේ ආජීව අධ්‍යාත්මක සීලය පිරිසිදුය. ඒ මම මාගේ මාර්ගය, මෙ තෙමේ ගෝචරය යන අර්ථයි. 'එතාපාථෝ' යනුවෙන් ද පාඨයක් වේ. එහි අර්ථය, මගේ ආජීව අෂ්ඨාමක සීලය පිරිසිදුය. ඒ මම ඒ සීලයාගේ පිරිසිදු බැවින් වීමංසක භික්ෂුවගේ නුවණෙහි එතාපාථෝ මෙසේ අපාථයටම එමි යි කියන ලද්දේය. නො

ච තෙන තමමයෝ තව ද මම ඒ පිරිසිදු සීලයෙන් තෘෂ්ණා සහිත නොවෙමි. පිරිසිදු සිල් ඇති බැවින් මම තෘෂ්ණා රහිත වෙමි'යි දක්වයි.

උත්තරුත්තරිං පණීත පණීතං යනු අතිශයින් ශ්‍රේෂ්ඨ ද අතිශයින් ප්‍රණීත ද කොට දේශනා කරති. **කණහසුකක පටිභාගං** අකුසලය ද කුසලය ද ප්‍රතිභාග සහිතකොට, විපාක සහිත කොට අකුසලය විනාසකොට කුසලය ද ප්‍රතිභානය කොට, අකුසලය සප්‍රතිභාග කොට කුසල් අකුසල් දේශනා කරති. අකුසලය දේශනා කරන්නාහූ උත්සාහ සහිතව, විපාක සහිතව දේශනා කරති. කුසලය දේශනා කරන්නාහූ උත්සාහ සහිතව විපාක සහිතව දේශනා කරති.

අභිඤ්ඤාය ඉධෙ කචචං ධම්මං ධම්මෙසු නිට්ඨ ගචඡනති ඒ දේශනා කළ ධර්මයෙහි ඇතැම් ප්‍රතිවේධ ධර්මයක් අවබෝධ කරගෙන, එසේ අවබෝධ කරගත් ප්‍රතිවේධ ධර්මයෙන් දේශනා ධර්මයේ කෙළවරට පැමිණෙයි. **සත්ථරි පසීදති** යනු එසේ ධර්මයේ කෙළවරට ගොස් ඇති හෙයින් **සම්මා සම්බුදෙධා භගවා** භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධයයි ශාස්තෘන් කෙරෙහි පහදියි. එහෙයින්ම ඒ භාග්‍යවතුන් වහන්සේ යම් ධර්මයක් දේශනා කරන්නේ ද, **සොපි සවාකඛාතො භගවතා ධම්මො** ඒ භාග්‍යවතුන් විසින් දේශිත ධර්මය ස්වාක්ඛාතය. නෛර්යාණික යයි (දනී), යමෙක් ඒ ධර්මය පිළිපදින්නේ ද ඒ (සංඝයා) **සුපටිපනෙනා සංඝො** සුප්‍රතිපන්නය. කාය වංකාදී දොස් රහිතය. පිළිවෙතට පිළිපන්හයි ධර්මයා කෙරෙහි ද සංඝයා කෙරෙහි ද, ප්‍රසන්න වේ. එහි තුන්රුවන ගුණ කියන්නා වූ භික්ෂුව

ඉමෙහි ආකාරෙහි මේ ශාස්තෘන් විමසන කරුණුවලින්, **ඉමෙහි පදෙහි** මේ අකුරුවලින් යුත් පදයන්ගෙන් **ඉමෙහි බ්‍යඤ්ජනෙහි** මෙහි මේ කී අකුරුවලින් **සද්ධ නිච්චයා ඔකප්පනා ශ්‍රද්ධාව පිහිටියා වෙයි.** මූලජාතා සෝවාන්මග විසින් ගත් මුල් ඇත්තී වෙයි. සෝවාන් මග ගත් ශ්‍රද්ධාවගේ මූලය නම් ආකාරවතී කාරණය විමසා ගෙන කරුණු සහිත වූ බැවින්, දසසන මූලිකා සෝවාන්මග මුල්කොට ඇති බැවින් ඒ සෝවාන් මග දර්ශනයයි කියනු ලැබේ. දළහා ස්ථිර වූ, අසංහාරියා හරින්නට නොහැකි, **සමණෙන වා** සංසිඳවූ පව් ඇති මහණෙකු විසින් හෝ, **බ්‍රාහමණෙන වා** බැහැර කළ පව් ඇති බ්‍රාහ්මණයකු වශයෙන් හෝ, **දෙවෙන වා** උත්පත්ති දෙවියකු විසින් හෝ, **මාරෙන වා** වසවත් මරු

විසින් හෝ, සෝවාන් වූවහුගේ ශ්‍රද්ධාව නො වෙනස් කළ හැක්කෝ වෙයි. සුරම්බට්ඨයාගේ මෙනි.

ඒ සුරම්බට්ඨ වනාහි තථාගතයන්ගෙන් බණ අසා සෝවාන්ව ගෙට ගියේය. එකල මාරයා දෙතිස්මහා පුරිස් ලකුණෙන් හෙබි බුද්ධ රූපය මවා දොරකඩ සිට ශාස්තෘන් වහන්සේ ආ සේකැයි පණිවුඩයක් යැවීය. සුරම්බට්ඨ, 'මා දැන් ශාස්තෘන් වහන්සේ සමීපයෙන් බණ අසා මෙය ආවා පමණි. කුමක් ද මේ වෙන්නේ යන සිතිවිල්ලෙන්ම පැමිණ, සර්වඥයන් යන හැඟීමෙන් වැන්දේය. මාරයා මෙසේ කීය. සුරම්බට්ඨය, මා විසින් නුඹට රූපය අනිත්‍යය -පෙ- විඤ්ඤාණය අනිත්‍යයයි යමක් කීවේද එය වැරදීමකින් කියන ලදී. යම්හෙයකින් නො විමසා මා විසින් මෙසේ කියන ලදද, එහෙයින් ඔබේ රූපය නිත්‍යය -පෙ- විඥානය නිත්‍යය යි සිතට ගනුව. සුරම්බට්ඨ මෙසේ සිතීය. ශාස්තෘවරයෝ නම් නො විමසා ප්‍රත්‍යක්ෂ නො කොට කිසිවක් නො කියති. මෙය කරුණු රහිතය. ඒකාන්තයෙන් මේ මාරයා මට අප්‍රසාදය උපදවනු පිණිස ආවේ වන. ඉක්බිතිව ඔහු 'ඔබ මාරයා නොවේදැ'යි ඇසීය. හෙතෙම බොරු කියන්ට නොහැකිව ඔව් මම මාරයා වෙමි'යි කීය. කුමක් නිසා මෙහි ආවේද, ඔබගේ ශ්‍රද්ධාව චලනය කරන්නට යයි කීය. පවිටු මාරය, නුඹ වැනි මාරයන් එකෙක් නොව සියයක් ආවත් මගේ ශ්‍රද්ධාව චලනය කරන්නට නුපුළුවන. තොප එයට අසමර්ථය. සෝවාන් මාර්ගයෙන් පැමිණි ශ්‍රද්ධාව ගල්පොළවෙහි පිහිටි මහමෙර මෙන් ස්ථිරය. නො සෙල්වෙන සුළුය. නුඹ මෙහි කුමක් කෙරේදැයි අසුර ගැසීය. ඔහුට එහි රැඳෙන්නට නො හැකි වූයේ අතුරුදන් විය. බ්‍රහ්මුනාවා බ්‍රහ්ම කායිකාදීන් අතරින් කිසියම් බ්‍රහ්මයකු විසින් හෝ, **කෙනචි වා ලොකසම්ං** වෙනත් ශ්‍රමණාදී වෙනත් කිසිවකු විසින් හෝ, වෙනස් කරන්නට නො හැක්කෝය. **ධම්ම සමනෙනසනා** යථා ස්වභාවය සෙවීම, **ධම්මතා සුසමනතිටෙයා** ධර්මතාවෙන් මැනවින් විමසන ලද්දේ, ස්වභාවයෙන් මැනවින් පරීක්ෂා කරන ලද්දේ වෙයි යන අර්ථයි. සෙස්ස සියලු තැන නො ගැඹුරු ඇත් ඇත්තේය.

වීමංසක සූත්‍ර වර්ණනාව නිමියේය.

1-5-8

එවමෙමසුතං කෝසම්බක සූත්‍රයයි. එහි කොසම්බියං යනු මෙනම් නම ඇති නගරයයි. ඒ නගරයේ ආරාම, පොකුණු, ආදී ඒ ඒ තන්හි කොසඹ ගස් බහුල වීම නිසා කෝසම්බි යයි ප්‍රසිද්ධියට පත්විය. කුසුම්බ නම් සෘෂීහුගේ අසපුව සමීපයේ ඉදිකරන ලද නිසා ද කොසම්බ යයි කියතියි ඇතැමෙක් කියති. ඝොසිතාරාමේ ඝෝසිත සිටු විසින් කරවන ලද ආරාමයේ දී මේ සූත්‍රය දේශනා කරන ලදී.

අතීතයේ අද්දිල නම් රටක් වූයේය. එරට විසූ කොතුහල නම් දුප්පතෙක් දුර්භික්ෂය නිසා සිය අඹුදරුවන් සමගින් කෙත් වත් ඇති රටකට යන්නේ පුත්‍රයා ඔසවා ගෙන යන්නට නො හැකි නිසා ඔහු හැරදමා ගියේය. මව් තොමෝ නැවතී, ඔහු ගෙන ගියාය. ඔව්හු එක් ගොපලු ගමකට පිවිසියාහුය. ඒ දවස ගොපල්ලන්ට ද බොහෝ කිරිබත් ලැබුණු දවසක් විය. ඔව්හු ද එයින් කිරිබත් ලැබ අනුභව කළහ. ඉක්බිති ඒ පුරුෂයා වැඩිපුර කිරිබත් අනුභව කළෙන් දිරවන්නට නොහැකි වූයේ රාත්‍රී කාලයේ කළුරිය කොට එහිම බැල්ලකගේ කුස පිළිසිඳගෙන බල්ලෙක්ව උපන්නේ ය. හේ ගොපල්ලාට මනාප වූයේ ප්‍රිය වූයේ විය. ගොපල්ලා එක්තරා පසේබුදු කෙනෙකුන්ට උපස්ථාන කරයි. පසේබුදුන් ද දන් වළඳින විටද බලු පැටියාට ද බත් පිඩක් දෙයි. හෙතෙම පසේබුදුන් කෙරෙහි බැති සිත් උපදවා ගොපල්ලා සමගින් පන්සලට ද යයි. හෙතෙම ගොපල්ලා නැති කල්හි බත් වේලාවට තෙමේ ම පන්සලට ගොස් බත් වේලාව දන්වනු පිණිස පන්සලේ දොරකඩ සිට බුරයි. අතරමග දී චණ්ඩ මෘගයන් දැක බුරමින් එලවා දමයි. හෙතෙම පසේබුදුන් කෙරෙහි බැති සිතින් කලුරිය කොට දෙව්ලොව ඉපදුනේය. ඔහු ඝෝසිත දිව්‍යපුත්‍රයා නමින් හැඳින්වීය. හේ දෙව්ලොවින් චුතවැ කොසඹෑ නුවර එක්තරා කුල ගෙදරක උපන්නේ ය. අපුත්තක නම් සිටුවරයෙක් ඔහුගේ දෙමාපියන්ට ධනය දී, ඔහු පුත්‍රයකු කොට ගත්තේ ය. ඉක්බිතිව තමන්ට දරුවකු ලැබුණු විට මොහු මරා දමන්නට සත්වරක්ම උත්සාහ කළේය. හෙතෙම පින්වත් දරුවෙකු නිසා සත් තැනදීම මරණයෙන් බේරී, අවසානයේ එක් සිටු දුවකගේ බුද්ධිමත් බවින් දිවි ලබා මෑත කාලයෙහි පියාගේ ඇවැමෙන් සිටු පදවියට පත්ව ඝෝසක සිටු නමින් ප්‍රචාරයට පත්විය. කොසඹෑ

නුවර කුක්කුට සිටුය. පාවාරික සිටු යයි තවත් සිටුවරු දෙදෙනෙක් සිටී. මොහු සමග සිටුවරු තිදෙනෙක් වූහ.

ඒ කාලයේ ම ඒ යහළු සිටුවරුන්ගේ කුලුපග වූ තාපසයෝ පන්සියයක් පර්වත පාදයේ විසූහ. ඔව්හූ කලින් කල ලුණුඇඹුල් සෙවීම සඳහා මිනිස් පෙදෙසට එන්නාහ. එක්වරක් ග්‍රීෂ්ම කාලයේ මිනිස් පියසට එන සෘෂීහූ නිරුදක මහා කාන්තාරය ගෙවා එන කල්හි කාන්තාරය කෙළවර සුවිසල් නුග ගසක් දැක මෙසේ සිතූහ. මෙබඳු වූ සුවිසල් රුකෙහි ඒකාන්තයෙන් දෙවියකු විසිය යුතුය. හේ මහේශාක්‍යයකු විය යුතුය. ඔහු අපට බීමට හා පරිභෝජනයට වතුර සපයන්නේ නම් යහපත්ය.

දෙවියා සෘෂීන්ගේ අදහස් දැන මොවුන්ට සංග්‍රහ කරන්නෙමියි තමන්ගේ ආනුභාවයෙන් වෙළෙප් අතරින් නගුලිසක් පමණ වූ දියදහරාවක් පැවැත්වීය. සෘෂි සමූහයා රිදී කඳක් බඳු වූ දියවැටිය දැක තම තමන්ගේ භාජනවලට ජලය රැගෙන පරිභෝග කොට යළි සිතීය. දෙවියෝ අපගේ පරිභෝගයට ජලය දුන්හ. මේ වූ කලී ගම් පියසක් නැති අරණ්‍යයකි. අපට ආහාර ද ලබාදෙන්නේ නම් ඉතා යහපත්ය. දෙවියා ද සෘෂීන්ගේ අදහස් අනුව දිව්‍යමය වූ කැඳ කෑ යුතු දේ දී සන්තර්පණය කළේය.

සෘෂිවරු සිතූහ. දෙවියා අපට ජලය ද ආහාර ද දුන්නේ ය. දැන් ඔහු අපට දැකීම සඳහා අප ඉදිරියේ පෙනී සිටින්නේ නම් මැනවි. දෙවියා ඔවුන්ගේ ඒ අදහස දැන තමන්ගේ උඩුකය පෙන්වීය. ඔව්හූ කීහූ. දේවතාවෙනි! තොපගේ සම්පත් ඉතා මහත්ය. කවර කුසල කර්මයක් කොට මෙවැනි සම්පත් ලදුයේද, ස්වාමීනි, ඒ තරම් විශාල ලොකු කුසලකර්ම නො කෙළෙමි. ඉතා සුළු කර්මයක් කළෙමි. අර්ථ උපෝසථ කර්මය නිසා මේ මහත් දිව්‍ය සම්පත් ලදුයෙමි.

පෙරදී මේ දෙවියා අනේපිඬු සිටාණන්ගේ සිටුමැදුරේ කම්කරුවකු වූයේය. සිටුවරයාගේ ගෙදර සියළුම දැසි දස් කම්කරුවෝ උපෝසථ දිනයන්හි පෙහෙවස් රකිති. එක් දවසක් මම හුදෙකලාවම පාන්දර නැගිට රැකියාවට ගියෙමි. මහා සිටානෝ සිය කම්කරුවන්ට දිනපතා බත් වැටුප් දෙයි. මේ සේවකයා වැඩට ගිය බව දැන ඔහුට ද සවස බත් වැටුප් දුනි. බත් පිසින දාසිය එක් අයකුට බත් උයා දවල් බතට වැඩපලෙන් ආ අයට බත් දින. කම්කරුවා මෙසේ ඇසීය. වෙනදා මේ වෙලාවට මේ ගෙයි හරි

කලබලය. අද බොහෝ නිශ්ශබ්දය. ඒ මන්දැයි ඇසීය. අද මේ ගෙයි සියලු දෙනා පෙහෙවස් සමාදන්ව ඇත. මහසිටාණෝ ඔබට පමණක් අද වැටුප් දුන්හ යි දාසිය කීවාය. මැණියනි එසේද, දැන් පෙහෙවස් සමාදන් වුවහොත් එය පෙහෙවස් වේද නොවේදැයි කම්කරුවා ඇසීය. ගොස් මහසිටු වෙතින් විචාරන්නැයි බත් අම්මා කීවාය. එසේ විචාරන ලද්දහුට මහසිටාණෝ මෙසේ කීහ. සම්පූර්ණ උපෝසථය සිදු නොවේ. එහෙත් අර්ධ උපෝසථය සිදු වේ. පෙහෙවස් සමාදන් වෙවයි කීය. සේවකයා බත් නොකා කට සෝදා පෙහෙවස් සමාදන්ව වසන තෙනට ගොස් වැද හොත්තේය. රාත්‍රී කාලයේ නිරාහාරව සිටි ඔහුගේ උදර වාතය කිපී අලුයම කලුරිය කළේය. අර්ථ උපෝසථය රැකි කර්මයේ ආනිසංසයෙන් මහා වත්තනි නම් වනදොර මහ නුගරුකෙහි බලවත් දිව්‍ය පුත්‍රයෙක් ව උපන්නේ යයි දෙවියා තම පුවත ඍෂීන්ට දැන්වීය.

ඍෂිවරු බුද්ධ, ධම්ම, සංඝ යන අප පෙර නො ඇසූ බසක් තා විසින් අපට කියන ලදී. බුදුන් ලොව උපන්නෙහි ද, එසේය බුදුන් ලොව පහළ්විය. දැන් කොහේ වසන්නේද, ස්වාමීනි, සැවැත්නුවර ඇසුරු කරමින් දෙව්රම වාසය කරයි. තෙපි ඔහොම සිටුවු. අපි ශාස්තෘන් වහන්සේ දකින්නට යන්නෙමුයි තුටුපහටු සිත් ඇතිව නික්මී පිළිවෙළින් කොසඹෑ නුවරට පැමිණියාහුය. මහසිටු තෙමේ ඍෂිවරුන් පැමිණි බව දැන පෙරගමන් කොට අපගේ නිවසේ දානය පිළිගන්නැයි ආරාධනා කොට දෙවැනි දින ඍෂි සමූහයාට මහා දන් දුන්හ.

ඍෂීහූ දන් වළඳ අපි යමු යයි කීහු. ස්වාමීනි, ඔබලා වෙනත් කාලවල පැමිණිවිට මාස දෙකක් තුනක් හතරක් මෙහි වැස ආපසු යයි. මේ වාරයෙහි අද ම යන්නෙමුයි කියයි. මේ මන්ද, ගෘහපතිය එසේය. බුදුහු ලොව පහළ වූහ. කොයි වේලේ ජීවිත අන්තරාවක් වේදැයි නොදනිමු. එහෙයින් අපි වහා යන්නෙමු. ස්වාමීනි එසේ වීනම් අපිද යන්නෙමු. අප සමගම යා හැකිය. තෙපි ගිහිගෙයි වසන්නෝ මහඅවුල් ඇත්තාහ. ඔබලා සිටින්න. අපි පළමුව යන්නෙමුයි පිටත් වී, එක් තැනක දෙ දවසකුදු නො නැවතී ඉක්මන් ගමනින් ම සැවැත්නුවරට ගොස් දෙව්රම් වෙහෙර ශාස්තෘන් සමීපයටම ගියාහුය. එහිදී මිහිරි බණ කථා අසා සියල්ලන්ම පැවිදි වී අර්හත්වයට පත්වූහ.

ඒ සිටුවරු තුන්දෙන ද පන්සියයක් පන්සියයක් ගැල්වල ගිතෙල් මී උක්සකුරු ආදිය ද, පටදුහුල් වස්ත්‍ර ආදිය ද ගෙන කොසඹෑ නුවරින් පිටත්ව පිළිවෙලින් සැවැත්නුවරට සැපත්ව, දෙව්රම අසල කඳවුරු බැඳ ශාස්තෘන් සමීපයට ගොස් පිළිසඳර කථාකොට එකත්පස්ව හුන්නාහුය. ශාස්තෘන් වහන්සේ යහළුවන් තිදෙනාටම මිහිරි ධර්මකථා වදාළහ. ඔව්හු බලවත් සොම්නසින් යුතුව දෙවන දවසේ පටන් අඩමසක් දන් දුන්හ. මෙසේ දන් දී ස්වාමීනි, අපගේ ජනපදයට වැඩමවීම සඳහා අපට ප්‍රතිඥා දුන මැනවැයි පාමුල වැදහොත්තාහ. ගෘහපතිවරුනි, තථාගතයෝ ශූන්‍යාගාරයෙහි සිත් අලවා වෙසෙති යි වදාළහ. මෙතෙකින් ප්‍රතිඥා දුන්නේ වනැයි සලකා, ගෘහපතීහූ භාග්‍යවතුන් වහන්සේ විසින් අපට ප්‍රතිඥා දෙන ලද්දේ වනැයි සලකා තථාගතයන් වැඳ නික්ම ගොස් යොදුනක් පාසා විහාරයක් බැගින් කරවා පිළිවෙළින් කොසඹෑ නුවරට පැමිණ ලෝකයෙහි බුදුන් උපන්නේ යයි කීහූ. තිදෙනම තම තමන්ගේ ආරාමයෙහි මහත් ධන පරිත්‍යාග කොට භාග්‍යවතුන් වහන්සේගේ වාසය සඳහා විහාර කරවූහ. එහි කුක්කුට සිටුහු විසින් කරවන ලද ආරාමය කුක්කුටාරාමය විය. පාවාරික සිටු විසින් පාවාරික අඹ වනයෙහි කරවන ලද විහාරය පාවාරිකම්බ වන නම් විය. ඝෝසිත සිටුහු විසින් කරවන ලද විහාරය ඝෝසිතාරාමය නම් විය. ඝෝසිත සෙට්ඨීනාකාරිත ආරාමෙ යන්න ඒ සඳහා කියන ලදී.

භණ්ඩන ජාතා ආරාවුලේ පසුබිම පූර්වභාගය 'භණ්ඩන' නම්. එය හටගත්තේ මේ අය අතරේ යයි කියනු සඳහා **භණ්ඩනජාතා** වී. අත්, පා, වචන ආදිය උපයෝගී කරගනිමින් පැමිණි කලහය ආරාවුල මොවුන් අතරේ ඇතිවිය යන්න කීම සඳහා **කලහජාතා** නම් විය. විරුද්ධ වාදයට විවාදයට පැමිණි බව කීම සඳහා **විවාදාපනනා** නම්. මුඛසතතීහි වචන නමැති අවි ආයුධවලින්, **විතු දනතා** විදින්නාහූ, **තෙන වෙව අඤ්ඤ මඤ්ඤං සඤ්ඤාපෙනති - න ච සඤ්ඤතතං උපෙනති** ඔව්හු අර්ථය ද කාරණය ද දක්වා ඔවුනොවුන්ට නො දන්වති. කියන්නට සූදානම් වෙත් ද එහෙත් දැන ගැනීමට නො පැමිණෙති. දැනගැනීමට කැමැත්තක් නැත යන අර්ථයි. 'නිජඣතති' යන්නෙහි ද මෙම ක්‍රමයමැයි. මෙහි **නිජඣතති** යනු හැඟීම් වශයෙන් ඒ අදහසට පරියාය වචනයි.

කුමක් හෙයින් මොව්හූ කලහ ඇතිකර ගත්තෝද, ඉතා සුළු කරුණක් සඳහාය. එක්තරා ආවාසයක විනයධර හා සූත්‍රධර භික්ෂූහූ දෙනමක් වූහ.

ඔවුන් අතුරෙන් සූත්‍රාන්තික භික්ෂුව එක් දවසක් වැසිකිළියට පිවිසියේ පරිභෝග කරන ලද ජලයෙන් මදක් භාජනයේම ඉතිරිව තබා නික්මගියේය. විනයධර භික්ෂුව පසුව පැමිණ ඒ ජලය දැක නික්ම ඒ භික්ෂුවගෙන් විචාළේය. ඇවැත්නි, ඔබ විසින් ජලය භාජනයේ ඉතිරි කර ආවෙහිද, ඇවැත්නි එසේය. ඔබ මෙය ඇවැත් බව නො දන්නේ ද, සේය නො දනිමි. ඇවැත්නි, එය ඇවැතකි. එනිසා එය ඇවැත් වේ නම් දෙසන්නෙමි. නැවත ඉදින් ඇවැත්නි, තොප නො දැන සිහි නො කිරීමෙන් කරන ලද නම් ඇවැත් නැත. හෙතෙම ඒ ඇවතෙහි ඇවැත් නැත යන නිගමනයට එළඹියේය.

විනයධර තෙම (එසේ කියා) තමන් ඇසුරු කරන්නන් සමග සූත්‍රාන්තික භික්ෂුව ඇවතට පැමිණ එය නො දැන සිටී යනුවෙන් කීය. ඔව්හූ විනයධර තෙරුන්ගේ අතවැසියන් දැක තොපගේ උපාධ්‍යායයෝ ඇවතට පැමිණ ද ඇවැත් බව නොදැන සිටී යයි කීහ. ඔව්හූ ගොස් තමන්ගේ උපාධ්‍යායන්ට කීහ. හෙතෙම (සූත්‍රාන්තික) මෙසේ කීය. මේ විනයධර තෙම පළමුව ඇවැත් නැතැයි කියා දැන් ඇවැත් වේයයි කියයි. ඒ නිසා විනයධර තෙම මුසාවාසියෙකි යි කීය. ඔව්හූ ගොස් (විනයධර අතවැස්සන් සමග) තොපගේ උපාධ්‍යාය තෙමේ බොරු කාරයෙකැයි චෝදනා කළහ. මෙසේ ඔවුනොවුන් කලහ, අරගල ඇතිකළහ. ඒ සඳහා මෙය කියන ලදී.

භගවනතං එතදවොච මේ ස්වාමීනි, **ඉධ භනෙත කොසම්බියං භිකඛූ භණ්ඩන ජාතානි** කොසඹෑ නුවර භික්ෂූහූ හටගත් කලහ ඇත්තෝ (අරගල කරන්නෝ) වෙති යි තථාගතයන්ට කීහ. එය එසේ කීවේ බිඳවන අදහසින් නොවේ. වැඩ කැමති බැවින් හිත කැමති බැවින් සමගි කරවනු සඳහාමය. යම්කිසි විධියකින් මේ දෙපිරිස සමගි කරවනු සඳහාමය. යම්කිසි විධියකින් මේ දෙපිරිස සමගි කරන්නෙක් වීද ඔහුට ඒ අදහසම ඇතිවිය. යම්කිසි අයුරකින් මේ දෙපිරිස කලහය පටන් ගත්තාහු ද අපට එය සමගි කළ නො හැකිය. වෙනත් භික්ෂුවකටද මේ අය සමගි කළ නොහැක. දෙවියන් සහිත ලෝකයේ අග්‍ර පුද්ගල වූ භාග්‍යවතුන් වහන්සේ, තමන් වහන්සේම පැමිණ හෝ, තමන්ගේ සමීපයට කැඳවා හෝ මේ භික්ෂූන්ට ඉවසීම, මෛත්‍රිය මුසු වූ සිහි කළයුතු ධර්මදේශනාවක් වදාරා මේ දෙපිරිස සමගි කරන්නේ නම් ඉතා යෙහෙකැයි වැඩ කැමැත්තෙන්ම මෙසේ කීයේය.

ඡයිමෙ භිකඛවෙ ධම්මා සාරාණීයා කලහ භණ්ඩන වශයෙන් දේශනාව ඉහතින් ආරම්භ කරන ලදී. එහෙත් මෙතැන්හි දී සාරාණීය ධර්ම සය පිළිබඳව ධර්මයෝ මේ කෝසම්බ සූත්‍රයට අනුසන්ධි ලෙසින් ගියේ වෙයි. එහි **සාරාණීයා** සිහිකළ යුතු, කල් ඉක්මගියද, අමතක නොකළ යුතු, යමෙක් ඒ ධර්මයන් පුරාද, ඔහු සම්බ්‍රම්සරුන්ට පිය කෙරෙත්. **පියකරණා** ගරුකෙරෙත්. **ගරුකරණ සංගාහායා** සංග්‍රහ කිරීම පිණිස, **අවිවාදාය** විවාද නො කිරීම පිණිස, **සාමගගියා** සමගි බව පිණිස, **එකීභාවාය** එක්බව පිණිස, නොවෙනස් වීම පිණිස, **සංවතතනතී** පවතිත්. **මෙතතං කායකමමං** මෙත් සිතින් කළයුතු කායකර්ම, වචීකර්ම හා මනඃකර්මයන්හි ද මෙම ක්‍රමයමයි. නැවත මොව්හු භික්ෂූන් වශයෙන් ආවාහූ ගිහීන් කෙරෙහි ද ලැබෙත්. භික්ෂූන්ගේ මෙත් සිත් වශයෙන් ආභිසමාචාරික ධර්මයන් පිරීම මෛත්‍රී කායකර්ම නම්. ගිහීන්ගේ චෛත්‍ය වැඳීම පිණිස, බෝධි වැඳීම පිණිස, සංඝ නිමන්ත්‍රණය පිණිස යාමය. ගමට පිඬු පිණිස වැඩි භික්ෂූන් දැක පෙරගමන් කිරීමය. පාත්‍ර පිළිගැනීම, අසුන් පැනවීම, පසුගමන් කිරීම ආදිය මෛත්‍රී කායකර්ම වේ. භික්ෂූන්ගේ මෙත් සිතින් ආචාරධර්මයන්හි හික්මවීම, කමටහන් කීම, බණ කීම, ත්‍රිපිටකය වැදෑරීම, මෛත්‍රී වාක් කර්ම නම් වේ. ගිහීන්ගේ චෛත්‍ය වැඳීමට යාම, බෝධි වැඳීමට යාම, බණ ඇසීම, මල් පහන් පූජා කිරීම, ත්‍රිවිධ සුචරිතයන්හි යෙදීම, ලාබ බත් ආදිය දීම, සිවුරු පිදීම, සංඝයාට සිව්පසය දීම, සංඝයා වඩමවා දන්දීම, අසුන් පැනවීම, පැන් පෙරහා තැබීම, සංඝයාට පෙරගමන් කිරීම, වඩා හිඳුවීම, වතාවත් කිරීම, පසුගමන් යාම ආදිය පිළිබඳව කථාකිරීම සාකච්ඡා කිරීම, විධිවිධාන යෙදීම මෛත්‍රී වාක් කර්ම නම් වේ. භික්ෂූහූ අරුණට පළමුව පිබිද සිරුර පිළිදැගුම් කොට වතාවත් නිමවා මේ විහාරයේ භික්ෂූහූ සුවපත් වේවා. අවෙරී වෙත්වා. ව්‍යාපාද රහිත වෙත්වා ආදී වශයෙන් සිතීම මෛත්‍රී මනඃකර්ම නම්. ගිහියෝ ද ආර්යයන් වහන්සේ සුවපත් වෙත්වා. අවෙරී වෙත්වා. ව්‍යාපාද නැත්තෝ වෙත්වා. දුකින් මිදෙත්වා ආදී වශයෙන් සිතීම මෛත්‍රී මනඃකර්ම නම් වේ.

ආවිචෙව රහොච යනු ඉදිරිපිටදී ද, නැති තැනදී ද නවකයන්ගේ සිවුරු කිරීම් ආදී කටයුතුවලදී සහාය බවට යාම සම්මුඛයෙහි මෛත්‍රී කාය කර්ම නම්. වැඩිමහල් ස්ථවිර භික්ෂූන්ගේ පා සේදීම, පවන් සැලීම ආදී සියලුම සාමීචිකර්ම (යහපත් ක්‍රියා) සම්මුඛයෙහි මෛත්‍රී කාර්ය කර්ම නම්. භික්ෂූන් විසින් වරදවා තබන ලද දැව බඩු ආදිය ඔවුන්

කෙරෙහි අවඥා නො කොට තමන් විසින් වැරදියට තබන ලද්දේයයි සලකා නිසි ලෙස සකස් කිරීම (පරාම්මුඛ) අනභිමුඛයේ කරන මෛත්‍රී කාය කර්ම නම් වේ. දේව ස්ථවිර තිස්ස ස්ථවිර ආදී වශ්‍යයන් ගරු ලෙස කථා කිරීම හමුවෙහි මෛත්‍රී වාක් කර්ම නම් වේ. විහාරයෙහි නැති භික්ෂුවක් පිළිබඳව 'අපේ දේව ස්ථවිරයන් කොහිද, අපගේ තිස්ස ස්ථවිරයන් කොහිද, කවදා වඩින්නේ ද ආදී මමත්වයෙන් යුතුව කරන කථාව අනභිමුඛයේ (නැති තැන) මෛත්‍රී වාක් කර්ම නම් වේ. මෛත්‍රී ස්නේහයෙන් යුතුවැ සිනිඳු ඇස් දල්වා පහන් මුහුණින් බැලීම හමුවෙහි මෛත්‍රී මනඃකර්ම නම්. දේව ස්ථවිර, තිස්ස ස්ථවිර සුවපත් වේවා. අල්පාබාධ ඇත්තේ වේවායි සිතින් සිතීම අනභිමුඛයේ තැන තැන මෛත්‍රී මනඃකර්ම වේ.

ලාභා චීවරාදී ලද ප්‍රත්‍යයෝ ධම්මිකා කුහක ආදී මිථ්‍යා ජීවය හැර දැහැමෙන් සෙමෙන් පිණ්ඩපාතයෙන් උපන් **අනතමසෝ පතත පරියාපනත මත්තමපි** යටත් පිරිසෙයින් පාත්‍රයට ලැබුනා වූ හැඳි දෙක තුනක් පමණ භික්ෂාවද, **අපප විහත්ත** භොගී බෙදීම් දෙකක් වෙති. ආමිෂ ප්‍රවිභක්තය පුද්ගල ප්‍රවිභක්තය යනුවෙනි. මෙපමණක් දෙන්නෙමි. මෙපමණක් නො දෙන්නෙමියි මෙසේ සිතින් බෙදීම ආමි ප්‍රවිභක්ත නම් වේ. අසවලාට දෙන්නෙමි. අසවලාට නො දෙන්නෙමි යනුවෙන් සිතින් බෙදීම පුද්ගල ප්‍රවිභක්තනම් වේ. ඒ දෙකම නොකොට යමක් නො බෙදන ලද ද එය වළඳ ද ඔහු නො බෙදා වළඳන තැනැත්තා වූයේ වෙයි.

සීලවනෙතහි සබ්‍රහමචාරීහි, සාධාරණ භොගී මේ සාධාරණ භෝගීහුගේ ලක්ෂණයි. යම් යම් ප්‍රණීත වූවකම ලබාද, ඒ ඒ දෙය ලාභයෙන් ලාභය සෙවීම, ද්වාරයෙන් ගිහීන්ට නොදෙයි. තමාද පරිභෝග නො කරයි. පිළිගන්නේම සංඝයා හා සාධාරණ වේවයි සිතා ගෙඩිය ගසා (භික්ෂූන් කැඳවා) පරිභෝග කළයුතු දෙයක් මෙන් සිතයි. මේ සාරාණීය ධර්ම කවරෙක් පුරයි ද කවරෙක් නොපුරයි ද, දුසිල් මහණ නො පුරයි. ඔහු අයත් දෙස සිල්වත්හු නො ගනිති. පිරිසිදු සිල් ඇති වත පිළිවෙත පුරණ තැනැත්තේම පුරයි.

තත්‍රිදං වතතං මේ එහි වත පිළිවෙතයි. යමෙක් නියමකොට මවට පියාට ආචාර්ය උපඣ්ඣාය ආදීන්ට දෙන්නේ ද හෙතෙම දිය යුත්තන්ට දෙන්නේ වෙයි. එහෙත් ඔහුට සාරාණීය ධර්මය නොවෙයි. පළිබෝධ

පිළිදැගීම නම් වෙයි. සාරාණීය ධර්මය මිදුණු පළිබෝධ ඇත්තහුටම විය යුතුය. යළි නියමකොට දෙන්නා වූ ඔහු විසින් ගිලනුන්ට, ගිලන් උපස්ථායකයන්ට, ආගන්තුකයන්ට, ගමිකයන්ට අලුත පැවිදි වූ සඟල සිවුර පාත්‍රා ගැනීම නොදන්නවුන්ට දිය යුතුයි. මොවුන්ට දී ඉතිරි කොටස් ස්ථවිර ආසනයෙහි සිට මදින් මද නො දී කැමති කැමති පරිදි දියයුතුයි. ඉතිරියක් වූයේ නැතිනම් නැවත පිඬු සිඟා වැඩ ස්ථවිරාසනයෙහි පටන් යමක් යමක් ප්‍රණීත නම් එසේ දී ඉතිරි වූ දෙය තමන් වැළඳිය යුතුයි. 'සීලවන්තෙහි' කී හෙයින් දුසිලුන්ට නොදිය යුතුයි.

මේ සාරාණීය ධර්ම නො හික්මුණු අය ඇසුරේ පිරිය නොහැක්ක. හික්මුණු පිරිසෙහි යමෙක් අන් තැනකින් ලබාද, හෙතෙම නොගනී. වෙනත් තැනකින් නො ලබන තැනැත්තේ ද ප්‍රමාදයෙන් යුක්තවම ගනී. වැඩියක් නො ගනී.

මෙ සාරාණීය ධර්මය නැවත නැවත පිඬු පිණිස හැසිර, ලැබුණු ලැබුණු දේ දෙන්නහුට ද දොළොස් වසරකින් පිරෙයි. ඉන් මෙපිට නො පිරේ. ඉදින් දොළොස්වන වසරේ සාරාණීය ධර්මය පිරූ තැනැත්තා පිණ්ඩපාතය පිරූ පාත්‍රය ආසන ශාලාවෙහි තබා නාන්නට ගියේ ද, සංඝ ස්ථවිරයන් වහන්සේත් මේ පාත්‍රය කාගේදැයි අසා සාරාණීය ධර්මය පුරන්නහුගේ යයි දැන එය ගෙනෙවැයි සියලු පිණ්ඩපාතය බෙදා ගෙන වළඳ හිස් පාත්‍රය තැබූ කල්හි (නාන්ට ගිය මහණ) ඒ හිස් පාත්‍රය දැක මට ඉතිරි නොකොටම වැළඳූයේ යයි දොම්නසක් උපදවාද, එකල්හි සාරාණීය ධර්මය බිඳේ. නැවත දොළොස් වසක් පිරිය යුතු වෙයි. මේ සාරාණීය ධර්මය තීර්ථක පරිවාසය හා සමානය. වරක් කඩ වූ කල නැවත මුලපටන් පිරිය යුතුය. මට ලාභයක. මා විසින් මැනැවින් ලබන ලද පිණ්ඩපාතය මා නොවිචාරාම, මට ඉතිරි නො කොටම සබ්‍රහ්මචාරීහූ වැළඳුවෝදැයි සතුටු වේද, සොම්නස් උපදවාද, ඔහුට සාරාණීය ධර්මය පිරුණේ නම් වෙයි.

මෙසේ පුරණ ලද සාරාණීය ධර්ම ඇත්තෙකුට ඊර්ෂ්‍යාවක්, මාත්සර්යයක් නොවේ. හේ මිනිසුන්ට ප්‍රිය වේ. සුලභ වූ ප්‍රත්‍ය ඇත්තේ වේ. ඔහුගේ පාත්‍ර ගත වූ දේ කෙතෙක් දුන්නත් ක්ෂය නොවේ. බෙදිය යුතු භාණ්ඩ ඇති තාක් අග්‍රභාණ්ඩ ලබයි. භයක් හෝ දුර්භික්ෂයක් පැමිණි කල්හි දෙවියෝ උත්සාහයට පැමිණෙත්.

ලුණුගල වැසි තිස්ස තෙරුන් වහන්සේ මාකිරිගම ඇසුරුකොට වැඩ වෙසෙති. පනහක් පමණ ස්ථවිරවරු නාගදීප මහාසෑය වැඳීම පිණිස වැඩමවන්නේ කිරිගම පිඬුසිඟා හැසිර කිසිවක් නො ලැබම නික්මුණාහුය. තෙරුන් වහන්සේ ගමට පිවිසෙමින්ම ඒ භික්ෂූන් දැක ස්වාමීනි, කිසිවක් ලදැයි විචාළහ. හෙතෙම නො ලද බව දැන දැනම කීයේය. ස්වාමීනි, යම්තාක් මම එම් ද ඒතාක් මෙතැන වැඩසිටිනු මැනවි. ඇවැත්නි, අපි පනස් දෙනම පාත්‍රය තෙමෙන පමණකුත් නොලදුම්හ. ස්වාමීනි, නේවාසිකයෝ නම් බල ඇත්තෝ වෙති. නොලබන්නාහු නමුත් පිඬු පිණිස හැසිරෙන මාර්ග ස්වභාවය දනී. ස්ථවිරවරහු නැවතුනාහ. (නේවාසික) තෙරහු ගමට පිවිසියේය. සමීපයෙහිම මහා උපාසිකා තොමෝ කිරිබතක් සකස්කොට තෙරුන් එනතෙක් මග බලමින් සිටියාය. දොරට පැමිණියා වූ මහතෙරණුන්ගේ පාත්‍රය පුරවා දිනි. උන්වහන්සේ එය ගෙන ස්ථවිරවරුන් සමීපයට ගොස් ස්වාමීනි ගනු මැනවැයි සංඝස්ථවිරයන්ට කීය. තෙරුන්වහන්සේ අප මෙතෙක් දෙනා විසින් කිසිවක් නො ලද මෙතෙම වහා ගෙන ආයේය. කිමෙක්දෝ හෝයි අනෙක් හිමිවරුන්ගේ මුහුණ බැලූහ. තෙරුන්වහන්සේ බලන ආකාරයෙන් ම දැන ස්වාමීනි දැහැමෙන් සෙමෙන් ලද පිණ්ඩපාතයයි කුකුස් නැතුව පිළිගත මැනව. මුලපටන් සියල්ලන්ට යැපෙන පමණ දී තමාද යැපෙන පමණ වැළඳූහ. ඉක්බිති සංඝස්ථවිරයෝ බත්කිස නිම වී උන්වහන්සේ විචාළහ. ඇවැත්නි, කවදා ලොව්තුරු දහම් ප්‍රතිවේධ කළේද, ස්වාමීනි, මට ලොව්තුරු දහම් නැත. ඇවැත්නි, ධ්‍යානලාභී ද, එය ද නැත. ඇවැත්නි, ප්‍රාතිහාර්යයක් නොවේද, ස්වාමීනි, මා විසින් සාරාණීය දහම් පුරන ලද, එය පිරුකල පටන් ඉදින් භික්ෂූන් දහසක් වුව ද, ඒ මගේ පාත්‍රගත පිණ්ඩය ක්ෂය නොවේ. සාධු, සාධු සත්පුරුෂය, ඔබට මෙය සුදුසුය. මේ වනාහි ඔහුගේ පාත්‍රගත වූ දෙය ක්ෂය නොවේයයි යන කාරණයයි.

නැවත මේ තෙරුන්වහන්සේම සෑගිරියෙහි ගිරිහණ්ඩ මහා පූජාවෙහි දානස්ථානයට ගොස් මේ දානයේ උතුම් භාණ්ඩය කුමක්දැයි විමසීය. ස්වාමීනි, සළු දෙකකැයි කීය. ඒ දෙක මට පැමිණෙන්නේ ය. ඒ අසා ඇමතිවරු රජුට කීය. එක් තරුණ භික්ෂුවක් මෙසේ කීය. තරුණ භික්ෂුවගේ සිත මෙබඳුය. මහතෙරුන්ට සියුම් සළු සුදුසුය කියා මහතෙරුන්ට දෙමියි තැබීය. භික්ෂු සංඝයා පිළිවෙළින් සිටි කල්හි මුදුනෙහි තබන ලද සළු දෙක දීම සඳහා ඔහුගේ අතට නොපැමිණේ. එහෙත්

තරුණ භික්ෂුවට දෙන කල්හි අතට ආයේය. හෙතෙම ඒ තෙරුන්ගේ අතේ තබා ඇමතියාගේ මුහුණ බලා තරුණ භික්ෂුව හිඳුවා දන් දී සංඝයා හැර තරුණ භික්ෂුව හිඳ, ස්වාමීනි, මේ ධර්මය කවදා ප්‍රතිවේධ කළාහුද, ඇසීය. ඒ තෙරණුවෝ පරියායෙනුදු නැති ගුණ නො කියන්නාහූ මහරජ, මට ලොව්තුරු දහමෙක් නැතයි කීහ. ස්වාමීනි, පළමුව කීයේ නොවේද, එසේය මහරජ, මම සාරාණීය ධර්මය පිරුවෙක්මි. ඒ ධර්මය පිරූ කල පටන් බෙදන තැන්හි අග්‍ර භාණ්ඩයමට පැමිණෙන්නේ ය. සාධු සාධු ස්වාමීනි, මේ ඔබවහන්සේට සුදුසුමය යි වැඳ නික්ම ගියේ ය. බෙදිය යුතු භාණ්ඩ ඇති තන්හි අග්‍ර භාණ්ඩය පැමිණේය යන කථා පුවතයි.

තව ද චණ්ඩාලතීය භය ඇතිකල්හි භාතර ගම්වැසියෝ නාග ස්ථවිරීන්ට නො කියාම පලා ගියහ. තෙරණියෝ අලුයම කාලයෙහි ගම ඉතාම නිශ්ශබ්දය. පළමුකොට විමසමු යයි තරුණ භික්ෂුණීන්ට කීහ. ඈලා ගොස් ගමේ සියල්ලෝම පිටව ගොස් ඇති බව දැන ආපසු පැමිණ තෙරණියට කීහ. ඕ තොමෝ එය අසා ඔබලා ඔවුන් ගිය බව නො සිතව්. තමාගේ උදෙසීම් පිළිවිසීම්, නුවණින් මෙනෙහි කිරීම් යන කරුණුවලට නිරත වෙව්. වෑයම් කරව් කියා, භික්ෂාචාර වේලාවෙහි සිවුරු පොරවා තොමෝ දොළොස්වෙනි කොට ඇත්තී ගම්දොර නුගරුක මුල සිටියාය. වෘක්ෂයේ අධිපති දේවතාවා භික්ෂුණීන් දොළොස් දෙනා වහන්සේටම පිණ්ඩපාතය දී ආර්යාවනි, වෙන කොහේවත් නො යන්න. දිනපතා මෙහිම වැඩමවන්නැයි කීය.

තෙරණින් වහන්සේගේ කණිටු සහෝදරයකු වූ නාග නම් ස්ථවිර කෙනෙක් සිටී. ඒ තෙරුන් වහන්සේ මහත් භයය. යැපෙන්ට නුපුළුවන. පරතෙර යන්නෙමුයි තමන් දොළොස්වෙනිකොට තමන් වසන තැනින් නික්මුනේ ස්ථවිරීන් දැක යන්නෙමියි භාතරගමට පැමිණියහ. තෙරණිය තෙරුන් ආ බව අසා. උන්වහන්සේ සමීපයට ගොස් කිමෙක් ද ආර්යයෙනියි ඇසුවාය. හෙතෙම තමාගේ ප්‍රවෘත්තිය කීයේය. ඕ තොමෝ අද එක දවසක් විහාරයෙහි වැස හෙට වඩින්නැයි කීවාය. තෙරණුවෝ විහාරයට වැඩමවූහ. තෙරණිය දෙවන දවසේ ගස මුලට පිණ්ඩපාතයේ ගොස්, තෙරුන් වෙත එළඹ මේ පිණ්ඩපාතය වළඳන්නැයි කීය. තෙරණුවෝ වටනේ ද සුදුසු දැයි අසා නිහඬව සිටියේය. තෙරණිය, පිණ්ඩපාතය ධාර්මිකය. කුකුස් නැතිව වළඳන්නැයි කීවාය. තෙරණියනි, වටනේද, ඕ තොමෝ පාත්‍රය ගෙන අහසට විසි කළාය. පාත්‍රය ආකාසයේ

පිහිටියේය. ස්ථවිර තෙමේ, තෙරණියනි, සත් තලකින් මතුයෙහි සිටියද, භික්ෂුණී බත්මැයි, කියා භය නම් හැමකල නොවේ. බිය සිඳුණු පසු ආර්යවංස කියමින්, එම්බා පිණ්ඩපාතිකය, භික්ෂුණියගේ බත වළඳ කල් යැවූවයි සිතින් උපවාද කරනු ලබන්නේ පිහිටා සිටින්නට (දරාගන්නට) නො හැකි වන්නෙමි. තෙරණියනි අප්‍රමාද වව් යයි කියා මගට පිළිපන්නේය.

රුක් දෙවියා ද ඉදින් තෙරුන් වහන්සේ තෙරණියගේ අතින් පිණ්ඩපාතය වළඳන්නාහු ද, එය නො නවත්වන්නෙමි, ඉදින් නො වළඳන්නාහු නම් නවත්වමි යි සිතමින් සිට තෙරුන්ගේ ගමන දැක රුකින් බැස ස්වාමීනි, පාත්‍රය දුන මැනව් යි පාත්‍රය ගෙන ගස මුලටම වඩමවා අසුන් පනවා පිණ්ඩපාතය පුදා කරන ලද බත්කිසෙන් පසුව ප්‍රතිඥා කරවා දොළසක් භික්ෂුණීන් ද දොළසක් භික්ෂූන් ද සත්වසක් උපස්ථාන කළහ. මේ දෙවියෝ උත්සාහ බවට පත්වෙති යන මේ වස්තුවයි. එහි වනාහි ස්ථවිරී තොමෝ සාරාණීයධර්මය පූරණය කළා වන්නීය.

අඛණ්ඩානි යන තැන්හි යමෙකුගේ සප්ත ආපත්තිස්කන්ධයන් අතුරෙන් මුලින් හෝ අගින් යම්කිසි ශික්ෂාපදයක් බිඳුනේද, ඔහුගේ සීලය කෙළවරක් ඉරුණු සාටකයක් මෙන් ඛණ්ඩ සීල නම් වේ. යළි යමෙකුගේ ශීලය මැදින් බිඳුනේ නම් මැද සිදුරු වූ සාටකයක් මෙන් 'ඡිද්‍ර' නම් වෙයි. යමෙකුගේ පිළිවෙළින් ශික්ෂාපද දෙක තුනක් බිඳුනේ ද ඔහුගේ ශීලය පිටෙහි හෝ බඩෙහි හෝ රතු ආදී පැහැයක් ඇති දෙනකගේ මෙන් 'ශබල' නම් වෙයි. යමෙකුගේ අතරින් පතර බිඳුනාහු නම් අසමාන තිත්වලින් පුල්ලිවලින් චිත්‍ර වූ දෙනක මෙන් 'කල්මාස' නම් වෙයි. යළි යමෙකුගේ ශීලය සියල්ලෙන් සියල්ල නො බිඳී පවතින්නේ නම් ඔහුගේ සීලය අඛණ්ඩ, අඡිද්‍ර, අශබල, අකල්මාස වූවාහූ වෙත්, තව ද ඒ මේ ශීලයෝ තණ්හා නමැති දාස බවින් මිදුණු හෙයින් **භුජිසසානි** බුද්ධාදී උතුමන් විසින් ප්‍රශස්ත හෙයින් **විඤ්ඤූපපසත්ථානි** තණ්හා දිට්ඨි ආදීන් විසින් පරාමර්ශනය නො කළ හෙයින් අසවල් ඇවතට පැමිණියේ යයි කිසිවකු විසින් චෝදනා කරන්ට නො හැකි බැවින් **අපරාමට්ඨා** උපචාර සමාධිය හෝ අර්පණා සමාධිය පවත්නුයි **සමාධි සංවත්තනිකානි** සමාධි සංවත්තනිකා යයි කියනු ලැබේ. **සීල සාමඤ්ඤගතෝ විහරති** ඒ ඒ පළාත්වල වාසය කරන්නා වූ භික්ෂූන් සමග සමාන බවට පැමිණ සිල් ඇතිව වෙසෙයි. සෝතාපන්න ආදීන්ගේ සීලය මුහුදින් එතෙරද,

දෙව්ලොවද වසන අනෙක් සෝතාපන්නාදීන්ගේ ශීලය හා සමාන වෙයි. මාර්ගයෙන් පැමිණි ශීලයෙහි විවිධත්වයක් නැත. ඒ සඳහා කියන ලදී.

යායං දිට්ඨි යනු මාර්ග සම්ප්‍රයුක්ත වූ සම්මා දිට්ඨියයි. අරියා නිදොස් වූ, නික්ම යානුයි. **නීය්‍යානිකා, තකකරසස** යමෙක් එසේ කරන්නේද, **දුකඛකඛාය** සියලු දුක් ක්‍ෂය කිරීම පිණිස **දිට්ඨිසාමඤඤගතො** සමාන දෘෂ්ටි බවට පැමිණියෙක්ව වෙසේ.

අගගං ජ්‍යෙෂ්ඨ වූයේ **සංගාහිකං** සියලු ගොනැස් රැස් කෙරේනුයි **සංඝානකිං** රැස්කිරීම යන අර්ථයි. **යදිදං කූටං** යම් මේ කුළුගෙයක කැණිමඬලක් කූටය නම් වේද, යම්හෙයකින් පංච භූමකාදී ප්‍රාසාදයෝ කූටයෙන් බඳනා ලද්දාහුම සිටිත්ද, එය වැටුණු කල්හි මැටි ආදී වශයෙන් සියල්ල වැටෙත් ද එහෙයින් මෙසේ කීහ. **එවමෙව ඛො** කූටය කුළුගෙයට යම්සේද, එපරිද්දෙන් මේ සාරාණීය ධර්මයන්ට කිසියම් ආර්ය දෘෂ්ටියක් වේද, ඒ අග්‍ර වූයේ ද සංග්‍රහ කරන්නේ ද, රැස් කරන්නේ ද වේයයි දතයුතුය.

කථඤච භිකඛවෙ යායං දිට්ඨි යනු මෙහි මහණෙනි, නිදොස් වූ නෛර්යාණික වූ යම්කිසි සෝවාන් මාර්ග දෘෂ්ටියක් එසේ භාවිත කරන්නහුගේ දුක් ක්‍ෂය වීමට පමුණුවන්නේ ය. ඕ කෙසේ පමුණුවන්නේද, කවර කාරණයකින් පමුණුවන්නේ ද යන අර්ථයි. **පරියුට්ඨි ත චිතෙතා ච** හොති, මෙතෙකිනුදු මඩනා ලද සිත් ඇත්තේ මෙනම් වේ යන තේරුමයි. සෑම තන්හිම මේ ක්‍රමයමැයි. **සුපපණිහිතං මෙ මානසං** මගේ සිත මනාකොට තබන ලද, **සචචානං බොධයා** සතර සත්‍යයන් ගේ අවබෝධය පිණිස **අරියං** යනාදියෙහි ඤාණය යම්හෙයකින් ආර්යයන්ට වේද, පෘථග්ජනයන්ට නොවේද, එහෙයින් අරිය යයි කියනු ලැබේ. යම් කෙනෙකුට ලොව්තුරු දහම් ඇත්ද, ඔවුන්ටම වේ. අන්‍යයන්ට නොවේ. එහෙයින් **ලොකුතතරං** යයි කියන ලදී. පෘථග්ජනයන්ට නැති හෙයින් **අසාධාරණං ප්‍රමුජජනෙ** යන්න කියන ලදී. සියලු වාරයන්හි මේ ක්‍රමයමයි.

ලභාමි පචචතතං සමථං තමන්ගේ සිතෙහි සමථය ලබමියි යන අර්ථයි. නිබ්බුතියෙහි ද මේ ක්‍රමයමයි. මෙහි **සමථො** යනු එකඟ බවයි. **නිබ්බුති** යනු කෙලෙස් සංසිඳීමයි. **තථාරූපාය දිට්ඨියා** මෙබඳු වූ සෝවාන් මාර්ග දැක්මෙන්, **ධම්ම තායා** ස්වභාවයෙන් **ධම්මතා එසා** මේ

ස්වභාවයමැයි. මුටඨානං පඤ්ඤායති සංඝකර්ම වශයෙන් හෝ දේශනාවෙන් හෝ නැගී සිටීම දක්නා ලැබේ. යම්හෙයකින් ආර්ය ශ්‍රාවකයා ඇවතට අවදනේ ගරුකාපත්තීන් අතුරෙහි කුටිකාර සමාන වූද ලුහු ඇවැත් අතුරෙන් සහසෙය්‍යාදි වැනි ඇවතකටද පැමිණේද, එය ද නොදැනය. දැන නො පැමිණේ. ඇවත් ඇවත, ඇවැත් දෙසීමෙන් නිදොස් නො කෙරේද, එහෙයින් අථ ඛො නං ඛිපපමෙව ආදිමාහ යනාදිය වදාළහ.

දහරො තරුණ වූයේ, කුමාරො මහළු නොවූයේ, මන්දො ඇස් කන් ආදීන්ගේ මන්ද භාවයෙන් මන්ද වූයේ, උත්තාන සෙය්‍යකො ඉතා තරුණ බවින් උඩුකුරුව නිදන්නේ දකුණු හෝ වම් ඇලයෙන් නිදන්නට නොහැකි වෙයි. අංගාරං අකකමිත්වා එහාට මෙහාට දිගුකරන අතින් හෝ පයින් හෝ ස්පර්ශකොට, මෙසේ ස්පර්ශ කරන මිනිසුන්ගේ අත් වහා නො දවයිද, ඇතැම් කෙනෙක් අඟුරු ගෙන පෙරළෙමින් දුරට යති. තරුණයාගේ අත් පා සීතල වෙති. හේ ස්පර්ශ කළ ඇසිල්ලකින්ම දවමින් 'චිරි' යයි හඬින් හකුළුවයිද, එහෙයින් මෙහි තරුණයෙක්ම දක්වන ලද, මහල්ලෙක් දවනු ලබන්නේ ඉවසයි. මොහුට ඉවසීමට නො හැක්කේය. එහෙයින්ම තරුණයෙක්වම දක්වන ලදී. දෙසෙති ඇවත පිළිගන්නා සමාන සහාග පුද්ගලයකු ඇති කල්හි එක් දවසක් හෝ රැයක් හෝ නොඉවසා රාත්‍රියෙහි චතුරංග අන්ධකාරයෙහි පවා සහාග භික්ෂුව වසන තැනට ගොස් ඇවැත දේශනා කෙරේ ම ය.

උච්චාවචානි උස් පහත් වූ, කිං කරණීයානි කුමක් කෙරෙම්දැයි මෙසේ කියා කළයුතු ක්‍රියාවෝ, එහි උසස් ක්‍රියා නම් සිවුරු මැහීම, පඬු පෙවීම, චෛත්‍යයේ පිරිසිදු කිරීම් ආදිය, පොහොය ගෙයි, චේතිය ඝරයෙහි, බෝධිඝරයෙහි කළයුතු වතාවත් ආදී ක්‍රියාවන් කිරීම ආදියයි. පහත් ක්‍රියා නම් පා සේදීම, තෙල් ගැල්වීම ආදී කුඩා කාර්යයන්ය. නොහොත් සෑයෙහි සුණුකම් කිරීම උසස් ක්‍රියාවකි. එහි කහට දිය වත්කිරීම, ඉනිමං බැඳීම, කොහු බැඳීම ආදිය කුඩා ක්‍රියාවන්ය. උසසුකකං ආපනෙනා හොති උත්සුක බවට කළයුතු බවට පිළිපන්නේ වෙයි. තිබබාපෙකඛා හොතීති බහුල වූ ප්‍රාර්ථනා වේ.

ථමඤ්ඤව ආලුමපති තණ ද කඩමින් කයි. වච්ඡකඤ්ඤව අපචිනති වසුපැටියා ද බලයි. තරුණ වස්සකු ඇති දෙනක් වස්සා සමග වනයට

ආයේද, වස්සා හැර දෙන දුරට නොයයි. නුදුරු තැන හැසිරෙමින්ම තණ කඩාගෙන කමින්ම ගෙල ඔසවා අනිවාර්යයෙන්ම (වරින්වර) වස්සාම බලයි. එපරිද්දෙන් සෝවාන් පුද්ගලයා විචාරා කළයුතු උස්පහත් වූ ක්‍රියාවන් කරමින් ඊට නැමුණේම නො ලිහිල්ව පුරන්නේ ම වෙයි. තීව්‍ර වූ කැමැත්ත ඇතිව දැඩි වූ ප්‍රාර්ථනා ඇතිවම කෙරෙයි.

මහා සෑයෙහි සුණුකම් කරන කල්හි එක් ආර්ය ශ්‍රාවකයෙක් එක් අතකින් හුණු බඳුන ද එක් අතකින් කොස්සද ගෙන සුණුකම් කරන්නෙමියි සෑමළුවට නැංගේය. කාය ශක්තියෙන් දැඩි වූ එක් මහණෙක් තෙරුන් සමීපයේ සිටියේය. තෙරුන්වහන්සේ අනිකෙක් ඇති නිසා ප්‍රමාද වේයයි එතැනින් වෙනත් තැනකට ගියේය. ඒ මහණ ද එහිම ගියේය. තෙරුන් වහන්සේ නැවත වෙනත් තැනකට ගියේය. ඒ මහණ ද එහි ගියේය. තෙරුන් වහන්සේ යළි අනිත් තැනකට ගියේය. මෙසේ තුන්වෙනි තැනටද ආ ඒ භික්ෂුවට සත්පුරුෂය, සෑමළුව විශාලය. කිම ද වෙනත් තැනක ඉඩක් නැත්ද, ඇසීය. එකල්හි අනික් මහණ නික්ම ගියේය.

බලතාය **සමන්නාගතො** බලයෙන් යුක්ත වූයේ, **අටඨිකත්වානි** ප්‍රයෝජන ඇතියෙක් වී **මනසිකත්වා** සිත්හි තබා, **සබ්බ චෙතසො සමන්නාහරිත්වා** මද පමණ වූත් වික්ෂේපයක් නො කරමින් මුළු සිතින්ම එළවා, **ඔහිත සොතො** බහා තැබූ කන ඇතිව, (බණ ඇසීමටම යොමු කළ කන් ඇතිව)

යම්හෙයකින් ආර්යශ්‍රාවකයෝ ධර්මශ්‍රවණයට ප්‍රිය වෙත් ද, මනාප වෙත් ද, (එවැන්නන්) බණ අසන තැනට ගොස් නිදි කිරමින් හෝ වෙනත් කිසිවකු සමග කථා කරමින් හෝ කලබලකාරී සිත් ඇතිව හෝ නො හිඳිත්. අමෘතය, වළඳන්නවුන් මෙන් ධර්මශ්‍රවණයෙන් සතුටට පැමිණියාහු වෙත් ද, අරුණ නැගීමද නො දනී. එහෙයින් මෙසේ වදාළහ.

ධම්මතා සුසමන්තිටඨා හොති ස්වභාවය මනාකොට විමසන ලද්දේ වෙයි. **සොතාපත්තිඵල සච්ඡිකිරියාය** යනු කරණ වචනයි. සෝවාන් ඵලය පසක් කළ නුවණින් යන අර්ථයි. **එවං සතතංග සමන්නාගතො** මෙසේ මහා ප්‍රත්‍යවේක්ෂා ඤාණ සතින් යුක්ත වූයේ මේ පළමුව දක්වන්නේ ආචාර්යවරුන්ගේ සමාන කථා ය. එනම් ලොව්තුරා මග, බහු චිත්තක්ෂණික වූයේ නම් නැත.

විරුද්ධවාදීහූ වනාහි ඒක චිත්ත ක්ෂණික වූ මාර්ගයක් නම් නැතැයි (කියත) 'එවං භාවෙය්‍ය සත්ත වසසානි' කී හෙයින් සත් වසකුදු මාර්ග භාවනාව වෙයි. ක්ලේශයෝ වහා සිඳෙන්නාහුය. නුවණ සතකින් සිඳෙතියි කියයි. හෙතෙම සූත්‍රයක් දක්වන්නැයි කිය යුතු. ඒකාන්තයෙන් අනිකක් නො දක්නේ '**ඉදමසස පඨමං ඤාණං අධිගතං හොති - ඉදමසස දුතියං ඤාණං -පෙ- ඉදමසස සත්තමංඤාණං අධිගතං හොති**' යන්න ගෙනහැර දක්වන්නේ ය. කිමෙක් ද මේ සූත්‍රය නෙය්‍යාර්ථ ද නීතාර්ථ ද, නීතාර්ථයයි කියන්නේ ය. සූත්‍රය යම්සේ ද අර්ථය එසේම වේ. හෙතෙම මෙසේ කිවයුතුය. 'ධම්මතා සුසමනනිට්ඨා හොති, සොතාඵල සච්ඡිකිරියාය' මෙහි අර්ථය කවරේද, ඒකාන්තයෙන් සෝවාන්ඵලය පසක් කිරීම පිණිසය. ඉක්බිතිව කිවයුතු. මාර්ගයෙන් යුක්ත වූයේ ඵලය පසක් කෙරේද, ඵලයෙන් යුක්ත වූයේ 'මාර්ගය'ද (හෙතෙම) දන්නේ ඵලයෙන් යුක්ත වූයේ පසක් කෙරේය යන්නය. 'එවං සපතංග සමනනාගතො ඛො භිකඛවෙ අරිය සාවකො සොතාපතති සමනනාගතො හොති' තොපට මේ මාර්ගය නොවඩා මැඩියෙකු මෙන් පැන ආර්යශ්‍රාවක ඵලයම ගන්නේද, මා විසින් සූත්‍රයක් ලදැයි යම් ඒ (කටට ආවක්) නො කියව. ප්‍රශ්න විසඳන්නහු විසින් නම් ආචාර්යවරුන් සමීපයේ වැස බුද්ධවචනය ඉගෙන, අර්ථ රසය විඳ කිවයුතු වන්නේය. මේ ඥාන සත ප්‍රත්‍යවේක්ෂා ඥානම වේ. ලෝකෝත්තර මාර්ගය බහු චිත්තක්ෂණික වූයේ නම් නැත. ඒක චිත්ත ක්ෂණික වූයේම යයි හැඟවිය යුතුය. ඉදින් පිළිගන්නේ නම් පිළිගන්වා නො පිළිගන්නේ නම් යව උදෑසනම ආරාමයට ගොස් කැඳ බොවයි යැවිය යුත්තේ ය. සෙසු තන්හි අර්ථය ප්‍රකට මැයි.

කෝසම්බක සූත්‍ර වර්ණනාව
නිමියේය.

1-5-9

එවමෙම සුතං බ්‍රහ්ම නිමන්තික සූත්‍රයයි. එහි **පාපකං දිට්ඨිගතං** ලාමක වූ ශාස්වත දෘෂ්ටිය, **ඉදනිච්චං** යනු මේ අවකාශ සහිත වූ අනිත්‍ය වූ, බ්‍රහ්මස්ථානය නිත්‍ය යයි කියයි. ධුවං යනු ද එයටම සමාන අර්ථයි. එහි 'ධුවං' ස්ථිරය. **සසසතං** සදාකල්හිම විද්‍යමාන වේ. කෙවලං අඛණ්ඩය. සියල්ලය. **අවචන ධම්මං** චුත නොවන ස්වභාවය. **ඉදං හි න ජායති** ආදියෙහි මෙතැන කිසිවකු උපදින්නේ හෝ මිය යන්නේ හෝ ප්‍රතිසන්ධි වශයෙන් පැමිණෙන්නේ හෝ නැත යනු සඳහා කියයි. **ඉතො ච පනඤ්ඤං** මේ අවකාශ සහිත වූ බ්‍රහ්මස්ථානයෙන් මත්තෙහි අන්‍ය වූ නිශ්ශරණයක් නම් නැත. මෙසේ ස්ථාවරත්වයට පැමිණි ඔහුට ශාස්වත දෘෂ්ටිය උපන්නේ වෙයි. මෙසේ කියන්නා වූ හෙතෙම මත්තෙහි තුන් ධ්‍යාන භූමි, සතරමාර්ග, සතරඵල, නිවන යන මේ සියල්ල නැතැයි කියයි. (ප්‍රතික්ෂේප කරයි) **අවිජජාගතො** අවිද්‍යාවට ගියේ, අවිද්‍යාවෙන් අන්ධ වූයේ **යත්‍ර හි නාම** යමෙක් නම්,

අථ ඛො භිකඛවෙ මාරො පාපිමා මාරයා භාග්‍යවතුන් වහන්සේ කෙසේ දැක්කේ ද, මාරයා වූ කලි කලින් කල තමන්ගේ භවනයෙහිම හිඳ ශාස්තෘන් වහන්සේ පිළිබඳව සොයා බලයි. මහණ ගොයුම් අද කොහේ ඉන්නේ ද, කවර ගමක හෝ නියම්ගමක වෙසේද, ඒ අන්දමට මෙදින ශාස්තෘන් ගැන බලන්නේ උක්කට්ඨා නුවර ඇසිරිකොට සුභග වනයෙහි වාසය කරතියි දැන, දැන් කොහේ ගියේදැයි බලන්නේ බ්‍රහ්මලෝකයට යන බව දැක, 'ශ්‍රමණ ගෞතමයන් බඹලොවට යයි. එහි ගොස් එහිදී දහම් දෙසා බ්‍රහ්ම සමූහයා මාගේ විෂය නො ඉක්මවාද, ඉන් පෙර ගොස් බ්‍රහ්මයන් තුළ ධර්මදේශනාවට කැමැත්ත නැති බව කරන්නෙමියි ශාස්තෘන් වහන්සේගේ පියවරින් පියවර ගොස් බ්‍රහ්ම සමූහයා අතර නො පෙනෙන ශරීරයෙන් යුතුව සිටියේය. හෙතෙම ශාස්තෘන් වහන්සේ විසින් බක බ්‍රහ්මයා කෙරෙහි අප්‍රසාද බව දැන බකබ්‍රහ්මයාට උඵස්ථම්භකව සිටියේය. **අථඛො භිකඛවෙ මාරො පාපිමා** යන්න එහෙයින් කියන ලදී. **බ්‍රහමපාරිසජ්ජං අඤ්ඤා විසිත්වා** බ්‍රහ්ම පාරිසජ්ජයෙහි එක් බ්‍රහ්මයකුගේ ශරීරයට ආවේශව එහෙත් මහා බ්‍රහ්මයාට හෝ බ්‍රහ්ම පුරෝහිතයන්ට ආවේශ වන්නට නො හැකි වේ. **මෙතවාසදො** මොහුට නින්දා නොකරව.

අභිභූ මැඩපවත්වාගෙන සිටියේ අනභිභූතෝ අනෙක් අය විසින් මැඩ නොපවත්වන ලද්දේ, අඤ්ඤදත්ථු ඒකාන්ත වචනයෙහි නිපාතය. දැකීම් වශයෙන් දසෝ සියල්ල දකියි යයි දක්වයි. **වසවත්ති** සියලු ජනයා වශයෙහි පවත්වයි. **ඉස්සරෝ** ලොවට ඊශ්වර වූයේ, **කත්තා නිම්මාතා** ලෝකය පිළිබඳ කර්තෘ ද නිර්මාතෘ ද වූ, පොළව, හිමවත, සිනේරු පර්වතය සක්වළ, මහා සමුද්‍ර, සඳ හිරු මේ සියල්ල මොහු විසින් මවන ලදැයි දක්වයි.

සෙට්ඨා සජ්ජිතා මෙතෙම ලොවට උතුම් වූයේ ද, සකස් කරන්නේද වෙයි. ඔබ ක්ෂත්‍රිය වෙව, ඔබ බ්‍රාහ්මණි වෙව. ඔබ වෛශ්‍ය වෙව. ඔබ ශූද්‍ර වෙව. ඔබ ප්‍රව්‍රජිත වෙව. යටත්පිරිසෙයින් ඔටු වෙව. ගොනෙක් වෙව. මෙසේ මේ සත්ත්වයා බෙදා වෙන් කරන්නේ ඔහුම බව දක්වයි. **වසී පිතා භූත භව්‍යානං** මෙතෙම පුරුදු පුහුණු කළ වශී බව ඇති බැවින් වශීය. මෙතෙම භූතයන්ටද භව්‍යයන්ට ද පිතෘ යයි කියයි.

එහි අණ්ඩජ-ජලාබුජ සත්ත්වයෝ ද, ඇතුළු බිජුවටෙහි ද ඇතුළු වස්තියෙහි ද සුදුස්සෝම වෙති. භව්‍යයෝම වෙති. පිටත නික්මීමේ පටන් භූතයෝ වෙති. සංස්වේදජයෝ පළමුවන චිත්තක්ෂණයෙහි භව්‍යයෝය. දෙවැනි චිත්ත ක්ෂණයේ පටන් භූතයෝය. ඕපපාතිකයෝ පළමුවන ඉරියව්වෙහි භව්‍යයේය. දෙවන චිත්ත ක්ෂණයේ පටන් භූතයෝ යයි දතයුතුයි. ඒ සියල්ලෝම මොහුගේ දරුවෝය යන සංඥාවෙන් **පිතා භූත භව්‍යානං** යනාදිය කීහ.

පඨවිගහෙකා යම්සේ තෙපි මෙකල්හි අනිත්‍යය, දුකය. අනාත්මය යයි මහපොළව ගර්හා කරයි ද, පිළිකුල් කරයි ද, එසේ ඔව්හු ද පෘථුවිය ගරහන්නෝ වූහ. හුදෙක් තෙපිම නොවේයයි දක්වයි. **ආපෙ ගරහකා** ආදියෙහි ද මෙම ක්‍රමයමැයි. **හීනෙ කායෙ පතිට්ඨිතා** සතර අපායේ උපන්නාහුය. **පඨවි පසංසකා** යම්සේ තෙපි එසේ නිගරු කෙරෙයි ද, එසේ නො ගරහා නිත්‍යය, ස්ථිරය, ශාස්වතය, නො සිඳිය හැකිය නො බිඳිය හැකිය. ක්ෂය නොවේ යයි පෘථුවියට පසසන්නාහු මහපොළවේ ගුණ කියන්නාහු වූහයි කියයි. **පඨවාහි නන්දිතෙ** තණ්හා දිට්ඨි වශයෙන් පොළවට සතුටු වන්නාහු සෙසු පදයන්හි ද මෙම නයයි. **පණීතෙ කායෙ පතිට්ඨිතා** බ්‍රහ්ම ලෝකයේ උපන්නාහු ය.

තං තාහනති මේ කාරණයෙන් මම **ඉංඝ** යනු චෝදනාර්ථයෙහි නිපාතය. **උපාතිවතතිත්‍ථෝ** ඉක්මව 'උපාතිවතතිතෝ' ද පාඨයක් වේ. මේ තේරුම ම යි. **දණ්ඩෙඩන පටිපජනාමෙය්‍ය** සතර රියන් මුගුරකින් තළා පලවා හරින්නේ ය. **නරකපපපාතෙ** රියන් සියයක් පමණ වූ නරාවෙළක, **විරාධෙය්‍යා** අතින් ගතයුතු තැන හෝ, පයින් සිටිය යුතු තැන හෝ ගැනීම් සිටීම් දෙක කරන්නට නො හැකි වන්නේ ද, **න නු ත්වං භිකඛු පසසසි** මහණ තෙපි රැස්ව සිටින්නා වූ, බබළන්නා වූ, දිලිසෙන්නා වූ, මේ බ්‍රහ්ම පිරිස නො දක්නෙහි ද, බ්‍රහ්මයාගේ අවවාදයෙහි සිටින්නවුන්ගේ සෘද්ධ්‍යානුභාවය දක්වයි. **ඉති ඛො මං භිකඛවෙ මාරො පාපිමා බ්‍රහම පරිසං උපනෙසී** පාපී වූ මාරයා ශ්‍රමණය, තෙපි යසසින් ද, ශ්‍රියාවෙන් ද බබළන්නා වූ බඹ පිරිස නො දක්නෙහි ද, තෙපිත් මහ බඹුගේ වචනය නො ඉක්මවා, නුඹට යමක් බ්‍රහ්මයා කියයිද එය කරන්නෙහි. නුඹත් මෙපරිද්දෙන් ම යසසින් ශ්‍රීයෙන් බබළන්නෙහි යයි කියමින් මා බඹ පිරිසට එළවූයේය. එක් කළේය.

මා ත්වං මඤඤත්‍ථෝ තෙපි නහමක් නො සිතව, **මාමෙ තිමසි පාපිමා** නුඹ මහජනයා මරණ හෙයින් මාරයාය. මහජනයාට පවිටු ලාමක, විපත් පමුණුවන හෙයින්ම පාපිමත් මාරයාම ය. මම තා දනිමි.

කසිණං ආයුනති සියලු ආයුෂ තෙචො එව ජානෙය්‍යුං ඔව්හූ මෙසේ මහත් තපස්කමින් යුක්තයෝය. තෙපි ඉපදී පළමු දිනයෙහිම කුමක් දන්නේද, තොපගේ කටේ අදත් කිරිසුවඳ හමා යයි. **පඨවි අපෙඤඤා සිසසසි** පෘථුවිය ද ඇතුළුව ගිල නිමවා තෘෂ්ණා මාන දෘෂ්ටීන් ගන්නෙහි **ඔපසායිකො මෙ භවිසසසි** මා සමීපයේ වසන්නෙක් වන්නෙහි, මා අනුව යන්නෙකු වන්නෙහි. සිටියහු සමීපයේ සිටින්නෙහි, හුන්නහු අනුව හිඳිනෙහි, හොත්තහු අනුව හෝනෙහි යන අර්ථයි. **වත්‍ථු සායිකො** මගේ වස්තුවෙහි සයනය කරන්නේ **යථාකාම කරණීයො බාහිතෙය්‍යාසී** මා විසින් තමාගේ කැමැත්තෙන් යමක් කැමති වෙම් ද, එය කළයුතු වූයේ, යළි යටපත් කොට ද (පණ්ඩරිකා)

ලැහැබකටත් වඩා ඉතා පහත් වූවෙක් ඉතා මිටි වූවෙක් කළ යුතු වන්නෙහිය යන අර්ථයි.

මෙයින් මෙතෙම භාග්‍යවතුන් අවමන් කරන්නේ වෙයි. නළවන්නේ හෝ වෙයි. නළවන්නේ නම්, මහණ, ඉදින් අපි තෘෂ්ණා දෘෂ්ටීන් මහපොළව ඇතුළත්කොට ගන්නේ නම්, මට අනුව වසන්නෙක් වන්නෙහි. මා යන කල යන්නෙහි, සිටින කල සිටිනෙහි, හිඳන කල හිඳිනෙහි, හෝනාකල හෝනෙහි මම තොප සෙසු ජනයා අත්හැර විශ්වාසවන්තයෙක් ඇතුළත් වූවෙක් කරන්නෙමි. මෙසේ පළමුව නළවයි. අනෙක් පදයන්ගෙන් නින්දා කරන්නේ නම් ඉදින් තෙපි මහපොළව ඇතුළත්කොට ගන්නෙහි නම්, මාගේ විෂය සංඝයාත වස්තුවෙහි හෝනේ වෙයි. මගේ ගමන්බිමන් බලා යන්නෙහි හෝ සිටින්නෙහි හෝ ඉඳින්නෙහි හෝ හෝනෙහි හෝ වන්නේ ය. මාගේ වස්තුවෙහි මට අරක් ගන්නෙහි, මම තා කැමති සේ යටපත් කොට.....

ලැහැබකටත් වඩා ඉතා මිටි වූවෙක් කරන්නෙමි. මෙසේ නින්දා කරන්නේ ය. යම්හෙයකින් මේ බ්‍රහ්ම මාන නිශ්‍රිත වී ද, එහෙයින් මෙහි නින්දාවම අදහස් කරන ලදී. ආපං යනාදියෙහි ද මේ ක්‍රමයමැයි.

අපි ච තෙ අහං බහමති මේ වනවිට භාග්‍යවතුන් වහන්සේ මම දනිමි. මේ බ්‍රහ්ම මාන නිශ්‍රිතය. තමන්ගේ යසසින් මත් වී සිටින ශරීරය ස්පර්ශයට ද සමත් කිසිවෙක් නො දකී. මදක් නිග්‍රහ කරන්නට වටී යයි සිතා මේ ධර්මදේශනාව ආරම්භ කළේය. එහි **ගතිඤ්ච පජානාති** උත්පත්තිය ද දනිමි. **ජුතිඤ්චාති** ආනුභාවය (බලය ශක්තිය) ද දනිමි. **එවං මහෙසක්ඛා** මෙසේ මහත් කීර්තියයි. මහා පිරිවරය.

යාවතා චන්දිමා සුරියා පරිහරන්ති යම් පමණ තැන්හි සඳ හිරු දෙදෙන සැරිසරත් ද, **දිසා භන්ති විරොචනා** ඒ දිශාවන් බබළවමින් දීප්තිමත් වෙත් ද, **තාව සහස්සධා ලොකො** එපමණකින් සහශ්‍රීලෝක ධාතුවයි. මේ සක්වල සමග සක්වල දහසෙක යන අර්ථයි. **එත්ථ තෙ වත්තතී වසො** මේ සක්වල දහසෙහි ඔබගේ බලපරාක්‍රමය (වශය) පවතී. **පරොචරං නාජානාසි** යන මෙහි සක්වල දහසෙහි පරාචර වූ උසස් පහත් වූ හීන ප්‍රණීත වූ සත්ත්වයන් දන්නෙහි, **අථො රාග විරාගීනං හුදෙක්** මේ තෙම සමෘද්ධයෙක. මෙතෙම ප්‍රකෘති මිනිසෙක.

යළි මෙතෙම රාග චරිතයෙක, රාග සහිතය. මෙතෙම පහ වූ රාග ඇත්තේය. රාග විරාගී ජනයා ද දන්නේ ය. **ඉත්ථභාවඤඤථා භාවං** මෙහි

ඉජ්ඣාභාවං යනු මේ සක්වළ ය. අඤ්ඤථාභාවං යනු මෙයින් වෙනස් වූ එකුන් දහසක් සක්වලය. **සතතානං ආගතිං ගතිං** මෙහි මේ සක්වළ දහසෙකි. පිළිසිඳීම් වශයෙන්, සත්ත්වයන්ගේ පැමිණීම ද, චුති වශයෙන් ඉවත්වීම ද දන්නෙකි. එහෙත් ඔබට මම ඉතා මහත් එකක් කියමි. නුඹ සහශ්‍රී බ්‍රහ්ම නමැයි හැඟීම පමණි, නුඹ සහශ්‍රී බ්‍රහ්මය, ඔබට ඔබට වැඩි ද්වි සහශ්‍රී ත්‍රිසහශ්‍රී චතු සහශ්‍රී, පංච සහශ්‍රී දස සහශ්‍රී ශත සහශ්‍රී බ්‍රහ්මයන්ගේ ප්‍රමාණයක් නැත. නුඹ සතර රියන් රෙදිකඩක් පමණ ගන්නට උත්සාහ දරන්නෙකු මෙනි ය. නිග්‍රහයට පත් කළේය.

ඉධූපපන්නෙනා මෙහි පළමුවන ධ්‍යාන භූමියේ උපන්නේ, **තෙන තං ත්වං නජානාසි** ඒ කරුණෙන් ඒ කය නුඹ නො දන්නෙහි, **නෙව තෙ සමසමෝ දතයුතු** තැනට පැමිණියද, ඔබ හා සම සමයෙක් නො වෙමි. **අභිඤ්ඤාය ප්‍රඥාවෙන් කුතෝ නීචෙය්‍යං** නුඹට වඩා පහත් බවක් මට කොයින්ද, මේ බ්‍රහ්ම වනාහි උඩ බඹලොවින් චුතව පහළ බඹලොව උපදනා කෙනෙකි. බුද්ධෝත්පාදයක් නො පැමිණි කල්හි තවුස් පැවිද්දෙහි පැවිදිව කිසිණු පිරියම්කොට සමවත් උපදවා නො පිරිහුණු ධ්‍යාන ඇතිව කලුරිය කොට චතුර්ථධ්‍යාන භූමියෙහි බ්‍රහ්මලෝකයේ කල්ප පන්සියයකට ආයු ඇතිව උපන්නේ ය. එහි ආයු ඇති තෙක් සිට යට බඹලොව උපදින්නට හේතු වූ තෘතිය ධ්‍යානය ප්‍රණීත කොට වඩා සුභකිණ්හක බ්‍රහ්ම ලෝකයෙහි කල්ප හැටහයක් ආයු ඇතිව උපන. එහිදී ද්විතියධ්‍යානය වඩා ආභස්සරයෙහි කල්ප අටක් ආයුෂ ඇතිව උපන. එහිදී ප්‍රථමධ්‍යානය වඩා ප්‍රථමධ්‍යාන භූමියේ කල්පයක් ආයු ඇතිව උපන. හෙතෙම ප්‍රථම කාලයේ තමන් කළ කර්මය ද, උපන් තැන ද දැන ගත්තේය. එහෙත් කල්‍යාමෙන් ශාස්වත දෘෂ්ටිය ඉපදවීය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ **තං ත්වං පජානාසි -පෙ- කුතෝ නීචෙය්‍යං** යන්න වදාළහ.

එවිට බ්‍රහ්මයා මෙසේ සිතීය. ශ්‍රමණ භවත් ගෞතමයෝ මගේ ආයුෂද උපදිනු තැන් ද, පෙර කරන ලද කර්මයන් ද සියල්ල දනිති. හොඳයි මම පෙර කළ කර්මය විචාරමි යි තමන් විසින් කරන ලද පූර්ව කර්මය ශාස්තෘන්ගෙන් විචාළේය. ශාස්තෘහු මෙසේ වදාරති.

අතීතයේ බ්‍රහ්ම කුල ගෙදරක ඉපිද, කාමයන්හි ආදීනව දැක ජාති ජරා ව්‍යාධි මරණ දුරු කරන්නෙමියි සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව සමාපත්තීන් උපදවා අභිඥාපාදක ධ්‍යානලාභීය ගංඉවුරක පන්සලක් කරවා ධ්‍යාන

සුව විඳිමින් කල්යැවීය. එකල්හි කලින් කල සාර්ථවාහකයෝ (කරත්තවලින් බඩු විකුණන්නෝ) ගැල් පන්සියයක බඩු පටවාගෙන මාරක කාන්තාරයට පිවිසෙත්. මරුකතර වනාහි දහවල් කාලයේ යන්නට නුපුළුවන. රාත්‍රී කාලයෙහිම ගමන වේ. එකල මුල් කරත්තයේ අශ්වියෙහි බැඳි ගවයෝ යෙමින් යෙමින් නැවතෙමින් පළමු ආ මගටම සේන්දු වූහ. සියලු කරත්ත එසේ නැවතුනහ. හිරු නැගි කල්හි කරත්ත නැවති බව දැනගත්හ. එදින දවස ඔව්හූ කතරින් එතරවිය යුතු දවස විය. සියලු ජලය දර අවසන් වී තිබුණි. එහෙයින් අපගේ ජීවිත නැතැයි සිතා ගවයන් කරත්ත රෝදවල බැඳ මිනිස්සු කරත්තවල සෙවණැලි යට නිදාගත්හ. තාපස තෙමේ කලින්ම පන්සලෙන් නික්ම පන්සල් දොර උන්නේ, ගඟ මහ වතුරෙන් පිරී පෙරැළී එන්නා වූ මැණික් කඳක් මෙන් දිටීය. එය දුටු තවුසා 'මෙබඳු මිහිරි ජලය නොලැබීමෙන් දුක් විඳින සත්ත්වයෝත් ඇත්දැයි' සිතීය. හෙතෙම මෙසේ ආවර්ජනය කරමින් සිටියදී මරුකතර දිය නොලැබ සිටින ගැල් සාත්තුව දැක 'මේ සත්ත්වයෝ නො නැසෙත්වා. මේ මහදිය කඳ සිදී මරුකතර කරත්තකරුවන්ට පෙනෙන සේ ඉදිරියෙන් යේවා'යි අභිඥා චිත්තයෙන් අධිෂ්ඨාන කළේය. එසේ සිතීමත් සමගම ඇලකින් ගලා යන්නා සේ වතුර එහි ගියේය. මිනිස්සු දියහඬින් නැගිට ජලය දැක සතුටු වී දිය නා ජලය බී ගොනුන්ට ද පොවා සුවසේ තමන් කැමති තැනට ගියාහුය. ශාස්තෘන් වහන්සේ මේ බ්‍රහ්මයාගේ එම පූර්වකර්මය දක්වමින් මෙසේ වදාළහ.

යං තවං අපායෙසි බහූ මනුසෙස - පිපාසිතෙසමමනි සමපරෙතෙ
තං තෙ පුරාණං වත සීල වනතං - සුතතපප බුදෙධා ව අනුසසරාමි

නුඹ හටගත් සා පිපාසා ඇති, ග්‍රීෂ්මයෙන් අතිශයින් පීඩිත වූ ක්ලාන්ත වූ බොහෝ මිනිසුන්ට පැන් පෙවූහ. ඔබ විසින් කරන ලද පැරණි වූ ඒ ව්‍රත සමාදානය හා ශීල ව්‍රතය නිදා පිබිදියකු අලුයම දුටු සිහිනයක් මෙන් සිහි කරමි.

ශාස්තෘන් වහන්සේ ඒ බ්‍රහ්මයාගේ (තවත්) පූර්ව කර්මයක් දක්වමින්

මෑත කාලයේ තාපසයා ගංතෙර පන්සලක වන ගමක් ඇසුරුකොට වසයි. එකල්හි සොරු ඒ ගම කොල්ලකමින් මිනිසුන්ගේ හස්තසාර වස්තුව ද, දෙනුන් ගොනුන් ආදී ජංගම වස්තූන් ද පැහැරගෙන යති. ගව

දෙනුන් ද බල්ලෝ ද මිනිස්සු ද මහ හඬින් හඬත්. තාපසයා ඒ ශබ්දය අසා මේ කිමෙක්දැයි ආවර්ජනා කර බලද්දී මිනිසුන්ට භයක් උපන් බව දැන 'මා දක්නා කල්හි මේ සත්ත්වයෝ නො නසිත්වා'යි අභිඥා පාදක ධ්‍යානයට සමවැදී නැගී සිට අභිඥා සිතෙන් සොරුන්ගේ ඉදිරියට එන ආයුධ සම්පන්න සිවුරඟ සෙනගක් මැවීය. සොරු ඒ සිවුරඟ හමුදාව දැක රජු ආවේ වනැයි පැහැරගත් වස්තුව දමා පියා පලා ගියහ. තාපස තෙමේ යම් භාණ්ඩයක් අයිති නම් ඒ සියල්ල නියම හිමියන්ටම අත්වේවායි අධිෂ්ඨාන කළෙන් එය එපරිද්දෙන්ම සිදුවිය. මහජනයා දුකින් මිදී සැපතට පැමිණියහ. සර්වඥයන් වහන්සේ ඔහුගේ මේ පූර්ව කුසලයත් දැක්වූ සේක.

යං එණි කූලසමිං ජනං ගහිතං
අමෝ වයි ගයහක නීය්‍යමානං
තං තෙ පුරාණං වත සීලවනතං
සුතනපප බුදෙධාව අනුසසරාමි

ඒණි නම් නදී තීරයේ සොරුන් විසින් බලහත්කාරයෙන් අල්ලාගෙන යන ලද සත්ත්වයෝ මේ තවුසා විසින් මුදවන ලද්දාහ.

නැවත එක් කලෙක ගඟ ඉහල ඉසව්වේ ජීවත්වන මිනිස්සු ගඟ පහල ඉසව්වේ ජීවත්වන මිනිසුන් සමග සමගි සම්පන්නව නැව්, අඟුලු ගෙන බොහෝ කන බොන ජාති පුරවා මල්දම් ආදියෙන් සැරසී ගඟදියෙන් එති. මේ මිනිස්සු දිව්‍ය විමානයකින් යන අය මෙන් ඉතා ප්‍රීතිමත්ව ගී ගයමින් නටමින් යන්නාහුය. මේ ගඟ වසන බලවත් නාගරාජයෙක් මොවුන් දැක 'මොව්හු මා කෙරෙහි කිසිදු ගරුසරුවක් නැතිව ගමන් කරතියි කිපී මේ සියලු දෙන මුහුදට ඇද දමන්නෙමියි මහත් වූ අත්බවක් මවාගෙන ගඟ දිය දෙබෑ කොට පෙනය නගා සුස්වමින් පිඹිමින් එළවීය. මහාජනයා නාගරාජයා දැක 'බිය වී මහත් හඬින් කෑගැසූහ. මේ වෙලාවේ පන්සලේ හුන් තාපසයා, විමසන්නේ නා රජු දැක 'මා බලා සිටිද්දී මේ සත්ත්වයෝ විනාශ නොවේවායි අභිඥාපාදක ධ්‍යානයට සමවැද, අත්බැව හැර දමා ගුරුළු වෙසක් මවාගෙන නා රජු හමුවේ පෙනී සිටියේය. නා රජු බිය වී පෙණය හකුළුවා ගෙන දිය යටට ගියේය. මහජනයා සැපයට පැමිණියේය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ මේ පූර්ව කර්මයක් දැක්වූ සේක්,

ගංගාය සොතසම්ං ගහීත නාවං
ලුද්ධෙන නාගෙන මනුසසකම්‍යා
අමොචයිත්ථ බලසා පසය්හ
තං තෙ පුරාණ වත සීලවනතං
සුත්තපප බුදෙධා අනුසසරාති

ගඟ දියෙහි නැව්වලින් යන්නා වූ මහජනයා නසනු කැමතිව, ගඟ දියෙන් මතු වූ දරුණු වූ නාගරාජයාගේ බලය මැඩපවත්වා, මිනිසුන් උවදුරුවලින් මිදවීය.

නැවත එක් කලෙක මොහු ඉසි පැවිද්දෙන් පැවිදිව 'කේසව' තාපස නමින් ජීවත් විය. එසමයෙහි අප බෝසතුන් 'කපප' නම් තරුණයෙක්ව කේසව තාපසයන්ගේ අතවැසි වූයේය. ආචාර්යවරයන් වෙනුවෙන් සියලු වතාවත් කළ කප්ප, නුවණැත්තේ වැඩකරුම වූයේ විය. කේසව තාපසයන්ට ඔහුගෙන් වෙන්ව ජීවිතයක් නුවූයේය. ඔහු නිසාම ජීවිකාව කළේය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ පූර්ව චරිතයද දැක්වීය.

කපෙපා ච තෙ බදධවරො අහොසි
තං බුදධිමනතං වතිනං අමඤඤි
තං තෙ පරාණං වත සීලවනතං
සුත්තපප බුදෙධාව අනුසසරාමි

කප්ප නම් වූ අතවැසියෙක් ඔබට සිටියේය. ඔහු මහා නුවණැත්තේ විය. හිතයෙන් ද සම්පූර්ණ වූවාහු යයි සිතීය.

මෙසේ බඹහු නොයෙක් ආත්ම භාවයන්හි දී කළ කර්මයන් ශාස්තෘන් වහන්සේ හෙළිකළ සේක. ශාස්තෘන් එසේ වදාරද්දීම පහන් දහසක් දැල්වෙන කල්හී සෙවණැලි පෙනෙන්නාක් මෙන් ඔහුට සියලු කර්මයෝ ප්‍රකට වූහ. හෙතෙම පහන් සිතින් යුතුව මේ ගාථාව කීය.

අඪා පජානාමි මමෙත මායුං
අඤඤමපි ජානාසි තථාහි බුදෙධා
තථාහි තය්‍යායං ජලිතානුභාවො
ඔභාසයං තිට්ඨති බ්‍රහමලොකං

ඒකාන්තයෙන් මම මාගේ මේ ආයුෂය දන්නෙහි. එහෙයින් ඔබ බුද්ධ වූ බැවින් සියලු ධර්මයන් අවබෝධ කළ හෙයින් ම, ඔබගේ මේ දිලිසෙන ශරීරප්‍රභාවය මේ සියලු බඹලොව බබුලුවමින් පවතී.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මත්තෙහි ද අසම බව ප්‍රකාශ කරන සේක්, **පථවිං ඛො අහං බ්‍රහම** ආදිය වදාළහ. එහි **පථවියා පථවිතෙනන අනනු භූතනති** පෘථුවි ධාතුව විසින් පෘථුවිය ස්වභාවයෙන් අනනුභූතය. නො පැමිණෙන ලද ඒ කුමක් ද, නිර්වාණයයි. ඒ නිවන වූ කලී සියලු සංස්කාරයන්ගෙන් නික්මුණු බැවින්, පෘථුවි භාවයෙන් ද නික්මුනේ විය. **තදභිඤ්ඤා** ඒ නිවන පසක් කොට **පථවිං නාහොසි** පෘථුවි ධාතුව තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් නො ගත්තෙමි. **ආපං** ආපෝ ධාතු ආදියෙහි ද මෙම න්‍යායයි. විස්තර මූල පරියාය සූත්‍රයේ කී ආකාරයෙන් දතයුතුයි.

සචෙ ඛො මාරිස සබ්බසස සබ්බතෙන යනු මේ බ්‍රහ්මයා 'අත්තවාදී' තමා වාදී බැවින් 'සබ්බං' යනුවෙන් අකුරා දක්වා අකුරුවල දොස් දක්වමින් කීය. 'ශාස්තෘන් වහන්සේ වනාහි සත්කාය සඳහා මෙහිදී 'සබ්බං' යන්න වදාරති. බ්‍රහ්මයා 'සර්ව සර්වය' සඳහා කියයි. ඔබ සියල්ල යයි කියව, සර්වභාවයෙන් නො පැමිණෙන ලදැයි කියව. ඉදින් සියල්ල සර්වභාවයෙන් පැමිණෙන ලද්දේ නො වන්නේ ද, එකල්හි ඔහුගේ නො පැමිණීම ඇති. **මා හෙව තෙ රිත්තක මෙව අහොසි තුච්ඡකමෙව අහොසි** ඔබගේ වචනය හිස් නොවේවා. පහත් නොවේවා යි ශාස්තෘන් මුසාවාදයෙන් නිග්‍ර කරයි.

ශාස්තෘන් වහන්සේ වනාහි බ්‍රහ්මයාට වඩා සිය ගුණයෙන් දහස් ගුණයෙන් වාදීහසිංහ වේ. එහෙයින් මම සියල්ල කියමි. හෙළි නොවුනු දේද, (අප්‍රාප්තිය) කියමි. මාගේ වචන අසව යි බ්‍රහ්මයාගේ වාදය මර්දනය සඳහා කරුණු දක්වති. **විඤ්ඤාණං** යනාදිය වදාළහ. එහි **විඤ්ඤාණං** යනු විශේෂයෙන් දතයුතු දේයි. අනිදසසනං චක්ඛුර් විඤ්ඤාණයාගේ ඉදිරියට නො පැමිණෙන හෙයින් ආපාථයට නොඑන හෙයින්, **අනිදසසන**' නමි. දෙපදයෙන්ම උත්පාදය හා ව්‍යය (නිවන) අන්තරහිත බැවින් අනන්ත නමි වේ.

අනනවනනානි භූතානි - අසමභූතං අනන්තකං
අභූතෙ අනතා නදිසසනති - භූතෙ අනතා පකාසිතා

භූතයෝ උත්පාද ව්‍යය සංඛ්‍යාත අන්තය ඇත්තාහුය. අන්ත රහිත වූ නිවන, ප්‍රත්‍යයෙන් ඉපදුනේ නොවේ. නූපන් වස්තුවෙහි උත්පාද ව්‍යය අන්තයෝ නො දක්නා ලැබෙත්. භූතයෙහි අන්තයෝ ප්‍රකාශ කරන ලදහ.

සබ්බතො පභං සම්පූර්ණයෙන් ප්‍රභා සම්පන්න වූ නිවනට වඩා අනික් දහමක් ප්‍රභා සම්පන්න වූයේ, අතිශයින් බබළන්නේ අතිශයින් පිරිසිදු වූයේ අතිශයින් පණ්ඩර වූයේ හෝ නැත. සියළු තැන්හි ප්‍රභූ වූයේ හෝ එයම කිසිතැනක නැත්තේ නොවේ. **සබ්බතොපභං** පූර්ව දිශාව ආදී කිසිම දිසාවක නිර්වාණය නම් නැතැයි නො කිව යුතුය. **පභං** තීර්ථයට නමකි. සියලු තන්හි තොටුපළවල් ඇත්තේ මොහුටනුයි **සබ්බතො පභං** නිවනට වනාහි යම්සේ මහ මුහුදට යම් යම් තැනකින් බසිනු කැමැත්තෝ ඒ ඒ තැනින්ම බසිති. සෑම තැනම තොට වෙයි. නො තොටක් නම් නැත. එපරිද්දෙන් අටතිස් කමටහන් අතුරෙහි, යම් යම් දොරටුවකින් නිවනට බසිනු කැමැත්තාහු වෙත් ද, ඒ ඒ කමටහනම නිවනට තොටුපළ වෙයි. තොටුපළක් නො වූ කමටහනක් නැත. **සබ්බතො පභං** යනු ඒ සඳහා වදාරන ලදී. **තං පඨවියා පඨවිතෙතන** ඒ නිවන පෘථිවි ධාතුවගේ පෘථිවි ස්වභාවයෙන්, එයින් වෙනස් වූ ආපෝ ධාතු ආදීන්ගේ ඒ ඒ ස්වභාවයන්ගෙන්, **අනනුභූතං** මෙසේ තොප වැන්නවුන්ට විෂය වූ ත්‍රෛභූමක ධම්මජාතයක් වේද, ඒ සියල්ලට සර්වභාවයෙන් දතයුතු වූ, චක්ෂුර් විඥානයට ගොදුරු නොවූ උත්පාද, ව්‍යය, අන්ත රහිත වූ, මුළුමනින්ම ප්‍රභා සම්පන්න වූ ඒ නිවන අප්‍රාප්තයයි වාදය පිහිටවූ සේක.

ඉක්බිති බ්‍රහ්ම තෙම ගත් ගත් වාදය ශාස්තෘන් විසින් විසඳන ලද්දේ ගතයුතු කිසිවක් නො දැක ලලිතයක් (ලීලාවක්) කරනු කැමතිව, **හන්ද චරහි තෙ මාරිස අනතරධායාමි** එහි **අනතර ධායාමි** යනු අදෘශ්‍යමාන ප්‍රාතිහාර්යයක් කරමි. **සචෙ විසහසී** ඉදින් මට අතුරුදහන් වන්නට හැකි නම් අතුරුදහන් වෙහි. පෙළහර කරව. **නෙවසඤ්ඤ මෙ සකෙකාසි අනතරධායිතුං** මට අතුරුදහන් වන්නට නොහැකි වෙයි.

නැවත මේ බ්‍රහ්මයා කුමක් කරන්නට අරඅදියිද, චූල ප්‍රතිසන්ධියට යනු කැමති වෙයි. යම්හෙයකින් බ්‍රහ්මයන්ගේ මූල ප්‍රතිසන්ධියෙහි ආත්මභාවය සියුම් වූයේ අන්‍යයන්ට සුදුසු නොවේ ද, නිර්මිත කයින්ම සිටින්ද, ශාස්තෘන් වහන්සේ ඔහුට මූල ප්‍රතිසන්ධියට යාමට ඉඩ නුදුන්

සේක් ද, මූල ප්‍රතිසන්ධියට හෝ නොගොස් යම් අන්ධකාරයකින් මුවහ වී නොපෙනී යන්නෙක් වන්නේද, ශාස්තෘන් වහන්සේ ඒ අන්ධකාරය දුරුකළ සේක්, එහෙයින් අන්ධකාරයේ සැඟවෙන්නට ද නුපුළුවන් විය. එසේ අසමත් වන ඔහු විමානයෙහි සැඟවෙයි. කප්රුකෙහි සැඟවෙයි. උක්කුටිකයෙන් හිඳී. බඹ පිරිස අපහාස කළේය. මේ බක බ්‍රහ්මයා විමානයේ සැඟවෙයි. කප්රුකේ සැඟවෙයි. උක්කුටිකව හිඳියි. බ්‍රහ්මය, ඔබ අතුරුදහන් වෙතියි සිතීද හෙතෙම බඹ පිරිස විසින් පිරිහාස කරන ලදින් මතු විය.

එවං වුතෙත අහං භිකඛවෙ මහණෙනි, බක බ්‍රහ්මයා විසින්, භාග්‍යවතුන් වහන්ස, එසේනම් ඔබට අතුරුදහන් වෙමි. මෙසේ කී කල්හි අතුරුදහන් වන්නට නො හැකි වන්නා වූ ඔහු දැක මම මෙසේ කීමි. මේ ගාථාව කීහ. ශ්‍රමණ භවත් ගෞතමයන් මෙතැන්හි ඇති බව හෝ නැති බව කෙසේ දැනගන්නාහුද, දැන ගන්නේ කෙසේද, බ්‍රහ්ම සමූහයාගේ මේ වචනවලට ඉඩක් නොවේවයි අතුරුදහන් වූවහු ගාථාව කීය.

භවෙචායං භයං දිසවා මම සංසාරයේ බිය දැකම **භවං විභවෙසිනං** මේ කාම භවාදී ත්‍රිවිධ සත්ත්ව ස්වභාවය **විභවෙසිනං** ගවේෂණය කරන්නහු පර්යේෂණය කරන්නහු. නැවත නැවත භවයෙහිම සිටිනු දැක, **භවං නාභි වදිනති** තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් කිසිවක් නොගත්තෙමි යන අර්ථයි. **නන්දිඤ්ච න උපාදියිං** භව තණ්හාවට නොපැමිණියෙමි. නොගත්තෙමි.

මෙසේ චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කරමින් ශාස්තෘන් වහන්සේ ධර්මදේශනා කළ සේක. දේශනාව අවසානයේ දේශනාව අනුසාරයෙන් විදර්ශනාව ගැබ් ගන්වා, දස දහසක් පමණ බ්‍රහ්මයෝ මාර්ගඵල නමැති අමෘත පානය වැළඳූහ. **අචඡරිය අබභූත චිත්ත ජාතාති** උපන් ආශ්චර්ය ඇති, උපන් අද්භූත ඇති, උපන් සතුට ඇත්තෝම වූහ. **සමූලභවං උදබබහී** බෝමැඩදී තමන්වහන්සේගේ ද ධර්මදේශනා මගින් අනෙක් බොහෝ දෙව් මිනිසුන්ගේ ද, මුල් සහිත වූ භවය. **උදබබහී** මුලිනුපුටා දැමීය.

එකල්හි පාපී වූ මාරයා ක්‍රෝධයෙන් පරිපීඩිත වී මා හැසිරෙත්ම, 'මා ඉදින්ම ශ්‍රමණ ගෞතමයන් විසින් ධර්මකථා වදාරා දස දහසක් පමණ බ්‍රහ්මයෝ මගේ වශය ඉක්මව, මගේ බලපරාක්‍රමයෙන් ඉවත් කළහ. ක්‍රෝධයෙන් පීඩිත වූ බැවින් බ්‍රහ්ම පාරිසජ්ජයේ එක් බ්‍රහ්මයෙකුගේ ශරීරයේ ආවේශ විය. එය දක්වන්නට **අථඛො භිකඛවෙ** යනාදිය වදාළහ.

එහි **සවෙ තවං එවමනු බුදෙධා** ඉදින් ඔබ විසින්ම චතුස්සත්‍යය අවබෝධ කළාහු නම් **මා සාවකෙ උපනෙසි** ගිහි ශ්‍රාවකයන් ද, පැවිදි ශ්‍රාවකයන්ද ඒ දහමට නො පමුණුව. **හීන කායෙ පතිටඨිතා සතර අපායෙහි පිහිටියාහු පණීත කායෙ** බඹලොව පිහිටියාහූ, මේ කවුරුන් සඳහා කියත්ද, බාහිර ප්‍රවෘජ්‍යාවෙන් පැවිදි වූ තාපස පිරිවැජියන් සඳහාය. අබුද්ධෝත්පාද කාලයන්හි, කුලපුත්‍රයෝ තවුස් පැවිද්දෙහි පැවිදිව කිසිවකුගෙන් කිසිවක් නො විමසා එකවරම සමාපත්ති උපදවා බඹලොව උපන් අය සඳහා මෙය කියන ලදී.

අනකඛානං කුසලංහි මාරිස තථාගතයිනි, අනුන්ට නොකීම, අවවාද නොකිරීම, ධර්මකථා නොදෙසීම මැනවි. මෙය ශ්‍රේෂ්ටය. **මා පරං ඔවදාහි** වරක් දෙව්ලොව, කලක් බඹලොව, කලක් නා ලොව, කලක් මනුලොව ඇවිදිමින් නො හැසිරෙනු මැනව. එක්තැනක හිඳ ධ්‍යාන මාර්ග ඵල සැපයෙන් සමවත් සුව විඳිනු මැනව.

අනාලපනතාය කථා නොකරන බැවින් බ්‍රහ්මුනො **අභිනමනතනකාය** බ්‍රහ්මයාගේ **ඉදංහි මාරිස නිචචං** යනාදී වශයෙන් අවකාශ සහිත බ්‍රහ්ම ලෝකයෙන් නිමන්ත්‍රණ වචනයෙන් ද, **තසමා** ඒ කරුණෙන් මේ ධර්මයට බ්‍රහමනිමනතනික යයි නාමය උපන්නේ ය. සෙසු සියලු තන්හි අදහස් ප්‍රකටය.

බ්‍රහ්ම නිමන්තණික සූත්‍ර වර්ණනාව නිමියේය.

1-5-10

එවමෙමසුතං මාර තජ්ජනික සූත්‍රයයි. එහි **කොටඨ** මනු පවිටෙඨා කුසට පිවිස අතුනුබහන් ඇතුළත පක්වාසය ස්ථානයේ හුන්නේ ගරුගරු විය. මහත් බරක් මෙන්, තද වූ ගල් රැසක් මෙන් වූයේ **මාසාචිතං** මඤ්ඤ උඳු බත් කෑ අයකුගේ කුස මෙන්, උඳු පිරූ මල්ලක් මෙන්, තෙත්

උඳු යනුවෙන් ද අරුත් දක්වයි. **විහාරං පවිසිත්වා** වැළඳූ ආහාරවල දොසින් මේ බර බව ඇතිවී නම් අභ්‍යවකාශයේ සක්මන් කරන්නට නො හැකි නිසා සක්මනින් බැස පන්සලට පිවිස ස්වභාවයෙන් ම පනවා තිබූ ආසනයෙහි හිඳගත්තේය. **පවත්තනං යොනිසො මනසිකාසි** මේ කිමෙක්දැයි ආවර්ජනය කරමින් තමන් විසින් උපායෙන් හොඳ සිහියෙන් මෙනෙහි කළේය. තෙරුන් වහන්සේ තමන්ගේ ශීලය ආවර්ජනය කරමින් ඊයේ හෝ පෙරේදා වැළඳූ නොදිරවූ යමක් ඇත්නම් හෝ වෙනත් කිසියම් විෂභාග දෝෂයක් ඇත්නම් හෝ ඒ සියල්ල පහසුවෙන් දිරවාවයි අතින් කුස පිරිමැද්දහ. පාපී මාරයා සැඟවී යන්නේ ය. නැවත තෙරුන් වහන්සේ එසේ නො කොට උපායයෙන් මෙනෙහි කළහ.

මා තථාගතං විහෙසි යම්සේ දරුවන් වෙහෙස කළ කල්හි මවුපිය දෙදෙන වෙහෙස වෙද්ද, වෙහෙසනු ලබද්ද, සද්ධිවිහාරික, අන්තේවාසික යන් වෙහෙස කළ කල්හි ආචාර්ය උපාධ්‍යාය යෝ වෙහෙසට පත්වෙද්ද, ජනපදය වෙහෙසූ කල රජතුමා වෙහෙසට ලද්දේද, එපරිද්දෙන් තථාගත ශ්‍රාවකයකු වෙහෙසූ කළ තථාගතයන් වෙහෙසවන ලද ලද්දේමය. **මා තථාගතං විහෙසි** යන්න එහෙයින් කියන ලදී. **පවගගලෙ අටයාසි** දොර කවුළුවෙහි සිටියේය. අගගල යනුවෙන් කවුළුවද ගැනේ. මුඛයෙන් උඩට නැගී පන්සලෙන් නික්ම ජනේලය අසල සිටියේය යන අදහසයි.

භූතපුබ්බං පාපිමා කුමක් හෙයින් මේ දේශනාව ආරම්භ කළේද, ස්ථවිරයෝ මෙසේ සිතූහු. අහසේ සිටින දෙවියන්ට යොදුන් සියයක් දුරින් සිටි මිනිසකුගේ ගඳ පීඩා කරයි. **යොජන සත ඛො රාජඤ්ඤ මනුස්ස ගන්ධො දෙවෙ උබ්බහති** යන්න එහෙයින් කියන ලදී. එහෙත් මේ මාර නම් වූ, සියුමැලි හාත්පසින් පිරිසිදු වූ මහේශාක්‍ය වූ, ආනුභාව සම්පන්න වූ දෙවි රජෙක් මගේ කුසට පිවිස අතුනු ඇතුළත පක්වාසය් පිහිටි කුඩා ඉඩකඩෙහි හුන්නේ ඉතාම දුෂ්ට වූවෙක් වන්නේ ය. මෙවැනි පිළිකුල් කටයුතු වූ විපරීත වූ පෙදෙසක සිටින්නට හැකි වූ මොහුට කළ නො හැක්කේ වෙන කුමක්ද, වෙනත් කුමකින් ලජ්ජා වන්නේ ද, නුඹ මගේ නෑයෙක් වන්නේ යයි කී කල්හි මොළොක් ගතියට නො පැමිණෙන්නාහු නම් නැත. එබැවින් ඔහුට නෑයෙකැයි අවබෝධ කරවා මෘදු වූ උපායකින්ම ඔහු පළවා හරිමියි සිතා මේ දේශනාව ආරම්භ කළහ.

සො මෙ තවං භාගිනෙය්‍යො හොසි එකල්හි නුඹ මගේ බෑනා කෙනෙකු වූයේය. පරම්පරාව වශයෙන් බලා මෙය කියන ලදී. දෙව්ලොව මගේ පිතෘ වංශයයි. මුත්තාගේ වංශයයි. රජ කරන්නෙක් නම් නැත. පින්කම්වල ශක්තියෙන් දෙව්ලොව දෙව්රජව ඉපදී, ආයු ඇති තෙක් දෙව් සැප විඳ එයින් චුත වෙයි. එතැන් සිට වෙනත් කෙනෙක් තමන් විසින් කරන ලද කුශලයන්ගේ විපාක අනුව එතැන රජවෙයි. මෙසේ මේ මාරයාද එකල ඉන් චුතව නැවත කුසල් කොට මෙකල මෙහි අධිපතිව උපන්නේ යයි දතයුතු.

විධුරො විධුරො විගතධර වූයේ, අන්‍යයන් හා සමග අසමාන වූයේ, **අපපකසිරෙන නිදුකින් පසුපාලකා** එළු බැටළුවන් රක්නාහු, **පථාවිනො** මගට පිළිපන්නාහු, **කායෙ උපචිනිත්වා** හාත්පසින් සෑයක් බැඳ, **අගගිං දත්වා පකකමිංසු** මෙතෙකින් ශරීරය විනාශයට යන්නේ යයි චිතකයාගේ පමණ සලකා, සිව් දිසාවන්හි ගිනි දී නික්ම ගියහ. චිතකය පහන් සිළුවක් මෙන් දැල්විනි. තෙරුන්ට දිය ළෙනකට බැස සිටින කලක් මෙන් විය. **චීවරානි පපෙථාටෙත්වා** සමවතින් නැගිට පහවගිය දුම් ඇති, කැලමල් පැහැ ඇති, ගිනි අඟුරු මඩිමින් සිවුරු උන්වහන්සේගේ සිරුරේ උණුසුමක් පමණකුදු නො වීය. සිවුරෙහි කොණක්වත් නො දැවිනි. සමාපත්ති බලය නම් වේ.

අකෙකාසථ දශ ආක්‍රොශ වස්තුවෙන් බනිවු. **පරිභාසථ** වචනයෙන් පරිභව කරවු. **රොසෙථ** ගටවු. **විහෙසෙථ** වෙහෙකරව්. දුක් ඉපදවව්. මේ සියල්ල වචනයෙන් පහර දීමට නම් ය. **යථා තං දුසිත මාරෝ** යම් සේ මොවුන්ට දුසීමාර තෙම, **ලභෙථ ඔතාරං** සිදුරක් ලබානම්, කෙලෙස් ඉපදීමට අරමුණක් ලබන්නේ නම් යන අර්ථයි.

මුණඩකා ආදියෙහි මුඩු වූවන්ට 'මුණඩ' යයි ද, ශ්‍රමණයන් ට 'සමණ' යයි ද කියන්නට වටී. මොව්හූ නැවත **මුණඩකා සමණකා** යයි කීහ. **ඉබභා** ගෘහපතියෝ **කිණහා** කළු වූවෝ, **බන්ධුපාදා පචව** මෙහි බන්ධු යන්නෙන් බ්‍රහ්මයා අදහස් කරයි. බමුණෝ ඔහු මුත්තා යයි ව්‍යවහාර කරති. **පාදාපචචා** බඹහුගේ පිටිපත්ලෙන් උපන්, පාදයන්ගේ දරුවෝ යන අදහසයි. බමුණෝ මහබඹුගේ පිටිපත්ලෙන් උපන්, පාදයන්ගේ දරුවෝ යන අදහසයි. බමුණෝ මහ බඹුගේ මුවින් ඉපදුනාහුය. ක්ෂත්‍රියයෝ ළයින්, වෛශ්‍යයෝ නැබින්, ශූද්‍රයෝ දණින් ශ්‍රමණයෝ පිටිපසින් නික්මුණාහු

යයි **ඣායි නො සම්ඣායි නොසමි** අපි ධ්‍යාන ඇත්තමෝ වමු. අපි ධ්‍යාන ඇත්තමෝ වමු. **මධුරක ජාතා** අලස බැව් ඇති, කම්මැලිකමින් යුත් **ඣායනති** සිතත්. **පජඣායනති** යනාදිය උපසර්ග ව්‍යයෙන් වැඩි වූවාහු, **මූසිකං මගයමානො** සවස ගොදුරු සඳහා රුක් සිදුරෙන් නික්මී ගසේ අත්තක සිටි මීයෙකු සොයන්නේ, හේ වනාහි අතිශයින් අතිශයින් ශාන්ත වූවෙකු මෙන් නිසසලව සිටී. පැමිණි වහාම අල්ලාගනී. **කොත්‍ථූ** යනු සිවලා - උකුස්සා යයි ද කියති. **සන්ධි සමලසංකටීරෙ** බිත්ති (ගෘහ) සන්ධියෙහි ද, අසූචි නික්ම යන ඇළ ද කසළ ගොඩ ය යන තැන්වල **වහච්ඡිනෙනා** කන්තාරයෙන් නික්මුණු බිඳුනු කඳ ඇති, **සන්ධි සමල සංකටීරෙ** ගෘහ (බිත්ත) සන්ධිවල හෝ අසූචි ගලා යන තන්හි හෝ කසළ ගොඩෙහි හෝ හෙතෙක් බාගයක් වැසූ සිරුරු ඇතිව, නිශ්චලව සිටියි.

නිරයං උපපජ්ජනති යනු මාරයා මිනිසුන්ගේ සිරුරෙහි ආවේශව, මෙසේ කරන්නේ නම්, මිනිසුන්ට අකුසල් නො වන්නේ ය. මාරයාටම වන්නේ ය. එබැවින් සිරුරෙහි ආවේශ නොව විභාග වස්තුවක් උපදින අරමුණක් දක්වයි. එකල වනාහී හෙතෙම භික්ෂූන් කෙමිනක් ගෙන මසුන් මිරිකන්නවුන් මෙන් ද, දැලක් ගෙන මසුන් අල්ලන්නවුන් මෙන් ද, ලාටු තැවරුණු දණ්ඩක් බහා ළිහිණින් බඳින්නවුන් මෙන් ද, බල්ලන් සමග වනයෙහි මුව දඩයමේ හැසිරෙන්නවුන් මෙන් ද මාගමුන් ගෙන අවන්හල්හි හුන්නවුන් මෙන් ද, නටන්නවුන්, ගයන්නවුන් මෙන් ද, භික්ෂුණීන්ගේ රාත්‍රී ස්ථාන දිවා ස්ථානයන්හි, හුන්නා වූ කාමාතුරයන් මෙන් ද, කොට දැක්වීය. මිනිස්සු වනයට ගියාහු ද, වලට ගියාහු ද, වෙහෙරට ගියාහුද, විපිළිසර අරමුණු දැක අනෙක් අයට කියති. 'ශ්‍රමණයෝ මෙබඳු මහණුන්ට නො ගැළපෙන දේ නො සුදුසු දේ කරති' මොවුන්ට දුන් කල කුසල් කොයින්ද, මොවුන්ට කිසිවක් නො දෙව' මෙසේ ඒ මනුෂ්‍යයෝ දුටු දුටු තැන සිල්වතුන්ට ආක්‍රොශ කරති. මෙසේ ආක්‍රොශ කොට පව් රැස්කොට අපාය පුරවන්නෝ ය. **නිරයං උපපජ්ජති** යන්න එහෙයින් කියන ලදී.

අත්‍ථාවිටයා ආවේශ වූවාහූ, **එරිත්වා විහරිංසු** හුදෙක් පතුරුවා, විසුරුවා වාසය කළාහු නො වෙති. කකුසඳ භාග්‍යවතුන්ගේ අවවාදයෙහි සිට, සතර බ්‍රහ්ම විහාරයන් උපදවා - ධ්‍යාන පාදස්ථාන කොට, විදසුන් රහත්බැව්හි පිහිටියාහුය.

ආගතිං වා ගතිං වා පිළිසිඳ ගැනීම් වශයෙන් පැමිණෙන තැනක් හෝ ගති විසින් යන තැනක් හෝ නො දනිමි. **සියා චිතතසස අඤඤතතථං** සොම්නස් වශයෙන් අනන්‍යතාවයක් වන්නේ නම්. **සයහං ලොකං උපපජජනති** ස්වර්ග ලෝකවල උපදිත් මෙහි ද යට කී සෙයින්ම අරුත් දතයුතු. යම්සේ පළමු විපිළිසර උපදනා අරමුණ දැක්වීද, එසේ මෙවිට ප්‍රසාද කරවූ අරමුණ දැක්වී හෙතෙම එකල්හි මිනිසුන්ට පෙනෙන තැන භික්ෂූන් අහසින් යන්නවුන් මෙන් අහසෙහි සිටියවුන් මෙන්, පළඟින් හුන්නවුන් මෙන්, අහසේ හිඳ සිවුරු මැසීම්, පොත් කියවීම්, අහසේදීම සිවුර දිගහැර සෘතු ගන්නන්නාවුන් මෙන්, මහලු පැවිද්දන් අහසේ හැසිරෙන්නවුන් මෙන්, තරුණ සාමණේරවරුන් අහසැ පිපි මල් නෙල්ලවුන් මෙන්, කොට දැක්වීය. මිනිස්සු කුලනයට ගියාහු වලට ගියාහු, වෙහෙරට ගියාහු පැවිද්දන්ගේ පිළිවෙත් දැක මෙසේ අනුන් සමග කියති. 'භික්ෂූන් අතුරෙහි යටත්පිරිසෙයින් සාමණේරයෝ පවා මෙසේ මහත් ඍද්ධි ඇත්තාහුය. මහානුභාව ඇත්තාහුය. මේ ශ්‍රමණයන්ට දෙන ලද්ද මහත්ඵල මහානිසංස වේ' මේ පැවිද්දන්ට දන් දෙවි. සත්කාර කරවි. එකල්හි මිනිස්සු භික්ෂූන්ට සිව්පසයෙන් සත්කාර කොට, බොහෝ පින් රැස්කොට යහමග පුරන්නෝ වූහ.

සගගං ලොකං උපපජජතති යනු එහෙයින් කීහ.
එථ තුමෙහ භිකඛවෙ අසුභානුපසසී කායෙ විහරථ

භාග්‍යවතුන් වහන්සේ මුළු දඹදිව ඇවිදිමින් අවම වශයෙන් භික්ෂූන් දෙතුන් නමක් වසන තැනකට ගොස් 'මහණෙනි, අශුභ සංඥාව පුරුදු කළ සිතින් බහුලව වසන භික්ෂුවගේ සිත, මෛථුන ධර්මයන් පිළිබඳ හැඟීම්වලින් සැඟවෙයි. හැකිළෙයි. පෙරලෙයි. නො පැතිරෙයි. උපේක්ෂාව හා පිළිකුල් බවම එළඹ සිටී. මහණෙනි, ආහාරය පිළිබඳව පිළිකුල් හැඟීම පුරුදු කළ සිතින් බහුලව වසන භික්ෂූන් ගේ සිත රස තෘෂ්ණාවෙන් සැඟවෙයි. හැකිළෙයි. පෙරළෙයි. නො පැතිරෙයි. උපේක්ෂාව හෝ පිළිකුල් බවම එළඹ සිටී. මහණෙනි, සියලු ලෝකයෙහි අනභිරති සංඥාව පුරුදු කළ සිතින් බහුලව වෙසෙන භික්ෂුවගේ සිත (ඇත්, අස් ආරාම පන්සල්) ආදී ලෝකයෙහි තෘෂ්ණාව උපදනා වස්තු විෂයෙහි සැඟවෙයි. හැකිළෙයි. පෙරළෙයි. නො පැතිරෙයි. උපේක්ෂාව හෝ පිළිකුල් බවම එළඹ සිටී. මහණෙනි, අනිත්‍ය සංඥාව පුහුණු කළ සිතින් බහුලව වෙසෙන භික්ෂුවගේ සිත ලාභ සත්කාර, කීර්ති ප්‍රශංසා ආදියෙහි සැඟවෙයි. පැකිළෙයි.

පෙරලෙයි. උපේක්ෂාව හෝ පිළිකුල් බවම එළඹ සිටී. මෙසේ අනුසස් දක්වන සේක. එසේ දක්වා එථ තුමෙහ භික්ඛවෙ අසුභානුපසසී කායෙ විහරථ, ආහාරෙ පටිකකූල සඤඤිනො සබ්බලොකෙ අනභිරත සඤඤිනො, සබ්බ සංඛාරෙසු අනිච්චානු පසසිනො මේ සතර කමටහන් වදාළහ. ඒ භික්ෂූහු ද මේ සතර කර්මස්ථානයන්හි නිරතවැ වඩා විදසුන් වඩා සියලු ආශ්‍රවයන් ක්‍ෂය කොට රහත්බැව්හි පිහිටියාහු වෙති. මේ සතර කර්මස්ථානයෝ රාගය සන්සිඳවන්නාහූ ද්වේෂ මෝහ සන්සිඳවන්නාහූ රාගය නසන්නාහු, ද්වේෂය නසන්නාහුම වෙති.

සකඛරං ගහෙත්වා මිට ඇතුළෙහි සිටින ප්‍රමාණයේ ගලක් ගෙන මේ මාරයා වනාහි වනාහි බමුණු ගෘහපති ආදීන් ලවා භික්ෂූන්ට අක්‍රොශ කරවා ද බමුණු ගෘහපති ආදීන්ගේ වශයෙන් භික්ෂු සංඝයාට ලාභ සත්කාර උපදවාද, සිදුරක් නො ලබන්නේ ද දැන් සියතින් උපක්‍රම කරනු කැමතිව, එක්තරා කුමාරයකුගේ ශරීරයෙහි ආවේශව මෙබඳු ගලක් ගත්තේය. **සකඛරං ගහෙත්වාති** යන්න ඒ සඳහා කියන ලදී. **සීසං වොභින්දති** හිස බිඳුනේය. හිසේ සම බිඳී මස් දෙකඩ විය. ගල වනාහි හිස් කබල නොබිඳ ඇටයටම හැපී නැවතුනේය.

නාගාපලොකිතං අපලොකෙසි මහා ශබ්දය අසා යම්සේ හස්ති නාගා ඇතා ඈත හෝ මෑත බලනු කැමැත්තේ, බෙල්ල නො හරවා මුළු ඇඟම හරවා නැවතී ආපසු බලාද, එපරිද්දෙන් සියලු සිරුරින්ම නැවතී හැරී ආපසු බැලූ සේක. යම්හෙයකින් යම්සේ මහජනයාගේ ඇට කෙළවරින් කෙළවර හැපුනේද, (උරෙනුර ගැටී සිටියේද) පසේබුදුවරුන්ගේ අංකුසයෙන් ලැගුනාහු වෙත්ද, බුදුවරුන්ගේ එසේ නො වෙති. බුදුවරුන්ගේ හැකිල්ලක් මෙන් ඒකාබද්ධව සිටියාහු ද, එහෙයින් පිටිපස බලන කල්හි බෙල්ල පෙරළන්නට නො හැකි වෙයි. යම්සේ හස්ති නාගයා පිටිපස බලනු කැමැත්තේ සියලු සිරුරින්ම හැරේද, එසේ පෙරළා හැරියයුතු වෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ යන්ත්‍රයකින් හරවන ලද රන්පිළිමයක් සෙයින් සියලු සිරුරින්ම නැවතී බැලූ සේක. නැවත නැවත බලා සිටි සේක්, **න චායං දුසීමාරො මතතමඤඤාසි** යි වදාළහ. මේ දුසී මාරයා පව් කරන්නේ ප්‍රමාණයක් නො දත්තේම ය. පමණ ඉක්මවන සේ පව් කරයි. **සභාපලොකෙනා** කකුසන්ධ භාග්‍යවතුන් වහන්සේගේ බැලීම සමග එකෙණෙහිම **තමහා ච යානා චවි** ඒ දෙව්ලොවින් ද චුත වූයේ මහා නරකයෙහි උපන්නේ ය. චුත වන්නේ ද යම්කිසි තැනක නොගොස්

වසවර්ති දිව්‍ය ලෝකයටම චුත විය. **සහාපලොකනාය** යන වචනයෙන් භාග්‍යවතුන් වහන්සේ බැලූ බැවින්ම චුත වීයයි නොදත යුතු. මේ වනාහි චුති කාලය දැක්වීම පමණකි. උදාර වූ මහා ශ්‍රාවකයන් වෙත වරද කරන ලද බැවින් පොරවෙන් ගසන ලද්දක් මෙන් ඔහුගේ ආයුෂ එහිම සිඳී ගියේයයි දතයුතුය.

තයො නාමධෙය්‍යා හොනති නම් තුනක් වෙති. **ඡ පසසායතනිකො** ස්පර්ශායතන සය අතුරෙහි වෙනම වේදනාවට ප්‍රත්‍යය වූ **සංකුසමාහතො** යහුල්වලින් විදින ලද්දේ **පචචත්ත වෙදනීයො** තමා ම වේදනාව උපදවන්නේ, **සංකුනා සංකු හදයෙ සමාගචෙඡය්‍ය** යහුල සමග යහුල ළමැද එක්වන්නේ ය. ඒ නිරයේ උපන් සත්ත්වයන්ගේ තුන්ගවු වූ ආත්මභාව වෙයි. දුසීමාර වූ තෙරුන්ට ද එසේම විය. එකල ඔහුගේ ඒ අත්බැව්හිදී නිරයපාලයෝ තල්කඳන් පමණ වූ, හාත්පසින් ගිනි ඇවිලෙන්නා වූ, ගිනිදැල් සහිත වූ යකඩ උල් සියයක්ම ගෙන 'තා විසින් මෙතැනින් සිතා පව්කරන ලදැයි' හුණු ඔරුවක හුණු කොටන්නවුන් මෙන් ළමැද කොටා පනස් දෙනෙක් දෙපා ළඟින් ද, පනස් දෙනෙක් ඔළුව ළඟින්ද කොට කොටා යති. මෙසේ යමින් අවුරුදු පන්සියයකින් දෙකෙළවරට පැමිණ, නැවතී යළි අවුරුදු පන්සියයක් ළමැදට පැමිණෙත්. ඒ සඳහා කියන ලදී.

වුටඨානිමං යනු විපාකයෙන් උපන් වේදනාවයි. එය වනාහි මහා නිරයේ වේදනාවට වඩා අතිශයින් දුක්වෙයි. යම්සේ තෙල් පානය කරන සතියට වඩා පරිහාර සතිය, පථ්‍ය සේවනය කරන සතිය අතිශයින් දුක් වේද, එපරිද්දෙන් මහා නිරයට වඩා උස්සද නිරයේ විපාක වුට්ඨාන වේදනාව දුක් සහිතයයි කියත්. **සෙය්‍යථාපි මචඡසස** යම්සේ පුරුෂයාගේ හිස රවුම් වේද, හුලෙන් පහර දෙන්නහුගේ පහර සිටීම නොලබාද, මාළුවාගේ හිස දික්ව පුළුල් වේද, පහර සිටීම ලබා ද, නොවරදවා කම්කටොළු කිරීම පහසු වේ. එහෙයින් මෙබඳු හිස වේ.

විධුරං සාවක මාසජජා විධුර නම් ශ්‍රාවකයන් අතර ගැටුම් ඇතිකොට, **පචචත්තවෙදනා** තෙමේම වෙන වෙන වේදනා උපදවන **ඊදිසො නිරයො ආසී** මෙතැන්හි නිරය දේවදූත සූත්‍රයෙන් දැක්විය යුතු. **කණහ දුකඛං නිගචඡසි** කළුවන් මාරයා දුක් විඳින්නෙහි.

මජෙඣ සරසසා මහ මුහුදු මැද ජලය වස්තු කොට උපන් විමානයෝ කල්පයක් පවතින්නා වෙති. ඒ විමානයන්ගේ වර්ණය පැහැය වෛඩූර්ය මැණික් පාට වේ. කන්දක් මුදුනේ දැල්වෙන ගිනි කඳක් මෙන් ද, ඒ විමානයන්ගේ රශ්මීහු බබළති. **පභසසරා** ප්‍රභාසම්පන්න වෙති. ඒ විමානයන්හි නිල් රතු ආදී විවිධ වර්ණ වෙති. අප්සරාවෝ නටති. **යො එතමහි ජානාති** යමෙක් ඒ විමාන තොරතුරු දනිත් ද යන අර්ථයි. මෙහි දී විමාන වත්‍ථු ප්‍රේත වත්‍ථු ආදියෙන් අරුත් දැක්විය යුතුය.

පාදංගුටෙඨන කම්පයී යනු මේය පාසාද කම්පන සූත්‍රයෙන් දැක්විය යුතුය. **යො වෙජයනතං** මෙය චූල තණ්හා සංඛය සූත්‍රයෙන් දැක්විය යුතුය. **සකකං සො පරිපුච්ඡති** මෙය ද ඒ සූත්‍රයෙන්ම දැක්විය යුතුය. **සුධම්මායං අභීතොසහං** සුධර්මා සභාව සම්පයෙහි, මෙය බඹලොව සුධර්මා සභාවයි. තව්තිසා දෙව්ලොව නොවේ. සුධර්මා සභාවක් නැති දෙව්ලොවක් නැත. **බ්‍රහ්මලොකෙ පභසසරං** බ්‍රහ්මලෝකයේ සැරියුත් මුගලන්, මහා කස්සප ආදී ශ්‍රාවකයන් විසින් පිරිවරන ලද, තේජෝ ධාතුවට සමවැද වැඩහුන් භාග්‍යවතුන් වහන්සේගේ ආලෝකය (ඒ මෙසේයි.) එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බඹලොව සුධර්මා සභාවට රැස්ව, 'යමෙක් මෙහි පැමිණෙන්නට හැකිවන්නේ නම් එසේ මහත් ඍද්ධි ඇති කිසි මහණෙක් හෝ බමුණෙක් ඇද්දෝ' හෝ යි සිතන්නේ බ්‍රහ්ම සමූහයාගේ සිත් දැන එහි ගොස්, බ්‍රහ්ම සමූහයාගේ මුදුනෙහි වැඩහුන් සේක් තේජෝ ධාතුවට සමවැද, මහ මුගලන් ආදී තෙරුන්ගේ පැමිණීම බලාපොරොත්තු වූ සේක. ඔවුහු ද ගොස් ශාස්තෘන් වැඳ තේජෝ ධාතුවට සමවැද, වෙන වෙන දිශාවන්හි වැඩහුන්හ. සමස්ත බඹලොවම ඒකාලෝක විය. ශාස්තෘන් වහන්සේ චතුස්සත්‍යය ඇතුළත් ධර්මය දෙසූ සේක. දේශනාවසානයේ නොයෙක් දහස් ගණන් බඹ පිරිස මාර්ග ඵලයන්හි පිහිටියාහුය. ඒ සඳහා මේ ගාථාව කියන ලදී. එය බක බ්‍රහ්ම සූත්‍රයෙහි දැක්විය යුතුය. දැනගත යුතුය.

විමොඛෙන අත්‍ථසසයී ධ්‍යාන විමෝක්ෂයෙන් ස්පර්ශ කළේය. **වනං දඹදිව, පුබබවිදෙහානං** පූර්වවිදේහ නම් ද්වීපය. **යෙච භූමිසයා නරා** බිම හෝනා මිනිස්සු නම් අපරගෝයාන වාසීහුද, උතුරුකුරු දිවයින් වාසීහුද වෙති. ඔවුන් සියල්ලන් ද ස්පර්ශ කරන ලද්දේ යයි කියයි. මේ අර්ථය නන්දෝපනන්ද දමනයෙන් දැක්විය යුතුය. ඒ වස්තුව විශුද්ධි මාර්ගයේ

සෘද්ධි කථාවෙන් විස්තර කරන ලදී. අපුඤ්ඤං පසව් අකුසල් ලැබී. අස මාකාසි භිකබූසු භික්ෂූන් රැස්වීම වෙහෙසෙමි. මෙසේ ආසා නොකරව.

සෙසු සියලු තන්හි පැහැදිලි වූ අරුත් ඇත්තාහ.

මාර තජ්ජනීය සූත්‍ර වර්ණනාව නිමියේය.

පස්වැනි චූල යමක වර්ගය සමාප්තයි.

පපඤ්ච සූදනී මජ්ඣිම නිකාය අට්ඨකථාවේ
මූල පණ්ණාසක වර්ණනාව මෙතෙකින් අවසන් වේ.

ධුතංගධාරී ගරු සිල්වත් පෝහද්දරමුල්ලේ සංඝ පිතෘ පරපුරේ
පෝහද්දරමුල්ලේ ධම්මරුචි
පෝහද්දරමුල්ලේ සුගතජෝති
පෝහද්දරමුල්ලේ විහාවි
හිමිවරුන්ගේ සුපේශල ශික්ෂාකාමී බවට
මාගේ මෙම ව්‍යායාමය උපහාරයක් වේවා !